සුත්තන්තපිටකේ
සූත්‍ර පිටකයෙහි

දීඝනිකායෝ
දීඝ නිකාය

සීලක්ඛන්ධවග්ගෝ
සීල ස්කන්ධ වර්ගය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස
ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

1.
බ්‍රහ්මජාලසුත්තං
දෘෂ්ටි ජාලය ගැන වදාළ දෙසුම

1. **එවං මේ සුතං: ඒකං සමයං භගවා අන්තරා ච රාජගහං අන්තරා ච නාලන්දං අද්ධානමග්ගපටිපන්නෝ හෝති මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි. සුප්පියෝපි ඛෝ පරිබ්බාජකෝ අන්තරා ච රාජගහං අන්තරා ච නාලන්දං අද්ධානමග්ගපටිපන්නෝ හෝති සද්ධිං අන්තේවාසිනා බ්‍රහ්මදත්තේන මාණවේන.**

1. මා හට අසන්නට ලැබුණේ මේ විදිහට යි. ඒ දිනවල භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ පන්සියයක් පමණ මහත් වූ භික්ෂු සංඝයා සමග රජගහ නුවරටත් නාලන්දා නුවරටත් අතරේ දිගු ගමන් මාර්ගයකට පැමිණ වදාළා. එහි දී සුප්පිය නම් වූ පිරිවැජියාත් ඔහු ගේ ශිෂ්‍යයකු වන බ්‍රහ්මදත්ත නම් තරුණයාත් සමග රජගහ නුවරටත් නාලන්දා නුවරටත් අතරේ දිගු ගමන් මාර්ගයට පැමිණුනා.

තත්‍ර සුදං සුප්පියෝ පරිබ්බාජකෝ අනේකපරියායේන බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සංඝස්ස අවණ්ණං භාසති. සුප්පියස්ස පන පරිබ්බාජකස්ස අන්තේවාසී බ්‍රහ්මදත්තෝ මාණවෝ

අනේකපරියායේන බුද්ධස්ස වණ්ණං භාසති, ධම්මස්ස වණ්ණං භාසති, සංඝස්ස වණ්ණං භාසති. ඉතිහ තේ උභෝ ආචරියන්තේවාසී අඤ්ඤමඤ්ඤස්ස උජුවිප-චනීකවාදා භගවන්තං පිට්ඨිතෝ පිට්ඨිතෝ අනුබද්ධා හොන්ති භික්ඛුසංඝං ච.

එහිදී සුප්පිය පිරිවැජියා නොයෙක් ආකාරයෙන් බුදු රජාණන් වහන්සේට අපහාස කරන්නට වුණා. ශ්‍රී සද්ධර්මයටත් අපහාස කරන්නට වුණා. ආර්ය සංඝ රත්නයටත් අපහාස කරන්නට වුණා. එනමුත් සුප්පිය පිරිවැජියා ගේ ශිෂ්‍යයා වන බ්‍රහ්මදත්ත තරුණයා නොයෙක් ආකාරයෙන් බුදු රජාණන් වහන්සේ ගේ ගුණ වර්ණනා කරන්නට වුණා. ශ්‍රී සද්ධර්මයේ ගුණ වර්ණනා කරන්නට වුණා. ආර්ය සංඝ රත්නයේ ගුණ වර්ණනා කරන්නට වුණා. ඉතින් ඔය විදිහට ගුරු ශිෂ්‍ය දෙදෙනා එකිනෙකාට හාත්පසින් ම විරුද්ධ වූ වාද ඇතිව භාග්‍යවතුන් වහන්සේත් භික්ෂු සංඝයාත් පිටුපසින් ගමන් කරන්නට වුණා.

2. අථ ඛෝ භගවා අම්බලට්ඨිකායං රාජාගාරකේ ඒකරත්තිවාසං උපගංජී සද්ධිං භික්ඛුසංඝේන. සුප්පියෝපි ඛෝ පරිබ්බාජකෝ අම්බලට්ඨිකායං රාජාගාරකේ ඒකරත්තිවාසං උපගංජී සද්ධිං අන්තේවාසිනා බ්‍රහ්මදත්තේන මාණවේන. තත්‍ර'පි සුදං සුප්පියෝ පරිබ්බාජකෝ අනේකපරියායේන බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සංඝස්ස අවණ්ණං භාසති. සුප්පියස්ස පන පරිබ්බාජකස්ස අන්තේවාසී බ්‍රහ්මදත්තෝ මාණවෝ අනේකපරියායේන බුද්ධස්ස වණ්ණං භාසති, ධම්මස්ස වණ්ණං භාසති, සංඝස්ස වණ්ණං භාසති. ඉතිහ තේ උභෝ ආචරියන්තේවාසී අඤ්ඤමඤ්ඤස්ස උජුවිප-චනීකවාදා විහරන්ති.

2. එතකොට භාග්‍යවතුන් වහන්සේ අම්බලට්ඨිකා උයනෙහි රාජාගාරකයෙහි (රජුන් විසින් කරවන ලද ශාලාවෙහි) එක් රැයක් භික්ෂු සංඝයා සමග නවාතැන් ගන්නට වැඩම කළා. එකල්හි සුප්පිය පිරිවැජියාත් තම ශිෂ්‍යයා වූ බ්‍රහ්මදත්ත තරුණයා සමග ඒ අම්බලට්ඨිකාවේ රාජාගාරකයට ම එක් රැයක් නවාතැන් පිණිස පැමිණියා. ඉතින් එතැන දීත් සුප්පිය පිරිවැජියා නොයෙක් ආකාරයෙන් බුදු රජාණන් වහන්සේට අපහාස කරන්නට වුණා. ශ්‍රී සද්ධර්මයටත් අපහාස කරන්නට වුණා. ආර්ය සංඝ රත්නයටත් අපහාස කරන්නට වුණා. එනමුත් සුප්පිය පිරිවැජියා ගේ ශිෂ්‍යයා වන බ්‍රහ්මදත්ත තරුණයා නොයෙක් ආකාරයෙන් බුදු රජාණන් වහන්සේ ගේ ගුණ වර්ණනා කරන්නට වුණා. ශ්‍රී සද්ධර්මයේ ගුණ වර්ණනා කරන්නට

වුණා. ආර්ය සංඝ රත්නයේ ගුණ වර්ණනා කරන්නට වුණා. ඉතින් ඔය විදිහට ගුරු ශිෂ්‍ය දෙදෙනා එකිනෙකාට හාත්පසින් ම විරුද්ධ වූ වාද ඇතිවයි වාසය කළේ.

3. අථ ඛෝ සම්බහුලානං භික්ඛූනං රත්තියා ප-චූසසමයං ප-චුට්ඨිතානං මණ්ඩලමාළේ සන්නිසින්නානං සන්නිපතිතානං අයං සංඛ්‍යාධම්මෝ උදපාදි: "අ-ඡරියං ආවුසෝ, අබ්භුතං ආවුසෝ, යාවඤ්චිදං තේන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධේන සත්තානං නානාධිමුත්තිකතා සුප්පටිවිදිතා. අයං හි සුප්පියෝ පරිබ්බාජකෝ අනේකපරියායේන බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සංඝස්ස අවණ්ණං භාසති. සුප්පියස්ස පන පරිබ්බාජකස්ස අන්තේවාසී බ්‍රහ්මදත්තෝ මාණවෝ අනේකපරියායේන බුද්ධස්ස වණ්ණං භාසති, ධම්මස්ස වණ්ණං භාසති, සංඝස්ස වණ්ණං භාසති. ඉතිහ'මේ උභෝ ආචරියන්තේවාසී අඤ්ඤමඤ්ඤස්ස උජුවිප-චනීකවාදා භගවන්තං පිට්ඨිතෝ පිට්ඨිතෝ අනුබද්ධා හොන්ති භික්ඛුසංඝං චා"ති.

3. ඉතින් රෑ පාන්දරින් අවදි වී රැස්වීම් ශාලාවේ එකතුවෙලා සිටි බොහෝ භික්ෂූන් වහන්සේලා අතර මේ කතාබහ ඇතිවුණා. "ප්‍රිය ආයුෂ්මතුනි, ආශ්චර්යය යි, ප්‍රිය ආයුෂ්මතුනි, පුදුම සහගතයි, දත යුතු සියල්ල දන්නා වූත් දැක්ක යුතු සියල්ල දක්නා වූත් ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් සත්වයන් ගේ එකිනෙකා අතර ඇති මේ වෙනස් අදහස් ඇති බව මොන තරම් පැහැදිලි ලෙස ද තේරුම් අරගෙන තියෙන්නේ. මේ සුප්පිය පිරිවැජියා නොයෙක් අයුරින් බුදු රජාණන් වහන්සේට අගුණයක් ම කියනවා. ශ්‍රී සද්ධර්මයටත් අගුණයක් ම යි කියනවා. ආර්ය සංඝයාටත් අගුණයක් ම කියනවා. ඒ වුණාට සුප්පිය පිරිවැජියා ගේ ගෝලයා වන බ්‍රහ්මදත්ත තරුණයා නම් බුදු රජාණන් වහන්සේට ප්‍රශංසාවක් ම යි කරන්නේ. ශ්‍රී සද්ධර්මයට ප්‍රශංසාවක් ම යි කරන්නේ. ආර්ය සංඝ රත්නයට ප්‍රශංසාවක් ම යි කරන්නේ. ඔය විදිහට ගුරු ගෝල දෙදෙනා එකිනෙකාට හාත්පසින්ම විරුද්ධ වාද ඇතිව භාග්‍යවතුන් වහන්සේ ගේත් භික්ෂු සංඝයාගේත් පස්සෙන් ම ආව නෙව" කියල.

4. අථ ඛෝ භගවා තේසං භික්ඛූනං ඉමං සංඛ්‍යාධම්මං විදිත්වා යේන මණ්ඩලමාලෝ තේනුපසංකමි. උපසංකමිත්වා පඤ්ඤත්තේ ආසනේ නිසීදි. නිසජ්ජ ඛෝ භගවා භික්ඛූ ආමන්තේසි: "කායනු'ත්ථ භික්ඛවේ ඒතරහි කථාය සන්නිසින්නා සන්නිපතිතා? කා ච පන වෝ අන්තරා කථා විප්පකතා?"ති.

එතකොට ඒ භික්ෂූන් ගේ මේ කතාබහ දැන වදාළ භාග්‍යවතුන් වහන්සේ රැස්වීම් ශාලාවට වැඩම කොට වදාළා. වැඩම කරලා පණවන ලද අසුනෙහි වැඩ සිටියා. වැඩ සිටිය භාග්‍යවතුන් වහන්සේ "පින්වත් මහණෙනි, දැන් කවර කතාවකින් යුතුවද ඔබ එක්රැස්වෙලා සිටියේ? ඔබ අතරේ කවර කතාවක් ද අඩාල වුණේ?

එවං වුත්තේ තේ භික්ඛූ භගවන්තං එතදවෝචුං: "ඉධ භන්තේ අම්හාකං රත්තියා ප-චූසසමයං ප-චුට්ඨිතානං මණ්ඩලමාළේ සන්නිසින්නානං සන්නිපතිතානං අයං සංඛියාධම්මෝ උදපාදි "අ-ඡරියං ආවුසෝ, අබ්භුතං ආවුසෝ, යාවඤ්චිදං තේන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධේන සත්තානං නානාධිමුත්තිකතා සුප්පටිවිදිතා. අයං හි සුප්පියෝ පරිබ්බාජකෝ අනේකපරියායේන බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සංඝස්ස අවණ්ණං භාසති. සුප්පියස්ස පන පරිබ්බාජකස්ස අන්තේවාසී බ්‍රහ්මදත්තෝ මාණවෝ අනේකපරියායේන බුද්ධස්ස වණ්ණං භාසති, ධම්මස්ස වණ්ණං භාසති, සංඝස්ස වණ්ණං භාසති. ඉතිහ'මේ උභෝ ආචරියන්තේවාසී අඤ්ඤමඤ්ඤස්ස උජුවිප-චනීකවාදා භගවන්තං පිට්ඨිතෝ පිට්ඨිතෝ අනුබද්ධා හොන්ති භික්ඛුසංඝං චා"ති. අයං ඛෝ නෝ භන්තේ අන්තරාකථා විප්පකතා. අථ භගවා අනුප්පත්තෝ"ති.

මෙසේ වදාළ විට ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පැවසුවා. "ස්වාමීනී, මෙහි රෑ පාන්දරින් අවදිවී රැස්වීම් ශාලාවේ එකතුවෙලා සිටි අප අතර මේ කතාබහ ඇතිවුණා. "ප්‍රිය ආයුෂ්මතුනි, ආශ්චර්යය යි, ප්‍රිය ආයුෂ්මතුනි, පුදුම සහගතයි, දත යුතු සියල්ල දන්නා වූත් දැක්ක යුතු සියල්ල දක්නා වූත් ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් සත්වයන් ගේ එකිනෙකා අතර ඇති මේ වෙනස් අදහස් ඇති බව මොන තරම් පැහැදිලි ලෙස ද තේරුම් අරගෙන තියෙන්නේ. මේ සුප්පිය පිරිවැජියා නොයෙක් අයුරින් බුදු රජාණන් වහන්සේට අගුණයක් ම කියනවා. ශ්‍රී සද්ධර්මයටත් අගුණයක් ම යි කියනවා. ආර්ය සංඝයාටත් අගුණයක් ම කියනවා. ඒ වුණාට සුප්පිය පිරිවැජියා ගේ ගෝලයා වන බ්‍රහ්මදත්ත තරුණයා නම් බුදු රජාණන් වහන්සේ ට ප්‍රශංසාවක් ම යි කරන්නේ. ශ්‍රී සද්ධර්මයට ප්‍රශංසාවක් ම යි කරන්නේ. ආර්ය සංඝ රත්නයට ප්‍රශංසාවක් ම යි කරන්නේ. ඔය විදිහට ගුරු ගෝල දෙදෙනා එකිනෙකාට හාත්පසින්ම විරුද්ධ වාද ඇතිව භාග්‍යවතුන් වහන්සේ ගේත් භික්ෂු සංඝයාගේත් පස්සෙන් ම ආව නෙව" කියල. ස්වාමීනී, අප ගේ මේ කථාව යි අඩාල වුණේ. එතකොට ම යි භාග්‍යවතුන් වහන්සේ වැඩම කොට වදාළේ.

5. "මම‍ං වා භික්ඛවේ පරේ අවණ්ණං භාසෙය්‍යු‍ං, ධම්මස්ස වා අවණ්ණං භාසෙය්‍යු‍ං, සංඝස්ස වා අවණ්ණං භාසෙය්‍යු‍ං, තත්‍ර තුම්හේහි න ආඝාතෝ න අප්ප-චයෝ න ෙ-තසෝ අනභිරද්ධි කරණීයා. මම‍ං වා භික්ඛවේ පරේ අවණ්ණං භාසෙය්‍යු‍ං, ධම්මස්ස වා අවණ්ණං භාසෙය්‍යු‍ං, සංඝස්ස වා අවණ්ණං භාසෙය්‍යු‍ං, තත්‍ර ෙ- තුම්හේ අස්සථ කුපිතා වා අනත්තමනා වා, තුම්හං යේවස්ස තේන අන්තරායෝ. මම‍ං වා භික්ඛවේ පරේ අවණ්ණං භාසෙය්‍යු‍ං, ධම්මස්ස වා අවණ්ණං භාසෙය්‍යු‍ං, සංඝස්ස වා අවණ්ණං භාසෙය්‍යු‍ං, තත්‍ර වේ තුම්හේ අස්සථ කුපිතා වා අනත්තමනා වා, අපි නු පරේසං සුභාසිතං වා දුබ්භාසිතං තුම්හේ ආජානෙය්‍යාථා?"ති. "නෝ හේතං භන්තේ"

පින්වත් මහණෙනි, පිටස්තර උදවිය මට වුණත් අපහාස කරනවා නම්, ධර්මයට වුණත් අපහාස කරනවා නම්, සංඝයාට වුණත් අපහාස කරනවා නම් ඒ කියුම් ගැන ඔබ විසින් තරහ බැඳගැනීම් නො කළ යුතුයි; අමනාපය ඇති නො කර ගත යුතුයි; සිතේ නො කැමැත්තක් ඇති නො කර ගත යුතුයි. පින්වත් මහණෙනි, පිටස්තර උදවිය මට දොස් කියන විට, ධර්මයට දොස් කියන විට, සංඝයාට දොස් කියන විට ඒ ගැන ඉදින් ඔබ කෝප වෙනවා නම්, අසතුටු වෙනවා නම්, එයින් ඔබටම යි අන්තරායක් වන්නේ. පින්වත් මහණෙනි, පිටස්තර උදවිය මට දොස් කියන විට, ධර්මයට දොස් කියන විට, සංඝයාට දොස් කියන විට ඒ ගැන ඉදින් ඔබ කෝප වෙනවා නම්, අසතුටු වෙනවා නම්, එතකොට පිටස්තර උදවිය කියන දේවල් යහපත්ව කියනවා ද අයහපත්ව කියනවා ද යන්න ඔබ තේරුම් ගන්නේ කොහොම ද? ස්වාමීනී, එය නොවේ ම යි.

"මම‍ං වා භික්ඛවේ පරේ අවණ්ණං භාසෙය්‍යු‍ං, ධම්මස්ස වා අවණ්ණං භාසෙය්‍යු‍ං, සංඝස්ස වා අවණ්ණං භාසෙය්‍යු‍ං, තත්‍ර තුම්හේහි අභූතං අභූතතෝ නිබ්බෙඨේතබ්බං: "ඉති'පේතං අභූතං. ඉති'පේතං අත-ඡං. නත්ථි ෙ-තං අම්හේසු. න ච පනේතං අම්හේසු සංවිජ්ජති'ති."

පින්වත් මහණෙනි, පිටස්තර උදවිය මට දොස් කියන විට, ධර්මයට දොස් කියන විට, සංඝයාට දොස් කියන විට ඒ ගැන ඔබ විසින් කළයුත්තේ "මේ කාරණයෙන් වික නම් නැති දෙයක් ම යි. මේ කාරණයෙන් වික නම් අසත්‍යයක් ම යි. ඔය කියන දෝෂය අප තුළ නැති දෙයක්. ඔය දෝෂය අප අතර දකින්න නෑ" කියල අසත්‍යය අසත්‍යය වශයෙන් ම තේරුම් ගෙන ලිහා ඉවත් කිරීම යි.

6. "මම‍ං වා භික්ඛවේ පරේ වණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා වණ්ණං භාසෙය්‍යුං, සංඝස්ස වා වණ්ණං භාසෙය්‍යුං, තත්‍ර තුම්හේ හි න ආනන්දෝ න සෝමනස්සං න ෙතසෝ උබ්බිලාවිතත්තං කරණීයං. මම‍ං වා භික්ඛවේ පරේ වණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා වණ්ණං භාසෙය්‍යුං, සංඝස්ස වා වණ්ණං භාසෙය්‍යුං, තත්‍ර ෙ- තුම්හේ අස්සථ ආනන්දිනෝ සුමනා උබ්බිලාවිනෝ, තුම්හං යේවස්ස තේන අන්තරායෝ. මම‍ං වා භික්ඛවේ පරේ වණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා වණ්ණං භාසෙය්‍යුං, සංඝස්ස වා වණ්ණං භාසෙය්‍යුං, තත්‍ර තුම්හේහි භූතං භූතතෝ පටිජානිතබ්බං: "ඉති'පේතං භූතං ඉති'පේතං ත-ඡං. අත්ථි ෙ-තං අම්හේසු. සංවිජ්ජති ච පනේතං අම්හේසූ'ති."

පින්වත් මහණෙනි, මා ගැන වුණත් පිටස්තර උදවිය ගුණ වර්ණනා කරනවා නම්, ධර්මය ගැන වුණත් ගුණ වර්ණනා කරනවා නම්, සංඝයා ගැන වුණත් ගුණ වර්ණනා කරනවා නම්, ඒ ගැන ඔබ විසින් අමුතුවෙන් සතුටු විය යුතු නෑ. සොම්නස් විය යුතු නෑ. සිතෙහි උද්දාමයකට පත්විය යුතු නෑ. පින්වත් මහණෙනි, මා ගැන වුණත් පිටස්තර උදවිය ගුණ වර්ණනා කරන විට, ධර්මය ගැන වුණත් ගුණ වර්ණනා කරන විට, සංඝයා ගැන වුණත් ගුණ වර්ණනා කරනවිට, ඒ ගැන ඔබ විසින් අමුතු සතුටක් ඇතිකර ගන්ට ගියොත් සිත සතුටු කරගෙන උද්දාම වෙන්ට ගියොත් ඒකෙන් අන්තරායක් වන්නේ ඔබට ම යි. පින්වත් මහණෙනි, මා ගැන වුණත් පිටස්තර උදවිය ගුණ වර්ණනා කරන විට, ධර්මය ගැන වුණත් ගුණ වර්ණනා කරන විට, සංඝයා ගැන වුණත් ගුණ වර්ණනා කරනවිට, ඒ ගැන ඔබ විසින් කළ යුත්තේ " මේ කාරණයෙන් වික නම් ඇති දෙයක් ම යි. මේ කාරණයෙන් වික නම් සත්‍යයක් ම යි. ඔය කියන ගුණය අප තුළ තියෙනවා. ඔය ගුණය අප අතර දකින්නටලැබෙනවා" කියල සත්‍යය සත්‍යය වශයෙන් ම තේරුම් ගැනීම යි.

7. "අප්පමත්තකං ඛෝ පනේතං භික්ඛවේ විරමත්තකං සීලමත්තකං, යේන පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය. කතමඤ්ච තං භික්ඛවේ අප්පමත්තකං විරමත්තකං සීලමත්තකං, යේන පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය?

පින්වත් මහණෙනි, පෘථග්ජනයා යම් කරුණකින් තථාගතයන් වහන්සේ ගේ ගුණ කියයි නම් ඒ ගුණය අල්ප මාත්‍ර දෙයක් ම යි. ස්වල්ප දෙයක් ම යි. සීල ගුණ මාත්‍රයක් ම යි. පින්වත් මහණෙනි, යම් කරුණකින් පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියනවා නම් ඒ අල්ප මාත්‍ර වුත් ස්වල්ප වුත් සීල ගුණ මාත්‍ර වුත් දෙය කුමක් ද?

8. "පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ සමණෝ ගෝතමෝ නිහිතදණ්ඩෝ නිහිතසත්ථෝ ලජ්ජී දයාපන්නෝ සබ්බපාණභූතහිතානුකම්පී විහරතී"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සතුන් මැරීම අත්හැර දාල සතුන් මැරීමෙන් වැළකී සිටින කෙනෙක්. දඩු මුගුරු අත්හළ කෙනෙක්, අවි ආයුධ බැහැර කළ කෙනෙක්, පවට ලැජ්ජා ඇති කෙනෙක්. සතුන් කෙරෙහි දයාවන්ත කෙනෙක්, සියව් ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව යි වාසය කරන්නේ කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

9. "අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතෝ සමණෝ ගෝතමෝ දින්නාදායී දින්නපාටිකංඛී අථේනේන සුචිභූතේන අත්තනා විහරතී"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

ශ්‍රමණ ගෞතමයන් වහන්සේ නුදුන් දේ ගැනීම අත් හැරලා නුදුන් දේ ගැනීමෙන් වැළකී සිටින කෙනෙක්. දුන් දේ පමණක් පිළිගන්නා කෙනෙක්. දුන් දේ පමණක් පිළිගනු කැමති කෙනෙක්. සොර රහිත සිතින් යුතු වූ පිරිසිදු සිතින් යුතු වූ ජීවිතයකිනුයි වාසය කරන්නේ කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

10. "අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී සමණෝ ගෝතමෝ ආරාචාරී විරතෝ මේථුනා ගාමධම්මා"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

10. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ අබ්‍රහ්මචාරී බව අත් හැරලා බ්‍රහ්මචාරීව ඉන්න කෙනෙක්. ලාමක දෙයක් වූ මෛථුන සේවනයෙන් වැළකී එය දුරින් ම දුරුකළ කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

11. "මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතෝ සමණෝ ගෝතමෝ ස-චවාදී ස-චසන්ධෝ ථේතෝ ප-චයිකෝ අවිසංවාදකෝ ලෝකස්සා"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

11. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බොරු කීම අත්හැරල, බොරු කීමෙන් වැළකී සිටින කෙනෙක්. සත්‍යය කථා කරණ කෙනෙක්. සත්‍යය ගලපන කෙනෙක්. ස්ථිරව පිහිටලා කථාකරන කෙනෙක්. පිළිගත හැකි දේ කථා කරන කෙනෙක්. ලෝකයාව නො රවටන කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

12. "පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතෝ සමණෝ ගෝතමෝ. ඉතෝ සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමේසම්භේදාය. අමුත්‍ර වා සුත්වා න ඉමේසං අක්ඛාතා අමූසම්භේදාය. ඉති භින්නානං වා සන්ධාතා සංහිතානං වා අනුප්පදාතා. සමග්ගාරාමෝ සමග්ගරතෝ සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

12. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කේලාම් කීම අත්හැරලා කේලාම් කීමෙන් වැළකුණු කෙනෙක්. මෙතැනින් අහලා මේ අය බිඳවන්නට අතන කියන්නෙ නෑ. අතනින් අහලා ඒ උදවිය බිඳවන්නට මෙතැන කියන්නේ නෑ. මේ අයුරින් බිඳුනු උදවිය සමගි කරවනවා. සමගි වූවන්ට අනුබල දෙනවා. සමගි වූවන් හා වාසයට කැමතියි. සමගි වූවන් හා එක්ව වසනවා. සමගි වූවන් සමග සතුටු වෙනවා. සාමය උදෙසා සාමකාමී වචන කතා කරන කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

13. "ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතෝ සමණෝ ගෝතමෝ. යා සා වාචා නේළා කණ්ණසුඛා පේමනීයා හදයංගමා පෝරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

13. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පරුෂ වචනය අත් හැරලා පරුෂ වචනයෙන් වැළකී ඉන්න කෙනෙක්. යම් වචනයක් දොස් රහිත නම්, කණට සැප නම්, ආදරවන්ත නම්, හෘදයාංගම නම්, ශිෂ්ට සම්පන්න නම්, බොහෝ ජනයා කැමති නම්, බොහෝ ජනයාට ප්‍රියමනාප නම් එබඳු වූ වචන පවසන කෙනෙක් කියල. පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

14. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතෝ සමණෝ ගෝතමෝ, කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී, නිධානවතිං වාචං භාසිතා කාලේන සාපදේසං පරියන්තවතිං අත්ථසංහිතන්ති." ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

14. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තේරුමක් නැති කතා බහ අත් හැරලා තේරුමක් නැති කතා කීමෙන් වැළකී සිටින කෙනෙක්. කල් යල් බලා කථා කරන කෙනෙක්, ඇත්ත කතා කරන කෙනෙක්, අර්ථවත් දෙය කතා කරන කෙනෙක්, ධර්මය ම කථා කරන කෙනෙක්, විනය ම කථා කරන කෙනෙක්, සිත්හි ලා දරාගැනීමට සුදුසු, වෙලාවට ගැලපෙන උපදේශ සහිත වූ මදිපාඩුකම් නොතබා ප්‍රමාණවත් පරිදි දෙලොව යහපත පිණිස වූ දේ පවසන කෙනෙක් කියල. පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

15. "බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. ඒකභත්තිකෝ සමණෝ ගෝතමෝ රත්තූපරතෝ පටිවිරතෝ විකාලභෝජනා. න-චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. මාලාගන්ධ-විලේපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. උ-චාසයනමහාසයනා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. ජාතරූපරජත පටිග්ගහණා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. ආමකමංසපටිග්ගහණා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. දාසිදාසපටිග්ගහණා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. අජේළක-පටිග්ගහණා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. හත්ථිගවාස්සවළවපටිග්ගහණා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. දූතෙය්‍ය පහිණගමනානුයෝගා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. කයවික්කයා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. තුලාකූට - කංසකූට - මානකූටා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. උක්කෝටන - වඤ්චන - නිකති - සාචියෝගා පටිවිරතෝ සමණෝ ගෝතමෝ. ඡේදන - වධබන්ධන - විපරාමෝස - ආලෝප - සහසාකාරා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පැලවෙන බීජ හා පැල වුණ ගස් කොළන් විනාශ කිරීමෙන් වැළකී සිටින කෙනෙක්. එක් වරුවේ බොජුන් වළඳන

කෙනෙක්. රාත්‍රී ආහාරයෙන් වැළකී විකාල භෝජනයෙන් වැළකී සිටින කෙනෙක්. නැටුම්, ගැයුම්, වැයුම් හා විසූක දර්ශනයන් නැරඹීමෙන් වැළකී සිටින කෙනෙක්. මල් සුවඳ විලවුන් දැරීමෙන් ද ඇඟපත සැරසීමෙන් ද විසිතුරු වස්ත්‍රාභරණයෙන් සැරසීමෙන් ද වැළකී සිටින කෙනෙක්. ප්‍රමාණය ඉක්ම වූ උස් ආසන ද වටිනා සුඛෝපභෝගී ආසන ද පරිහරණයෙන් වැළකී සිටින කෙනෙක්. රන් රිදී මිල මුදල් පිළිගැනීමෙන් වැළකී සිටින කෙනෙක්. අමු ධාන්‍ය පිළිගැනීමෙන් වැළකී සිටින කෙනෙක්. අමු මස් පිළිගැනීමෙන් වැළකී සිටින කෙනෙක්. ස්ත්‍රීන්, කුමරියන් පිළිගැනීමෙන් වැළකී සිටින කෙනෙක්. දැසි දස්සන් පිළිගැනීමෙන් වැළකී සිටින කෙනෙක්. එළුබැටළුවන් පිළිගැනීමෙන් වැළකී සිටින කෙනෙක්. කුකුළන් ඌරන් පිළිගැනීමෙන් වැළකී සිටින කෙනෙක්. ඇතුන් ගවයන් අසුන් වෙළඹුන් පිළිගැනීමෙන් වැළකී සිටින කෙනෙක්. කෙත් වතු පිළිගැනීමෙන් වැළකී සිටින කෙනෙක්. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගිහි කටයුතු සඳහා දූත මෙහෙවර කිරීමෙන් වැළකී සිටින කෙනෙක්. වෙළ හෙළඳාම් කිරීමෙන් වැළකී සිටින කෙනෙක්. තරාදියෙන් රැවටීම, නො වටනා දෙයින් රැවටීම, මිනුමෙන් රැවටීම යන මෙයින් වැළකී සිටින කෙනෙක්. අල්ලස් ගෙන හිමිකරුවන් ගේ දේ අහිමි කිරීම, වංචා කිරීම, බාලදේ වටිනා දේ හැටියට පෙන්වීම ආදී නොයෙක් වංචනික දෙයින් වැළකී සිටින කෙනෙක්. අත්පා කැපීම් මැරීම් බන්ධන කිරීම් මං පැහැරගැනීම්, ගම් පැහැර ගැනීම් ආදී සැහැසි දෙයින් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

චුල්ලසීලං නිට්ඨිතං
කුඩා සීලය නිමාවිය.

16. “යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං: මූලබීජ ඛන්ධබීජං එව්බීජං අග්ගබීජං බීජබීජමේව පඤ්චමං. ඉති වා ඉති එවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ සමණෝ ගෝතමෝ”ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

16. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ විදිහේ පැලවෙන දේ හා ගස් කොළන් ආදිය වනසමින් ඉන්නවා. ඒ කියන්නේ මුලින් පැලවෙන දේවල්, කඳින් පැලවෙන දේවල්, පුරුකින් පැලවෙන දේවල්, දල්ලෙන් පැලවෙන දේවල්,

පස්වෙනුව බිජුවටින් පැලවෙන දේවල් යන ආදිය වනසමින් ඉන්නවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගස් කොළන් සිඳලීම් ආදී මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලිනුත් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

17. **"යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං සන්නිධිකාරපරිභෝග‍ං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද‍ං: අන්නසන්නිධි‍ං පානසන්නිධි‍ං වත්ථසන්නිධි‍ං යානසන්නිධි‍ං සයනසන්නිධි‍ං ගන්ධසන්නිධි‍ං ආමිසසන්නිධි‍ං. ඉති වා ඉති ඒවරූපා සන්නිධිකාරපරිභෝගා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණ‍ං වදමානෝ වදෙය්‍ය.**

17. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ දේ රැස්කරගෙන පරිභෝග කරමින් වාසය කරනවා. ඒ කියන්නේ කෑම වර්ග රැස් කරලා තියා ගන්නවා. බීම වර්ග රැස් කරලා තියා ගන්නවා. වස්ත්‍ර රැස් කරලා තියා ගන්නවා. යානවාහන රැස් කරලා තියා ගන්නවා. ඇඳ පුටු මේස රැස් කරලා තියා ගන්නවා. සුවඳ වර්ග රැස් කරලා තියා ගන්නවා. තවත් ආමිස රැස් කරලා තියා ගන්නවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි හෝ මෙවැනි වෙනත් දේවල් හෝ රැස්කරගෙන පරිහරණය කිරීමෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

18. **"යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං විසූකදස්සන‍ං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද‍ං: න-ච‍ං ගීත‍ං වාදිත‍ං පෙක්ඛ‍ං අක්ඛාන‍ං පාණිස්සර‍ං වේතාල‍ං කුම්භථූන‍ං සෝභනක‍ං චණ්ඩාල‍ං වංස‍ං ධෝවන‍ං හත්ථියුද්ධ‍ං අස්සයුද්ධ‍ං මහිසයුද්ධ‍ං උසභයුද්ධ‍ං අජයුද්ධ‍ං මෙණ්ඩයුද්ධ‍ං කුක්කුටයුද්ධ‍ං වට්ටකයුද්ධ‍ං දණ්ඩයුද්ධ‍ං මුට්ඨියුද්ධ‍ං නිබ්බුද්ධ‍ං උය්‍යෝධික‍ං බලග්ග‍ං සේනාබ්‍යූහ‍ං අනීකදස්සන‍ං. ඉති වා ඉති ඒවරූපා විසූකදස්සනා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණ‍ං වදමානෝ වදෙය්‍ය.**

18. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයේ විසූක දර්ශනයන් නැරඹීමෙහි

යෙදිල ඉන්නවා. ඒ කියන්නේ නැටුම්, ගැයුම්, වැයුම්, නාටක, පැරණි කථා රහදැක්වීම්, අත්තාල ගසා නැටීම්, වේතාල නැටීම්, බෙර වාදන කිරීම්, රහමඬළෙහි දේවතාවන්ට පූජා පිණිස නැටීම්, උණ ගසින් කරන ක්‍රීඩා, මිනී ඇට මැද තබා වටකොට නැටීම්, ඇත් යුධ බැලීම්, අශ්ව යුධ බැලීම්, ගොන් පොර බැලීම්, එළු පොර බැලීම්, බැටළු පොර බැලීම්, කුකුළු පොර බැලීම්, වටු පොර බැලීම්, පොව් හරඹ බැලීම්, මිටි හරඹ බැලීම්, මල්ලව පොර බැලීම්, යුධ සේනා බලන්ට යෑම, බලසෙන් ගණින තැන් බලන්ට යාම, බලසෙනහ විසිරුවන තැන් බලන්ට යාම ආදී දේවල්වල යෙදෙමින් ඉන්නවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලින් යුතු විසූක දර්ශන නැරඹීම්වලින් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

19. **“යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං ජූතප්පමාදට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං බලිකං සටිකං සලාකහත්ථං අක්ඛං පංගචිරං වංකකං මොක්ඛචිකං චිංගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනේසිකං යථාවජ්ජං. ඉති වා ඉති ඒවරූපා ජූතප්පමාදට්ඨානානුයෝගා පටිවිරතෝ සමණෝ ගෝතමෝ”ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.**

19. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල තමාව ප්‍රමාදයට පත් කරවන මේ ආකාර වූ සූදු කෙළියෙන් කල් යවනවා. ඒ කියන්නේ හතරැස් කොටු අටකින් යුතුව කරන සූදුව, කොටු දහයකින් කරන සූදුව, අහසේ රූ අඳිමින් කරන සූදුව, කොටු පැනීමෙන් කරණ සූදුව, සන්තික නම් වූ සූදුව, දාදු කැටයෙන් කරන සූදුව, කල්ලි ගැසුම, බුරුවා ගැසීම, ගුළ කෙළිය, නළා පිඹීම, කරණම් ගැසීම, මුගුරක් ගෙන උඩ යට වැටෙන පරිදි උඩට ගැසීම, කොළවලින් කළ ගොටුවලින් තරහෙට වැලි මැනීම, කුඩා රිය තරහ, කුඩා දුනුවලින් විදීමේ තරහ, අකුරු ලිවීමේ සෙල්ලම, සිතූ දේ කියන සෙල්ලම, විකලාංග අනුකරණයෙන් හිනැස්සීමේ සෙල්ලම ආදී දේ කිරීමයි. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මේ දෙයිනුත් මෙවැනි තවත් දේවල් ඇත්නම් එයිනුත් වැළකී ප්‍රමාදයට පත්වන සූදුවෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

20. "යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං උ-චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: ආසන්දිං පල්ලංකං ගෝනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලෝමිං ඒකන්තලෝමිං කට්ඨිස්සං කෝසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවේණිං කාදලිමිගපවර-ප-චත්ථරණං සඋත්තර-ඡදං උභතෝලෝහිතකූපධානං. ඉති වා ඉති ඒවරූපා උ-චාසයනමහාසයනා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

20. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ පමණ ඉක්මවා උස් වූ ආසනත් වටිනා සුඛෝප භෝගී ආසනත් පරිහරණය කරනවා. ඒ කියන්නේ දිග හාන්සි පුටු, කව්විචි, ලොකු පලස් යෙදූ ආසන, විසිතුරු ගෙත්තම් කළ එළු ලොම් ඇතිරිළි, සුදු එළු ලොමින් කළ ඇතිරිළි, මල් යෙදූ එළු ලොමින් කළ ඇතිරිළි, පුළුන් යෙදූ මෙට්ට, සත්ව රූපවලින් සැරසූ එළු ලොම් ඇතිරිළි, මුළුමණින්ම එළු ලොමින් කළ ඇතිරිළි, රන් නූලෙන් සැරසූ කලාල, පට නූලෙන් කළ කලාල, නාටිකාංගනාවන් ඒමත නැටිය හැකි එළු ලොමින් කළ කලාල, ඇතුන් පිට යොදන ඇතිරිළි, අසුන් පිට යොදන ඇතිරිළි, රථවල යොදන ඇතිරිළි, අඳුන් දිවි සමෙන් කළ ඇතිරිළි, කදලි මුව සමෙන් කළ කලාල, හිස දෙපැත්තට රතු විල්වීද කොට්ට තබා රතු උඩුවියන් බැඳ සැදූ වටිනා යහන් ආදිය පරිහරණය කරයි. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී උස් අසුන් මහා අසුන් පරිහරණයෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

21. "යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: උ-ජ්ජාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලේපනං මුඛචුණ්ණකං මුඛාලේපනං හත්ථබන්ධං සිඛාබන්ධං දණ්ඩකං නාළිකං අසිං ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවිජනිං විදානානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති ඒවරූපා මණ්ඩන-විභූසනට්ඨානානුයෝගා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

21. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් ඇඟපත සැරසීමෙන් හා

විසිතුරු වස්ත්‍රාභරණ පැළඳීමෙන් යුක්තව කල් ගෙවනවා. ඒ කියන්නේ සුවඳ වර්ග ඇහ තවරා සිරුර සිනිඳු කිරීම, තෙල් වර්ග ගා සම්බාහනය කොට සිරුර හැඩ කිරීම, සුවඳපැන් නෑම, උරහිස් ආදියෙහි මස් වැඩීමට මුගුරෙන් තැලීම, කැඩපතින් මුහුණ බලා සැරසීම, ඇස්වල අඳුන් ගෑම, මල් හා සුවඳ විලවුන් දැරීම, මුව සුවඳ කිරීම, මුව විලවුන් දැරීම, අත්වල ආභරණ දැමීම, හිසෙහි කුඩුම්බි දැරීම. විසිතුරු සැරයැටි දැරීම, විසිතුරු බෙහෙත් නල දැරීම, විසිතුරු කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නලල් පට දැරීම, මැණික් පැළඳීම, චාමර දැරීම, දිග වාටි ඇති සුදු වස්ත්‍ර දැරීම ආදියෙන් යුතුවෙයි. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී ඇහපත සැරසීම් හා විසිතුරු වස්ත්‍රාභරණ සැරසීමෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

22. "යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රාජකථං චෝරකථං මහාමත්තකථං සේනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං කුමාරකථං කුමාරිකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපේතකථං නානත්තකථං ලෝකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථන්ති. ඉති වා ඉති ඒවරූපාය තිරච්ඡානකථාය පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

22. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරිසන් කථාවල යෙදී වාසය කරනවා. ඒ කියන්නේ, රජවරුන් ගැන කථා, සොරුන් ගැන කථා, මහ ඇමතිවරුන් ගැන කථා, හමුදාවන් ගැන කථා, භය ඇතිවෙන දේවල් ගැන කථා, ආහාර වර්ග ගැන කථා, බොන දේවල් ගැන කථා, ඇඳුම් පැළඳුම් ගැන කථා, ඇඳ පුටු ගැන කථා, මල් වර්ග ගැන කථා, සුවඳ වර්ග ගැන කථා, නෑදෑයන් ගැන කථා, යාන වාහන ගැන කථා, ගම්මාන ගැන කථා, නියම් ගම්මාන ගැන කථා, නගර ගැන කථා, රටවල් ගැන කථා, ස්ත්‍රීන් ගැන කථා, පුරුෂයින් ගැන කථා, කුමාරයින් ගැන කථා, කුමාරියන් ගැන කථා ශූරයින් ගැන කථා, මංමාවත් ගැන කථා, වලං පොලේ දේවල් ගැන කථා, මියගිය උදවිය ගැන කථා, තව තව දේවල් ගැන කථා, ලෝකය ගැන

කථා, සාගරය ගැන කථා, මෙහෙමයි වුණේ මෙහෙමයි නොවුණේ කියන දේ ගැන කථා කරකර ඉන්නවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරිසන් කථාවෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

23. "යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මි-ඡාපටිපන්නෝ ත්වමසි, අහමස්මි සම්මා පටිපන්නෝ. සහිතං මේ, අසහිතං තේ. පුරේ වචනීයං ප-ඡා අවච. ප-ඡා වචනීයං පුරේ අවච. ආචිණ්ණං තේ විපරාවත්තං. ආරෝපිතෝ තේ වාදෝ. නිග්ගහිතෝ ත්වමසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බේඨේහි වා සෙ- පහෝසීති. ඉති වා ඉති ඒවරූපාය විග්ගාහිකකථාය පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

23. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් එකිනෙකා අතර බැණ දොඩා ගන්නා කථාවෙන් යුතුව යි ඉන්නෙ. ඒ කියන්නේ "නුඹ මේ ධර්ම විනය දන්නෙ නෑ. මම තමයි මේ ධර්ම විනය දන්නේ, ආ ... එහෙම ද එතකොට නුඹද මේ ධර්ම විනය දන්නේ? නුඹ ඉන්නේ මිත්‍යා වැඩපිළිවෙලකයි. මම තමයි නියම වැඩපිළිවෙල තුළ ඉන්නේ. මං කරුණු සහිතව යි කියන්නේ. නුඹේ කීම කරුණු රහිත යි. නුඹ කලින් කිවයුතු දේ පස්සේ කිව්වා. පස්සේ කිවයුතුදේ කලින් කිව්වා. නුඹ කලක් තිස්සේ කියපු දේ කණපිට පෙරළෙනා. මා විසින් නුඹට වාද නංවලයි තියෙන්නේ. නුඹට නිග්‍රහ කරල යි තියෙන්නේ. වාදයෙන් නිදහස් වීමට මගක් හොයාගෙන පලයන්. පුළුවන් නම් ලෙහාගනින්" යනාදිය කියමින් ආරවුල් හදාගන්නවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ බැණ දොඩාගන්නා කථාවෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

24. "යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං දූතෙය්‍යපහිණගමනානුයෝගං අනුයුත්තා

විහරන්ති. සෙය්‍යථීදං: රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං "ඉධ ග-ඡ. අමුත්‍රග-ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉති ඒවරූපා දූතෙය්‍යපහිණගමනානුයෝගා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

24. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල ගිහියන් ගේ පණිවිඩපණත් ගෙන යන මෙබඳු වූ දූත මෙහෙවරෙහි යෙදෙනවා. ඒ කියන්නේ, "මෙහෙ යන්න, අසවල් තැනට එන්න, මේක (අපේ මේ පණිවිඩය) අරන් යන්න. අසවල් තැනට මේක අරන් යන්න" යනාදී රජුන් ගේ, රාජමහා ඇමැතිවරුන් ගේ, ක්ෂත්‍රියයන් ගේ, බ්‍රාහ්මණයන් ගේ, ගෘහපතියන් ගේ, කුමාරවරුන් ගේ, පණිවුඩපණත් ගෙනියනවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ පණිවුඩපණත් ගෙනයන ගිහියන් ගේ දූත මෙහෙවරෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

25. **"යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ කුහකා ච හොන්ති ලපනා ච නේමිත්තිකා ච නිප්පේසිකා ච ලාභේන ලාභං නිජිගිංසිතාරෝ. ඉති වා ඉති ඒවරූපා කුහනලපනා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.**

25. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල කුහක (උඩින් වෙන ජීවිතයක් පෙන්වමින් යටින් වෙනත්) ජීවිත ගෙවනවා. ලාභ සත්කාර ලැබෙන විදිහට (පුහු වර්ණනා කිරීම්, තොදොල් කිරීම්, නැති ගුණ කීම් ආදී) චාටු බස් කියනවා. දායකයින් හට නො දී බැරි තත්වයට පත් වෙන ආකාරයේ නිමිති දක්වමින් කථා කරනවා. තමන්ට ලැබෙන විදිහට අනුන්ට ගරහනවා. ලාභයෙන් ලාභය හොයනවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ කුහකකමින් චාටුබස්වලින් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

මජ්ඣිමසීලං නිට්ඨිතං
මධ්‍යම සීලය නිමාවිය.

26. "යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථීදං: අංගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසික-ඡින්නං අග්ගිහෝමං දබ්බිහෝමං ථුසහෝමං කණහෝමං තණ්ඩුල-හෝමං සප්පිහෝමං තේලහෝමං මුඛහෝමං ලෝහිතහෝමං අංගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජ භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා වි-ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගපක්ඛං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

26. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙවැනි වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ ශාරීරික අංග බලලා පලාපල කියනවා, නිමිති බලලා එලාඵල කියනවා, උත්පාත බලලා එලාඵල කියනවා, සිහින එලාඵල කියනවා, ශාරීරික ලක්ෂණ බලලා එලාඵල කියනවා, මීයන් කෑ වස්ත්‍ර බලලා එලාඵල කියනවා, ගිනි පූජා පවත්වනවා, හැන්දෙන් පූජා පවත්වනවා, ධාන්‍ය පොතුවලින් පූජා පවත්වනවා, කණ නම් වූ සහලින් කළ පූජා පවත්වනවා, සහලින් පූජා පවත්වනවා, ගිතෙලින් පූජා පවත්වනවා, තල තෙලින් පූජා පවත්වනවා, විශේෂ කොට කරණ පූජා පවත්වනවා, සතුන් මරා ලේ පුදා කරන පූජා පවත්වනවා, අංග විද්‍යාව, වාස්තු විද්‍යාව, දේශපාලන විද්‍යාව, වාසනාව උරගා බැලීමේ (ලොතරැයි) විද්‍යාව, භූත විද්‍යාව, පොළොව යට බිම් ගෙයක ඉඳ මැතිරීමෙන් කරන (භූරි) විද්‍යාව, සර්ප විද්‍යාව, විෂ විද්‍යාව, වෘශ්චික විද්‍යාව, මූසික විද්‍යාව, පක්ෂි විද්‍යාව, විශාල පක්ෂි විද්‍යාව, ඉදුණු දේ මුල් කොට අනාවැකි කියන විද්‍යාව, මතුරන ලද ඊතල විද ආරක්ෂා කරන විද්‍යාව, මෘග පක්ෂ යනාදී මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

27. "යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති සෙය්‍යථීදං: මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං

පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරීලක්ඛණං දාසලක්ඛණං දාසීලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගෝලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගෝධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං ක-ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

27. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ මැණික්වල සුභ අසුභ ලකුණු කීම, දඬුවල සුභ අසුභ ලකුණු කීම, වස්ත්‍රවල සුභ අසුභ ලකුණු කීම, කඩු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ඊතල ආදී සලකුණුවලින් සුභාසුභ කීම, දුනු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ආයුධ ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ස්ත්‍රීන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, පුරුෂයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දරුවන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දැරියන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසීයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, ඒ ඒ කටයුතු සඳහා තෝරා ගත යුතු ඇතුන් ගේ ලකුණු කීම, අසුන් ගේ ලකුණු කීම, ඔටුවන් ගේ ලකුණු කීම, වෘෂභයන් ගේ ලකුණු කීම, ගවයන් ගේ ලකුණු කීම, එළුවන් ගේ ලකුණු කීම, බැටළුවන් ගේ ලකුණු කීම, කුකුළු පොර ආදියට සුදුසු කුකුළන් ගේ ලකුණු කීම, වටුවන් ගේ ලකුණු කීම, සුහුනන් ඇහ වැටීමේ සහ හඬනැගීමේ ඵලාඵල කීම, කණෙහි පළඳාගත් උපකරණවලින් ඵලාඵල කීම, කැස්බෑවන්ට මතුරා ඵලාඵල කීම, මුවන්ට මතුරා ඵලාඵල කීම ආදී තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

28. **"යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති. රඤ්ඤං අතියානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං**

අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයෝ භවිස්සති. බහිරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයෝ භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. ඉති ඉමස්ස ජයෝ භවිස්සති. ඉමස්ස පරාජයෝ භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

28. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් නැකතට රජතුමා ගේ යුධ පිණිස නික්මීම වන්නේ ය. අසවල් නැකතින් ආපසු නුවරට ඇතුළ්වීම සිදු කළ යුත්තේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිට පිටත සතුරු රජුන් හමුවීමට රජු ගේ ගමන කළ යුත්තේ ය. අසවල් නැකතින් පිටත සිටින රජවරු රට ඇතුළට පැමිණීම වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජු ගේ ඉවත්වීම සිදුවන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජුට ජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුනට පරාජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුන්ට ජය වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ රජුට පරාජය වන්නේ ය කියල මොහුට ජය වෙනවා. මොහුට පරාජය වෙනවා" ආදී වශයෙන් පවසමින් තිරිසන් විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

29. **"යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: චන්දග්ගාහෝ භවිස්සති, සුරියග්ගාහෝ භවිස්සති, නක්ඛත්තග්ගාහෝ භවිස්සති, චන්දිමසුරියානං පථගමනං භවිස්සති, චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, නක්ඛත්තානං පථගමනං භවිස්සති, නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, උක්කාපාතෝ භවිස්සති, දිසාඩාහෝ භවිස්සති, භූමිචාලෝ භවිස්සති, දේවදුන්දුභි භවිස්සති, චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං විගමනං සංකිලේසං වෝදානං භවිස්සති, ඒවං විපාකෝ චන්දග්ගාහෝ භවිස්සති, ඒවං විපාකෝ සුරියග්ගාහෝ භවිස්සති, ඒවං විපාකෝ නක්ඛත්තග්ගාහෝ භවිස්සති, ඒවං**

විපාකං චන්දිමසුරියානං පථගමනං භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, ඒවං විපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති, ඒවං විපාකං නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, ඒවං විපාකෝ උක්කාපාතෝ භවිස්සති, ඒවං විපාකෝ දිසාඩාහෝ භවිස්සති, ඒවං විපාකෝ භූමිචාලෝ භවිස්සති, ඒවං විපාකෝ දේවදුන්දුභි භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං විගමනං සංකිලේසං වෝදානං භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

29. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් දින චන්ද්‍රග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සූර්යග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින නැකත් ග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නිසිමහින් යෑම සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නො මහින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නිසිමහින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නොමහින් යෑම සිදුවෙනවා. අසවල් දින උල්කාපාත වැටෙනවා. අසවල් දින අසවල් දිශාවේ උෂ්ණත්වය වැඩිවෙනවා. අසවල් දින භූමි කම්පාවක් සිදුවෙනවා. අසවල් දින වැසි රහිතව අහස ගුගුරනවා. හිරු සඳු හා නැකත්වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම මේ මේ වෙලාවට සිදුවෙනවා. චන්ද්‍ර ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. සූර්ය ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. නැකත් ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නිසිගමන මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නොමඟ යෑම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. උල්කාපාත වැටීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. දිශා දාහය මෙවැනි ඵල විපාක ලබා දෙනවා. භූකම්පන මෙවැනි ඵල විපාක ලබා දෙනවා. වැසි නැතිව අහස ගිගිරීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. හිරු සඳු හා නැකත්වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම ලෝකයට මෙවැනි විපාක ලබා දෙනවා." කියල තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

30. "යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: සුබ්බුට්ඨිකා භවිස්සති, දුබ්බුට්ඨිකා භවිස්සති, සුභික්ඛං භවිස්සති, දුබ්භික්ඛං භවිස්සති, ඛේමං භවිස්සති, භයං භවිස්සති, රෝගෝ භවිස්සති, ආරෝග්‍යං භවිස්සති, මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලෝකයතං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

30. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "මේ කාලයේ දී වැස්ස වහිනවා. මේ කාලයේ දී නියහය ඇතිවෙනවා. මේ කාලයේ දී ආහාරපානාදියෙන් සරුවෙනවා. මේ කාලයේ දී දුර්භික්ෂය ඇතිවෙනවා. මේ කාලයේ දී රට සරුවෙනවා. මේ කාලයේ දී බිය සැක නැතිව ඉන්නවා. මේ කාලයේ දී භය උපදිනවා. මේ කාලයේ දි රෝග ඇති වෙනවා. මේ කාලයේ දි නීරෝග බව ඇති වෙනවා කියමින් එලාඵල පැවසීමත් මුද්‍රා, ගණිත, සංඛ්‍යාන, කාව්‍ය ශාස්ත්‍ර, ලෝකායත ශාස්ත්‍ර ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

31. "යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හානිත්ථම්භනං හනුසංහනනං හත්ථාභිජප්පනං හනුජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිකපඤ්හං දේවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිවිහානං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

31. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා

ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, විවාහයට නැකත් කීම, ආවාහයට නැකත් කීම, වෙන් වූ අඹු සැමියන් එක් කිරීමට නැකත් සැදීම, එක් වූ අඹු සැමියන් වෙන් කිරීමට නැකත් සැදීම, දීපු ණය එකතු කිරීමට නැකත් සැදීම, මුදල් ණයට පොලියට දීමට නැකත් සැදීම, දියුණු වීමට ගුරුකම් කිරීම, පාළු වී නැති වීමට ගුරුකම් කිරීම, දරුගැබ් රැකෙන්නට ගුරුකම් කිරීම, දිව අගුළු බැඳෙන්නට ගුරුකම් කිරීම, හනු තද කරන්නට ගුරුකම් කිරීම, අත් පෙරලෙන්නට ගුරුකම් කිරීම, හනු සිරවෙන්නට ගුරුකම් කිරීම, කණ් අගුළු වැටෙන්නට ගුරුකම් කිරීම, කණ්ණාඩියෙන් භූතයන් කැඳවා ප්‍රශ්න විචාරීම, ගෑණු දරුවන් ලවා පේන කීම, දෙවියන් ලවා පේන කීම, සූර්ය වන්දනාව, මහ බඹු වන්දනාව, මන්ත්‍ර බලයෙන් කටින් ගිනිදැල් පිටකිරීම, මන්ත්‍ර බලෙන් ලක්ෂ්මි පූජා කිරීම යනාදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

32. "යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: සන්තිකම්මං පණිධිකම්මං භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපනං ජුහනං වමනං විරේචනං උද්ධවිරේචනං අධෝවිරේචනං සීසවිරේචනං කණ්ණතේලං නෙත්තතප්පනං නත්ථුකම්මං අඤ්ජනං ප-චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකි-ඡා මූලභේසජ්ජානං අනුප්පදානං විසඨීනං පටිමොක්ඛෝ. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡාන-විජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ සමණෝ ගෝතමෝ"ති. ඉති වා හි භික්ඛවේ පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

32. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, ශාන්ති කර්ම, බාර ඔප්පු කිරීම, පොළොව යට හිඳ මතුරා ගුරුකම් කිරීම, නපුංසකයා පිරිමියෙකු කිරීම, පිරිමියා නපුංසකයෙකු කිරීම, ගෙවල් තැනීමේ දිශාවන් පෙන්වා දීම, අළුතෙන් නිවාස තැනීමේදී පුද පූජා පැවැත් වීම, වතුර මතුරා මූණ සේදවීම, වතුර මතුරා නැහැවීම, ගිනිපිඳීම, ලය විරේක කරවීම, බඩ විරේක කරවීම, වමනය

කරවීම, වස්ති කරවීම, ශීර්ෂ විරේකය, කණට තෙල් පිඹීම, ඇස් වෙදකම, නස්න කිරීම, ඇස්වලට අඳුන් සෑදීම, ප්‍රති අංජන සෑදීම, ශල්‍ය කර්ම කිරීම, ළදරු චිකිත්සාව, කාය චිකිත්සාව, වනවලට බෙහෙත් බැඳීම ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී සිටින කෙනෙක් කියල, පින්වත් මහණෙනි, ඔය විදිහට යි පෘථග්ජනයා තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියන්නේ.

33. ඉදං ඛෝ තං භික්ඛවේ අප්පමත්තකං විරමත්තකං සීලමත්තකං යේන පුථුජ්ජනෝ තථාගතස්ස වණ්ණං වදමානෝ වදෙය්‍ය.

33. පින්වත් මහණෙනි, පෘථග්ජනයා යම් කරුණකින් තථාගතයන් වහන්සේ ගේ ගුණ කියතොත් කියනවා නම් ඒ මෙවැනි අල්ප මාත්‍ර දෙයකි. ස්වල්ප දෙයකි. සීල මාත්‍රයකි.

මහාසීලං නිට්ඨිතං
මහා සීලය නිමාවිය

34. අත්ථි භික්ඛවේ අඤ්ඤේව ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබෝධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවේදනීයා, යේ තථාගතෝ සයං අභිඤ්ඤා ස-ඡීකත්වා පවේදේති, යේහි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං. කතමේ ච තේ භික්ඛවේ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබෝධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවේදනීයා යේ තථාගතෝ සයං අභිඤ්ඤා ස-ඡීකත්වා පවේදේති, යේහි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං?

34. පින්වත් මහණෙනි, වෙනත් දේවල් තියෙනවා ම යි. ඒවා ගාම්භීර යි. දැකීමට දුෂ්කර යි. අවබෝධයට දුෂ්කර යි. ශාන්ත යි. ප්‍රණීත යි. ඒ වගේ ම තර්ක ගෝචරයෙන් තොර යි. සියුම්. නුවණැත්තන්ට විෂය වන දෙයක්. තථාගතයන් වහන්සේ ස්වකීය විශිෂ්ට වූ ප්‍රඥාවෙන් අවබෝධ කරලා යම් දෙයක් ලෝකයට ප්‍රකාශ කරනවා නම්, අන්න එබඳු දේවල්වලින් තමයි තථාගතයන් වහන්සේ ගේ යථාර්ථ වශයෙන් ම තිබෙන ගුණ ගැන මනා කොට වර්ණනා කරනවා නම් කළ යුත්තේ. පින්වත් මහණෙනි, තථාගතයන්

වහන්සේ ස්වකීය විශිෂ්ට ප්‍රඥාවෙන් සාක්ෂාත් කරපු යම් දේවල් ඇද්ද, ඒ දේවල්වලින් තථාගතයන් වහන්සේ ගේ යථාර්ථ වශයෙන් තිබෙන ගුණය වර්ණනා කරනවා නම්, වර්ණනා කළ යුතු දේ වන ගාම්භීර වූත්, දැකීමට දුෂ්කර වූත්, අවබෝධයට දුෂ්කර වූත්, ශාන්ත වූත්, ප්‍රණීත වූත්, තර්ක ගෝචරයෙන් තොර වූත්, සියුම් වූත්, නුවණැත්තන්ට විෂය වූත් ඒ දේවල් මොනවා ද?

35. සන්ති භික්ඛවේ ඒකේ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනෝ පුබ්බන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාරසහි වත්ථූහි. තේ ච හොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනෝ පුබ්බන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාරසහි වත්ථූහි ?

35. පින්වත් මහණෙනි, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් අතීත ජීවිතයේ කෙළවර පිළිබඳව කල්පනා කරමින් අතීත ජීවිත කෙළවර ගැන ගොඩනහාගත් මතවාදවලින් යුක්ත යි. ඔවුන් අතීත ජීවිතයේ ආරම්භක කෙළවර අරභයා දහඅට කරුණකින් යුතුව නොයෙක් ආකාරයෙන් මතවාද ප්‍රකාශ කරමින් කරුණු කියනවා. අතීත ජීවිත කෙළවර පිළිබඳව කල්පනා කරමින් අතීත ජීවිත කෙළවර ගැන මතවාද ගොඩනහා ගත් ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් නොයෙක් ආකාරයෙන් මතවාද ප්‍රකාශ කරමින් කරුණු දහඅටකින් තම මත පවසන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද?

36. සන්ති භික්ඛවේ ඒකේ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි. තේ ච හොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි?

36. පින්වත් මහණෙනි, ශාස්වතවාදී (සදාකාලික දේවල් ඇත යන මතවාදය පවසන) ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් තමා ගැනත් ලෝකය ගැනත් ශාස්වතයි කියලා කරුණු හතරකින් උගන්වනවා. ඒ ශාස්වතවාදී වූ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත් ලෝකය ගැනත් ශාස්වතයි (සදාකාලික යි) කියලා කරුණු හතරකින් උගන්වන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද ?

37. ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයෝගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චේතෝසමාධිං ඵුසති යථා සමාහිතේ චිත්තේ අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: "ඒකම්පි ජාතිං ද්වේ'පි ජාතියෝ තිස්සෝ'පි ජාතියෝ චතස්සෝ'පි ජාතියෝ පඤ්ච'පි ජාතියෝ දස'පි ජාතියෝ වීසතිම්පි ජාතියෝ තිංසම්පි ජාතියෝ චත්තාරීසම්පි ජාතියෝ පඤ්ඤාසම්පි ජාතියෝ ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසත-සහස්සම්පි අනේකානි'පි ජාතිසතානි අනේකානි'පි ජාතිසහස්සානි අනේකානි'පි ජාතිසතසහස්සානි අමුත්‍රාසිං එවන්නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං තත්‍රාපාසිං එවමන්නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝ'ති."

37. පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ඉන්නවා. ඔහු කෙලෙස් තවමින් වීරිය කරනවා. අධික වීරිය කරනවා. යළි යළිත් වීරිය කරනවා. අප්‍රමාදීව භාවනා වඩනවා. හොඳට සිත හසුරුවනවා. යම් අයුරකින් සිත සමාහිත වෙලා අනේකවිධ වූ අතීතයේ ගතකළ ජීවිත සිහි කරනවා නම් එවැනි චිත්ත සමාධියක් ඇති කර ගන්නවා. ඒ කියන්නේ එක උපතක් ද, උපත් දෙකක් ද, උපත් තුනක් ද, උපත් හතරක් ද, උපත් පහක් ද, උපත් දහයක් ද, උපත් විස්සක් ද, උපත් තිහක් ද, උපත් හතලිහක් ද, උපත් පනහක් ද, උපත් සියයක් ද, උපත් දාහක් ද, උපත් ලක්ෂයක් ද වශයෙන් නොයෙක් ලක්ෂ ගණනින් ගෙවන ලද අතීත ජීවිත සිහි කරනවා. "මං අසවල් තැන හිටියා. එතකොට මගේ නම මේකයි, ගෝත්‍ර නාමය මේකයි, රූප සෝභාව මෙහෙම යි, කෑවේ බිව්වේ මෙහෙම යි, සැපදුක් වින්දේ මෙහෙම යි, මෙහෙම යි ජීවිතය අවසන් වුණේ, ඊට පස්සේ මං එතැනින් චුතවෙලා අසවල් තැන යි උපන්නේ, එහෙදි මට ලැබුණෙ මේ නම, මේක තමයි ගෝත්‍ර නාමය, රූප සෝභාව මෙහෙම යි, කෑවේ බිව්වේ මෙහෙම යි, සැපදුක් වින්දේ මෙහෙම යි, මෙහෙම යි ජීවිතය අවසන් වුණේ, ඊට පස්සේ මං එතැනින් චුතවෙලා මෙහි උපන්නා" කියල.

ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති. සෝ එවමාහ: සස්සතෝ අත්තා ච ලෝකෝ ච වඤ්ඣෝ කූටට්ඨෝ එසිකට්ඨායිට්ඨිතෝ. තේව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති

උපපජ්ජන්ති, අත්ථිත්වේව සස්සතිසමං. තං කිස්ස හේතු? අහං හි ආතප්පමන්වාය පධානමන්වාය අනුයෝගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චේතෝසමාධිං ඵුසාමි යථාසමාහිතේ චිත්තේ අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරාමි. සෙය්‍යථීදං: එකම්'පි ජාතිං ද්වේ'පි ජාතියෝ..... අනේකානිපි ජාතිසතසහස්සානි අමුත්‍රාසිං එවන්නාමෝ එවංගොත්තෝ ..... ඉධූපපන්නෝති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරාමි. ඉමිනාමහං ඒතං ජානාමි. යථා සස්සතෝ අත්තා ච ලෝකෝ ච වඤ්ඣෝ කූටට්ඨෝ ඒසිකට්ඨායිට්ඨිතෝ. තේව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති අත්ථිත්වේව සස්සතිසම"න්ති.

මේ විදිහට කරුණු සහිතව, පැහැදිළි කිරීම් සහිතව, නොයෙක් අයුරින් කලින් ගතකළ ජීවිත ගැන සිහි කරනවා. එතකොට ඔහු මෙහෙම කියනවා. "ආත්මයත් ලෝකයත් සදාකාලික යි. වඳබැහැල තියෙන්නේ. ගිරිකුළක් වගේ තියෙන්නේ. නගර මැද නො සෙල්වෙන පරිදි සිටුවා තිබෙන ඒෂිකා ස්ථම්භයක් වගේ. ඒ සත්වයන් ම යි, එක එක තැන උපදින්නේ. භවයෙන් භවයට සැරිසරා යන්නේ. චුතවෙන්නේ, උපදින්නේ. සදාකාලික වස්තු වගෙයි පවතින්නේ" කියල. ඒකට හේතුව කුමක් ද? මං කෙලෙසේ තවන විර්යයයෙන් යුතුව ගොඩාක් උත්සාහ කරල, යළි යළිත් උත්සාය කරල, අප්‍රමාදීව මැනවින් මෙනෙහි කරල යම් සමාහිත සිතකින් නොයෙක් අයුරින් පෙර විසූ ජීවිත ගැන සිහි කරනවා නම් මං එබඳු සමාධියක් ඇතිකර ගත්තා. ඒ කියන්නේ එක උපතක් ද, උපත් දෙකක් ද ..... නොයෙක් ලක්ෂ ගණන් උපත් ද මං සිහි කරනවා. මං අසවල් තැනයි හිටියේ. එතකොට මගේ නම මේකයි. ගෝත්‍ර නාමය මේකයි ..... මෙහි උපන්නා කියල. ඔය විදිහට කරුණු සහිතව පැහැදිළි කිරීම් සහිතව නොයෙක් අයුරින් කලින් ගතකළ ජීවිත ගැන මං සිහි කරනවා. මේ තුළින් තමයි ආත්මයත් ලෝකයත් සදාකාලික බව, වඳබැහැල තියෙන බව, ගිරිකුළක් වගේ තියෙන බව, නගර මැද නො සෙල්වෙන පරිදි සිටුවා තිබෙන ඒෂිකා ස්ථම්භයක් වගේ තියෙන බව, ඒ සත්වයන් ම එක එක තැන උපදින බව, භවයෙන් භවයට සැරිසරා යන බව, චුතවෙන උපදින බව, සදාකාලික වස්තු වගේ පවතින බව කියන මං මේ කාරණය (ශාස්වතයි කියල) දන්නේ.

ඉදං භික්ඛවේ පඨමං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, යමකට පැමිණිලා, යමක් අරභයා ශාස්වතවාදී වූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ශාස්වත යි කියලා උගන්වනවා නම්, මේක තමයි පළමු වෙනි කාරණය.

38. දුතියේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති?

38. ශාස්වතවාදී වූ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ශාස්වත යි කියලා දෙවෙනි කරුණකින් උගන්වන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද?

ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයෝගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාර-මන්වාය තථාරූපං චේතෝ සමාධිං ඵුසති යථා සමාහිතේ චිත්තේ අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං : "ඒකම්'පි සංවට්ට-විවට්ටං. ද්වේ'පි සංවට්ටවිවට්ටානි තීණි'පි සංවට්ටවිවට්ටානි චත්තාරි'පි සංවට්ටවිවට්ටානි පඤ්ච'පි සංවට්ටවිවට්ටානි දස'පි සංවට්ටවිවට්ටානි අමුත්‍රාසිං එවන්නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උප්පාදිං තත්‍රාපාසිං එවමන්නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපප-න්නෝ'ති." ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති.

පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ඉන්නවා. ඔහු කෙලෙස් තවනමින් වීරිය කරනවා. අධික වීරිය කරනවා. යළි යළිත් වීරිය කරනවා. අප්‍රමාදීව භාවනා වඩනවා. හොඳට සිත හසුරුවනවා. යම් අයුරකින් සිත සමාහිත වෙලා අනේකවිධ වූ අතීතයේ ගතකළ ජීවිත සිහි කරනවා නම් එවැනි චිත්ත සමාධියක් ඇති කර ගන්නවා. ඒ කියන්නේ, එක සංවට්ට (පෘථිවිය විනාශ වෙන්ට ගත වන කාලය) විවට්ට (නැවත හැදෙන්නට ගත වන කාලය වශයෙන්) කල්පයක් ද, සංවට්ට විවට්ට කල්ප දෙකක් ද, සංවට්ටවිවට්ට කල්ප තුනක් ද, සංවට්ටවිවට්ට කල්ප හතරක් ද, සංවට්ටවිවට්ට කල්ප පහක් ද, සංවට්ටවිවට්ට කල්ප දහයක් ද වශයෙන් අතීතය සිහි කරනවා. "මං අසවල් තැන හිටියා. එතකොට මගේ නම මේක යි, ගෝත්‍ර නාමය මේක යි, රූප සෝභාව මෙහෙම යි, කෑවේ බිව්වේ මෙහෙම යි, සැපදුක් වින්දේ මෙහෙම යි, මෙහෙම යි ජීවිතය අවසන් වුණේ, ඊට පස්සේ

ම‍ං එතැනින් චුතවෙලා අසවල් තැනයි උපන්නේ, එහෙදී මට ලැබුණෙ මේ නම, මේක තමයි ගෝත්‍ර නාමය, රූප සෝභාව මෙහෙම යි, කෑවෙ බිව්වෙ මෙහෙම යි, සැපදුක් වින්දේ මෙහෙම යි, මෙහෙම යි ජීවිතය අවසන් වුණේ, ඊට පස්සේ ම‍ං එතැනින් චුතවෙලා මෙහි උපන්නා" කියල. මේ විදිහට කරුණු සහිතව පැහැදිළි කිරීම් සහිතව නොයෙක් අයුරින් කලින් ගතකළ ජීවිත ගැන සිහි කරනවා.

සෝ එවමාහ: සස්සතෝ අත්තා ච ලෝකෝ ච වඤ්ඣෝ කූටට්ඨෝ එසිකට්ඨායිට්ඨිතෝ. තේව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති, අත්ථිත්වේව සස්සතිසමං. තං කිස්ස හේතු? අහං හි ආතප්ප-මන්වාය ..... තථාරූපං චේතෝසමාධිං ඵුසාමි යථා සමාහිතේ චිත්තේ අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරාමි. සෙය්‍යථීදං: එකම්'පි ..... දස'පි සංවට්ටවිවට්ටානි අමුත්‍රාසිං එවන්නාමෝ ..... ඉධූපපන්නෝ'ති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරාමි. ඉමිනා'පාහං ඒතං ජානාමි යථා සස්සතෝ අත්තා ච ලෝකෝ ච වඤ්ඣෝ කූටට්ඨෝ එසිකට්ඨායිට්ඨිතෝ. තේව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති අත්ථිත්වේව සස්සතිසමන්ති."

එතකොට ඔහු මෙහෙම කියනවා. "ආත්මයත් ලෝකයත් සදාකාලික යි. වඳබැහැල තියෙන්නේ. ගිරිකුළක් වගේ තියෙන්නේ. නගර මැද නො සෙල්වෙන පරිදි සිටුවා තිබෙන ඒෂිකා ස්ථම්භයක් වගේ. ඒ සත්වයන් ම යි, එක එක තැන උපදින්නේ. භවයෙන් භවයට සැරිසරා යන්නේ. චුතවෙන්නේ උපදින්නේ. සදාකාලික වස්තු වගේ තමයි පවතින්නේ" කියල. ඒකට හේතුව කුමක් ද? ම‍ං කෙලෙසේ තවන වීර්යයෙන් යුතුව ..... යම් සමාහිත සිතකින් නොයෙක් අයුරින් පෙර විසූ ජීවිත ගැන සිහි කරනවා නම් ම‍ං එබඳු සමාධියක් ඇතිකර ගත්තා. ඒ කියන්නේ එක සංවට්ටවිවට්ට කල්පයක් ද, ... සංවට්ටවිවට්ට කල්ප දහයක් ද, වශයෙන් අතීතය සිහි කරනවා. "ම‍ං අසවල් තැන හිටියා. ..... ඊට පස්සේ ම‍ං එතනින් චුතවෙලා මෙහි උපන්නා" කියල. මේ විදිහට කරුණු සහිතව පැහැදිළි කිරීම් සහිතව නොයෙක් අයුරින් කලින් ගතකළ ජීවිත ගැන ම‍ං සිහි කරනවා. මේ තුළින් තමයි ආත්මයත් ලෝකයත් සදාකාලික බව, වඳබැහැල තියෙන බව, ගිරිකුළක් වගේ තියෙන බව, නගර මැද නො සෙල්වෙන පරිදි සිටුවා තිබෙන ඒෂිකා ස්ථම්භයක් වගේ තියෙන බව, ඒ සත්වයන් ම එක එක තැන උපදින බව, භවයෙන් භවයට සැරිසරා යන බව, චුතවෙන උපදින බව, සදාකාලික වස්තු වගේ පවතින බව කියන මේ කාරණය (ශාස්වතයි කියල) ම‍ං දන්නේ.

ඉදං භික්ඛවේ දුතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, යමකට පැමිණිලා, යමක් අරභයා ශාස්වතවාදී වූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ශාස්වතයි කියලා උගන්වනවා නම්, මේක තමයි දෙවෙනි කාරණය

39. තතියේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති?

39. ශාස්වතවාදී වූ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ශාස්වතයි කියලා තුන්වෙනි කරුණකින් උගන්වන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද?

ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයෝගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාර-මන්වාය තථාරූපං චේතෝ සමාධිං ඵුසති යථා සමාහිතේ චිත්තේ අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති, සෙය්‍යථීදං: "දස'පි සංවට්ට-විවට්ටානි වීසතිම්'පි සංවට්ටවිවට්ටානි තිංසම්'පි සංවට්ටවිවට්ටානි චත්තාරීසම්'පි සංවට්ටවිවට්ටානි "අමුත්‍රාසිං ඒවං නාමෝ ඒවං ගොත්තෝ ඒවං වණ්ණෝ ඒවමාහාරෝ ඒවං සුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං තත්‍රාපාසිං ඒවමන්නාමෝ ඒවංගොත්තෝ ඒවංවණ්ණෝ ඒවමාහාරෝ ඒවංසුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝති." ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති.

පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ඉන්නවා. ඔහු කෙලෙස් තවනමින් වීරිය කරනවා. අධික වීරිය කරනවා. යළි යළිත් වීරිය කරනවා. අප්‍රමාදීව භාවනා වඩනවා. හොඳට සිත හසුරුවනවා. යම් අයුරකින් සිත සමාහිත වෙලා අනේකවිධ වූ අතීතයේ ගතකළ ජීවිත සිහි කරනවා නම් එවැනි චිත්ත සමාධියක් ඇති කර ගන්නවා. ඒ කියන්නේ, සංවට්ටවිවට්ට කල්ප දහයක් ද, සංවට්ටවිවට්ට කල්ප විස්සක් ද, සංවට්ටවිවට්ට කල්ප තිහක් ද, සංවට්ටවිවට්ට කල්ප හතළිහක් ද වශයෙන් අතීතය සිහි කරනවා. "මං අසවල් තැන හිටියා. එතකොට මගේ නම මේකයි, ගෝත්‍ර නාමය මේකයි, රූප සෝභාව මෙහෙම යි, කෑවේ බිව්වේ මෙහෙම යි,

සැපදුක් වින්දේ මෙහෙම යි, මෙහෙම යි ජීවිතය අවසන් වුණේ, ඊට පස්සේ මං එතැනින් චුතවෙලා අසවල් තැනයි උපන්නේ, එහෙදී මට ලැබුණේ මේ නම, මේක තමයි ගෝත්‍ර නාමය, රූප සෝභාව මෙහෙම යි, කෑවේ බිව්වේ මෙහෙම යි, සැපදුක් වින්දේ මෙහෙම යි, මෙහෙම යි ජීවිතය අවසන් වුණේ, ඊට පස්සේ මං එතැනින් චුතවෙලා මෙහි උපන්නා" කියල. මේ විදිහට කරුණු සහිතව පැහැදිළි කිරීම් සහිතව නොයෙක් අයුරින් කලින් ගතකළ ජීවිත ගැන සිහි කරනවා.

සෝ එවමාහ: සස්සතෝ අත්තා ච ලෝකෝ ච වඤ්ඣෝ කූටට්ඨෝ එසිකට්ඨායිට්ඨිතෝ. තේව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති, අත්ථිත්වේව සස්සතිසමං. තං කිස්ස හේතු? අහං හි ආතප්ප-මන්වාය ..... තථාරූපං චේතෝසමාධිං ඵුසාමි යථා සමාහිතේ චිත්තේ අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරාමි. සෙය්‍යථීදං: දස'පි සංවට්ට-විවට්ටානි ..... චත්තාරීසම්'පි සංවට්ටවිවට්ටානි අමුත්‍රාසිං එවන්නාමෝ ..... ඉධූපපන්නෝති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරාමි. ඉමිනා මහං ඒතං ජානාමි: යථා සස්සතෝ අත්තා ච ලෝකෝ ච වඤ්ඣෝ කූටට්ඨෝ එසිකට්ඨායිට්ඨිතෝ. තේව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති අත්ථිත්වේව සස්සතිසමන්ති."

එතකොට ඔහු මෙහෙම කියනවා. "ආත්මයත් ලෝකයත් සදාකාලික යි. වඳබැහැල තියෙන්නේ. ගිරිකුළක් වගේ තියෙන්නේ. නගර මැද නො සෙල්වෙන පරිදි සිටුවා තිබෙන ඒෂිකා ස්ථම්භයක් වගේ. ඒ සත්වයන් ම යි, එක එක තැන උපදින්නේ. භවයෙන් භවයට සැරිසරා යන්නේ. චුතවෙන්නේ උපදින්නේ. සදාකාලික වස්තු වගේ තමයි පවතින්නේ" කියල. ඒකට හේතුව කුමක් ද? මං කෙලෙසේ තවන වීර්යයයෙන් යුතුව ..... යම් සමාහිත සිතකින් නොයෙක් අයුරින් පෙර විසූ ජීවිත ගැන සිහි කරනවා නම් මං එබඳු සමාධියක් ඇති කරගත්තා. ඒ කියන්නේ සංවට්ටවිවට්ට කල්පදහයක් ද, ... සංවට්ටවිවට්ට කල්ප හතළිහක් ද වශයෙන් අතීතය සිහි කරනවා. "මං අසවල් තැන හිටියා ..... ඊට පස්සේ මං එතැනින් චුතවෙලා මෙහි උපන්නා" කියල. මේ විදිහට කරුණු සහිතව පැහැදිළි කිරීම් සහිතව නොයෙක් අයුරින් කලින් ගතකළ ජීවිත ගැන මං සිහි කරනවා. මේ තුළින් තමයි ආත්මයත් ලෝකයත් සදාකාලික බව, වඳබැහැල තියෙන බව, ගිරිකුළක් වගේ තියෙන බව, නගර මැද නො සෙල්වෙන පරිදි සිටුවා තිබෙන

ඒෂිකා ස්ථම්භයක් වගේ තියෙන බව, ඒ සත්වයන් ම එක එක තැන උපදින බව, භවයෙන් භවයට සැරිසරා යන බව, චුතවෙන උපදින බව, සදාකාලික වස්තු වගේ පවතින බව කියන මේ කාරණය (ශාස්වතයි කියල) මං දන්නේ.

ඉදං භික්ඛවේ තතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, යමකට පැමිණිලා, යමක් අරභයා ශාස්වතවාදී වූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ශාස්වතයි කියලා උගන්වනවා නම්, මේක තමයි තුන් වෙනි කාරණය.

40. චතුත්ථේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති?

40. ශාස්වතවාදී වූ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ශාස්වතයි කියලා හතර වෙනි කරුණකින් උගන්වන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද?

ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා තක්කී හෝති වීමංසී. සෝ තක්කපරියාහතං වීමංසානුචරිතං සයම්පටිභානං ඒවමාහ: "සස්සතෝ අත්තා ච ලෝකෝ ච වඤ්ඣෝ කූටට්ඨෝ ඒසිකට්ඨායිට්ඨිතෝ. තේව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උපපජ්ජන්ති අත්ථිත්වේව සස්සතිසමන්ති.

පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් තර්ක කරනවා. එක එක විදිහට විමසනවා. තර්ක කරමින් කරුණු රැස්කොට විමස විමසා තමන්ට වැටහෙන පරිදි කරුණු රැස්කොට මෙහෙම කියනවා. "ආත්මයත් ලෝකයත් සදාකාලික යි. වඳබැහැල තියෙන්නේ. ගිරිකුළක් වගේ තියෙන්නේ. නගර මැද නො සෙල්වෙන පරිදි සිටුවා තිබෙන ඒෂිකා ස්ථම්භයක් වගේ. ඒ සත්වයන් ම යි, එක එක තැන උපදින්නේ, භවයෙන් භවයට සැරිසරා යන්නේ, චුතවෙන්නේ උපදින්නේ, සදාකාලික වස්තු වගෙයි තමයි පවතින්නේ"

ඉදං භික්ඛවේ චතුත්ථං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, යමකට පැමිණිලා, යමක් අරභයා ශාස්වතවාදී වූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ශාස්වතයි කියලා උගන්වනවා නම්, මේක තමයි හතර වෙනි කාරණය.

41. ඉමේහි ඛෝ තේ භික්ඛවේ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි. යේ හි කේචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති, සබ්බේ තේ ඉමේහේව චතූහි වත්ථූහි ඒතේසං වා අඤ්ඤතරේන නත්ථි ඉතෝ බහිද්ධා.

41. පින්වත් මහණෙනි, මේ කරුණු හතරෙන් තමයි ශාස්වතවාදී (සදාකාලික දේ ගැන මතවාද කියන) වූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත්, ලෝකය ගැනත් ශාස්වතයි කියලා උගන්වන්නේ. පින්වත් මහණෙනි, ඒ ශාස්වතවාදී වූ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත් ලෝකය ගැනත් ශාස්වතයි කියලා උගන්වන්නේ යම් කරුණකින් නම්, ඒ සියළු දෙනා ම මේ කරුණු හතරෙන් හෝ මේවායෙන් එක් කරුණක් හෝ ගෙන තමයි උගන්වන්නේ. මෙයින් බාහිර කරුණක් නැත.

42. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති: "ඉමේ ඛෝ දිට්ඨිට්ඨානා ඒවං ගහිතා ඒවං පරාමට්ඨා ඒවං ගතිකා භවිස්සන්ති ඒවං අභිසම්පරායා"ති. තඤ්ච තථාගතෝ පජානාති තතෝ ච උත්තරිතරං පජානාති. තං ච පජානනං න පරාමසති. අපරාමසතෝ චස්ස ප-චත්තඤ්ඤේව නිබ්බුති විදිතා. වේදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තෝ භික්ඛවේ තථාගතෝ.

42. පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ මේ කාරණය අවබෝධයෙන් ම දන්නවා. ඒ කියන්නේ "මේ දෘෂ්ටීන් මේ විදහට ග්‍රහණය කරගත්තොත්, මේ විදිහට බැඳිල ගියොත් මේ මේ ආකාරයේ උපත් ලබාගෙන මරණින් මතු මේ මේ විදිහට පරලොව යාවී" කියලා තථාගතයන් වහන්සේ මෙයත් දන්නවා. මෙයට වඩා උත්තරීතර දේවත් දන්නවා. ඒවා දැනගත්තා කියල අමුතුවෙන් ඒවාට බැඳෙන්නේ නෑ. ඒ දෘෂ්ටිවලට හසු නොවෙන නිසා ම තමා තුළ ම නිවීගිය බව තමයි අවබෝධ වෙලා තියෙන්නේ. ඒ වගේ ම පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ (ඔය දෘෂ්ටි හතරට බැඳීමට හේතු වූ ඒ ඒ තැන්වල සැපදුක් විඳි බවට ඇති) වේදනාවන් ගේ හටගැනීමත් නැතිවීයාමත් ආශ්වාදයත් ආදීනවයත් නිස්සරණයත් ඒ වූ ආකාරයෙන් ම අවබෝධ කරගෙන උපාදාන රහිතව කෙලෙසුන්ගෙන් නිදහස් වෙලයි ඉන්නේ.

43. ඉමේ ඛෝ තේ භික්ඛවේ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබෝධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවේදනීයා යේ තථාගතෝ සයං අභිඤ්ඤා ස-ඡීකත්වා පවේදේති යේහි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

43. පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ ස්වකීය විශිෂ්ට ප්‍රඥාවෙන් සාක්ෂාත් කරපු යම් දේවල් ඇද්ද, ඒ දේවල්වලින් තථාගතයන් වහන්සේ ගේ යථාර්ථ වශයෙන් තිබෙන ගුණය වර්ණනා කරනවා නම්, වර්ණනා කළ යුතු දේ වන ගාම්භීර වූත්, දැකීමට දුෂ්කර වූත්, අවබෝධයට දුෂ්කර වූත්, ශාන්ත වූත්, ප්‍රණීත වූත්, තර්ක ගෝචරයෙන් තොර වූත්, සියුම් වූත්, නුවණැත්තන්ට විෂය වූත් ඒ දේවල් යනු මේව තමයි.

පඨමකභාණවාරං
පළමු වෙනි බණවර යි

44. සන්ති භික්ඛවේ ඒකේ සමණබ්‍රාහ්මණා ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි. තේ ච හොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි?

44. පින්වත් මහණෙනි, ඇතැම් දේවල් සදාකාලිකය යන ශාස්වතවාදී මතයත්, ඇතැම් දේවල් සදාකාලික නැත යන අශාස්වතවාදී මතයත් වශයෙන් මත දෙකක් දරණ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් තමා ගැනත් ලෝකය ගැනත් ශාස්වතයි කියලත්, අශාස්වතයි කියලත් කරුණු හතරකින් උගන්වනවා. ඒ ශාස්වතවාදී හා අශාස්වතවාදී මත දෙක දරණ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත් ලෝකය ගැනත් ශාස්වතයි කියලත්, අශාස්වතයි කියලත් කරුණු හතරකින් උගන්වන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද?

45. හෝති ඛෝ සෝ භික්ඛවේ සමයෝ යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනෝ අ-චයේන අයං ලෝකෝ සංවට්ටති. සංවට්ටමානේ ලෝකේ යේභුය්‍යෙන සත්තා ආභස්සරසංවත්තනිකා හොන්ති. තේ තත්ථ හොන්ති මනෝමයා පීතිභක්ඛා සයම්පභා අන්තලික්ඛචරා සුභට්ඨායිනෝ චිරං දීඝමද්ධානං තිට්ඨන්ති.

45. පින්වත් මහණෙනි, ඉතාමත් ම දීර්ඝ කාලයක් ගෙවී ගියාට පසු යම් කලෙක මේ ලෝකය විනාශ වෙනවා නම් එබඳු කාලයක් එනවා. ලෝකය විනාශ වෙද්දී බොහෝ සෙයින් ම සත්වයන් ආභස්සර ලෝකයේ උපදිනවා. ඔවුන් එහි මනෝමය ශරීර ඇතිව, ප්‍රීතිය අනුභව කරමින්, තමා ගේ ශරීරයේ ආලෝකය විහිදුවමින්, අහසේ හැසිරෙමින්, සොඳුරු ලෙස සිටිමින් දීර්ඝ කාලයක් ගතකරනවා.

හෝති ඛෝ සෝ භික්ඛවේ සමයෝ යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනෝ අ-චයේන අයං ලෝකෝ විවට්ටති. විවට්ටමානෝ ලෝකේ සුඤ්ඤං බ්‍රාහ්මවිමානං පාතුභවති. අථඤ්ඤතරෝ සත්තෝ ආයුක්ඛයා වා පුඤ්ඤක්ඛයා වා ආභස්සරකායා චවිත්වා සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජති. සෝ තත්ථ හෝති මනෝමයෝ පීතිභක්ඛෝ සයම්පභෝ අන්තලික්ඛචරෝ සුභට්ඨායී චිරං දීඝමද්ධානං තිට්ඨති. තස්ස තත්ථ ඒකකස්ස දීඝරත්තං නිබ්බුසිතත්තා අනභිරති පරිතස්සනා උප්පජ්ජති: "අහෝ වත අඤ්ඤේපි සත්තා ඉත්ථත්තං ආග-ඡෙය්යුන්ති" අථ අඤ්ඤතරේපි සත්තා ආයුක්ඛයා වා පුඤ්ඤක්ඛයා වා ආභස්සරකායා චවිත්වා බ්‍රහ්මවිමානං උපපජ්ජන්ති තස්ස සත්තස්ස සහව්‍යතං. තේපි තත්ථ හොන්ති මනෝමයා පීතිභක්ඛා සයම්පභා අන්තලික්ඛචරා සුභට්ඨායිනෝ චිරං දීඝමද්ධානං තිට්ඨන්ති.

පින්වත් මහණෙනි, ඉතා දීර්ඝ කාලයක් ගෙවුණාට පසු මේ ලෝකය නැවත සකස් වෙනවා නම් එබඳු කාලයකුත් එනවා. ලෝකය නැවත සකස් වෙද්දි, හිස් බ්‍රහ්ම විමානයක් පහළවෙනවා. එතකොට කවුරුන් හෝ කෙනෙක් ආයුෂ ක්ෂය වීමෙන් හරි, පින ක්ෂය වීමෙන් හරි අර ආභස්සර ලෝකයෙන් චුත වෙලා හිස් බ්‍රහ්ම විමානයේ උපදිනවා. ඔහු එහි ඉන්නෙත් මනෝමය ශරීර ඇතිවයි. ප්‍රීතිය අනුභව කරමින්, ස්වකීය ශරීරාලෝකය විහිදුවමින් අහසේ හැසිරෙමින් සොඳුරු පැවැත්මකින් යුතුව යි. ඒ විදිහට ඉතා දීර්ඝ කාලයක් ඉන්නවා. ඉතින් දීර්ඝ කාලයක් ගතකරන ඔහුට පාළු ගතියක් ඇතිවෙනවා. නො ඇල්මක් ඇතිවෙනවා. කැළඹීමක් ඇතිවෙනවා. "අහෝ..! ඇත්තෙන් ම තවත් කවුරුහරි සත්වයෙක් මේ වගේ ජීවිතයකට පැමිණෙනවා නම් කොයි තරම් දෙයක් ද" කියල හිතනවා. එතකොට ආයුෂ අවසන් වුණ, පින අවසන් වුණ අනෙකුත් සත්වයන් ද අර ආභස්සර ලෝකයෙන් චුතවෙලා බ්‍රහ්ම විමානයේ ඒ සත්වයා ගේ ස්වභාවයෙන් ම උපදිනවා. ඒ උදවියත් එහි මනෝමය සිරුරු ඇතිවයි ඉන්නේ. ප්‍රීතිය අනුභව කරමින් ස්වකීය ශරීරාලෝක විහිදුවමින් අහසේ හැසිරෙමින් සොඳුරු පැවතුම් ඇතිව බොහෝ කාලයක් ගතකරනවා.

තත්‍ර භික්ඛවේ යෝ සෝ සත්තෝ පඨමං උපපන්නෝ තස්ස ඒවං හෝති: "අහමස්මි බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතෝ අඤ්ඤදත්ථුදසෝ වසවත්තී ඉස්සරෝ කත්තා නිම්මාතා සෙට්ඨෝ සජිතා වසී පිතා භූතභව්‍යානං. මයා ඉමේ සත්තා නිම්මිතා. තං කිස්ස හේතු? මමං හි පුබ්බේ ඒතදහෝසි: අහෝ වත අඤ්ඤේපි සත්තා ඉත්ථත්තං ආග-ඡෙය්‍යුන්ති. ඉති මමඤ්ච මනෝපණිධි. ඉමේ ච සත්තා ඉත්ථත්තං ආගතාති. යේ'පි තේ සත්තා ප-ඡා උප්පන්නා තේසම්පි ඒවං හෝති. අයං ඛෝ භවං බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතෝ අඤ්ඤදත්ථුදසෝ වසවත්තී ඉස්සරෝ කත්තා නිම්මාතා සෙට්ඨෝ සජිතා වසී පිතා භූතභව්‍යානං. ඉමිනා මයං භෝතා බ්‍රහ්මුණා නිම්මිතා. තං කිස්ස හේතු? ඉමං හි මයං අද්දසාම ඉධ පඨමං උපපන්නං. මයං පනම්හා ප-ඡා උපපන්නාති.

පින්වත් මහණෙනි, එතකොට යම් සත්වයෙක් මුලින්ම ඉපදුනා නම්, ඔහුට මෙවැනි අදහසක් ඇතිවෙනවා. "මං තමයි බ්‍රහ්මයා, මං මහා බ්‍රහ්මයා, මං සියල්ල මැඩලන කෙනා. මාව කාටවත් මැඩලන්න බෑ. මං හැමදේ ම දකිනවා. මං හැමදේ ම වසඟයට අරගෙනයි ඉන්නේ. මං තමයි දෙවියන් වහන්සේ. මං තමයි කර්තෘ, මං තමයි ලෝකය නිර්මාණය කළේ. මං තමයි ශ්‍රේෂ්ඨ, ලෝකය සකස් කළේ මං. ලොව වසඟ කලේ මම යි. උපන් සත්වයන් ගේත් ඉපදෙන්ට ඉන්න සත්වයන් ගේත් පියාණන් මම ය" කියල. ඒකට හේතුව කුමක් ද? කලින්ම මේ විදිහට මටයි හිතුනේ. "අහෝ..! ඇත්තෙන් ම තවත් කවුරු හරි සත්වයෙක් මේ වගේ ජීවිතයකට පැමිණෙනවා නම් කොයි තරම් දෙයක් ද" කියල. මේක තමයි මගේ මනෝ ප්‍රණිධිය (මගේ ප්‍රාර්ථනාව) වුණේ. එතකොටයි මේ සත්වයන් මේ ජීවිතයට පැමුණුනේ කියලා. ඒ වගේ ම යම් සත්වයෙක් පසුව උපන්නා නම්, ඔවුන්ට ඇතිවුණේ මේ විදිහේ අදහසක්. "මේ තමයි භවත් බ්‍රහ්මයා. මහා බ්‍රහ්මයා. ලොව මැඩලන කෙනා. වෙන කෙනෙකුන්ට නො මැඩිය හැකි කෙනා. සියල්ල දක්නා කෙනා. ලොව වසඟයෙහි පවත්වන කෙනා. දෙවියන් වහන්සේ. මෙයා තමයි කර්තෘ. නිර්මාතෘ. මෙයා තමයි ශ්‍රේෂ්ඨ කෙනා. ලොව සකස් කරන කෙනා. පුරුදු කළ වශී ඇති කෙනා. ඉපදුනු උපදින සත්වයන් ගේ පියාණන් වහන්සේ. මේ භවත් බ්‍රහ්මයා විසිනු යි අපිව මැව්වේ. ඒකට හේතුව මොකක් ද? මේ ලෝකයෙහි මුලින්ම ඉපදිලා සිටිය මොහුව තමයි අපි දැක්කේ. අපි වනාහි පසුව ඉපදිච්ච අය නෙව" කියල.

46. තත්‍ර භික්ඛවේ යෝ සෝ සත්තෝ පඨමං උපපන්නෝ, සෝ දීඝායුකතරෝ ච හෝති වණ්ණවන්තතරෝ ච මහේසක්ඛතරෝ ච. යේ පන

තේ සත්තා ප-ඡා උපපන්නා, තේ අප්පායුකතරා ච හොන්ති දුබ්බණ්ණතරා ච අප්පේසක්ඛතරා ච. ඨානං ඛෝ පනේතං භික්ඛවේ විජ්ජති යං අඤ්ඤතරෝ සත්තෝ තම්හා කායා චවිත්වා ඉත්ථත්තං ආග-ඡති.

46. පින්වත් මහණෙනි, ඉතින් එහි යම් ඒ සත්වයෙක් මුලින් ම ඉපදුනා නම්, ඔහු ඉතාමත් දිගු ආයුෂයකින් යුතු වුණා. ඉතා සුන්දර වුණා. ඉතාමත් මහේශාක්‍ය වුණා. නමුත් යම් ඒ සත්වයන් පසුව උපන්නා ද, ඔවුන්ට ආයුෂ තිබුනේ අල්පයයි. එතරම් ලස්සන වුණේ නෑ. අල්පේශාක්‍ය වෙලයි හිටියේ. පින්වත් මහණෙනි, යම් සත්වයෙක් ඒ ලෝකයෙන් චුතවෙලා මේ මිනිස් ලොවට පැමිණෙනවා ය යන මෙකරුණ විද්‍යමාන (දකින්ට ලැබෙන) දෙයක්.

ඉත්ථත්තං ආගතෝ සමානෝ අගාරස්මා අනගාරියං පබ්බජති. අගාරස්මා අනගාරියං පබ්බජිතෝ සමානෝ ආතප්පමන්වාය පධාන-මන්වාය අනුයෝගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං ෙ-තෝසමාධිං ඵුසති යථා සමාහිතේ චිත්තේ තං පුබ්බේනිවාසං අනුස්සරති, තතෝ පරං නානුස්සරති. සෝ ඒවමාහ:

ඉතින්, මිනිස් ලොවට ආපු ඒ කෙනා ගිහිගෙය අත්හැරලා අනගාරික වූ පැවිදි බව ලබනවා. ගිහිගෙයින් නික්මී අනගාරිකව පැවිදි වූ ඔහු කෙලෙස් තවන වීර්යයෙන් යුතුව, මහත් වීර්යයකින් යුතුව, යළි යළිත් වීරිය කොට, අප්‍රමාදීව ඉතා හොඳින් මනසිකාර කරල යම් අයුරකින් සිත සමාධිමත් වුණ විට ඒ කලින් ගතකල ජීවිතය සිහි කළ හැකි වෙයි ද, එබඳු වූ චිත්ත සමාධියක් ඇතිකර ගන්නවා. එයින් එහාට සිහි කරන්ට පුළුවන් වෙන්නේ නෑ. එතකොට ඔහු මෙහෙම කියනවා.

“යෝ ඛෝ සෝ භවං බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතෝ අඤ්ඤදත්ථුදසෝ වසවත්තී ඉස්සරෝ කත්තා නිම්මාතා සෙට්ඨෝ සජිතා වසී පිතා භූතභව්‍යානං, යේන මයං භෝතා බ්‍රහ්මුණා නිම්මිතා, සෝ නි-චෝ ධුවෝ සස්සතෝ අවිපරිණාමධම්මෝ සස්සතිසමං තථේව ඨස්සති. යේ පන මයං අහුම්හා තේන භෝතා බ්‍රහ්මුණා නිම්මිතා, තේ මයං අනි-චා අද්ධුවා අප්පායුකා චවනධම්මා ඉත්ථත්තං ආගතා”ති.

“යම් ඒ භවත් බ්‍රහ්මයෙක් ඇත් ද, එයා තමයි මහා බ්‍රහ්මයා. ලොව මැඩලන කෙනා. වෙන කෙනෙකුන්ට නො මැඩිය හැකි කෙනා. සියල්ල දක්නා කෙනා. ලොව වසඟයෙහි පවත්වන කෙනා. දෙවියන් වහනසේ. මෙයා තමයි

කර්තෘ. නිර්මාතෘ. මෙයා තමයි ශ්‍රේෂ්ඨ කෙනා. ලොව සකස් කරන කෙනා. පුරුදු කළ වශී ඇති කෙනා. ඉපදුනු උපදින සත්වයන් ගේ පියාණන් වහන්සේ. එයා විසින් තමයි අපිව මැව්වේ. එයා නිත්‍ය යි. ස්ථිර යි. සදාකාලික යි. වෙනස් නොවන ස්වභාවයෙන් යුක්තයි. සදාකාලිකව පවතින යමක් ඇත්ද ඒ විදිහට ම පවතිනවා. ඒ භවත් දෙවියන් වහන්සේ විසින් මවන ලද්දා වූ යම් වූ අපි වෙමු ද ඒ අපි අනිත්‍ය යි. අස්ථිර යි. අල්පායුෂයෙන් යුක්ත යි. චුතවෙන ස්වභාවයෙන් යුක්ත යි. ඒ නිසයි මෙලොවට ආවේ" කියල.

ඉදං භික්ඛවේ පඨමං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, යම් කරුණකට පැමිණිලා යම් කරුණක් අරභයා ඒ ශාස්වතවාදී (මැවුම්කරු සදාකාලික යි) හා අශාස්වතවාදී (මවන ලද උදවිය අනිත්‍ය යි) යන මත දෙක දරන භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත් ලෝකය ගැනත් ශාස්වතයි කියලත්, අශාස්වතයි කියලත් උගන්වනවා නම් මේක තමයි ඒ පළමු වෙනි කරුණ.

47. දුතියේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්ඛ ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති?

47. ඇතැම් දේ සදාකාලිකයි යන මතය කියන ශාස්වතවාදී හා ඇතැම් දේ සදාකාලික නැත යන මතය කියන අශාස්වතවාදී මත දෙක දරණ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත් ලෝකය ගැනත් ශාස්වතයි කියලත්, අශාස්වතයි කියලත් දෙවෙනි කරුණෙන් උගන්වන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද?

සන්ති භික්ඛවේ ඛිඩ්ඩාපදෝසිකා නාම දේවා. තේ අතිවේලං හස්ස-ඛිඩ්ඩාරතිධම්මසමාපන්නා විහරන්ති. තේසං අතිවේලං හස්සඛිඩ්ඩා-රතිධම්මසමාපන්නානං විහරතං සති මුස්සති. සතියා සම්මෝසා තේ දේවා තම්හා කායා චවන්ති.

පින්වත් මහණෙනි, (සෙල්ලමින් කල්ගෙවා ආහාර ගන්ට බැරිවීමෙන් චුතවෙන) ඛිඩ්ඩාපදෝසික නම් වූ දේව කොට්ඨාශයක් ඉන්නවා. ඔවුන් වෙලාව

ඉක්මවා යනතුරු ක්‍රීඩා කරමින් විනෝද වෙමින්, එහි ම ඇලෙමින්, ඒ තුළම වාසය කරනවා. එතකොට වේලාව ඉක්මවා යන තුරු ක්‍රීඩා කරමින්, විනෝද වෙමින්, එහි ම ඇලෙමින් ඒ තුළම වාසය කරන ඔවුන්ට ආහාර ගන්ට අමතක වෙනවා. සිහි මුලාවීම නිසා ඒ දෙවිවරු ඒ දෙවිලොවෙන් චුතවෙනවා.

ඨානං ඛෝ පනේතං භික්ඛවේ විජ්ජති යං අඤ්ඤතරෝ සත්තෝ තම්හා කායා චවිත්වා ඉත්ථත්තං ආග-ඡති. ඉත්ථත්තං ආගතෝ සමානෝ අගාරස්මා අනගාරියං පබ්බජති. අගාරස්මා අනගාරියං පබ්බජිතෝ සමානෝ ආතප්පමන්වාය පධානමන්වාය අනුයෝගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං චේතෝසමාධිං ඵුසති යථාසමාහිතේ චිත්තේ තං පුබ්බේනිවාසං අනුස්සරති, තතෝ පරං නානුස්සරති.

පින්වත් මහණෙනි, යම් සත්වයෙක් ඒ ලෝකයෙන් චුතවෙලා මේ මිනිස් ලොවට පැමිණෙනවා ය යන මෙකරුණ විද්‍යමාන (දකින්ට ලැබෙන) දෙයක්. ඉතින්, මිනිස් ලොවට ආපු ඒ කෙනා ගිහිගෙය අත්හැරලා අනගාරික වූ පැවිදිබව ලබනවා. ගිහිගෙයින් නික්මී අනගාරිකව පැවිදි වූ ඔහු කෙලෙස් තවන වීර්යයෙන් යුතුව, මහත් වීර්යයකින් යුතුව, යළි යළිත් වීරිය කොට අප්‍රමාදීව ඉතා හොඳින් මනසිකාර කරල යම් අයුරකින් සිත සමාධිමත් වුණ විට ඒ කලින් ගතකළ ජීවිතය සිහි කළ හැකි වෙයි ද, එබඳු වූ චිත්ත සමාධියක් ඇතිකර ගන්නවා. එයින් එහාට සිහි කරන්ට පුළුවන් වෙන්නේ නෑ. එතකොට ඔහු මෙහෙම කියනවා.

සෝ ඒවමාහ: යේ ඛෝ තේ භොන්තෝ දේවා න ඛිඩ්ඩාපදෝසිකා, තේ න අතිවේලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නා විහරන්ති. තේසං න අතිවේලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නානං විහරතං සති න මුස්සති. සතියා අසම්මෝසා තේ දේවා තම්හා කායා න චවන්ති, නි-චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා සස්සතිසමං තථේව ඨස්සන්ති. යේ පන මයං අහුම්හ ඛිඩ්ඩාපදෝසිකා, තේ මයං අතිවේලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නානං විහරිම්හ. තේසං නෝ අතිවේලං හස්සඛිඩ්ඩාරතිධම්මසමාපන්නානං විහරතං සති මුස්සි. සතියා සම්මෝසා ඒවං මයං තම්හා කායා චුතා අනි-චා අද්ධුවා අප්පායුකා චවනධම්මා ඉත්ථත්තං ආගතා'ති.

එතකොට ඔහු මෙහෙම කියනවා. යම් ඒ භවත් දෙවිවරු ඉන්නවා. ඔවුන් ඛිඩ්ඩාපදෝසික දෙවිවරුන් නොවේ. ඔවුන් වෙලාව ඉක්මවා යනතුරු ක්‍රීඩා කරමින් විනෝද වෙමින් එහි ම ඇලෙමින් ඒ තුළම වාසය කරන්නෙ නෑ.

එතකොට වේලාව ඉක්මවා යනතුරු ක්‍රීඩා කරමින් විනෝද වෙමින් එහි ම ඇලෙමින් ඒ තුළම වාසය නො කරන නිසා ඔවුන් ගේ ආහාර ගන්ට ඇති සිහිය මුලාවෙන්නෙ නෑ. සිහි මුලා නො වීම නිසා ඒ දෙවිවරු ඒ දෙව්ලොවෙන් චුතවෙන්නෙ නෑ. ඒ අය නිත්‍ය යි. ස්ථිර යි. සදාකාලික යි. නො වෙනස්වන ස්භාවයෙන් යුක්ත යි. සදාකාලික දේවල් පවතිනවා වගෙයි ඒ අයත් ඉන්නේ. අනේ ඒ වුණාට අපි නම් යම් බිඩ්ඩාපදෝසික දෙවිවරුන් වෙලයි හිටියේ. ඒ අපි වෙලාව ඉක්මවා යනතුරු ක්‍රීඩා කරමින් විනෝද වෙමින් එහි ම ඇලෙමින් ඒ තුළම වාසය කළා. එතකොට වේලාව ඉක්මවා යන තුරු ක්‍රීඩා කරමින් විනෝද වෙමින් එහි ම ඇලෙමින් ඒ තුළම වාසය කළ අපට ආහාර ගැනීමට ඇති සිහිය මුලා වුණා. සිහි මුලාවීම නිසයි අපි ඒ දෙව්ලොවෙන් චුත වුණේ. අපි අනිත්‍ය යි. අස්ථිර යි. අල්පායුෂ්ක යි. චුතවෙන ස්වභාවයෙන් යුක්ත යි. ඒ නිසයි අපි මෙහි ඉපදුනේ.

ඉදං භික්ඛවේ දුතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, යම් කරුණකට පැමිණිලා යම් කරුණක් අරභයා ඇතැම් දෙයක් සදාකාලිකයි කියන ශාස්වතවාදී හා ඇතැම් දෙයක් සදාකාලික නැත කියන අශාස්වතවාදී යන මත දෙක පවසන භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත් ලෝකය ගැනත් ඇතැම් දෙයක් ශාස්වතයි කියලත්, ඇතැම් දෙයක් අශාස්වතයි කියලත් උගන්වනවා නම් මේක තමයි ඒ දෙවෙනි කරුණ.

48. තතියේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්බ ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති?

ඇතැම් දේ සදාකාලිකයි යන මතය කියන ශාස්වතවාදී හා ඇතැම් දේ සදාකාලික නැත යන මතය කියන අශාස්වතවාදී මත දෙක දරණ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත් ලෝකය ගැනත් ශාස්වතයි කියලත්, අශාස්වතයි කියලත් තුන්වෙනි කරුණෙන් උගන්වන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද?

සන්ති භික්ඛවේ මනෝපදෝසිකා නාම දේවා. තේ අතිවේලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්ති. තේ අතිවේලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣා-යන්තා අඤ්ඤමඤ්ඤම්හි චිත්තානි පදූසෙන්ති. තේ අඤ්ඤමඤ්ඤම්හි පදුට්ඨචිත්තා කිලන්තකායා කිලන්තචිත්තා. තේ දේවා තම්හා කායා චවන්ති.

පින්වත් මහණෙනි, (සිත දූෂ්‍ය කරගැනීම නිසා චුතවෙන) මනෝපදෝසික නම් දේව කොට්ඨාශයක් ඉන්නවා. ඔවුන් වේලාව ඉක්මවා යනතුරු එකිනෙකා දෙස කිපුනු සිතින් බලගෙන ඉන්නවා. ඔවුන් වේලාව ඉක්මවා යනතුරු එකිනෙකා දෙස කිපුනු සිතින් බලාගෙන ඉන්න කොට එකිනෙකා ගේ සිත් දූෂ්‍ය වෙලා යනවා. එකිනෙකා ගේ සිත් දූෂ්‍ය වීමෙන් කය ක්ලාන්ත වෙනවා. සිත ක්ලාන්ත වෙනවා. එතකොට ඒ දෙවිවරුන් ඒ ලෝකයෙන් චුත වෙනවා.

ඨානං ඛෝ පනේතං භික්ඛවේ විජ්ජති යං අඤ්ඤතරෝ සත්තෝ තම්හා කායා චවිත්වා ඉත්ථත්තං ආග-ඡති. ඉත්ථත්තං ආගතෝ සමානෝ අගාරස්මා අනගාරියං පබ්බජති. අගාරස්මා අනගාරියං පබ්බජිතෝ සමානෝ ආතප්පමන්වාය පධානමන්වාය අනුයෝගමන්වාය අප්පමාද- මන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං ෙ-තෝසමාධිං ඵුසති යථාසමාහිතේ චිත්තේ තං පුබ්බේනිවාසං අනුස්සරති, තතෝ පරං නානුස්සරති.

පින්වත් මහණෙනි, යම් සත්වයෙක් ඒ ලෝකයෙන් චුතවෙලා මේ මිනිස් ලොවට පැමිණෙනවා ය යන මෙකරුණ විද්‍යමාන (දකින්ට ලැබෙන) දෙයක්. ඉතින්, මිනිස් ලොවට ආපු ඒ කෙනා ගිහිගෙය අත්හැරලා අනගාරික වූ පැවිදිබව ලබනවා. ගිහිගෙයින් නික්මී අනගාරිකව පැවිදි වූ ඔහු කෙලෙස් තවන වීර්යයෙන් යුතුව, මහත් වීර්යයකින් යුතුව, යළි යළිත් වීරිය කොට අප්‍රමාදීව ඉතා හොඳින් මනසිකාර කරල යම් අයුරකින් සිත සමාධිමත් වුණ විට ඒ කලින් ගතකල ජීවිතය සිහි කළ හැකි වෙයි ද, එබඳු වූ චිත්ත සමාධියක් ඇතිකර ගන්නවා. නමුත් එයින් එහාට සිහි කරන්ට පුළුවන් වෙන්නේ නෑ.

සෝ ඒවමාහ: යේ ඛෝ තේ හොන්තෝ දේවා න මනෝපදෝසිකා, තේ න අතිවේලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්ති. තේ න අතිවේලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්තා අඤ්ඤමඤ්ඤම්හි අප්පදුට්ඨචිත්තා අකිලන්තකායා අකිලන්තචිත්තා. තේ දේවා තම්හා කායා න චවන්ති නි-චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා සස්සතිසමං තථේව ඨස්සන්ති. යේ පන මයං අභුම්හ

මනෝපදෝසිකා. තේ මයං අතිවේලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායිම්හා. තේ මයං අතිවේලං අඤ්ඤමඤ්ඤං උපනිජ්ඣායන්තා අඤ්ඤමඤ්ඤම්හි චිත්තානි පදූසිම්හ. තේ මයං අඤ්ඤමඤ්ඤම්හා පදුට්ඨචිත්තා කිලන්තකායා කිලන්තචිත්තා. ඒවං තම්හා කායා චුතා අනි-චා අද්ධුවා අප්පායුකා චවනධම්මා ඉත්ථත්තං ආගතාති.

එතකොට ඔහු මෙහෙම කියනවා. "යම් ඒ භවත් දෙවිවරු ඉන්නවා. ඔවුන් මනෝපදෝසික දෙවිවරු නෙවෙයි. ඔවුන් එකිනෙකා වේලාව ඉක්මවා යන තුරු කිපුනු සිතින් බලාගෙන ඉන්නෙ නෑ. ඉතින් ඔවුන් එකිනෙකා වේලාව ඉක්මවා යනතුරු කිපුනු සිතින් බලාගෙන ඉන්නෙ නැති නිසා එකිනෙකා සිත් දූෂ්‍ය කරගන්නේ නෑ. ඒ නිසා කය ක්ලාන්ත වෙන්නේ නෑ. සිත ක්ලාන්ත වෙන්නෙත් නෑ. එතකොට ඒ දෙවිවරුන් ඒ ලෝකයෙන් චුත වෙන්නේ නෑ. ඒ දෙවිවරු නම් නිත්‍ය යි. ස්ථිර යි. සදාකාලික යි. නො වෙනස්වන ස්වභාවයෙන් යුක්ත යි. සදාකාලික දේවල් වගේ ම පවතිනවා. ඒ වුණාට යම් ඒ අපි මනෝපදෝසික වුණා නෙව. වේලාව ඉක්මවා යනතුරු අපි එකිනෙකා දෙස කිපුනු සිතින් බලා සිටියා. ඒ අපි වේලාව ඉක්මවා යන තුරු එකිනෙකා දෙස කිපුනු සිතින් බලා සිටිය නිසා එකිනෙකා ගේ සිත් දූෂ්‍ය වුණා. ඒ අපි එකිනෙකා ගේ සිත් දූෂ්‍ය වීමෙන් ක්ලාන්ත හැදුනු කයක් ඇතිවුණා. ක්ලාන්ත හැදුනු සිතක් ඇතිවුණා. මේ විදියටයි ඒ ලෝකයෙන් චුතවුණේ. ඒ නිසා අපි අනිත්‍ය යි. අස්ථිර යි. අල්පායුෂ්ක යි. චුතවෙන ස්වභාවයෙන් යුක්ත යි. ඒ නිසයි අපි මෙලොවට ආවේ" කියල.

ඉදං භික්ඛවේ තතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, යම් කරුණකට පැමිණිලා යම් කරුණක් අරභයා ඇතැම් දෙයක් සදාකාලිකයි කියන ශාස්වතවාදී හා ඇතැම් දෙයක් සදාකාලික නැත කියන අශාස්වතවාදී යන මත දෙක පවසන භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත් ලෝකය ගැනත් ඇතැම් දෙයක් ශාස්වතයි කියලත්, ඇතැම් දෙයක් අශාස්වතයි කියලත් උගන්වනවා නම් මේක තමයි ඒ තුන්වෙනි කරුණ.

49. චතුත්ථේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති?

ඇතැම් දේ සදාකාලිකයි යන මතය කියන ශාස්වතවාදී හා ඇතැම් දේ සදාකාලික නැත යන මතය කියන අශාස්වතවාදී මත දෙක දරණ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත් ලෝකය ගැනත් ශාස්වතයි කියලත්, අශාස්වතයි කියලත් හතරවෙනි කරුණෙන් උගන්වන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද?

ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා තක්කී හෝති වීමංසී. සෝ තක්කපරියාහතං වීමංසානුචරිතං සයම්පටිභානං ඒවමාහ: යං ඛෝ ඉදං වු-චති චක්ඛුන්ති'පි සෝතන්ති'පි ඝාණංති'පි ජිව්හාති'පි කායෝති'පි, අයං අත්තා අනි-චෝ අද්ධුවෝ අසස්සතෝ විපරිණාමධම්මෝ. යං ච ඛෝ ඉදං වු-චති චිත්තන්ති වා මනෝති වා විඤ්ඤාණන්ති වා අයං අත්තා නි-චෝ ධුවෝ සස්සතෝ අවිපරිණාමධම්මෝ සස්සතිසමං තථේව ඨස්සතීති.

පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් තර්ක කරනවා. එක එක විදිහට විමසනවා. තර්ක කරමින් කරුණු රැස්කොට විමස විමසා තමන්ට වැටහෙන පරිදි කරුණු රැස්කොට මෙහෙම කියනවා. "මේ යමක් ඇස කියල කියනවාද, කණ කියල කියනවාද, නාසය කියල කියනවාද, දිව කියල කියනවාද, කය කියල කියනවාද මේ ආත්මය නම් අනිත්‍ය යි. අස්ථිර යි. සදාකාලික නෑ. වෙනස්වන ස්වභාවයෙන් යුක්ත යි. නමුත් මේ යමක් සිත කියල කියනවා ද, මනස කියල කියනවා ද, විඤ්ඤාණය කියල කියනවාද මේ ආත්මය නිත්‍ය යි. ස්ථිරයි. සදාකාලික යි. නොවෙනස්වන ස්වභාවයෙන් යුක්තයි. සදාකාලික දෙයක් පවතින පරිද්දෙන් ම පවතිනවා" කියල.

ඉදං භික්ඛවේ චතුත්ථං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, යම් කරුණකට පැමිණිලා යම් කරුණක් අරභයා ඇතැම් දෙයක් සදාකාලික යි කියන ශාස්වතවාදී හා ඇතැම් දෙයක් සදාකාලික නැත කියන අශාස්වතවාදී යන මත දෙක පවසන භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත් ලෝකය ගැනත් ඇතැම් දෙයක් ශාස්වත යි කියලත්, ඇතැම් දෙයක් අශාස්වත යි කියලත් උගන්වනවා නම් මේක තමයි ඒ හතර වෙනි කරුණ.

ඉමේහි ඛෝ තේ භික්ඛවේ සමණබ්‍රාහ්මණා ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි. යේ හි කේචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති, සබ්බේ තේ ඉමේහේව චතූහි වත්ථූහි, ඒතේසං වා අඤ්ඤතරේන, නත්ථි ඉතෝ බහිද්ධා.

පින්වත් මහණෙනි, මේ කරුණු හතරෙන් තමයි ඇතැම් දේ සදාකාලිකයි යන මතය කියන ශාස්වතවාදී, ඇතැම් දේ සදාකාලික නෑ යන මතය කියන අශාස්වතවාදී ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත්, ලෝකය ගැනත් ඇතැම් දෙය ශාස්වත යි, ඇතැම් දෙය අශාස්වත යි කියලා උගන්වන්නේ. පින්වත් මහණෙනි, ඇතැම් දේ ගැන ශාස්වතවාදී වූ ඇතැම් දේ ගැන අශාස්වතවාදී වූ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් තමා ගැනත් ලෝකය ගැනත් ඇතැම් දේ ශාස්වත යි කියලත් ඇතැම් දේ අශාස්වත යි කියලත් උගන්වන්නේ යම් කරුණකින් නම්, ඒ සියළු දෙනා ම මේ කරුණු හතරෙන් හෝ මේවායෙන් එක් කරුණක් හෝ ගෙන තමයි උගන්වන්නේ. මෙයින් බාහිර කරුණක් නැත.

50. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති: "ඉමේ දිට්ඨිට්ඨානා ඒවං ගහිතා ඒවං පරාමට්ඨා ඒවංගතිකා භවිස්සන්ති ඒවං අභිසම්පරායා"ති. තං ච තථාගතෝ පජානාති. තතෝ ච උත්තරිතරං පජානාති. තං ච පජානනං න පරාමසති. අපරාමසතෝ චස්ස ප-චත්තංයේව නිබ්බුති විදිතා. වේදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තෝ භික්ඛවේ තථාගතෝ.

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ මේ කාරණය අවබෝධයෙන් ම දන්නවා. ඒ කියන්නේ "මේ දෘෂ්ටීන් මේ විදහට ග්‍රහණය කරගත්තොත්, මේ විදිහට බැඳිල ගියොත් මේ මේ ආකාරයේ උපත් ලබාගෙන මරණින් මතු මේ මේ විදිහට පරලොව යාවී" කියලා තථාගතයන් වහන්සේ මෙයත් දන්නවා. මෙයට වඩා උත්තරීතර දේවලුත් දන්නවා. ඒවා දැනගත්තා කියල අමුතුවෙන් ඒවාට බැඳෙන්නේ නෑ. ඒ දෘෂ්ටිවලට හසු නොවෙන නිසා ම තමා තුළ ම නිවීගිය බව තමයි අවබෝධ වෙලා තියෙන්නේ. ඒ වගේ ම පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ (ඔය දෘෂ්ටි හතරට බැඳීමට හේතු වූ ඒ ඒ තැන්වල සැපදුක් විඳි බවට ඇති) වේදනාවන් ගේ හටගැනීමත් නැතිවී යාමත් ආශ්වාදයත් ආදීනවයත් නිස්සරණයත් ඒ වූ ආකාරයෙන් ම අවබෝධ කරගෙන උපාදාන රහිතව කෙලෙසුන්ගෙන් නිදහස් වෙලයි ඉන්නේ.

51. ඉමේ ඛෝ තේ භික්ඛවේ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබෝධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවේදනීයා, යේ තථාගතෝ සයං අභිඤ්ඤා ස-ඡීකත්වා පවේදේති. යේහි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ ස්වකීය විශිෂ්ට ප්‍රඥාවෙන් සාක්ෂාත් කරපු යම් දේවල් ඇද්ද, ඒ දේවල්වලින් තථාගතයන් වහන්සේ ගේ යථාර්ථ වශයෙන් තිබෙන ගුණය වර්ණනා කරනවා නම්, වර්ණනා කළ යුතු දේ වන ගාම්භීර වූත්, දැකීමට දුෂ්කර වූත්, අවබෝධයට දුෂ්කර වූත්, ශාන්ත වූත්, ප්‍රණීත වූත්, තර්ක ගෝචරයෙන් තොර වූත්, සියුම් වූත්, නුවණැත්තන්ට විෂය වූත් ඒ දේවල් යනු මේව තමයි.

52. සන්ති භික්ඛවේ එකේ සමණබ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලෝකස්ස පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි. තේ ච හොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අන්තානන්තිකා අන්තානන්තං ලෝකස්ස පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි?

පින්වත් මහණෙනි, ලෝකයෙහි කෙළවරක් තිබෙනවා, වගේම කෙළවරක් නැත යන මතය දරණ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් ලෝකයේ කෙළවරක් ඇත, නැත යන මතය කරුණු හතරකින් උගන්වනවා. ලෝකයෙහි කෙළවරක් තිබෙනවා, වගේ ම කෙළවරක් නැත යන මතය දරන ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ලෝකයේ කෙළවරක් ඇත, නැත යන මතය කරුණු හතරකින් උගන්වන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද?

ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයෝගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාර-මන්වාය තථාරූපං චේතෝසමාධිං ඵුසති යථාසමාහිතේ චිත්තේ අන්තසඤ්ඤී ලෝකස්මිං විහරති, සෝ ඒවමාහ: "අන්තවා අයං ලෝකෝ පරිවටුමෝ තං කිස්ස හේතු? අහං හි ආතප්පමන්වාය ..... තථාරූපං චේතෝසමාධිං ඵුසාමි යථා සමාහිතේ චිත්තේ අන්තසඤ්ඤී ලෝකස්මිං විහරාමි. ඉමිනාමහං ඒතං ජානාමි: යථා අන්තවා අයං ලෝකෝ පරිවටුමෝ"ති.

පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා කෙලෙස් තවන වීර්යයෙන් යුතුව, අධික වීර්යයෙන් යුතුව, යළි යළිත්

වීරිය කොට අප්‍රමාදීව භාවනා කොට මැනවින් මනසිකාර කරල, යම් අයුරකින් සිත සමාහිත වෙලා ලෝකයෙහි කෙළවරක් ඇත යන හැඟීමෙන් වාසය කරනවා නම් එවැනි චිත්ත සමාධියක් ඇති කර ගන්නවා. එතකොට ඔහු මෙහෙම කියනවා. "මේ ලෝකය කෙළවර සහිත යි. හාත්පසින් වටවෙලයි තියෙන්නේ. එයට හේතුව කුමක් ද? මං ඉතින් ගොඩාක් උත්සාහ කරල ..... යම් අයුරකින් සිත සමාහිත වෙලා ලෝකයෙහි කෙළවරක් ඇත යන හැඟීමෙන් වාසය කරනවා නම් එවැනි චිත්ත සමාධියක් ඇති කරගත්තා. මේ කාරණය නිසයි මං මෙය දන්නේ. යම් අයුරකින් කෙළවර සහිත නම් මේ ලෝකය එවැනි හාත්පසින් වට වූ දෙයක් කියල.

ඉදං භික්ඛවේ පඨමං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලෝකස්ස පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, යම් කරුණකට පැමිණිලා යම් කරුණක් අරභයා ලෝකයෙහි කෙළවරක් තිබෙනවා, වගේම කෙළවරක් නැත යන මතය දරන ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ලෝකයේ කෙළවරක් ඇත නැත යන ඒ මතය උගන්වනවා නම් මේක තමයි ඒ පළමු වෙනි කරුණ.

53. දුතියේ ච හොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අන්තානන්තිකා අන්තානන්තං ලෝකස්ස පඤ්ඤාපෙන්ති?

ලෝකයෙහි කෙළවරක් තිබෙනවා, වගේම කෙළවරක් නැත යන මතය දරණ ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ලෝකයේ කෙළවරක් ඇත නැත යන මතය දෙවෙනි කරුණෙන් උගන්වන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද?

ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයෝගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාර-මන්වාය තථාරූපං චේතෝසමාධිං ඵුසති යථාසමාහිතේ චිත්තේ අනන්තසඤ්ඤී ලෝකස්මිං විහරති, සෝ ඒවමාහ: "අනන්තෝ අයං ලෝකෝ අපරියන්තෝ. යේ තේ සමණබ්‍රාහ්මණා ඒවමාහංසු: අන්තවා අයං ලෝකෝ පරිවටුමෝති, තේසං මුසා. අනන්තෝ, අයං ලෝකෝ අපරියන්තෝ. තං කිස්ස හේතු? අහං හි ආතප්පමන්වාය ..... තථාරූපං චේතෝසමාධිං ඵුසාමි යථා සමාහිතේ චිත්තේ අනන්තසඤ්ඤී ලෝකස්මිං විහරාමි. ඉමිනාමහං ඒතං ජානාමි: යථා අනන්තෝ අයං ලෝකෝ අපරියන්තෝති."

පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් වේවා බ්‍රාහ්මණයෙක් වේවා කෙලෙස් තවන වීර්යයෙන් යුතුව, අධික වීර්යයෙන් යුතුව, යළි යළිත් වීරිය කොට අප්‍රමාදීව භාවනා කොට මැනැවින් මනසිකාර කරල, යම් අයුරකින් සිත සමාහිත වෙලා ලෝකයෙහි කෙළවරක් නැත යන හැඟීමෙන් වාසය කරනවා නම් එවැනි චිත්ත සමාධියක් ඇති කර ගන්නවා. එතකොට ඔහු මෙහෙම කියනවා. “මේ ලෝකය අනන්ත යි. හාත්පසින් වටවුණ සීමාවක් නෑ. නමුත් යම් මේ ශ්‍රමණ බ්‍රාහ්මණයින් මෙහෙම කියල තියෙනවා. මේ ලෝකය කෙළවර සහිත යි ව්, හාත්පසින් වටවෙලා තියෙනවා ව්. ඒක ඔවුන් ගේ බොරුවක්. මේ ලෝකය අනන්ත යි. හාත්පසින් වටවුණ සීමාවක් නෑ. එයට හේතුව කුමක් ද? මං ඉතින් ගොඩාක් උත්සාහ කරල ..... යම් අයුරකින් සිත සමාහිත වෙලා ලෝකයෙහි කෙළවරක් නැත යන හැඟීමෙන් වාසය කරනවා නම් එවැනි චිත්ත සමාධියක් ඇති කරගත්තා. මේ කාරණය නිසයි මං මේ දන්නේ. යම් අයුරකින් මේ ලෝකය අනන්ත යි, හාත්පසින් වටවුණ සීමාවක් නෑ කියල.

ඉදං භික්ඛවේ දුතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලෝකස්ස පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, යම් කරුණකට පැමිණිලා යම් කරුණක් අරභයා ලෝකයෙහි කෙළවරක් තිබෙනවා, වගේම කෙළවරක් නැත යන මතය දරන ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ලෝකයේ කෙළවරක් ඇත නැත යන ඒ මතය උගන්වනවා නම් මේක තමයි ඒ දෙවැනි කරුණ.

54. තතියේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අන්තානන්තිකා අන්තානන්තං ලෝකස්ස පඤ්ඤාපෙන්ති?

54. ලෝකයෙහි කෙළවරක් තිබෙනවා, වගේම කෙළවරක් නැත යන මතය දරණ ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ලෝකයේ කෙළවරක් ඇත නැත යන මතය තෙවෙනි කරුණෙන් උගන්වන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද?

ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ආතප්පමන්වාය පධානමන්වාය අනුයෝගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාර-මන්වාය තථාරූපං චේතෝසමාධිං ඵුසති යථාසමාහිතේ චිත්තේ උද්ධමධෝ අන්තසඤ්ඤී ලෝකස්මිං විහරති තිරියං අනන්තසඤ්ඤී. සෝ ඒවමාහ:

"අන්තවා ච අයං ලෝකෝ අනන්තෝ ච. යේ තේ සමණබ්‍රාහ්මණා ඒවමාහංසු: අන්තවා අයං ලෝකෝ පරිවටුමෝති, තේසං මුසා. යේ'පි තේ සමණබ්‍රාහ්මණා ඒවමාහංසු: අනන්තෝ අයං ලෝකෝ අපරියන්තෝති, තේසම්පි මුසා. අන්තවා ච අයං ලෝකෝ අනන්තෝ ච. තං කිස්ස හේතු? අහං හි ආතප්පමන්වාය ..... තථාරූපං චෙතෝසමාධිං ඵුසාමි යථා සමාහිතේ චිත්තේ උද්ධමධෝ අන්තසඤ්ඤී ලෝකස්මිං විහරාමි නිරියං අනන්තසඤ්ඤී. ඉමිනාමහං ඒතං ජානාමි: යථා අන්තවා ච අයං ලෝකෝ අනන්තෝ"වාති.

පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා කෙලෙස් තවන වීර්යයෙන් යුතුව, අධික වීර්යයෙන් යුතුව, යළි යළිත් වීරිය කොට, අප්‍රමාදීව භාවනා කොට මැනවින් මනසිකාර කරල, යම් අයුරකින් සිත සමාහිත වෙලා ලෝකයෙහි උඩත් යටත් කෙළවරක් තියෙන නමුත් හරස් අතට කෙළවරක් නෑ යන හැඟීමෙන් වාසය කරනවා නම් එවැනි චිත්ත සමාධියක් ඇති කර ගන්නවා. එතකොට ඔහු මෙහෙම කියනවා. "මේ ලෝකය කෙළවර සහිත යි. ඒ වගේම කෙළවර රහිත යි. නමුත් යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා මේ විදහටයි කියන්නේ "මේ ලෝකය කෙළවර සහිත යි, හාත්පසින් වටවෙලයි තියෙන්නේ " කියල. ඒක ඔවුන් ගේ බොරුවක්. යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා මේ විදහටයි කියන්නේ "මේ ලෝකය කෙලවරක් නෑ, හාත්පසින් වටවුණ සීමාවක් නෑ" කියල. ඒකත් ඔවුන් ගේ බොරුවක්. එයට හේතුව කුමක් ද ? මං ඉතින් ගොඩාක් උත්සාහ කරල ..... යම් අයුරකින් සිත සමාහිත වෙලා ලෝකයෙහි උඩත් යටත් කෙළවරක් තියෙන නමුත් හරස් අතට කෙළවරක් නෑ යන හැඟීමෙන් වාසය කරනවා නම් එවැනි චිත්ත සමාධියක් ඇති කරගත්තා. මේ කාරණය නිසයි මං මේ දන්නේ. යම් අයුරකින් ලෝකය කෙළවර සහිත යි, ඒ වගේ ම කෙළවරක් නැති දෙයක් කියල.

ඉදං භික්ඛවේ තතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලෝකස්ස පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, යම් කරුණකට පැමිණිලා යම් කරුණක් අරභයා ලෝකයෙහි කෙළවරක් තිබෙනවා, වගේම කෙළවරක් නැත යන මතය දරන ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ලෝකයේ කෙළවරක් ඇත නැත යන ඒ මතය උගන්වනවා නම් මේක තමයි ඒ තුන්වැනි කරුණ.

55. චතුත්ථේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අන්තානන්තිකා අන්තානන්තං ලෝකස්ස පඤ්ඤාපෙන්ති?

ලෝකයෙහි කෙළවරක් තිබෙනවා, වගේම කෙළවරක් නැත යන මතය දරණ ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ලෝකයේ කෙළවරක් ඇත නැත යන මතය සතරවෙනි කරුණෙන් උගන්වන්නේ කුමකට පැමිණිලා ද? කුමක් අරභයා ද?

ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා තක්කී හෝති වීමංසී. සෝ තක්කපරියාහතං වීමංසානුචරිතං සයම්පටිභානං ඒවමාහ: "නේවායං ලෝකෝ අන්තවා න පනානන්තෝ. යේ තේ සමණබ්‍රාහ්මණා ඒවමාහංසු: අන්තවා අයං ලෝකෝ පරිවටුමෝති, තේසං මුසා. යේ'පි තේ සමණබ්‍රාහ්මණා ඒවමාහංසු: අනන්තෝ අයං ලෝකෝ අපරියන්තෝති, තේසම්පි මුසා. යේ'පි තේ සමණබ්‍රහ්මණා ඒවමාහංසු: අන්තවා ච අයං ලෝකෝ අනන්තෝ චා'ති තේසම්පි මුසා. නේවායං ලෝකෝ අන්තවා න පනානන්තෝ"ති.

පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් තර්ක කරනවා. එක එක විදිහට විමසනවා. තර්ක කරමින් කරුණු රැස්කොට විමස විමසා තමන්ට වැටහෙන පරිදි කරුණු රැස්කොට මෙහෙම කියනවා. "මේ ලෝකය කෙළවරක් සහිත වූවක් නොවෙයි. කෙළවරක් රහිත වූවකුත් නොවෙයි. යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා මේ විදහටයි කියන්නේ "මේ ලෝකය කෙළවර සහිතයි, හාත්පසින් වටවෙලයි තියෙන්නේ" කියල. ඒක ඔවුන්ගේ බොරුවක්. යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා මේ විදහටයි කියන්නේ "මේ ලෝකය කෙළවරක් නෑ, හාත්පසින් වටවුණ සීමාවක් නෑ" කියල. ඒකත් ඔවුන් ගේ බොරුවක්. ඒ වගේ ම යම් මේ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා ඔවුන් කියන්නේ මේ විදිහට යි. "ලෝකය කෙළවර සහිත යි. ඒ වගේ ම කෙළවර රහිත යි" කියලා. ඒකත් ඔවුන් ගේ බොරුවක්. මේ ලෝකය කෙළවරකින් යුක්තත් නෑ. කෙළවර රහිතත් නෑ" කියල.

ඉදං භික්ඛවේ චතුත්ථං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලෝකස්ස පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, යම් කරුණකට පැමිණිලා යම් කරුණක් අරභයා ලෝකයෙහි කෙළවරක් තිබෙනවා, වගේම කෙළවරක් නැත යන මතය දරන

ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ලෝකයේ කෙළවරක් ඇත නැත යන ඒ මතය උගන්වනවා නම් මේක තමයි ඒ හතර වෙනි කරුණ.

56. ඉමේහි ඛෝ තේ භික්ඛවේ සමණබ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලෝකස්ස පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි. යේ හි කේචි භික්ඛවේ, සමණා වා බ්‍රාහ්මණා වා අන්තානන්තිකා අන්තානන්තං ලෝකස්ස පඤ්ඤාපෙන්ති, සබ්බේ තේ ඉමේහේව චතූහි වත්ථූහි, ඒතේසං වා අඤ්ඤතරේන. නත්ථි ඉතෝ බහිද්ධා.

56. පින්වත් මහණෙනි, ලෝකයෙහි කෙළවරක් තිබෙනවා, වගේම කෙළවරක් නැත යන මතය දරණ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ලෝකයේ කෙළවරක් ඇත නැත යන ඒ මතය මේ කරුණු හතරින් තමයි උගන්වන්නේ. පින්වත් මහණෙනි, ඒ ලෝකයෙහි කෙළවරක් තිබෙනවා, වගේම කෙළවරක් නැත යන මතය දරණ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ලෝකයේ කෙළවරක් ඇත නැත යන ඒ මතය උගන්වනවා නම්, මේ කරුණු හතරින් තමයි ඒ සියළු දෙනා ම උගන්වන්නේ. එක්කෝ මේ කරුණුවලින් එකකිනුයි. මෙයින් බාහිර කරුණක් නම් නෑ.

57. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති: "ඉමේ දිට්ඨිට්ඨානා ඒවං ගහිතා ඒවං පරාමට්ඨා ඒවං ගතිකා භවිස්සන්ති ඒවං අභිසම්පරායා"ති. තඤ්ච තථාගතෝ පජානාති. තතෝ ච උත්තරිතරං පජානාති. තඤ්ච පජානනං න පරාමසති. අපරාමසතෝ චස්ස ප-චත්තංයේව නිබ්බුති විදිතා. වේදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තෝ භික්ඛවේ තථාගතෝ.

57. පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ මේ කාරණය ගැන අවබෝධ කරගෙනයි ඉන්නේ "මේ දෘෂ්ටීන් මේ විදහට ග්‍රහණය කරගත්තොත්, මේ විදිහට බැඳිල ගියොත් මේ මේ ආකාරයේ උපත් ලබාගෙන මරණින් මතු මේ මේ විදිහට පරලොව යාවී" කියලා තථාගතයන් වහන්සේ මෙයත් දන්නවා. මෙයට වඩා උත්තරීතර දේවත් දන්නවා. ඒවා දැනගත්තා කියල අමුතුවෙන් ඒවාට බැඳෙන්ට යන්නේ නෑ. ඒ දෘෂ්ටිවලට හසු නො වෙන නිසාම යි තමා තුළ ම නිවීගිය බව දැන ගෙන තියෙන්නේ. ඒ වගේ ම පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ වේදනාවන්ගේ හටගැනීමත් නැතිවී යාමත් ආශ්වාදයත් ආදීනවයත් නිස්සරණයත් ඒ වූ ආකාරයෙන් ම අවබෝධ කරගෙන උපාදාන රහිතව කෙලෙසුන්ගෙන් නිදහස් වෙලයි ඉන්නේ.

58. ඉමේ ඛෝ තේ භික්ඛවේ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබෝධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවේදනීයා, යේ තථාගතෝ සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. යේහි තථාගතස්ස යථාභූ-වං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

58. පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ තමන් තුළින් ම උපදවා ගන්නා ලද විශිෂ්ට ඤාණයෙන් අත්දැකල ලොවට පෙන්වා දෙන යම් යම් දේවල් ඇත්නම්, ඒ යම් යම් දේවල්වලින් තථාගතයන් වහන්සේ ගේ සත්‍ය වශයෙන් ම තිබෙන ගුණත් මනා කොට කියනවා නම්, කිව යුතු වූ ඉතා ගැඹුරු වූ දුකසේ දකින්න තියෙන, දුකසේ අවබෝධ කරන්න තියෙන, ශාන්ත වූ, ප්‍රණීත වූ, තර්කයට හසු නො වන, ඉතා සියුම් වූ, ඒවගේම නුවණැතියන් විසින් ම දත යුත්තේ මේ දේවල් තමයි.

59. සන්ති භික්ඛවේ ඒකේ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං චතූහි වත්ථූහි. තේ ච හොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිම්රාබ්භ අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං චතූහි වත්ථූහි?

59. පින්වත් මහණෙනි, ඇහ බේරාගැනීමට පිළිතුරු දී (ආදෙකු මෙන් ලිස්සා) ප්‍රශ්නයෙන් මගහැර යන අමරාවික්ෂේපවාදී ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් ඒ ඒ කරුණු අරභයා ප්‍රශ්න ඇසුවිට ක්‍රම හතරකින් වචනවලින් මගහැරලා යනවා. ආදෙකු මෙන් ලිස්සා යනවා. අමරාවික්ෂේපවාදී ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ද ඒ ඒ කරුණු අරභයා ප්‍රශ්න ඇසුවිට ක්‍රම හතරකින් වචනවලින් මගහැරලා යන්නේ ආදෙකු මෙන් ලිස්සා යන්නේ කුමකට පැමිණීමෙන් ද? කුමක් අරභයා ද?

60. ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ඉදං කුසලන්ති යථාභූතං නප්පජානාති. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාති. තස්ස ඒවං හෝති: "අහං ඛෝ ඉදං කුසලන්ති යථාභූතං නප්පජානාමි. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාමි. අහඤ්ඤ-ව ඛෝ පන ඉදං කුසලන්ති යථාභූතං නප්පජානන්තෝ, ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානන්තෝ, ඉදං කුසලන්ති වා ව්‍යාකරෙය්‍යං, ඉදං අකුසලන්ති වා ව්‍යාකරෙය්‍යං, තත්ථ මේ අස්ස ඡන්දෝ වා රාගෝ වා දෝසෝ වා පටිඝෝ වා. යත්ථ මේ අස්ස ඡන්දෝ වා රාගෝ වා

දෝසෝ වා පටිසෝ වා, නං මමස්ස මුසා. යං මමස්ස මුසා, සෝ මමස්ස විඝාතෝ. යෝ මමස්ස විඝාතෝ, සෝ මමස්ස අන්තරායෝ”ති.

60. පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. මේක කුසලය කියල ඒ වූ ආකාරයෙන් ම දන්නෙ නෑ. මේක අකුසලය කියලත් ඒ වූ ආකාරයෙන් ම දන්නෙ නෑ. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. “මං මේක කුසලය කියල ඒ වූ ආකාරයෙන් ම දන්නෙ නෑ. මේක අකුසලය කියලත් ඒ වූ ආකාරයෙන් ම දන්නෙ නෑ. ඉදින් මං පවා මේක කුසලය කියල ඒ වූ ආකාරයෙන් ම නො දන්න කොට, මේක අකුසලය කියලත් ඒ වූ ආකාරයෙන් ම නො දන්න කොට, මේක තමයි කුසලය කියලා මං කිව්වොත්, මේක තමයි අකුසලය කියලා මං කිව්වොත්, එහි දී මගේ ඒ කියමන තුළ කැමැත්තක් හෝ රාගයක් හෝ ද්වේෂයක් හෝ තරහක් හෝ ඇතිවෙන්ට පුළුවනි. යම් කරුණකට මගේ කියමනට කැමැත්තක් හෝ රාගයක් හෝ ද්වේෂයක් හෝ තරහක් හෝ ඇතිවෙන්ට පුළුවන් නම් ඒක මගේ බොරුවක් වෙනවා. මගේ යම් කීමක් බොරු වෙනවා නම් ඒක මට පීඩා සහිත යි. මට යමක් පීඩා සහිත නම් ඒක මට අන්තරාදායක යි.

ඉති සෝ මුසාවාදභයා මුසාවාදපරිජේගු-ඡා නේවිදං කුසලන්ති ව්‍යාකරෝති. න පනිදං අකුසලන්ති ව්‍යාකරෝති. තත්ථ තත්ථ පඤ්හං පුට්ඨෝ සමානෝ වාචාවික්ඛේපං ආපජ්ජති අමරාවික්ඛේපං: “ඒවම්පි මේ නෝ, තථාති’පි මේ නෝ, අඤ්ඤථාති’පි මේ නෝ, නෝති’පි මේ නෝ, නෝ නෝති’පි මේ නෝ”ති.

ඉතින් ඔය විදිහට ඔහු බොරුකීමට බියෙන්, බොරුකීමට පිළිකුලෙන් මේක කුසල්ය කියල කියන්නෙත් නෑ. මෙය අකුසල්ය කියල කියන්නෙත් නෑ. ඒ ඒ කරුණු ගැන ප්‍රශ්ණ ඇසූ විට “මා තුළ ඔවැනි අදහසක් නම් නෑ. මා තුළ ඒ අයුරින් පිළිගැනීමකුත් නෑ. මා තුළ ඔයිට වෙනස් අයුරකින් පිළිගැනීමකුත් නෑ. නො පිළිගන්නවා කියල දෙයකුත් නෑ. නො පිළිගන්නේ නැත කියල දෙයකුත් නෑ” කියල වචනවලින් මගහැරලා යනවා. ආදෙකු මෙන් ලිස්සා යනවා.

ඉදං භික්ඛවේ පඨමං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං.

පින්වත් මහණෙනි, යම් කරුණකට පැමිණිලා යම් කරුණක් අරභයා අමරාවික්ඛේපවාදී ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ද ඒ ඒ කරුණු අරභයා ප්‍රශ්න ඇසුවිට වචනවලින් මගහැරලා යන්නේ ආදෙකු මෙන් ලිස්සා යන්නේ නම් මේක තමයි ඒ පලමුවැනි කරුණ.

61. දුතියේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිම්‍රාබ්භ අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං?

61. අමරා වික්ඛේපවාදී ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඒ ඒ කරුණු අරභයා ප්‍රශ්න ඇසුවිට වචනවලින් මගහැරලා යන ආදෙකු මෙන් ලිස්සා යන දෙවෙනි ක්‍රමයට එන්නේ කුමකට පැමිණීමෙන් ද? කුමක් අරභයා ද?

ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ඉදං කුසලන්ති යථාභූතං නප්පජානාති. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාති. තස්ස ඒවං හෝති: "අහං ඛෝ ඉදං කුසලන්ති යථාභූතං නප්පජානාමි. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාමි. අහඤ්ඤ-ව ඛෝ පන ඉදං කුසලන්ති යථාභූතං නප්පජානන්තෝ, ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානන්තෝ, ඉදං කුසලන්ති වා ව්‍යාකරෙය්‍යං, ඉදං අකුසලන්ති වා ව්‍යාකරෙය්‍යං, තත්ථ මේ අස්ස ඡන්දෝ වා රාගෝ වා දෝසෝ වා පටිඝෝ වා. යත්ථ මේ අස්ස ඡන්දෝ වා රාගෝ වා දෝසෝ වා පටිඝෝ වා, තං මමස්ස උපාදානං. යං මමස්ස උපාදානං, සෝ මමස්ස විඝාතෝ. යෝ මමස්ස විඝාතෝ, සෝ මමස්ස අන්තරායෝ"ති.

පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. මේක කුසලය කියල ඒ වූ ආකාරයෙන් ම දන්නෙ නෑ. මේක අකුසලය කියලත් ඒ වූ ආකාරයෙන් ම දන්නෙ නෑ. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං මේක කුසලය කියල ඒ වූ ආකාරයෙන් ම දන්නෙ නෑ. මේක අකුසලය කියලත් ඒ වූ ආකාරයෙන් ම දන්නෙ නෑ. ඉදින් මං පවා මේක කුසලය කියල ඒ වූ ආකාරයෙන් ම නො දන්න කොට, මේක අකුසලය කියලත් ඒ වූ ආකාරයෙන් ම නො දන්න කොට, මේක තමයි කුසලය කියලා මං කිව්වොත්, මේක තමයි අකුසලය කියලා මං කිව්වොත්, එහි දී මට ඒ කියමන තුළ කැමැත්තක් හෝ රාගයක් හෝ ද්වේෂයක් හෝ තරහක් හෝ ඇතිවෙන්ට පුළුවනි. යම් කරුණකට මා තුළ කැමැත්තක් හෝ රාගයක් හෝ ද්වේෂයක් හෝ තරහක් හෝ ඇතිවෙන්ට පුළුවන් නම් ඒක මගේ උපාදානයක් (අනවශ්‍ය බැඳීමක්) වෙනවා.

මගේ යම් කීමක් උපාදානයක් වෙනවා නම් ඒක මට පීඩා සහිත යි. මට යමක් පීඩා සහිත නම් ඒක මට අන්තරාදායක යි.

ඉති සෝ උපාදානභයා උපාදානපරිජේගු-ඡා නේවිදං කුසලන්ති ව්‍යාකරෝති. න පනිදං අකුසලන්ති ව්‍යාකරෝති. තත්ථ තත්ථ පඤ්හං පුට්ඨෝ සමානෝ වාචාවික්ඛේපං ආපජ්ජති අමරාවික්ඛේපං: "ඒවම්පි මේ නෝ. තථාති'පි මේ නෝ, අඤ්ඤථාති'පි මේ නෝ, නෝති'පි මේ නෝ, නෝ නෝති'පි මේ නෝ"ති.

ඉතින් ඔය විදිහට ඔහු උපාදානයට බියෙන්, උපාදානයට පිළිකුලෙන් මේක කුසල්ය කියල කියන්නෙත් නෑ. මෙය අකුසල්ය කියල කියන්නෙත් නෑ. ඒ ඒ කරුණු ගැන ප්‍රශ්ණ ඇසූ විට "මා තුළ ඔවැනි අදහසක් නම් නෑ. මා තුළ ඒ අයුරින් පිළිගැනීමකුත් නෑ. මා තුළ ඔයිට වෙනස් අයුරකින් පිළිගැනීමකුත් නෑ. නො පිළිගන්නවා කියල දෙයකුත් නෑ. නො පිළිගන්නේ නැත කියල දෙයකුත් නෑ" කියල වචනවලින් මගහැරලා යනවා. ආදෙකු මෙන් ලිස්සා යනවා.

ඉදං භික්ඛවේ දුතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං.

පින්වත් මහණෙනි, යම් කරුණකට පැමිණිලා යම් කරුණක් අරභයා අමරාවික්ඛේපවාදී ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ද ඒ ඒ කරුණු අරභයා ප්‍රශ්ණ ඇසූවිට වචනවලින් මගහැරලා යන්නේ ආදෙකු මෙන් ලිස්සා යන්නේ නම් මේක තමයි ඒ දෙවෙනි කරුණ.

62. තතියේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිම්‌රාබ්භ අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං?

අමරාවික්ඛේපවාදී ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඒ ඒ කරුණු අරභයා ප්‍රශ්ණ ඇසූවිට වචනවලින් මගහැරලා යන, ආදෙකු මෙන් ලිස්සා යන තුන්වෙනි ක්‍රමයට එන්නේ කුමකට පැමිණීමෙන් ද? කුමක් අරභයා ද?

ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ඉදං කුසලන්ති යථාභූතං නප්පජානාති. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාති. තස්ස ඒවං හෝති: "අහං ඛෝ ඉදං කුසලන්ති යථාභූතං නප්පජානාමි. ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානාමි. අහඤ්ඤේ-ව ඛෝ පන ඉදං කුසලන්ති යථාභූතං නප්පජානන්තෝ, ඉදං අකුසලන්ති යථාභූතං නප්පජානන්තෝ, ඉදං කුසලන්ති වා ව්‍යාකරෙය්‍යං, ඉදං අකුසලන්ති වා ව්‍යාකරෙය්‍යං, සන්ති හි ඛෝ පන සමණබ්‍රාහ්මණා පණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවේධිරූපා වෝභින්දන්තා මඤ්ඤේ චරන්ති පඤ්ඤාගතේන දිට්ඨිගතානි, තේ මං තත්ථ සමනුයුඤ්ජෙය්‍යුං සමනුගාහෙය්‍යුං සමනුභාසෙය්‍යුං. යේ මං තත්ථ සමනුයුඤ්ජෙය්‍යුං සමනුගාහෙය්‍යුං සමනුභාසෙය්‍යුං, තේසාහං න සම්පායෙය්‍යං. යේසාහං න සම්පායෙය්‍යං, සෝ මමස්ස විඝාතෝ. යෝ මමස්ස විඝාතෝ, සෝ මමස්ස අන්තරායෝ"ති.

පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. මේක කුසලය කියල ඒ වූ ආකාරයෙන් ම දන්නෙ නෑ. මේක අකුසලය කියලත් ඒ වූ ආකාරයෙන් ම දන්නෙ නෑ. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. " මං මේක කුසලය කියල ඒ වූ ආකාරයෙන් ම දන්නෙ නෑ. මේක අකුසලය කියලත් ඒ වූ ආකාරයෙන් ම දන්නෙ නෑ. ඉදින් මං පවා මේක කුසලය කියල ඒ වූ ආකාරයෙන් ම නො දන්න කොට, මේක අකුසලය කියලත් ඒ වූ ආකාරයෙන් ම නො දන්න කොට, මේක තමයි කුසලය කියලා මං කිව්වොත්, මේක තමයි අකුසලය කියලා මං කිව්වොත්, මෙහෙම වේවි. පණ්ඩිතවූ, සියුම් නුවණ ඇති, අනුන් හා වාද කරල ජයගත්තු, ඊතලයෙන් අශ්වලෝමයට විදින දක්ෂ දුනුවායන් වැනි වූ, තමන් ගේ දෘෂ්ටිවලින් නුවණ හසුරුවා අනුන් පරදවන්නන්ව හැසිරෙන යමෙක් ඇත් ද එබඳු ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. මං කුසල් අකුසල් ගැන කියන්ට ගියොත් ඔවුන් ඒ කරුණු අරභයා මගෙන් ප්‍රශ්න කරන්ට පුළුවනි. කරුණු ඉස්මතු කොට වාදයට එන්ට පුළුවනි. දොස් කියන්ට පුළුවනි. යම් කෙනෙක් මා පවසන කුසල් අකුසල් ගැන මගෙන් ප්‍රශ්න කරද්දී කරුණු ඉස්මතුකොට වාද කරද්දී දොස් කියද්දී ඔවුන් ගෙන් කරුණු විමසා මට ප්‍රශ්න කරන්ට බැරිවුණොත් කරුණු ඉස්මතු කොට වාද කරන්ට බැරි වුණොත් දොස් කියන්ට බැරි වුණොත් ඒක මට පීඩා සහිතයි. මට යමක් පීඩා සහිත නම් ඒක මට අන්තරාදායක යි.

ඉති සෝ අනුයෝගභයා අනුයෝගපරිජේගු-ඡා නේව්දං කුසලන්ති ව්‍යාකරෝති. න පනිදං අකුසලන්ති ව්‍යාකරෝති. තත්ථ තත්ථ පඤ්හං පුට්ඨෝ

සමානෝ වාචාවික්ඛේපං ආපජ්ජති අමරාවික්ඛේපං: "එවම්පි මේ නෝ, තථාති'පි මේ නෝ, අඤ්ඤථාති'පි මේ නෝ, නෝති'පි මේ නෝ, නෝ නෝති'පි මේ නෝ"ති.

ඉතින් ඔය විදිහට ඔහු කරුණු ඉස්මතු කොට වාද කිරීමට බියෙන්, කරුණු ඉස්මතු කොට වාද කිරීමට පිළිකුලෙන් මේක කුසල්ය කියල කියන්නෙත් නෑ. මෙය අකුසල්ය කියල කියන්නෙත් නෑ. ඒ ඒ කරුණු ගැන ප්‍රශ්න ඇසූ විට "මා තුළ ඔවැනි අදහසක් නම් නෑ. මා තුළ ඒ අයුරින් පිළිගැනීමකුත් නෑ. මා තුළ ඔයිට වෙනස් අයුරකින් පිළිගැනීමකුත් නෑ. නො පිළිගන්නවා කියල දෙයකුත් නෑ. නො පිළිගන්නේ නැත කියල දෙයකුත් නෑ" කියල වචනවලින් මගහැරලා යනවා. ආදෙකු මෙන් ලිස්සා යනවා.

ඉදං භික්ඛවේ තතියං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං.

පින්වත් මහණෙනි, යම් කරුණකට පැමිණිලා යම් කරුණක් අරභයා අමරාවික්ඛේපවාදී ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ද ඒ ඒ කරුණු අරභයා ප්‍රශ්න ඇසූවිට වචනවලින් මගහැරලා යන්නේ ආදෙකු මෙන් ලිස්සා යන්නේ නම් මේක තමයි ඒ තුන් වෙනි කරුණ.

63. චතුත්ථේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමිරාබ්භ අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං?

අමරාවික්ඛේපවාදී ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඒ ඒ කරුණු අරභයා ප්‍රශ්න ඇසූවිට වචනවලින් මගහැරලා යන ආදෙකු මෙන් ලිස්සා යන සතරවෙනි ක්‍රමයට එන්නේ කුමකට පැමිණීමෙන් ද? කුමක් අරභයා ද?

ඉධ භික්ඛවේ ඒකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා මන්දෝ හෝති මෝමුහෝ. සෝ මන්දත්තා මෝමුහත්තා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨෝ සමානෝ වාචාවික්ඛේපං ආපජ්ජති අමරාවික්ඛේපං: "අත්ථි පරෝ ලෝකෝ'ති ඉති චෙ- මං පුච්ඡසි, අත්ථි පරෝ ලෝකෝ'ති ඉති චෙ- මේ අස්ස, අත්ථි පරෝලෝකෝ'ති ඉති තේ නං ව්‍යාකරෙය්‍යං. එවම්පි මේ නෝ තථාති'පි

මේ නෝ. අඤ්ඤථාති'පි මේ නෝ. නෝති'පි මේ නෝ. නෝ නොති'පි මේ නෝ. නත්ථි පරෝ ලෝකෝ'ති? ..... අත්ථි ච නත්ථි ච පරෝ ලෝකෝ'ති? ..... අත්ථි සත්තා විපපාතිකා? ..... අත්ථි ච නත්ථි ච සත්තා විපපාතිකා? ..... නේවත්ථි න නත්ථි සත්තා විපපාතිකා? ..... අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකෝ? ..... නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකෝ? ..... අත්ථි ච නත්ථි ච සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකෝ? ..... නේවත්ථි න නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකෝ? ..... හෝති තථාගතෝ පරම්මරණා? ..... න හෝති තථාගතෝ පරම්මරණා? ..... හෝති ච න හෝති ච තථාගතෝ පරම්මරණා? ..... නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා ති? ඉති ෙ- මං පු-ඡසි "නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා"ති ඉති ෙ- මේ අස්ස, නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණාති ඉති තේ නං ව්‍යාකරෙය්‍යං. ඒවම්පි මේ නෝ. තථාති'පි මේ නෝ. අඤ්ඤථාති'පි මේ නෝ. නෝති'පි මේ නෝ. නෝ නෝති'පි මේ නෝ"ති.

පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ඉන්නවා. නුවණ මදි. ඉතා මෝඩ යි. ඔහු නුවණ මදි නිසා, බොහෝ සේ මෝඩ නිසා ඒ ඒ කරුණු අරභයා ප්‍රශ්න විමසූ විට එක එක දේවල් කියා වචනවලින් මග අරිනවා. ආදෙකු මෙන් ලිස්සා යනවා. "පරලොවක් තියෙනවා ද? කියල මගෙන් විමසුවොත් එතකොට මට හිතෙනවා නම් පරලොවක් ඇත කියලා මං ඔබට එය විසඳන්නේ පරලොවක් තියෙනවා කියල යි. ඒ වුණාට මා තුළ ඔවැනි අදහසක් නම් නෑ. මා තුළ ඒ අයුරින් පිළිගැනීමකුත් නෑ. මා තුළ ඔයිට වෙනස් අයුරකින් පිළිගැනීමකුත් නෑ. නො පිළිගන්නවා කියල දෙයකුත් නෑ. නො පිළිගන්නේ නැත කියල දෙයකුත් නෑ. ඒ වගේ ම පරලොවක් නැද්ද? කියල මගෙන් ඇහුවොත් ..... පරලොවක් තියෙනවා ද නැද්ද? කියල ..... පරලොවක් ඇත්තේත් නැද්ද? නැත්තේත් නැද්ද? කියල ..... විපපාතික සත්වයන් ඉන්නවාද? කියල ..... විපපාතික සත්වයන් නැද්ද? කියල ..... විපපාතික සත්වයන් ඇද්ද නැද්ද? කියල ..... හොඳ නරක කර්මවල ඵලවිපාක තියෙනවා ද? කියල ..... හොඳ නරක කර්මවල ඵල විපාක නැද්ද? කියල ..... හොඳනරක කර්මවල ඵලවිපාක ඇත්තේත් නැද්ද නැත්තේත් නැද්ද? කියල ..... තථාගතයන් වහන්සේ මරණින් මතු ඉන්නවාද? කියල ..... තථාගතයන් වහන්සේ**

මරණින් මතු නැද්ද? කියල ..... තථාගතයන් වහන්සේ මරණින් මතු ඇත්තේත් නැද්ද නැත්තේත් නැද්ද? කියල මගෙන් විමසුවොත් එතකොට මට හිතෙනවා නම් තථාගතයන් වහන්සේ මරණින් මතු අත්තේත් නෑ නැත්තේත් නෑ කියලා මං ඔබට එය විසඳන්නේ තථාගතයන් වහන්සේ මරණින් මතු ඇත්තේත් නෑ නැත්තේත් නෑ කියල යි. ඒ වුණාට මා තුළ ඔවැනි අදහසක් නම් නෑ. මා තුළ ඒ අයුරින් පිළිගැනීමකුත් නෑ. මා තුළ ඔයිට වෙනස් අයුරකින් පිළිගැනීමකුත් නෑ. නො පිළිගන්නවා කියල දෙයකුත් නෑ. නො පිළිගන්නේ නැත කියල දෙයකුත් නෑ.

ඉදං භික්ඛවේ චතුත්ථං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං.

පින්වත් මහණෙනි, යම් කරුණකට පැමිණිලා යම් කරුණක් අමරා වික්ෂේපවාදී ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ද ඒ ඒ කරුණු අරභයා ප්‍රශ්න ඇසුවිට වචනවලින් මගහැරලා යන්නේ ආදෙකු මෙන් ලිස්සා යන්නේ නම් මේක තමයි ඒ හතර වෙනි කරුණ.

64. ඉමේහි ඛෝ තේ භික්ඛවේ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං චතූහි වත්ථූහි. යේ හි කේචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං, සබ්බේ තේ ඉමේහේව චතූහි වත්ථූහි, ඒතේසං වා අඤ්ඤතරේන. නත්ථි ඉතෝ බහිද්ධා.

64. පින්වත් මහණෙනි, අමරාවික්ෂේපවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඒ ඒ කරුණු පිළිබඳව ප්‍රශ්ණ විමසද්දී කෙළින් පිළිතුරු නොදී වචනවලින් මහහරින්නේත්, ආදෙකු මෙන් ලිස්සා යන්නේත්ත් මේ කරුණු හතරින් තමයි. පින්වත් මහණෙනි, අමරාවික්ෂේපවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඒ ඒ කරුණු පිළිබඳව ප්‍රශ්ණ විමසද්දී කෙළින් පිළිතුරු නො දී වචනවලින් මහහරින්නේත්, ආදෙකු මෙන් ලිස්සා යන්නේත් යම් කරුණුවලින් නම්, ඒ මේ කරුණු හතරින් තමයි. එක්කෝ මේ කරුණුවලින් එකකිනුයි. මෙයින් බාහිර කරුණක් නම් නෑ.

65. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති: "ඉමේ දිට්ඨිට්ඨානා එවං ගහිතා එවං පරාමට්ඨා එවංගතිකා භවිස්සන්ති එවං අභිසම්පරායා"ති. තඤ්ච තථාගතෝ පජානාති. තතෝ ච උත්තරිතරං පජානාති. තඤ්ච පජානනං න පරාමසති. අපරාමසතෝ චස්ස ප-චත්තංයේව නිබ්බුති විදිතා. වේදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තෝ භික්ඛවේ තථාගතෝ.

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ මේ කාරණය ගැන අවබෝධ කරගෙනයි ඉන්නේ "මේ දෘෂ්ටීන් මේ විදහට ග්‍රහණය කරගත්තොත්, මේ විදිහට බැඳිල ගියොත් මේ මේ ආකාරයේ උපත් ලබාගෙන මරණින් මතු මේ මේ විදිහට පරලොව යාවී" කියලා තථාගතයන් වහන්සේ මෙයත් දන්නවා. මෙයට වඩා උත්තරීතර දේවලුත් දන්නවා. ඒවා දැනගත්තා කියල අමුතුවෙන් ඒවාට බැඳෙන්ට යන්නේ නෑ. ඒ දෘෂ්ටිවලට හසු නොවෙන නිසාම යි තමා තුළම නිවීගිය බව දැනගෙන තියෙන්නේ. ඒ වගේ ම පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ වේදනාවන් ගේ හටගැනීමත් නැතිවී යාමත් ආශ්වාදයත් ආදීනවයත් නිස්සරණයත් ඒ වූ ආකාරයෙන් ම අවබෝධ කරගෙන උපාදාන රහිතව කෙලෙසුන්ගෙන් නිදහස් වෙලයි ඉන්නේ.

ඉමේ ඛෝ තේ භික්ඛවේ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබෝධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවේදනීයා, යේ තථාගතෝ සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. යේහි තථාගතස්ස යථාභූ-ච වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ තමන් තුළින් ම උපදවා ගන්නා ලද විශිෂ්ට ඥාණයෙන් අත්දැකල ලොවට පෙන්වා දෙන යම් යම් දේවල් ඇත්නම්, ඒ යම් යම් දේවල්වලින් තථාගතයන් වහන්සේ ගේ සත්‍ය වශයෙන් ම තිබෙන ගුණත් මනා කොට කියනවා නම්, කිව යුතු වූ ඉතා ගැඹුරු වූ දුකසේ දකින්න තියෙන, දුකසේ අවබෝධ කරන්න තියෙන, ශාන්ත වූ, ප්‍රණීත වූ, තර්කයට හසු නොවන, ඉතා සියුම් වූ, ඒ වගේ ම නුවණැතියන් විසින් ම දතයුත්තේ මේ දේවල් තමයි.

66. සන්ති භික්ඛවේ ඒකේ සමණබ්‍රාහ්මණා අධිච්චසමුප්පන්නිකා අධිච්චසමුප්පන්නං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති ද්වීහි වත්ථූහි. තේ ච හොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්මා කිමාරබ්භා අධි-ච-සමුප්පන්නිකා අධි-චසමුප්පන්නං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති ද්වීහි වත්ථූහි?

පින්වත් මහණෙනි, හේතුඵල දහමින් තොරව ඉබේ සිදුවෙනවා යන මතය ඇති අධිච්චසමුප්පන්නවාදී ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් ආත්මය ගැනත්, ලෝකය ගැනත් ඉබේ හටගත් දේවල් හැටියට මතවාද දෙකකින් උගන්වනවා. ඒ අධිච්චසමුප්පන්නවාදී භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් මතවාද දෙකක් ඔස්සේ ආත්මය ගැනත් ලෝකය ගැනත් ඉබේ හටගත් දේ හැටියට උගන්වන්නේ කුමකට පැමිණීමෙන් ද? කුමක් අරභයා ද?

සන්ති භික්ඛවේ අසඤ්ඤසත්තා නාම දේවා. සඤ්ඤුප්පාදා ච පන තේ දේවා තම්හා කායා චවන්ති. ඨානං ඛෝ පනේතං භික්ඛවේ විජ්ජති යං අඤ්ඤතරෝ සත්තෝ තම්හා කායා චවිත්වා ඉත්ථත්තං ආග-ඡති. ඉත්ථත්තං ආගතෝ සමානෝ අගාරස්මා අනාගාරියං පබ්බජති. අගාරස්මා අනාගරියං පබ්බජිතෝ සමානෝ ආතප්පමන්වාය පධානමන්වාය අනුයෝගමන්වාය අප්පමාදමන්වාය සම්මාමනසිකාරමන්වාය තථාරූපං ෙ-තෝසමාධිං ඵුසති, යථාසමාහිතේ චිත්තේ සඤ්ඤුප්පාදං අනුස්සරති තතෝ පරං නානුස්සරති, සෝ ඒවමාහ: "අධි-චසමුප්පන්නෝ අත්තා ච ලෝකෝ ච. තං කිස්ස හේතු? අහං හි පුබ්බේ නාහෝසිං. සෝම්හි ඒතරහි අභූත්වා සන්තත්තාය පරිණතෝ"ති.

පින්වත් මහණෙනි, (තමා ගේ සිතත් කයත් පවතින බව නො දැන ඉපදි සිටින) අසඤ්ඤසත්ත නමින් දෙවිවරු කොටසක් ඉන්නවා. සඤ්ඤුව ඉපදුන සැණින් ඒ දෙවිවරුන් ඒ ලෝකයෙන් චුත වෙනවා. පින්වත් මහණෙනි, යම් සත්වයෙක් ඒ ලෝකයෙන් චුතවෙලා මේ මිනිස් ලොවට පැමිණෙනවා ය යන මෙකරුණ විද්‍යමාන (දකින්ට ලැබෙන) දෙයක්. ඉතින්, මිනිස් ලොවට ආපු ඒ කෙනා ගිහිගෙය අත්හැරලා අනගාරික වූ පැවිදිබව ලබනවා. ගිහිගෙයින් නික්මී අනගාරිකව පැවිදි වූ ඔහු කෙලෙස් තවන වීර්යයෙන් යුතුව, මහත් වීර්යයකින් යුතුව, යළි යළිත් වීරිය කොට අප්‍රමාදීව ඉතා හොඳින් මනසිකාර කරල යම් අයුරකින් සිත සමාධිමත් වුණ විට සඤ්ඤුව ඉපදීම ගැන සිහිකරන්න පුළුවන් වෙනවා නම්, එයින් එහාට සිහි කරන්ට පුළුවන් වෙන්නේ නැත්නම්, එබඳු වූ චිත්ත සමාධියක් ඇතිකර ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. ආත්මයත් ලෝකයත් ඉබේමයි හට අරගෙන තියෙන්නේ. මක්නිසාද එහෙම වෙන්නේ? මං කලින් ඉඳලා නෑ. ඒ මං මේ ජීවිතය තුළ තමයි ජීවිතය පිණිස පරිණාමයට පත්වුණේ.

ඉදං භික්ඛවේ පඨමං ඨානං යං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණ-බ්‍රාහ්මණා අධි-චසමුප්පන්නිකා අධි-චසමුප්පන්නං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, අධිච්චසමුප්පන්නවාදී ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ආත්මයත් ලෝකයත් ගැන ඉබේහටගත් දෙයක් වශයෙන් උගන්වන්නේ යම් කරුණකට පැමිණිලා නම් යමක් අරභයා නම්, මේ ඒ පළමු වෙනි මතවාදය යි.

67. දුතියේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්බ අධි-චසමුප්පන්නිකා අධි-චසමුප්පන්නං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති?

ඒ අධිච්චසමුප්පන්නවාදී වූ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් දෙවෙනි කරුණ හැටියට ආත්මයත් ලෝකයත් ඉබේ හටගත් දෙයක් වශයෙන් උගන්වන්නේ කුමකට පැමිණීමෙන් ද? කුමක් අරභයා ද?

ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා තක්කී හෝති වීමංසී. සෝ තක්කපරියාහතං වීමංසානුචරිතං සයම්පටිභානං ඒවමාහ: "අධි-චසමුපන්නෝ අත්තා ච ලෝකෝ චා"ති.

පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් තර්ක කරනවා. එක එක විදිහට විමසනවා. තර්ක කරමින් කරුණු රැස්කොට විමස විමසා තමන්ට වැටහෙන පරිදි කරුණු රැස්කොට මෙහෙම කියනවා. "ආත්මයත් ලෝකයත් ඉබේ හටගෙනයි තියෙන්නෙ" කියල.

ඉදං භික්ඛවේ දුතියං ආගම්ම යං ආරබ්භ ඒකේ සමණබ්‍රාහ්මණා අධි-චසමුප්පන්නිකා අධි-චසමුප්පන්නං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති.

පින්වත් මහණෙනි, අධිච්චසමුප්පන්නවාදී ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ආත්මයත් ලෝකයත් ඉබේ හටගත්තක් ය කියල උගන්වන්නේ යමකට පැමිණිලා නම්, යමක් අරභයා නම්, මේ ඒ දෙවෙනි කාරණය යි.

68. ඉමේහි ඛෝ තේ භික්ඛවේ සමණබ්‍රාහ්මණා අධි-චසමුප්පන්නිකා අධි-චසමුප්පන්නං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති ද්වීහි වත්ථූහි. යේහි කේචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා අධි-චසමුපන්නිකා අධි-චසමුප්පන්නං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති, සබ්බේ තේ ඉමේහේව ද්වීහි වත්ථූහි, ඒතේසං වා අඤ්ඤතරේන, නත්ථි ඉතෝ බහිද්ධා.

පින්වත් මහණෙනි, අධිච්චසමුප්පන්නවාදී ශ්‍රමණ බ්‍රාහ්මණයන් ආත්මයත් ලෝකයත් ඉබේ හටගත්ත බවට උගන්වන්නේ ඔය කරුණු දෙකෙන් තමයි. පින්වත් මහණෙනි, අධිච්චසමුප්පන්නවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ඉබේ හටගත් බවට යම් කරුණුවලින් උගන්වනවා නම්, ඒ සියළු දෙනා ම උගන්වන්නේ මේ කරුණු දෙකෙන් තමයි. එහෙම නැත්නම් ඔය දෙකෙන් එක් කරුණකින් තමයි. ඔයිට බාහිර කරුණකින් නොවේ.

69. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති ..... යේ හි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

පින්වත් මහණෙනි, ඔය කාරණය තථාගතයන් වහන්සේ හොඳින් දන්නවා ..... යම් කරුණකින් තථාගතයන් වහන්සේ ව සැබෑ ලෙසම වර්ණනා කරනවා නම්, වර්ණනා කරන්නේ.

70. ඉමේහි ඛෝ තේ භික්ඛවේ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනෝ පුබ්බන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාරසහි වත්ථූහි. යේහි කේචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනෝ පුබ්බන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති, සබ්බේ තේ ඉමේහේව අට්ඨාරසහි වත්ථූහි, ඒතේසං වා අඤ්ඤතරේන. නත්ථි ඉතෝ බහිද්ධා.

70. පින්වත් මහණෙනි, අතීතයේ කෙළවර ගැන කල්පනා කරන පූර්ව අන්ත කල්පික වූ ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් අතීතයේ කෙළවර ගැන ඇතිකරගත් මතවාද අනුව කලින් ජීවිතවල කෙළවර අරභයා නොයෙක් ආකාරවලින් අදහස් මතවාදයන් ප්‍රකාශනයන් ඉදිරිපත් කරන්නේ ඔය කරුණු දහඅටෙන් තමයි. පින්වත් මහණෙනි, ඒ පූර්වාන්ත කල්පික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් කලින් ජීවිතවල කෙළවර ගැන ඇති කරගන් දෘෂ්ටිය අනුව කලින් ජීවිතවල කෙළවර අරභයා නොයෙක් ආකාරයෙන් අදහස් මතවාද ප්‍රකාශනයන් වශයෙන් යමක් ඉදිරිපත් කරයි නම් ඒ සියළු දෙනා ම මේ කරුණු දහඅටෙන් තමයි ඉදිරිපත් කරන්නේ. එහෙම නැත්නම් මේවායින් එක දෙයෙකිනුයි. ඔයින් පිටස්තර කරුණකින් නම් නොවේ.

71. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති: "ඉමේ දිට්ඨිට්ඨානා ඒවං ගහිතා ඒවං පරාමට්ඨා ඒවං ගතිකා භවිස්සන්ති ඒවං අභිසම්පරායා"ති. තඤ්ච තථාගතෝ පජානාති. තතෝ ච උත්තරිතරං පජානාති. තඤ්ච

පජානනං න පරාමසති. අපරාමසතෝ චස්ස ප-චත්තංයේව නිබ්බුති විදිතා. වේදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තෝ භික්ඛවේ තථාගතෝ.

71. පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ මේ කාරණය ගැන අවබෝධ කරගෙනයි ඉන්නේ "මේ දෘෂ්ටීන් මේ විදහට ග්‍රහණය කරගත්තොත්, මේ විදිහට බැඳිල ගියොත් මේ මේ ආකාරයේ උපත් ලබාගෙන මරණින් මතු මේ මේ විදිහට පරලොව යාවී" කියලා තථාගතයන් වහන්සේ මෙයත් දන්නවා. මෙයට වඩා උත්තරීතර දේවත් දන්නවා. ඒවා දැනගත්තා කියල අමුතුවෙන් ඒවාට බැඳෙන්ට යන්නේ නෑ. ඒ දෘෂ්ටිවලට හසු නොවෙන නිසාම යි තමා තුළම නිවීගිය බව දැනගෙන තියෙන්නේ. ඒ වගේ ම පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ වේදනාවන් ගේ හටගැනීමත්, නැතිවී යාමත් ආශ්වාදයත්, ආදීනවයත්, නිස්සරණයත් ඒ වූ ආකාරයෙන් ම අවබෝධ කරගෙන උපාදාන රහිතව කෙලෙසුන්ගෙන් නිදහස් වෙලයි ඉන්නේ.

ඉමේ ඛෝ තේ භික්ඛවේ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබෝධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවේදනීයා, යේ තථාගතෝ සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. යේහි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ තමන් තුළින්ම උපදවා ගන්නා ලද විශිෂ්ට ඥණයෙන් අත්දැකල ලොවට පෙන්වා දෙන යම් යම් දේවල් ඇත්නම්, ඒ යම් යම් දේවල්වලින් තථාගතයන් වහන්සේ ගේ සත්‍ය වශයෙන් ම තිබෙන ගුණත් මනා කොට කියනවා නම්, කිව යුතු වූ ඉතා ගැඹුරු වූ දුකසේ දකින්න තියෙන, දුකසේ අවබෝධ කරන්න තියෙන, ශාන්ත වූ, ප්‍රණීත වූ, තර්කයට හසු නොවන, ඉතා සියුම් වූ, ඒවගේම නුවණැතියන් විසින් ම දතයුත්තේ මේ දේවල් තමයි.

72. **සන්ති භික්ඛවේ ඒකේ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනෝ අපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුචත්තාරීසාය වත්ථූහි. තේ ච හොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනෝ අපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුචත්තාරීසාය වත්ථූහි?**

72. පින්වත් මහණෙනි, අනාගත ජීවිතයේ කෙළවර ගැන නොයෙක් දෘෂ්ටි ඇතිකරගන්නා අපරාන්ත කල්පික වූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් අනාගත ජීවිතයේ කෙළවර ගැන නොයෙක් දෘෂ්ටීන් ඇතිකරගෙන අනාගත ජීවිතයේ කෙළවර අරභයා අනේකප්‍රකාර වූ අදහස් දෘෂ්ටි මතවාද ආදිය ප්‍රකාශ කරමින් කරුණු හතළිස් හතරකින් ඉදිරිපත් කරනවා. ඒ පූර්වාන්ත කල්පික වූ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් අනාගත ජීවිතයේ කෙළවර අරභයා දෘෂ්ටිවාද ඇතිකර ගනිමින් අනාගත ජීවිතයේ කෙළවර පිළිබඳ කරුණු හතළිස් හතරකින් අදහස් මතවාද දෘෂ්ටි ආදිය ඉදිරිපත් කරන්නේ කුමකට පැමිණීමෙන් ද? කුමක් අරභයා ද?

73. සන්ති භික්ඛවේ ඒකේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා උද්ධමාඝාතනා සඤ්ඤං අත්තානං පඤ්ඤාපෙන්ති සෝළසහි වත්ථූහි. තේ ච හොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා උද්ධමාඝාතනා සඤ්ඤං අත්තානං පඤ්ඤාපෙන්ති සෝළසහි වත්ථූහි?

73. පින්වත් මහණෙනි, මරණින් මතු ආත්මයක් තියෙනවා යන මතය දැරූ උද්ධමාඝාතනික සඤ්ඤීවාදක වූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් මරණින් මතු ලබන ඒ ආත්මය සඤ්ඤ සහිත යැයි කරුනු දහසයකින් විස්තර කරනවා. මරණින් මත්තෙහි ආත්මය සඤ්ඤ සහිත යැයි දෘෂ්ටිගතික වූ ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් මරණින් මතු ආත්මය සඤ්ඤ සහිත බවට දහසය කරුණකින් විස්තර කරන්නේ කුමකට පැමිණීමෙන් ද? කුමක් අරභයා ද?

රූපී අත්තා හෝති අරෝගෝ පරම්මරණා සඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. අරූපී අත්තා හෝති අරෝගෝ පරම්මරණා සඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. රූපී ච අරූපී ච අත්තා හෝති ..... නේව රූපී නාරූපී අත්තා හෝති ..... අන්තවා අත්තා හෝති ..... අනන්තවා අත්තා හෝති ..... අන්තවා ච අනන්තවා ච අත්තා හෝති ..... නේවන්තවා නානන්තවා ච අත්තා හෝති ..... ඒකත්තසඤ්ඤී අත්තා හෝති .....නානත්ත සඤ්ඤී අත්තා හෝති..... පරිත්තසඤ්ඤී අත්තා හෝති ..... අප්පමාණසඤ්ඤී අත්තා හෝති ..... ඒකන්තසුඛී අත්තා හෝති ..... ඒකන්තදුක්ඛී අත්තා හෝති ..... සුඛදුක්ඛී අත්තා හෝති ..... අදුක්ඛමසුඛී අත්තා හෝති අරෝගෝ පරම්මරණා සඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති.

කෙනෙක් උගන්වන්නේ "ආත්මය යනු රූපයෙන් හැදුනු දෙයක්. මරණින් මතු නිත්‍ය වෙනවා. සඤ්ඤාවකින් යුතුවෙනවා" කියල යි. තව කෙනෙක් විස්තර කරන්නේ "ආත්මය යනු අරූපී දෙයක් එය මරණින් මතු නිත්‍ය වෙනවා. සඤ්ඤා සහිත වෙනවා" කියල. "ආත්මය රූපී වගේ ම අරූපී දෙයක් ..... ආත්මය රූපීත් නොවෙයි අරූපීත් නොවෙයි ..... ආත්මය කෙළවරක් ඇති දෙයක් ..... ආත්මය අනන්ත දෙයක් ..... ආත්මය කෙළවරකුත් තිබෙන කෙළවරකුත් නැති දෙයක් ..... ආත්මය කෙළවරකුත් නැති අනන්තයකුත් නැති දෙයක් ..... ආත්මය එක ම සඤ්ඤාවකින් යුක්ත වූ දෙයක් ..... ආත්මය නානා සඤ්ඤාවලින් යුක්ත දෙයක් ..... ආත්මය කුඩා සඤ්ඤාවකින් යුක්ත දෙයක් ..... ආත්මය අප්‍රමාණ සඤ්ඤාවකින් යුක්ත දෙයක් .....ආත්මය ඒකාන්ත සැපයෙන් යුක්ත දෙයක් ..... ආත්මය ඒකාන්ත දුකින් යුතු දෙයක් ..... ආත්මය සැප දුක දෙකෙන් ම යුතු දෙයක්. ආත්මය දුක්සැප රහිත වූ දෙයක් මරණින් මතු නිත්‍ය වූ සඤ්ඤා සහිත වූ දෙයක් කියල.

74. ඉමේහි ඛෝ තේ භික්ඛවේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා උද්ධමාඝාතනා සඤ්ඤීනං අත්තානං පඤ්ඤාපෙන්ති සෝළසහි වත්ථූහි.

74. පින්වත් මහණෙනි, ඒ උද්ධමාඝාතනික සඤ්ඤීවාදී වූ ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් මරණින් මතු සඤ්ඤා සහිත ආත්මයක් තියෙනවා යන දෘෂ්ටිය ඉදිරිපත් කරන්නේ ඔය මතවාද දහසය තුළිනුයි.

යේහි කේචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා උද්ධමාඝාතනා සඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති සබ්බේ තේ ඉමේහේව සෝළසහි වත්ථූහි, ඒතේසං වා අඤ්ඤතරේන, නත්ථි ඉතෝ බහිද්ධා.

පින්වත් මහණෙනි, උද්ධමාඝාතනික සඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් මරණින් මතු සඤ්ඤා සහිත ආත්මයක් තිබෙන බවට මතවාද ඉදිරිපත් කරන්නේ යම් කරුණකින් නම්, ඒ සියළු දෙනා ම ඔය කරුණු දහසයෙන් තමයි කරුණු කියන්නේ. එක්කොට්ටායින් එක කරුණකින්. ඔයින් පිටස්තර කරුණු කියන්නේ නෑ.

75. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති: "ඉමේ දිට්ඨිට්ඨානා එවං ගහිතා එවං පරාමට්ඨා එවං ගතිකා භවිස්සන්ති එවං අභිසම්පරායා"ති.

තඤ්ච තථාගතෝ පජානාති. තතෝ ච උත්තරිතරං පජානාති. තඤ්ච පජානනං න පරාමසති. අපරාමසතෝ චස්ස ප-චත්තංයේව නිබ්බුති විදිතා. වේදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තෝ භික්ඛවේ තථාගතෝ.

75. පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ මේ කාරණය ගැන අවබෝධ කරගෙනයි ඉන්නේ "මේ දෘෂ්ටීන් මේ විදිහට ග්‍රහණය කරගත්තොත්, මේ විදිහට බැඳිල ගියොත් මේ මේ ආකාරයේ උපත් ලබාගෙන මරණින් මතු මේ මේ විදිහට පරලොව යාවී" කියලා තථාගතයන් වහන්සේ මෙයත් දන්නවා. මෙයට වඩා උත්තරීතර දේවලුත් දන්නවා. ඒවා දැනගත්තා කියල අමුතුවෙන් ඒවාට බැඳෙන්ට යන්නේ නෑ. ඒ දෘෂ්ටිවලට හසු නොවෙන නිසාම යි තමා තුළ ම නිවීගිය බව දැනගෙන තියෙන්නේ. ඒ වගේ ම පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ වේදනාවන් ගේ හටගැනීමත් නැතිවී යාමත් ආශ්වාදයත් ආදීනවයත් නිස්සරණයත් ඒ වූ ආකාරයෙන් ම අවබෝධ කරගෙන උපාදාන රහිතව කෙලෙසුන්ගෙන් නිදහස් වෙලයි ඉන්නේ.

76. ඉමේ ඛෝ තේ භික්ඛවේ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබෝධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවේදනීයා, යේ තථාගතෝ සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. යේහි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ තමන් තුළින් ම උපදවා ගන්නා ලද විශිෂ්ට ඤාණයෙන් අත්දැකල ලොවට පෙන්වා දෙන යම් යම් දේවල් ඇත්නම්, ඒ යම් යම් දේවල්වලින් තථාගතයන් වහන්සේ ගේ සත්‍ය වශයෙන් ම තිබෙන ගුණත් මනා කොට කියනවා නම්, කිව යුතු වූ ඉතා ගැඹුරු වූ දුකසේ දකින්න තියෙන, දුකසේ අවබෝධ කරන්න තියෙන, ශාන්ත වූ, ප්‍රණීත වූ, තර්කයට හසු නොවන, ඉතා සියුම් වූ, ඒ වගේම නුවණැතියන් විසින් ම දතයුත්තේ මේ දේවල් තමයි.

දුතියභාණවාරං
දෙවෙනි බණවර යි

77. සන්ති භික්ඛවේ ඒකේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා උද්ධමාඝාතනා අසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති අට්ඨහි

වත්ථූහි. තේ ච හොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා උද්ධමාඝාතනා අසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති අට්ඨහි වත්ථූහි?

77. පින්වත් මහණෙනි, මරණින් මතු සඤ්ඤා රහිත වූ ආත්මයක් තියෙනවා ය යන දෘෂ්ටියෙන් යුතු වූ උද්ධමාඝාතනික අසඤ්ඤීවාදී වූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් මතවාද අටක් මුල් කරගෙන මරණින් මතු සඤ්ඤා රහිත වූ ආත්මයකින් යුතුවෙනවා කියලා මතවාද පවසනවා. ඒ උද්ධමාඝතනික අසඤ්ඤීවාදී වූ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් මතවාද අටක් තුළින් මරණින් මතු සඤ්ඤා රහිත ආත්මයක් තිබෙන බවට කරුණු කියන්නේ කුමකට පැමිණීමෙන් ද? කුමක් අරභයා ද?

78. රූපී අත්තා හෝති අරෝගෝ පරම්මරණා අසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. අරූපී අත්තා හෝති ..... රූපී ච අරූපී ච අත්තා හෝති ..... නේව රූපී නාරූපී අත්තා හෝති ..... අන්තවා අත්තා හෝති ..... අනන්තවා අත්තා හෝති ..... අන්තවා ච අනන්තවා ච අත්තා හෝති ..... නේවන්තවා නානන්තවා අත්තා හෝති අරෝගෝ පරම්මරණා අසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති.

78. එක්කෙනෙක් මෙහෙම කියනවා. ආත්මය යනු රූපවත් දෙයක්. මරණින් මතු නිත්‍ය වූ සඤ්ඤා රහිත බවට පත්වෙනවා. ආත්මය යනු අරූපී දෙයක් ..... ආත්මය යනු රූපී වූත් අරූපීවුත් දෙයක් ..... ආත්මය යනු රූපීත් නොවන අරූපීත් නොවන දෙයක් ..... ආත්මය යනු කෙළවරක් ඇති දෙයක් ..... ආත්මය යනු කෙළවරක් නැති දෙයක් ..... ආත්මය යනු කෙළවරක් සහිත වූත් කෙළවරක් රහිත වූත් දෙයක් ..... ආත්මය යනු කෙළවරක් ඇත්තේත් නැති කෙළවරක් නැත්තේත් නැති දෙයක් මරණින් මතු නිත්‍ය වෙනවා. සඤ්ඤා රහිත වෙනවා.

79. ඉමේහි ඛෝ භික්ඛවේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා උද්ධමාඝාතනා අසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති අට්ඨහි වත්ථූහි. යේහි කේචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා උද්ධමාඝාතනා අසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති සබ්බේ තේ ඉමේහේව අට්ඨහි වත්ථූහි, ඒතේසං වා අඤ්ඤතරේන, නත්ථි ඉතෝ බහිද්ධා.

79. පින්වත් මහණෙනි, උද්ධමාඝාතනික අසඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් මරණින් මතු සඤ්ඤා රහිත වූ ආත්මයකින් යුතුවන බවට මතවාද ඉදිරිපත් කරන්නේ ඔය කරුණු අට මුල් කරගෙනයි. ඒ උද්ධමාඝාතනික අසඤ්ඤීවාදී වූ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් යම් මතවාද මුල්කොට මරණින් මතු සඤ්ඤා රහිත ආත්මයක් ඇති බවට කරුණු කියනවා නම්, ඒ සියළු දෙනා ම ඔය කරුණු අට තුළින් තමයි කියන්ට තියෙන්නේ. එක්කෝ ඒ කරුණුවලින් එකකින් තමයි. ඔයින් පිටස්තර කරුණකින් නම් නොවෙයි.

80. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති ..... යේහි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

80. පින්වත් මහණෙනි, ඔය කාරණය තථාගතයන් වහන්සේ හොඳින් දන්නවා ..... තථාගතයන් වහන්සේ ගේ තිබෙන්නා වූ ඒ ගුණ මනා කොට කියනු කැමති නම් ඒ විදිහට යි කිව යුත්තේ.

81. සන්ති භික්ඛවේ ඒකේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නේවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නේවසඤ්ඤීනාසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති අට්ඨහි වත්ථූහි. තේ ච හොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ උද්ධමාඝාතනිකා නේවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නේවසඤ්ඤීනාසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති අට්ඨහි වත්ථූහි?

81. පින්වත් මහණෙනි, මරණින් මතු සඤ්ඤාව ඇත්තේත් නැති නැත්තේත් නැති ආත්මයක් තිබේය යන දෘෂ්ටි ඇති උද්ධමාඝාතනික නේවසඤ්ඤීනාසඤ්ඤීවාදී ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් මරණින් මතු ආත්මය සඤ්ඤාව ඇත්තේත් නැති නැත්තේත් බවට පත්වන්නේය යන දෘෂ්ටිය කරුණු අටකින් ඉදිරිපත් කරනවා. ඒ උද්ධමාඝාතනික නේවසඤ්ඤීනාසඤ්ඤීවාදී භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් මරණින් මතු ආත්මය සඤ්ඤාව ඇත්තේත් නැති නැත්තේත් නැති බවට පත්වන්නේ යැ යි අට වැදෑරුම් දෘෂ්ටි ඇතිව කරුණු ඉදිරිපත් කරන්නේ කුමකට පැමිණීමෙන් ද? කුමක් අරභයා ද?

82. "රූපී අත්තා හෝති අරෝගෝ පරම්මරණා නේවසඤ්ඤීනාසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. අරූපී අත්තා හෝති අරෝගෝ පරම්මරණා නේවසඤ්ඤී-නාසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. රූපී ච අරූපී ච අත්තා හෝති අරෝගෝ

පරම්මරණා නේවසඤ්ඤීනාසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. නේව රූපී නාරූපී අත්තා හෝති අරෝගෝ පරම්මරණා නේවසඤ්ඤීනාසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. අන්තවා අත්තා හෝති අරෝගෝ පරම්මරණා නේවසඤ්ඤී-නාසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. අනන්තවා අත්තා හෝති අරෝගෝ පරම්මරණා නේවසඤ්ඤීනාසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. අන්තවා ච අනන්තවා ච අත්තා හෝති අරෝගෝ පරම්මරණා නේවසඤ්ඤීනාසඤ්ඤීති නං පඤ්ඤාපෙන්ති. නේවන්තවා නානන්තවා ච අත්තා හෝති අරෝගෝ පරම්මරණා නේවසඤ්ඤීනාසඤ්ඤී"ති නං පඤ්ඤාපෙන්ති.

82. කෙනෙක් මෙහෙම කියනවා. ආත්මය යනු රූපවත් දෙයක් මරණින් මතු නිත්‍ය වෙනවා. සඤ්ඤුව ඇත්තේත් නැති නැත්තේත් නැති බවට පත්වෙනවා කියල. තව කෙනෙක් මෙහෙම කියනවා. ආත්මය අරූපී දෙයක් මරණින් මතු ඇත්තේත් නැති නැත්තේත් නැති දෙයක් බවට පත්වෙනවා කියල. තවත් කෙනෙක් මෙහෙම කියනවා. ආත්මය රූපීවූත් අරූපීවූත් දෙයක්. මරණින් මතු සඤ්ඤුව ඇත්තේත් නැති නැත්තේත් නැති බවට පත්වෙනවා කියල. තවත් කෙනෙක් මෙහෙම කියනවා ආත්මය රූපීත් නොවෙයි අරූපීත් නොවෙයි මරණින් මතු නිත්‍ය වෙනවා. සඤ්ඤුව ඇත්තේත් නැති නැත්තේත් නැති බවට පත්වෙනවා කියලා. කෙනෙක් මෙහෙම කියනවා. ආත්මය යනු කෙළවරක් ඇති දෙයක් මරණින් මතු නිත්‍යය වෙනවා. සඤ්ඤුව ඇත්තේත් නැති නැත්තේත් නැති බවට පත්වෙනවා කියල. තව කෙනෙක් මෙහෙම කියනවා. ආත්මය කෙළවරක් නැති දෙයක් මරණින් මතු සඤ්ඤුව ඇත්තේත් නැති නැත්තේත් නැති දෙයක් බවට පත්වෙනවා කියල. තවත් කෙනෙක් මෙහෙම කියනවා. ආත්මය කෙළවරක් ඇත්තා වූත් කෙළවරක් නැත්තා වූත් දෙයක්. මරණින් මතු සඤ්ඤුව ඇත්තේත් නැති නැත්තේත් නැති බවට පත්වෙනවා කියල. තවත් කෙනෙක් මෙහෙම කියනවා ආත්මය කෙළවරක් ඇත්තේත් නොවෙයි කෙළවරක් නැත්තේත් නොවෙයි මරණින් මතු නිත්‍ය වෙනවා. සඤ්ඤුව ඇත්තේත් නැති නැත්තේත් නැති බවට පත්වෙනවා.

83. ඉමේහි ඛෝ භික්ඛවේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නේවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නේවසඤ්ඤීනාසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති අට්ඨහි වත්ථූහි. යේහි කේචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා උද්ධමාඝාතනිකා නේවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නේවසඤ්ඤීනාසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති සබ්බේ තේ ඉමේහේව අට්ඨහි වත්ථූහි, ඒතේසං වා අඤ්ඤතරේන, නත්ථි ඉතෝ බහිද්ධා.

83. පින්වත් මහණෙනි, ඒ උද්ධමාඝාතනික නේවසඤ්ඤීනාසඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් මරණින් මතු සඤ්ඤාව ඇත්තේත් නැති නැත්තේත් නැති ආත්මයක් ඇති බවට කරුණු කියන්නේ මේ දෘෂ්ටි අට තුළිනුයි. ඒ උද්ධමාඝාතනික නේවසඤ්ඤීනාසඤ්ඤීවාදී වූ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් මරණින් මතු සඤ්ඤාව ඇත්තේත් නැති නැත්තේත් නැති ආත්මයක් බවට පත්වෙනවා ය යන්න උගන්වන්නේ යම් කරුණකින් නම් ඔවුන් සියල්ලෝ ම ඔය කරුණු අටෙන් තමයි උගන්වන්න තියෙන්නේ. එක්කෝ ඔය කරුණු අටෙන් එකකින්. ඔයින් පිටස්තර දෙයක් නම් නෑ.

84. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති ..... යේහි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

84. පින්වත් මහණෙනි, ඔය කාරණය තථාගතයන් වහන්සේ හොඳින් දන්නවා ..... තථාගතයන් වහන්සේ ගේ තිබෙන්නා වූ ඒ ගුණ මනා කොට කියනු කැමති නම් ඒ විදිහට යි කිව යුත්තේ.

85. සන්ති භික්ඛවේ ඒකේ සමණබ්‍රාහ්මණා උ-ඡේදවාදා සතෝ සත්තස්ස උ-ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති සත්තහි වත්ථූහි. තේ ච හොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ උ-ඡේදවාදා සතෝ සත්තස්ස උ-ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති සත්තහි වත්ථූහි?

85. පින්වත් මහණෙනි, මරණින් මතු සත්වයා ගේ පැවැත්මක් නැත යන දෘෂ්ටිය දරණ උච්ඡේදවාදී ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. සිටින්නා වූ සත්වයා ගේ සම්පූර්ණ නො පැවැත්මත්, විනාශයත්, නැතිවීමත් මතවාද හතක් ඔස්සේ ඔවුන් උගන්වනවා. ඒ උච්ඡේදවාදී භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් සිටින්නා වූ සත්වයා ගේ සම්පූර්ණ නො පැවැත්මත්, විනාශයත්, නැතිවීමත් මතවාද හතක් ඔස්සේ උගන්වන්නේ කුමකට බැසගෙන ද? කුමක් අරභයා ද?

86. ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ඒවංවාදී හෝති ඒවංදිට්ඨී: "යතෝ ඛෝ භෝ අයං අත්තා රූපී චාතුම්මහාභූතිකෝ මාතාපෙ-ත්තිකසම්භවෝ කායස්ස භේදා උ-ච්ඡිජ්ජති විනස්සති න හෝති පරම්මරණා. එත්තාවතා ඛෝ භෝ අයං අත්තා සම්මා සමු-ච්ඡින්නෝ හෝතී"ති. ඉත්ථේකේ සතෝ සත්තස්ස උ-ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති.

86. පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ඉන්නවා. ඔහු මෙවැනි මතයක් පවසන මෙවැනි මතයක් දරණ කෙනෙක්. "භවත, මේ ආත්මය සතරමහා ධාතූන්ගෙන් හටගත් රූපමය එකක්. මව්පියන් නිසා හැදුණු දෙයක්. යම් කලෙක කය බිඳීයාමෙන් මරණින් මතු නොවෙයි ද, විනාශ වෙයි ද, භවත, එපමණකින් ම මේ ආත්මය මුළුමණින් ම විනාශ වෙලා යනවා" කියල. මේ විදිහට සිටින්නා වූ ම සත්වයන් ගේ මුළුමණින් ම නැතිවීමත්, විනාශවීමත්, නො පැවැත්මත් ඇතැම් උදවිය උගන්වනවා.

87. **තමඤ්ඤෝ එවමාහ: "අත්ථි ඛෝ භෝ ඒසෝ අත්තා යං ත්වං වදේසි, නේසෝ නත්ථීති වදාමි. නෝ ච ඛෝ භෝ අයං අත්තා එත්තාවතා සම්මා සමු-ඡින්නෝ හෝති. අත්ථි ඛෝ භෝ අඤ්ඤෝ අත්තා දිබ්බෝ රූපී කාමාවචරෝ කබලිංකාරාහාරභක්ඛෝ, තං ත්වං න ජානාසි න පස්සසි. තමහං ජානාමි පස්සාමි. සෝ ඛෝ භෝ අත්තා යතෝ කායස්ස භේදා උ-ජ්ජ්ජති විනස්සති න හෝති පරම්මරණා. එත්තාවතා ඛෝ භෝ අයං අත්තා සම්මා සමු-ඡින්නෝ හෝතීති. ඉත්ථේකේ සතෝ සත්තස්ස උ-ච්ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති.**

87. එතකොට ඔහුට වෙන කෙනෙක් මෙහෙම කියනවා. "භවත, ඔබ ඔය කියන ආත්මය තියෙනවා තමයි, ඒක නෑ කියන්නේ නෑ. එනමුත් භවත, ඔය ආත්මය එපමණකින් මුළුමණින් ම නැසී යන්නේ නෑ. භවත, වෙනත් දිව්‍ය වූ ආත්මයක් තියෙනවා, ඒකත් රූපවත්. කාමාවචර දෙව්ලොවටයි අයිති වන්නේ. ගොරෝසු ආහාර අනුභවයෙන් යුක්ත යි. ඒ ආත්මය ගැන ඔබ දන්නේ නෑ. දකින්නෙත් නෑ. නමුත් ඒ ගැන මං දන්නවා වගේ ම දකිනවා. භවත, ඒ දිව්‍ය ආත්මය නම් කය බිඳී මරණින් මතු නැසී යනවා, විනාශ වෙනවා, පවතින්නේ නෑ. භවත, එපමණකින් ම යි මේ ආත්මය මුළුමණින් ම විනාශ වෙන්නේ" කියල මේ විදිහට සිටින්නා වූ ම සත්වයන්ගේ මුළුමණින් ම නැතිවීමත් විනාශවීමත්, නො පැවැත්මත්, ඇතැම් උදවිය උගන්වනවා.

88. **තමඤ්ඤෝ එවමාහ: අත්ථි ඛෝ භෝ ඒසෝ අත්තා යං ත්වං වදේසි. න සෝ නත්ථීති වදාමි. නෝ ච ඛෝ භෝ අයං අත්තා එත්තාවතා සම්මා සමු-ඡින්නෝ හෝති. අත්ථි ඛෝ භෝ අඤ්ඤෝ අත්තා දිබ්බෝ රූපී මනෝමයෝ සබ්බංගප-චංගි අහීනින්ද්‍රියෝ. තං ත්වං න ජානාසි න පස්සසි. තමහං ජානාමි පස්සාමි. සෝ ඛෝ භෝ අත්තා යතෝ කායස්ස භේදා උ-ජ්ජ්ජති විනස්සති න හෝති පරම්මරණා. එත්තාවතා ඛෝ භෝ අයං අත්තා**

සම්මා සමු-ජින්නෝ හෝතී"ති. ඉත්ථේකේ සතෝ සත්තස්ස උ-ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති.

88. එතකොට ඔහුට වෙන කෙනෙක් මෙහෙම කියනවා. "භවත, ඔබ ඔය කියන ආත්මය තියෙනවා තමයි, ඒක නෑ කියන්නේ නෑ. එනමුත් භවත ඔය ආත්මය එපමණකින් මුළුමණින් ම නැසී යන්නේ නෑ. භවත, වෙනත් දිව්‍ය වූ ආත්මයක් තියෙනවා, ඒකත් සතර මහා ධාතූන්ගෙන් යුක්ත තමයි. නමුත් මනෝමය යි. ඒ වගේ ම සියළු අභපසභ තියෙනවා. ඉඳුරන් හොඳින් තියෙනවා. ඔබ ඒ ආත්මය දන්නේ නෑ. දකින්නෙත් නෑ. නමුත් මං ඒ ගැන දන්නවා. දකිනවා. භවත, ඒ මනෝමය (මනසින් හටගත්) ආත්මය නම් කය බිඳී මරණින් මතු නැසී යනවා, විනාශ වෙනවා, පවතින්නේ නෑ. භවත, එපමණකින් ම යි මේ ආත්මය මුළුමණින් ම විනාශ වෙන්නේ" කියල මේ විදිහට සිටින්නා වූ ම සත්වයන්ගේ මුළුමණින් ම නැතිවීමත් විනාශවීමත් නො පැවැත්මත් ඇතැම් උදවිය උගන්වනවා.

89. තමඤ්ඤෝ එවමාහ: අත්ථි ඛෝ හෝ එසෝ අත්තා යං ත්වං වදේසි. නේසෝ නත්ථීති වදාමි. නෝ ච ඛෝ හෝ අයං අත්තා එත්තාවතා සම්මා සමු-ජින්නෝ හෝති. අත්ථි ඛෝ හෝ අඤ්ඤෝ අත්තා සබ්බසෝ රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තෝ ආකාසෝති ආකාසානඤ්චායතනූපගෝ. තං ත්වං න ජානාසි න පස්සසි. තමහං ජානාමි පස්සාමි. සෝ ඛෝ හෝ අත්තා යතෝ කායස්ස භේදා උ-ජ්ජ්ජති විනස්සති න හෝති පරම්මරණා. එත්තාවතා ඛෝ හෝ අයං අත්තා සම්මා සමු-ජින්නෝ හෝතීති. ඉත්ථේකේ සතෝ සත්තස්ස උ-ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති.

89. එතකොට තව කෙනෙක් ඔහුට මෙහෙම කියනවා, "භවත, යම් ආත්මයක් ගැන ඔබ කියනවා නම්, ඒක තියෙනවා තමයි. ඒක නැතෙයි කියන්නේ නෑ. නමුත් භවත, ඔය ආත්මය එපමණකින් ම මුළුමණින් ම නැසිලා යන්නේ නෑ. භවත, වෙනත් ආත්මයකුත් තියෙනවා. සියළු රූප සඤ්ඤාවන් ඉක්මවා ගිහින් ගොරෝසු සඤ්ඤාවන් නැතිවීමෙන් නානා සඤ්ඤාවන් මෙනෙහි නො කර අනන්ත ආකාසය කියල මෙනෙහි කිරීමෙන් ආකාසානඤ්චායතනයට පැමිණෙනවා. ඔබ මේ ගැන දන්නෙත් නෑ. දකින්නෙත් නෑ. නමුත් මං මේ ගැන දන්නවා, දකිනවා. භවත, ඒ ආත්මය නම් කය බිඳී මරණින් මතු නැසී යනවා, විනාශ වෙනවා, පවතින්නේ නෑ. භවත, එපමණකින් ම යි මේ ආත්මය මුළුමණින් ම විනාශ වෙන්නේ" කියල

මේ විදිහට සිටින්නා වූ ම සත්වයන්ගේ මුළුමණින් ම නැතිවීමත්, විනාශවීමත්, නො පැවැත්මත් ඇතැම් උදවිය උගන්වනවා.

90. තමඤ්ඤෝ එවමාහ: අත්ථි ඛෝ භෝ එසෝ අත්තා යං ත්වං වදේසි. නේසෝ නත්ථීති වදාමි. නෝ ච ඛෝ භෝ අයං අත්තා එත්තාවතා සම්මා සමු-ඡින්නෝ හෝති. අත්ථි ඛෝ භෝ අඤ්ඤෝ අත්තා සබ්බසෝ ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණ-ඤ්චායතනූපගෝ. තං ත්වං න ජානාසි න පස්සසි. තමහං ජානාමි පස්සාමි. සෝ ඛෝ භෝ අත්තා යතෝ කායස්ස භේදා උ-ජ්ජ්ජති විනස්සති න හෝති පරම්මරණා. එත්තාවතා ඛෝ භෝ අයං අත්තා සම්මා සමු-ඡින්නෝ හෝතීති. ඉත්ථේකේ සතෝ සත්තස්ස උ-ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති.

90. එතකොට තව කෙනෙක් ඔහුට මෙහෙම කියනවා, "භවත, යම් ආත්මයක් ගැන ඔබ කියනවා නම්, ඒක තියෙනවා තමයි. ඒක නැතෙයි කියන්නේ නෑ. නමුත් භවත, ඔය ආත්මය එපමණකින් ම මුළුමණින් ම නැසිලා යන්නේ නෑ. භවත, වෙනත් ආත්මයකුත් තියෙනවා. සියළු ආකාසානඤ්චායතනය ඉක්මවා යෑමෙන් අනන්ත වූ විඤ්ඤාණය කියල අරූප ධ්‍යාන වැඩීමෙන් විඤ්ඤාණඤ්චායතනයට පැමිණෙනවා. ඔබ මේ ගැන දන්නෙත් නෑ. දකින්නෙත් නෑ. නමුත් මං මේ ගැන දන්නවා, දකිනවා. ඒ ආත්මය නම් කය බිඳී මරණින් මතු නැසීයනවා, විනාශ වෙනවා, පවතින්නේ නෑ. භවත, එපමණකින් ම යි මේ ආත්මය මුළුමණින් ම විනාශ වෙන්නේ" කියල මේ විදිහට සිටින්නා වූ ම සත්වයන්ගේ මුළුමණින් ම නැතිවීමත්, විනාශවීමත්, නො පැවැත්මත් ඇතැම් උදවිය උගන්වනවා.

91. තමඤ්ඤෝ එවමාහ: අත්ථි ඛෝ භෝ එසෝ අත්තා යං ත්වං වදේසි. නේසෝ නත්ථීති වදාමි. නෝ ච ඛෝ භෝ අයං අත්තා එත්තාවතා සම්මා සමු-ඡින්නෝ හෝති. අත්ථි ඛෝ භෝ අඤ්ඤෝ අත්තා සබ්බසෝ විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති අකිඤ්චඤ්ඤා-යතනූපගෝ. තං ත්වං න ජානාසි න පස්සසි. තමහං ජානාමි පස්සාමි. සෝ ඛෝ භෝ අත්තා යතෝ කායස්ස භේදා උ-ජ්ජ්ජති විනස්සති න හෝති පරම්මරණා. එත්තාවතා ඛෝ භෝ අයං අත්තා සම්මා සමු-ඡින්නෝ හෝතීති. ඉත්ථේකේ සතෝ සත්තස්ස උ-ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති.

91. එතකොට තවකෙනෙක් ඔහුට මෙහෙම කියනවා, "භවත, යම් ආත්මයක් ගැන ඔබ කියනවා නම්, ඒක තියෙනවා තමයි. ඒක නැතෙයි කියන්නේ නෑ. නමුත් භවත, ඔය ආත්මය එපමණකින් ම මුළුමණින්ම නැසිලා

යන්නේ නෑ. භවත, වෙනත් ආත්මයකුත් තියෙනවා. සියළු විඤ්ඤාණ-ඤ්චායතනය ඉක්මවා යෑමෙන් "කිසිවක් නැත" කියල අරූප ධ්‍යාන වැඩීමෙන් ආකිඤ්චඤ්ඤායතනයට පැමිණෙනවා. ඔබ මේ ගැන දන්නෙත් නෑ, දකින්නෙත් නෑ. නමුත් මං මේ ගැන දන්නවා, දකිනවා. භවත, ඒ ආත්මය නම් කය බිඳී මරණින් මතු නැසීයනවා, විනාශවෙනවා, පවතින්නේ නෑ. භවත, එපමණකින් ම යි මේ ආත්මය මුළුමණින් ම විනාශ වෙන්නේ" කියල මේ විදිහට සිටින්නා වූ ම සත්වයන්ගේ මුළුමණින්ම නැතිවීමත්, විනාශ වීමත්, නො පැවැත්මත් ඇතැම් උදවිය උගන්වනවා.

92. තමඤ්ඤෝ එවමාහ: අත්ථි ඛෝ හෝ ඒසෝ අත්තා යං ත්වං වදේසි. නේසෝ නත්ථීති වදාමි. නෝ ච ඛෝ හෝ අයං අත්තා එත්තාවතා සම්මා සමු-ජින්නෝ හෝති. අත්ථි ඛෝ හෝ අඤ්ඤෝ අත්තා සබ්බසෝ ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම සන්තමේතං පණීතමේතන්ති නේව-සඤ්ඤානාසඤ්ඤායතනූපගෝ. තං ත්වං න ජානාසි න පස්සසි. තමහං ජානාමි පස්සාමි. සෝ ඛෝ හෝ අත්තා යතෝ කායස්ස භේදා උ-ජ්ජ්ජති විනස්සති න හෝති පරම්මරණා. එත්තාවතා ඛෝ හෝ අයං අත්තා සම්මා සමු-ජින්නෝ හෝතීති. ඉත්ථේකේ සතෝ සත්තස්ස උ-ච්ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති.

92. එතකොට තවකෙනෙක් ඔහුට මෙහෙම කියනවා, "භවත, යම් ආත්මයක් ගැන ඔබ කියනවා නම්, ඒක තියෙනවා තමයි. ඒක නැතෙයි කියන්නේ නෑ. නමුත් භවත, ඔය ආත්මය එපමණකින්ම මුළුමණින් ම නැසිලා යන්නේ නෑ. භවත, වෙනත් ආත්මයකුත් තියෙනවා. සියළු ආකිඤ්ච-ඤ්ඤායතනය ඉක්මවා යෑමෙන් "මෙයයි ශාන්ත, මෙයයි ප්‍රණීත" කියල අරූප ධ්‍යාන වැඩීමෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණෙනවා. ඔබ මේ ගැන දන්නෙත් නෑ, දකින්නෙත් නෑ. නමුත් මං මේ ගැන දන්නවා, දකිනවා. භවත, ඒ ආත්මය නම් කය බිඳී මරණින් මතු නැසී යනවා, විනාශවෙනවා, පවතින්නේ නෑ. භවත, එපමණකින් ම යි මේ ආත්මය මුළුමණින් ම විනාශ වෙන්නේ" කියල මේ විදිහට සිටින්නා වූ ම සත්වයන්ගේ මුළුමණින්ම නැතිවීමත්, විනාශවීමත්, නො පැවැත්මත් ඇතැම් උදවිය උගන්වනවා.

93. ඉමේහි ඛෝ තේ භික්ඛවේ සමණබ්‍රාහ්මණා උ-ච්ඡේදවාදා සතෝ සත්තස්ස උ-ච්ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති සත්තහි වත්ථූහි. යේ හි කේචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා උ-ච්ඡේදවාදා සතෝ සත්තස්ස උ-ච්ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති. සබ්බේ තේ ඉමේහේව සත්තහි වත්ථූහි, ඒතේසං වා අඤ්ඤතරේන, නත්ථි ඉතෝ බහිද්ධා.

93. පින්වත් මහණෙනි, ඒ උච්ඡේදවාදී ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඔය මතවාද හතෙන් තමයි සිටින්නා වූ ම සත්වයා ගේ නැසීයාමත්, විනාශ වීමත්, නොපැවැත්මත් උගන්වන්නේ. පින්වත් මහණෙනි, ඒ උච්ඡේදවාදී ශ්‍රමණ බ්‍රාහ්මණයන් සිටින්නා වූ ම සත්වයා ගේ නැසී යාමත්, විනාශ වීමත්, නොපැවැත්මත් උගන්වන්නේ යම් මතවාදවලින් නම් ඔවුන් සියළු දෙනා ම මේ මතවාදවලින් තමයි කියාදෙන්නේ. එහෙම නැත්නම් මේවායින් එකකිනුයි. මෙයින් බාහිර දෙයක් නම් නෑ.

94. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති ..... යේහි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

94. පින්වත් මහණෙනි, ඔය කාරණය තථාගතයන් වහන්සේ හොඳින් දන්නවා ..... තථාගතයන් වහන්සේ ගේ තිබෙන්නා වූ ඒ ගුණ මනා කොට කියනු කැමති නම් ඒ විදිහට යි කිවයුත්තේ.

95. සන්ති භික්ඛවේ ඒකේ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මනිබ්බානවාදා සතෝ සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති පඤ්චහි වත්ථූහි. තේ ච භොන්තෝ සමණබ්‍රාහ්මණා කිමාගම්ම කිමාරබ්භ දිට්ඨධම්ම-නිබ්බානවාදා සතෝ සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති පඤ්චහි වත්ථූහි?

95. පින්වත් මහණෙනි, මේ ජීවිතයේ දී ම නිවන අත්දකිනවා ය යි මතවාද කියන **දිට්ඨධම්ම නිබ්බානවාදී** ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් සිටින්නා වූ ම සත්වයන් ගේ උතුම් දිට්ඨධම්ම නිබ්බානය මතවාද පහක් ඔස්සේ උගන්වනවා. ඒ දිට්ඨධම්ම නිබ්බානවාදී වූ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් සිටින්නා වූ ම සත්වයා හට මෙලොවදී ම දැක්ක හැකි උතුම් නිවන යැයි කියමින් මතවාද පහක් ඔස්සේ උගන්වන්නේ කුමකට බැස ගෙන ද? කුමක් අරභයා ද?

96. ඉධ භික්ඛවේ ඒක-චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ඒවංවාදී හෝති ඒවංදිට්ඨී: යතෝ ඛෝ භෝ අයං අත්තා පඤ්චහි කාමගුණේහි සමප්පිතෝ සමංගීභූතෝ පරිචාරේති, එත්තාවතා ඛෝ භෝ අයං අත්තා පරමදිට්ඨධම්ම-නිබ්බානං පත්තෝ හෝතීති. ඉත්ථේකේ සතෝ සත්තස්ස පරමදිට්ඨධම්ම-නිබ්බානං පඤ්ඤාපෙන්ති.

96. පින්වත් මහණෙනි, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් ඉන්නවා. ඔවුන් මෙවැනි මතයක් පවසන්නේ. "භවත, යම් කලෙක මේ ආත්මය රූප ශබ්දාදී පංච කාම ගුණයෙන් පිනවමින් එහිම ඇලිලා, එහිම සතුටු කරනවා ද, භවත, එපමණකින් ම යි මේ ආත්මය මෙලොව දැක්ක යුතු උතුම් නිවනට පත්වෙන්නේ" කියලා. ඇතැම් කෙනෙක් ඔය විදිහට සිටින්නා වූ සත්වයා හට මෙලොව දී දැක්ක යුතු උතුම් නිවන කියලා උගන්වනවා.

97. තමඤ්ඤෝ එවමාහ: අත්ථි ඛෝ භෝ එසෝ අත්තා යං ත්වං වදේසි. නේසෝ නත්ථීති වදාමි. නෝ ච ඛෝ භෝ අයං අත්තා එත්තාවතා පරම-දිට්ඨධම්මනිබ්බානං පත්තෝ හෝති. තං කිස්ස හේතු? කාමා හි භෝ අනි-චා දුක්ඛා විපරිණාමධම්මා තේසං විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සෝකපරිදේවදුක්ඛදෝමනස්සුපායාසා යතෝ ඛෝ භෝ අයං අත්තා විවි-ච-ව කාමේහි විවි-ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, එත්තාවතා ඛෝ භෝ අයං අත්තා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තෝ හෝතීති. ඉත්ථේකේ සතෝ සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති.

97. එතකොට තවකෙනෙක් ඔහුට මෙහෙම කියනවා. "භවත, ඔබ ඔය කියන ආත්මය තියෙනවා තමයි. ඒක මං නැතෙයි කියන්නේ නෑ. නමුත් භවත, මේ ආත්මය එපමණකින් ම මේ ජීවිතය තුළ දී උතුම් නිවනට පත්වෙන්නේ නෑ. ඒකට හේතුව කුමක් ද? භවත, කාමයන් කියන්නේ අනිත්‍ය දෙයක්. දුක් දෙයක්. වෙනස්වන දහමට අයත් දෙයක්. ඔය කාමයන් ගේ විපරිණාමයෙන්, වෙනස්වීමෙන් තමයි සෝක, වැළපීම්, දුක්දොම්නස්, උපායාස හටගන්නේ. භවත, යම් කලෙක මේ ආත්මය කාමයන්ගෙන් වෙන්වෙලා අකුසල් දහමින් වෙන්වෙලා විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් හටගත් ප්‍රීති සුඛය ඇති පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා නම් භවත, අන්න එපමණකින් තමයි මේ ආත්මය මේ ජීවිතයේ දී ම උතුම් නිවනට පත්වන්නේ" කියලා. ඇතැම් කෙනෙක් ඔය විදිහට සිටින්නා වූ සත්වයා හට මෙලොව දී දැක්ක යුතු උතුම් නිවන වශයෙන් උගන්වනවා.

98. තමඤ්ඤෝ එවමාහ: අත්ථි ඛෝ භෝ එසෝ අත්තා යං ත්වං වදේසි. නේසෝ නත්ථීති වදාමි. නෝ ච ඛෝ භෝ අයං අත්තා එත්තාවතා පරම-දිට්ඨධම්මනිබ්බානං පත්තෝ හෝති. තං කිස්ස හේතු? යදේව තත්ථ විතක්කීතං විචාරිතං ඒතේනේතං විළාරිකං අක්ඛායති. යතෝ ඛෝ භෝ අයං අත්තා විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං ච-තසෝ ඒකෝ-

දිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, එත්තාවතා ඛෝ භෝ අයං අත්තා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තෝ හෝතීති. ඉත්ථේකේ සතෝ සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති.

98. එතකොට තව කෙනෙක් ඔහුට මෙහෙම කියනවා. "භවත, ඔබ ඔය කියන ආත්මය තියෙනවා තමයි. ඒක මං නැතෙයි කියන්නේ නෑ. නමුත් භවත, මේ ආත්මය එපමණකින් ම මේ ජීවිතය තුළ දී උතුම් නිවනට පත්වෙන්නේ නෑ. ඒකට හේතුව කුමක් ද? භවත, ඔය විතර්ක විචාර කියන දේ ගැන අපට වැටහෙන්නේ ගොරෝසු දේවල් හැටියට යි. එනිසා භවත, යම් කලෙක මේ ආත්මය විතර්ක විචාර සංසිඳුවාගෙන, සිත තුළ ඇතිකර ගන්නා වූ පැහැදීමෙන් යුතුව, සිතේ එකඟබව ඇතිව සමාධියෙන් හටගත් ප්‍රීති සුඛය ඇති දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා නම් භවත, අන්න එපමණකින් තමයි මේ ආත්මය මේ ජීවිතයේ දී ම උතුම් නිවනට පත්වන්නේ" කියලා. ඇතැම් කෙනෙක් ඔය විදිහට සිටින්නා වූ සත්වයා හට මෙලොව දී දැක්ක යුතු උතුම් නිවන වශයෙන් උගන්වනවා.

99. තමඤ්ඤෝ ඒවමාහ: අත්ථි ඛෝ භෝ ඒසෝ අත්තා යං ත්වං වදේසි. නේසෝ නත්ථීති වදාමි. නෝ ච ඛෝ භෝ අයං අත්තා එත්තාවතා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තෝ හෝති. තං කිස්ස හේතු? යදේවා තත්ථ පීතිගතං ෙතසෝ උබ්බිල්ලාවිතත්තං ඒතේනේතං විළාරිකං අක්ඛායති. යතෝ ඛෝ භෝ අයං අත්තා පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති සතෝ ච සම්පජානෝ සුඛං ච කායේන පටිසංවේදේති, යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති, එත්තාවතා ඛෝ භෝ අයං අත්තා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තෝ හෝතීති. ඉත්ථේකේ සතෝ සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති.

99. එතකොට තවකෙනෙක් ඔහුට මෙහෙම කියනවා. "භවත, ඔබ ඔය කියන ආත්මය තියෙනවා තමයි. ඒක මං නැතෙයි කියන්නේ නෑ. නමුත් භවත, මේ ආත්මය එපමණකින් ම මේ ජීවිතය තුළ දී උතුම් නිවනට පත්වෙන්නේ නෑ. ඒකට හේතුව කුමක් ද? භවත, ඔය සිතේ ඇති වෙන්නා වූ ප්‍රීති සහගත බවක් ඇත් ද, ඒකෙන් සිත ඉල්පී යනවා. ඒ ගැන අපට වැටහෙන්නේ ගොරෝසු දේ හැටියට යි. එනිසා භවත, යම් කලෙක මේ ආත්මය ප්‍රීතියට ද නොඇල්මෙන් උපේක්ෂා සහගතව වාසය කරනවා නම්, සිහි නුවණින් යුතුව කයෙනුත් සැපයක් විඳිනවා නම්, ආර්යයන් වහන්සේලා උපේක්ෂා සහගතව

සිහි ඇතිව සුවසේ ඉන්නවා කියා යම් සමාධියකට කියයි ද, අන්න ඒ තුන්වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා නම් භවත, අන්න එපමණකින් තමයි මේ ආත්මය මේ ජීවිතයේ දී ම උතුම් නිවනට පත්වන්නේ" කියලා. ඇතැම් කෙනෙක් ඔය විදිහට සිටින්නා වූ සත්වයා හට මෙලොව දී දැක්ක යුතු උතුම් නිවන වශයෙන් උගන්වනවා.

100. තමඤ්ඤෝ එවමාහ: අත්ථි ඛෝ භෝ ඒසෝ අත්තා යං ත්වං වදේසි. නේසෝ නත්ථීති වදාමි. නෝ ච ඛෝ භෝ අයං අත්තා එත්තාවතා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තෝ හෝති. තං කිස්ස හේතු? යදේවා තත්ථ සුඛන්ති ෙතසෝ ආභෝගෝ ඒතේනේතං විළාරිකං අක්ඛායති. යතෝ ඛෝ භෝ අයං අත්තා සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බේව-සෝමනස්සදෝමනස්සානං අත්ථගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති, එත්තාවතා ඛෝ භෝ අයං අත්තා පරමදිට්ඨධම්මනිබ්බානං පත්තෝ හෝතීති. ඉත්ථේකේ සතෝ සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති.

100. එතකොට තව කෙනෙක් ඔහුට මෙහෙම කියනවා. "භවත, ඔබ ඔය කියන ආත්මය තියෙනවා තමයි. ඒක මං නැතෙයි කියන්නේ නෑ. නමුත් භවත, මේ ආත්මය එපමණකින් ම මේ ජීවිතය තුළ දී උතුම් නිවනට පත්වෙන්නේ නෑ. ඒකට හේතුව කුමක් ද? භවත, ඔය සිතේ ඇතිවෙන්නා වූ සැපයක් ඇත් ද, ඒ කෙරෙහි සිත නැමී යනවා. ඒ ගැන අපට වැටහෙන්නේ ගොරෝසු දේ හැටියට යි. එ නිසා භවත, යම් කලෙක මේ ආත්මය සැපය ද ප්‍රහාණය කිරීමෙන් දුක ද ප්‍රහාණය කිරීමෙන් කලින් ම සොම්නස් දොම්නස් නැති වීමෙන් දුක් සැප රහිත වූ උපේක්ෂා සහගතව පාරිශුද්ධ සතියෙන් යුතුව හතර වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා නම් භවත, අන්න එපමණකින් තමයි මේ ආත්මය මේ ජීවිතයේ දී ම උතුම් නිවනට පත්වන්නේ" කියලා. ඇතැම් කෙනෙක් ඔය විදිහට සිටින්නා වූ සත්වයා හට මෙලොව දී දැක්ක යුතු උතුම් නිවන වශයෙන් උගන්වනවා.

101. ඉමේහි ඛෝ තේ භික්ඛවේ ඒකේ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්ම-නිබ්බානවාදා සතෝ සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති පඤ්චහි වත්ථූහි. යේ හි කේචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා දිට්ඨධම්මනිබ්බානවාදා සතෝ සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති, සබ්බේ තේ ඉමේහේව පඤ්චහි වත්ථූහි, ඒතේසං අඤ්ඤතරේන. නත්ථි ඉතෝ බහිද්ධා.

101. පින්වත් මහණෙනි, දිට්ඨධම්මනිබ්බානවාදී වූ ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් සිටින්නා වූ ම සත්වයා ගේ මෙලොව දැක්ක යුතු උතුම් නිවන යැ යි උගන්වන්නේ මේ මතවාද පහ තුළින් තමයි. පින්වත් මහණෙනි, ඒ දිට්ඨධම්මනිබ්බානවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් සිටින්නා වූ ම සත්වයා ගේ මෙලොව දැක්ක යුතු නිවන යැයි කියා යම් කරුණුවලින් උගන්වනවා නම් ඒ සෑම කෙනෙක් ම උගන්වන්නේ ඔය කරුණු පහ තුළින් තමයි, එක්කොා මේවායින් එකකිනුයි. මෙයින් බැහැර මොකවත් නෑ.

102. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති ..... යේහි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

පින්වත් මහණෙනි, ඔය කාරණය තථාගතයන් වහන්සේ හොඳින් දන්නවා ..... තථාගතයන් වහන්සේ ගේ තිබෙන්නා වූ ඒ ගුණ මනා කොට කියනු කැමති නම් ඒ විදිහට යි කිවයුත්තේ.

103. ඉමේහි ඛෝ තේ භික්ඛවේ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනෝ අපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුචත්තාරීසාය වත්ථූහි. යේ හි කේචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනෝ අපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති, සබ්බේ තේ ඉමේහේව චතුචත්තාරීසාය වත්ථූහි, ඒතේසං වා අඤ්ඤතරේන, නත්ථි ඉතෝ බහිද්ධා.

103. පින්වත් මහණෙනි, ඒ අනාගතය අරභයා කල්පිත ගොඩනගන අනාගතය අරභයා නොයෙකුත් දෘෂ්ටි ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයන් අනාගතය අරභයා නොයෙක් ආකාරයේ ආකල්ප දෘෂ්ටි මතවාද ඉදිරිපත් කරන්නේ ඔය හතළිස් හතර ආකාරයෙන් තමයි. පින්වත් මහණෙනි, අනාගත කෙළවර ගැන කල්පිත ගොඩනගන අනාගත අන්තයේ දෘෂ්ටිගත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් අනාගතය ගැන නොයෙක් ආකාරයේ කල්පිත මතවාද ඉදිරිපත් කරන්නේ යම් දේවල්වලින් නම් ඒ සියල්ලෝ ම මේ මතවාද හතළිස් හතර තුළින් තමයි උගන්වන්නේ. එක්කෝ මේවායින් එක්තරා මතයකිනුයි. මේවායින් බැහැරව මතයක් නෑ.

104. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති ..... යේහි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.

104. පින්වත් මහණෙනි, ඔය කාරණය තථාගතයන් වහන්සේ හොඳින් දන්නවා ..... තථාගතයන් වහන්සේ ගේ තිබෙන්නා වූ ඒ ගුණ මනා කොට කියනු කැමති නම් ඒ විදිහට යි කිවයුත්තේ.

105. ඉමේහි ඛෝ තේ භික්ඛවේ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තානුදිට්ඨිනෝ පුබ්බන්තාපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති ද්වාසට්ඨියා වත්ථූහි. යේ හි කේචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච පුබ්බාන්තාපරන්තානුදිට්ඨිනෝ පුබ්බන්තාපරන්තං ආරබ්භ අනේක-විහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති, සබ්බේ තේ ඉමේහේව ද්වාසට්ඨියා වත්ථූහි, ඒතේසං වා අඤ්ඤතරේන, නත්ථි ඉතෝ බහිද්ධා.

105. පින්වත් මහණෙනි, අතීත ජීවිතයේ කෙළවර ගැන කල්පිත ගොඩනඟන අනාගතයේ ජීවිතයේ කෙළවර ගැන කල්පිත ගොඩනඟන, අතීතයේත් අනාගතයේත් කල්පිත ගොඩනගන අතීත අනාගත කෙළවර ගැන දෘෂ්ටි ඇති කරගත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් අතීතයේ හා අනාගතයේ කෙළවර අරභයා අනේකවිධ වූ අදහස් මතවාද ආකල්ප දෘෂ්ටි ඉදිරිපත් කරන්නේ ඔය මතවාද හැටදෙකෙන් තමයි. පින්වත් මහණෙනි, අතීත ජීවිතයේ කෙළවර ගැන කල්පිත ගොඩනඟන අනාගතයේ ජීවිතයේ කෙළවර ගැන කල්පිත ගොඩනඟන, අතීතයේත් අනාගතයේත් කල්පිත ගොඩනගන අතීත අනාගත කෙළවර ගැන දෘෂ්ටි ඇති කරගත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් අතීතයේ හා අනාගතයේ කෙළවර අරභයා අනේකවිධ වූ අදහස් මතවාද ආකල්ප දෘෂ්ටි ඉදිරිපත් කරන්නේ යම් මතවලින් නම් ඒ සියල්ලෝ ම ඔය මත හැටදෙකෙන් තමයි කරුණු කියන්නේ. එක්කොට මේවායින් එක මතයකිනුයි. මෙයින් පිටස්තර වූ කරුණක් නම් නෑ.

106. තයිදං භික්ඛවේ තථාගතෝ පජානාති: "ඉමේ දිට්ඨිට්ඨානා ඒවං ගහිතා ඒවං පරාමට්ඨා ඒවංගතිකා භවිස්සන්ති ඒවං අභිසම්පරායා"ති. තඤ්ච තථාගතෝ පජානාති. තතෝ ච උත්තරිතරං පජානාති. තඤ්ච පජානනං න පරාමසති. අපරාමසතෝ චස්ස ප-චත්තංයේව නිබ්බුති විදිතා. වේදනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාදා විමුත්තෝ භික්ඛවේ තථාගතෝ.

106. පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ මේ කාරණය ගැන අවබෝධ කරගෙනයි ඉන්නේ "මේ දෘෂ්ටීන් මේ විදහට ග්‍රහණය කරගත්තොත්, මේ විදිහට බැඳිල ගියොත් මේ මේ ආකාරයේ උපත් ලබාගෙන මරණින් මතු මේ මේ විදිහට පරලොව යාවී" කියලා තථාගතයන් වහන්සේ මෙයත් දන්නවා. මෙයට වඩා උත්තරීතර දේවත් දන්නවා. ඒවා දැනගත්තා කියල අමුතුවෙන් ඒවාට බැඳෙන්ට යන්නේ නෑ. ඒ දෘෂ්ටිවලට හසු නොවෙන නිසාම යි තමා තුළ ම නිවීගිය බව දැන ගෙන ඉන්නේ. ඒ වගේ ම පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ වේදනාවන් ගේ හටගැනීමත්, නැතිවී යාමත්, ආශ්වාදයත්, ආදීනවයත්, නිස්සරණයත් ඒ වූ ආකාරයෙන් ම අවබෝධ කරගෙන උපාදාන රහිතව කෙලෙසුන්ගෙන් නිදහස් වෙලයි ඉන්නේ.

107. **ඉමේ ඛෝ තේ භික්ඛවේ ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබෝධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිතවේදනීයා, යේ තථාගතෝ සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. යේහි තථාගතස්ස යථාභූ-චං වණ්ණං සම්මා වදමානා වදෙය්‍යුං.**

107. පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ තමන් තුළින් ම උපදවා ගන්නා ලද විශිෂ්ට ඥාණයෙන් අත්දැකල ලොවට පෙන්වා දෙන යම් යම් දේවල් ඇත්නම්, ඒ යම් යම් දේවල්වලින් තථාගතයන් වහන්සේ ගේ සත්‍ය වශයෙන් ම තිබෙන ගුණත් මනා කොට කියනවා නම්, කිව යුතු වූ ඉතා ගැඹුරු වූ දුකසේ දකින්න තියෙන, දුකසේ අවබෝධ කරන්න තියෙන, ශාන්ත වූ, ප්‍රණීත වූ, තර්කයට හසු නොවන, ඉතා සියුම් වූ, ඒ වගේම නුවණැතියන් විසින් ම දතයුත්තේ මේ දේවල් තමයි.

108. **තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.**

108. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ ශාස්වතවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ගැන කරුණු හතරක් ඔස්සේ සදාකාලිකයි කියලා උගන්වනවාද එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ නොදැනීමක් මයි. නොදැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන් ගේ කැළඹීමක් ම යි, තැති ගැනීමක් ම යි.

109. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා ඒක-චසස්සතිකා ඒක-ච අසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.

109. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ ඇතැම් මතවාදයන් ශාස්වතවාදී වූ අනෙක් මතවාදයන් අශාස්වතවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ගැන කරුණු හතරක් ඔස්සේ එක් කොටසක් සදාකාලිකයි කියලත් අනෙක් කොටස සදාකාලික නෑ කියලත් උගන්වනවාද එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ නොදැනීමක් මයි. නොදැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන් ගේ කැළඹීමක් ම යි, තැති ගැනීමක් ම යි.

110. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලෝකං පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.

110. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අන්ත අනන්තවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ගැන කරුණු හතරක් ඔස්සේ කෙළවරක් ඇත නැත කියලා උගන්වනවාද එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ නොදැනීමක් මයි. නොදැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන් ගේ කැළඹීමක් ම යි තැති ගැනීමක් මයි.

111. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං චතූහි වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.

111. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අමරාවික්ෂේපවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඒ ඒ කරුණු පිළිබඳ ප්‍රශ්න විමසද්දී වචනයෙන් මහහැර යනවා නම් ආදෙකු මෙන් ලිස්සා යනවා නම් ඔවුන් එය කරන්නෙත් කරුණු හතරකිනුයි. එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ නොදැනීමක් ම යි. නොදැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන්ගේ කැළඹීමක් ම යි, තැති ගැනීමක් ම යි.

112. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා අධි-චසමුප්පන්නිකා අධි-චසමුප්පන්නං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති ද්වීහි වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.

112. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අධිච්චසමුප්පන්නවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ගැන කරුණු දෙකක් ඔස්සේ ඉබේ හටගත්තා කියලා උගන්වනවාද එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ නො දැනීමක් ම යි. නො දැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන් ගේ කැළඹීමක් ම යි, තැති ගැනීමක් ම යි.

113. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනෝ පුබ්බන්තං අරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාරසහි වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.

113. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ පූර්ව අන්ත කල්පික වූ පූර්ව අන්ත දෘෂ්ටි ගතික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් අතීත කෙළවර ගැන කරුණු නොයෙක් මතවාද අදහස් දෘෂ්ටි ඔස්සේ මතවාද දහ අටකින් උගන්වනවාද එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ නො දැනීමක් ම යි. නො දැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන් ගේ කැළඹීමක් ම යි, තැති ගැනීමක් ම යි.

114. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා උද්ධමාඝාතනා සඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති සෝළසහි වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.

114. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මය ගැන කරුණු දහසයක් ඔස්සේ මරණින් මතු සඤ්ඤ සහිත වන්නේ ය කියලා උගන්වනවාද එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ නො දැනීමක් ම යි. නො දැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන් ගේ කැළඹීමක් ම යි, තැති ගැනීමක් ම යි.

115. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා උද්ධමාඝාතනා අසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති අට්ඨහි වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.

115. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ උද්ධමාඝාතනික අසඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මය ගැන කරුණු අටක් ඔස්සේ මරණින් මතු සඤ්ඤා රහිත වන්නේ ය කියලා උගන්වනවාද එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ නො දැනීමක් ම යි. නො දැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන් ගේ කැළඹීමක් ම යි, තැති ගැනීමක් ම යි.

116. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නේවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නේවසඤ්ඤිංනාසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති අට්ඨහි වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.

116. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ උද්ධමාඝාතනික නේවසඤ්ඤානාසඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මය ගැන කරුණු අටක් ඔස්සේ මරණින් මතු නේවසඤ්ඤානාසඤ්ඤා සහිත වන්නේ ය කියලා උගන්වනවාද එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ නො දැනීමක් මයි. නො දැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන් ගේ කැළඹීමක් ම යි, තැති ගැනීමක් ම යි.

117. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා උ-ඡේදවාදා සතෝ සත්තස්ස උ-ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති සත්තහි වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.

117. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ උච්ඡේදවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් සිටින්නා වූ ම සත්වයාගේ උච්ඡේදය විනාශය නො පැවැත්ම ගැන කරුණු හතක් ඔස්සේ උගන්වනවාද එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ නො දැනීමක් ම යි. නො දැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන් ගේ කැළඹීමක් ම යි, තැති ගැනීමක් ම යි.

118. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මනිබ්බානවාදා සතෝ සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති පඤ්චහි වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.

119. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ දිට්ඨධම්මනිබ්බානවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් සිටින්නා වූ ම සත්වයා ගේ පරමදිට්ඨධම්මනිබ්බානය ගැන කරුණු පහක් ඔස්සේ උගන්වනවාද එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ නො දැනීමක් ම යි. නො දැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන්ගේ කැළඹීමක් ම යි, තැති ගැනීමක් ම යි.

119. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනෝ අපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුචත්තාරීසාය වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.

119. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අපරාන්තකල්පික වූ අපරාන්තදෘෂ්ටිගතික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් අපරාන්තය ගැන කරුණු හතළිස්හතරක් ඔස්සේ අනේකවිධ ආකල්ප මතවාද අදහස් දෘෂ්ටි උගන්වනවාද එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ නො දැනීමක් ම යි. නො දැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන් ගේ කැළඹීමක් ම යි, තැති ගැනීමක් ම යි.

120. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තා-නුදිට්ඨිනෝ පුබ්බන්තාපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති ද්වාසට්ඨියා වත්ථූහි, තදපි තේසං භවතං සමණබ්‍රාහ්මණානං අජානතං අපස්සතං වේදයිතං තණ්හාගතානං පරිතසිතවිප්ඵන්දිතමේව.

120. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අපරාන්තකල්පික වූ පූර්වාන්තකල්පික වූ අපරාන්තදෘෂ්ටිගතික වූ පූර්වාන්තදෘෂ්ටිගතික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් පූර්වාන්තය හා අපරාන්තය ගැන කරුණු හැටදෙකක් ඔස්සේ අනේකවිධ ආකල්ප, මතවාද, අදහස්, දෘෂ්ටි උගන්වනවාද එය පවා ඒ භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ නො දැනීමක් ම යි. නො දැකීමක් ම යි. විඳීමකටයි අයිති, තෘෂ්ණාවට පැමිණියා වූ ඔවුන් ගේ කැළඹීමක් ම යි, තැති ගැනීමක් ම යි.

121. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි, තදපි ඵස්සප-චයා.

121. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ ශාස්වතවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ගැන කරුණු හතරක් ඔස්සේ සදාකාලිකයි කියලා උගන්වනවාද එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

122. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි, තදපි ඵස්සප-චයා.

122. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ ඇතැම් මතවාදයක් ශාස්වතවාදී වූ ඇතැම් මතවාදයක් අශාස්වතවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ගැන කරුණු හතරක් ඔස්සේ කොටසක් සදාකාලික යි, කොටසක් සදාකාලික නැ කියලා උගන්වනවාද එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

123. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලෝකං පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි, තදපි ඵස්සප-චයා.

123. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ ලෝකය අන්තවත්ය අනන්තවත්ය යන මතවාදයෙන් යුතුව ලෝකය අන්තවත් මෙන් ම අනන්තවත් යැ යි පවසන්නා වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ගැන කරුණු හතරක් ඔස්සේ උගන්වනවාද එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

124. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං චතූහි වත්ථූහි, තදපි ඵස්සප-චයා.

124. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අමරාවික්ෂේපවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඒ ඒ කරුණු පිළිබඳ ප්‍රශ්න විමසද්දී වචනයෙන් මහහැර යනවා නම්, ආදෙකු මෙන් ලිස්සා යනවා නම් ඔවුන් එය කරන්නේත් කරුණු හතරකිනුයි. එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

125. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා අධි-චසමුප්පන්නිකා අධි-චසමුප්පන්නං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති ද්වීහි වත්ථූහි, තදපි ඵස්සප-චයා.

125. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අධිච්චසමුප්පන්නවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ගැන කරුණු දෙකක් ඔස්සේ ඉබේ හටගත්තා කියලා උගන්වනවාද එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

126. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනෝ පුබ්බන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාරසහි වත්ථූහි, තදපි ඵස්සප-චයා.

126. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ පූර්ව අන්ත කල්පික වූ පූර්ව අන්ත දෘෂ්ටි ගතික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් අතීත කෙළවර ගැන කරුණු නොයෙක් මතවාද අදහස් දෘෂ්ටි ඔස්සේ මතවාද දහ අටකින් උගන්වනවාද එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

127. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා උද්ධමාඝාතනා සඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති සෝළසහි වත්ථූහි, තදපි ඵස්සප-චයා.

127. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ උද්ධමාඝාතනික සඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මය ගැන කරුණු දහසයක් ඔස්සේ මරණින් මතු සඤ්ඤා සහිත වන්නේ ය කියලා උගන්වනවාද එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

128. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා උද්ධමාඝාතනා අසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති අට්ඨහි වත්ථූහි, තදපි ඵස්සප-චයා.

129. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ උද්ධමාඝාතනික අසඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මය ගැන කරුණු අටක් ඔස්සේ මරණින් මතු සඤ්ඤා රහිත වන්නේ ය කියලා උගන්වනවාද එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

129. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නේවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නේවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති අට්ඨහි වත්ථූහි, තදපි ඔස්සප-චයා.

129. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ උද්ධමාඝාතනික නේවසඤ්ඤානාසඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මය ගැන කරුණු අටක් ඔස්සේ මරණින් මතු නේවසඤ්ඤානාසඤ්ඤා සහිත වන්නේ ය කියලා උගන්වනවාද එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

130. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා උ-ඡේදවාදා සතෝ සත්තස්ස උ-ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති සත්තහි වත්ථූහි, තදපි ඔස්සප-චයා.

130. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ උච්ඡේදවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් සිටින්නාවූ ම සත්වයා ගේ උච්ඡේදය විනාශය නො පැවැත්ම ගැන කරුණු හතක් ඔස්සේ උගන්වනවාද එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

131. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මනිබ්බානවාදා සතෝ සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති පඤ්චහි වත්ථූහි, තදපි ඔස්සප-චයා.

131. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ දිට්ඨධම්මනිබ්බානවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් සිටින්නා වූම සත්වයා ගේ පරමදිට්ඨධම්මනිබ්බානය ගැන කරුණු පහක් ඔස්සේ උගන්වනවාද එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

132. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනෝ අපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුවත්තාරීසාය වත්ථූහි, තදපි ඔස්සප-චයා.

132. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අපරාන්තකල්පික වූ අපරාන්තදෘෂ්ටිගතික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් අපරාන්තය ගැන කරුණු හතළිස්හතරක් ඔස්සේ අනේකවිධ ආකල්ප මතවාද අදහස් දෘෂ්ටි උගන්වනවාද එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

133. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තානුදිට්ඨිනෝ පුබ්බන්තාපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති ද්වාසට්ඨියා වත්ථූහි, තදපි ඵස්සප-චයා.

133. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අපරාන්තකල්පික වූ පූර්වාන්තකල්පික වූ අපරාන්තදෘෂ්ටිගතික වූ පූර්වාන්තදෘෂ්ටිගතික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් අපරාන්තය ගැන කරුණු හැටදෙකක් ඔස්සේ අනේකවිධ ආකල්ප මතවාද අදහස් දෘෂ්ටි උගන්වනවාද එය පවා හටගන්නේ ස්පර්ශය ප්‍රත්‍යයෙනුයි.

134. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

134. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ ශාස්වතවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ගැන කරුණු හතරක් ඔස්සේ සදාකාලිකයි කියලා උගන්වනවාද ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නො හැකි දෙයක් ම යි.

135. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා ඒක-චං සස්සතං ඒක-චං අසස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

135. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ ඇතැම් මතවාදයන් ශාස්වතවාදී වූ අනෙක් මතවාදයන් අශාස්වතවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ගැන කරුණු හතරක් ඔස්සේ එක් කොටසක් සදාකාලිකයි කියලත් අනෙක් කොටස සදාකාලික නැ කියලත් උගන්වනවාද ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නො හැකි දෙයක් ම යි.

136. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා අන්තානන්තිකා අන්තානන්තං ලෝකස්ස පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

136. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ ලෝකය අන්තවත් ය අනන්තවත් ය යන මතය කියන ශ්‍රමණ බ්‍රාහ්මණයින් ලෝකය අන්තවත් ය, අනන්තවත් ය කියලා කරුණු හතරකින් උගන්වනවාද ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නොහැකි දෙයක් ම යි.

137. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා අමරාවික්ඛේපිකා තත්ථ තත්ථ පඤ්හං පුට්ඨා සමානා වාචාවික්ඛේපං ආපජ්ජන්ති අමරාවික්ඛේපං චතූහි වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර එස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

137. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අමරාවික්ෂේපවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඒ ඒ කරුණු පිළිබඳ ප්‍රශ්න විමසද්දී වචනයෙන් මහහැර යනවා නම්, ආදෙකු මෙන් ලිස්සා යනවා නම් ඔවුන් එය කරන්නෙත් කරුණු හතරකිනුයි. ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නොහැකි දෙයක් ම යි.

138. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා අධි-චසමුප්පන්නිකා අධි-චසමුප්පන්නං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති ද්වීහි වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර එස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

138. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අධිච්චසමුප්පන්නවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මයත් ලෝකයත් ගැන කරුණු දෙකක් ඔස්සේ ඉබේ හටගත්තා කියලා උගන්වනවාද ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නොහැකි දෙයක් ම යි.

139. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා පුබ්බන්තානුදිට්ඨිනෝ පුබ්බන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති අට්ඨාරසහි වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර එස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

139. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ පූර්ව අන්ත කල්පික වූ පූර්ව අන්ත දෘෂ්ටිගතික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් අතීත කෙළවර ගැන කරුණු නොයෙක් මතවාද අදහස් දෘෂ්ටි ඔස්සේ මතවාද දහ අටකින් උගන්වනවාද ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නොහැකි දෙයක් ම යි.

140. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා උද්ධමාඝාතනා සඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති සෝළසහි වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

140. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ උද්ධමාඝාතනික සඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මය ගැන කරුණු දහසයක් ඔස්සේ මරණින් මතු සඤ්ඤා සහිත වන්නේ ය කියලා උගන්වනවා ද ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නොහැකි දෙයක් ම යි.

141. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා උද්ධමාඝාතනා අසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති අට්ඨහි වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

141. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ උද්ධමාඝාතනික අසඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මය ගැන කරුණු අටක් ඔස්සේ මරණින් මතු සඤ්ඤා රහිත වන්නේ ය කියලා උගන්වනවාද ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නොහැකි දෙයක් ම යි.

142. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නේවසඤ්ඤීනාසඤ්ඤීවාදා උද්ධමාඝාතනා නේවසඤ්ඤිං නාසඤ්ඤිං අත්තානං පඤ්ඤාපෙන්ති අට්ඨහි වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ උද්ධමාඝාතනික නේවසඤ්ඤානාසඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ආත්මය ගැන කරුණු අටක් ඔස්සේ මරණින් මතු නේවසඤ්ඤානාසඤ්ඤා සහිත වන්නේ ය කියලා උගන්වනවාද ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නොහැකි දෙයක් ම යි.

143. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා උ-ඡේදවාදා සතෝ සත්තස්ස උ-ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති සත්තහි වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

143. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ උච්ඡේදවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් සිටින්නාවූ ම සත්වයාගේ උච්ඡේදය විනාශය නො පැවැත්ම ගැන කරුණු හතක් ඔස්සේ උගන්වනවාද ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නො හැකි දෙයක් ම යි.

144. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මනිබ්බානවාදා සතෝ සත්තස්ස පරමදිට්ඨධම්මනිබ්බානං පඤ්ඤාපෙන්ති පඤ්චහි වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

144. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ දිට්ඨධම්මනිබ්බානවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් සිටින්නා වූ ම සත්වයා ගේ පරමදිට්ඨධම්මනිබ්බානය ගැන කරුණු පහක් ඔස්සේ උගන්වනවාද ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නො හැකි දෙයක් ම යි.

145. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා අපරන්තානුදිට්ඨිනෝ අපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති චතුචත්තාරීසාය වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

145. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අපරාන්තකල්පික වූ අපරාන්තදෘෂ්ටිගතික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් අපරාන්තය ගැන කරුණු හතළිස් හතරක් ඔස්සේ අනේකවිධ ආකල්ප මතවාද අදහස් දෘෂ්ටි උගන්වනවාද ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නො හැකි දෙයක් මයි.

146. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තානුදිට්ඨිනෝ පුබ්බන්තාපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති ද්වාසට්ඨියා වත්ථූහි, තේ වත අඤ්ඤත්‍ර ඵස්සා පටිසංවේදිස්සන්තීති නේතං ඨානං විජ්ජති.

146. පින්වත් මහණෙනි, ඒ දෘෂ්ටි අතර යම් ඒ අපරාන්තකල්පික වූ පූර්වාන්තකල්පික වූ අපරාන්තදෘෂ්ටිගතික වූ පූර්වාන්තදෘෂ්ටිගතික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් අපරාන්තය ගැන කරුණු හැටදෙකක් ඔස්සේ අනේකවිධ

ආකල්ප මතවාද අදහස් දෘෂ්ටි උගන්වනවාද ඔවුන් වනාහි ඒ දෘෂ්ටි ආශ්වාදය ස්පර්ශයෙන් තොරව විඳිනවා යන කරුණ සිදුවිය නොහැකි දෙයක් ම යි.

147. තත්‍ර භික්ඛවේ යේ තේ සමණබ්‍රාහ්මණා සස්සතවාදා සස්සතං අත්තානඤ්ච ලෝකඤ්ච පඤ්ඤාපෙන්ති චතූහි වත්ථූහි, යේපි තේ සමණබ්‍රාහ්මණා ඒක-චසස්සතිකා ඒක-චඅසස්සතිකා, යේපි තේ සමණබ්‍රාහ්මණා අන්තානන්තිකා, යේපි තේ සමණබ්‍රාහ්මණා අමරා-වික්ඛේපිකා, යේපි තේ සමණබ්‍රාහ්මණා අධි-චසමුප්පන්නිකා, යේපි තේ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා, යේපි තේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා සඤ්ඤීවාදා, යේපි තේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා අසඤ්ඤීවාදා, යේපි තේ සමණබ්‍රාහ්මණා උද්ධමාඝාතනිකා නේවසඤ්ඤී-සඤ්ඤීවාදා, යේපි තේ සමණබ්‍රාහ්මණා උ-ච්ඡේදවාදා, යේපි තේ සමණබ්‍රාහ්මණා දිට්ඨධම්මනිබ්බානවාදා, යේපි තේ සමණබ්‍රාහ්මණා අපරන්තකප්පිකා, යේපි තේ සමණබ්‍රාහ්මණා පුබ්බන්තකප්පිකා ච අපරන්තකප්පිකා ච පුබ්බන්තාපරන්තකප්පිකා ච, පුබ්බන්තාපරන්තා-නුදිට්ඨිනෝ පුබ්බන්තාපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති ද්වාසට්ඨියා වත්ථූහි, සබ්බේ තේ ඉමේ ඵස්සායතනේහි ඵුස්ස ඵුස්ස පටිසංවේදෙන්ති. තේසං වේදනාප-චයා තණ්හා, තණ්හාප-චයා උපාදානං, උපාදානප-චයා භවෝ, භවප-චයා ජාති, ජාතිප-චයා ජරාමරණං සෝකපරිදේවදුක්ඛදෝමනස්ස උපායාසා සම්භවන්ති. යතෝ ඛෝ භික්ඛවේ භික්ඛු ඉන්නං ඵස්සායතනානං සමුදයං ච අත්ථගමං ච අස්සාදං ච ආදීනවං ච නිස්සරණං ච යථාභූතං පජානාති, අයං ඉමේහි සබ්බේහේව උත්තරිතරං පජානාති.

147. පින්වත් මහණෙනි, ඔය දෘෂ්ටිවලට අයත්වන යම් ඒ ශාස්වතවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් ආත්මයත් ලෝකයත් මතවාද හතරක් ඔස්සේ සදාකාලික යි කියලා උගන්වනවාද, යම් ඒ ඇතැම් මතවාදයක් ශාස්වතවාදී වූ ඇතැම් මතවාදයක් අශාස්වතවාදී වූත් මත පවසන ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවාද, ඒ වගේ ම ලෝකය අන්තවත් ය, අනන්තවයත් ය යන මතය පවසන යම් ඒ ශ්‍රමණබ්‍රාහ්මණයින් ඉන්නවා ද, ඒ වගේ ම ප්‍රශ්න විමසද්දී වචනයෙන් මගහැර ආදෙකු මෙන් ලිස්සා යන අමරාවික්ෂේපවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවාද, ඒ වගේ ම ලෝකය ඉබේ හටගත් බව පවසන යම් ඒ අධිච්චසමුප්පන්නවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවාද, අතීත ජීවිතයේ කෙළවර ගැන මතවාද පවසන පූර්ව අන්ත දෘෂ්ටිගතික වූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවාද, මරණින් මතු සඤ්ඤා සහිත වන්නේ යැ යි මතවාද

පවසන යම් ඒ උද්ධමාඝාතනික සඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවාද, මරණින් මතු සඤ්ඤා රහිත වන්නේ යැ යි මතවාද පවසන යම් ඒ උද්ධමාඝාතනික අසඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවාද, මරණින් මතු සඤ්ඤා ඇත්තේත් නැති සඤ්ඤා නැත්තේත් නැති බවට පත් වන්නේ යැ යි මතවාද පවසන යම් ඒ උද්ධමාඝාතනික නේවසඤ්ඤානාසඤ්ඤීවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවාද, මරණින් මතු මුළුමණින් ම වැනසෙන්නේ යැ යි මත පවසන යම් ඒ උච්ඡේදවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවාද, මෙලොව දී ම දකින නිවනක් වශයෙන් මතවාද පවසන යම් ඒ දිට්ඨධම්මනිබ්බානවාදී වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවාද, අනාගතයෙහි කෙළවර අරභයා මතවාද පවසන යම් ඒ අපරාන්තකල්පික වූ ශ්‍රමණබ්‍රාහ්මණයින් ඉන්නවාද, යම් ඒ පූර්ව අන්ත කල්පික වූ අපරාන්තකල්පික වූ ද පූර්ව අන්ත අපර අන්ත කල්පික වූ ද, පූර්වාන්ත අපරාන්තදෘෂ්ටිගතික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් පූර්ව අන්තය හා අපරාන්තය ගැන කරුණු හැටදෙකක් ඔස්සේ අනේකවිධ ආකල්ප මතවාද අදහස් දෘෂ්ටි උගන්වනවාද, ඒ සියල්ලෝම ඇස් කණ් ආදී ස්පර්ශ ආයතන හය තුළින් බාහිර ආයතනයන් ස්පර්ශ කර කර ඒ දෘෂ්ටි ආශ්වාදයන් විඳිනවා. ඔවුන්ට විඳීම හේතු කොටගෙන තණ්හාව ඇතිවෙනවා. තණ්හාව හේතු කොට ගෙන බැඳීම ඇතිවෙනවා. බැඳීම හේතු කොට ගෙන විපාක පිණිස කර්ම සකස් (භවය) වෙනවා. විපාක පිණිස කර්ම සකස්වීම හේතු කොට ගෙන උපදිනවා. ඉපදීම හේතු කොටගෙන ජරාමරණ සෝක වැළපීම් සුසුම් හෙළීම් දුක් දොම්නස් හට ගන්නවා. පින්වත් මහණෙනි, යම් කලෙක භික්ෂුව මේ ස්පර්ෂ ආයතනයන් හයේ හටගැනීමත්, නැතිවීමත්, ආශ්වාදයත්, ආදීනවයත්, නිස්සරණයත් ඇතිසැටියෙන් ම අවබෝධ කරගනී ද මේ භික්ෂුව ඔය කලින් කියාපු සියළු දෘෂ්ටිවලට වඩා උත්තරීතර දේ (චතුරාර්ය සත්‍යය) දැනගන්නවා.

148. යේ හි කේචි භික්ඛවේ, සමණා වා බ්‍රාහ්මණා වා පුබ්බන්ත-කප්පිකා වා අපරන්තකප්පිකා වා පුබ්බන්තාපරන්තකප්පිකා වා, පුබ්බන්තාපරන්තානුදිට්ඨිනෝ පුබ්බන්තාපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති, සබ්බේ තේ ඉමේහේව ද්වාසට්ඨියා වත්ථූහි අන්තෝජාලිකතා එත්ථ සිතාව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති, (නිමුජ්ජමානා නිමුජ්ජන්ති) එත්ථ පරියාපන්නා අන්තෝජාලිකතාව උම්මුජ්ජමාන උම්මුජ්ජන්ති, (නිමුජ්ජමානා නිමුජ්ජන්ති) සෙය්‍යථාපි භික්ඛවේ දක්ඛෝ කේවට්ටෝ වා කේවට්ටන්තේවාසී වා සුඛුම-ජීකේන ජාලේන පරිත්තං උදකදහං ඔත්ථාරෙය්‍ය, තස්ස එවමස්ස: "යේ ඛෝ කේචි ඉමස්මිං උදකදහේ විළාරිකා පාණා, සබ්බේ තේ අන්තෝජාලිකතා එත්ථ සිතාව උම්මුජ්ජමානා

උම්මුජ්ජන්ති, (නිමුජ්ජමානා නිමුජ්ජන්ති). එත්ථ පරියාපන්නා අන්තෝජාලිකාතාව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති, (නිමුජ්ජමානා නිමුජ්ජන්ති) ඒවමේව ඛෝ භික්ඛවේ, යේ හි කේචි සමණා වා බ්‍රාහ්මණා වා පුබ්බන්තකප්පිකා වා අපරන්තකප්පිකා වා පුබ්බන්තාපරන්තකප්පිකා වා, පුබ්බන්තාපරන්තානුදිට්ඨිනෝ පුබ්බන්තාපරන්තං ආරබ්භ අනේකවිහිතානි අධිවුත්තිපදානි අභිවදන්ති, සබ්බේ තේ ඉමේහේව ද්වාසට්ඨියා වත්ථූහි අන්තෝජාලීකතා එත්ථ සිතාව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති, (නිමුජ්ජමානා නිමුජ්ජන්ති) එත්ථ පරියාපන්නා අන්තෝජාලීකතාව උම්මුජ්ජමානා උම්මුජ්ජන්ති, (නිමුජ්ජමානා නිමුජ්ජන්ති).

149. පින්වත් මහණෙනි, යම් කිසි අපරාන්තකල්පික වූ පූර්වාන්තකල්පික වූත් පූර්වාන්ත අපරාන්තදෘෂ්ටිගතික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් පූර්වාන්තය හා අපරාන්තය ගැන කරුණු හැටදෙකක් ඔස්සේ අනේකවිධ ආකල්ප මතවාද අදහස් දෘෂ්ටි උගන්වනවාද, ඒ සියල්ලෝ ම මේ දෘෂ්ටිවාද හැටදෙක නමැති දැළ ඇතුළට ම ගිහිල්ලයි ඉන්නේ. ඒ දැලට ම බැඳිලයි ඉන්නේ. මේ දෘෂ්ටිවාද නමැති දැල ඇතුළෙම යි උඩට එනවා නම් උඩට මතුවෙන්නේ. ගිලෙනවා නම් ගිලෙන්නේ. මේ දෘෂ්ටිවාද නමැති රාමුව තුළ ම යි ඉන්නේ. ඒ දැල ඇතුළෙම පැටලිලා උඩට එනවා නම් උඩට එන්නේ. ගිලෙනවා නම් ගිලෙන්නේ. පින්වත් මහණෙනි, එක මේ වගේ දෙයක්. දක්ෂ මසුන් මරන්නෙක් ඉන්නවා. එක්කෝ ඔහු ගේ ගෝලයෙක් ඉන්නවා. ඔහු සියුම් සිදුරු ඇති දැලක් වතුර ටිකක් තිබෙන දිය වලක අතුරනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. මේ දිය වලේ යම්තාක් ගොරෝසු සතුන් ඉන්නවා නම්, ඒ සියළු සතුන් ම මේ දැල ඇතුළට අහුවෙනවා. එතකොට මේ දැල තුළ ම යි තමයි ඔවුන් බැඳිලා ඉන්නේ. දැල තුළ ම යි උඩට එතොත් උඩට එන්නේ, ගිව් නොත් ගිලෙන්නේ. පින්වත් මහණෙනි, ඔන්න ඔය විදිහමයි යම් කිසි අපරාන්තකල්පික වූ පූර්වාන්තකල්පික වූ පූර්වාන්ත අපරාන්තදෘෂ්ටිගතික වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් පූර්වාන්තය හා අපරාන්තය ගැන කරුණු හැටදෙකක් ඔස්සේ අනේකවිධ ආකල්ප මතවාද අදහස් දෘෂ්ටි උගන්වනවාද, ඒ සියල්ලෝ ම මේ දෘෂ්ටිවාද හැටදෙක නමැති දැල ඇතුළට ම ගිහිල්ලයි ඉන්නේ. ඒ දැලට ම බැඳිලයි ඉන්නේ මේ දෘෂ්ටිවාද නමැති දැල ඇතුළේමයි උඩට එනවා නම් උඩට මතුවෙන්නේ. ගිලෙනවා නම් ගිලෙන්නේ. මේ දෘෂ්ටිවාද නමැති රාමුව තුල තමයි ඒ දැල ඇතුළෙම පැටලිලා උඩට එනවා නම් උඩට එන්නේ. ගිලෙනවා නම් ගිලෙන්නේ.

149. උ-ඡින්නභවනෙත්තිකෝ භික්ඛවේ තථාගතස්ස කායෝ තිට්ඨති. යාවස්ස කායෝ ඨස්සති. තාව නං දක්ඛින්ති දේවමනුස්සා. කායස්ස භේදා උද්ධං ජීවිතපරියාදානා න නං දක්ඛින්ති දේවමනුස්සා.

149. පින්වත් මහණෙනි, තථාගතයන් වහන්සේ ගේ බුදු සිරුර තිබෙන්නේ මුළුමණින්ම සිඳුනු භව රැහැන් ඇතිවයි. යම්තාක් කාලයක් තථාගත සිරුර තිබෙයි ද ඒතාක්කල් විතරයි දෙවි මිනිසුන් එය දකින්නේ. ඒ තථාගත සිරුර බිඳී යාමෙන් ජීවිතය නිමාවීමෙන් පසු දෙවිමිනිසුන්ට ඒ තථාගත සිරුර දකින්නට ලැබෙන්නේ නෑ.

සෙය්‍යථාපි භික්ඛවේ, අම්බපිණ්ඩියා වණ්ට-ඡින්නාය යානි කානිචි අම්බානි වණ්ටපටිබද්ධානි. සබ්බානි තානි තදන්වයානි භවන්ති, ඒවමේව ඛෝ භික්ඛවේ උ-ඡින්නභවනෙත්තිකෝ තථාගතස්ස කායෝ තිට්ඨති. යාවස්ස කායෝ ඨස්සති. තාව නං දක්ඛින්ති දේවමනුස්සා. කායස්ස භේදා උද්ධං ජීවිතපරියාදානා න නං දක්ඛින්ති දේවමනුස්සාති.

පින්වත් මහණෙනි, එක මේ වගේ දෙයක්. අඹ පොකුරක් තියෙනවා. එය මුල් නටුවෙන් ගිලිහුන විට ඒ නටුව හා බැඳුණු යම්තාක් අඹ ඇත්ද, ඒ සෑම අඹයක් ම කැඩුණු නටුවත් සමහම බිම වැටෙනවා. පින්වත් මහණෙනි, අන්න ඒ විදිහට ම තථාගතයන් වහන්සේ ගේ බුදු සිරුර තිබෙන්නේ මුළුමණින්ම සිඳුනු භව රැහැන් ඇතිවයි. යම්තාක් කාලයක් තථාගත සිරුර තිබෙයි ද ඒතාක්කල් විතරයි දෙවි මිනිසුන් එය දකින්නේ. ඒ තථාගත සිරුර බිඳී යාමෙන් ජීවිතය නිමාවීමෙන් පසු දෙවි මිනිසුන්ට ඒ තථාගත සිරුර දකින්නට ලැබෙන්නේ නෑ.

150. ඒවං වුත්තේ ආයස්මා ආනන්දෝ භගවන්තං ඒතදවෝච: "අ-ඡරියං භන්තේ, අබ්භුතං භන්තේ, කෝ නාමායං භන්තේ ධම්මපරියායෝ?"ති.

මෙසේ වදාළ විට ආයුෂ්මත් ආනන්ද තෙරුන් භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පැවසුවා. "ස්වාමීනී, ආශ්චර්යය යි. ස්වාමීනී, පුදුමසහගත යි. ස්වාමීනී, මේ ධර්ම ක්‍රමයට කියන නම මොකක් ද?"

"තස්මාතිහ ත්වං ආනන්ද ඉමං ධම්මපරියායං අත්ථජාලන්ති'පි නං ධාරේහි. ධම්මජාලන්ති'පි නං ධාරේහි, බ්‍රහ්මජාලන්ති'පි නං ධාරේහි. දිට්ඨිජාලන්ති'පි නං ධාරේහි. අනුත්තරෝ සංගාමවිජයෝති'පි නං ධාරේහී"ති.

එහෙම නම් පින්වත් ආනන්ද, මේ ධර්ම ක්‍රමය අර්ථජාලය කියලා මතක තබා ගන්න. ධර්මජාලය කියලත් මතක තබා ගන්න. බ්‍රහ්මජාලය කියලත් මතක තබා ගන්න. දෘෂ්ටිජාලය කියලත් මතක තබා ගන්න. අනුත්තරසංග්‍රාම විජය (දෘෂ්ටි යුද්ධයෙන් ලැබූ උත්තරීතර ජයග්‍රහණය) කියලත් මතක තබා ගන්න.

ඉදමවෝච භගවා. අත්තමනා තේ භික්ඛූ භගවතෝ භාසිතං අභිනන්දුන්ති,

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ ගේ භාෂිතය සතුටින් පිළිගත්තා.

ඉමස්මිං ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානේ දසසහස්සී ලෝකධාතු අකම්පිත්ථාති.

මෙම ව්‍යාකරණය (නාවාංග ශාස්තෘ සාසනයෙහිලා ඇතුළත් වන වෙය්‍යාකරණය) වදාරණ කල්හි දස දහසක් ලෝක ධාතු කම්පාවට පත්වුණා.

බ්‍රහ්මජාලසුත්තං නිට්ඨිතං පඨමං
පළමු වෙනි බ්‍රහ්මජාල සූත්‍රය නිමාවිය.

සාදු ! සාදු !! සාදු !!!

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

2
සාමඤ්ඤඵලසුත්තං
පැවිදි දිවියෙන් ලබන ප්‍රයෝජන ගැන වදාළ දෙසුම

1. එවං මේ සුතං. එකං සමයං භගවා රාජගහේ විහරති ජීවකස්ස කෝමාරභ-චස්ස අම්බවනේ මහතා භික්ඛුසංඝේන සද්ධිං අඩ්ඪතේළසේහි භික්ඛුසතේහි, තේන ඛෝ පන සමයේන රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ තදහුපෝසථේ පණ්ණරසේ කෝමුදියා චාතුමාසිනියා පුණ්ණාය පුණ්ණමාය රත්තියා රාජාම-චපරිවුතෝ උපරිපාසාදවරගතෝ නිසින්නෝ හෝති. අථ ඛෝ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ තදහුපෝසථේ උදානං උදානේසි:

1. මා හට අසන්නට ලැබුනේ මේ විදහටයි. ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ එක්දහස් දෙසිය පණහක් පමණ වූ මහත් භික්ෂු සංඝයා සමග වැඩ සිටියේ රජගහනුවර ජීවක කෝමාරභච්ච ගේ අඹවනයේ. ඒ දිනවල ම මගධ රජු වන වේදේහි පුත්‍ර අජාසත් රජතුමා ඒ පසළොස්වක පොහෝ දවසෙහි රාජකීය ඇමතිවරුන් පිරිවරා ගෙන උඩුමහල් තළයෙහි වාඩිවෙලා හිටියා. ඒ පුන් පොහෝ දවස වනාහී සිවුමසක් පිරෙද්දී කුමුදු මල් පිපෙන පිරුණු සඳ ඇති රාත්‍රිය යි. ඉතින් වේදේහි පුත්‍ර අජාසත් මගධ රජු ඒ පුන් පොහෝ දවසේ මේ විදිහට උදන් ඇනුවා.

"රමණීයා වත භෝ දෝසිනා රත්ති, අභිරූපා වත භෝ දෝසිනා රත්ති, දස්සනීයා වත භෝ දෝසිනා රත්ති, පාසාදිකා වත භෝ දෝසිනා රත්ති, ලක්ඛඤ්ඤා වත භෝ දෝසිනා රත්ති. කන්නු ඛ්වජ්ජ සමණං වා බ්‍රාහ්මණං වා පයිරුපාසෙය්‍යාම යන්නෝ පයිරුපාසතෝ චිත්තං පසීදෙය්‍යා!"කි.

"භවත්නි, ඇත්තෙන් ම කිසි දොසක් නැති රමණීය රාත්‍රියක්! භවත්නි, ඇත්තෙන් ම කිසි දොසක් නැති ඉතා සුන්දර රාත්‍රියක්! භවත්නි, ඇත්තෙන් ම කිසි දොසක් නැති දර්ශනීය රාත්‍රියක්! භවත්නි, ඇත්තෙන් ම කිසි දොසක් නැති ප්‍රසාදනීය රාත්‍රියක්! භවත්නි, ඇත්තෙන් ම කිසි දොසක් නැති ඉතා ම ලස්සන රාත්‍රියක්! අද වගේ දවසක අප ගේ සිත පහදවාලිය හැකි මොන විදිහේ ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු ඇසුරු කරන එක ද හොඳ" කියල.

2. එවං වුත්තේ අඤ්ඤතරෝ රාජාම-චෝ රාජානං මාගධං අජාතසත්තුං වේදේහිපුත්තං එතදවෝච: "අයං දේව පූරණෝ කස්සපෝ සංඝී ච ගණී ච ගණාචරියෝ ච ඤාතෝ යසස්සී තිත්ථංකරෝ සාධුසම්මතෝ බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතෝ අද්ධගතෝ වයෝ අනුප්පත්තෝ. තං දේවෝ පූරණං කස්සපං පයිරුපාසතු. අප්පේවනාම දේවස්ස පූරණං කස්සපං පයිරුපාසතෝ චිත්තං පසීදෙය්‍යා"ති. එවං වුත්තේ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ තුණ්හී අහෝසි.

2. මෙසේ පැවසූ විට එක්තරා රජ ඇමැතියෙක් වේදේහි පුත්‍ර අජාසත් මගධ රජු හට මෙහෙම කිව්වා. " දේවයන් වහන්ස, මේ පූරණ කස්සප ලොකු ගෝල පිරිසක් ඇතුව ඉන්නවා. ගොඩාක් පිරිස ඉන්නවා. ඒ පිරිසට ආචාර්යවරයෙක්. ප්‍රසිද්ධ යි. කීර්තිමත්. ආගමික නායකයෙක්. බොහෝ දෙනා අතර හොඳයි කියල සම්මත යි. පැවිදි වෙලා ගොඩාක් කල් වෙනවා. පිළිවෙලින් වයසට ගිහිල්ලයි ඉන්නේ. දේවයන් වහන්සේ ඒ පූරණ කස්සපයා ඇසුරු කරණ සේක්වා! පූරණ කස්සපයන් ඇසුරු කරන දේවයන් වහන්සේ ගේ සිත පහදින්නේ ම යි" කියල. එතකොට වේදේහිපුත්‍ර අජාසත් මගධ රජු (උනන්දුවක් නො දක්වා) නිශ්ශබ්ද වුණා.

3. අඤ්ඤතරෝපි ඛෝ රාජාම-චෝ රාජානං මාගධං අජාතසත්තුං වේදේහිපුත්තං එතදවෝච: "අයං දේව මක්ඛලී ගෝසාලෝ සංඝී ච ගණී ච ගණාචරියෝ ච ඤාතෝ යසස්සී තිත්ථංකරෝ සාධුසම්මතෝ බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතෝ අද්ධගතෝ වයෝ අනුප්පත්තෝ. තං දේවෝ මක්ඛලී ගෝසාලං පයිරුපාසතු. අප්පේවනාම දේවස්ස මක්ඛලිං ගෝසාලං පයිරුපාසතෝ චිත්තං පසීදෙය්‍යා"ති. එවං වුත්තේ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ තුණ්හී අහෝසි.

3. ඊ ළඟට වෙනත් රජ ඇමැතියෙක් වේදේහිපුත්‍ර අජාසත් මගධ රජු හට මෙකරුණ පැවසුවා. "දේවයන් වහන්ස, මේ මක්ඛලී ගෝසාල ලොකු ගෝල පිරිසක් ඇතුව ඉන්නවා. ගොඩක් පිරිස ඉන්නවා. ඒ පිරිසට ආචාර්යවරයෙක්. ප්‍රසිද්ධ යි. කීර්තිමත්. ආගමික නායකයෙක්. බොහෝ දෙනා අතර හොඳයි කියල සම්මත යි. පැවිදිවෙලා ගොඩාක් කල් වෙනවා. පිළිවෙලින් වයසට ගිහිල්ලයි ඉන්නේ. දේවයන් වහන්සේ ඒ මක්ඛලී ගෝසාල ඇසුරු කරණ සේක්වා! මක්ඛලී ගෝසාලයන් ඇසුරු කරන දේවයන් වහන්සේ ගේ සිත පහදින්නේ ම යි" කියල. එතකොට වේදේහිපුත්‍ර අජාසත් මගධ රජු (උනන්දුවක් නො දක්වා) නිශ්ශබ්ද වුණා.

4. අඤ්ඤතරෝපි ඛෝ රාජාම-චෝ රාජානං මාගධං අජාතසත්තුං වේදේහිපුත්තං ඒතදවෝච: "අයං දේව අජිතෝ කේසකම්බලෝ සංඝී ච-ව ගණී ච ගණාචරියෝ ච ඤාතෝ යසස්සී තිත්ථංකරෝ සාධුසම්මතෝ බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතෝ අද්ධගතෝ වයෝ අනුප්පත්තෝ. තං දේවෝ අජිතං කේසකම්බලං පයිරුපාසතු. අප්පේවනාම දේවස්ස අජිතං කේසකම්බලං පයිරුපාසතෝ චිත්තං පසීදෙය්‍යා"ති. ඒවං වුත්තේ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ තුණ්හී අහෝසි.

4. ඊ ළඟට වෙනත් රජ ඇමැතියෙක් වේදේහිපුත්‍ර අජාසත් මගධ රජු හට මෙකරුණ පැවසුවා. "දේවයන් වහන්ස, මේ කේසකම්බල අජිත ලොකු ගෝල පිරිසක් ඇතුව ඉන්නවා. ගොඩක් පිරිස ඉන්නවා. ඒ පිරිසට ආචාර්යවරයෙක්. ප්‍රසිද්ධ යි. කීර්තිමත්. ආගමික නායකයෙක්. බොහෝ දෙනා අතර හොඳයි කියල සම්මත යි. පැවිදිවෙලා ගොඩාක් කල් වෙනවා. පිළිවෙලින් වයසට ගිහිල්ලයි ඉන්නේ. දේවයන් වහන්සේ ඒ කේසකම්බල අජිත ඇසුරු කරණ සේක්වා! කේසකම්බල අජිතයන් ඇසුරු කරන දේවයන් වහන්සේ ගේ සිත පහදින්නේ ම යි" කියල. එතකොට වේදේහිපුත්‍ර අජාසත් මගධ රජු (උනන්දුවක් නො දක්වා) නිශ්ශබ්ද වුණා.

5. අඤ්ඤතරෝපි ඛෝ රාජාම-චෝ රාජානං මාගධං අජාතසත්තුං වේදේහිපුත්තං ඒතදවෝච: "අයං දේව පකුධෝ ක-චායනෝ සංඝී ච-ව ගණී ච ගණාචරියෝ ච ඤාතෝ යසස්සී තිත්ථංකරෝ සාධුසම්මතෝ බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතෝ අද්ධගතෝ වයෝ අනුප්පත්තෝ. තං දේවෝ පකුධං ක-චායනං පයිරුපාසතු. අප්පේවනාම දේවස්ස පකුධං ක-චායනං පයිරුපාසතෝ චිත්තං පසීදෙය්‍යා"ති. ඒවං වුත්තේ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ තුණ්හී අහෝසි.

5. ඊ ළඟට වෙනත් රජ ඇමැතියෙක් වේදේහිපුත්‍ර අජාසත් මගධ රජු හට මෙකරුණ පැවසුවා. "දේවයන් වහන්ස, මේ පකුධ කච්චායන ලොකු ගෝල පිරිසක් ඇතුව ඉන්නවා. ගොඩක් පිරිස ඉන්නවා. ඒ පිරිසට ආචාර්යවරයෙක්. ප්‍රසිද්ධ යි. කීර්තිමත්. ආගමික නායකයෙක්. බොහෝ දෙනා අතර හොඳයි කියල සම්මතයි. පැවිදිවෙලා ගොඩාක් කල් වෙනවා. පිළිවෙලින් වයසට ගිහිල්ලයි ඉන්නේ. දේවයන් වහන්සේ ඒ පකුධ කච්චායන ඇසුරු කරණ සේක්වා! පකුධ කච්චායනයන් ඇසුරු කරන දේවයන් වහන්සේ ගේ සිත පහදින්නේ ම යි" කියල. එතකොට වේදේහිපුත්‍ර අජාසත් මගධ රජු (උනන්දුවක් නො දක්වා) නිශ්ශබ්ද වුණා.

6. අඤ්ඤතරෝපි ඛෝ රාජාම-චෝ රාජානං මාගධං අජාතසත්තුං වේදේහිපුත්තං ඒතදවෝච: "අයං දේව සඤ්ජයෝ බේළට්ඨපුත්තෝ සංඝී ච-ව ගණී ච ගණාචරියෝ ච ඤාතෝ යසස්සී තිත්ථංකරෝ සාධුසම්මතෝ බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතෝ අද්ධගතෝ වයෝ අනුප්පත්තෝ. තං දේවෝ සඤ්ජයං බේලට්ඨපුත්තං පයිරුපාසතු. අප්පේවනාම දේවස්ස සඤ්ජයං බේලට්ඨපුත්තං පයිරුපාසතෝ චිත්තං පසීදෙය්‍යා"ති. ඒවං වුත්තේ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ තුණ්හී අහෝසි.

6. ඊ ළඟට වෙනත් රජ ඇමැතියෙක් වේදේහිපුත්‍ර අජාසත් මගධ රජු හට මෙකරුණ පැවසුවා. "දේවයන් වහන්ස, මේ බේළට්ඨපුත්ත සංජය ලොකු ගෝල පිරිසක් ඇතුව ඉන්නවා. ගොඩක් පිරිස ඉන්නවා. ඒ පිරිසට ආචාර්යවරයෙක්. ප්‍රසිද්ධ යි. කීර්තිමත්. ආගමික නායකයෙක්. බොහෝ දෙනා අතර හොඳයි කියල සම්මතයි. පැවිදිවෙලා ගොඩාක් කල් වෙනවා. පිළිවෙලින් වයසට ගිහිල්ලයි ඉන්නේ. දේවයන් වහන්සේ ඒ බේළට්ඨපුත්ත සංජය ඇසුරු කරණ සේක්වා! බේළට්ඨපුත්ත සංජය ඇසුරු කරන දේවයන් වහන්සේ ගේ සිත පහදින්නේ ම යි" කියල. එතකොට වේදේහිපුත්‍ර අජාසත් මගධ රජු (උනන්දුවක් නො දක්වා) නිශ්ශබ්ද වුණා.

7. අඤ්ඤතරෝපි ඛෝ රාජාම-චෝ රාජානං මාගධං අජාතසත්තුං වේදේහිපුත්තං ඒතදවෝච: "අයං දේව නිගණ්ඨෝ නාතපුත්තෝ සංඝී ච-ව ගණී ච ගණාචරියෝ ච ඤාතෝ යසස්සී තිත්ථංකරෝ සාධුසම්මතෝ බහුජනස්ස රත්තඤ්ඤූ චිරපබ්බජිතෝ අද්ධගතෝ වයෝ අනුප්පත්තෝ. තං දේවෝ නිගණ්ඨං නාතපුත්තං පයිරුපාසතු. අප්පේවනාම දේවස්ස නිගණ්ඨං නාතපුත්තං පයිරුපාසතෝ චිත්තං පසීදෙය්‍යා"ති. ඒවං වුත්තේ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ තුණ්හී අහෝසි.

7. ඊ ළඟට වෙනත් රජ ඇමැතියෙක් වේදේහිපුත්‍ර අජාසත් මගධ රජු හට මෙකරුණ පැවසුවා. "දේවයන් වහන්ස, මේ නාතපුත්ත නිඝණ්ඨ ලොකු ගෝල පිරිසක් ඇතුව ඉන්නවා. ගොඩක් පිරිස ඉන්නවා. ඒ පිරිසට ආචාර්යවරයෙක්. ප්‍රසිද්ධ යි. කීර්තිමත්. ආගමික නායකයෙක්. බොහෝ දෙනා අතර හොඳයි කියල සම්මතයි. පැවිදිවෙලා ගොඩාක් කල් වෙනවා. පිළිවෙලින් වයසට ගිහිල්ලයි ඉන්නේ. දේවයන් වහන්සේ ඒ නාතපුත්ත නිඝණ්ඨ ඇසුරු කරණ සේක්වා! නාතපුත්ත නිඝණ්ඨ ඇසුරු කරන දේවයන් වහන්සේ ගේ සිත පහදින්නේ ම යි" කියල. එතකොට වේදේහිපුත්‍ර අජාසත් මගධ රජු (උනන්දුවක් නො දක්වා) නිශ්ශබ්ද වුණා.

8. තේන ඛෝ පන සමයේන ජීවකෝ කෝමාරභ-චෝ රඤ්ඤෝ මාගධස්ස අජාතසත්තුස්ස වේදේහිපුත්තස්ස අවිදූරේ තුණ්හීභූතෝ නිසින්නෝ හෝති. අථ ඛෝ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ ජීවකං කෝමාරභ-චං ඒතදවෝච: "ත්වං පන සම්ම ජීවක කිං තුණ්හී?"ති.

8. ඒ වෙලාවේ දී ජීවක කෝමාරභච්චයන් වේදේහි පුත්‍ර අජාසත් මගධ රජුට නුදුරින් නිශ්ශබ්දව වාඩිවෙලා හිටියා. එතකොට වේදේහිපුත්‍ර අජාසත් මගධ රජු ජීවක කෝමාරභච්චයන්ගෙන් මෙහෙම ඇහුවා. "යහළු ජීවකය, ඔබ මොකද නිශ්ශබ්දව ඉන්නේ?"

"අයං දේව භගවා අරහං සම්මාසම්බුද්ධෝ අම්හාකං අම්බවනේ විහරති මහතා භික්ඛුසංඝේන සද්ධිං අඩ්ඪතේළසේහි භික්ඛුසතේහි. තං ඛෝ පන භගවන්තං ගෝතමං ඒවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගතෝ: "ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා"ති. තං දේවෝ භගවන්තං පයිරුපාසතු. අප්පේවනාම දේවස්ස භගවන්තං පයිරුපාසිතෝ චිත්තං පසීදෙය්‍යා"ති.

"දේවයන් වහන්ස, මේ අරහත් වූ සම්මා සම්බුදු වූ භාග්‍යවතුන් වහන්සේ එක්දහස් දෙසීය පනහක් පමණ වූ මහත් භික්ෂු සංඝයා සමග අප ගේ අඹ වනයෙහි වැඩ ඉන්නවා. ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේ ගැන මෙබඳු කළ්‍යාණ වූ කීර්ති ඝෝෂාවක් පැතිර ගිහින් තිබෙනවා. මේ අයුරින් ඒ භාග්‍යවතුන් වහන්සේ අරහං වන සේක! සම්මා සම්බුද්ධ වන සේක! විජ්ජාචරණ සම්පන්න වන සේක! සුගත වන සේක! ලෝකවිදූ වන සේක! අනුත්තරෝ පුරිසදම්ම සාරථී වන සේක! සත්ථා දේව මනුස්සානං වන සේක! බුද්ධ වන සේක! භගවා වන සේක! කියල. දේවයන් වහන්සේ ඒ භාග්‍යවතුන් වහන්සේ ව ඇසුරු කළ මැනව. ඒ භාග්‍යවතුන් වහන්සේව ඇසුරු කරන්නා වූ දේවයන් වහන්සේ ගේ සිත පහදිනවා ම යි."

"තේන හි සම්ම ජීවක හත්ථියානානි කප්පාපේහී"ති.

"එහෙම නම් යහළු ජීවකය, ඇත් වාහනයන් පිළියෙල කරන්න."

9. ඒවං දේවාති ඛෝ ජීවකෝ කෝමාරභ-චෝ රඤ්ඤෝ මාගධස්ස අජාතසත්තුස්ස වේදේහිපුත්තස්ස පටිස්සුත්වා පඤ්චමත්තානි හත්ථිනිකා-

සතානි කප්පාපෙත්වා රඤ්ඤෝ ච ආරෝහණියං නාගං, රඤ්ඤෝ මාගධස්ස අජාතසත්තුස්ස වේදේහිපුත්තස්ස පටිවේදේසි: "කප්පිතානි ඛෝ තේ දේව හත්ථියානානි යස්සදානි කාලං මඤ්ඤසී"ති.

9. "එසේය දේවයන් වහන්ස" කියල කෝමාරභච්ච ජීවකයන් වේදේහි පුත්‍ර අජාසත් මගධ රජුට පිළිතුරු දීල පන්සියයක් පමණ ඇතින්නියන් සරසවල, රජතුමාටත් නැඟීමට සුදුසු හස්තියෙක්ව සරසවල වේදේහි පුත්‍ර අජාසත් මගධ රජුට " දේවයන් වහන්ස, ඔබ උදෙසා ඇත්වාහනයන් සරසවල තියෙනවා. යම් ගමනකට දැන් කාලය නම් ඒ ගැන සිතනු මැනව" කියල දැනුම් දුන්නා.

අථ ඛෝ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ පඤ්චසු හත්ථිනිකාසතේසු ප-චේකා ඉත්ථියෝ ආරෝපෙත්වා ආරෝහණියං නාගං අභිරුහිත්වා උක්කාසු ධාරියාමානාසු රාජගහම්හා නියාසි මහ-ච රාජානුභාවේන. යේන ජීවකස්ස කෝමාරභ-චස්ස අම්බවනං තේන පායාසි.

එතකොට වේදේහි පුත්‍ර අජාසත් මගධ රජු පන්සියයක් ඇතිනියන් පිට එක් එක් කාන්තාව බැගින් නංවලා තමන්ට නහින්ට සුදුසු ඇතා පිට තමනුත් නැහලා දඩුවැට පහන් දරාගෙන සිටිද්දී මහත් වූ රාජ ආනුභාවය ඇතිව රජගහ නුවරින් නික්මී කෝමාරභච්ච ජීවක ගේ අඹ වනය තිබෙන තැනට පිටත් වුණා.

10. අථ ඛෝ රඤ්ඤෝ මාගධස්ස අජාතසත්තුස්ස වේදේහිපුත්තස්ස අවිදූරේ අම්බවනස්ස අහුදේව භයං අහු ඡම්භිතත්තං අහු ලෝමහංසෝ. අථ ඛෝ රාජා මාගධෝ අජාතසත්තු වේදේහි පුත්තෝ භීතෝ සංවිග්ගෝ ලෝමහට්ඨජාතෝ ජීවකං කෝමාරභ-චං ඒතදවෝච: "ක-චි මං සම්ම ජීවක න වඤ්ච-සි? ක-චි මං සම්ම ජීවක න පලම්භේසි? ක-චි මං සම්ම ජීවක න ප-චත්ථිකානං දේසි? කථං හි නාම තාවමහතෝ භික්ඛුසංඝස්ස අඩ්ඪ-තේළසානං භික්ඛුසතානං නේව බ්‍යිපිතසද්දෝ භවිස්සති න උක්කාසිතසද්දෝ න නිග්ඝෝසෝ?"ති.

10. එතකොට වේදේහිපුත්‍ර අජාසත් මගධ රජුට අඹ වනයට ළං වෙද්දී භයක් ම යි ඇතිවුණේ. තැති ගැනීමකුයි ඇති වුණේ. ලොමු ඩහගැනීමකුයි ඇති වුණේ. ඉතින් වේදේහි පුත්‍ර අජාසත් මගධ රජු භය වෙලා, තැති අරගෙන ඇහේ මවිල් කෙලින් කරගෙන ජීවක කෝමාරභච්චයන් හට මෙහෙම කිව්වා.

"ඒයි යහළු ජීවකය, මාව රැවැට්ටුවේ නෑ නේද? ඒයි යහළු ජීවකය, මාව මුලා කළේ නෑ නේද? ඒයි යහළු ජීවකය, මාව සතුරන්ට පාවලා දෙන්නෙ නෑ නේද? එක්දහස් දෙසිය පණහක් පමණ වූ ඔතරම් ම මහත් භික්ෂු සඟ පිරිසක ගේ කිවිසුම් හඬක්වත් නැත්තේ කොහොම ද? උගුරපාදන හඬක්වත් නැත්තේ මොකද? කිසි ම සද්දයක් නැත්තේ මොකද?"

"මා භායි මහාරාජ, න තං දේව වඤ්ඵ-මි. න තං දේව පලම්භේමි. න තං දේව ප-චත්ථිකානං දේමි. අභික්කම මහාරාජ, අභික්කම මහාරාජ, ඒතේ මණ්ඩලමාළේ දීපා කධායන්ති"ති.

"මහා රාජයාණෙනි, බිය නොවනු මැනව. මං ඔබව රවටන කෙනෙක් නොවෙයි. මං ඔබව මුලා කරන කෙනෙක් නොවෙයි. මං ඔබව සතුරන්ට පාවලා දෙන්නේ නෑ. මහා රාජයාණෙනි, ඉදිරියටම වඩිනු මැනව. මහා රාජයාණෙනි, ඉදිරියටම වඩිනු මැනව. අර රැස්වීම් ශාලාවේ පහන් දැල්වෙමින් තියෙනවා."

11. අථ ඛෝ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ යාවතිකා නාගස්ස භූමි නාගේන ගන්ත්වා නාගා ප-චෝරෝහිත්වා පත්තිකෝ'ව යේන මණ්ඩලමාළස්ස ද්වාරං තේනුපසංකමි. උපසංකමිත්වා ජීවකං කෝමාරභ-චං ඒතදවෝච: "කහං පන සම්ම ජීවක භගවා?"ති.

11. එතකොට වේදේහිපුත්‍ර අජාසත් මගධ රජතුමා ඇතුපිටින් යා හැකි තරම් දුර ගොස් ඇතුපිටින් බැස පා ගමනින් ම රැස්වීම් ශාලාවේ දොරටුව තෙක් පැමිණුනා. පැමිණිලා ජීවක කෝමාරභච්චයන්ගෙන් මෙහෙම ඇහුවා. "යහළු ජීවකය, භාග්‍යවතුන් වහන්සේ කොහේද?"

"ඒසෝ මහාරාජ භගවා, ඒසෝ මහාරාජ භගවා මජ්ඣිමං ථම්භං නිස්සාය පුරත්ථාභිමුඛෝ නිසින්නෝ පුරක්ඛතෝ භික්ඛුසංඝස්සා"ති.

"මහා රාජයාණෙනි, අර වැඩ ඉන්නේ භාග්‍යවතුන් වහන්සේ. මහා රාජයාණෙනි, මැද කණුවට පිට දී පෙරදිගට මුණලා භික්ෂු සංඝයා පිරිවරා ගෙන භාග්‍යවතුන් වහන්සේ තමයි අර වැඩ ඉන්නේ."

12. අථ ඛෝ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා ඒකමන්තං අට්ඨාසි. ඒකමන්තං ඨිතෝ ඛෝ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ තුණ්හීභූතං තුණ්හීභූතං

භික්ඛුසංඝං අනුවිලෝකෙත්වා රහදමිව විප්පසන්නං, උදානං උදානේසි: "ඉමිනා මේ උපසමේන උදායිභද්දෝ කුමාරෝ සමන්නාගතෝ හෝතු යේනේතරහි උපසමේන භික්ඛුසංඝෝ සමන්නාගතෝ"ති.

12. එතකොට වේදේහිපුත්‍ර අජාසත් මගධ රජතුමා භාග්‍යවතුන් වහන්සේ වැඩසිටින තැනට පැමිණුනා. පැමිණිලා එකත්පස්ව හිට ගත්තා. එකත්පස්ව සිටි වේදේහිපුත්‍ර අජාසත් මගධ රජතුමා මනා සේ පහන් වූ දිය ඇති විලක් පරිද්දෙන් ඉතාමත් නිශ්ශබ්දව වැඩසිටිනා භික්ෂු සංඝයා දෙස හොඳින් ඇස් යොමා බලා මේ උදානය පැවසුවා. "දැන් මෙහි වැඩසිටින භික්ෂු සංඝයා යම් සංසිඳීමකින් යුතු නම් මාගේ උදායීභද්‍ර කුමරා ද මෙවැනි සංසිඳිමෙන් යුතු වේවා" කියලා.

"අගමා ඛෝ ත්වං මහාරාජ යථාපේමං"ති?

"පින්වත් මහාරාජ, ඔබේ සිත ප්‍රේමය ඇති දිශාවට ගියා නේද?"

"පියෝ මේ භන්තේ උදායිභද්දෝ කුමාරෝ. ඉමිනා මේ භන්තේ උපසමේන උදායිභද්දෝ කුමාරෝ සමන්නාගතෝ හෝතු යේනේතරහි උපසමේන භික්ඛුසංඝෝ සමන්නාගතෝ"ති.

"ස්වාමීනී, උදායි භද්‍ර කුමාරයා මට හරි ප්‍රිය යි. ස්වාමීනී, ඒ නිසයි දැන් මෙතැන වැඩසිටින භික්ෂු සංඝයා යම් සංසිඳීමකින් යුක්ත නම් උදායි භද්‍ර කුමාරයා ද මෙබඳු සංසිඳීමෙන් යුතු වේවා යි කියල හිතුවේ."

13. අථ ඛෝ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ භගවන්තං අභිවාදෙත්වා භික්ඛුසංඝස්ස අඤ්ජලිම්පණාමෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නෝ ඛෝ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ භගවන්තං ඒතදවෝච: "පු-ඡෙය්‍යාමහං භන්තේ භගවන්තං කිඤ්චිදේව දේසං, සෙ- මේ භගවා විකාසං කරෝති පඤ්හස්ස වෙය්‍යාකරණායා"ති.

13. එවිට වේදේහිපුත්‍ර අජාසත් මගධ රජතුමා භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට භික්ෂු සංඝයා ද, ඇදිළි බැඳ වැඳ එකත්පස්ව වාඩිවුණා. එකත්පස්ව වාඩිවුණ වේදේහි පුත්‍ර අජාසත් මගධ රජතුමා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පැවසුවා. "ඉදින් භාග්‍යවතුන් වහන්සේ මා හට ප්‍රශ්නයක් අසන්නට අවසර දෙන සේක් නම් ස්වාමීනී, මං භාග්‍යවතුන් වහන්සේගෙන් සුළු කරුණක් අසන්නට කැමතියි.

"පු-ඡ මහාරාජ යදාකංඛසී"ති.

"පින්වත් මහාරාජ, යමක් අසන්ට කැමති නම් එය අසනු මැනව."

14. "යථා නු ඛෝ භන්තේ පුථුසිප්පායතනානි සෙය්‍යථීදං: හත්ථාරෝහා අස්සාරෝහා රථිකා ධනුග්ගහා ෙ-ලකා චලකා පිණ්ඩදායකා උග්ගා රාජපුත්තා පක්ඛන්දිනෝ මහානාගා සූරා චම්මයෝධිනෝ දාසකපුත්තා ආළාරිකා කප්පකා නහාපකා සූදා මාලාකාරා රජකා පේසකාරා නළකාරා කුම්භකාරා ගණකා මුද්දිකා, යානි වා පනඤ්ඤානිපි ඒවංගතිකානි පුථුසිප්පායතනානි, තේ දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සිප්පඵලං උපජීවන්ති. තේ තේන අත්තානං සුඛෙන්ති පීනෙන්ති. මාතාපිතරෝ සුඛෙන්ති පීනෙන්ති. පුත්තදාරං සුඛෙන්ති පීනෙන්ති. මිත්තාම-ෙ- සුඛෙන්ති පීනෙන්ති. සමණේසු බ්‍රාහ්මණේසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙන්ති සෝවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං. සක්කා නු ඛෝ භන්තේ ඒවමේව දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤාපේතුන්ති."

14. ස්වාමීනී, ඉගෙන ගත යුතු යම් ආකාර වූ ශිල්ප ශාස්ත්‍ර රාශියක් තිබෙනවා. ඒ කියන්නේ ඇතරුවන් ඉන්නවා. අශ්වාරෝහකයන් ඉන්නවා. රියැදුරන් ඉන්නවා. දුණුවායන් ඉන්නවා. කොඩි ඔසවාගෙන යන අය ඉන්නවා. සේනා හසුරුවන අය ඉන්නවා. ආහාර සංවිධානය කරන අය ඉන්නවා. බලසම්පන්න නිල දරන රාජ පුත්‍රයින් ඉන්නවා. සේනා මැදට පනින සෙබවින් ඉන්නවා. හස්තිරාජයන් බඳු සෙබවින් ඉන්නවා. තනියම යුධවදින සෙබවින් ඉන්නවා. කඩු පළිහ දරන සෙබවුන් ඉන්නවා. ප්‍රවේනි දාස යෝධයන් ඉන්නවා. ආහාර පිසින සෙබවින් ඉන්නවා. නාවන සෙබවින් ඉන්නවා. සූපකාරයන් ඉන්නවා. මල්කරුවන් ඉන්නවා. රෙදිසෝදන අය ඉන්නවා. රෙදිවියන්නන් ඉන්නවා. බටපොතුවියන්නන් ඉන්නවා. වලං හදන්නන් ඉන්නවා. කිරුම් මිනුම් ගණිත ආදිය දන්න අය ඉන්නවා. මෙවැනි තවත් ශිල්ප ශාස්ත්‍ර වින තරම් තියෙනවා. ඒ ශිල්ප ශාස්ත්‍ර ඉගෙනගත් උදවිය මේ ජීවිතයේ දී ම එහි ප්‍රතිඵලවලින් ජීවත් වෙනවා. ඒ ශිල්පය නිසා ම තමාවත් සුවපත් කරවනවා. පිනවනවා. දෙමව්පියන්වත් සුවපත් කරවනවා. පිනවනවා. අඹු දරුවන්ව සුවපත් කරවනවා. පිනවනවා. යහළු මිත්‍රයන්ව සුවපත් කරවනවා. පිනවනවා. ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි අනාගතයේ සැප විපාක ඇති සුගතියට පමුණුවන්නා වූ පින් රැස්කිරීමට දන්පැන් පුදනවා. ඉතින් ස්වාමීනී, ගිහි ජීවිතයේ දී ඔය විදිහට ප්‍රතිඵල ලබද්දී පැවිදි ජීවිතයෙනුත් ඔය ආකාරයෙන් ම ලබා ගන්නා ප්‍රයෝජන දක්වන්නට පුළුවන් ද?

15. "අභිජානාසි නෝ ත්වං මහාරාජ ඉමං පඤ්හං අඤ්ඤේ සමණබ්‍රාහ්මණේ පු-ඡිතා"ති.

15. "පින්වත් මහාරාජ, ඔබ ඔය ප්‍රශ්නය අනෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගෙනුත් විමසූ බවක් දන්නවා ද?"

"අභිජානාමහං භන්තේ ඉමං පඤ්හං අඤ්ඤේ සමණබ්‍රාහ්මණේ පු-ඡිතා"ති.

ස්වාමීනී, මං මේ ප්‍රශ්නය අනෙක් ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගෙනුත් ඇසූ බව දන්නවා.

"යථාකථං පන තේ මහාරාජ බ්‍යාකරිංසු, සෙ- තේ අගරු භාසස්සූ"ති.

පින්වත් මහාරාජ, ඒ උදවිය ඔය ප්‍රශ්නයට කොහොමද පිළිතුරු දුන්නේ. ඔබට අපහසුවක් නැත්නම් කියන්න.

"න ඛෝ මේ භන්තේ ගරු යත්ථස්ස භගවා වා නිසින්නෝ භගවන්තං රූපෝ වා"ති. "තේන හි මහාරාජ භාසස්සූ"ති.

"ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ හෝ භාග්‍යවතුන් වහන්සේ වැනි කෙනෙක් අභියස මට කිසි අපහසුවක් නැතුව කියන්නට පුළුවනි." එසේ නම් පින්වත් මහා රාජ, කියන්න.

16. "ඒකමිදාහං භන්තේ සමයං යේන පූරණෝ කස්සපෝ තේනුපසංකමිං. උපසංකමිත්වා පූරණේන කස්සපේන සද්ධිං සම්මෝදිං. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදිං. ඒකමන්තං නිසින්නෝ ඛෝ අහං භන්තේ පූරණං කස්සපං ඒතදවෝච: යථා නු ඛෝ ඉමානි භෝ කස්සප පුථුසිප්පායතනානි සෙය්‍යථීදං: හත්ථාරෝහා ..... යානි වා පනඤ්ඤානිපි ඒවංගතිකානි පුථුසිප්පායතනානි, තේ දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සිප්පඵලං උපජීවන්ති. තේ තේන අත්තානං සුඛෙන්ති පීනෙන්ති. මාතාපිතරෝ සුඛෙන්ති පීනෙන්ති. පුත්තදාරං සුඛෙන්ති පීනෙන්ති. මිත්තාම-ෙ- සුඛෙන්ති පීනෙන්ති. සමණේසු බ්‍රාහ්මණේසු උද්ධග්ගිකං දක්ඛිණං පතිට්ඨාපෙන්ති සෝවග්ගිකං සුඛවිපාකං සග්ගසංවත්තනිකං. සක්කා නු ඛෝ භෝ කස්සප ඒවමේව දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤාපේතුන්ති.

16. ස්වාමීනී, මම දවසක් පූරණ කස්සප ළඟට ගියා. ගිහින් පූරණ කස්සපයන් සමඟ සතුටු වුණා. සතුටු විය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව වාඩි වුණා. ඉතින් ස්වාමීනී, එකත්පස්ව වාඩි වුණ මං පූරණ කස්සපයන්ට මෙකරුණ කිව්වා. "භවත් කාශ්‍යප, ඉගෙන ගත යුතු යම් ආකාර වූ ශිල්ප ශාස්ත්‍ර රාශියක් තිබෙනවා. ඒ කියන්නේ ඇතරුවන් ඉන්නවා ..... මෙවැනි තවත් ශිල්ප ශාස්ත්‍ර වින තරම් තියෙනවා. ඒ ශිල්ප ශාස්ත්‍ර ඉගෙනගත් උදවිය මේ ජීවිතයේ දී ම එහි ප්‍රතිඵලවලින් ජීවත් වෙනවා. ඒ ශිල්පය නිසා ම තමාවත් සුවපත් කරවනවා. පිනවනවා. දෙමව්පියන්වත් සුවපත් කරවනවා. පිනවනවා. අඹු දරුවන් ව සුවපත් කරවනවා. පිනවනවා. යහළු මිත්‍රයන්ව සුවපත් කරවනවා. පිනවනවා. ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි අනාගතයේ සැප විපාක ඇති සුගතියට පමුණුවන්නා වූ පින් රැස්කිරීමට දන්පැන් පුදනවා. ඉතින් භවත් කාශ්‍යප, ගිහි ජීවිතයේ දී ඔය විදිහට ප්‍රතිඵල ලබද්දී පැවිදි ජීවිතයෙනුත් ඔය ආකාරයෙන් ම ලබා ගන්නා ප්‍රයෝජන දක්වන්නට පුළුවන් ද?" කියලා.

17. **එවං වුත්තේ භන්තේ පූරණෝ කස්සපෝ මං එතදවෝච: "කරතෝ ඛෝ මහාරාජ කාරයතෝ ඡින්දතෝ ඡේදාපයතෝ පචතෝ පාචයතෝ සෝචයතෝ සෝචාපයතෝ කිලමතෝ කිලමාපයතෝ එන්දතෝ එන්දාපයතෝ පාණමතිපාතයතෝ අදින්නං ආදියතෝ සන්ධිං ඡින්දතෝ නිල්ලෝපං හරතෝ ඒකාගාරිකං කරෝතෝ පරිපන්ථේ තිට්ඨතෝ පරදාරං ග-ඡතෝ මුසා භණතෝ කරෝතෝ න කරියති පාපං, ඛුරපරියන්තේන ච-'පි චක්කේන යෝ ඉමිස්සා පඨවියා පාණේ ඒකමංසඛලං ඒකමංසපුඤ්ජං කරෙය්‍ය, නත්ථි තතෝ නිදානං පාපං. නත්ථි පාපස්ස ආගමෝ, දක්ඛිණඤ්ච-පි ගංගාය තීරං ග-ඡෙය්‍ය හනන්තෝ ඝාතෙන්තෝ ඡින්දන්තෝ ඡේදාපෙන්තෝ පචෙන්තෝ පාචෙන්තෝ නත්ථි තතෝ නිදානං පාපං නත්ථි පාපස්ස ආගමෝ, උත්තරඤ්ච-පි ගංගාය තීරං ග-ඡෙය්‍ය දදන්තෝ දාපෙන්තෝ යජන්තෝ යාජාපෙන්තෝ, නත්ථි තතෝ නිදානං පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමෝ, දානේන දමේන සංයමේන ස-චවජ්ජේන නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමෝ"ති.**

17. ස්වාමීනී, මං ඔය විදිහට ඇසුවහම පූරණ කස්සප මට මෙහෙම කිව්වා. "මහාරාජ, "කරන කෙනාට, අනුන් ලවා කරවන කෙනාට, අනුන් ගේ අත්පා සිඳින කෙනාට, අනුන් ගේ අත්පා සිඳවන කෙනාට, අනුන් ව පෙළන කෙනාටත්, පෙළවන කෙනාටත්, අනුන්ව ශෝකයට පත් කරන කෙනාටත්, කරවන කෙනාටත්, අනුන් ව වෙහෙසන කෙනාටත්, වෙහෙසවන කෙනාටත්,

අනුන් ව කම්පා කරන කෙනාටත්, කම්පා කරවන කෙනාටත්, සතුන් මරණ කෙනාටත්, මරවන කෙනාටත්, නොදුන් දෙය සොරකම් කරන කෙනාටත්, සොරකම් කරවන කෙනාටත්, ගෙවල් බිඳින කෙනාටත්, බිඳවන කෙනාටත්, මං පහරන කෙනාටත්, මං පහරවන කෙනාටත්, එක් ගෙයක් වට කොට කොල්ලකන කෙනාටත්, මහරැක සිට කොල්ලකන කෙනාටත්, පරස්ත්‍රීන් කරා යන කෙනාටත්, බොරු කියන කෙනාටත්, ඒවා කරවන කෙනාටත්, එයින් පවක් නො කෙරෙයි. ඉතා තියුණු මුවහත් ඇති ආයුධයක් ගෙන මේ පොළොවෙහි සියළු සතුන් එකම මස්ගොඩක් බවට, එකම මස් පිණ්ඩයක් බවට පත් කෙරුවත්, ඒ හේතුවෙන් සිදුවෙන පවක් නෑ. පාපයෙහි නැවත පැමිණීමක් නෑ. ඉදින් වනසමින්, ඝාතනය කරවමින්, සිඳිමින්, සිඳවමින්, පෙළමින්, පෙළවමින් දකුණු ගං තෙර දක්වා ගියත් ඒ හේතුවෙන් සිදුවෙන පවක් නෑ. පාපයෙහි නැවත පැමිණීමක් නෑ. ඉදින් දන් දෙමින්, දෙවමින් යාග කරමින්, යාග කරවමින් උතුරු ගං තෙර දක්වා ගියත්, ඒ හේතුවෙන් සිදුවෙන පිනක් නෑ. පිනෙහි නැවත පැමිණීමක් නෑ. දානයෙන්, ඉන්ද්‍රිය දමනයෙන්, සීලසංවරයෙන්, සත්‍ය වචනයෙන් පිනක් ලැබෙන්නේ නෑ. පිනක ආපසු පැමිණීමක් නෑ" කියලා.

ඉත්ථං ඛෝ මේ භන්තේ පූරණෝ කස්සපෝ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨෝ සමානෝ අකිරියං බ්‍යාකාසි. සෙය්‍යථාපි භන්තේ අම්බං වා පුට්ඨෝ ලබුජං බ්‍යාකරෙය්‍ය ලබුජං වා පුට්ඨෝ අම්බං බ්‍යාකරෙය්‍ය, ඒවමේව ඛෝ මේ භන්තේ පූරණෝ කස්සපෝ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨෝ සමානෝ අකිරියං බ්‍යාකාසි.

ඉතින් ස්වාමීනී, මේ ජීවිතයේ දී ම පැවිදිබවෙන් ලබන ප්‍රයෝජන ගැන ඇසූ ප්‍රශ්නයට ඔය විදිහට පූරණ කස්සපයා මට අකිරියවාදය (ක්‍රියාවෙහි ඵල නැතිබව) පැවසුවා. ස්වාමීනී, ඒක මේ වගේ දෙයක්. අඹ ගැන ඇසූ කල්හී දෙල් ගැන කියා දෙනවා වගේ. දෙල් ගැන ඇසූ කල්හී අඹ ගැන කියා දෙනවා වගේ. ඒ අයුරින් ම ස්වාමීනී, මේ ජීවිතයේ දී ම පැවිදිබවෙන් ලබන ප්‍රයෝජන ගැන ඇසූ ප්‍රශ්නයට ඔය විදිහට පූරණ කස්සපයා මට අකිරියවාදය (ක්‍රියාවෙහි ඵල නැතිබව) පැවසුවා.

තස්ස මය්හං භන්තේ ඒතදහෝසි: "කථං හි නාම මාදිසෝ සමණං වා බ්‍රාහ්මණං වා විජිතේ වසන්තං අපසාදේතබ්බං මඤ්ඤෙය්‍යා"ති. සෝ ඛෝ අහං භන්තේ පූරණස්ස කස්සපස්ස භාසිතං නේව අභිනන්දිං නප්පටික්කෝසිං. අනභිනන්දිත්වා අප්පටික්කෝසිත්වා අනත්තමනෝ අනත්තමනවාචං

අනි-ඡාරෙත්වා තමේව වාචං අනුග්ගණ්හන්තෝ අනිකුජ්ජන්තෝ උට්ඨායාසනා පක්කාමිං.

ස්වාමීනී, එතකොට මට මෙහෙමත් හිතුනා. "මං වගේ කෙනෙක් තම විජිතයෙහි වාසය කරන ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පෙළිය යුතුයි කියල කොහොම නම් සිතන්ට ද?" කියලා. ස්වාමීනී, ඒ මං පූරණකස්සපයා ගේ කීම පිළිගත්තේ නෑ. ප්‍රතික්ෂේප කළෙත් නෑ. නො පිළිගෙන, ප්‍රතික්ෂේප නො කොට, නො සතුටු සිතින් යුතු ව, නමුත් නො සතුටු සිතින් වචනයක් නිකුත් කරන්නේ නැතිව, ඒ කියමන භාරගන්නේ නැතිව, සිතේ පිහිටුවා නො ගෙන අසුනෙන් නැගිට නික්මිලා ගියා.

18. "ඒකමිදාහං භන්තේ සමයං යේන මක්ඛලී ගෝසාලෝ තේනුපසංකමිං. උපසංකමිත්වා මක්ඛලීනා ගෝසාලේන සද්ධිං සම්මෝදිං. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදිං. ඒකමන්තං නිසින්නෝ ඛෝ අහං භන්තේ මක්ඛලිං ගෝසාලං ඒතදවෝච: යථා නු ඛෝ ඉමානි භෝ ගෝසාල පුථුසිප්පායතනානි සෙය්‍යථීදං: හත්ථාරෝහා ..... සක්කා නු ඛෝ භෝ ගෝසාල ඒවමේව දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤාපේතුන්ති.

18. ස්වාමීනී, මං එක්තරා දවසක මක්ඛලී ගෝසාලයන් ළඟට ගියා. ගිහින් මක්ඛලී ගෝසාලයන් සමඟ සතුටුවුණා. සතුටු විය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව වාඩි වුණා. ඉතින් ස්වාමීනී, එකත්පස්ව වාඩි වුණ මං මක්ඛලී ගෝසාලයන්ට මෙකරුණ කිව්වා. "භවත් ගෝසාල, ඉගෙන ගත යුතු යම් ආකාර වූ ශිල්ප ශාස්ත්‍ර රාශියක් තිබෙනවා. ඒ කියන්නේ ඇතරුවන් ඉන්නවා ..... ඉතින් භවත් ගෝසාල, ගිහි ජීවිතයේ දී ඔය විදිහට ප්‍රතිඵල ලබද්දී පැවිදි ජීවිතයෙනුත් ඔය ආකාරයෙන් ම ලබා ගන්නා ප්‍රයෝජන දක්වන්නට පුළුවන් ද?" කියලා.

19. ඒවං වුත්තේ භන්තේ මක්ඛලී ගෝසාලෝ මං ඒතදවෝච: "නත්ථි මහාරාජ හේතු නත්ථි ප-චයෝ සත්තානං සංකිලේසාය, අහේතු අප-චයා සත්තා සංකිලිස්සන්ති, නත්ථි හේතු නත්ථි ප-චයෝ සත්තානං විසුද්ධියා අහේතු අප-චයා සත්තා විසුජ්ඣන්ති, නත්ථි අත්තකාරේ, නත්ථි පරකාරේ, නත්ථි පුරිසකාරේ, නත්ථි බලං නත්ථි විරියං නත්ථි පුරිසථාමෝ නත්ථි පුරිසපරක්කමෝ සබ්බේ සත්තා සබ්බේ පාණා සබ්බේ භූතා සබ්බේ ජීවා අවසා අබලා අවිරියා නියතිසංගතිභාවපරිණතා ඡස්සේවාභිජාතිසු සුඛදුක්ඛං පටිසංවේදෙන්ති"ති.

19. ස්වාමීනී, මං ඔය විදිහට කිව්වහම මක්ඛලී ගෝසාලයා මට මෙහෙම කිව්වා. "මහාරාජ, සත්වයන් ගේ කිළිටු වීමට හේතු වන දේවල් නැත. උපකාර වන දේවල් නැත. හේතු රහිත ව ම, ප්‍රත්‍ය රහිතව ම සත්වයන් කෙලෙසී යනවා. සත්වයන් ගේ පිරිසිදු වීමට හේතු වන දේවල් නැත. උපකාර වන දේවල් නැත. හේතු රහිත ව ම, ප්‍රත්‍ය රහිතව ම සත්වයන් පිරිසිදු වෙනවා. පිරිසිදු වීම පිණිස තමා විසින් කළ යුතු දෙයක් නැත. අනුන් විසින් කළ යුතු දෙයක් නැත. පුරුෂයා විසින් කළ යුතු දෙයක් නැත. කායික මානසිකව පවතින බලයක් නැත. වීරියක් නැත. පුරුෂ වීරිය කියා දෙයක් නැත. පුරුෂ පරාක්‍රමය කියා දෙයක් නැත. සියළු සත්වයන්, සියළු ප්‍රාණීන්, සියළු භූතයින්, සියළු ජීවීන්, ඉන්නේ තමන් ගේ පාලනයෙන් තොරව යි. බල රහිතව යි. වීරිය රහිතව යි. නියත වශයෙන් ම සසර සැරිසැරීමෙන් මෝරලා යනවා. අභිජාති හය තුළ තමයි ඔවුන් සැප දුක් විඳින්නේ."

චුද්දස ඛෝ පනිමානි යෝනිප්පමුඛසතසහස්සානි සට්ඨි ච සතානි ඡ ච සතානි, පඤ්ච ච කම්මුනෝ සතානි, පඤ්ච ච කම්මානි, තීණි ච කම්මානි, කම්මේ ච අඩ්ඪකම්මේ ච. ද්වට්ඨි පටිපදා, ද්වට්ඨන්තරකප්පෝ, ඡළභිජාතියෝ, අට්ඨ පුරිසභූමියෝ, ඒකූනපඤ්ඤාස ආජීවකසතේ, ඒකූනපඤ්ඤාස පරිබ්බාජකසතේ, ඒකූනපඤ්ඤාස නාගාවාසසතේ, වීසේ ඉන්ද්‍රියසතේ, තිංස නිරයසතේ, ඡත්තිංස රජෝධාතුයෝ, සත්ත සඤ්ඤීගබ්භා, සත්ත අසඤ්ඤීගබ්භා, සත්ත නිගණ්ඨීගබ්භා, සත්ත දේවා, සත්ත මානුසා, සත්ත පේසාචා, සත්ත සරා, සත්ත පවුටා, සත්ත පවුටසතානි, සත්ත පපාතා, සත්ත පපාතසතානි, සත්ත සුපිනා, සත්ත සුපිනසතානි, චුළාසීති මහකප්පුනෝ සතසහස්සානි යානි බාලේ ච පණ්ඩිතේ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති.

"මේ ප්‍රධාන යෝනි (උප්පත්ති ස්ථාන) දාහතරලක්ෂයක් තියෙනවා. තවත් යෝනි හයදාහක්. තව හයසියයකුත් තියෙනවා. කර්ම පන්සියයක් තියෙනවා. තව කර්ම පහක් තියෙනවා. තව කර්ම තුනකුත් තියෙනවා. සම්පූර්ණ කර්මත්, අර්ධ කර්මත් තියෙනවා. ප්‍රතිපදා හැට දෙකක් තියෙනවා. අන්තර කල්ප හැට දෙකක් තියෙනවා. අභිජාති හයක් තියෙනවා. පුරුෂ භූමි අටක් තියෙනවා. ආජීවයන් එකසියහතළිස්නවයක් තියෙනවා. පරිබ්‍රාජක පැවිදිකම් එකසියහතළිස්නවයක් තියෙනවා. නාගයන් ගේ වාසස්ථාන එකසියහතළිස්නවයක් තියෙනවා. ඉන්ද්‍රියයන් එකසියවිස්සක් තියෙනවා. නිරය එකසිය තිහක් තියෙනවා. රජෝධාතු තිස්හයක් තියෙනවා. සඤ්ඤී ගර්භ හතක් තියෙනවා. අසඤ්ඤී ගර්භ හතක් තියෙනවා. නිගණ්ඨ ගර්භ

හතක් තියෙනවා. දේව ගර්භ හතක් තියෙනවා. මිනිස් ගර්භ හතක් තියෙනවා. පිසාච ගර්භ හතක් තියෙනවා. මහාවිල් හතක් තියෙනවා. මහා ගැට හතක් තියෙනවා. කුඩා ගැට හත් සියයක් තියෙනවා. ප්‍රපාත හතක් තියෙනවා. කුඩා ප්‍රපාත හත්සියයක් තියෙනවා. මහා සිහින හතක් තියෙනවා. කුඩා සිහින හත් සියයක් තියෙනවා. අඳුන උදවියත් නුවණැති උදවියත් යන කවුරුත් කල්ප අසූහතර ලක්ෂයක් සංසාරේ සැරිසරලයි දුක් කෙළවර කරන්නේ."

තත්ථ නත්ථි ඉමිනාහං සීලේන වා වතේන වා තපේන වා බ්‍රහ්මචරියේන වා අපරිපක්කං වා කම්මං පරිපාචෙස්සාමීති පරිපක්කං වා කම්මං ඵුස්ස ඵුස්ස බ්‍යන්තී කරිස්සාමීති හේවං නත්ථි. දෝණමිතේ සුඛදුක්ඛේ පරියන්තකතේ. සංසාරේ නත්ථි හායනවඩ්ඪනේ, නත්ථි උක්කංසාවකංසේ. සෙය්‍යථාපි නාම සුත්තගුළේ ඛිත්තේන නිබ්බේධියමානමේව පළේති, එවමේව බාලේ ච පණ්ඩිතේ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්තීති.

"එහි මේවා නෑ. "මං මේ සීලයෙන් හරි, ව්‍රතයෙන් හරි, තපසෙන් හරි, බ්‍රහ්මචාරී ජීවිතයෙන් හරි, නො මේරූ කර්මයන් මුහුකුරුවන්නෙමි යි කියලා හෝ මේරූ කර්මයන් විඳව විඳවා කෙළවර කරන්නෙමි යි" කියලා කියනවා නම් එහෙම දෙයක් නෑ. ඔය සැප දුක් කියෙන්නේ ද්‍රෝණයකින් මැනලා තියෙන දෙයක් වගේ. සංසාරය කෙළවර වෙන්නේ ඒ විදිහට යි. සසරේ පිරිහීමකුත් නෑ. වැඩීමකුත් නෑ. නැගීමකුත් නෑ. බැසීමකුත් නෑ. ඒක හරියට ඇතට වීසි කරපු නූල් බෝලයක් වගේ. ඒ නූල එතිලා තියෙන ප්‍රමාණයට යි ලෙහි ලෙහී යන්නේ. අන්න ඒ වගේ තමයි අඳුන උදවියත්, පණ්ඩිත උදවියත් ලෙහි ලෙහී යමින් සැප දුක් විඳිනවා" කියලා.

ඉත්ථං ඛෝ මේ භන්තේ මක්ඛලී ගෝසාලෝ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨෝ සමානෝ සංසාරසුද්ධිං ඛ්‍යාකාසි. සෙය්‍යථාපි භන්තේ අම්බං වා පුට්ඨෝ ලබුජං ඛ්‍යාකරෙය්‍ය ලබුජං වා පුට්ඨෝ අම්බං ඛ්‍යාකරෙය්‍ය, එවමේව ඛෝ මේ භන්තේ මක්ඛලී ගෝසාලෝ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨෝ සමානෝ සංසාරසුද්ධිං ඛ්‍යාකාසි. තස්ස මය්හං භන්තේ ඒතදහෝසි: "කතං හි නාම මාදිසෝ සමණං වා බ්‍රාහ්මණං වා විජිතේ වසන්තං අපසාදේතබ්බං මඤ්ඤෙය්‍යා?"ති. සෝ ඛෝ අහං භන්තේ මක්ඛලිගෝසාලස්ස භාසිතං නේව අභිනන්දිං නප්පටික්කෝසිං. අනභිනන්දිත්වා අප්පටික්කෝසිත්වා අනත්තමනෝ අනත්තමනවාචං අනි-ඡාරෙත්වා තමේව වාචං අනුග්ග-ණ්හන්තෝ අනිකුජ්ජන්තෝ උට්ඨායාසනා පක්කාමිං.

ඉතින් ස්වාමීනී, මේ ජීවිතයේ දී ම පැවිදිබවෙන් ලබන ප්‍රයෝජන ගැන ඇසූ ප්‍රශ්නයට ඔය විදිහට මක්ඛලී ගෝසාලයා මට සංසාර ශුද්ධිවාදය (ඉබේ ම සසරින් නිදහස් වෙන බව) පැවසුවා. ස්වාමීනී, එක මේ වගේ දෙයක්. අඹ ගැන ඇසූ කල්හී දෙල් ගැන කියා දෙනවා වගේ. දෙල් ගැන ඇසූ කල්හී අඹ ගැන කියා දෙනවා වගේ. ඒ අයුරින් ම ස්වාමීනී, මේ ජීවිතයේ දී ම පැවිදිබවෙන් ලබන ප්‍රයෝජන ගැන ඇසූ ප්‍රශ්නයට ඔය විදිහට මක්ඛලී ගෝසාලයා මට සංසාර ශුද්ධිවාදය (ඉබේ ම සසරින් නිදහස් වෙන බව) පැවසුවා. ස්වාමීනී, එතකොට මට මෙහෙමත් හිතුනා. "මං වගේ කෙනෙක් තම විජිතයෙහි වාසය කරන ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පෙළිය යුතුයි කියල කොහොම නම් සිතන්ට ද?" කියලා. ස්වාමීනී, ඒ මං මක්ඛලී ගෝසාලයා ගේ කීම පිළිගත්තේ නෑ. ප්‍රතික්ෂේප කළෙත් නෑ. නො පිළිගෙන, ප්‍රතික්ෂේප නො කොට, නො සතුටු සිතින් යුතු ව, නමුත් නො සතුටු සිතින් වචනයක් නිකුත් කරන්නේ නැතිව, ඒ කියමන භාරගන්නේ නැතිව, සිතේ පිහිටුවා නො ගෙන අසුනෙන් නැගිට නික්මිලා ගියා.

20. "ඒකමිදාහං භන්තේ සමයං යේන අජිතෝ කේසකම්බලෝ තේනුපසංකමිං. උපසංකමිත්වා අජිතේන කේසකම්බලේන සද්ධිං සම්මෝදිං. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදිං. ඒකමන්තං නිසින්නෝ ඛෝ අහං භන්තේ අජිතං කේසකම්බලං ඒතදවෝච: යථා නු ඛෝ ඉමානි භෝ අජිත පුථුසිප්පායතනානි සෙය්‍යථීදං: හත්ථාරෝහා ..... සක්කා නු ඛෝ භෝ අජිත ඒවමේව දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤාපේතුන්ති.

20. ස්වාමීනී, මං එක්තරා දවසක කේසකම්බල අජිත ළඟට ගියා. ගිහින් කේසකම්බල අජිතයන් සමඟ සතුටුවුණා. සතුටු විය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව වාඩි වුණා. ඉතින් ස්වාමීනී, එකත්පස්ව වාඩි වුණ මං කේසකම්බල අජිතයන්ට මෙකරුණ කිව්වා. "භවත් අජිත, ඉගෙන ගත යුතු යම් ආකාර වූ ශිල්ප ශාස්ත්‍ර රාශියක් තිබෙනවා. ඒ කියන්නේ ඇතරුවන් ඉන්නවා ..... ඉතින් භවත් අජිත, ගිහි ජීවිතයේ දී ඔය විදිහට ප්‍රතිඵල ලබද්දී පැවිදි ජීවිතයෙනුත් ඔය ආකාරයෙන් ම ලබා ගන්නා ප්‍රයෝජන දක්වන්නට පුළුවන් ද?" කියලා.

ඒවං වුත්තේ භන්තේ අජිතෝ කේසකම්බලෝ මං ඒතදවෝච: "නත්ථි මහාරාජ දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකෝ, නත්ථි අයං ලෝකෝ, නත්ථි පරෝලෝකෝ, නත්ථි

මාතා, නත්ථි පිතා, නත්ථි සත්ථා විපපාතිකා, නත්ථි ලෝකේ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යේ ඉමඤ්ච ලෝකං පරඤ්ච ලෝකං සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදෙන්ති. චාතුම්මහාභූතිකෝ අයං පුරිසෝ යදා කාලං කරෝති, පඨවී පඨවීකායං අනුපේති, අනුපග-ඡති, ආපෝ ආපෝකායං අනුපේති, අනුපග-ඡති, තේජෝ තේජෝකායං අනුපේති, අනුපග-ඡති, වායෝ වායෝකායං අනුපේති, අනුපග-ඡති, ආකාසං ඉන්ද්‍රියානි සංකමන්ති, ආසන්දිපඤ්චමා පුරිසා මතං ආදාය ග-ඡන්ති, යාව ආළහනා පදානි පඤ්ඤායන්ති, කාපෝතකානි අට්ඨීනි භවන්ති, භස්මන්තා ආහුතියෝ, දත්තුපඤ්ඤත්තං යදිදං දානං. තේසං තු-ඡං මුසා විලාපෝ. යේ කේචි අත්ථිකවාදං වදන්ති බාලේ ච පණ්ඩිතේ ච කායස්ස භේදා උ-ඡිජ්ජන්ති විනස්සන්ති, න හොන්ති පරම්මරණා"ති.

ස්වාමීනී, මං ඔය විදිහට කිව්වහම කේසකම්බල අජිතයා මට මෙහෙම කිව්වා. "මහාරාජ, දීමෙහි විපාක නැත. පුදපූජාවන්වල විපාක නැත. ඇප උපස්ථාන සේවා ආදියෙහි විපාක නැත. කුසල අකුසල කර්මයන් ගේ විපාක නැත. මෙලොව නැත. පරලොවක් නැත. (විශේෂයෙන් සැළකිය යුතු) මවක් නැත. (විශේෂයෙන් සැළකිය යුතු) පියෙක් නැත. විපපාතික සත්වයන් නැත. ලෝකයෙහි යහපත් මගෙහි ගමන් කළ, යහපත් ප්‍රතිපදාවෙන් යුතුව මේ ලෝකයත්, පරලොවත් ස්වකීය ප්‍රඥාවෙන් ම අවබෝධ කොට ප්‍රකාශ කරන්නා වූ යම් ශ්‍රමණ බමුණන් ද නැත. සතර මහා ධාතූන්ගෙන් හටගත් මේ පුරුෂයා යම් දවසක කව්රිය කළෝතින් පඨවි ධාතුව, පඨවි ධාතුවට එකතු වෙනවා. අපෝ ධාතුව, ආපෝ ධාතුවට එකතු වෙනවා. තේජෝ ධාතුව, තේජෝ ධාතුවට එකතු වෙනවා. වායෝ ධාතුව, වායෝ ධාතුවට එකතු වෙනවා. ඉන්ද්‍රියයන් අහස කරා යනවා. මිනී ඇඳ පස්වෙනුවට තබා ගත් පුරුෂයන් මළ සිරුර රැගෙන යනවා. ගුණ ගායනය තියෙන්නේ ආදාහනය දක්වා විතරයි. ඇට ටික පරවිපැහැ ගැන්වෙනවා. හෝම පූජාවන් අළුවලින් අවසන් වෙනවා. දානය කියා කියන්නේ අඥානයින් පණවා ගත්තු දෙයක්. යම් කිසි කෙනෙක් විවා තියෙනවා කියලා කියනවා නම්, ඒවා ඔවුන්ගේ තුච්ඡ වූ බොරු ප්‍රලාප විතරයි. අඥාන උදවියත්, නුවණැති උදවියත් කය බිඳුනට පස්සේ උච්ඡේදයට පත්වෙනවා. වැනසිලා යනවා. මරණින් මතු පැවැත්මක් නෑ" කියලා.

ඉත්ථං ඛෝ මේ භන්තේ අජිතෝ කේසකම්බලෝ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨෝ සමානෝ උ-ඡේදං බ්‍යාකාසි. සෙය්‍යථාපි භන්තේ අම්බං වා පුට්ඨෝ ලබුජං බ්‍යාකරෙය්‍ය ලබුජං වා පුට්ඨෝ අම්බං බ්‍යාකරෙය්‍ය, ඒවමේව ඛෝ මේ භන්තේ අජිතෝ කේසකම්බලෝ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං

පුට්ඨෝ සමානෝ උ-ඡේදං බ්‍යාකාසි. තස්ස මය්හං භන්තේ ඒතදහෝසි: "කථං හි නාම මාදිසෝ සමණං වා බ්‍රාහ්මණං වා විජිතේ වසන්තං අපසාදේතබ්බං මඤ්ඤෙය්‍යා?"ති. සෝ ඛෝ අහං භන්තේ අජිතස්ස කේසකම්බලස්ස භාසිතං නේව අභිනන්දිං නප්පටික්කෝසිං. අනභිනන්දිත්වා අප්පටික්කෝසිත්වා අනත්තමනෝ අනත්තමනවාචං අනි-ඡාරෙත්වා තමේව වාචං අනුග්ග-ණ්හන්තෝ අනිකුජ්ජන්තෝ උට්ඨායාසනා පක්කාමිං.

ඉතින් ස්වාමීනී, මේ ජීවිතයේ දී ම පැවිදිබවෙන් ලබන ප්‍රයෝජන ගැන ඇසූ ප්‍රශ්නයට ඔය විදිහට කේසකම්බල අජිතයා මට උච්ඡේදවාදය (මරණින් මතු සම්පූර්ණයෙන් වැනසී යාම) පැවසුවා. ස්වාමීනී, ඒක මේ වගේ දෙයක්. අඹ ගැන ඇසූ කල්හී දෙල් ගැන කියා දෙනවා වගේ. දෙල් ගැන ඇසූ කල්හී අඹ ගැන කියා දෙනවා වගේ. ඒ අයුරින් ම ස්වාමීනී, මේ ජීවිතයේ දී ම පැවිදිබවෙන් ලබන ප්‍රයෝජන ගැන ඇසූ ප්‍රශ්නයට ඔය විදිහට කේසකම්බල අජිතයා මට උච්ඡේදවාදය (මරණින් මතු සම්පූර්ණයෙන් වැනසී යාම) පැවසුවා. ස්වාමීනී, එතකොට මට මෙහෙමත් හිතුනා. "මං වගේ කෙනෙක් තම විජිතයෙහි වාසය කරන ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පෙළිය යුතුයි කියල කොහොම නම් සිතන්ට ද?" කියලා. ස්වාමීනී, ඒ මං කේසකම්බල අජිතයා ගේ කීම පිළිගත්තේ නෑ. ප්‍රතික්ෂේප කළෙත් නෑ. නො පිළිගෙන, ප්‍රතික්ෂේප නො කොට, නො සතුටු සිතින් යුතු ව, නමුත් නො සතුටු සිතින් වචනයක් නිකුත් කරන්නේ නැතිව, ඒ කියමන භාරගන්නේ නැතිව, සිතේ පිහිටුවා නො ගෙන අසුනෙන් නැගිට නික්මිලා ගියා.

21. "ඒකම්දාහං භන්තේ සමයං යේන පකුධෝ ක-චායනෝ තේනුපසංකමිං. උපසංකමිත්වා පකුධේන ක-චායනේන සද්ධිං සම්මෝදිං. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදිං. ඒකමන්තං නිසින්නෝ ඛෝ අහං භන්තේ පකුධං ක-චායනං ඒතදවෝච: යථා නු ඛෝ ඉමානි හෝ ක-චායන පුථුසිප්පායතනානි සෙය්‍යථීදං: හත්ථාරෝහා ..... සක්කා නු ඛෝ හෝ ක-චායන ඒවමේව දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤාපේතු?න්ති.

21. ස්වාමීනී, මං එක්තරා දවසක පකුධ කච්චායනයන් ළඟට ගියා. ගිහින් පකුධ කච්චායනයන් සමඟ සතුටුවුණා. සතුටු විය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව වාඩි වුණා. ඉතින් ස්වාමීනී, එකත්පස්ව වාඩි වුණ මං පකුධ කච්චායනයන්ට මෙකරුණ කිව්වා. "භවත් කච්චායන, ඉගෙන ගත යුතු යම් ආකාර වූ ශිල්ප ශාස්ත්‍ර රාශියක් තිබෙනවා. ඒ කියන්නේ

ඇතරුවන් ඉන්නවා ..... ඉතින් භවත් කච්චායන, ගිහි ජීවිතයේ දී ඔය විදිහට ප්‍රතිඵල ලබද්දී පැවිදි ජීවිතයෙනුත් ඔය ආකාරයෙන් ම ලබා ගන්නා ප්‍රයෝජන දක්වන්නට පුළුවන් ද?" කියලා.

ඒවං වුත්තේ භන්තේ පකුධෝ ක-චායනෝ මං ඒතදවෝච: "සන්තිමේ මහාරාජ කායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඣා කූටට්ඨා ඒසිකට්ඨායිට්ඨිතා, තේ න ඉඤ්ජන්ති න විපරිණමන්ති න අඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්ති, නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා. කතමේ සත්ත: පඨවීකායෝ ආපෝකායෝ තේජෝකායෝ වායෝකායෝ සුඛේ දුක්ඛේ ජීවේ සත්තමේ. ඉමේ සත්තකායා අකටා අකටවිධා අනිම්මිතා අනිම්මාතා වඤ්ඣා කූටට්ඨා ඒසිකට්ඨායිට්ඨිතා, තේ න ඉඤ්ජන්ති න විපරිනමන්ති න අඤ්ඤමඤ්ඤං ව්‍යාබාධෙන්ති, නාලං අඤ්ඤමඤ්ඤස්ස සුඛාය වා දුක්ඛාය වා සුඛදුක්ඛාය වා. තත්ථ නත්ථි හන්තා වා ඝාතේතා වා සෝතා වා සාවේතා වා විඤ්ඤාතා වා විඤ්ඤාපේතා වා. යෝපි තික්ඛේන සත්තේන සීසං ඡින්දති න කෝචි කඤ්චි ජීවිතා වෝරෝපේති, සත්තන්නං යේව කායානමන්තරේන සත්ථං විවරමනුපතතී"ති.

ස්වාමීනී, ඔය විදිහට මං කිව්වහම පකුධ කච්චායනයා මට මෙහෙම කිව්වා. "මහාරාජ, "මේ කාය හතක් තියෙනවා. ඒවා කවුරුත් කළ දේවල් නොවෙයි. විධානය කරලා නොවෙයි. දේව මැවිල්ලක් නොවෙයි. වෙන මැවිල්ලකුත් නොවෙයි. වඳ බැහැල යි තියෙන්නේ. පර්වත කූටයක් වගේ ස්ථිරව යි තියෙන්නේ. ඒෂිකාස්ථම්භයක් වගේ ස්ථිරව යි තියෙන්නේ. ඒවායේ වෙනස්කම් ඇති වන්නේ නෑ. පරිණාමයක් වෙන්නේ නෑ. එකිනෙකට බාධා ඇතිවෙන්නේ නෑ. එකිනෙකට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැපදුක් පිණිස හෝ පවතින්නේ නෑ. ඒ සප්ත කාය කුමක් ද? පඨවිකාය, අපෝකාය, තේජෝකාය, වායෝකාය, සැප, දුක හා ජීව යන හත යි. මේ තමයි සප්ත කාය. මේවා කවුරුත් කළ දේවල් නොවෙයි. විධානය කරලා නොවෙයි. දේව මැවිල්ලක් නොවෙයි. වෙන මැවිල්ලකුත් නොවෙයි. වඳ බැහැල යි තියෙන්නේ. පර්වත කූටයක් වගේ ස්ථිරව යි තියෙන්නේ. ඒෂිකාස්ථම්භයක් වගේ ස්ථිරව යි තියෙන්නේ. ඒවායේ වෙනස්කම් ඇති වන්නේ නෑ. පරිණාමයක් වෙන්නේ නෑ. එකිනෙකට බාධා ඇතිවෙන්නේ නෑ. එකිනෙකට සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැපදුක් පිණිස හෝ පවතින්නේ නෑ. නසන කෙනෙක් නැත. නසවන කෙනෙක් ද නැත. අසන කෙනෙක් ද නැත. අසවන කෙනෙක් ද නැත. දන්නා කෙනෙක් ද නැත. දනවන්නා වූ කෙනෙක් ද නැත. යම් කෙනෙක් තියුණු ආයුධයක් ගෙන තව කෙනෙකු ගේ හිස සින්දොත්, කවුරුවත්, කාගෙවත්

ජීවිතය තොර කළේ නෑ. අර සප්තකාය අතරින් ආයුධය සිදුරු කර ගෙන ගියා විතරයි" කියලා

ඉත්ථං ඛෝ මේ භන්තේ පකුධෝ ක-චායනෝ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨෝ සමානෝ අඤ්ඤේන අඤ්ඤං බ්‍යාකාසි. සෙය්‍යථාපි භන්තේ අම්බං වා පුට්ඨෝ ලබුජං බ්‍යාකරෙය්‍ය ලබුජං වා පුට්ඨෝ අම්බං බ්‍යාකරෙය්‍ය, ඒවමේව ඛෝ මේ භන්තේ පකුධෝ ක-චායනෝ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨෝ සමානෝ අඤ්ඤේන අඤ්ඤං බ්‍යාකාසි. තස්ස මය්හං භන්තේ ඒතදහෝසි: "කථං හි නාම මාදිසෝ සමණං වා බ්‍රාහ්මණං වා විජිතේ වසන්තං අපසාදේතබ්බං මඤ්ඤෙය්‍යා?"ති. සෝ ඛෝ අහං භන්තේ පකුධස්ස ක-චායනස්ස භාසිතං නේව අභිනන්දිං නප්පටික්කෝසිං. අනභිනන්දිත්වා අප්පටික්කෝසිත්වා අනත්තමනෝ අනත්තමනවාචං අනි-ඡාරෙත්වා තමේව වාචං අනුග්ගණ්හන්තෝ අනික්කුජ්ජන්තෝ උට්ඨායාසනා පක්කාමිං.

ඉතින් ස්වාමීනී, මේ ජීවිතයේ දී ම පැවිදිබවෙන් ලබන ප්‍රයෝජන ගැන ඇසූ ප්‍රශ්නයට ඔය විදිහට පකුධ කච්චායනයා මට එකිනෙකට හාත්පසින් විරුද්ධ දෙයක් පැවසුවා. ස්වාමීනී, ඒක මේ වගේ දෙයක්. අඹ ගැන ඇසූ කල්හී දෙල් ගැන කියා දෙනවා වගේ. දෙල් ගැන ඇසූ කල්හී අඹ ගැන කියා දෙනවා වගේ. ඒ අයුරින් ම ස්වාමීනී, මේ ජීවිතයේ දී ම පැවිදිබවෙන් ලබන ප්‍රයෝජන ගැන ඇසූ ප්‍රශ්නයට ඔය විදිහට පකුධ කච්චායනයා මට එකිනෙකට හාත්පසින් විරුද්ධ දෙයක් පැවසුවා. ස්වාමීනී, එතකොට මට මෙහෙමත් හිතුනා. "ම‍ං වගේ කෙනෙක් තම විජිතයෙහි වාසය කරන ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පෙළිය යුතුයි කියල කොහොම නම් සිතන්ට ද?" කියලා. ස්වාමීනී, ඒ ම‍ං පකුධ කච්චායනයා ගේ කීම පිළිගත්තේ නෑ. ප්‍රතික්ෂේප කළෙත් නෑ. නො පිළිගෙන, ප්‍රතික්ෂේප නො කොට, නො සතුටු සිතින් යුතු ව, නමුත් නො සතුටු සිතින් වචනයක් නිකුත් කරන්නේ නැතිව, ඒ කියමන භාරගන්නේ නැතිව, සිතේ පිහිටුවා නො ගෙන අසුනෙන් නැගිට නික්මිලා ගියා.

22. "ඒකමිදාහං භන්තේ සමයං යේන නිගණ්ඨෝ නාතපුත්තෝ තේනුපසංකමිං. උපසංකමිත්වා නිගණ්ඨේන නාතපුත්තේන සද්ධිං සම්මෝදිං. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදිං. ඒකමන්තං නිසින්නෝ ඛෝ අහං භන්තේ නිගණ්ඨං නාතපුත්තං ඒතදවෝච: යථා නු ඛෝ ඉමානි භෝ අග්ගිවෙස්සන පුථුසිප්පායතනානි සෙය්‍යථීදං: හත්ථාරෝහා ..... සක්කා නු ඛෝ භෝ අග්ගිවෙස්සන ඒවමේව දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤාපේතු?"න්ති.

22. ස්වාමීනී, මං එක්තරා දවසක නිගණ්ඨ නාතපුත්ත ළඟට ගියා. ගිහින් නිගණ්ඨ නාතපුත්ත සමඟ සතුටුවුණා. සතුටු විය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව වාඩි වුණා. ඉතින් ස්වාමීනී, එකත්පස්ව වාඩි වුණ මං නිගණ්ඨ නාතපුත්තට මෙකරුණ කිව්වා. "භවත් අග්ගිවෙස්සන, ඉගෙන ගත යුතු යම් ආකාර වූ ශිල්ප ශාස්ත්‍ර රාශියක් තිබෙනවා. ඒ කියන්නේ ඇතරුවන් ඉන්නවා ..... ඉතින් භවත් අග්ගිවෙස්සන, ගිහි ජීවිතයේ දී ඔය විදිහට ප්‍රතිඵල ලබද්දී පැවිදි ජීවිතයෙනුත් ඔය ආකාරයෙන් ම ලබා ගන්නා ප්‍රයෝජන දක්වන්නට පුළුවන් ද?" කියලා.

ඒවං වුත්තේ භන්තේ නිගණ්ඨෝ නාතපුත්තෝ මං ඒතදවෝච: "ඉධ මහාරාජ නිගණ්ඨෝ චාතුයාමසංවරසංවුතෝ හෝති. කථඤ්ච මහාරාජ නිගණ්ඨෝ චාතුයාමසංවරසංවුතෝ හෝති? ඉධ මහාරාජ නිගණ්ඨෝ සබ්බවාරිවාරිතෝ ච හෝති, සබ්බවාරියුතෝ ච, සබ්බවාරිධුතෝ ච, සබ්බවාරිඵුටෝ ච. ඒවං ඛෝ මහාරාජ නිගණ්ඨෝ, චාතුයාමසංවරසංවුතෝ හෝති. අයං වු-චති මහාරාජ නිගණ්ඨෝ ගතත්තෝ ච යතත්තෝ ච ඨිතත්තෝ චා"ති.

ස්වාමීනී, මං මෙහෙම කිව්වහම නිගණ්ඨ නාතපුත්තයා මට මෙහෙම කිව්වා. "මහාරාජ, නිගණ්ඨයා අවස්ථා හතරක සංවරයෙන් සංවරව ඉන්නවා. මහාරාජ, නිගණ්ඨයා අවස්ථා හතරක සංවරයෙන් සංවරව ඉන්නේ කොහොම ද? මහාරාජ, මෙහිලා නිගණ්ඨයා සියළු ඇල්දිය පරිහරණයෙන් වැළකී ඉන්නවා. ඒ වගේ ම සියළු පවින් සංවරව ඉන්නවා. සියළු පව් තපසින් පිඹ හැරල ඉන්නවා. සියළු පව් දුරු කළ බව ස්පර්ශ කරල ඉන්නවා. මහාරාජ, ඔය ආකාරයට යි නිගණ්ඨයා චතුයාම සංවරයෙන් යුක්ත වන්නේ. මහාරාජ, මේ නිගණ්ඨයාට කියන්නේ අවශ්‍ය අරමුණට ගිය ආත්මය ඇති කෙනා කියල යි. තවන ලද ආත්මය ඇති කෙනා කියල යි. මැනවින් පිහිටි ආත්මය ඇති කෙනා කියල යි.

ඉත්ථං ඛෝ මේ භන්තේ නිගණ්ඨෝ නාතපුත්තෝ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨෝ සමානෝ චාතුයාමසංවරං බ්‍යාකාසි. සෙය්‍යථාපි භන්තේ අම්බං වා පුට්ඨෝ ලබුජං බ්‍යාකරෙය්‍ය ලබුජං වා පුට්ඨෝ අම්බං බ්‍යාකරෙය්‍ය, ඒවමේව ඛෝ මේ භන්තේ නිගණ්ඨෝ නාතපුත්තෝ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨෝ සමානෝ චාතුයාමසංවරං බ්‍යාකාසි. තස්ස මය්හං භන්තේ ඒතදහෝසි: "කතං හි නාම මාදිසෝ සමණං වා බ්‍රාහ්මණං වා විජිතේ වසන්තං අපසාදේතබ්බං මඤ්ඤෙය්‍යා?"ති. සෝ ඛෝ අහං භන්තේ නිගණ්ඨස්ස

නාතපුත්තස්ස භාසිතං නේව අභිනන්දිං නප්පටික්කෝසිං. අනභිනන්දිත්වා අප්පටික්කෝසිත්වා අනත්තමනෝ අනත්තමනවාචං අනි-ඝාරෙත්වා තමේව වාචං අනුග්ගණ්හන්තෝ අනික්කුජ්ජන්තෝ උට්ඨායාසනා පක්කාමිං.

ඉතින් ස්වාමීනී, මේ ජීවිතයේ දී ම පැවිදිබවෙන් ලබන ප්‍රයෝජන ගැන ඇසූ ප්‍රශ්නයට ඔය විදිහට නිගණ්ඨ නාතපුත්තයා මට චතුයාම සංවරය (සංවර වීමේ අවස්ථා හතර) පැවසුවා. ස්වාමීනී, ඒක මේ වගේ දෙයක්. අඹ ගැන ඇසූ කල්හී දෙල් ගැන කියා දෙනවා වගේ. දෙල් ගැන ඇසූ කල්හී අඹ ගැන කියා දෙනවා වගේ. ඒ අයුරින් ම ස්වාමීනී, මේ ජීවිතයේ දී ම පැවිදිබවෙන් ලබන ප්‍රයෝජන ගැන ඇසූ ප්‍රශ්නයට ඔය විදිහට නිගණ්ඨ නාතපුත්තයා මට චතුයාම සංවරය (සංවර වීමේ අවස්ථා හතර) පැවසුවා. ස්වාමීනී, එතකොට මට මෙහෙමත් හිතුනා. "මං වගේ කෙනෙක් තම විජිතයෙහි වාසය කරන ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පෙළිය යුතුයි කියල කොහොම නම් සිතන්ට ද?" කියලා. ස්වාමීනී, ඒ මං නිගණ්ඨ නාතපුත්තයා ගේ කීම පිළිගත්තේ නෑ. ප්‍රතික්ෂේප කළෙත් නෑ. නො පිළිගෙන, ප්‍රතික්ෂේප නො කොට, නො සතුටු සිතින් යුතු ව, නමුත් නො සතුටු සිතින් වචනයක් නිකුත් කරන්නේ නැතිව, ඒ කියමන භාරගන්නේ නැතිව, සිතේ පිහිටුවා නො ගෙන අසුනෙන් නැගිට නික්මිලා ගියා.

23. "ඒකමිදාහං භන්තේ සමයං යේන සඤ්ජයෝ බේලට්ඨිපුත්තෝ තේනුපසංකමිං. උපසංකමිත්වා සඤ්ජයේන බේලට්ඨිපුත්තේන සද්ධිං සම්මෝදිං. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදිං. ඒකමන්තං නිසින්නෝ ඛෝ අහං භන්තේ සඤ්ජයං බේලට්ඨිපුත්තං ඒතදවෝච: යථා නු ඛෝ ඉමානි හෝ සඤ්ජය පුථුසිප්පායතනානි සෙය්‍යථීදං: හත්ථාරෝහා ..... සක්කා නු ඛෝ හෝ සඤ්ජය ඒවමේව දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤාපේතු?"න්ති.

23. ස්වාමීනී, මං එක්තරා දවසක සංජය බේලට්ඨිපුත්තයන් ළඟට ගියා. ගිහින් සංජය බේලට්ඨිපුත්තයන් සමඟ සතුටුවුණා. සතුටු විය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව වාඩි වුණා. ඉතින් ස්වාමීනී, එකත්පස්ව වාඩි වුණ මං සංජය බේලට්ඨිපුත්තයන්ට මෙකරුණ කිව්වා. "භවත් සංජය, ඉගෙන ගත යුතු යම් ආකාර වූ ශිල්ප ශාස්ත්‍ර රාශියක් තිබෙනවා. ඒ කියන්නේ ඇතරුවන් ඉන්නවා ..... ඉතින් භවත් සංජය, ගිහි ජීවිතයේ දී ඔය විදිහට ප්‍රතිඵල ලබද්දී පැවිදි ජීවිතයෙනුත් ඔය ආකාරයෙන් ම ලබා ගන්නා ප්‍රයෝජන දක්වන්නට පුළුවන් ද?" කියලා.

එවං වුත්තේ භන්තේ සඤ්ඤයෝ බේලට්ඨිපුත්තෝ මං එතදවෝච: "අත්ථි පරෝ ලෝකෝති ඉති ෙ- මං පු-ඡසි, අත්ථි පරෝ ලෝකෝති ඉති ෙ- මේ අස්ස, අත්ථි පරෝලෝකෝති ඉති තේ නං බ්‍යාකරය්‍යං. එවන්තිපි මේ නෝ තථාති'පි මේ නෝ. අඤ්ඤථාති'පි මේ නෝ. නෝති'පි මේ නෝ. නෝ නෝති'පි මේ නෝ. නත්ථි පරෝ ලෝකෝති? ..... අත්ථි ච නත්ථි ච පරෝ ලෝකෝති? ..... නේවත්ථි න නත්ථි පරෝ ලෝකේ ..... අත්ථි සත්තා විපපාතිකා? ..... නත්ථි සත්තා විපපාතිකා ..... අත්ථි ච නත්ථි ච සත්තා විපපාතිකා? ..... නේවත්ථි න නත්ථි සත්තා විපපාතිකා? ..... අත්ථි සුකටදුක්කටානං කම්මං ඵලං විපාකෝ? ..... නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකෝ? ..... අත්ථි ච නත්ථි ච සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකෝ? ..... නේවත්ථි න නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකෝ? ..... හෝති තථාගතෝ පරම්මරණා? ..... න හෝති තථාගතෝ පරම්මරණා? ..... හෝති ච න හෝති ච තථාගතෝ පරම්මරණා? ..... නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා ති? ඉති ෙ- මං පු-ඡසි "නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා"ති ඉති ෙ- මේ අස්ස, නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණාති ඉති තේ නං බ්‍යාකරෙය්‍යං. එවම්පි මේ නෝ. තථාති'පි මේ නෝ. අඤ්ඤථාති'පි මේ නෝ. නෝති'පි මේ නෝ. නෝ නෝති'පි මේ නෝ"ති.

ස්වාමීනී, ඔය විදිහට මං කිව්වහම සංජය බේලට්ඨිපුත්තයා මට මෙහෙම කිව්වා. "මහාරාජ, පරලොවක් තියෙනවා ද? කියල මගෙන් විමසුවොත් එතකොට මට හිතෙනවා නම් පරලොවක් ඇත කියලා මං ඔබට එය විසඳන්නේ පරලොවක් තියෙනවා කියල යි. ඒ වුණාට මා තුළ ඔවැනි අදහසක් නම් නෑ. මා තුළ ඒ අයුරින් පිළිගැනීමකුත් නෑ. මා තුළ ඔයිට වෙනස් අයුරකින් පිළිගැනීමකුත් නෑ. නො පිළිගන්නවා කියල දෙයකුත් නෑ. නො පිළිගන්නේ නැත කියල දෙයකුත් නෑ. ඒ වගේ ම පරලොවක් නැද්ද? කියල මගෙන් ඇහුවොත් ..... පරලොවක් තියෙනවා ද නැද්ද? කියල ..... පරලොවක් ඇත්තේත් නැද්ද? නැත්තේත් නැද්ද? කියල ..... විපපාතික සත්වයන් ඉන්නවාද? කියල ..... විපපාතික සත්වයන් නැද්ද? කියල ..... විපපාතික සත්වයන් ඇද්ද නැද්ද? කියල ..... විපපාතික සත්වයන් ඇත්තේත් නැද්ද? නැත්තේත් නැද්ද? කියල ..... හොඳ නරක කර්මවල ඵලවිපාක තියෙනවා ද? කියල ..... හොඳ නරක කර්මවල ඵල විපාක නැද්ද? කියල ..... හොඳනරක කර්මවල ඵලවිපාක ඇත්තේත්**

නැද්ද නැත්තේත් නැද්ද? කියල ..... තථාගතයන් වහන්සේ මරණින් මතු ඉන්නවාද? කියල ..... තථාගතයන් වහන්සේ මරණින් මතු නැද්ද? කියල ..... තථාගතයන් වහන්සේ මරණින් මතු ඉන්නවාද? නැද්ද? කියල ..... තථාගතයන් වහන්සේ මරණින් මතු ඇත්තේත් නැද්ද නැත්තේත් නැද්ද? කියල මගෙන් විමසුවොත් එතකොට මට හිතෙනවා නම් තථාගතයන් වහන්සේ මරණින් මතු අත්තේත් නෑ නැත්තේත් නෑ කියලා මං ඔබට එය විසඳන්නේ තථාගතයන් වහන්සේ මරණින් මතු ඇත්තේත් නෑ, නැත්තේත් නෑ කියල යි. ඒ වුණාට මා තුළ ඔවැනි අදහසක් නම් නෑ. මා තුළ ඒ අයුරින් පිළිගැනීමකුත් නෑ. මා තුළ ඔයිට වෙනස් අයුරකින් පිළිගැනීමකුත් නෑ. නොපිළිගන්නවා කියල දෙයකුත් නෑ. නොපිළිගන්නේ නැත කියල දෙයකුත් නෑ.

ඉත්ථං ඛෝ මේ භන්තේ සඤ්ජයෝ බේලට්ඨිපුත්තෝ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨෝ සමානෝ වික්ඛේපං බ්‍යාකාසි. සෙය්‍යථාපි භන්තේ අම්බං වා පුට්ඨෝ ලබුජං බ්‍යාකරෙය්‍ය ලබුජං වා පුට්ඨෝ අම්බං බ්‍යාකරෙය්‍ය, ඒවමේව ඛෝ මේ භන්තේ සඤ්ජයෝ බේලට්ඨිපුත්තෝ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨෝ සමානෝ වික්ඛේපං බ්‍යාකාසි. තස්ස මය්හං භන්තේ ඒතදහෝසි: අයඤ්ච ඉමේසං සමණබ්‍රාහ්මණානං සබ්බබාලෝ සබ්බමූළ්හෝ කථංහි නාම සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුට්ඨෝ සමානෝ වික්ඛේපං බ්‍යාකරිස්සතී?ති. තස්ස මය්හං භන්තේ ඒතදහෝසි. "කතං හි නාම මාදිසෝ සමණං වා බ්‍රාහ්මණං වා විජිතේ වසන්තං අපසාදේතබ්බං මඤ්ඤෙය්‍යා?"ති. සෝ ඛෝ අහං භන්තේ සඤ්ජයස්ස බේලට්ඨිපුත්තස්ස භාසිතං නේව අභිනන්දිං නප්පටික්කෝසිං. අනභිනන්දිත්වා අප්පටික්කෝසිත්වා අනත්තමනෝ අනත්තමනවාචං අනි-ඡාරෙත්වා තමේව වාචං අනුග්ගණ්හන්තෝ අනික්කුජ්ජන්තෝ උට්ඨායාසනා පක්කාමිං.

ඉතින් ස්වාමීනී, මේ ජීවිතයේ දී ම පැවිදිබවෙන් ලබන ප්‍රයෝජන ගැන ඇසූ ප්‍රශ්නයට ඔය විදිහට සංජය බේලට්ඨිපුත්තයා මට අමරාවික්ඛේපවාදය (ප්‍රශ්න අසන්නන් වික්ෂිප්ත වෙන පරිදි ආදෙකු මෙන් ලිස්සා යාම) පැවසුවා. ස්වාමීනී, ඒක මේ වගේ දෙයක්. අඹ ගැන ඇසූ කල්හී දෙල් ගැන කියා දෙනවා වගේ. දෙල් ගැන ඇසූ කල්හී අඹ ගැන කියා දෙනවා වගේ. ඒ අයුරින් ම ස්වාමීනී, මේ ජීවිතයේ දී ම පැවිදි බවෙන් ලබන ප්‍රයෝජන ගැන ඇසූ ප්‍රශ්නයට ඔය විදිහට සංජය බේලට්ඨිපුත්තයා මට අමරාවික්ඛේපවාදය (ප්‍රශ්න අසන්නන් වික්ෂිප්ත වෙන පරිදි ආදෙකු මෙන් ලිස්සා යාම) පැවසුවා. ස්වාමීනී, එතකොට මට මෙහෙම හිතුනා. "මේ පුද්ගලයා මේ ශ්‍රමණබ්‍රාහ්මණයන්ගෙන් හැමෝට ම වැඩිය බාලයෙක්. හැමෝට ම වැඩිය

මෝඩයෙක්. මේ ජීවිතයේ දී ම පැවිදිබවෙන් ලබන ප්‍රයෝජන ගැන විමසද්දී කොහොම නම් අමරාවික්ඛේපය ගැන විස්තර කරන්නේ ද?" ස්වාමීනී, එතකොට මට මෙහෙමත් හිතුනා. "මං වගේ කෙනෙක් තම විජිතයෙහි වාසය කරන ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පෙළිය යුතුයි කියල කොහොම නම් සිතන්ට ද?" කියලා. ස්වාමීනී, ඒ මං සංජය බේලට්ඨිපුත්තයා ගේ කීම පිළිගත්තේ නෑ. ප්‍රතික්ඛේප කළෙත් නෑ. නො පිළිගෙන, ප්‍රතික්ඛේප නො කොට, නො සතුටු සිතින් යුතු ව, නමුත් නො සතුටු සිතින් වචනයක් නිකුත් කරන්නේ නැතිව, ඒ කියමන භාරගන්නේ නැතිව, සිතේ පිහිටුවා නො ගෙන අසුනෙන් නැගිට නික්මිලා ගියා.

24. සෝ'හං භන්තේ භගවන්තම්පි පු-ඡාමි: යථා නු ඛෝ ඉමානි භන්තේ පුථුසිප්පායතනානි, සෙය්‍යථීදං: හත්ථාරෝහා ..... සක්කා නු ඛෝ මේ භන්තේ ඒවමේව දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤාපේතු?න්ති."

24. ස්වාමීනී, ඒ මං භාග්‍යවතුන් වහන්සේගෙනුත් අසන්නම්. "ස්වාමීනී, ඉගෙන ගත යුතු යම් ආකාර වූ ශිල්ප ශාස්ත්‍ර රාශියක් තිබෙනවා. ඒ කියන්නේ ඇතරුවන් ඉන්නවා ..... ඉතින් ස්වාමීනී, ගිහි ජීවිතයේ දී ඔය විදිහට ප්‍රතිඵල ලබද්දී පැවිදි ජීවිතයෙනුත් ඔය ආකාරයෙන් ම ලබා ගන්නා ප්‍රයෝජන දක්වන්නට පුළුවන් ද?" කියලා.

"සක්කා මහාරාජ. තේන හි මහාරාජ තඤ්ඤේවෙත්ථ පටිපු-ඡිස්සාමි. යථා තේ ඛමෙය්‍ය, තථා නං බ්‍යාකරෙය්‍යාසි".

"පින්වත් මහාරාජ, ප්‍රයෝජන දක්වන්නට පුළුවනි. එසේ නම් පින්වත් මහාරාජ, මං ඔබෙන් ම මේ කාරණය විමසන්නම්. ඔබ යම් විදිහකට නම් කැමැති ඒ විදිහට පිළිතුරු දෙන්න."

25. "තං කිම්මඤ්ඤසි. මහාරාජ, ඉධ තේ අස්ස පුරිසෝ දාසෝ කම්මකාරෝ පුබ්බුට්ඨායී ප-ඡානිපාතී කිංකාරපටිස්සාවී මනාපචාරී පියවාදී මුඛුල්ලෝකකෝ. තස්ස ඒවමස්ස: "අ-ඡරියං වත භෝ, අබ්භුතං වත භෝ. පුඤ්ඤානං ගති පුඤ්ඤානං විපාකෝ. අයං හි රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ මනුස්සෝ. අහම්පි මනුස්සෝ. අයං හි රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ පඤ්චහි කාමගුණේහි සමප්පිතෝ සමංගීභූතෝ

පරිචාරේති දේවෝ මඤ්ඤේ. අහම්පනම්හි'ස්ස දාසෝ කම්මකාරෝ පුබ්බුට්ඨායී ප-ඡානිපාතී කිංකාරපටිස්සාවී මනාපචාරී පියවාදී මුඛුල්ලෝකකෝ. සෝ වතස්සාහං පුඤ්ඤානි කරෙය්‍යං. යන්නූනාහං කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.

25. "පින්වත් මහාරාජ, මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? මෙහි ඔබ ගේ දාස වූ පුරුෂයෙක් ඉන්නවා. ඔහු කම්කරුවෙක්. උදේ පාන්දර නැගිටිනවා. අන්තිමට ම නිදනවා. කළ යුතු දේ සොයාබලා කරනවා. සිත් ගන්නා අයුරින් හැසිරෙනවා. ප්‍රිය බස් කියනවා. සතුටු සිතින් ඔබේ මුහුණ බලනවා. ඔහුට මේ විදිහට සිතෙනවා. පින්වල ගතිය නම්, පින්වල විපාක නම් ඒකාන්තයෙන් ම අසිරිමත්, ඒකාන්තයෙන් ම පුදුම සහගත යි. මේ වේදේහිපුත්ත අජාසත් මගධ රජතුමා මනුෂ්‍යයෙක්. මමත් මනුෂ්‍යයෙක්. නමුත් වේදේහිපුත්ත ආජාසත් මගධ රජතුමා පංචකාම ගුණයෙන් පිණා ගිහින් එයින් ඉදුරන් පිණවමින් ඉන්නේ දෙවියෙකු වගෙයි. නමුත් මං එතුමා ගේ දාසයෙක්. කම්කරුවෙක්. උදේ පාන්දර නැගිටිනවා. අන්තිමට ම නිදනවා. කළ යුතු දේ සොයාබලා කරනවා. සිත් ගන්නා අයුරින් හැසිරෙනවා. ප්‍රිය බස් කියනවා. සතුටු සිතින් ඔබේ මුහුණ බලනවා. එහෙමනම් ඒ මමත් පින් දහම් කළොත් මෙතුමා වගේ වේවි. ඒ නිසා මං කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත්වෙන එක තමයි හොඳ" කියලා.

සෝ අපරේන සමයේන කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය. සෝ ඒවං පබ්බජිතෝ සමානෝ කායේන සංවුතෝ විහරෙය්‍ය, වාචාය සංවුතෝ විහරෙය්‍ය, මනසා සංවුතෝ විහරෙය්‍ය, ඝාස-ඡාදනපරමතාය සන්තුට්ඨෝ අභිරතෝ පවිවේකේ.

ඔහු පස්සෙ කාලෙක කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙනවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා කයෙන් සංවරව වාසය කරනවා. වචනයෙන් සංවරව වාසය කරනවා. මනසින් සංවරව වාසය කරනවා. කෙලෙස් නැසීමේ උතුම් අරුතෙන් යුතු ව හුදෙකලා විවේකයෙහි ඇලී වාසය කරනවා.

තඤ්ඤේ- තේ පුරිසා ඒවමාරෝචෙය්‍යුං: "යග්ඝේ දේව ජානෙය්‍යාසි, යෝ තේ පුරිසෝ දාසෝ කම්මකාරෝ පුබ්බුට්ඨායී ප-ඡානිපාතී කිංකාරපටිස්සාවී

මනාපචාරී පියවාදී මුඛුල්ලෝකකෝ, සෝ දේව කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ඝාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජීතෝ. සෝ එවං පබ්බජීතෝ සමානෝ කායේන සංවුතෝ විහරති, වාචාය සංවුතෝ විහරති, මනසා සංවුතෝ විහරති. ඝාස-ඡාදනපරමතාය සන්තුට්ඨෝ අහිරතෝ පවිවේකේ'ති. අපි නු ත්වං එවං වදෙය්‍යාසි: එතු මේ භෝ සෝ පුරිසෝ. පුනදේව හෝතු දාසෝ කම්මකාරෝ පුබ්බුට්ඨායී ප-ඡානිපාතී කිංකාරපටිස්සාවී මනාපචාරී පියවාදී මුඛුල්ලෝකකෝ"ති.

එතකොට ඔබ ගේ රාජපුරුෂයන් අර පුද්ගලයා ගැන මේ විදිහට දැනුම් දෙනවා. "අවසරයි දේවයන් වහන්ස, දන්නවා ද? ඔබේ ඒ දාස පුරුෂයෙක් හිටියා. ඔහු කම්කරුවෙක්. උදේ පාන්දර නැගිටිනවා. අන්තිමට ම නිදනවා. කළ යුතු දේ සොයාබලා කරනවා. සිත් ගන්නා අයුරින් හැසිරෙනවා. ප්‍රිය බස් කියනවා. සතුටු සිතින් ඔබේ මුහුණ බලනවා. දේවයන් වහන්ස, ඔහු කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙලා ඉන්නවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා කයෙන් සංවරව වාසය කරනවා. වචනයෙන් සංවරව වාසය කරනවා. මනසින් සංවරව වාසය කරනවා. කෙලෙස් නැසීමේ උතුම් අරුතෙන් යුතු ව හුදෙකලා විවේකයෙහි ඇලී වාසය කරනවා" කියල. එතකොට ඔබ මේ විදිහට කියනවා ද? "භවත්නි, මාගේ ඒ පුරුෂයා පැමිණේවා. යළිත් මාගේ දාසයා වේවා. කම්කරුවා වේවා. උදේ පාන්දර නැගිටින, අන්තිමට ම නිදන, කළ යුතු දේ සොයාබලා කරන, සිත් ගන්නා අයුරින් හැසිරෙන, ප්‍රිය බස් කියන, ඔහු සතුටු සිතින් මගේ මුහුණ බලාවා" කියල.

"නෝ හේතං භන්තේ. අථ ඛෝ නං මයමේව අභිවාදෙය්‍යාමපි, ප-ච්චුට්ඨෙය්‍යාමපි, ආසනේනපි නිමන්තෙය්‍යාම. අභිනිමන්තෙය්‍යාමපි නං විවර පිණ්ඩපාත සේනාසන ගිලානප-චයභේසජ්ජපරික්ඛාරේහි. ධම්මිකම්පි'ස්ස රක්ඛාවරණගුත්තිං සංවිදහෙය්‍යාමා"ති.

"ස්වාමීනී, එහෙම දෙයක් වෙන්නේ නෑ. එහෙම නම් අපි ම යි ඔහුට ආදරයෙන් වඳින්නේ. අපි ම යි ඔහු දැක හුනස්නෙන් නැගිටින්නේ. ආසනයක් වුණත් පිළිගන්වන්නේ. විවර පිණ්ඩපාත සේනාසන ගිලන්පසින් මනා කොට පිළිගන්වන්නේ. උන්වහන්සේට දැහැමින් රැකවරණ සළස්වන්නේ"

"තං කිම්මඤ්ඤසි මහාරාජ, යදි එවං සන්තේ හෝති වා සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං නෝ වා?"ති.

"පින්වත් මහාරාජ, ඉතින් ඔය විදිහට කරුණු යෙදෙන කොට වික මේ ජීවිතයේ දී දැක්ක හැකි පැවිදිබවේ ඵලයක් ද? නැද්ද?"

"අද්ධා ඛෝ භන්තේ ඒවං සන්තේ හෝති සන්දිට්ඨිකං සාමඤ්ඤඵල"න්ති.

"ස්වාමීනී, ඔය විදිහට කරුණු යෙදෙන කොට, ඒකාන්තයෙන් ම මේ ජීවිතයේ දී දැක්ක හැකි පැවිදිබවේ ඵලයක් ම යි."

"ඉදං ඛෝ තේ මහාරාජ මයා පඨමං දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤත්ත"න්ති.

"පින්වත් මහාරාජ, මෙය වනාහී මා විසින් ඔබට පෙන්වා දෙන පැවිදිබව තුළින් මේ ජීවිතයේ දී ම ලැබිය හැකි පළමු වෙනි ප්‍රයෝජනය යි."

26. "සක්කා පන භන්තේ අඤ්ඤම්පි ඒවමේව දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤාපේතු?"න්ති.

26. "ස්වාමීනී, පැවිදිබව තුළින් මේ ජීවිතයේ දී ම අත්විඳිය හැකි ඔය ආකාර වූ වෙනත් ප්‍රයෝජනත් පෙන්වා දෙන්ට පුළුවන් ද?"

"සක්කා මහාරාජ. තේන හි මහාරාජ තඤ්ඤේවෙත්ථ පටිපුඡිස්සාමි. යථා තේ ඛමෙය්‍ය, තථා නං බ්‍යාකරෙය්‍යාසි. තං කිම්මඤ්ඤසි මහාරාජ, ඉධ තේ අස්ස පුරිසෝ කස්සකෝ ගහපතිකෝ කාරකාරකෝ රාසිවඩ්ඪකෝ, තස්ස ඒවමස්ස: අ-ඡරියං වත භෝ, අබ්භුතං වත භෝ. පුඤ්ඤානං ගති පුඤ්ඤානං විපාකෝ. අයං හි රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ මනුස්සෝ. අහම්පි මනුස්සෝ. අයං හි රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ පඤ්චහි කාමගුණේහි සමප්පිතෝ සමංගීභූතෝ පරිචාරේති දේවෝ මඤ්ඤේ. අහම්පනම්හි'ස්ස කස්සකෝ ගහපතිකෝ කාරකාරකෝ රාසිවඩ්ඪකෝ, සෝ වතස්සාහං පුඤ්ඤානි කරෙය්‍යං. යන්නූනාහං කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.

"පින්වත් මහාරාජ, ප්‍රයෝජන දක්වන්නට පුළුවනි. එසේ නම් පින්වත් මහාරාජ, මං ඔබෙන් ම මේ කාරණය විමසන්නම්. ඔබ යම් විදිහකට නම් කැමැති ඒ විදිහට පිළිතුරු දෙන්න. "පින්වත් මහාරාජ, මේ ගැන ඔබ කුමක්

ද හිතන්නේ? මෙහි ඔබ ගේ ගොවියෙක් වූ ගෘහපතියෙක් ඉන්නවා. ඔහු ඔබට බදු ගෙවනවා. ධනධාන්‍ය වැඩි කර දෙනවා. ඔහුට මේ විදිහට සිතෙනවා. පින්වල ගතිය නම්, පින්වල විපාක නම් ඒකාන්තයෙන් ම අසිරිමත්, ඒකාන්තයෙන් ම පුදුම සහගත යි. මේ වේදේහිපුත්ත අජාසත් මගධ රජතුමා මනුෂ්‍යයෙක්. මමත් මනුෂ්‍යයෙක්. නමුත් වේදේහිපුත්ත ආජාසත් මගධ රජතුමා පංචකාම ගුණයෙන් පිණා ගිහින් එයින් ඉඳුරන් පිණවමින් ඉන්නේ දෙවියෙකු වගෙයි. නමුත් මං එතුමා ගේ ගොවියෙක් වූ ගෘහපතියෙක්. එතුමාට බදු ගෙවනවා. ධනධාන්‍ය වැඩි කර දෙනවා. එහෙමනම් ඒ මමත් පින් දහම් කළොත් මෙතුමා වගේ වේවි. ඒ නිසා මං කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත්වෙන එක තමයි හොඳ" කියලා.

සෝ අපරේන සමයේන අප්පං වා භෝගක්ඛන්ධං පහාය මහන්තං වා භෝගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය. සෝ ඒවං පබ්බජිතෝ සමානෝ කායේන සංවුතෝ විහරෙය්‍ය, වාචාය සංවුතෝ විහරෙය්‍ය, මනසා සංවුතෝ විහරෙය්‍ය, ඝාස-ඡාදනපරමතාය සන්තුට්ඨෝ අභිරතෝ පවිවේකේ.

ඔහු පස්සෙ කාලෙක ස්වල්ප වූ භෝග සම්පත් අත්හරිනවා. මහත් වූ භෝග සම්පත් අත්හරිනවා. ස්වල්ප වූ නෑදෑයන් අත්හරිනවා. මහත් වූ නෑදෑයන් අත්හරිනවා. කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙනවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා කයෙන් සංවරව වාසය කරනවා. වචනයෙන් සංවරව වාසය කරනවා. මනසින් සංවරව වාසය කරනවා. කෙලෙස් නැසීමේ උතුම් අරුතෙන් යුතු ව හුදෙකලා විවේකයෙහි ඇලී වාසය කරනවා.

තං ඒ- තේ පුරිසා එවමාරෝචෙය්‍යුං: යග්ඝේ දේව ජානෙය්‍යාසි, යෝ තේ පුරිසෝ කස්සකෝ ගහපතිකෝ කාරකාරකෝ රාසිවඩ්ඪකෝ, සෝ දේව කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතෝ. සෝ ඒවං පබ්බජිතෝ සමානෝ කායේන සංවුතෝ විහරති, වාචාය සංවුතෝ විහරති, මනසා සංවුතෝ විහරති. ඝාස-ඡාදනපරමතාය සන්තුට්ඨෝ අභිරතෝ පවිවේකේති. අපි නු ත්වං ඒවං වදෙය්‍යාසි: ඒතු මේ භෝ සෝ පුරිසෝ. පුනදේව හෝතු කස්සකෝ ගහපතිකෝ කාරකාරකෝ රාසිවඩ්ඪකෝ"ති?

එතකොට ඔබ ගේ රාජපුරුෂයන් අර පුද්ගලයා ගැන මේ විදිහට දැනුම් දෙනවා. "අවසරයි දේවයන් වහන්ස, දන්නවා ද? ඔබේ ඒ ගොවියෙක් වූ ගෘහපතියෙක් හිටියා. ඔහු ඔබට බදු ගෙව්වා. ධනධාන්‍ය වැඩි කර දුන්නා. දේවයන් වහන්ස, ඔහු කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙලා ඉන්නවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා කයෙන් සංවරව වාසය කරනවා. වචනයෙන් සංවරව වාසය කරනවා. මනසින් සංවරව වාසය කරනවා. කෙලෙස් නැසීමේ උතුම් අරුතෙන් යුතු ව හුදෙකලා විවේකයෙහි ඇලී වාසය කරනවා" කියල. එතකොට ඔබ මේ විදිහට කියනවා ද? "භවත්නි, මාගේ ඒ පුරුෂයා පැමිණේවා. යළිත් මාගේ ගොවියෙකු වේවා. ගෘහපතියෙකු වේවා. බදුගෙවන්නෙකු වේවා. ධනධාන්‍ය වැඩි කරන්නෙකු වේවා" කියල.

"නෝ හේතං භන්තේ. අථ ඛෝ නං මයමේව අභිවාදෙය්‍යාමපි, ප-චුට්ඨෙය්‍යාමපි, ආසනේනපි නිමන්තෙය්‍යාම. අභිනිමන්තෙය්‍යාමපි නං විවර පිණ්ඩපාත සේනාසන ගිලානප-චයභේසජ්ජපරික්ඛාරේහි. ධම්මිකම්පිස්ස රක්ඛාවරණගුත්තිං සංවිදහෙය්‍යාමා"ති.

"ස්වාමීනී, එහෙම දෙයක් වෙන්නේ නෑ. එහෙම නම් අපි ම යි ඔහුට ආදරයෙන් වඳින්නේ. අපි ම යි ඔහු දැක හුනස්නෙන් නැගිටින්නේ. ආසනයක් වුණත් පිළිගන්වන්නේ. විවර පිණ්ඩපාත සේනාසන ගිලන්පසින් මනා කොට පිළිගන්වන්නේ. උන්වහන්සේට දැහැමින් රැකවරණ සළස්වන්නේ"

"තං කිම්මඤ්ඤසි මහාරාජ, යදි ඒවං සන්තේ හෝති වා සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං නෝ වා?"ති.

"පින්වත් මහාරාජ, ඉතින් ඔය විදිහට කරුණු යෙදෙන කොට වික මේ ජීවිතයේ දී දැක්ක හැකි පැවිදිබවේ ඵලයක් ද? නැද්ද?"

"අද්ධා ඛෝ භන්තේ ඒවං සන්තේ හෝති සන්දිට්ඨිකං සාමඤ්ඤඵල"න්ති.

"ස්වාමීනී, ඔය විදිහට කරුණු යෙදෙන කොට, ඒකාන්තයෙන් ම මේ ජීවිතයේ දී දැක්ක හැකි පැවිදිබවේ ඵලයක් ම යි."

"ඉදං ඛෝ තේ මහාරාජ මයා දුතියං දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤත්ත"න්ති.

"පින්වත් මහාරාජ, මෙය වනාහී මා විසින් ඔබට පෙන්වා දෙන පැවිදිබව තුළින් මේ ජීවිතයේ දී ම ලැබිය හැකි දෙ වෙනි ප්‍රයෝජනය යි."

27. "සක්කා පන භන්තේ අඤ්ඤම්පි දිට්ඨේව ධම්මේ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පඤ්ඤාපේතුං ඉමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්චා?"ති.

27. "ස්වාමීනී, පැවිදිබව තුළින් මේ ජීවිතයේ දී ම අත්විඳිය හැකි ඔය ප්‍රයෝජනයන්ටත් වඩා අතිශයින් ම උසස් වූත්, අතිශයින් ම ප්‍රණීත වූත් පැවිදිබවෙන් ලබන වෙනත් ප්‍රයෝජනත් පෙන්වා දෙන්ට පුළුවන් ද?"

"සක්කා මහාරාජ. තේන හි මහාරාජ සුණෝහි සාධුකං මනසිකරෝහි භාසිස්සාමී"ති.

"පින්වත් මහාරාජ, ප්‍රයෝජන දක්වන්නට පුළුවනි. එසේ නම් පින්වත් මහාරාජ, මනා කොට සවන් යොමා අසන්න. නුවණින් මෙනෙහි කරන්න. මා කියා දෙන්නම්."

"එවං භන්තේ"ති ඛෝ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ භගවතෝ ප-චස්සෝසි.

"එසේය ස්වාමීනී," කියලා වේදේහි පුත්‍ර අජාසත් මගධ රජු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නා.

28. භගවා ඒතදවෝච: "ඉධ මහාරාජ තථාගතෝ ලෝකේ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣේකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසේති.

28. භාග්‍යවතුන් වහන්සේ මෙම දෙසුම වදාළා. "පින්වත් මහාරාජ, මෙහි අරහත් වූ සම්මාසම්බුද්ධ වූ විජ්ජාචරණසම්පන්න වූ සුගත වූ ලෝකවිදූ වූ අනුත්තර පුරිසදම්ම සාරථී වූ, සත්ථා දේවමනුස්සානං වූ, බුද්ධ වූ, භගවා

වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපත ලබනවා. උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙව්මිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඥාණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා.

තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තෝ වා අඤ්ඤතරස්මිං වා කුලේ ප-චාජාතෝ. සෝ තං ධම්මං සුත්වා තථාගතේ සද්ධං පටිලභති. සෝ තේන සද්ධාපටිලාභේන සමන්නාගතෝ ඉති පටිසංචික්ඛති: "සම්බාධෝ ඝරාවාසෝ රජෝපථෝ. අබ්භෝකාසෝ පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා ඒකන්තපරිපුණ්ණං ඒකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කේසමස්සුං ඡිභාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.

එතකොට ගෘහපතියෙක් වේවා, ගෘහපති පුත්‍රයෙක් වේවා කවර හෝ කුලයක උපන් කෙනෙක් වේවා ඒ ධර්මය අසනවා. ඔහු ඒ ධර්මය අසලා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ගන්නවා. ඉතින් ඔහු ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වෙලා මේ විදිහට නුවණින් කල්පනා කරනවා. "ගිහි ගෙදර වාසය කිරීම හරිම කරදරයක්. කෙලෙස් වැඩෙන මාවතක්. නමුත් පැවිදි ජීවිතය ආකාසය වගේ. ගිහි ගෙදර වාසය කරමින් මුළුමණින් ම පිරිපුන්, මුළුමණින් ම පිරිසිදු, සුදෝසුදු බඹසර වසනවා යන කාරණ ලෙහෙසි එකක් නොවේ. ඒ නිසා මං කෙස් රැවුල් බාලා, කසාවත් පොරොවා ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට ඇතුළත් වෙන එක තමයි හොඳ" කියලා.

සෝ අපරේන සමයේන අප්පං වා භෝගක්ඛන්ධං පහාය මහන්තං වා භෝගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කේසමස්සුං ඡිභාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සෝ ඒවං පබ්බජිතෝ සමානෝ පාතිමොක්ඛසංවරසංවුතෝ විහරති, ආචාරගෝචරසම්පන්නෝ, අණුමත්තේසු වජ්ජේසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදේසු, කාය-කම්මවචිකම්මේන සමන්නාගතෝ කුසලේන, පරිසුද්ධාජීවෝ, සීලසම්පන්නෝ, ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ, භෝජනේ මත්තඤ්ඤූ, සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ, සන්තුට්ඨෝ.

ඔහු පස්සෙ කාලෙක ස්වල්ප වූ භෝග සම්පත් අත්හරිනවා. මහත් වූ භෝග සම්පත් අත්හරිනවා. ස්වල්ප වූ නෑදෑයන් අත්හරිනවා. මහත් වූ නෑදෑයන් අත්හරිනවා. කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙනවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් (පැවිද්දෙක් විසින් රැකගත යුතු නිවනට උපකාරී වන උතුම් සිල්පදවලින්) සංවරව ඉන්නවා. යහපත් ඇවැතුම් පැවැතුම්වලින් යුතු වෙනවා. අණුමාත්‍ර වූ වරදෙහි පවා භය දකිනවා. සික්ෂාපදවල සමාදන්ව හික්මෙනවා. කුසල්සහගත කාය හා වචිකර්මයෙන් යුතු වෙනවා. පිරිසිදු ආජීවයෙන් යුතු වෙනවා. සිල්වත් වෙනවා. අකුසලයෙන් වැළකූ දොරටු ඇතුව ඉන්නවා. නුවණින් සළකා ආහාර ගන්නවා. සිහිනුවණින් යුතුව ඉන්නවා. ලද දෙයින් සතුටුව ඉන්නවා.

29. කථඤ්ච මහාරාජ භික්ඛු සීලසම්පන්නෝ හෝති? ඉධ මහාරාජ භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ හෝති. නිහිතදණ්ඩෝ නිහිතසත්ථෝ ලජ්ජී දයාපන්නෝ සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

29. පින්වත් මහාරාජ, භික්ෂුව සීලයෙන් යුක්ත වන්නේ කොහොම ද? පින්වත් මහාරාජ, මෙහි භික්ෂුව සතුන් මැරීම අත්හැර දාල සතුන් මැරීමෙන් වැළකී ඉන්නවා. දඬු මුගුරු අත් හැර දාල, අවි ආයුධ බැහැර කරලා, පවට ලැජ්ජා ඇතිව ඉන්නවා. සතුන් කෙරෙහි දයාවන්ත වෙනවා, සියව් ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතෝ හෝති. දින්නාදායී දින්නපාටිකංඛී අථේනේන සුචිභූතේන අත්තනා විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

නුදුන් දේ ගැනීම අත් හැරලා නුදුන් දේ ගැනීමෙන් වැළකී ඉන්නවා. දුන් දේ පමණක් පිළිගන්නවා. දුන් දේ පමණක් පිළිගනු කැමති වෙනවා. සොර රහිත සිතින් යුතු වූ පිරිසිදු සිතින් යුතු වූ ජීවිතයකින් වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හෝති. ආරාචාරී විරතෝ මේථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

අබ්‍රහ්මචාරී බව අත් හැරලා බ්‍රහ්මචාරීව ඉන්නවා. ලාමක දෙයක් වූ මෛථුන සේවනයෙන් වැළකී එය දුරින් ම දුරුකර දමනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතෝ හෝති. ස-චවාදී ස-චසන්ධෝ ථේතෝ ප-චයිකෝ අවිසංවාදකෝ ලෝකස්ස. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

බොරු කීම අත් හැරල, බොරු කීමෙන් වැළකී ඉන්නවා. සත්‍යය කථා කරනවා. ඇත්තෙන් ඇත්ත ගලපනවා. ස්ථිරව පිහිටලා කථාකරනවා. පිළිගත හැකි දේ කථා කරනවා. ලෝකයාව රවටන්නේ නෑ. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතෝ හෝති. ඉතෝ සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමේසම්භේදාය. අමුත්‍ර වා සුත්වා න ඉමේසං අක්ඛාතා අමූසං භේදාය. ඉති භින්නානං වා සන්ධාතා සංහිතානං වා අනුප්පදාතා. සමග්ගාරාමෝ සමග්ගරතෝ සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

කේලාම් කීම අත්හැරලා කේලාම් කීමෙන් වැළකී ඉන්නවා. මෙතැනින් අහලා මේ අය බිඳවන්නට අතන කියන්නෙ නෑ. අතනින් අහලා ඒ උදවිය බිඳවන්නට මෙතැන කියන්නේ නෑ. මේ අයුරින් බිඳුනු උදවිය සමගි කරවනවා. සමගි වූවන්ට අනුබල දෙනවා. සමගි වූවන් හා වාසයට කැමතියි. සමගි වූවන් හා එක්ව වසනවා. සමගි වූවන් සමග සතුටු වෙනවා. සාමය උදෙසා සාමකාමී වචන කතා කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතෝ හෝති. යා සා වාචා නේළා කණ්ණසුඛා පේමනීයා හදයංගමා පෝරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

පරුෂ වචනය අත් හැරලා පරුෂ වචනයෙන් වැළකී ඉන්නවා. යම් වචනයක් දොස් රහිත නම්, කණට සැප නම්, ආදරවන්ත නම්, හෘදයාංගම නම්, ශිෂ්ට සම්පන්න නම්, බොහෝ ජනයා කැමති නම්, බොහෝ ජනයාට ප්‍රියමනාප නම් එබඳු වූ වචන පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතෝ හෝති. කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී, නිධානවතිං වාචං භාසිතා කාලේන සාපදේසං පරියන්තවතිං අත්ථසඤ්හිතං. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

තේරුමක් නැති කතා බහ අත්හැරලා තේරුමක් නැති කතා කීමෙන් වැළකී සිටිනවා. කල් යල් බලා කථා කරනවා. ඇත්ත කතා කරනවා. අර්ථවත් දෙය කතා කරනවා. ධර්මය ම කථා කරනවා. විනය ම කථා කරනවා. සිත්හි ලා දරාගැනීමට සුදුසු, වෙලාවට ගැලපෙන උපදේශ සහිත වූ, මදිපාඩුකම් නොතබා, ප්‍රමාණවත් පරිදි, දෙලොව යහපත පිණිස වූ දේ පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

30. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඒකභත්තිකෝ රත්තූපරතෝ පටිවිරතෝ විකාලභෝජනා. න-ච්ඡිතවාදිතවිසූකදස්සනා පටිවිරතෝ හෝති. මාලාගන්ධවිලේපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතෝ හෝති. උ-චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ජාතරූපරජත පටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකමංසපටිග්ගහණා පටිවිරතෝ හෝති. ඉත්ථිකුමාරික-පටිග්ගහණා පටිවිරතෝ හෝති. දාසිදාසපටිග්ගහණා පටිවිරතෝ හෝති. අජේළකපටිග්ගහණා පටිවිරතෝ හෝති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතෝ හෝති. හත්ථිගාවස්සවළවපටිග්ගහණා පටිවිරතෝ හෝති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතෝ හෝති. දූතෙය්‍ය පහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. කයවික්කයා පටිවිරතෝ හෝති. තුලාකූට-කංසකූටමානකූටා පටිවිරතෝ හෝති. උක්කෝටනවඤ්චනනිකතිසාචියෝගා පටිවිරතෝ හෝති. ඡේදනවධබන්ධනවිපරාමෝසආලෝපසහසාකාරා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

30. පැලවෙන බීජ හා පැල වුණ ගස් කොළන් විනාශ කිරීමෙන් වැළකී ඉන්නවා. එක් වරුවේ බොජුන් වළඳනවා. රාත්‍රී ආහාරයෙන් වැළකී විකාල භෝජනයෙන් වැළකී ඉන්නවා. නැටුම්, ගැයුම්, වැයුම් හා විසූක දර්ශනයන් නැරඹීමෙන් වැළකී ඉන්නවා. මල් සුවඳ විලවුන් දැරීමෙන් ද ඇඟපත සැරසීමෙන් ද විසිතුරු වස්ත්‍රාභරණයෙන් සැරසීමෙන් ද වැළකී ඉන්නවා. ප්‍රමාණය ඉක්ම වූ උස් ආසන ද වටිනා සුඛෝපභෝගී ආසන ද පරිහරණයෙන් වැළකී ඉන්නවා. රන් රිදී මිල මුදල් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු ධාන්‍ය පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු මස් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ස්ත්‍රීන්, කුමරියන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. දැසි දස්සන් පිළිගැනීමෙන් වැළකී

ඉන්නවා. එළුබැටළුවන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කුකුළන් ඌරන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ඇතුන් ගවයන් අසුන් වෙළඹුන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කෙත් වතු පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ගිහි කටයුතු සඳහා දූත මෙහෙවර කිරීමෙන් වැළකී ඉන්නවා. වෙළ හෙළඳාම් කිරීමෙන් වැළකී ඉන්නවා. තරාදියෙන් රැවටීම, නො වටනා දෙයින් රැවටීම, මිනුමෙන් රැවටීම යන මෙයින් වැළකී ඉන්නවා. අල්ලස් ගෙන හිමිකරුවන් ගේ දේ අහිමි කිරීම, වංචා කිරීම, බාලදේ වටිනා දේ හැටියට පෙන්වීම ආදී නොයෙක් වංචනික දෙයින් වැළකී ඉන්නවා. අත්පා කැපීම් මැරීම් බන්ධන කිරීම් මං පැහැරගැනීම්, ගම් පැහැර ගැනීම් ආදී සැහැසි දෙයින් වැළකී සිටිනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

චුල්ලසීලං නිට්ඨිතං
චූලසීලය නිමාවිය

31. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං: මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං අග්ගබීජං බීජබීජමේව පඤ්චමං. ඉති වා ඉති ඒවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

31. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ විදිහේ පැලවෙන දේ හා ගස් කොළන් ආදිය වනසමින් ඉන්නවා. ඒ කියන්නේ මුලින් පැලවෙන දේවල්, කඳින් පැලවෙන දේවල්, පුරුකින් පැලවෙන දේවල්, දල්ලෙන් පැලවෙන දේවල්, පස්වෙනුවට බීජුවටින් පැලවෙන දේවල් යන ආදිය වනසමින් ඉන්නවා. ගස් කොළන් සිඳලීම් ආදී මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලිනුත් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

32. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං සන්නිධිකාරපරිභෝගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉති ඒවරූපා සන්නිධිකාරපරිභෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

32. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ දේ රැස්කරගෙන පරිභෝග කරමින් වාසය කරනවා. ඒ කියන්නේ කෑම වර්ග රැස් කරලා තියා ගන්නවා. බීම වර්ග රැස් කරලා තියා ගන්නවා. වස්ත්‍ර රැස් කරලා තියා ගන්නවා. යාන වාහන රැස් කරලා තියා ගන්නවා. ඇඳ පුටු මේස රැස් කරලා තියා ගන්නවා. සුවඳ වර්ග රැස් කරලා තියා ගන්නවා. තවත් ආමිස රැස් කරලා තියා ගන්නවා. මෙවැනි හෝ මෙවැනි වෙනත් දේවල් හෝ රැස්කරගෙන පරිහරණය කිරීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

33. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: න-චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වේතාලං කුම්භථූනං සෝභනකං චණ්ඩාලං වංසං ධෝවනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යෝධිකං බලග්ගං සේනාබ්‍යූහං අනීකදස්සනං. ඉති වා ඉති ඒවරූපා විසූකදස්සනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

33. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයේ විසූක දර්ශනයන් නැරඹීමෙහි යෙදිල ඉන්නවා. ඒ කියන්නේ නැටුම්, ගැයුම්, වැයුම්, නාටක, පැරණි කථා රහදැක්වීම්, අත්තාල ගසා නැටීම්, වේතාල නැටීම්, බෙර වාදන කිරීම්, රහමඩළෙහි දේවතාවන්ට පූජා පිණිස නැටීම්, උණ ගසින් කරන ක්‍රීඩා, මිනී ඇට මැද තබා වටකොට නැටීම්, ඇත් යුධ බැලීම්, අශ්ව යුධ බැලීම්, ගොන් පොර බැලීම්, එළු පොර බැලීම්, බැටළු පොර බැලීම්, කුකුළු පොර බැලීම්, වටු පොර බැලීම්, පොව් හරඹ බැලීම්, මිටි හරඹ බැලීම්, මල්ලව පොර බැලීම්, යුධ සේනා බලන්ට යෑම, බලසෙන් ගණින තැන් බලන්ට යාම, බලසෙනහ විසිරුවන තැන් බලන්ට යාම ආදී දේවල්වල යෙදෙමින් ඉන්නවා. මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලින් යුතු විසූක දර්ශන නැරඹීම්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

34. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං ජූතප්පමාදට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පංගචිරං වංකකං මොක්ඛචිකං චිංගුලකං

පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනේසිකං යථාවජ්ජං. ඉති වා ඉති එවරූපා ජූතප්පමාදට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

34. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල තමාව ප්‍රමාදයට පත් කරවන මේ ආකාර වූ සූදු කෙළියෙන් කල් යවනවා. ඒ කියන්නේ හතරැස් කොටු අටකින් යුතුව කරණ සූදුව, කොටු දහයකින් කරන සූදුව, අහසේ රූ අඳිමින් කරන සූදුව, කොටු පැනීමෙන් කරණ සූදුව, සන්තික නම් වූ සූදුව, දාදු කැටයෙන් කරන සූදුව, කල්ලි ගැසුම, බුරුවා ගැසීම, ගුළ කෙළිය, නළා පිඹීම, කරණම් ගැසීම, මුගුරක් ගෙන උඩ යට වැටෙන පරිදි උඩට ගැසීම, කොළවලින් කළ ගොටුවලින් තරහෙට වැලි මැනීම, කුඩා රිය තරහ, කුඩා දුනුවලින් විදීමේ තරහ, අකුරු ලිවීමේ සෙල්ලම, සිතූ දේ කියන සෙල්ලම, විකලාංග අනුකරණයෙන් හිනැස්සීමේ සෙල්ලම ආදී දේ කිරීමයි. මේ දෙයිනුත් මෙවැනි තවත් දේවල් ඇත්නම් එයිනුත් වැළකී ප්‍රමාදයට පත්වන සූදුවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

35. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යාථීදං: ආසන්දිං පල්ලංකං ගෝනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලෝමිං ඒකන්තලෝමිං කට්ඨිස්සං කෝසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවේණිං කාදලිමිගපවරප-ච-ත්ථරණං සඋත්තර-ඡදං උභතෝලෝහිතකූපධානං. ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

35. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ පමණ ඉක්මවා උස් වූ ආසනත් වටිනා සුඛෝපභෝගී ආසනත් පරිහරණය කරනවා. ඒ කියන්නේ දිග හාන්සි පුටු, කව්විචි, ලොකු පලස් යෙදූ ආසන, විසිතුරු ගෙත්තම් කළ එළු ලොම් ඇතිරිළි, සුදු එළු ලොමින් කළ ඇතිරිළි, මල් යෙදූ එළු ලොමින් කළ ඇතිරිළි, පුළුන් යෙදූ මෙට්ට, සත්ව රූපවලින් සැරසූ එළු ලොම් ඇතිරිළි, මුළුමණින්ම එළු ලොමින් කළ ඇතිරිළි, රන් නූලෙන් සැරසූ කලාල, පට නූලෙන් කළ කලාල, නාටිකාංගනාවන් ඒමත නැටිය හැකි එළු ලොමින් කළ කලාල, ඇතුන් පිට යොදන ඇතිරිළි, අසුන් පිට යොදන ඇතිරිළි, රථවල යොදන ඇතිරිළි, අඳුන් දිවි සමෙන් කළ ඇතිරිළි, කදලි මුව සමින් කළ කලාල, හිස දෙපැත්තට

රතු විල්විද කොට්ට තබා රතු උඩුවියන් බැඳ සැදූ වටිනා යහන් ආදිය පරිහරණය කරයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී උස් අසුන් මහා අසුන් පරිහරණයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

36. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං මණ්ඩනවිභූසනට්ඨානානුයෝග‍ං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීද‍ං: උ-ච්ඡාදන‍ං පරිමද්දන‍ං නහාපන‍ං සම්බාහන‍ං ආදාස‍ං අඤ්ජන‍ං මාලාවිලේපන‍ං මුඛචුණ්ණක‍ං මුඛලේපන‍ං හත්ථබන්ධ‍ං සිඛාන්ධ‍ං දණ්ඩක‍ං නාළික‍ං ඛග්ග‍ං ඡත්ත‍ං චිත්‍රූපාහන‍ං උණ්හීස‍ං මණි‍ං වාලවීජනි‍ං විදානානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති ඒවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මි‍ං.

36. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් ඇඟපත සැරසීමෙන් හා විසිතුරු වස්ත්‍රාභරණ පැළඳීමෙන් යුක්තව කල් ගෙවනවා. ඒ කියන්නේ සුවඳ වර්ග ඇඟ තවරා සිරුර සිනිඳු කිරීම, තෙල් වර්ග ගා සම්බාහනය කොට සිරුර හැඩ කිරීම, සුවඳපැන් නෑම, උරහිස් ආදියෙහි මස් වැඩීමට මුගුරෙන් තැලීම, කැඩපතින් මුහුණ බලා සැරසීම, ඇස්වල අඳුන් ගෑම, මල් හා සුවඳ විලවුන් දැරීම, මුව සුවඳ කිරීම, මුව විලවුන් දැරීම, අත්වල ආභරණ දැමීම, හිසෙහි කුඩුම්බි දැරීම. විසිතුරු සැරයැටි දැරීම, විසිතුරු බෙහෙත් නල දැරීම, විසිතුරු කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නලල් පට දැරීම, මැණික් පැළඳීම, චාමර දැරීම, දිග වාටි ඇති සුදු වස්ත්‍ර දැරීම ආදියෙන් යුතුවෙයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී ඇඟපත සැරසීම් හා විසිතුරු වස්ත්‍රාභරණ සැරසීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

37. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං තිර-ච්ඡානකථ‍ං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද‍ං: රාජකථ‍ං චෝරකථ‍ං මහාමත්තකථ‍ං සේනාකථ‍ං භයකථ‍ං යුද්ධකථ‍ං අන්නකථ‍ං පානකථ‍ං වත්ථකථ‍ං සයනකථ‍ං මාලාකථ‍ං ගන්ධකථ‍ං ඤාතිකථ‍ං යානකථ‍ං ගාමකථ‍ං නිගමකථ‍ං නගරකථ‍ං ජනපදකථ‍ං ඉත්ථීකථ‍ං පුරිසකථ‍ං කුමාරකථ‍ං කුමාරීකථ‍ං සූරකථ‍ං විසිඛාකථ‍ං කුම්භට්ඨානකථ‍ං පුබ්බපේතකථ‍ං නානත්තකථ‍ං ලෝකක්ඛායික‍ං සමුද්දක්ඛායික‍ං

ඉතිභවාභවකථං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

37. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරිසන් කථාවල යෙදී වාසය කරනවා. ඒ කියන්නේ, රජවරුන් ගැන කථා, සොරුන් ගැන කථා, මහ ඇමතිවරුන් ගැන කථා, හමුදාවන් ගැන කථා, භය ඇතිවෙන දේවල් ගැන කථා, ආහාර වර්ග ගැන කථා, බොන දේවල් ගැන කථා, ඇඳුම් පැළඳුම් ගැන කථා, ඇඳ පුටු ගැන කථා, මල් වර්ග ගැන කථා, සුවඳ වර්ග ගැන කථා, නෑදෑයන් ගැන කථා, යාන වාහන ගැන කථා, ගම්මාන ගැන කථා, නියම් ගම්මාන ගැන කථා, නගර ගැන කථා, රටවල් ගැන කථා, ස්ත්‍රීන් ගැන කථා, පුරුෂයින් ගැන කථා, කුමාරයින් ගැන කථා, කුමාරියන් ගැන කථා, ශූරයින් ගැන කථා, මංමාවත් ගැන කථා, වලං පොලේ දේවල් ගැන කථා, මියගිය උදවිය ගැන කථා, තව තව දේවල් ගැන කථා, ලෝකය ගැන කථා, සාගරය ගැන කථා, මෙහෙමයි වුණේ මෙහෙමයි නොවුණේ කියන දේ ගැන කථා කරකර ඉන්නවා, මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරිසන් කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

38. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: "න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මි-ඡාපටිපන්නෝ ත්වමසි, අහමස්මි සම්මා පටිපන්නෝ. සහිතං මේ, අසහිතං තේ. පුරේ වචනීයං ප-ඡා අවච. ප-ඡා වචනීයං පුරේ අවච. ආචිණ්ණං තේ විපරාවත්තං. ආරෝපිතෝ තේ වාදෝ. නිග්ගහිතෝ ත්වමසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බේඨේහි වා සං- පහෝසී"ති. ඉති වා ඉති ඒවරූපාය විග්ගාහිකකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

38. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් එකිනෙකා අතර බැණ දොඩා ගන්නා කථාවෙන් යුතුව යි ඉන්නෙ. ඒ කියන්නේ "නුඹ මේ ධර්ම විනය දන්නෙ නෑ. මම තමයි මේ ධර්ම විනය දන්නේ, ආ ... එහෙම ද එතකොට නුඹද මේ ධර්ම විනය දන්නේ? නුඹ ඉන්නේ මිත්‍යා වැඩ පිළිවෙලක යි. මම තමයි නියම වැඩ පිළිවෙල තුළ ඉන්නේ. මං කරුණු සහිතව යි කියන්නේ. නුඹේ කීම කරුණු රහිත යි. නුඹ කලින් කිව්යුතු දේ පස්සේ කිව්වා. පස්සේ

කිව්යුතුදේ කලින් කිව්වා. නුඹ කලක් තිස්සේ කියපු දේ කණපිට පෙරළෙනා. මා විසින් නුඹට වාද නංවල යි තියෙන්නේ. නුඹට නිග්‍රහ කරල යි තියෙන්නේ. වාදයෙන් නිදහස් වීමට මගක් හොයාගෙන පලයන්. පුළුවන් නම් ලෙහාගනින්" යනාදිය කියමින් ආරවුල් හදාගන්නවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ බැණ දොඩාගන්නා කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

39. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං දූතෙය්‍යපහිණගමනානුයෝගමනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං "ඉධ ග-ඡ. අමුත්‍රාග-ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉති ඒවරූපා දූතෙය්‍යපහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

39. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල ගිහියන් ගේ පණිවිඩ පණත් ගෙන යන මෙබඳු වූ දූත මෙහෙවරෙහි යෙදෙනවා. ඒ කියන්නේ, "මෙහෙ යන්න, අසවල් තැනට එන්න, මේක (අපේ මේ පණිවිඩය) අරන් යන්න. අසවල් තැනට මේක අරන් යන්න" යනාදී රජුන් ගේ, රාජමහා ඇමැතිවරුන් ගේ, ක්ෂත්‍රියයන් ගේ, බ්‍රාහ්මණයන් ගේ, ගෘහපතියන් ගේ, කුමාරවරුන් ගේ, පණිවුඩ පණත් ගෙනියනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ පණිවුඩ පණත් ගෙනයන ගිහියන් ගේ දූත මෙහෙවරෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

40. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ කුහකා ච හොන්ති ලපකා ච නේමිත්තිකා ච නිප්පේසිකා ච ලාභේන ලාභං නිජිගිංසිතාරෝ. ඉති වා ඉති ඒවරූපා කුහනලපනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

40. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල කුහක (උඩින් වෙන ජීවිතයක් පෙන්වමින් යටින් වෙනත් ජීවිතයක් ගෙවමින් නැති ගුණ පෙන්වා) ජීවිත ගෙවනවා. ලාභ සත්කාර ලැබෙන විදිහට (පුහු වර්ණනා කිරීම්, තොදොල් කිරීම්, නැති ගුණ කීම් ආදී) චාටු බස් කියනවා. දායකයින් හට නො දී බැරි තත්වයට පත් වෙන ආකාරයේ නිමිති දක්වමින් කථා කරනවා. තමන්ට ලැබෙන විදිහට අනුන්ට

ගරහනවා. ලාභයෙන් ලාභය හොයනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ කුහක කමින් චාටුබස්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

මජ්ඣිමසීලං නිට්ඨිතං
මධ්‍යම සීලය නිමාවිය

41. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: අංගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසික-ඡින්නං අග්ගිහෝම්මං දබ්බිහෝම්මං ථුසහෝම්මං කණහෝම්මං තණ්ඩුල-හෝම්මං සප්පිහෝම්මං තේලහෝම්මං මුඛහෝම්මං ලෝහිතහෝම්මං අංගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජ භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා වි-ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගපක්ඛං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

41. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙවැනි වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ ශාරීරික අංග බලා ඵලාඵල කියනවා, නිමිති බලා ඵලාඵල කියනවා, උත්පාත බලා ඵලාඵල කියනවා, සිහින ඵලාඵල කියනවා, ශාරීරික ලක්ෂණ බලා ඵලාඵල කියනවා, මීයන් කෑ වස්ත්‍ර බලා ඵලාඵල කියනවා, ගිනි පූජා පවත්වනවා, හැන්දෙන් පූජා පවත්වනවා, ධාන්‍ය පොතුවලින් පූජා පවත්වනවා. කණ නම් සහලින් කළ පූජා පවත්වනවා, සහලින් පූජා පවත්වනවා, ගිතෙලින් පූජා පවත්වනවා, තල තෙලින් පූජා පවත්වනවා, විශේෂ කොට කරණ පූජා පවත්වනවා, සතුන් මරා ලේ පුදා කරන පූජා පවත්වනවා, අංග විද්‍යාව, වාස්තු විද්‍යාව, දේශපාලන විද්‍යාව, වාසනාව උරගා බැලීමේ (ලොතරැයි) විද්‍යාව, භූත විද්‍යාව, පොළොව යට බිම් ගෙයක ඉඳ මැතිරීමෙන් කරන (භූරි) විද්‍යාව, සර්ප විද්‍යාව, විෂ විද්‍යාව, වෘශ්චික විද්‍යාව, මූෂික විද්‍යාව, පක්ෂි විද්‍යාව, විශාල පක්ෂි විද්‍යාව, ඉදුණු දේ මුල් කොට අනාවැකි කියන විද්‍යාව, මතුරන ලද ඊතල විද ආරක්ෂා කරන විද්‍යාව, මෘග පක්ෂ යනාදී මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

42. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරීලක්ඛණං දාසලක්ඛණං දාසීලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගෝලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගෝධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං ක-ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

42. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ මැණික්වල සුභ අසුභ ලකුණු කීම, දඬුවල සුභ අසුභ ලකුණු කීම, වස්ත්‍රවල සුභ අසුභ ලකුණු කීම, කඩු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ඊතල ආදී සලකුණුවලින් සුභාසුභ කීම, දුනු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ආයුධ ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ස්ත්‍රීන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, පුරුෂයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දරුවන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දැරියන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසීයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, ඒ ඒ කටයුතු සඳහා තෝරා ගත යුතු ඇතුන් ගේ ලකුණු කීම, අසුන් ගේ ලකුණු කීම, ඔටුවන් ගේ ලකුණු කීම, වෘෂභයන් ගේ ලකුණු කීම, ගවයන් ගේ ලකුණු කීම, එළුවන් ගේ ලකුණු කීම, බැටළුවන් ගේ ලකුණු කීම, කුකුළු පොර ආදියට සුදුසු කුකුළන් ගේ ලකුණු කීම, වටුවන් ගේ ලකුණු කීම, සුභුනන් ඇහ වැටීමේ සහ හඬනැගීමේ ඵලාඵල කීම, කණෙහි පළඳාගත් උපකරණවලින් ඵලාඵල කීම, කැස්බෑවන්ට මතුරා ඵලාඵල කීම, මුවන්ට මතුරා ඵලාඵල කීම ආදී තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

43. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති. රඤ්ඤං අතියානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං

අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයෝ භවිස්සති. බහිරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයෝ භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. ඉති ඉමස්ස ජයෝ භවිස්සති. ඉමස්ස පරාජයෝ භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

43. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් නැකතට රජතුමා ගේ යුධ පිණිස නික්මීම වන්නේ ය. අසවල් නැකතින් ආපසු නුවරට ඇතුළ්වීම සිදු කළ යුත්තේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිට පිටත සතුරු රජුන් හමුවීමට රජු ගේ ගමන කළයුත්තේ ය. අසවල් නැකතින් පිටත සිටින රජවරු රට ඇතුළට පැමිණීම වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජු ගේ ඉවත්වීම සිදුවන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජුට ජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුනට පරාජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුන්ට ජය වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ රජුට පරාජය වන්නේ ය කියල මොහුට ජය වෙනවා. මොහුට පරාජය වෙනවා" ආදී වශයෙන් පවසමින් තිරිසන් විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

44. **"යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: චන්දග්ගාහෝ භවිස්සති, සුරියග්ගාහෝ භවිස්සති, නක්ඛත්තග්ගාහෝ භවිස්සති, චන්දිමසුරියානං පථගමනං භවිස්සති, චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, නක්ඛත්තානං පථගමනං භවිස්සති, නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, උක්කාපාතෝ භවිස්සති, දිසාඩාහෝ භවිස්සති, භූමිචාලෝ භවිස්සති, දේවදුන්දුභි භවිස්සති, චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං විගමනං සංකිලේසං වෝදානං භවිස්සති, ඒවං විපාකෝ චන්දග්ගාහෝ භවිස්සති, ඒවං විපාකෝ සුරියග්ගාහෝ භවිස්සති, ඒවං විපාකෝ නක්ඛත්තග්ගාහෝ භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියානං පථගමනං භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියානං**

උප්පථගමනං භවිස්සති, එවං විපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති, එවං විපාකං නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, එවං විපාකෝ උක්කාපාතෝ භවිස්සති, එවං විපාකෝ දිසාඩාහෝ භවිස්සති, එවං විපාකෝ භූමිචාලෝ භවිස්සති, එවං විපාකෝ දේවදුන්දුභි භවිස්සති, එවං විපාකං චන්දිමසූරියනක්ඛත්තානං උග්ගමනං විගමනං සංකිලේසං වෝදානං භවිස්සති. ඉති වා ඉති එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

44. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් දින චන්ද්‍රග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සූර්යග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින නැකත් ග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නිසිමහින් යෑම සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නොමහින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නිසි මහින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නොමහින් යෑම සිදුවෙනවා. අසවල් දින උල්කාපාත වැටෙනවා. අසවල් දින අසවල් දිශාවේ උෂ්ණත්වය වැඩිවෙනවා. අසවල් දින භූමි කම්පාවක් සිදුවෙනවා. අසවල් දින වැසි රහිතව අහස ගුගුරනවා. හිරු සඳු හා නැකත්වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම මේ මේ වෙලාවට සිදුවෙනවා. චන්ද්‍ර ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. සූර්ය ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. නැකත් ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නිසිගමන මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නොමග යෑම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. උල්කාපාත වැටීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. දිශා දාහය මෙවැනි ඵල විපාක ලබා දෙනවා. භූකම්පන මෙවැනි ඵල විපාක ලබා දෙනවා. වැසි නැතිව අහස ගිගිරීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. හිරු සඳු හා නැකත්වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම ලෝකයට මෙවැනි විපාක ලබා දෙනවා" කියල තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

45. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: සුබ්බුට්ඨිකා භවිස්සති, දුබ්බුට්ඨිකා භවිස්සති, සුභික්ඛං භවිස්සති, දුබ්භික්ඛං භවිස්සති, ඛේමං භවිස්සති, භයං භවිස්සති,**

රෝගෝ භවිස්සති, ආරෝග්‍යං භවිස්සති, මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලෝකායතං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

45. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "මේ කාලයේ දී වැස්ස වහිනවා. මේ කාලයේ දී නියහය ඇතිවෙනවා. මේ කාලයේ දී ආහාරපානාදියෙන් සරුවෙනවා. මේ කාලයේ දී දුර්භික්ෂය ඇතිවෙනවා. මේ කාලයේ දී රට සරුවෙනවා. මේ කාලයේ දී බිය සැක නැතිව ඉන්නවා. මේ කාලයේ දී භය උපදිනවා. මේ කාලයේ දී රෝග ඇතිවෙනවා. මේ කාලයේ දී නීරෝග බව ඇතිවෙනවා කියමින් එලා එල පැවසීමත් මුද්‍රා, ගණිත, සංඛ්‍යාන, කාව්‍ය ශාස්ත්‍ර, ලෝකායත ශාස්ත්‍ර ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

46. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හා-නිත්ථම්භනං හනුසංහනනං හත්ථාභිජප්පනං හනුජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිකපඤ්හං දේවපඤ්හං ආදි-චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිවිහානං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

46. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, විවාහයට නැකත් කීම, ආවාහයට නැකත් කීම, වෙන් වූ අඹු සැමියන් එක් කිරීමට නැකත් සැදීම, එක් වූ අඹු සැමියන් වෙන් කිරීමට නැකත් සැදීම, දීපු ණය එකතු කිරීමට නැකත් සැදීම, මුදල් ණයට පොලියට දීමට නැකත් සැදීම, දියුණු වීමට ගුරුකම් කිරීම, පාළුවී නැති වීමට ගුරුකම් කිරීම, දරුගැබ් රැකෙන්නට ගුරුකම් කිරීම, දිව අගුළු බැඳෙන්නට ගුරුකම් කිරීම, හනු තද කරන්නට ගුරුකම් කිරීම, අත් පෙරලෙන්නට ගුරුකම් කිරීම, හනු සිරවෙන්නට ගුරුකම්

කිරීම, කණ් අගුළු වැටෙන්නට ගුරුකම් කිරීම, කණ්ණාඩියෙන් භූතයන් කැඳවා ප්‍රශ්න විචාරීම, ගෑණු දරුවන් ලවා පේන කීම, දෙවියන් ලවා පේන කීම, සූර්ය වන්දනාව, මහ බඹු වන්දනාව, මන්ත්‍ර බලයෙන් කටින් ගිනිදැල් පිටකිරීම, මන්ත්‍ර බලෙන් ලක්ෂ්මී පූජා කිරීම යනාදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

47. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: සන්තිකම්මං පණිධිකම්මං භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකම්මං වත්ථුපරිකිරණං ආවමනං නහාපනං ජුහනං වමනං විරේචනං උද්ධවිරේචනං අධෝවිරේචනං සීස-විරේචනං කණ්ණතේලං නෙත්තතප්පනං නත්ථුකම්මං අඤ්ජනං ප-චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකි-ඡා මූලභේසජ්ජානං අනුප්පාදානං විසඨීනං පටිමොක්ඛෝ. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

47. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, ශාන්ති කර්ම, බාර ඔප්පු කිරීම, පොළොව යට හිඳ මතුරා ගුරුකම් කිරීම, නපුංසකයා පිරිමියෙකු කිරීම, පිරිමියා නපුංසකයෙකු කිරීම, ගෙවල් තැනීමේ දිශාවන් පෙන්වා දීම, අළුතෙන් නිවාස තැනීමේදී පුද පූජා පැවැත්වීම. වතුර මතුරා මූණ සේදවීම. වතුර මතුරා නැහැවීම, ගිනිපිඳීම, ලය විරේක කරවීම, බඩ විරේක කරවීම, වමනය කරවීම, වස්ති කරවීම, ශීර්ෂ විරේකය, කණට තෙල් පිඹීම, ඇස් වෙදකම, නස්න කිරීම, ඇස්වලට අඳුන් සෑදීම, ප්‍රති අංජන සෑදීම, ශල්‍ය කර්ම කිරීම, ළදරු චිකිත්සාව, කාය චිකිත්සාව, වනවලට බෙහෙත් බැඳීම ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

48. **ස ඛෝ සෝ මහාරාජ භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෙය්‍යථාපි මහාරාජ ඛත්තියෝ මුද්ධාවසිත්තෝ නිහතප-චාමිත්තෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං**

ප-චත්ථිකතෝ. ඒවමේව ඛෝ මහාරාජ භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෝ ඉමිනා අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ මහාරාජ භික්ඛු සීලසම්පන්නෝ හෝති.

48. පින්වත් මහාරාජ, ඒ භික්ෂුව වනාහී මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. පින්වත් මහාරාජ, එක මේ වගේ දෙයක්. ඔටුනු පළන් රජ කෙනෙක් ඉන්නවා. ඔහු සතුරන් පරදවල බැහැර කරලයි ඉන්නේ. ඉතින් ඔහු සතුරන් හේතුවෙන් මොන ම අයුරකින්වත් භයක් දකින්නේ නෑ. පින්වත් මහාරාජ, භික්ෂුවත් ඔය විදිහම යි. මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් සමන්විතව ආධ්‍යාත්මිකව නිවැරදි සැපයක් විඳිනවා. පින්වත් මහාරාජ, ඔන්න විදිහට යි භික්ෂුව සීලසම්පන්න වන්නේ.

49. කථඤ්ච මහාරාජ භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති? ඉධ මහාරාජ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියේ සංවරං ආපජ්ජති. සෝතේන සද්දං සුත්වා ..... ඝාණේන ගන්ධං ඝායිත්වා ..... ජිව්හාය රසං සායිත්වා ..... කායේන ඵොට්ඨබ්බං ඵුසිත්වා ..... මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියේ සංවරං ආපජ්ජති. සෝ ඉමිනා අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ අජ්ඣත්තං අබ්‍යාසේකසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ මහාරාජ භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති.

49. පින්වත් මහාරාජ, භික්ෂුව අකුසලයන් වැළකූ ද්වාර ඇති ඉඳුරන් ඇතිව ඉන්නේ කොහොම ද? පින්වත් මහාරාජ, මෙහිලා භික්ෂුව ඇසින් රූප දැක නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් ඇස නමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස

පිළිපදිනවා. ඇස රැක ගන්නවා. ඇස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. කණෙන් ශබ්දයක් අහලා ..... නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කරලා ..... දිවෙන් රසයක් රස විඳලා ..... කයෙන් පහසක් ලබලා ..... මනසින් අරමුණක් දැන ගෙන නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් මනස නමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. මනස රැක ගන්නවා. මනස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. ඔහු මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව ආධ්‍යාත්මිකව පීඩා රහිතව සැපයක් විඳිනවා. පින්වත් මහාරාජ, භික්ෂුව අකුසලයෙන් වැළැක් වූ දොරටු ඇති ඉන්ද්‍රියයන් තුළ ඉන්නේ ඔය විදිහට යි.

50. කථඤ්ච මහාරාජ භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති? ඉධ මහාරාජ භික්ඛු අභික්කන්තේ පටික්කන්තේ සම්පජානකාරී හෝති. ආලෝකිතේ විලෝකිතේ සම්පජානකාරී හෝති. සම්මිඤ්ජිතේ පසාරිතේ සම්පජානකාරී හෝති. සංඝාටිපත්තචීවරධාරණේ සම්පජානකාරී හෝති. අසිතේ පීතේ ඛායිතේ සායිතේ සම්පජානකාරී හෝති. උච්චාරපස්සාවකම්මේ සම්පජානකාරී හෝති. ගතේ ඨිතේ නිසින්නේ සුත්තේ ජාගරිතේ භාසිතේ තුණ්හීභාවේ සම්පජානකාරී හෝති. එවං ඛෝ මහාරාජ භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති.

50. පින්වත් මහාරාජ, භික්ෂුව සිහිනුවණින් යුතුව සිටින්නේ කොහොම ද? පින්වත් මහාරාජ, මෙහිලා භික්ෂුව ඉදිරියට යද්දීත්, ආපසු එද්දීත්, එය කරන්නේ සිහි නුවණින් ම යි. ඉදිරිය බලද්දී, වටපිට බලද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. අතපය හකුළද්දී, දිගහරිද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. දෙපට සිවුර, පාත්‍රය, අනෙක් සිවුරු ආදිය දරද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. වළඳද්දී පානය කරද්දී අනුභව කරද්දී රස විඳිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. වැසිකිළි කැසිකිළි යාමේ දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. ගමන් කරද්දී, සිටගෙන සිටිද්දී, වාඩි වී සිටිද්දී, සැතපෙද්දී, නිදිවරද්දී, කථාබස් කරද්දී, නිහඬව සිටිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. පින්වත් මහාරාජ, භික්ෂුව සිහිනුවණින් යුතු වන්නේ ඔය ආකාරයට යි.

51. කථඤ්ච මහාරාජ භික්ඛු සන්තුට්ඨෝ හෝති? ඉධ මහාරාජ භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරියේන චීවරේන කුච්ඡිපරිහාරියේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති.

සෙය්‍යථාපි මහාරාජ, පක්ඛී සකුණෙෝ යේන යේනේව ඩේති සපත්තභාරෝ'ව ඩේති, ඒවමේව ඛෝ මහාරාජ, භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරියේන චීවරේන කු-ජීපරිහාරියේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. ඒවං ඛෝ මහාරාජ භික්ඛු සන්තුට්ඨෝ හෝති.

51. පින්වත් මහාරාජ, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ කොහොම ද? පින්වත් මහාරාජ, මෙහිලා භික්ෂුව කය පරිහරණයට සෑහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සෑහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. ඒක මේ වගේ දෙයක්. කුරුල්ලෙක් යම් ම තැනකට පියඹා යනවා නම්, පියාපත් බර පමණක් සහිතව පියඹනවා වගෙයි. පින්වත් මහාරාජ, ඔය අයුරින් ම භික්ෂුව කය පරිහරණයට සෑහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සෑහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. පින්වත් මහාරාජ, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ ඔය විදිහට යි.

52. සෝ ඉමිනා ච අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතෝ, විවිත්තං සේනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භෝකාසං පලාලපුඤ්ජං. සෝ ප-ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තෝ නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

52. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ සිහිනුවණින් යුක්ත වෙලා, මේ ආර්ය වූ ලද දෙයින් සතුටුවීමෙන් යුක්ත වෙලා හුදෙකලා සෙනසුනක වාසය කරනවා. ඒ කියන්නේ ආරණ්‍යය, රුක්සෙවණ, පර්වතය, දිය ඇල්ල, ගිරිගුහාව, සොහොන, වනගැබ, ගස් කොළන් රහිත හිස් පිටිය, පිදුරු ගෙය ආදිය යි. ඔහු පිණ්ඩපාතය වළඳා, දානයෙන් පසු (එවැනි තැනක) පළඟක් බැඳ ගෙන, කය සෘජු කර ගෙන, භාවනා අරමුණෙහි සිහිය පිහිටුවා ගෙන වාඩිවෙනවා.

53. සෝ අභිජ්ඣං ලෝකේ පහාය විගතාභිජ්ඣේන චේතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසෝධේති. බ්‍යාපාදපදෝසං පහාය අබ්‍යාපන්නචිත්තෝ විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදෝසා චිත්තං පරිසෝධේති.

ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධෝ විහරති අලෝකසඤ්ඤී සතෝ සම්පජානෝ. ථීනමිද්ධා චිත්තං පරිසෝධේති. උද්ධ-චකුක්කු-චං පහාය අනුද්ධතෝ විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තෝ. උද්ධ-චකුක්කු-චා චිත්තං පරිසෝධේති. විචිකි-ඡං පහාය තිණ්ණවිචිකි-ඡෝ විහරති අකථංකථී කුසලේසු ධම්මේසු. විචිකි-ඡාය චිත්තං පරිසෝධේති.

53. ඔහු ජීවිතය නම් වූ ලෝකය ගැන ඇති විසම ලෝභය දුරු කොට ඇලීම් රහිත වූ සිතින් වාසය කරනවා. විසම ලෝභය කෙරෙන් සිත පිරිසිදු කරනවා. තරහ වෛර ආදිය අත්හැර තරහ නැති සිතින් සියළු සතුන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා. තරහ වෛර ආදිය කෙරෙන් සිත පිරිසිදු කරනවා. නිදිමත අලසකම අත්හැර නිදිමත අලසකමින් බැහැරව ආලෝක සඤ්ඤාවෙන් යුතුව, සිහිනුවණ ඇතිව වාසය කරනවා. නිදිමත අලසකම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සිතේ විසිරීමත්, පසුතැවීමත් බැහැර කොට නො කැළඹී ගිය සංසිඳුනු සිතින් වාසය කරනවා. සිතේ විසිරීම හා පසුතැවීම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සැකය දුරු කොට කුසල් දහම් ගැන කෙසේ ද? කෙසේ ද? යනාදී සැකයෙන් එතෙරව වාසය කරනවා. සැකය කෙරෙන් සිත පිරිසිදු කරනවා.

54. සෙය්‍යථාපි මහාරාජ පුරිසෝ ඉණං ආදාය කම්මන්තේ පයෝජෙය්‍ය, තස්ස තේ කම්මන්තා සම්ඡ්ජෙය්‍යුං, සෝ යානි ච පෝරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ඉණං ආදාය කම්මන්තේ පයෝජේසිං. තස්ස මේ තේ කම්මන්තා සම්ඡ්ඣිංසු. සෝ'හං යානි ච පෝරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තී අකාසිං. අත්ථි ච මේ උත්තරිං අවසිට්ඨං දාරභරණාය"න්ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

54. පින්වත් මහාරාජ, එය මෙවැනි දෙයක්. පුරුෂයෙක් ණයක් අරගෙන කර්මාන්තයක යොදවනවා. ඔහු ගේ ඒ ව්‍යාපාරය සාර්ථක වෙනවා. එතකොට ඔහු යම් පරණ මුල් ණයක් ඇද්ද, එය සම්පූර්ණයෙන් ම ගෙවලා දානවා. එයින් පසු ඔහුට අඹුදරුවන් පෝෂණය පිණිස ලාභයක් ඉතිරිත් වෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං කලින් ණයක් අරගෙනයි ව්‍යාපාරයක යෙදෙව්වේ. ඒ මගේ ව්‍යාපාරය සාර්ථක වුණා. ඒ මං යම් පරණ මුල් ණයක් ඇද්ද එය සම්පූර්ණයෙන් ම ගෙව්වා. අඹුදරුවන් පෝෂණයටත් මට ආදායම ඉතිරි වුණා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

55. සෙය්‍යථාපි මහාරාජ පුරිසෝ ආබාධිකෝ අස්ස දුක්ඛිතෝ බාළ්හගිලානෝ, භත්තං චස්ස න-ඡාදෙය්‍ය, න චස්ස කායේ බලමත්තා, සෝ අපරේන සමයේන තම්හා ආබාධා මු-චෙය්‍ය, භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායේ බලමත්තා, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ආබාධිකෝ අහෝසිං දුක්ඛිතෝ බාළ්හගිලානෝ. භත්තං ච මේ න-ඡාදේසි. නචස්ස මේ ආසි කායේ බලමත්තා. සෝ'මිහි ඒතරහි තම්හා ආබාධා මුත්තෝ. භත්තඤ්ච මේ ඡාදේති. අත්ථි ච මේ කායේ බලමත්තා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

55. පින්වත් මහාරාජ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව ඉන්නවා. ඔහුට බත් කෑමටවත් පිරියක් නෑ. ඔහු ගේ ඇහේ පතේ ප්‍රාණවත් ගතියක් නෑ. නමුත් පස්සෙ කාලෙක ඔහු ඒ රෝගයෙන් මිදුනා. ඔහුට දැන් බත් කෑමත් ප්‍රිය යි. ඔහු ගේ ඇහපතත් ප්‍රාණවත්. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව හිටියේ. මට බත් කෑමටවත් පිරියක් තිබුණේ නෑ. මගේ ඇහේ පතේ ප්‍රාණවත් ගතියක් තිබුණේ නෑ. නමුත් දැන් මං ඒ රෝගයෙන් මිදුනා. මට දැන් බත් කෑමත් ප්‍රිය යි. මගේ ඇහපතත් ප්‍රාණවත්" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

56. සෙය්‍යථාපි මහාරාජ පුරිසෝ බන්ධනාගාරේ බද්ධෝ අස්ස, සෝ අපරේන සමයේන තම්හා බන්ධනාගාරා මු-චෙය්‍ය සොත්ථිනා අබ්භයේන න චස්ස කිඤ්චි භෝගානං වයෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ බන්ධනාගාරේ බද්ධෝ අහෝසිං. සෝ'මිහි ඒතරහි තම්හා බන්ධනාගාරා මුත්තෝ සොත්ථිනා අබ්භයේන. නත්ථි මේ කිඤ්චි භෝගානං වයෝ"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

56. පින්වත් මහාරාජ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් හිරගෙදරක බන්ධනයකට හසුවෙනවා. නමුත් ඔහු පස්සෙ කාලෙක තමන් ගේ ධනය වියදම් නොකොට සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වෙනවා. ඔහු ගේ සම්පත්වලින් කිසි වියදමක් යන්නේ නෑ. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර හිරගෙදරක බන්ධනයකට අහු වුණා. නමුත් ඒ මං දැන් ධන වියදමකින් තොරව සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වුණා. මගේ භෝග සම්පත්වලින් කිසිදෙයක් වියදම් වුණේ නෑ" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

57. සෙය්‍යථාපි මහාරාජ පුරිසෝ දාසෝ අස්ස අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාමංගමෝ, සෝ අපරේන සමයේන තම්හා දාසබ්‍යා මු-චෙය්‍ය අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාමංගමෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ දාසෝ අහෝසිං අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාමංගමෝ. සෝ'ම්හි ඒතරහි තම්හා දාසබ්‍යා මුත්තෝ අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාමංගමෝ"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

57. පින්වත් මහාරාජ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නො හැකි, දාසයෙක් වෙලා හිටියා. ඔහු පස්සෙ කාලෙක ඒ දාසබවෙන් නිදහස් වුණා. තමාට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නො වන, තමන් කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබුණා. එතකොට ඔහුට මෙහෙම හිතුනා. "මං ඉස්සර තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නොහැකි, දාසයෙක් වෙලා හිටියා. ඒ මං දැන් ඒ දාසබවෙන් නිදහස් වෙලයි ඉන්නේ. මට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නො වන, මං කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබිලා තියෙනවා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

58. සෙය්‍යථාපි මහාරාජ පුරිසෝ සධනෝ සභෝගෝ කන්තාර-ද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සෝ අපරේන සමයේන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛේමං අප්පටිභයං, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සෝ'ම්හි ඒතරහි තං කන්තාරං තිණ්ණෝ සොත්ථිනා ගාමන්තං අනුප්පත්තෝ ඛේමං අප්පටිභය"න්ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

58. පින්වත් මහාරාජ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසෙනවා. නමුත් ඔහු පසු කාලෙක ඒ කාන්තාරයෙන් එතෙර වෙනවා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා "මං කලින් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත

කාන්තාර ගමනකට පිවිසුනා. නමුත් දැන් මා ඒ කාන්තාරයෙන් එතෙර වුණා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණුනා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

59. එවමේව ඛෝ මහාරාජ භික්ඛු යථා ඉණං යථා රෝගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං. එවං ඉමේ පඤ්ච නීවරණේ අප්පහීණේ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි මහාරාජ ආනණ්‍යං, යථා ආරෝග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛේමන්තභූමිං එවමේව ඛෝ මහාරාජ භික්ඛු ඉමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සති.

59. පින්වත් මහාරාජ, අන්න ඒ විදිහම යි. භික්ෂුවත් (කලින්) ණයක් ගත්තා වගේ, ලෙඩ වුණා වගේ, හිරේවිලංගුවේ වැටුනා වගේ, වහල්බවට පත් වුණා වගේ, නිරුදක කතරකට පැමිණුනා වගේ මේ පංච නීවරණයන් ප්‍රහාණය නො වී තමා තුළ පවතින හැටි දකිනවා. නමුත් පින්වත් මහාරාජ, ඒ ණය ගෙවා දමා ණය රහිත වුණා වගේ, රෝගයෙන් නිදහස් වෙලා නීරෝග වුණා වගේ, වියදම් නැතුව හිරෙන් නිදහස් වුණා වගේ, දාසබවෙන් නිදහස් වුණා වගේ, නිරුදක කතර ගෙවා ආරක්ෂා සහිත ක්ෂේම භූමියකට පැමිණුනා වගේ තමයි. පින්වත් මහාරාජ, අන්න ඒ විදිහමයි භික්ෂුව තමා තුළ මේ පංච නීවරණයන් දුරුවී ඇති ආකාරයත් දකින්නේ.

60. තස්සිමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සතෝ පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායෝ පස්සම්භති. පස්සද්ධකායෝ සුඛං වේදේති. සුඛිනෝ චිත්තං සමාධියති.

60. ඔහුට මේ පඤ්ච නීවරණයන් තමා තුළ නැති බව දකිද්දි මහත් සතුටක් ඇති වෙනවා. ඒ ප්‍රමුදිත වීම ඇති කෙනාට ප්‍රීතිය ඇති වෙනවා. ප්‍රීති මනසක් ඇති කෙනා ගේ කය සංසිඳෙනවා. සංසිඳුනු කයින් යුතුව සැපක් විඳිනවා. සැප ඇති කෙනා ගේ සිත සමාධිමත් වෙනවා.

61. සෝ විවි-ච්-ච කාමේහි විවි-ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

61. ඔහු කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් හට ගත් ප්‍රීති සුඛය ඇති පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

62. සෙය්‍යථාපි මහාරාජ දක්ඛෝ නහාපකෝ වා නහාපකන්තේවාසී වා කංසථාලේ නහානීයචුණ්ණානි ආකිරිත්වා උදකේන පරිප්ඵෝසකං පරිප්ඵෝසකං සන්නෙය්‍ය සායං නහානීයපිණ්ඩි ස්නේහානුගතා ස්නේහපරේතා සන්තරබාහිරා ඵුටා ස්නේහේන න ච පග්ඝරණි.

62. පින්වත් මහාරාජ, එක මේ වගේ දෙයක්. (රජවරුන් ආදී පිරිස් නහවන) දක්ෂ නහවන්නෙක් හෝ නහවන කෙනෙකු ගේ ගෝලයෙක් ඉන්නවා. ඔහු ලෝහ බඳුනක නානසුණු විසුරුවනවා. ඊට පස්සේ දිය ඉස ඉස පිඬු කරනවා. එතකොට ඒ නානසුණු පිඬට අර වතුර කාවදිනවා. හොඳින් තෙත් වෙනවා. ඒ නහන පිඬ ඇතුළත පිටත සෑම තැන ම හොඳින් දිය පැතිරිලා තියෙනවා. පිටතට වැගිරෙන්නෙත් නෑ.

එවමේව ඛෝ මහාරාජ භික්ඛු ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති. ඉදම්පි ඛෝ මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

පින්වත් මහාරාජ, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ. පින්වත් මහාරාජ, මෙයත් අර කලින් කියන ලද ශ්‍රමණ ඵලයන්ට වඩා අතිශයින් සොඳුරු වූත් ප්‍රණීත වූත් මේ ජීවිතයේ දී ම ලද හැකි පැවිදි දිවියේ ඵලයකි.

64. පුන ච පරං මහාරාජ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසෝ ඒකෝදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං

සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

64. පින්වත් මහාරාජ, තව දුරටත් කියනවා නම් භික්ෂුව විතක්ක විචාරයන් ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්මිකව පැහැදීම ඇතිව සිතෙහි මනා එකඟ බවෙන් යුතු ව විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් හටගත්, ප්‍රීති සුඛය ඇති දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිසුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

65. සෙය්‍යථාපි මහාරාජ උදකරහදෝ උබ්භිදෝදකෝ, තස්ස නේවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, න ප-ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, දේවෝ ච න කාලේන කාලං සම්මා ධාරං අනුපවෙ-ඡෙය්‍ය, අථ ඛෝ තම්හා ච උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමේව උදකරහදං සීතේන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතෝ උදකරහදස්ස වාරිනා සීතේන අප්ඵුටං අස්ස.

65. පින්වත් මහාරාජ, එක මේ වගේ දෙයක්. යට දිය උල්පත්වලින් වතුර ගලන ගැඹුරු විලක් තියෙනවා. හැබැයි ඒ විලට නැගෙනහිර පැත්තෙන් වතුර එන මගක් නෑ. දකුණු පැත්තෙන් වතුර එන මගක් නෑ. බටහිර පැත්තෙන් වතුර එන මගක් නෑ. උතුරු පැත්තෙන් වතුර එන මගක් නෑ. වැස්සත් කලින් කලට පිළිවෙලකට වහින්නේ නෑ. එතකොට ඒ විලෙන් ම සීතල දියදහරා උල්පත්වලින් උඩට මතු වෙවී ඒ විල ම සීතල ජලයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. වතුරෙන් පුරවනවා. හොඳින් පුරවනවා. ඒ මුළු විලේ ම සිහිල් ජලයෙන් පහස නො ලැබූ කිසි තැනක් නෑ.

එවමේව ඛෝ මහාරාජ භික්ඛු ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති. ඉදම්පි ඛෝ මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

පින්වත් මහාරාජ, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා.

එයින් පුරවනවා. පිරිසුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. පින්වත් මහාරාජ, මෙයත් අර කලින් කියන ලද ශ්‍රමණ ඵලයන්ට වඩා අතිශයින් සොඳුරු වූත් ප්‍රණීත වූත් මේ ජීවිතයේ දී ම ලද හැකි පැවිදි දිවියේ ඵලයකි.

66. පුන ච පරං මහාරාජ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති සතෝ සම්පජානෝ සුඛඤ්ච කායේන පටිසංවේදේති. යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති.

66. පින්වත් මහාරාජ, තව දුරටත් කියනවා නම් භික්ෂුව ප්‍රීතියට ද නො ඇලීමෙන් උපේක්ෂාවෙන් යුතුව වාසය කරනවා. සිහියෙන් නුවණින් යුතුව කයෙන් සැපයක් ද විඳිනවා. ආර්යයන් වහන්සේලා යම් ධ්‍යානයකට උපේක්ෂා සහගත සිහිය ඇති සැප විහරණය යැයි පවසනවා ද, ඒ තුන් වෙනි ධ්‍යානයත් උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිසුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

67. සෙය්‍යථාපි මහාරාජ උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පේක-චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකේ ජාතානි උදකේ සංවද්ධානි උදකානුග්ගතානි අන්තෝනිමුග්ගපෝසීනි තානි යාව චග්ගා යාව ච මූලා සීතේන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි, පරිප්ඵුටානි නාස්සා කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතේන වාරිනා අප්ඵුටං අස්ස.

67. පින්වත් මහාරාජ, ඒක මේ වගේ දෙයක්. මහනෙල් විලක හෝ රතු නෙළුම් විලක හෝ සුදු නෙළුම් විලක හෝ ඇතැම් මහනෙල් වේවා, රතු නෙළුම් වේවා, සුදු නෙළුම් වේවා ඒ නෙළුම් ජලයේ ම යි හට ගන්නේ. ජලයේ ම යි වැඩෙන්නේ. නමුත් ජලයෙන් උඩට ඇවිත් නෑ. ජලය තුළ ම ගිලී වැඩෙනවා. එතකොට ඒ නෙළුම් අග දක්වාත් මුල දක්වාත් සීතල දියෙන් හොඳට තෙත් වෙලා තියෙන්නේ. මුළුමණින් ම තෙත් වෙලා තියෙන්නේ. පිරිල තියෙන්නේ. හැම තැනම පැතිරිලා තියෙන්නේ. ඒ සෑම මහනෙල්වල, රතුනෙළුම්වල, සුදුනෙළුම්වල සීතල දිය නො පැතුරුණු කිසි තැනක් නෑ.

එවමේව ඛෝ මහාරාජ භික්ඛු ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති. ඉදම්පි ඛෝ මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

පින්වත් මහාරාජ, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ. පින්වත් මහාරාජ, මෙයත් අර කලින් කියන ලද ශ්‍රමණ ඵලයන්ට වඩා අතිශයින් සොඳුරු වූත් ප්‍රණීත වූත් මේ ජීවිතයේ දී ම ලද හැකි පැවිදි දිවියේ ඵලයකි.

68. පුන ච පරං මහාරාජ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බේව සෝමනස්සදෝමනස්සානං අත්ථගමා අදුක්ඛමසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති.

68. පින්වත් මහාරාජ, නැවතත් කියනවා නම් භික්ෂුව සැපය ද ප්‍රහාණය කිරීමෙන්, දුක ද ප්‍රහාණය කිරීමෙන් කලින් ම සොම්නස් දොම්නස් දෙක ඉක්ම යෑමෙන් දුක් සැප රහිත වූ පාරිශුද්ධ උපේක්ෂා සහගත සතිය ඇති සතර වෙනි ධ්‍යානය උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

සෙය්‍යථාපි මහාරාජ පුරිසෝ විදාතේන වත්ථේන සසීසං පාරුපිත්වා නිසින්නෝ අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විදාතේන වත්ථේන අප්ඵුටං අස්ස, ඒවමේව ඛෝ මහාරාජ භික්ඛු ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති. ඉදම්පි ඛෝ මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

පින්වත් මහාරාජ, එක මේ වගේ දෙයක්. සුදු වස්ත්‍රයකින් හිස සහිතව මුළු සිරුර ම පොරොවාගෙන වාඩි වී සිටින කෙනෙක් ඉන්නවා. එතකොට

ඔහු ගේ මුළු කයෙහි ම සුදු වස්ත්‍රයෙන් නො වැසුණු කිසි තැනක් නෑ. පින්වත් මහාරාජ, අන්න ඒ වගේ ම යි භික්ෂුව මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. පින්වත් මහාරාජ, මෙයත් අර කලින් කියන ලද ශ්‍රමණ ඵලයන්ට වඩා අතිශයින් සොඳුරු වූත් ප්‍රණීත වූත් මේ ජීවිතයේ දී ම ලද හැකි පැවිදි දිවියේ ඵලයකි.

69. පුන ච පරං මහාරාජ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සානාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතාපෙත්තිකසම්භවෝ විදනකුම්මාසූපචයෝ අනි-චු-ඡාදනපරිමද්දන-භේදනවිද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති.

69. පින්වත් මහාරාජ, තව දුරටත් කියනවා නම් භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් වැංජන ආදියෙන් වැඩුණු, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි.

70. සෙය්‍යථාපි මහාරාජ මණි වේළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ සබ්බාකාරසම්පන්නෝ, තත්‍ර'ස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා විදාතං වා පණ්ඩු-සුත්තං වා. තමේනං චක්ඛුමා පුරිසෝ හත්ථේ කරිත්වා ප-චවෙක්ඛෙය්‍ය "අයං ඛෝ මණි වේළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ, අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ සබ්බාකාරසම්පන්නෝ, තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා විදාතං වා පණ්ඩුසුත්තං වා"ති.

70. පින්වත් මහාරාජ, ඒක මේ වගේ දෙයක්. වෛරෝඩි මාණික්‍යයක් තියෙනවා. හරි ලස්සනට පහළ වුණ දෙයක්. අටපට්ටම්. හොඳින් ඔපමට්ටම්, ඉතාමත් හොඳ යි. ඉතාම ප්‍රසන්න යි. පිවිතුරු යි. මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. ඉතින් ඔය මැණික තුළ නිල් වේවා, රන්වන් වේවා, රතු වේවා, සුදු වේවා, පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා. එතකොට ඇස් ඇති පුරුෂයෙක් මැණික අතට ගෙන හොඳින් විමසා බලනවා. "මේ වෛරෝඩි මැණික හරි ලස්සනට පහළ වුණ දෙයක්. අටපට්ටම්. හොඳින් ඔපමට්ටම්, ඉතාමත් හොඳ යි. ඉතාම ප්‍රසන්න යි. පිවිතුරු යි. මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. මේ මැණික තුළ නිල් වේවා, රන්වන් වේවා, රතු වේවා, සුදු වේවා, පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා" කියලා.

එවමේව ඛෝ මහාරාජ භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සානය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ එවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතාපෙත්තිකසම්භවෝ විදනකුම්මාසූපචයෝ අනි-චු-ඡාදනපරිමද්දන-භේදනවිද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති. ඉදම්පි ඛෝ මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

පින්වත් මහාරාජ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් ව්‍යංජන ආදියෙන් වැඩුණ, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි" කියල. පින්වත් මහාරාජ, මෙයත් අර කලින් කියන ලද ශ්‍රමණ ඵලයන්ට වඩා අතිශයින් සොඳුරු වූත් ප්‍රණීත වූත් මේ ජීවිතයේ දී ම ලද හැකි පැවිදි දිවියේ ඵලයකි.

71. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ මනෝමයං කායං අභිනිම්මානාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගප-චංගිං අහීනින්ද්‍රියං,

71. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා.

සෙය්‍යථාපි මහාරාජ පුරිසෝ මුඤ්ජම්හා ඉසිකං පවාහෙය්‍ය. තස්ස එවමස්ස: අයං මුඤ්ජෝ අයං ඉසිකා අඤ්ඤෝ මුඤ්ජෝ අඤ්ඤා ඉසිකා මුඤ්ජම්හාත්වේව ඉසිකා පවාළ්හාති.

පින්වත් මහාරාජ, එක මේ වගේ දෙයක්. පුරුෂයෙක් මුඤ්ජතණ ගසෙන් තණ ගොබය ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. මේ මුඤ්ජතණ ගස යි, මේ තණ ගොබය යි. එතකොට මුඤ්ජතණ ගස වෙන එකක්. තණ ගොබය වෙන එකක්. නමුත් මුඤ්ජතණ ගසෙන් ම යි තණ ගොබය ඇදල ගත්තේ කියලා.

සෙය්‍යථාපි වා පන මහාරාජ පුරිසෝ අසිං කෝසියා පවාහෙය්‍ය. තස්ස එවමස්ස: "අයං අසි අයං කෝසි, අඤ්ඤෝ අසි, අඤ්ඤ කෝසි, කෝසියාත්වේව අසි පවාළ්හෝ"ති.

පින්වත් මහාරාජ, එක මේ වගේ දෙයක්. පුරුෂයෙක් කොපුවෙන් කඩුවක් ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ කඩුව යි. මේ කොපුව. එතකොට කඩුව අනෙකක්, කොපුව අනෙකක්. නමුත් කොපුවෙන් තමයි කඩුව ඇදල ගත්තේ" කියලා.

සෙය්‍යථාපි වා පන මහාරාජ පුරිසෝ අහිං කරණ්ඩෝ උද්ධරෙය්‍ය. තස්ස එවමස්ස: "අයං අහි අයං කරණ්ඩෝ, අඤ්ඤෝ අහි, අඤ්ඤේ කරණ්ඩෝ, කරණ්ඩාත්වේව අහි උබ්භතෝ"ති.

පින්වත් මහාරාජ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් නයි පෙට්ටියෙන් නයෙකුව ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ තමයි නයා. මේක නයි පෙට්ටිය. එතකොට නයා අනෙකෙක්. නයි පෙට්ටිය අනෙකක්. නමුත් නයි පෙට්ටියෙන් තමයි නයාව ඇදල ගත්තේ" කියලා.

ඒවමේව ඛෝ මහාරාජ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ මනෝමයං කායං අභිනිම්මානාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගප-චංගිං අහීනින්ද්‍රියං. ඉදම්පි ඛෝ මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

පින්වත් මහාරාජ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා. පින්වත් මහාරාජ, මෙයත් අර කලින් කියන ලද ශ්‍රමණ ඵලයන්ට වඩා අතිශයින් සොඳුරු වූත් ප්‍රණීත වූත් මේ ජීවිතයේ දී ම ලද හැකි පැවිදි දිවියේ ඵලයකි.

72. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝ'පි හුත්වා බහුධා හෝති, බහුධාපි හුත්වා ඒකෝ හෝති, ආවීභාවං තිරෝභාවං තිරෝකුඩ්ඩං තිරෝපාකාරං තිරෝපබ්බතං අසජ්ජමානෝ ග-ඡති සෙය්‍යථාපි ආකාසේ, පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරෝති සෙය්‍යථාපි උදකේ, උදකේ'පි අභිජ්ජමානේ ග-ඡති සෙය්‍යථාපි පඨවියං, ආකාසේපි පල්ලංකේන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණෝ. ඉමේ'පි චන්දිමසූරියේ ඒවං මහිද්ධිකේ ඒවං මහානුභාවේ පාණිනා පරාමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලෝකාපි කායේන වසං වත්තේති.

72. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ

විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි. එයට සිත නතු කරයි. තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. පෙනෙන්ට සළස්වනවා. නො පෙනී යනවා. බිත්තිය විනිවිද, ප්‍රාකාරය විනිවිද, පර්වතය විනිවිද කිසිවක් හා නො ගැටී, අහසේ යන්නාක් මෙන් යනවා. ජලයේ වගේ පොළොවෙහි කිඳාබැසීමත්, උඩට මතුවීමත් කරනවා. පොළොව මතුපිට වගේ ජලය මත නො ගිලී ඇවිද යනවා. අහසෙහි පියාසරණ කුරුල්ලන් පරිද්දෙන් පළඟක් බැඳ ගෙන අහසේ යනවා. මේසා මහත් ඉර්ධි ඇති, මහානුභාව ඇති හිරු සඳු පවා අතින් අල්ලනවා. පිරිමඳිනවා. බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා.

73. සෙය්‍යථාපි මහාරාජ දක්ඛෝ කුම්භකාරෝ වා කුම්භකාරන්තේවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදේව භාජනවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය.

73. පින්වත් මහාරාජ, ඒක මේ වගේ දෙයක්. දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ මැටිටෙන් යම් ම ආකාරයේ භාජනයක් හදන්ට කැමැති නම්, ඒ ඒ ආකාරයේ බඳුන් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා.

සෙය්‍යථාපි වා පන මහාරාජ දක්ඛෝ දන්තකාරෝ වා දන්තකාරන්තේවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදේව දන්තවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය.

පින්වත් මහාරාජ, ඒක මේ වගේ දෙයක්. දක්ෂ ඇත්දත් කැටයම්-කරුවෙක් හෝ ඇත්දත් කැටයම්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ ඇත්දතක යම් ම ආකාරයේ ඇත් දළ කැටයමක් කරන්ට කැමති නම්, ඒ ඒ ආකාරයේ ඇත් දළ කැටයම් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා.

සෙය්‍යථාපි වා පන මහාරාජ දක්ඛෝ සුවණ්ණකාරෝ වා සුවණ්ණකාරන්තේවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදේව සුවණ්ණවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය.

පින්වත් මහාරාජ, ඒක මේ වගේ දෙයක්. දක්ෂ රන් කැටයම්කරුවෙක් හෝ රන් කැටයම්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ රනක යම් ම ආකාරයේ රන් කැටයමක් කරන්ට කැමති නම්, ඒ ඒ ආකාරයේ රන් කැටයම් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා.

ඒවමේව ඛෝ මහාරාජ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝ'පි හුත්වා බහුධා හෝති, බහුධාපි හුත්වා ඒකෝ හෝති, ආවීභාවං තිරෝභාවං තිරෝකුඩ්ඩං තිරෝපාකාරං තිරෝපබ්බතං අසජ්ජමානෝ ග-ඡති සෙය්‍යථාපි ආකාසේ, පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරෝති සෙය්‍යථාපි උදකේ, උදකේපි අභිජ්ජමානේ ග-ඡති සෙය්‍යථාපි පඨවියං, ආකාසේපි පල්ලංකේන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණෝ, ඉමේපි චන්දිමසූරියේ ඒවං මහිද්ධිකේ ඒවං මහානුභාවේ පාණිනා පරාමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලෝකා'පි කායේන වසං වත්තේති. ඉදම්පි ඛෝ මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

පින්වත් මහාරාජ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වින්‍යෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි. එයට සිත නතු කරයි. තනි කෙනෙක් ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් වශයෙන් පෙනී සිටිනවා. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. පෙනෙන්ට සළස්වනවා. නො පෙනී යනවා. බිත්තිය විනිවිද, ප්‍රාකාරය විනිවිද, පර්වතය විනිවිද කිසිවක් හා නො ගැටී, අහසේ යන්නාක් මෙන් යනවා. ජලයේ වගේ පොළොවෙහි කිඳාබැසීමත්, උඩට මතුවීමත් කරනවා. පොළොව මතුපිට වගේ ජලය මත නො ගිලී ඇවිද යනවා. අහසෙහි පියාසරණ කුරුල්ලන් පරිද්දෙන් පළඟක් බැඳ ගෙන අහසේ යනවා. මේසා මහත් ඉර්ධි ඇති, මහානුභාව ඇති හිරු සඳු පවා අතින් අල්ලනවා. පිරිමඳිනවා. බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා. පින්වත් මහාරාජ, මෙයත් අර කලින් කියන ලද ශ්‍රමණ ඵලයන්ට වඩා අතිශයින් සොඳුරු වූත් ප්‍රණීත වූත් මේ ජීවිතයේ දී ම ලද හැකි පැවිදි දිවියේ ඵලයකි.

74. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බාය සෝතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච.

74. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා. එයට සිත නතු කරනවා. එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා.

75. සෙය්‍යථාපි මහාරාජ පුරිසෝ අද්ධානමග්ගපටිපන්නෝ සෝ සුණෙය්‍ය භේරිසද්දම්පි මුදිංගසද්දම්පි සංඛපණවදෙණ්ඩිමසද්දම්පි, තස්ස එවමස්ස: භේරිසද්දෝ ඉති'පි මුදිංගසද්දෝ ඉති'පි සංඛපණවදෙණ්ඩිමසද්දෝ ඉති'පි.

75. පින්වත් මහාරාජ, ඒක මේ වගේ දෙයක්. දිගු ගමනකට පිළිපන් පුරුෂයෙක් ඉන්නවා. ඔහු බෙර හඬත්, මිහිඟු බෙර හඬත්, සක්, පනා බෙර, ගැට බෙර හඬත් අසනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක බෙර හඬක්, මේ තමයි මිහිඟු බෙර හඬ, මේක සක් හඬ, මේක පනා බෙර හඬ, මේක ගැට බෙර හඬ" කියලා.

එවමේව ඛෝ මහාරාජ භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බාය සෝතධාතුයා විසුද්ධාය අතික්කන්ත-මානුසිකාය උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච. ඉදම්පි ඛෝ මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

පින්වත් මහාරාජ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය

(විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා. එයට සිත නතු කරනවා. එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා. පින්වත් මහාරාජ, මෙයත් අර කලින් කියන ලද ශ්‍රමණ ඵලයන්ට වඩා අතිශයින් සොඳුරු වූත් ප්‍රණීත වූත් මේ ජීවිතයේ දී ම ලද හැකි පැවිදි දිවියේ ඵලයකි.

76. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ චේතෝපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ පරසත්තානං පරපුග්ගලානං චේතසා චේතෝ පරි-ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති, වීතදෝසං වා චිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති, සමෝහං වා චිත්තං සමෝහං චිත්තන්ති පජානාති, වීතමෝහං වා චිත්තං වීතමෝහං චිත්තන්ති පජානාති, සංඛිත්තං වා චිත්තං සංඛිත්තං චිත්තන්ති පජානාති, වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති, මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති, සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති, අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති, සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති, අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති, විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

76. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, අනුන් ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා. රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. රාග රහිත සිත වීතරාගී සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ රහිත සිත වීතදෝසී සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ සහිත සිත මෝහ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ රහිත සිත වීතමෝහී සිතක් වශයෙන්

දැන ගන්නවා. හැකුළුනු සිත හැකිළුණු සිතක් වශයෙන් දැන ගන්නවා. විසිරුණු සිත විසිරුණු සිතක් වශයෙන් දැන ගන්නවා. සමාධිමත් සිත සමාධිමත් සිතක් වශයෙන් දැන ගන්නවා. සමාධි රහිත සිත සමාධි රහිත සිතක් වශයෙන් දැන ගන්නවා. නො දියුණු සිත නො දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා. දියුණු සිත දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා. එකඟ වෙන සිත එකඟ වෙන සිතක් වශයෙන් දැන ගන්නවා. එකඟ නො වෙන සිත එකඟ නො වෙන සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් මිදුණු සිත කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා.

77. සෙය්‍යථාපි මහාරාජ ඉත්ථී වා පුරිසෝ වා දහරෝ වා යුවා මණ්ඩනකජාතිකෝ ආදාසේ වා පරිසුද්ධේ පරියෝදාතේ අ-ඡේ වා උදකපත්තේ සකං මුඛනිමිත්තං ප-ච්චවෙක්ඛමානෝ සකණිකං වා සකණිකන්ති ජානෙය්‍ය, අකණිකංවා අකණිකන්ති ජානෙය්‍ය.

77. පින්වත් මහාරාජ, එක මේ වගේ දෙයක්. ලස්සනට සැරසෙන්ට කැමති ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දරුවෙක් හෝ තරුණයෙක් හෝ ඉන්නවා. ඔහු පිරිසිදු දීප්තිමත් කණ්ණාඩියක් ඉදිරියේ හෝ පැහැදිලි දිය ඇති බඳුනකින් හෝ තමන් ගේ මුව මඩල හොඳින් විමසා බලනවා. එතකොට දොස් ඇති තැන දොස් ඇති තැන වශයෙන් දැන ගන්නවා. දොස් නැති තැන දොස් නැති තැන වශයෙන් දැන ගන්නවා.

ඒවමේව ඛෝ මහාරාජ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ෙ-තෝපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති.

පින්වත් මහාරාජ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අනුන් ගේ සිත් පිරිසිඳ දන්නා ඥාණය පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි.

සෝ පරසත්තානං පරපුග්ගලානං ෙ-තසා ෙ-තෝ පරි-ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති, වීතදෝසං වා චිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති, සමෝහං වා චිත්තං

සමෝහං චිත්තන්ති පජානාති, විතමෝහං වා චිත්තං විතමෝහං චිත්තන්ති පජානාති, සංඛිත්තං වා චිත්තං ..... වික්ඛිත්තං වා චිත්තං ..... මහග්ගතං වා චිත්තං ..... අමහග්ගතං වා චිත්තං ..... සඋත්තරං වා චිත්තං ..... අනුත්තරං වා චිත්තං ..... සමාහිතං වා චිත්තං ..... අසමාහිතං වා චිත්තං ..... විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති. ඉදම්පි ඛෝ මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා. රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. රාග රහිත සිත වීතරාගී සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ රහිත සිත වීතදෝසී සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ සහිත සිත මෝහ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ රහිත සිත වීතමෝහී සිතක් වශයෙන් දැන ගන්නවා. හැකුළුනු සිත ..... විසිරුණු සිත ..... සමාධිමත් සිත ..... සමාධි රහිත සිත ..... නො දියුණු සිත ..... දියුණු සිත ..... එකඟ වෙන සිත ..... එකඟ නො වෙන සිත ..... කෙලෙසුන්ගෙන් මිදුණු සිත කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. පින්වත් මහාරාජ, මෙයත් අර කලින් කියන ලද ශ්‍රමණ ඵලයන්ට වඩා අතිශයින් සොඳුරු වූත් ප්‍රණීත වූත් මේ ජීවිතයේ දී ම ලද හැකි පැවිදි දිවියේ ඵලයකි.

78. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං, ද්වේ'පි ජාතියෝ, තිස්සෝ'පි ජාතියෝ, චතස්සෝ'පි ජාතියෝ, පඤ්ච'පි ජාතියෝ, දස'පි ජාතියෝ, වීසම්පි ජාතියෝ, තිංසම්පි ජාතියෝ, චත්තාරීසම්පි ජාතියෝ, පඤ්ඤාසම්පි ජාතියෝ, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනේකේ'පි සංවට්ටකප්පේ, අනේකේ'පි විවට්ටකප්පේ, අනේකේ'පි සංවට්ටවිවට්ටකප්පේ, අමුත්‍රාසිං එවං නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ

අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවං නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති.

78. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. ඉතින් ඔහු නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක්, ජීවිත දෙකක්, ජීවිත තුනක්, ජීවිත හතරක්, ජීවිත පහක්, ජීවිත දහයක්, ජීවිත විස්සක්, ජීවිත තිහක්, ජීවිත හතළිහක්, ජීවිත පනහක්, ජීවිත සියයක්, ජීවිත දහසක්, ජීවිත ලක්ෂයක්; අනේකවිධ වූ සංවට්ට කල්පයන් ද, අනේකවිධ වූ විවට්ට කල්පයන් ද, අනේකවිධ වූ සංවට්ට විවට්ට කල්පයන් ද සිහි කරනවා. මං ඉස්සර සිටියේ අසවල් තැන, එතකොට මගේ නම මේක යි. ගෝත්‍ර නාමය මේක යි. හැඩරුව මෙහෙම යි. කෑම බීම මෙහෙම යි. දුක් සැප වින්දේ මේ විදිහට යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. ඒ මං එතැනින් චුත වුණා. අසවල් තැන උපන්නා. එතකොට මගේ නම වුණේ මේක යි. ගෝත්‍රනාමය මේක යි. හැඩරුව වුණේ මෙහෙමයි. කෑවේ බිව්වේ මෙහෙම යි. සැප දුක් වින්දේ මෙහෙම යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. මං එතැනින් චුත වුණා. මේ ලෝකෙ උපන්නා" ආදී වශයෙන් ආකාර සහිත ව සවිස්තර ව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා.

79. සෙය්‍යථාපි මහාරාජ පුරිසෝ සකම්හා ගාමා අඤ්ඤං ගාමං ග-ඡෙය්‍ය තම්හා'පි ගාමා අඤ්ඤං ගාමං ග-ඡෙය්‍ය. සෝ තම්හා ගාමා සකඤ්ඤේව ගාමං ප-චාග-ඡෙය්‍ය. තස්ස එවමස්ස: "අහං ඛෝ සකම්හා ගාමා අමුං ගාමං අග-ඡිං තත්‍ර එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහෝසිං. තම්හාපි ගාමා අමුං ගාමං අග-ඡිං තත්‍රාපි එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහෝසිං. සෝ'මිහි තම්හා ගාමා සකඤ්ඤේව ගාමං ප-චාගතෝ"ති.

79. පින්වත් මහාරාජ, එක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමන් ගේ ගමෙන් වෙනත් ගමකට යනවා. ඒ ගමෙන් තවත් ගමකට යනවා. ඒ ගමෙන්

යළි තමන් ගේ ගමට එනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. මං මගේ ගමෙන් අසවල් ගමට ගියා. මං එහෙදී මෙහෙමයි හිටියේ. මෙහෙමයි වාඩි වුණේ. මෙහෙමයි කතාබහ කළේ. මෙහෙමයි නිශ්ශබ්දව සිටියේ. ඉතින් මං ඒ ගමෙනුත් අසවල් ගමට ගියා. එහෙ හිටියේ මේ විදිහට යි. වාඩි වුණේ මේ විදිහට යි. කථාබස් කළේ මේ විදිහට යි. නිහඬව සිටියේ මේ විදිහට යි. ඒ මං ඒ ගමෙන් මගේ ගමටම නැවත ආවා" කියලා.

එවමේව ඛෝ මහාරාජ භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: ඒකම්'පි ජාතිං, ද්වේ'පි ජාතියෝ, තිස්සෝ'පි ජාතියෝ, චතස්සෝ'පි ජාතියෝ, පඤ්ච'පි ජාතියෝ, දස'පි ජාතියෝ, වීසම්පි ජාතියෝ, තිංසම්පි ජාතියෝ, චත්තාරීසම්පි ජාතියෝ, පඤ්ඤාසම්පි ජාතියෝ, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනේකේ'පි සංවට්ටකප්පේ, අනේකේ'පි විවට්ටකප්පේ, අනේකේපි සංවට්ටවිවට්ටකප්පේ, අමුත්‍රාසිං එවං නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවං නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝ'ති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති. ඉදම්පි ඛෝ මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

පින්වත් මහාරාජ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. ඉතින් ඔහු නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක්, ජීවිත දෙකක්, ජීවිත තුනක්, ජීවිත හතරක්, ජීවිත පහක්, ජීවිත දහයක්, ජීවිත විස්සක්, ජීවිත තිහක්, ජීවිත හතළිහක්, ජීවිත පනහක්, ජීවිත සියයක්, ජීවිත දහසක්, ජීවිත ලක්ෂයක්; අනේකවිධ වූ සංවට්ට කල්පයන් ද, අනේකවිධ වූ විවට්ට කල්පයන් ද, අනේකවිධ වූ සංවට්ට විවට්ට කල්පයන් ද සිහි කරනවා. මං ඉස්සර සිටියේ අසවල් තැන, එතකොට මගේ නම මේක යි. ගෝත්‍ර නාමය මේක යි. හැඩරුව

මෙහෙම යි. කෑම බීම මෙහෙම යි. දුක් සැප වින්දේ මේ විදිහට යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. ඒ මං එතැනින් චුත වුණා. අසවල් තැන උපන්නා. එතකොට මගේ නම වුණේ මේක යි. ගෝත්‍රනාමය මේක යි. හැඩරුව වුණේ මෙහෙමයි. කෑවේ බිව්වේ මෙහෙම යි. සැප දුක් වින්දේ මෙහෙම යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. මං එතැනින් චුත වුණා. මේ ලෝකෙ උපන්නා" ආදී වශයෙන් ආකාර සහිත ව සවිස්තර ව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා. පින්වත් මහාරාජ, මෙයත් අර කලින් කියන ලද ශ්‍රමණ ඵලයන්ට වඩා අතිශයින් සොඳුරු වූත් ප්‍රණීත වූත් මේ ජීවිතයේ දී ම ලද හැකි පැවිදි දිවියේ ඵලයකි.

80. **සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානති: ඉමේ වත භොන්තෝ සත්තා කායදු-චරිතේන සමන්නාගතා, වචිදු-චරිතේන සමන්නාගතා, මනෝදු-චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මි-ඡාදිට්ඨිකා, මි-ඡාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමේ වා පන භොන්තෝ සත්තා කායසුචරිතේන සමන්නාගතා, වචිසුචරිතේන සමන්නාගතා, මනෝසුචරිතේන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නාති. ඉති දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති.**

80. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා. එයට සිත නතු කරනවා. එතකොට ඒ භික්ෂුව මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ

කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. “අහෝ! මේ භවත් සත්වයන් කයින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, මනසින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයේ ඉපදිලා ඉන්නවා. ඒ වගේ ම මේ භවත් සත්වයන් කයින් සුචරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් සුචරිතයෙහි යෙදීම නිසා, මනසින් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නොකොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ සුගති නම් වූ, ස්වර්ග ලෝකයෙහි ඉපදිලා ඉන්නවා” කියලා. මේ විදිහට මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා.

81. සෙය්‍යථාපි මහාරාජ මජ්ඣේඩි සිංඝාටකේ පාසාදෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ ඨිතෝ පස්සෙය්‍ය මනුස්සේ ගේහං පවිසන්තේ’පි නික්ඛමන්තේ’පි රථියා වීතිසඤ්චරන්තේ’පි මජ්ඣේඩි සිංඝාටකේ නිසින්නේ’පි, තස්ස එවමස්ස: එතේ මනුස්සා ගේහං පවිසන්ති. එතේ නික්ඛමන්ති. ඒතේ රථියා වීතිසඤ්චරන්ති. ඒතේ මජ්ඣේඩි සිංඝාටිකේ නිසින්නා’ති.

81. පින්වත් මහාරාජ, ඒක මේ වගේ දෙයක්. හතරමං හන්දියක තට්ටු නිවසක් තියෙනවා. එහි ඇස් ඇති පුරුෂයෙක් සිටගෙන බලාගෙන ඉන්නවා. ඔහු (පහළ) ගෙට ඇතුළු වන්නා වූත්, නික්මෙන්නා වූත්, වීදියේ එහාට මෙහාට ඇවිදින්නා වූත්, හතරමං හන්දිය මැද වාඩි වී සිටින්නා වූත් මිනිසුන් දකිනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා “මේ මිනිසුන් ගෙට ඇතුළු වෙනවා. මේ උදවිය ගෙයින් නික්මෙනවා. මේ උදවිය වීදියේ එහාට මෙහාට ඇවිදිනවා. මේ උදවිය හතරමං හන්දිය මැද වාඩි වෙලා ඉන්නවා” කියලා.

ඒවමේව ඛෝ මහාරාජ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති: ඉමේ වත භොන්තෝ සත්තා

කායදු-චරිතේන සමන්නාගතා, වචිදු-චරිතේන සමන්නාගතා, මනෝදු-චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මි-ඡාදිට්ඨිකා, මි-ඡාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමේ වා පන හොන්තෝ සත්තා කායසුචරිතේන සමන්නාගතා, වචිසුචරිතේන සමන්නාගතා, මනෝසුචරිතේන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නාති. ඉති දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති. ඉදම්පි ඛෝ මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච.

පින්වත් මහාරාජ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වින්‍යෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා. එයට සිත නතු කරනවා. එතකොට ඒ භික්ෂුව මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිව්‍යැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. “අහෝ! මේ භවත් සත්වයන් කයින් දුශ්චරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් දුශ්චරිතයෙහි යෙදීම නිසා, මනසින් දුශ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයේ ඉපදිලා ඉන්නවා. ඒ වගේ ම මේ භවත් සත්වයන් කයින් සුචරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් සුචරිතයෙහි යෙදීම නිසා, මනසින් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නොකොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ සුගති නම් වූ, ස්වර්ග ලෝකයෙහි ඉපදිලා ඉන්නවා” කියලා. මේ විදිහට මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිව්‍යැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා.

පින්වත් මහාරාජ, මෙයත් අර කලින් කියන ලද ශ්‍රමණ ඵලයන්ට වඩා අතිශයින් සොඳුරු වූත් ප්‍රණීත වූත් මේ ජීවිතයේ දී ම ලද හැකි පැවිදි දිවියේ ඵලයකි.

82. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමේ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. තස්ස එවං ජානතෝ එවං පස්සතෝ කාමාසවාපි චිත්තං විමු-චති භවාසවාපි චිත්තං විමු-චති. අවිජ්ජාසවාපි චිත්තං විමු-චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

82. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා. එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මේවා ආශ්‍රවයන් කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රවයන් ගේ හට ගැනීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස් වුණ බවට ඤාණය ඇති වෙනවා. "ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා.

83. සෙය්‍යථාපි මහාරාජ පබ්බතසංඛේපේ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ තීරේ ඨිතෝ පස්සෙය්‍ය සිප්පිසම්බූකම්පි සක්ඛරකඨලම්පි ම-ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි. තස්ස ඒවමස්ස: අයං ඛෝ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්‍රිමේ සිප්පිසම්බූකා'පි සක්ඛරකඨලා'පි ම-ඡගුම්බා'පි චරන්තාපි තිට්ඨන්තාපීති.

83. පින්වත් මහාරාජ, එක මේ වගේ දෙයක්. පර්වත මුදුනක ජලාශයක් තියෙනවා. එහි ජලය ඉතා හොඳ යි. හරිම ප්‍රසන්න යි. කැළඹිලා නෑ. එතැන ඇස් ඇති පුරුෂයෙක් ඒ ඉවුරේ සිටගෙන ජලාශය දෙස බලා සිටිනවා. එතකොට ඔහුට සිප්පිබෙල්ලනුත්, සක්බෙල්ලනුත්, කැටකැබලිත්, මාළු රංචු ආදියත් හැසිරෙන අයුරු, සිටින අයුරු දකින්ට ලැබෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක ඉතා හොඳ ජලය ඇති හරිම ප්‍රසන්න වූ නොකැළඹුණු දිය ඇති විලක්. මෙහි මේ සිප්පිබෙල්ලන්, සක්බෙල්ලන්, කැටකැබලිති, මාළු රංචුත් හැසිරෙනවා නෙව. ඉන්නවා නෙව" කියල.

ඒවමේව ඛෝ මහාරාජ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමේ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. තස්ස ඒවං ජානතෝ ඒවං පස්සතෝ කාමාසවා'පි චිත්තං විමු-චති භවාසවා'පි චිත්තං විමු-චති. අවිජ්ජාසවා'පි චිත්තං විමු-චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. ඉදං ඛෝ මහාරාජ සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං පුරිමේහි සන්දිට්ඨිකේහි සාමඤ්ඤඵලේහි අභික්කන්තතරඤ්ච පණීතතරඤ්ච. ඉමස්මා ච පන මහාරාජ සන්දිට්ඨිකා සාමඤ්ඤඵලා අඤ්ඤං සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං උත්තරිතරං වා පණීතතරං වා නත්ථීති.

පින්වත් මහාරාජ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන්

බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා. එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මේවා ආශ්‍රවයන් කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රවයන් ගේ හට ගැනීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස් වුණ බවට ඤාණය ඇති වෙනවා. “ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ”යි අවබෝධයෙන් ම දැන ගන්නවා. පින්වත් මහාරාජ, මෙයත් අර කලින් කියන ලද ශ්‍රමණ ඵලයන්ට වඩා අතිශයින් සොඳුරු වූත් ප්‍රණීත වූත් මේ ජීවිතයේ දී ම ලද හැකි පැවිදි දිවියේ ඵලයකි. පින්වත් මහාරාජ, මෙලොව දී ම දැක්ක හැකි පැවිදි ජීවිතයේ මෙම ප්‍රතිඵලයට වඩා වෙනස් වූත්, උත්තරිතර වූත්, ප්‍රණීතතර වූත් සන්දිට්ඨික ශ්‍රමණඵලයක් නම් නෑ.

84. ඒවං වුත්තේ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ භගවන්තං ඒතදවෝච: “අභික්කන්තං භන්තේ අභික්කන්තං භන්තේ. සෙය්‍යථාපි භන්තේ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටි-ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරේ වා තේල පජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තෝ රූපානි දක්ඛින්තීති. ඒවමේව භන්තේ භගවතා අනේකපරියායේන ධම්මෝ පකාසිතෝ. ඒසාහං භන්තේ භගවන්තං සරණං ග-ඡාමි ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. උපාසකං මං භගවා ධාරේතු අජ්ජතග්ගේ පාණුපේතං සරණං ගතං. අ-චයෝ මං භන්තේ අ-චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං යෝ’හං පිතරං ධම්මිකං ධම්මරාජානං ඉස්සරියස්ස කාරණා ජීවිතා වෝරෝපේසිං. තස්ස මේ භන්තේ භගවා අ-චයං අ-චයතෝ පටිග්ගණ්හාතු ආයතිං සංවරායා”ති.

84. මෙසේ වදාළ විට වේදේහි පුත්‍ර වූ අජාසත් මගධරජු භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළා. "ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි. යටට හරවා තිබූ දෙයක් උඩු අතට හැරෙව්වා වගෙයි. වහලා තිබුණු දෙයක් ඇරලා පෙන්නුවා වගෙයි. මං මුලා වූවන්ට නියම මග පෙන්වා දෙනවා වගෙයි. ඇස් ඇති උදවියට රූප දකින්න අඳුරෙහි තෙල් පහනක් දල්වා ගෙන දරා සිටිනවා වගෙයි. ඔය විදිහට භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ශ්‍රී සද්ධර්මය වදාළා. ස්වාමීනී, මේ මමත් භාග්‍යවතුන් වහන්සේව සරණ යනවා. ශ්‍රී සද්ධර්මයත් ආර්ය මහා සංඝ රත්නයත් සරණ යනවා. ස්වාමීනී, මං ගැන අද පටන් දිවි තිබෙන තුරාවට ම තෙරුවන් සරණ ගිය උපාසකයෙක් ලෙස සළකන සේක්වා! ස්වාමීනී, බාලයෙක් වගේ, මෝඩයෙක් වගේ, අදක්ෂයෙක් වගේ, යම් බඳු මං ධාර්මික වූත්, ධාර්මික රජකෙනෙකු වූත් පියාණන්ව රාජ ඉසුරු කරණ කොට ගෙන ජීවිතයෙන් තොර කළා. ඒ වරද මාව යට කරගෙන තියෙනවා. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, මාගේ ඒ වරද මත්තෙහි සංවර වීම පිණිස වරදක් වශයෙන් ම පිළිගන්නා සේක්වා!"

85. තග්ඝ ත්වං මහාරාජ අ-චයෝ අ-චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං යෝ ත්වං පිතරං ධම්මිකං ධම්මරාජානං ජීවිතා වෝරෝපේසි. යතෝ ච ඛෝ ත්වං මහාරාජ අ-චයං අ-චයතෝ දිස්වා යථාධම්මං පටිකරෝසි. තන්තේ මයං පටිගණ්හාම. වුද්ධි හේසා මහාරාජ අරියස්ස විනයේ යෝ අ-චයං අ-චයතෝ දිස්වා යථාධම්මං පටිකරෝති ආයතිං සංවරං ආපජ්ජතීති.

85. පින්වත් මහාරාජ, ඒකාන්තයෙන් ම බාලයෙක් වගේ, මෝඩයෙක් වගේ, අදක්ෂයෙක් වගේ සිටිමින් කළ ඒ වරද ඔබව යට කරගෙන ගියා. යම් බඳු ඔබ ධර්මික වූ, ධාර්මික රජු වූ තම පියාණන් ජීවිතයෙන් තොර කළා නෙව. නමුත් පින්වත් මහාරාජ, ඔබ යම් කලෙක වරද වරද වශයෙන් දැක ධර්මයට අනුව ප්‍රතිකර්ම කරයි නම් ඔබේ ඒ වරද (පිළිගෙන නිවැරදි වූ බවට) අපි පිළිගන්නවා. පින්වත් මහාරාජ, වරද වරද වශයෙන් දැකලා ධර්මානුකූල ප්‍රතිකර්ම කරනවා නම්, මත්තෙහි සංවර වෙනවා නම්, ඒක ආර්ය විනයෙහි (බුදු සසුනෙහි) අභිවෘද්ධියක් ම යි.

86. ඒවං වුත්තේ රාජා මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ භගවන්තං ඒතදවෝච: හන්ද ච දානි හන්තේ ග-ඡාම බහුකි-චා මයං බහුකරණීයාති. "යස්ස දානි ත්වං මහාරාජ කාලං මඤ්ඤසී"ති. අථ ඛෝ රාජා

මාගධෝ අජාතසත්තු වේදේහිපුත්තෝ භගවතෝ භාසිතං අභිනන්දිත්වා අනුමෝදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

86. මෙසේ වදාළ විට වේදේහි පුත්‍ර අජාසත් මගධ රජු භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පැවසුවා. "එහෙමනම් ස්වාමීනී, අපි දැන් යන්නම්. අපිට බොහෝ වැඩ තියෙනවා නෙව. බොහෝ කටයුතු තියෙනවා නෙව." "පින්වත් මහාරාජ, යම් ගමනකට කල් දන්නවා නම් දැන් එයට කාලය යි." ඉතින් වේදේහි පුත්‍ර අජාසත් මගධ රජු භාග්‍යවතුන් වහන්සේ වදාළ ධර්මය ආදරයෙන් පිළිගෙන, අනුමෝදන් වෙලා, අසුනෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට, පැදකුණු කොට නික්ම ගියා.

87. **අථ ඛෝ භගවා අචිරපක්කන්තස්ස රඤ්ඤෝ මාගධස්ස අජාතසත්තුස්ස වේදේහිපුත්තස්ස භික්ඛූ ආමන්තේසි: ඛතාය භික්ඛවේ රාජා, උපහතාය භික්ඛවේ රාජා. ස්වාය භික්ඛවේ රාජා පිතරං ධම්මිකං ධම්මරාජානං ජීවිතා න වොරෝපෙස්සථ ඉමස්මිං යේව ආසනේ විරජං වීතමලං ධම්මචක්ඛුං උප්පජ්ජිස්සථාති. ඉදමවෝච භගවා. අත්තමනා තේ භික්ඛූ භගවතෝ භාසිතං අභිනන්දුන්ති.**

87. එතකොට වේදේහි පුත්‍ර අජාසත් මගධ රජු පිටත් වී ගිය නොබෝ වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා වදාළා. "පින්වත් මහණෙනි, මේ රජ්ජුරුවන් දහම දකින වාසනාව නැමැති මුල් ගැලවී ගිය කෙනෙක්, පින්වත් මහණෙනි, මේ රජ්ජුරුවන් දහම දැකීමේ වාසනාව මුළුමණින් ම විනාශ කරගත් කෙනෙක්. පින්වත් මහණෙනි, ඉදින් මේ රජ්ජුරුවන් ධාර්මික වූත්, ධාර්මික රජු වූ තම පියාණන්ව ජීවිතයෙන් තොර කළේ නැත්නම්, මේ ආසනයේ දී ම කෙලෙස් රහිත වූ, මල රහිත වූ, දහම් ඇස (සෝවාන්) පහළ වෙලා ඉවරයි." භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ. සතුටු සිත් ඇති ඒ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ වදාළ මෙම කාරණය සතුටින් පිළිගත්තා.

සාමඤ්ඤඵලසුත්තං නිට්ඨිතං දුතියං
දෙවෙනි සාමඤ්ඤඵල සූත්‍රය නිමාවිය.

සාදු ! සාදු !! සාදු !!!

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

3.
අම්බට්ඨ සුත්තං
අම්බට්ඨ මාණවකයාට වදාළ දෙසුම

1. එවං මේ සුතං එකං සමයං භගවා කෝසලේසු චාරිකං චරමානෝ මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි යේන ඉ-ඡානංගලං නාම කෝසලානං බ්‍රාහ්මණගාමෝ තදවසරි. තත්‍ර සුදං භගවා ඉ-ඡානංගලේ විහරති ඉ-ඡානංගලවනසණ්ඩේ.

1. මා හට අසන්නට ලැබුණේ මේ විදිහට යි. ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු සංඝයා සමඟ කොසොල් ජනපදයෙහි චාරිකාවේ වඩිද්දී කොසොල් වැසියන් ගේ ඉච්ඡානංගල නම් වූ බ්‍රාහ්මණ ගමට ද වැඩම කළා. එහිදී භාග්‍යවතුන් වහන්සේ ඉච්ඡානංගල ගමෙහි ඉච්ඡානංගල නම් වූ වන ලැහැබෙහි වැඩ සිටියා.

2. තේන ඛෝ පන සමයේන බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී උක්කට්ඨං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨෝදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා පසේනදිනා කෝසලේන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං. අස්සෝසි ඛෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාති:

2. ඒ කාලයෙහි පොක්ඛරසාතී බ්‍රාහ්මණයා උක්කට්ඨා කියන නගරයේ වාසය කළා. ඒ නගරය ඔහුට පසේනදී කොසොල් රජුගෙන් ලැබුණු තෑග්ගක්. ඒක ශ්‍රේෂ්ඨ තෑග්ගක්. එහි බොහෝ ජනයා ඉන්නවා. තණ සහිත, දරසහිත, ජලය සහිත වූ, බොහෝ ධාන්‍ය තියෙනවා. රාජ පරිභෝග නගරයක්. ඉතින් පොක්ඛරසාති බ්‍රාහ්මණයාට මේ කතාව අසන්ට ලැබුණා.

"සමණෝ ඛලු භෝ ගෝතමෝ සක්‍යපුත්තෝ සක්‍යකුලා පබ්බජිතෝ කෝසලේසු චාරිකං චරමානෝ මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි ඉ-ඡානංගලං අනුප්පත්තෝ ඉ-ඡානංගලේ විහරති ඉ-ඡානංගලවනසණ්ඩේ. තං ඛෝ පන භවන්තං ගෝතමං ඒවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගතෝ: "ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී

සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣේඩිකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසේති. සාධු ඛෝ පන තථාරූපානං අරහතං දස්සනං හෝතී"ති.

"භවත්නි, අන්න ශාක්‍ය පුත්‍ර වූ, ශාක්‍ය කුලයෙන් නික්මී පැවිදි වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමඟ කොසොල් රට චාරිකාවේ වඩිද්දී ඉච්ඡානංගලයටත් වැඩම කරලා ඉච්ඡානංගල ගමේ ඉච්ඡානංගල වනලැහැබෙහි වැඩ ඉන්නවා. ඒ භවත් ගෞතමයන් වහන්සේ ගැන මෙවැනි වූ කල්‍යාණ කීර්ති ඝෝෂාවක් පැතිර ගොසින් තියෙනවා. "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණින් අරහත් වන සේක. සම්මාසම්බුද්ධ වන සේක. විජ්ජාචරණසම්පන්න වන සේක. සුගත වන සේක. ලෝකවිදූ වන සේක. අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක. සත්ථා දේවමනුස්සානං වන සේක. බුද්ධ වන සේක. භගවා වන සේක. උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙව්මිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඤාණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා. එබඳු වූ රහතුන් දැකගන්නට ලැබීම කොතරම් යහපත් දෙයක් ද" කියලා.

3. තේන ඛෝ පන සමයේන බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස අම්බට්ඨෝ නාම මාණවෝ අන්තේවාසී හෝති අජ්ඣායකෝ මන්තධරෝ තිණ්ණං වේදානං පාරගූ සනිඝණ්ඩුකේටුභානං සාක්ඛරප්පභේදානං ඉතිහාස-පඤ්චමානං පදකෝ වෙය්‍යාකරණෝ ලෝකායතමහාපුරිසලක්ඛණේසු අන්වයෝ අනුඤ්ඤාතපටිඤ්ඤාතෝ සකේ ආචරියකේ තේවිජ්ජකේ පාවචනේ යමහං ජානාමි තං ත්වං ජානාසි, යං ත්වං ජානාසි තමහං ජානාමීති.

3. එසමයෙහි පොක්ඛරසාති බ්‍රාහ්මණයාට අම්බට්ඨ මාණව නමින් ගෝලයෙක් හිටියා. ඔහු වේදය හදරපු, මන්ත්‍ර පාඩම් කරපු, ත්‍රිවේද පාරප්‍රාප්ත වූ කෙනෙක්. ඔහු භාෂා ශාස්ත්‍ර පිළිබඳ සික්ෂා නිරුත්ති සහිත අක්ෂර ප්‍රභේද සහිත දැනුමෙන් යුතු ඉතිහාසය පස්වැනි කොට දන්නා කෙනෙක්. ඒ වගේ ම

පද පාඨ, ව්‍යාකරණ දන්නා ලෝකායත ශාස්ත්‍රයත්, මහාපුරුෂ ලක්ෂණත් ගැන මනා නිපුණත්වයක් ඇති කෙනෙක්. ඒ වගේ ම උගන්වන ලද ත්‍රිවේදයට අදාළ කරුණු ගැන "මං යමක් දන්නවා නම්, (එම්බා ශිෂ්‍යය,) ඔබ ද එය දන්නවා. ඔබ යමක් දන්නවා නම්, මාත් එය දන්නවා" කියලා තමන් ගේ ආචාර්යවරුන් විසින් සමතත්වයෙහිලා සළකනු ලබන කෙනෙක්.

4. අථ ඛෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාති අම්බට්ඨං මාණවං ආමන්තේසි. "අයං තාත අම්බට්ඨ සමණෝ ගෝතමෝ සක්‍යපුත්තෝ සක්‍යකුලපබ්බජිතෝ කෝසලේසු චාරිකං චරමානෝ මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි ඉ-ඡානංගලං අනුප්පත්තෝ ඉ-ඡානංගලේ විහරති ඉ-ඡානංගලවනසණ්ඩේ. තං ඛෝ පන භවන්තං ගෝතමං ඒවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගතෝ: "ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ ..... බ්‍රහ්මචරියං පකාසේති. සාධු ඛෝ පන තථාරූපානං අරහතං දස්සනං හෝතී"ති.

4. එතකොට පොක්ඛරසාති බ්‍රාහ්මණයා අම්බට්ඨ මාණවකයා ඇමතුවා. "පුතේ අම්බට්ඨ, ශාක්‍යපුත්‍ර වූ ශාක්‍ය කුලයෙන් නික්මී පැවිදි වූ මේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමඟ කොසොල් රට චාරිකාවේ වඩිද්දී ඉච්ඡානංගලයටත් වැඩම කරලා ඉච්ඡානංගල ගමේ ඉච්ඡානංගල වනලැහැබෙහි වැඩ ඉන්නවා. ඒ භවත් ගෞතමයන් වහන්සේ පිළිබඳව මෙවැනි කල්‍යාණ කීර්ති රාවයක් පැතිර ගොස් තිබෙනවා. "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණු නිසා අරහං වන සේක. සම්මාසම්බුද්ධ වන සේක ..... බඹසර ප්‍රකාශ කරනවා. එබඳු වූ රහතුන් දැකගන්නට ලැබීම කොතරම් යහපත් දෙයක් ද."

ඒහි ත්වං තාත අම්බට්ඨ යේන සමණෝ ගෝතමෝ තේනුපසංකම. උපසංකමිත්වා සමණං ගෝතමං ජානාහි යදි වා තං භවන්තං ගෝතමං තථාසන්තංයේව සද්දෝ අබ්භුග්ගතෝ, යදි වා නෝ තථා, යදි වා සෝ භවං ගෝතමෝ තාදිසෝ, යදිවා න තාදිසෝ, තථා මයං තං භවන්තං ගෝතමං වේදිස්සාමාති.

"පුතේ අම්බට්ඨ, මෙහෙ එන්න. ඔබ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ළඟට යන්න. ගිහින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගැන දැන ගන්න. භවත් ගෞතමයන් වහන්සේ තුළ පවතින්නා වූ ම කීර්ති ඝෝෂාවක් ද පැතිර තියෙන්නේ, එහෙම නැත්නම් නො පවතින දෙයක් ගැන කීර්ත ඝෝෂාවක් ද

කියලා. එහෙමත් නැත්නම්, ඒ භවත් ගෞතමයන් වහන්සේ තුළ එබඳු ගුණ තියෙනවා ද? නැත්නම් එබඳු ගුණ රහිත ද, කියලා ඔය විදිහට අපි ඒ භවත් ගෞතමයන් වහන්සේ ගැන දැනගන්නට කැමැති යි."

5. "යථා කථං පනාහං භෝ තං භවන්තං ගෝතමං ජානිස්සාමි යදි වා තං භවන්තං ගෝතමං තථාසන්තංයේව සද්දෝ අබ්භුග්ගතෝ, යදි වා නෝ තථා, යදි වා සෝ භවං ගෝතමෝ තාදිසෝ යදි වා න තාදිසෝ"ති.

5. "භවත, මං කොහොම ද ඒ භවත් ගෞතමයන් වහන්සේ ගැන දැන ගන්නේ? ඒ කියන්නේ භවත් ගෞතමයන් වහන්සේ තුළ තිබෙන්නා වූ ම ගුණයන් ගැන ද ඔය කීර්ති රාවය පැතිර තියෙන්නේ. නො එසේ නම් නැති ගුණ පිළිබඳ ව ද කියලා? ඒ වගේ ම භවත් ගෞතමයන් වහන්සේ තුළ එබඳු ගුණ තියෙනවා ද? එහෙමත් නැත්නම් එබඳු ගුණ නැත්ද කියලා?"

6. "ආගතානි ඛෝ තාත අම්බට්ඨ අම්හාකං මන්තේසු ද්වත්තිංසමහාපුරිසලක්ඛණානි යේහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වේව ගතියෝ භවන්ති අනඤ්ඤා: සචෙ අගාරං අජ්ඣාවසති රාජා හෝති චක්කවත්තී ධම්මිකෝ ධම්මරාජා චාතුරන්තෝ විජිතාවී ජනපදත්ථාවරියප්පත්තෝ සත්තරතනසමන්නාගතෝ. තස්සිමානි සත්තරතනානි භවන්ති. සෙය්‍යථීදං: චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමේව සත්තමං. පරෝසහස්සං ඛෝ පනස්ස පුත්තා භවන්ති සූරා වීරංගරූපා පරසේනප්පමද්දනා. සෝ ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩේන අසත්ථේන ධම්මේන අභිවිජිය අජ්ඣාවසති.

6. පුතේ අම්බට්ඨ, අප ගේ මන්ත්‍රවල මහා පුරිස ලක්ෂණ තිස් දෙකක් ගැන විස්තර ඇවිල්ල තියෙනවා නෙව. ඉදින් යම් මහාපුරුෂයෙකුට ඔය ලක්ෂණ තියෙනවා නම්, ඒ උතුමන්ට තියෙන්නේ ගති දෙක යි. වෙන එකක් නෑ. ඉදින් ඔහු ගිහි ගෙදර වාසය කරනවා නම්, සක්විති රජකෙනෙක් වෙනවා. ධාර්මික වූ ධාර්මික රජු වූ සිව් මහා සමුදුර ජයගත් කෙනෙක් වෙනවා. ජනපදවල තහවුරු බවට පත් වෙනවා. මාණික්‍ය හතකින් සමන්විත වෙනවා. ඔහුට මෙන්න මේ මාණික්‍යයන් හත ලැබෙනවා. ඒ කියන්නේ, චක්‍ර මැණික, ඇත් මැණික, අශ්ව මැණික, මාණික්‍ය මැණික, ස්ත්‍රී මැණික, ගෘහපති මැණික, පුත්‍ර මැණික කියන්නේ හත්වෙනි එකයි. ඉතින් ඔහුට දාහකට වැඩි පිරිසක් පුතුන් හැටියට ලැබෙනවා. ඔවුන් හරී සූරයි. මහාවීරවරයන්. සතුරු

සේනා මඩිනවා. ඔහු මේ සාගරය කෙලෙවර කොට ඇති පොළොව දඬුවමෙන් තොරව ආයුධයෙන් තොරව ධර්මයෙන් ම සුවිශේෂ ජය ලබාගෙන වාසය කරනවා.

සෙ- ඛෝ පන අගාරස්මා අනගාරියං පබ්බජති අරහං හෝති සම්මා-සම්බුද්ධෝ ලෝකේ විවත්ත-ඡදෝ. අහං ඛෝ පන තාත අම්බට්ඨ මන්තානං දාතා, ත්වං මන්තානං පටිග්ගහේතා"ති.

ඉදින් ඒ මහාපුරුෂයා ගිහිගෙය අත්හැර අනගාරිකව පැවිදි වෙනවා නම්, ලෝකයෙහි සියළු පවින් මිදුණ අරහත් වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් වෙනවා. පුතේ අම්බට්ඨ, මම තමයි ඔබට මන්ත්‍ර දෙන කෙනා. ඔබ ඒ මන්ත්‍ර පිළිගන්නා කෙනා නෙව"

"ඒවං භෝති ඛෝ අම්බට්ඨෝ මාණවෝ බ්‍රාහ්මණස්ස පොක්ඛර-සාතිස්ස පටිස්සුත්වා උට්ඨායාසනා බ්‍රාහ්මණං පොක්ඛරසාතිං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා වළවාරථමාරුය්හ සම්බහුලේහි මාණවේහි සද්ධිං යේන ඉ-ඡානංගලවනසණ්ඩෝ තේන පායාසි. යාවතිකා යානස්ස භූමි යානේන ගන්ත්වා යානා ප-ච්චෝරෝහිත්වා පත්තිකෝ'ව ආරාමං පාවිසි.

"භවත, එසේය" කියලා අම්බට්ඨ මාණවකයා පොක්ඛරසාති බ්‍රාහ්මණයාට පිළිතුරු දීලා අසුනෙන් නැගිට, පොක්ඛරසාති බ්‍රාහ්මණයාට ආදරයෙන් වන්දනා කොට, ප්‍රදක්ෂිණා කොට වෙළඹුන් යොදූ රථයක නැගලා, බොහෝ තරුණයින් සමඟ ඉච්ඡානංගල වනලැහැබ කරා පිටත් වුණා. යානයෙන් යා හැකිතාක් බිම දක්වා ගිහින් යානයෙන් බැහැල පාගමනින් ම ආරාමයට පිවිසුණා.

7. තේන ඛෝ පන සමයේන සම්බහුලා භික්ඛූ ආබ්භෝකාසේ චංකමන්ති. අථ ඛෝ අම්බට්ඨෝ මාණවෝ යේන තේ භික්ඛූ තේනුපසංකමි. උපසංකමිත්වා තේ භික්ඛූ ඒතදවෝච: "කහන්නු ඛෝ භෝ ඒතරහි සෝ භවං ගෝතමෝ විහරති? තං හි මයං භවන්තං ගෝතමං දස්සනාය ඉධූපසංකන්තා"ති.

7. ඒ වන විට බොහෝ භික්ෂූන් වහන්සේලා එළිමහනෙහි සක්මන් කරනවා. එතකොට අම්බට්ඨ මාණවකයා ඒ භික්ෂූන් කරා එළඹුණා. එළඹ ඒ භික්ෂූන්ට මෙකරුණ පැවසුවා. "භවත්නි, මේ වෙලාවේ ඒ භවත් ගෞතමයන්

වහන්සේ වැඩ ඉන්නේ කොහේද? අපි ඒ භවත් ගෞතමයන් වහන්සේව දැකගැනීම පිණිසයි මෙහි ආවේ."

8. අථ ඛෝ තේසං භික්ඛූනං ඒතදහෝසි: "අයං ඛෝ අම්බට්ඨෝ මාණවෝ අභිඤ්ඤාතකෝලඤ්ඤෝ ච-ව අභිඤ්ඤාතස්ස ච බ්‍රාහ්මණස්ස පොක්ඛර-සාතිස්ස අන්තේවාසී. අගරූ ඛෝ පන භගවතෝ ඒවරූපේහි කුලපුත්තේහි සද්ධිං කථාසල්ලාපෝ හෝති"ති. තේ අම්බට්ඨං මාණවං ඒතදවෝචුං: "ඒසෝ අම්බට්ඨ විහාරෝ සංවුතද්වාරෝ තේන අප්පසද්දෝ උපසංකමිත්වා අතරමානෝ ආලින්දං පවිසිත්වා උක්කාසිත්වා අග්ගළං ආකෝටේහි, විවරිස්සති තේ භගවා ද්වාරන්ති."

8. එතකොට ඒ භික්ෂූන්ට මෙහෙම හිතුනා. "මේ අම්බට්ඨ මාණවකයා ඉතා සම්භාවනීය පවුලක කෙනෙක්. ඒ වගේ ම ඉතාමත් ප්‍රසිද්ධ පොක්ඛරසාති බ්‍රාහ්මණයා ගේ ගෝලයෙක්. ඉතින් මෙවැනි කුලපුත්‍රයන් සමග භාග්‍යවතුන් වහන්සේ ගේ කථාබහ ඇති වීම කරදරයක් නොවේ" කියලා. ඒ භික්ෂූන් අම්බට්ඨ මාණවකයාට මෙය පැවසුවා. "පින්වත් අම්බට්ඨ, මේ දොර වහල තියෙන්නේ විහාරය තමයි. ඔබ එතැනට නිශ්ශබ්දව ගිහින් කලබල නැතිව ආලින්දයට පිවිසිලා උගුර පාදලා දොර අහුලට සෙමින් තට්ටු කරන්න. එතකොට භාග්‍යවතුන් වහන්සේ ඔබට දොර විවර කරන සේක්ම ය."

9. අථ ඛෝ අම්බට්ඨෝ මාණවෝ යේන සෝ විහාරෝ සංවුත්තද්වාරෝ තේන අප්පසද්දෝ උපසංකමිත්වා අතරමානෝ ආලින්දං පවිසිත්වා උක්කාසිත්වා අග්ගළං ආකෝටේසි. විවරි භගවා ද්වාරං. පාවිසි අම්බට්ඨෝ මාණවෝ. මාණවකා'පි පවිසිත්වා භගවතා සද්ධිං සම්මෝදිංසු. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදිංසු. අම්බට්ඨෝ පන මාණවෝ චංකමන්තෝ'පි නිසින්නේන භගවතා කඤ්චි කඤ්චි කථං සාරාණීයං වීතිසාරේති. ඨිතෝ'පි නිසින්නේ භගවතා කඤ්චි කඤ්චි කථං සාරාණීයං වීතිසාරේති.

9. ඉතින් අම්බට්ඨ මාණවකයා ඒ දොරවසා ඇති විහාරය ඇති තැනට නිශ්ශබ්දව ගිහින් කලබල නොවී ආලින්දයට පිවිසිලා උගුරපාදා සෙමින් දොර අගුලට තට්ටු කළා. භාග්‍යවතුන් වහන්සේ දොර විවර කොට වදාළා. අම්බට්ඨ මාණවකයා ඇතුළට පිවිසුනා. අනෙක් තරුණයනුත් පිවිසිලා භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වුණා. සතුටුවිය යුතු පිළිසඳර කථාබහේ යෙදිලා එකත්පස්ව වාඩි වුණා. නමුත් අම්බට්ඨ මාණවකයා වැඩසිටින්නා

වූ භාග්‍යවතුන් වහන්සේ සමග ඇවිද ඇවිදත් යම් යම් පිළිසඳර කථාබහේ යෙදෙනවා. වැඩ සිටින්නා වූ භාග්‍යවතුන් වහන්සේ සමඟ හිටගෙනත් යම් යම් පිළිසඳර කථාබහේ යෙදෙනවා.

10. අථ ඛෝ භගවා අම්බට්ඨං මාණවං ඒතදවෝච: ඒවන්නු ඛෝ තේ අම්බට්ඨ බ්‍රාහ්මණේහි වුද්ධේහි මහල්ලකේහි ආචරියපාචරියේහි සද්ධිං කථාසල්ලාපෝ හෝති යථයිදං චරං තිට්ඨං නිසින්නේන මයා කඤ්චි කඤ්චි කථං සාරාණීයං වීතිසාරේසී?"ති.

10. එතකොට භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයාගෙන් මෙකරුණ විමසුවා. "අම්බට්ඨය, ඔබ වාඩි වී සිටින මාත් සමඟ ඇවිදිමිනුත්, හිටගෙනත් යම් යම් පිළිසඳර කථා බහේ යෙදෙනවා නම්, ඒ විදිහට ද වැඩිමහළු, ආචාර්ය ප්‍රාචාර්ය වූ බ්‍රාහ්මණයන් සමඟත් ඔබ ගේ කථාබහ කෙරෙන්නේ?"

"නෝහිදං භෝ ගෝතම. ග-ඡන්තෝ වා හි ගෝතම ග-ඡන්තේන බ්‍රාහ්මණෝ බ්‍රාහ්මණේන සද්ධිං සල්ලපිතුමරහති. යිතෝ වා හි භෝ ගෝතම යිතේන බ්‍රාහ්මණෝ බ්‍රාහ්මණේන සද්ධිං සල්ලපිතුමරහති. නිසින්නෝ වා හි භෝ ගෝතම නිසින්නේන බ්‍රාහ්මණෝ බ්‍රාහ්මණේන සද්ධිං සල්ලපිතුමරහති. සයානෝ වා හි භෝ ගෝතම සයානේන බ්‍රාහ්මණෝ බ්‍රාහ්මණේන සද්ධිං සල්ලපිතුමරහති. යේ ච ඛෝ තේ භෝ ගෝතම මුණ්ඩකා සමණකා ඉබ්භා කණ්හා බන්ධුපාදාප-චා, තේහිපි මේ සද්ධිං ඒවං කථාසල්ලාපෝ හෝති යථරිව භෝතා ගෝතමේනා"ති.

"භවත් ගෞතමනි, එහෙම කරන්නේ නෑ. භවත් ගෞතමයෙනි, ගමන් කරන බ්‍රාහ්මණයා ගමන් කරන බ්‍රාහ්මණයෙකු සමග කථා බස් කරන්ට සුදුසු යි. හිටගෙන ඉන්න බ්‍රාහ්මණයා හිටගෙන ඉන්න බ්‍රාහ්මණයෙකු සමග කථා බස් කරන්ට සුදුසු යි. වාඩි වී ඉන්න බ්‍රාහ්මණයා වාඩි වී සිටින බ්‍රාහ්මණයෙකු සමග කථා බස් කරන්ට සුදුසු යි. සැතපී සිටින බ්‍රාහ්මණයා සැතපී සිටින බ්‍රාහ්මණයෙකු සමග කථා බස් කරන්ට සුදුසු යි. එහෙත් භවත් ගෞතමය, යම් ඒ හිසමුඩු කළ උදවිය, ලාමක දිවිගෙවන, පහත් දිවි ගෙවන, කළු වූ මහාබ්‍රහ්මයා ගේ යටිපතුලෙන් වැටුණු අය ඉන්නවා නම්, ඔවුන් සමඟ මගේ මෙබඳු වූ කථාබහ තමයි මට තියෙන්නේ. ඒ භවත් ගෞතමයන් සමග කථා කරන විදිහයි."

11. "අත්ථිකවතෝ ඛෝ පන තේ අම්බට්ඨ ඉධාගමනං අහෝසි. යායේව ඛෝ පනත්ථාය ආග-ඡෙය්‍යාථ තමේව අත්ථං සාධුකං මනසිකරෙය්‍යාථ. අවුසිතවා යේව ඛෝ පන භෝ අයං අම්බට්ඨෝ මාණවෝ වුසිතමානී කිමඤ්ඤත්‍ර අවුසිතත්තා"ති.

11. "අම්බට්ඨය, ඔබේ මේ ගමන සිදු වුණේ යම්කිසි වැඩක් පිණිස යි. ඉතින් යම්කිසි කටයුත්තක් සඳහා නම් ඔබ ආවේ අන්න ඒ කටයුත්ත ගැනයි හොඳින් මෙනෙහි කළ යුත්තේ. නමුත් භවත්නි, මේ අම්බට්ඨ මාණවකයා, ස්වකීය ධර්මය තුළ නො හික්මී සිටිය දී ම යි සම්පූර්ණයෙන් හික්මුණු කෙනෙක් හැටියට මාන්නයෙන් ඉන්නේ. මේක නො හික්මුණුකම විනා වෙන කුමක් ද?"

12. අථ ඛෝ අම්බට්ඨෝ මාණවෝ භගවතා, ආවුසිතවාදේන වු-චමානෝ කුපිතෝ අනත්තමනෝ භගවන්තංයේව බ්‍රූසෙන්තෝ භගවන්තංයේව වම්භෙන්තෝ භගවන්තංයේව උපවදමානෝ සමණෝ ච මේ භෝ ගෝතමෝ පාපිතෝ භවිස්සතීති භගවන්තං ඒතදවෝච: "චණ්ඩා භෝ ගෝතම සක්‍යජාති, එරුසා භෝ ගෝතම සක්‍යජාති, ලහුසා භෝ ගෝතම සක්‍යජාති, රහසා භෝ ගෝතම සක්‍යජාති. ඉබ්භා සන්තා ඉබ්භා සමානා න බ්‍රාහ්මණේ සක්කරොන්ති න බ්‍රාහ්මණේ ගරුකරොන්ති න බ්‍රාහ්මණේ මානෙන්ති න බ්‍රාහ්මණේ පූජෙන්ති න බ්‍රාහ්මණේ අපචායන්ති. තයිදං භෝ ගෝතම න-ඡන්නං තයිදං නප්පටිරූපං යදිමේ සක්‍යා ඉබ්භා සන්තා ඉබ්භා සමානා න බ්‍රාහ්මණේ සක්කරොන්ති න බ්‍රාහ්මණේ ගරු කරොන්ති න බ්‍රාහ්මණේ මානෙන්ති න බ්‍රාහ්මණේ පූජෙන්ති න බ්‍රාහ්මණේ අපචායන්තීති.

12. එතකොට භාග්‍යවතුන් වහන්සේ විසින් ඇදුරු කුලයෙහි නොහික්මුණු කෙනෙක් ය යන අවුසිතවාදයෙන් පවසනු ලැබූ අම්බට්ඨ මානවකයා කිපුණා. නො සතුටු සිත් ඇති වුණා. භාග්‍යවතුන් වහන්සේට ම ආක්‍රෝෂ කරමින්, භාග්‍යවතුන් වහන්සේව ම හෙළා කථා කරමින්, භාග්‍යවතුන් වහන්සේට ම උපවාද කරමින්, මා විසිනුත් ශ්‍රමණ භවත් ගෞතමයන්ව දෝෂයට පමුණුවනවා කියල හිතාගෙන මෙහෙම කිව්වා. "භවත් ගෞතමයෙනි, ශාක්‍ය ජාතිය චණ්ඩයි. භවත් ගෞතමයෙනි, ශාක්‍ය ජාතිය එරුෂයි. භවත් ගෞතමයෙනි, ශාක්‍ය ජාතිය ලාමක යි. භවත් ගෞතමයෙනි, ශාක්‍ය ජාතිය රළු වචනයෙන් යුක්ත යි. ඔවුන් (බ්‍රාහ්මණයන් ගේ මෙහෙකාර වූ) ගිහියන්ව ඉඳගෙනත් බ්‍රාහ්මණයන්ට සත්කාර කරන්නේ නෑ. බ්‍රාහ්මණයන්ට ගෞරව කරන්නේ නෑ. බ්‍රාහ්මණයන්ට බුහුමන් දක්වන්නේ

නෑ. බ්‍රාහ්මණයන්ව පුදන්නේ නෑ. බ්‍රාහ්මණයන්ට යටහත් පැවැතුම් දක්වන්නේ නෑ. එනිසා භවත් ගෞතමයෙනි, ඒ වැඩේ හරි නෑ. ඒක ගැලපෙන එකක් නොවෙයි. යම් මේ පහත් ගති ඇති ශාක්‍යයන් පහත් ගිහිගති ඇතිව ම සිටිද්දී බ්‍රාහ්මණයන්ට සත්කාර කරන්නේ නෑ. බ්‍රාහ්මණයන්ට ගෞරව කරන්නේ නෑ. බ්‍රාහ්මණයන්ට බුහුමන් දක්වන්නේ නෑ. බ්‍රාහ්මණයන්ව පුදන්නේ නෑ. බ්‍රාහ්මණයන්ට යටහත් පැවැතුම් දක්වන්නේ නෑ.

ඉතිහ අම්බට්ඨෝ මාණවෝ ඉදං පඨමං සක්කේසු ඉබ්භවාදං නිපාතේසි.

මේ විදිහට අම්බට්ඨ මාණවකයා ශාක්‍යයන් හට මේ ලාමක ගිහිබව (බමුණන් ගේ මෙහෙකාරබව) හෙවත් ඉබ්භවාදය නම් වූ පළමු වෙනි චෝදනාව හෙළුවා.

13. "කිම්පන තේ අම්බට්ඨ සක්‍යා අපරද්ධුන්ති?"

"පින්වත් අම්බට්ඨ, ඔබට ශාක්‍යයන් යම්කිසි වරදක් කරල තියෙනවා ද?"

"ඒකමිදාහං භෝ ගෝතම සමයං ආචරියස්ස බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස කේනචිදේව කරණීයේන කපිලවත්ථුං අගමාසිං. යේන සක්‍යානං සන්ථාගාරං තේනුපසංකමිං. තේන ඛෝ පන සමයේන සම්බහුලා සක්‍යා ෙ-ව සක්‍යකුමාරා ච සන්ථාගාරේ උ-ෙ-සු ආසනේසු නිසින්නා හොන්ති අඤ්ඤමඤ්ඤං අංගුලිපතෝදකේහි සඤ්ජග්ඝන්තා සංකීළන්තා අඤ්ඤදත්ථු මමඤ්ඤේව මඤ්ඤේ අනුජග්ඝන්තා. න මං කෝචි ආසනේන'පි නිමන්තේසි. තයිදං භෝ ගෝතම න-ඡන්නං, තයිදං නප්පටිරූපං, යදිමේ සක්‍යා ඉබ්භා සන්තා ඉබ්භා සමානා න බ්‍රාහ්මණේ සක්කරොන්ති න බ්‍රාහ්මණේ ගරුකරොත්ති න බ්‍රාහ්මණේ මානෙන්ති න බ්‍රාහ්මණේ පූජෙන්ති න බ්‍රාහ්මණේ අපචායන්ති"ති.

"භවත් ගෞතමයෙනි, මං එක් කලෙක පොක්ඛරසාති බ්‍රාහ්මණාචාර්යතුමා ගේ යම්කිසි කටයුත්තකට කපිලවස්තු නගරයට ගියා. එහි ශාක්‍යයන් ගේ විවේකාගාරයකටත් ගියා. ඒ වෙලාවේ බොහෝ ශාක්‍යයන් ශාක්‍යකුමාරවරුන් ඒ විවේකාගාරයෙහි උස් ආසනවල ඉඳගෙන හිටියා. එකිනෙකාට ඇඟිලිවලින් කිතිකවා ගනිමින්, මහාහඬින් සිනාසෙමින්, විහිළු තහළු කරමින් හිටියා. ඒක හරියට මට ම හිනහ වෙනවා වගේ. ඒ කවුරුවත්

මට වාඩි වෙන්න ආසනයක් දුන්නේ නෑ. භවත් ගෞතමයෙනි, ඒ වැඩේ හරි නෑ. ඒක ගැලපෙන එකක් නොවෙයි. යම් මේ පහත් ගති ඇති ශාක්‍යයන් පහත් ගිහිගති ඇතිව ම සිටිද්දී බ්‍රාහ්මණයන්ට සත්කාර කරන්නේ නෑ. බ්‍රාහ්මණයන්ට ගෞරව කරන්නේ නෑ. බ්‍රාහ්මණයන්ට බුහුමන් දක්වන්නේ නෑ. බ්‍රාහ්මණයන්ව පුදන්නේ නෑ. බ්‍රාහ්මණයන්ට යටහත් පැවැතුම් දක්වන්නේ නෑ.

ඉතිහ අම්බට්ඨෝ මාණවෝ ඉදං දුතියං සක්කේසු ඉබ්භවාදං නිපාතේසි.

මේ විදිහට අම්බට්ඨ මාණවකයා ශාක්‍යයන් හට මේ ලාමක ගිහිබව (බමුණන් ගේ මෙහෙකාරබව) හෙවත් ඉබ්භවාදය නම් වූ දෙවෙනි චෝදනාව හෙළුවා.

14. "ලටුකිකාපි ඛෝ අම්බට්ඨ සකුණිකා සකේ කුලාවකේ කාමලාපිනී හෝති. සකං ඛෝ පනේතං අම්බට්ඨ සක්‍යානං යදිදං කපිලවත්ථු. න අරහතායස්මා අම්බට්ඨෝ ඉමාය අප්පමත්තාය අභිසජ්ජිතුන්ති."

14. "පින්වත් අම්බට්ඨය, කැට කිරිල්ල වුණත් තමන් ගේ කූඩුවේ සිටිද්දී හිතුමනාපෙට කෑගසනවා නෙව. ඉතින් අම්බට්ඨ යම් මේ කපිලවස්තු කියල කියන්නේ ශාක්‍යවරුන් සතු තමන් ගේ ම නගරය යි. ඉතින් ඔවැනි අල්ප මාත්‍ර වූ කාරණයකට ආයුෂ්මත් අම්බට්ඨයන් වෛරබැඳ සිටින එක සුදුසු නෑ."

15. "චත්තාරෝ" මේ භෝ ගෝතම වණ්ණා: ඛත්තියා බ්‍රාහ්මණා වෙස්ස සුද්දා. ඉමේසං හි භෝ ගෝතම චතුන්නං වණ්ණානං තයෝ වණ්ණා ඛත්තියා ච වෙස්සා ච සුද්දා ච අඤ්ඤදත්ථු බ්‍රාහ්මණස්සේව පරිචාරිකා සම්පජ්ජන්ති. තයිදං භෝ ගෝතම න-ඡන්නං තයිදං නප්පටිරූපං යදි මේ සක්‍යා ඉබ්භා සන්තා ඉබ්භා සමානා න බ්‍රාහ්මණේ සක්කරොන්ති න බ්‍රාහ්මණේ ගරුකරොන්ති න බ්‍රාහ්මණේ මානෙන්ති න බ්‍රාහ්මණේ පූජෙන්ති න බ්‍රාහ්මණේ අපචායන්ති"ති.

15. භවත් ගෞතමයෙනි, මේ වර්ණ (කුල) හතරක් තියෙනවා. ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ක්ෂුද්‍ර කියලා. භවත් ගෞතමයෙනි, මේ වර්ණ හතරෙන් වර්ණ තුනක්, ඒ කියන්නේ ක්ෂත්‍රිය, වෛශ්‍ය, ක්ෂුද්‍ර යන කුල තුන ඒකාන්ත-යෙන් ම බ්‍රාහ්මණයා ගේ මෙහෙකරුවන් ම යි. එනිසා භවත් ගෞතමයෙනි, ඒ වැඩේ හරි නෑ. ඒක ගැලපෙන එකක් නොවෙයි. යම් මේ පහත් ගති ඇති

ශාක්‍යයන් පහත් ගිහිගති ඇතිව ම සිටිද්දී බ්‍රාහ්මණයන්ට සත්කාර කරන්නේ නෑ. බ්‍රාහ්මණයන්ට ගෞරව කරන්නේ නෑ. බ්‍රාහ්මණයන්ට බුහුමන් දක්වන්නේ නෑ. බ්‍රාහ්මණයන්ව පුදන්නේ නෑ. බ්‍රාහ්මණයන්ට යටහත් පැවැතුම් දක්වන්නේ නෑ.

ඉතිහ අම්බට්ඨෝ මාණවෝ ඉදං තතියං සක්කේසු ඉබ්භවාදං නිපාතේසි.

මේ විදිහට අම්බට්ඨ මාණවකයා ශාක්‍යයන් හට මේ ලාමක ගිහිබව (බමුණන් ගේ මෙහෙකාරබව) හෙවත් ඉබ්භවාදය නම් වූ තුන්වෙනි චෝදනාව හෙළුවා.

16. අථ ඛෝ භගවතෝ ඒතදහෝසි: අතිබාළ්හං ඛෝ අයං අම්බට්ඨෝ මාණවෝ සක්කේසු ඉබ්භවාදේන නිම්මානේති. යන්නූනාහං ගොත්තං පු-ඡෙය්‍යන්ති.

16. එතකොට භාග්‍යවතුන් වහන්සේට මෙහෙම හිතුනා. "මේ අම්බට්ඨ මාණවකයා අතිශයින්ම බාල විදිහට ශාක්‍යන් හට ලාමක ගිහිවාදයෙන් පිරිහෙළා කථා කරනවා. මා මෙයා ගේ ගෝත්‍රය කුමක් ද කියලා අහන එක හොඳ යි."

අථ ඛෝ භගවා අම්බට්ඨං මාණවං ඒතදවෝච: "කථං ගොත්තෝසි අම්බට්ඨා?ති" "කණ්හායනෝහමස්මි භෝ ගෝතමා"ති.

ඉතින් භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයාගෙන් මෙකරුණ විමසුවා. "අම්බට්ඨයන් කවර ගෝත්‍ර ඇති කෙනෙක් ද?" "භවත් ගෞතමයෙනි, මං කණ්හායන ගෝත්‍රයට අයිති කෙනෙක්."

17. "පෝරාණං ඛෝ පන තේ අම්බට්ඨ මාතාපෙත්තිකං නාමගොත්තං අනුස්සරතෝ අය්‍යපුත්තා සක්‍යා භවන්ති, දාසිපුත්තෝ ත්වමසි සක්‍යානං සක්‍යා ඛෝ පන අම්බට්ඨ රාජානං ඔක්කාකං පිතාමහං දහන්ති."

17. "පින්වත් අම්බට්ඨය, ඔබ ගේ මව්පියවරුන් අයත් පැරණි නම්ගොත් සිහිකරද්දී ශාක්‍යයන්ම යි ඔබ ගේ ආර්ය (ස්වාමී) පුත්‍රයන් වන්නේ. ඔබ ශාක්‍යයන් ගේ දාසියෙකු ගේ පුතෙක්. අම්බට්ඨය ශාක්‍යවරුන් තමන් ගේ මීමුත්තන් හැටියට සළකන්නේ ඔක්කාක රජතුමායි."

“භූතපුබ්බං අම්බට්ඨ රාජා ඔක්කාකෝ යා සා මහේසී පියා මනාපා තස්සා පුත්තස්ස රජ්ජං පරිණාමේතුකාමෝ ජෙට්ඨකුමාරේ රට්ඨස්මා පබ්බාජේසි උක්කාමුඛං කරකණ්ඩං හත්ථිනිකං නිපුරං. තේ රට්ඨස්මා පබ්බජිතා හිමවන්තපස්සේ පොක්ඛරණියා තීරේ මහාසාකසණ්ඩෝ තත්ථ වාසං කප්පේසුං. තේ ජාතිසම්භේදභයා සකාහි භගිනීහි සද්ධිං සංවාසං කප්පේසුං.

“පින්වත් අම්බට්ඨය, මේක ඉස්සර සිදුවුණු දෙයක්. ඔක්කාක කියල රජ කෙනෙක් හිටියා. ඔහුට ඉතා ප්‍රියමනාප මහේසිකාවක් හිටියා. ඇය ගේ පුතුට රජකම දෙන්ට වින වුණා. ඒ නිසා උක්කාමුඛ, කරණ්ඩක, හත්ථිනික, නිපුර යන ජ්‍යේෂ්ඨ කුමාරවරුන්ව රටින් පිටුවහල්කළා. ඔවුන් රටින් පිටුවහල් කළාට පස්සේ හිමාල පර්වත ප්‍රදේශයට ගිහින් පොකුණක් අද්දර මහා ගස් ඇති වනගොමුවක වාසය කළා. ඔවුන් තම ජාතිය කිලිටි වේය යන බියෙන් තමන් ගේ ම සහෝදරියන් සමග අඹුසැමියන් සේ වාසය කළා.

අථ ඛෝ අම්බට්ඨ රාජා ඔක්කාකෝ අම-ෙ- පාරිසජ්ජේ ආමන්තේසි: “කහන්නු ඛෝ භෝ ඒතරහි කුමාරා සම්මන්තීති?”

ඉතින් අම්බට්ඨ, ඔක්කාක රජ්ජුරුවෝ තම ඇමති පිරිස ඇමතුවා. “භවත්නි, දැන් කුමාරවරු කොහේ ඉන්නවා ඇද්ද?” කියලා.

“අත්ථි දේව හිමවන්තපස්සේ පොක්ඛරණියා තීරේ මහාසාකසණ්ඩෝ තත්ථේතරහි කුමාරා සම්මන්ති. තේ ජාතිසම්භේදභයා සකාහි භගිනීහි සද්ධිං සංවාසං කප්පෙන්ති”ති.

“දේවයන් වහන්ස, හිමාල පර්වත ප්‍රදේශයේ පොකුණක් අද්දර මහාගස් ඇති වනාන්තරයක් තියෙනවා. එහෙ තමයි දැන් කුමාරවරු ඉන්නේ. ඔවුන් තම ජාතිය කිලිටි වේය යන බියෙන් තමන් ගේ ම සහෝදරියන් සමග අඹුසැමියන් හැටියට වාසය කරනවා.”

අථ ඛෝ අම්බට්ඨ රාජා ඔක්කාකෝ උදානං උදානේසි: “සක්‍යා වත භෝ කුමාරා පරමසක්‍යා වත භෝ කුමාරා”ති. තදග්ගේ ඛෝ පන අම්බට්ඨ සක්‍යා පඤ්ඤායන්ති. සෝ’ව නේසං පුබ්බපුරිසෝ.

එතකොට අම්බට්ඨ, ඔක්කාක රජ්ජුරුවෝ සතුටින් උදන් ඇණුවා. “භවත්නි, ඒකාන්තයෙන් ම කුමාරවරු දක්ෂ යි. භවත්නි, ඒකාන්තයෙන් ම

කුමාරවරු පරම දක්ෂ යි.” පින්වත් අම්බට්ඨ, එතැන් පටන් තමයි ශාක්‍යය යන නාමය ඔවුන්ට ලැබුණේ. ඔවුන් ගේ පූර්ව පුරුෂයා වුණේ ඔක්කාක රජතුමා යි.

රක්ඛෙෝ ච ඛෝ පන අම්බට්ඨ ඔක්කාකස්ස දිසා නාම දාසී අහෝසි. සා කණ්හං නාම ජනේසි. ජාතෝ කණ්හෝ පබ්‍යාහාසි: “ධෝවථ මං අම්ම, නාහපේථ මං අම්ම, ඉමස්මා මං අම්ම අසුචිස්මා පරිමෝ-ථ, අත්ථාය වෝ භවිස්සාමී”ති.

පින්වත් අම්බට්ඨ, ඔය ඔක්කාක රජ්ජුරුවන්ට දිසා කියල දාසියක් හිටියා. කණ්හ කියන කෙනාව වැදුවේ ඇය යි. කණ්හ ඉපදුනු ගමන් කෑ ගැසුවා. “අම්මා මාව සෝදන්න. අම්මා මාව නහවන්න. අම්මා මේ අසූචිවලින් මාව මුදවන්න. මං ඔබට යහපත පිණිස වෙන්නම්” කියලා.

යථා ඛෝ පන අම්බට්ඨ එතරහි මනුස්සා පිසා-ෙ දිස්වා පිසාචාති සඤ්ජානන්ති. එවමේව ඛෝ අම්බට්ඨ තේන සමයේන මනුස්සා පිසා-ෙ කණ්හාති සඤ්ජානන්ති. තේ එවමාහංසු: අයං ජාතෝ පබ්‍යාහාසි: කණ්හෝ ජාතෝ පිසාචෝ ජාතෝති. තදග්ගේ ඛෝ පන අම්බට්ඨ කණ්හායනා පඤ්ඤායන්ති. සෝ ච කණ්හායනානං පුබ්බපුරිසෝ. ඉති ඛෝ තේ අම්බට්ඨ පෝරාණං මාතාපෙත්තිකං නාමගොත්තං අනුස්සරතෝ අය්‍යපුත්තා සක්‍යා භවන්ති. දාසිපුත්තෝ ත්වමසි සක්‍යානන්ති.

පින්වත් අම්බට්ඨ, මේ කාලේ මිනිසුන් පිසාචයන් දැක්කට පස්සේ, පිසාචයන් කියල හඳුනා ගන්නවා වගේ පින්වත් අම්බට්ඨ, ඒ කාලෙ මිනිසුන් පිසාචයන් හඳුනා ගත්තේ කණ්හ කියල යි. ඔවුන් මෙහෙම කිව්වා. “මෙයා ඉපදුන ගමන් කෑ ගහල කථා කළා. කණ්හයෙක් (කළු කෙනෙක්) ඉපදුනා. පිසාචයෙක් ඉපදුනා” කියලා. එදා ඉඳල තමයි අම්බට්ඨ, කණ්හායන යන ගෝත්‍රය හඳුන්වන්නේ. කණ්හායන ගෝත්‍රිකයන් ගේ පූර්ව පුරුෂයා ඔහු තමයි. ඔය විදිහට පින්වත් අම්බට්ඨ, ඔබ ගේ මව්පියවරුන් අයත් පැරණි නම්ගොත් සිහිකරද්දී ශාක්‍යයන්ම යි ඔබ ගේ ආර්ය (ස්වාමී) පුත්‍රයන් වන්නේ. ඔබ ශාක්‍යයන් ගේ දාසියෙකු ගේ පුතෙක්.

18. ඒවං වුත්තේ තේ මාණවකා භගවන්තං ඒතදවෝචුං: “මා භවං ගෝතමෝ අම්බට්ඨං මාණවං අතිබාළ්හං දාසිපුත්තවාදේන නිම්මානේසි. සුජාතෝ ච භෝ ගෝතම අම්බට්ඨෝ මාණවෝ කුලපුත්තෝ ච අම්බට්ඨෝ

මාණවෝ බහුස්සුතෝ ච අම්බට්ඨෝ මාණවෝ කල්‍යාණවාක්කරණෝ ච අම්බට්ඨෝ මාණවෝ පණ්ඩිතෝ ච අම්බට්ඨෝ මාණවෝ. පහෝති ච අම්බට්ඨෝ මාණවෝ භෝතා ගෝතමේන සද්ධිං අස්මිං වචනේ පටිමන්තේතූ"න්ති.

18. මෙසේ වදාළ විට ඒ තරුණයන් භාග්‍යවතුන් වහන්සේට මෙය කියා සිටියා. "භවත් ගෞතමයන් වහන්ස, අම්බට්ඨ මාණවකයාව අතිශයින් ම දැඩි විදිහට දාසිපුත්‍රවාදයෙන් නො පිරිහෙලත්වා. භවත් ගෞතමයන් වහන්ස, අම්බට්ඨ මාණවකයා සුජාත උපතක් ලද කෙනෙක්. අම්බට්ඨ මාණවකයා කුල පුත්‍රයෙක්. අම්බට්ඨ මාණවකයා බහුශ්‍රැත යි. අම්බට්ඨ මාණවකාය කල්‍යාණ වූ වචන කථාබහ කරන කෙනෙක්. අම්බට්ඨ මාණවකයා පණ්ඩිත යි. අම්බට්ඨ මාණවකයා භවත් ගෞතමයන් වහන්සේ සමග මේ වචනය පිළිබඳව පිළිතුරු සපයන්නට පොහොසත්" කියල.

19. අථ ඛෝ භගවා තේ මාණවකේ ඒතදවෝච: "සෙ- ඛෝ තුම්හාකං මාණවකා ඒවං හෝති දුජ්ජාතෝ ච අම්බට්ඨෝ මාණවෝ, අකුලපුත්තෝ ච අම්බට්ඨෝ මාණවෝ, අප්පස්සුතෝ ච අම්බට්ඨෝ මාණවෝ, අකල්‍යාණ-වාක්කරණෝ ච අම්බට්ඨෝ මාණවෝ, දුප්පඤ්ඤෝ ච අම්බට්ඨෝ මාණවෝ, න ච පහෝති අම්බට්ඨෝ මාණවෝ සමණේන ගෝතමේන සද්ධිං අස්මිං වචනේ පටිමන්තේතූන්ති, නිට්ඨතු අම්බට්ඨෝ මාණවෝ, තුම්හේ මයා සද්ධිං මන්තයව්හෝ අස්මිං වචනේ. සෙ- පන තුම්හාකං මාණවකා ඒවං හෝති: සුජාතෝ ච අම්බට්ඨෝ මාණවෝ කුලපුත්තෝ ච අම්බට්ඨෝ මාණවෝ බහුස්සුතෝ ච අම්බට්ඨෝ මාණවෝ කල්‍යාණවාක්කරණෝ ච අම්බට්ඨෝ මාණවෝ පණ්ඩිතෝ ච අම්බට්ඨෝ මාණවෝ. පහෝති ච අම්බට්ඨෝ මාණවෝ සමණේන ගෝතමේන සද්ධිං අස්මිං වචනේ පටිමන්තේතූන්ති, නිට්ඨථ තුම්හේ, අම්බට්ඨෝ මාණවෝ මයා සද්ධිං පටිමන්තේතූ"ති.

19. එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ මාණවකයන් අමතා වදාළා. "පින්වත් තරුණයිනි, ඉදින් ඔබට මේ විදිහට හිතෙනවා නම්, ඒ කියන්නේ අම්බට්ඨ මාණවකයා ලාමක උපතක් ලද කෙනෙක්. අම්බට්ඨ මාණවකයා අකුල පුත්‍රයෙක්. අම්බට්ඨ මාණවකයා අල්පශ්‍රැතයෙක්. අම්බට්ඨ මාණවකයා අකල්‍යාණ වාක්කරණ ඇති කෙනෙක්. අම්බට්ඨ මාණවකයා දුෂ්ප්‍රාඥ කෙනෙක්. අම්බට්ඨ මාණවකයා ශ්‍රමණ ගෞතමයන් සමග මේ වචනය පිළිබඳ ව ප්‍රත්‍යුත්තර දෙන්නට නො පොහොසත් කෙනෙක්" කියලා අම්බට්ඨ මාණවකයා සිටීවා. ඔබ මා සමග මේ වචනය පිළිබඳව පිළිතුරු සපයන්න.

ඉදින් ඔබට මෙහෙම හිතෙනවා නම්, ඒ කියන්නේ "අම්බට්ඨ මාණවකයා සුජාත උපතක් ලද කෙනෙක්. අම්බට්ඨ මාණවකයා කුල පුත්‍රයෙක්. අම්බට්ඨ මාණවකයා බහුශ්‍රැත යි. අම්බට්ඨ මාණවකාය කල්‍යාණ වූ වචන කථාබහ කරන කෙනෙක්. අම්බට්ඨ මාණවකයා පණ්ඩිත යි. අම්බට්ඨ මාණවකයා ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සමග මේ වචනය පිළිබඳ ව පිළිතුරු සපයන්නට පොහොසත් කියල. ඔබ සිටින්වා. අම්බට්ඨ මාණවකයා ම මා සමග මේ වචනය පිළිබඳ ව පිළිතුරු කථාබස් කරාවා."

20. **"සුජාතෝ ච භෝ ගෝතම අම්බට්ඨෝ මාණවෝ කුලපුත්තෝ ච අම්බට්ඨෝ මාණවෝ බහුස්සුතෝ ච අම්බට්ඨෝ මාණවෝ කල්‍යාණ-වාක්කරණෝ ච අම්බට්ඨෝ මාණවෝ පණ්ඩිතෝ ච අම්බට්ඨෝ මාණවෝ. පහෝති ච අම්බට්ඨෝ මාණවෝ භෝතා ගෝතමේන සද්ධිං අස්මිං වචනේ පටිමන්තේතුං. තුණ්හී මයං භවිස්සාම. අම්බට්ඨෝ මාණවෝ භෝතා ගෝතමේන සද්ධිං අස්මිං වචනේ පටිමන්තේතූ"ති.**

20. "භවත් ගෞතමයන් වහන්ස, අම්බට්ඨ මාණවකයා සුජාත උපතක් ලද කෙනෙක්. අම්බට්ඨ මාණවකයා කුල පුත්‍රයෙක්. අම්බට්ඨ මාණවකයා බහුශ්‍රැත යි. අම්බට්ඨ මාණවකාය කල්‍යාණ වූ වචන කථාබහ කරන කෙනෙක්. අම්බට්ඨ මාණවකයා පණ්ඩිත යි. අම්බට්ඨ මාණවකයා භවත් ගෞතමයන් වහන්සේ සමග මේ වචනය පිළිබඳ ව පිළිතුරු සපයන්නට පොහොසත්. අපි නිශ්ශබ්ද වෙන්නම්. අම්බට්ඨ මාණවකයා භවත් ගෞතමයන් සමග මේ වචනය ගැන පිළිතුරු කථාබහ කරාවා."

21. **අථ ඛෝ භගවා අම්බට්ඨං මාණවං ඒතදවෝච: අයං ඛෝ පන තේ අම්බට්ඨ සහධම්මිකෝ පඤ්හෝ ආගඡති. අකාමාපි ව්‍යාකාතබ්බෝ. සචේ ත්වං න ව්‍යාකරිස්සසි අඤ්ඤේන වා අඤ්ඤං පටිචරිස්සසි, තුණ්හී වා භවිස්සසි, පක්කමිස්සසි වා, එත්ථේව තේ සත්තධා මුද්ධා ඵලිස්සති. තං කිං මඤ්ඤසි අම්බට්ඨ? කින්ති තේ සුතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං කුතෝපභුතිකා කණ්හායනා? කෝ ච කණ්හායනානං පුබ්බපුරිසෝ?ති.**

21. එතකොට භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයා හට මෙකරුණ වදාළා. "පින්වත් අම්බට්ඨය, මේ කරුණු සහිතව, පිළිතුරු දිය යුතු ප්‍රශ්නයක් ඔබ වෙත එනවා. අකමැත්තෙන් වුණත් විසඳිය යුතු යි. ඉදින් ඔබ එය විසඳන්නේ නැත්නම්, වෙන වෙන කරුණුවලින් ඒක වහලා දානවා

නම්, නිශ්ශබ්දව හෝ සිටිනවා නම්, පැනලා දුවනවා නම්, ඔබ ගේ හිස මෙහි දී ම සත්කඩකට පැලී යාවි. පින්වත් අම්බට්ඨ, මේ ගැන ඔබ කුමක් ද සිතන්නේ? වැඩිමහළු ආචාර්ය ප්‍රාචාර්ය වූ බ්‍රාහ්මණයන් කියන්නා වූ දෙය ඔබ අහල තියෙන්නේ කොහොම ද? කණ්හායන ගෝත්‍රිකයන් ගේ ආරම්භය ඇති වුණේ කවුරුන්ගෙන් ද? කණ්හායන ගෝත්‍රිකයන් ගේ පූර්ව පුරුෂයා කවුද?"

එවං වුත්තේ අම්බට්ඨෝ මාණවෝ තුණ්හී අහෝසි. දුතියම්පි ඛෝ භගවා අම්බට්ඨං මාණවං ඒතදවෝච: තං කිං මඤ්ඤසි අම්බට්ඨ? කින්ති තේ සුතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං කුතෝපභුතිකා කණ්හායනා? කෝ ච කණ්හායනානං පුබ්බපුරිසෝ?ති. දුතියම්පි ඛෝ අම්බට්ඨෝ මාණවෝ තුණ්හී අහෝසි.

මෙසේ වදාළ විට අම්බට්ඨ මාණවකයා නිශ්ශබ්ද වුණා. දෙවෙනි වතාවේ දීත් භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයා හට මෙකරුණ වදාළා. "පින්වත් අම්බට්ඨ, මේ ගැන ඔබ කුමක් ද සිතන්නේ? වැඩිමහළු ආචාර්ය ප්‍රාචාර්ය වූ බ්‍රාහ්මණයන් කියන්නා වූ දෙය ඔබ අහල තියෙන්නේ කොහොම ද? කණ්හායන ගෝත්‍රිකයන් ගේ ආරම්භය ඇති වුණේ කවුරුන්ගෙන් ද? කණ්හායන ගෝත්‍රිකයන් ගේ පූර්ව පුරුෂයා කවුද?" දෙවන වතාවටත් අම්බට්ඨ මාණවකයා නිශ්ශබ්ද වුණා.

අථ ඛෝ භගවා අම්බට්ඨං මාණවං ඒතදවෝච: ව්‍යාකරෝහි දානි අම්බට්ඨ, න දානි තේ තුණ්හීභාවස්ස කාලෝ. යෝ ඛෝ අම්බට්ඨ තථාගතේන යාවතතියකං සහධම්මිකං පඤ්හං පුට්ඨෝ න ව්‍යාකරෝති එත්ථේවස්ස සන්තධා මුද්ධා ඵලිස්සති.

එතකොට භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයාට මෙය වදාළා. "පින්වත් අම්බට්ඨයෙනි, දැන් උත්තර දෙන්න. දැන් ඔබට නිශ්ශබ්දව සිටින්ට කාලය නොවේ. පින්වත් අම්බට්ඨ, තථාගතයන් වහන්සේ විසින් යමෙකුගෙන් තුන්වරක් දක්වා කරුණු සහිතව ප්‍රශ්නයක් විමසන විට පිළිතුරු නො දෙන්නේ නම්, ඔහු ගේ හිස එතැන දී ම සත්කඩකට පැලී යාවි."

22. තේන ඛෝ පන සමයේන වජිරපාණි යක්ඛෝ මහන්තං අයෝකූටං ආදාය ආදිත්තං සම්පජ්ජලිතං සජෝතිභූතං අම්බට්ඨස්ස මාණවස්ස උපරිවේහාසං ඨිතෝ හෝති. සචායං අම්බට්ඨෝ මාණවෝ භගවතා

යාවතතියකං සහධම්මිකං පඤ්හං පුට්ඨෝ න ව්‍යාකරිස්සති එත්ථේවස්ස සත්තධා මුද්ධා ඵාලෙස්සාමීති. තං ඛෝ පන වජිරපාණිං යක්ඛං භගවා චේව පස්සති අම්බට්ඨෝ ච මාණවෝ.

22. ඒ වෙලාවේ දී වජ්‍රපාණී යක්ෂයා ගිනිගෙන දිළිසෙන, ගිනිදැල් සහිත මහත් යගදාවක් අතින් ගෙන අම්බට්ඨ මාණවකයාට උඩින් අහසේ හිටියා. ඉදින් මේ අම්බට්ඨ මාණවකයා තුන්වරක් දක්වා භාග්‍යවතුන් වහන්සේ කරුණු සහිතව ප්‍රශ්නයක් විමසද්දී පිළිතුරු නොදෙන්නේ නම්, මෙහි ම මොහු ගේ හිස සත්කඩකට පලා දමනවා කියලා. ඒ වජ්‍රපාණී යක්ෂයාව පෙනෙන්නේ භාග්‍යවතුන් වහන්සේටත් අම්බට්ඨ මාණවකයාටත් විතරයි.

23. අථ ඛෝ අම්බට්ඨෝ මාණවෝ භීතෝ සංවිග්ගෝ ලෝමහට්ඨජාතෝ භගවන්තංයේව තාණගවේසී භගවන්තංයේව ලේණගවේසී භගවන්තංයේව සරණගවේසී උපනිසීදිත්වා භගවන්තං ඒතදවෝච; "කිං මේ තං භවං ගෝතමෝ ආහ? පුන භවං ගෝතමෝ බ්‍රවීතූ"ති.

23. එතකොට අම්බට්ඨ මාණවකයා භය වුණා. සංවේග වුණා. ඇඟේ මවිල් කෙළින් වුණා. භාග්‍යවතුන් වහන්සේව ම රැකවරණය කොට සෙව්වා. භාග්‍යවතුන් වහන්සේව ම ආරක්ෂාව කොට සෙව්වා. භාග්‍යවතුන් වහන්සේව ම පිළිසරණ කොට සෙව්වා. භාග්‍යවතුන් වහන්සේ ළඟින් ම හිඳගෙන මෙහෙම කිව්වා. "භවත් ගෞතමයන් වහන්ස, මට ඒ කුමක් ද පැවසුවේ? භවත් ගෞතමයන් වහන්සේ ආයෙමත් එය පවසත්වා" කියලා.

"තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? කින්ති තේ සුතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං, කුතෝප්පභුතිකා කණ්හායනා? කෝ ච කණ්හායනානං පුබ්බපුරිසෝ?ති."

"පින්වත් අම්බට්ඨ, මේ ගැන ඔබ කුමක් ද සිතන්නේ? වැඩිමහළු ආචාර්ය ප්‍රාචාර්ය වූ බ්‍රාහ්මණයන් කියන්නා වූ දෙය ඔබ අහල තියෙන්නේ කොහොම ද? කණ්හායන ගෝත්‍රිකයන් ගේ ආරම්භය ඇති වුණේ කවුරුන්ගෙන් ද? කණ්හායන ගෝත්‍රිකයන් ගේ පූර්ව පුරුෂයා කවුද?"

"ඒවමේව මේ භෝ ගෝතම සුතං, යථේව භවං ගෝතමෝ ආහ. තතොප්පභුතිකා කණ්හායනා. සෝ ච කණ්හායනානං පුබ්බපුරිසෝ"ති.

"භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයන් යම් ආකාරයකින් පැවසුවාහුද ඔය ආකාරයෙන් තමයි මා අසල තියෙන්නේ. ඔහුගෙන් තමයි කණ්හායන ගෝත්‍රිකයන් ගේ පටන් ගැනීම වෙලා තියෙන්නේ. ඔහු තමයි කණ්හායන ගෝත්‍රිකයන් ගේ පූර්ව පුරුෂයා."

24. එවං වුත්තේ තේ මාණවකා උන්නාදිනෝ උච්චාසද්දමහාසද්දා අහේසුං: "දුජ්ජාතෝ කිර භෝ අම්බට්ඨෝ මාණවෝ, අකුලපුත්තෝ කිර භෝ අම්බට්ඨෝ මාණවෝ, දාසිපුත්තෝ කිර භෝ අම්බට්ඨෝ මාණවෝ සක්‍යානං, අය්‍යපුත්තා කිර භෝ අම්බට්ඨස්ස මාණවස්ස සක්‍යා භවන්ති. ධම්මවාදිං යේව කිර මයං සමණං ගෝතමං අපසාදේතබ්බං අමඤ්ඤිම්හා"ති.

"එසේ කී විට ඒ තරුණයන් මහ හඬින්, උස් හඬින් කෑ ගසන්නට පටන් ගත්තා. "භවත්නි, අම්බට්ඨ මාණවකයා දුර්ජාතයිව්. භවත්නි, අම්බට්ඨ මාණවකයා අකුල පුත්‍රයෙක්ව්. භවත්නි, අම්බට්ඨ මාණවකයා ශාක්‍යයන් ගේ දාසී පුත්‍රයෙක්ව්. භවත්නි, ශාක්‍යයන් අම්බට්ඨ මාණවකයා ගේ ස්වාමී පුත්‍රයන්ව්. අපි ධර්මවාදී වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගැරහිය යුතු කොට යි සිතුවේ" කියලා.

25. අථ ඛෝ භගවතෝ ඒතදහෝසි: "අතිබාළ්හං ඛෝ ඉමේ මාණවකා අම්බට්ඨං මාණවං දාසිපුත්තවාදේන නිම්මානෙන්ති. යන්නූනාහං පරිමෝචෙය්‍යන්ති." අථ ඛෝ භගවා තේ මාණවකේ ඒතදවෝච: "මා ඛෝ තුම්හේ මාණවකා අම්බට්ඨං මාණවං අතිබාළ්හං දාසිපුත්තවාදේන නිම්මානේථ. උළාරෝ සෝ කණ්හෝ ඉසි අහෝසි. සෝ දක්ඛිණං ජනපදං ගන්ත්වා බ්‍රහ්මේ මන්තේ අධීයිත්වා රාජානං ඔක්කාකං උපසංකමිත්වා මට්ඨරූපිං ධීතරං යාචි. තස්ස රාජා ඔක්කාකෝ "කෝ නේව රේ අයං මය්හං දාසිපුත්තෝ සමානෝ මට්ඨරූපිං ධීතරං යාචතී"ති කුපිතෝ අනත්තමනෝ බ්‍රහ්මං සන්නය්හි. සෝ තං බ්‍රහ්මං නේව අසක්ඛි මුඤ්චිතුං, නෝ පටිසංහරිතුං.

25. එතකොට භාග්‍යවතුන් වහන්සේට මෙහෙම හිතුනා. "මේ තරුණයන් අම්බට්ඨ මාණවකයා හට දාසිපුත්‍රවාදයෙන් අතිශයින් ම දැඩි විදිහට පිරිහෙලා කථා කරනවා. මං මොහුව ඒකෙන් නිදහස් කරවන්ට ඕන." ඉතින් භාග්‍යවතුන් වහන්සේ ඒ මාණවකයන් හට මෙසේ වදාළා. "පින්වත් තරුණයෙනි, අම්බට්ඨ මාණවකයා හට දාසිපුත්‍රවාදයෙන් ඔතරම් දැඩිලෙස පිරිහෙළා කථා නොකරත්වා. ඒ කණ්හ ඍෂිවරයා උදාර වූ කෙනෙක් ඔහු

දක්ෂිණ ජනපදයට ගිහින් බ්‍රහ්මමන්ත්‍ර හොඳින් ඉගෙන ගත්තා. ඔක්කාක රජතුමා ළඟට පැමිණුනා. පැමිණිලා මට්ඨරූපී නම් රාජ දියණිය ඉල්ව්වා. එතකොට ඔක්කාක රජතුමා "එම්බල, මේක මාගේ දාසී පුත්‍රයෙක්ව ඉඳගෙනත් මට්ඨරූපී දියණිය මගෙන් ඉල්ලන්ට කවුද මූ" කියලා කිපිලා නො සතුටු සිතින් (ඔහුව විද මැරීම පිණිස) ඊතලය දුන්නෙහි පිහිටෙව්වා. නමුත් රජතුමාට ඒ ඊතලය දුන්නෙත් අත්හරින්ට බැරිවුණා. ඇදගන්නටත් බැරිවුණා.

අථ ඛෝ මාණවකා අමච්චා පාරිසජ්ජා කණ්හං ඉසිං උපසංකමිත්වා එතදවෝචුං: "සොත්ථි භදන්තේ හෝතු රඤ්ඤේ, සොත්ථි භදන්තේ හෝතු රඤ්ඤේ"ති.

එතකොට පින්වත් තරුණයිනි, ඇමති පිරිස කණ්හ ඍෂිවරයා ළඟට ගිහින් මෙහෙම කිව්වා. "පින්වතුන් වහන්ස, රජතුමාට සෙතක් වේවා. පින්වතුන් වහන්ස, රජතුමාට සෙතක් වේවා" කියලා.

"සොත්ථි භවිස්සති රඤ්ඤේ, අපි ච රාජා යදි අධෝ බ්‍රරප්පං මුඤ්චිස්සති යාවතා රඤ්ඤේ විජිතං එත්තාවතා පඨවි උද්‍රියිස්සතී"ති.

"රජතුමාට සෙතක් වේවි, නමුත් යම් හෙයකින් රජතුමා ඔය ඊතලය යට දිසාවට මුදාහළොත්, රජුගේ රට යම්තාක් ද ඒතාක් ම පොළොව විනාශ වෙලා යාවි."

"සොත්ථි භදන්තේ හෝතු රඤ්ඤේ, සොත්ථි ජනපදස්සා"ති.

"පින්වතුන් වහන්ස, රජතුමාට සෙතක් වේවා. රටටත් සෙතක් වේවා."

"සොත්ථි භවිස්සති රඤ්ඤේ, සොත්ථි ජනපදස්ස. අපි ච රාජා යදි උද්ධං බ්‍රරප්පං මුඤ්චිස්සති යාවතා රඤ්ඤේ විජිතං එත්තාවතා සත්තවස්සානි දේවෝ න වස්සිස්සතී"ති.

"රජතුමාට සෙතක් වේවි, රටටත් සෙතක් වේවි, නමුත් යම් විදිහකින් රජතුමා ඔය ඊතලය උඩ දිසාවට මුදාහළොත්, රජු ගේ විජිතය යම්තාක් ද ඒතාක් ප්‍රදේශයට සත් අවුරුද්දක් ම වැසි වසින එකක් නෑ."

"සොත්ථි භදන්තේ හෝතු රඤ්ඤෝ, සොත්ථි ජනපදස්ස, දේවෝ ච වස්සතූ"ති.

"පින්වතුන් වහන්ස, රජතුමාට සෙතක් වේවා. රටටත් සෙතක් වේවා. වැස්ස ද වසීවා."

"සොත්ථි භවිස්සති රඤ්ඤෝ, සොත්ථි ජනපදස්ස, දේවෝ ච වස්සිස්සති. අපි ච රාජා ජෙට්ඨකුමාරේ බ්‍රූරප්පං පතිට්ඨාපේතූ, සොත්ථි කුමාරෝ, පල්ලෝමෝ භවිස්සතී"ති.

"රජතුමාට සෙතක් වේවි, රටටත් සෙතක් වේවි, වැස්සත් වසීවි, නමුත් රජතුමා ඔය ඊතලය දෙටු කුමාරයා කෙරෙහි පිහිටුවාවා. එතකොට කුමාරයාට සෙතක් වේවි. ලොමුඩහ ගැනීම් පමණක්වත් ඇති නොවේවි."

අථ ඛෝ මාණවකා, අමච්චා ඔක්කාකස්ස ආරෝචේසුං: "දේවෝ ජෙට්ඨකුමාරේ බ්‍රූරප්පං පතිට්ඨාපේතූ, සොත්ථි කුමාරෝ පල්ලෝමෝ භවිස්සතී"ති. අථ ඛෝ රාජා ඔක්කාකෝ ජෙට්ඨකුමාරේ බ්‍රූරප්පං පතිට්ඨාපේසි. සොත්ථි කුමාරෝ පල්ලෝමෝ භවි.

එතකොට පින්වත් තරුණයෙනි, ඇමැතිවරුන් ඔක්කාක රජ්ජුරුවන්ට මෙහෙම කිව්වා "දේවයන් වහන්ස, දෙටු කුමරා කෙරෙහි ඔය ඊතලය පිහිටුවාවා. කුමාරයට කරදරයක් වෙන්නේ නෑ. කුමාරයාට ලොමුඩහ ගැනුම් පමණක්වත් වෙන්නේ නෑ." ඉතින් ඔක්කාක රජතුමා දෙටු කුමරා කෙරෙහි ඊතලය පිහිටෙව්වා. (ඒ දෙසට මුදා හැරියා) කුමාරයාට කරදරයක් වුණේ නෑ. ලොමුඩහගැනීම් ඇති වුණේ නෑ.

අථ ඛෝ තස්ස රාජා ඔක්කාකෝ භීතෝ සංවිග්ගෝ ලෝමහට්ඨජාතෝ බ්‍රහ්මදණ්ඩේන තජ්ජීතෝ මට්ඨරූපිං ධීතරං අදාසි. මා ඛෝ තුම්හේ මාණවකා අම්බට්ඨං මාණවං අතිබාළ්හං දාසිපුත්තවාදේන නිම්මානේථ. උළාරෝ සෝ කණ්හෝ ඉසි අහෝසි.

එතකොට ඔක්කාක රජතුමා භය වුණා. සංවේග වුණා. මවිල් කෙළින් වුණා. බ්‍රහ්මදණ්ඩයෙන් තරවටු කරණු ලැබුවා. ඔහුට මට්ඨරූපී දියණිය දුන්නා. පින්වත් තරුණයිනි, ඔය අම්බට්ඨ මාණවකයා දාසපුත්‍රවාදයෙන් දැඩි විදිහට පිරිහෙළන්න එපා. ඒ කණ්හ ඍෂිවරයා උදාර වූ කෙනෙක්."

26. අථ ඛෝ භගවා අම්බට්ඨං මාණවං ආමන්තේසි: "තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? ඉධ ඛත්තියකුමාරෝ බ්‍රාහ්මණකඤ්ඤය සද්ධිං සංවාසං කප්පෙය්‍ය, තේසං සංවාසමන්වාය පුත්තෝ ජායේථ, යෝ සෝ ඛත්තිය කුමාරේන බ්‍රාහ්මණකඤ්ඤය පුත්තෝ උප්පන්නෝ, අපි නු සෝ ලභේථ බ්‍රාහ්මණේසු ආසනං වා උදකං වා?ති, "ලභේථ හෝ ගෝතම" "අපි නු නං බ්‍රාහ්මණා හෝජෙය්‍යුං සද්ධේ වා ථාලිපාකේ වා යඤ්ඤේ වා පාහුනේ වා?ති" "හෝජෙය්‍යුං හෝ ගෝතම" "අපි නු නං බ්‍රාහ්මණා මන්තේ වාචෙය්‍යුං වා නෝ වා?"ති. "වාචෙය්‍යුං හෝ ගෝතම" "අපිනු'ස්ස ඉත්ථීසු ආවටං වා අස්ස අනාවටං වා?"ති. "අනාවටං හි'ස්ස හෝ ගෝතම" "අපි නු නං ඛත්තියා ඛත්තියාභිසේකේන අභිසිඤ්චෙය්‍යුන්ති?" "නෝ හිදං හෝ ගෝතම" "තං කිස්ස හේතු?" "මාතිතෝ හි හෝ ගෝතම අනුප්පන්නෝ"ති.

26. ඉතින් භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයා අමතා වදාළා. "පින්වත් අම්බට්ඨ මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? මෙහි ක්ෂත්‍රිය කුමාරයෙක් බ්‍රාහ්මණ දියණියක් සමග එකට වාසය කරනවා නම්, ඔවුන් ගේ එකට වාසය කිරීමෙන් දරුවෙක් ලැබෙනවා නම්, ඒ ක්ෂත්‍රිය කුමරයා නිසා බ්‍රාහ්මණ දියණියට උපන් දරුවා බ්‍රාහ්මණ සමාජය තුළ අසුනෙන් සැළකීමත්, සංග්‍රහයෙන් සැළකීමත් ලබනවා ද?" "භවත් ගෞතමයෙනි, ලැබෙනවා" "එතකොට බ්‍රාහ්මණයන් මලවුන් උදෙසා දෙන දානයේ දීත්, මංගල්‍ය දානයේ දීත්, යාග දානයේ දීත්, ආගන්තුක දානයේ දීත්, ඔහුට දන්පැන් දෙනවා ද?" "භවත් ගෞතමයෙනි, ඔහු වළඳවනවා ම යි." "ඒ වගේ ම බ්‍රාහ්මණයන් ඔහුට වේද මන්ත්‍රයන් පාඩම් කරවනවා ද? නැද්ද?" "භවත් ගෞතමයෙනි, පාඩම් කරවනවා ම යි." "බමුණු දැරියන් හා විවාහ වීම වළක්වනවා ද? නොවළක්වනවා ද?" "භවත් ගෞතමයෙනි, නොවළක්වනවා ම යි." "එසේ නමුත්, ක්ෂත්‍රියවරුන් ඒ දරුවාව ක්ෂත්‍රිය අභිෂේකයෙන් ඔටුනු පළන්දනවා ද?" "භවත් ගෞතමයෙනි, මෙය නොවේම ය" "ඒකට හේතුව කුමක් ද?" "භවත් ගෞතමයෙනි, මව් පාර්ශවයෙන් ඔහු නිසිතැනට පැමිණ නැ."

27. "තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? ඉධ බ්‍රාහ්මණ කුමාරෝ ඛත්තියකඤ්ඤය සද්ධිං සංවාසං කප්පෙය්‍ය, තේසං සංවාසමන්වාය පුත්තෝ ජායේථ, යෝ සෝ බ්‍රාහ්මණ කුමාරේන ඛත්තිය කඤ්ඤය පුත්තෝ උප්පන්නෝ, අපි නු සෝ ලභේථ බ්‍රාහ්මණේසු ආසනං වා උදකං වා?"ති. "ලභේථ හෝ ගෝතම"

27. "පින්වත් අම්බට්ඨ මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? මෙහි බ්‍රාහ්මණ කුමාරයෙක් ක්ෂත්‍රිය දියණියක් සමග එකට වාසය කරනවා නම්, ඔවුන් ගේ එකට වාසය කිරීමෙන් දරුවෙක් ලැබෙනවා නම්, ඒ බ්‍රාහ්මණ කුමරයා නිසා ක්ෂත්‍රිය දියණියට උපන් දරුවා බ්‍රාහ්මණ සමාජය තුළ අසුනෙන් සැළකීමත්, සංග්‍රහයෙන් සැළකීමත් ලබනවා ද?" "භවත් ගෞතමයෙනි, ලැබෙනවා"

"අපි නු නං බ්‍රාහ්මණා හෝජෙය්‍යුං සද්ධේ වා ථාලිපාකේ වා යඤ්ඤේ වා පාහුනේ වා?"ති. "හෝජෙය්‍යුං හෝ ගෝතම"

"එතකොට බ්‍රාහ්මණයන් මලවුන් උදෙසා දෙන දානයේ දීත්, මංගල්‍ය දානයේ දීත්, යාග දානයේ දීත්, ආගන්තුක දානයේ දීත්, ඔහුට දන්පැන් දෙනවා ද?" "භවත් ගෞතමයෙනි, ඔහු වළඳවනවා ම යි."

"අපි නු නං බ්‍රාහ්මණා මන්තේ වාචෙය්‍යුං වා නෝ වා?"ති. "වාචෙය්‍යුං හෝ ගෝතම"

"ඒ වගේ ම බ්‍රාහ්මණයන් ඔහුට වේද මන්ත්‍රයන් පාඩම් කරවනවා ද? නැද්ද?" "භවත් ගෞතමයෙනි, පාඩම් කරවනවා ම යි."

"අපිනු'ස්ස ඉත්ථීසු ආවටං වා අස්ස අනාවටං වා?"ති. "අනාවටං හි'ස්ස හෝ ගෝතම"

"බමුණු දැරියන් හා විවාහ වීම වළක්වනවා ද? නො වළක්වනවා ද?" "භවත් ගෞතමයෙනි, නො වළක්වනවා ම යි."

"අපි නු නං ඛත්තියා ඛත්තියාභිසේකේන අභිසිඤ්චෙය්‍යුන්ති?" "නෝ හිදං හෝ ගෝතම"

"එසේ නමුත්, ක්ෂත්‍රියවරුන් ඒ දරුවාව ක්ෂත්‍රිය අභිෂේකයෙන් ඔටුනු පළන්දනවා ද?" "භවත් ගෞතමයෙනි, මෙය නො වේම ය"

"තං කිස්ස හේතු?" "පිතිනෝහි හෝ ගෝතම අනුපපන්නෝ"ති.

"ඒකට හේතුව කුමක් ද?" "භවත් ගෞතමයෙනි, පිය පාර්ශවයෙන් ඔහු නිසිතැනට පැමිණ නෑ."

28. "ඉති ඛෝ අම්බට්ඨ ඉත්ථියා වා ඉත්ථිං කරිත්වා පුරිසේන වා පුරිසං කරිත්වා ඛත්තියා ව සෙට්ඨා, හීනා බ්‍රාහ්මණා. තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? ඉධ බ්‍රාහ්මණා බ්‍රාහ්මණං කිස්මිඤ්චි දේව පකරණේ බුරමුණ්ඩං කරිත්වා අස්සපුටේන වධිත්වා රට්ඨා වා නගරා වා පබ්බාජෙය්‍යුං, අපි නු සෝ ලභේථ බ්‍රාහ්මණේසු ආසනං වා උදකං වා?"ති. "නෝ හිදං භෝ ගෝතම"

28. මෙසේ පින්වත් අම්බට්ඨ, ස්ත්‍රියක හා තවත් ස්ත්‍රියක සැසඳුවත්, පුරුෂයෙකු හා තවත් පුරුෂයෙකු සැසඳුවත් ශ්‍රේෂ්ඨ වන්නේ ක්ෂත්‍රියයන් ම යි. හීන වන්නේ බ්‍රාහ්මණයන් ම යි. පින්වත් අම්බට්ඨ, මේ ගැන ඔබ කුමක් ද සිතන්නේ? මෙහි බ්‍රාහ්මණවරු කිසියම් වරදකට තවත් බමුණෙකුට හිස මුඩු කරවල, හිසෙහි අළු තවරලා, රටෙන් හරි නගරයෙන් හරි පිටුවහල් කරනවා. එතකොට ඔහු බ්‍රාහ්මණ සමාජයේ ආසනයෙන් හෝ දන්පැන්වලින් හෝ සැළකිලි ලබනවා ද?" "භවත් ගෞතමයෙනි, මෙය නොවේමයි"

"අපි නු නං බ්‍රාහ්මණා භෝජය්‍යුං සද්ධේ වා ථාලිපාකේ වා යඤ්ඤේ වා පාහුනේ වා?"ති "නෝ හිදං භෝ ගෝතම"

"එතකොට බ්‍රාහ්මණයන් මලවුන් උදෙසා දෙන දානයේ දීත්, මංගල්‍ය දානයේ දීත්, යාග දානයේ දීත්, ආගන්තුක දානයේ දීත්, ඔහුට දන්පැන් දෙනවා ද?" "භවත් ගෞතමයෙනි, මෙය නොවේමයි"

"අපි නු නං බ්‍රාහ්මණා මන්තේ වාචෙය්‍යුං වා නෝ වා?"ති. "නෝ හිදං භෝ ගෝතම."

"ඒ වගේ ම බ්‍රාහ්මණයන් ඔහුට වේද මන්ත්‍රයන් පාඩම් කරවනවා ද? නැද්ද?" "භවත් ගෞතමයෙනි, මෙය නොවේමයි"

"අපි නු'ස්ස ඉත්ථිසු ආවටං වා අස්ස අනාවටං වා?ති." "ආවටං හි'ස්ස භෝ ගෝතම."

"බමුණු දැරියන් හා විවාහ වීම වළක්වනවා ද? නො වළක්වනවා ද?" "භවත් ගෞතමයෙනි, වළක්වනවා ම යි."

29. "තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? ඉධ ඛත්තියා ඛත්තියං කිස්මිඤ්චිදේව පකරණේ බුරමුණ්ඩං කරිත්වා අස්සපුටේන වධිත්වා රට්ඨා වා නගරා වා

පබ්බාජෙය්‍යුං, අපි නු සෝ ලභේථ බ්‍රාහ්මණේසු ආසනං වා උදකං වා?ති” “ලභේථ හෝ ගෝතම.”

පින්වත් අම්බට්ඨ, මේ ගැන ඔබ කුමක් ද සිතන්නේ? මෙහි ක්ෂත්‍රියවරු කිසියම් වරදකට තවත් ක්ෂත්‍රියෙකුට හිස මුඩු කරවල, හිසෙහි අළු තවරලා, රටෙන් හරි නගරයෙන් හරි පිටුවහල් කරනවා. එතකොට ඔහු බ්‍රාහ්මණ සමාජයේ ආසනයෙන් හෝ දන්පැන්වලින් හෝ සැළකිලි ලබනවා ද? “භවත් ගෞතමයෙනි, ලැබෙනවා”

“අපි නු නං බ්‍රාහ්මණා භෝජෙය්‍යුං සද්ධේ වා ථාලිපාකේ වා යඤ්ඤේ වා පාහුනේ වා?ති” “භෝජෙය්‍යුං භෝ ගෝතම.”

“එතකොට බ්‍රාහ්මණයන් මලවුන් උදෙසා දෙන දානයේ දීත්, මංගල්‍ය දානයේ දීත්, යාග දානයේ දීත්, ආගන්තුක දානයේ දීත්, ඔහුට දන්පැන් දෙනවා ද?” “භවත් ගෞතමයෙනි, ඔහු වළඳවනවා ම යි.”

“අපි නු නං බ්‍රාහ්මණා මන්තේ වාචෙය්‍යුං වා නෝ වා?”ති. “වාචෙය්‍යුං භෝ ගෝතම.”

“ඒ වගේ ම බ්‍රාහ්මණයන් ඔහුට වේද මන්ත්‍රයන් පාඩම් කරවනවා ද? නැද්ද?” “භවත් ගෞතමයෙනි, පාඩම් කරවනවා ම යි.”

“අපි නු’ස්ස ඉත්ථිසු ආවටං වා අස්ස අනාවටං වා?”ති. “අනාවටං හි’ස්ස භෝ ගෝතම.”

“බමුණු දැරියන් හා විවාහ වීම වළක්වනවා ද? නො වළක්වනවා ද?” “භවත් ගෞතමයෙනි, නො වළක්වනවා ම යි.”

“එත්තාවතා ඛෝ අම්බට්ඨ ඛත්තියෝ පරමනිහීනතං පත්තෝ හෝති, යදේව නං ඛත්තියා බුරමුණ්ඩං කරිත්වා අස්සපුටේන වධිත්වා රට්ඨා වා නගරා වා පබ්බාජෙන්ති. ඉති ඛෝ අම්බට්ඨ යදා ඛත්තියෝ පරමනිහීනතං පත්තෝ හෝති, තදාපි ඛත්තියා’ව සෙට්ඨා හීනා බ්‍රාහ්මණා.

පින්වත් අම්බට්ඨ, මෙපමණකින් ම ක්ෂත්‍රියයා අතිශයින් ම නිහීනබවට පත් වෙනවා. ඒ කියන්නේ ක්ෂත්‍රිවවරුන් ඔහුව හිස මුඩු කරවල, හිසෙහි අළු

තවරලා, රටෙන් හරි නගරයෙන් හරි පිටුවහල් කරනවා. අම්බට්ඨ, ඔය විදිහට යම් කලෙක ක්ෂත්‍රියයා අතිශයින් ම නිහීන බවට පත් වෙලා හිටියත් එවේලේදීත් ක්ෂත්‍රියයා ම යි ශ්‍රේෂ්ඨ වන්නේ. බ්‍රාහ්මණයන් හීන යි.

30. බ්‍රහ්මුනා'පි අම්බට්ඨ සනංකුමාරේන ගාථා භාසිතා:

30. අම්බට්ඨය, සනංකුමාර බ්‍රහ්මයා විසිනුත් මේ ගැන ගාථාවක් පවසලා තියෙනවා.

ඛත්තියෝ සෙට්ඨෝ ජනේතස්මිං
යේ ගොත්තපටිසාරිනෝ,
විජ්ජාචරණසම්පන්නෝ
සෝ සෙට්ඨෝ දේවමානුසේති

ගෝත්‍ර පිළිවෙල අනුව සිය පරපුර අතීතයට යොමු කොට විමසා බැව්වොත් ජනයා අතර ශ්‍රේෂ්ඨ වන්නේ ක්ෂත්‍රියයා ම යි. යමෙක් විජ්ජාචරණ දෙකෙන් (අවබෝධය හා ඊට අනුව හැසිරීම) යුක්ත නම්, ඔහු තමයි දෙව් මිනිසුන් අතර ශ්‍රේෂඨ වන්නේ.

සා බෝ පනේසා අම්බට්ඨ බ්‍රහ්මුනා සනංකුමාරේන ගාථා සුගීතා නෝ දුග්ගීතා, සුභාසිතා නෝ දුබ්භාසිතා, අත්ථසංහිතා නෝ අනත්ථසංහිතා, අනුමතා මයා. අහම්පි අම්බට්ඨ එවං වදාමි:

පින්වත් අම්බට්ඨ, සනංකුමාර බ්‍රහ්මයා විසින් ඔය ගාථාව මැනැවින් ම පවසන ලද දෙයක්. නො මනා ලෙස කියූ ගාථාවක් නොවේ. සුභාෂිත දෙයක්. දුර්භාෂිතයක් නොවේ. අර්ථ සහිත වූ දෙයක්. අනර්ථ සහිත දෙයක් නොවේ. මා විසින් අනුමත කරල තියෙන්නේ. අම්බට්ඨය, මමත් ඒ විදිහට තමයි පවසන්නේ.

ඛත්තියෝ සෙට්ඨෝ ජනේතස්මිං
යේ ගොත්තපටිසාරිනෝ,
විජ්ජාචරණසම්පන්නෝ
සෝ සෙට්ඨෝ දේවමානුසේති.

ගෝත්‍ර පිළිවෙල අනුව සිය පරපුර අතීතයට යොමු කොට විමසා බැව්වොත් ජනයා අතර ශ්‍රේෂ්ඨ වන්නේ ක්ෂත්‍රියයා ම යි. යමෙක් විජ්ජාචරණ දෙකෙන් (අවබෝධය හා ඊට අනුව හැසිරීම) යුක්ත නම්, ඔහු තමයි දෙවි මිනිසුන් අතර ශ්‍රේෂඨ වන්නේ.

භාණවාරෝපඨමෝ
පළමු වෙනි බණවරයි

31. "කතමං පන තං භෝ ගෝතම චරණං, කතමා ච පන සා විජ්ජා?"ති. "න ඛෝ අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ජාතිවාදෝ වා වුච්චති ගොත්තවාදෝ වා වුච්චති මානවාදෝ වා වුච්චති: අරහසි වා මං ත්වං න වා මං ත්වං අරහසීති. යත්ථ ඛෝ අම්බට්ඨ ආවාහෝ වා හෝති, විවාහෝ වා හෝති, ආවාහවිවාහෝ වා හෝති, එත්ථේතං වුච්චති ජාතිවාදෝ වා ඉතිපි, ගොත්තවාදෝ වා ඉතිපි, මානවාදෝ වා ඉතිපි: අරහසි වා මං ත්වං න වා මං ත්වං අරහසීති. යේ හි කේචි අම්බට්ඨ ජාතිවාදවිනිබද්ධා වා ගොත්තවාදවිනිබද්ධා වා මානවාදවිනිබද්ධා වා ආවාහවිවාහවිනිබද්ධා වා, ආරකා තේ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය, පහාය ඛෝ අම්බට්ඨ ජාතිවාදවිනිබද්ධඤ්ච ගොත්තවාදවිනිබද්ධඤ්ච මානවාදවිනිබද්ධඤ්ච ආවාහවිවාහවිනිබද්ධඤ්ච අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සච්ඡිකිරියා හෝතී"ති.

31. "භවත් ගෞතමයෙනි, ඒ චරණ කියන්නේ මොකක් ද? ඒ විද්‍යාව කියන්නේ මොකක් ද?" "පින්වත් අම්බට්ඨ, අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තියෙහි දී "නුඹ මට සුදුසු යි කියල හෝ නුඹ මට නුසුදුසු යි කියල හෝ ජාතිවාදය කථා කරන්නේ නෑ. ගෝත්‍රවාදය කථා කරන්නේ නෑ. මැනීම් වාදය කථා කරන්නේ නෑ. නමුත් පින්වත් අම්බට්ඨ, යම් තැනක ආවාහයක් වෙනවාද, විවාහයක් වෙනවා ද, ආවාහවිවාහයක් වෙනවා ද අන්න එතැන දී නම් නුඹ මට සුදුසු යි කියල හෝ නුඹ මට නුසුදුසු යි කියල හෝ කථා කරනවා ද, ඒකටයි ජාතිවාදය කියන්නේ. ඒකට තමයි ගෝත්‍රවාදය කියන්නේ. ඒකට තමයි මැනීම්වාදය කියන්නේ. පින්වත් අම්බට්ඨ, යම් කිසි කෙනෙක් ජාතිවාදයට බැඳිල ගිහින් හෝ ගෝත්‍රවාදයට බැඳිල ගිහින් හෝ මැනීම් වාදයකට බැඳිල ගිහින් හෝ ආවාහවිවාහයකට බැඳිල ගිහින් හෝ ඉන්නවා ද, ඔවුන් අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තියෙන් දුරුවෙලා ම යි ඉන්නේ. පින්වත් අම්බට්ඨ, ජාතිවාදයට ඇති බැඳීමත්, ගෝත්‍රවාදයට ඇති බැඳීමත්,

මැනීම්වාදයට ඇති බැඳීමත්, ආවාහවිවාහයට ඇති බැඳීමත් අත්හැරල තමයි අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තියෙහි සාක්ෂාත් කිරීම තියෙන්නේ.

32. "කතමං පන තං භෝ ගෝතම චරණං? කතමා ච සා විජ්ජා?"ති "ඉධ අම්බට්ඨ තථාගතෝ ලෝකේ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣේකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසේති.

32. "භවත් ගෞතමයෙනි, ඒ චරණ කියන්නේ මොකක් ද? ඒ විද්‍යාව කියන්නේ මොකක් ද?" "පින්වත් අම්බට්ඨ, මෙහි අරහත් වූ සම්මාසම්බුද්ධ වූ විජ්ජාචරණසම්පන්න වූ සුගත වූ ලෝකවිදූ වූ අනුත්තර පුරිසදම්ම සාරථී වූ, සත්ථා දේවමනුස්සානං වූ, බුද්ධ වූ, භගවා වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපත ලබනවා. උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙව්මිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඤාණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා.

33. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තෝ වා අඤ්ඤතරස්මිං වා කුලේ ප-ච්චාජාතෝ. සෝ තං ධම්මං සුත්වා තථාගතේ සද්ධං පටිලභති. සෝ තේන සද්ධාපටිලාභේන සමන්නාගතෝ ඉති පටිසංචික්ඛති: "සම්බාධෝ ඝරාවාසෝ රජෝපථෝ. අබ්භෝකාසෝ පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා ඒකන්තපරිපුණ්ණං ඒකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.

33. එතකොට ගෘහපතියෙක් වේවා, ගෘහපති පුත්‍රයෙක් වේවා කවර හෝ කුලයක උපන් කෙනෙක් වේවා ඒ ධර්මය අසනවා. ඔහු ඒ ධර්මය අසලා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ගන්නවා. ඉතින් ඔහු ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වෙලා මේ විදිහට නුවණින් කල්පනා කරනවා. "ගිහි

ගෙදර වාසය කිරීම හරිම කරදරයක්. කෙලෙස් වැඩෙන මාවතක්. නමුත් පැවිදි ජීවිතය ආකාසය වගේ. ගිහි ගෙදර වාසය කරමින් මුළුමණින් ම පිරිපුන්, මුළුමණින් ම පිරිසිදු, සුදෝසුදු බඹසර වසනවා යන කරුණ ලෙහෙසි එකක් නොවේ. ඒ නිසා මං කෙස් රැවුල් බාලා, කසාවත් පොරොවා ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට ඇතුළත් වෙන එක තමයි හොඳ" කියලා.

සෝ අපරේන සමයේන අප්පං වා භෝගක්ඛන්ධං පහාය මහන්තං වා භෝගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සෝ ඒවං පබ්බජිතෝ සමානෝ පාතිමොක්ඛසංවරසංවුතෝ විහරති, ආචාරගෝචරසම්පන්නෝ, අණුමත්තේසු වජ්ජේසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදේසු, කායකම්මවචිකම්මේන සමන්නාගතෝ කුසලේන, පරිසුද්ධාජීවෝ, සීලසම්පන්නෝ, ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ, භෝජනේ මත්තඤ්ඤූ, සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ සන්තුට්ඨෝ.

ඔහු පස්සෙ කාලෙක ස්වල්ප වූ භෝග සම්පත් අත්හරිනවා. මහත් වූ භෝග සම්පත් අත්හරිනවා. ස්වල්ප වූ නෑදෑයන් අත්හරිනවා. මහත් වූ නෑදෑයන් අත්හරිනවා. කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙනවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් (පැවිද්දෙක් විසින් රැකගත යුතු නිවනට උපකාරී වන උතුම් සිල්පදවලින්) සංවරව ඉන්නවා. යහපත් ඇවැතුම් පැවැතුම්වලින් යුතු වෙනවා. අණුමාත්‍ර වූ වරදෙහි පවා භය දකිනවා. සික්ෂාපදවල සමාදන්ව හික්මෙනවා. කුසල්සහගත කායකර්මයෙන් හා වචිකර්මයෙන් යුතු වෙනවා. පිරිසිදු ආජීවයෙන් යුතු වෙනවා. සිල්වත් වෙනවා. අකුසලයෙන් වැළකූ දොරටු ඇතුව ඉන්නවා. නුවණින් සළකා ආහාර ගන්නවා. සිහිනුවණින් යුතුව ඉන්නවා. ලද දෙයින් සතුටුව ඉන්නවා.

34. කථඤ්ච අම්බට්ඨ භික්ඛු සීලසම්පන්නෝ හෝති? ඉධ අම්බට්ඨ භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ හෝති. නිහිතදණ්ඩෝ නිහිතසත්ථෝ ලජ්ජී දයාපන්නෝ සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

34. පින්වත් අම්බට්ඨ, භික්ෂුව සීලයෙන් යුක්ත වන්නේ කොහොම ද? පින්වත් අම්බට්ඨ, මෙහි භික්ෂුව සතුන් මැරීම අත්හැර දාල සතුන් මැරීමෙන් වැළකී ඉන්නවා. දඬු මුගුරු අත්හැර දාල, අවි ආයුධ බැහැර කරලා, පවට

ලැජ්ජා ඇතිව ඉන්නවා. සතුන් කෙරෙහි දයාවන්ත වෙනවා, සියව් ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතෝ හෝති. දින්නාදායී දින්නපාටිකංඛී අථේනේන සුචිභූතේන අත්තනා විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

නුදුන් දේ ගැනීම අත්හැරලා නුදුන් දේ ගැනීමෙන් වැළකී ඉන්නවා. දුන් දේ පමණක් පිළිගන්නවා. දුන් දේ පමණක් පිළිගනු කැමති වෙනවා. සොර රහිත සිතින් යුතු වූ පිරිසිදු සිතින් යුතු වූ ජීවිතයකින් වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හෝති. ආරාචාරී විරතෝ මේථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

අබ්‍රහ්මචාරී බව අත්හැරලා බ්‍රහ්මචාරීව ඉන්නවා. ලාමක දෙයක් වූ මෛථුන සේවනයෙන් වැළකී එය දුරින් ම දුරුකර දමනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතෝ හෝති. ස-චවාදී ස-චසන්ධෝ ථේතෝ ප-චයිකෝ අවිසංවාදකෝ ලෝකස්ස. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

බොරු කීම අත් හැරල, බොරු කීමෙන් වැළකී ඉන්නවා. සත්‍යය කථා කරනවා. ඇත්තෙන් ඇත්ත ගලපනවා. ස්ථිරව පිහිටලා කථාකරනවා. පිළිගත හැකි දේ කථා කරනවා. ලෝකයාව රවටන්නේ නෑ. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතෝ හෝති. ඉතෝ සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමේසම්භේදාය. අමුත්‍ර වා සුත්වා න ඉමේසං අක්ඛාතා අමූසම්භේදාය. ඉති භින්නානං වා සන්ධාතා සංහිතානං වා අනුප්පදාතා. සමග්ගාරාමෝ සමග්ගරතෝ සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

කේලාම් කීම අත්හැරලා කේලාම් කීමෙන් වැළකී ඉන්නවා. මෙතැනින් අහලා මේ අය බිඳවන්නට අතන කියන්නෙ නෑ. අතනින් අහලා ඒ උදවිය බිඳවන්නට මෙතැන කියන්නේ නෑ. මේ අයුරින් බිඳුනු උදවිය සමගි කරවනවා.

සමගි වූවන්ට අනුබල දෙනවා. සමගි වූවන් හා වාසයට කැමති යි. සමගි වූවන් හා එක්ව වසනවා. සමගි වූවන් සමඟ සතුටු වෙනවා. සාමය උදෙසා සාමකාමී වචන කතා කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතෝ හෝති. යා සා වාචා නේළා කණ්ණසුඛා පේමනීයා හදයංගමා පෝරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

පරුෂ වචනය අත්හැරලා පරුෂ වචනයෙන් වැළකී ඉන්නවා. යම් වචනයක් දොස් රහිත නම්, කණට සැප නම්, ආදරවන්ත නම්, හෘදයාංගම නම්, ශිෂ්ට සම්පන්න නම්, බොහෝ ජනයා කැමති නම්, බොහෝ ජනයාට ප්‍රියමනාප නම් එබඳු වූ වචන පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතෝ හෝති. කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී, නිධානවතිං වාචං භාසිතා හෝති කාලේන සාපදේසං පරියන්තවතිං අත්ථසංහිතං. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

තේරුමක් නැති කතා බහ අත් හැරලා තේරුමක් නැති කතා කීමෙන් වැළකී සිටිනවා. කල් යල් බලා කථා කරනවා. ඇත්ත කතා කරනවා. අර්ථවත් දෙය කතා කරනවා. ධර්මය ම කථා කරනවා. විනය ම කථා කරනවා. සිත්හි ලා දරාගැනීමට සුදුසු, වෙලාවට ගැලපෙන උපදේශ සහිත වූ, මදිපාඩුකම් නො තබා, ප්‍රමාණවත් පරිදි, දෙලොව යහපත පිණිස වූ දේ පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

35. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඒකභත්තිකෝ හෝති රත්තූපරතෝ පටිවිරතෝ විකාලභෝජනා. න-චගීතවාදිත-විසූකදස්සනා පටිවිරතෝ හෝති. මාලාගන්ධවිලේපනධාරණමණ්ඩන-විභූසනට්ඨානා පටිවිරතෝ හෝති. උ-චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ජාතරූපරජත පටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකධඤ්ඤ පටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකමංස පටිග්ගහණා පටිවිරතෝ හෝති. ඉත්ථිකුමාරික- පටිග්ගහණා පටිවිරතෝ හෝති. දාසිදාසපටිග්ගහණා පටිවිරතෝ හෝති. අජේළකපටිග්ගහණා පටිවිරතෝ හෝති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතෝ හෝති. හත්ථිගාවස්සවළව-පටිග්ගහණා පටිවිරතෝ හෝති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතෝ

හෝති. දූතෙය්‍යපහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. කයවික්කයා පටිවිරතෝ හෝති. තුලාකූටකංසකූටමානකූට පටිවිරතෝ හෝති. උක්කෝටනවඤ්චනනිකතිසාචියෝගා පටිවිරතෝ හෝති. ඡේදනවධබන්ධන-විපරමෝසආලෝපසහසාකාරා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

35. පැලවෙන බීජ හා පැල වුණ ගස් කොළන් විනාශ කිරීමෙන් වැළකී ඉන්නවා. එක් වරුවේ බොජුන් වළඳනවා. රාත්‍රී ආහාරයෙන් වැළකී විකාල භෝජනයෙන් වැළකී ඉන්නවා. නැටුම්, ගැයුම්, වැයුම් හා විසූක දර්ශනයන් නැරඹීමෙන් වැළකී ඉන්නවා. මල් සුවඳ විලවුන් දැරීමෙන් ද ඇඟපත සැරසීමෙන් ද විසිතුරු වස්ත්‍රාභරණයෙන් සැරසීමෙන් ද වැළකී ඉන්නවා. ප්‍රමාණය ඉක්ම වූ උස් ආසන ද වටිනා සුඛෝපභෝගී ආසන ද පරිහරණයෙන් වැළකී ඉන්නවා. රන් රිදී මිල මුදල් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු ධාන්‍ය පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු මස් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ස්ත්‍රීන්, කුමරියන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. දැසි දස්සන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. එළුබැටළුවන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කුකුළන් ඌරන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ඇතුන් ගවයන් අසුන් වෙළඹුන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කෙත් වතු පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ගිහි කටයුතු සඳහා දූත මෙහෙවර කිරීමෙන් වැළකී ඉන්නවා. වෙළඳාම් කිරීමෙන් වැළකී ඉන්නවා. තරාදියෙන් රැවටීම, නො වටනා දෙයින් රැවටීම, මිනුමෙන් රැවටීම යන මෙයින් වැළකී ඉන්නවා. අල්ලස් ගෙන හිමිකරුවන් ගේ දේ අහිමි කිරීම, වංචා කිරීම, බාලදේ වටිනා දේ හැටියට පෙන්වීම, ආදී නොයෙක් වංචනික දෙයින් වැළකී ඉන්නවා. අත්පා කැපීම් මැරීම් බන්ධන කිරීම් මං පැහැරගැනීම්, ගම් පැහැර ගැනීම් ආදී සැහැසි දෙයින් වැළකී සිටිනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

36. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං බීජගාමභූතගාමසමාරම්භ‍ං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීද‍ං: මූලබීජ‍ං ඛන්ධබීජ‍ං ඵ්ඵුබීජ‍ං අග්ගබීජ‍ං බීජබීජමේව පඤ්චම‍ං. ඉති වා ඉති ඒවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

36. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ විදිහේ පැලවෙන දේ හා ගස් කොළන් ආදිය වනසමින් ඉන්නවා. ඒ කියන්නේ මුලින් පැලවෙන දේවල්, කඳින්

පැලවෙන දේවල්, පුරුකින් පැලවෙන දේවල්, දල්ලෙන් පැලවෙන දේවල්, බිජුවටින් පැලවෙන දේවල් යන ආදිය වනසමින් ඉන්නවා. ගස් කොළන් සිඳලීම් ආදී මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලිනුත් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

37. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං සන්නිධිකාරපරිභෝගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉති ඒවරූපා සන්නිධිකාරපරිභෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

37. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ දේ රැස්කරගෙන පරිභෝග කරමින් වාසය කරනවා. ඒ කියන්නේ කෑම වර්ග රැස් කරලා තියාගන්නවා. බීම වර්ග රැස් කරලා තියාගන්නවා. වස්ත්‍ර රැස් කරලා තියාගන්නවා. යාන වාහන රැස් කරලා තියාගන්නවා. ඇඳ පුටු මේස රැස් කරලා තියාගන්නවා. සුවඳ වර්ග රැස් කරලා තියාගන්නවා. තවත් ආමිස රැස් කරලා තියාගන්නවා. මෙවැනි හෝ මෙවැනි වෙනත් දේවල් හෝ රැස්කරගෙන පරිහරණය කිරීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

38. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: න-ච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වේතාලං කුම්භථූනං සෝභනකං චණ්ඩාලං වංසං ධෝවනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යෝධිකං බලග්ගං සේනාබ්‍යූහං අනීකදස්සනං. ඉති වා ඉති ඒවරූපා විසූකදස්සනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

38. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයේ විසූක දර්ශනයන් නැරඹීමෙහි යෙදිල ඉන්නවා. ඒ කියන්නේ නැටුම්, ගැයුම්, වැයුම්, නාටක, පැරණි කථා රහදැක්වීම්, අත්තාල ගසා නැටීම්, වේතාල නැටීම්, බෙර වාදන කිරීම්,

රහමඩලෙහි දේවතාවන්ට පූජා පිණිස නැටීම්, උණ ගසින් කරන ක්‍රීඩා, මිනී ඇට මැද තබා වටකොට නැටීම්, ඇත් යුධ බැලීම්, අශ්ව යුධ බැලීම්, ගොන් පොර බැලීම්, එළු පොර බැලීම්, බැටළු පොර බැලීම්, කුකුළු පොර බැලීම්, වටු පොර බැලීම්, පොව් හරඹ බැලීම්, මිටි හරඹ බැලීම්, මල්ලව පොර බැලීම්, යුධ සේනා බලන්ට යෑම, බලසෙන් ගණිත තැන් බලන්ට යාම, බලසෙනඟ විසිරුවන තැන් බලන්ට යාම ආදී දේවල්වල යෙදෙමින් ඉන්නවා. මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලින් යුතු විසූක දර්ශන නැරඹීම්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

39. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං ජූතප්පමාදට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං බලිකං සටිකං සලාකහත්ථං අක්ඛං පංගචිරං වංකකං මොක්ඛචිකං චිංගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනේසිකං යථාවජ්ජං. ඉති වා ඉති ඒවරූපා ජූතප්පමාදට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි 'ස්ස හෝති සීලස්මිං.

39. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල තමාව ප්‍රමාදයට පත් කරවන මේ ආකාර වූ සූදු කෙළියෙන් කල් යවනවා. ඒ කියන්නේ හතරැස් කොටු අටකින් යුතුව කරණ සූදුව, කොටු දහයකින් කරන සූදුව, අහසේ රූ අඳිමින් කරන සූදුව, කොටු පැනීමෙන් කරණ සූදුව, සන්තික නම් වූ සූදුව, දාදු කැටයෙන් කරන සූදුව, කල්ලි ගැසුම, බුරුවා ගැසීම, ගුළ කෙළිය, නළා පිඹීම, කරණම් ගැසීම, මුගුරක් ගෙන උඩ යට වැටෙන පරිදි උඩට ගැසීම, කොළවලින් කළ ගොටුවලින් තරහෙට වැලි මැනීම, කුඩා රිය තරහ, කුඩා දුනුවලින් විදීමේ තරහ, අකුරු ලිවීමේ සෙල්ලම, සිතූ දේ කියන සෙල්ලම, විකලාංග අනුකරණයෙන් හිනැස්සීමේ සෙල්ලම ආදී දේ කිරීමයි. මේ දෙයිනුත් මෙවැනි තවත් දේවල් ඇත්නම් එයිනුත් වැළකී ප්‍රමාදයට පත්වන සූදුවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

40. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං උ-චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: ආසන්දිං පල්ලංකං ගෝනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලෝමිං ඒකන්තලෝමිං කට්ඨිස්සං කෝසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවේණිං කාදලිමිගපවරප-ච-

න්ථරණං සඋත්තර-ඡදං උභතෝලෝහිතකූපධානං. ඉති වා ඉති ඒවරූපා උ-චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

40. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ පමණ ඉක්මවා උස් වූ ආසනත් වටිනා සුඛෝපභෝගී ආසනත් පරිහරණය කරනවා. ඒ කියන්නේ දිග හාන්සි පුටු, කවිච්චි, ලොකු පලස් යෙදූ ආසන, විසිතුරු ගෙත්තම් කළ එළු ලොම් ඇතිරිළි, සුදු එළු ලොමින් කළ ඇතිරිළි, මල් යෙදූ එළු ලොමින් කළ ඇතිරිළි, පුළුන් යෙදූ මෙට්ට, සත්ව රූපවලින් සැරසූ එළු ලොම් ඇතිරිළි, මුළුමණින්ම එළු ලොමින් කළ ඇතිරිළි, රන් නූලෙන් සැරසූ කලාල, පට නූලෙන් කළ කලාල, නාටිකාංගනාවන් ඒමත නැටිය හැකි එළු ලොමින් කළ කලාල, ඇතුන් පිට යොදන ඇතිරිළි, අසුන් පිට යොදන ඇතිරිළි, රථවල යොදන ඇතිරිළි, අඳුන් දිවි සමෙන් කළ ඇතිරිළි, කදලි මුව සමෙන් කළ කලාල, හිස දෙපැත්තට රතු විල්විද කොට්ට තබා රතු උඩුවියන් බැඳ සැදූ වටිනා යහන් ආදිය පරිහරණය කරයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී උස් අසුන් මහා අසුන් පරිහරණයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

41. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං මණ්ඩනවිභූසනට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීද‍ං: උ-ඡාදන‍ං පරිමද්දන‍ං නහාපන‍ං සම්බාහන‍ං ආදාස‍ං අඤ්ජන‍ං මාලාවිලේපන‍ං මුඛචුණ්ණක‍ං මුඛලේපන‍ං හත්ථබන්ධ‍ං සිඛාබන්ධ‍ං දණ්ඩක‍ං නාළික‍ං අසි‍ං ඡත්ත‍ං චිත්‍රූපාහන‍ං උණ්හීස‍ං ඛග්ග‍ං මණි‍ං වාලවිජනි‍ං විදාතානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති ඒවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මි‍ං.

41. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් ඇඟපත සැරසීමෙන් හා විසිතුරු වස්ත්‍රාභරණ පැළඳීමෙන් යුක්තව කල් ගෙවනවා. ඒ කියන්නේ සුවඳ වර්ග ඇඟ තවරා සිරුර සිනිඳු කිරීම, තෙල් වර්ග ගා සම්බාහනය කොට සිරුර හැඩ කිරීම, සුවඳපැන් නෑම, උරහිස් ආදියෙහි මස් වැඩීමට මුගුරෙන් තැලීම, කැඩපතින් මුහුණ බලා සැරසීම, ඇස්වල අඳුන් ගෑම, මල් හා සුවඳ විලවුන් දැරීම, මුව සුවඳ කිරීම, මුව විලවුන් දැරීම, අත්වල ආභරණ දැමීම, හිසෙහි කුඩුම්බි දැරීම, විසිතුරු සැරයැටි දැරීම, විසිතුරු බෙහෙත් නල දැරීම,

විසිතුරු කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නලල් පට දැරීම, මැණික් පැළඳීම, චාමර දැරීම, දිග වාටි ඇති සුදු වස්ත්‍ර දැරීම ආදියෙන් යුතුවෙයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී ඇහපත සැරසීම් හා විසිතුරු වස්ත්‍රාභරණ සැරසීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

42. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං තිර-ඡානකත‍ං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද‍ං: රාජකථ‍ං චෝරකථ‍ං මහාමත්තකථ‍ං සේනාකථ‍ං භයකථ‍ං යුද්ධකථ‍ං අන්නකථ‍ං පානකථ‍ං වත්ථකථ‍ං සයනකථ‍ං මාලාකථ‍ං ගන්ධකථ‍ං ඤාතිකථ‍ං යානකථ‍ං ගාමකථ‍ං නිගමකථ‍ං නගරකථ‍ං ජනපදකථ‍ං ඉත්ථිකථ‍ං පුරිසකථ‍ං කුමාරකථ‍ං කුමාරීකථ‍ං සූරකථ‍ං විසිඛාකථ‍ං කුම්භට්ඨානකථ‍ං පුබ්බපේතකථ‍ං නානත්තකථ‍ං ලෝකක්ඛායික‍ං සමුද්දක්ඛායික‍ං ඉතිභවාභවකථ‍ං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මි‍ං.

42. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරිසන් කථාවල යෙදී වාසය කරනවා. ඒ කියන්නේ, රජවරුන් ගැන කථා, සොරුන් ගැන කථා, මහ ඇමතිවරුන් ගැන කථා, හමුදාවන් ගැන කථා, භය ඇතිවෙන දේවල් ගැන කථා, ආහාර වර්ග ගැන කථා, බොන දේවල් ගැන කථා, ඇඳුම් පැළඳුම් ගැන කථා, ඇඳ පුටු ගැන කථා, මල් වර්ග ගැන කථා, සුවඳ වර්ග ගැන කථා, නෑදෑයන් ගැන කථා, යාන වාහන ගැන කථා, ගම්මාන ගැන කථා, නියම් ගම්මාන ගැන කථා, නගර ගැන කථා, රටවල් ගැන කථා, ස්ත්‍රීන් ගැන කථා, පුරිෂයින් ගැන කථා, කුමාරයින් ගැන කථා, කුමරියන් ගැන කථා, ශූරයින් ගැන කථා, මංමාවත් ගැන කථා, වල‍ං පොලේ දේවල් ගැන කථා, මියගිය උදවිය ගැන කථා, තව තව දේවල් ගැන කථා, ලෝකය ගැන කථා, සාගරය ගැන කථා, මෙහෙමයි වුණේ මෙහෙමයි නොවුණේ කියන දේ ගැන කථා කරකර ඉන්නවා, මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරිසන් කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

43. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං විග්ගාහිකකථ‍ං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද‍ං: න ත්වං ඉම‍ං ධම්මවිනය‍ං ආජානාසි. අහ‍ං ඉම‍ං ධම්මවිනය‍ං

ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මි-ඡාපටිපන්නෝ ත්වමසි, අහමස්මි සම්මා පටිපන්නෝ. සහිතං මේ, අසහිතං තේ. පුරේ වචනීයං ප-ඡා අවච. ප-ඡා වචනීයං පුරේ අවච. ආචිණ්ණං තේ විපරාවත්තං. ආරෝපිතෝ තේ වාදෝ. නිග්ගහිතෝ ත්වමසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බේඨේහි වා ස- පහෝසීති. ඉති වා ඉති ඒවරූපාය විග්ගාහිකකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

43. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් එකිනෙකා අතර බැණ දොඩා ගන්නා කථාවෙන් යුතුව යි ඉන්නෙ. ඒ කියන්නේ "නුඹ මේ ධර්ම විනය දන්නෙ නෑ. මම තමයි මේ ධර්ම විනය දන්නේ, ආ ... එහෙම ද එතකොට නුඹද මේ ධර්ම විනය දන්නේ? නුඹ ඉන්නේ මිත්‍යා වැඩපිළිවෙලක යි. මම තමයි නියම වැඩපිළිවෙල තුළ ඉන්නේ. මං කරුණු සහිතව යි කියන්නේ. නුඹේ කීම කරුණු රහිත යි. නුඹ කලින් කිව්යුතු දේ පස්සේ කිව්වා. පස්සේ කිව්යුතුදේ කලින් කිව්වා. නුඹ කලක් තිස්සේ කියපු දේ කණපිට පෙරළෙනා. මා විසින් නුඹට වාද නංවල යි තියෙන්නේ. නුඹට නිග්‍රහ කරල යි තියෙන්නේ. වාදයෙන් නිදහස් වීමට මගක් හොයාගෙන පලයන්. පුළුවන් නම් ලෙහාගනින්" යනාදිය කියමින් ආරවුල් හදාගන්නවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ බැණ දොඩාගන්නා කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

44. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං දූතෙය්‍යපහිණගමනානුයෝගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං "ඉධ ග-ඡ. අමුත්‍රාග-ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉති ඒවරූපා දූතෙය්‍යපහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

44. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල ගිහියන් ගේ පණිවිඩ පණත් ගෙන යන මෙබඳු වූ දූත මෙහෙවරෙහි යෙදෙනවා. ඒ කියන්නේ, "මෙහෙ යන්න, අසවල් තැනට එන්න, මේක (අපේ මේ පණිවිඩය) අරන් යන්න. අසවල් තැනට මේක අරන් යන්න" යනාදී රජුන් ගේ, රාජමහා ඇමතිවරුන් ගේ, ක්ෂත්‍රියයන් ගේ, බ්‍රාහ්මණයන් ගේ, ගෘහපතියන් ගේ, කුමාරවරුන් ගේ, පණිවුඩ පණත් ගෙනියනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ

පණිවුඩ පණත් ගෙනයන ගිහියන්ගේ දූත මෙහෙවරෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

45. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ කුහකා ච හොන්ති ලපකා ච නේමිත්තිකා ච නිප්පේසිකා ච ලාභේන ලාභං නිජිගිංසිතාරෝ ච. ඉති වා ඉති ඒවරූපා කුහනලපනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

45. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල කුහක (උඩින් වෙන ජීවිතයක් පෙන්වමින් යටින් වෙනත් ජීවිතයක් ගෙවමින් නැති ගුණ පෙන්වා) ජීවිත ගෙවනවා. ලාභ සත්කාර ලැබෙන විදිහට (පුහු වර්ණනා කිරීම්, තොදොල් කිරීම්, නැති ගුණ කීම් ආදී) චාටු බස් කියනවා. දායකයින් හට නො දී බැරි තත්වයට පත් වෙන ආකාරයේ නිමිති දක්වමින් කථා කරනවා. තමන්ට ලැබෙන විදිහට අනුන්ට ගරහනවා. ලාභයෙන් ලාභය හොයනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ කුහකකමින් චාටුබස්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

46. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: අංගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසික-ඡින්නං අග්ගිහෝමං දබ්බිහෝමං ථුසහෝමං කණහෝමං තණ්ඩුලහෝමං සප්පිහෝමං තේලහෝමං මුඛහෝමං ලෝහිතහෝමං අංගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා වි-ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගචක්ඛං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

46. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙවැනි වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ ශාරීරික අංග බලා ඵලාඵල කියනවා, නිමිති බලා ඵලාඵල කියනවා, උත්පාත බලා ඵලාඵල කියනවා, සිහින ඵලාඵල කියනවා, ශාරීරික ලක්ෂණ බලා ඵලාඵල කියනවා, මීයන් කෑ වස්ත්‍ර බලා ඵලාඵල කියනවා, ගිනි පූජා පවත්වනවා, හැන්දෙන් පූජා පවත්වනවා, ධාන්‍ය පොතුවලින් පූජා පවත්වනවා. කණ නම් සහලින් කළ

පූජා පවත්වනවා, සහලින් පූජා පවත්වනවා, ගිතෙලින් පූජා පවත්වනවා, තල තෙලින් පූජා පවත්වනවා, විශේෂ කොට කරණ පූජා පවත්වනවා, සතුන් මරා ලේ පුදා කරන පූජා පවත්වනවා, අංග විද්‍යාව, වාස්තු විද්‍යාව, දේශපාලන විද්‍යාව, වාසනාව උරගා බැලීමේ (ලොතරැයි) විද්‍යාව, භූත විද්‍යාව, පොළොව යට බිම් ගෙයක ඉඳ මැතිරීමෙන් කරන (භූරි) විද්‍යාව, සර්ප විද්‍යාව, විෂ විද්‍යාව, වෘශ්චික විද්‍යාව, මූෂක විද්‍යාව, පක්ෂි විද්‍යාව, විශාල පක්ෂි විද්‍යාව, ඉදුණු දේ මුල් කොට අනාවැකි කියන විද්‍යාව, මතුරන ලද ඊතල විද ආරක්ෂා කරන විද්‍යාව, මෘග පක්ෂ යනාදී මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

47. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරීලක්ඛණං දාසලක්ඛණං දාසීලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගෝලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගෝධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං ක-ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

47. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ මැණික්වල සුභ අසුභ ලකුණු කීම, දඬුවල සුභ අසුභ ලකුණු කීම, වස්ත්‍රවල සුභ අසුභ ලකුණු කීම, කඩු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ඊතල ආදී සලකුණුවලින් සුභාසුභ කීම, දුනු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ආයුධ ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ස්ත්‍රීන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, පුරුෂයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දරුවන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දැරියන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසීයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, ඒ ඒ කටයුතු සඳහා තෝරා ගත යුතු ඇතුන් ගේ ලකුණු කීම, අසුන් ගේ ලකුණු කීම, ඔටුවන් ගේ ලකුණු කීම, වෘෂභයන් ගේ ලකුණු කීම, ගවයන් ගේ ලකුණු කීම, එළුවන්

ගේ ලකුණු කීම, බැටළුවන් ගේ ලකුණු කීම, කුකුළු පොර ආදියට සුදුසු කුකුළන් ගේ ලකුණු කීම, වටුවන් ගේ ලකුණු කීම, සුභුනන් ඇහ වැටීමේ සහ හඬනැගීමේ ඵලාඵල කීම, කණෙහි පළඳාගත් උපකරණවලින් ඵලාඵල කීම, කැස්බෑවන්ට මතුරා ඵලාඵල කීම, මුවන්ට මතුරා ඵලාඵල කීම ආදී තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

48. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති. රඤ්ඤං අනිය්‍යානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයෝ භවිස්සති. බාහිරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයෝ භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. ඉති ඉමස්ස ජයෝ භවිස්සති. ඉමස්ස පරාජයෝ භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

48. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් නැකතට රජතුමා ගේ යුධ පිණිස නික්මීම වන්නේ ය. අසවල් නැකතින් ආපසු නුවරට ඇතුළ්වීම සිදු කළ යුත්තේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිට පිටත සතුරු රජුන් හමුවීමට රජු ගේ ගමන කළයුත්තේ ය. අසවල් නැකතින් පිටත සිටින රජවරු රට ඇතුළට පැමිණීම වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජු ගේ ඉවත්වීම සිදුවන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජුට ජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුනට පරාජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුන්ට ජය වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ රජුට පරාජය වන්නේ ය කියල මොහුට ජය වෙනවා. මොහුට පරාජය වෙනවා" ආදී වශයෙන් පවසමින් තිරිසන් විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

49. "යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: චන්දග්ගාහෝ භවිස්සති, සුරියග්ගාහෝ භවිස්සති, නක්ඛත්තග්ගාහෝ භවිස්සති, චන්දිමසුරියානං පථගමනං භවිස්සති, චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, නක්ඛත්තානං පථගමනං භවිස්සති, නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, උක්කාපාතෝ භවිස්සති, දිසාඩාහෝ භවිස්සති, භූමිචාලෝ භවිස්සති, දේවදුන්දුභි භවිස්සති, චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමන විගමන සංකිලේස වෝදානං භවිස්සති, ඒව විපාකෝ චන්දග්ගාහෝ භවිස්සති, ඒව විපාකෝ සුරියග්ගාහෝ භවිස්සති, ඒව විපාකෝ නක්ඛත්තග්ගාහෝ භවිස්සති, ඒව විපාක චන්දිමසුරියානං පථගමනං භවිස්සති, ඒව විපාක චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, ඒව විපාක නක්ඛත්තානං පථගමනං භවිස්සති, ඒව විපාක නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, ඒව විපාකෝ උක්කාපාතෝ භවිස්සති, ඒව විපාකෝ දිසාඩාහෝ භවිස්සති, ඒව විපාකෝ භූමිචාලෝ භවිස්සති, ඒව විපාකෝ දේවදුන්දුභි භවිස්සති, ඒව විපාක චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමන විගමන සංකිලේස වෝදානං භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

49. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් දින චන්ද්‍රග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සූර්යග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින නැකත් ග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නිසිමඟින් යෑම සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නොමඟින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නිසි මඟින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නොමඟින් යෑම සිදුවෙනවා. අසවල් දින උල්කාපාත වැටෙනවා. අසවල් දින අසවල් දිශාවේ උෂ්ණත්වය වැඩිවෙනවා. අසවල් දින භූමි කම්පාවක් සිදුවෙනවා. අසවල් දින වැසි රහිතව අහස ගුගුරනවා. හිරු සඳු හා නැකත්වල උදාව, බැසීම, කෙලෙසීම, පිරිසිදු වීම මේ මේ වෙලාවට සිදුවෙනවා. චන්ද්‍ර ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. සූර්ය ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. නැකත් ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නිසිගමන මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නොමඟ යෑම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. උල්කාපාත වැටීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. දිශා දාහය මෙවැනි ඵල විපාක ලබා

දෙනවා. භූකම්පන මෙවැනි ඵල විපාක ලබා දෙනවා. වැසි නැතිව අහස ගිගිරීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. හිරු සඳු හා නැකත්වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම ලෝකයට මෙවැනි විපාක ලබා දෙනවා" කියල තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

50. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: සුබ්බුට්ඨිකා භවිස්සති, දුබ්බුට්ඨිකා භවිස්සති, සුභික්ඛං භවිස්සති, දුබ්භික්ඛං භවිස්සති, ඛේමං භවිස්සති, භයං භවිස්සති, රෝගෝ භවිස්සති, ආරෝග්‍යං භවිස්සති, මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලෝකායතං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

50. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "මේ කාලයේ දී වැස්ස වහිනවා. මේ කාලයේ දී නියහය ඇතිවෙනවා. මේ කාලයේ දී ආහාරපාන සරු වෙනවා. මේ කාලයේ දී දුර්භික්ෂය ඇතිවෙනවා. මේ කාලයේ දී රට සරුවෙනවා. මේ කාලයේ දී බිය සැක නැතිව ඉන්නවා. මේ කාලයේ දී භය උපදිනවා. මේ කාලයේ දී රෝග ඇති වෙනවා. මේ කාලයේ දී නීරෝග බව ඇති වෙනවා කියමින් එලාඵල පැවසීමත් මුද්‍රා, ගණිත, සංඛ්‍යාන, කාව්‍ය ශාස්ත්‍ර, ලෝකායත ශාස්ත්‍ර ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

51. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හා-නිත්ථම්භනං හනුසංහනනං හත්ථාභිජප්පනං හනුජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිකාපඤ්හං දේවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්භායනං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

51. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, විවාහයට නැකත් කීම, ආවාහයට නැකත් කීම, වෙන් වූ අඹු සැමියන් එක් කිරීමට නැකත් සැදීම, එක් වූ අඹු සැමියන් වෙන් කිරීමට නැකත් සැදීම, දීපු ණය එකතු කිරීමට නැකත් සැදීම, මුදල් ණයට පොලියට දීමට නැකත් සැදීම, දියුණු වීමට ගුරුකම් කිරීම, පාළුවී නැති වීමට ගුරුකම් කිරීම, දරුගැබ් රැකෙන්නට ගුරුකම් කිරීම, දිව අගුළු බැඳෙන්නට ගුරුකම් කිරීම, හනු තද කරන්නට ගුරුකම් කිරීම, අත් පෙරලෙන්නට ගුරුකම් කිරීම, හනු සිරවෙන්නට ගුරුකම් කිරීම, කණ් අගුළු වැටෙන්නට ගුරුකම් කිරීම, කණ්ණාඩියෙන් භූතයන් කැඳවා ප්‍රශ්න විචාරීම, ගෑණු දරුවන් ලවා පේන කීම, දෙවියන් ලවා පේන කීම, සූර්ය වන්දනාව, මහ බඹු වන්දනාව, මන්ත්‍ර බලයෙන් කටින් ගිනිදැල් පිටකිරීම, මන්ත්‍ර බලෙන් ලක්ෂ්මී පූජා කිරීම යනාදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

52. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: සන්තිකම්මං පණිධිකම්මං භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපනං ජුහනං වමනං විරේචනං උද්ධවිරේචනං අධෝවිරේචනං සීස-විරේචනං කණ්ණතේලං නෙත්තපතප්පනං නත්ථුකම්මං අඤ්ජනං ප-චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකි-ඡා මූලභේසජ්ජානං අනුප්පදානං විසඨීනං පටිමොක්ඛෝ. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

52. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, ශාන්ති කර්ම, බාර ඔප්පු කිරීම, පොළොව යට හිඳ මතුරා ගුරුකම් කිරීම, නපුංසකයා පිරිමියෙකු කිරීම, පිරිමියා නපුංසකයෙකු කිරීම, ගෙවල් තැනීමේ දිශාවන් පෙන්වා දීම, අළුතෙන් නිවාස තැනීමේදී පුද පූජා පැවැත්වීම, වතුර මතුරා මූණ සේදවීම, වතුර මතුරා නැහැවීම, ගිනිපිඳීම, ලය විරේක කරවීම, බඩ විරේක කරවීම, වමනය කරවීම, වස්ති කරවීම, ශීර්ෂ විරේකය, කණට තෙල් පිඹීම, ඇස් වෙදකම,

නස්න කිරීම, ඇස්වලට අඳුන් සෑදීම, ප්‍රති අංජන සෑදීම, ශල්‍ය කර්ම කිරීම, ළදරු චිකිත්සාව, කාය චිකිත්සාව, වනවලට බෙහෙත් බැඳීම ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

53. අථ ඛෝ සෝ අම්බට්ඨ භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෙය්‍යථාපි අම්බට්ඨ ඛත්තියෝ මුද්ධාවසිත්තෝ නිහතප-චාමිත්තෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං ප-චත්ථිකතෝ. ඒවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෝ ඉමිනා අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ අම්බට්ඨ භික්ඛු සීලසම්පන්නෝ හෝති.

53. පින්වත් අම්බට්ඨ, ඒ භික්ෂුව වනාහී මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. ඔටුනු පළන් රජ කෙනෙක් ඉන්නවා. ඔහු සතුරන් පරදවල බැහැර කරලයි ඉන්නේ. ඉතින් ඔහු සතුරන් හේතුවෙන් මොන ම අයුරකින්වත් භයක් දකින්නේ නෑ. පින්වත් අම්බට්ඨ, භික්ෂුවත් ඔය විදිහම යි. මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් සමන්විතව ආධ්‍යාත්මිකව නිවැරදි සැපයක් විඳිනවා. පින්වත් අම්බට්ඨ, ඔන්න විදිහට යි භික්ෂුව සීලසම්පන්න වන්නේ.

54. කථඤ්ච අම්බට්ඨ භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති? ඉධ අම්බට්ඨ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියේ සංවරං ආපජ්ජති. සෝතේන සද්දං සුත්වා ..... ඝාණේන ගන්ධං ඝායිත්වා ..... ජිව්හාය රසං ඝායිත්වා ..... කායේන ඵොට්ඨබ්බං ඵුසිත්වා ..... මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති.

රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියේ සංවරං ආපජ්ජති. සෝ ඉමිනා අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ අජ්ඣත්තං අබ්‍යාසේකසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ අම්බට්ඨ භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති.

54. පින්වත් අම්බට්ඨ, භික්ෂුව අකුසලයන් වැළකූ ද්වාර ඇති ඉඳුරන් ඇතිව ඉන්නේ කොහොම ද? පින්වත් අම්බට්ඨ, මෙහිලා භික්ෂුව ඇසින් රූප දැක නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් ඇස නැමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. ඇස රැක ගන්නවා. ඇස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. කණෙන් ශබ්දයක් අහලා ..... නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කරලා ..... දිවෙන් රසයක් රස විඳලා ..... කයෙන් පහසක් ලබලා ..... මනසින් අරමුණක් දැන ගෙන නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් මනස නැමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. මනස රැක ගන්නවා. මනස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. ඔහු මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව ආධ්‍යාත්මිකව පීඩා රහිතව සැපයක් විඳිනවා. පින්වත් අම්බට්ඨ, භික්ෂුව අකුසලයෙන් වැළැක් වූ දොරටු ඇති ඉන්ද්‍රියයන් තුළ ඉන්නේ ඔය විදිහට යි.

55. කථඤ්ච අම්බට්ඨ භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති? ඉධ අම්බට්ඨ, භික්ඛු අභික්කන්තේ පටික්කන්තේ සම්පජානකාරී හෝති. ආලෝකිතේ විලෝකිතේ සම්පජානකාරී හෝති. සම්මිඤ්ජිතේ පසාරිතේ සම්පජානකාරී හෝති. සංඝාටිපත්තචීවරධරණේ සම්පජානකාරී හෝති. අසිතේ පීතේ ඛායිතේ සායිතේ සම්පජානකාරී හෝති. උච්චාරපස්සාවකම්මේ සම්පජානකාරී හෝති. ගතේ ඨිතේ නිසින්නේ සුත්තේ ජාගරිතේ භාසිතේ තුණ්හීභාවේ සම්පජානකාරී හෝති. ඒවං ඛෝ අම්බට්ඨ භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති.

55. පින්වත් අම්බට්ඨ, භික්ෂුව සිහිනුවණින් යුතුව සිටින්නේ කොහොම ද? පින්වත් අම්බට්ඨ, මෙහිලා භික්ෂුව ඉදිරියට යද්දීත්, ආපසු එද්දීත්, එය කරන්නේ සිහි නුවණින් ම යි. ඉදිරිය බලද්දී, වටපිට බලද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. අතපය හකුළද්දී, දිගහරිද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. දෙපට සිවුර, පාත්‍රය, අනෙක් සිවුරු ආදිය දරද්දී එය කරන්නෙත්

සිහිනුවණින් ම යි. වළඳද්දී පානය කරද්දී අනුභව කරද්දී රස විඳිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. වැසිකිළි කැසිකිළි යාමේ දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. ගමන් කරද්දී, සිටගෙන සිටිද්දී, වාඩි වී සිටිද්දී, සැතපෙද්දී, නිදිවරද්දී, කථාබස් කරද්දී, නිහඬව සිටිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. පින්වත් අම්බට්ඨ, භික්ෂුව සිහිනුවණින් යුතු වන්නේ ඔය ආකාරයට යි.

56. කථඤ්ච අම්බට්ඨ භික්ඛු සන්තුට්ඨෝ හෝති? ඉධ අම්බට්ඨ භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරිකේන චීවරේන කු-ඡිපරිහාරිකේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. සෙය්‍යථාපි අම්බට්ඨ පක්ඛී සකුණෝ යේන යේනේව ඩේති සපත්තභාරෝ'ව ඩේති, එවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරිකේන චීවරේන කු-ඡිපරිහාරිකේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. එවං ඛෝ අම්බට්ඨ භික්ඛු සන්තුට්ඨෝ හෝති.

56. පින්වත් අම්බට්ඨ, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ කොහොම ද? පින්වත් අම්බට්ඨ, මෙහිලා භික්ෂුව කය පරිහරණයට සැහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සැහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. ඒක මේ වගේ දෙයක්. කුරුල්ලෙක් යම් ම තැනකට පියඹා යනවා නම්, පියාපත් බර පමණක් සහිතව පියඹනවා වගෙයි. පින්වත් අම්බට්ඨ, ඔය අයුරින් ම භික්ෂුව කය පරිහරණයට සැහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සැහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. පින්වත් අම්බට්ඨ, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ ඔය විදිහට යි.

57. සෝ ඉමිනා ච අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතෝ, විවිත්තං සේනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භෝකාසං පලාලපුඤ්ජං. සෝ ප-ඡාහත්තං පිණ්ඩපාතපටික්කන්තෝ නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

57. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ සිහිනුවණින් යුක්ත වෙලා, මේ

ආර්ය වූ ලද දෙයින් සතුටුවීමෙන් යුක්ත වෙලා හුදෙකලා සෙනසුනක වාසය කරනවා. ඒ කියන්නේ ආරණ්‍යය, රුක්සෙවණ, පර්වතය, දිය ඇල්ල, ගිරිගුහාව, සොහොන, වනගැබ, ගස් කොළන් රහිත හිස් පිටිය, පිදුරු ගෙය ආදිය යි. ඔහු පිණ්ඩපාතය වළඳා, දානයෙන් පසු (එවැනි තැනක) පළඟක් බැඳ ගෙන, කය සෘජු කර ගෙන, භාවනා අරමුණෙහි සිහිය පිහිටුවා ගෙන වාඩිවෙනවා.

58. සෝ අභිජ්ඣං ලෝකේ පහාය විගතාභිජ්ඣේන චේතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසෝධේති. බ්‍යාපාදපදෝසං පහාය අබ්‍යාපන්නචිත්තෝ විහරති සබ්බපාණභූත හිතානුකම්පී. බ්‍යාපාදපදෝසා චිත්තං පරිසෝධේති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධෝ විහරති ආලෝකසඤ්ඤී සතෝ සම්පජානෝ. ථීනමිද්ධා චිත්තං පරිසෝධේති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතෝ විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තෝ. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසෝධේති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡෝ විහරති අකථංකථී කුසලේසු ධම්මේසු. විචිකිච්ඡාය චිත්තං පරිසෝධේති.

58. ඔහු ජීවිතය නම් වූ ලෝකය ගැන ඇති විසම ලෝභය දුරු කොට ඇලීම් රහිත වූ සිතින් වාසය කරනවා. විසම ලෝභය කෙරෙන් සිත පිරිසිදු කරනවා. තරහ වෛර ආදිය අත්හැර තරහ නැති සිතින් සියළු සතුන් කෙරෙහි හිතානුකම්පිව වාසය කරනවා. තරහ වෛර ආදිය කෙරෙන් සිත පිරිසිදු කරනවා. නිදිමත අලසකම අත්හැර නිදිමත අලසකමින් බැහැරව ආලෝක සඤ්ඤාවෙන් යුතුව, සිහිනුවණ ඇතිව වාසය කරනවා. නිදිමත අලසකම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සිතේ විසිරීමත්, පසුතැවීමත් බැහැර කොට නො කැළඹී ගිය සංසිඳුනු සිතින් වාසය කරනවා. සිතේ විසිරීම හා පසුතැවීම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සැකය දුරු කොට කුසල් දහම් ගැන කෙසේ ද? කෙසේ ද? යනාදී සැකයෙන් එතෙරව වාසය කරනවා. සැකය කෙරෙන් සිත පිරිසිදු කරනවා.

59. සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසෝ ඉණං ආදාය කම්මන්තේ පයෝජෙය්‍ය, තස්ස තේ කම්මන්තා සම්ඡ්ජේය්‍යුං, සෝ යානි ච පෝරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය, තස්ස එවමස්ස: "අහං බෝ පුබ්බේ ඉණං ආදාය කම්මන්තේ පයෝජේසිං. තස්ස මේ තේ කම්මන්තා සම්ඡ්ඣිංසු. සෝ'හං යානි ච පෝරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීඅකාසිං. අත්ථි ච මේ උත්තරිං අවසිට්ඨං දාරභරණායා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

59. පින්වත් අම්බට්ඨ, එය මෙවැනි දෙයක්. පුරුෂයෙක් ණයක් අරගෙන කර්මාන්තයක යොදවනවා. ඔහු ගේ ඒ ව්‍යාපාරය සාර්ථක වෙනවා. එතකොට ඔහු යම් පරණ මුල් ණයක් ඇද්ද, එය සම්පූර්ණයෙන් ම ගෙවලා දානවා. එයින් පසු ඔහුට අඹුදරුවන් පෝෂණය පිණිස ලාභයක් ඉතිරිත් වෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං කලින් ණයක් අරගෙනයි ව්‍යාපාරයක යෙදෙව්වේ. ඒ මගේ ව්‍යාපාරය සාර්ථක වුණා. ඒ මං යම් පරණ මුල් ණයක් ඇද්ද එය සම්පූර්ණයෙන් ම ගෙව්වා. අඹුදරුවන් පෝෂණයටත් මට ආදායම ඉතිරි වුණා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

60. **සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසෝ ආබාධිකෝ අස්ස දුක්ඛිතෝ බාළ්හගිලානෝ, භත්තං චස්ස න-ඡාදෙය්‍ය, න චස්ස කායේ බලමත්තා, සෝ අපරේන සමයේන තම්හා ආබාධා මු-චෙය්‍යා, භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායේ බලමත්තා, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ආබාධිකෝ අහෝසිං දුක්ඛිතෝ බාළ්හගිලානෝ. භත්තං ච මේ න-ඡාදේසි න චස්ස මේ ආසි කායේ බලමත්තා. සෝ'මිහි ඒතරහි තම්හා ආබාධා මුත්තෝ භත්තඤ්ච මේ ඡාදේති අත්ථි ච මේ කායේ බලමත්තා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.**

60. පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව ඉන්නවා. ඔහුට බත් කෑමටවත් පිරියක් නෑ. ඔහු ගේ ඇඟේ පතේ ප්‍රාණවත් ගතියක් නෑ. නමුත් පස්සෙ කාලෙක ඔහු ඒ රෝගයෙන් මිදුනා. ඔහුට දැන් බත් කෑමත් ප්‍රිය යි. ඔහු ගේ ඇඟපතත් ප්‍රාණවත්. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව හිටියේ. මට බත් කෑමටවත් පිරියක් තිබුණේ නෑ. මගේ ඇඟේ පතේ ප්‍රාණවත් ගතියක් තිබුණේ නෑ. නමුත් දැන් මං ඒ රෝගයෙන් මිදුනා. මට දැන් බත් කෑමත් ප්‍රිය යි. මගේ ඇඟපතත් ප්‍රාණවත්" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

61. **සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසෝ බන්ධනාගාරේ බද්ධෝ අස්ස, සෝ අපරේන සමයේන තම්හා බන්ධනාගාරා මු-චෙය්‍ය සොත්ථිනා අබ්බයේන න චස්ස කිඤ්චි භෝගානං වයෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ බන්ධනාගාරේ බද්ධෝ අහෝසිං. සෝ'මිහි ඒතරහි තම්හා බන්ධනාගාරා මුත්තෝ සොත්ථිනා අබ්බයේන. නත්ථි ච මේ කිඤ්චි භෝගානං වයෝ"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.**

61. පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් හිරගෙදරක බන්ධනයකට හසුවෙනවා. නමුත් ඔහු පස්සෙ කාලෙක තමන් ගේ ධනය වියදම් නොකොට සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වෙනවා. ඔහු ගේ සම්පත්වලින් කිසි වියදමක් යන්නේ නෑ. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර හිරගෙදරක බන්ධනයකට අහු වුණා. නමුත් ඒ මං දැන් ධන වියදමකින් තොරව සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වුණා. මගේ භෝග සම්පත්වලින් කිසිදෙයක් වියදම් වුණේ නෑ" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

62. සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසෝ දාසෝ අස්ස අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාමංගමෝ. සෝ අපරේන සමයේන තම්හා දාසබ්‍යා මු-චෙය්‍ය අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාමංගමෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ දාසෝ අහෝසිං අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාමංගමෝ. සෝ'මිහි ඒතරහි තම්හා දාසබ්‍ය මුත්තෝ අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාමංගමෝ"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

62. පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නොහැකි, දාසයෙක් වෙලා හිටියා. ඔහු පස්සෙ කාලෙක ඒ දාසබවෙන් නිදහස් වුණා. තමාට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නොවන, තමන් කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබුණා. එතකොට ඔහුට මෙහෙම හිතුනා. "මං ඉස්සර තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නොහැකි, දාසයෙක් වෙලා හිටියා. ඒ මං දැන් ඒ දාසබවෙන් නිදහස් වෙලයි ඉන්නේ. මට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නොවන, මං කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබිලා තියෙනවා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

63. සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසෝ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං, සෝ අපරේන සමයේන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛේමං අප්පටිභයං, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සෝ'මිහි ඒතරහි තං

කන්තාරං තිණ්ණෝ සොත්ථිනා ගාමන්තං අනුප්පත්තෝ ඛේමං අප්පටිභය”න්ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

63. පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසෙනවා. නමුත් ඔහු පසු කාලෙක ඒ කාන්තාරයෙන් එතෙර වෙනවා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා “මං කලින් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසුනා. නමුත් දැන් මා ඒ කාන්තාරයෙන් එතෙර වුණා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණුනා” කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

ඒවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු යථා ඉණං යථා රෝගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං. ඒවං ඉමේ පඤ්ච නීවරණේ අප්පහීණේ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි අම්බට්ඨ ආනණ්‍යං, යථා ආරෝග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛේමන්තභූමිං ඒවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු ඉමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සති.

පින්වත් අම්බට්ඨ, අන්න ඒ විදිහම යි. භික්ෂුවත් (කලින්) ණයක් ගත්තා වගේ, ලෙඩ වුණා වගේ, හිරේවිලංගුවේ වැටුනා වගේ, වහල්බවට පත් වුණා වගේ, නිරුදක කතරකට පැමිණුනා වගේ මේ පංච නීවරණයන් ප්‍රහාණය නො වී තමා තුළ පවතින හැටි දකිනවා. නමුත් පින්වත් අම්බට්ඨ, ඒ ණය ගෙවා දමා ණය රහිත වුණා වගේ, රෝගයෙන් නිදහස් වෙලා නීරෝග වුණා වගේ, වියදම් නැතුව හිරෙන් නිදහස් වුණා වගේ, දාසබවෙන් නිදහස් වුණා වගේ, නිරුදක කතර ගෙවා ආරක්ෂා සහිත ක්ෂේම භූමියකට පැමිණුනා වගේ තමයි. පින්වත් අම්බට්ඨ, අන්න ඒ විදිහමයි භික්ෂුව තමා තුළ මේ පංච නීවරණයන් දුරුවී ඇති ආකාරයත් දකින්නේ.

64. තස්සිමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සතෝ පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායෝ පස්සම්භති. පස්සද්ධිකායෝ සුඛං වේදේති. සුඛිනෝ චිත්තං සමාධියති.

64. ඔහුට මේ පඤ්ච නීවරණයන් තමා තුළ නැති බව දකිද්දි මහත් සතුටක් ඇති වෙනවා. ඒ ප්‍රමුදිත වීම ඇති කෙනාට ප්‍රීතිය ඇති වෙනවා. ප්‍රීති මනසක් ඇති කෙනා ගේ කය සංසිඳෙනවා. සංසිඳුනු කයින් යුතු ව සැපක් විඳිනවා. සැප ඇති කෙනා ගේ සිත සමාධිමත් වෙනවා.

65. සෝ විවි-ච-ව කාමේහි විවි-ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

65. ඔහු කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් හට ගත් ප්‍රීති සුඛය ඇති පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

66. සෙය්‍යථාපි අම්බට්ඨ දක්ඛෝ නහාපකෝ වා නහාපකන්තේවාසී වා කංසථාලේ නහානීයචුණ්ණානි ආකිරිත්වා උදකේන පරිප්ඵෝසකං පරිප්ඵෝසකං සන්නෙය්‍ය සායං නහානීයපිණ්ඩි ස්නේහානුගතා ස්නේහපරේතා සන්තරබාහිරා ඵුටා ස්නේහේන න ච පග්ඝරණි.

66. පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. (රජවරුන් ආදී පිරිස් නහවන) දක්ෂ නහවන්නෙක් හෝ නහවන කෙනෙකු ගේ ගෝලයෙක් ඉන්නවා. ඔහු ලෝහ බඳුනක නාන සුණු විසුරුවනවා. ඊට පස්සේ දිය ඉස ඉස පිඬු කරනවා. එතකොට ඒ නානසුණු පිඬට අර වතුර කාවදිනවා. හොඳින් තෙත් වෙනවා. ඒ නහන පිඬ ඇතුළත පිටත සෑම තැන ම හොඳින් දිය පැතිරිලා තියෙනවා. පිටතට වැගිරෙන්නෙත් නෑ.

එවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති. ඉදම්පි 'ස්ස හෝති චරණස්මිං.

පින්වත් අම්බට්ඨ, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ. මේකත් ඔහු ගේ ධර්මයේ හැසිරීමට අයත් දෙයක්.

67. පුන ච පරං අම්බට්ඨ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසෝ ඒකෝදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පූරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

67. පින්වත් අම්බට්ඨ, තව දුරටත් කියනවා නම් භික්ෂුව විතක්ක විචාරයන් ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්මිකව පැහැදීම ඇතිව සිතෙහි මනා එකඟ බවෙන් යුතු ව විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් හටගත්, ප්‍රීති සුඛය ඇති දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

68. සෙය්‍යථාපි අම්බට්ඨ උදකරහදෝ ගම්භීරෝ උබ්භිදෝදකෝ, නස්ස නේවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, දේවෝ වා න කාලේන කාලං සම්මා ධාරං අනුපවේච්ඡෙය්‍ය, අථ ඛෝ තම්හා ච උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමේව උදකරහදං සීතේන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පූරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතෝ උදකරහදස්ස සීතේන වාරිනා අප්ඵුටං අස්ස.

68. පින්වත් අම්බට්ඨ, එක මේ වගේ දෙයක්. යට දිය උල්පත්වලින් වතුර ගලන ගැඹුරු විලක් තියෙනවා. හැබැයි ඒ විලට නැගෙනහිර පැත්තෙන් වතුර එන මගක් නෑ. දකුණු පැත්තෙන් වතුර එන මගක් නෑ. බටහිර පැත්තෙන් වතුර එන මගක් නෑ. උතුරු පැත්තෙන් වතුර එන මගක් නෑ. වැස්සත් කලින් කලට පිළිවෙලකට වහින්නේ නෑ. එතකොට ඒ විලෙන් ම සීතල දියදහරා උල්පත්වලින් උඩට මතු වෙවී ඒ විල ම සීතල ජලයෙන් හොඳට තෙත් කරනවා.

මුළුමණින් ම තෙත් කරනවා. වතුරෙන් පුරවනවා. හොඳින් පුරවනවා. ඒ මුළු විලේ ම සිහිල් ජලයෙන් පහස නොලැබූ කිසි තැනක් නෑ.

එවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති. ඉදම්පි'ස්ස හෝති චරණස්මිං.

පින්වත් අම්බට්ඨ, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ. මේකත් ඔහු ගේ ධර්මයේ හැසිරීමට අයත් දෙයක්.

69. පුන ච පරං අම්බට්ඨ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති සතෝ සම්පජානෝ සුඛඤ්ච කායේන පටිසංවේදේති. යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති.

69. පින්වත් අම්බට්ඨ, තව දුරටත් කියනවා නම් භික්ෂුව ප්‍රීතියට ද නොඇලීමෙන් උපේක්ෂාවෙන් යුතුව වාසය කරනවා. සිහියෙන් නුවණින් යුතුව කයෙන් සැපයක් ද විඳිනවා. ආර්යයන් වහන්සේලා යම් ධ්‍යානයකට උපේක්ෂා සහගත සිහිය ඇති සැප විහරණය යැයි පවසනවා ද, ඒ තුන්වන ධ්‍යානයත් උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

සෙය්‍යථාපි අම්බට්ඨ උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පේක-චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකේ ජාතානි උදකේ සංවද්ධානි උදකානුග්ගතානි අන්තෝනිමුග්ගපෝසීනි තානි යාව චග්ගා යාව ච මූලා සීතේන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි, පරිප්ඵුටානි නාස්සා කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතේන වාරිනා අප්ඵුටං අස්ස.

පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. මහනෙල් විලක හෝ රතු නෙළුම් විලක හෝ සුදු නෙළුම් විලක හෝ ඇතැම් මහනෙල් වේවා, රතු නෙළුම් වේවා, සුදු නෙළුම් වේවා ඒ නෙළුම් ජලයේ ම යි හට ගන්නේ. ජලයේ ම යි වැඩෙන්නේ. නමුත් ජලයෙන් උඩට ඇවිත් නෑ. ජලය තුළ ම ගිලී වැඩෙනවා. එතකොට ඒ නෙළුම් අග දක්වාත් මුල දක්වාත් සීතල දියෙන් හොඳට තෙත් වෙලා තියෙන්නේ. මුළුමණින් ම තෙත් වෙලා තියෙන්නේ. පිරිල තියෙන්නේ. හැම තැනම පැතිරිලා තියෙන්නේ. ඒ සෑම මහනෙල්වල, රතුනෙළුම්වල, සුදුනෙළුම්වල සීතල දිය නො පැතුරුණු කිසි තැනක් නෑ.

ඒවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති. ඉදම්පි 'ස්ස හෝති චරණස්මිං.

පින්වත් අම්බට්ඨ, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. මේකත් ඔහු ගේ ධර්මයේ හැසිරීමට අයත් දෙයක්.

70. පුන ච පරං අම්බට්ඨ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බේව සෝමනස්සදෝමනස්සානං අත්ථංගමා අදුක්ඛමසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති.

70. පින්වත් අම්බට්ඨ, නැවතත් කියනවා නම් භික්ෂුව සැපය ද ප්‍රහාණය කිරීමෙන්, දුක ද ප්‍රහාණය කිරීමෙන් කලින් ම සොම්නස් දොම්නස් දෙක ඉක්ම යෑමෙන් දුක් සැප රහිත වූ පාරිශුද්ධ උපේක්ෂා සහගත සතිය ඇති සතර වෙනි ධ්‍යානය උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසෝ විදාතේන වත්ථේන සසීසං පාරුපිත්වා නිසින්නෝ අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විදාතේන වත්ථේන අප්ඵුටං අස්ස, ඒවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි

සබ්බාවතෝ කායස්ස පරිසුද්ධෙන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති. ඉදම්පි'ස්ස හෝති චරණස්මිං.

පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. සුදු වස්ත්‍රයකින් හිස සහිතව මුළු සිරුර ම පොරොවාගෙන වාඩි වී සිටින කෙනෙක් ඉන්නවා. එතකොට ඔහු ගේ මුළු කයෙහි ම සුදු වස්ත්‍රයෙන් නොවැසුණු කිසි තැනක් නෑ. පින්වත් අම්බට්ඨ, අන්න ඒ වගේ ම යි භික්ෂුව මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ. මේකත් ඔහු ගේ ධර්මයේ හැසිරීමට අයත් දෙයක්.

ඉදං ඛෝ තං අම්බට්ඨ චරණං.

පින්වත් අම්බට්ඨය, චරණය යනු මෙය යි.

71. **(පුන ච පරං අම්බට්ඨ) සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සානාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතා-පෙත්තිකසම්භවෝ විදනකුම්මාසූපචයෝ අනි-චු-ඡාදනපරිමද්දනභේදන-විද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති.**

71. පින්වත් අම්බට්ඨ, තව දුරටත් කියනවා නම් භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් වෑංජන ආදියෙන් වැඩුණු, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි.

සෙය්‍යථාපි අම්බට්ඨ මණි වේළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ සබ්බාකාරසම්පන්නෝ,

තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා විඳාතං වා පණ්ඩුසුත්තං වා. තමේනං චක්ඛුමා පුරිසෝ හත්ථේ කරිත්වා ප-ච්චෙක්ඛෙය්‍ය "අයං ඛෝ මණි වේළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ, අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ සබ්බාකාරසම්පන්නෝ, තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා විඳාතං වා පණ්ඩුසුත්තං වා"ති.

පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. වෛරෝඩි මාණික්‍යයක් තියෙනවා. හරි ලස්සනට පහළ වුණ දෙයක්. අටපට්ටම්. හොඳින් ඔපමට්ටම්, ඉතාමත් හොඳ යි. ඉතාම ප්‍රසන්න යි. පිවිතුරු යි. මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. ඉතින් ඔය මැණික තුළ නිල් වේවා, රන්වන් වේවා, රතු වේවා, සුදු වේවා, පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා. එතකොට ඇස් ඇති පුරුෂයෙක් මැණික අතට ගෙන හොඳින් විමසා බලනවා. "මේ වෛරෝඩි මැණික හරි ලස්සනට පහළ වුණ දෙයක්. අටපට්ටම්. හොඳින් ඔපමට්ටම්, ඉතාමත් හොඳ යි. ඉතාම ප්‍රසන්න යි. පිවිතුරු යි. මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. මේ මැණික තුළ නිල් වේවා, රන්වන් වේවා, රතු වේවා, සුදු වේවා, පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා" කියලා.

ඒවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සානාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතා-පෙත්තිකසම්භවෝ විදනකුම්මාසූපචයෝ අනි-චු-ච්ඡාදනපරිමද්දනභේදන-විද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති. ඉදම්පි'ස්ස හෝති විජ්ජාය.

පින්වත් අම්බට්ඨ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වින්‍යෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් වැංජන ආදියෙන් වැඩුණ, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත

නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි" කියල. මේකත් ඔහු ගේ විද්‍යාවට (අවබෝධයට) අයත් දෙයක්.

72. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගප-චංගිං අහීනින්ද්‍රියං,

72. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අහපසහ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා.

සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසෝ මුඤ්ජම්හා ඊසිකං පබ්බාහෙය්‍ය. තස්ස එවමස්ස: අයං මුඤ්ජෝ අයං ඊසිකා අඤ්ඤෝ මුඤ්ජෝ, අඤ්ඤා ඊසිකා මුඤ්ජම්හාත්වේව ඊසිකා පබ්බාළ්හා'ති. සෙය්‍යථාපි වා පන අම්බට්ඨ පුරිසෝ අසිං කෝසියා පබ්බාහෙය්‍ය, තස්ස එවමස්ස "අයං අසි, අයං කෝසි, අඤ්ඤේ අසි, අඤ්ඤා කෝසි, කෝසියාත්වේව අසි පබ්බාළ්හෝ"ති. සෙය්‍යථාපි වා පන අම්බට්ඨ පුරිසෝ අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස එවමස්ස: අයං අහි, අයං කරණ්ඩෝ, අඤ්ඤෝ අහි, අඤ්ඤේ කරණ්ඩෝ, කරණ්ඩාත්වේව අහි උබ්භිතෝ"ති. එවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගපච්චංගිං අහීනින්ද්‍රියං. ඉදම්පි'ස්ස හෝති විජ්ජාය.

පින්වත් අම්බට්ඨ, එක මේ වගේ දෙයක්. පුරුෂයෙක් මුඤ්ජතණ ගසෙන් තණ ගොබය ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. මේ මුඤ්ජතණ ගස යි, මේ තණ ගොබය යි. එතකොට මුඤ්ජතණ ගස වෙන එකක්. තණ ගොබය වෙන එකක්. නමුත් මුඤ්ජතණ ගසෙන් ම යි තණ

ගොබය ඇදල ගත්තේ කියලා. පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් කොපුවෙන් කඩුවක් ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ කඩුව යි. මේ කොපුව. එතකොට කඩුව අනෙකක්, කොපුව අනෙකක්. නමුත් කොපුවෙන් තමයි කඩුව ඇදල ගත්තේ" කියලා. පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් නයි පෙට්ටියෙන් නයෙකුව ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ තමයි නයා. මේක නයිපෙට්ටිය. එතකොට නයා අනෙකෙක්. නයි පෙට්ටිය අනෙකක්. නමුත් නයි පෙට්ටියෙන් තමයි නයාව ඇදල ගත්තේ" කියලා. පින්වත් අම්බට්ඨ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා. මේකත් ඔහු ගේ විද්‍යාවට (අවබෝධයට) අයත් දෙයක්.

73. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝ'පි හුත්වා බහුධා හෝති, බහුධාපි හුත්වා ඒකෝ හෝති, ආවීභාවං තිරෝභාවං තිරෝකුඩ්ඩං තිරෝපාකාරං තිරෝපබ්බතං අසජ්ජමානෝ ග-ඡති සෙය්‍යථාපි ආකාසේ, පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරෝති සෙය්‍යථාපි උදකේ, උදකේ'පි අභිජ්ජමානේ ග-ඡති සෙය්‍යථාපි පඨවියං, ආකාසේනි පල්ලංකේන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණෝ, ඉමේ'පි චන්දිමසුරියේ ඒවං මහිද්ධිකේ ඒවං මහානුභාවේ පාණිනා පරාමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලෝකාපි කායේන වසං වත්තේති.

73. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි. එයට සිත නතු කරයි. තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. පෙනෙන්ට සළස්වනවා. නො පෙනී යනවා. බිත්තිය විනිවිද, ප්‍රාකාරය විනිවිද, පර්වතය

විනිවිද කිසිවක් හා නො ගැටී, අහසේ යන්නාක් මෙන් යනවා. ජලයේ වගේ පොළොවෙහි කිඳාබැසීමත්, උඩට මතුවීමත් කරනවා. පොළොව මතුපිට වගේ ජලය මත නො ගිලී ඇවිද යනවා. අහසෙහි පියාසරණ කුරුල්ලන් පරිද්දෙන් පළඟක් බැඳ ගෙන අහසේ යනවා. මේසා මහත් ඉර්ධි ඇති, මහානුභාව ඇති හිරු සඳු පවා අතින් අල්ලනවා. පිරිමඳිනවා. බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා.

සෙය්‍යථාපි අම්බට්ඨ දක්ඛෝ කුම්භකාරෝ වා කුම්භකාරන්තේවාසී වා සුපරික්කම්මකතාය මත්තිකාය යං යදේව භාජනවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථාපි වා පන අම්බට්ඨ දක්ඛෝ දන්තකාරෝ වා දන්තකාරන්තේවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදේව දන්තවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථාපි වා පන අම්බට්ඨ දක්ඛෝ සුවණ්ණකාරෝ වා සුවණ්ණ-කාරන්තේවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදේව සුවණ්ණවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය.

පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ මැටිටෙන් යම් ම ආකාරයේ භාජනයක් හදන්ට කැමැති නම්, ඒ ඒ ආකාරයේ බඳුන් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා. පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. දක්ෂ ඇත්දත් කැටයම්කරුවෙක් හෝ ඇත්දත් කැටයම්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ ඇත්දතක යම් ම ආකාරයේ ඇත් දළ කැටයමක් කරන්ට කැමති නම්, ඒ ඒ ආකාරයේ ඇත් දළ කැටයම් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා. පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. දක්ෂ රන් කැටයම්කරුවෙක් හෝ රන් කැටයම්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ රනක යම් ම ආකාරයේ රන් කැටයමක් කරන්ට කැමති නම්, ඒ ඒ ආකාරයේ රන් කැටයම් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා.

ඒවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝ'පි හුත්වා බහුධා හෝති, බහුධාපි හුත්වා ඒකෝ හෝති, ආවීභාවං තිරෝභාවං තිරෝකුඩ්ඩං තිරෝපාකාරං තිරෝපබ්බතං අසජ්ජමානෝ ග-ඡති සෙය්‍යථාපි ආකාසේ,

පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරෝති සෙය්‍යථාපි උදකේ, උදකේපි අභිජ්ජමානේ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං, ආකාසේපි පල්ලංකේන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණෝ, ඉමේපි චන්දිමසුරියේ ඒවං මහිද්ධිකේ ඒවං මහානුභාවේ පාණිනා පරාමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලෝකාපි කායේන වසං වත්තේති. ඉදම්පි'ස්ස හෝති විජ්ජාය.

පින්වත් අම්බට්ඨ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි. එයට සිත නතු කරයි. තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. පෙනෙන්ට සළස්වනවා. නොපෙනී යනවා. බිත්තිය විනිවිද, ප්‍රකාරය විනිවිද, පර්වතය විනිවිද කිසිවක් හා නොගැටී, අහසේ යන්නාක් මෙන් යනවා. ජලයේ වගේ පොළොවෙහි කිදාබැසීමත්, උඩට මතුවීමත් කරනවා. පොළොව මතුපිට වගේ ජලය මත නොගිලී ඇවිද යනවා. අහසෙහි පියාසරණ කුරුල්ලන් පරිද්දෙන් පළඟක් බැඳ ගෙන අහසේ යනවා. මේසා මහත් ඉර්ධි ඇති, මහානුභාව ඇති හිරු සඳු පවා අතින් අල්ලනවා. පිරිමඳිනවා. බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා. මේකත් ඔහු ගේ විද්‍යාවට (අවබෝධයට) අයත් දෙයක්.

74. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බාය සෝතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච.

74. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා. එයට සිත නතු කරනවා. එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා.

සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසෝ අද්ධානමග්ගපටිපන්නෝ සෝ සුණෙය්‍ය හේරිසද්දම්පි මුදිංගසද්දම්පි සංඛපණවදෙණ්ඩිමසද්දම්පි, තස්ස ඒවමස්ස: හේරිසද්දෝ ඉතිපි මුදිංගසද්දෝ ඉතිපි සංඛපණවදෙණ්ඩිමසද්දෝ ඉතිපි.

පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. දුගු ගමනකට පිළිපන් පුරුෂයෙක් ඉන්නවා. ඔහු බෙර හඬත්, මිහිඟු බෙර හඬත්, සක්, පනා බෙර, ගැට බෙර හඬත් අසනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක බෙර හඬක්, මේ තමයි මිහිඟු බෙර හඬ, මේක සක් හඬ, මේක පනා බෙර හඬ, මේක ගැට බෙර හඬ" කියලා.

ඒවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බාය සෝතධාතුයා විසුද්ධාය අතික්කන්ත-මානුසිකාය උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච. ඉදම්පි'ස්ස හෝති විජ්ජාය.

පින්වත් අම්බට්ඨ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා. එයට සිත නතු කරනවා. එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා. මේකත් ඔහු ගේ විද්‍යාවට (අවබෝධයට) අයත් දෙයක්.

75. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ චේතෝපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ පරසත්තානං පරපුග්ගලානං චේතසා චේතසෝ පරි-ච පජානාති:

75. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, අනුන්

ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා.

සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති,
වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති,
සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති,
වීතදෝසං වා චිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති,
සමෝහං වා චිත්තං සමෝහං චිත්තන්ති පජානාති,
වීතමෝහං වා චිත්තං වීතමෝහං චිත්තන්ති පජානාති,
සංඛිත්තං වා චිත්තං සංඛිත්තං චිත්තන්ති පජානාති,
වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති,
මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති,
අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති,
සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති,
අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති,
සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති,
අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති,
විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති,
අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා.
රාග රහිත සිත වීතරාගී සිතක් වශයෙන් දැන ගන්නවා.
ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා.
ද්වේශ රහිත සිත වීතදෝසී සිතක් වශයෙන් දැන ගන්නවා.
මෝහ සහිත සිත මෝහ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා.
මෝහ රහිත සිත වීතමෝහී සිතක් වශයෙන් දැන ගන්නවා.
හැකුළුනු සිත හැකිළුණු සිතක් වශයෙන් දැන ගන්නවා.
විසිරුණු සිත විසිරුණු සිතක් වශයෙන් දැන ගන්නවා.
සමාධිමත් සිත සමාධිමත් සිතක් වශයෙන් දැන ගන්නවා.
සමාධි රහිත සිත සමාධි රහිත සිතක් වශයෙන් දැන ගන්නවා.
නො දියුණු සිත නො දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා.
දියුණු සිත දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා.
එකඟ වෙන සිත එකඟ වෙන සිතක් වශයෙන් දැන ගන්නවා.
එකඟ නො වෙන සිත එකඟ නො වෙන සිතක් වශයෙන් දැන ගන්නවා.

කෙලෙසුන්ගෙන් මිදුණු සිත කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා.

කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා.

සෙය්‍යථාපි අම්බට්ඨ ඉත්ථී වා පුරිසෝ වා දහරෝ වා යුවා මණ්ඩනකජාතිකෝ ආදාසේ වා පරිසුද්ධේ පරියෝදාතේ අ-ඡේ වා උදකපත්තේ සකං මුඛනිමිත්තං ප-චවෙක්ඛමානෝ සකණිකං වා සකණිකන්ති ජානෙය්‍ය, අකණිකං වා අකණිකන්ති ජානෙය්‍ය, ඒවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ෙ-තෝපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ පරසත්තානං පරපුග්ගලානං ෙ-තසා ෙ-තසෝ පරි-ච පජානාති:

පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. ලස්සනට සැරසෙන්ට කැමති ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දරුවෙක් හෝ තරුණයෙක් හෝ ඉන්නවා. ඔහු පිරිසිදු දීප්තිමත් කණ්ණාඩියක් ඉදිරියේ හෝ පැහැදිලි දිය ඇති බඳුනකින් හෝ තමන් ගේ මුව මඩල හොඳින් විමසා බලනවා. එතකොට දොස් ඇති තැන දොස් ඇති තැන වශයෙන් දැන ගන්නවා. දොස් නැති තැන දොස් නැති තැන වශයෙන් දැන ගන්නවා. පින්වත් අම්බට්ඨ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අනුන් ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා.

**සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති,
වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති,
සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති,
වීතදෝසං වා චිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති,
සමෝහං වා චිත්තං සමෝහං චිත්තන්ති පජානාති,
වීතමෝහං වා චිත්තං වීතමෝහං චිත්තන්ති පජානාති,
සංඛිත්තං වා චිත්තං සංඛිත්තං චිත්තන්ති පජානාති,
වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති,**

මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති,
අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති,
සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති,
අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති,
සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති,
අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති,
විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති,
අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.
ඉදම්පි'ස්ස හෝති විජ්ජාය.

රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා.
රාග රහිත සිත වීතරාගී සිතක් වශයෙන් දැන ගන්නවා.
ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා.
ද්වේශ රහිත සිත වීතදෝසී සිතක් වශයෙන් දැන ගන්නවා.
මෝහ සහිත සිත මෝහ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා.
මෝහ රහිත සිත වීතමෝහී සිතක් වශයෙන් දැන ගන්නවා.
හැකුළුනු සිත හැකිළුණු සිතක් වශයෙන් දැන ගන්නවා.
විසිරුණු සිත විසිරුණු සිතක් වශයෙන් දැන ගන්නවා.
සමාධිමත් සිත සමාධිමත් සිතක් වශයෙන් දැන ගන්නවා.
සමාධි රහිත සිත සමාධි රහිත සිතක් වශයෙන් දැන ගන්නවා.
නො දියුණු සිත නො දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා.
දියුණු සිත දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා.
එකඟ වෙන සිත එකඟ වෙන සිතක් වශයෙන් දැන ගන්නවා.
එකඟ නො වෙන සිත එකඟ නො වෙන සිතක් වශයෙන් දැන ගන්නවා.
කෙලෙසුන්ගෙන් මිදුණු සිත කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා.
කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. මේකත් ඔහු ගේ විද්‍යාවට (අවබෝධයට) අයත් දෙයක්.

76. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: ඒකම්'පි ජාතිං, ද්වේ'පි ජාතියෝ, තිස්සෝ'පි ජාතියෝ, චතස්සෝ'පි ජාතියෝ, පඤ්ච'පි ජාතියෝ,

දස'පි ජාතියෝ, වීසම්පි ජාතියෝ, තිංසම්පි ජාතියෝ, චත්තාරීසම්පි ජාතියෝ, පඤ්ඤාසම්පි ජාතියෝ, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනේකේ'පි සංවට්ටකප්පේ, අනේකේ'පි විවට්ටකප්පේ, අනේකේ'පි සංවට්ටවිවට්ටකප්පේ, "අමුත්‍රාසිං එවන්නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවන්නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝ"ති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති.

76. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. ඉතින් ඔහු නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක්, ජීවිත දෙකක්, ජීවිත තුනක්, ජීවිත හතරක්, ජීවිත පහක්, ජීවිත දහයක්, ජීවිත විස්සක්, ජීවිත තිහක්, ජීවිත හතළිහක්, ජීවිත පනහක්, ජීවිත සියයක්, ජීවිත දහසක්, ජීවිත ලක්ෂයක්; අනේකවිධ වූ සංවට්ට කල්පයන් ද, අනේකවිධ වූ විවට්ට කල්පයන් ද, අනේකවිධ වූ සංවට්ට විවට්ට කල්පයන් ද සිහි කරනවා. "මං ඉස්සර සිටියේ අසවල් තැන, එතකොට මගේ නම මේක යි. ගෝත්‍ර නාමය මේක යි. හැඩරුව මෙහෙම යි. කෑම බීම මෙහෙම යි. දුක් සැප වින්දේ මේ විදිහට යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. ඒ මං එතැනින් චුත වුණා. අසවල් තැන උපන්නා. එතකොට මගේ නම වුණේ මේක යි. ගෝත්‍රනාමය මේක යි. හැඩරුව වුණේ මෙහෙමයි. කෑවේ බිව්වේ මෙහෙම යි. සැප දුක් වින්දේ මෙහෙම යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. මං එතැනින් චුත වුණා. මේ ලෝකෙ උපන්නා" ආදී වශයෙන් ආකාර සහිතව සවිස්තරව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා.

සෙය්‍යථාපි අම්බට්ඨ පුරිසෝ සකම්හා ගාමා අඤ්ඤං ගාමං ග-ඡෙය්‍ය තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ග-ඡෙය්‍ය. සෝ තම්හා ගාමා සකඤ්ඤේව ගාමං ප-චාග-ඡෙය්‍ය. තස්ස එවමස්ස: අහං ඛෝ සකම්හා ගාමං අමුං ගාමං ආග-ඡිං තත්‍ර එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහෝසිං. තම්හාපි ගාමා අමුං ගාමං අග-ඡිං තත්‍රාපි එවං අට්ඨාසිං එවං නිසීදිං එවං

අභාසිං එවං තුණ්හී අහෝසිං. සෝ'මිහි තම්හා ගාමා සකඤ්ඤේව ගාමං ප-චාගතෝ'ති.

පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමන් ගේ ගමෙන් වෙනත් ගමකට යනවා. ඒ ගමෙන් තවත් ගමකට යනවා. ඒ ගමෙන් යළි තමන් ගේ ගමට එනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. මං මගේ ගමෙන් අසවල් ගමට ගියා. මං එහෙදී මෙහෙමයි හිටියේ. මෙහෙමයි වාඩි වුණේ. මෙහෙමයි කතාබහ කළේ. මෙහෙමයි නිශ්ශබ්දව සිටියේ. ඉතින් මං ඒ ගමෙනුත් අසවල් ගමට ගියා. එහෙ හිටියේ මේ විදිහට යි. වාඩි වුණේ මේ විදිහට යි. කථාබස් කළේ මේ විදිහට යි. නිහඬව සිටියේ මේ විදිහට යි. ඒ මං ඒ ගමෙන් මගේ ගමට ම නැවත ආවා" කියලා.

එවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යාථීදං: එකම්'පි ජාතිං, ද්වේ'පි ජාතියෝ, තිස්සෝ'පි ජාතියෝ, චතස්සෝ'පි ජාතියෝ, පඤ්ච'පි ජාතියෝ, දස'පි ජාතියෝ, වීසම්පි ජාතියෝ, තිංසම්පි ජාතියෝ, චත්තාරීසම්පි ජාතියෝ, පඤ්ඤාසම්පි ජාතියෝ, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනේකේ'පි සංවට්ටකප්පේ, අනේකේ'පි විවට්ටකප්පේ, අනේකේ'පි සංවට්ටවිවට්ටකප්පේ, අමුත්‍රාසිං එවන්නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං එවං නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති. ඉදම්පි'ස්ස හෝති විජ්ජාය.

පින්වත් අම්බට්ඨ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. ඉතින් ඔහු නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක්, ජීවිත දෙකක්, ජීවිත තුනක්, ජීවිත හතරක්, ජීවිත පහක්, ජීවිත දහයක්, ජීවිත විස්සක්, ජීවිත තිහක්,

ජීවිත හතළිහක්, ජීවිත පනහක්, ජීවිත සියයක්, ජීවිත දහසක්, ජීවිත ලක්ෂයක්, අනේකවිධ වූ සංවට්ට කල්පයන් ද, අනේකවිධ වූ විවට්ට කල්පයන් ද, අනේකවිධ වූ සංවට්ට විවට්ට කල්පයන් ද සිහි කරනවා. මං ඉස්සර සිටියේ අසවල් තැන, එතකොට මගේ නම මේක යි. ගෝත්‍ර නාමය මේක යි. හැඩරුව මෙහෙම යි. කෑම බීම මෙහෙම යි. දුක් සැප වින්දේ මේ විදිහට යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. ඒ මං එතැනින් චුත වුණා. අසවල් තැන උපන්නා. එතකොට මගේ නම වුණේ මේක යි. ගෝත්‍රනාමය මේක යි. හැඩරුව වුණේ මෙහෙමයි. කෑවේ බිව්වේ මෙහෙම යි. සැප දුක් වින්දේ මෙහෙම යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. මං එතැනින් චුත වුණා. මේ ලෝකෙ උපන්නා" ආදී වශයෙන් ආකාර සහිතව සවිස්තරව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා. මේකත් ඔහු ගේ විද්‍යාවට (අවබෝධයට) අයත් දෙයක්.

77. **සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උප්පජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති: ඉමේ වත භොන්තෝ සත්තා කායදු-චරිතේන සමන්නාගතා, වචිදු-චරිතේන සමන්නාගතා, මනෝදු-චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මි-ඡාදිට්ඨිකා, මි-ඡාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමේ වා පන භොන්තෝ සත්තා කායසුචරිතේන සමන්නාගතා, වචිසුචරිතේන සමන්නාගතා, මනෝසුචරිතේන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නාති. ඉති දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උප්පජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති.**

77. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා. එයට සිත නතු කරනවා. එතකොට ඒ භික්ෂුව මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය

පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. “අහෝ! මේ භවත් සත්වයන් කයින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, මනසින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයේ ඉපදිලා ඉන්නවා. ඒ වගේ ම මේ භවත් සත්වයන් කයින් සුචරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් සුචරිතයෙහි යෙදීම නිසා, මනසින් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නො කොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ සුගති නම් වූ, ස්වර්ග ලෝකයෙහි ඉපදිලා ඉන්නවා” කියලා. මේ විදිහට මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුතවන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා.

සෙය්‍යථාපි අම්බට්ඨ මජ්ඣෙඩ්ඩි සිංඝාටකේ පාසාදෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ ඨිතෝ පස්සෙය්‍ය මනුස්සේ ගේහං පවිසන්තේ’පි නික්ඛමන්තේ’පි රථියා වීතිසඤ්චරන්තේ’පි මජ්ඣෙඩ්ඩි සිංඝාටකේ නිසින්නේ’පි, තස්ස එවමස්ස: ඒතේ මනුස්සා ගේහං පවිසන්ති. ඒතේ නික්ඛමන්ති. ඒතේ රථියා වීතිසඤ්චරන්ති. ඒතේ මජ්ඣෙඩ්ඩි සිංඝාටිකේ නිසින්නා’ති.

පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. හතරමං හන්දියක තට්ටු නිවසක් තියෙනවා. එහි ඇස් ඇති පුරුෂයෙක් සිටගෙන බලාගෙන ඉන්නවා. ඔහු (පහළ) ගෙට ඇතුළු වන්නා වූත්, නික්මෙන්නා වූත්, වීදියේ එහාට මෙහාට ඇවිදින්නා වූත්, හතරමං හන්දිය මැද වාඩි වී සිටින්නා වූත් මිනිසුන් දකිනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා “මේ මිනිසුන් ගෙට ඇතුළු වෙනවා. මේ උදවිය ගෙයින් නික්මෙනවා. මේ උදවිය වීදියේ එහාට මෙහාට ඇවිදිනවා. මේ උදවිය හතරමං හන්දිය මැද වාඩි වෙලා ඉන්නවා” කියලා.

එවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උප්පජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ

දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානති: ඉමේ වත හොන්තෝ සත්තා කායදු-චරිතේන සමන්නාගතා, වච්දු-චරිතේන සමන්නාගතා, මනෝදු-චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මි-ඡාදිට්ඨිකා, මි-ඡාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමේ වා පන හොන්තෝ සත්තා කායසුචරිතේන සමන්නාගතා, වච්සුචරිතේන සමන්නාගතා, මනෝ සුචරිතේන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නාති. ඉති දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උප්පජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති. ඉදම්පි'ස්ස හෝති විජ්ජාය.

පින්වත් අම්බට්ඨ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා. එයට සිත නතු කරනවා. එතකොට ඒ භික්ෂුව මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුතවන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. "අහෝ! මේ භවත් සත්වයන් කයින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, මනසින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයේ ඉපදිලා ඉන්නවා. ඒ වගේ ම මේ භවත් සත්වයන් කයින් සුචරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් සුචරිතයෙහි යෙදීම නිසා, මනසින් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නොකොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ සුගති නම් වූ, ස්වර්ග ලෝකයෙහි ඉපදිලා ඉන්නවා" කියලා. මේ විදිහට මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුතවන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. මේකත් ඔහු ගේ විද්‍යාවට (අවබෝධයට) අයත් දෙයක්.

78. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති.

78. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා.

සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමේ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යයයි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මේවා ආශ්‍රවයන් කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රවයන් ගේ හට ගැනීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

තස්ස මේ එවං ජානතෝ එවං පස්සතෝ කාමාසවා'පි චිත්තං විමුච්චති භවාසවා'පි චිත්තං විමුච්චති. අවිජ්ජාසවා'පි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති.

ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස්

වුණ බවට ඤාණය ඇති වෙනවා. "ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා.

සෙය්‍යථාපි අම්බට්ඨ පබ්බතසංඛේපේ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ තීරේ ඨිතෝ පස්සෙය්‍ය සිප්පිසම්බූකම්පි සක්ඛරකඨලම්පි ම-ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි. තස්ස එවමස්ස: අයං ඛෝ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්‍රිමේ සිප්පිසම්බූකා'පි සක්ඛරකඨලා'පි ම-ඡගුම්බා'පි චරන්තා'පි තිට්ඨන්ති'ඉති.

පින්වත් අම්බට්ඨ, ඒක මේ වගේ දෙයක්. පර්වත මුදුනක ජලාශයක් තියෙනවා. එහි ජලය ඉතා හොඳ යි. හරිම ප්‍රසන්න යි. කැළඹිලා නෑ. එතැන ඇස් ඇති පුරුෂයෙක් ඒ ඉවුරේ සිටගෙන ජලාශය දෙස බලා සිටිනවා. එතකොට ඔහුට සිප්පිබෙල්ලනුත්, සක්බෙල්ලනුත්, කැටකැබලිත්, මාළු රංචු ආදියත් හැසිරෙන අයුරු, සිටින අයුරු දකින්ට ලැබෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක ඉතා හොඳ ජලය ඇති හරිම ප්‍රසන්න වූ නොකැළඹුණු දිය ඇති විලක්. මෙහි මේ සිප්පිබෙල්ලන්, සක්බෙල්ලන්, කැටකැබලිති, මාළු රංචුත් හැසිරෙනවා නෙව. ඉන්නවා නෙව" කියල.

ඒවමේව ඛෝ අම්බට්ඨ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති.

පින්වත් අම්බට්ඨ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා.

සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති.
අයං දුක්ඛසමුදයෝ'ති යථාභූතං පජානාති.
අයං දුක්ඛනිරෝධෝ'ති යථාභූතං පජානාති.

අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.
ඉමේ ආසවා'ති යථාභූතං පජානාති.
අයං ආසවසමුදයෝ'ති යථාභූතං පජානාති.
අයං ආසවනිරෝධෝ'ති යථාභූතං පජානාති.
අයං ආසවනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

මෙය දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

මෙය දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

මේවා ආශ්‍රවයන් කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

මෙය ආශ්‍රවයන් ගේ හට ගැනීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

මෙය ආශ්‍රව නිරුද්ධ වීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

තස්ස එවං ජානතෝ එවං පස්සතෝ කාමාසවා'පි චිත්තං විමු-චති භවාසවා'පි චිත්තං විමු-චති. අවිජ්ජාසවා'පි චිත්තං විමු-චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. අයං ඛෝ සා අම්බට්ඨ විජ්ජා.

ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස් වුණ බවට ඤාණය ඇති වෙනවා. "ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා. පින්වත් අම්බට්ඨය, විද්‍යාව (අවබෝධය) යනු මෙය යි.

79. අයං වුච්චති අම්බට්ඨ භික්ඛු විජ්ජාසම්පන්නෝ ඉතිපි, චරණසම්පන්නෝ ඉතිපි, විජ්ජාචරණසම්පන්නෝ ඉතිපි. ඉමාය ච අම්බට්ඨ විජ්ජාසම්දාය චරණසම්පදාය ච අඤ්ඤා විජ්ජාසම්පදා ච චරණසම්පදා ච උත්තරිතරා වා පණීතතරා වා නත්ථි.

79. පින්වත් අම්බට්ඨ, මේ භික්ෂුවට තමයි විද්‍යාවෙන් සමන්විතව ඉන්නවා කියන්නේ. චරණයෙන් සමන්විතව ඉන්නවා කියන්නේ. විජ්ජාචරණින් සමන්විතව ඉන්නවා කියන්නේ. පින්වත් අම්බට්ඨ, මේ විද්‍යා සම්පත්තියෙනුත්, චරණ සම්පත්තියෙනුත් බැහැර වූ වෙනත් උත්තරීතර වූත්, ප්‍රණීතතර වූත් විද්‍යාසම්පතියක්වත් චරණසම්පත්තියක්වත් නෑ.

80. ඉමාය ඛෝ අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය චත්තාරි අපායමුඛානි භවන්ති. කතමානි චත්තාරි? ඉධ අම්බට්ඨ ඒකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ඉමඤ්ඤේව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානෝ ඛාරිවිවධමාදාය අරඤ්ඤායතනං අජ්ඣෝගාහති පවත්තඵලභෝජනෝ භවිස්සාමීති. සෝ අඤ්ඤදත්ථු විජ්ජාචරණසම්පන්නස්සේව පරිචාරකෝ සම්පජ්ජති. ඉමාය ඛෝ අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ඉදං පඨමං අපායමුඛං භවති.

80. පින්වත් අම්බට්ඨ, මේ අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තියට විනාශ මුඛ සතරක් තියෙනවා. ඒ කවර සතරක් ද යත්, පින්වත් අම්බට්ඨ, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, මෙම විජ්ජාචරණ සම්පත්තියට පැමිණගන්ට බැරිව තවුස් පිරිකරත් අරගෙන "මං පවත්තඵල භෝජනයෙන් යැපෙන (ගසෙන් වැටුණු ගෙඩි වළඳා දිවිගෙවන) කෙනෙක් වෙනවා" කියලා වනාන්තරයක් ඇතුළට යනවා. ඇත්තෙන් ම ඔහු විජ්ජාචරණ සම්පන්න කෙනෙකු ගේ ගෝලයෙක් වගේ කෙනෙක්. පින්වත් අම්බට්ඨ, මේ අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තියට ඇති පළමු වෙනි විනාශ මුඛය මෙය යි.

81. පුන ච පරං අම්බට්ඨ ඉධේකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ඉමඤ්ඤේව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානෝ පවත්තඵල භෝජනතඤ්ච අනභිසම්භුණමානෝ කුද්දාලපිටකං ආදාය අරඤ්ඤායතන-මජ්ඣෝගාහති කන්දමූලඵලභෝජනෝ භවිස්සාමීති. සෝ අඤ්ඤදත්ථු විජ්ජාචරණසම්පන්නස්සේව පරිචාරකෝ සම්පජ්ජති. ඉමාය ච ඛෝ අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ඉදං දුතියං අපායමුඛං භවති.

81. පින්වත් අම්බට්ඨ, තව දුරටත් කියනවා නම්, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, මෙම විජ්ජාචරණ සම්පත්තියට පැමිණගන්ට බැරිව පවත්තඵල භෝජනයෙන් යැපෙන (ගසෙන් වැටුණු ගෙඩි වළඳා දිවිගෙවන) කෙනෙක් වෙන්ටත් බැරිව, "මං අල මුල් ගෙඩි වළඳන කෙනෙක් වෙනවා" කියලා උදැල්ලකුත්, මල්ලකුත් අරගෙන වනාන්තරයක් ඇතුළට යනවා. ඇත්තෙන් ම ඔහු විජ්ජාචරණ සම්පන්න කෙනෙකු ගේ ගෝලයෙක් වගේ කෙනෙක්. පින්වත් අම්බට්ඨ, මේ අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තියට ඇති දෙවෙනි විනාශ මුඛය මෙය යි.

82. පුන ච පරං අම්බට්ඨ ඉධේකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ඉමඤ්චේව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානෝ පවත්තඵල භෝජනතඤ්ච අනභිසම්භුණමානෝ කන්දමූලඵලභෝජනතඤ්ච අනභිසම්භුණමානෝ ගාමසාමන්තං වා නිගමසාමන්තං වා අග්‍යාගාරං කරිත්වා අග්ගිං පරිචරන්තෝ අච්ඡති. සෝ අඤ්ඤදත්ථු විජ්ජාචරණසම්පන්නස්සේව පරිචාරකෝ සම්පජ්ජති. ඉමාය ච ඛෝ අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ඉදං තතියං අපායමුඛං භවති.

82. පින්වත් අම්බට්ඨ, තව දුරටත් කියනවා නම්, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, මෙම විජ්ජාචරණ සම්පත්තියට පැමිණගන්ට බැරිව පවත්තඵල භෝජනයෙන් යැපෙන (ගසෙන් වැටුණු ගෙඩි වළඳා දිවිගෙවන) කෙනෙක් වෙන්ටත් බැරිව, අල මුල් ගෙඩි වළඳන කෙනෙක් වෙන්ටත් බැරිව, ගමක් සමීපයේ හෝ නියම්ගමක් සමීපයෙහි හෝ ගිනිපුදන ගෙයක් හදාගෙන, ගිනි පුදන්ට පටන් ගන්නවා. ඇත්තෙන් ම ඔහු විජ්ජාචරණ සම්පන්න කෙනෙකු ගේ ගෝලයෙක් වගේ කෙනෙක්. පින්වත් අම්බට්ඨ, මේ අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තියට ඇති තුන්වෙනි විනාශ මුඛය මෙය යි.

83. පුන ච පරං අම්බට්ඨ ඉධේකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ඉමඤ්චේව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානෝ පවත්තඵලභෝජනතඤ්ච අනභිසම්භුණමානෝ කන්දමූලඵලභෝජනතඤ්ච අනභිසම්භුණමානෝ අග්ගිපරිචරියඤ්ච අනභිසම්භුණමානෝ චාතුම්මහාපථේ චතුද්වාරං අගාරං කරිත්වා අච්ඡති: යෝ ඉමාහි චතූහි දිසාහි ආගමිස්සති සමණෝ වා බ්‍රාහ්මණෝ වා තම්හං යථාසත්ති යථාබලං පටිපූජෙස්සාමීති. සෝ අඤ්ඤදත්ථු විජ්ජාචරණසම්පන්නස්සේව පරිචාරකෝ සම්පජ්ජති. ඉමාය ච ඛෝ අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ඉදං චතුත්ථං අපායමුඛං භවති.

83. පින්වත් අම්බට්ඨ, තව දුරටත් කියනවා නම්, මෙහි ඇතැම් ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, මෙම විජ්ජාචරණ සම්පත්තියට පැමිණගන්ට බැරිව පවත්තඵල භෝජනයෙන් යැපෙන (ගසෙන් වැටුණු ගෙඩි වළඳා දිවිගෙවන) කෙනෙක් වෙන්ටත් බැරිව, අල මුල් ගෙඩි වළඳන කෙනෙක් වෙන්ටත් බැරිව, ගිනි පිඳීමත් කරගන්ට බැරිව, හතරමං හන්දියක දොර සතරක් ඇති ගෙයක් තනා ගෙන ඉන්නවා. “කවුරුහරි ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා සිව් දිසාවෙන් එනවා නම්, මම ඔහුට පුළුවන්තරමින් උපස්ථාන කරනවා” කියලා. ඇත්තෙන් ම ඔහු විජ්ජාචරණ සම්පන්න කෙනෙකු ගේ ගෝලයෙක් වගේ කෙනෙක්. පින්වත් අම්බට්ඨ, මේ අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තියට ඇති හතරවෙනි විනාශ මුඛය මෙය යි.

ඉමාය ඛෝ අම්බට්ඨ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය ඉමානි චත්තාරි අපායමුඛානි භවන්ති.

පින්වත් අම්බට්ඨ, මෙම අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තියට බාධක වූ විනාශ මුඛ හතර කියන්නේ මේකට යි.

84. තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? අපි නු ත්වං ඉමාය අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සන්දිස්සසි සාචරියකෝ?”ති

84. පින්වත් අම්බට්ඨ, මේ ගැන ඔබ කුමක් ද සිතන්නේ? මේ අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තිය තුළ ඔබ තමන් ගේ ආචාර්යවරයා සමග ඉන්න බව දකිනවා ද?

“නෝ හිදං භෝ ගෝතම. කෝ චාහං භෝ ගෝතම සාචරියකෝ? කා ච අනුත්තරා විජ්ජාචරණසම්පදා? ආරකා’හං භෝ ගෝතම අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සාචරියකෝ”ති.

“භවත් ගෞතමයෙනි, මෙය නොවේ මයි. භවත් ගෞතමයෙනි, ආචාර්යවරයා සහිත වූ මම කවුද? අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තිය මොකක්ද? භවත් ගෞතමයෙනි, ආචාර්යවරයා සහිත වූ මං අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තියෙන් දුරු වෙලා ම යි ඉන්නේ.

“තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? අපි නු ත්වං ඉමඤ්චේව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානෝ ඛාරිවිවධමාදාය අරඤ්ඤවන-

මඤ්ඤෝ‍ගාහසි සාචරියකෝ පවත්තඵලභෝජනෝ භවිස්සාමීති?" "නෝ හිදං භෝ ගෝතම."

පින්වත් අම්බට්ඨ, මේ ගැන ඔබ කුමක් ද සිතන්නේ? එහෙමනම්, ඔබ මේ අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තිය ලබාගන්ට බැරුව තවුස් පිරිකර කඳ ගෙන පවත්තඵල භෝජී වන්නෙමි යි කියල ආචාර්යවරයා සහිතව අරණ්‍ය වනයක් මැදට ගිහිල්ලවත් ඉන්න කෙනෙක් ද? "භවත් ගෞතමයෙනි, මෙය නොවේ මයි."

"තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? අපි නු ත්වං ඉමඤ්චේව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානෝ පවත්තඵල භෝජනතඤ්ච අනභිසම්භුණමානෝ කුද්දාලපිටකං ආදාය අරඤ්ඤවනමඤ්ඤෝ‍ගාහසි සාචරියකෝ කන්දමූලඵලභෝජනෝ භවිස්සාමීති?" "නෝ හිදං භෝ ගෝතම."

පින්වත් අම්බට්ඨ, මේ ගැන ඔබ කුමක් ද සිතන්නේ? එහෙමනම්, ඔබ මේ අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තිය ලබාගන්ට බැරුව, පවත්තඵල භෝජී වන්ටත් බැරුව, අල මුල් ගෙඩි අනුභව කරන කෙනෙක් වෙනවා කියල ආචාර්යවරයා සහිතව උදැල්ලකුත් මල්ලකුත් අරගෙන අරණ්‍ය වනයක් මැදට ගිහිල්ලවත් ඉන්න කෙනෙක් ද? "භවත් ගෞතමයෙනි, මෙය නොවේ මයි."

"තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? අපි නු ත්වං ඉමඤ්චේව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානෝ පවත්තඵලභෝජනතඤ්ච අනභිසම්භුණමානෝ කන්දමූලඵලභෝජනතඤ්ච අනභිසම්භුණමානෝ ගාමසාමන්තං වා නිගමසාමන්තං වා අග්ගාගාරං කරිත්වා අග්ගිං පරිචරන්තෝ අච්ඡති සාචරියකෝ?"ති "නෝ හිදං භෝ ගෝතම."

පින්වත් අම්බට්ඨ, මේ ගැන ඔබ කුමක් ද සිතන්නේ? එහෙමනම්, ඔබ මේ අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තිය ලබාගන්ට බැරුව, පවත්තඵල භෝජී වන්ටත් බැරුව, අල මුල් ගෙඩි අනුභව කරන කෙනෙක් වෙන්ටත් බැරුව, ගමක් අසල හෝ නියම්ගමක් අසල හෝ ගිනි පුදන ගෙයක් කරවලා, ආචාර්යවරයා සහිතව ඔබ ගිනි පුදමින් ඉන්න කෙනෙක් ද? "භවත් ගෞතමයෙනි, මෙය නොවේ මයි."

"තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? අපි නු ත්වං ඉමඤ්චේව අනුත්තරං විජ්ජාචරණසම්පදං අනභිසම්භුණමානෝ පවත්තඵලභෝජනතඤ්ච

අනභිසම්භුණමානෝ කන්දමූලඵලහෝජනතඤ්ච අනභිසම්භුණමානෝ අග්ගිපරිචරියඤ්ච අනභිසම්භුණමානෝ චාතුම්මහාපථේ චතුද්වාරං අගාරං කරිත්වා අච්ඡති සාචරියකෝ, යෝ ඉමාහි චතූහි දිසාහි ආගමිස්සති සමණෝ වා බ්‍රාහ්මණෝ වා තං මයං යථාසත්ති යථාබලං පටිපූජෙස්සාමාති?" "නෝ හිදං භෝ ගෝතම."

පින්වත් අම්බට්ඨ, මේ ගැන ඔබ කුමක් ද සිතන්නේ? එහෙමනම්, ඔබ මේ අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තිය ලබාගන්ට බැරුව, පවත්තඵල භෝජී වන්ටත් බැරුව, අල මුල් ගෙඩි අනුභව කරන කෙනෙක් වෙන්ටත් බැරුව, ගිනි පුදා ගන්ටත් බැරුව, සතරමං හන්දියක දොර සතරක් ඇති ගෙයක් කරවලා, ආචාර්යවරයා සහිතව ඔබ "කවුරු හරි ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා සතර දිශාවෙන් එනවා නම් අපි ශක්ති පමණින්, පුළුවන් හැටියට ඔහුට උපස්ථාන කරනවා" කියල ඉන්න කෙනෙක් ද? "භවත් ගෞතමයෙනි, මෙය නොවේ මයි."

85. ඉති ඛෝ අම්බට්ඨ ඉමාය චේව ත්වං අනුත්තරාය විජ්ජාචරණසම්පදාය පරිහීනෝ සාචරියකෝ. යේ චිමේ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය චත්තාරි අපායමුඛානි භවන්ති, තතෝ ච ත්වං පරිහීනෝ සාචරියකෝ. භාසිතා ඛෝ පන තේ ඒසා අම්බට්ඨ ආචරියේන බ්‍රාහ්මණේන පොක්ඛරසාතිනා වාචා "කේ ච මුණ්ඩකා සමණකා ඉබ්භා කණ්හා බන්ධුපාදාපච්චා, කා ච තේවිජ්ජානං බ්‍රාහ්මණානං සාකච්ඡා"ති, අත්තනා ආපායිකෝ'පි අපරිපූරයමානෝ. පස්ස අම්බට්ඨ යාව අපරද්ධඤ්ච තේ ඉදං ආචරියස්ස බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස.

85. පින්වත් අම්බට්ඨ, ඔය විදිහට ආචාර්යවරයා සහිත වූ ඔබ මෙම අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තියෙනුත් පිරිහිලා ඉන්නේ. මෙම අනුත්තර වූ විජ්ජාචරණ සම්පත්තියට යම් විනාශ මුඛ හතරක් ඇත්නම්, ආචාර්යවරයා සහිත වූ ඔබ එයිනුත් පිරිහිලා ඉන්නේ. පින්වත් අම්බට්ඨ, ඔබ ගේ ගුරුවරයා වූ පොක්ඛරසාති බ්‍රාහ්මණයා විසින් මේ වචන කියල තියෙනවා. "ලාමක ගිහියන් වූ, කළු වූ, මහබඹු ගේ පයින් උපන්, පවිටු මුඩු ශ්‍රමණයන් කවුද, එබඳු අයත් එක්ක ත්‍රිවිද්‍යා ලබාගත් බ්‍රාහ්මණයන්ට මොන සාකච්ඡාද" කියලා. එහෙම කියන්නේ තමන් විසින් විනාශ මුඛ හතරවත් නො පුරමිනුයි. පින්වත් අම්බට්ඨ, බලන්න ඔබ ගේ ආචාර්යවරයා වූ පොක්ඛරසාති බ්‍රාහ්මණයා විසින් මොන තරම් බරපතල වරදක් ද කරල තියෙන්නේ?

86. බ්‍රාහ්මණෝ බෝ පන අම්බට්ඨ පොක්ඛරසාතී රඤ්ඤෝ පසේනදිස්ස කෝසලස්ස දන්තිකං භුඤ්ජති. තස්ස රාජා පසේනදි කෝසලෝ සම්මුඛීභාවම්පි න දදාති. යදාපි තේන මන්තේති තිරෝදුස්සේන මන්තේති. යස්ස බෝ පන අම්බට්ඨ ධම්මිකං පයතං භික්ඛං පතිගණ්හෙය්‍ය, කථං තස්ස රාජා පසේනදී කෝසලෝ සම්මුඛීභාවම්පි න දදෙය්‍ය? පස්ස අම්බට්ඨ යාව අපරද්ධඤ්ච තේ ඉදං ආචරියස්ස බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස.

86. පින්වත් අම්බට්ඨ, පොක්ඛරසාති බ්‍රාහ්මණයා භුක්ති විඳින්නේ පසේනදී කොසොල් රජතුමා දීපු දේවල් නෙව. නමුත් කොසොල් රජතුමා ඔහුට මුණගැසීමක්වත් වෙලා නෑ. යම් දවසක ඔහු සමග සාකච්ඡා කරනවා නම්, කඩතුරාවකට මුවාවෙලයි ඒකත් කරන්නේ. පින්වත් අම්බට්ඨ යමෙකු විසින් තමාට දෙන ලද ධාර්මික භික්ෂාව පිළිගන්නවා නම්, ඒ පසේනදි කොසොල් රජු ඔහු හා මුණ ගැසීමක්වත් නො දෙන්නේ කොහොමද? අම්බට්ඨ, බලන්න ඔබ ගේ ආචාර්යවරයා වූ පොක්ඛරසාති බ්‍රාහ්මණයා විසින් මොන තරම් බරපතල වරදක් ද කරල තියෙන්නේ?

තං කිම්මඤ්ඤසි අම්බට්ඨ? රාජා පසේනදි කෝසලෝ හත්ථිගීවාය වා නිසින්නෝ අස්සපිට්ඨියේ ව නිසින්නෝ රථූපත්ථරේ වා යීතෝ උග්ගේහි වා රාජඤ්ඤේහි වා කිඤ්චිදේව මන්තණං මන්තෙය්‍ය, සෝ තම්හා පදේසා අපක්කම්ම ඒකමන්තං තිට්ඨෙය්‍ය. අථ ආගච්ඡෙය්‍ය සුද්දෝ වා සුද්දාසෝ වා, සෝ තස්මිං පදේසේ යීතෝ තදේව මන්තණං මන්තෙය්‍ය: එවම්පි රාජා පසේනදී කොසලෝ ආහ එවම්පි රාජා පසේනදී කෝසලෝ ආහාති. අපි නු සෝ රාජභණිතං වා භණති රාජමන්තා වා මන්තේති, එත්තාවතා සෝ අස්ස රාජා වා රාජමහාමත්තෝ වාති?" "නෝ හිදං භෝ ගෝතම."

පින්වත් අම්බට්ඨ, මේ ගැන ඔබ කුමක් ද සිතන්නේ? පසේනදී කොසොල් රජතුමා ඇත් ගෙල මත වාඩි වෙලා ඉන්නවා. එහෙම නැත්නම් අසු පිට වාඩි වෙලා ඉන්නවා. එක්කෝ රථයෙහි සරසා ඇති තැන සිටගෙන හෝ ඉන්නවා. එතකොට රජුට උසස් ඇමතිවරුන් සමඟ හෝ ඔටුන්න හිමි කුමාරවරුන් සමඟ හෝ යම් යම් කරුණු ගැන කථා කරන්ට උවමනා වෙනවා. ඉතින් ඔහු එතැනින් මෑත් වෙලා පැත්තක හිට ගන්නවා. එතකොට ඔතැනට ශූද්‍රයෙක් හෝ ශූද්‍රදාසයෙක් එනවා. ඔහුත් ඒ ප්‍රදේශයේ ම ඉඳගෙන ඒ කරුණ ගැන ම කථා කරනවා. ඒ කියන්නේ "මේ විදිහටත් පසේනදී කොසොල් රජ්ජුරුවෝ කිව්වා. මේ විදිහටත් පසේනදී කොසොල් රජ්ජුරුවෝ කිව්වා" කියලා. එතකොට එකරුණින් ඔහු රාජකීය කථාබහ කරන කෙනෙක් ද? රාජමන්ත්‍රණ

කරන කෙනෙක් ද? එපමණකින් ඔහු රජෙක් වෙනවා ද? රාජමහාමාත්‍යයෙක් වෙනවා ද? "භවත් ගෞතමයෙනි, එය නොවේ ම ය."

87. එවමේව ඛෝ ත්වං අම්බට්ඨ, යේ තේ අහේසුං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයෝ මන්තානං කත්තාරෝ මන්තානං පවත්තාරෝ, යේසමිදං එතරහි බ්‍රාහ්මණා පෝරාණං මන්තපදං ගීතං පවුත්තං සමූහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථීදං: අට්ටකෝ වාමකෝ වාමදේවා වෙස්සාමිත්තෝ යමතග්ගි අංගිරසෝ භාරද්වාජෝ වාසෙට්ඨෝ කස්සපෝ භගු, න්‍යාහං මන්තේ අධියාමි සාචරියකෝ'ති තාවතා ත්වං භවිස්සසි ඉසි වා ඉසිත්තාය වා පටිපන්නෝ'ති නේතං ඨානං විජ්ජති.

87. පින්වත් අම්බට්ඨ, අන්න ඒ වගේ තමයි. යම් ඒ බ්‍රාහ්මණයින් ගේ මන්ත්‍ර හදන, මන්ත්‍ර කියන පූර්ව ඍෂිවරු හිටියා ද ඒ කියන්නේ අට්ටක, වාමක, වාමදේව, වෙස්සාමිත්ත, යමතග්ගී, අංගීරස, භාරද්වාජ, වාසෙට්ඨ, කස්සප, භගු කියල. ඒ පැරණි ඍෂිවරුන් යම් මේ මන්ත්‍රපද ගායනා කළා ද, කියෙව්වා ද, රැස්කළා ද, දැන් ඉන්න බමුණන් ඔවුන් අනුව ගායනා කරනවා. ඒ කියපු දෙය කියාගෙන යනවා. ඒ කියපු දෙය ම නැවත නැවතත් කියා ගෙන යනවා. ඒ විදිහට පාඩම් කරවනවා. එහෙම කරලා "මාත් ආචාර්යවරයා සහිතව මන්ත්‍ර හදාරණවා" කියල කියූ පමණකින් ඔබ ඍෂිවරයෙක් වෙනවා, ඍෂිබවට පිළිපන් කෙනෙක් වෙනවා යන කරුණ සිදුවෙන දෙයක් නොවේ.

88. තං කිම්මඤ්ඤසි අම්බට්ඨ කින්ති තේ සුතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං: "යේ තේ අහේසුං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයෝ මන්තානං කත්තාරෝ මන්තානං පවත්තාරෝ, යේසමිදං එතරහි බ්‍රාහ්මණා පෝරාණං මන්තපදං ගීතා පවුත්තං සමූහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති සෙය්‍යථීදං: අට්ටකෝ, වාමකෝ, වාමදේවෝ, වෙස්සාමිත්තෝ, යමතග්ගි, අංගිරසෝ, භාරද්වාජෝ, වාසෙට්ඨෝ, කස්සපෝ, භගු ඒවං සු තේ සුන්හාතා සුවිලිත්තා කප්පිතකේසුමස්සු ආමුත්තමණිකුණ්ඩලාභරණා විදාතවත්ථ-වසාන පඤ්චහි කාමගුණේහි සමප්පිතා සමංගිභූතා පරිචාරෙන්ති, සෙය්‍යථාපි ත්වං එතරහී සාචරියකෝ?"ති. "නෝ හිදං භෝ ගෝතම."

88. පින්වත් අම්බට්ඨ, මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? ඒ වැඩිමහළු ආචාර්ය ප්‍රාචාර්ය වූ බ්‍රාහ්මණයන් ඒ ඍෂිවරුන් ගැන කියන දේ ඔබ අහල

තියෙන්නේ කොහොම ද? "යම් ඒ බ්‍රාහ්මණයින් ගේ මන්ත්‍ර හදන, මන්ත්‍ර කියන පූර්ව ඍෂිවරු හිටියා ද ඒ කියන්නේ අට්ටක, වාමක, වාමදේව, වෙස්සාමිත්ත, යමතග්ගී, අංගීරස, භාරද්වාජ, වාසෙට්ඨ, කස්සප, භගු කියල. ඒ පැරණි ඍෂිවරුන් යම් මේ මන්ත්‍රපද ගායනා කළා ද, කියෙව්වා ද, රැස්කළා ද, දැන් ඉන්න බමුණන් ඔවුන් අනුවනෙ ගායනා කරන්නේ. ඒ කියපු දෙයනෙ කියාගෙන යන්නේ. ඒ කියපු දෙයමනෙ නැවත නැවතත් කියා ගෙන යන්නේ. ඒ විදිහටමනෙ පාඩම් කරවන්නේ. ඉතින් ඔබ අහල තියෙනවා ද දැන් ආචාර්යවරයා සහිතව ඔබ හොඳට නාලා, හොඳට සුවඳවිලවුන් ගාලා, හැඩට කෙස්රැවුල් පීරලා, මිණිකොඩොල් ආභරණවලින් සැරසිලා, සුදුවස්ත්‍ර ඇඳගෙන පඤ්චකාම ගුණයන්හි ඇලී ගැලී එහි සතුටුවෙමින් ඉන්නවා වාගේ ඒ ඍෂිවරුත් සිටියා කියල? "භවත් ගෞතමයෙනි, එය නොවේ ම ය."

89. "එවංසු තේ සාලීනං විදනං සුචිමංසූපසේවනං විචිතකාලකං අනේකසූපං අනේකබ්‍යඤ්ජනං පරිභුඤ්ජන්ති, සෙය්‍යථාපි ත්වං එතරහි සාචරියකෝ?"ති. "නෝ හිදං භෝ ගෝතම."

"ඒ වගේ ම දැන් ආචාර්යවරයා සහිත ඔබ කළුහාල් ඉවත් කරපු, ඇල්හාලේ බත් ඇතුව, අනේක වූ සූපව්‍යංජන ඇතිව, රසමසවුලින් යුතු කෑම කනවා වගේ ඒ ඍෂිවරුත් ආහාර අරගෙන තියෙනවා ද?" "භවත් ගෞතමයෙනි, එය නොවේ ම ය."

"එවංසු තේ වේඨනකපස්සාහි නාරීහි පරිචාරෙන්ති සෙය්‍යථාපි ත්වං එතරහි සාචරියකෝ?"ති. "නෝ හිදං භෝ ගෝතම."

"ඒ වගේ ම දැන් ආචාර්යවරයා සහිත ඔබ කුසට වෙළුම්පටි බැඳල, සිහින් කළ ඉහ තියෙන ස්ත්‍රීන් ලවා උපස්ථාන කරගන්නවා වගේ ඒ ඍෂිවරුත් එහෙම කර ගෙන තියෙනවා ද?" "භවත් ගෞතමයෙනි, එය නොවේ ම ය."

"එවංසු තේ කුත්තවාලේහි වළවාරථේහි දීසාහි පතෝදලට්ඨීහි වාහනේ විතුදෙන්තා විපරියායන්ති සෙය්‍යථාපි ත්වං එතරහි සාචරියකෝ?"ති. "නෝ හිදං භෝ ගෝතම."

"ඒ වගේ ම දැන් ආචාර්යවරයා සහිත ඔබ ලස්සනට වල්ගා සරසපු, වෙළඹුන් යොදපු රථවල නැගලා, කෙවිටි දික්කරගෙන, සතුන්ට සන්කරමින් ඉන්නවා වගේ ඒ ඍෂිවරුත් එහෙම ගමන් බිමන් ගිහින් තියෙනවා ද?" "භවත් ගෞතමයෙනි, එය නොවේ ම ය."

"එවංසු තේ උක්කිණ්ණපරිඛාසු ඔක්ඛිත්තපළිඝාසු නගරූපකාරිකාසු දීඝාසිබද්ධේහි පුරිසේහි රක්ඛාපේති. සෙය්‍යථාපි ත්වං ඒතරහි සාචරියකෝ?ති" "නෝ හිදං භෝ ගෝතම."

"ඒ වගේ ම දැන් ආචාර්යවරයා සහිත ඔබ අගල් කැණුල තියෙන, යටට හාරපු උපකාරිකා තියෙන නගරවල්වල දිග කඩුගත්තු පුරුෂයන් ගේ රැකවරණ ලබමින් ඉන්නවා වගේ ඒ සෘෂිවරුත් රැකවල් ඇතිව සිටියා ද?" "භවත් ගෞතමයෙනි, එය නොවේ ම ය."

ඉති ඛෝ අම්බට්ඨ නේව ත්වං ඉසි, න ඉසිත්තාය පටිපන්නෝ සාචරිකෝ. යස්ස ඛෝ පන අම්බට්ඨ මයි කංඛා වා විමති වා, සෝ මං පඤ්හේන, අහං වෙය්‍යාකරණේන සෝධිස්සාමී"ති.

එහෙමනම් පින්වත් අම්බට්ඨ, ආචාර්යවරයා සහිත වූ ඔබ සෘෂිවරයෙකුත් නොවේ. සෘෂිවරයෙක් වීමට පිළිපන් කෙනෙකුත් නොවේ. පින්වත් අම්බට්ඨ, නමුත් යම් කෙනෙකුට මා ගැන සැකයක් හෝ විමතියක් හෝ තියෙනවා නම්, ඔහු මගෙන් ප්‍රශ්න අහන්ට වින. එතකොට මං ඔහු ගේ ප්‍රශ්න විසඳීමෙන් ඒ සැකය දුරු කරලා දානවා.

90. අථ ඛෝ භගවා විහාරා නික්ඛම්ම චංකමං අබ්භුට්ඨාසි. අම්බට්ඨෝ'පි මාණවෝ විහාරා නික්ඛම්ම චංකමං අබ්භුට්ඨාසි. අථ ඛෝ අම්බට්ඨෝ මාණවෝ භගවන්තං චංකමන්තං අනුචංකමමානෝ කායේ ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි සමන්නේසි. අද්දස ඛෝ අම්බට්ඨෝ මාණවෝ භගවතෝ කායේ ද්වත්තිංසමහාපුරිසලක්ඛණානි යේභුය්‍යේන ඨපෙත්වා ද්වේ. ද්වීසු මහාපුරිසලක්ඛණේසු කංඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති කෝසෝහිතේ ච වත්ථගුය්හේ පහූතජිව්හතාය ච.

90. ඊට පස්සේ භාග්‍යවතුන් වහන්සේ විහාරයෙන් එළියට වැඩලා සක්මන් මළුවට පැමිණ වදාළා. අම්බට්ඨ මාණවකයාත් විහාරයෙන් නික්මිලා සක්මනට නැග්ගා. ඉතින් අම්බට්ඨ මාණවකයා භාග්‍යවතුන් වහන්සේ සක්මනේ වඩිද්දී ඒ අනුව සක්මන් කරමින් බුදු සිරුරක තිබෙන මහාපුරුෂ ලක්ෂණ තිස්දෙක සොයන්න පටන් ගත්තා. එතකොට අම්බට්ඨ මාණවකයා දෙකක් හැර මහාපුරුෂ ලක්ෂණ බොහොමයක් භාග්‍යවතුන් වහන්සේ ගේ කයෙහි තිබෙන බව දැක ගත්තා. ඔහු කෙමියක් තුළ බහාවි පරිද්දෙන් ඇති පුරුෂ නිමිත්තද, පුළුල් දිව ද යන මහාපුරුෂ ලක්ෂණ දෙක ගැන සැක කළා. විචිකිච්ඡා කළා. ඒ වටහා ගත්තේ නෑ. ඒ ගැන පැහැදුනේ නෑ.

91. අථ ඛෝ භගවතෝ ඒතදහෝසි: පස්සති ඛෝ මේ අයං අම්බට්ඨෝ මාණවෝ ද්වත්තිංසමහාපුරිසලක්ඛණානි යේභුය්‍යෙන ඨපෙත්වා ද්වේ. ද්වීසු මහාපුරිසලක්ඛණේසු කංඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති කෝසෝහිතේ ච වත්ථගුය්හේ පහූතජිව්හතාය චාති.

91. එතකොට භාග්‍යවතුන් වහන්සේට මේ අදහස ඇති වුණා. "මේ අම්බට්ඨ මාණවකයා දෙකක් හැර මහාපුරුෂ ලක්ෂණ බොහොමයක් මාගේ කයෙහි තිබෙන බව දැක ගත්තා. නමුත් ඔහු කෙමියක් තුළ බහාව් පරිද්දෙන් ඇති පුරුෂ නිමිත්තද, පුළුල් දිව ද යන මහාපුරුෂ ලක්ෂණ දෙක ගැන සැක කරනවා. විචිකිච්ඡා කරනවා. ඒ වටහා ගන්නේ නෑ. ඒ ගැන පහදින්නේ නෑ.

අථ ඛෝ භගවා තථාරූපං ඉද්ධාභිසංඛාරං අභිසංඛාසි යථා අද්දස අම්බට්ඨෝ මාණවෝ භගවතෝ කෝසෝහිතං වත්ථගුය්හං. අථ ඛෝ භගවා ජිව්හං නින්නාමෙත්වා උභෝපිකණ්ණසෝතානි අනුමසි පරිමසි. උභෝ'පි නාසිකාසෝතානි අනුමසි පරිමසි. කේවලම්පි නළාටමණ්ඩලං ජිව්හාය ඡාදේසි.

ඉතින් භාග්‍යවතුන් වහන්සේ ඉර්ධි ප්‍රාතිහාර්යයක් දක්වා වදාළා. ඒ කියන්නේ අම්බට්ඨ මාණවකයා භාග්‍යවතුන් වහන්සේ ගේ කෙමියක් තුළ බහාව් පරිද්දෙන් ඇති පුරුෂ නිමිත්ත දැක ගන්නවා ද අන්න ඒ ආකාරයට යි. ඒ වගේ ම භාග්‍යවතුන් වහන්සේ (මෙය ද ඉර්ධියකි) දිව නිකුත්කොට දෙකන් සිදුරු පිරිමැද වදාළා. දෙනාස්පුඩු පිරිමැද වදාළා. සම්පූර්ණ නලල් තලය දිවෙන් වසා වදාළා.

අථ ඛෝ අම්බට්ඨස්ස මාණවස්ස ඒතදහෝසි: සමන්නාගතෝ ඛෝ සමණෝ ගෝතමෝ ද්වත්තිංසමහාපුරිසලක්ඛණේහි පරිපුණ්ණේහි නෝ අපරිපුණ්ණේහීති භගවන්තං ඒතදවෝච: "හන්ද ච'දානි මයං භෝ ගෝතම ගච්ඡාම. බහුකිච්චා මයං බහුකරණියා"ති. "යස්සදානි ත්වං අම්බට්ඨ කාලං මඤ්ඤසීති." අථ ඛෝ අම්බට්ඨෝ මාණවෝ වළවාරථමාරුය්හ පක්කාමි.

එතකොට අම්බට්ඨ මාණවකයාට මෙහෙම හිතුනා. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මහාපුරුෂ ලක්ෂණ තිස්දෙකෙන් ම පරිපූර්ණ යි. අපරිපූර්ණ නෑ කියලා. භාග්‍යවතුන් වහන්සේට මෙහෙම කිව්වා. "භවත් ගෞතමයෙනි, දැන් අපි යනවා. අපි ඉතින් බොහෝ වැඩකටයුතු ඇති උදවිය නෙව" කියලා. "පින්වත් අම්බට්ඨය, යමකට දැන් කාලය යැ යි ඔබ සිතනවා

නම් එය කරන්න.” ඊට පස්සේ අම්බට්ඨ මාණවකයා වෙළඹුන් යෙදූ රථයේ නැගිලා පිටත් වුණා.

92. තේන ඛෝ පන සමයේන බ්‍රාහ්මණෝ පොක්ඛරසාති උක්කට්ඨාය නික්ඛමිත්වා මහතා බ්‍රාහ්මණගණේන සද්ධිං සකේ ආරාමේ නිසින්නෝ හෝති අම්බට්ඨං යේව මාණවං පතිමානෙන්තෝ. අථ ඛෝ අම්බට්ඨෝ මාණවෝ යේන සකෝ ආරාමෝ තේන පායාසි. යාවතිකා යානස්ස භූමි යානේන ගන්ත්වා යානා පච්චෝරෝහිත්වා පත්තිකෝ’ව යේන බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී තේනුපසංකමි, උපසංකමිත්වා බ්‍රාහ්මණං පොක්ඛරසාතිං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදි.

92. ඒ වෙලාවේ දී පොක්ඛරසාති බ්‍රාහ්මණයා උක්කට්ඨා නගරයෙන් නික්මිලා මහත් බ්‍රාහ්මණ පිරිසත් සමග තමන් ගේ ආරාමයෙහි අම්බට්ඨ මාණවකයා ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් හිටියා. එතකොට අම්බට්ඨ මාණවකයා තමන් ගේ ආරාමය වෙත පැමිණුනා. රථයෙන් යා හැකිතාක් දුර ගිහින් එයින් බැහැලා පාගමනින් ම පොක්ඛරසාති බ්‍රාහ්මණයා සිටි තැනට ගියා. ගිහින් පොක්ඛරසාති බ්‍රාහ්මණයාට වන්දනා කොට එකත්පස්ව වාඩි වුණා.

93. ඒකමන්තං නිසින්නං ඛෝ අම්බට්ඨං මාණවං බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී ඒතදවෝච: කච්චි තාත අම්බට්ඨ අද්දස තං භගවන්තං ගෝතමන්ති. “අද්දසාම ඛෝ මයං භෝ තං භගවන්තං ගෝතමන්ති.”

එකත්පස්ව වාඩි වුණ අම්බට්ඨ මාණවකයාගෙන් පොක්ඛරසාති බ්‍රාහ්මණයා මෙහෙම ඇහුවා. “පුතේ අම්බට්ඨ, කොහොම ද? භවත් ගෞතමයන් වහන්සේව දැක ගත්තද?” “භවතාණෙනි, අපි භවත් ගෞතමයන්ව දැක්කා.”

“කච්චි තාත අම්බට්ඨ තං භගවන්තං ගෝතමං තථා සන්තෝ යේව සද්දෝ අබ්භුග්ගතෝ නෝ අඤ්ඤථා? කච්චි පන භෝ සෝ භවං ගෝතමෝ තාදිසෝ නෝ අඤ්ඤදිසෝ?”ති.

“පුතේ අම්බට්ඨ, ඒ භවත් ගෞතමයන් තුළ තිබෙන්නා වූ ම ගුණයන් පිළිබඳ කීර්ති ඝෝෂාවක් ද පැතිර තිබෙන්නේ? නැති ගුණයන් ගැන ද? ඒ වගේ ම භවත් ගෞතමයන් එබඳු ගුණයන්ගෙන් යුක්තයි ද? එහෙම නැත්නම් නැද්ද?”

"තථා සන්තෝ යේව භෝ තං භවන්තං ගෝතමං සද්දෝ අබ්භුග්ගතෝ නෝ අඤ්ඤථා. නාදිසෝව භෝ සෝ භවං ගෝතමෝ නෝ අඤ්ඤාදිසෝ. සමන්නාගතෝ ච භෝ සෝ භවං ගෝතමෝ ද්වත්තිංසමහාපුරිසලක්ඛණේහි පරිපුණ්ණේහි නෝ අපරිපුණ්ණේහී"ති.

"භවත, ඒ භවත් ගෞතමයන් තුළ තියෙන ගුණ ගැන ම යි කීර්ති රාවයක් පැතිරිලා තියෙන්නේ. නැති ගුණ ගැන නොවෙයි. භවත, ඒ භවත් ගෞතමයන් ඒ පැතිරුණු ගුණයන්ගෙන් යුක්ත යි. එහෙම නැතුව වෙන විදිහක් නෑ. භවත, ඒ භවත් ගෞතමයන් මහාපුරුෂ ලක්ෂණ තිස්දෙකෙන් ම පරිපූර්ණ යි. අපරිපූර්ණ නෑ."

"අහු පන තේ තාත අම්බට්ඨ සමණේන ගෝතමේන සද්ධිං කෝචිදේව කථාසල්ලාපෝ?"ති. "අහු ඛෝ යේව භෝ සමණේන ගෝතමේන සද්ධිං කෝචිදේව කථාසල්ලාපෝ?"ති. "යථාකථං පන තේ තාත අම්බට්ඨ අහු සමණේන ගෝතමේන සද්ධිං කෝචිදේව කථාසල්ලාපෝ?"ති. අථ ඛෝ අම්බට්ඨෝ මාණවෝ යාවතකෝ අහෝසි භගවතා සද්ධිං කථාසල්ලාපෝ තං සබ්බං බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස ආරෝචේසි.

"පුතේ අම්බට්ඨ, එතකොට ශ්‍රමණ ගෞතමයන් එක්ක ඔබේ මොනව හරි කථාබහක් වුණා ද?" "භවත, ශ්‍රමණ ගෞතමයන් සමග මගේ යම්කිසි කථාබහක් වුණා තමයි." "පුතේ අම්බට්ඨ, ශ්‍රමණ ගෞතමයන් සමග මොන විදිහේ කථාබහක් ද සිද්ධ වුණේ?" එතකොට අම්බට්ඨ මාණවකයා භාග්‍යවතුන් වහන්සේ සමඟ යම්තාක් කථාබහක් වුණා ද ඒ සෑම දෙයක් ම පොක්ඛරසාති බ්‍රාහ්මණයාට කියා සිටියා.

94. ඒවං වුත්තෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී අම්බට්ඨං මාණවං ඒතදවෝච: "අහෝ වත රේ, අම්හාකං පණ්ඩිතක! අහෝ වත රේ, අම්හාකං බහුස්සුතක! අහෝ වත රේ, අම්හාකං තේවිජ්ජක! ඒවරූපේන කිර භෝ පුරිසෝ අත්ථවරකේන කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. යදේව ඛෝ ත්වං අම්බට්ඨ තං භවන්තං ගෝතමං ඒවං ආසජ්ජ ආසජ්ජ අවචාසි. අථ ඛෝ භවං ගෝතමෝ අම්හේ'පි ඒවං උපනෙය්‍ය උපනෙය්‍ය අවච. අහෝ වත රේ, අම්හාකං පණ්ඩිතක! අහෝ වත රේ, අම්හාකං බහුස්සුතක! අහෝ වත රේ, අම්හාකං තේවිජ්ජක! ඒවරූපේන කිර භෝ පුරිසෝ අත්ථවරකේන කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍යා"ති කුපිතෝ අනත්තමනෝ අම්බට්ඨං මාණවං

පදසා යේව පවත්තේසි. ඉච්ඡති ච තාවදේව භගවන්තං දස්සනාය උපසංකමිතුං.

94. එහෙම කිව්වහම පොක්ඛරසාති බ්‍රාහ්මණයා අම්බට්ඨ මාණවකයාට මෙහෙම කිව්වා "අය්යෝ! මේකා ද අපේ මහලොකු පණ්ඩිතයා, අය්යෝ! මේකා ද අපේ මහලොකු බහුශ්‍රැතයා. අය්යෝ! මේකා ද අපේ මහලොකු ත්‍රිවිද්‍යාධරයා. මේ ජාතියේ එකෙක් ව ඇසුරු කරන භවත් පුරුෂයා ඒ හේතුවෙන් ම කය බිඳී මරණින් මතු අපාය දුර්ගති විනිපාත නිරයේ තමයි උපදින්නේ. එම්බා අම්බට්ඨ, නුඹ භවත් ගෞතමයන් හට එකට එක හැප්පි හැප්පි කියන්න ගියා ඒ නිසා තමයි භවත් ගෞතමයන් වහන්සේ අපේ අතීතය එළියට ඇද ඇද දුන්නේ. "අය්යෝ! මේකා ද අපේ මහලොකු පණ්ඩිතයා, අය්යෝ! මේකා ද අපේ මහලොකු බහුශ්‍රැතයා. අය්යෝ! මේකා ද අපේ මහලොකු ත්‍රිවිද්‍යාධරයා. මේ ජාතියේ එකෙක් ව ඇසුරු කරන භවත් පුරුෂයා ඒ හේතුවෙන් ම කය බිඳී මරණින් මතු අපාය දුර්ගති විනිපාත නිරයේ තමයි උපදින්නේ" කියලා නො සතුටු සිතින් කිපුණු පොක්ඛරසාති බ්‍රාහ්මණයා අම්බට්ඨ මාණවකයාට දුන් පා පහරින් එතැනම බිම පෙරළී ගියා. ඒ ක්ෂණයෙහි ම භාග්‍යවතුන් වහන්සේව බැහැදකින්ට කැමැත්තක් ඇති වුණා.

95. අථ ඛෝ තේ බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පොක්ඛරසාතිං ඒතදවෝචුං: අතිවිකාලෝ ඛෝ භෝ අජ්ජ සමණං ගෝතමං දස්සනාය උපසංකමිතුං. සේවදානි භවං පොක්ඛරසාතී සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සතී"ති.

95. එතකොට ඒ බ්‍රාහ්මණවරු පොක්ඛරසාති බ්‍රාහ්මණයාට මෙහෙම කිව්වා. "භවත, අද ශ්‍රමණ ගෞතමයන්ව දකින්නට යන්න කිසිසේත් ම වෙලාව නොවෙයි. ඒ නිසා භවත් පෙක්ඛරසාතී, හෙට දවසේ ශ්‍රමණ ගෞතමයන් දකින්නට යන එක හොඳ යි."

අථ ඛෝ බ්‍රාහ්මණෝ සකේ නිවේසේන පණීතං ඛාදනීයං භෝජනීයං පටියාදාපෙත්වා යානේසු ආරෝපෙත්වා උක්කාසු ධාරියමානාසු උක්කට්ඨාය නිය්‍යාසි. යේන ඉච්ඡානංගලවනසණ්ඩෝ තේන පායාසි. යාවතිකා යානස්ස භූමි යානේන ගන්ත්වා යානා පච්චෝරෝහිත්වා පත්තිකෝ'ව යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මෝදිං සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නෝ ඛෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී භගවන්තං ඒතදවෝච: "ආගමානුඛවිධ භෝ

ගෝතම අම්හාකං අන්තේවාසී අම්බට්ඨෝ මාණවෝ?"ති. "ආගමා ඛෝ තේ බ්‍රාහ්මණ අන්තේවාසී අම්බට්ඨෝ මාණවෝ"ති.

ඉතින් පොක්ඛරසාතී බ්‍රාහ්මණයා තමන් ගේ නිවසේ ප්‍රණීත ලෙස කෑම්බීම් පිළියෙල කරගෙන රථවල තබාගෙන දඩුවැට පහන් අරගෙන උක්කට්ඨා නුවරින් නික්මුණා. ඉච්ඡානංගල වන පියසට පැමිණුනා. යානයෙන් යාහැකිතාක් බිම ගොස් එයින් බැහැලා පයින් භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටි තැනට ගියා. ගිහින් භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු වුණා. පිළිසඳර කථාබහේ යෙදිලා එකත්පස්ව වාඩි වුණා. එකත්පස්ව වාඩිවුණ පොක්ඛරසාති බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේගෙන් මෙකරුණ විමසුවා. "භවත් ගෞතමයෙනි, අම්බට්ඨ මාණවක කියලා අපේ ගෝලයෙක් මේ පැත්තේ ආවද?" "පින්වත් බ්‍රාහ්මණය, අම්බට්ඨ මාණවක කියන ඔබේ ගෝලයා මෙහේ ආව තමයි."

"අහු පන තේ භෝ ගෝතම අම්බට්ඨේන මාණවේන සද්ධිං කෝචිදේව කථාසල්ලාපෝ?"ති. "අහු ඛෝ පන මේ බ්‍රාහ්මණ අම්බට්ඨේන මාණවේන සද්ධිං කෝචිදේව කථාසල්ලාපෝ?"ති. "යථාකථං පන තේ භෝ ගෝතම අහු අම්බට්ඨේන මාණවේන සද්ධිං කෝචිදේව කථාසල්ලාපෝ?"ති.

"භවත් ගෞතමයෙනි, එතකොට අම්බට්ඨ මාණවකයාත් සමඟ ඔබ වහන්සේ ගේ යම් කිසි කථාබහක් ඇති වුණා ද?" "පින්වත් බ්‍රාහ්මණය, අම්බට්ඨ මාණවකයාත් සමග මගේ යම් කිසි කථාබහක් ඇති වුණා තමයි." "භවත් ගෞතමයෙනි, අම්බට්ඨ මාණවකයාත් සමග ඔබ වහන්සේ මොන වගේ කථාබහක් ද කළේ?"

අථ ඛෝ භගවා යාවතිකෝ අහෝසි අම්බට්ඨේන මාණවේන සද්ධිං කථාසල්ලාපෝ, තං සබ්බං බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස ආරෝචේසි.

එතකොට භාග්‍යවතුන් වහන්සේ අම්බට්ඨ මාණවකයා සමග යම්තාක් කථාබහක යෙදුනා ද, ඒ සෑම දෙයක් ම පොක්ඛරසාති බ්‍රාහ්මණයාට පවසා වදාළා.

එවං වුත්තෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී භගවන්තං එතදවෝච: බාලෝ භෝ ගෝතම අම්බට්ඨෝ මාණවෝ. ඛමතු භවං ගෝතමෝ අම්බට්ඨස්ස මාණවස්සා"ති. "සුඛී හෝතු බ්‍රාහ්මණ අම්බට්ඨෝ මාණවෝ"ති.

එසේ වදාළ විට පොක්ඛරසාතී බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පැවසුවා. “භවත් ගෞතමයෙනි, ඔය අම්බට්ඨ මාණවකයා මෝඩ යි. භවත් ගෞතමයාණෙනි අම්බට්ඨ මාණවකයාට කමා කරත්වා!” “පින්වත් බ්‍රාහ්මණය අම්බට්ඨ මාණවකයා සුවපත් වේවා!”

96. අථ ඛෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී භගවතෝ කායේ ද්වත්තිංසමහාපුරිසලක්ඛණානි සමන්නේසි. අද්දසා ඛෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී භගවතෝ කායේ ද්වත්තිංසමහාපුරිසලක්ඛණානි යේභුය්‍යෙන ඨපෙත්වා ද්වේ. ද්වීසු මහාපුරිසලක්ඛණේසු කංඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති කෝසෝහිතේ ච වත්ථගුය්හේ පහූතජිව්හතාය ච.

96. ඉතින් පොක්ඛරසාතී බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ ගේ ශරීරයෙහි තිබෙන මහාපුරුෂ ලක්ෂණ තිස්දෙක සොයන්න පටන් ගත්තා. එතකොට පොක්ඛරසාතී බ්‍රාහ්මණයා දෙකක් හැර මහාපුරුෂ ලක්ෂණ බොහොමයක් භාග්‍යවතුන් වහන්සේ ගේ කයෙහි තිබෙන බව දැක ගත්තා. ඔහු කෙමියක් තුළ බහාව් පරිද්දෙන් ඇති පුරුෂ නිමිත්තද, පුළුල් දිව ද යන මහාපුරුෂ ලක්ෂණ දෙක ගැන සැක කළා. විචිකිච්ඡා කළා. ඒ වටහා ගත්තේ නෑ. ඒ ගැන පැහැදුනේ නෑ.

97. අථ ඛෝ භගවා ඒතද්හෝසි: පස්සති ඛෝ මේ අයං බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී ද්වත්තිංසමහාපුරිසලක්ඛණානි යේභුය්‍යෙන ඨපෙත්වා ද්වේ. ද්වීසු මහාපුරිසලක්ඛණේසු කංඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති කෝසෝහිතේ ච වත්ථගුය්හේ පහූතජිව්හතාය චාති.

එතකොට භාග්‍යවතුන් වහන්සේට මේ අදහස ඇති වුණා. “මේ පොක්ඛරසාතී බ්‍රාහ්මණයා දෙකක් හැර මහාපුරුෂ ලක්ෂණ බොහොමයක් මාගේ කයෙහි තිබෙන බව දැක ගත්තා. නමුත් ඔහු කෙමියක් තුළ බහාව් පරිද්දෙන් ඇති පුරුෂ නිමිත්තද, පුළුල් දිව ද යන මහාපුරුෂ ලක්ෂණ දෙක ගැන සැක කරනවා. විචිකිච්ඡා කරනවා. ඒ වටහා ගන්නේ නෑ. ඒ ගැන පහදින්නේ නෑ.

අථ ඛෝ භගවා තථාරූපං ඉද්ධාභිසංඛාරං අභිසංඛාසි යථා අද්දස බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී භගවතෝ කෝසෝහිතං වත්ථගුය්හං. අථ ඛෝ භගවා ජිව්හං නින්නාමෙත්වා උභෝපිකණ්ණසෝතානි අනුමසි, පටිමසි. උභෝ’පි නාසිකාසෝතානි අනුමසි, පටිමසි. කේවලම්පි නළාටමණ්ඩලං ජිව්හාය ඡාදේසි.

ඉතින් භාග්‍යවතුන් වහන්සේ ඉර්ධි ප්‍රාතිහාර්යයක් දක්වා වදාළා. ඒ කියන්නේ පොක්ඛරසාතී බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ ගේ කෙමියක් තුළ බහාව් පරිද්දෙන් ඇති පුරුෂ නිමිත්ත දැක ගන්නවා ද අන්න ඒ ආකාරයට යි. ඒ වගේ ම භාග්‍යවතුන් වහන්සේ (මෙය ද ඉර්ධියකි) දිව නිකුත්කොට දෙකන් සිදුරු පිරිමැද වදාළා. දෙනාස්පුඩු පිරිමැද වදාළා. සම්පූර්ණ නලල් තලය දිවෙන් වසා වදාළා.

98. අථ ඛෝ බ්‍රාහ්මණස්ස පොක්ඛරසාදිස්ස ඒතදහෝසි: "සමන්නාගතෝ ඛෝ සමණෝ ගෝතමෝ ද්වත්තිංසමහාපුරිසලක්ඛණේහි පරිපුණ්ණේහි නෝ අපරිපුණ්ණේහී"ති භගවන්තං ඒතදවෝච: අධිවාසේතු මේ භවං ගෝතමෝ අජ්ජතනාය භත්තං සද්ධිං භික්ඛුසංඝේනා"ති. අධිවාසේසි භගවා තුණ්හීභාවේන.

එතකොට පොක්ඛරසාතී බ්‍රාහ්මණයාට මෙහෙම හිතුනා. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මහාපුරුෂ ලක්ෂණ තිස්දෙකෙන් ම පරිපූර්ණ යි. අපරිපූර්ණ නෑ කියලා. භාග්‍යවතුන් වහන්සේට මෙහෙම කිව්වා. "භවත් ගෞතමයෙනි, අද දවසේ දානය පිණිස මාගේ බත භික්ෂු සංඝයා සමග ඉවසා වදාළ මැනැව" කියලා. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව වැඩ සිටීමෙන් ඉවසා වදාළා.

99. අථ ඛෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාදී භගවතෝ, අධිවාසනං විදිත්වා භගවතෝ කාලං ආරෝචේසි: කාලෝ භෝ ගෝතම, නිට්ඨිතං භත්තන්ති.

99. ඉතින් පොක්ඛරසාති බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ ගේ නිශ්ශබ්දබව තුළින් එම ඇරැයුම පිළිගත්බව දැන භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන් වහන්ස, දැන් සුදුසු කාලය යි. දානය පිළියෙල කරල තියෙන්නේ" කියලා නිසිකල් එළඹි බව දන්වා සිටියා.

අථ ඛෝ භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසංඝේන යේන බ්‍රාහ්මණස්ස පෝක්ඛරසාතිස්ස පරිවේසනං තේනුපසංකමි. උපසංකමිත්වා පඤ්ඤත්තේ ආසනේ නිසීදි. අථ ඛෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී භගවන්තං පණීතේන ඛාදනීයේන භෝජනීයේන සහත්ථා සන්තප්පේසි සම්පවාරේසි මාණවකා'පි භික්ඛුසංඝං. අථ ඛෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී භගවන්තං භුත්තාවිං විනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා ඒකමන්තං නිසීදි.

ඉතින් භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි සිවුරු හැඳ පොරොවා, පාසිවුරු ගෙන භික්ෂු සංඝයා සමග පොක්ඛරසාති බ්‍රාහ්මණයා ගේ දන් බෙදන තැනට වැඩම කළා. වැඩම කොට පණවන ලද ආසනයන්හි වැඩ සිටියා. එතකොට පොක්ඛරසාති බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ ප්‍රණීත වූ වැළඳිය යුතු, අනුභව කළ යුතු දෙයින් සියතින් ම හොඳින් වැළඳෙව්වා. හොඳින් පිළිගැන්වුවා. තරුණ පිරිසත් භික්ෂු සංඝයා වහන්සේ සියතින් ම හොඳින් වැළඳෙව්වා. හොඳින් පිළිගැන්වුවා. පසුව පොක්ඛරසාති බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ දන් වළඳා අවසන් වූ පසු එක්තරා කුඩා ආසනයක් ගෙන එකත්පස්ව වාඩි වුණා.

100. ඒකමන්තං නිසින්නස්ස ඛෝ බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස භගවා අනුපුබ්බිකථං කථේසි, සෙය්‍යථීදං: දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං විකාරං සංකිලේසං නෙක්ඛම්මේ ච ආනිසංසං පකාසේසි. යදා භගවා අඤ්ඤාසි බ්‍රාහ්මණං පොක්ඛරසාතිං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං, අථ යා බුද්ධානං සාමුක්කංසිකා ධම්මදේසනා තං පකාසේසි: දුක්ඛං සමුදයං නිරෝධං මග්ගං.

100. එකත්පස්ව වාඩිවුණ පොක්ඛරසාති බ්‍රාහ්මණයා හට භාග්‍යවතුන් වහන්සේ අනුපිළිවෙළ කථාව වදාළා. ඒ කියන්නේ; දන් දීමේ අනුසස් ගැන කථාව, සිල් රැකීමෙහි අනුසස් ගැන කථාව, සුගතියෙහි උපත ගැන කථාව, කාමයන්හි ඇති පීඩාකාරීබව ගැන කථාව, කෙලෙස් නිසා ඇති වන කිළුට ගැන කථාව, එයින් නික්මීමෙන් ලැබෙන ආනිසංස ගැන කථාව වදාළා. එතකොට යම් වෙලාවක පොක්ඛරසාති බ්‍රාහ්මණයා එයට සවන් දීම නිසා යහපත් සිතක් ඇති වුණා ද, මෘදු සිතක් ඇති වුණා ද, නීවරණ බැහැර වුණ සිතක් ඇති වුණා ද, සතුටින් ඔද වැඩුණු සිතක් ඇති වුණා ද, පහන් වූ සිතක් ඇති වුණා ද, එය දැන වදාළ භාග්‍යවතුන් වහන්සේ බුදුවරයන් වහන්සේලා ගේ යම් සුවිශේෂී සාමුක්කංසික දේශනාවක් ඇද්ද ඒ කියන්නේ; දුක්ඛ ආර්ය සත්‍යය, සමුදය ආර්ය සත්‍යය, නිරෝධ ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධගාමිනී පටිපදා ආර්ය සත්‍යය යන චතුරාර්ය සත්‍යය වදාළා.

සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදේව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමේව ඛෝ බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස තස්මිං යේව ආසනේ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරෝධධම්මන්ති.

කළු පැල්ලම් නැති පිරිසිදු වස්ත්‍රයකට සායම් පොවද්දී ඉතා හොඳින් ඒ සායම් උරාගන්නේ යම්සේ ද ඒ අයුරින් ම පොක්ඛරසාති බ්‍රාහ්මණයා හටත් ඒ ආසනයේ දී ම හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා ස්වභාවයෙන් යුතු යමක් ඇද්ද ඒ හේතු ප්‍රත්‍යයන් නැති වීමෙන් ඒවා නිරුද්ධ වී යන ස්වභාවයට අයත් වන්නේ ය කියල කෙලෙස් රහිත වූ අවිද්‍යා මල රහිත වූ දහම් ඇස පහළ වුණා.

101. **අථ ඛෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී දිට්ඨධම්මෝ පත්තධම්මෝ විදිතධම්මෝ පරියෝගාළ්හධම්මෝ තිණ්ණවිචිකිච්ඡෝ විගතකථංකථෝ වේසාරජ්ජප්පත්තෝ අපරප්පච්චයා සත්ථුසාසනේ භගවන්තං ඒතදවෝච: "අභික්කන්තං භෝ ගෝතම අභික්කන්තං භෝ ගෝතම. සෙය්‍යථාපි භෝ ගෝතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටි-ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරේ වා තේල පජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තෝ රූපානි දක්ඛින්තීති. ඒවමේව භෝතා ගෝතමේන අනේකපරියායේන ධම්මෝ පකාසිතෝ. ඒසාහං භෝ ගෝතම සපුත්තෝ සභරියෝ සපරිසෝ සාමච්චෝ භගවන්තං ගෝතමං සරණං ග-ඡාම ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. උපාසකං මං භවං ගෝතමෝ ධාරේතු අජ්ජතග්ගේ පාණුපේතං සරණං ගතං. යථා ච භවං ගෝතමං උක්කට්ඨාය අඤ්ඤානි උපාසකකුලානි උපසංකමති ඒවමේව භවං ගෝතමෝ පොක්ඛරසාදිකුලං උපසංකමතු. තත්ථ යේ තේ මාණවකා වා මාණවිකා වා භවන්තං ගෝතමං අභිවාදෙස්සන්ති වා පච්චුට්ඨිස්සන්ති වා ආසනං වා උදකං වා දස්සන්ති චින්තං වා පසාදෙස්සන්ති, තේසං තං භවිස්සති දීඝරත්තං හිතාය සුඛාය"ති. "කල්‍යාණං වුච්චති බ්‍රාහ්මණා"ති.**

101. එතකොට ධර්මය දැකපු, ධර්මයට පැමිණි, ධර්මය අවබෝධ කළ, ධර්මයෙහි බැසගත්, සැකයෙන් එතෙර වුණ, කෙසේද කෙසේද කියන අවිශ්වාසයෙන් බැහැර වුණ, ආර්ය සත්‍ය ධර්මය තුළ විශාරදභාවටය පත් වුණ, ශාස්තෘ සාසනය තුළ බාහිර උපකාර නොසොයන බවට පත් වුණ පොක්ඛරසාති බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙය පවසා සිටියා. "ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි. යටට හරවා තිබූ දෙයක් උඩු අතට හැරෙව්වා වගෙයි. වහලා තිබුණු දෙයක් ඇරලා පෙන්නුවා වගෙයි. මං මුලා වූවන්ට නියම මග පෙන්වා දෙනවා වගෙයි. ඇස් ඇති උදවියට රූප දකින්න අඳුරෙහි තෙල් පහනක් දල්වා ගෙන දරා සිටිනවා වගෙයි. ඔය විදිහට භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ශ්‍රී සද්ධර්මය වදාළා. ස්වාමීනී, මේ මමත් භාග්‍යවතුන්

වහන්සේ ව සරණ යනවා. ශ්‍රී සද්ධර්මයත් ආර්ය මහා සංඝ රත්නයත් සරණ යනවා. ස්වාමීනී, මං ගැන අද පටන් දිවි තිබෙන තුරාවට ම තෙරුවන් සරණ ගිය උපාසකයෙක් ලෙස සළකන සේක්වා! ඒ මං පුතුන් සහිත ව, බිරින්දෑ සහිතව, පිරිස් සහිතව, ඇමැතිවරුන් සහිතව, භවත් ගෞතමයන් වහන්සේව සරණ යනවා. ශ්‍රී සද්ධර්මයත්, ආර්ය සංඝරත්නයත් සරණ යනවා. අද පටන් දිවි තිබෙන තුරාවට ම තෙරුවන් සරණ ගිය උපාසකයෙකු වශයෙන් භවත් ගෞතමයන් වහන්සේ මාව පිළිගන්නා සේක්වා. භවත් ගෞතමයන් වහන්සේ උක්කට්ඨා නගරයෙහි අනෙක් උපාසක පවුල් කරා යම් අයුරකින් වඩින සේක් ද, ඒ අයුරින් ම භවත් ගෞතමයන් වහන්සේ පොක්ඛරසාතී පවුල වෙත ද වඩින සේක්වා. එහිදී යම් මේ මාණවකයන් වේවා, මාණවිකාවන් වේවා, භවත් ගෞතමයන් වහන්සේට ආදරයෙන් වඳිනවා ම යි. යටහත් පැවැතුම් දක්වනවා ම යි. වැඩසිටින්ට අසුන් හෝ වළඳන්ට පැන් ආදිය හෝ පුදනවා ම යි. සිත හෝ පහදවා ගන්නවා ම යි. එය ඔවුන්ට බොහෝ කලක් හිත සුව පිණිස පවතීවි. "පින්වත් බ්‍රාහ්මණය, කල්‍යාණ වූ දෙයක් ම ය ඔය කීවේ."

අම්බට්ඨසුත්තං තතියං.
තුන් වෙනි අම්බට්ඨ සූත්‍රය නිමා විය.

සාදු ! සාදු !! සාදු !!!

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

4.
සෝණදණ්ඩ සුත්තං
සෝණදණ්ඩ බ්‍රාහ්මණයාට වදාළ දෙසුම

1. එවං මේ සුතං. එකං සමයං භගවා අංගේසු චාරිකං චරමානෝ මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි යේන චම්පා තදවසරි. තත්‍ර සුදං භගවා චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියං තීරේ.

1. මා හට අසන්ට ලැබුණේ මේ විදිහට යි. ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමඟ චාරිකාවේ වඩිමින් සිටිය දී චම්පා නගරයට ද වැඩම කොට වදාළා. ඒ චම්පා නගරයේ දී භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටියේ ගග්ගරා නම් වූ පොකුණ අසබඩය.

තේන ඛෝ පන සමයේන සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ චම්පං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨෝදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධේන සේනියේන බිම්බිසාරේන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

ඒ කාලයෙහි සෝණදණ්ඩ බ්‍රාහ්මණයා වාසය කළේ චම්පා නුවර ම යි. ඒ නගරය ඔහුට මගධ දේශාධිපති වූ සේනිය බිම්බිසාර රජුගෙන් ලැබුණු තෑග්ගක්. ඒක ශ්‍රේෂ්ඨ තෑග්ගක්. එහි බොහෝ ජනයා ඉන්නවා. තණ සහිත, දරසහිත, ජලය සහිත වූ, බොහෝ ධාන්‍ය තියෙනවා. රාජ පරිභෝග නගරයක්.

2. අස්සෝසි ඛෝ චම්පෙය්‍යකා බ්‍රහ්මණගහපතිකා "සමණෝ ඛලු භෝ ගෝතමෝ සක්‍යපුත්තෝ සක්‍යකුල පබ්බජිතෝ අංගේසු චාරිකං චරමානෝ මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි චම්පං අනුප්පත්තෝ, චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරේ. තං ඛෝ පන භවන්තං ගෝතමං එවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගතෝ: "ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරාථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති

ආදිකල්‍යාණං මජ්ඣේකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසේන්ති. සාධු ඛෝ පන තථාරූපානං අරහතං දස්සනං හෝතීති.

2. එතකොට චම්පා නුවරවාසී බ්‍රාහ්මණ ගෘහපතියන් හට මේ කථාව අසන්ට ලැබුණා. "භවත්නි, අන්න ශාක්‍ය පුත්‍ර වූ, ශාක්‍ය කුලයෙන් නික්මී පැවිදි වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමඟ අංග ජනපදයෙහි චාරිකාවේ වඩිද්දී චම්පා නුවරටත් වැඩම කරලා චම්පා නුවර ගග්ගරා පොකුණ අසබඩ වැඩ ඉන්නවා. ඒ භවත් ගෞතමයන් වහන්සේ ගැන මෙවැනි වූ කල්‍යාණ කීර්ති ඝෝෂාවක් පැතිර ගොසින් තියෙනවා. "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණින් අරහත් වන සේක! සම්මාසම්බුද්ධ වන සේක! විජ්ජාචරණසම්පන්න වන සේක! සුගත වන සේක! ලෝකවිදූ වන සේක! අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක! සත්ථා දේවමනුස්සානං වන සේක! බුද්ධ වන සේක! භගවා වන සේක! උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙවිමිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඤාණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා. එබඳු වූ රහතුන් දැකගන්නට ලැබීම කොතරම් යහපත් දෙයක් ද" කියලා.

3. අථ ඛෝ චම්පෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා චම්පාය නික්ඛමිත්වා සංසසංසි ගණිභූතා යේන ගග්ගරා පොක්ඛරණී තේනුපසංකමන්ති.

3. එතකොට චම්පා නුවරවැසි බ්‍රාහ්මණ ගෘහපතිවරුන් චම්පා නගරයෙන් නික්ම බොහෝ පිරිස් රැස්වෙලා, කණ්ඩායම් වශයෙන් හැදිලා (භාග්‍යවතුන් වහන්සේ බැහැදැකීම පිණිස) ගග්ගරා පොකුණ දිශාවට පැමිණෙමින් සිටියා.

4. තේන ඛෝ පන සමයේන සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ උපරිපාසාදේ දිවාසෙය්‍යං උපගතෝ හෝති. අද්දසා ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ චම්පෙය්‍යකේ බ්‍රාහ්මණගහපතිකේ චම්පාය නික්ඛමිත්වා සංසසංසී ගණිභූතේ යේන ගග්ගරා පොක්ඛරණී තේනුපසංකමන්තේ. දිස්වා ඛත්තං ආමන්තේසි:

"කින්නු ඛෝ භෝ ඛත්තේ චම්පෙය්‍යකා බ්‍රහ්මණගහපතිකා චම්පාය නික්ඛමිත්වා සංසසංසී ගණිභූතා යේන ගග්ගරාපෙක්ඛරණී තේනුපසංකමන්තී?"ති.

4. ඒ වෙලාවේ දී සෝණදණ්ඩ බ්‍රාහ්මණයා තම ප්‍රාසාදයෙහි උඩුමහල් තලයෙහි දහවල් විවේකයේ හාන්සි වී සිටියා. එතකොට චම්පා නුවරවැසි බ්‍රාහ්මණ ගෘහපතිවරුන් චම්පා නගරයෙන් නික්ම බොහෝ පිරිස් රැස්වෙලා, කණ්ඩායම් වශයෙන් හැදිලා (භාග්‍යවතුන් වහන්සේ බැහැදැකීම පිණිස) ගග්ගරා පොකුණ දෙසට ගමන් කරමින් සිටින අයුරු සෝණදණ්ඩ බ්‍රාහ්මණයාට දැකගන්ට ලැබුණා. දැක තම උපදේශක ඛත්ත නම් තැනැත්තා ඇමතුවා. "භවත් ඛත්ත, චම්පා නුවරවැසි බ්‍රාහ්මණ ගෘහපතිවරුන් මොන කරුණක් නිසා ද බොහෝ පිරිස් එකතුව, කණ්ඩායම් වශයෙන් රැස්වෙලා ගග්ගරා පොකුණ දිශාවට යන්නේ?"

"අත්ථි ඛෝ භෝ සමණෝ ගෝතමෝ සක්‍යපුත්තෝ සක්‍යකුලා පබ්බජිතෝ අංගේසු චාරිකං චරමානෝ මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි චම්පං අනුප්පත්තෝ චම්පායං විහරති ගග්ගරායපොක්ඛරණියා තීරේ. තං ඛෝ පන භවන්තං ගෝතමං ඒවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගත්තෝ: ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරාථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති. තමේතේ භවන්තං ගෝතමං දස්සනාය උපසංකමන්තී"ති.

"භවත, ශාක්‍ය කුලයෙන් පැවිදි වූ ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග අංග ජනපදයෙහි චාරිකාවේ වඩිද්දී චම්පා නුවරටත් වැඩම කරලා චම්පා නුවර ගග්ගරා පොකුණ අසබඩ වැඩ ඉන්නවා. ඒ භවත් ගෞතමයන් වහන්සේ ගැන මෙවැනි වූ කල්‍යාණ කීර්ති ඝෝෂාවක් පැතිර ගොසින් තියෙනවා. "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණින් අරහත් වන සේක! සම්මාසම්බුද්ධ වන සේක! විජ්ජාචරණසම්පන්න වන සේක! සුගත වන සේක! ලෝකවිදූ වන සේක! අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක! සත්ථා දේවමනුස්සානං වන සේක! බුද්ධ වන සේක! භගවා වන සේක! අන්න ඒ භවත් ගෞතමයන් වහන්සේව දැකීම පිණිසයි ඔය උදවිය යන්නේ."

5. තේන හි භෝ ඛත්තේ යේන චම්පෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා තේනුපසංකම. උපසංකමිත්වා චම්පෙය්‍යකේ බ්‍රාහ්මණගහපතිකේ ඒවං වදේහි: "සෝණදණ්ඩෝ භෝ බ්‍රාහ්මණෝ ඒවමාහ: ආගමෙන්තු කිර භවන්තෝ සෝණදණ්ඩෝ'පි බ්‍රාහ්මණෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සතී"ති.

5. එහෙමනම් භවත් ඛත්ත, චම්පා නුවරවැසි බ්‍රාහ්මණ ගෘහපතිවරුන් ළඟට යන්න. ගිහින් චම්පා නුවරවැසි බ්‍රාහ්මණ ගෘහපතිවරුන්ට මෙහෙම කියන්න. "භවත්නි, සෝණදණ්ඩ බ්‍රාහ්මණයා මෙහෙම කියනවා. "භවත්නි, මොහොතක් සිටිනු මැනව. ශ්‍රමණ ගෞතමයන් වහන්සේව බැහැදැකීම පිණිස සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ද පැමිණෙනවා" කියල.

ඒවං භෝ'ති ඛෝ සෝ ඛත්තා සෝණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යේන චම්පෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා තේනුපසංකමි. උපසංකමිත්වා චම්පෙය්‍යකේ බ්‍රාහ්මණගහපතිකේ ඒතදවෝච: "සෝණදණ්ඩෝ භෝ බ්‍රාහ්මණෝ ඒවමාහ: "ආගමෙන්තු කිර භවන්තෝ. සෝණදණ්ඩෝ'පි බ්‍රාහ්මණෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සතී"ති.

එසේය භවත, කියල ඒ ඛත්ත නම් තැනැත්තා සෝණදණ්ඩ බ්‍රාහ්මණයාට පිළිතුරු දීල චම්පා නුවරවැසි බ්‍රාහ්මණගෘහපතිවරුන් ළඟට ගියා. ගිහින් චම්පා නුවරවැසි බ්‍රාහ්මණගෘහපතිවරුන්ට මෙහෙම කිව්වා. "භවත්නි, සෝණදණ්ඩ බ්‍රාහ්මණයා මෙහෙම කියනවා. "භවත්නි, මොහොතක් සිටිනු මැනව. ශ්‍රමණ ගෞතමයන් වහන්සේව බැහැදැකීම පිණිස සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ද පැමිණෙනවා" කියල.

6. තේන ඛෝ පන සමයේන නානාවේරජ්ජකානං බ්‍රාහ්මණානං පඤ්චමත්තානි බ්‍රාහ්මණසතානි චම්පායං පටිවසන්ති කේනචිදේව කරණීයේන. අස්සෝසුං ඛෝ තේ බ්‍රාහ්මණා "සෝණදණ්ඩෝ කිර බ්‍රාහ්මණෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සතී"ති. අථ ඛෝ තේ බ්‍රාහ්මණා යේන සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ තේනුපසංකමිංසු. උපසංකමිත්වා සෝණදණ්ඩං බ්‍රාහ්මණං ඒතදවෝචුං. "සච්චං කිර භවං සෝණදණ්ඩෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සතී?"ති.

ඒ දිනවල නොයෙක් ප්‍රදේශවලින් පැමිණ සිටි පන්සියයක් පමණ වූ බ්‍රාහ්මණ පිරිසක් ද කිසියම් කටයුත්තකට පැමිණ චම්පා නුවර වාසය කළා. ඒ බ්‍රාහ්මණවරුන්ට සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ශ්‍රමණ ගෞතමයන් වහන්සේව

බැහැදකින්නට යන බව අසන්නට ලැබුණා. එතකොට ඒ බ්‍රාහ්මණවරුන් සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ළඟට ගියා. ගිහින් සෝණදණ්ඩ බ්‍රාහ්මණයාට මෙකරුණ කිව්වා. "භවත් සෝණදණ්ඩයන් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදකින්ට යන්ට ඉන්නවා කියල කියන්නේ හැබෑවක් ද?"

"එවං ඛෝ මේ හෝ හෝති අහම්පි සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සමී"ති.

"එසේය භවත්නි, මාත් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදැකීමට යන්ට තමයි ඉන්නේ"

7. "මා භවං සෝණදණ්ඩෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමි. න අරහති භවං සෝණදණ්ඩෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිතුං. සචේ භවං සෝණදණ්ඩෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සති, හෝතෝ සෝණදණ්ඩස්ස යසෝ හායිස්සති සමණස්ස ගෝතමස්ස යසෝ අභිවඩ්ඪිස්සති. යම්පි හෝතෝ සෝණදණ්ඩස්ස යසෝ හායිස්සති සමණස්ස ගෝතමස්ස යසෝ අභිවඩ්ඪිස්සති, ඉමිනා පංගේන න අරහති භවං සෝණදණ්ඩෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිතුං. සමණොත්වේව ගෝතමෝ අරහති භවන්තං සෝණදණ්ඩං දස්සනාය උපසංකමිතුං.

7. "හා ... හා ... භවත් සෝණදණ්ඩයන් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදකින්ට යන්ට එපා! භවත් සෝණදණ්ඩයන් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදැකීමට යන එක තමන් ගේ තත්වයට ගැලපෙන්නේ නෑ. ඉදින් භවත් සෝණදණ්ඩයන් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදකින්ට යනවා නම්, භවත් සෝණදණ්ඩයන් ගේ කීර්තිරාවය පිරිහිලා යාවි. ශ්‍රමණ ගෞතමයන් ගේ කීර්ති රාවය වඩ වඩාත් ඉහළ යාවි. භවත් සෝණදණ්ඩයන් ගේ කීර්තිය පිරිහීමත්, ශ්‍රමණ ගෞතමයන් ගේ කීර්තිය ඉහළ යෑමත් යන යම් කරුණක් ඇද්ද, මෙන්න මේ කරුණ නිසයි භවත් සෝණදණ්ඩයන් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදකින්ට යන එක සුදුසු නොවන්නේ. හැබැයි ශ්‍රමණ ගෞතමයන් නම් භවත් සෝණදණ්ඩයන්ව බැහැදැකීමට එන එක සුදුසු යි."

භවං හි සෝණදණ්ඩෝ උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන.

භවත් සෝණදණ්ඩයන් වනාහී මව් පාර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක් නෙව. සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වා ම පිරිසිදු කුල ප්‍රවේණියක් තියෙනවා නෙව. එනිසා ම කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස ලබා නෑ නෙව. ගැරහුම් ලබා නෑ නෙව.

යම්පි භවං සෝණදණ්ඩෝ උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. ඉමිනා පංගේන න අරහති භවං සෝණදණ්ඩෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිතුං. සමණෙනාත්වේව ගෝතමෝ අරහති භවන්තං සෝණදණ්ඩං දස්සනාය උපසංකමිතුං.

ඉතින් භවත් සෝණදණ්ඩයන් මව් පාර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක් යන යම් කරුණක් ඇද්ද, සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වාම පිරිසිදු කුල ප්‍රවේණියක් තියෙනවා යන යම් කරුණක් ඇද්ද, එනිසා ම කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස ලබා නැතිබවත්, ගැරහුම් ලබා නැතිබවත් යන යම් කරුණක් ඇද්ද, අන්න ඒ කාරණය නිසයි භවත් සෝණදණ්ඩයන් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදකින්ට යන එක සුදුසු නො වන්නේ. හැබැයි ශ්‍රමණ ගෞතමයන් නම් භවත් සෝණදණ්ඩයන්ව බැහැදැකීමට එන එක සුදුසු යි.

භවං හි සෝණදණ්ඩෝ අඩ්ඪෝ මහද්ධනෝ මහාභෝගෝ .....

ඒ වගේ ම භවත් සෝණදණ්ඩයන් වනාහී සැපසම්පතින් ආඪ්‍ය කෙනෙක් නෙව. මහා ධනවතෙක් නෙව. මහාභෝග ඇති කෙනෙක් නෙව .....

භවං හි සෝණදණ්ඩෝ අජ්ඣායකෝ. මන්තධරෝ, තිණ්ණං වේදානං පාරගූ සනිඝණ්ඩුකේටුභානං සාක්ඛරප්පභේදානං ඉතිහාසපඤ්චමානං, පදකෝ, වෙය්‍යාකරණෝ, ලෝකායතමහාපුරිසලක්ඛණේසු අන්වයෝ .....

ඒ වගේ ම භවත් සෝණදණ්ඩයන් වනාහී වේද හදාරණ කෙනෙක් නෙව. මන්ත්‍රධාරී කෙනෙක් නෙව. ඉතිහාසය පස්වෙනි කොට ඇති වේදසමයාගත භාෂා ශාස්ත්‍රයන්හි නිපුණත්වයක් ඇති අක්ෂර ප්‍රභේද ගැන හසල බුද්ධිය ඇති ත්‍රිවේද පාරප්‍රප්ත කෙනෙක් නෙව. වේදසමයාගත පද පාඨ දන්නා

කෙනෙක් නෙව. ව්‍යාකරණ දන්නා කෙනෙක් නෙව. ලෝකායත ශාස්ත්‍රයෙහි, මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයෙහි නිපුණ කෙනෙක් නෙව .....

භවං හි සෝණදණ්ඩෝ අභිරූපෝ, දස්සනීයෝ, පාසාදිකෝ, පරමායවණ්ණපොක්ඛරතාය සමන්නාගතෝ, බ්‍රහ්මවණ්ණී, බ්‍රහ්මවච්චසී, අක්ඛුද්දාවකාසෝ දස්සනාය .....

ඒ වගේම භවත් සෝණදණ්ඩයන් වනාහී ඉතා රූපවත් කෙනෙක් නෙව. සොඳුරු පෙනුමක් ඇති කෙනෙක් නෙව. දුටුවන් පහදින කෙනෙක් නෙව. උතුම් වර්ණ සෞන්දර්යයෙන් යුතු කෙනෙක් නෙව. රන්වන් පැහැ ඇති කෙනෙක් නෙව. බ්‍රහ්මයා ගේ බඳු ශරීරාලෝකය ඇති කෙනෙක් නෙව. දැකීමට පවා ඉඩකඩ අපහසුවෙන් ලැබිය යුතු කෙනෙක් නෙව .....

භවං හි සෝණදණ්ඩෝ සීලවා වුද්ධසීලී වුද්ධසීලේන සමන්නාගතෝ ..... භවං හි සෝණදණ්ඩෝ කල්‍යාණවාචෝ කල්‍යාණවාක්කරණෝ, පෝරියාවාචාය සමන්නාගතෝ විස්සට්ඨාය අනේලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා .....

ඒ වගේ ම භවත් සෝණදණ්ඩයන් වනාහී සිල්වත් නෙව, වැඩුණු සිල් ඇති කෙනෙක් නෙව. වැඩුණු සීලයෙන් සමන්විත කෙනෙක් නෙව ..... ඒ වගේ ම භවත් සෝණදණ්ඩයන් වනාහී මිහිරි වචන ඇති කෙනෙක් නෙව. මිහිරි ලෙස කරුණු විග්‍රහ කරන කෙනෙක් නෙව. ශිෂ්ඨසම්පන්න වචන ඇති කෙනෙක් නෙව. නො විසුරුණු වචන ඇති කෙනෙක් නෙව. පැහැදිලි වචන ඇති කෙනෙක් නෙව. අරුත් මතු කොට කථා කරන කෙනෙක් නෙව .....

භවං හි සෝණදණ්ඩෝ බහුන්නං ආචරියපාචරියෝ, තීණි මාණවකසතානි මන්තේ වාචේති. බහූ ඛෝ පන නානාදිසා නානාජනපදා මාණවකා ආගච්ඡන්ති භෝතෝ සෝණදණ්ඩස්ස සන්තිකේ මන්තත්ථිකා මන්තේ අධීයිතුකාමා .....

ඒ වගේ ම භවත් සෝණදණ්ඩයන් වනාහී බොහෝ දෙනාට ආචාර්ය ප්‍රාචාර්ය වූ කෙනෙක් නෙව. බ්‍රාහ්මණ මාණවකයන් තුන් සියයකට වේදය උගන්වන කෙනෙක් නෙව. භවත් සෝණදණ්ඩයන් සමීපයෙහි වේද හදාරණු කැමැති, එහි ප්‍රයෝජන ඇති මාණවකයින් නානාදිසාවලින්, නානාජනපද-වලින් බොහෝ සෙයින් එනවා නෙව .....

භවං හි සෝණදණ්ඩෝ ජින්නෝ වුද්ධෝ මහල්ලකෝ අද්ධගතෝ වයෝ අනුප්පත්තෝ. සමණෝ ගෝතමෝ තරුණෝ චේව තරුණපබ්බජිතෝ ච .....

ඒ වගේ ම භවත් සෝණදණ්ඩයන් වනාහී වයෝවෘද්ධ කෙනෙක් නෙව. මහළු කෙනෙක් නෙව. පිළිවෙලින් වයසට පත් වූ කෙනෙක් නෙව. නමුත් ශ්‍රමණ ගෞතමයන් තරුණයි නෙ. ඒ වගේ ම තරුණ පැවිද්දෙක් නෙ .....

භවං හි සෝණදණ්ඩෝ රඤ්ඤෝ මාගධස්ස සේනියස්ස බිම්බිසාරස්ස සක්කතෝ ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ .....

ඒ වගේ ම භවත් සෝණදණ්ඩයන් වනාහී මගධේශ්වර සේනිය බිම්බිසාර නිරිඳුන්ගෙන් සත්කාර ලැබූ කෙනෙක් නෙව. ගෞරව ලැබූ කෙනෙක් නෙව. බුහුමන් ලැබූ කෙනෙක් නෙව. පිදුම් ලැබූ කෙනෙක් නෙව. යටහත් පැවැතුම් ලැබූ කෙනෙක් නෙව .....

භවං හි සෝණදණ්ඩෝ බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස සක්කතෝ ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ .....

ඒ වගේ ම භවත් සෝණදණ්ඩයන් වනාහී පොක්ඛරසාති බ්‍රාහ්මණතුමාගෙන් සත්කාර ලැබූ කෙනෙක් නෙව. ගෞරව ලැබූ කෙනෙක් නෙව. බුහුමන් ලැබූ කෙනෙක් නෙව. පිදුම් ලැබූ කෙනෙක් නෙව. යටහත් පැවැතුම් ලැබූ කෙනෙක් නෙව .....

භවං හි සෝණදණ්ඩෝ චම්පං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨෝදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධේන සේනියේන බිම්බිසාරේන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

ඒ වගේ ම භවත් සෝණදණ්ඩයන් වනාහී මගධේශ්වර සේනිය බිම්බිසාර නිරිඳුන් විසින් දෙන ලද රාජ දායාදය වූ ශ්‍රේෂ්ඨ ත්‍යාගය වූ රාජපරිභෝග වූ බොහෝ ජනයා ගැවසී සිටින, තණ දර දිය ආදියෙන් පිරි, ධාන්‍යයෙන් පිරි චම්පා නගරයෙහි (ප්‍රධානව) වසන කෙනෙක් නෙව.

යම්පි භවං සෝණදණ්ඩෝ චම්පං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨෝදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධේන සේනියේන

බිම්බිසාරේන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං, ඉමිනා පංගේන න අරහති භවං සෝණදණ්ඩෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිතුං. සමණොත්වේව ගෝතමෝ අරහති භවන්තං සෝණදණ්ඩං දස්සනාය උපසංකමිතුන්ති.

ඒ වගේ ම භවත් සෝණදණ්ඩයන් මගධේශ්වර සේනිය බිම්බිසාර නිරිඳුන් විසින් දෙන ලද රාජ දායාදය වූ ශ්‍රේෂ්ඨ ත්‍යාගය වූ රාජපරිභෝග වූ බොහෝ ජනයා ගැවසී සිටින, තණ දර දිය ආදියෙන් පිරි, ධාන්‍යයෙන් පිරි චම්පා නගරයෙහි (ප්‍රධානව) වාසය කරනවා යන යම් කරුණක් ඇද්ද, මෙන්න මේ කරුණ නිසයි භවත් සෝණදණ්ඩයන් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදකින්ට යන එක සුදුසු නොවන්නේ. හැබැයි ශ්‍රමණ ගෞතමයන් නම් භවත් සෝණදණ්ඩයන්ව බැහැදැකීමට එන එක සුදුසු යි.”

8. එවං වුත්තේ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ තේ බ්‍රාහ්මණේ එතදවෝච: තේන හි භෝ මමපි සුණාථ, යථා මයමේව අරහාම තං භවන්තං ගෝතමං දස්සනාය උපසංකමිතුං. නත්වේව අරහති සෝ භවං ගෝතමෝ අම්හාකං දස්සනාය උපසංකමිතුං. සමණෝ ඛ්වි ගෝතමෝ උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාවසත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන.

8. මෙසේ පැවසූ විට සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ඒ බ්‍රාහ්මණවරුන්ට මෙහෙම කිව්වා. “එසේ වී නම් භවත්නි, ඒ භවත් ගෞතමයන් වහන්සේව බැහැ දකින්ට යෑම අපට කොයිතරම් සුදුසුද යන වගටත්, ඒ වගේ ම ඒ භවත් ගෞතමයන් වහන්සේ වැනි උතුමෙක් අපව දකින්ට පැමිණීම උන්වහන්සේ ගේ තත්වයට සුදුසු නැති වගටත් කියවෙන මගේ වචනය ද අසනු මැනැව. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ද මව් පාර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක්. සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වාම පිරිසිදු කුල ප්‍රවේණියක් තියෙනවා. එනිසා ම කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස ලබා නෑ. ගැරහුම් ලබා නෑ.

යම්පි භෝ සමණෝ ගෝතමෝ උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාවසත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. ඉමිනා පංගේන න අරහති සෝ භවං ගෝතමෝ අම්හාකං දස්සනාය උපසංකමිතුං. අථ ඛෝ මයමේව අරහාම තං භවන්තං ගෝතමං දස්සනාය උපසංකමිතුන්ති.

ඉතින් භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මව් පාර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක් යන යම් කරුණක් ඇද්ද, සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වාම පිරිසිදු කුල ප්‍රවේණියක් තියෙනවා යන යම් කරුණක් ඇද්ද, එනිසා ම කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස ලබා නැතිබවත්, ගැරහුම් ලබා නැතිබවත් යන යම් කරුණක් ඇද්ද, අන්න ඒ කාරණය මත ඒ භවත් ගෞතමයන් වහන්සේ වැනි උතුමෙක් අපව දකින්ට පැමිණීම උන්වහන්සේ ගේ තත්වයට සුදුසු නැහැ ම යි. එනිසා ශ්‍රමණ භවත් ගෞමයන් වහන්සේව බැහැදකින්ට යෑම අපට ම යි සුදුසු.

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ මහන්තං ඤාතිසංඝං විහාය පබ්බජීතෝ ..... සමණෝ ඛ්වි හෝ ගෝතමෝ පහූතං හිරඤ්ඤසුවණ්ණං විහාය පබ්බජීතෝ භූමිගතඤ්ච වේහාසට්ඨඤ්ච .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මහත් ඤාතිපිරිසක් අත්හැර දමා උතුම් පැවිදිබව ලැබූ කෙනෙක් නෙව ..... ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පොළොවට අයත් වූත්, පොළොවෙන් උඩ තිබෙන්නා වූත් බොහෝ රන් රිදී ආදී වස්තුව අත්හැර දමා උතුම් පැවිදිබව ලැබූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ දහරෝ ච සමණෝ යුවා සුසු කාළකේසෝ භද්දේන යොබ්බණේන සමන්නාගතෝ පඨමේන වයසා අගාරස්මා අනගාරියං පබ්බජීතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඉතා තරුණ වූ යෞවන කාලයේ දී ම මනා කළු කෙස් ඇති හද්‍ර වූ යොවුන් වියෙහි සිටිය දී ම ජීවිතයෙහි ප්‍රථම වයසේ දී ගිහිගෙයින් නික්ම අනගාරිකව උතුම් පැවිදිබව ලැබූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ අකාමකානං මාතාපිතූන්නං අස්සුමුඛානං රුදන්තානං කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජීතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තමන් ගේ රාජවංශික දෙමාපියන් අකැමැත්තෙන් කඳුළු වැකුණු මුහුණින් හඬද්දී ම කෙස් රැවුල් බා

කසාවත් පොරොවා ගෙන ගිහිගෙයින් නික්ම අනගාරිකව උතුම් පැවිදිබව ලැබූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්‍ව භෝ ගෝතමෝ අභිරූපෝ දස්සනීයෝ පාසාදිකෝ පරමායවණ්ණපොක්ඛරතාය සමන්නාගතෝ බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුද්දාවකාසෝ දස්සනාය .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ද ඉතා රූපවත් කෙනෙක් නෙව. සොඳුරු පෙනුමක් ඇති කෙනෙක් නෙව. දුටුවන් පහදින කෙනෙක් නෙව. උතුම් වර්ණ සෞන්දර්යයෙන් යුතු කෙනෙක් නෙව. රන්වන් පැහැ ඇති කෙනෙක් නෙව. බ්‍රහ්මයා ගේ බඳු ශරීරාලෝකය ඇති කෙනෙක් නෙව. දැකීමට පවා ඉඩකඩ අපහසුවෙන් ලැබිය යුතු කෙනෙක් නෙව .....

සමණෝ ඛ්‍ව භෝ ගෝතමෝ සීලවා අරියසීලී කුසලසීලි කුසලසීලේන සමන්නාගාතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ආර්ය වූ සිල් ඇති කෙනෙක් නෙව, කුසල සිල් ඇති කෙනෙක් නෙව. කුසල සීලයෙන් සමන්විත කෙනෙක් නෙව .....

සමණෝ ඛ්‍ව භෝ ගෝතමෝ කල්‍යාණවාචෝ කල්‍යාණවාක්කරණෝ පෝරියා වාචාය සමන්නාගතෝ විස්සට්ඨාය අනේලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ද මිහිරි වචන ඇති කෙනෙක් නෙව. මිහිරි ලෙස කරුණු විග්‍රහ කරන කෙනෙක් නෙව. ශිෂ්ඨසම්පන්න වචන ඇති කෙනෙක් නෙව. නො විසුරුණු වචන ඇති කෙනෙක් නෙව. පැහැදිලි වචන ඇති කෙනෙක් නෙව. අරුත් මතු කොට කථා කරන කෙනෙක් නෙව .....

සමණෝ ඛ්‍ව භෝ ගෝතමෝ බහුන්නං ආචරියපාචරියෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ද බොහෝ ජනයා හට ආචාර්ය ප්‍රාචාර්ය වූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ ඛීණකාමරාගෝ විගතචාපල්ලෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කාමරාගය ක්ෂය කළ කෙනෙක් නෙව. චපලබව බැහැර කළ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ කම්මවාදී කිරියවාදී අපාපපුරෙක්ඛාරෝ බ්‍රහ්මඤ්ඤය පජාය .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කර්මවාදී ක්‍රියාවාදී උත්තමයෙක් නෙව. ශ්‍රේෂ්ඨ වූ දෙය ම පෙරටු කොට ඇති කෙනෙක් නෙව. උතුම් බ්‍රාහ්මණ පිරිසටත් අවශේෂ ප්‍රජාවටත් නායකත්වය දරණ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ උච්චා කුලා පබ්බජිතෝ අසම්භින්න ඛත්තියකුලා .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සම්භේද නොවූ පිරිසිදු රාජවංශික කුල ප්‍රවේණි ඇති උසස් ම වංශයෙන් පැවිදි වූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ අඩ්ඪා කුලා පබ්බජිතෝ මහද්ධනා මහාභෝගා .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ආඪ්‍ය වූ මහාධන ඇති මහාභෝග ඇති කුලවත් වංශයෙන් පැවිදි වූ කෙනෙක් නෙව .....

සමණං ඛ්වි හෝ ගෝතමං තිරෝරට්ඨා තිරෝජනපදා සම්පුච්ඡිතුං ආගච්ඡන්ති .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වෙත පිටරටවලින් ද පිට ජනපදවලින් ද ප්‍රශ්න විසඳා ගැනීමට බොහෝ පිරිස් පැමිණෙනවා නෙව .....

සමණං ඛ්වි හෝ ගෝතමං අනේකානි දේවතාසහස්සානි පාණේහි සරණං ගතානි .....

ඒ වගේ ම අනේක වූ දහස් සංඛ්‍යාත දෙවිවරුන් භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේව දිවිහිමියෙන් සරණ ගිහින් තිබෙනවා නෙව .....

සමණං ඛ්වි හෝ ගෝතමං ඒවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගතෝ ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසධම්මසාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පිළිබඳ ව මේ ආකාර වූ කල්‍යාණ කීර්ති ඝෝෂාවක් පැතිර ගිහින් තිබෙනවා නෙව. "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණින් අරහත් වන සේක! සම්මාසම්බුද්ධ වන සේක! විජ්ජාචරණසම්පන්න වන සේක! සුගත වන සේක! ලෝකවිදූ වන සේක! අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක! සත්ථා දේවමනුස්සානං වන සේක! බුද්ධ වන සේක! භගවා වන සේක!" කියල .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ ද්වත්තිංසමහාපුරිසලක්ඛණේහි සමන්නාගතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මහාපුරුෂ ලක්ෂණ තිස්දෙකකින් සමන්විත වූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ ඒහිසාගතවාදී, සඛ්ලෝ, සම්මෝදකෝ, අබ්භාකුටිකෝ, උත්තානමුඛෝ, පුබ්බභාසී .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තමන් වෙත පැමිණෙන පිරිසට ඉතා සුහද ලෙස "එන්න ඔබේ පැමිණීම සාදරයෙන් පිළිගනිමු" කියමින් පිළිගන්නා කෙනෙකි. මිහිරි වචන කථා කරන කෙනෙකි. පිළිසඳර කථාවෙහි ඉතා දක්ෂ කෙනෙකි. කවර කරුණකටවත් ඇහිබැම හකුළුවා නොබලන කෙනෙකි. විනෑම කෙනෙක් දෙස ප්‍රියශීලී ලෙස මුහුණ ඔසවා කෙළින් බලන කෙනෙකි. පැමිණි පිරිසට පළමුවෙන් ම කථාබස් කරන කෙනෙකි .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ චතුන්නං පරිසානං සක්කතෝ ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව්වණක් පිරිසෙන් සත්කාර ලැබූ කෙනෙකි. ගෞරව ලැබූ කෙනෙකි. බුහුමන් ලැබූ කෙනෙකි. පිදුම් ලැබූ කෙනෙකි. යටහත් පැවැතුම් ලැබූ කෙනෙකි .....

සමණේ ඛ්‍ව හෝ ගෝතමේ බහූදේවා මනුස්සා ච අභිප්පසන්නා .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කෙරෙහි බොහෝ දෙවිවරුත්, බොහෝ මිනිසුනුත් අතිශයින් ම පැහැදීමෙන් යුක්තයි නෙව .....

සමණෝ ඛ්‍ව හෝ ගෝතමෝ යස්මිං ගාමෝ වා නිගමෝ වා පටිවසති, න තස්මිං ගාමේ වා නිගමේ වා අමනුස්සා මනුස්සේ විහේඨෙන්ති .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යම් ගමක වේවා, නියම්ගමක වේවා, වැඩසිටිනවා නම් ඒ ගමේවත්, නියම්ගමේවත් අමනුෂ්‍යයන් මිනිසුන් හට කිසි පීඩාවක් කරන්නේ නෑ .....

සමණෝ ඛ්‍ව හෝ ගෝතමෝ සංඝී ගණී ගණාචරියෝ පුථුතිත්ථකරානං අග්ගමක්ඛායති .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මහා පිරිස් සහිත යි. විශාල පිරිස්වලට ආචාර්ය වශයෙන් සිටින්නේ. ඒ වගේ ම බොහෝ ආගමික නායකයන් අතරින් උන්වහන්සේ තමයි අග්‍ර වන්නේ .....

යථා ඛෝ පන හෝ ඒතේසං සමණබ්‍රාහ්මණානං යථා වා තථා වා යසෝ සමුදාගච්ඡති න හේවං සමණස්ස ගෝතමස්ස යසෝ සමුදාගතෝ. අථ ඛෝ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සමණස්ස ගෝතමස්ස යසෝ සමුදාගතෝ .....

භවත්නි, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ කීර්තිරාවය තියෙන්නේ ඔවුන් ගේ යම් යම් ව්‍රත සමාදන් වීම් ආදී බාහිර දේ මුල් කර ගෙන යි. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ කීර්තිය පැතිරිලා තියෙන්නේ එවන් කරුණක් දෙකක් මුල් කර ගෙන නොවේ. සැබැවින් ම අනුත්තර වූ (අවබෝධ ඤාණය නම් වූ විද්‍යාවෙනුත් ඊට අනුකූල හැසිරීම නම් වූ චරණයෙනුත් යන)

විජ්ජාචරණ සම්පන්න ගුණයෙන් ම යි ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ කීර්තිරාවය පැතිරී තියෙන්නේ .....

සමණං ඛ්වි හෝ ගෝතමං රාජා මාගධෝ සේනියෝ බිම්බිසාරෝ සපුත්තෝ සභරියෝ සපරිසෝ සාමච්චෝ පාණේහි සරණං ගතෝ .....

ඒ වගේ ම මගධේශ්වර සේනිය බිම්බිසාර නිරිඳාණන් සිය දරුවනුත් හා එක්ව, බිරින්දෑවරුන් හා එක්ව, පිරිස් හා එක්ව, ඇමැතිවරුන් හා එක්ව භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේව දිවිහිමියෙන් සරණ ගිහිල්ලයි ඉන්නේ .....

සමණං ඛ්වි හෝ ගෝතමං රාජා පසේනදී කෝසලෝ සපුත්තෝ සභරියෝ සපරිසෝ සාමච්චෝ පාණේහි සරණං ගතෝ .....

ඒ වගේ ම පසේනදී කෝසල නිරිඳාණන් සිය දරුවනුත් හා එක්ව, බිරින්දෑවරුන් හා එක්ව, පිරිස් හා එක්ව, ඇමැතිවරුන් හා එක්ව භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේව දිවිහිමියෙන් සරණ ගිහිල්ලයි ඉන්නේ .....

සමණං ඛ්වි හෝ ගෝතමං බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී සපුත්තෝ සභරියෝ සපරිසෝ සාමච්චෝ පාණේහි සරණං ගතෝ .....

ඒ වගේ ම පොක්ඛරසාතී බ්‍රාහ්මණතුමා සිය දරුවනුත් හා එක්ව, බිරින්දෑවරුන් හා එක්ව, පිරිස් හා එක්ව, ඇමැතිවරුන් හා එක්ව භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේව දිවිහිමියෙන් සරණ ගිහිල්ලයි ඉන්නේ .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ රඤ්ඤෝ මාගධස්ස සේනියස්ස බිම්බිසාරස්ස සක්කතෝ ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මගධේශ්වර සේනිය බිම්බිසාර නිරිඳාණන් ගෙන් සත්කාර ලැබූ කෙනෙකි. ගෞරව ලැබූ කෙනෙකි. බුහුමන් ලැබූ කෙනෙකි. පිදුම් ලැබූ කෙනෙකි. යටහත් පැවැතුම් ලැබූ කෙනෙකි .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ රඤ්ඤෝ පසේනදිස්ස කෝසලස්ස සක්කතෝ ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පසේනදී කෝසල නිරිඳාණන් ගෙන් සත්කාර ලැබූ කෙනෙකි. ගෞරව ලැබූ කෙනෙකි. බුහුමන් ලැබූ කෙනෙකි. පිදුම් ලැබූ කෙනෙකි. යටහත් පැවැතුම් ලැබූ කෙනෙකි .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාතිස්ස සක්කතෝ ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පොක්ඛරසාතී බ්‍රාහ්මණතුමා ගෙන් සත්කාර ලැබූ කෙනෙකි. ගෞරව ලැබූ කෙනෙකි. බුහුමන් ලැබූ කෙනෙකි. පිදුම් ලැබූ කෙනෙකි. යටහත් පැවැතුම් ලැබූ කෙනෙකි .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරේ. යේ ඛෝ පන හෝ කේචි සමණා වා බ්‍රාහ්මණා වා අම්හාකං ගාමක්ඛෙත්තං ආගච්ඡන්ති, අතිථී නෝ තේ හොන්ති. අතිථී ඛෝ පනම්හේහි සක්කාතබ්බා ගරුකාතබ්බා මානේතබ්බා පූජේතබ්බා අපචේතබ්බා. යම්පි හෝ සමණෝ ගෝතමෝ චම්පං අනුප්පත්තෝ චම්පායං විහරති ගග්ගරාය පොක්ඛරණියා තීරේ. අතිථම්හාකං සමණෝ ගෝතමෝ. අතිථී ඛෝ පනම්හේහි සක්කාතබ්බෝ ගරුකාතබ්බෝ මානේතබ්බෝ පූජේතබ්බෝ අපචේතබ්බෝ. ඉමිනාපනංගේන න අරහති සෝ භවං ගෝතමෝ අම්හකං දස්සනාය උපසංකමිතුං. අථ ඛෝ පන මයමේව අරහාම තං භවන්තං ගෝතමං දස්සනාය උපසංකමිතුං.

ඒ භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ චම්පා නුවර ගග්ගරා පොකුණ අසබඩ වැඩසිටිනවා. ඉතින් යම්කිසි ශ්‍රමණවරුන් වේවා බ්‍රාහ්මණවරුන් වේවා අප ගේ ගම් කෙතට සම්ප්‍රාප්ත වෙනවා නම් ඔවුන් අපට ආගන්තුක පිරිසකි. අප විසින් ඒ ආගන්තුක පිරිසට සත්කාර කළ යුතු යි. ගරු කළ යුතු යි. පිදිය යුතු යි. යටහත් පැවතුම් දැක්විය යුතු යි. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ චම්පාවට වැඩම කරලා, චම්පාවෙහි ගග්ගරා පොකුණ අසබඩ වැඩ සිටිනවා ද, ඒ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ අප ගේ ආගන්තුකයෙක් ම යි. ඉතින් අප විසින් ආගන්තුක වූ උන්වහන්සේට සත්කාර කළ යුතු යි. ගරු කළ යුතු යි. පිදිය යුතු යි. යටහත් පැවතුම් දැක්විය යුතු යි. ඔන්න ඔය කාරණයේ දීත් ඒ භවත් ගෞතමයන් වහන්සේ වැනි උතුමෙක් අපව දකින්ට පැමිණීම උන්වහන්සේ ගේ තත්වයට සුදුසු නැහැ ම යි. එනිසා ශ්‍රමණ භවත් ගෞමයන් වහන්සේව බැහැදකින්ට යෑම අපට ම යි සුදුසු.

එත්තකෝ ඛෝ අහං භෝ තස්ස භෝතෝ ගෝතමස්ස ගුණේ පරියාපුණාමි. නෝ ච සෝ භවං ගෝතමෝ එත්තකවණ්ණෝ. අපරිමාණවණ්ණෝ හි සෝ භවං ගෝතමෝ"ති.

භවත්නි, ඒ භවත් ගෞතමයන් වහන්සේ ගේ ගුණය පිළිබඳ ව මා දන්නේ ඔව්වර යි. නමුත් ඒ භවත් ගෞතමයන් වහන්සේ නම්, ගුණ ඔව්වරක් පමණක් තිබෙන උත්තමයෙක් නොවෙයි. ඒ භවත් ගෞතමයන් වහන්සේ ප්‍රමාණ කළ නො හැකි වූ ගුණ සම්පත්වලින් යුක්ත යි.

9. එවං වුත්තේ තේ බ්‍රාහ්මණා සෝණදණ්ඩං බ්‍රාහ්මණං එතදවෝචුං: යථා ඛෝ භවං සෝණදණ්ඩෝ සමණස්ස ගෝතමස්ස වණ්ණේ භාසති ඉතෝ චේපි සෝ භවං ගෝතමෝ යෝජනසතේ විහරති, අලමේව සද්ධේන කුලපුත්තේන දස්සනාය උපසංකමිතුං අපි පුටෝසේන. තේන හි භෝ සබ්බේව මයං සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සාමා"ති.

9. මෙසේ පැවසූ විට ඒ බ්‍රාහ්මණවරු සෝණදණ්ඩ බ්‍රාහ්මණයාට මෙහෙම කිව්වා. "භවත් සෝණදණ්ඩයන් ශ්‍රමණ ගෞතමයන් ගේ ගුණයන් යම් ආකාරයකින් පැවසුවා නම්, ඒ ආකාරයෙන් යුතු ගුණ ඇති ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යොදුන් සියයක් එපිටින් වාසය කළත් සැදැහැවත් කුලපුත්‍රයෙක් විසින් මග වියදම් ද රැගෙන උන්වහන්සේව බැහැදකින්ට යෑම සුදුසු දෙයක් ම යි. එහෙමනම් අපි හැමෝම ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේව බැහැ දකින්ට යමු."

අථ ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ මහතා බ්‍රාහ්මණගණේන සද්ධිං යේන ගග්ගරා පොක්ඛරණී තේනුපසංකමි.

ඉතින් සෝණදණ්ඩ බ්‍රාහ්මණයා මහත් වූ බ්‍රාහ්මණ පිරිසත් සමග ගග්ගරා පොකුණ දෙසට පිටත් වුණා.

10. අථ ඛෝ සෝණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස තිරෝවනසණ්ඩගසතස්ස එවං චේතසෝ පරිවිතක්කෝ උදපාදි: "අහඤ්චේව ඛෝ පන සමණං ගෝතමං පඤ්හං පුච්ඡෙය්‍යං, තත්‍ර චේ මං සමණෝ ගෝතමෝ එවං වදෙය්‍ය: "න ඛෝ ඒස බ්‍රාහ්මණ පඤ්හෝ එවං පුච්ඡිතබ්බෝ, එවං නාමේස බ්‍රාහ්මණ පඤ්හෝ පුච්ඡිතබ්බෝ"ති. තේන මං අයං පරිසා පරිභවෙය්‍ය: "බාලෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ අබ්‍යත්තෝ, නාසක්ඛි සමණං ගෝතමං යෝනිසෝ පඤ්හං

පුච්ඡිතුන්ති.” යං ඛෝ පනායං පරිසා පරිහවෙය්‍ය, යසෝ’පි තස්ස හායේථ, යස්ස ඛෝ පන යසෝ හායේථ භෝගා’පි තස්ස හායෙයුං. යසෝලද්ධා ඛෝ පනාම්හාකං භෝගා.

10. ඉතින් සෝණදණ්ඩ බ්‍රාහ්මණයාට ඒ වන ගොමුව අතරින් යද්දී මෙවැනි කල්පනාවක් ඇති වුණා. “ඉදින් මං ශ්‍රමණ ගෞතමයන් වහන්සේගෙන් ප්‍රශ්නයක් විමසුවොත්තින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඒ ගැන මට මේ විදිහට පවසන්ට ඉඩ තියෙනවා. “පින්වත් බ්‍රාහ්මණය, ඔය ප්‍රශ්නය අසන්ට විත ඔය විදිහට නොවෙයි, පින්වත් බ්‍රාහ්මණය ඔය ප්‍රශ්නය ඇසිය යුත්තේ මේ විදිහටයි” කියල. එතකොට මේ පිරිස මට අපහාස කරාවි. “සෝණදණ්ඩ බ්‍රාහ්මණයා මෝඩයෙක් නෙව. අව්‍යක්ත කෙනෙක් නෙව. ශ්‍රමණ ගෞතමයන්ගෙන් නුවණැති ප්‍රශ්නයක් අසන්ට බැරිවුණා නෙව” කියලා. මේ පිරිස යම් කෙනෙකුට නිග්‍රහ කරනවා නම්, ඔහු ගේ කීර්තිය පිරිහෙනවා ම යි. යමෙකුගේ කීර්තිය පිරිහෙනවා නම්, ඔහු ගේ භෝගසම්පත් පවා පිරිහී යනවා. අප ගේ භෝගසම්පත් වුණත් කීර්තිය නිසා ලැබුණු දේවල් නෙව.

මඤ්ඤේව ඛෝ පන සමණෝ ගෝතමෝ පඤ්හං පුච්ඡෙය්‍ය, තස්ස චාහං පඤ්හස්ස වෙය්‍යාකරණේන චිත්තං න ආරාධෙය්‍යං, තත්‍ර වේ මං සමණෝ ගෝතමෝ එවං වදෙය්‍ය: “න ඛෝ ඒස බ්‍රාහ්මණ පඤ්හා එවං ව්‍යාකාතබ්බෝ. එවං නාමේසං බ්‍රාහ්මණ පඤ්හෝ ව්‍යාකාතබ්බෝ”ති. තේන මං අයං පරිසා පරිහවෙය්‍ය: “බාලෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ, අබ්‍යත්තෝ නාසක්ඛි සමණස්ස ගෝතමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණේන චිත්තං ආරාධෙතුන්ති.” යං ඛෝ පනායං පරිසා පරිහවෙය්‍ය, යසෝ’පි තස්ස හායේථ. යස්ස ඛෝ පන යසෝ හායේථ භෝගා’පි තස්ස හායෙයුං. යසෝලද්ධා ඛෝ පනාමහාකං භෝගා.

ඉතින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මගෙන් ප්‍රශ්න ඇසුවොතින් ඒ ප්‍රශ්නයට දෙන පිළිතුරෙන් මට උන්වහන්සේගේ සිත සතුටු කරන්නට බැරි වුණොතින් ඒ පිළිතුර පිළිබඳව ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මට මෙහෙම කියන්ට ඉඩ තියෙනවා. “පින්වත් බ්‍රාහ්මණය, ඔය ප්‍රශ්නයට උත්තර දිය යුත්තේ ඔහොම නොවෙයි නෙ. පින්වත් බ්‍රාහ්මණය, ඔය ප්‍රශ්නයට උත්තර දිය යුත්තේ මෙහෙමයි නෙ” කියල. එතකොට ඔය කාරණය මුල කර ගෙන මේ පිරිස මට පරිභව කරාවි. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා මෝඩයෙක් නෙව. අව්‍යක්ත කෙනෙක් නෙව. ශ්‍රමණ ගෞතමයන් ගේ ප්‍රශ්නයට උන්වහන්සේ ගේ සිත සතුටු වෙන ආකාරයට පිළිතුරක් දීගන්ට බැරිවුණා නෙව” කියලා.

මේ පිරිස යම් කෙනෙකුට නිග්‍රහ කරනවා නම්, ඔහු ගේ කීර්තිය පිරිහෙනවා ම යි. යමෙකු ගේ කීර්තිය පිරිහෙනවා නම්, ඔහු ගේ භෝගසම්පත් පවා පිරිහී යනවා. අප ගේ භෝගසම්පත් වුණත් කීර්තිය නිසා ලැබුණු දේවල් නෙව.

අහං චේව ඛෝ පන ඒවං සමීපගතෝ සමානෝ අදිස්වා'ව සමණං ගෝතමං නිවත්තෙය්‍යං, තේන මං අයං පරිසා පරිභවෙය්‍ය: "බාලෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ අබ්‍යත්තෝ මානත්ථද්ධෝ භීතෝ ච. නෝ විසහි සමණං ගෝතමං දස්සනාය උපසංකමිතුං. කථං හි නාම සමීපගතෝ සමානෝ අදිස්වා සමණං ගෝතමං නිවත්තිස්සතී?"ති. යං ඛෝ පනායං පරිසා පරිභවෙය්‍ය යසෝ'පි තස්ස හායේථ. යස්ස ඛෝ පන හායේථ, භෝගා'පි තස්ස හායෙය්‍යුං. යසෝලද්ධා ඛෝ පනාමිභාකං භෝගා"ති.

ඉදින් මං මෙහෙම ළඟට ඇවිල්ලත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේව නො දැක ආපසු හැරී ගියොත්, ඒ ගැනත් මේ පිරිස මට පරිභව කරාවි. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා මෝඩයෙක් නෙව. අව්‍යක්ත කෙනෙක් නෙව. දැඩි මාන්නයෙන් යුතු කෙනෙක් නෙව. භයට පත් වූ කෙනෙක් නෙව. ශ්‍රමණ ගෞතමයන්ව බැහැදැකීම පිණිස පැමිණෙන්ට බැරි වුණා නෙ. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ළඟට ගිහිල්ලත් නො දැක ම ආපසු හැරී යන්නේ කොහොම ද?" කියල. මේ පිරිස යම් කෙනෙකුට නිග්‍රහ කරනවා නම්, ඔහු ගේ කීර්තිය පිරිහෙනවා ම යි. යමෙකු ගේ කීර්තිය පිරිහෙනවා නම්, ඔහු ගේ භෝගසම්පත් පවා පිරිහී යනවා. අප ගේ භෝගසම්පත් වුණත් කීර්තිය නිසා ලැබුණු දේවල් නෙව.

11. අථ ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මෝදි. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදි. චම්පෙය්‍යකාපි ඛෝ බ්‍රාහ්මණගහපතිකා අප්පේකච්චේ භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදිංසු. අප්පේකච්චේ භගවතා සද්ධිං සම්මෝදිංසු. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදිංසු. අප්පේකච්චේ යේන භගවා තේනඤ්ජලිං පනාමෙත්වා ඒකමන්තං නිසීදිංසු. අප්පේකච්චේ නාමගොත්තං සාවෙත්වා ඒකමන්තං නිසීදිංසු. අප්පේකච්චේ තුණ්හීභූතා ඒකමන්තං නිසීදිංසු.

11. ඉතින් සෝණදණ්ඩ බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණුනා. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වුණා. සතුටුවිය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව වාඩිවුණා. චම්පා නුවරවැසි

බ්‍රාහ්මණ ගෘහපතියන්ගෙන් ඇතැම් උදවිය භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට එකත්පස්ව වාඩි වුණා. සමහරුන් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වුණා. සතුටුවිය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව වාඩිවුණා. තවත් සමහරුන් භාග්‍යවතුන් වහන්සේට ඇඳිලි බැඳ ආචාර කොට එකත්පස්ව වාඩි වුණා. සමහර උදවිය තම තමන් ගේ නම්ගොත් පවසලා එකත්පස්ව වාඩිවුණා. තවත් සමහරුන් නිශ්ශබ්දව එකත්පස්ව වාඩිවුණා.

12. තත්‍රපි සුදං සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ ඒතදේව බහුල-මනුවිතක්කෙන්තෝ නිසින්නෝ හෝති: "අහං වේව ඛෝ පන සමණං ගෝතමං පඤ්හං පුච්ඡෙය්‍යං, තත්‍ර වේ මං සමණෝ ගෝතමෝ ඒවං වදෙය්‍ය: "න ඛෝ ඒස බ්‍රාහ්මණ පඤ්හෝ ඒවං පුච්ඡිතබ්බෝ, ඒවං නාමේස බ්‍රාහ්මණ පඤ්හෝ පුච්ඡිතබ්බෝ"ති. තේන මං අයං පරිසා පරිභවෙය්‍ය: "බාලෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ අබ්‍යත්තෝ, නාසක්ඛි සමණං ගෝතමං යෝනිසෝ පඤ්හං පුච්ඡිතුන්ති." යං ඛෝ පනායං පරිසා පරිභවෙය්‍ය, යසෝ'පි තස්ස හායේථ, යස්ස ඛෝ පන යසෝ හායේථ භෝගා'පි තස්ස හායෙය්‍යුං. යසෝලද්ධා ඛෝ පනාම්හාකං භෝගා.

12. එතකොටත් සෝණදණ්ඩ බ්‍රාහ්මණයා මේ කාරණය ගැන ම බහුල වශයෙන් සිත සිතා වාඩිවෙලා හිටියා. ඒ කියන්නේ "ඉදින් මං ශ්‍රමණ ගෞතමයන් වහන්සේගෙන් ප්‍රශ්නයක් විමසුවෝතින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඒ ගැන මට මේ විදිහට පවසන්ට ඉඩ තියෙනවා. "පින්වත් බ්‍රාහ්මණය, ඔය ප්‍රශ්නය අසන්ට වින ඔය විදිහට නොවෙයි, පින්වත් බ්‍රාහ්මණය ඔය ප්‍රශ්නය ඇසිය යුත්තේ මේ විදිහටයි" කියල. එතකොට මේ පිරිස මට අපහාස කරාවි. "සෝණදණ්ඩ බ්‍රාහ්මණයා මෝඩයෙක් නෙව. අව්‍යක්ත කෙනෙක් නෙව. ශ්‍රමණ ගෞතමයන්ගෙන් නුවණැති ප්‍රශ්නයක් අසන්ට බැරිවුණා නෙව" කියලා. මේ පිරිස යම් කෙනෙකුට නිග්‍රහ කරනවා නම්, ඔහු ගේ කීර්තිය පිරිහෙනවා ම යි. යමෙකු ගේ කීර්තිය පිරිහෙනවා නම්, ඔහු ගේ භෝගසම්පත් පවා පිරිහී යනවා. අප ගේ භෝගසම්පත් වුණත් කීර්තිය නිසා ලැබුණු දේවල් නෙව.

මඤ්චේව ඛෝ පන සමණෝ ගෝතමෝ පඤ්හං පුච්ඡෙය්‍ය, තස්ස චාහං පඤ්හස්ස වෙය්‍යාකරණේන චිත්තං න ආරාධෙය්‍යං, තත්‍ර වේ මං සමණෝ ගෝතමෝ ඒවං වදෙය්‍ය: "න ඛෝ ඒස බ්‍රාහ්මණ පඤ්හා ඒවං ව්‍යාකාතබ්බෝ. ඒවං නාමේසං බ්‍රාහ්මණ පඤ්හෝ ව්‍යාකාතබ්බෝ"ති. තේන මං අයං පරිසා

පරිභවෙය්‍ය: "බාලෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ, අබ්‍යත්තෝ නාසක්ඛි සමණස්ස ගෝතමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණේන චිත්තං ආරාධේතුන්ති." යං ඛෝ පනායං පරිසා පරිභවෙය්‍ය, යසෝ'පි තස්ස හායේථ. යස්ස ඛෝ පන යසෝ හායේථ භෝගා'පි තස්ස හායෙය්‍යුං. යසෝලද්ධා ඛෝ පනාමහාකං භෝගා.

ඉතින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මගෙන් ප්‍රශ්න ඇසුවොතින් ඒ ප්‍රශ්නයට දෙන පිළිතුරෙන් මට උන්වහන්සේ ගේ සිත සතුටු කරන්නට බැරි වුණොතින් ඒ පිළිතුර පිළිබඳව ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මට මෙහෙම කියන්ට ඉඩ තියෙනවා. "පින්වත් බ්‍රාහ්මණය, ඔය ප්‍රශ්නයට උත්තර දිය යුත්තේ ඔහොම නොවෙයි නෙ. පින්වත් බ්‍රාහ්මණය, ඔය ප්‍රශ්නයට උත්තර දිය යුත්තේ මෙහෙමයි නෙ" කියල. එතකොට ඔය කාරණය මුල කර ගෙන මේ පිරිස මට පරිභව කරාවි. "සෝණදණ්ඩ බ්‍රාහ්මණයා මෝඩයෙක් නෙව. අව්‍යක්ත කෙනෙක් නෙව. ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රශ්නයට උන්වහන්සේ ගේ සිත සතුටු වෙන ආකාරයට පිළිතුරක් දීගන්ට බැරිවුණා නෙව" කියලා. මේ පිරිස යම් කෙනෙකුට නිග්‍රහ කරනවා නම්, ඔහු ගේ කීර්තිය පිරිහෙනවා ම යි. යමෙකුගේ කීර්තිය පිරිහෙනවා නම්, ඔහු ගේ භෝගසම්පත් පවා පිරිහී යනවා. අප ගේ භෝගසම්පත් වුණත් කීර්තිය නිසා ලැබුණු දේවල් නෙව.

අහෝ වත මං සමණෝ ගෝතමෝ සකේ ආචරියකේ තේවිජ්ජකෙ පඤ්හං පුච්ඡෙය්‍ය. අද්ධාවනස්සාහං චිත්තං ආරාධෙය්‍යං පඤ්හස්ස වෙය්‍යාකරණේනා"ති.

අනේ! ඒ නිසා ඇත්තෙන් ම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මගෙන් අප ගේ ආචාර්යවාදයට අයත් ත්‍රිවිද්‍යාව ගැන ප්‍රශ්නයක් අසනවා නම් කොතරම් හොඳද. ඒකාන්තයෙන් ම උන්වහන්සේ ගේ සිත සතුටුවෙන අයුරින් මට ඒ ප්‍රශ්නය විසඳන්ටත් පුළුවනි" කියල.

13. අථ ඛෝ භගවතෝ සෝණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස චේතසා චේතෝපරිවිතක්කමඤ්ඤාය එතදහෝසි: "විහඤ්ඤති ඛෝ අයං සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ සකේන චිත්තේන. යන්නූනාහං සෝණදණ්ඩං බ්‍රාහ්මණං සකේ ආචරියකේ තේවිජ්ජකේ පඤ්හං පුච්ඡෙය්‍යන්ති."

13. එතකොට සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ගේ සිතේ තිබුණ පටලැවිල්ල අවබෝධ කරගත් භාග්‍යවතුන් වහන්සේට මේ අදහස ඇති වුණා. "මේ සෝණදණ්ඩ බ්‍රාහ්මණයා තමන් ගේ සිතුවිල්ලෙන් පීඩා විඳිනවා. එනිසා මං

සෝණදණ්ඩ බ්‍රාහ්මණයාගෙන් තම ආචාර්යවාදය වන ත්‍රිවිද්‍යාව අරභයා ප්‍රශ්නයක් අසනවා නම් හොඳයි" කියලා.

අථ ඛෝ භගවා සෝණදණ්ඩං බ්‍රාහ්මණං ඒතදවෝච: "කතීහි පන බ්‍රාහ්මණ අංගේහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති බ්‍රාහ්මණෝ'ස්මීති ච වදමානෝ සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යා?"ති.

ඉතින් භාග්‍යවතුන් වහන්සේ සෝණදණ්ඩ බ්‍රාහ්මණයාට මෙකරුණ වදාළා. "පින්වත් බ්‍රාහ්මණය, බ්‍රාහ්මණවරුන් බ්‍රාහ්මණයෙකු ලෙස සළකන්නේ කවර අන්දමේ අංගවලින් සමන්විත කෙනෙක්වද? මැනැවින් ම කියනවා නම් "මම බ්‍රාහ්මණයෙක් වෙමි" කියා පවසන්නෙත් එය මුසාවාදයක් බවට පත් නොවන්නේත් කවර කරුණු මතද?"

14. අථ ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණස්ස ඒතදහෝසි: "යං වත නෝ අහෝසි ඉච්ඡිතං, යං ආකංඛිතං, යං අධිප්පේතං, යං අභිපත්ථිතං "අහෝ වත මං සමණෝ ගෝතමෝ සකේ ආචරියකේ තේවිජ්ජකේ පඤ්හං පුච්ඡෙය්‍ය, අද්ධා වතස්සාහං චිත්තං ආරාධෙය්‍යං පඤ්හස්ස වෙය්‍යාකරණේනා"ති, තත්‍ර මං සමණෝ ගෝතමෝ සකේ ආචරියකේ තේවිජ්ජකේ පඤ්හං පුච්ඡති. අද්ධා වතස්සාහං චිත්තං ආරාධෙස්සාමි පඤ්හස්ස වෙය්‍යාකරණේනා"ති.

14. එතකොට සෝණදණ්ඩ බ්‍රාහ්මණයාට මේ අදහස් ඇති වුණා. "අනේ ඇත්තෙන් ම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මගෙන් තම ආචාර්යවාදය වූ ත්‍රිවිද්‍යාව අරභයා ප්‍රශ්නයක් අසනවා නම් හොඳයි කියල. ඒ වගේ ම උන්වහන්සේ ගේ සිත සතුටු වන ආකාරයට මට පිළිතුරු දෙන්ටත් පුළුවනි කියල ඇත්තෙන් ම අප යම් කරුණක් ගැන රුචි වුණා නම්, යම් කරුණක් කැමැති වුණා නම්, යම් කරුණක් අදහස් කළා නම්, යම් කරුණක් පැතුවා නම් ඒ ගැන ම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මගෙන් තම ආචාර්ය වාදය වූ ත්‍රිවිද්‍යාව අරභයා ප්‍රශ්නයක් අසනවා නෙව. ඉතින් මටත් සැබැවින් ම උන්වහන්සේ ගේ සිත සතුටුවන අයුරින් පිළිතුරු දෙන්ටත් පුළුවනි."

15. අථ ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ අබ්භුන්නාමෙත්වා කායං අනුවිලෝකෙත්වා පරිසං භගවන්තං ඒතදවෝච: "පඤ්චහි භෝ ගෝතම අංගේහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති. 'බ්‍රාහ්මණෝ'ස්මීති ච වදමානෝ සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං

ආපජ්ජෙය්‍ය. කතමේහි පඤ්චහි? ඉධ භෝ ගෝතම බ්‍රාහ්මණෝ උභතෝ සුජාතෝ හෝති මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන.

15. එතකොට සෝණදණ්ඩ බ්‍රාහ්මණයා කය සෘජු කරගෙන හාත්පස සිටි පිරිස දෙස හොඳ හැටියට බලා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පවසා සිටියා. "භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණවරුන් බ්‍රාහ්මණයෙකු ලෙස සළකන්නේත්, මනාකොට කියනවා නම් "මම බ්‍රාහ්මණයෙක් වෙමි" කියල කිය හැකි වන්නේත්, එය බොරුවක් නොවන්නේත් අංග පහකින් සමන්විත කෙනා ගැන යි. ඒ අංග පහ මොනවා ද? භවත් ගෞතමයෙනි, මෙහිලා බ්‍රාහ්මණයා මව්පිය දෙපාර්ශවයෙන් ම පිරිසිදු සුජාත උපතක් ලැබූ කෙනෙක් වෙනවා. ඒ කියන්නේ මීමුතු යුග පරපුරෙන් සත්වෙනි පරපුර දක්වා පිරිසිදු මව්කුසක් තිබෙන කෙනෙක්. ඒ වගේ ම තමන් ගේ ජාතිය පිළිබඳ ව අපවාද නොලැබූ, ගැරහුම් නොලැබූ කෙනෙක්,

අජ්ඣායකෝ හෝති මන්තධරෝ තිණ්ණං වේදානං පාරගූ සනිඝණ්ඩුකේටුභානං සාක්ඛරප්පභේදානං ඉතිහාසපඤ්චමානං, පදකෝ වෙය්‍යාකරණෝ ලෝකායතමහාපුරිසලක්ඛණේසු අනවයෝ:

ඒ වගේ ම ඔහු වේද හදාරණ කෙනෙක්. මන්ත්‍රධාරී කෙනෙක්. ඉතිහාසය පස්වෙනි කොට ඇති වේදසමයාගත භාෂා ශාස්ත්‍රයන්හි නිපුණත්වයක් ඇති අක්ෂර ප්‍රභේද ගැන හසල බුද්ධිය ඇති ත්‍රිවේද පාරප්‍රාප්ත කෙනෙක්. වේදසමයාගත පද පාඨ දන්නා කෙනෙක්. ව්‍යාකරණ දන්නා කෙනෙක්. ලෝකායත ශාස්ත්‍රයෙහි, මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයෙහි නිපුණ කෙනෙක්:

අභිරූපෝ හෝති දස්සනීයෝ පාසාදිකෝ පරමාය වණ්ණ-පොක්ඛරතාය සමන්නාගතෝ, බ්‍රහ්මණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුද්දාවකාසෝ දස්සනාය.

ඒ වගේ ම ඔහු ඉතා රූපවත් කෙනෙක්. සොඳුරු පෙනුමක් ඇති කෙනෙක්. දුටුවන් පහදින කෙනෙක්. උතුම් වර්ණ සෞන්දර්යයෙන් යුතු කෙනෙක්. රන්වන් පැහැ ඇති කෙනෙක. බ්‍රහ්මයා ගේ බඳු ශරීරාලෝකය ඇති කෙනෙක්. දැකීමට පවා ඉඩකඩ අපහසුවෙන් ලැබිය යුතු කෙනෙක්.

සීලවා හෝති වුද්ධසීලී වුද්ධසීලේන සමන්නාගතෝ.

ඒ වගේ ම ඔහු සිල්වත්, වැඩුණු සිල් ඇති කෙනෙක්. වැඩුණු සීලයෙන් සමන්විත කෙනෙක්.

පණ්ඩිතෝ ච හෝති මේධාවී, පඨමෝ වා දුතියෝ වා සුජං පග්ගණ්හන්තානං. ඉමේහි ඛෝ හෝ ගෝතම පඤ්චහි අංගේහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති. 'බ්‍රාහ්මණෝ'ස්මීති ච වදමානෝ සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යාති.

නුවණැති කෙනෙක්, ප්‍රඥාවන්ත කෙනෙක්. යාග කිරීම පිණිස යාග හැන්ද එසවීමේ දී පළමු කොට හෝ දෙවනුව හෝ කරන කෙනෙක්. භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණවරුන් බ්‍රාහ්මණයෙකු ලෙස සළකන්නේත්, මනාකොට කියනවා නම් "මම බ්‍රාහ්මණයෙක් වෙමි" කියල කිය හැකි වන්නේත්, එය බොරුවක් නොවන්නේත් මෙම අංග පහෙන් සමන්විත කෙනා ගැන යි.

16. "ඉමේසං පන බ්‍රාහ්මණ පඤ්චන්නං අංගානං සක්කා ඒකං අංගං ඨපෙත්වා චතූහි අංගේහි සමන්නාගතං බ්‍රාහ්මණං පඤ්ඤපේතුං 'බ්‍රාහ්මණෝ'ස්මීති ච වදමානෝ සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යා?"ති.

16. "පින්වත් බ්‍රාහ්මණය, ඔය අංග පහෙන් එක අංගයක් අත්හැර දමා අංග හතරකින් සමන්විත කෙනාව බ්‍රාහ්මණයෙක් වශයෙන් බ්‍රාහ්මණ පිරිස සළකන්නටත්, "මම බ්‍රාහ්මණයෙක් වෙමි" කියල මැනැවින් කියන්නටත්, එය බොරුවක් නොවන්නටත් පුළුවන්කමක් තිබේ ද?"

17. "සක්කා හෝ ගෝතම, ඉමේසං හි හෝ ගෝතම පඤ්චන්නං අංගානං වණ්ණං ඨපයාම. කිං හි වණ්ණෝ කරිස්සති? යතෝ ඛෝ හෝ ගෝතම බ්‍රාහ්මණෝ උභතෝ සුජාතෝ හෝති මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. අජ්ඣායකෝ ච හෝති මන්තධරෝ, තිණ්ණං වේදානං පාරගූ සනිඝණ්ඩුකේටුභානං සාක්ඛරප්පභේදානං ඉතිහාසපඤ්චමානං, පදකෝ, වෙය්‍යාකරණෝ, ලෝකයතමහාපුරිසලක්ඛණේසු අනවයෝ. සීලවා ච හෝති වුද්ධසීලී වුද්ධසීලේන සමන්නාගතෝ, පණ්ඩිතෝ ච හෝති මේධාවී පඨමෝ වා දුතියෝ වා සුජං පග්ගණ්හන්තානං. ඉමේහි ඛෝ හෝ ගෝතම චතූහංගේහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති. 'බ්‍රාහ්මණෝ'ස්මීති ච වදමානෝ සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යා"ති.

17. පුළුවනි භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෙනි, මේ අංග පහෙන් රූපසෝභාව අත්හරිමු. රූපසෝභාවෙන් කුමක් කරන්ට ද? භවත් ගෞතමයෙනි, යම් කලෙක බ්‍රාහ්මණයා මව්පිය දෙපාර්ශ්වයෙන් ම පිරිසිදු සුජාත උපතක් ලැබූ කෙනෙක් වෙනවා ද, ඒ කියන්නේ මීමුතු යුග පරපුරෙන් සත්වෙනි පරපුර දක්වා පිරිසිදු මව්කුසක් තිබෙන කෙනෙක් වෙනවා ද, ඒ වගේ ම තමන් ගේ ජාතිය පිළිබඳ ව අපවාද නො ලැබූ, ගැරහුම් නො ලැබූ කෙනෙක් වෙනවා ද, ඒ වගේ ම වේද හදාරණ කෙනෙක් වෙනවා ද, මන්ත්‍රධාරී කෙනෙක් වෙනවා ද, ඉතිහාසය පස්වෙනි කොට ඇති වේදසමයාගත භාෂා ශාස්ත්‍රයන්හි නිපුණත්වයක් ඇති අක්ෂර ප්‍රභේද ගැන හසල බුද්ධිය ඇති ත්‍රිවේද පාරප්‍රප්ත කෙනෙක් වෙනවා ද, වේදසමයාගත පද පාඨ දන්නා කෙනෙක් වෙනවා ද, ව්‍යාකරණ දන්නා කෙනෙක් වෙනවා ද, ලෝකායත ශාස්ත්‍රයෙහි, මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයෙහි නිපුණ කෙනෙක් වෙනවා ද, ඒ වගේ ම ඔහු සිල්වත්, වැඩුණු සිල් ඇති කෙනෙක් වෙනවා ද, වැඩුණු සීලයෙන් සමන්විත කෙනෙක් වෙනවා ද, නුවණැති කෙනෙක් වෙනවා ද, ප්‍රඥවන්ත කෙනෙක් වෙනවා ද, ඒ වගේ ම යාග කිරීම පිණිස යාග හැන්ද එසවීමේ දී පළමු කොට හෝ දෙවනුව හෝ කරන කෙනෙක් වෙනවා ද, භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණවරුන් බ්‍රාහ්මණයෙකු ලෙස සළකන්නටත්, මනාකොට කියනවා නම් "මම බ්‍රාහ්මණයෙක් වෙමි" කියල කියන්නටත්, එය බොරුවක් නො වන්නටත් මෙම අංග හතරෙන් සමන්විත කෙනාට පුළුවනි.

18. **"ඉමේසං පන බ්‍රාහ්මණ චතුන්නං අංගානං සක්කා ඒකං අංගං ඨපෙත්වා තීහි අංගේහි සමන්නාගතං බ්‍රාහ්මණං පඤ්ඤපේතුං 'බ්‍රාහ්මණෝ'ස්මීති ච වදමානෝ සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යා?"ති.**

18. "පින්වත් බ්‍රාහ්මණය, ඔය අංග හතරෙන් එක අංගයක් අත්හැර දමා අංග තුනකින් සමන්විත කෙනාව බ්‍රාහ්මණයෙක් වශයෙන් බ්‍රාහ්මණ පිරිස සළකන්නටත්, "මම බ්‍රාහ්මණයෙක් වෙමි" කියල මැනැවින් කියන්නටත්, එය බොරුවක් නො වන්නටත් පුළුවන්කමක් තිබේ ද?"

19. **"සක්කා හෝ ගෝතම, ඉමේසං හි හෝ ගෝතම චතුන්නං අංගානං මන්තේ ඨපයාම. කිං හි මන්තා කරිස්සති? යතෝ ඛෝ හෝ ගෝතම බ්‍රාහ්මණෝ උභතෝ සුජාතෝ හෝති මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. සීලවා ච හෝති වුද්ධසීලී වුද්ධසීලේන සමන්නාගතෝ, පණ්ඩිතෝ ච හෝති මේධාවී පඨමෝ වා දුතියෝ වා සුජං පග්ගණ්හන්තානං. ඉමේහි ඛෝ හෝ**

ගෝතම තීහි අංගේහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති 'බ්‍රාහ්මණෝ'ස්මීති ච වදමානෝ සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යා"ති.

19. පුළුවනි භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෙනි, මේ අංග හතරෙන් වේදමන්ත්‍ර අත්හරිමු. වේදමන්ත්‍රවලින් කුමක් කරන්ට ද? භවත් ගෞතමයෙනි, යම් කලෙක බ්‍රාහ්මණයා මව්පිය දෙපාර්ශවයෙන් ම පිරිසිදු සුජාත උපතක් ලැබූ කෙනෙක් වෙනවා ද, ඒ කියන්නේ මීමුතු යුග පරපුරෙන් සත්වෙනි පරපුර දක්වා පිරිසිදු මව්කුසක් තිබෙන කෙනෙක් වෙනවා ද, ඒ වගේ ම තමන් ගේ ජාතිය පිළිබඳ ව අපවාද නො ලැබූ, ගැරහුම් නො ලැබූ කෙනෙක් වෙනවා ද, ඒ වගේ ම ඔහු සිල්වත්, වැඩුණු සිල් ඇති කෙනෙක් වෙනවා ද, වැඩුණු සීලයෙන් සමන්විත කෙනෙක් වෙනවා ද, නුවණැති කෙනෙක් වෙනවා ද, ප්‍රඥාවන්ත කෙනෙක් වෙනවා ද, ඒ වගේ ම යාග කිරීම පිණිස යාග හැන්ද එසවීමේ දී පළමු කොට හෝ දෙවනුව හෝ කරන කෙනෙක් වෙනවා ද, භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණවරුන් බ්‍රාහ්මණයෙකු ලෙස සළකන්නටත්, මනාකොට කියනවා නම් "මම බ්‍රාහ්මණයෙක් වෙමි" කියල කියන්නටත්, එය බොරුවක් නොවන්නටත් මෙම අංග තුනෙන් සමන්විත කෙනාට පුළුවනි.

20. "ඉමේසං පන බ්‍රාහ්මණ තිණ්ණං අංගානං සක්කා ඒකං අංගං ඨපෙත්වා ද්වීහංගේහි සමන්නාගතං බ්‍රාහ්මණං පඤ්ඤපේතුං 'බ්‍රාහ්මණෝ'ස්මීති ච වදමානෝ සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යා?"ති.

20. "පින්වත් බ්‍රාහ්මණය, ඔය අංග තුනෙන් එක අංගයක් අත්හැර දමා අංග දෙකකින් සමන්විත කෙනාව බ්‍රාහ්මණයෙක් වශයෙන් බ්‍රාහ්මණ පිරිස සළකන්නටත්, "මම බ්‍රාහ්මණයෙක් වෙමි" කියල මැනැවින් කියන්නටත්, එය බොරුවක් නො වන්නටත් පුළුවන්කමක් තිබේ ද?"

21. "සක්කා හෝ ගෝතම, ඉමේසං හි හෝ ගෝතම තිණ්ණං අංගානං ජාතියා ඨපයාම. කිං හි ජාති කරිස්සති? යතෝ ඛෝ හෝ ගෝතම බ්‍රාහ්මණෝ සීලවා ච හෝති වුද්ධසීලී වුද්ධසීලේන සමන්නාගතෝ, පණ්ඩිතෝ ච හෝති මේධාවී පඨමෝ වා දුතියෝ වා සුජං පග්ගණ්හන්තානං. ඉමේහි ඛෝ හෝ ගෝතම ද්වීහංගේහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති. 'බ්‍රාහ්මණෝ'ස්මීති ච වදමානෝ සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යා"ති.

21. පුළුවනි භවත් ගෞතමයෙනි, භවත් ගෞතමයෙනි, මේ අංග තුනෙන් උපන් ජාතිය අත්හරිමු. උපන් ජාතියෙන් කුමක් කරන්ට ද? භවත් ගෞතමයෙනි, යම් කලෙක බ්‍රාහ්මණයා සිල්වත්, වැඩුණු සිල් ඇති කෙනෙක් වෙනවා ද, වැඩුණු සීලයෙන් සමන්විත කෙනෙක් වෙනවා ද, නුවණැති කෙනෙක් වෙනවා ද, ප්‍රඥාවන්ත කෙනෙක් වෙනවා ද, ඒ වගේ ම යාග කිරීම පිණිස යාග හැන්ද එසවීමේ දී පළමු කොට හෝ දෙවනුව හෝ කරන කෙනෙක් වෙනවා ද, භවත් ගෞතමයෙනි, බ්‍රාහ්මණවරුන් බ්‍රාහ්මණයෙකු ලෙස සළකන්නටත්, මනාකොට කියනවා නම් "මම බ්‍රාහ්මණයෙක් වෙමි" කියල කියන්නටත්, එය බොරුවක් නොවන්නටත් මෙම අංග දෙකෙන් සමන්විත කෙනාට පුළුවනි.

22. එවං වුත්තේ තේ බ්‍රාහ්මණා බ්‍රාහ්මණෝ සෝණදණ්ඩං බ්‍රාහ්මණං එතදවෝචුං: "මා භවං සෝණදණ්ඩෝ එවං අවච. මා භවං සෝණදණ්ඩෝ එවං අවච. අපවදතේව භවං සෝණදණ්ඩෝ වණ්ණං, අපවදති මන්තේ, අපවදති ජාතිං. ඒකංසේන භවං සෝණදණ්ඩෝ සමණස්සේව ගෝතමස්ස වාදං අනුපක්ඛන්දතී"ති.

22. මෙසේ පැවසූ විට ඒ බ්‍රාහ්මණවරු සෝණදණ්ඩ බ්‍රාහ්මණයාට මේ විදිහට කියා සිටියා. "භවත් සෝණදණ්ඩයෙනි, ඔහොම කියන්ට එපා! භවත් සෝණදණ්ඩයෙනි, ඔහොම කියන්ට එපා! භවත් සෝණදණ්ඩයන් රූපසෝභාවත් බැහැර කර දමනවා නෙව. වේදමන්ත්‍රත් බැහැර කරනවා නෙව. උපන් ජාතියත් බැහැර කරනවා නෙව. ඒකාන්තයෙන් ම භවත් සෝණදණ්ඩයන් ශ්‍රමණ ගෞතමයන් ගේ අදහසට යි ඔය ඇතුළු වෙන්නේ!" කියලා.

23. අථ ඛෝ භගවා තේ බ්‍රාහ්මණේ එතදවෝච: "සචේ ඛෝ තුම්හාකං බ්‍රාහ්මණා එවං හෝති, අප්පස්සුතෝ ච සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ, අකල්‍යාණවාක්කරණෝ ච සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ, දුප්පඤ්ඤෝ ච සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ, න ච පහෝති සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ සමණේන ගෝතමේන සද්ධිං අස්මිං වචනේ පටිමන්තේතුන්ති," තිට්ඨතු සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ, තුම්හේ මයා සද්ධිං මන්තවිහෝ. සචේ පන තුම්හාකං බ්‍රාහ්මණා එවං හෝති: "බහුස්සුතෝ ච සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ, කල්‍යාණවාක්කරණෝ ච සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ, පණ්ඩිතෝ ච සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ, පහෝති ච සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ සමණේන ගෝතමේන සද්ධිං අස්මිං වචනේ පටිමන්තේතුන්ති," තිට්ඨථ තුම්හේ, සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ මයා සද්ධිං පටිමන්තේතු"ති.

23. එතකොට භාග්‍යවතුන් වහන්සේ ඒ බ්‍රාහ්මණ පිරිසට මෙසේ වදාළා. "ඉදින් පින්වත් බ්‍රාහ්මණවරුනි, ඔබට මෙහෙම හිතෙනවා නම්, ඒ කියන්නේ "සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ඔය විදිහේ අල්පශ්‍රැත කෙනෙක්. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා කල්‍යාණ කථාබහ නැති කෙනෙක්. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ප්‍රඥා රහිත කෙනෙක්. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ශ්‍රමණ ගෞතමයන් සමග මෙම වචනය පිළිබඳව සාකච්ඡා කරන්නට සමත් නොවන කෙනෙක්" කියල. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා පසෙක සිටීවා. මා සමඟ ඔබ සාකච්ඡා කරන්න. ඉදින් පින්වත් බ්‍රාහ්මණවරුනි, ඔබට මෙහෙම හිතෙනවා නම්, ඒ කියන්නේ "සෝණදණ්ඩ බ්‍රාහ්මණයා බහුශ්‍රැත කෙනෙක්. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා කල්‍යාණ කථාබහ ඇති කෙනෙක්. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ප්‍රඥාවන්ත කෙනෙක්. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ශ්‍රමණ ගෞතමයන් සමග මෙම වචනය පිළිබඳව සාකච්ඡා කරන්නට සමත් කෙනෙක්" කියල, ඔබ පසෙක සිටින්වා. සෝණදණ්ඩ බ්‍රාහ්මණයා මා සමග සාකච්ඡා කරාවා."

24. එවං වුත්තේ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ භගවන්තං එතදවෝච: "නිට්ඨතු භවං ගෝතමෝ. තුණ්හී භවං ගෝතමෝ හෝතු. අහමේව තේසං සහධම්මේන පටිවචනං කරිස්සාමී"ති.

24. මෙසේ වදාළ විට සෝණදණ්ඩ බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණත් පවසා සිටියා. "භවත් ගෞතමයන් වැඩසිටින්වා! භවත් ගෞතමයන් නිශ්ශබ්ද වෙන්වා! මම මුන්දැලාට කරුණු සහිතව උත්තර දෙන්නම්" කියල.

අථ ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ තේ බ්‍රාහ්මණේ එතදවෝච: "මා භවන්තෝ එවං අවචුත්ථ, මා භවන්තෝ එවං අවචුත්ථ: අපවදතේව භවං සෝණදණ්ඩෝ වණ්ණං, අපවදති මන්තේ, අපවදති ජාතිං, එකංසේන භවං සෝණදණ්ඩෝ සමණස්සේව ගෝතමස්ස වාදං අනුපක්ඛන්දති'ති. නාහං භෝ අපවදාමි වණ්ණං වා මන්තේ වා ජාතිං වා"ති.

ඉතින් සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ඒ බ්‍රාහ්මණවරුන්ට මෙහෙම කිව්වා. "භවත්නි, ඔය විදිහට කථා කරන්ට එපා! භවත්නි, ඔය විදිහට කථා කරන්ට එපා! භවත් සෝණදණ්ඩයන් රූපසෝභාවත් බැහැර කර දමනවා නෙව. වේදමන්ත්‍රත් බැහැර කරනවා නෙව. උපන් ජාතියත් බැහැර කරනවා නෙව. ඒකාන්තයෙන් ම භවත් සෝණදණ්ඩයන් ශ්‍රමණ ගෞතමයන් ගේ අදහසට යි ඔය ඇතුළු වෙනවා නෙව කියලා. භවත්නි, මං රූප සෝභාවත්, වේදමන්ත්‍රවත්, උපන් ජාතියවත් බැහැර කරන්නේ නෑ."

25. තේන ඛෝ පන සමයේන සෝණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස භාගිනෙය්‍යා අංගකෝ නාම මාණවකෝ තස්සං පරිසායං නිසින්නෝ හෝති. අථ ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ තේ බ්‍රාහ්මණේ ඒතදවොච: "පස්සන්ති නෝ භොන්තෝ ඉමං අංගකං මාණවකං අම්හාකං භාගිනෙය්‍යන්ති?" "ඒවං හෝ."

25. ඒ වෙලාවේ දී සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ගේ බෑණා කෙනෙක් වන අංගක නම් මාණවකයා ඒ පිරිස අතර වාඩිවෙලා හිටියා. එතකොට සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ඒ බමුණු පිරිසට මෙහෙම කිව්වා. "භවත්නි, අප ගේ බෑණා කෙනෙක් වන මේ අංගක මාණවකයාව දකිනවා ද?" "එසේය භවත."

"අංගකෝ ඛෝ හෝ මාණවකෝ අභිරූපෝ දස්සනීයෝ පාසාදිකෝ පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතෝ බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුද්දාවකාසෝ දස්සනාය. නාස්ස ඉමිස්සං පරිසාය සමසමෝ අත්ථි වණ්ණේන, ඨපෙත්වා සමණං ගෝතමං.

"භවත්නි, අංගක මාණවකයා ඉතා රූපවත්. සොඳුරු පෙනුමෙන් යුක්ත යි. දුටුවන් පහදිනවා. උතුම් වර්ණ සෞන්දර්යයෙන් යුක්ත යි. රන්වන් පැහැ තියෙනවා. බ්‍රහ්මයා ගේ බඳු ශරීරාලෝකය තියෙනවා. දැකීමට පවා ඉඩකඩ අපහසුවෙන් ලැබිය යුතු යි. ඒ වගේ ම මේ පිරිස අතර මොහු ගේ රූප සෝභාවය ශ්‍රමණ ගෞතමයන් හැරුණු කොට සම කරන්ට පුළුවන් කෙනෙක් නෑ.

අංගකෝ ඛෝ හෝ මාණවකෝ අජ්ඣායකෝ මන්තධරෝ තිණ්ණං වේදානං පාරගූ සනිඝණ්ඩුකේටුභානං සාක්ඛරප්පභේදානං ඉතිහාස-පඤ්චමානං, පදකෝ වෙය්‍යාකරණෝ ලෝකායතමහාපුරිසලක්ඛණේසු අනවයෝ: අහමස්ස මන්තේ වාචේතා.

ඒ වගේ ම භවත්නි, අංගක මාණවකයා වේද හදාරණ කෙනෙක්. මන්ත්‍රධාරී කෙනෙක්. ඉතිහාසය පස්වෙනි කොට ඇති වේදසමයාගත භාෂා ශාස්ත්‍රයන්හි නිපුණත්වයක් ඇති අක්ෂර ප්‍රභේද ගැන හසල බුද්ධිය ඇති ත්‍රිවේද පාරප්‍රප්ත කෙනෙක්. වේදසමයාගත පද පාඨ දන්නා කෙනෙක්. ව්‍යාකරණ දන්නා කෙනෙක්. ලෝකායත ශාස්ත්‍රයෙහි, මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයෙහි නිපුණ කෙනෙක්. මං තමයි මෙයාට මන්ත්‍ර ශාස්ත්‍රය ඉගැන්වුයේ.

අංගකෝ ඛෝ හෝ මාණවකෝ උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. අහමස්ස මාතාපිතරෝ ජානාමි.

ඒ වගේ ම භවත්නි, අංගක මාණවකයා මව්පිය දෙපාර්ශවයෙන් ම පිරිසිදු සුජාත උපතක් ලැබූ කෙනෙක් වෙනවා. ඒ කියන්නේ මීමුතු යුග පරපුරෙන් සත්වෙනි පරපුර දක්වා පිරිසිදු මව්කුසක් තිබෙන කෙනෙක්. ඒ වගේ ම තමන් ගේ ජාතිය පිළිබඳ ව අපවාද නො ලැබූ, ගැරහුම් නො ලැබූ කෙනෙක්, මං මෙයා ගේ මව්පියන් ගැන දන්නවා.

අංගකෝ ඛෝ හෝ මාණවකෝ පාණම්පි හනෙය්‍ය අදින්නම්පි ආදියෙය්‍ය පරදාරම්පි ගච්ඡෙය්‍ය මුසාපි භණෙය්‍ය මජ්ජම්පි පිවෙය්‍ය, එත්ථදානි හෝ කිං වණ්ණෝ කරිස්සති, කිං මන්තා, කිං ජාති?

භවත්නි, ඉදින් අංගක මාණවකයා ප්‍රාණඝාතය කරනවා නම්, සොරකම් කරනවා නම්, පරස්ත්‍රී සේවනයේ යෙදෙනවා නම්, බොරු කියනවා නම්, මත්පැන් මත්ද්‍රව්‍ය පාවිච්චි කරනවා නම්, භවත්නි, එතකොට ඒ රූපසෝභාවයෙන් ඇති ඵලය මොකක් ද? ඒ වේදමන්ත්‍රවලින් ඇති ඵලය මොකක් ද? උපන් ජාතියෙන් ඇති ඵලය මොකක් ද?

යතෝ ඛෝ හෝ බ්‍රාහ්මණෝ සීලවා හෝති වුද්ධසීලී වුද්ධසීලේන සමන්නාගතෝ, පණ්ඩිතෝ ච හෝති මේධාවී, පඨමෝ වා දුතියෝ වා සුජං පග්ගණ්හන්තානං. ඉමේහි ඛෝ හෝ ද්වීහංගේහි සමන්නාගතං බ්‍රාහ්මණා බ්‍රාහ්මණං පඤ්ඤපෙන්ති. 'බ්‍රාහ්මණෝ'ස්මීති ච වදමානෝ සම්මා වදෙය්‍ය න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍යා"ති.

භවත්නි, යම් දවසක බ්‍රාහ්මණයා සිල්වත් නම්, වැඩුණු සිල් ඇති කෙනෙක් නම්, වැඩුණු සීලයෙන් සමන්විත කෙනෙක් නම්, නුවණැති නම්, ප්‍රඥාවන්ත නම්, යාග කිරීම පිණිස යාග හැන්ද එසවීමේ දී පළමු කොට හෝ දෙවනුව හෝ කරන කෙනෙක් නම්, භවත්නි, බ්‍රාහ්මණවරුන් බ්‍රාහ්මණයෙකු ලෙස සළකන්නටත්, මනාකොට කියනවා නම් "මම බ්‍රාහ්මණයෙක් වෙමි" කියල කියන්නටත්, එය බොරුවක් නො වන්නටත් ඔය අංග දෙකින් යුතු පුද්ගලයා ගැන පැණවිය හැකියි.

26. "ඉමේසං පන බ්‍රාහ්මණ ද්වින්නං අංගානං සක්කා ඒකං අංගං ඨපයිත්වා ඒකේන අංගේන සමන්නාගතං බ්‍රාහ්මණං පඤ්ඤාපේතුං,

‘බ්‍රාහ්මණෝ’ස්මීති ච වදමානෝ සම්මා වදෙය්‍ය. න ච පන මුසාවාදං ආපජ්ජෙය්‍ය?”ති

26. “පින්වත් බ්‍රාහ්මණය, ඔය අංග දෙකෙන් එක අංගයක් අත්හැර දමා එක අංගයකින් සමන්විත කෙනාව බ්‍රාහ්මණයෙක් වශයෙන් බ්‍රාහ්මණ පිරිස සළකන්නටත්, “මම බ්‍රාහ්මණයෙක් වෙමි” කියල මැනැවින් කියන්නටත්, එය බොරුවක් නො වන්නටත් පුළුවන්කමක් තිබේ ද?”

“නෝ හිදං භෝ ගෝතම. සීලපරිධෝතා හි භෝ ගෝතම පඤ්ඤා, පඤ්ඤාපරිධෝතං සීලං. යත්ථ සීලං තත්ථ පඤ්ඤා, යත්ථ පඤ්ඤා තත්ථ සීලං. සීලවතෝ පඤ්ඤා, පඤ්ඤාවතෝ සීලං. සීලපඤ්ඤාණං ච පන ලෝකස්මිං අග්ගමක්ඛායති. සෙය්‍යථාපි භෝ ගෝතම හත්ථේන වා හත්ථං ධෝවෙය්‍ය පාදේන වා පාදං ධෝවෙය්‍ය, එවමේව ඛෝ භෝ ගෝතම සීලපරිධෝතා පඤ්ඤා, පඤ්ඤාපරිධෝතං සීලං. යත්ථ සීලං තත්ථ පඤ්ඤා, යත්ථ පඤ්ඤා තත්ථ සීලං. සීලවතෝ පඤ්ඤා, පඤ්ඤාවතෝ සීලං. සීලපඤ්ඤාණඤ්ච පන ලෝකස්මිං අග්ගමක්ඛායති.

“භවත් ගෞතමයෙනි, එහෙම වෙන්නේ නෑ. භවත් ගෞතමයෙනි, ප්‍රඥාව පිරිසිදු වන්නේ සීලයෙනුයි. සීලය පිරිසිදු වන්නේ ප්‍රඥාවෙනුයි. යම් තැනක සීලය තිබෙනවා ද, එතැන තමයි ප්‍රඥාව තිබෙන්නේ. යම් තැනක ප්‍රඥාව තිබෙනවා ද, එතැන තමයි සීලය තිබෙන්නේ. සිල්වතාට තමයි ප්‍රඥාව තිබෙන්නේ. ප්‍රඥාවන්තයාට තමයි සීලය තිබෙන්නේ. සීලයටත් ප්‍රඥාවටත් කියන්නේ ලෝකයෙහි අග්‍ර දේ කියලයි. භවත් ගෞතමයෙනි, ඒක මේ වගේ දෙයක්. අතින් අත සෝදනවා වගේ. පයෙන් පය සෝදනවා වගේ. භවත් ගෞතමයෙනි, මෙයත් ඒ වගේ ම යි. ප්‍රඥාව පිරිසිදු වන්නේ සීලයෙනුයි. සීලය පිරිසිදු වන්නේ ප්‍රඥාවෙනුයි. යම් තැනක සීලය තිබෙනවා ද, එතැන තමයි ප්‍රඥාව තිබෙන්නේ. යම් තැනක ප්‍රඥාව තිබෙනවා ද, එතැන තමයි සීලය තිබෙන්නේ. සිල්වතාට තමයි ප්‍රඥාව තිබෙන්නේ. ප්‍රඥාවන්තයාට තමයි සීලය තිබෙන්නේ. සීලයටත් ප්‍රඥාවටත් කියන්නේ ලෝකයෙහි අග්‍ර දේ කියල යි.

“එවමේතං බ්‍රාහ්මණ සීලපරිධෝතා හි බ්‍රාහ්මණ පඤ්ඤා, පඤ්ඤාපරිධෝතං සීලං. යත්ථ සීලං තත්ථ පඤ්ඤා, යත්ථ පඤ්ඤා තත්ථ සීලං. සීලවතෝ පඤ්ඤා, පඤ්ඤාවතෝ සීලං. සීලපඤ්ඤාණඤ්ච පන ලෝකස්මිං අග්ගමක්ඛායති.

"පින්වත් බ්‍රාහ්මණය, ඒක එහෙම ම යි. ප්‍රඥාව පිරිසිදු වන්නේ සීලයෙනුයි. සීලය පිරිසිදු වන්නේ ප්‍රඥාවෙනුයි. යම් තැනක සීලය තිබෙනවා ද, එතැන තමයි ප්‍රඥාව තිබෙන්නේ. යම් තැනක ප්‍රඥාව තිබෙනවා ද, එතැන තමයි සීලය තිබෙන්නේ. සිල්වතාට තමයි ප්‍රඥාව තිබෙන්නේ. ප්‍රඥාවන්තයාට තමයි සීලය තිබෙන්නේ. සීලයටත් ප්‍රඥාවටත් කියන්නේ ලෝකයෙහි අග්‍ර දේ කියල යි."

"කතමං පන තං බ්‍රාහ්මණ සීලං? කතමා සා පඤ්ඤා"?ති

"පින්වත් බ්‍රාහ්මණය, එහෙමනම් ඒ සීලය මොකක් ද? ඒ ප්‍රඥාව මොකක් ද?"

"එත්තකපරමා'ව මයං භෝ ගෝතම ඒතස්මිං අත්ථේ. සාධු වත භවන්තංයේව ගෝතමං පටිභාතු ඒතස්ස භාසිතස්ස අත්ථෝ"ති.

"භවත් ගෞතමයෙනි, අපි නම් මෙකරුණෙහිලා, නම් වශයෙන් විතරයි ඒ වචන දෙක ගැන දන්නේ. එනිසා පින්වත් ගෞතමයන් වහන්සේට මේ කරුණ පිළිබඳව අර්ථ වැටහෙන සේක් නම් ඉතා මැනැවි."

"තේන හි බ්‍රාහ්මණ සුණාහි, සාධුකං මනසි කරෝහි, භාසිස්සාමී"ති. ඒවං භෝ'ති ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ භගවතෝ පච්චස්සෝසි. භගවා ඒතවෝච:

"එහෙමනම් පින්වත් බ්‍රාහ්මණය, සවන් යොමා අසන්න. මැනැවින් නුවණින් මෙනෙහි කරන්න. මං කියා දෙන්නම්." "එසේය භවත්නි," කියල සෝණදණ්ඩ බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නා. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළා.

25. "ඉධ බ්‍රාහ්මණ තථාගතෝ ලෝකේ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධෝ .....

25. "පින්වත් බ්‍රාහ්මණය, මෙහිලා තථාගත වූ අරහත් සම්මාසම්බුදු රජාණන් වහන්සේ ලෝකයෙහි පහල වන සේක .....

(යථා සාමඤ්ඤඵලේ ඒවං විත්ථාරේතබ්බං) ඒවං ඛෝ බ්‍රාහ්මණ භික්ඛු සීලසම්පන්නෝ හෝති. ඉදං ඛෝ තං බ්‍රාහ්මණ සීලං ..... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. දුතියං ඣානං උපසම්පජ්ජ විහරති ..... තතියං

කඩානං උපසම්පජ්ජ විහරති ..... චතුත්ථං කඩානං උපසම්පජ්ජ විහරති ..... අයං ඛෝ සෝ බ්‍රාහ්මණ සමාධි ..... ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති, අභින්නාමේති ..... නාපරං ඉත්ථත්තායාති පජානාති. ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය. අයං ඛෝ සා බ්‍රාහ්මණ පඤ්ඤ"ති.

(සාමඤ්ඤඵල සූත්‍රයෙහි දැක්වෙන පරිදි මෙම කොටස විස්තර කළ යුතු ය) පින්වත් බ්‍රාහ්මණය, ඔය අයුරින් භික්ෂුව සීල්වත් කෙනෙක් වෙයි. පින්වත් බ්‍රාහ්මණය, මේ ඒ සීලය යි. ..... පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරයි ..... දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරයි ..... තුන්වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරයි ..... හතර වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරයි ..... පින්වත් බ්‍රාහ්මණ, මේ ඒ සමාධිය යි ..... ආශ්‍රවයන් ගේ ක්ෂය වීම අවබෝධ කර ගැනීම පිණිස සිත යොමු කරයි. වඩාත් නැඹුරු කරයි ..... නැවත උපතක් නැතැයි අවබෝධයෙන් ම දැන ගන්නවා. මෙය ඒ භික්ෂුව ගේ ප්‍රඥාව යි. පින්වත් බ්‍රාහ්මණය, මේ ඒ ප්‍රඥාව යි.

26. එවං වුත්තේ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ භගවන්තං එතදවෝච: "අභික්කන්තං භෝ ගෝතම අභික්කන්තං භෝ ගෝතම. සෙය්‍යථාපි භෝ ගෝතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටි-ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරේ වා තේල පජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තෝ රූපානි දක්ඛින්තීති. ඒවමේව භෝතා ගෝතමේන අනේකපරියායේන ධම්මෝ පකාසිතෝ. ඒසාහං භවන්තං ගෝතමං සරණං ග-ඡාම ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. උපාසකං මං භවං ගෝතමෝ ධාරේතු අජ්ජතග්ගේ පාණුපේතං සරණං ගතං. අධිවාසේතු ච මේ භවං ගෝතමෝ ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසංඝේනා"ති. අධිවාසේසි භගවා තුණ්හීභාවේන.

26. මෙසේ වදාළ විට සෝණදණ්ඩ බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළා. "ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි! ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි! යටට හරවා තිබූ දෙයක් උඩු අතට හැරෙව්වා වගෙයි. වහලා තිබුණු දෙයක් ඇරලා පෙන්නුවා වගෙයි. මං මුලා වුවන්ට නියම මග පෙන්වා දෙනවා වගෙයි. ඇස් ඇති උදවියට රූප දකින්න අඳුරෙහි තෙල් පහනක් දල්වා ගෙන දරා සිටිනවා වගෙයි. ඔය විදිහට භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ශ්‍රී සද්ධර්මය වදාළා. මේ මමත් භවත් ගෝතමයන් වහන්සේ ව සරණ යනවා. ශ්‍රී සද්ධර්මයත් ආර්ය මහා

සංඝ රත්නයත් සරණ යනවා. භවත් ගෝතමයන් වහන්ස, මං ගැන අද පටන් දිවි තිබෙන තුරාවට ම තෙරුවන් සරණ ගිය උපාසකයෙක් ලෙස සළකන සේක්වා! භවත් ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමඟ හෙට දවසෙහි දානය පිණිස මාගේ ආරාධනය පිළිගන්නා සේක්වා!" භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව වැඩ සිටීමෙන් එම ඇරයුම පිළිගෙන වදාළා.

27. අථ ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ භගවතෝ, අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ තස්සා රත්තියා අච්චයේන සකේ නිවේසනේ පණීතං ඛාදනීයං භෝජනීයං පටියාදාපෙත්වා භගවතෝ කාලං ආරෝපේසි: කාලෝ හෝ ගෝතම, නිට්ඨිතං භත්තන්ති.

27. ඉන්පසු සෝණදණ්ඩ බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ එම ආරාධනය පිළිගෙන වදාළ බව දැන අසුනෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වන්දනා කොට, ප්‍රදක්ෂිණා කොට පිටත් වුණා. ඉතින් සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ඒ රැය ඇවෑමෙන් තම නිවසෙහි වැළඳිය යුතු, අනුභව කළ යුතු ප්‍රණීත වූ දන්පැන් සකසා "භවත් ගෞතමයන් වහන්ස, දන්පැන් පිළියෙළ කොට තිබෙනවා. දැන් වඩින්නට කාලය යි" කියලා භාග්‍යවතුන් වහන්සේට කාලය දන්වා යැව්වා.

28. අථ ඛෝ භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසංඝේන යේන සෝණදණ්ඩස්ස බ්‍රාහ්මණස්ස නිවේසනං තේනුපසංකමි. උපසංකමිත්වා පඤ්ඤත්තේ ආසනේ නිසීදි. අථ ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ බුද්ධප්පමුඛං භික්ඛුසංඝං පණීතේන ඛාදනීයේන භෝජනීයේන සහත්ථා සන්තප්පේසි සම්පවාරේසි.

28. භාග්‍යවතුන් වහන්සේ පෙරවරු සමයෙහි සිවුරු හැඳ පොරොවා, පාසිවුරු ගෙන භික්ෂු සංඝයා සමඟ සෝණදණ්ඩ බ්‍රාහ්මණයා ගේ නිවස වෙත වැඩම කළා. වැඩම කොට පණවන ලද ආසනයෙහි වැඩ සිටියා. එතකොට සෝණදණ්ඩ බ්‍රාහ්මණයා බුදු රජුන් ප්‍රමුඛ වූ භික්ෂු සංඝයා ප්‍රණීත වූ වළඳන, අනුභව කරන දැයින් සිය අතින් මනා කොට පිළිගැන්වුවා. හොඳින් පැවරුවා.

29. අථ ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ භගවන්තං භුත්තාවිං විනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නෝ ඛෝ සෝණදණ්ඩෝ බ්‍රාහ්මණෝ භගවන්තං ඒතදවෝච:

"අහඤ්චේව ඛෝ පන භෝ ගෝතම පරිසගතෝ සමානෝ ආසනා වුට්ඨහිත්වා භවන්තං ගෝතමං අභිවාදෙය්‍යං, තේන මං සා පරිසා පරිභවෙය්‍ය. යං ඛෝ පන සා පරිසා පරිභවෙය්‍ය යසෝ'පි තස්ස හායේථ. යස්ස ඛෝ පන යසෝ හායේථ භෝගා'පි තස්ස හායෙය්‍යුං. යසෝලද්ධා ඛෝ පනම්හාකං භෝගා.

29. ඊට පස්සේ සෝණදණ්ඩ බ්‍රාහ්මණයා වළඳා අවසන් කොට පාත්‍රයෙන් බැහැර වූ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ අසළින් එක්තරා මිටි අසුනක් ගෙන එකත්පස්ව වාඩි වුණා. එකත්පස්ව වාඩි වුණ සෝණදණ්ඩ බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළ කළා. "භවත් ගෞතමයන් වහන්ස, මං පිරිස මැද සිටිද්දී පින්වත් ගෞතමයන් වහන්සේ දැක ආසනයෙන් නැගිට වන්දනා කළොත් එකරුණ මුල් කොට ඒ පිරිස මට පරිභව කරාවි. ඒ පිරිස යමෙකුට පරිභව කරනවා නම්, ඔහු ගේ කීර්තිරාවය පවා පිරිහී යනවා. යමෙකු ගේ කීර්ති රාවය පිරිහී යනවා නම්, ඔහු ගේ භෝග සම්පත් ද පිරිහී යනවා. ඉතින් අප ගේ භෝග සම්පත් කීර්තිය නිසා ම ලැබූ දේවල් නෙව.

අහඤ්චේව ඛෝ පන භෝ ගෝතම පරිසගතෝ සමානෝ අඤ්ජලිං පග්ගණ්හෙය්‍යං, ආසනා මේ තං භවං ගෝතමෝ පච්චුට්ඨානං ධාරේතු.

භවත් ගෞතමයන් වහන්ස, පිරිස මැද සිටින්නා වූ මම ඇදිලිබැඳ ආචාර කෙරුවොත් භවත් ගෞතමයන් වහන්සේ එය මා අසුනෙන් නැගිට කරන ලද ගෞරවයක් ලෙස සළකන සේක්වා.

අහඤ්චේව ඛෝ පන භෝ ගෝතම පරිසගතෝ සමානෝ වේඨනං විමුඤ්චෙය්‍යං, සිරසා මේ තං භවං ගෝතමෝ අභිවාදනං ධාරේතු.

ඒ වගේ ම භවත් ගෞතමයන් වහන්ස, මා පිරිස මැදට ගිය අවස්ථාවක (භාග්‍යවතුන් වහන්සේ දැක) හිස් වෙළුම මුදා අතට ගන්නේ නම් භවත් ගෞතමයන් වහන්සේ එය මා හිස නමා කළ වන්දනාවක් ලෙස පිළිගන්නා සේක්වා.

අහඤ්චේව ඛෝ පන භෝ ගෝතම යානගතෝ සමානෝ යානා පච්චෝරෝහිත්වා භවන්තං ගෝතමං අභිවාදෙය්‍යං, තේන මං සා පරිසා පරිභවෙය්‍ය. යං ඛෝ පන සා පරිසා පරිභවෙය්‍ය යසෝ'පි තස්ස හායේථ. යස්ස ඛෝ පන යසෝ හායේථ භෝගා'පි තස්ස හායෙය්‍යුං. යසෝ ලද්ධා ඛෝ පනම්හාකං භෝගා.

ඒ වගේ ම භවත් ගෞතමයන් වහන්ස, මා යානයකට නැග ගමන් කරද්දී එයින් බැස භවත් ගෞතමයන් වහන්සේට වන්දනා කරන්නේ නම්, එකරුණ මුල්කොට ඒ පිරිස මට පරිභව කරාවි. ඒ පිරිස යමෙකුට පරිභව කරනවා නම්, ඔහු ගේ කීර්තිරාවය පවා පිරිහී යනවා. යමෙකු ගේ කීර්ති රාවය පිරිහී යනවා නම්, ඔහු ගේ භෝග සම්පත් ද පිරිහී යනවා. ඉතින් අප ගේ භෝග සම්පත් කීර්තිය නිසා ම ලැබූ දේවල් නෙව.

අහඤ්චේව ඛෝ පන භෝ ගෝතම යානගතෝ සමානෝ පතෝදලට්ඨිං අබ්භුන්නාමෙය්‍යං, යානා මේ තං භවං ගෝතමෝ පච්චෝරෝහනං ධාරේතු.

ඒ වගේ ම භවත් ගෞතමයන් වහන්ස, මා යානයකට නැග ගමන් කරද්දී (භාග්‍යවතුන් වහන්සේ දැක) කෙවිට බිම පහත් කොට ඉදිරිපසට නැමුනේ නම් භවත් ගෞතමයන් වහන්සේ මා යානයෙන් බැස ගරු කළ ලෙසට සළකන සේක්වා.

අහඤ්චේව ඛෝ පන භෝ ගෝතම යානගතෝ සමානෝ ඡත්තං අපනාමෙය්‍යං, සිරසා මේ තං භවං ගෝතමෝ අභිවාදනං ධාරේතූ"ති.

ඒ වගේ ම භවත් ගෞතමයන් වහන්ස, මා යානයකට නැග ගමන් කරද්දී ඉහලාගෙන සිටින කුඩය පසෙකට හරවා පහළට නවන්නේ නම්, භවත් ගෞතමයන් වහන්සේ එය මා හිස නමා කළ වන්දනාවක් ලෙස පිළිගන්නා සේක්වා.

අථ ඛෝ භගවා සෝණදණ්ඩං බ්‍රාහ්මණං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තේජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමීති.

ඉතින් භාග්‍යවතුන් වහන්සේ සෝණදණ්ඩ බ්‍රාහ්මණයා දහම් කථාවෙන් සන්තෝෂයට පත් කරවලා, සමාදන් කරවලා, උනන්දු කරවලා, බලවත් ව සතුටු කරවලා වැඩ සිටි අසුනෙන් නැගිට නික්ම වදාළා.

සෝණදණ්ඩසුත්තං නිට්ඨිතං චතුත්ථං
හතරවෙනි සෝණදණ්ඩ සූත්‍රය නිමා විය.

සාදු ! සාදු !! සාදු !!!

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

5
කූටදන්තසුත්තං
කූටදන්ත බ්‍රාහ්මණයාට වදාළ දෙසුම

1. එවං මේ සුතං. එකං සමයං භගවා මගධේසු චාරිකං චරමානෝ මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි යේන ඛාණුමතං නාම මගධානං බ්‍රාහ්මණගාමෝ තදවසරි. තත්‍ර සුදං භගවා ඛාණුමතේ විහරති අම්බලට්ඨිකායං.

1. මා හට අසන්ට ලැබුණේ මේ විදිහට යි. ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමඟ මගධ ජනපදයේ චාරිකාවේ වඩිමින් සිටිය දී මගධ ජනපදයේ ඛාණුමත නම් බ්‍රාහ්මණ ගමට ද වැඩම කොට වදාළා. ඒ ඛාණුමත බ්‍රාහ්මණ ගමේ අම්බලට්ඨිකා උයනේ තමයි භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටියේ.

තේන ඛෝ පන සමයේන කූටදන්තෝ බ්‍රාහ්මණෝ ඛාණුමතං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨෝදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධේන සේනියේන බිම්බිසාරේන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

ඒ දිනවල ම කූටදන්ත බ්‍රාහ්මණයා වාසය කළේ ඛාණුමත බ්‍රාහ්මණ ගමේ ම යි. ඒ බ්‍රාහ්මණ ගම ඔහුට මගධ දේශාධිපති වූ සේනිය බිම්බිසාර රජුගෙන් ලැබුණු තෑග්ගක්. ඒක ශ්‍රේෂ්ඨ තෑග්ගක්. එහි බොහෝ ජනයා ඉන්නවා. තණ සහිත, දරසහිත, ජලය සහිත වූ, බොහෝ ධාන්‍ය තියෙනවා. රාජ පරිභෝග ගමක්.

තේන ඛෝ පන සමයේන කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස මහායඤ්ඤේ උපක්ඛටෝ හෝති. සත්ත ච උසභසතානි සත්ත ච වච්ඡතරසතානි සත්ත ච වච්ඡතරීසතානි සත්ත ච අජසතානි සත්ත ච උරබ්භසතානි ථූනූපනීතානි හොන්ති යඤ්ඤත්ථාය.

ඒ කාලයේ දී කූටදන්ත බ්‍රාහ්මණයා ගේ මහායාගයක් සූදානම් කරල තිබුණා. ලොකු ගවයන් හත් සියයකුත්, ගොන්නාම්බන් හත් සියයකුත්, නහඹු වැස්සියන් හත් සියයකුත්, එළුවන් හත් සියයකුත්, තරුණ බැටළුවන් හත් සියයකුත් යාගය පිණිස යාග කණුවල ගැටගහල තිබුණා.

2. අස්සෝසුං ඛෝ ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා "සමණෝ ඛලු හෝ ගෝතමෝ සක්‍යපුත්තෝ සක්‍යාකුලා පබ්බජිතෝ මගධේසු චාරිකං චරමානෝ මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි ඛාණුමතං අනුප්පත්තෝ, ඛාණුමතේ විහරති අම්බලට්ඨිකායං. තං ඛෝ පන භවන්තං ගෝතමං ඒවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගතෝ: "ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරාථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣේකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසේති. සාධු ඛෝ පන තථාරූපානං අරහතං දස්සනං හෝතී"ති.

2. ඉතින් ඛාණුමත ගම්වැසි බ්‍රාහ්මණයන්ට මේ කාරණය අසන්ට ලැබුණා. "භවත්නි, අන්න ශාක්‍ය පුත්‍ර වූ, ශාක්‍ය කුලයෙන් නික්මී පැවිදි වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමඟ මගධ ජනපදයෙහි චාරිකාවේ වඩිද්දී ඛාණුමත ගමටත් වැඩම කරලා ඛාණුමත ගමේ අම්බලට්ඨිකාවෙහි වැඩ ඉන්නවා. ඒ භවත් ගෞතමයන් වහන්සේ ගැන මෙවැනි වූ කල්‍යාණ කීර්ති ඝෝෂාවක් පැතිර ගොසින් තියෙනවා. "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණින් අරහත් වන සේක! සම්මාසම්බුද්ධ වන සේක! විජ්ජාචරණසම්පන්න වන සේක! සුගත වන සේක! ලෝකවිදූ වන සේක! අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක! සත්ථා දේවමනුස්සානං වන සේක! බුද්ධ වන සේක! භගවා වන සේක! උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙව්මිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඤාණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා. එබඳු වූ රහතුන් දැකගන්නට ලැබීම කොතරම් යහපත් දෙයක් ද" කියලා.

අථ ඛෝ ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා ඛාණුමතා නික්ඛමිත්වා සංසසංසි ගණිභූතා යේන අම්බලට්ඨිකා තේනුපසංකමන්ති.

එතකොට ඛාණුමත ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතිවරුන් ඛාණුමතයෙන් නික්ම බොහෝ පිරිස් රැස්වෙලා, කණ්ඩායම් වශයෙන් හැදිලා (භාග්‍යවතුන්

වහන්සේ බැහැදැකීම පිණිස) අම්බලට්ඨිකා වනය ඇති දිශාවට පැමිණෙමින් සිටියා.

3. තේන ඛෝ පන සමයේන කූටදන්තෝ බ්‍රාහ්මණෝ උපරිපාසාදේ දිවාසෙය්‍යං උපගතෝ හෝති. අද්දසා ඛෝ කූටදන්තෝ බ්‍රාහ්මණෝ ඛාණුමතකේ බ්‍රාහ්මණගහපතිකේ ඛාණුමතා නික්ඛමිත්වා සංසසංසී ගණිභූතේ යේන අම්බලට්ඨිකා තේනුපසංකමන්තේ. දිස්වා ඛත්තං ආමන්තේසි: "කින්නු ඛෝ භෝ ඛත්තේ ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා ඛාණුමතා නික්ඛමිත්වා සංසසංසී ගණිභූතා යේන අම්බලට්ඨිකා තේනුපසංකමන්තී?"ති.

3. ඒ වෙලාවේ දී කූටදන්ත බ්‍රාහ්මණයා තම ප්‍රාසාදයෙහි උඩුමහල් තලයෙහි දහවල් විවේකයේ හාන්සි වී සිටියා. එතකොට ඛාණුමත ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතිවරුන් ඛාණුමතයෙන් නික්ම බොහෝ පිරිස් රැස්වෙලා, කණ්ඩායම් වශයෙන් හැදිලා (භාග්‍යවතුන් වහන්සේ බැහැදැකීම පිණිස) අම්බලට්ඨිකා වනය දෙසට ගමන් කරමින් සිටින අයුරු කූටදන්ත බ්‍රාහ්මණයාට දැකගන්ට ලැබුණා. දැක තම උපදේශක ඛත්ත නම් තැනැත්තා ඇමතුවා. "භවත් ඛත්ත, ඛාණුමත ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතිවරුන් මොන කරුණක් නිසා ද බොහෝ පිරිස් එකතුව, කණ්ඩායම් වශයෙන් රැස්වෙලා ඛාණුමත ගමෙන් නික්මිලා අම්බලට්ඨිකා වනය දිශාවට යන්නේ?"

"අත්ථි ඛෝ භෝ සමණෝ ගෝතමෝ සක්‍යපුත්තෝ සක්‍යකුලා පබ්බජිතෝ මගධේසු චාරිකං චරමානෝ මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි ඛාණුමතං අනුප්පත්තෝ ඛාණුමතේ විහරති අම්බට්ඨිකායං. තං ඛෝ පන භවන්තං ගෝතමං ඒවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගත්තෝ: ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරාථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා'ති. තමේතේ භවන්තං ගෝතමං දස්සනාය උපසංකමන්තී"ති.

"භවත, ශාක්‍ය කුලයෙන් පැවිදි වූ ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග මගධ ජනපදයෙහි චාරිකාවේ වඩිද්දී ඛාණුමත ගමටත් වැඩම කරලා ඛාණුමත ගමේ අම්බලට්ඨිකා වනයේ වැඩ ඉන්නවා. ඒ භවත් ගෞතමයන් වහන්සේ ගැන මෙවැනි වූ කල්‍යාණ කීර්ති ඝෝෂාවක් පැතිර ගොසින් තියෙනවා. "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණින් අරහත් වන සේක! සම්මාසම්බුද්ධ

වන සේක! විජ්ජාචරණසම්පන්න වන සේක! සුගත වන සේක! ලෝකවිදූ වන සේක! අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක! සත්ථා දේවමනුස්සානං වන සේක! බුද්ධ වන සේක! භගවා වන සේක!" කියල. අන්න ඒ භවත් ගෞතමයන් වහන්සේව දැකීම පිණිස යි ඔය උදවිය යන්නේ."

4. අථ ඛෝ කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස ඒතදහෝසි: "සුතං ඛෝ පන මේ තං සමණෝ ගෝතමෝ තිවිධං යඤ්ඤසම්පදං සෝළසපරික්ඛාරං ජානාතීති. න ඛෝ පනාහං ජානාමි තිවිධං යඤ්ඤසම්පදං සෝළසපරික්ඛාරං. ඉච්ඡාමි චාහං මහායඤ්ඤං යජිතුං. යන්නූනාහං සමණං ගෝතමං උපසංකමිත්වා තිවිධං යඤ්ඤසම්පදං සෝළසපරික්ඛාරං පුච්ඡෙය්‍යන්ති".

4. එතකොට කූටදන්ත බ්‍රාහ්මණයාට මේ අදහස ඇති වුණා. "ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ත්‍රිවිධ වූ යාග සම්පත් ගැනත්, යාගයට උවමනා දහසය ආකාර පිරිකර ගැනත් දන්නා සේකැ යි මං අහල තියෙනවා. ඒ වුණාට මං ත්‍රිවිධ වූ යාග සම්පත් ගැනත්, යාගයට උවමනා දහසය ආකාර පිරිකර ගැනත් දන්නේ නෑ. මමත් මහා යාගයක් කරන්ට කැමැති යි. එහෙනම් මං ශ්‍රමණ ගෞතමයන් ළඟට ගිහින් ත්‍රිවිධ වූ යාග සම්පත් ගැනත්, යාගයට උවමනා දහසය ආකාර පිරිකර ගැනත් අහන එක තමයි හොඳ."

අථ ඛෝ කූටදන්තෝ බ්‍රාහ්මණෝ ඛත්තං ආමන්තේසි "තේන හි භෝ ඛත්තේ යේන ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා තේනුපසංකම. උපසංකමිත්වා ඛාණුමතකේ බ්‍රාහ්මණගහපතිකේ එවං වදේහි: "කූටදන්තෝ භෝ බ්‍රාහ්මණෝ එවමාහ: ආගමෙන්තු කිර භවන්තෝ. කූටදන්තෝපි බ්‍රාහ්මණෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සතී"ති.

ඉතින් කූටදන්ත බ්‍රාහ්මණයා ඛත්ත නම් තැනැත්තා ඇමතුවා "භවත් ඛත්ත, ඛාණුමත ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතිවරුන් ළඟට යන්න. ගිහින් ඛාණුමත ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතිවරුන්ට මෙහෙම කියන්න. "භවත්නි, කූටදන්ත බ්‍රාහ්මණයා මෙහෙම කියනවා. "භවත්නි, මොහොතක් සිටිනු මැනව. ශ්‍රමණ ගෞතමයන් වහන්සේව බැහැදැකීම පිණිස කූටදන්ත බ්‍රාහ්මණයා ද පැමිණෙනවා" කියල.

එවං භෝති ඛෝ සෝ ඛත්තා කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යේන ඛාණුමතකා බ්‍රාහ්මණගහපතිකා තේනුපසංකම. උපසංකමිත්වා ඛාණුමතකේ බ්‍රාහ්මණගහපතිකේ ඒතදවෝච: "කූටදන්තෝ භෝ බ්‍රාහ්මණෝ

ඒවමාහ: ආගමෙන්තු කිර භොන්තෝ. කූටදන්තෝපි බ්‍රාහ්මණෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සතී”ති.

“එසේය භවත,” කියල ඒ බත්ත නම් තැනැත්තා කූටදන්ත බ්‍රාහ්මණයාට පිළිතුරු දීල ඛාණුමත ගම්වැසි බ්‍රාහ්මණගෘහපතිවරුන් ළඟට ගියා. ගිහින් ඛාණුමත ගම්වැසි බ්‍රාහ්මණගෘහපතිවරුන්ට මෙහෙම කිව්වා. “භවත්නි, කූටදන්ත බ්‍රාහ්මණයා මෙහෙම කියනවා. “භවත්නි, මොහොතක් සිටිනු මැනව. ශ්‍රමණ ගෞතමයන් වහන්සේව බැහැදැකීම පිණිස කූටදන්ත බ්‍රාහ්මණයා ද පැමිණෙනවා” කියල.

5. තේන ඛෝ පන සමයේන අනේකානි බ්‍රාහ්මණසතානි ඛාණුමතේ පටිවසන්ති “කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස මහායඤ්ඤං අනුභවිස්සාමා”ති. අස්සෝසුං ඛෝ තේ බ්‍රාහ්මණා “කූටදන්තෝ කිර බ්‍රාහ්මණෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සතී”ති. අථ ඛෝ තේ බ්‍රාහ්මණා යේන කූටදන්තෝ බ්‍රාහ්මණෝ තේනුපසංකමිංසු. උපසංකමිත්වා කූටදන්තං බ්‍රාහ්මණං ඒතදවෝචුං “සච්චං කිර භවං කූටදන්තෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සතී?”ති.

ඒ දිනවල නොයෙක් ප්‍රදේශවලින් පැමිණ සිටි පන්සියයක් පමණ වූ බ්‍රාහ්මණ පිරිසක් ද “කූටදන්ත බ්‍රාහ්මණයා ගේ මහා යාගය වළඳන්නෙමු” යි කියා ඛාණුමත ගමේ වාසය කළා. ඒ බ්‍රාහ්මණවරුන්ට කූටදන්ත බ්‍රාහ්මණයා ශ්‍රමණ ගෞතමයන් වහන්සේව බැහැදකින්නට යන බව අසන්නට ලැබුණා. එතකොට ඒ බ්‍රාහ්මණවරුන් කූටදන්ත බ්‍රාහ්මණයා ළඟට ගියා. ගිහින් කූටදන්ත බ්‍රාහ්මණයාට මෙකරුණ කිව්වා. “භවත් කූටදන්ත ශ්‍රමණ ගෞතමයන්ව බැහැදකින්ට යන්ට ඉන්නවා කියල කියන්නේ හැබෑවක් ද?”

“ඒවං ඛෝ මේ හෝ හෝති අහම්පි සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සාමී”ති.

“එසේය භවත්නි, මාත් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදැකීමට යන්ට තමයි ඉන්නේ”

6. “මා භවං කූටදන්තෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමි. න අරහති භවං කූටදන්තෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිතුං. සචේ භවං කූටදන්තෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සති, භෝතෝ

කූටදන්තස්ස යසෝ හායිස්සති. සමණස්ස ගෝතමස්ස යසෝ අභිවඩ්ඪිස්සති. යම්පි හෝතෝ කූටදන්තස්ස යසෝ හායිස්සති සමණස්ස ගෝතමස්ස යසෝ අභිවඩ්ඪිස්සති, ඉමිනා පංගේන න අරහති භවං කූටදන්තෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිතුං. සමණෝ ත්වේව ගෝතමෝ අරහති භවන්තං කූටදන්තං දස්සනාය උපසංකමිතුං.

6. "හා ... හා ... භවත් කූටදන්තයන් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදකින්ට යන්ට එපා! භවත් කූටදන්තයන් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදැකීමට යන එක තමන් ගේ තත්වයට ගැලපෙන්නේ නෑ. ඉදින් භවත් කූටදන්තයන් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදකින්ට යනවා නම්, භවත් කූටදන්තයන් ගේ කීර්තිරාවය පිරිහිලා යාවි. ශ්‍රමණ ගෞතමයන් ගේ කීර්ති රාවය වඩ වඩාත් ඉහළ යාවි. භවත් කූටදන්තයන් ගේ කීර්තිය පිරිහීමත්, ශ්‍රමණ ගෞතමයන් ගේ කීර්තිය ඉහළ යෑමත් යන යම් කරුණක් ඇද්ද, මෙන්න මේ කරුණ නිසයි භවත් කූටදන්තයන් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදකින්ට යන එක සුදුසු නොවන්නේ. හැබැයි ශ්‍රමණ ගෞතමයන් නම් භවත් කූටදන්තයන්ව බැහැදැකීමට එන එක සුදුසු යි."

භවං හි කූටදන්තෝ උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාවසත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. යම්පි භවං කූටදන්තෝ උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාවසත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. ඉමිනා පංගේන න අරහති භවං කූටදන්තෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිතුං. සමණෝ ත්වේව ගෝතමෝ අරහති භවන්තං කූටදන්තං දස්සනාය උපසංකමිතුං.

භවත් කූටදන්තයන් වනාහී මව් පාර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක් නෙව. සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වා ම පිරිසිදු කුල ප්‍රවේණියක් තියෙනවා නෙව. එනිසා ම කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස ලබා නෑ නෙව. ගැරහුම් ලබා නෑ නෙව. ඉතින් භවත් කූටදන්තයන් මව් පාර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක් යන යම් කරුණක් ඇද්ද, සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වා ම පිරිසිදු කුල ප්‍රවේණියක් තියෙනවා යන යම් කරුණක් ඇද්ද, එනිසා ම කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස ලබා නැතිබවත්, ගැරහුම් ලබා නැතිබවත් යන යම් කරුණක් ඇද්ද, අන්න ඒ කාරණය නිසයි භවත් කූටදන්තයන් ශ්‍රමණ

ගෞතමයන්ව බැහැදකින්ට යන එක සුදුසු නො වන්නේ. හැබැයි ශ්‍රමණ ගෞතමයන් නම් භවත් කූටදන්තයන්ව බැහැදැකීමට එන එක සුදුසු යි.

භවං හි කූටදන්තෝ අඩ්ඪෝ මහද්ධනෝ මහාභෝගෝ .....

ඒ වගේ ම භවත් කූටදන්තයන් වනාහී සැපසම්පතින් ආඪ්‍ය කෙනෙක් නෙව. මහා ධනවතෙක් නෙව. මහාභෝග ඇති කෙනෙක් නෙව .....

භවං හි කූටදන්තෝ අජ්ඣායකෝ මන්තධරෝ, තිණ්ණං වේදානං පාරගූ සනිඝණ්ඩුකේටුභානං සාක්ඛරප්පභේදානං ඉතිහාසපඤ්චමානං, පදකෝ, වෙය්‍යාකරණෝ, ලෝකායතමහාපුරිසලක්ඛණේසු අනවයෝ .....

ඒ වගේම භවත් කූටදන්තයන් වනාහී වේද හදාරණ කෙනෙක් නෙව. මන්ත්‍රධාරී කෙනෙක් නෙව. ඉතිහාසය පස්වෙනි කොට ඇති වේදසමයාගත භාෂා ශාස්ත්‍රයන්හි නිපුණත්වයක් ඇති අක්ෂර ප්‍රභේද ගැන හසල බුද්ධිය ඇති ත්‍රිවේද පාරප්‍රප්ත කෙනෙක් නෙව. වේදසමයාගත පද පාඨ දන්නා කෙනෙක් නෙව. ව්‍යාකරණ දන්නා කෙනෙක් නෙව. ලෝකායත ශාස්ත්‍රයෙහි, මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයෙහි නිපුණ කෙනෙක් නෙව .....

භවං හි කූටදන්තෝ අභිරූපෝ දස්සනීයෝ පාසාදිකෝ පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතෝ, බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුද්දාවකාසෝ දස්සනාය .....

ඒ වගේම භවත් කූටදන්තයන් වනාහී ඉතා රූපවත් කෙනෙක් නෙව. සොඳුරු පෙනුමක් ඇති කෙනෙක් නෙව. දුටුවන් පහදින කෙනෙක් නෙව. උතුම් වර්ණ සෞන්දර්යයෙන් යුතු කෙනෙක් නෙව. රන්වන් පැහැ ඇති කෙනෙක් නෙව. බ්‍රහ්මයා ගේ බඳු ශරීරාලෝකය ඇති කෙනෙක් නෙව. දැකීමට පවා ඉඩකඩ අපහසුවෙන් ලැබිය යුතු කෙනෙක් නෙව .....

භවං හි කූටදන්තෝ සීලවා වුද්ධසීලී වුද්ධසීලේන සමන්නාගතෝ .....

ඒ වගේ ම භවත් කූටදන්තයන් වනාහී සිල්වත් නෙව, වැඩුණු සිල් ඇති කෙනෙක් නෙව. වැඩුණු සීලයෙන් සමන්විත කෙනෙක් නෙව .....

භවං හි කූටදන්තෝ කල්‍යාණවාචෝ කල්‍යාණවාක්කරණෝ, පෝරියාවාචාය සමන්නාගතෝ විස්සට්ඨාය අනේලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා .....

ඒ වගේ ම භවත් කූටදන්තයන් වනාහී මිහිරි වචන ඇති කෙනෙක් නෙව. මිහිරි ලෙස කරුණු විග්‍රහ කරන කෙනෙක් නෙව. ශිෂ්ඨසම්පන්න වචන ඇති කෙනෙක් නෙව. නො විසුරුණු වචන ඇති කෙනෙක් නෙව. පැහැදිලි වචන ඇති කෙනෙක් නෙව. අරුත් මතු කොට කථා කරන කෙනෙක් නෙව .....

භවං හි කූටදන්තෝ බහුන්නං ආචරියපාචරියෝ, තීණි මාණවකසතානි මන්තේ වාචේති. බහූ ඛෝ පන නානාදිසා නානාජනපදා මාණවකා ආගච්ඡන්ති හෝතෝ කූටදන්තස්ස සන්තිකේ මන්තත්ථිකා මන්තේ අධියිතුකාමා .....

ඒ වගේ ම භවත් කූටදන්තයන් වනාහී බොහෝ දෙනාට ආචාර්ය ප්‍රාචාර්ය වූ කෙනෙක් නෙව. බ්‍රාහ්මණ මාණවකයන් තුන් සියයකට වේදය උගන්වන කෙනෙක් නෙව. භවත් කූටදන්තයන් සමීපයෙහි වේද හදාරණු කැමැති, එහි ප්‍රයෝජන ඇති මාණවකයින් නානාදිසාවලින්, නානා ජනපදවලින් බොහෝ සෙයින් එනවා නෙව .....

භවං හි කූටදන්තෝ ජිණ්ණෝ වුද්ධෝ මහල්ලකෝ අද්ධගතෝ වයෝ අනුප්පත්තෝ. සමණෝ ගෝතමෝ තරුණෝ චේව තරුණපබ්බජීතෝ ච .....

ඒ වගේ ම භවත් කූටදන්තයන් වනාහී වයෝවෘද්ධ කෙනෙක් නෙව. මහළු කෙනෙක් නෙව. පිළිවෙලින් වයසට පත් වූ කෙනෙක් නෙව. නමුත් ශ්‍රමණ ගෞතමයන් තරුණයි නෙ. ඒ වගේ ම තරුණ පැවිද්දෙක් නෙ .....

භවං හි කූටදන්තෝ රඤ්ඤෝ මාගධස්ස සේනියස්ස බිම්බිසාරස්ස සක්කතෝ ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ .....

ඒ වගේ ම භවත් කූටදන්තයන් වනාහී මගධේශ්වර සේනිය බිම්බිසාර නිරිඳුන්ගෙන් සත්කාර ලැබූ කෙනෙක් නෙව. ගෞරව ලැබූ කෙනෙක් නෙව. බුහුමන් ලැබූ කෙනෙක් නෙව. පිදුම් ලැබූ කෙනෙක් නෙව. යටහත් පැවැතුම් ලැබූ කෙනෙක් නෙව .....

භවං හි කූටදන්තෝ බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස සක්කතෝ ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ .....

ඒ වගේ ම භවත් කූටදන්තයන් වනාහී පොක්ඛරසාතී බ්‍රාහ්මණතුමාගෙන් සත්කාර ලැබූ කෙනෙක් නෙව. ගෞරව ලැබූ කෙනෙක් නෙව. බුහුමන් ලැබූ කෙනෙක් නෙව. පිදුම් ලැබූ කෙනෙක් නෙව. යටහත් පැවැතුම් ලැබූ කෙනෙක් නෙව .....

භවං හි කූටදන්තෝ ඛාණුමතං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨෝදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධේන සේනියේන බිම්බිසාරේන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං. යම්පි භවං කූටදන්තෝ ඛාණුමතං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨෝදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා මාගධේන සේනියේන බිම්බිසාරේන දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං, ඉමිනා පංගේන න අරහති භවං කූටදන්තෝ සමණං ගෝතමං දස්සනාය උපසංකමිතුං. සමණෙෝ ත්වේව ගෝතමෝ අරහති භවන්තං කූටදන්තං දස්සනාය උපසංකමිතුන්ති.

ඒ වගේ ම භවත් කූටදන්තයන් වනාහී මගධේශ්වර සේනිය බිම්බිසාර නිරිඳුන් විසින් දෙන ලද රාජ දායාදය වූ ශ්‍රේෂ්ඨ ත්‍යාගය වූ රාජපරිභෝග වූ බොහෝ ජනයා ගැවසී සිටින, තණ දර දිය ආදියෙන් පිරි, ධාන්‍යයෙන් පිරි ඛාණුමත ගමෙහි (ප්‍රධානව) වසන කෙනෙක් නෙව. ඒ වගේ ම භවත් කූටදන්තයන් මගධේශ්වර සේනිය බිම්බිසාර නිරිඳුන් විසින් දෙන ලද රාජ දායාදය වූ ශ්‍රේෂ්ඨ ත්‍යාගය වූ රාජපරිභෝග වූ බොහෝ ජනයා ගැවසී සිටින, තණ දර දිය ආදියෙන් පිරි, ධාන්‍යයෙන් පිරි ඛාණුමත ගමෙහි (ප්‍රධානව) වාසය කරනවා යන යම් කරුණක් ඇද්ද, මෙන්න මේ කරුණ නිසයි භවත් කූටදන්තයන් ශ්‍රමණ ගෞතමයන්ව බැහැදකින්ට යන එක සුදුසු නො වන්නේ. හැබැයි ශ්‍රමණ ගෞතමයන් නම් භවත් කූටදන්තයන්ව බැහැදැකීමට එන එක සුදුසු යි.”

7. එවං වුත්තේ කූටදන්තෝ බ්‍රාහ්මණෙෝ තේ බ්‍රාහ්මණේ ඒතදවෝච: “තේන හි භෝ මමපි සුණාථ, යථා මයමේව අරහාම තං භවන්තං ගෝතමං දස්සනාය උපසංකමිතුං. නත්වේව අරහති සෝ භවං ගෝතමෝ අම්හාකං දස්සනාය උපසංකමිතුං.

මෙසේ පැවසූ විට කූටදන්ත බ්‍රාහ්මණයා ඒ බ්‍රාහ්මණවරුන්ට මෙහෙම කිව්වා. “එසේ වී නම් භවත්නි, ඒ භවත් ගෞතමයන් වහන්සේව බැහැ දකින්ට

යැම අපට කොයිතරම් සුදුසුද යන වගටත්, ඒ වගේ ම ඒ භවත් ගෞතමයන් වහන්සේ වැනි උතුමෙක් අපව දකින්ට පැමිණීම උන්වහන්සේ ගේ තත්වයට සුදුසු නැති වගටත් කියවෙන මගේ වචනය ද අසනු මැනැව.

"සමණෝ ඛ්වි භෝ ගෝතමෝ උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. යම්පි භෝ සමණෝ ගෝතමෝ උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. ඉමිනා පංගේන න අරහති සෝ භවං ගෝතමෝ අම්හාකං දස්සනාය උපසංකමිතුං. අථ ඛෝ මයමේව අරහාම තං භවන්තං ගෝතමං දස්සනාය උපසංකමිතුං.

ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ද මව් පාර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක්. සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වාම පිරිසිදු කුල ප්‍රවේණියක් තියෙනවා. එනිසා ම කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස ලබා නෑ. ගැරහුම් ලබා නෑ. ඉතින් භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මව් පාර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක් යන යම් කරුණක් ඇද්ද, සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වා ම පිරිසිදු කුල ප්‍රවේණියක් තියෙනවා යන යම් කරුණක් ඇද්ද, එනිසා ම කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස ලබා නැතිබවත්, ගැරහුම් ලබා නැතිබවත් යන යම් කරුණක් ඇද්ද, අන්න ඒ කාරණය මත ඒ භවත් ගෞතමයන් වහන්සේ වැනි උතුමෙක් අපව දකින්ට පැමිණීම උන්වහන්සේ ගේ තත්වයට සුදුසු නැහැ ම යි. එනිසා ශ්‍රමණ භවත් ගෞමයන් වහන්සේව බැහැදකින්ට යැම අපට ම යි සුදුසු.

සමණෝ ඛ්වි භෝ ගෝතමෝ මහන්තං ඤාතිසංඝං විහාය පබ්බජිතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මහත් ඤාතිපිරිසක් අත්හැර දමා උතුම් පැවිදිබව ලැබූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි භෝ ගෝතමෝ පහූතං හිරඤ්ඤ සුවණ්ණං විහාය පබ්බජිතෝ භූමිගතඤ්ච වේහාසට්ඨඤ්ච .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පොළොවට අයත් වූත්, පොළොවෙන් උඩ තිබෙන්නා වූත් බොහෝ රන් රිදී ආදී වස්තුව අත්හැර දමා උතුම් පැවිදිබව ලැබූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ දහරෝ ව සමානෝ යුවා සුසු කාළකේසෝ භද්‍රේන යොබ්බනේන සමන්නාගතෝ පඨමේන වයසා අගාරස්මා අනගාරියං පබ්බජීතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඉතා තරුණ වූ යෞවන කාලයේ දී ම මනා කළු කෙස් ඇති හද්‍ර වූ යොවුන් වියෙහි සිටිය දී ම ජීවිතයෙහි ප්‍රථම වයසේ දී ගිහිගෙයින් නික්ම අනගාරිකව උතුම් පැවිදිබව ලැබූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ අකාමකානං මාතාපිතූන්නං අස්සුමුඛානං රුදන්තානං කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජීතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තමන් ගේ රාජවංශික දෙමාපියන් අකැමැත්තෙන් කඳුළු වැකුණු මුහුණින් හඬද්දී ම කෙස් රැවුල් බා කසාවත් පොරොවා ගෙන ගිහිගෙයින් නික්ම අනගාරිකව උතුම් පැවිදිබව ලැබූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ අභිරූපෝ දස්සනීයෝ පාසාදිකෝ පරමායවණ්ණපොක්ඛරතාය සමන්නාගතෝ බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුද්දාවකාසෝ දස්සනාය .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ද ඉතා රූපවත් කෙනෙක් නෙව. සොඳුරු පෙනුමක් ඇති කෙනෙක් නෙව. දුටුවන් පහදින කෙනෙක් නෙව. උතුම් වර්ණ සෞන්දර්යයෙන් යුතු කෙනෙක් නෙව. රන්වන් පැහැ ඇති කෙනෙක් නෙව. බ්‍රහ්මයා ගේ බඳු ශරීරාලෝකය ඇති කෙනෙක් නෙව. දැකීමට පවා ඉඩකඩ අපහසුවෙන් ලැබිය යුතු කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ සීලවා අරියසීලී කුසලසීලි කුසලසීලේන සමන්නාගාතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ආර්ය වූ සිල් ඇති කෙනෙක් නෙව, කුසල සිල් ඇති කෙනෙක් නෙව. කුසල සීලයෙන් සමන්විත කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ කල්‍යාණවාචෝ කල්‍යාණවාක්කරණෝ පෝරියා වාචාය සමන්නාගතෝ විස්සට්ඨාය අනේලගලාය අත්ථස්ස විඤ්ඤාපනියා .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ද මිහිරි වචන ඇති කෙනෙක් නෙව. මිහිරි ලෙස කරුණු විග්‍රහ කරන කෙනෙක් නෙව. ශිෂ්ඨසම්පන්න වචන ඇති කෙනෙක් නෙව. නො විසුරුණු වචන ඇති කෙනෙක් නෙව. පැහැදිලි වචන ඇති කෙනෙක් නෙව. අරුත් මතු කොට කථා කරන කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ බහුන්නං ආචරියපාචරියෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ද බොහෝ ජනයා හට ආචාර්ය ප්‍රාචාර්ය වූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ ඛීණකාමරාගෝ විගතචාපල්ලෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කාමරාගය ක්ෂය කළ කෙනෙක් නෙව. චපලබව බැහැර කළ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ කම්මවාදී කිරියවාදී අපාපපුරෙක්ඛාරෝ බ්‍රහ්මඤ්ඤය පජාය .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කර්මවාදී ක්‍රියාවාදී උත්තමයෙක් නෙව. ශ්‍රේෂ්ඨ වූ දෙයම පෙරටු කොට ඇති කෙනෙක් නෙව. උතුම් බ්‍රාහ්මණ පිරිසටත් අවශේෂ ප්‍රජාවටත් නායකත්වය දරන කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ උච්චා කුලා පබ්බජිතෝ අසම්භින්න ඛත්තිය කුලා .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සම්භේද නොවූ පිරිසිදු රාජවංශික කුල ප්‍රවේණි ඇති උසස් ම වංශයෙන් පැවිදි වූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි භෝ ගෝතමෝ අඩ්ඪා කුලා පබ්බජිතෝ මහද්ධනා මහාභෝගා .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ආඪ්‍ය වූ මහාධන ඇති මහාභෝග ඇති කුලවත් වංශයෙන් පැවිදි වූ කෙනෙක් නෙව .....

සමණං ඛ්වි භෝ ගෝතමං තිරෝරට්ඨා තිරෝජනපදා සම්පුච්ඡිතුං ආගච්ඡන්ති .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වෙත පිටරටවලින් ද පිට ජනපදවලින් ද ප්‍රශ්න විසඳා ගැනීමට බොහෝ පිරිස් පැමිණෙනවා නෙව .....

සමණං ඛ්වි භෝ ගෝතමං අනේකානි දේවතාසහස්සානි පාණේහි සරණං ගතානි .....

ඒ වගේ ම අනේක වූ දහස් සංඛ්‍යාත දෙවිවරුන් භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේව දිවිහිමියෙන් සරණ ගිහින් තිබෙනවා නෙව .....

සමණං ඛ්වි භෝ ගෝතමං ඒවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගතෝ ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසධම්මසාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පිළිබඳ ව මේ ආකාර වූ කල්‍යාණ කීර්ති ඝෝෂාවක් පැතිර ගිහින් තිබෙනවා නෙව. “ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණින් අරහත් වන සේක! සම්මාසම්බුද්ධ වන සේක! විජ්ජාචරණසම්පන්න වන සේක! සුගත වන සේක! ලෝකවිදූ වන සේක! අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක! සත්ථා දේවමනුස්සානං වන සේක! බුද්ධ වන සේක! භගවා වන සේක!” කියල .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ ද්වත්තිංසමහාපුරිසලක්ඛණේහි සමන්නාගතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මහාපුරුෂ ලක්ෂණ තිස්දෙකකින් සමන්විත වූ කෙනෙක් නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ ඒහිසාගතවාදී සඛ්ලෝ සම්මෝදකෝ අබ්භාකුටිකෝ උත්තානමුඛෝ පුබ්බභාසී .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තමන් වෙත පැමිණෙන පිරිසට ඉතා සුහද ලෙස "එන්න ඔබේ පැමිණීම සාදරයෙන් පිළිගනිමු" කියමින් පිළිගන්නා කෙනෙකි. මිහිරි වචන කථා කරන කෙනෙකි. පිළිසඳර කථාවෙහි ඉතා දක්ෂ කෙනෙකි. කවර කරුණකටවත් ඇහිබැම හකුළුවා නොබලන කෙනෙකි. විනෑම කෙනෙක් දෙස ප්‍රියශීලී ලෙස මුහුණ ඔසවා කෙලින් බලන කෙනෙකි. පැමිණි පිරිසට පළමුවෙන් ම කථාබස් කරන කෙනෙකි .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ චතුන්නං පරිසානං සක්කතෝ ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව්වණක් පිරිසෙන් සත්කාර ලැබූ කෙනෙකි. ගෞරව ලැබූ කෙනෙකි. බුහුමන් ලැබූ කෙනෙකි. පිදුම් ලැබූ කෙනෙකි. යටහත් පැවැතුම් ලැබූ කෙනෙකි .....

සමණේ ඛ්වි හෝ ගෝතමේ බහූදේවා ච මනුස්සා ච අභිප්පසන්නා .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කෙරෙහි බොහෝ දෙවිවරුත්, බොහෝ මිනිසුනුත් අතිශයින් ම පැහැදීමෙන් යුක්තයි නෙව .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ යස්මිං ගාමේ වා නිගමේ වා පටිවසති, න තස්මිං ගාමේ වා නිගමේ වා අමනුස්සා මනුස්සේ විහේඨෙන්ති .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යම් ගමක වේවා, නියම්ගමක වේවා, වැඩසිටිනවා නම් ඒ ගමේවත්, නියම්ගමේවත් අමනුෂ්‍යයන් මිනිසුන් හට කිසි පීඩාවක් කරන්නේ නැ .....

සමණෝ ඛ්වි හෝ ගෝතමෝ සංඝී ගණී ගණාචරියෝ පුථුතිත්ථකරානං අග්ගමක්ඛායති. යථා ඛෝ පන හෝ ඒතේසං සමණබ්‍රාහ්මණානං යථා වා තථා වා යසෝ සමුදාගච්ඡති න හේවං සමණස්ස ගෝතමස්ස යසෝ සමුදාගතෝ. අථ ඛෝ අනුත්තරාය විජ්ජාචරණසම්පදාය සමණස්ස ගෝතමස්ස යසෝ සමුදාගතෝ .....

ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මහා පිරිස් සහිත යි. විශාල පිරිස්වලට ආචාර්ය වශයෙන් සිටින්නේ. ඒ වගේ ම බොහෝ ආගමික නායකයන් අතරින් උන්වහන්සේ තමයි අග්‍ර වන්නේ. භවත්නි, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ කීර්තිරාවය තියෙන්නේ ඔවුන් ගේ යම් යම් ව්‍රත සමාදන් වීම් ආදී බාහිර දේ මුල් කර ගෙනයි. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ කීර්තිය පැතිරිලා තියෙන්නේ එවන් කරුණක් දෙකක් මුල් කර ගෙන නොවේ. සැබැවින් ම අනුත්තර වූ (අවබෝධ ඤාණය නම් වූ විද්‍යාවෙනුත් ඊට අනුකූල හැසිරීම නම් වූ චරණයෙනුත් යන) විජ්ජාචරණ සම්පන්න ගුණයෙන් ම යි ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ කීර්තිරාවය පැතිරී තියෙන්නේ .....

සමණං ඛ්වි හෝ ගෝතමං රාජා මාගධෝ සේනියෝ බිම්බිසාරෝ සපුත්තෝ සභරියෝ සපරිසෝ සාමච්චෝ පාණේහි සරණං ගතෝ. සමණං ඛ්වි හෝ ගෝතමං රාජා පසේනදී කෝසලෝ සපුත්තෝ සභරියෝ සපරිසෝ සාමච්චෝ පාණේහි සරණං ගතෝ. සමණං ඛ්වි හෝ ගෝතමං බ්‍රාහ්මණෝ පොක්ඛරසාතී සපුත්තෝ සභරියෝ සපරිසෝ සාමච්චෝ පාණේහි සරණං ගතෝ. සමණෝ ඛ්වි හෝ ගෝතමෝ රඤ්ඤෝ මාගධස්ස සේනියස්ස බිම්බිසාරස්ස සක්කතෝ ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ. සමණෝ ඛ්වි හෝ ගෝතමෝ රඤ්ඤෝ පසේනදිස්ස කෝසලස්ස සක්කතෝ ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ. සමණෝ ඛ්වි හෝ ගෝතමෝ බ්‍රාහ්මණස්ස පොක්ඛරසාතිස්ස සක්කතෝ ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ.

ඒ වගේ ම මගධේශ්වර සේනිය බිම්බිසාර නිරිඳාණන් සිය දරුවනුත් හා එක්ව, බිරින්දෑවරුන් හා එක්ව, පිරිස් හා එක්ව, ඇමැතිවරුන් හා එක්ව භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේව දිවිහිමියෙන් සරණ ගිහිල්ලයි ඉන්නේ.

ඒ වගේ ම පසේනදී කෝසල නිරිඳාණන් සිය දරුවනුත් හා එක්ව, බිරින්දෑවරුන් හා එක්ව, පිරිස් හා එක්ව, ඇමැතිවරුන් හා එක්ව භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේව දිවිහිමියෙන් සරණ ගිහිල්ලයි ඉන්නේ. ඒ වගේ ම පොක්ඛරසාතී බ්‍රාහ්මණතුමා සිය දරුවනුත් හා එක්ව, බිරින්දෑවරුන් හා එක්ව, පිරිස් හා එක්ව, ඇමැතිවරුන් හා එක්ව භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේව දිවිහිමියෙන් සරණ ගිහිල්ලයි ඉන්නේ. ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මගධේශ්වර සේනිය බිම්බිසාර නිරිඳාණන් ගෙන් සත්කාර ලැබූ කෙනෙකි. ගෞරව ලැබූ කෙනෙකි. බුහුමන් ලැබූ කෙනෙකි. පිදුම් ලැබූ කෙනෙකි. යටහත් පැවැතුම් ලැබූ කෙනෙකි. ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පසේනදී කෝසල නිරිඳාණන් ගෙන් සත්කාර ලැබූ කෙනෙකි. ගෞරව ලැබූ කෙනෙකි. බුහුමන් ලැබූ කෙනෙකි. පිදුම් ලැබූ කෙනෙකි. යටහත් පැවැතුම් ලැබූ කෙනෙකි. ඒ වගේ ම භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පොක්ඛරසාතී බ්‍රාහ්මණතුමා ගෙන් සත්කාර ලැබූ කෙනෙකි. ගෞරව ලැබූ කෙනෙකි. බුහුමන් ලැබූ කෙනෙකි. පිදුම් ලැබූ කෙනෙකි. යටහත් පැවැතුම් ලැබූ කෙනෙකි.

සමණෝ ඛලු භෝ ගෝතමෝ ඛාණුමතං අනුප්පත්තෝ ඛාණුමතේ විහරති අම්බලට්ඨිකායං. යේ ඛෝ පන කේචි සමණා වා බ්‍රාහ්මණා වා අම්හාකං ගාමක්ඛෙත්තං ආගච්ඡන්ති, අතිථී නෝ තේ හොන්ති. අතිථී ඛෝ පනම්හේහි සක්කාතබ්බා ගරුකාතබ්බා මානේතබ්බා පූජේතබ්බා අපචේතබ්බා. යම්පි භෝ සමණෝ ගෝතමෝ ඛාණුමතං අනුප්පත්තෝ ඛාණුමතේ විහරති අම්බලට්ඨිකායං. අතිථිම්හාකං සමණෝ ගෝතමෝ. අතිථී ඛෝ පනම්හේහි සක්කාතබ්බෝ ගරුකාතබ්බෝ මානේතබ්බෝ පූජේතබ්බෝ අපචේතබ්බෝ.

ඒ භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඛාණුමත ගමේ අම්බලට්ඨිකාවේ වැඩසිටිනවා. ඉතින් යම් කිසි ශ්‍රමණවරුන් වේවා බ්‍රාහ්මණවරුන් වේවා අප ගේ ගම් කෙතට සම්ප්‍රාප්ත වෙනවා නම් ඔවුන් අපට ආගන්තුක පිරිසකි. අප විසින් ඒ ආගන්තුක පිරිසට සත්කාර කළ යුතු යි. ගරු කළ යුතු යි. පිදිය යුතු යි. යටහත් පැවතුම් දැක්විය යුතු යි. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ඛාණුමතයට වැඩම කරලා, ඛාණුමත ගමෙහි අම්බලට්ඨිකාවෙහි වැඩ සිටිනවා ද, ඒ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ අප ගේ ආගන්තුකයෙක් ම යි. ඉතින් අප විසින් ආගන්තුක වූ උන්වහන්සේට සත්කාර කළ යුතු යි. ගරු කළ යුතු යි. පිදිය යුතු යි. යටහත් පැවතුම් දැක්විය යුතු යි.

ඉමිනාපංඝේන නාරහති සෝ භවං ගෝතමෝ අම්හාකං දස්සනාය උපසංකමිතුං. අථ ඛෝ මයමේව අරහාම තං භවන්තං ගෝතමං දස්සනාය උපසංකමිතුං.

ඔන්න ඔය කාරණයේ දීත් ඒ භවත් ගෞතමයන් වහන්සේ වැනි උතුමෙක් අපව දකින්ට පැමිණීම උන්වහන්සේ ගේ තත්වයට සුදුසු නැහැ මයි. එනිසා ශ්‍රමණ භවත් ගෞමයන් වහන්සේව බැහැදකින්ට යෑම අපට ම යි සුදුසු.

එත්තකේ ඛෝ අහං භෝ තස්ස භෝතෝ ගෝතමස්ස වණ්ණේ පරියාපුණාමි. නෝ ච ඛෝ සෝ භවං ගෝතමෝ එත්තකවණ්ණෝ. අපරිමාණවණ්ණෝ හි සෝ භවං ගෝතමෝති.

භවත්නි, ඒ භවත් ගෞතමයන් වහන්සේ ගේ ගුණය පිළිබඳ ව මා දන්නේ ඔච්චර යි. නමුත් ඒ භවත් ගෞතමයන් වහන්සේ නම්, ගුණ ඔච්චරක් පමණක් තිබෙන උත්තමයෙක් නොවෙයි. ඒ භවත් ගෞතමයන් වහන්සේ ප්‍රමාණ කළ නො හැකි වූ ගුණ සම්පත්වලින් යුක්ත යි.

8. ඒවං වුත්තේ තේ බ්‍රාහ්මණා කූටදන්තං බ්‍රාහ්මණං එතදවෝචුං: "යථා ඛෝ භවං කූටදන්තෝ සමණස්ස ගෝතමස්ස වණ්ණේ භාසති ඉතෝ චේපි සෝ භවං ගෝතමෝ යෝජනසතේ විහරති, අලමේව සද්ධේන කුලපුත්තේන දස්සනාය උපසංකමිතුං අපි පුටංසේනාපි. තේන හි භෝ සබ්බේව මයං සමණං ගෝතමං දස්සනාය උපසංකමිස්සාමා"ති.

මෙසේ පැවසූ විට ඒ බ්‍රාහ්මණවරු කූටදන්ත බ්‍රාහ්මණයාට මෙහෙම කිව්වා. "භවත් කූටදන්තන් ශ්‍රමණ ගෞතමයන් ගේ ගුණයන් යම් ආකාරයකින් පැවසුවා නම්, ඒ ආකාරයෙන් යුතු ගුණ ඇති ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යොදුන් සියයක් එපිටින් වාසය කළත් සැදැහැවත් කුලපුත්‍රයෙක් විසින් මග වියදම් ද රැගෙන උන්වහන්සේව බැහැදකින්ට යෑම සුදුසු දෙයක් ම යි. එහෙමනම් අපි හැමෝම ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේව බැහැ දකින්ට යමු."

9. අථ ඛෝ කූටදන්තෝ බ්‍රාහ්මණෝ මහතා බ්‍රාහ්මණගණේන සද්ධිං යේන අම්බලට්ඨිකා යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා භගවතා

සද්ධිං සම්මෝදි. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදි. ඛාණුමතිකාපි ඛෝ බ්‍රාහ්මණගහපතිකා අප්පේකච්චේ භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදිංසු. අප්පේකච්චේ භගවතා සද්ධිං සම්මෝදිංසු. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදිංසු. අප්පේකච්චේ යේන භගවා තේනඤ්ජලිං පණාමෙත්වා ඒකමන්තං නිසීදිංසු. අප්පේකච්චේ නාමගොත්තං සාවෙත්වා ඒකමන්තං නිසීදිංසු. අප්පේකච්චේ තුණ්හීභූතා එකමන්තං නිසීදිංසු.

ඉතින් කූටදන්ත බ්‍රාහ්මණයා මහත් වූ බ්‍රාහ්මණ පිරිසත් සමග අම්බලට්ඨිකාවේ භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටි තැනට පැමිණුනා. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වුණා. සතුටුවිය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව වාඩිවුණා. ඛාණුමතිකා ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතියන්ගෙන් ඇතැම් උදවිය භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට එකත්පස්ව වාඩි වුණා. සමහරුන් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වුණා. සතුටුවිය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව වාඩිවුණා. තවත් සමහරුන් භාග්‍යවතුන් වහන්සේට ඇදිලි බැඳ ආචාර කොට එකත්පස්ව වාඩි වුණා. සමහර උදවිය තම තමන් ගේ නම්ගොත් පවසලා එකත්පස්ව වාඩිවුණා. තවත් සමහරුන් නිශ්ශබ්දව එකත්පස්ව වාඩිවුණා.

10. **ඒකමන්තං නිසින්නෝ ඛෝ කූටදන්තෝ බ්‍රාහ්මණෝ භගවන්තං ඒතදවෝච: "සුතං මේතං භෝ ගෝතම සමණෙෝ ගෝතමෝ තිවිධං යඤ්ඤසම්පදං සෝළසපරික්ඛාරං ජානාතීති. න ඛෝ පනාහං ජානාමි තිවිධං යඤ්ඤසම්පදං සෝළසපරික්ඛාරං. ඉච්ඡාමි චාහං මහායඤ්ඤං යජිතුං. සාධු මේ භවං ගෝතමෝ තිවිධං යඤ්ඤසම්පදං සෝළසපරික්ඛාරං දේසේතූ"ති.**

10. එකත්පස්ව හුන් කූටදන්ත බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පැවසුවා. "ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ත්‍රිවිධ වූ යාග සම්පත් ගැනත්, යාගයට උවමනා දහසය ආකාර පිරිකර ගැනත් දන්නා සේකැ යි ම‍ං අහල තියෙනවා. ඒ වුණාට ම‍ං ත්‍රිවිධ වූ යාග සම්පත් ගැනත්, යාගයට උවමනා දහසය ආකාර පිරිකර ගැනත් දන්නේ නෑ. මමත් මහා යාගයක් කරන්ට කැමැති යි. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මා හට ත්‍රිවිධ වූ යාග සම්පත් ගැනත්, යාගයට උවමනා දහසය ආකාර පිරිකර ගැනත් දේශනා කරන සේක්වා."

"තේන හි බ්‍රාහ්මණ සුණෝහි සාධුකං මනසිකරෝහි භාසිස්සාමී"ති. ඒවං භෝ'ති ඛෝ කූටදන්තෝ බ්‍රාහ්මණෝ භගවතෝ පච්චස්සෝසි. භගවා ඒතදවෝච:

"එහෙමනම් පින්වත් බ්‍රාහ්මණය, සවන් යොමා අසන්න. හොඳින් නුවණින් මෙනෙහි කරන්න. මං කියා දෙන්නම්." "එසේ ය භවත," කියල කූටදන්ත බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නා. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළා.

11. "භූතපුබ්බං බ්‍රාහ්මණ රාජා මහාවිජිතෝ නාම අහෝසි, අඩ්ඪෝ මහද්ධනෝ මහාභෝගෝ පහූතජාතරූපරජතෝ පහූතවිත්තූපකරණෝ පහූතධනධඤ්ඤෝ පරිපුණ්ණකෝසකොට්ඨාගාරෝ. අථ ඛෝ බ්‍රාහ්මණ රඤ්ඤෝ මහාවිජිතස්ස රහෝගතස්ස පටිසල්ලීනස්ස ඒවං චේතසෝ පරිවිතක්කෝ උදපාදි: "අධිගතා ඛෝ මේ විපුලා මානුසකා භෝගා. මහන්තං පඨවිමණ්ඩලං අභිවිජිය අජ්ඣාවසාමි. යන්නූනාහං මහායඤ්ඤං යජෙය්‍යං, යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛායා"ති.

11. "පින්වත් බ්‍රාහ්මණය, මේක ඉස්සර සිදු වුණ දෙයක්. මහාවිජිත කියල රජ කෙනෙක් හිටියා. ඔහු සම්පත්වලින් ආඪ්‍ය කෙනෙක්. මහා ධනවත්, මහා භෝග තිබුණා. බොහෝ රන්රිදී තිබුණා. බොහෝ වස්තු උපකරණ තිබුණා. බොහෝ ධනධාන්‍ය තිබුණා. ගබඩාවල් අටුකොටු පුරවලා තිබුණා. ඉතින් පින්වත් බ්‍රාහ්මණය, මහාවිජිත රජ්ජුරුවන්ට හුදෙකලා විවේකයෙන් ඉන්න අවස්ථාවක මෙවැනි කල්පනාවක් සිතේ ඇති වුණා. මට මිනිස් ලෝකයෙහි තිබෙන මහත් භෝගසම්පත් ලැබිල තියෙනවා. මේ සා විශාල පෘථිවි මණ්ඩලය දිනා ගෙන මං අධිපති වෙලා ඉන්නවා. ඉතින් මාත් මහායාගයක් කළොත් ඒක මට බොහෝ කලක් හිතසුව පිණිස පවතීවි" කියල.

අථ ඛෝ බ්‍රාහ්මණ රාජා මහාවිජිතෝ පුරෝහිතං බ්‍රාහ්මණං ආමන්තෙත්වා ඒතදවෝච: "ඉධ මය්හං බ්‍රාහ්මණ රහෝගතස්ස පටිසල්ලීනස්ස ඒවං චේතසෝ පරිවිතක්කෝ උදපාදි: "අධිගතා ඛෝ මේ විපුලා මානුසකා භෝගා. මහන්තං පඨවිමණ්ඩලං අභිවිජිය අජ්ඣාවසාමි. යන්නූනාහං මහායඤ්ඤං යජෙය්‍යං, යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛායා'ති. ඉච්ඡාමහං බ්‍රාහ්මණ මහායඤ්ඤං යජිතුං. අනුසාසතු මං භවං, යං මමස්ස දීඝරත්තං හිතාය සුඛායා"ති.

පින්වත් බ්‍රාහ්මණය, ඊට පස්සේ මහාවිජිත රජ්ජුරුවෝ පුරෝහිත බ්‍රාහ්මණයා අමතා මෙහෙම කිව්වා. "එම්බා බ්‍රාහ්මණය, හුදෙකලා විවේකයෙන් සිටින මට මෙවැනි කල්පනාවක් හිතේ ඇති වුණා. "මට මිනිස් ලෝකයෙහි තිබෙන මහත් භෝගසම්පත් ලැබිල තියෙනවා. මේ සා විශාල පෘථුවි මණ්ඩලය දිනා ගෙන මං අධිපති වෙලා ඉන්නවා. ඉතින් මාත් මහායාගයක් කළොත් ඒක මට බොහෝ කලක් හිතසුව පිණිස පවතීවි" කියල. ඉතින් බ්‍රාහ්මණය මං මහා යාගයක් කරන්ට කැමැති යි. භවත, එයට මට අනුශාසනා කළ මැනැව. එය මා හට බොහෝ කලක් හිතසුව පිණිස පවතීවි."

12. ඒවං වුත්තේ බ්‍රාහ්මණ පුරෝහිතෝ බ්‍රාහ්මණෝ රාජානං මහාවිජිතං ඒතදවෝච: "භෝතෝ ඛෝ රඤ්ඤෝ ජනපදෝ සකණ්ටකෝ සඋප්පීළෝ. ගාමඝාතා'පි දිස්සන්ති, නිගමඝාතා'පි දිස්සන්ති, පන්ථදූහනා'පි දිස්සන්ති. භවං චේ ඛෝ පන රාජා ඒවං සකණ්ටකේ ජනපදේ සඋප්පීළේ බලිමුද්ධරෙය්‍යා, අකිච්චකාරී අස්ස තේන භවං රාජා. සියා ඛෝ පන භෝතෝ රඤ්ඤේ ඒවමස්ස: "අහමේතං දස්සුඛීලං වධේන වා බන්ධේන වා ජානියා වා ගරහාය වා පබ්බාජනාය වා සමූහනිස්සාමී"ති.

12. පින්වත් බ්‍රාහ්මණය, මෙසේ පැවසූ විට පුරෝහිත බ්‍රාහ්මණයා මහා විජිත රජුට මෙහෙම කිව්වා. "භවත්, රජාණන් ගේ ජනපදය සොර උවදුරු සහිත යි. සොර උවදුරින් පෙළෙනවා. ගම්පහරන සොරුන්ව දකින්ට ලැබෙනවා. නියම්ගම් පහරන සොරුන්වත් දකින්ට ලැබෙනවා. මං පහරන සොරුන්වත් දකින්ට ලැබෙනවා. ඉදින් භවත් රජාණන් මෙවැනි සොර උවදුරු සහිත, සොර උවදුරින් පීඩා විඳින ජනපදවාසීන්ගෙන් අධික බදු අය කරනවා නම්, අන්න ඒ කාරණය භවත් රජාණන් අතින් නො කෙරිය යුත්තක් ම යි. භවත් රජිදාණන් හට මේ විදිහට සිතෙන්ට පුළුවනි. "මං ඔය සොර මුල් අල්ලලා එක්කෝ මරවනවා. එක්කෝ හිරේ දමනවා. දඩ ගසනවා. එක්කෝ අපහාස කරනවා. එක්කෝ පිටුවහල් කරනවා. ඒ විදිහට ඒ ප්‍රශ්නෙ මුලින් ම උදුරා දමනවා" කියල.

න ඛෝ පනේතස්ස දස්සුඛීලස්ස ඒවං සම්මා සමුග්ඝාතෝ හෝති. යේ තේ හතාවසේසකා භවිස්සන්ති, තේ පච්ඡා රඤ්ඤේ ජනපදං විහේඨෙස්සන්ති. අපි ච ඛෝ ඉදං සංවිධානං ආගම්ම ඒවමේතස්ස දස්සුඛීලස්ස සම්මා සමුග්ඝාතෝ හෝති. තේන හි භවං රාජා යේ භෝතෝ රඤ්ඤේ ජනපදේ උස්සහන්ති කසිගෝරක්ඛේ, තේසං භවං රාජා බීජභත්තං අනුප්පදේතු. යේ භෝතෝ රඤ්ඤේ ජනපදේ උස්සහන්ති වණිජ්ජාය, තේසං භවං රාජා පාභතං

අනුප්පදේතු. යේ හෝතෝ රඤ්ඤේ ජනපදේ උස්සහන්ති රාජපෝරිසේ, තේසං භවං රාජා භත්තවේතනං පකප්පතු. තේ ච මනුස්සා සකම්මපසුතා රඤ්ඤේ ජනපදං න විහේඨෙස්සන්ති. මහා ච රඤ්ඤේ රාසිකෝ භවිස්සති, ඛේමට්ඨිතා ජනපදා අකණ්ටකා අනුප්පීළා. මනුස්සා ච මුදා මෝදමානා උරේ පුත්තේ නච්චෙන්තා අපාරුතඝරා මඤ්ඤේ විහරිස්සන්ති"ති.

නමුත් සොර මුල්වලට ඔය විදිහට දඩුවම් දීල ඒ ප්‍රශ්නය මනාකොට මුලින් ම ඉදිරී යන්නේ නෑ. වනසන ලද සොරුන්ගෙන් යමෙක් ඉතිරි වුණොත් ඔවුන් පසුවට මුළුරටම පීඩාවට පත් කරාවි. එසේ නමුත් මේ සංවිධානාත්මක වැඩපිළිවෙලට පැමිණිලා ඔය සොරු මුල් මනා කොට උදුරා දමන්ට පුළුවන් වෙනවා. එම නිසා භවත් රජතුමා යම් කෙනෙක් භවත් රජුන් ගේ රට තුළ ගොවිතැනටත්, ගව පාලනයටත් උනන්දු වෙනවා නම්, ඔවුන් හට භවත් රජතුමා බිත්තර වී, බත් වැටුප් ආදිය සපයා දෙන සේක්වා. භවත් රජු ගේ රට තුළ යම් කෙනෙක් ව්‍යාපාර පිණිස උත්සහාවත් වෙනවා නම්, ඔවුන් හට භවත් රජතුමා ප්‍රාග්ධනය සළසා දෙන සේක්වා. භවත් රජු ගේ රට තුළ යම් කෙනෙක් රාජ්‍ය සේවය පිණිස උත්සහාවත් වෙනවා නම්, ඔවුන් හට භවත් රජතුමා බත් වැටුප් පිළියෙල කර දෙන සේක්වා. එතකොට ඒ මිනිසුන් තම තමන් ගේ රාජකාරිවල යෙදෙමින් සිටින විට රජතුමා ගේ රට පෙළන්නේ නෑ. රජතුමාටත් මහා ධන ධාන්‍ය වර්ධනයක් වෙනවා. ඒ ඒ ප්‍රදේශ සොර උවදුරු රහිතව, සොර පීඩා රහිතව බිය සැක නැති, රැකවරණ ඇති තැන්බවට පත් වෙනවා. එතකොට සතුටු වන මිනිසුන් උරයෙහි දරුවන් නටවමින් ගෙවල් දොරවල් බිය සැක නැතිව විවෘත කර වාසය කරාවි.

13. ඒවං හෝති ඛෝ බ්‍රාහ්මණ රාජා මහාවිජිතෝ පුරෝහිතස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යේ රඤ්ඤේ ජනපදේ උස්සහිංසු කසිගෝරක්ඛෙ, තේසං රාජා මහාවිජිතෝ බීජභත්තං අනුප්පාදාසි. යේ රඤ්ඤේ ජනපදේ උස්සහිංසු වණිජ්ජාය, තේසං රාජා මහාවිජිතෝ පාභතං අනුප්පාදාසි. යේ රඤ්ඤේ ජනපදේ උස්සහිංසු රාජපෝරිසේ, තේසං රාජා මහාවිජිතෝ භත්තවේතනං පකප්පේසි. තේ ච මනුස්සා සකම්මපසුතා රඤ්ඤේ ජනපදං න විහේඨේසුං. මහා ච රඤ්ඤේ රාසිකෝ අහෝසි, ඛේමට්ඨිතා ජනපදා අකණ්ටකා අනුප්පීළා. මනුස්සා මුදා මෝදමානා උරේ පුත්තේ නච්චෙන්තා අපාරුතඝරා මඤ්ඤේ විහරිංසු.

13. පින්වත් බ්‍රාහ්මණය, ඉතින් මහාවිජිත රජ්ජුරුවෝ "එසේය භවත" කියල පුරෝහිත බ්‍රාහ්මණයාට පිළිතුරු දී රජු ගේ රටෙහි ගොවිතැනෙන් ගව පාලනය කටයුතු කරන්ට යමෙක් උත්සාහවත් වුණා නම්, ඔවුන්ට මහාවිජිත

රජතුමා බිත්තර වී බත් ආදියත් ලබා දුන්නා. යම් කෙනෙක් රජු ගේ රටෙහි ව්‍යාපාර කිරීමෙහි උනන්දු වුණා නම්, ඔවුන්ට මහාවිජිත රජතුමා ප්‍රාග්ධනය දුන්නා. යම් කෙනෙක් රජු ගේ රටෙහි රාජ්‍ය සේවයට උත්සහාවත් වුණා නම්, ඔවුන්ට මහාවිජිත රජතුමා බත් වැටුප් දුන්නා. එතකොට ඒ මිනිස්සු තම තමන් ගේ රැකියාවල නියුතු වීම නිසා රජුගේ රට පෙළුවේ නෑ. රජු ගේ (භාණ්ඩාගාරය ද) ධන ධාන්‍යවලින් පිරී ගියා. ඒ ඒ ප්‍රදේශ සොර උවදුරු රහිතව, සොර පීඩා රහිතව බිය සැක නැති, රැකවරණ ඇති තැන්බවට පත් වුණා. එතකොට සතුටු වන මිනිසුන් උරයෙහි දරුවන් නටවමින් ගෙවල් දොරවල් බිය සැක නැතිව විවෘත කර වාසය කළා.

14. අථ ඛෝ බ්‍රාහ්මණ රාජා මහාවිජිතෝ පුරෝහිතං බ්‍රාහ්මණං ආමන්තෙත්වා ඒතදවෝච: "සමූහතෝ ඛෝ මේ භෝ සෝ දස්සුඛීලෝ භෝතෝ සංවිධානං ආගම්ම. මහා ච මේ රාසිකෝ. ඛේමට්ඨිතා ජනපදා අකණ්ටකා අනුප්පීළා. මනුස්සා මුදා මෝදමානා උරේ පුත්තේ නච්චෙන්තා අපාරුතඝරා මඤ්ඤේ විහරන්ති. ඉච්ඡාමහං බ්‍රාහ්මණ මහායඤ්ඤං යජිතුං. අනුසාසතු මං භවං, යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛායා"ති.

14. ඉතින් පින්වත් බ්‍රාහ්මණය මහාවිජිත රජ්ජුරුවෝ පුරෝහිත බ්‍රාහ්මණයා අමතා මෙහෙම කිව්වා. "භවත මා විසින් සංවිධානාත්මකව කටයුතු කිරීම නිසා ඒ සොර මුල මුලින් ම ඉදිරී ගියා. මාගේ ධනධාන්‍ය රාශිය ද අතිවිශාල යි. ඒ ඒ ප්‍රදේශ සොර උවදුරු රහිතව, පෙළීම් රහිතව බිය සැක නැතුව තියෙනවා. මිනිස්සුත් සතුටින් ඉපිල යමින් දරුවන් උරයේ නටවමින්, ගෙවල් දොරවල් බිය නැතිව විවෘත කරල දාල ඉන්නවා වගේ වාසය කරනවා. එම්බා බ්‍රාහ්මණය, මං දැන් මහා යාගයක් කරන්ට කැමැති යි. භවත මට අනුශාසනා කළ මැනැව. එය මට බොහෝ කලක් හිතසුව පිණිස පවතීවි."

"තේන හි භවං රාජා යේ භෝතෝ රඤ්ඤේ ජනපදේ ඛත්තියා අනුයුත්තා නේගමා චේව ජානපදා ච, තේ භවං රාජා ආමන්තයතං, "ඉච්ඡාමහං භෝ මහායඤ්ඤං යාජිතුං. අනුජානන්තු මේ භොන්තෝ යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛායා"ති. යේ භෝතෝ රඤ්ඤේ ජනපදේ අමච්චා පාරිසජ්ජා නේගමා චේව ජානපදා ච ..... බ්‍රාහ්මණමහාසාලා නේගමා චේව ජානපදා ච ..... ගහපතිනේවයිකා නේගමා චේව ජානපදා ච, තේ භවං රාජා ආමන්තයතං, "ඉච්ඡාමහං භෝ මහායඤ්ඤං යජිතුං. අනුජානන්තු මේ භවන්තෝ යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛායා"ති.

"එසේ නම් භවත් රජතුමනි, භවත් රජු ගේ රටෙහි රජ අණ පිළිපදින නියම්ගම් වාසී වූත්, ජනපදවාසී වූත් යම් ක්ෂත්‍රියවරුන් (රාජකීය පිරිස) සිටිනවා නම්, භවත් රජතුමා "භවත්නි, මං මහා යාගයක් කරන්ට කැමැති යි. භවත්නි, ඒ සඳහා මට අනුමැතිය දෙත්වා. එය මට බොහෝ කලක් හිත සුව පිණිස පවතීවි" කියල ඔවුන් අමතන සේක්වා. භවත් රජු ගේ රටෙහි රජ අණ පිළිපදින නියම්ගම් වාසී වූත්, ජනපදවාසී වූත් යම් ඇමැති පිරිස සිටිනවා නම් ..... භවත් රජු ගේ රටෙහි රජ අණ පිළිපදින නියම්ගම් වාසී වූත්, ජනපදවාසී වූත් යම් සම්භාවනීය බ්‍රාහ්මණ පිරිස සිටිනවා නම් ..... භවත් රජු ගේ රටෙහි රජ අණ පිළිපදින නියම්ගම් වාසී වූත්, ජනපදවාසී වූත් යම් සම්භාවනීය ගිහි පිරිස සිටිනවා නම්, භවත් රජතුමා "භවත්නි, මං මහා යාගයක් කරන්ට කැමැති යි. භවත්නි, ඒ සඳහා මට අනුමැතිය දෙත්වා. එය මට බොහෝ කලක් හිත සුව පිණිස පවතීවි" කියල ඔවුන් අමතන සේක්වා.

එවං හෝති ඛෝ බ්‍රාහ්මණ රාජා මහාවිජිතෝ පුරෝහිතස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යේ රඤ්ඤේ ජනපදේ ඔත්තියා අනුයුත්තා නේගමා චේව ජානපදා ච, තේ රාජා මහාවිජිතෝ ආමන්තේසි: "ඉච්ඡාමහං භෝ මහායඤ්ඤං යජිතුං. අනුජානන්තු මේ භොන්තෝ, යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛායා"ති. "යජතං භවං රාජා යඤ්ඤං. යඤ්ඤකාලෝ මහාරාජා"ති.

පින්වත් බ්‍රාහ්මණය, "එසේය භවත" කියල මහාවිජිත රජ්ජුරුවෝ පුරෝහිත බ්‍රාහ්මණයාට පිළිතුරු දී රජු ගේ රටෙහි රජ අණ පිළිපදින නියම්ගම් වාසී වූත්, ජනපදවාසී වූත් යම් ක්ෂත්‍රියවරුන් (රාජකීය පිරිස) සිටිනවා නම්, ඒ මහාවිජිත රජතුමා "භවත්නි, මං මහා යාගයක් කරන්ට කැමැති යි. භවත්නි, ඒ සඳහා මට අනුමැතිය දෙත්වා. එය මට බොහෝ කලක් හිත සුව පිණිස පවතීවි" කියල ඔවුන් ඇමතුවා. "භවත් රජතුමනි, යාගය කරන සේක්වා. මහාරාජයාණෙනි, මේ යාගයට කාලය යි."

යේ රඤ්ඤේ ජනපදේ අමච්චා පාරිසජ්ජා නේගමා චේව ජානපදා ච ..... බ්‍රාහ්මණමහාසාලා නේගමා චේව ජානපදා ච ..... ගහපතිනේවයිකා නේගමා චේව ජානපදා ච, තේ රාජා මහාවිජිතෝ ආමන්තේසි: "ඉච්ඡාමහං භෝ මහායඤ්ඤං යජිතුං. අනුජානන්තු මේ භවන්තෝ, යං මම'ස්ස දීඝරත්තං හිතාය සුඛායා"ති. "යජතං භවං රාජා යඤ්ඤං. යඤ්ඤකාලෝ මහාරාජා"ති.

රජු ගේ රටෙහි රජ අණ පිළිපදින නියම්ගම් වාසී වූත්, ජනපදවාසී වූත් යම් ඇමැති පිරිස සිටිනවා නම් ..... රජු ගේ රටෙහි රජ අණ පිළිපදින නියම්ගම් වාසී වූත්, ජනපදවාසී වූත් යම් සම්භාවනීය බ්‍රාහ්මණ පිරිස සිටිනවා නම් ..... රජු ගේ රටෙහි රජ අණ පිළිපදින නියම්ගම් වාසී වූත්, ජනපදවාසී වූත් යම් සම්භාවනීය ගිහි පිරිස සිටිනවා නම්, ඒ මහාවිජිත රජතුමා "භවත්නි, මං මහා යාගයක් කරන්ට කැමැති යි. භවත්නි, ඒ සඳහා මට අනුමැතිය දෙත්වා. එය මට බොහෝ කලක් හිත සුව පිණිස පවතීවි" කියල ඔවුන් ඇමතුවා. "භවත් රජතුමනි, යාගය කරන සේක්වා. මහාරාජයාණෙනි, මේ යාගයට කාලය යි."

ඉතිමේ චත්තාරෝ අනුමතිපක්ඛා තස්සේව යඤ්ඤස්ස පරික්ඛාරා භවන්ති.

මෙසේ යාගයට අවසර දෙන පිරිස් හතර තමයි ඒ යාගයේ පිරිකර බවට පත්වන්නේ.

15. රාජා මහාවිජිතෝ අට්ඨහි අංගේහි සමන්නාගතෝ:

15. මහාවිජිත රජතුමා අංග අටකින් සමන්විත යි.

උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන,

මව් පාර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක්. සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වාම පිරිසිදු කුල ප්‍රවේණියක් තියෙනවා. එනිසා ම කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස ලබා නෑ. ගැරහුම් ලබා නෑ.

අභිරූපෝ, දස්සනීයෝ පාසාදිකෝ, පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතෝ, බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුවද්දාවකාසෝ දස්සනාය.

ඉතා රූපවත් කෙනෙක්. සොඳුරු පෙනුමක් ඇති කෙනෙක්. දුටුවන් පහදින කෙනෙක්. උතුම් වර්ණ සෞන්දර්යයෙන් යුතු කෙනෙක්. රන්වන් පැහැ ඇති කෙනෙක්. බ්‍රහ්මයා ගේ බඳු ශරීරාලෝකය ඇති කෙනෙක්. දැකීමට පවා ඉඩකඩ අපහසුවෙන් ලැබිය යුතු කෙනෙක්.

අඩ්ඪෝ මහද්ධනෝ මහාභෝගෝ පහූතජාතරූපරජතෝ පහූත-විත්තූපකරණෝ පහූතධනධඤ්ඤේ පරිපුණ්ණකෝසකොට්ඨාගාරෝ.

සැපසම්පතින් ආඪ්‍ය කෙනෙක්. මහා ධනවතෙක්. මහාභෝග ඇති කෙනෙක්, බොහෝ මිළමුදල් ඇති කෙනෙක්, බොහෝ පාරිභෝගික උපකරණ ඇති කෙනෙක්, බොහෝ ධනධාන්‍ය ඇති කෙනෙක්. අටුකොටු පිරීගිය සම්පත් ඇති කෙනෙක්.

බලවා චතුරංගිනියා සේනාය සමන්නාගතෝ අස්සවාය විවාදපටිකරාය, පතපති මඤ්ඤේ පච්චත්ථිකේ යසසා.

බලවන්ත යි. රජ අණට සවන් දෙන රජු ගේ අවවාදයට අනුව කටයුතු කරන ඇත්, අස්, රිය, පාබල යන චතුරංගිනී සේනාවෙන් සමන්විත යි. රජු ගේ යසස් තේජසින් විරුද්ධ පාක්ෂිකයන් තැවී යන සුළු යි.

සද්ධෝ දායකෝ දානපති අනාවටද්වාරෝ, සමණබ්‍රාහ්මණ-කපණද්ධිකවණිබ්බකයාචකානං විපානභූතෝ, පුඤ්ඤානි කරෝති.

ශ්‍රද්ධාවන්ත යි, පරිත්‍යාගශීලි යි, දානපති කෙනෙක්. ශ්‍රමණ-බ්‍රාහ්මණවරුන් හට ද දුගී මගී යාචකාදීනට ද විවෘත වූ දොරටුවලින් යුක්ත යි. හැමට පානය කළ හැකි පැන් ඇති පොකුණක් මෙන් සිටිමින් දන්පින් කරයි.

බහුස්සුතෝ තස්ස තස්ස සුතජාතස්ස. තස්ස තස්සේව ඛෝ පන භාසිතස්ස අත්ථං ජානාති: අයං ඉමස්ස භාසිතස්ස අත්ථෝ අයං ඉමස්ස භාසිතස්ස අත්ථෝති.

තමා ඉගෙන ගන්නා ඒ ඒ කරුණු පිළිබඳ ව බහුශ්‍රැත යි, මේ පවසන දේ තුළ තිබෙන්නේ මේ අර්ථ යි. මේ කියමන තුළ තිබෙන්නේ මේ අර්ථය යි කියල ඒ ඒ පැවසූ කරුණු පිළිබඳ ව අර්ථ දන්නවා.

පණ්ඩිතෝ වියත්තෝ මේධාවී පටිබලෝ අතීතානගතපච්චුප්පන්නේ අත්ථේ චින්තේතුං.

ඤාණවන්ත යි. ව්‍යක්ත යි. ඉතා බුද්ධිමත්. අතීත අනාගත වර්තමාන කරුණු පිළිබඳව අරුත් සිතන්නට දක්ෂ යි.

රාජා මහාවිජිතෝ ඉමේහි අට්ඨහි අංගේහි සමන්නාගතෝ. ඉති ඉමානි'පි අට්ඨංගානි තස්සේව යඤ්ඤස්ස පරික්ඛාරා භවන්ති.

මහාවිජිත රජතුමා ඔය අංග අටෙනුත් සමන්විත යි. ඔය විදිහට මේ අංග අටත් රජතුමා ගේ යාග පිරිකර බවට පත් වෙනවා.

16. පුරෝහිතෝ'පි බ්‍රාහ්මණෝ චතුහංගේහි සමන්නාගතෝ:

16. පුරෝහිත බ්‍රාහ්මණයාත් අංග හතරකින් සමන්විත යි.

උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන.

මව් පාර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක්. සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වා ම පිරිසිදු කුල ප්‍රවේණියක් තියෙනවා. එනිසා ම කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස ලබා නෑ. ගැරහුම් ලබා නෑ.

අජ්ඣායකෝ මන්තධරෝ, තිණ්ණං වේදානං පාරගූ සනිඝණ්ඩුකේටුභානං සාක්ඛරප්පභේදානං ඉතිහාසපඤ්චමානං, පදකෝ, වෙය්‍යාකරණෝ, ලෝකායතමහාපුරිසලක්ඛණේසු අනවයෝ.

වේද හදාරණ කෙනෙක්. මන්ත්‍රධාරී කෙනෙක්. ඉතිහාසය පස්වෙනි කොට ඇති වේදසමයාගත භාෂා ශාස්ත්‍රයන්හි නිපුණත්වයක් ඇති අක්ෂර ප්‍රභේද ගැන හසල බුද්ධිය ඇති ත්‍රිවේද පාරප්‍රප්ත කෙනෙක්. වේදසමයාගත පද පාඨ දන්නා කෙනෙක්. ව්‍යාකරණ දන්නා කෙනෙක්. ලෝකායත ශාස්ත්‍රයෙහි, මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයෙහි නිපුණ කෙනෙක්.

සීලවා හෝති වුද්ධසීලී වුද්ධසීලේන සමන්නාගතෝ.

සිල්වත්. වැඩුණු සිල් ඇති කෙනෙක්. වැඩුණු සීලයෙන් සමන්විත කෙනෙක්.

පණ්ඩිතෝ මේධාවී පඨමෝ වා දුතියෝ වා සුජං පග්ගණ්හන්තානං. පුරෝහිතෝ බ්‍රාහ්මණෝ ඉමේහි චතුහංගේහි සමන්නාගතෝ. ඉති ඉමානි'පි චත්තාරි අංගානි තස්සේව යඤ්ඤස්ස පරික්ඛාරා භවන්ති.

නුවණැති කෙනෙක්, ප්‍රඥාවන්ත කෙනෙක්. යාග කිරීම පිණිස යාග හැන්ද එසවීමේ දී පළමු කොට හෝ දෙවනුව හෝ කරන කෙනෙක්. පුරෝහිත බ්‍රාහ්මණයා ඔය අංග හතරෙන් සමන්විත යි. ඔය විදිහට මේ අංග හතරත් රජතුමා ගේ යාග පිරිකර බවට පත් වෙනවා.

17. අථ ඛෝ බ්‍රාහ්මණ, පුරෝහිතෝ බ්‍රාහ්මණෝ රඤ්ඤේ මහාවිජිතස්ස පුබ්බේව යඤ්ඤ තිස්සෝ විධා දේසේසි:

17. එතකොට පින්වත් බ්‍රාහ්මණය, පුරෝහිත බ්‍රාහ්මණයාත් මහාවිජිත රජතුමා හට කාල තුනක් දැනුම් දුන්නා.

"සියා ඛෝ පන භෝතෝ රඤ්ඤේ මහායඤ්ඤං යිට්ඨුකාමස්ස කෝචිදේව විප්පටිසාරෝ "මහා වත මේ භෝගක්ඛන්ධෝ විගච්ඡිස්සතී"ති, සෝ භෝතෝ රඤ්ඤේ විප්පටිසාරෝ න කරණීයෝ. සියා ඛෝ පන භෝතෝ රඤ්ඤේ මහායඤ්ඤං යජමානස්ස කෝචිදේව විප්පටිසාරෝ "මහා වත මේ භෝගක්ඛන්ධෝ විගච්ඡතී"ති. සෝ භෝතෝ රඤ්ඤේ විප්පටිසාරෝ න කරණීයෝ. සියා ඛෝ පන භෝතෝ රඤ්ඤේ මහායඤ්ඤං යිට්ඨස්ස කෝචිදේව විප්පටිසාරෝ "මහා වත මේ භෝගක්ඛන්ධෝ විගතෝ"ති. සෝ භෝතෝ රඤ්ඤේ විප්පටිසාරෝ න කරණීයෝ"ති.

"භවත් රජතුමා හට මහායාගයක් කිරීමට කැමැති වෙද්දී යම් කිසි විපිළිසරබවක් ඇති වන්නට ඉඩ තිබෙනවා. ඒ කියන්නේ "අය්යෝ! මගේ මහත් භෝග රාශියක් මේ වෙනුවෙන් වැනසිලා යාවි" කියල. පින්වත් රජු විසින් ඒ විපිළිසරබව නො කළ යුතු ය. භවත් රජතුමා හට මහායාගය කරමින් සිටින විට දී යම් කිසි විපිළිසරබවක් ඇති වන්නට ඉඩ තිබෙනවා. ඒ කියන්නේ "අය්යෝ! මගේ මහත් භෝග රාශියක් මේ වෙනුවෙන් වැනසෙනවා" කියල. පින්වත් රජු විසින් ඒ විපිළිසරබව නො කළ යුතු ය. "භවත් රජතුමා හට මහායාගය කළාට පස්සේ යම් කිසි විපිළිසරබවක් ඇති වන්නට ඉඩ තිබෙනවා. ඒ කියන්නේ "අය්යෝ! මගේ මහත් භෝග රාශියක් මේ වෙනුවෙන් වැනසිලා ගියා" කියල. පින්වත් රජු විසින් ඒ විපිළිසරබව නො කළ යුතු ය."

ඉමා ඛෝ පන බ්‍රාහ්මණ පුරෝහිතෝ බ්‍රාහ්මණෝ රඤ්ඤේ මහාවිජිතස්ස පුබ්බේව යඤ්ඤ තිස්සෝ විධා දේසේසි.

පින්වත් බ්‍රාහ්මණය, ඉතින් පුරෝහිත බ්‍රාහ්මණයා මහාවිජිත රජ්ජුරුවන්ට යාගයට කලින් ම ත්‍රිවිධ කාල සම්පත්තිය දේශනා කළා.

18. අථ ඛෝ බ්‍රාහ්මණ පුරෝහිතෝ බ්‍රාහ්මණෝ රඤ්ඤේ මහාවිජිතස්ස පුබ්බේව යඤ්ඤා දසහාකාරේහි පටිග්ගාහකේසු විප්පටිසාරං පටිවිනෝදේසි: "ආගමිස්සන්ති ඛෝ භෝතෝ යඤ්ඤං පාණාතිපාතිනෝ'පි පාණාතිපාතා පටිවිරතා'පි. යේ තත්ථ පාණාතිපාතිනෝ තේසඤ්ඤේව තේන. යේ තත්ථ පාණාතිපාතා පටිවිරතා තේ ආරබ්භ යජතං භවං, සජ්ජතං භවං, මෝදතං භවං, චිත්තමේව භවං අන්තරං පසාදේතු. ආගමිස්සන්ති ඛෝ භෝතෝ යඤ්ඤං අදින්නාදායිනෝ'පි අදින්නාදානා පටිවිරතා'පි ..... කාමේසු මිච්ඡාචාරිනෝ'පි කාමේසු මිච්ඡාචාරා පටිවිරතා'පි ..... මුසාවාදිනෝ'පි මුසාවාදා පටිවිරතා'පි ..... පිසුණාවාචිනෝ'පි පිසුණාය වාචාය පටිවිරතා'පි ..... ඵරුසාවාචිනෝ'පි ඵරුසාය වාචාය පටිවිරතා'පි ..... සම්ඵප්පලාපිනෝ'පි සම්ඵප්පලාපා පටිවිරතා'පි ..... අභිජ්ඣාවිනෝ'පි අනභිජ්ඣාවිනෝ'පි ..... බ්‍යාපන්නචිත්තා'පි අබ්‍යාපන්නචිත්තා'පි ..... මිච්ඡාදිට්ඨිකා'පි සම්මාදිට්ඨිකා'පි. යේ තත්ථ මිච්ඡාදිට්ඨිකා තේසඤ්ඤේව තේන. යේ තත්ථ සම්මාදිට්ඨිකා තේ ආරබ්භ යජතං භවං, සජ්ජතං භවං, මෝදතං භවං, චිත්තමේව භවං අන්තරං පසාදේතු"නි.

18. ඉතින් පින්වත් බ්‍රාහ්මණය, පුරෝහිත බ්‍රාහ්මණයා මහාවිජිත රජතුමා හට යාගයට කලින් ම යාගය පිළිගන්නා පිරිස කෙරෙහි ඇති විය හැකි විපිළිසරයන් දහ අයුරකින් දුරු කළා. "භවත් රජතුමා ගේ යාගයට ප්‍රාණඝාත කරන අයත්, ප්‍රාණඝාතයෙන් වැළකී සිටින අයත් පැමිණේවි. ඉතින් ඔවුන් අතරේ යමෙක් ප්‍රාණඝාත කරනවා නම් එයින් අයහපතක් සිදු වන්නේ ඔවුන්ට ම යි. ඒ පැමිණි පිරිස අතරේ යමෙක් ප්‍රාණඝාතයෙන් වැළකී සිටිනවා නම්, භවතාණන් ඔවුන් අරභයා යාගය කරන සේක්වා. භවතාණන් ඔවුන් අරභයා පරිත්‍යාග කරන සේක්වා. භවතාණන් යාගයෙන් සතුටු වෙන සේක්වා. භවතාණන් යාගය කරද්දී සිත ම පහදා ගන්නා සේක්වා. භවත් රජතුමා ගේ යාගයට සොරකම් කරන අයත්, සොරකමින් වැළකී සිටින අයත් පැමිණේවි ..... වැරදි කාමසේවනයෙහි යෙදෙන අයත්, වැරදි කාමසේවනයෙන් වැළකී සිටින අයත් පැමිණේවි ..... බොරු කියන අයත්, බොරු කීමෙන් වැළකී සිටින අයත් පැමිණේවි ..... කේලාම් කියන අයත්, කේලමින් වැළකී සිටින අයත් පැමිණේවි ..... පරුෂ වචන කියන අයත්, ඵරුෂ වචනයෙන් වැළකී සිටින අයත් පැමිණේවි ..... හිස් වචන කියන අයත්, හිස් වචනයෙන් වැළකී සිටින අයත් පැමිණේවි ..... විෂම ලෝභයෙන් යුතු අයත්, විෂම ලෝභ නැති අයත් පැමිණේවි ..... තරහ සිත් ඇති අයත්, තරහ සිත් නැති අයත්

පැමිණේවි ..... මිසදිටු අයත්, සම්මාදිට්ඨියෙන් යුතු අයත් පැමිණේවි. ඉතින් ඔවුන් අතරේ යමෙක් මිසදිටු නම් එයින් අයහපතක් සිදු වන්නේ ඔවුන්ට ම යි. ඒ පැමිණි පිරිස අතරේ යමෙක් සම්මාදිට්ඨියෙන් යුතු නම්, භවතාණන් ඔවුන් අරභයා යාගය කරන සේක්වා. භවතාණන් ඔවුන් අරභයා පරිත්‍යාග කරන සේක්වා. භවතාණන් යාගයෙන් සතුටු වෙන සේක්වා. භවතාණන් යාගය කරද්දී සිත ම පහදා ගන්නා සේක්වා."

ඉමේහි ඛෝ බ්‍රාහ්මණ පුරෝහිතෝ බ්‍රාහ්මණෝ රඤ්ඤෝ මහාවිජිතස්ස පුබ්බේව යඤ්ඤා දසහාකාරේහි පටිග්ගාහකේසු විප්පටිසාරං පටිවිනෝදේසි.

පින්වත් බ්‍රාහ්මණය, ඉතින් පුරෝහිත බ්‍රාහ්මණයා මහාවිජිත රජතුමා ගේ යාගයට කලින් ම යාගය පිළිගන්නා පිරිස කෙරෙහි ඇති විය හැකි විපිළිසරයන් මේ දස ආකාර කරුණින් දුරු කළා.

19. අථ ඛෝ බ්‍රාහ්මණ, පුරෝහිතෝ බ්‍රාහ්මණෝ රඤ්ඤෝ මහාවිජිතස්ස මහායඤ්ඤං යජමානස්ස සෝළසහාකාරේහි චිත්තං සන්දස්සේසි සමාදපේසි සමුත්තේජේසි සම්පහංසේසි: සියා ඛෝ පන හෝතෝ රඤ්ඤෝ මහායඤ්ඤං යජමානස්ස කෝචිදේව වත්තා: "රාජා ඛෝ මහාවිජිතෝ මහායඤ්ඤං යජති. නෝ ච ඛෝ තස්ස ආමන්තිතා ඛත්තියා අනුයුත්තා නේගමා චේව ජානපදා ච. අථ ච පන භවං රාජා ඒවරූපං මහායඤ්ඤං යජතී"ති. ඒවම්පි හෝතෝ රඤ්ඤෝ වත්තා ධම්මතෝ නත්ථි. හෝතා ඛෝ පන රඤ්ඤා ආමන්තිතා ඛත්තියා අනුයුත්තා නේගමා චේව ජානපදා ච.

19. ඉතින් පින්වත් බ්‍රාහ්මණය, පුරෝහිත බ්‍රාහ්මණයා මහා යාගය කරන්නා වූ මහාවිජිත රජතුමා ගේ සිතට දහසය ආකාරයකින් කරුණු පෙන්වලා දුන්නා. සමාදන් කෙරෙව්වා. උත්සාහවත් කෙරෙව්වා. එයින් සතුටු කෙරෙව්වා. භවත් රජතුමා හට මහායාගය කරන අතරේදී මෙවැනි දේවල් කියන අය සිටිය හැකියි. "මහාවිජිත රජතුමා නම් මහායාගයක් කරන්නේ. ඒ වුණාට තමා ගේ බස් අදහන නියම්ගම් වැසි ජනපදවැසි රාජකීය පිරිස කැඳවලා නෑ නෙව. නමුත් භවත් රජතුමා ඔය විදිහේ මහා යාගයක් නම් කරනවා" කියලා. භවත් රජතුමාණන් හට ඔය අයුරින් කියන අය සිටියත් ධර්මානුකූලව නම් එහෙම කියන කෙනෙක් නෑ. පින්වත් රජතුමාණන් විසින් තමා ගේ වචනය අනුව කටයුතු කරන නියම්ගම්වැසි රටවැසි රාජකීය පිරිස් කැඳවලා නෙව තියෙන්නේ.

ඉමිනාපේතං භවං රාජා ජානාතු. යජතං භවං, සජ්ජතං භවං, මෝදතං භවං, චිත්තමේව භවං අන්තරං පසාදේතු.

භවත් රජතුමාණන් ඔය කාරණාව ද දැන සිටින සේක්වා. භවත් රජතුමාණන් යාගය කරන සේක්වා. භවත් රජතුමාණන් දන් දෙන සේක්වා. භවත් රජතුමාණන් සතුටු වන සේක්වා. භවත් රජතුමාණන් අභ්‍යන්තර සිත ම පහදවා ගන්නා සේක්වා.

20. සියා ඛෝ පන භෝතෝ රඤ්ඤේ මහායඤ්ඤං යජමානස්ස කෝචිදේව වත්තා රාජා ඛෝ මහාවිජිතෝ මහායඤ්ඤං යජති, නෝ ච ඛෝ තස්ස ආමන්තිකා අමච්චා පාරිසජ්ජා නේගමා චේව ජානපදා ච ..... බ්‍රාහ්මණමහාසාලා නේගමා චේව ජානපදා ච ..... ගහපතිනේචයිකා නේගමා චේව ජානපදා ච. අථ ච පන භවං රාජා ඒවරූපං මහායඤ්ඤං යජතී"ති. ඒවම්පි භෝතෝ රඤ්ඤේ වත්තා ධම්මතෝ නත්ථි. භෝතා ඛෝ පන රඤ්ඤා ආමන්තිතා ගහපතිනේචයිකා නේගමා චේව ජානපදා ච. ඉමිනාපේතං භවං රාජා ජානාතු. යජතං භවං, සජ්ජතං භවං, මෝදතං භවං, චිත්තමේව භවං අන්තරං පසාදේතු.

20. භවත් රජතුමා හට මහායාගය කරන අතරේදී මෙවැනි දේවල් කියන අය සිටිය හැකියි. "මහාවිජිත රජතුමා නම් මහායාගයක් කරන්නේ. ඒ වුණාට තමා ගේ බස් අදහන නියම්ගම් වැසි ජනපදවැසි ඇමැති පිරිස කැඳවලා නෑ නෙව ..... ඒ වුණාට තමා ගේ බස් අදහන නියම්ගම් වැසි ජනපදවැසි සම්භාවනීය බ්‍රාහ්මණ පිරිස කැඳවලා නෑ නෙව ..... ඒ වුණාට තමා ගේ බස් අදහන නියම්ගම් වැසි ජනපදවැසි සම්භාවනීය ගිහි පිරිස කැඳවලා නෑ නෙව. නමුත් භවත් රජතුමා ඔය විදිහේ මහා යාගයක් නම් කරනවා" කියලා. භවත් රජතුමාණන් හට ඔය අයුරින් කියන අය සිටියත් ධර්මානුකූලව නම් එහෙම කියන කෙනෙක් නෑ. පින්වත් රජතුමාණන් විසින් තමා ගේ වචනය අනුව කටයුතු කරන නියම්ගම්වැසි රටවැසි සම්භාවනීය ගිහි පිරිස් කැඳවලා නෙව තියෙන්නේ. භවත් රජතුමාණන් ඔය කාරණාව ද දැන සිටින සේක්වා. භවත් රජතුමාණන් යාගය කරන සේක්වා. භවත් රජතුමාණන් දන් දෙන සේක්වා. භවත් රජතුමාණන් සතුටු වන සේක්වා. භවත් රජතුමාණන් අභ්‍යන්තර සිත ම පහදවා ගන්නා සේක්වා.

21. සියා ඛෝ පන භෝතෝ රඤ්ඤේ මහායඤ්ඤං යජමානස්ස කෝචිදේව වත්තා "රාජා ඛෝ මහාවිජිතෝ මහායඤ්ඤං යජති, නෝ ච ඛෝ

උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. අථ ච පන භවං රාජා ඒවරූපං මහායඤ්ඤං යජතී"ති. ඒවම්පි භෝතෝ රඤ්ඤේ වත්තා ධම්මතෝ නත්ථි. භවං ඛෝ පන රාජා උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. ඉමිනාපේතං භවං රාජා ජානාතු. යජතං භවං, සජ්ජතං භවං, මෝදතං භවං, චිත්තමේව භවං අන්තරං පසාදේතු.

21. භවත් රජතුමා හට මහායාගය කරන අතරේදී මෙවැනි දේවල් කියන අය සිටිය හැකි යි. "මහාවිජිත රජතුමා නම් මහායාගයක් කරන්නේ. ඒ වුණාට ඔහු මව් පාර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක් නොවෙයි නෙව. සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වා ම පිරිසිදු කුල ප්‍රවේණියක් නෑ නෙව. කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස නො ලබා නෑ නෙව. ගැරහුම් නො ලබා නෑ නෙව. නමුත් භවත් රජතුමා ඔය විදිහේ මහා යාගයක් නම් කරනවා" කියලා. භවත් රජතුමාණන් හට ඔය අයුරින් කියන අය සිටියත් ධර්මානුකූලව නම් එහෙම කියන කෙනෙක් නෑ. පින්වත් රජතුමා පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක් නෙව. සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වා ම පිරිසිදු කුල ප්‍රවේණියක් තියෙනවා නෙව. එනිසා ම කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස ලබා නෑ නෙන. ගැරහුම් ලබා නෑ නෙව. භවත් රජතුමාණන් ඔය කාරණාව ද දැන සිටින සේක්වා. භවත් රජතුමාණන් යාගය කරන සේක්වා. භවත් රජතුමාණන් දන් දෙන සේක්වා. භවත් රජතුමාණන් සතුටු වන සේක්වා. භවත් රජතුමාණන් අභ්‍යන්තර සිත ම පහදවා ගන්නා සේක්වා.

22. **සියා ඛෝ පන භෝතෝ රඤ්ඤේ මහායඤ්ඤං යජමානස්ස කෝචිදේව වත්තා "රාජා ඛෝ මහාවිජිතෝ මහායඤ්ඤං යජති, නෝ ච ඛෝ අභිරූපෝ, දස්සනීයෝ පාසාදිකෝ, පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතෝ, බ්‍රහ්මවණ්ණී බ්‍රහ්මවච්චසී අක්ඛුද්දාවකාසෝ දස්සනාය ..... නෝ ච ඛෝ අඩ්ඪෝ මහද්ධනෝ මහාභෝගෝ පහූතජාතරූපරජතෝ පහූතවිත්තූපකරණෝ පහූතධනධඤ්ඤේ පරිපුණ්ණකෝසකොට්ඨාගාරෝ ..... නෝ ච ඛෝ බලවා චතුරංගිනියා සේනාය සමන්නාගතෝ අස්සවාය විවාදපටිකරාය, පතපති මඤ්ඤේ පච්චත්ථිකේ යසසා ..... නෝ ච ඛෝ සද්ධෝ දායකෝ දානපති අනාවටද්වාරෝ, සමණබ්‍රාහ්මණකපණද්ධිකවණිබ්බකයාචකානං විපානභූතෝ, පුඤ්ඤානි**

කරෝති ..... නෝ ච ඛෝ බහුස්සුතෝ තස්ස තස්ස සුතජාතස්ස ..... නෝ ච ඛෝ තස්ස තස්සේව ඛෝ පන භාසිතස්ස අත්ථං ජානාති: 'අයං ඉමස්ස භාසිතස්ස අත්ථෝ අයං ඉමස්ස භාසිතස්ස අත්ථෝ'ති ..... නෝ ච ඛෝ පණ්ඩිතෝ වියත්තෝ මේධාවී පටිබලෝ අතීතානාගතපච්චුප්පන්නේ අත්ථේ චින්තේතුං ..... අථ ච පන භවං රාජා ඒවරූපං මහායඤ්ඤං යජතී"ති. ඒවම්පි භෝතෝ රඤ්ඤේ වත්තා ධම්මතෝ නත්ථි. භවං ඛෝ පන රාජා ..... පණ්ඩිතෝ වියත්තෝ මේධාවී පටිබලෝ අතීතානාගතපච්චුප්පන්නේ අත්ථේ චින්තේතුං. ඉමිනාපේතං භවං රාජා ජානාතු. යජතං භවං, සජ්ජතං භවං, මෝදතං භවං, චිත්තමේව භවං අන්තරං පසාදේතු.

22. භවත් රජතුමා හට මහායාගය කරන අතරේදී මෙවැනි දේවල් කියන අය සිටිය හැකි යි. "මහාවිජිත රජතුමා නම් මහායාගයක් කරන්නේ. ඒ වුණාට ඔහු රූපවත් කෙනෙක් නොවෙයි නෙව. සොඳුරු පෙනුමක් ඇති කෙනෙක් නොවෙයි නෙව. දුටුවන් පහදින කෙනෙක් නොවෙයි නෙව. උතුම් වර්ණ සෞන්දර්යයෙන් යුතු කෙනෙක් නෙවෙයි නෙව. රන්වන් පැහැ ඇති කෙනෙක් නෙවෙයි නෙව. බ්‍රහ්මයා ගේ බඳු ශරීරාලෝකය ඇති කෙනෙක් නෙවෙයි නෙව. දැකීමට පවා ඉඩකඩ අපහසුවෙන් ලැබිය යුතු කෙනෙක් නෙවෙයි නෙව ..... ඒ වුණාට ඔහු සැපසම්පතින් ආඪ්‍ය කෙනෙක් නෙවෙයි නෙව. මහා ධනවතෙක් නෙවෙයි නෙව. මහාභෝග ඇති කෙනෙක් නෙවෙයි නෙව. බොහෝ මිළමුදල් ඇති කෙනෙක් නෙවෙයි නෙව. බොහෝ පාරිභෝගික උපකරණ ඇති කෙනෙක් නෙවෙයි නෙව. බොහෝ ධනධාන්‍ය ඇති කෙනෙක් නෙවෙයි නෙව. අටුකොටු පිරීගිය සම්පත් ඇති කෙනෙක් නෙවෙයි නෙව ..... ඒ වුණාට ඔහු බලවන්ත නෑ නෙව. රජ අණට සවන් දෙන රජු ගේ අවවාදයට අනුව කටයුතු කරන ඇත්, අස්, රිය, පාබල යන චතුරංගිනී සේනාවෙන් සමන්විත නෑ නෙව. රජු ගේ යසස් තේජසින් විරුද්ධ පාක්ෂිකයන් තැවී යන සුළු නෑ නෙව ..... ඒ වුණාට ඔහු ශ්‍රද්ධාවන්ත නෑ නෙව, පරිත්‍යාගශීලී නෑ නෙව, දානපති කෙනෙක් නෙවෙයි නෙව. ශ්‍රමණ-බ්‍රාහ්මණවරුන් හට ද දුගී මගී යාචකාදීනට ද විවෘත වූ දොරටුවලින් යුක්ත නෑ නෙව. හැමට පානය කළ හැකි පැන් ඇති පොකුණක් මෙන් සිටිමින් දන්පින් කරන්නේ නෑ නෙව ..... ඒ වුණාට ඔහු තමා ඉගෙන ගන්නා ඒ ඒ කරුණු පිළිබඳ ව බහුශ්‍රුත නෑ නෙව, මේ පවසන දේ තුළ තිබෙන්නේ මේ අර්ථයි. මේ කියමන තුළ තිබෙන්නේ මේ අර්ථය යි කියල ඒ ඒ පැවසූ කරුණු පිළිබඳ ව අර්ථ දන්නේ නෑ නෙව ..... ඒ වුණාට ඔහු ඤාණවන්ත නෑ නෙව. ව්‍යක්ත නෑ නෙව. බුද්ධිමත් නෑ නෙව. අතීත අනාගත වර්තමාන

කරුණු පිළිබඳව අරුත් සිතන්නට දක්ෂ නෑ නෙව කියල. භවත් රජතුමාණන් හට ඔය අයුරින් කියන අය සිටියත් ධර්මානුකූලව නම් එහෙම කියන කෙනෙක් නෑ. පින්වත් රජතුමාණන් ඤණවන්ත යි. ව්‍යක්ත යි. ඉතා බුද්ධිමත්. අතීත අනාගත වර්තමාන කරුණු පිළිබඳව අරුත් සිතන්නට දක්ෂ යි. භවත් රජතුමාණන් ඔය කාරණාව ද දැන සිටින සේක්වා. භවත් රජතුමාණන් යාගය කරන සේක්වා. භවත් රජතුමාණන් දන් දෙන සේක්වා. භවත් රජතුමාණන් සතුටු වන සේක්වා. භවත් රජතුමාණන් අභ්‍යන්තර සිත ම පහදවා ගන්නා සේක්වා.

23. සියා ඛෝ පන භෝතෝ රඤ්ඤෝ මහායඤ්ඤං යජමානස්ස කෝචිදේව වත්තා: "රාජා ඛෝ මහාවිජිතෝ මහායඤ්ඤං යජති. නෝ ච ඛ්වාස්ස පුරෝහිතෝ බ්‍රාහ්මණෝ උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. අථ ච පන භවං රාජා ඒවරූපං මහායඤ්ඤං යජතී"ති. ඒවම්පි භෝතෝ රඤ්ඤෝ වත්තා ධම්මතෝ නත්ථි. භෝතෝ ඛෝ පන රඤ්ඤෝ පුරෝහිතෝ බ්‍රාහ්මණෝ උභතෝ සුජාතෝ මාතිතෝ ච පිතිතෝ ච, සංසුද්ධගහණිකෝ යාව සත්තමා පිතාමහයුගා, අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදේන. ඉමිනාපේතං භවං රාජා ජානාතු. යජතං භවං, සජ්ජතං භවං, මෝදතං භවං, චිත්තමේව භවං අන්තරං පසාදේතු.

23. භවත් රජතුමා හට මහායාගය කරන අතරේදී මෙවැනි දේවල් කියන අය සිටිය හැකියි. "මහාවිජිත රජතුමා නම් මහායාගයක් කරන්නේ. ඒ වුණාට පුරෝහිත බ්‍රාහ්මණයා මව් පාර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක් නොවෙයි නෙව. සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වා ම පිරිසිදු කුල ප්‍රවේණියක් නෑ නෙව. කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස නො ලබා නෑ නෙව. ගැරහුම් නො ලබා නෑ නෙව. නමුත් භවත් රජතුමා ඔය විදිහේ මහා යාගයක් නම් කරනවා" කියලා. භවත් රජතුමාණන් හට ඔය අයුරින් කියන අය සිටියත් ධර්මානුකූලව නම් එහෙම කියන කෙනෙක් නෑ. පින්වත් රජතුමාණෙනි, පුරෝහිත බ්‍රාහ්මණයා මව් පර්ශවයෙනුත් පිය පාර්ශවයෙනුත් යන දෙපාර්ශවයෙන් ම පිරිසිදු වූ සුජාත උපතක් ලද කෙනෙක් නෙව. සත් වෙනි මීමුතු පරම්පරාවල් දක්වා ම පිරිසිදු කුල ප්‍රවේණියක් තියෙනවා නෙව. එනිසා ම කුලපාරිශුද්ධිය මුල් කොට කිසිවෙකුගෙන් උපහාස ලබා නෑ නෙව. ගැරහුම් ලබා නෑ නෙව. භවත් රජතුමාණන් ඔය කාරණාව ද දැන සිටින සේක්වා. භවත් රජතුමාණන් යාගය කරන සේක්වා. භවත් රජතුමාණන් දන් දෙන

සේක්වා. භවත් රජතුමාණන් සතුටු වන සේක්වා. භවත් රජතුමාණන් අභ්‍යන්තර සිත ම පහදවා ගන්නා සේක්වා.

24. සියා ඛෝ පන භෝතෝ රඤ්ඤේ මහායඤ්ඤං යජමානස්ස කෝචිදේව වත්තා: "රාජා ඛෝ මහාවිජිතෝ මහායඤ්ඤං යජති. නෝ ච ඛ්වස්ස පුරෝහිතෝ බ්‍රාහ්මණෝ අජ්ඣායකෝ මන්තධරෝ, තිණ්ණං වේදානං පාරගූ සනිඝණ්ඩුකේටුභානං සාක්ඛරප්පභේදානං ඉතිහාසපඤ්චමානං, පදකෝ, වෙය්‍යාකරණෝ, ලෝකායත මහාපුරිසලක්ඛණේසු අනවයෝ ..... නෝ ච ඛ්වස්ස පුරෝහිතෝ බ්‍රාහ්මණෝ සීලවා වුද්ධසීලී වුද්ධසීලේන සමන්නාගතෝ ..... නෝ ච ඛ්වස්ස පුරෝහිතෝ බ්‍රාහ්මණෝ පණ්ඩිතෝ වියත්තෝ මේධාවී පඨමෝ වා දුතියෝ වා සුජං පග්ගණ්හන්තානං. අථ ච පන භවං රාජා ඒවරූපං මහායඤ්ඤං යජති"ති. ඒවම්පි භෝතෝ රඤ්ඤේ වත්තා ධම්මතෝ නත්ථි. භෝතෝ ඛෝ පන රඤ්ඤේ පුරෝහිතෝ බ්‍රාහ්මණෝ පණ්ඩිතෝ වියත්තෝ මේධාවී පඨමෝ වා දුතියෝ වා සුජං පග්ගණ්හන්තානං. ඉමිනාපේතං භවං රාජා ජානාතු. යජතං භවං, සජ්ජතං භවං, මෝදතං භවං, චිත්තමේව භවං අන්තරං පසාදේතු"ති.

24. භවත් රජතුමා හට මහායාගය කරන අතරේදී මෙවැනි දේවල් කියන අය සිටිය හැකියි. "මහාවිජිත රජතුමා නම් මහායාගයක් කරන්නේ. ඒ වුණාට පුරෝහිත බ්‍රාහ්මණයා වේද හදාරණ කෙනෙක් නෙවෙයි නෙව. මන්ත්‍රධාරී කෙනෙක් නෙවෙයි නෙව. ඉතිහාසය පස්වෙනි කොට ඇති වේදසමයාගත භාෂා ශාස්ත්‍රයන්හි නිපුණත්වයක් ඇති අක්ෂර ප්‍රභේද ගැන හසල බුද්ධිය ඇති ත්‍රිවේද පාරප්‍රප්ත කෙනෙක් නෙවෙයි නෙව. වේදසමයාගත පද පාඨ දන්නා කෙනෙක් නෙවෙයි නෙව. ව්‍යාකරණ දන්නා කෙනෙක් නෙවෙයි නෙව. ලෝකායත ශාස්ත්‍රයෙහි, මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයෙහි නිපුණ කෙනෙක් නෙවෙයි නෙව ..... ඒ වුණාට පුරෝහිත බ්‍රාහ්මණයා සිල්වත් නෑ නෙව. වැඩුණු සිල් ඇති කෙනෙක් නෙවෙයි නෙව. වැඩුණු සීලයෙන් සමන්විත කෙනෙක් නෙවෙයි නෙව ..... ඒ වුණාට පුරෝහිත බ්‍රාහ්මණයා නුවණැති කෙනෙක් නෙවෙයි නෙව, ප්‍රඥාවන්ත කෙනෙක් නෙවෙයි නෙව. යාග කිරීම පිණිස යාග හැන්ද එසවීමේ දී පළමු කොට හෝ දෙවනුව හෝ කරන කෙනෙක් නෙවෙයි නෙව" කියල. භවත් රජතුමාණන් හට ඔය අයුරින් කියන අය සිටියත් ධර්මානුකූලව නම් එහෙම කියන කෙනෙක් නෑ. පින්වත් රජතුමාණෙනි, පුරෝහිත බ්‍රාහ්මණයා නුවණැති කෙනෙක් නෙව, ප්‍රඥාවන්ත කෙනෙක් නෙව. යාග කිරීම පිණිස යාග හැන්ද එසවීමේ දී පළමු කොට හෝ දෙවනුව හෝ කරන කෙනෙක් නෙව. භවත් රජතුමාණන් ඔය කාරණාව ද

දැන සිටින සේක්වා. භවත් රජතුමාණන් යාගය කරන සේක්වා. භවත් රජතුමාණන් දන් දෙන සේක්වා. භවත් රජතුමාණන් සතුටු වන සේක්වා. භවත් රජතුමාණන් අභ්‍යන්තර සිත ම පහදවා ගන්නා සේක්වා.

ඉමේහි ඛෝ බ්‍රාහ්මණ, පුරෝහිතෝ බ්‍රාහ්මණෝ රඤ්ඤේ මහාවිජිතස්ස මහායඤ්ඤං යජමානස්ස සෝළසහි ආකාරේහි චිත්තං සන්දස්සේසි, සමාදපේසි, සමුත්තේජේසි, සම්පහංසේසි.

පින්වත් බ්‍රාහ්මණය, පුරෝහිත බ්‍රාහ්මණයා මහාවිජිත රජ්ජුරුවන්ට යාගය කරමින් සිටිය දී මේ කරුණු දහසය තුළින් සිත දැනුවත් කළා. එහි සමාදන් කෙරෙව්වා. උත්සහාවත් කෙරෙව්වා. සතුටු කෙරෙව්වා.

25. තස්මිං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤේ නේව ගාවෝ හඤ්ඤිංසු, න අජේළකා හඤ්ඤිංසු, න කුක්කුටසූකරා හඤ්ඤිංසු, න විවිධා පාණා සංඝාතං ආපජ්ජිංසු, න රුක්ඛා ඡිජ්ජිංසු යූපත්ථාය, න දබ්බා වියිංසු බරිහිසත්ථාය. යේ'පි'ස්ස අහේසුං දාසා'ති වා පෙස්සා'ති වා කම්මකරා'ති වා, තේ'පි න දණ්ඩතජ්ජිතා න භයතජ්ජිතා න අස්සුමුඛා රුදමානා පරිකම්මානි අකංසු. අථ ඛෝ යේ ඉච්ඡිංසු තේ අකංසු. යේ න ඉච්ඡිංසු න තේ අකංසු. යං ඉච්ඡිංසු තං අකංසු. යං න ඉච්ඡිංසු න තං අකංසු. සප්පිතේලනවනීතදධිමධුඵාණිතේන චේව සෝ යඤ්ඤෝ නිට්ඨානමගමාසි.

25. පින්වත් බ්‍රාහ්මණය, ඒ යාගයේ දී ගවයන් මැරුවේ නෑ. එළු බැටළුවන් මැරුවේ නෑ. කුකුළන් ඌරන් මැරුවේ නෑ. තවත් විවිධාකාර වූ සතුන් මැරුවේ නෑ. යාග කණු සැකසීම පිණිස ගස් කැපුවේ නෑ. යාග බිම සකස් කිරීම පිණිස තණකොළ කැපුවෙත් නෑ. ඔහු ගේ යම් දාසයන් ඉන්නවා නම්, මෙහෙකරුවන් ඉන්නවා නම්, කම්කරුවන් ඉන්නවා නම් ඔවුන්ව පවා වේවැල් කස ආදී පහරවල්වලින් භය කෙරෙව්වේ නෑ. තැති ගැන්වූයේ නෑ. කඳුළු වැගුරුණු මුහුණින් හඬව හඬවා වැඩ ගත්තේ නෑ. එසේ නමුත් යමෙක් යම් දෙයක් කිරීමට කැමැති නම් ඔවුන් ඒ දේ කළා. යමක් කිරීමට අකැමැති නම් ඔවුන් එය කළේ නෑ. යමක් කැමැති නම් එය කළා. යමක් අකැමැති නම් ඔය කළේ නෑ. ගිතෙල්, තල, තෙල්, වෙඩරු, දී කිරි, මී පැණි, සකුරු ආදී දෙයින් යුතු කැඳබත්වලින් ඒ යාගය අවසන් වුණා.

26. අථ ඛෝ බ්‍රාහ්මණ ඛත්තියා අනුයුත්තා නේගමා චේව ජානපදා ච අමච්චා පාරිසජ්ජා නේගමා චේව ජානපදා ච, බ්‍රාහ්මණමහාසාලා නේගමා

වේව ජානපදා ච, ගහපතිනේචයිකා නේගමා වේව ජානපදා ච පහූතං සාපතෙය්‍යං ආදාය රාජානං මහාවිජිතං උපසංකමිත්වා ඒවමාහංසු: "ඉදං දේව පහූතං සාපතෙය්‍යං දේවඤ්ඤේව උද්දිස්ස ආහතං. තං දේවෝ පතිගණ්හාතූ"ති.

26. ඉතින් පින්වත් බ්‍රාහ්මණය, රජතුමා ගේ අවවාද පරිදි කටයුතු කරන ඒ නියම්ගම්වැසි රටවැසි රාජකීය පිරිසත්, නියම්ගම්වැසි රටවැසි ඇමැති පිරිසත්, නියම්ගම්වැසි රටවැසි සම්භාවනීය බ්‍රාහ්මණ පිරිසත්, නියම්ගම්වැසි රටවැසි සම්භාවනීය ගිහි පිරිසත් බොහෝ ධනධාන්‍යාදී තෑගි හෝග ගෙන මහාවිජිත රජු ළඟට ගිහින් මෙහෙම කියා සිටියා. "දේවයන් වහන්ස, මේ බොහෝ ධනය දේවයන් වහන්සේ උදෙසා ම යි අරගෙන ආවේ. එය දේවයන් වහන්සේ පිළිගන්නා සේක්වා."

"අලං හෝ. මමපි ඉදං පහූතං සාපතෙය්‍යං ධම්මිකේන බලිනා අභිසංඛතං. තඤ්ච වෝ හෝතු ඉතෝ ච භියෝ හරථා"ති.

"භවත්නි, කම් නැත. මගේත් මේ බොහෝ ධනධාන්‍යාදී සම්පත් තිබෙන්නේ ධාර්මික ලෙස ගත් බදු ආදියෙන් රැස්කරගෙන යි. එනිසා එයත් ඔබට ම වේවා. මාගේ ධනයෙනුත් තව අරගෙන යන්න."

27. තේ රඤ්ඤෝ පටික්ඛිත්තා ඒකමන්තං අපක්කම්ම ඒවං සම්මන්තේසුං: "න ඛෝ ඒතං අම්හාකං පතිරූපං යං මයං ඉමානි සාපතෙය්‍යානි පුනදේව සකානි ඝරානි පටිහරෙය්‍යාම. රාජා ඛෝ මහාවිජිතෝ මහායඤ්ඤං යජති. හන්දස්ස මයං අනුයාගිනෝ හෝමා"ති.

27. රජතුමා විසින් නො පිළිගත් ඒ ධනය ඇති ඔවුන් එකත්පස්ව බැහැරකට ගොස් මේ විදිහට සාකච්ඡා කළා. "අපි මේ ගෙනාපු තෑගි හෝග ධනය ආයෙමත් තම තමන් ගේ නිවෙස්වලට අරගෙන යන එක අපට ගැලපෙන දෙයක් නොවේ. මහාවිජිත රජ්ජුරුවෝ මහායාගයක් කරනවා. ඒනිසා අපි ඒ යාගයට ම අනුයාග කරන අය බවට පත් වෙමු."

අථ ඛෝ බ්‍රාහ්මණ පුරත්ථිමේන යඤ්ඤවාටස්ස ඛත්තියා අනුයුත්තා නේගමා වේව ජානපදා ච දානානි පට්ඨපේසුං. දක්ඛිණේන යඤ්ඤවාටස්ස අමච්චා පාරිසජ්ජා නේගමා වේව ජානපදා ච දානානි පට්ඨපේසුං. පච්ඡිමේන යඤ්ඤවාටස්ස බ්‍රාහ්මණමහාසාලා නේගමා වේව ජානපදා ච දානානි

පට්ඨපේසුං. උත්තරේන යඤ්ඤවාටස්ස ගහපතිනේචයිකා නේගමා චේව ජානපදා ච දානානි පට්ඨපේසුං. තේසුපි ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤේසු නේව ගාවෝ හඤ්ඤිංසු, න අජේළකා හඤ්ඤිංසු, න කුක්කුටසූකරා හඤ්ඤිංසු, න විවිධා පාණා සංඝාතං ආපජ්ජිංසු, න රුක්ඛා ඡිජ්ජිංසු යූපත්ථාය, න දබ්බා වියිංසු බරිහිසත්ථාය. යේ'පි නේසං අහේසුං දාසා'ති වා පෙස්සා'ති වා කම්මකරා'ති වා, තේ'පි න දණ්ඩතජ්ජිතා න භයතජ්ජිතා න අස්සුමුඛා රුදමානා පරිකම්මානි අකංසු. අථ ඛෝ යේ ඉච්ඡිංසු තේ අකංසු. යේ න ඉච්ඡිංසු න තේ අකංසු. යං ඉච්ඡිංසු තං අකංසු. යං න ඉච්ඡිංසු න තං අකංසු. සප්පිතේලනවනීතදධිමධුඵාණිතේන චේව තේ යඤ්ඤා නිට්ඨානමගමංසු.

එතකොට පින්වත් බ්‍රාහ්මණය, යාග ශාලාවේ නැගෙනහිර දිශාවේ දන්හල් පිහිටෙව්වේ රජුට අනුයුක්ත වූ ඒ නියම්ගම්වැසි, ජනපද වැසි රාජකීය පිරිස යි. යාග ශාලාවේ දකුණු දිශාවේ දන්හල් පිහිටෙව්වේ රජුට අනුයුක්ත වූ ඒ නියම්ගම්වැසි, ජනපද වැසි ඇමැති පිරිස යි. යාග ශාලාවේ බටහිර දිශාවේ දන්හල් පිහිටෙව්වේ රජුට අනුයුක්ත වූ ඒ නියම්ගම්වැසි, ජනපද වැසි සම්භාවනීය බ්‍රාහ්මණ පිරිස යි. යාග ශාලාවේ උතුරු දිශාවේ දන්හල් පිහිටෙව්වේ රජුට අනුයුක්ත වූ ඒ නියම්ගම්වැසි, ජනපද වැසි සම්භාවනීය ගිහි පිරිස යි. පින්වත් බ්‍රාහ්මණය, ඒ යාගයේ දීත් යාගයේ දී ගවයන් මැරුවේ නෑ. එළු බැටළුවන් මැරුවේ නෑ. කුකුළන් ඌරන් මැරුවේ නෑ. තවත් විවිධාකාර වූ සතුන් මැරුවේ නෑ. යාග කණු සැකසීම පිණිස ගස් කැපුවේ නෑ. යාග බිම සකස් කිරීම පිණිස තණකොළ කැපුවෙත් නෑ. ඔහු ගේ යම් දාසයන් ඉන්නවා නම්, මෙහෙකරුවන් ඉන්නවා නම්, කම්කරුවන් ඉන්නවා නම් ඔවුන්ව පවා වේවැල් කස ආදී පහරවල්වලින් භය කෙරෙව්වේ නෑ. තැති ගැන්වූයේ නෑ. කඳුළු වැගුරුණු මුහුණින් හඬව හඬවා වැඩ ගත්තේ නෑ. එසේ නමුත් යමෙක් යම් දෙයක් කිරීමට කැමැති නම් ඔවුන් ඒ දේ කළා. යමක් කිරීමට අකැමැති නම් ඔවුන් එය කළේ නෑ. යමක් කැමැති නම් එය කළා. යමක් අකැමැති නම් ඔය කළේ නෑ. ගිතෙල්, තල, තෙල්, වෙඩරු, දී කිරි, මී පැණි, සකුරු ආදී දෙයින් යුතු කැඳබත්වලින් ඒ යාග අවසන් වුණා.

28. ඉති චත්තාරෝ ච අනුමතිපක්ඛා, රාජා මහාවිජිතෝ අට්ඨහංගේහි සමන්නාගතෝ, පුරෝහිතෝ බ්‍රාහ්මණෝ චතුහංගේහි සමන්නාගතෝ, නිස්සෝ ච විධා. අයං වුච්චති බ්‍රාහ්මණ තිවිධා යඤ්ඤසම්පදා සෝළසපරික්ඛාරා'ති.

28. මේ විදිහට යාගයට අවසර ගත් පක්ෂ හතර යි. මහාවිජිත රජ්ජුරුවෝ අංග අටකින් සමන්විත යි. පුරෝහිත බ්‍රාහ්මණයා අංග හතරකින් සමන්විත යි. ත්‍රිවිධ කාලසම්පත්තියකින් යුක්ත යි. පින්වත් බ්‍රාහ්මණය, මෙයට තමයි කියන්නේ ත්‍රිවිධ යාග සම්පත් හා යාගයට අවශ්‍ය පිරිකර දහසය කියල.

29. **ඒවං වුත්තේ තේ බ්‍රාහ්මණා උන්නාදිනෝ උච්චාසද්දමහාසද්දා අහේසුං: "අහෝ යඤ්ඤේ අහෝ යඤ්ඤසම්පදා"ති. කූටදන්තෝ පන බ්‍රාහ්මණෝ තුණ්හීභූතෝව නිසින්නෝ හෝති. අථ ඛෝ තේ බ්‍රාහ්මණා කූටදන්තං බ්‍රාහ්මණං ඒතදවෝචුං: කස්මා පන භවං කූටදන්තෝ සමණස්ස ගෝතමස්ස සුභාසිතං සුභාසිතතෝ නාබ්භනුමෝදතී?ති.**

29. එසේ වදාළ විට ඒ බ්‍රාහ්මණවරු මහා හඬනැගෙන පරිදි උස්හඬින් මහාහඬින් කෑ ගසා කිව්වා "අහෝ! යාගයක් නම් මේක ම යි. අහෝ! යාගසම්පත්තිය නම් මේකම යි" කියල. නමුත් කූටදන්ත බ්‍රාහ්මණයා නිශ්ශබ්දව වාඩි වෙලා හිටියා. එතකොට ඒ බ්‍රාහ්මණවරු කූටදන්ත බ්‍රාහ්මණයාට මෙහෙම කිව්වා. "භවත් කූටදන්තයෙනි, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ මේ සුභාෂිත ධර්මය සුභාෂිතයක් ලෙස ම අනුමෝදන් නොවන්නේ මක් නිසාද?"

"නාහං භෝ සමණස්ස ගෝතමස්ස සුභාසිතං සුභාසිතතෝ නාබ්භනුමෝදාමි. මුද්ධාපි තස්ස විපතෙය්‍ය යෝ සමණස්ස ගෝතමස්ස සුභාසිතං සුභාසිතතෝ නාබ්භනුමෝදෙය්‍ය. අපි ච මේ භෝ ඒවං හෝති: න සමණෝ ගෝතමෝ ඒවමාහ: "ඒවං මේ සුතන්ති වා ඒවං අරහාති භවිතුන්ති"වා. අපි ච සමණෝ ගෝතමෝ: 'ඒවං තදා ආසි ඉත්ථං තදා ආසි'ත්වේව භාසති. තස්ස මය්හං භෝ ඒවං හෝති: "අද්ධා සමණෝ ගෝතමෝ තේන සමයේන රාජා වා අහෝසි මහාවිජිතෝ යඤ්ඤසාමි, පුරෝහිතෝ වා බ්‍රාහ්මණෝ තස්ස යඤ්ඤස්ස යාජේතා'ති. අභිජානාති පන භවං ගෝතමෝ ඒවරූපං යඤ්ඤං යජිත්වා වා යාජෙත්වා වා කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපජ්ජිතා?"ති.

"භවත්නි, මං ශ්‍රමණ ගෞතමයන් ගේ මේ සුභාෂිත ධර්මය සුභාෂිතයක් ලෙස ම අනුමෝදන් නොවෙනවා නොවේ. යම් කෙනෙක් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ සුභාෂිත ධර්ම සුභාෂිතයක් වශයෙන් අනුමෝදන් වෙන්නේ නැති නම් ඔහු ගේ හිසත් කඩා හැලේවි. නමුත් භවත්නි, මට මේ විදිහටයි හිතුනේ. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මෙහෙම වදාරන්නේ නෑ නෙව. ඒ කියන්නේ

"මං අහල තියෙන්නේ මේ විදිහට යි. මේ විදිහටයි වෙන්න පුළුවන් වෙන්නේ" කියලා. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ "එතකොට මෙහෙම වුණා. ඉතින් එතකොට මේ විදිහටත් වුණා" කියල යි වදාරන්නේ. ඒ මට හවත්නි, ඒ ගැන මෙහෙම හිතෙනවා. ඒකාන්තයෙන් ම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඒකාලෙ යාග ස්වාමී වූ මහාවිජිත රජ්ජුරුවෝ ම වෙන්ට ඕන. එක්කෝ ඒ යාගය කරවපු පුරෝහිත බ්‍රාහ්මණයා වෙන්ට ඕන. හවත් ගෞතමයන් වහන්සේ, ඔය ආකාරයෙන් යාගයක් කරල, එහෙමත් නැත්නම් කරවල කය බිඳී මරණින් මතු සුගති සංඛ්‍යාත දෙව්ලොව ඉපදුනු බවත් දන්නා සේක්ද?"

"අභිජානාමහං බ්‍රාහ්මණ ඒවරූපං යඤ්ඤං යජිත්වා වා යාජෙත්වා වා කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපජ්ජිතා. අහං තේන සමයේන පුරෝහිතෝ බ්‍රාහ්මණෝ අහෝසිං තස්ස යඤ්ඤස්ස යාජේතා"ති.

"පින්වත් බ්‍රාහ්මණය, මං ඔය ආකාරයේ යාගයක් කරල, කරවල කය බිඳී මරණින් මතු සුගති සංඛ්‍යාත දෙව් ලොව උපන් බව දන්නවා. ඒ කාලයේ ඒ යාගය කරවපු පුරෝහිත බ්‍රාහ්මණයා වෙලා හිටියේ මම යි."

30. "අත්ථි පන භෝ ගෝතම අඤ්ඤේ යඤ්ඤේ ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා?"ති.

30. "හවත් ගෞතමයන් වහන්ස, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති අන්‍ය වූ යාගයක් තියෙනවා ද?"

"අත්ථි ඛෝ බ්‍රාහ්මණ අඤ්ඤේ යඤ්ඤේ ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා"ති.

"පින්වත් බ්‍රාහ්මණය, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති අන්‍ය වූ යාගයක් තියෙනවා"

31. "කතමෝ පන සෝ භෝ ගෝතම අඤ්ඤේ යඤ්ඤේ ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා?"ති.

31. "භවත් ගෞතමයන් වහන්ස, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති ඒ අන්‍ය වූ යාගයක් කුමක් ද?"

"යානි ඛෝ පන තානි බ්‍රාහ්මණ නිච්චදානානි අනුකූලයඤ්ඤානි සීලවන්තේ පබ්බජිතේ උද්දිස්ස දීයන්ති, අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤෝ ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා"ති.

"පින්වත් බ්‍රාහ්මණය, සිල්වත් පැවිදි උතුමන් උදෙසා කුල පරම්පරාවෙන් දෙන යම් නිති දන් වැටවල් තියෙනවා. පින්වත් බ්‍රාහ්මණය, අන්න ඒ දානය කලින් කියපු මේ ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගයක් ම යි."

32. කෝ නු ඛෝ හෝ ගෝතම හේතු කෝ පච්චයෝ යේන තං නිච්චදානං අනුකූලයඤ්ඤං ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය අප්පට්ටතරඤ්ච අප්පසමාරම්භතරඤ්ච මහප්ඵලතරඤ්ච මහානිසංසතරඤ්චා?"ති.

32. "භවත් ගෞතමයන් වහන්ස, මේ ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය බවට ඒ කුලපරම්පරාවෙන් එන නිත්‍ය දානය පත්වෙන්නේ කවර හේතුවක් නිසා ද? කවර ප්‍රත්‍යයක් නිසා ද?"

න ඛෝ බ්‍රාහ්මණ ඒවරූපං යඤ්ඤං උපසංකමන්ති අරහන්තෝ වා අරහන්තමග්ගං වා සමාපන්නා. තං කිස්ස හේතු? දිස්සන්ති හෙත්ථ බ්‍රාහ්මණ දණ්ඩප්පහාරා'පි ගලග්ගාහා'පි. තස්මා ඒවරූපං යඤ්ඤං න උපසංකමන්ති අරහන්තෝ වා අරහන්තමග්ගං මා සමාපන්නා. යානි ඛෝ පන තානි බ්‍රාහ්මණ නිච්චදානානි අනුකූලයඤ්ඤානි සීලවන්තේ පබ්බජිතේ උද්දිස්ස දීයන්ති, ඒවරූපං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤං උපසංකමන්ති අරහන්තෝ වා අරහන්තමග්ගං වා සමාපන්නා. තං කිස්ස හේතු? න හෙත්ථ බ්‍රාහ්මණ දිස්සන්ති දණ්ඩප්පහාරා'පි ගලග්ගාහා'පි. තස්මා ඒවරූපං යඤ්ඤං උපසංකමන්ති අරහන්තෝ වා අරහන්තමග්ගං වා සමාපන්නා. අයං ඛෝ බ්‍රාහ්මණ හේතු අයං පච්චයෝ යේන තං නිච්චදානං අනුකූලයඤ්ඤං ඉමාය

තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය අප්පට්ටතරඤ්ච අප්පසමාරම්භතරඤ්ච මහප්ඵලතරඤ්ච මහානිසංසතරඤ්චා”ති.

පින්වත් බ්‍රාහ්මණය, මෙන්න මේ විදිහේ යාගයන්ට නම් රහතන් වහන්සේලා හෝ රහත්මගට පිළිපන් උතුමන් හෝ වඩින්නේ නෑ. ඒකට හේතුව මොකක් ද? පින්වත් බ්‍රාහ්මණය, එබඳු මහායාගවල දී දන් දෙන උදවියට පෝලිමේ වරෙල්ලා කියමින් දඬුවලින් පහර දෙනවා. ගෙල අල්ලා ඇද දමනවා. අන්න ඒ නිසයි මේ විදිහේ යාගයන්ට නම් රහතන් වහන්සේලා හෝ රහත්මගට පිළිපන් උතුමන් හෝ වඩින්නේ නැත්තේ. පින්වත් බ්‍රාහ්මණය සිල්වත් පැවිදි උතුමන් උදෙසා කුලපරම්පරාවෙන් නිති දන්වැට පවත්වන තැන් ඇද්ද, අන්න එබඳු තැන්වලට නම් පින්වත් බ්‍රාහ්මණය රහතන් වහන්සේලා හෝ රහත් මගට පිළිපන් උතුමන් හෝ වඩිනවා. ඒකට හේතුව මොකක් ද? පින්වත් බ්‍රාහ්මණය, එබඳු මහායාගවල දී දන් දෙන උදවියට පෝලිමේ වරෙල්ලා කියමින් දඬුවලින් පහර දෙන්නේ නෑ. ගෙල අල්ලා ඇද දමන්නේ නෑ. අන්න ඒ නිසයි මේ විදිහේ යාගයන්ට නම් රහතන් වහන්සේලා හෝ රහත්මගට පිළිපන් උතුමන් හෝ වඩින්නේ. පින්වත් බ්‍රාහ්මණය, මේ ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය බවට ඒ කුලපරම්පරාවෙන් එන නිත්‍ය දානය පත්වෙන්නේ මේ හේතුව නිසයි. මේ ප්‍රත්‍ය නිසයි.

33. “අත්ථි පන හෝ ගෝතම අඤ්ඤේ යඤ්ඤේ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලයඤ්ඤේන අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා?”ති.

33. “භවත් ගෞතමයන් වහන්ස, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති අන්‍ය වූ යාගයක් තියෙනවා ද?”

“අත්ථි ඛෝ බ්‍රාහ්මණ අඤ්ඤේ යඤ්ඤේ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලය-ඤ්ඤේන අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා”ති.

"පින්වත් බ්‍රාහ්මණය, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති අන්‍ය වූ යාගයක් තියෙනවා."

"කතමෝ පන සෝ භෝ ගෝතම යඤ්ඤෝ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලයඤ්ඤේන අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා?"ති.

"භවත් ගෞතමයන් වහන්ස, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති ඒ අන්‍ය වූ යාගය කුමක් ද?"

"යෝ ඛෝ බ්‍රාහ්මණ චතුද්දිසං සංඝං උද්දිස්ස විහාරං කරෝති, අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤෝ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලයඤ්ඤේන අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා"ති.

"පින්වත් බ්‍රාහ්මණය, යම් කෙනෙක් සිව් දිශාවෙන් වඩින සංඝයා උදෙසා විහාරයක් කරනවා නම්, පින්වත් බ්‍රාහ්මණය මෙය ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති ඒ යාගය යි."

34. "අත්ථි පන භෝ ගෝතම අඤ්ඤෝ යඤ්ඤෝ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලයඤ්ඤේන ඉමිනා ච විහාරදානේන අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා?"ති.

34. "භවත් ගෞතමයන් වහන්ස, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා, මේ විහාර පූජාවටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති අන්‍ය වූ යාගයක් තියෙනවා ද?"

"අත්ථි ඛෝ බ්‍රාහ්මණ අඤ්ඤේ යඤ්ඤේ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලය-ඤ්ඤේන ඉමිනා ච විහාරදානේන අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා"ති.

"පින්වත් බ්‍රාහ්මණය, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා, මේ විහාර පූජාවටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති අන්‍ය වූ යාගයක් තියෙනවා."

"කතමෝ පන සෝ භෝ ගෝතම අඤ්ඤේ යඤ්ඤේ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලය-ඤ්ඤේන ඉමිනා ච විහාරදානේන අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා?"ති.

"භවත් ගෞතමයන් වහන්ස, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා, මේ විහාර පූජාවටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති ඒ අන්‍ය වූ යාගය කුමක් ද?"

"යෝ ඛෝ බ්‍රාහ්මණ පසන්නචිත්තෝ බුද්ධං සරණං ගච්ඡති, ධම්මං සරණං ගච්ඡති, සංඝං සරණං ගච්ඡති, අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤේ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලයඤ්ඤේන ඉමිනා ච විහාරදානේන අප්පට්ටතරෝ ච අප්පසමාරම්-භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා"ති.

"පින්වත් බ්‍රාහ්මණය, යම් කෙනෙක් පැහැදුනු සිතින් යුතුව බුදු රජාණන් වහන්සේව සරණ යනවා නම්, ශ්‍රී සද්ධර්මය සරණ යනවා නම්, ආර්ය සංඝ රත්නය සරණ යනවා නම් පින්වත් බ්‍රාහ්මණය, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා, මේ විහාර පූජාවටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති ඒ යාගය නම් මෙය යි."

35. "අත්ථි පන භෝ ගෝතම අඤ්ඤේ යඤ්ඤේ ඉමාය තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලය-

ඤ්ඤේන ඉමිනා ච විහාරදානේන ඉමේහි ච සරණගමනේහි අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා?"ති.

35. "භවත් ගෞතමයන් වහන්ස, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා, මේ විහාර පූජාවටත් වඩා, මේ තෙරුවන් සරණ යාමටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති අන්‍ය වූ යාගයක් තියෙනවා ද?"

"අත්ථි ඛෝ බ්‍රාහ්මණ අඤ්ඤේ යඤ්ඤේ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලයඤ්ඤේන ඉමිනා ච විහාරදානේන ඉමේහි ච සරණාගමනේහි අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා"ති.

"පින්වත් බ්‍රාහ්මණය, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා, මේ විහාර පූජාවටත් වඩා, මේ තෙරුවන් සරණ යාමටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති අන්‍ය වූ යාගයක් තියෙනවා."

"කතමෝ පන සෝ භෝ ගෝතම අඤ්ඤේ යඤ්ඤේ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලය-ඤ්ඤේන ඉමිනා ච විහාරදානේන ඉමේහි ච සරණගමනේහි අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා?"ති.

"භවත් ගෞතමයන් වහන්ස, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා, මේ විහාර පූජාවටත් වඩා, මේ තෙරුවන් සරණ යාමටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති ඒ අන්‍ය වූ යාගය කුමක් ද?"

"යෝ ඛෝ බ්‍රාහ්මණ පසන්නචිත්තෝ සික්ඛාපදානි සමාදියති පාණාතිපාතා වේරමණිං අදින්නාදානා වේරමණිං කාමේසු මිච්ඡාචාරා වේරමණිං මුසාවාදා වේරමණිං සුරාමේරයමජ්ජපමාදට්ඨානා වේරමණිං, අයං

ඛෝ බ්‍රාහ්මණ අඤ්ඤේ යඤ්ඤේ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළස-පරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලයඤ්ඤේන ඉමිනා ච විහාරදානේන ඉමේහි ච සරණගමනේහි අප්පට්ටතරෝ ච අප්පසමාරම්භ-තරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා"ති.

"පින්වත් බ්‍රාහ්මණය, යම් කෙනෙක් පැහැදුනු සිතින් යුතුව තිසරණයෙහි පිහිටා ප්‍රාණඝාතයෙන් වැළකී සිටීම නම් වූ, සොරකමින් වැළකී සිටීම නම් වූ, වැරදි කාමසේවනයෙන් වැළකී සිටීම නම් වූ, බොරුකීමෙන් වැළකී සිටීම නම් වූ, මත්පැන් මත් ද්‍රව්‍ය භාවිතයෙන් වැළකී සිටීම නම් වූ ශික්ෂාපද සමාදන් වෙනවා නම්, පින්වත් බ්‍රාහ්මණය, මෙය වනාහී ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා, මේ විහාර පූජාවටත් වඩා, මේ තෙරුවන් සරණ යාමටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති ඒ යාගය යි."

36. "අත්ථි පන භෝ ගෝතම අඤ්ඤේ යඤ්ඤේ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලය-ඤ්ඤේන ඉමිනා ච විහාරදානේන ඉමේහි ච සරණගමනේහි ඉමේහි ච සික්ඛාපදේහි අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා?"ති.

36. "භවත් ගෞතමයන් වහන්ස, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා, මේ විහාර පූජාවටත් වඩා, මේ තෙරුවන් සරණ යාමටත් වඩා, මේ සිල්පදවලටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති අන්‍ය වූ යාගයක් තියෙනවා ද?"

"අත්ථි ඛෝ බ්‍රාහ්මණ අඤ්ඤේ යඤ්ඤේ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චදානේන අනුකූලය-ඤ්ඤේන ඉමිනා ච විහාරදානේන ඉමේහි සරණගමනේහි ඉමේහි ච සික්ඛාපදේහි අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා"ති.

"පින්වත් බ්‍රාහ්මණය, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා, මේ

විහාර පූජාවටත් වඩා, මේ තෙරුවන් සරණ යාමටත් වඩා, මේ සිල්පදවලටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති අන්‍ය වූ යාගයක් තියෙනවා.”

“කතමෝ පන සෝ භෝ ගෝතම අඤ්ඤේ යඤ්ඤේ ඉමාය ච තිවිධාය යඤ්ඤසම්පදාය සෝළසපරික්ඛාරාය ඉමිනා ච නිච්චාදානේන අනුකූලය-ඤ්ඤේන ඉමිනා ච විහාරදානේන ඉමේහි සරණගමනේහි ඉමේහි ච සික්ඛාපදේහි අප්පට්ටතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ චා?”ති.

“භවත් ගෞතමයන් වහන්ස, ඔය ත්‍රිවිධ යාගසම්පත්වලටත් වඩා, යාගපිරිකර දහසයටත් වඩා, කුලපරම්පරාවෙන් එන මේ නිත්‍ය දන්වැටටත් වඩා, මේ විහාර පූජාවටත් වඩා, මේ තෙරුවන් සරණ යාමටත් වඩා, මේ සිල්පදවලටත් වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති ඒ අන්‍ය වූ යාගය කුමක් ද?”

37. ඉධ බ්‍රාහ්මණ තථාගතෝ ලෝකේ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣේඩිකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවල-පරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසේති.

“පින්වත් බ්‍රාහ්මණය, මෙහි අරහත් වූ සම්මාසම්බුද්ධ වූ විජ්ජාචරණ-සම්පන්න වූ සුගත වූ ලෝකවිදූ වූ අනුත්තර පුරිසදම්ම සාරථී වූ, සත්ථා දේවමනුස්සානං වූ, බුද්ධ වූ, භගවා වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපත ලබනවා. උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙව්මිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඥණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා.

38. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තෝ වා අඤ්ඤතරස්මිං වා කුලේ ප-ච්චාජාතෝ. සෝ තං ධම්මං සුත්වා තථාගතේ සද්ධං පටිලභති.

සෝ තේන සද්ධාපටිලාභේන සමන්නාගතෝ ඉති පටිසංචික්ඛති: "සම්බාධෝ සරාවාසෝ රජෝපථෝ අබ්භෝකාසෝ පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා ඒකන්තපරිපුණ්ණං ඒකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං යන්නූනාහං කේසමස්සුං ඡිභාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.

එතකොට ගෘහපතියෙක් වේවා, ගෘහපති පුත්‍රයෙක් වේවා කවර හෝ කුලයක උපන් කෙනෙක් වේවා ඒ ධර්මය අසනවා. ඔහු ඒ ධර්මය අසලා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ගන්නවා. ඉතින් ඔහු ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වෙලා මේ විදිහට නුවණින් කල්පනා කරනවා. "ගිහි ගෙදර වාසය කිරීම හරිම කරදරයක්. කෙලෙස් වැඩෙන මාවතක්. නමුත් පැවිදි ජීවිතය ආකාසය වගේ. ගිහි ගෙදර වාසය කරමින් මුළුමණින් ම පිරිපුන්, මුළුමණින් ම පිරිසිදු, සුදෝසුදු බඹසර වසනවා යන කරණ ලෙහෙසි එකක් නොවේ. ඒ නිසා මං කෙස් රැවුල් බාලා, කසාවත් පොරොවා ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට ඇතුලත් වෙන එක තමයි හොඳ" කියලා.

සෝ අපරේන සමයේන අප්පං ව භෝගක්ඛන්ධං පහාය මහන්තං වා භෝගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කේසමස්සුං ඡිභාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සෝ ඒවං පබ්බජිතෝ සමානෝ පාතිමොක්ඛසංවරසංවුතෝ විහරති, ආචාරගෝචරසම්පන්නෝ, අණුමත්තේසු වජ්ජේසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදේසු, කායකම්මවචිකම්මේන සමන්නාගතෝ කුසලේන, පරිසුද්ධාජීවෝ, සීලසම්පන්නෝ, ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ, භෝජනේ මත්තඤ්ඤූ, සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ සන්තුට්ඨෝ.

ඔහු පස්සෙ කාලෙක ස්වල්ප වූ භෝග සම්පත් අත්හරිනවා. මහත් වූ භෝග සම්පත් අත්හරිනවා. ස්වල්ප වූ නෑදෑයන් අත්හරිනවා. මහත් වූ නෑදෑයන් අත්හරිනවා. කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙනවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් (පැවිද්දෙක් විසින් රැකගත යුතු නිවනට උපකාරී වන උතුම් සිල්පදවලින්) සංවරව ඉන්නවා. යහපත් ඇවැතුම් පැවැතුම්වලින් යුතු වෙනවා. අණුමාත්‍ර වූ වරදෙහි පවා භය දකිනවා. සික්ෂාපදවල සමාදන්ව හික්මෙනවා. කුසල්සහගත කායකර්මයෙන් හා වචිකර්මයෙන් යුතු වෙනවා. පිරිසිදු ආජීවයෙන් යුතු වෙනවා. සිල්වත්

වෙනවා. අකුසලයෙන් වැළකූ දොරටු ඇතුව ඉන්නවා. නුවණින් සළකා ආහාර ගන්නවා. සිහිනුවණින් යුතුව ඉන්නවා. ලද දෙයින් සතුටුව ඉන්නවා.

39. කථඤ්ච බ්‍රාහ්මණ භික්ඛු සීලසම්පන්නෝ හෝති? ඉධ බ්‍රාහ්මණ භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ හෝති. නිහිතදණ්ඩෝ නිහිතසත්ථෝ ලජ්ජී දයාපන්නෝ සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

පින්වත් බ්‍රාහ්මණය, භික්ෂුව සීලයෙන් යුක්ත වන්නේ කොහොම ද? පින්වත් බ්‍රාහ්මණය, මෙහි භික්ෂුව සතුන් මැරීම අත්හැර දාල සතුන් මැරීමෙන් වැළකී ඉන්නවා. දඬු මුගුරු අත් හැර දාල, අවි ආයුධ බැහැර කරලා, පවට ලැජ්ජා ඇතිව ඉන්නවා. සතුන් කෙරෙහි දයාවන්ත වෙනවා, සියවි ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතෝ හෝති. දින්නාදායී දින්නපාටිකංඛී අථේනේන සුචිභූතේන අත්තනා විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

නුදුන් දේ ගැනීම අත් හැරලා නුදුන් දේ ගැනීමෙන් වැළකී ඉන්නවා. දුන් දේ පමණක් පිළිගන්නවා. දුන් දේ පමණක් පිළිගනු කැමති වෙනවා. සොර රහිත සිතින් යුතු වූ පිරිසිදු සිතින් යුතු වූ ජීවිතයකින් වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හෝති. ආරාචාරී විරතෝ මේථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

අබ්‍රහ්මචාරී බව අත් හැරලා බ්‍රහ්මචාරීව ඉන්නවා. ලාමක දෙයක් වූ මෛථුන සේවනයෙන් වැළකී එය දුරින් ම දුරුකර දමනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතෝ හෝති. ස-චවාදී ස-චසන්ධෝ ථේතෝ ප-චයිකෝ අවිසංවාදකෝ ලෝකස්ස. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

බොරු කීම අත් හැරල, බොරු කීමෙන් වැළකී ඉන්නවා. සත්‍යය කථා කරනවා. ඇත්තෙන් ඇත්ත ගලපනවා. ස්ථිරව පිහිටලා කථාකරනවා.

පිළිගත හැකි දේ කථා කරනවා. ලෝකයාව රවටන්නේ නෑ. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතෝ හෝති. ඉතෝ සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමේසම්භේදාය. අමුත්‍ර වා සුත්වා න ඉමේසං අක්ඛාතා අමූසං භේදාය. ඉති භින්නානං වා සන්ධාතා සංහිතානං වා අනුප්පාදාතා. සමග්ගාරාමෝ සමග්ගරතෝ සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

කේලාම් කීම අත්හැරලා කේලාම් කීමෙන් වැළකී ඉන්නවා. මෙතැනින් අහලා මේ අය බිඳවන්නට අතන කියන්නෙ නෑ. අතනින් අහලා ඒ උදවිය බිඳවන්නට මෙතැන කියන්නේ නෑ. මේ අයුරින් බිඳුනු උදවිය සමගි කරවනවා. සමගි වූවන්ට අනුබල දෙනවා. සමගි වූවන් හා වාසයට කැමති යි. සමගි වූවන් හා එක්ව වසනවා. සමගි වූවන් සමග සතුටු වෙනවා. සාමය උදෙසා සාමකාමී වචන කතා කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතෝ හෝති. යා සා වාචා නේලා කණ්ණසුඛා පේමනීයා හදයංගමා පෝරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

පරුෂ වචනය අත් හැරලා පරුෂ වචනයෙන් වැළකී ඉන්නවා. යම් වචනයක් දොස් රහිත නම්, කණට සැප නම්, ආදරවන්ත නම්, හෘදයාංගම නම්, ශිෂ්ට සම්පන්න නම්, බොහෝ ජනයා කැමති නම්, බොහෝ ජනයාට ප්‍රියමනාප නම් එබඳු වූ වචන පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතෝ හෝති. කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී, නිධානවතිං වාචං භාසිතා කාලේන සාපදේසං පරියන්තවතිං අත්ථසඤ්හිතං. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

තේරුමක් නැති කතා බහ අත් හැරලා තේරුමක් නැති කතා කීමෙන් වැළකී සිටිනවා. කල් යල් බලා කථා කරනවා. ඇත්ත කතා කරනවා. අර්ථවත් දෙය කතා කරනවා. ධර්මය ම කථා කරනවා. විනය ම කථා කරනවා. සිත්හි ලා දරාගැනීමට සුදුසු, වෙලාවට ගැලපෙන උපදේශ සහිත

වූ, මදිපාඩුකම් නොා තබා, ප්‍රමාණවත් පරිදි, දෙලොව යහපත පිණිස වූ දේ පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

40. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඒකභත්තිකෝ හෝති රත්තූපරතෝ පටිවිරතෝ විකාලභෝජනා. න-චගීතවාදිත-විසූකදස්සනා පටිවිරතෝ හෝති. මාලාගන්ධවිලේපනධාරණමණ්ඩන-විභූසනට්ඨානා පටිවිරතෝ හෝති. උ-චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ජාතරූපරජත පටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකධඤ්ඤ-පටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකමංසපටිග්ගහණා පටිවිරතෝ හෝති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතෝ හෝති. දාසිදාසපටිග්ගහණා පටිවිරතෝ හෝති. අජේළකපටිග්ගහණා පටිවිරතෝ හෝති. කුක්කුටසූකර-පටිග්ගහණා පටිවිරතෝ හෝති. හත්ථිගවාස්සවළවපටිග්ගහණා පටිවිරතෝ හෝති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතෝ හෝති. දූතෙය්‍ය පහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. කයවික්කයා පටිවිරතෝ හෝති. තුලාකූටකංසකූටමානකූටා පටිවිරතෝ හෝති. උක්කෝටනවඤ්චන-නිකතිසාචියෝගා පටිවිරතෝ හෝති. ඡේදනවධබන්ධනවිපරමෝස-ආලෝපසහසාකාරා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

30. පැලවෙන බීජ හා පැල වුණ ගස් කොළන් විනාශ කිරීමෙන් වැළකී ඉන්නවා. එක් වරුවේ බොජුන් වළඳනවා. රාත්‍රී ආහාරයෙන් වැළකී විකාල භෝජනයෙන් වැළකී ඉන්නවා. නැටුම්, ගැයුම්, වැයුම් හා විසූක දර්ශනයන් නැරඹීමෙන් වැළකී ඉන්නවා. මල් සුවඳ විලවුන් දැරීමෙන් ද ඇඟපත සැරසීමෙන් ද විසිතුරු වස්ත්‍රාභරණයෙන් සැරසීමෙන් ද වැළකී ඉන්නවා. ප්‍රමාණය ඉක්ම වූ උස් ආසන ද වටිනා සුඛෝපභෝගී ආසන ද පරිහරණයෙන් වැළකී ඉන්නවා. රන් රිදී මිල මුදල් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු ධාන්‍ය පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු මස් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ස්ත්‍රීන්, කුමරියන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. දැසි දස්සන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. එළුබැටළුවන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කුකුළන් ඌරන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ඇතුන් ගවයන් අසුන් වෙළඹුන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කෙත් වතු පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගිහි කටයුතු සඳහා දූත මෙහෙවර කිරීමෙන් වැළකී ඉන්නවා. වෙළ හෙළඳාම් කිරීමෙන් වැළකී ඉන්නවා. තරාදියෙන් රැවටීම, නොවටනා දෙයින් රැවටීම, මිනුමෙන් රැවටීම යන මෙයින් වැළකී ඉන්නවා. අල්ලස් ගෙන හිමිකරුවන් ගේ දේ අහිමි කිරීම, වංචා කිරීම, බාලදේ වටිනා දේ හැටියට

පෙන්වීම, ආදී නොයෙක් වංචනික දෙයින් වැළකී ඉන්නවා. අත්පා කැපීම් මැරීම් බන්ධන කිරීම් ම‍ං පැහැරගැනීම්, ගම් පැහැර ගැනීම් ආදී සැහැසි දෙයින් වැළකී සිටිනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

චුල්ලසීලං නිට්ඨිතං
චූලසීලය නිමාවිය

41. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං: මූලබීජ ඛන්ධබීජං එව්බීජ අග්ගබීජ බීජබීජමේව පඤ්චමං. ඉති වා ඉති ඒවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

41. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ විදිහේ පැලවෙන දේ හා ගස් කොළන් ආදිය වනසමින් ඉන්නවා. ඒ කියන්නේ මුලින් පැලවෙන දේවල්, කඳින් පැලවෙන දේවල්, පුරුකින් පැලවෙන දේවල්, දල්ලෙන් පැලවෙන දේවල්, බිජුවටින් පැලවෙන දේවල් යන ආදිය වනසමින් ඉන්නවා. ගස් කොළන් සිඳලීම් ආදී මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලිනුත් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

42. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං සන්නිධිකාරපරිභෝගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඒවරූපා සන්නිධිකාරපරිභෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

42. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ දේ රැස්කරගෙන පරිභෝග කරමින් වාසය කරනවා. ඒ කියන්නේ කෑම වර්ග රැස් කරලා තියා ගන්නවා. බීම වර්ග රැස් කරලා තියා ගන්නවා. වස්ත්‍ර රැස් කරලා තියා ගන්නවා. යාන වාහන රැස් කරලා තියා ගන්නවා. ඇඳ පුටු මේස රැස් කරලා තියා ගන්නවා. සුවඳ වර්ග රැස් කරලා තියා ගන්නවා. තවත් ආමිස රැස් කරලා තියා ගන්නවා. මෙවැනි හෝ මෙවැනි වෙනත් දේවල් හෝ රැස්කරගෙන පරිහරණය කිරීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

43. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: න-ච ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වේතාලං කුම්භථූනං සෝභනකං චණ්ඩාලං වංසං ධෝවන හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩකයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යෝධිකං බලග්ගං සේනාබ්‍යූහං අනීකදස්සනං. ඉති වා ඉති ඒවරූපා විසූකදස්සනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

43. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයේ විසූක දර්ශනයන් නැරඹීමෙහි යෙදිල ඉන්නවා. ඒ කියන්නේ නැටුම්, ගැයුම්, වැයුම්, නාටක, පැරණි කථා රහදැක්වීම්, අත්තල ගසා නැටීම්, වේතාල නැටීම්, බෙර වාදන කිරීම්, රහමඩලෙහි දේවතාවන්ට පූජා පිණිස නැටීම්, උණ ගසින් කරන ක්‍රීඩා, මිනී ඇට මැද තබා වටකොට නැටීම්, ඇත් යුධ බැලීම්, අස්ව යුධ බැලීම්, ගොන් පොර බැලීම්, එළු පොර බැලීම්, බැටළු පොර බැලීම්, කුකුළු පොර බැලීම්, වටු පොර බැලීම්, පොව් හරඹ බැලීම්, මිටි හරඹ බැලීම්, මල්ලව පොර බැලීම්, යුධ සේනා බලන්ට යෑම, බලසෙන් ගණින තැන් බලන්ට යාම, බලසෙනඟ විසිරුවන තැන් බලන්ට යාම ආදී දේවල්වල යෙදෙමින් ඉන්නවා. මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලින් යුතු විසූක දර්ශන නැරඹීම්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

44. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං ජූතප්පමාදට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පංගචිරං වංකකං මොක්ඛචිකං චිංගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනේසිකං යථාවජ්ජං. ඉති වා ඉති ඒවරූපා ජූතප්පමාදට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

44. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල තමාව ප්‍රමාදයට පත් කරවන මේ ආකාර වූ සුදු කෙළියෙන් කල් යවනවා. ඒ කියන්නේ හතරැස් කොටු අටකින් යුතුව කරණ සූදුව, කොටු දහයකින් කරන සූදුව, අහසේ රූ අඳිමින් කරන සූදුව, කොටු පැනීමෙන් කරණ සූදුව, සන්තික නම් වූ සූදුව, දාදු කැටයෙන් කරන

සූදුව, කල්ලි ගැසුම, බුරුවා ගැසීම, ගුළ කෙළිය, නළා පිඹීම, කරණම් ගැසීම, මුගුරක් ගෙන උඩ යට වැටෙන පරිදි උඩට ගැසීම, කොළවලින් කළ ගොටුවලින් තරහෙට වැලි මැනීම, කුඩා රිය තරහ, කුඩා දුනුවලින් විදීමේ තරහ, අකුරු ලිවීමේ සෙල්ලම, සිතූ දේ කියන සෙල්ලම, විකලාංග අනුකරණයෙන් හිනැස්සීමේ සෙල්ලම ආදී දේ කිරීමයි. මේ දෙයිනුත් මෙවැනි තවත් දේවල් ඇත්නම් එයිනුත් වැළකී ප්‍රමාදයට පත්වන සූදුවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

45. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: ආසන්දිං පල්ලංකං ගෝනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලෝමිං ඒකන්තලෝමිං කට්ඨිස්සං කෝසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවේණිං කාදලිමිගපවරප-ච්චත්ථරණං සඋත්තර-ඡදං උභතෝලෝහිතකූපධානං. ඉති වා ඉති ඒවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

45. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ පමණ ඉක්මවා උස් වූ ආසනත් වටිනා සුඛෝපභෝගී ආසනත් පරිහරණය කරනවා. ඒ කියන්නේ දිග හාන්සි පුටු, කවිච්චි, ලොකු පලස් යෙදූ ආසන, විසිතුරු ගෙත්තම් කළ එළු ලොම් ඇතිරිළි, සුදු එළු ලොමින් කළ ඇතිරිළි, මල් යෙදූ එළු ලොමින් කළ ඇතිරිළි, පුළුන් යෙදූ මෙට්ට, සත්ව රූපවලින් සැරසූ එළු ලොම් ඇතිරිළි, මුළුමණින්ම එළු ලොමින් කළ ඇතිරිළි, රන් නූලෙන් සැරසූ කලාල, පට නූලෙන් කළ කලාල, නාටිකාංගනාවන් ඒ මත නැටිය හැකි එළු ලොමින් කළ කලාල, ඇතුන් පිට යොදන ඇතිරිළි, අසුන් පිට යොදන ඇතිරිළි, රථවල යොදන ඇතිරිළි, අඳුන් දිවි සමෙන් කළ ඇතිරිළි, කදලි මුව සමෙන් කළ කලාල, හිස දෙපැත්තට රතු විල්වැද කොට්ට තබා රතු උඩුවියන් බැඳ සැදූ වටිනා යහන් ආදිය පරිහරණය කරයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී උස් අසුන් මහා අසුන් පරිහරණයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

46. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප මණ්ඩනවිභූසනට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලේපනං මුඛචුණ්ණකං මුඛාලේපනං

හත්ථබන්ධං සිඛාන්ධං දණ්ඩකං නාළිකං අසිං ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවිජනිං විදාතානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති ඒවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

46. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් ඇඟපත සැරසීමෙන් හා විසිතුරු වස්ත්‍රාභරණ පැළඳීමෙන් යුක්තව කල් ගෙවනවා. ඒ කියන්නේ සුවඳ වර්ග ඇඟ තවරා සිරුර සිනිඳු කිරීම, තෙල් වර්ග ගා සම්බාහනය කොට සිරුර හැඩ කිරීම, සුවඳපැන් නෑම, උරහිස් ආදියෙහි මස් වැඩීමට මුගුරෙන් තැලීම, කැඩපතින් මුහුණ බලා සැරසීම, ඇස්වල අඳුන් ගෑම, මල් හා සුවඳ විලවුන් දැරීම, මුව සුවඳ කිරීම, මුව විලවුන් දැරීම, අත්වල ආභරණ දැමීම, හිසෙහි කුඩුම්බි දැරීම, විසිතුරු සැරයැටි දැරීම, විසිතුරු බෙහෙත් නල දැරීම, විසිතුරු කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නලල් පට දැරීම, මැණික් පැළඳීම, චාමර දැරීම, දිග වාටි ඇති සුදු වස්ත්‍ර දැරීම ආදියෙන් යුතුවෙයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී ඇඟපත සැරසීම් හා විසිතුරු වස්ත්‍රාභරණ සැරසීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

47. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං තිර-ඡානකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද‍ං: රාජකථං චෝරකථං මහාමත්තකථං සේනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථීකථං පුරිසකථං (කුමාරකථං කුමාරීකථං) සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපේතකථං නානත්තකථං ලෝකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

47. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරිසන් කථාවල යෙදී වාසය කරනවා. ඒ කියන්නේ, රජවරුන් ගැන කථා, සොරුන් ගැන කථා, මහ ඇමතිවරුන් ගැන කථා, හමුදාවන් ගැන කථා, භය ඇතිවෙන දේවල් ගැන කථා, ආහාර වර්ග ගැන කථා, බොන දේවල් ගැන කථා, ඇඳුම් පැළඳුම් ගැන කථා, ඇඳ පුටු ගැන කථා, මල් වර්ග ගැන කථා, සුවඳ වර්ග ගැන කථා, නැදෑයන් ගැන කථා, යාන වාහන ගැන කථා, ගම්මාන ගැන කථා,

නියම් ගම්මාන ගැන කථා, නගර ගැන කථා, රටවල් ගැන කථා, ස්ත්‍රීන් ගැන කථා, පුරුෂයින් ගැන කථා, කුමාරයින් ගැන කථා, කුමාරියන් ගැන කථා, ශූරයින් ගැන කථා, මංමාවත් ගැන කථා, වලං පොලේ දේවල් ගැන කථා, මියගිය උදවිය ගැන කථා, තව තව දේවල් ගැන කථා, ලෝකය ගැන කථා, සාගරය ගැන කථා, මෙහෙමයි වුණේ මෙහෙමයි නොවුණේ කියන දේ ගැන කථා කරකර ඉන්නවා, මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරිසන් කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

48. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: "න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මි-ඡාපටිපන්නෝ ත්වමසි, අහමස්මි සම්මා පටිපන්නෝ. සහිතං මේ, අසහිතං තේ. පුරේ වචනීයං ප-ඡා අවච. ප-ඡා වචනීයං පුරේ අවච. අවිචිණ්ණං තේ විපරාවත්තං. ආරෝපිතෝ තේ වාදෝ. නිග්ගහිතෝ ත්වමසි. චර වාදප්පමෙක්ඛාය. නිබ්බේඨේහි වා සං- පහෝසී"ති. ඉති වා ඉති ඒවරූපාය විග්ගාහිකකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

48. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් එකිනෙකා අතර බැණ දොඩා ගන්නා කථාවෙන් යුතුව යි ඉන්නෙ. ඒ කියන්නේ "නුඹ මේ ධර්ම විනය දන්නෙ නෑ. මම තමයි මේ ධර්ම විනය දන්නේ, ආ ... එහෙම ද එතකොට නුඹද මේ ධර්ම විනය දන්නේ? නුඹ ඉන්නේ මිත්‍යා වැඩ පිළිවෙලක යි. මම තමයි නියම වැඩ පිළිවෙල තුළ ඉන්නේ. මං කරුණු සහිතව යි කියන්නේ. නුඹේ කීම කරුණු රහිත යි. නුඹ කලින් කිවයුතු දේ පස්සේ කිව්වා. පස්සේ කිවයුතුදේ කලින් කිව්වා. නුඹ කලක් තිස්සේ කියපු දේ කණපිට පෙරළෙනා. මා විසින් නුඹට වාද නංවල යි තියෙන්නේ. නුඹට නිග්‍රහ කරල යි තියෙන්නේ. වාදයෙන් නිදහස් වීමට මගක් හොයාගෙන පලයන්. පුළුවන් නම් ලෙහාගනින්" යනාදිය කියමින් ආරවුල් හදාගන්නවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ බැණ දොඩාගන්නා කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

49. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං දූතෙය්‍යපහිණගමනානුයෝගමනුයුත්තා

විහරන්ති. සෙය්‍යථීදං: රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං "ඉධ ග-ඡ. අමුත්‍රාග-ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉති ඒවරූපා දූතෙය්‍යපහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

49. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල ගිහියන් ගේ පණිවිඩ පණත් ගෙන යන මෙබඳු වූ දූත මෙහෙවරෙහි යෙදෙනවා. ඒ කියන්නේ, "මෙහෙ යන්න, අසවල් තැනට එන්න, මේක (අපේ මේ පණිවිඩය) අරන් යන්න. අසවල් තැනට මේක අරන් යන්න" යනාදී රජුන් ගේ, රාජමහා ඇමතිවරුන් ගේ, ක්ෂත්‍රියයන් ගේ, බ්‍රාහ්මණයන් ගේ, ගෘහපතියන් ගේ, කුමාරවරුන් ගේ, පණිවුඩ පණත් ගෙනියනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ පණිවුඩ පණත් ගෙනයන ගිහියන්ගේ දූත මෙහෙවරෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

50. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ කුහකා ච හොන්ති ලපකා ච නේමිත්තිකා ච නිප්පේසිකා ච ලාභේන ලාභං නිජිගිංසිතාරෝ ච. ඉති වා ඉති ඒවරූපා කුහනලපනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

50. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල කුහක (උඩින් වෙන ජීවිතයක් පෙන්වමින් යටින් වෙනත් ජීවිතයක් ගෙවමින් නැති ගුණ පෙන්වා) ජීවිත ගෙවනවා. ලාභ සත්කාර ලැබෙන විදිහට (පුහු වර්ණනා කිරීම්, තොදොල් කිරීම්, නැති ගුණ කීම් ආදී) චාටු බස් කියනවා. දායකයින් හට නො දී බැරි තත්වයට පත් වෙන ආකාරයේ නිමිති දක්වමින් කථා කරනවා. තමන්ට ලැබෙන විදිහට අනුන්ට ගරහනවා. ලාභයෙන් ලාභය හොයනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල් වලිනුත් වැළකී මෙබඳු වූ කුහක කමින් චාටුබස්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

මජ්ඣිමසීලං නිට්ඨිතං
මධ්‍යම සීලය නිමාවිය

51. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං

කප්පෙන්ති - සෙය්‍යථීදං: අංගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසික-ඡින්නං අග්ගිහෝමං දබ්බිහෝමං ථුසහෝමං කණහෝමං තණ්ඩුලහෝමං සප්පිහෝමං තේලහෝමං මුඛහෝමං ලෝහිතහෝමං අංගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජ භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා වි-ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගචක්ඛං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

51. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙවැනි වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ ශාරීරික අංග බලා ඵලාඵල කියනවා, නිමිති බලා ඵලාඵල කියනවා, උත්පාත බලා ඵලාඵල කියනවා, සිහින ඵලාඵල කියනවා, ශාරීරික ලක්ෂණ බලා ඵලාඵල කියනවා, මීයන් කෑ වස්ත්‍ර බලා ඵලාඵල කියනවා, ගිනි පූජා පවත්වනවා, හැන්දෙන් පූජා පවත්වනවා, ධාන්‍ය පොතුවලින් පූජා පවත්වනවා. කණ නම් සහලින් කළ පූජා පවත්වනවා, සහලින් පූජා පවත්වනවා, ගිතෙලින් පූජා පවත්වනවා, තල තෙලින් පූජා පවත්වනවා, විශේෂ කොට කරණ පූජා පවත්වනවා, සතුන් මරා ලේ පුදා කරන පූජා පවත්වනවා, අංග විද්‍යාව, වාස්තු විද්‍යාව, දේශපාලන විද්‍යාව, වාසනාව උරගා බැලීමේ (ලොතරැයි) විද්‍යාව, භූත විද්‍යාව, පොළොව යට බිම් ගෙයක ඉඳ මැතිරීමෙන් කරන (භූරි) විද්‍යාව, සර්ප විද්‍යාව, විෂ විද්‍යාව, වෘශ්චික විද්‍යාව, මූෂක විද්‍යාව, පක්ෂි විද්‍යාව, විශාල පක්ෂි විද්‍යාව, ඉදුණු දේ මුල් කොට අනාවැකි කියන විද්‍යාව, මතුරන ලද ඊතල විද ආරක්ෂා කරන විද්‍යාව, මෘග පක්ෂ යනාදී මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

52. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරීලක්ඛණං දාසලක්ඛණං දාසීලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගෝලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං

ගෝධාලක්ඛණං කණ්හිකාලක්ඛණං ක-ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

52. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ මැණික්වල සුභ අසුභ ලකුණු කීම, දඬුවල සුභ අසුභ ලකුණු කීම, වස්ත්‍රවල සුභ අසුභ ලකුණු කීම, කඩු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ඊතල ආදී සලකුණුවලින් සුභාසුභ කීම, දුනු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ආයුධ ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ස්ත්‍රීන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, පුරුෂයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දරුවන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දැරියන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසීයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, ඒ ඒ කටයුතු සඳහා තෝරා ගත යුතු ඇතුන් ගේ ලකුණු කීම, අසුන් ගේ ලකුණු කීම, ඔටුවන් ගේ ලකුණු කීම, වෘෂභයන් ගේ ලකුණු කීම, ගවයන් ගේ ලකුණු කීම, එළුවන් ගේ ලකුණු කීම, බැටළුවන් ගේ ලකුණු කීම, කුකුළු පොර ආදියට සුදුසු කුකුළන් ගේ ලකුණු කීම, වටුවන් ගේ ලකුණු කීම, සුහුනන් ඇහ වැටීමේ සහ හඬනැගීමේ ඵලාඵල කීම, කණෙහි පළඳාගත් උපකරණවලින් ඵලාඵල කීම, කැස්බෑවන්ට මතුරා ඵලාඵල කීම, මුවන්ට මතුරා ඵලාඵල කීම ආදී තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

53. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති. රඤ්ඤං අතියානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයෝ භවිස්සති. බහිරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයෝ භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. ඉති ඉමස්ස ජයෝ භවිස්සති. ඉමස්ස පරාජයෝ භවිස්සති. ඉති වා ඉති එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

53. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් නැකතට රජතුමා ගේ යුධ පිණිස නික්මීම වන්නේ ය. අසවල් නැකතින් ආපසු නුවරට ඇතුළ්වීම සිදු කළ යුත්තේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිට පිටත සතුරු රජුන් හමුවීමට රජු ගේ ගමන කළයුත්තේ ය. අසවල් නැකතින් පිටත සිටින රජවරු රට ඇතුළට පැමිණීම වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජු ගේ ඉවත්වීම සිදුවන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජුට ජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුනට පරාජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුන්ට ජය වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ රජුට පරාජය වන්නේ ය කියල මොහුට ජය වෙනවා. මොහුට පරාජය වෙනවා" ආදී වශයෙන් පවසමින් තිරිසන් විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

54. **"යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: චන්දග්ගාහෝ භවිස්සති, සුරියග්ගාහෝ භවිස්සති, නක්ඛත්තග්ගාහෝ භවිස්සති, චන්දිමසුරියානං පථගමනං භවිස්සති, චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, නක්ඛත්තානං පථගමනං භවිස්සති, නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, උක්කාපාතෝ භවිස්සති, දිසාඩාහෝ භවිස්සති, භූමිචාලෝ භවිස්සති, දේවදුන්දුභි භවිස්සති, චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං විගමනං සංකිලේසං වෝදානං භවිස්සති, ඒවං විපාකෝ චන්දග්ගාහෝ භවිස්සති, ඒවං විපාකෝ සුරියග්ගාහෝ භවිස්සති, ඒවං විපාකෝ නක්ඛත්තග්ගාහෝ භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියානං පථගමනං භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, ඒවං විපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති, ඒවං විපාකං නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, ඒවං විපාකෝ උක්කාපාතෝ භවිස්සති, ඒවං විපාකෝ දිසාඩාහෝ භවිස්සති, ඒවං විපාකෝ භූමිචාලෝ භවිස්සති, ඒවං විපාකෝ දේවදුන්දුභි භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං විගමනං සංකිලේසං වෝදානං භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

54. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් දින චන්ද්‍රග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සූර්යග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින නැකත් ග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නිසිමඟින් යෑම සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නොමඟින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නිසි මඟින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නොමඟින් යෑම සිදුවෙනවා. අසවල් දින උල්කාපාත වැටෙනවා. අසවල් දින අසවල් දිශාවේ උෂ්ණත්වය වැඩිවෙනවා. අසවල් දින භූමි කම්පාවක් සිදුවෙනවා. අසවල් දින වැසි රහිතව අහස ගුගුරනවා. හිරු සඳු හා නැකත් වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම මේ මේ වෙලාවට සිදුවෙනවා. චන්ද්‍ර ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. සූර්ය ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. නැකත් ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නිසිගමන මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නොමඟ යෑම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. උල්කාපාත වැටීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. දිශා දාහය මෙවැනි ඵල විපාක ලබා දෙනවා. භූකම්පන මෙවැනි ඵල විපාක ලබා දෙනවා. වැසි නැතිව අහස ගිගිරීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. හිරු සඳු හා නැකත්වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම ලෝකයට මෙවැනි විපාක ලබා දෙනවා" කියල තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

55. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: සුබ්බුට්ඨිකා භවිස්සති, දුබ්බුට්ඨිකා භවිස්සති, සුභික්ඛං භවිස්සති, දුබ්භික්ඛං භවිස්සති, ඛේමං භවිස්සති, භයං භවිස්සති, රෝගෝ භවිස්සති, ආරෝග්‍යං භවිස්සති, මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලෝකායතං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

55. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "මේ කාලයේ දී වැස්ස වහිනවා. මේ කාලයේ දී නියඟය ඇතිවෙනවා. මේ කාලයේ දී ආහාරපාන සරු වෙනවා.

මේ කාලයේ දී දුර්භික්ෂය ඇතිවෙනවා. මේ කාලයේ දී රට සරුවෙනවා. මේ කාලයේ දී බිය සැක නැතිව ඉන්නවා. මේ කාලයේ දී භය උපදිනවා. මේ කාලයේ දී රෝග ඇති වෙනවා. මේ කාලයේ දී නීරෝග බව ඇති වෙනවා කියමින් එලා එල පැවසීමත් මුද්‍රා, ගණිත, සංඛ්‍යාන, කාව්‍ය ශාස්ත්‍ර, ලෝකායත ශාස්ත්‍ර ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

56. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හානිත්ථම්-භනං හනුසංහන්නං හත්ථාභිජප්පනං හනුජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිකාපඤ්හං දේවපඤ්හං ආදි-චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්භායනං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

56. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, විවාහයට නැකත් කීම, ආවාහයට නැකත් කීම, වෙන් වූ අඹු සැමියන් එක් කිරීමට නැකත් සැදීම, එක් වූ අඹු සැමියන් වෙන් කිරීමට නැකත් සැදීම, දීපු ණය එකතු කිරීමට නැකත් සැදීම, මුදල් ණයට පොලියට දීමට නැකත් සැදීම, දියුණු වීමට ගුරුකම් කිරීම, පාළුවී නැති වීමට ගුරුකම් කිරීම, දරුගැබ් රැකෙන්නට ගුරුකම් කිරීම, දිව අගුළු බැඳෙන්නට ගුරුකම් කිරීම, හනු තද කරන්නට ගුරුකම් කිරීම, අත් පෙරලෙන්නට ගුරුකම් කිරීම, හනු සිරවෙන්නට ගුරුකම් කිරීම, කණ් අගුළු වැටෙන්නට ගුරුකම් කිරීම, කණ්ණාඩියෙන් භූතයන් කැඳවා ප්‍රශ්න විචාරීම, ගෑණු දරුවන් ලවා පේන කීම, දෙවියන් ලවා පේන කීම, සූර්ය වන්දනාව, මහ බඹු වන්දනාව, මන්ත්‍ර බලයෙන් කටින් ගිනිදැල් පිටකිරීම, මන්ත්‍ර බලෙන් ලක්ෂ්මි පූජා කිරීම යනාදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

57. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: සන්තිකම්මං පණිධිකම්මං (භූතකම්මං) භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපනං ජුහනං වමනං විරේචනං උද්ධවිරේචනං අධෝවිරේචනං සීසවිරේචනං කණ්ණතේලං නෙත්තතප්පනං නත්ථුකම්මං අඤ්ජනං ප-චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකි-ඡා මූලභේසජ්ජානං අනුප්පදානං විසධීනං පටිමොක්ඛෝ. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡාන-විජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

57. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, ශාන්ති කර්ම, බාර ඔප්පු කිරීම, පොළොව යට හිඳ මතුරා ගුරුකම් කිරීම, නපුංසකයා පිරිමියෙකු කිරීම, පිරිමියා නපුංසකයෙකු කිරීම, ගෙවල් තැනීමේ දිශාවන් පෙන්වා දීම, අළුතෙන් නිවාස තැනීමේදී පුද පූජා පැවැත් වීම. වතුර මතුරා මූණ සේදවීම, වතුර මතුරා නැහැවීම, ගිනිපිඳීම, ලය විරේක කරවීම, බඩ විරේක කරවීම, වමනය කරවීම, වස්ති කරවීම, ශීර්ෂ විරේකය, කණට තෙල් පිඹීම, ඇස් වෙදකම, නස්න කිරීම, ඇස්වලට අඳුන් සෑදීම, ප්‍රති අංජන සෑදීම, ශල්‍ය කර්ම කිරීම, ළදරු චිකිත්සාව, කාය චිකිත්සාව, වනවලට බෙහෙත් බැඳීම ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

58. අථ ඛෝ බ්‍රාහ්මණ, භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, ඛත්තියෝ මුද්ධාවසිත්තෝ නිහතප-චාමිත්තෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං ප-චත්ථිකතෝ. ඒවමේව ඛෝ බ්‍රාහ්මණ භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෝ ඉමිනා අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ බ්‍රාහ්මණ භික්ඛු සීලසම්පන්නෝ හෝති.

58. පින්වත් බ්‍රාහ්මණය, ඒ භික්ෂුව වනාහී මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. ඔටුනු පලන් රජ

කෙනෙක් ඉන්නවා. ඔහු සතුරන් පරදවල බැහැර කරලයි ඉන්නේ. ඉතින් ඔහු සතුරන් හේතුවෙන් මොන ම අයුරකින්වත් භයක් දකින්නේ නෑ. පින්වත් බ්‍රාහ්මණය, භික්ෂුවත් ඔය විදිහම යි. මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් සමන්විත ව ආධ්‍යාත්මිකව නිවැරදි සැපයක් විඳිනවා. පින්වත් බ්‍රාහ්මණය, ඔන්න විදිහට යි භික්ෂුව සීලසම්පන්න වන්නේ.

(මහාසීල නිට්ඨිතං)
මහා සීලය නිමා විය

59. කථඤ්ච බ්‍රාහ්මණ, භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති? ඉධ බ්‍රාහ්මණ, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියේ සංවරං ආපජ්ජති. සෝතේන සද්දං සුත්වා ..... ඝාණේන ගන්ධං ඝායිත්වා ..... ජිව්හාය රසං සායිත්වා ..... කායේන ඵොට්ඨබ්බං ඵුසිත්වා ..... මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියේ සංවරං ආපජ්ජති. සෝ ඉමිනා අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ අජ්ඣත්තං අබ්‍යාසේකසුඛං පටිසංවේදේති. එවං ඛෝ බ්‍රාහ්මණ, භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති.

59. පින්වත් බ්‍රාහ්මණය, භික්ෂුව අකුසලයන් වැළකූ ද්වාර ඇති ඉඳුරන් ඇතිව ඉන්නේ කොහොම ද? පින්වත් බ්‍රාහ්මණය, මෙහිලා භික්ෂුව ඇසින් රූප දැක නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් ඇස නැමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. ඇස රැක ගන්නවා. ඇස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. කණෙන් ශබ්දයක් අහලා ..... නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කරලා ..... දිවෙන් රසයක් රස විඳලා ..... කයෙන් පහසක් ලබලා ..... මනසින් අරමුණක් දැන ගෙන නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් මනස

නැමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. මනස රැක ගන්නවා. මනස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. ඔහු මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව ආධ්‍යාත්මිකව පීඩා රහිතව සැපයක් විඳිනවා. පින්වත් බ්‍රාහ්මණය, භික්ෂුව අකුසලයෙන් වැළැක් වූ දොරටු ඇති ඉන්ද්‍රියයන් තුළ ඉන්නේ ඔය විදිහට යි.

60. කථඤ්ච බ්‍රාහ්මණ, භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති? ඉධ බ්‍රාහ්මණ, භික්ඛු අභික්කන්තේ පටික්කන්තේ සම්පජානකාරී හෝති. ආලෝකිතේ විලෝකිතේ සම්පජානකාරී හෝති. සම්මිඤ්ජිතේ පසාරිතේ සම්පජානකාරී හෝති. සංඝාටිපත්තචීවරධාරණේ සම්පජානකාරී හෝති. අසිතේ පීතේ ඛායිතේ සායිතේ සම්පජානකාරී හෝති. උච්චාරපස්සාවකම්මේ සම්පජානකාරී හෝති. ගතේ ඨිතේ නිසින්නේ සුත්තේ ජාගරිතේ භාසිතේ තුණ්හීභාවේ සම්පජානකාරී හෝති. ඒවං ඛෝ බ්‍රාහ්මණ, භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති.

60. පින්වත් බ්‍රාහ්මණය, භික්ෂුව සිහිනුවණින් යුතුව සිටින්නේ කොහොම ද? පින්වත් බ්‍රාහ්මණය, මෙහිලා භික්ෂුව ඉදිරියට යද්දීත්, ආපසු එද්දීත්, එය කරන්නේ සිහි නුවණින් ම යි. ඉදිරිය බලද්දී, වටපිට බලද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. අතපය හකුළද්දී, දිගහරිද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. දෙපට සිවුර, පාත්‍රය, අනෙක් සිවුරු ආදිය දරද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. වළඳද්දී පානය කරද්දී අනුභව කරද්දී රස විඳිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. වැසිකිළි කැසිකිළි යාමේ දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. ගමන් කරද්දී, සිටගෙන සිටිද්දී, වාඩි වී සිටිද්දී, සැතපෙද්දී, නිදිවරද්දී, කථාබස් කරද්දී, නිහඬව සිටිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. පින්වත් බ්‍රාහ්මණය, භික්ෂුව සිහිනුවණින් යුතු වන්නේ ඔය ආකාරයට යි.

61. කථඤ්ච බ්‍රාහ්මණ, භික්ඛු සන්තුට්ඨෝ හෝති? ඉධ බ්‍රාහ්මණ භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරිකේන චීවරේන කුච්ඡිපරිහාරිකේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, පක්ඛී සකුණෝ යේන යේනේව ඩේති සපත්තභාරෝව ඩේති, ඒවමේව ඛෝ බ්‍රාහ්මණ, භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරිකේන චීවරේන කුච්ඡිපරිහාරිකේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. ඒවං ඛෝ බ්‍රාහ්මණ, භික්ඛු සන්තුට්ඨෝ හෝති.

61. පින්වත් බ්‍රාහ්මණය, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ කොහොම ද? පින්වත් බ්‍රාහ්මණය, මෙහිලා භික්ෂුව කය පරිහරණයට සෑහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සෑහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. ඒක මේ වගේ දෙයක්. කුරුල්ලෙක් යම් ම තැනකට පියඹා යනවා නම්, පියාපත් බර පමණක් සහිතව පියඹනවා වගෙයි. පින්වත් බ්‍රාහ්මණය, ඔය අයුරින් ම භික්ෂුව කය පරිහරණයට සෑහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සෑහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. පින්වත් බ්‍රාහ්මණය, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ ඔය විදිහට යි.

62. සෝ ඉමිනා ච අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතෝ, විවිත්තං සේනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භෝකාසං පලාලපුඤ්ජං. සෝ ප-ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තෝ නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

62. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ සිහිනුවණින් යුක්ත වෙලා, මේ ආර්ය වූ ලද දෙයින් සතුටුවීමෙන් යුක්ත වෙලා හුදෙකලා සෙනසුනක වාසය කරනවා. ඒ කියන්නේ ආරණ්‍යය, රුක්සෙවණ, පර්වතය, දිය ඇල්ල, ගිරිගුහාව, සොහොන, වනගැබ, ගස් කොළන් රහිත හිස් පිටිය, පිදුරු ගෙය ආදිය යි. ඔහු පිණ්ඩපාතය වළඳා, දානයෙන් පසු (එවැනි තැනක) පළඟක් බැඳ ගෙන, කය සෘජු කර ගෙන, භාවනා අරමුණෙහි සිහිය පිහිටුවා ගෙන වාඩිවෙනවා.

63. සෝ අභිජ්ඣං ලෝකේ පහාය විගතාභිජ්ඣේන චේතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසෝධේති. බ්‍යාපාදපදෝසං පහාය අබ්‍යාපන්නචිත්තෝ විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදෝසා චිත්තං පරිසෝධේති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධෝ විහරති අලෝකසඤ්ඤී සතෝ සම්පජානෝ. ථීනමිද්ධා චිත්තං පරිසෝධේති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතෝ විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තෝ. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසෝධේති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡෝ විහරති අකථංකථී කුසලේසු ධම්මේසු. විචිකිච්ඡාය චිත්තං පරිසෝධේති.

63. ඔහු ජීවිතය නම් වූ ලෝකය ගැන ඇති විසම ලෝභය දුරු කොට ඇලීම් රහිත වූ සිතින් වාසය කරනවා. විසම ලෝභය කෙරෙන් සිත පිරිසිදු කරනවා. තරහ වෛර ආදිය අත්හැර තරහ නැති සිතින් සියළු සතුන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා. තරහ වෛර ආදිය කෙරෙන් සිත පිරිසිදු කරනවා. නිදිමත අලසකම අත්හැර නිදිමත අලසකමින් බැහැරව ආලෝක සඤ්ඤාවෙන් යුතුව, සිහිනුවණ ඇතිව වාසය කරනවා. නිදිමත අලසකම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සිතේ විසිරීමත්, පසුතැවීමත් බැහැර කොට නො කැළඹී ගිය සංසිඳුනු සිතින් වාසය කරනවා. සිතේ විසිරීම හා පසුතැවීම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සැකය දුරු කොට කුසල් දහම් ගැන කෙසේ ද? කෙසේ ද? යනාදී සැකයෙන් එතෙරව වාසය කරනවා. සැකය කෙරෙන් සිත පිරිසිදු කරනවා.

64. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, පුරිසෝ ඉණං ආදාය කම්මන්තේ පයෝජෙය්‍ය, තස්ස තේ කම්මන්තා සම්ඡ්ජෙය්‍යුං, සෝ යානි ච පෝරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ඉණං ආදාය කම්මන්තේ පයෝජේසිං. තස්ස මේ තේ කම්මන්තා සම්ඡ්ඣඩිංසු. සෝ'හං යානි ච පෝරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීඅකාසිං. අත්ථි ච මේ උත්තරිං අවසිට්ඨං දාරභරණායා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

64. පින්වත් බ්‍රාහ්මණය, එය මෙවැනි දෙයක්. පුරුෂයෙක් ණයක් අරගෙන කර්මාන්තයක යොදවනවා. ඔහු ගේ ඒ ව්‍යාපාරය සාර්ථක වෙනවා. එතකොට ඔහු යම් පරණ මුල් ණයක් ඇද්ද, එය සම්පූර්ණයෙන් ම ගෙවලා දානවා. එයින් පසු ඔහුට අඹුදරුවන් පෝෂණය පිණිස ලාභයක් ඉතිරිත් වෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං කලින් ණයක් අරගෙනයි ව්‍යාපාරයක යෙදෙව්වේ. ඒ මගේ ව්‍යාපාරය සාර්ථක වුණා. ඒ මං යම් පරණ මුල් ණයක් ඇද්ද එය සම්පූර්ණයෙන් ම ගෙව්වා. අඹුදරුවන් පෝෂණයටත් මට ආදායම ඉතිරි වුණා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

65. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, පුරිසෝ ආබාධිකෝ අස්ස දුක්ඛිතෝ බාළ්හගිලානෝ, භත්තං චස්ස න-ඡාදෙය්‍ය, න චස්ස කායේ බලමත්තා, සෝ අපරේන සමයේන තම්හා ආබාධා මු-චෙය්‍ය, භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායේ බලමත්තා, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ආබාධිකෝ අහෝසිං දුක්ඛිතෝ බාළ්හගිලානෝ. භත්තං ච මේ න-ඡාදේසි. න චස්ස මේ

ආසි කායේ බලමත්තා. සෝ'මිහි ඒතරහි තම්හා ආබාධා මුත්තෝ. භත්තඤ්ච මේ ඡාදේති. අත්ථි ච මේ කායේ බලමත්තා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

65. පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව ඉන්නවා. ඔහුට බත් කෑමටවත් පිරියක් නෑ. ඔහු ගේ ඇහේ පතේ ප්‍රාණවත් ගතියක් නෑ. නමුත් පස්සෙ කාලෙක ඔහු ඒ රෝගයෙන් මිදුනා. ඔහුට දැන් බත් කෑමත් ප්‍රිය යි. ඔහු ගේ ඇහපතත් ප්‍රාණවත්. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව හිටියේ. මට බත් කෑමටවත් පිරියක් තිබුණේ නෑ. මගේ ඇහේ පතේ ප්‍රාණවත් ගතියක් තිබුණේ නෑ. නමුත් දැන් මං ඒ රෝගයෙන් මිදුනා. මට දැන් බත් කෑමත් ප්‍රිය යි. මගේ ඇහපතත් ප්‍රාණවත්" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

66. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, පුරිසෝ බන්ධනාගාරේ බද්ධෝ අස්ස, සෝ අපරේන සමයේන තම්හා බන්ධනාගාර මු-චෙය්‍ය සොත්ථිනා අබ්බයේන න චස්ස කිඤ්චි භෝගානං වයෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ බන්ධනාගාරේ බද්ධෝ අහෝසිං. සෝම්හි ඒතරහි තම්හා බන්ධනාගාරා මුත්තෝ සොත්ථිනා අබ්බයේන. නත්ථි ච මේ කිඤ්චි භෝගානං වයෝ"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

66. පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් හිරගෙදරක බන්ධනයකට හසුවෙනවා. නමුත් ඔහු පස්සෙ කාලෙක තමන් ගේ ධනය වියදම් නොකොට සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වෙනවා. ඔහු ගේ සම්පත්වලින් කිසි වියදමක් යන්නේ නෑ. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර හිරගෙදරක බන්ධනයකට අහු වුණා. නමුත් ඒ මං දැන් ධන වියදමකින් තොරව සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වුණා. මගේ භෝග සම්පත්වලින් කිසිදෙයක් වියදම් වුණේ නෑ" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

67. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, පුරිසෝ දාසෝ අස්ස අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාමංගමෝ, සෝ අපරේන සමයේන තම්හා දාසබ්‍යා මු-චෙය්‍ය අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාමංගමෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ දාසෝ අහෝසිං අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාමංගමෝ. සෝ'මිහි ඒතරහි තම්හා දාසබ්‍ය මුත්තෝ අත්තාධීනෝ

අපරාධීනෝ භුජිස්සෝ යේනකාමංගමෝ”ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

67. පින්වත් බ්‍රාහ්මණය, එක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නොහැකි, දාසයෙක් වෙලා හිටියා. ඔහු පස්සෙ කාලෙක ඒ දාසබවෙන් නිදහස් වුණා. තමාට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නොවන, තමන් කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබුණා. එතකොට ඔහුට මෙහෙම හිතුනා. “මං ඉස්සර තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නොහැකි, දාසයෙක් වෙලා හිටියා. ඒ මං දැන් ඒ දාසබවෙන් නිදහස් වෙලයි ඉන්නේ. මට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නොවන, මං කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබිලා තියෙනවා” කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

68. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, පුරිසෝ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං, සෝ අපරේන සමයේන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛේමං අප්පටිභයං, තස්ස එවමස්ස: “අහං ඛෝ පුබ්බේ සධනෝ සභෝගෝ කන්තාරමද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සෝ’ම්හි එතරහි තං කන්තාරං නිත්ථිණ්ණෝ සොත්ථිනා ගාමන්තං අනුප්පත්තෝ ඛේමං අප්පටිභය”න්ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

68. පින්වත් බ්‍රාහ්මණය, එක මේ වගේ දෙයක්. පුරුෂයෙක් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසෙනවා. නමුත් ඔහු පසු කාලෙක ඒ කාන්තාරයෙන් එතෙර වෙනවා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා “මං කලින් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසුනා. නමුත් දැන් මා ඒ කාන්තාරයෙන් එතෙර වුණා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණුනා” කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

69. එවමේව ඛෝ බ්‍රාහ්මණ, භික්ඛු යථා ඉණං යථා රෝගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං. එවං ඉමේ පඤ්ච නීවරණේ අප්පහීණේ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි බ්‍රාහ්මණ ආනණ්‍යං, යථා ආරෝග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛේමන්තභූමිං එවමේව ඛෝ බ්‍රාහ්මණ භික්ඛු ඉමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සති.

69. පින්වත් බ්‍රාහ්මණය, අන්න ඒ විදිහම යි. භික්ෂුවත් (කලින්) ණයක් ගත්තා වගේ, ලෙඩ වුණා වගේ, හිරේවිලංගුවේ වැටුනා වගේ, වහල්බවට පත් වුණා වගේ, නිරුදක කතරකට පැමිණුනා වගේ මේ පංච නීවරණයන් ප්‍රහාණය නොවී තමා තුළ පවතින හැටි දකිනවා. නමුත් පින්වත් බ්‍රාහ්මණය, ඒ ණය ගෙවා දමා ණය රහිත වුණා වගේ, රෝගයෙන් නිදහස් වෙලා නීරෝග වුණා වගේ, වියදම් නැතුව හිරෙන් නිදහස් වුණා වගේ, දාසබවෙන් නිදහස් වුණා වගේ, නිරුදක කතර ගෙවා ආරක්ෂා සහිත ක්ෂේම භූමියකට පැමිණුනා වගේ තමයි. පින්වත් බ්‍රාහ්මණය, අන්න ඒ විදිහමයි භික්ෂුව තමා තුළ මේ පංච නීවරණයන් දුරුවී ඇති ආකාරයත් දකින්නේ.

70. තස්සිමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සතෝ පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායෝ පස්සම්භති. පස්සද්ධකායෝ සුඛං වේදේති. සුඛිනෝ චිත්තං සමාධියති.

70. ඔහුට මේ පඤ්ච නීවරණයන් තමා තුළ නැති බව දකිද්දි මහත් සතුටක් ඇති වෙනවා. ඒ ප්‍රමුදිත වීම ඇති කෙනාට ප්‍රීතිය ඇති වෙනවා. ප්‍රීති මනසක් ඇති කෙනා ගේ කය සංසිඳෙනවා. සංසිඳුනු කයින් යුතු ව සැපක් විඳිනවා. සැප ඇති කෙනා ගේ සිත සමාධිමත් වෙනවා.

71. සෝ විවි-ච-ව කාමේහි විවි-ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

71. ඔහු කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් හට ගත් ප්‍රීති සුඛය ඇති පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින්

පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

72. සෙය්‍යථාපි බ්‍රාහ්මණ දක්ඛෝ නහාපකෝ වා නහාපකන්තේවාසී වා කංසථාලේ නහානීයචුණ්ණානි ආකිරිත්වා උදකේන පරිප්ඵෝසකං පරිප්ඵෝසකං සන්නෙය්‍ය සායං නහානීයපිණ්ඩි සේනාහානුගතා සේනාහපරේතා සන්තරබාහිර ඵුටා සේනහේන න ච පග්ඝරණි.

72. පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. (රජවරුන් ආදී පිරිස් නහවන) දක්ෂ නහවන්නෙක් හෝ නහවන කෙනෙකු ගේ ගෝලයෙක් ඉන්නවා. ඔහු ලෝහ බඳුනක නාන සුණු විසුරුවනවා. ඊට පස්සේ දිය ඉස ඉස පිඬු කරනවා. එතකොට ඒ නානසුණු පිඬට අර වතුර කාවදිනවා. හොඳින් තෙත් වෙනවා. ඒ නහන පිඬ ඇතුළත පිටත සෑම තැන ම හොඳින් දිය පැතිරිලා තියෙනවා. පිටතට වැගිරෙන්නෙත් නෑ.

එවමේව ඛෝ බ්‍රාහ්මණ භික්ඛු ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති. අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤේ පුරිමේහි යඤ්ඤේහි අප්පටිඨතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ ච.

පින්වත් බ්‍රාහ්මණය, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ. පින්වත් බ්‍රාහ්මණය කලින් කියන ලද යාගයන්ට වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය නම් මෙය යි.

73. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසෝ ඒකෝදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්නේති පරිසන්නේති පූරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

73. පින්වත් බ්‍රාහ්මණය, තව දුරටත් කියනවා නම් භික්ෂුව විතක්ක විචාරයන් ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්මිකව පැහැදීම ඇතිව සිතෙහි මනා එකඟ

බවෙන් යුතු ව විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් හටගත්, ප්‍රීති සුඛය ඇති දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිසුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

74. සෙය්‍යථාපි බ්‍රාහ්මණ උදකරහදෝ ගම්භීරෝ උබ්භිදෝදකෝ, නස්ස නේවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, දේවෝ ච න කාලේන කාලං සම්මා ධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, අථ ඛෝ තම්හා ව උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමේව උදකරහදං සීතේන වාරිනා අභිසන්නෙය්‍ය පරිසන්නෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතෝ උදකරහදස්ස සීතේන වාරිනා අප්ඵුටං අස්ස.

74. පින්වත් බ්‍රාහ්මණය, එක මේ වගේ දෙයක්. යට දිය උල්පත්වලින් වතුර ගලන ගැඹුරු විලක් තියෙනවා. හැබැයි ඒ විලට නැගෙනහිර පැත්තෙන් වතුර එන මගක් නෑ. දකුණු පැත්තෙන් වතුර එන මගක් නෑ. බටහිර පැත්තෙන් වතුර එන මගක් නෑ. උතුරු පැත්තෙන් වතුර එන මගක් නෑ. වැස්සත් කලින් කලට පිළිවෙලකට වහින්නේ නෑ. එතකොට ඒ විලෙන් ම සීතල දියදහරා උල්පත්වලින් උඩට මතු වෙවී ඒ විල ම සීතල ජලයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. වතුරෙන් පුරවනවා. හොඳින් පුරවනවා. ඒ මුළු විලේ ම සිහිල් ජලයෙන් පහස නො ලැබූ කිසි තැනක් නෑ.

එවමේව ඛෝ බ්‍රාහ්මණ භික්ඛු ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති. අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤේ පුරිමේහි යඤ්ඤේහි අප්පටිඨතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ ච.

පින්වත් බ්‍රාහ්මණය, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිසුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. පින්වත් බ්‍රාහ්මණය, කලින් කියන ලද යාගයන්ට වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය නම් මෙය යි.

75. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති සතෝ සම්පජානෝ සුඛඤ්ච කායේන පටිසංවේදේති. යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති.

75. පින්වත් බ්‍රාහ්මණය, තව දුරටත් කියනවා නම් භික්ෂුව ප්‍රීතියට ද නො ඇලීමෙන් උපේක්ෂාවෙන් යුතුව වාසය කරනවා. සිහියෙන් නුවණින් යුතු ව කයෙන් සැපයක් ද විඳිනවා. ආර්යයන් වහන්සේලා යම් ධ්‍යානයකට උපේක්ෂා සහගත සිහිය ඇති සැප විහරණය යැයි පවසනවා ද, ඒ තුන්වන ධ්‍යානයත් උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

76. සෙය්‍යථාපි බ්‍රාහ්මණ උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පේක-චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකේ ජාතානි උදකේ සංවද්ධානි උදකානුග්ගතානි අන්තෝනිමුග්ගපෝසීනි තානි යාව චග්ගා යාව ච මූලා සීතේන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි, පරිප්ඵුටානි නාස්සා කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතේන වාරිනා අප්ඵුටං අස්ස.

76. පින්වත් බ්‍රාහ්මණය, එක මේ වගේ දෙයක්. මහනෙල් විලක හෝ රතු නෙළුම් විලක හෝ සුදු නෙළුම් විලක හෝ ඇතැම් මහනෙල් වේවා, රතු නෙළුම් වේවා, සුදු නෙළුම් වේවා ඒ නෙළුම් ජලයේ ම යි හට ගන්නේ. ජලයේ ම යි වැඩෙන්නේ. නමුත් ජලයෙන් උඩට ඇවිත් නෑ. ජලය තුළ ම ගිලී වැඩෙනවා. එතකොට ඒ නෙළුම් අග දක්වාත් මුල දක්වාත් සීතල දියෙන් හොඳට තෙත් වෙලා තියෙන්නේ. මුළුමණින් ම තෙත් වෙලා තියෙන්නේ. පිරිල තියෙන්නේ. හැම තැන ම පැතිරිලා තියෙන්නේ. ඒ සෑම මහනෙල්වල, රතුනෙළුම්වල, සුදුනෙළුම්වල සීතල දිය නො පැතුරුණු කිසි තැනක් නෑ.

ඒවමේව ඛෝ බ්‍රාහ්මණ භික්ඛු ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති. අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤේ

පුරිමේහි යඤ්ඤේහි අප්පටිඨතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ ච.

පින්වත් බ්‍රාහ්මණය, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ. පින්වත් බ්‍රාහ්මණය කලින් කියන ලද යාගයන්ට වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය නම් මෙය යි.

77. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බේව සෝමනස්සදෝමනස්සානං අත්ථගමා අදුක්ඛමසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති.

77. පින්වත් බ්‍රාහ්මණය, නැවතත් කියනවා නම් භික්ෂුව සැපය ද ප්‍රහාණය කිරීමෙන්, දුක ද ප්‍රහාණය කිරීමෙන් කලින් ම සොම්නස් දොම්නස් දෙක ඉක්ම යෑමෙන් දුක් සැප රහිත වූ පාරිශුද්ධ උපේක්ෂා සහගත සතිය ඇති සතර වෙනි ධ්‍යානය උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

78. සෙය්‍යථාපි බ්‍රාහ්මණ පුරිසෝ විදාතේන වත්ථේන සසීසං පාරුපිත්වා නිසින්නෝ අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විදාතේන වත්ථේන අප්ඵුටං. අස්ස, ඒවමේව ඛෝ බ්‍රාහ්මණ භික්ඛු ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති. අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤෝ පුරිමේහි යඤ්ඤේහි අප්පටිඨතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ ච.

78. පින්වත් බ්‍රාහ්මණය, එක මේ වගේ දෙයක්. සුදු වස්ත්‍රයකින් හිස සහිතව මුළු සිරුර ම පොරොවාගෙන වාඩි වී සිටින කෙනෙක් ඉන්නවා. එතකොට ඔහු ගේ මුළු කයෙහි ම සුදු වස්ත්‍රයෙන් නොවැසුණු කිසි තැනක් නෑ. පින්වත් මහාරාජ, අන්න ඒ වගේ ම යි භික්ෂුව මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි

පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ. පින්වත් බ්‍රාහ්මණය, කලින් කියන ලද යාගයන්ට වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය නම් මෙය යි.

79. **සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ එවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතාපෙත්තිකසම්භවෝ විදනකුම්මාසූපචයෝ අනි-චු-ඡාදනපරිමද්දනභේදනවිද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති.**

79. ඒ භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් වෑංජන ආදියෙන් වැඩුණු, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි.

80. **සෙය්‍යථාපි බ්‍රාහ්මණ, මණි වේළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ සබ්බාකාරසම්පන්නෝ, තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා විදානං වා පණ්ඩුසුත්තං වා. තමේනං චක්ඛුමා පුරිසෝ හත්ථේ කරිත්වා ප-ච්චවෙක්ඛෙය්‍ය "අයං ඛෝ මණි වේළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ, අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ සබ්බාකාරසම්පන්නෝ, තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා විදානං වා පණ්ඩුසුත්තං වා"ති.**

80. පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. වෛරෝඩි මාණික්‍යයක් තියෙනවා. හරි ලස්සනට පහළ වුණ දෙයක්. අටපට්ටම්. හොඳින් ඔපමට්ටම්, ඉතාමත් හොඳ යි. ඉතාම ප්‍රසන්න යි. පිවිතුරු යි. මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. ඉතින් ඔය මැණික තුළ නිල් වේවා, රන්වන් වේවා, රතු වේවා, සුදු වේවා, පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා. එතකොට

ඇස් ඇති පුරුෂයෙක් මැණික අතට ගෙන හොඳින් විමසා බලනවා. "මේ වෛරෝඩි මැණික හරි ලස්සනට පහළ වුණ දෙයක්. අටපට්ටම්. හොඳින් ඔපමට්ටම්, ඉතාමත් හොඳ යි. ඉතාම ප්‍රසන්න යි. පිවිතුරු යි. මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. මේ මැණික තුළ නිල් වේවා, රන්වන් වේවා, රතු වේවා, සුදු වේවා, පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා" කියලා.

එවමේව ඛෝ බ්‍රාහ්මණ, භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ එවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතා-පෙත්තිකසම්භවෝ විදනකුම්මාසූපචයෝ අනි-චු-ඡාදනපරිමද්දනභේදන-විද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති. අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤේ හි පුරිමේහි යඤ්ඤේහි අප්පටිඨතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ ච.

පින්වත් බ්‍රාහ්මණය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් ව්‍යංජන ආදියෙන් වැඩුණ, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි" කියල. පින්වත් බ්‍රාහ්මණය, කලින් කියන ලද යාගයන්ට වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය නම් මෙය යි.

81. **සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගප-චංගියා අහීනින්ද්‍රියං,**

81. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අහපසහ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා.

සෙය්‍යථාපි බ්‍රාහ්මණ පුරිසෝ මුඤ්ජම්හා ඊසිකං පබ්බාහෙය්‍ය. තස්ස ඒවමස්ස: "අයං මුඤ්ජෝ, අයං ඊසිකා අඤ්ඤෝ මුඤ්ජෝ, අඤ්ඤා ඊසිකා. මුඤ්ජම්හා ත්වේව ඊසිකා පබ්බාළ්හා"ති.

පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් මුඤ්ජතණ ගසෙන් තණ ගොබය ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. මේ මුඤ්ජතණ ගස යි, මේ තණ ගොබය යි. එතකොට මුඤ්ජතණ ගස වෙන එකක්. තණ ගොබය වෙන එකක්. නමුත් මුඤ්ජතණ ගසෙන් ම යි තණ ගොබය ඇදල ගත්තේ කියලා.

සෙය්‍යථාපි වා පන බ්‍රාහ්මණ පුරිසෝ අසිං කෝසියා පබ්බාහෙය්‍ය, තස්ස ඒවමස්ස "අයං අසි, අයං කෝසි, අඤ්ඤෝ අසි, අඤ්ඤා කෝසි, කෝසියාත්වේව අසි පබ්බාළ්හෝ"ති.

පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් කොපුවෙන් කඩුවක් ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ කඩුව යි. මේ කොපුව. එතකොට කඩුව අනෙකක්, කොපුව අනෙකක්. නමුත් කොපුවෙන් තමයි කඩුව ඇදල ගත්තේ" කියලා.

සෙය්‍යථාපි වා පන බ්‍රාහ්මණ පුරිසෝ අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස ඒවමස්ස: අයං අහි, අයං කරණ්ඩෝ, අඤ්ඤෝ අහි, අඤ්ඤේ කරණ්ඩෝ, කරණ්ඩා ත්වේව අහි උබ්භතෝ"ති.

පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් නයි පෙට්ටියෙන් නයෙකුව ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ තමයි නයා. මේක නයිපෙට්ටිය. එතකොට නයා අනෙකෙක්. නයි පෙට්ටිය අනෙකක්. නමුත් නයි පෙට්ටියෙන් තමයි නයාව ඇදල ගත්තේ" කියලා.

එවමේව ඛෝ බ්‍රාහ්මණ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගපච්චංගිං අහීනින්ද්‍රියං. අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤේ පුරිමේහි යඤ්ඤේහි අප්පට්ඨතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ ච.

පින්වත් බ්‍රාහ්මණය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අඟපසඟ ඇති, නො පිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා. පින්වත් බ්‍රාහ්මණය, කලින් කියන ලද යාගයන්ට වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය නම් මෙය යි.

82. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝ'පි හුත්වා බහුධා හෝති, බහුධා'පි හුත්වා ඒකෝ හෝති, ආවීභාවං තිරෝභාවං තිරෝකුඩ්ඩං තිරෝපාකාරං තිරෝපබ්බතං අසජ්ජමානෝ ග-ඡති සෙය්‍යථාපි ආකාසේ, පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරෝති සෙය්‍යථාපි උදකේ, උදකේපි අභිජ්ජමානේ ග-ඡති සෙය්‍යථාපි පඨවියං, ආකාසේති පල්ලංකේන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණෝ, ඉමේ'පි චන්දිමසූරියේ ඒවං මහිද්ධිකේ ඒවං මහානුභාවේ පාණිනා පරිමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලෝකා'පි කායේන වසං වත්තේති.

82. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි. එයට සිත නතු කරයි. තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. පෙනෙන්ට සළස්වනවා. නො පෙනී

යනවා. බිත්තිය විනිවිද, ප්‍රාකාරය විනිවිද, පර්වතය විනිවිද කිසිවක් හා නොා ගැටී, අහසේ යන්නාක් මෙන් යනවා. ජලයේ වගේ පොළොවෙහි කිදාබැසීමත්, උඩට මතුවීමත් කරනවා. පොළොව මතුපිට වගේ ජලය මත නොා ගිලී ඇවිද යනවා. අහසෙහි පියාසරණ කුරුල්ලන් පරිද්දෙන් පළඟක් බැඳ ගෙන අහසේ යනවා. මේසා මහත් ඉර්ධි ඇති, මහානුභාව ඇති හිරු සඳු පවා අතින් අල්ලනවා. පිරිමඳිනවා. බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා.

සෙය්‍යථාපි බ්‍රාහ්මණ දක්ඛෝ කුම්භකාරෝ වා කුම්භකාරන්තේවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදේව භාජනවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය.

පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ මැටිටෙන් යම් ම ආකාරයේ භාජනයක් හදන්ට කැමැති නම්, ඒ ඒ ආකාරයේ බඳුන් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා.

සෙය්‍යථාපි වා පන බ්‍රාහ්මණ දක්ඛෝ දන්තකාරෝ වා දන්තකාරන්තේවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදේව දන්තවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය.

පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. දක්ෂ ඇත්දත් කැටයම්කරුවෙක් හෝ ඇත්දත් කැටයම්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ ඇත්දතක යම් ම ආකාරයේ ඇත් දළ කැටයමක් කරන්ට කැමති නම්, ඒ ඒ ආකාරයේ ඇත් දළ කැටයම් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා.

සෙය්‍යථාපි වා පන බ්‍රාහ්මණ දක්ඛෝ සුවණ්ණකාරෝ වා සුවණ්ණකාරන්තේවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදේව සුවණ්ණවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය;

පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. දක්ෂ රන් කැටයම්කරුවෙක් හෝ රන් කැටයම්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ රනක යම් ම ආකාරයේ රන් කැටයමක් කරන්ට කැමති නම්, ඒ ඒ ආකාරයේ රන් කැටයම් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා.

එවමේව ඛෝ බ්‍රාහ්මණ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝ'පි හුත්වා බහුධා හෝති, බහුධා'පි හුත්වා ඒකෝ හෝති, ආවිභාවං තිරෝභාවං තිරෝකුඩ්ඩං තිරෝපාකාරං තිරෝපබ්බතං අසජ්ජමානෝ ග-ඡති සෙය්‍යථාපි ආකාසේ, පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරෝති සෙය්‍යථාපි උදකේ, උදකේපි අභිජ්ජමානේ ග-ඡති සෙය්‍යථාපි පඨවියං, ආකාසේපි පල්ලංකේන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණෝ, ඉමේපි චන්දිමසුරියේ ඒවං මහිද්ධිකේ ඒවං මහානුභාවේ පාණිනා පරාමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලෝකා'පි කායේන වසං වත්තේති. අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤේ පුරිමේහි යඤ්ඤේහි අප්පට්ඨතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ ච.

පින්වත් බ්‍රාහ්මණය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි. එයට සිත නතු කරයි. තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. පෙනෙන්ට සළස්වනවා. නො පෙනී යනවා. බිත්තිය විනිවිද, ප්‍රාකාරය විනිවිද, පර්වතය විනිවිද කිසිවක් හා නො ගැටී, අහසේ යන්නාක් මෙන් යනවා. ජලයේ වගේ පොළොවෙහි කිඳාබැසීමත්, උඩට මතුවීමත් කරනවා. පොළොව මතුපිට වගේ ජලය මත නො ගිලී ඇවිද යනවා. අහසෙහි පියාසරණ කුරුල්ලන් පරිද්දෙන් පළඟක් බැඳ ගෙන අහසේ යනවා. මේසා මහත් ඉර්ධි ඇති, මහානුභාව ඇති හිරු සඳු පවා අතින් අල්ලනවා. පිරිමඳිනවා. බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා. පින්වත් බ්‍රාහ්මණය, කලින් කියන ලද යාගයන්ට වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය නම් මෙය යි.

83. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බාය සෝතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච.

83. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා. එයට සිත නතු කරනවා. එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා.

84. **සෙය්‍යථාපි බ්‍රාහ්මණ පුරිසෝ අද්ධානමග්ගපටිපන්නෝ සෝ සුණෙය්‍ය භේරිසද්දම්'පි මුදිංගසද්දම්'පි සංඛපණවදෙණ්ඩිමසද්දම්'පි, තස්ස ඒවමස්ස: "භේරිසද්දෝ ඉති'පි මුදිංගසද්දෝ ඉති'පි සංඛපණවදෙණ්ඩිමසද්දෝ ඉති'පි."**

84. පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. දුගු ගමනකට පිළිපන් පුරුෂයෙක් ඉන්නවා. ඔහු බෙර හඬත්, මිහිඟු බෙර හඬත්, සක්, පනා බෙර, ගැට බෙර හඬත් අසනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක බෙර හඬක්, මේ තමයි මිහිඟු බෙර හඬ, මේක සක් හඬ, මේක පනා බෙර හඬ, මේක ගැට බෙර හඬ" කියලා.

ඒවමේව ඛෝ බ්‍රාහ්මණ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බාය සෝතධාතුයා විසුද්ධාය අතික්කන්ත-මානුසිකාය උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච. අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤේ පුරිමේහි යඤ්ඤේහි අප්පටිඨතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ ච.

පින්වත් බ්‍රාහ්මණය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා. එයට සිත නතු කරනවා. එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා. පින්වත් බ්‍රාහ්මණය, කලින් කියන ලද යාගයන්ට වඩා වැඩකටයුතු අඩු

උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය නම් මෙය යි.

85. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉ-තෝපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ පරසත්තානං පරපුග්ගලානං ඉ-තසා ඉ-තෝ පරි-ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති, වීතදෝසං වා චිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති, සමෝහං වා චිත්තං සමෝහං චිත්තන්ති පජානාති, වීතමෝහං වා චිත්තං වීතමෝහං චිත්තන්ති පජානාති, සංඛිත්තං වා චිත්තං සංඛිත්තං චිත්තන්ති පජානාති, වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති, මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති, සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති, අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති, සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති, අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති, විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

85. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, අනුන් ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා. රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. රාග රහිත සිත වීතරාගී සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ රහිත සිත වීතදෝසී සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ සහිත සිත මෝහ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ රහිත සිත වීතමෝහී සිතක් වශයෙන් දැන ගන්නවා. හැකුළුනු සිත හැකිළුණු සිතක් වශයෙන් දැන ගන්නවා. විසිරුණු සිත විසිරුණු සිතක් වශයෙන් දැන ගන්නවා. සමාධිමත් සිත සමාධිමත් සිතක් වශයෙන් දැන ගන්නවා. සමාධි රහිත සිත සමාධි රහිත සිතක් වශයෙන් දැන ගන්නවා. නො දියුණු සිත නො දියුණු සිතක් වශයෙන්

දැන ගන්නවා. දියුණු සිත දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා. එකඟ වෙන සිත එකඟ වෙන සිතක් වශයෙන් දැන ගන්නවා. එකඟ නොවෙන සිත එකඟ නොවෙන සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් මිදුණු සිත කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් නොමිදුණු සිත කෙලෙසුන්ගෙන් නොමිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා.

86. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, ඉත්ථී වා පුරිසෝ වා දහරෝ වා යුවා මණ්ඩනකජාතිකෝ ආදාසේ වා පරිසුද්ධේ පරියෝදාතේ අ-ඡේ වා උදකපත්තේ සකං මුඛනිමිත්තං ප-ච්චවෙක්ඛමානෝ සකණිකං වා සකණිකන්ති ජානෙය්‍ය, අකණිකංවා අකණිකන්ති ජානෙය්‍ය.

86. පින්වත් බ්‍රාහ්මණය, එක මේ වගේ දෙයක්. ලස්සනට සැරසෙන්ට කැමති ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දරුවෙක් හෝ තරුණයෙක් හෝ ඉන්නවා. ඔහු පිරිසිදු දීප්තිමත් කණ්ණාඩියක් ඉදිරියේ හෝ පැහැදිලි දිය ඇති බඳුනකින් හෝ තමන් ගේ මුව මඩල හොඳින් විමසා බලනවා. එතකොට දොස් ඇති තැන දොස් ඇති තැන වශයෙන් දැන ගන්නවා. දොස් නැති තැන දොස් නැති තැන වශයෙන් දැන ගන්නවා.

එවමේව ඛෝ බ්‍රාහ්මණ, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ෙ-තෝපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති.

පින්වත් බ්‍රාහ්මණය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අනුන් ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි.

සෝ පරසත්තානං පරපුග්ගලානං ෙ-තසා ෙ-තෝ පරි-ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති, වීතදෝසං වා චිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති, සමෝහං වා චිත්තං සමෝහං චිත්තන්ති පජානාති, වීතමෝහං වා චිත්තං වීතමෝහං චිත්තන්ති පජානාති, සංඛිත්තං වා චිත්තං ..... වික්ඛිත්තං වා චිත්තං ..... මහග්ගතං වා චිත්තං ..... අමහග්ගතං වා චිත්තං

..... සඋත්තරං වා චිත්තං ..... අනුත්තරං වා චිත්තං ..... සමාහිතං වා චිත්තං ..... අසමාහිතං වා චිත්තං ..... විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති. අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤේ පුරිමේහි යඤ්ඤේහි අප්පටිඨතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ ච.

එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා. රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. රාග රහිත සිත වීතරාගී සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ රහිත සිත වීතදෝසී සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ සහිත සිත මෝහ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ රහිත සිත වීතමෝහී සිතක් වශයෙන් දැන ගන්නවා. හැකුළුනු සිත ..... විසිරුණු සිත ..... සමාධිමත් සිත ..... සමාධි රහිත සිත ..... නො දියුණු සිත ..... දියුණු සිත ..... එකඟ වෙන සිත ..... එකඟ නො වෙන සිත ..... කෙලෙසුන්ගෙන් මිදුණු සිත කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. පින්වත් බ්‍රාහ්මණය, කලින් කියන ලද යාගයන්ට වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය නම් මෙය යි.

87. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යාථීදං: ඒකම්'පි ජාතිං, ද්වේ'පි ජාතියෝ, තිස්සෝ'පි ජාතියෝ, චතස්සෝ'පි ජාතියෝ, පඤ්ච'පි ජාතියෝ, දස'පි ජාතියෝ, වීසම්පි ජාතියෝ, තිංසම්පි ජාතියෝ, චත්තාරීසම්පි ජාතියෝ, පඤ්ඤාසම්පි ජාතියෝ, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනේකේ'පි සංවට්ටකප්පේ, අනේකේ'පි විවට්ටකප්පේ, අනේකේ'පි සංවට්ටවිවට්ටකප්පේ, අමුත්‍රාසිං ඒවන්නාමෝ ඒවං ගොත්තෝ ඒවං වණ්ණෝ ඒවමාහාරෝ ඒවං සුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං ඒවන්නාමෝ ඒවං ගොත්තෝ ඒවං වණ්ණෝ

ඒවමාහාරෝ ඒවං සුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති.

87. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. ඉතින් ඔහු නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක්, ජීවිත දෙකක්, ජීවිත තුනක්, ජීවිත හතරක්, ජීවිත පහක්, ජීවිත දහයක්, ජීවිත විස්සක්, ජීවිත තිහක්, ජීවිත හතළිහක්, ජීවිත පනහක්, ජීවිත සියයක්, ජීවිත දහසක්, ජීවිත ලක්ෂයක්; අනේකවිධ වූ සංවට්ට කල්පයන් ද, අනේකවිධ වූ විවට්ට කල්පයන් ද, අනේකවිධ වූ සංවට්ට විවට්ට කල්පයන් ද සිහි කරනවා. මං ඉස්සර සිටියේ අසවල් තැන, එතකොට මගේ නම මේක යි. ගෝත්‍ර නාමය මේක යි. හැඩරුව මෙහෙම යි. කෑම බීම මෙහෙම යි. දුක් සැප වින්දේ මේ විදිහට යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. ඒ මං එතැනින් චුත වුණා. අසවල් තැන උපන්නා. එතකොට මගේ නම වුණේ මේක යි. ගෝත්‍රනාමය මේක යි. හැඩරුව වුණේ මෙහෙමයි. කෑවේ බිව්වේ මෙහෙම යි. සැප දුක් වින්දේ මෙහෙම යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. මං එතැනින් චුත වුණා. මේ ලෝකෙ උපන්නා" ආදී වශයෙන් ආකාර සහිතව සවිස්තරව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා.

88. සෙය්‍යථාපි බ්‍රාහ්මණ පුරිසෝ සකම්හා ගාමා අඤ්ඤං ගාමං ග-ඡෙය්‍ය තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ග-ඡෙය්‍ය. සෝ තම්හා ගාමා සකඤ්ඤේව ගාමං ප-චාග-ඡෙය්‍ය. තස්ස ඒවමස්ස: "අහං බෝ සකම්හා ගාමං අමුං ගාමං ආග-ඡිං. තත්‍ර ඒවං අට්ඨාසිං ඒවං නිසීදිං ඒවං අභාසිං ඒවං තුණ්හී අහෝසිං. තම්හාපි ගාමා අමුං ගාමං අග-ඡිං. තත්‍රාපි ඒවං අට්ඨාසිං ඒවං නිසීදිං ඒවං අභාසිං ඒවං තුණ්හී අහෝසිං. සෝ'ම්හි තම්හා ගාමා සකඤ්ඤේව ගාමං ප-චාගතෝ"ති.

88. පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමන් ගේ ගමෙන් වෙනත් ගමකට යනවා. ඒ ගමෙන් තවත් ගමකට යනවා. ඒ ගමෙන් යළි තමන් ගේ ගමට එනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. මං මගේ

ගමෙන් අසවල් ගමට ගියා. මං එහෙදී මෙහෙමයි හිටියේ. මෙහෙමයි වාඩි වුණේ. මෙහෙමයි කතාබහ කළේ. මෙහෙමයි නිශ්ශබ්දව සිටියේ. ඉතින් මං ඒ ගමෙනුත් අසවල් ගමට ගියා. එහෙ හිටියේ මේ විදිහට යි. වාඩි වුණේ මේ විදිහට යි. කථාබස් කළේ මේ විදිහට යි. නිහඬව සිටියේ මේ විදිහට යි. ඒ මං ඒ ගමෙන් මගේ ගමටම නැවත ආවා" කියලා.

එවමේව ඛෝ බ්‍රාහ්මණ, භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: ඒකම්'පි ජාතිං, ද්වේ'පි ජාතියෝ, තිස්සෝ'පි ජාතියෝ, චතස්සෝ'පි ජාතියෝ, පඤ්ච'පි ජාතියෝ, දස'පි ජාතියෝ, වීසම්පි ජාතියෝ, තිංසම්පි ජාතියෝ, චත්තාරීසම්පි ජාතියෝ, පඤ්ඤාසම්පි ජාතියෝ, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනේකේ'පි සංවට්ටකප්පේ, අනේකේ'පි විවට්ටකප්පේ, අනේකේ'පි සංවට්ටවිවට්ටකප්පේ, අමුත්‍රාසිං ඒවන්නාමෝ ඒවං ගොත්තෝ ඒවං වණ්ණෝ ඒවමාහාරෝ ඒවං සුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං ඒවන්නාමෝ ඒවං ගොත්තෝ ඒවං වණ්ණෝ ඒවමාහාරෝ ඒවං සුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝත්ති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති. අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤේ වා පුරිමේහි යඤ්ඤේහි අප්පට්ඨතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ ච.

පින්වත් බ්‍රාහ්මණය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. ඉතින් ඔහු නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක්, ජීවිත දෙකක්, ජීවිත තුනක්, ජීවිත හතරක්, ජීවිත පහක්, ජීවිත දහයක්, ජීවිත විස්සක්, ජීවිත තිහක්, ජීවිත හතළිහක්, ජීවිත පනහක්, ජීවිත සියයක්, ජීවිත දහසක්, ජීවිත ලක්ෂයක්, අනේකවිධ වූ සංවට්ට කල්පයන් ද, අනේකවිධ වූ විවට්ට කල්පයන් ද, අනේකවිධ වූ සංවට්ට විවට්ට කල්පයන් ද සිහි කරනවා. මං ඉස්සර සිටියේ අසවල් තැන, එතකොට මගේ නම මේක යි. ගෝත්‍ර නාමය මේක යි. හැඩරුව

මෙහෙම යි. කෑම බීම මෙහෙම යි. දුක් සැප වින්දේ මේ විදිහට යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. ඒ මං එතැනින් චුත වුණා. අසවල් තැන උපන්නා. එතකොට මගේ නම වුණේ මේක යි. ගෝත්‍රනාමය මේක යි. හැඩරුව වුණේ මෙහෙමයි. කෑවේ බිව්වේ මෙහෙම යි. සැප දුක් වින්දේ මෙහෙම යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. මං එතැනින් චුත වුණා. මේ ලෝකෙ උපන්නා" ආදී වශයෙන් ආකාර සහිතව සවිස්තරව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා. පින්වත් බ්‍රාහ්මණය කලින් කියන ලද යාගයන්ට වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය නම් මෙය යි.

89. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානති: ඉමේ වත භොන්තෝ සත්තා කායදු-චරිතේන සමන්නාගතා, වචිදු-චරිතේන සමන්නාගතා, මනෝදු-චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මි-ඡාදිට්ඨිකා, මි-ඡාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමේ වා පන භොන්තෝ සත්තා කායසුචරිතේන සමන්නාගතා, වචිසුචරිතේන සමන්නාගතා, මනෝසුචරිතේන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නාති. ඉති දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උප්පජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති.

89. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා. එයට සිත නතු කරනවා. එතකොට ඒ භික්ෂුව මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල

සිටින්නා වූ සත්වයන් දකිනවා. "අහෝ! මේ භවත් සත්වයන් කයින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, මනසින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයේ ඉපදිලා ඉන්නවා. ඒ වගේ ම මේ භවත් සත්වයන් කයින් සුචරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් සුචරිතයෙහි යෙදීම නිසා, මනසින් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නො කොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ සුගති නම් වූ, ස්වර්ග ලෝකයෙහි ඉපදිලා ඉන්නවා" කියලා. මේ විදිහට මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා.

90. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, මජ්ඣෙඩි සිංඝාටකේ පාසාදෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ ඨිතෝ පස්සෙය්‍ය මනුස්සේ ගේහං පවිසන්තේ'පි නික්ඛමන්තේ'පි රථියා වීතිසඤ්චරන්තේ'පි මජ්ඣෙඩි සිංඝාටකේ නිසින්නේ'පි, තස්ස එවමස්ස: එතේ මනුස්සා ගේහං පවිසන්ති. එතේ නික්ඛමන්ති. එතේ රථියා වීතිසඤ්චරන්ති. එතේ මජ්ඣෙඩි සිංඝාටිකේ නිසින්නාති.

90. පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. හතරමං හන්දියක තට්ටු නිවසක් තියෙනවා. එහි ඇස් ඇති පුරුෂයෙක් සිටගෙන බලාගෙන ඉන්නවා. ඔහු (පහළ) ගෙට ඇතුළ් වන්නා වූත්, නික්මෙන්නා වූත්, වීදියේ එහාට මෙහාට ඇවිදින්නා වූත්, හතරමං හන්දිය මැද වාඩි වී සිටින්නා වූත් මිනිසුන් දකිනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා "මේ මිනිසුන් ගෙට ඇතුළු වෙනවා. මේ උදවිය ගෙයින් නික්මෙනවා. මේ උදවිය වීදියේ එහාට මෙහාට ඇවිදිනවා. මේ උදවිය හතරමං හන්දිය මැද වාඩි වෙලා ඉන්නවා" කියලා.

එවමේව ඛෝ බ්‍රාහ්මණ භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානති: ඉමේ වත භොන්තෝ සත්තා කායදු-චරිතේන සමන්නාගතා, වචිදු-චරිතේන සමන්නාගතා,

මනෝදු-චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මි-ඡාදිට්ඨිකා, මි-ඡාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.

පින්වත් බ්‍රාහ්මණය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වින්‍යෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා. එයට සිත නතු කරනවා. එතකොට ඒ භික්ෂුව මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිව්‍යැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. “අහෝ! මේ භවත් සත්වයන් කයින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, මනසින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයේ ඉපදිලා ඉන්නවා.

ඉමේ වා පන හොන්තෝ සත්තා කායසුචරිතේන සමන්නාගතා, වචීසුචරිතේන සමන්නාගතා, මනෝසුචරිතේන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නාති. ඉති දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති. අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤෝ පුරිමේහි යඤ්ඤේහි අප්පට්ඨතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ ච.

ඒ වගේ ම මේ භවත් සත්වයන් කයින් සුචරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් සුචරිතයෙහි යෙදීම නිසා, මනසින් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නොකොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ සුගති නම් වූ, ස්වර්ග ලෝකයෙහි ඉපදිලා ඉන්නවා” කියලා. මේ විදිහට මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිව්‍යැසින් චුත වන්නා වූත්,

උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. පින්වත් බ්‍රාහ්මණය, කලින් කියන ලද යාගයන්ට වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය නම් මෙය යි.

91. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමේ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. තස්ස ඒවං ජානතෝ ඒවං පස්සතෝ කාමාසවා'පි චිත්තං විමු-චති භවාසවා'පි චිත්තං විමු-චති. අවිජ්ජාසවා'පි චිත්තං විමු-චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

91. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා. එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මේවා ආශ්‍රවයන් කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රවයන් ගේ හට ගැනීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස්

වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස් වුණ බවට ඤාණය ඇති වෙනවා. "ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා.

92. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, පබ්බතසංඛේපේ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ තීරේ ඨිතෝ පස්සෙය්‍ය සිප්පිසම්බුකම්'පි සක්ඛරකඨලම්'පි ම-ඡගුම්බම්'පි චරන්තම්'පි තිට්ඨන්තම්'පි. තස්ස ඒවමස්ස: අයං ඛෝ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්‍රිමේ සිප්පිසම්බුකා'පි සක්ඛරකඨලා'පි ම-ඡගුම්බා'පි චරන්ති'පි තිට්ඨන්තිපි'ති.

92. පින්වත් බ්‍රාහ්මණය, ඒක මේ වගේ දෙයක්. පර්වත මුදුනක ජලාශයක් තියෙනවා. එහි ජලය ඉතා හොඳ යි. හරිම ප්‍රසන්න යි. කැළඹිලා නෑ. එතැන ඇස් ඇති පුරුෂයෙක් ඒ ඉවුරේ සිටගෙන ජලාශය දෙස බලා සිටිනවා. එතකොට ඔහුට සිප්පිබෙල්ලනුත්, සක්බෙල්ලනුත්, කැටකැබලිත්, මාළු රංචු ආදියත් හැසිරෙන අයුරු, සිටින අයුරු දකින්ට ලැබෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක ඉතා හොඳ ජලය ඇති හරිම ප්‍රසන්න වූ නො කැළඹුණු දිය ඇති විලක්. මෙහි මේ සිප්පිබෙල්ලන්, සක්බෙල්ලන්, කැටකැබලිති, මාළු රංචුත් හැසිරෙනවා නෙව. ඉන්නවා නෙව" කියල.

ඒවමේව ඛෝ බ්‍රාහ්මණ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමේ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

පින්වත් බ්‍රාහ්මණය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වින්‍යෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත

එයට නතු කරනවා. එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මේවා ආශ්‍රවයන් කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රවයන් ගේ හට ගැනීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

තස්ස මේ එවං ජානතෝ එවං පස්සතෝ කාමාසවා'පි චිත්තං විමු-චති භවාසවා'පි චිත්තං විමු-චති. අවිජ්ජාසවා'පි චිත්තං විමු-චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස් වුණ බවට ඤාණය ඇති වෙනවා. "ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා.

අයං ඛෝ බ්‍රාහ්මණ යඤ්ඤෝ පුරිමේහි යඤ්ඤේහි අප්පටිඨතරෝ ච අප්පසමාරම්භතරෝ ච මහප්ඵලතරෝ ච මහානිසංසතරෝ ච. ඉමාය ච බ්‍රාහ්මණ යඤ්ඤසම්පදාය අඤ්ඤ යඤ්ඤසම්පදා උත්තරිතරා වා පණීතතරා වා නත්ථී"ති.

පින්වත් බ්‍රාහ්මණය කලින් කියන ලද යාගයන්ට වඩා වැඩකටයුතු අඩු උත්සාහයන් අඩු නමුත් මහත් ප්‍රතිඵල ඇති මහත් ආනිශංස ඇති යාගය නම් මෙය යි. පින්වත් බ්‍රාහ්මණය, මේ යාග සම්පතට වඩා උත්තරිතර හෝ ප්‍රණීතතර හෝ අන්‍ය වූ යාග සම්පතක් නම් නෑ.

93. එවං වුත්තේ කූටදන්තෝ බ්‍රාහ්මණෝ භගවන්තං එතදවෝචුං: "අභික්කන්තං හෝ ගෝතම අභික්කන්තං හෝ ගෝතම. සෙය්‍යථාපි හෝ ගෝතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටි-ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස

වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරේ වා තේල පජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තෝ රූපානි දක්ඛින්තීති. ඒවමේව භෝතා ගෝතමේන අනේකපරියායේන ධම්මෝ පකාසිතෝ. ඒසාහං භවන්තං ගෝතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. උපාසකං මං භවං ගෝතමෝ ධාරේතු අජ්ජතග්ගේ පාණුපේතං සරණං ගතං. ඒසාහං භෝ ගෝතම සත්ත ච උසභසතානි සත්ත ච වච්ඡතරසතානි, සත්ත ච වච්ඡතරීසතානි, සත්ත ච අජසතානි සත්ත ච උරබ්භසතානි මුඤ්චාමි, ජීවිතං දේමි. හරිතානි චේව තිණානි ඛාදන්තු සීතානි ච පානීයානි පිවන්තු සීතෝ ච නේසං වාතෝ උපවායතූති.

93. මෙසේ වදාළ විට කූටදන්ත බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළා. “භවත් ගෞතමයන් වහන්ස, ඉතා සුන්දර යි. භවත් ගෞතමයන් වහන්ස, ඉතා සුන්දර යි. යටට හරවා තිබූ දෙයක් උඩු අතට හැරෙව්වා වගෙයි. වහලා තිබුණු දෙයක් ඇරලා පෙන්නුවා වගෙයි. මං මුලා වූවන්ට නියම මග පෙන්වා දෙනවා වගෙයි. ඇස් ඇති උදවියට රූප දකින්න අඳුරෙහි තෙල් පහනක් දල්වා ගෙන දරා සිටිනවා වගෙයි. ඔය විදිහට භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ශ්‍රී සද්ධර්මය වදාළා. මේ මමත් භවත් ගෞතමයන් වහන්සේව සරණ යනවා. ශ්‍රී සද්ධර්මයත් ආර්ය මහා සංඝ රත්නයත් සරණ යනවා. භවත් ගෞතමයන් වහන්සේ, මං ගැන අද පටන් දිවි තිබෙන තුරාවට ම තෙරුවන් සරණ ගිය උපාසකයෙක් ලෙස සළකන සේක්වා! භවත් ගෞතමයන් වහන්ස, ඒ මං ලොකු ගවයන් හත්සිය දෙනාත්, ගොන්නාම්බන් හත්සිය දෙනාත්, නහඹු වැස්සියන් හත්සිය දෙනාත්, එළුවන් හත්සිය දෙනාත්, තරුණ බැටළුවන් හත්සිය දෙනාත් නිදහස් කරනවා. ජීවිතය දෙනවා. ඔවුන් නිල්තණ කත්වා. සිහිල් පැන් බොත්වා. ඔවුන්ට ද සිහිලැල් පවන් හමත්වා.

94. අථ ඛෝ භගවා කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස ආනුපුබ්බිකථං කථේසි සෙය්‍යථීදං? දානකථං සීලකථං සග්ගකථං කාමානං ආදීනවං විකාරං සංකිලේසං නෙක්ඛම්මේ ච ආනිසංසං පකාසේසි. යදා භගවා අඤ්ඤාසි කූටදන්තං බ්‍රාහ්මණං කල්ලචිත්තං මුදුචිත්තං විනීවරණචිත්තං උදග්ගචිත්තං පසන්නචිත්තං. අථ ඛෝ බුද්ධානං සාමුක්කංසිකා ධම්මදේසනා, තං පකාසේසි: දුක්ඛං සමුදයං නිරෝධං මග්ගං.

94. එතකොට කූටදන්ත බ්‍රාහ්මණයා හට භාග්‍යවතුන් වහන්සේ අනුපිළිවෙළ කථාව වදාළා. ඒ කියන්නේ; දන් දීමේ අනුසස් ගැන කථාව, සිල්

රැකීමෙහි අනුසස් ගැන කථාව, සුගතියෙහි උපත ගැන කථාව, කාමයන්හි ඇති පීඩාකාරීබව ගැන කථාව, කෙලෙස් නිසා ඇති වන කිළුට ගැන කථාව, එයින් නික්මීමෙන් ලැබෙන ආනිසංස ගැන කථාව වදාළා. එතකොට යම් වෙලාවක කූටදන්ත බ්‍රාහ්මණයා එයට සවන් දීම නිසා යහපත් සිතක් ඇති වුණා ද, මෘදු සිතක් ඇති වුණා ද, නීවරණ බැහැර වුණ සිතක් ඇති වුණා ද, සතුටින් ඔද වැඩුණු සිතක් ඇති වුණා ද, පහන් වූ සිතක් ඇති වුණා ද, එය දැන වදාළ භාග්‍යවතුන් වහන්සේ බුදුවරයන් වහන්සේලා ගේ යම් සුවිශේෂී සාමුක්කංසික දේශනාවක් ඇද්ද ඒ කියන්නේ; දුක්ඛාර්ය සත්‍යය, සමුදය ආර්ය සත්‍යය, නිරෝධ ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධගාමිනී පටිපදා ආර්ය සත්‍යය යන චතුරාර්ය සත්‍යය වදාළා.

සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදේව රජනං පටිග්ගණ්හෙය්‍ය, ඒවමේවං කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස තස්මිංයේව ආසනේ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරෝධධම්මන්ති.

කළු පැල්ලම් නැති පිරිසිදු වස්ත්‍රයකට සායම් පොවද්දී ඉතා හොඳින් ඒ සායම් උරාගන්නේ යම්සේ ද ඒ අයුරින් ම කූටදන්ත බ්‍රාහ්මණයා හටත් ඒ ආසනයේ දී ම හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා ස්වභාවයෙන් යුතු යමක් ඇද්ද ඒ හේතු ප්‍රත්‍යයන් නැති වීමෙන් ඒවා නිරුද්ධ වී යන ස්වභාවයට අයත් වන්නේ ය කියල කෙලෙස් රහිත වූ අවිද්‍යා මල රහිත වූ දහම් ඇස පහළ වුණා.

95. අථ ඛෝ කූටදන්තෝ බ්‍රාහ්මණෝ දිට්ඨධම්මෝ පත්තධම්මෝ විදිතධම්මෝ පරියෝගාළ්හධම්මෝ තිණ්ණවිචිකිච්ඡෝ විගතකථංකථෝ වේසාරජ්ජප්පත්තෝ අපරප්පච්චයෝ සත්ථුසාසනේ භගවන්තං ඒතදවෝච: අධිවාසේතු ච මේ භවං ගෝතමෝ ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසංඝේනාති. අධිවාසේසි භගවා තුණ්හීභාවේන.

95. එතකොට ධර්මය දැකපු, ධර්මයට පැමිණි, ධර්මය අවබෝධ කළ, ධර්මයෙහි බැසගත්, සැකයෙන් එතෙර වුණ, කෙසේද කෙසේද කියන අවිශ්වාසයෙන් බැහැර වුණ, ආර්ය සත්‍ය ධර්මය තුළ විශාරදභාවටය පත් වුණ, ශාස්තෘ සාසනය තුළ බාහිර උපකාර නොා සොයන බවට පත් වුණ කූටදන්ත බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙය පවසා සිටියා. භවත්

ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමඟ හෙට දවසෙහි දානය පිණිස මාගේ ආරාධනය පිළිගන්නා සේක්වා!" භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව වැඩ සිටීමෙන් එම ඇරයුම පිළිගෙන වදාළා.

96. අථ ඛෝ කූටදන්තෝ බ්‍රාහ්මණෝ භගවතෝ, අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛෝ කූටදන්තෝ බ්‍රාහ්මණෝ තස්සා රත්තියා අච්චයේන සකේ යඤ්ඤවාටේ පණීතං ඛාදනීයං භෝජනීයං පටියාදාපෙත්වා භගවතෝ කාලං ආරෝචාපේසි: කාලෝ හෝ ගෝතම, නිට්ඨිතං භත්තන්ති.

96. ඉන්පසු කූටදන්ත බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ එම ආරාධනය පිළිගෙන වදාළ බව දැන අසුනෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වන්දනා කොට, ප්‍රදක්ෂිණා කොට පිටත් වුණා. ඉතින් කූටදන්ත බ්‍රාහ්මණයා ඒ රැය ඇවැමෙන් තම යාග ශාලාවේ වැළඳිය යුතු, අනුභව කළ යුතු ප්‍රණීත වූ දන්පැන් සකසා "භවත් ගෞතමයන් වහන්ස, දන්පැන් පිළියෙළ කොට තිබෙනවා. දැන් වඩින්නට කාලය යි" කියලා භාග්‍යවතුන් වහන්සේට කාලය දන්වා යැව්වා.

97. අථ ඛෝ භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසංඝේන යේන කූටදන්තස්ස බ්‍රාහ්මණස්ස යඤ්ඤවාටෝ තේනුපසංකමි. උපසංකමිත්වා පඤ්ඤත්තේ ආසනේ නිසීදි. අථ ඛෝ කූටදන්තෝ බ්‍රාහ්මණෝ බුද්ධප්පමුඛං භික්ඛුසංඝං පණීතේන ඛාදනීයේන භෝජනීයේන සහත්ථා සන්තප්පේසි සම්පවාරේසි. අථ ඛෝ කූටදන්තෝ බ්‍රාහ්මණෝ භගවන්තං භුත්තාවිං විනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නං ඛෝ කූටදන්තං බ්‍රාහ්මණං භගවා ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තේජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමීති.

97. භාග්‍යවතුන් වහන්සේ පෙරවරු සමයෙහි සිවුරු හැඳ පොරොවා, පාසිවුරු ගෙන භික්ෂු සංඝයා සමඟ කූටදන්ත බ්‍රාහ්මණයා ගේ යාග ශාලාව වෙත වැඩම කළා. වැඩම කොට පණවන ලද ආසනයෙහි වැඩ සිටියා. එතකොට කූටදන්ත බ්‍රාහ්මණයා බුදු රජුන් ප්‍රමුඛ වූ භික්ෂු සංඝයා ප්‍රණීත වූ වළඳන, අනුභව කරන දැයින් සිය අතින් මනා කොට පිළිගැන්වුවා. හොඳින් පැවරුවා. ඊට පස්සේ කූටදන්ත බ්‍රාහ්මණයා වළඳා අවසන් කොට පාත්‍රයෙන්

බැහැර වූ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ අසළින් එක්තරා මිටි අසුනක් ගෙන එකත්පස්ව වාඩි වුණා. එකත්පස්ව වාඩි වුණ කූටදන්ත බ්‍රාහ්මණයාට භාග්‍යවතුන් වහන්සේ ධර්ම කථාවෙන් කරුණු පැහැදිලි කරවලා, සමාදන් කරවලා, උත්සාහවත් කරවලා, සතුටු කරවලා, අසුණෙන් නැගිට නික්ම වදාළා.

කූටදන්තසුත්තං නිට්ඨිතං පඤ්චමං.
පස්වෙනි කූටදන්ත සූත්‍රය නිමා විය.

සාදු ! සාදු !! සාදු !!!

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

6.
මහාලිසුත්තං
මහාලි ලිච්ඡවී හට වදාළ දෙසුම

1. **එවං මේ සුතං එකං සමයං භගවා වේසාලියං විහරති මහාවනේ කූටාගාරසාලායං.**

1. මා හට අසන්ට ලැබුණේ මේ විදිහට යි. ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටියේ විශාලා මහනුවර මහාවනයේ කූටාගාර ශාලාවේ.

තේන ඛෝ පන සමයේන සම්බහුලා කෝසලකා ච බ්‍රාහ්මණගහපතිකා මාගධකා ච බ්‍රාහ්මණගහපතිකා වේසාලියං පටිවසන්ති කේනචිදේව කරණීයේන. අස්සෝසුං ඛෝ තේ කෝසලකා ච බ්‍රාහ්මණගහපතිකා මාගධකා ච බ්‍රාහ්මණගහපතිකා, "සමණෝ ඛලු භෝ ගෝතමෝ සක්‍යපුත්තෝ සක්‍යාකුලා පබ්බජිතෝ වේසාලියං විහරති කූටාගාරසාලායං. තං ඛෝ පන භවන්තං ගෝතමං එවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගතෝ: ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරාථි සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣේකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසේති. සාධු ඛෝ පන තථාරූපානං අරහතං දස්සනං හෝතී"ති.

ඒ දිනවල ම කොසොල් රට වාසී රාජ්‍යතාන්ත්‍රික බොහෝ බ්‍රාහ්මණයන් ද, මගධ රට වාසී රාජ්‍යතාන්ත්‍රික බොහෝ බ්‍රාහ්මණයන් ද, කිසියම් කටයුත්තක් පිණිස විශාලා මහනුවරට ඇවිත් වාසය කළා. ඒ කොසොල්රට වැසි බ්‍රාහ්මණ දූතයන්ටත්, මගධ රට වැසි බ්‍රාහ්මණ දූතයන්ටත් මෙය අසන්ට ලැබුණා. "අන්න ශාක්‍ය පුත්‍ර වූ, ශාක්‍ය කුලයෙන් නික්මී පැවිදි වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විශාලා මහනුවර කූටාගාර ශාලාවේ වැඩ ඉන්නවා. ඒ භවත් ගෞතමයන් වහන්සේ ගැන මෙවැනි වූ කල්‍යාණ කීර්ති ඝෝෂාවක් පැතිර ගොසින් තියෙනවා. "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණින් අරහත්

වන සේක! සම්මාසම්බුද්ධ වන සේක! විජ්ජාචරණසම්පන්න වන සේක! සුගත වන සේක! ලෝකවිදූ වන සේක! අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක! සත්ථා දේවමනුස්සානං වන සේක! බුද්ධ වන සේක! භගවා වන සේක! උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙව්මිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඤාණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා. එබඳු වූ රහතුන් දැකගන්නට ලැබීම කොතරම් යහපත් දෙයක් ද" කියලා.

2. අථ ඛෝ තේ කෝසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා යේන මහාවනං කූටාගාරසාලා තේනුපසංකමිංසු. තේන ඛෝ පන සමයේන ආයස්මා නාගිතෝ භගවතෝ උපට්ඨාකෝ හෝති. අථ ඛෝ තේ කෝසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා යේනායස්මා නාගිතෝ තේනුපසංකමිංසු. උපසංකමිත්වා ආයස්මන්තං නාගිතං ඒතදවෝචුං: "කහං නු ඛෝ භෝ නාගිත, ඒතරහි සෝ භවං ගෝතමෝ විහරති? දස්සනකාමා හි මයං තං භවන්තං ගෝතමන්ති."

2. ඉතින් ඒ කොසොල් රට වැසි බ්‍රාහ්මණ දූතයනුත්, මගධ රට වැසි බ්‍රාහ්මණ දූතයනුත් මහවනයේ කූටාගාර ශාලාව වෙත පැමිණුනා. ඒ කාලයේ භාග්‍යවතුන් වහන්සේ ගේ උපස්ථායක වශයෙන් සිටියේ ආයුෂ්මත් නාගිත තෙරුන්. ඉතින් ඒ කොසොල් රට වැසි බ්‍රාහ්මණ දූතයනුත්, මගධ රට වැසි බ්‍රාහ්මණ දූතයනුත් ආයුෂ්මත් නාගිත තෙරුන් වෙත පැමිණුනා. පැමිණිලා ආයුෂ්මත් නාගිත තෙරුන්ට මෙහෙම කිව්වා. "භවත් නාගිතයෙනි, දැන් ඒ භවත් ගෞතමයන් වහන්සේ වැඩ ඉන්නේ කොහේ ද? අපි ඒ භවත් ගෞතමයන් වහන්සේව බැහැ දකින්ට කැමැතියි."

"අකාලෝ ඛෝ ආවුසෝ භගවන්තං දස්සනාය. පටිසල්ලීනෝ භගවා"ති.

"ආයුෂ්මතුනි, භාග්‍යවතුන් වහන්සේව බැහැ දකින්ට මේ කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේ දැන් භාවනාවෙනුයි වැඩ සිටින්නේ."

අථ ඛෝ තේ කෝසලකා ච බ්‍රාහ්මණගහපතිකා ච බ්‍රාහ්මණගහපතිකා තත්ථේව ඒකමන්තං නිසීදිංසු: "දිස්වා'ව මයං තං භවන්තං ගෝතමං ගමිස්සාමා"ති.

එතකොට ඒ කොසොල් රට වැසි බ්‍රාහ්මණ ගෘහපතියනුත්, මගධ රට වැසි බ්‍රාහ්මණ ගෘහපතියනුත් "අපි ඒ භවත් ගෞතමයන් වහන්සේව බැහැ දැකලම යි යන්නේ" කියලා එතැන ම එකත්පස්ව වාඩි වුණා.

3. ඔට්ඨද්ධෝ'පි ලිච්ඡවී මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං යේන මහාවනං කූටාගාරසාලා යේනායස්මා නාගිතෝ තේනුපසංකමි. උපසංකමිත්වා ආයස්මන්තං නාගිතං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි. ඒකමන්තං ඨිතෝ ඛෝ ඔට්ඨද්ධෝපි ලිච්ඡවී ආයස්මන්තං නාගිතං ඒතදවෝච: "කහං නු ඛෝ භෝ නාගිත, ඒතරහි සෝ භගවා විහරති අරහං සම්මාසම්බුද්ධෝ? දස්සනකාමා හි මයං තං භගවන්තං අරහන්තං සම්මා-සම්බුද්ධන්ති."

3. ඔට්ඨද්ධ ලිච්ඡවීත් මහත් ලිච්ඡවී පිරිසක් සමඟ මහාවනයේ කූටාගාර ශාලාවට ගොස් ආයුෂ්මත් නාගිත තෙරුන් වෙත පැමිණුනා. පැමිණිලා ආයුෂ්මත් නාගිත තෙරුන්ට ආදරයෙන් වන්දනා කොට එකත්පස්ව සිටගත්තා. එකත්පස්ව සිටි ඔට්ඨද්ධ ලිච්ඡවීතුමා ද ආයුෂ්මත් නාගිත තෙරුන්ට මෙහෙම කිව්වා. "භවත් නාගිතයෙනි, දැන් ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රාජාණන් වහන්සේ වැඩ ඉන්නේ කොහේ ද? අපි ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රාජාණන් වහන්සේව බැහැ දකින්ට කැමැතියි."

"අකාලෝ ඛෝ මහාලි භගවන්තං දස්සනාය. පටිසල්ලීනෝ භගවා"ති. ඔට්ඨද්ධෝපි ලිච්ඡවී තත්ථේව ඒකමන්තං නිසීදි: "දිස්වා'ව අහං තං භගවන්තං ගමිස්සාමි අරහන්තං සම්මාසම්බුද්ධන්ති."

"පින්වත් මහාලි, භාග්‍යවතුන් වහන්සේව බැහැ දකින්ට මේ කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේ දැන් භාවනාවෙනුයි වැඩ සිටින්නේ." එතකොට ඔට්ඨද්ධ ලිච්ඡවී තුමා ද "අපි ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රාජාණන් වහන්සේ බැහැ දැකලම යි යන්නේ" කියලා එතැන ම එකත්පස්ව වාඩි වුණා.

4. අථ ඛෝ සීහෝ සමණුද්දේසෝ යේනායස්මා නාගිතෝ තේනුපසංකමි. උපසංකමිත්වා ආයස්මන්තං නාගිතං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි. ඒකමන්තං ඨිතෝ ඛෝ සීහෝ සමණුද්දේසෝ ආයස්මන්තං නාගිතං

ඒතදවෝච: "ඒතේ භන්තේ කස්සප, සම්බහුලා කෝසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා ඉධූපසංකන්තා භගවන්තං දස්සනාය. ඔට්ඨද්ධෝ'පි ලිච්ඡවී මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං ඉධූපසංකන්තෝ භගවන්තං දස්සනාය. සාධු භන්තේ කස්සප ලභතං ඒසා ජනතා භගවන්තං දස්සනායා"ති.

4. එතකොට සීහ සාමණේරයන් ආයුෂ්මත් නාගිත තෙරුන් වෙත එළඹුනා. එළඹ ආයුෂ්මත් නාගිත තෙරුන්ට වන්දනා කොට එකත්පස්ව සිටගත්තා. එකත්පස්ව සිටගත් සීහසාමණේරයන් ආයුෂ්මත් නාගිත තෙරුන්ට මෙහෙම කිව්වා. "ස්වාමීනී, කාශ්‍යපයන් වහන්ස, කොසොල්රට වැසි බොහෝ බ්‍රාහ්මණ දූතයිනුත්, මගධරට වැසි බොහෝ බ්‍රාහ්මණ දූතයිනුත් භාග්‍යවතුන් වහන්සේව බැහැදකින්ට මෙහි ඇවිත් ඉන්නවා. ඒ වගේ ම ඔට්ඨද්ධ ලිච්ඡවීතුමාත් මහත් ලිච්ඡවී පිරිසක් සමග භාග්‍යවතුන් වහන්සේව බැහැ දකින්ට මෙහි ඇවිත් ඉන්නවා. ඉතින් ස්වාමීනී කාශ්‍යපයන් වහන්ස, ඒ පිරිසට භාග්‍යවතුන් වහන්සේව බැහැදකින්නට ලැබුණොත් ඉතා හොඳ යි.

තේන හි සීහ, ත්වඤ්ඤේව භගවතෝ ආරෝචේහීති. ඒවං භන්තේති ඛෝ සීහෝ සමණුද්දේසෝ ආයස්මතෝ නාගිතස්ස පටිස්සුත්වා යේන භගවා තේනුපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි. ඒකමන්තං ඨිතෝ ඛෝ සීහෝ සමණුද්දේසෝ භගවන්තං ඒතදවෝච: "ඒතේ භන්තේ, සම්බහුලා කෝසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා ඉධූපසංකන්තා භගවන්තං දස්සනාය, ඔට්ඨද්ධෝ'පි ලිච්ඡවී මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං ඉධූපසංකන්තෝ භගවන්තං දස්සනාය. සාධු භන්තේ ලභතං ඒසා ජනතා භගවන්තං දස්සනායා"ති.

එසේ වී නම් සීහ, ඔබ ම භාග්‍යවතුන් වහන්සේට දැනුම් දෙන්න. එසේය ස්වාමීනී කියල සීහ සාමණේරයන් ආයුෂ්මත් නාගිත තෙරුන් හට පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණිලා භාග්‍යවතුන් වහන්සේට වන්දනා කොට එකත්පස්ව සිට ගත්තා. එකත්පස්ව සිටි සීහ සාමණේරයන් භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළ කළා. "ස්වාමීනී, කොසොල්රට වැසි බොහෝ බ්‍රාහ්මණ දූතයිනුත්, මගධරට වැසි බොහෝ බ්‍රාහ්මණ දූතයිනුත් භාග්‍යවතුන් වහන්සේව බැහැ දකින්ට මෙහි ඇවිත් ඉන්නවා. ඒ වගේ ම ඔට්ඨද්ධ ලිච්ඡවීතුමාත් මහත් ලිච්ඡවී පිරිසක් සමග භාග්‍යවතුන් වහන්සේව බැහැ දකින්ට මෙහි ඇවිත් ඉන්නවා. ඉතින් ස්වාමීනී, ඒ පිරිසට භාග්‍යවතුන් වහන්සේව බැහැදකින්නට ලැබුණොත් ඉතා හොඳ යි.

"තේන හි සීහ විහාරපච්ඡායායං ආසනං පඤ්ඤපේහී"ති.

"එහෙමනම් සීහයෙනි, විහාරය ඉදිරිපස සෙවණෙහි ආසනයක් පණවන්න."

"එවං භන්තේ"ති ඛෝ සීහෝ සමණුද්දේසෝ භගවතෝ පටිස්සුත්වා විහාරපච්ඡායායං ආසනං පඤ්ඤපේසි. අථ ඛෝ භගවා විහාරා නික්ඛම්ම විහාරපච්ඡායායං පඤ්ඤත්තේ ආසනේ නිසීදි.

"එසේය ස්වාමීනී" කියල සීහ සාමණේරයන් භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී විහාරය ඉදිරිපස සෙවණෙහි ආසනයක් පැණෙව්වා. එතකොට භාග්‍යවතුන් වහන්සේ කුටියෙන් නික්ම කුටිය ඉදිරිපස සෙවණෙහි පණවන ලද අසුනෙහි වැඩ සිටියා.

5. අථ ඛෝ තේ කෝසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා යේන භගවා තේනුපසංකමිංසු. උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මෝදිංසු. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදිංසු. ඔට්ඨද්ධෝ'පි ලිච්ඡවී මහතියා ලිච්ඡවී පාරිසාය සද්ධිං යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නෝ ඛෝ ඔට්ඨද්ධෝ ලිච්ඡවී භගවන්තං එතදවෝච:

5. එතකොට කොසොල් රට වැසි බ්‍රාහ්මණ දූතයිනුත්, මගධ රට වැසි බ්‍රාහ්මණ දූතයිනුත් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණුනා. පැමිණිලා භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වුණා. සතුටු විය යුතු පිළිසඳර කථාබහේ යෙදිලා එකත්පස්ව වාඩිවුණා. ඔට්ඨද්ධ ලිච්ඡවීතුමා ද මහත් වූ ලිච්ඡවී පිරිස සමග භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණුනා. පැමිණිලා භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට එකත්පස්ව වාඩිවුණා. එකත්පස්ව වාඩි වුණ ඔට්ඨද්ධ ලිච්ඡවී තුමා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පැවසුවා.

පුරිමානි භන්තේ දිවසානි පුරිමතරානි සුනක්ඛත්තෝ ලිච්ඡවිපුත්තෝ යේනාහං තේනුපසංකමි. උපසංකමිත්වා මං එතදවෝච: යදග්ගේ අහං මහාලි, භගවන්තං උපනිස්සාය විහරාමි න චිරං තීණි වස්සානි, දිබ්බානි හි ඛෝ රූපානි පස්සාමි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. නෝ ච ඛෝ දිබ්බානි සද්දානි සුණාමි පියරූපානි කාමූපසංහිතානි රජංනීයානී"ති. සන්තානේව නු ඛෝ භන්තේ සුනක්ඛත්තෝ ලිච්ඡවිපුත්තෝ දිබ්බානි සද්දානි නාස්සෝසි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි උදාහු අසන්තානී"?ති.

ස්වාමීනී, ඊයේ දවසෙත් ඊට කලින් දවස්වලත් සුනක්ඛත්ත ලිච්ඡවී පුත්‍රයා මා වෙත ආවා. ඇවිදින් මට මේකරුණ කීවා. "මහාලි, දන්නවා ද? මං භාග්‍යවතුන් වහන්සේව ඇසුරු කරමින් තුන් අවුරුද්දකට වැඩි නැති කාලයක් වාසය කළා. ඒ කාලෙ දී මං කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දැක්කා. නමුත් මං කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්ද නම් ඇසුවේ නෑ" කියලා. ඉතින් ස්වාමීනී, සුනක්ඛත්ත ලිච්ඡවී පුත්‍රයා කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් තිබෙන්නා වූම දිව්‍ය ශබ්දයන් ද ඇසුවේ නැත්තේ? එහෙම නැත්නම් නැත්තා වූම දිව්‍ය ශබ්දයන් ද?

"සන්තානේව ඛෝ මහාලි සුනක්ඛත්තෝ ලිච්ඡවිපුත්තෝ දිබ්බානි සද්දානි නාස්සෝසි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නෝ අසන්තානී"ති.

"පින්වත් මහාලි, සුනක්ඛත්ත ලිච්ඡවී පුත්‍රයා කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් තිබෙන්නා වූම දිව්‍ය ශබ්දයන් තමයි ඇසුවෙ නැත්තේ. එහෙම නැතිව දිව්‍ය ශබ්දයන් නැතිකමට නොවේ."

6. කෝ නු ඛෝ හන්තේ හේතු කෝ පච්චයෝ, යේන සන්තානේව සුනක්ඛත්තෝ ලිච්ඡවිපුත්තෝ දිබ්බානි සද්දානි නාස්සෝසි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නෝ අසන්තානී?"ති.

6. "ස්වාමීනී, එහෙම නම් සුනක්ඛත්ත ලිච්ඡවී පුත්‍රයා ඇසුවේ නැත්තේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් තිබෙන්නා වූම දිව්‍ය ශබ්ද නම්, ඒ වගේ ම නො තිබෙන්නා වූ දිව්‍ය ශබ්ද නොවේ නම් එයට හේතුව කුමක් ද? ප්‍රත්‍ය කුමක් ද?"

"ඉධ මහාලි භික්ඛුනෝ පුරත්ථිමාය දිසාය ඒකංසභාවිතෝ සමාධි හෝති දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නෝ ච ඛෝ දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සෝ පුරත්ථිමාය දිසාය ඒකංසභාවිතේ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නෝ ච ඛෝ දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. පුරත්ථිමාය දිසාය දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි, නෝ ච ඛෝ දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හේතු: ඒවං හේතං මහාලි

හෝති භික්ඛුනෝ පුරත්ථිමාය දිසාය ඒකංසභාවිතේ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නෝ ච ඛෝ දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

"පින්වත් මහාලි, මෙහිලා භික්ෂුව පෙරදිග දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍යමය රූප දැකීම පිණිස පමණක් යොමු කොට වඩපු සමාධියක් තියෙනවා. නමුත් කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්දයන් ඇසීම පිණිස එහෙම සමාධියක් වඩල නෑ. එතකොට ඔහු පෙරදිග දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දැකීම පිණිස පමණක් සමාධිය වඩල තියෙන විට පෙරදිග දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්දයන් ඇසීම පිණිස සමාධිය වඩල නැති කොට කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දකිනවා. නමුත් කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්ද අසන්නේ නෑ. ඒකට හේතුව කුමක් ද? පින්වත් මහාලි, භික්ෂුව පෙරදිග දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දැකීම පිණිස පමණක් සමාධිය වඩල තියෙද්දී කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්ද ඇසීමට සමාධිය වඩල නො තිබෙන කොට එහෙම තමයි.

7. පුන ච පරං මහාලි භික්ඛුනෝ දක්ඛිණාය දිසාය ..... පච්ඡිමාය දිසාය ..... උත්තරාය දිසාය ..... උද්ධමධෝ තිරියං ඒකංසභාවිතෝ සමාධි හෝති දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නෝ ච ඛෝ දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සෝ උද්ධමධෝ තිරියං ඒකංසභාවිතේ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නෝ ච ඛෝ දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. උද්ධමධෝ තිරියං දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි, නෝ ච ඛෝ දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හේතු: එවං හේතං මහාලි හෝති භික්ඛුනෝ දක්ඛිණාය දිසාය ..... උද්ධමධෝ තිරියං ඒකංසභාවිතේ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නෝ ච ඛෝ දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

7. තව දුරටත් කියනවා නම් පින්වත් මහාලි, භික්ෂුව දකුණු දිශාවේ ..... බටහිර දිශාවේ ..... උතුරු දිශාවේ ..... උඩ යට හරහට දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍යමය රූප දැකීම පිණිස පමණක් යොමු කොට වඩපු සමාධියක් තියෙනවා. නමුත් කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්දයන් ඇසීම පිණිස එහෙම සමාධියක් වඩල නෑ. එතකොට ඔහු කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දැකීම පිණිස පමණක් උඩ යට හරහට සමාධිය වඩල තියෙන විට කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්දයන් ඇසීම පිණිස සමාධිය වඩල නැති කොට උඩ යට හරහට කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දකිනවා. නමුත් කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්ද අසන්නේ නෑ. ඒකට හේතුව කුමක් ද? පින්වත් මහාලි, භික්ෂුව දකුණු දිශාවේ ..... උඩ යට හරහට කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දැකීම පිණිස පමණක් සමාධිය වඩල තියෙද්දී කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්ද ඇසීමට සමාධිය වඩල නො තිබෙන කොට එහෙම තමයි.

8. ඉධ මහාලි භික්ඛුනෝ පුරත්ථිමාය දිසාය ඒකංසභාවිතෝ සමාධි හෝති දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නෝ ච ඛෝ දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සෝ පුරත්ථිමාය දිසාය ඒකංසභාවිතේ සමාධිම්හි දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නෝ ච ඛෝ දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. පුරත්ථිමාය දිසාය දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි, නෝ ච ඛෝ දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හේතු: ඒවං හේතං මහාලි හෝති භික්ඛුනෝ පුරත්ථිමාය දිසාය ඒකංසභාවිතේ සමාධිම්හි දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නෝ ච ඛෝ දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

8. තව දුරටත් කියනවා නම් පින්වත් මහාලි, මෙහිලා භික්ෂුව පෙරදිග දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍යමය ශබ්ද ඇසීම පිණිස පමණක් යොමු කොට වඩපු සමාධියක්

තියෙනවා. නමුත් කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දැකීම පිණිස එහෙම සමාධියක් වඩල නෑ. එතකොට ඔහු පෙරදිග දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්ද ඇසීම පිණිස පෙරදිග දිශාවට පමණක් සමාධිය වඩල තියෙන විට කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දැකීම පිණිස සමාධිය වඩල නැති කොට පෙරදිග දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්ද පමණක් අසනවා. නමුත් කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දකින්නේ නෑ. ඒකට හේතුව කුමක් ද? පින්වත් මහාලි, භික්ෂුව පෙරදිග දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්ද ඇසීම පිණිස පමණක් සමාධිය වඩල තියෙද්දී කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දැකීමට සමාධිය වඩල නොතිබෙන කොට එහෙම තමයි.

9. පුන ච පරං මහාලි භික්ඛුනෝ දක්ඛිණාය දිසාය ..... පච්ඡිමාය දිසාය ..... උත්තරාය දිසාය ..... උද්ධමධෝ තිරියං ඒකංසභාවිනෝ සමාධි හෝති දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නෝ ච ඛෝ දිබ්බානි රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සෝ දක්ඛිණාය දිසාය ..... උද්ධමධෝ තිරියං ඒකංසභාවිතේ සමාධිම්හි දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නෝ ච ඛෝ දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. උද්ධමධෝ තිරියං දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි, නෝ ච ඛෝ දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හේතු: ඒවං හේතං මහාලි හෝති භික්ඛුනෝ දක්ඛිණාය දිසාය ..... උද්ධමධෝ තිරියං ඒකංසභාවිතේ සමාධිම්හි දිබ්බානං සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, නෝ ච ඛෝ දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

9. තව දුරටත් කියනවා නම් පින්වත් මහාලි, භික්ෂුව දකුණු දිශාවේ ..... බටහිර දිශාවේ ..... උතුරු දිශාවේ ..... උඩ යට හරහට දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍යමය ශබ්ද ඇසීම පිණිස පමණක් යොමු කොට වඩපු සමාධියක් තියෙනවා. නමුත් කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දැකීම පිණිස එහෙම සමාධියක් වඩල නෑ.

එතකොට ඔහු කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්ද ඇසීම පිණිස පමණක් උඩ යට හරහට සමාධිය වඩල තියෙන විට කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දැකීම පිණිස සමාධිය වඩල නැති කොට උඩ යට හරහට කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්ද අසනවා. නමුත් කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දකින්නේ නෑ. ඒකට හේතුව කුමක් ද? පින්වත් මහාලි, භික්ෂුව දකුණු දිශාවේ ..... උඩ යට හරහට කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය ශබ්ද ඇසීම පිණිස පමණක් සමාධිය වඩල තියෙද්දී කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය රූප දැකීමට සමාධිය වඩල නො තිබෙන කොට එහෙම තමයි.

10. **ඉධ මහාලි භික්ඛුනෝ පුරත්ථිමාය දිසාය උභයංසභාවිතෝ සමාධි හෝති දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සෝ පුරත්ථිමාය දිසාය උභයංසභාවිතේ සමාධිම්හි දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. පුරත්ථිමාය දිසාය දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි, දිබ්බානි ච සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හේතු: එවං හේතං මහාලි හෝති භික්ඛුනෝ පුරත්ථිමාය දිසාය උභයංසභාවිතේ සමාධිම්හි දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.**

10. පින්වත් මහාලි, මෙහිලා භික්ෂුව පෙරදිග දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ රූපයන් දැකීම පිණිසත්, කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ ශබ්ද ඇසීම පිණිසත් යන දෙපැත්තට ම යොමු කරන ලද සමාධියක් වඩල තියෙනවා. එතකොට ඔහු පෙරදිග දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ රූපයන් දැකීම පිණිස වගේ ම, කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ ශබ්ද ඇසීම පිණිසත් යන ඒ දෙයංශයට ම යොමු කොට සමාධිය වඩන ලද හෙයින් පෙරදිග දිශාවේත්, කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ රූපයන් දකිනවා. කැමැත්ත ඇති කරවන්නා වූ, සිත්

අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ ශබ්දත් අසනවා. ඒකට හේතුව කුමක් ද? පින්වත් මහාලි, භික්ෂුව පෙරදිග දිශාවේ කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ රූප දැකීම පිණිසත්, කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ ඇසීම පිණිසත් යන දෙයංශයට ම යොමු කොට වඩන ලද සමාධියක් ඇති විට එහෙම තමයි.

11. පුන ච පරං මහාලි භික්ඛුනෝ දක්ඛිණාය දිසාය ..... පච්ඡිමාය දිසාය ..... උත්තරාය දිසාය ..... උද්ධමධෝ තිරියං උභයංසභාවිතෝ සමාධි හෝති දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සෝ දක්ඛිණාය දිසාය ..... උද්ධමධෝ තිරියං උභයංසභාවිතේ සමාධිම්හි දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. උද්ධමධෝ තිරියං දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි, දිබ්බානි ච සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හේතු: ඒවං හේතං මහාලි හෝති භික්ඛුනෝ උද්ධමධෝ තිරියං උභයංසභාවිතේ සමාධිම්හි දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං, දිබ්බානඤ්ච සද්දානං සවණාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

11. තව දුරටත් කියනවා නම් පින්වත් මහාලි, දකුණු දිශාවේ ..... බටහිර දිශාවේ ..... උතුරු දිශාවේ ..... උඩ යට හරහට කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ රූපයන් දැකීම පිණිසත්, කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ ශබ්ද ඇසීම පිණිසත් යන දෙපැත්තට ම යොමු කරන ලද සමාධියක් වඩල තියෙනවා. එතකොට ඔහු දකුණු දිශාවේ ..... උඩ යට හරහට කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ රූපයන් දැකීම පිණිස වගේ ම, කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ ශබ්ද ඇසීම පිණිසත් යන ඒ දෙයංශයට ම යොමු කොට සමාධිය වඩන ලද හෙයින් උඩ යට හරහට කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ රූපයන් දකිනවා. කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ ශබ්දත් අසනවා. ඒකට හේතුව කුමක් ද? පින්වත් මහාලි, භික්ෂුව උඩ යට හරහට කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප

වූත් දිව්‍ය වූ රූප දැකීම පිණිසත්, කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් දිව්‍ය වූ ඇසීම පිණිසත් යන දෙයංශයට ම යොමු කොට වඩන ලද සමාධියක් ඇති විට එහෙම තමයි.

අයං ඛෝ මහාලි හේතු අයං පච්චයෝ, යේන සන්තානේව සුනක්ඛත්තෝ ලිච්ඡවිපුත්තෝ දිබ්බානි සද්දානි නාස්සෝසි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නෝ අසන්තානී”ති.

පින්වත් මහාලි, සුනක්ඛත්ත ලිච්ඡවී පුත්‍රයා කැමැත්ත ඇති කරවන්නා වූ, සිත් අලවන්නා වූ, ප්‍රිය මනාප වූත් නො තිබෙන්නා වූ නොව තිබෙන්නා වූම දිව්‍ය ශබ්දයන් ඇසුවේ නැත්තේ නම් එයට හේතුව මෙය යි. ප්‍රත්‍යය මෙය යි.”

12. “ඒතාසං නූන භන්තේ සමාධිභාවනානං සච්ඡිකිරියාහේතු භික්ඛූ භගවති බ්‍රහ්මචරියං චරන්තී”ති.

12. “ස්වාමීනී, භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචාරීව වාසය කරන්නේ ඔය සමාධි භාවනාවන් සාක්ෂාත් කිරීම පිණිස කියල යි මට හිතෙන්නේ.”

13. න ඛෝ මහාලි, ඒතාසං සමාධිභාවනානං සච්ඡිකිරියාහේතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති. අත්ථි ඛෝ මහාලි, අඤ්ඤේව ධම්මා උත්තරිතරා ච පණීතතරා ච යේසං සච්ඡිකිරියාහේතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්තීති.

13. නැත, පින්වත් මහාලි, ඔය සමාධි භාවනාවන් සාක්ෂාත් කිරීම පිණිස භික්ෂූන් වහන්සේලා මා වෙත බඹසර හැසිරෙන්නේ නෑ. පින්වත් මහාලි, එයට වඩා උත්තරීතර වූත්, ප්‍රණීතතර වූත්, අන්‍ය වූ ධර්මයන් සාක්ෂාත් කිරීම පිණිස යි මා වෙත භික්ෂූන් වහන්සේලා බඹසර රකින්නේ.

14. කතමේ පන තේ භන්තේ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච යේසං සච්ඡිකිරියාහේතු භික්ඛූ භගවති බ්‍රහ්මචරියං චරන්තීති.

14. ස්වාමීනී, ඒ යම් දෙයක් සාක්ෂාත් කිරීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි භික්ෂූන් වහන්සේලා බඹසර රකිනවා නම් වඩාත් උත්තරීතර වූත්, ප්‍රණීතතර වූත් ඒ ධර්මයන් මොනවා ද?

15. ඉධ මහාලි, භික්ඛු තිණ්ණං සංයෝජනානං පරික්ඛයා සෝතාපන්නෝ හෝති අවිනිපාතධම්මෝ, නියතෝ සම්බෝධිපරායණෝ. අයංපි ඛෝ මහාලි, ධම්මෝ උත්තරිතරෝ ච පණීතතරෝ ච යස්ස සච්ඡිකිරියාහේතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති.

15. පින්වත් මහාලි, මෙහිලා භික්ෂුව සංයෝජන තුනක් ක්ෂය කිරීමෙන්, සෝවාන් වෙනවා. අපායෙහි නො වැටෙන ස්වභාවයට පත් වෙනවා. නියත වශයෙන් ම අමාමහ නිවන පිහිට කොට ඉන්නවා. පින්වත් මහාලි, යමක් සාක්ෂාත් කිරීම පිණිස භික්ෂූන් වහන්සේලා මා වෙත බඹසර හැසිරෙනවා නම්, මෙයත් ඒ උත්තරීතර වූත්, ප්‍රණීතතර වූත් ධර්මයක් තමයි.

පුනචපරං මහාලි, භික්ඛු තිණ්ණං සංයෝජනානං පරික්ඛයා රාගදෝසමෝහානං තනුත්තා සකදාගාමී හෝති සකිදේව ඉමං ලෝකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරෝති. අයම්පි ඛෝ මහාලි, ධම්මෝ උත්තරිතරෝ ච පණීතතරෝ ච යස්ස සච්ඡිකිරියාහේතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති.

තව දුරටත් කියනවා නම් පින්වත් මහාලි, භික්ෂුව සංයෝජන තුනක් ක්ෂය කිරීමෙන් රාග ද්වේශ මෝහයන් ගේ තුනී වීමෙන් සකදාගාමී වෙනවා. එතකොට එක්වරක් පමණක් මේ ලෝකයට පැමිණිලා දුක් අවසන් කරනවා (පිරිනිවන් පානවා). පින්වත් මහාලි, යමක් සාක්ෂාත් කිරීම පිණිස භික්ෂූන් වහන්සේලා මා වෙත බඹසර හැසිරෙනවා නම්, මෙයත් ඒ උත්තරීතර වූත්, ප්‍රණීතතර වූත් ධර්මයක් තමයි.

පුනචපරං මහාලි, භික්ඛු විරම්භාගියානං සංයෝජනානං පරික්ඛයා විපපාතිකෝ හෝති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මෝ තස්මා ලෝකා. අයම්පි ඛෝ මහාලි, ධම්මෝ උත්තරිතරෝ ච පණීතතරෝ ච යස්ස සච්ඡිකිරියාහේතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති.

තව දුරටත් කියනවා නම් පින්වත් මහාලි, භික්ෂුව කාම ලෝකයෙහි බැඳ තබන විරම්භාගීය සංයෝජනයන් ක්ෂය කරලා විපපාතිකව බඹ ලොව උපදින කෙනෙක් වෙනවා. ඒ ලෝකයෙන් නැවතත් කාමලොවට නො පැමිණෙන ස්වභාවයෙන් යුතුව එහි ම පිරිනිවන් පානවා. පින්වත් මහාලි, යමක් සාක්ෂාත් කිරීම පිණිස භික්ෂූන් වහන්සේලා මා වෙත බඹසර හැසිරෙනවා නම්, මෙයත් ඒ උත්තරීතර වූත්, ප්‍රණීතතර වූත් ධර්මයක් තමයි.

පුනචපරං මහාලි, භික්ඛු අසවානං ඛයා අනාසවං චේතෝවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයම්පි ඛෝ මහාලි, ධම්මෝ උත්තරිතරෝ ච පණීතතරෝ ච යස්ස සච්ඡිකිරියාහේතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති.

තව දුරටත් කියනවා නම් පින්වත් මහාලි, භික්ෂුව ආශ්‍රවයන් ක්ෂය වීමෙන්, ආශ්‍රව රහිත වූ චේතෝ විමුක්තියත්, ප්‍රඥා විමුක්තියත් මේ ජීවිතයේ දී ම ස්වකීය ප්‍රඥාවෙන් සාක්ෂාත් කරල එයට පැමිණ වාසය කරනවා. පින්වත් මහාලි, යමක් සාක්ෂාත් කිරීම පිණිස භික්ෂූන් වහන්සේලා මා වෙත බඹසර හැසිරෙනවා නම්, මෙයත් ඒ උත්තරීතර වූත්, ප්‍රණීතතර වූත් ධර්මයක් තමයි.

ඉමේ ඛෝ තේ මහාලි, ධම්මා උත්තරීතරා ච පණීතතරා ච යේසං සච්ඡිකිරියාහේතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති"ති.

පින්වත් මහාලි, යමක් සාක්ෂාත් කිරීම පිණිස භික්ෂූන් වහන්සේලා මා වෙත බඹසර හැසිරෙනවා නම්, මේවා ඒ උත්තරීතර වූත්, ප්‍රණීතතර වූත් ධර්මයන් තමයි.

16. "අත්ථි පන භන්තේ මග්ගෝ, අත්ථි පටිපදා ඒතේසං ධම්මානං සච්ඡිකිරියායා?"ති.

16. "ස්වාමීනී, මෙම ධර්මයන් සාක්ෂාත් කිරීම පිණිස මාර්ගයක් තිබෙනවා ද? ප්‍රතිපදාවක් තිබෙනවා ද?"

"අත්ථි ඛෝ මහාලි, මග්ගෝ, අත්ථි පටිපදා, ඒතේසං ධම්මානං සච්ඡිකිරියායා"ති.

"පින්වත් මහාලි, මෙම ධර්මයන් සාක්ෂාත් කිරීම පිණිස මාර්ගයක් තිබෙනවා. ප්‍රතිපදාවක් තිබෙනවා."

17. "කතමෝ පන භන්තේ මග්ගෝ, කතමා පටිපදා, ඒතේසං ධම්මානං සච්ඡිකිරියායා?"ති.

17. "ස්වාමීනී, මෙම ධර්මයන් සාක්ෂාත් කිරීම පිණිස තිබෙන්නා වූ මාර්ගය කුමක් ද? ප්‍රතිපදාව කුමක් ද?

"අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ, සෙය්‍යථීදං? සම්මාදිට්ඨි, සම්මාසංකප්පෝ, සම්මාවාචා, සම්මාකම්මන්තෝ, සම්මාආජීවෝ, සම්මාවායාමෝ, සම්මාසති, සම්මාසමාධි. අයං ඛෝ මහාලි මග්ගෝ, අයං පටිපදා, ඒතේසං සච්ඡිකිරියාය.

"ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම යි. ඒ කියන්නේ: සම්මාදිට්ඨිය, සම්මා සංකල්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන මෙය යි. පින්වත් මහාලි, ඒ ධර්මයන් සාක්ෂාත් කිරීමේ මාර්ගය මෙය යි. ප්‍රතිපදාව මෙය යි.

18. ඒකමිදාහං මහාලි සමයං කෝසම්බියං විහරාමි ඝෝසිතාරාමේ. අථ ඛෝ ද්වේ පබ්බජිතා මණ්ඩිස්සෝ ච පරිබ්බාජකෝ ජාලියෝ ච දාරුපත්තිකන්තේවාසී යේනාහං තේනුපසංකමිංසු. උපසංකමිත්වා මම සද්ධිං සම්මෝදිංසු. සම්මෝදනීයං කථං සරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං අට්ඨංසු. ඒකමන්තං ඨිතා ඛෝ තේ ද්වේ පබ්බජිතා මං ඒතදවෝචුං. "කින්නුඛෝ ආවුසෝ ගෝතම, තං ජීවං තං සරීරං? උදාහු අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර?"න්ති.

18. පින්වත් මහාලි, එක් කාලයක මා වාසය කළේ කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේ. එතකොට මණ්ඩිස්ස කියන පිරිවැජියාත්, දාරුපත්තික ගේ ගෝලයෙක් වන ජාලියත් යන පැවිද්දන් දෙදෙනා මා ළඟට පැමිණුනා. පැමිණිලා මා සමග සතුටු වුණා. සතුටු විය යුතු පිළිසඳර කථාබහ නිමවා එකත්පස්ව සිට ගත්තා. එකත්පස්ව සිටගත් ඒ පැවිද්දන් දෙදෙනා මට මෙහෙම කිව්වා. "ආයුෂ්මත් ගෞතමයෙනි, ඒ ජීවය ම ද ඒ ශරීරය වන්නේ? එහෙම නැත්නම් ජීවය වෙන එකක් ද? ශරීරය වෙන එකක් ද?" කියල.

"තේන හාවුසෝ සුණාථ සාධුකං මනසි කරෝථ භාසිස්සාමී"ති.

"එසේනම් ආයුෂ්මතුනි, සවන් යොමා අසන්න. හොඳින් මෙනෙහි කරන්න. මා කියා දෙන්නම්."

"ඒවමාවුසෝ"ති ඛෝ තේ ද්වේ පබ්බජිතා මම පච්චස්සෝසුං. අහං ඒතදවෝචං:

"එසේය ආයුෂ්මතුනි" කියා ඒ පැවිද්දන් දෙදෙනා මට පිළිතුරු දුන්නා. මං මෙකරුණ පැවසුවා.

19. ඉධාවුසෝ තථාගතෝ ලෝකේ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධෝ (යථා සාමඤ්ඤඵලේ එවං විත්ථාරේතබ්බං) .....

19. ආයුෂ්මතුනි, මෙහිලා තථාගත වූ අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව පහළ වන සේක (සාමඤ්ඤඵල සූත්‍රයේ විස්තර වන ආකාරයට ම විස්තර කළ යුතු ය.) .....

තස්සිමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සතෝ පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායෝ පස්සම්භති. පස්සද්ධකායෝ සුඛං වේදේති. සුඛිනෝ චිත්තං සමාධියති

ඔහුට මේ පඤ්ච නීවරණයන් තමා තුළ නැති බව දකිද්දි මහත් සතුටක් ඇති වෙනවා. ඒ ප්‍රමුදිත වීම ඇති කෙනාට ප්‍රීතිය ඇති වෙනවා. ප්‍රීති මනසක් ඇති කෙනා ගේ කය සංසිඳෙනවා. සංසිඳුනු කයින් යුතු ව සැපක් විඳිනවා. සැප ඇති කෙනා ගේ සිත සමාධිමත් වෙනවා.

20. සෝ විවි-ච-ව කාමේහි විවි-ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

20. ඔහු කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් හට ගත් ප්‍රීති සුඛය ඇති පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

සෙය්‍යථාපි ආවුසෝ දක්ඛෝ නහාපකෝ වා නහාපකන්තේවාසී වා කංසථාලේ නහානීයචුණ්ණානි ආකිරිත්වා උදකේන පරිප්ඵෝසකං පරිප්ඵෝසකං සන්දෙය්‍ය සායං නහානීයපිණ්ඩි සේනාහානුගතා සේනාහපරේතා සන්තරබාහිර ඵුටා සේනහේන න ච පග්ඝරණි.

ආයුෂ්මතුනි, ඒක මේ වගේ දෙයක්. (රජවරුන් ආදී පිරිස් නහවන) දක්ෂ නහවන්නෙක් හෝ නහවන කෙනෙකු ගේ ගෝලයෙක් ඉන්නවා. ඔහු

ලෝහ බඳුනක නාන සුණු විසුරුවනවා. ඊට පස්සේ දිය ඉස ඉස පිඬු කරනවා. එතකොට ඒ නානසුණු පිඬට අර වතුර කාවදිනවා. හොඳින් තෙත් වෙනවා. ඒ නහන පිඬ ඇතුළත පිටත සෑම තැන ම හොඳින් දිය පැතිරිලා තියෙනවා. පිටතට වැගිරෙන්නෙත් නෑ.

එවමේව ඛෝ ආවුසෝ භික්ඛු ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

ආයුෂ්මතුනි, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

21. පුන ච පරං ආවුසෝ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසෝ ඒකෝදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පූරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

21. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම් භික්ෂුව විතක්ක විචාරයන් ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්මිකව පැහැදීම ඇතිව සිතෙහි මනා එකඟ බවෙන් යුතු ව විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් හටගත්, ප්‍රීති සුඛය ඇති දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

22. සෙය්‍යථාපි උදකරහදෝ ගම්භීරෝ උබ්භිදෝදකෝ ..... (යථා සාමඤ්ඤඵලේ ඒවං විත්ථාරේතබ්බං)

22. ආයුෂ්මතුනි, එක මේ වගේ දෙයක්. යට දිය උල්පත්වලින් වතුර ගලන ගැඹුරු විලක් තියෙනවා ..... (සාමඤ්ඤඵල සූත්‍රයේ විස්තර වන ආකාරයට ම විස්තර කළ යුතු ය.)

නාස්ස කිඤ්චි සබ්බාවතෝ උදකරහදස්ස සීතේන වාරිනා අප්ඵුටං අස්ස, ඒවමේව ඛෝ ආවුසෝ භික්ඛු ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

ඒ මුළු විලේ ම සිහිල් ජලයෙන් පහස නො ලැබූ කිසි තැනක් නෑ. ආයුෂ්මතුනි, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

23. පුන ච පරං ආවුසෝ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති සතෝ සම්පජානෝ සුඛඤ්ච කායේන පටිසංවේදේති. යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති.

ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම් භික්ෂුව ප්‍රීතියට ද නොඇලීමෙන් උපේක්ෂාවෙන් යුතුව වාසය කරනවා. සිහියෙන් නුවණින් යුතු ව කයෙන් සැපයක් ද විඳිනවා. ආර්යයන් වහන්සේලා යම් ධ්‍යානයකට උපේක්ෂා සහගත සිහිය ඇති සැප විහරණය යැයි පවසනවා ද, ඒ තුන්වන ධ්‍යානයත් උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

24. සෙය්‍යථාපි ආවුසෝ උප්පලිනියං වා පදුමිනියං වා ..... පුණ්ඩරීකානං වා සීතේන වාරිනා අප්ඵුටං අස්ස.

ආයුෂ්මතුනි, ඒක මේ වගේ දෙයක්. මහනෙල් විලක හෝ රතු නෙළුම් විලක හෝ ..... සුදුනෙළුම්වල සීතල දිය නො පැතුරුණු කිසි තැනක් නෑ.

ඒවමේව ඛෝ ආවුසෝ භික්ඛු ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති.

ආයුෂ්මතුනි, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

25. පුන ච පරං ආවුසෝ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බේව සෝමනස්සදෝමනස්සානං අත්ථගමා අදුක්ඛමසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති.

25. ආයුෂ්මතුනි, නැවතත් කියනවා නම් භික්ෂුව සැපය ද ප්‍රහාණය කිරීමෙන්, දුක ද ප්‍රහාණය කිරීමෙන් කලින් ම සොම්නස් දොම්නස් දෙක ඉක්ම යෑමෙන් දුක් සැප රහිත වූ පාරිශුද්ධ උපේක්ෂා සහගත සතිය ඇති සතර වෙනි ධ්‍යානය උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

සෙය්‍යථාපි ආවුසෝ පුරිසෝ විදාතේන වත්ථේන සසීසං පාරුපිත්වා නිසින්නෝ අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විදාතේන වත්ථේන අප්ඵුටං අස්ස, ඒවමේව ඛෝ ආවුසෝ භික්ඛු ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති.

ආයුෂ්මතුනි, ඒක මේ වගේ දෙයක්. සුදු වස්ත්‍රයකින් හිස සහිතව මුළු සිරුර ම පොරොවාගෙන වාඩි වී සිටින කෙනෙක් ඉන්නවා. එතකොට ඔහු ගේ මුළු කයෙහි ම සුදු වස්ත්‍රයෙන් නො වැසුණු කිසි තැනක් නෑ. පින්වත් මහාරාජ, අන්න ඒ වගේ ම යි භික්ෂුව මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

26. පුන ච පරං ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සානය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතා-පෙත්තිකසම්භවෝ විදනකුම්මාසූපචයෝ අනි-චු-ඡාදනපරිමද්දනභේදන-විද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති. සෙය්‍යථාපි ආවුසෝ මණි වේළුරියෝ ..... සබ්බාකාරසම්පන්නෝ, තත්‍ර සුත්තං ආවුතං නීලං වා ..... පණ්ඩුසුත්තං වා. තමේනං චක්ඛුමා පුරිසෝ හත්ථේ කරිත්වා ප-ච්චවෙක්ඛෙය්‍ය "අයං ඛෝ මණි වේළුරියෝ ..... සබ්බාකාරසම්පන්නෝ, තත්‍ර සුත්තං ආවුතං නීලං වා ..... පණ්ඩුසුත්තං වා"ති. ඒවමේව ඛෝ ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... ඤාණදස්සානය චිත්තං අභිනීහරති ..... සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී ..... ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති.

26. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම් භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාස්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් වැංජන ආදියෙන් වැඩුණු, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත

නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි. ආයුෂ්මතුනි, එක මේ වගේ දෙයක්. වෛරෝඩි මාණික්‍යයක් තියෙනවා ..... මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. ඉතින් ඔය මැණික තුළ නිල් වේවා ..... පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා. එතකොට ඇස් ඇති පුරුෂයෙක් මැණික අතට ගෙන හොඳින් විමසා බලනවා. "මේ වෛරෝඩි මැණික ..... මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. මේ මැණික තුළ නිල් වේවා ..... පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා" කියලා. ආයුෂ්මතුනි, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි ..... එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත් ..... මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි" කියල.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

27. පුනචපරං ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති ..... සෙය්‍යථාපි ආවුසෝ පුරිසෝ මුඤ්ජම්හා ඉසිකං පවාහෙය්‍ය ..... ඒවමේව ඛෝ ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති ..... සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති ..... අභිනින්ද්‍රියං.

27. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම්, භික්ෂුව සිත සමාධිමත් වූ විට ..... මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි ..... ආයුෂ්මතුනි, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් මුඤ්ජතණ ගසෙන් තණ ගොබය ඇදල ගන්නවා ..... ආයුෂ්මතුනි, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරය ..... ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

28. පුන ච පරං ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති ..... සෙය්‍යථාපි ආවුසෝ දක්ඛෝ කුම්භකාරෝ වා කුම්භකාරන්තේවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදේව භාජනවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය ..... ඒවමේව ඛෝ ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති ..... සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති ..... යාව බ්‍රහ්මලෝකාපි කායේන වසං වත්තේති.

28. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම්, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි ..... ආයුෂ්මතුනි, ඒක මේ වගේ දෙයක්. දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ මැට්ටෙන් යම් ම ආකාරයේ භාජනයක් හදන්ට කැමැති නම්, ඒ ඒ ආකාරයේ බඳුන් හදනවා ..... ආයුෂ්මතුනි, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි ..... මේසා මහත් ඉර්ධි ඇති ..... බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල

හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

29. පුන ච පරං ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති ..... සෝ දිබ්බාය සෝතධාතුයා ..... උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච ..... සෙය්‍යථාපි ආවුසෝ පුරිසෝ අද්ධානමග්ගපටිපන්නෝ සෝ සුණෙය්‍ය භේරිසද්දම්'පි ..... තස්ස ඒවමස්ස: භේරසද්දෝ ඉති'පි ..... ඒවමේව ඛෝ ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති ..... සෝ දිබ්බාය සෝතධාතුයා ..... උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච.

29. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම්, ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා ..... දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා ..... ආයුෂ්මතුනි,ඒක මේ වගේ දෙයක්. දුගු ගමනකට පිළිපන් පුරුෂයෙක් ඉන්නවා. ඔහු බෙර හඬත් ..... එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක බෙර හඬක් ..... ආයුෂ්මතුනි, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා ..... දිව්‍ය වූ ශ්‍රවණයෙන් ..... දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

30. පුන ච පරං ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... ඓතෝපරියඤාණාය චිත්තං අභිනීහරති ..... සෝ පරසත්තානං පරපුග්ගලානං ඓතසා ඓතෝ පරි-ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති ..... අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති. සෙය්‍යථාපි ආවුසෝ ඉත්ථී වා පුරිසෝ වා ..... ආදාසේ වා..... උදකපත්තේ සකං මුඛනිමිත්තං ප-චවෙක්ඛමානෝ සකණිකං වා සකණිකන්ති ජානෙය්‍ය, අකණිකං වා අකණිකන්ති ජානෙය්‍ය, ඒවමේව ඛෝ ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... ඓතෝපරියඤාණාය චිත්තං අභිනීහරති ..... සෝ පරසත්තානං පරපුග්ගලානං ඓතසා ඓතෝ පරි-ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති ..... අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

30. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම්, ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි ..... එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා. රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා ..... කෙලෙසුන්ගෙන් නොමිදුණු සිත කෙලෙසුන්ගෙන් නොමිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. ආයුෂ්මතුනි, ඒක මේ වගේ දෙයක්. ලස්සනට සැරසෙන්ට කැමති ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ..... ඔහු පිරිසිදු දීප්තිමත් කණ්ණාඩියක් ඉදිරියේ හෝ පැහැදිලි

දිය ඇති බඳුනකින් හෝ තමන් ගේ මුව මඩල හොඳින් විමසා බලනවා. එතකොට දොස් ඇති තැන දොස් ඇති තැන වශයෙන් දැන ගන්නවා. දොස් නැති තැන දොස් නැති තැන වශයෙන් දැන ගන්නවා. ආයුෂ්මතුනි, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි ..... එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා. රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා ..... කෙලෙසුන්ගෙන් මිදුණු සිත කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

31. පුන ච පරං ආවුසෝ ඒවං සමාහිතේ චිත්තේ ..... පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති ..... අනේකවිහිතං

පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: ඒකම්'පි ජාතිං ..... අනේකේ'පි සංවට්ටවිවට්ටකප්පේ, අමුත්‍රාසිං ඒවන්නාමෝ ඒවං ගොත්තෝ ..... ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති.

31. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම්, ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි ..... එයට සිත නතු කරයි ..... නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක් ..... ආදී වශයෙන් ආකාර සහිත ව සවිස්තර ව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

32. පුනචපරං ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති ..... සෝ දිබ්බේන

චක්ඛුනා ..... සත්තේ පස්සති චවමානේ උප්පජ්ජමානේ ..... සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානති.

32. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම්, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා ..... එතකොට ඒ භික්ෂුව දිවැසින් ..... චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා ..... ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා.

පුනචපරං ආවුසෝ, ඒවං සමාහිතේ චිත්තේ ..... සෙය්‍යථාපි ආවුසෝ පබ්බතසංඛේපේ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ තීරේ ඨිතෝ පස්සෙය්‍ය සිප්පිසම්බුකම්'පි සක්ඛර-කඨලම්'පි ම-ඡගුම්බම්'පි චරන්තම්'පි තිට්ඨන්තම්'පි. තස්ස ඒවමස්ස: අයං ඛෝ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්‍රිමේ සිප්පිසම්බුකා'පි සක්ඛරකඨලා'පි ම-ඡගුම්බා'පි චරන්ති'පි තිට්ඨන්ති'පීති. ඒවමේව ඛෝ ආවුසෝ, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති ..... අයං ආසවනිරෝධගාමිනී පටිපදාති යථාභූතං පජානාති.

ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම්, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... ආයුෂ්මතුනි, එක මේ වගේ දෙයක්. පර්වත මුදුනක ජලාශයක් තියෙනවා. එහි ජලය ඉතා හොඳයි. හරිම ප්‍රසන්නයි. කැළඹිලා නෑ. එතැන ඇස් ඇති පුරුෂයෙක් ඒ ඉවුරේ සිටගෙන ජලාශය දෙස බලා සිටිනවා. එතකොට ඔහුට සිප්පි බෙල්ලනුත්, සක්බෙල්ලනුත්, කැටකැබලිත්, මාළු රංචු ආදියත් හැසිරෙන අයුරු, සිටින අයුරු දකින්ට ලැබෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක ඉතා හොඳ ජලය ඇති හරිම ප්‍රසන්න වූ නො කැළඹුණු දිය ඇති විලක්. මෙහි මේ සිප්පිබෙල්ලන්, සක්බෙල්ලන්, කැටකැබලිති, මාළු රංචුත් හැසිරෙනවා නෙව. ඉන්නවා නෙව" කියල. ආයුෂ්තුනි, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා. එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යයයි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා ..... මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

තස්ස එවං ජානතෝ එවං පස්සතෝ කාමාසවා'පි චිත්තං විමු-චති භවාසවා'පි චිත්තං විමු-චති. අවිජ්ජාසවා'පි චිත්තං විමු-චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස් වුණ බවට ඤැණය ඇති වෙනවා. "ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා.

33. යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු එවං ජානාති එවං පස්සති, න කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙන්නේ නෑ.

අහං ඛෝ පනේතං ආවුසෝ එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

34. ඉදමවෝච භගවා. අත්තමනෝ ඔට්ඨද්ධෝ ලිච්ඡවී භගවතෝ භාසිතං අභිනන්දීති.

34. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළා. සතුටට පත් ඔට්ඨද්ධ ලිච්ඡවී භාග්‍යවතුන් වහන්සේ ගේ මෙම දේශනය සතුටින් පිළිගත්තා.

මහාලීසුත්තං නිට්ඨිතං ඡට්ඨං
හයවෙනි මහාලී සූත්‍රය නිමා විය.

සාදු ! සාදු !! සාදු !!!

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

7
ජාලිය සුත්තං
ජාලිය පිරිවැජියාට වදාළ දෙසුම

1. ඒවං මේ සුතං ඒකං සමයං භගවා කෝසම්බියං විහරති ඝෝසිතාරාමේ. තේන ඛෝ පන සමයේන ද්වේ පබ්බජිතා මණ්ඩිස්සෝ ච පරිබ්බාජකෝ ජාලියෝ ච දාරුපත්තිකන්තේවාසී යේන භගවා තේනුපසංකමිංසු. උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මෝදිංසු. සම්මෝදනීයං කථං සරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං අට්ඨංසු. ඒකමන්තං ඨිතා ඛෝ තේ ද්වේ පබ්බජිතා භගවන්තං ඒතදවෝචුං. "කින්නු ඛෝ ආවුසෝ ගෝතම, තං ජීවං තං සරීරං? උදාහු අඤ්ඤං ජීවං අඤ්ඤං සරීර?"න්ති.

1. මා හට අසන්ට ලැබුණේ මේ විදිහට යි. ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ වාසය කළේ කොසඹෑ නුවර ඝෝෂිතාරාමයේ. එතකොට මණ්ඩිස්ස කියන පිරිවැජියාත්, දාරුපත්තික ගේ ගෝලයෙක් වන ජාලියත් යන පැවිද්දන් දෙදෙනා භාග්‍යවතුන් වහන්සේ ළඟට පැමිණුනා. පැමිණිලා භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වුණා. සතුටු විය යුතු පිළිසඳර කථාබහ නිමවා එකත්පස්ව සිට ගත්තා. එකත්පස්ව සිටගත් ඒ පැවිද්දන් දෙදෙනා භාග්‍යවතුන් වහන්සේට මෙහෙම කිව්වා. "ආයුෂ්මත් ගෞතමයෙනි, ඒ ජීවය ම ද ඒ ශරීරය වන්නේ? එහෙම නැත්නම් ජීවය වෙන එකක් ද? ශරීරය වෙන එකක් ද?" කියල.

2. තේන හාවුසෝ සුණාථ සාධුකං මනසි කරෝථ භාසිස්සාමීති. "ඒවමාවුසෝ"ති ඛෝ තේ ද්වේ පබ්බජිතා භගවතෝ පච්චස්සෝසුං. භගවා ඒතදවෝච:

2. "එසේනම් ආයුෂ්මතුනි, සවන් යොමා අසන්න. හොඳින් මෙනෙහි කරන්න. මා කියා දෙන්නම්." "එසේය ආයුෂ්මතුනි" කියා ඒ පැවිද්දන් දෙදෙනා භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නා. භාග්‍යවතුන් වහන්සේ මෙකරුණ පැවසුවා.

3. ඉධාවුසෝ තථාගතෝ ලෝකේ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධෝ (යථා සාමඤ්ඤඵලේ ඒවං විත්ථාරේතබ්බං) ..... ඒවං ඛෝ ආවුසෝ භික්ඛු සීලසම්පන්නෝ හෝති.

3. ආයුෂ්මතුනි, මෙහිලා තථාගත වූ අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව පහළ වන සේක (සාමඤ්ඤඵල සූත්‍රයේ විස්තර වන ආකාරයට ම විස්තර කළ යුතු ය) ..... ආයුෂ්මතුනි, භික්ෂුව සීල සම්පන්න වන්නේ ඔය ආකාරයට යි.

4. කථඤ්ච ආවුසෝ භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති? ඉධාවුසෝ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හෝති ..... එවං ඛෝ ආවුසෝ, භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති.

4. ආයුෂ්මතුනි, භික්ෂුව අකුසලයන් වැළකූ ද්වාර ඇති ඉඳුරන් ඇතිව ඉන්නේ කොහොම ද? ආයුෂ්මතුනි, මෙහිලා භික්ෂුව ඇසින් රූප දැක නිමිති ගන්නේ නෑ ..... ආයුෂ්මතුනි, භික්ෂුව අකුසලයෙන් වැළැක් වූ දොරටු ඇති ඉන්ද්‍රියයන් තුළ ඉන්නේ ඔය විදිහට යි.

5. කථඤ්ච ආවුසෝ, භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති? ඉධාවුසෝ, භික්ඛු අභික්කන්තේ පටික්කන්තේ සම්පජානකාරී හෝති ..... ඒවං ඛෝ ආවුසෝ, භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති.

5. ආයුෂ්මතුනි, භික්ෂුව සිහිනුවණින් යුතුව සිටින්නේ කොහොම ද? ආයුෂ්මතුනි, මෙහිලා භික්ෂුව ඉදිරියට යද්දීත්, ආපසු එද්දීත්, එය කරන්නේ සිහි නුවණින් ම යි ..... ආයුෂ්මතුනි, භික්ෂුව සිහිනුවණින් යුතු වන්නේ ඔය ආකාරයට යි.

6. කථඤ්ච ආවුසෝ, භික්ඛු සන්තුට්ඨෝ හෝති? ඉධාවුසෝ භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරිකේන චීවරේන ..... ඒවං ඛෝ ආවුසෝ, භික්ඛු සන්තුට්ඨෝ හෝති.

6. ආයුෂ්මතුනි, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ කොහොම ද? ආයුෂ්මතුනි, මෙහිලා භික්ෂුව කය පරිහරණයට සෑහෙන සිවුරෙන් ..... ආයුෂ්මතුනි, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ ඔය විදිහට යි.

7. සෝ ඉමිනා ච අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ ..... පරිමුඛං සතිං උපට්ඨපෙත්වා ..... සෝ අභිජ්ඣං ලෝකේ පහාය ..... විචිකිච්ඡාය චිත්තං පරිසෝධේති.

7. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් යුක්ත වෙලා ..... භාවනා අරමුණෙහි සිහිය පිහිටුවා ගෙන වාඩිවෙනවා ..... ඔහු ජීවිතය නම් වූ ලෝකය ගැන ඇති විසම ලෝභය දුරු කොට ..... සැකය කෙරෙන් සිත පිරිසිදු කරනවා.

සෙය්‍යථාපි ආවුසෝ, පුරිසෝ ඉණං ආදාය කම්මන්තේ පයෝජෙය්‍ය ..... සෙය්‍යථාපි ආවුසෝ, පුරිසෝ ආබාධිකෝ අස්ස ..... සෙය්‍යථාපි ආවුසෝ, පුරිසෝ බන්ධනාගාරේ බද්ධෝ අස්ස ..... සෙය්‍යථාපි ආවුසෝ, පුරිසෝ දාසෝ අස්ස අනත්තාධීනෝ ..... සෙය්‍යථාපි ආවුසෝ, පුරිසෝ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය ..... ඉමේ පඤ්ච නීවරණේ අප්පහීණේ අත්තනි සමනුපස්සෙය්‍ය ..... සෝ අපරේන සමයේන තං කන්තාරං නිත්ථරෙය්‍ය ..... එවමේව ඛෝ ආවුසෝ, භික්ඛු ඉමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සති .....

ආයුෂ්මතුනි, එය මෙවැනි දෙයක්. පුරුෂයෙක් ණයක් අරගෙන කර්මාන්තයක යොදවනවා ..... ආයුෂ්මතුනි, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් රෝගී වෙලා ..... ආයුෂ්මතුනි, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් හිරගෙදරක බන්ධනයකට හසුවෙනවා ..... ආයුෂ්මතුනි, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නොහැකි, දාසයෙක් වෙලා හිටියා ..... ආයුෂ්මතුනි, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසෙනවා ..... මේ පංච නීවරණයන් ප්‍රහාණය නොවී තමා තුළ පවතින හැටි දකිනවා ..... ඔහු පසුකලෙක නිරුදක කතර ගෙවා ආරක්ෂා සහිත ක්ෂේම භූමියකට පැමිණුනා ..... ආයුෂ්මතුනි අන්න ඒ විදිහමයි භික්ෂුව තමා තුළ මේ පංච නීවරණයන් දුරුවී ඇති ආකාරයත් දකින්නේ .....

තස්සිමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සතෝ ..... චිත්තං සමාධියති

ඔහුට මේ පඤ්ච නීවරණයන් තමා තුළ නැති බව දකිද්දි ..... සිත සමාධිමත් වෙනවා.

සෝ විවි-ෙච කාමේහි ..... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති ..... නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

ඔහු කාමයන්ගෙන් වෙන්ව ..... පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා ..... ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

8. පුන ච පරං ආවුසෝ භික්ඛු විතක්කවිචාරානං වූපසමා ..... දුතියං ඣානං උපසම්පජ්ජ විහරති ..... නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

8. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම් භික්ෂුව විතක්ක විචාරයන් ගේ සංසිඳීමෙන් ..... දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා ..... ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

පුන ච පරං ආවුසෝ භික්ඛු පීතියා ච විරාගා ..... තතියං ඣානං උපසම්පජ්ජ විහරති ..... නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති.

ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම් භික්ෂුව ප්‍රීතියට ද නොඇලීමෙන් ..... තුන්වන ධ්‍යානයත් උපදවා ගෙන වාසය කරනවා ..... ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

9. පුන ච පරං ආවුසෝ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා ..... චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති ..... නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති.

9. ආයුෂ්මතුනි, නැවතත් කියනවා නම් භික්ෂුව සැපය ද ප්‍රහාණය කිරීමෙන්, දුක ද ප්‍රහාණය කිරීමෙන් ..... සතර වෙනි ධ්‍යානය උපදවා ගෙන වාසය කරනවා ..... ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

10. **පුන ච පරං ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ ..... භේදනවිද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති. සෙය්‍යථාපි ආවුසෝ මණි වේළුරියෝ ..... තත්‍රස්ස සුත්තං අයං ඛෝ මණි වේළුරියෝ ..... තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා ..... පණ්ඩුසුත්තං වා"ති. ඒවමේව ඛෝ ආවුසෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... ඤාණදස්සනාය චිත්තං අභිනීහරති ..... සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී ..... ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති ..... (යථා පුබ්බේ ඒවං විත්ථාරේ තබ්බං)**

10. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම් භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "සතර මහා භූතයන්ගෙන් හට ගත් රූපවත් වූ මාගේ මේ කය

වනාහී ..... බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, (මහාභූත නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි. ආයුෂ්මතුනි, එක මේ වගේ දෙයක්. වෛරෝඩි මාණික්‍යයක් තියෙනවා ..... මේ මැණික තුළ නිල් නූලක් වේවා ..... පඬුපැහැ නූලක් වේවා, අමුණලා තියෙනවා" කියලා. ආයුෂ්මතුනි, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි ..... එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත් ..... මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි" කියල. (පෙර පරිදිම විස්තර කළ යුතුයි)

11. පුනචපරං ආවුසෝ ..... එවං සමාහිතේ චිත්තේ ..... මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති .....

11. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම් ..... ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි .....

12. පුන ච පරං ආවුසෝ භික්ඛු ..... එවං සමාහිතේ චිත්තේ ..... ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති ..... යාව බ්‍රහ්මලෝකා'පි කායේන වසං වත්තේති .....

12. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම්, භික්ෂුව ..... ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි ..... බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා.

13. පුන ච පරං ආවුසෝ භික්ඛු එවං සමාහිතේ චිත්තේ ..... දිබ්බාය සෝතධාතුයා ..... චෙතෝපරියඤාණාය ..... පුබ්බේනිවාසානුස්සතිඤාණාය .....

13. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම්, ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා

..... අනුන් ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ ..... කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ .....

(යථා මහාලිසුත්තේ එවං විත්ථාරේතබ්බං)
(මහාලි සූත්‍රයේ පරිදි විස්තර කළ යුතු යි)

14. පුනචපරං ආවුසෝ භික්ඛු එවං සමාහිතේ චිත්තේ ..... සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති ..... යථාකම්මූපගේ සත්තේ පජානති.

14. ආයුෂ්මතුනි, තව දුරටත් කියනවා නම්, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා ..... ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා.

යෝ ඛෝ ආවුසෝ භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

"යෝ සෝ ආවුසෝ භික්ඛු එවං ජානාති එවං පස්සති, කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා"ති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා.

අහං ඛෝ පනේතං ආවුසෝ එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

15. පුනචපරං ආවුසෝ, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති ..... ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

15. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට ..... ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා. එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා ..... "ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා.

යෝ නු ඛෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, කල්ලං නු ඛෝ තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා?ති.

ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙනවා ද?

"යෝ සෝ ආවුසෝ භික්ඛු ඒවං ජානාති ඒවං පස්සති, න කල්ලං තස්සේතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා"ති.

(ඒ පිරිවැජියන්:) ආයුෂ්මතුනි, යම් භික්ෂුවක් ඔය විදිහට දන්නවා නම්, ඔය විදිහට දකිනවා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි කරුණු කියන එක ගැලපෙන්නේ නෑ.

අහං ඛෝ පනේතං ආවුසෝ ඒවං ජානාමි ඒවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ආයුෂ්මතුනි, ඔය කරුණ ගැන මං ඔය විදිහට දන්නවා. ඔය විදිහට දකිනවා. නමුත් මා නම් ජීවයත් එය ම යි, ශරීරයත් එය ම යි කියල හරි, ජීවය වෙනත් එකක්, ශරීරය තවත් එකක් කියල හරි පවසන්නේ නෑ.

16. ඉදමවෝච භගවා. අත්තමනා තේ ද්වේ පබ්බජිතා භගවතෝ භාසිතං අභිනන්දුන්ති.

16. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළා. සතුටට පත් ඒ පැවිද්දන් දෙදෙනා භාග්‍යවතුන් වහන්සේ ගේ මෙම දේශනය සතුටින් පිළිගත්තා.

ජාලියසුත්තං නිට්ඨිතං සත්තමං.
හත් වෙනි ජාලිය සූත්‍රය නිමා විය.

සාදු ! සාදු !! සාදු !!!

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

8.
සීහනාද සුත්තං
අචේලකස්සපට වදාළ සිංහනාදයක් බඳු දෙසුම

1. එවං මේ සුතං: එකං සමයං භගවා උජුඤ්ඤයං විහරති කණ්ණකත්ථලේ මිගදායේ. අථ ඛෝ අචේලෝ කස්සපෝ යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මෝදි. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං අට්ඨාසි.

1. මා හට අසන්ට ලැබුණේ මේ විදිහට යි. ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ වැඩසිටියේ උජුඤ්ඤ නුවර කණ්ණකත්ථල නම් මුව වනයෙහිය. එදා අචේලකස්සප (නම් වූ නිරුවත් තවුසා) භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි තැනට පැමිණුනා. පැමිණිලා භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වුණා. සතුටුවිය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව සිටගත්තා.

2. ඒකමන්තං ඨිතෝ ඛෝ අචේලෝ කස්සපෝ භගවන්තං ඒතදවෝච: "සුතම්මේතං භෝ ගෝතම, සමණෝ ගෝතමෝ සබ්බං තපං ගරහති. සබ්බං තපස්සිං විඛාජීවිං. ඒකංසේන උපක්කෝසති උපවදතීති. යේ තේ භෝ ගෝතම ඒවමාහංසු සමණෝ ගෝතමෝ සබ්බං තපං ගරහති, සබ්බං තපස්සිං විඛාජීවිං ඒකංසේන උපක්කෝසති උපවදතීති. කච්චි තේ භෝතෝ ගෝතමස්ස වුත්තවාදිනෝ? න ච භවන්තං ගෝතමං අභූතේන අබ්භාචික්ඛන්ති? ධම්මස්ස චානුධම්මං බ්‍යාකරොන්ති? න ච කෝචි සහධම්මිකෝ වාදානුවාදෝ ගාරය්හං ඨානං ආගච්ඡති? අනබ්භක්ඛාතුකාමා හි මයං භවන්තං ගෝතම"න්ති.

2. එකත්පස්ව සිටි අචේලකස්සප භාග්‍යවතුන් වහන්සේට මෙහෙම කිව්වා. "භවත් ගෞතමයෙනි, මට මේ කාරණය අසන්ට ලැබුණා. ඒ කියන්නේ ශ්‍රමණ ගෞතමයන් සෑම තපසකට ම ගරහනවා කියල. ඒ වගේ ම රූක්ෂ ජීවිකා ඇති සෑම තවුසෙකුටමත් එක් අංශයකින් විතරක් බලල ආක්‍රෝෂ, උපවාද කරනවා කියල. ඒ යමෙක් භවත් ගෞතමයන්ට මෙහෙම කිව්වා නම්, ඒ කියන්නේ "ශ්‍රමණ ගෞතමයන් සෑම තපසකට ම ගරහනවා කියල. ඒ වගේ ම රූක්ෂ ජීවිකා ඇති සෑම තවුසෙකුටමත් එක් අංශයකින් විතරක් බලල ආක්‍රෝෂ, උපවාද කරනවා" කියල. ඇත්තෙන් ම ඔවුන් කියන්නේ භවත්

ගෞතමයන් වහන්සේ පැවැසූ දෙයක් ම ද? භවත් ගෞතමයන් වහන්සේට අභූතයෙන් චෝදනා කිරීමක් නැද්ද? ධර්මානුකූල දෙයක් ම පැවසීමක් ද? කිසිවෙක් කරුණු සහිතව වාද නන්වා ගැරහිය යුතු බවට පත් වීමක් නැද්ද? අනික අපට නම් භවත් ගෞතමයන් වහන්සේට අභූතයෙන් චෝදනා කරන්ට කැමැත්තක් නෑ.

3. යේ තේ කස්සප ඒවමාහංසු: සමණෝ ගෝතමෝ සබ්බං තපං ගරහති. සබ්බං තපස්සිං විඛාජීවිං ඒකංසේන උපක්කෝසති උපවදතීති. න මේ තේ වුත්තවාදිනෝ. අබ්භාචික්ඛන්ති ච පන මං තේ අසතා අභූතේන.

3. පින්වත් කස්සප, යම් කෙනෙක් මේ විදිහට කිව්වා නම්, ඒ කියන්නේ "ශ්‍රමණ ගෞතමයන් සෑම තපසකට ම ගරහනවා කියල. ඒ වගේ ම රූක්ෂ ජීවිකා ඇති සෑම තවුසෙකුටමත් එක් අංශයකින් විතරක් බලල ආක්‍රෝෂ, උපවාද කරනවා" කියල. ඔවුන් කියන්නේ මා පැවසූ දෙයක් නොවේ. ඔවුන් මට නැති දෙයකින් අභූතයෙන් චෝදනා කරනවා.

ඉදාහං කස්සප ඒකච්චං තපස්සිං විඛාජීවිං පස්සාමි දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං. ඉධ පනාහං කස්සප ඒකච්චං තපස්සිං විඛාජීවිං පස්සාමි දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නං.

පින්වත් කස්සප, මෙහි මම මිනිස් දර්ශන පථය ඉක්මවා ගිය පිරිසිදු දිව්‍යැසින් රූක්ෂ ජීවිත ඇති ඇතැම් තවුසෙකු කය බිඳී මරණින් මතු අපාය දුගති විනිපාත නම් වූ නිරයෙහි ඉපද සිටින බව දකිනවා. ඒ වගේ ම පින්වත් කස්සප, මෙහි මම මිනිස් දර්ශන පථය ඉක්මවා ගිය පිරිසිදු දිව්‍යැසින් රූක්ෂ ජීවිත ඇති ඇතැම් තවුසෙකු කය බිඳී මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ග ලෝකයෙහි ඉපද සිටින බව දකිනවා.

ඉදාහං කස්සප ඒකච්චං තපස්සිං අප්පදුක්ඛවිහාරිං පස්සාමි දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං. ඉධ පනාහං කස්සප ඒකච්චං තපස්සිං අප්පදුක්ඛවිහාරිං පස්සාමි දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නං.

පින්වත් කස්සප, මෙහි මම මිනිස් දර්ශන පථය ඉක්මවා ගිය පිරිසිදු දිවැසින් අල්ප දුක් ඇති විහරණයෙන් ගත කළ ජීවිත ඇති ඇතැම් තවුසෙකු කය බිඳී මරණින් මතු අපාය දුගති විනිපාත නම් වූ නිරයෙහි ඉපද සිටින බව දකිනවා. ඒ වගේ ම පින්වත් කස්සප, මෙහි මම මිනිස් දර්ශන පථය ඉක්මවා ගිය පිරිසිදු දිවැසින් අල්ප දුක් ඇති විහරණයෙන් ගත කළ ජීවිත ඇති ඇතැම් තවුසෙකු කය බිඳී මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ග ලෝකයෙහි ඉපද සිටින බව දකිනවා.

යෝ'හං කස්සප ඉමේසං තපස්සීනං ඒවං ආගතිඤ්ච ගතිඤ්ච චුතිඤ්ච උපපත්තිඤ්ච යථාභූතං පජානාමි. සෝ'හං කිං සබ්බං තපං ගරහිස්සාමි, සබ්බං වා තපස්සිං විඛාජීවිං ඒකංසේන උපක්කෝසිස්සාමි උපවදිස්සාමි?

පින්වත් කස්සප, යම් බඳු මා ඔය තාපසයන් ගේ මෙලොව පැමිණීමත්, පරලොව උපතත්, චුත වීමත්, ඉපදීමත් ඒ ආකාරයෙන් ම දැනගන්නවා නම්, එතකොට ඒ මං සියළු තපසට මොනවට නම් ගරහනවා ද? කටුක දිවිපෙවෙත් ඇති සියළු තවුසන්ට එක් පැත්තකින් පමණක් බලා මොනවට නම් ආක්‍රෝෂ කරන්ට ද? උපවාද කරන්ට ද?

4. සන්ති කස්සප එකේ සමණබ්‍රාහ්මණා පණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාළවේධිරූපා වෝභින්දන්තා මඤ්ඤේ චරන්ති පඤ්ඤාගතේන දිට්ඨිගතානි. තේහි'පි මේ සද්ධිං ඒකච්චේසු ඨානේසු සමේති ඒකච්චේසු ඨානේසු න සමේති. යන්තේ ඒකච්චං වදෙන්ති සාධූ'ති, මයම්පි තං ඒකච්චං වදේම සාධූ'ති. යන්තේ ඒකච්චං වදෙන්ති න සාධූ'ති, මයම්පි තං ඒකච්චං වදේම න සාධූ'ති. යන්තේ ඒකච්චං වදෙන්ති සාධූ'ති, මයං තං ඒකච්චං වදේම න සාධූ'ති. යන්තේ ඒකච්චං වදෙන්ති න සාධූ'ති, මයං තං ඒකච්චං වදේම සාධූ'ති. යං මයං ඒකච්චං වදේම සාධූ'ති. පරේපි තං ඒකච්චං වදෙන්ති සාධූනි. යං මයං ඒකච්චං වදේම න සාධූ'ති. පරේපි තං ඒකච්චං වදෙන්ති න සාධූ'ති. යං මයං ඒකච්චං වදේම න සාධූ'ති. පරේපි තං ඒකච්චං වදෙන්ති සාධූ'ති. යං මයං ඒකච්චං වදේම සාධූ'ති. පරේපි තං ඒකච්චං වදෙන්ති න සාධූ'ති.

4. පින්වත් කස්සප, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. සූක්ෂ්ම ඥාණවන්ත යි. නිපුණ යි. අතිශයින් ම දක්ෂ දුනුවායන් වගේ අනුන් සමග වාදවිවාද කරල තමන් ගේ ප්‍රඥා කෞෂල්‍යයෙන් දෘෂ්ටිගතිකයන් පරදවලා ඉන්නවා. ඔවුනුත් මා සමග ඇතැම් ආකල්ප පිළිබඳ ව සමාන වෙනවා. ඇතැම් ආකල්ප

පිළිබඳ ව සමාන නෑ. ඔවුන් ඇතැම් දේවල් යහපත් කියා කියනවා ද, අපිත් ඒ ඇතැම් දේවල් යහපත් කියා කියනවා. ඔවුන් යම් ඇතැම් දේවල් අයහපත් කියා කියනවා ද, අපිත් ඒ ඇතැම් දේවල් අයහපත් කියා කියනවා. ඔවුන් ඇතැම් දේවල් හොඳ යි කියනවා. ඉතින් ඔවුන් ඒ හොඳ යි කියන ඇතැම් දේවල් ගැන අපි කියන්නේ හොඳ නෑ කියල. ඔවුන් ඇතැම් දේවල් හොඳ නෑ කියනවා. ඉතින් ඔවුන් ඒ හොඳ නෑ කියන ඇතැම් දේවල් ගැන අපි කියන්නේ හොඳ යි කියල. අපි යම් දෙයක් හොඳ යි කියල කියනවා ද අනෙක් අයත් එය හොඳ යි කියල කියනවා. අපි යම් දෙයක් හොඳ නෑ කියල කියනවා ද අනෙක් අය එය හොඳ නෑ කියල කියනවා. අපි යම් දෙයක් හොඳ යි කියල කියනවා ද අනෙක් අයත් එය හොඳ නෑ කියල කියනවා. අපි යම් දෙයක් හොඳ නෑ කියල කියනවා ද අනෙක් අය එය හොඳ යි කියල කියනවා.

නාහං උපසංකමිත්වා එවං වදාමි: යේසු නෝ ආවුසෝ ඨානේසු න සමේති, තිට්ඨන්තු තානි ඨානානි. යේසු ඨානේසු සමේති, තත්ථ විඤ්ඤූ සමනුයුඤ්ජන්තං සමනුගාහන්තං සමනුභාසන්තං සත්ථාරා වා සත්ථාරං සංසේන වා සංසං: "යේ ඉමේසං භවතං ධම්මා අකුසලා අකුසලසංඛාතා සාවජ්ජා සාවජ්ජසංඛාතා අසේවිතබ්බා අසේවිතබ්බසංඛාතා න අලමරියා න අලමරියසංඛාතා කණ්හා කණ්හසංඛාතා, කෝ ඉමේ ධම්මේ අනවසේසං පහාය වත්තති, සමණෝ වා ගෝතමෝ පරේ වා පන හොන්තෝ ගණාචරියා?"ති.

ම‍ං ඔවුන් කරා ගිහින් මෙහෙම කියනවා. "ආයුෂ්මත්නි, යම් යම් ආකල්ප පිළිබඳ ව අපි සමාන වෙන්නේ නැත්නම්, ඒවා පසෙක තබත්වා. යම් යම් ආකල්ප පිළිබඳ ව අපි සමාන වෙනවා නම්, ඒ පිළිබඳව නුවණැති උදවිය ශාස්තෘවරයෙක් ශාස්තෘවරයෙක් සමග හෝ ශ්‍රාවක පිරිසක් ශ්‍රාවක පිරිසක් සමග හෝ එක්ව සාකච්ඡා කරත්වා. කරුණු මතු කරත්වා. තම අදහස් ඉදිරිපත් කරත්වා" කියල. ඒ කියන්නේ "මේ භවතුන් ගේ යම් කිසි ධර්මයක් තියෙනවා නම් එක්කෝ අකුසල් වේවා, අකුසල පාක්ෂික වේවා. වැරදි සහිත වේවා, වැරදි පක්ෂයට අයත් වේවා, සේවනය නො කළ යුතු දෙයක් වේවා, සේවනය නො කළ යුතු පක්ෂයට අයත් දෙයක් වේවා, ආර්යභාවය ඇති නො කරන දෙයක් වේවා, ආර්යභාවය ඇති නො කරන පක්ෂයට අයත් දෙයක් වේවා. පවිටු දෙයක් වේවා, පවිටු පාක්ෂික දෙයක් වේවා. කවුද මේ දේවල් ඉතිරි නැතුව ප්‍රහාණය කරල ඉන්නේ? ශ්‍රමණ ගෞතමයන් ද? එහෙම නැත්නම් අන්‍ය වූ භවත් ගණාචාර්යවරුන් ද?" කියල.

යානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා ඒවං වදෙය්‍යුං: "යේ ඉමේසං භවතං ධම්මා අකුසලා අකුසලසංඛාතා සාවජ්ජා සාවජ්ජසංඛතා අසේවිතබ්බා අසේවිතබ්බසංඛාතා න අලමරියා න අලමරියසංඛාතා කණ්හා කණ්හසංඛතා, සමණෝ ගෝතමෝ ඉමේ ධම්මේ අනවසේසං පහාය වත්තති, යං වා පන හොන්තෝ පරේ ගණාචරියා"ති. ඉතිහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හේව තත්ථ යේභුය්‍යෙන පසංසෙය්‍යුං.

පින්වත් කස්සප, එතකොට මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. නුවණැති උදවිය තමන් ගේ මතවාද එක්ව සාකච්ඡා කරද්දී, කරුණු මතු කරද්දී තම අදහස් ඉදිරිපත් කරද්දී මෙහෙමයි කියන්නේ. "මේ භවතුන් ගේ යම් කිසි ධර්මයක් තියෙනවා නම් එක්කෝ අකුසල් වේවා, අකුසල පාක්ෂික වේවා. වැරදි සහිත වේවා, වැරදි පක්ෂයට අයත් වේවා, සේවනය නො කළ යුතු දෙයක් වේවා, සේවනය නො කළ යුතු පක්ෂයට අයත් දෙයක් වේවා, ආර්යභාවය ඇති නො කරන දෙයක් වේවා, ආර්යභාවය ඇති නො කරන පක්ෂයට අයත් දෙයක් වේවා. පවිටු දෙයක් වේවා, පවිටු පාක්ෂික දෙයක් වේවා. මේ අකුසල ධර්මයන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තමයි මුළුමණින් ම ප්‍රහාණය කරලා සිටින්නේ. අන්‍ය වූ භවත් ගණාචාර්යවරු යන්තමින් දෙයක් බැහැර කරල ඉන්නවා" කියල. ඉතින් පින්වත් කස්සප, ඔය විදිහට නුවණැති උදවිය තමන් ගේ මතවාද එක්ව සාකච්ඡා කරද්දී, කරුණු මතු කරද්දී තම අදහස් ඉදිරිපත් කරද්දී ඒ කාරණ අරභයා බොහෝ සෙයින් ම ප්‍රශංසා කරන්නේ අපට ම යි.

5. අපරම්පි නෝ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තං සමනුගාහන්තං සමනුභාසන්තං සත්ථාරා වා සත්ථාරං සංසේන වා සංඝං: "යේ ඉමේසං භවතං ධම්මා කුසලා කුසලසංඛාතා අනවජ්ජා අනවජ්ජසංඛාතා සේවිතබ්බා සේවිතබ්බසංඛාතා අලමරියා අලමරියසංඛාතා සුක්කා සුක්කසංඛාතා, කෝ ඉමේ ධම්මේ අනවසේසං සමාදාය වත්තති, සමණෝ වා ගෝතමෝ පරේ වා පන හොන්තෝ ගණාචරියා?"ති.

5. තව දුරටත් කියනවා නම් පින්වත් කස්සප, නුවණැති උදවිය ශාස්තෘවරයෙක් ශාස්තෘවරයෙක් සමග හෝ ශ්‍රාවක පිරිසක් ශ්‍රාවක පිරිසක් සමග හෝ එක්ව සාකච්ඡා කරත්වා. කරුණු මතු කරත්වා. තම අදහස් ඉදිරිපත් කරත්වා" කියල. ඒ කියන්නේ "මේ භවතුන් ගේ යම් කිසි ධර්මයක්

තියෙනවා නම් එක්කෝ කුසල් වේවා, කුසල පාක්ෂික වේවා. වැරදි රහිත වේවා, නිවැරදි පක්ෂයට අයත් වේවා, සේවනය කළ යුතු දෙයක් වේවා, සේවනය කළ යුතු පක්ෂයට අයත් දෙයක් වේවා, ආර්යභාවය ඇති කරන දෙයක් වේවා, ආර්යභාවය ඇති කරන පක්ෂයට අයත් දෙයක් වේවා. යහපත් දෙයක් වේවා, යහපත් පාක්ෂික දෙයක් වේවා. කවුද මේ දේවල් අඩු නැතුව සම්පූර්ණ කරගෙන ඉන්නේ? ශ්‍රමණ ගෞතමයන් ද? එහෙම නැත්නම් අන්‍ය වූ භවත් ගණාචාර්යවරුන් ද?" කියල.

යානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා ඒවං වදෙය්‍යුං: "යේ ඉමේසං භවතං ධම්මා කුසලා කුසලසංඛාතා අනවජ්ජා අනවජ්ජසංඛාතා සේවිතබ්බා සේවිතබ්බසංඛාතා අලමරියා අලමරියසංඛාතා සුක්කා සුක්කසංඛාතා, සමණෝ ගෝතමෝ ඉමේ ධම්මේ අනවසේසං සමාදාය වත්තති, යං වා පන හොන්තෝ පරේ ගණාචරියා"ති. ඉතිහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හේව තත්ථ යේභුය්‍යෝන පසංසෙය්‍යුං.

පින්වත් කස්සප, එතකොට මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. නුවණැති උදවිය තමන් ගේ මතවාද එක්ව සාකච්ඡා කරද්දී, කරුණු මතු කරද්දී තම අදහස් ඉදිරිපත් කරද්දී මෙහෙමයි කියන්නේ. "මේ භවතුන් ගේ යම් කිසි ධර්මයක් තියෙනවා නම් එක්කෝ කුසල් වේවා, කුසල පාක්ෂික වේවා. වැරදි රහිත වේවා, නිවැරදි පක්ෂයට අයත් වේවා, සේවනය කළ යුතු දෙයක් වේවා, සේවනය කළ යුතු පක්ෂයට අයත් දෙයක් වේවා, ආර්යභාවය ඇති කරන දෙයක් වේවා, ආර්යභාවය ඇති කරන පක්ෂයට අයත් දෙයක් වේවා. යහපත් දෙයක් වේවා, යහපත් පාක්ෂික දෙයක් වේවා. මේ කුසල ධර්මයන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තමයි මුළුමණින් ම සම්පූර්ණ කරලා සිටින්නේ. අන්‍ය වූ භවත් ගණාචාර්යවරු යන්තමින් දෙයක් කරගෙන ඉන්නවා" කියල. ඉතින් පින්වත් කස්සප, ඔය විදිහට නුවණැති උදවිය තමන් ගේ මතවාද එක්ව සාකච්ඡා කරද්දී, කරුණු මතු කරද්දී තම අදහස් ඉදිරිපත් කරද්දී ඒ කරුණ අරභයා බොහෝ සෙයින් ම ප්‍රශංසා කරන්නේ අපට ම යි.

6. අපරම්පි නෝ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තං සමනුගාහන්තං සමනුභාසන්තං සත්ථාරා වා සත්ථාරං සංසේන වා සංඝං: "යේ ඉමේසං භවතං ධම්මා අකුසලා අකුසලසංඛාතා සාවජ්ජා සාවජ්ජසංඛතා අසේවිතබ්බා අසේවිතබ්බසංඛාතා න අලමරියා න අලමරියසංඛාතා කණ්හා කණ්හසංඛාතා, කෝ ඉමේ ධම්මේ අනවසේසං පහාය වත්තති, ගෝතම -

සාවකසංඝෝ වා පරේ වා පන හොන්තෝ ගණාචරියසාවකසංඝා?"ති.

6. තව දුරටත් කියනවා නම් පින්වත් කස්සප, නුවණැති උදවිය ශාස්තෘවරයෙක් ශාස්තෘවරයෙක් සමග හෝ ශ්‍රාවක පිරිසක් ශ්‍රාවක පිරිසක් සමග හෝ එක්ව සාකච්ඡා කරත්වා, කරුණු මතු කරත්වා, තම අදහස් ඉදිරිපත් කරත්වා කියල. ඒ කියන්නේ "මේ භවතුන් ගේ යම් කිසි ධර්මයක් තියෙනවා නම් එක්කෝ අකුසල් වේවා, අකුසල පාක්ෂික වේවා. වැරදි සහිත වේවා, වැරදි පක්ෂයට අයත් වේවා, සේවනය නො කළ යුතු දෙයක් වේවා, සේවනය නො කළ යුතු පක්ෂයට අයත් දෙයක් වේවා, ආර්යභාවය ඇති නො කරන දෙයක් වේවා, ආර්යභාවය ඇති නො කරන පක්ෂයට අයත් දෙයක් වේවා. පවිටු දෙයක් වේවා, පවිටු පාක්ෂික දෙයක් වේවා. කවුද මේ දේවල් ඉතිරි නැතුව ප්‍රහාණය කරල ඉන්නේ? ශ්‍රමණ ගෞතමයන් ගේ ශ්‍රාවක සංඝයා ද? එහෙම නැත්නම් අන්‍ය වූ භවත් ගණාචාර්යවරුන් ගේ ශ්‍රාවක සංඝයා ද?" කියල.

ඨානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා ඒවං වදෙය්‍යුං: "යේ ඉමේසං භවතං ධම්මා අකුසලා අකුසලසංඛාතා සාවජ්ජා සාවජ්ජසංඛතා අසේවිතබ්බා අසේවිතබ්බසංඛාතා න අලමරියා න අලමරියසංඛාතා කණ්හා කණ්හසංඛාතා, ගෝතමසාවකසංඝෝ ඉමේ ධම්මේ අනවසේසං පහාය වත්තති, යං වා පන වා හොන්තෝ පරේ ගණාචරියසාවකසංඝා"ති. ඉතිහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හේව තත්ථ යේභුය්‍යෝන පසංසෙය්‍යුං.

පින්වත් කස්සප, එතකොට මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. නුවණැති උදවිය තමන් ගේ මතවාද එක්ව සාකච්ඡා කරද්දී, කරුණු මතු කරද්දී තම අදහස් ඉදිරිපත් කරද්දී මෙහෙමයි කියන්නේ. "මේ භවතුන් ගේ යම් කිසි ධර්මයක් තියෙනවා නම් එක්කෝ අකුසල් වේවා, අකුසල පාක්ෂික වේවා. වැරදි සහිත වේවා, වැරදි පක්ෂයට අයත් වේවා, සේවනය නො කළ යුතු දෙයක් වේවා, සේවනය නො කළ යුතු පක්ෂයට අයත් දෙයක් වේවා, ආර්යභාවය ඇති නො කරන දෙයක් වේවා, ආර්යභාවය ඇති නො කරන පක්ෂයට අයත් දෙයක් වේවා. පවිටු දෙයක් වේවා, පවිටු පාක්ෂික දෙයක් වේවා. මේ අකුසල ධර්මයන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ ශ්‍රාවකයින් තමයි මුළුමණින් ම ප්‍රහාණය කරලා සිටින්නේ. අන්‍ය වූ භවත් ගණාචාර්යවරු ගේ ශ්‍රාවකයින් යන්තමින් දෙයක් බැහැර කරල ඉන්නවා" කියල. ඉතින්

පින්වත් කස්සප, ඔය විදිහට නුවණැති උදවිය තමන් ගේ මතවාද එක්ව සාකච්ඡා කරද්දී, කරුණු මතු කරද්දී තම අදහස් ඉදිරිපත් කරද්දී ඒ කරුණ අරභයා බොහෝ සෙයින් ම ප්‍රශංසා කරන්නේ අපට ම යි.

7. අපරම්පි නෝ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තං සමනුගාහන්තං සමනුභාසන්තං සත්ථාරා වා සත්ථාරං සංසේන වා සංඝං: "යේ ඉමේසං භවතං ධම්මා කුසලා කුසලසංඛාතා අනවජ්ජා අනවජ්ජසංඛාතා සේවිතබ්බා සේවිතබ්බසංඛාතා අලමරියා අලමරියසංඛාතා සුක්කා සුක්කසංඛාතා, කෝ ඉමේ ධම්මේ අනවසේසං සමාදාය වත්තති? ගෝතමසාවකසංඝෝ වා පරේ වා පන හොන්තෝ ගණාචරියසාවකසංඝා?"නි.

තව දුරටත් කියනවා නම් පින්වත් කස්සප, නුවණැති උදවිය ශාස්තෘවරයෙක් ශාස්තෘවරයෙක් සමග හෝ ශ්‍රාවක පිරිසක් ශ්‍රාවක පිරිසක් සමග හෝ එක්ව සාකච්ඡා කරත්වා. කරුණු මතු කරත්වා. තම අදහස් ඉදිරිපත් කරත්වා" කියල. ඒ කියන්නේ "මේ භවතුන් ගේ යම් කිසි ධර්මයක් තියෙනවා නම් එක්කෝ කුසල් වේවා, කුසල පාක්ෂික වේවා. වැරදි රහිත වේවා, නිවැරදි පක්ෂයට අයත් වේවා, සේවනය කළ යුතු දෙයක් වේවා, සේවනය කළ යුතු පක්ෂයට අයත් දෙයක් වේවා, ආර්යභාවය ඇති කරන දෙයක් වේවා, ආර්යභාවය ඇති කරන පක්ෂයට අයත් දෙයක් වේවා. යහපත් දෙයක් වේවා, යහපත් පාක්ෂික දෙයක් වේවා. කවුද මේ දේවල් අඩු නැතුව සම්පූර්ණ කරගෙන ඉන්නේ? ශ්‍රමණ ගෞතමයන් ගේ ශ්‍රාවක සංඝයා ද? එහෙම නැත්නම් අන්‍ය වූ භවත් ගණාචාර්යවරුන් ගේ ශ්‍රාවක සංඝයා ද?" කියල.

ඨානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං "යේ ඉමේසං භවතං ධම්මා කුසලා කුසලසංඛාතා අනවජ්ජා අනවජ්ජසංඛාතා සේවිතබ්බා සේවිතබ්බ-සංඛාතා අලමරියා අලමරියසංඛාතා සුක්කා සුක්කසංඛාතා, ගෝතම-සාවකසංඝෝ ඉමේ ධම්මේ අනවසේසං සමාදාය වත්තති, යං වා පන වා හොන්තෝ පරේ ගණාචරියසාවකසංඝා"නි. ඉතිහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හේව තත්ථ යේභුය්‍යෙන පසංසෙය්‍යුං.

පින්වත් කස්සප, එතකොට මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. නුවණැති උදවිය තමන් ගේ මතවාද එක්ව සාකච්ඡා කරද්දී, කරුණු මතු කරද්දී තම අදහස් ඉදිරිපත් කරද්දී මෙහෙමයි කියන්නේ. "මේ භවතුන් ගේ යම් කිසි ධර්මයක් තියෙනවා නම් එක්කෝ කුසල් වේවා, කුසල පාක්ෂික

වේවා. වැරදි රහිත වේවා, නිවැරදි පක්ෂයට අයත් වේවා, සේවනය කළ යුතු දෙයක් වේවා, සේවනය කළ යුතු පක්ෂයට අයත් දෙයක් වේවා, ආර්යභාවය ඇති කරන දෙයක් වේවා, ආර්යභාවය ඇති කරන පක්ෂයට අයත් දෙයක් වේවා. යහපත් දෙයක් වේවා, යහපත් පාක්ෂික දෙයක් වේවා. මේ කුසල ධර්මයන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝයා තමයි මුළුමණින් ම සම්පූර්ණ කරලා සිටින්නේ. අන්‍ය වූ භවත් ගණාචාර්යවරු ගේ ශ්‍රාවක සංඝයා යන්තමින් දෙයක් කරගෙන ඉන්නවා" කියල. ඉතින් පින්වත් කස්සප, ඔය විදිහට නුවණැති උදවිය තමන් ගේ මතවාද එක්ව සාකච්ඡා කරද්දී, කරුණු මතු කරද්දී තම අදහස් ඉදිරිපත් කරද්දී ඒ කරුණ අරභයා බොහෝ සෙයින් ම ප්‍රශංසා කරන්නේ අපට ම යි.

8. අත්ථි කස්සප මග්ගෝ අත්ථි පටිපදා යථා පටිපන්නෝ සාමඤ්ඤේව ඤස්සති සාමං දක්ඛිති "සමණෝ'ව ගෝතමෝ කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී"ති.

8. පින්වත් කාශ්‍යපය, යම් අයුරකින් පිළිපදිද්දී තමන් ම දැන ගන්නවා නම්, දැක ගන්නවා නම්, "ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ම යි කල්යල් බලා කථා කරන්නේ. සත්‍යය කථා කරන්නේ. අර්ථවත්ව කථා කරන්නේ. ධර්මවාදීව කථා කරන්නේ. විනයවාදීව කථා කරන්නේ" කියල එබඳු මාර්ගයක් තියෙනවා. ප්‍රතිපදාවක් තියෙනවා.

කතමෝ ච කස්සප මග්ගෝ කතමා පටිපදා යථා පටිපන්නෝ සාමඤ්ඤේව ඤස්සති සාමං දක්ඛිති "සමණෝ'ව ගෝතමෝ කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී?"ති.

පින්වත් කාශ්‍යපය, යම් අයුරකින් පිළිපදිද්දී තමන් ම දැන ගන්නවා නම්, දැක ගන්නවා නම්, "ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ම යි කල්යල් බලා කථා කරන්නේ. සත්‍යය කථා කරන්නේ. අර්ථවත්ව කථා කරන්නේ. ධර්මවාදීව කථා කරන්නේ. විනයවාදීව කථා කරන්නේ" කියල ඒ මාර්ගය කුමක් ද? ප්‍රතිපදාව කුමක් ද?

අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ සෙය්‍යථීදං: සම්මාදිට්ඨි, සම්මාසංකප්පෝ, සම්මාවාචා, සම්මාකම්මන්තෝ, සම්මාආජීවෝ, සම්මාවායාමෝ, සම්මාසති, සම්මාසමාධි. අයං ඛෝ කස්සප මග්ගෝ අයං පටිපදා, යථා පටිපන්නෝ සාමඤ්ඤේව ඤස්සති සාමං දක්ඛිති "සමණෝ'ව ගෝතමෝ කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී"ති.

ඒ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ම යි. ඒ කියන්නේ: සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන අට යි. පින්වත් කාශ්‍යපය යම් අයුරකින් පිළිපදිද්දී තමන් ම දැන ගන්නවා නම්, දැක ගන්නවා නම්, "ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ම යි කල්යල් බලා කථා කරන්නේ. සත්‍යය කථා කරන්නේ. අර්ථවත්ව කථා කරන්නේ. ධර්මවාදීව කථා කරන්නේ. විනයවාදීව කථා කරන්නේ" කියල මේ තමයි ඒ මාර්ගය. මේ තමයි ඒ ප්‍රතිපදාව.

9. ඒවං වුත්තේ අචේලෝ කස්සපෝ භගවන්තං ඒතදවෝච:

9. මෙසේ වදාළ විට අචේලකස්සප භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පැවසුවා:

"ඉමේ'පි ඛෝ ආවුසෝ ගෝතම තපෝජිගුච්ඡකා ඒකේසං සමණබ්‍රාහ්මණානං සාමඤ්ඤසංඛාතා ච බ්‍රහ්මඤ්ඤසංඛාතා ච: අචේලකෝ හෝති මුත්තාචාරෝ, හත්ථාපලේඛනෝ, න ඒහිභදන්තිකෝ, න තිට්ඨභදන්තිකෝ, නාභිහටං, න උද්දිස්සකටං, න නිමන්තනං සාදියති. සෝ න කුම්භිමුඛා පටිග්ගණ්හාති, න ඛළෝපිමුඛා පටිග්ගණ්හාති, න ඒළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං, න ද්වින්නං භුඤ්ජමානානං, න ගබ්භිනියා, න පායමානාය, න පුරිසන්තරගතාය, න සංකිත්තීසු, න යත්ථ සා උපට්ඨිතෝ හෝති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී, න මච්ඡං, න මංසං, න සුරං, න මේරයං, න ථුසෝදකං පිවති. සෝ ඒකාගාරිකෝ වා හෝති ඒකාලෝපිකෝ, ද්වාගාරිකෝ වා හෝති ද්වාලෝපිකෝ, සත්තාගාරිකෝ වා හෝති සත්තාලෝපිකෝ. එකිස්සාපි දත්තියා යාපේති ද්වීහිපි දත්තීහි යාපේති, සත්තහිපි දත්තීහි යාපේති, ඒකාහිකම්පි ආහාරං ආහාරේති, ද්වීහිපිකම්පි ආහාරං ආහාරේති. සත්තාහිකම්පි ආහාරං ආහාරේති. ඉති ඒවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභෝජනානුයෝගමනුයුත්තෝ විහරති.

"ආයුෂ්මත් ගෞතමයෙනි, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ මහණකමත්, බ්‍රාහ්මණකමත් යනු මේ තපස් උපක්‍රම බවයි කියන්නේ. ඒ කියන්නේ: නිරුවත්ව ඉන්නවා. ආචාර ධර්ම අත්හරිනවා. කෑමෙන් පසු අත ලෙව කනවා. ස්වාමීනී මෙහි වඩින්න කියූ විට එන්නේ නෑ. ස්වාමීනී සිටින්ට කියූ විට ඉන්නේ නෑ. තමා එන්නට කලින් ගෙනා භොජුන් ගන්නේ නෑ. තමා උදෙසා කළ භොජුන් ගන්නේ නෑ. ඇරැයුම් පිළිගන්නේ නෑ. වළඳේ උඩ කොටසෙන් දුන් දන් පිළිගන්නේ නෑ. බඳුන්වල උඩින් ම දෙන දන් පිළිගන්නේ

නෑ. එළිපත්තේ සිට දෙන දන් පිළිගන්නේ නෑ. කණුවක් අසල දී දෙන දන් පිළිගන්නේ නෑ. මෝල්ගසක් අසල සිට දෙන දන් පිළිගන්නේ නෑ. දෙදෙනෙක් ආහාර ගනිද්දී දෙන දන් පිළිගන්නේ නෑ. ගැබිණි මවක් දෙන දන් පිළිගන්නේ නෑ. කිරිදෙන මව දෙන දන් පිළිගන්නේ නෑ. පුරුෂයා වෙතට ගිය ස්ත්‍රිය දෙන දන් පිළිගන්නේ නෑ. සම්මාදන් කොට පිස දෙන දන් පිළිගන්නේ නෑ. බල්ලෙක් සිටිද්දී ඌට නො දී දෙන දන් පිළිගන්නේ නෑ. අධික ලෙස මැස්සන් ගැවසුණු තැනින් දෙන දන් පිළිගන්නේ නෑ. මස්මාළු පිළිගන්නේ නෑ. රහමෙර බොන්නෙ නෑ. කාඩිහොඳි බොන්නෙ නෑ. ඇතැම්විට ඔහු එක ගෙදරකින් ලැබෙන එක් බත් පිඩකින් යැපෙනවා. ගෙවල් දෙකකින් ලැබෙන එක් බත් පිඬු දෙකකින් යැපෙනවා. ගෙවල් හතකින් ලැබෙන එක් බත් පිඬු හතකින් යැපෙනවා. එක් බත් තලියකින් යැපෙනවා. බත් තළි දෙකකින් යැපෙනවා. බත්තලි සතකින් යැපෙනවා. දවසක් හැර දවසක් ආහාර ගන්නවා. දෙදවසක් හැර දවසක් ආහාර ගන්නවා. සත් දවසක් හැර දවසක් ආහාර ගන්නවා. මේ විදිහට අඩමාසයක් හැර දවසක් බත් අනුභව කිරීම් වශයෙන් ව්‍රත සමාදානයෙන් වාසය කරනවා.”

10. **ඉමේ’පි ඛෝ ආවුසෝ ගෝතම තපෝජක්කමා ඒකේසං සමණබ්‍රාහ්මණානං සාමඤ්ඤසංඛාතා ච බ්‍රහ්මඤ්ඤසංඛාතා ච: සාකභක්ඛෝ වා හෝති. සාමාකභක්ඛෝ වා හෝති. නීවාරභක්ඛෝ වා හෝති. දද්දුලභක්ඛෝ වා හෝති. හටභක්ඛෝ වා හෝති. කණ්හභක්ඛෝ වා හෝති. ආචාමභක්ඛෝ වා හෝති. පිඤ්ඤාකභක්ඛෝ වා හෝති. තිණභක්ඛෝ වා හෝති. ගොමයභක්ඛෝ වා හෝති. වනමූලඵලාහාරෝ යාපේති පවත්තඵලභෝජී.**

10. “ආයුෂ්මත් ගෞතමයෙනි, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ මහණකමත්, බ්‍රාහ්මණකමත් යනු මේ තපස් උපක්‍රම බවයි කියන්නේ. ඒ කියන්නේ: කොළ වර්ග අමුවෙන් අනුභව කරනවා. ගස් බොඩ අනුභව කරනවා. හූරු හැල් වී අනුභව කරනවා. සම්තැම්බු කහට වතුර අනුභව කරනවා. ලහටු දියසෙවල අනුභව කරනවා. සහල්කුඩු අනුභව කරනවා. දන්කුඩ අනුභව කරනවා. මුරුවට අනුභව කරනවා. තණකොළ අනුභව කරනවා. ගොම අනුභව කරනවා. වනමුල් ගෙඩි අනුභව කරනවා. ගස්වලින් වැටුනු ගෙඩි පමණක් අනුභව කරනවා.

11. **ඉමේ’පි ඛෝ ආවුසෝ ගෝතම තපෝජක්කමා ඒකේසං සමණබ්‍රාහ්මණානං සාමඤ්ඤසංඛාතා ච බ්‍රහ්මඤ්ඤසංඛාතා ච: සාණානි’පි ධාරේති. මසාණානි’පි ධාරේති. ඡවදුස්සානි’පි ධාරේති. පංසුකූලානි’පි ධාරේති. තිරීටානි’පි ධාරේති. අජිනම්’පි ධාරේති. අජිනක්ඛිපම්’පි ධාරේති.**

කුසචිරම්'පි ධාරේති. වාකචිරම්'පි ධාරේති. එලකචිරම්'පි ධාරේති. කේසකම්බලම්'පි ධාරේති. වාළකම්බලම්'පි ධාරේති. උච්චපක්ඛිකම්'පි ධාරේති. කේසමස්සුලෝචකෝ'පි හෝති කේසමස්සුලෝචනානුයෝගමනුයුත්තෝ. උබ්බට්ඨකෝ'පි හෝති ආසනපටික්ඛිත්තෝ. උක්කුටිකෝ'පි හෝති උක්කුටිකප්පධානමනුයුත්තෝ. කණ්ටකාපස්සයිකෝ'පි හෝති කණ්ටකාපස්සයේ සෙය්‍යං කප්පේති. එලකසෙය්‍යම්'පි කප්පේති, ඨණ්ඩිලසෙය්‍යම්'පි කප්පේති, ඒකපස්සසයිකෝ'පි හෝති, රජෝජල්ලධරෝ අබ්භෝකාසිකෝ'පි හෝති යථාසන්ථතිකෝ, වේකටිකෝ'පි හෝති විකටභෝජනානුයෝගමනුයුත්තෝ, අපානකෝ'පි හෝති අපානකත්තමනුයුත්තෝ, සායතතියකම්'පි උදකරෝහණානුයෝගමනුයුත්තෝ විහරතී"ති.

11. "ආයුෂ්මත් ගෞතමයෙනි, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ගේ මහණකමත්, බ්‍රාහ්මණකමත් යනු මේ තපස් උපක්‍රම බවයි කියන්නේ. ඒ කියන්නේ: හණවැහැරි දරනවා. හණවැහැරි මිශ්‍ර වස්ත්‍ර දරනවා. ඉවත්කළ කඩමාව් දරනවා. මිනියෙන් බැහැර කළ රෙදි දරනවා. පොතුසුඹුළුවලින් කළ වස්ත්‍ර දරනවා. අඳුන් දිවිසම් දරනවා. මැදින් පැව් අඳුන් දිවිසම් දරනවා. කුසතණින් ගෙතූ වස්ත්‍ර දරනවා. නියඳවැහැරි දරනවා. එළුලොමින් කළ වස්ත්‍ර දරනවා. මිනිස් කෙස්වලින් කළ වස්ත්‍ර දරනවා. අස්ලොමින් කළ වස්ත්‍ර දරනවා. බකමූණු පියාපතින් කළ වස්ත්‍ර දරනවා. කෙස්රැවුල් උදුරනවා. කෙස්රැවුල් උදුරන වැඩපිළිවෙලක යෙදී සිටිනවා. වාඩිවෙන අසුන් ප්‍රතික්ෂේප කොට හිටගෙන ඉන්නවා. උක්කුටියෙන් ඉන්නවා. උක්කුටියෙන් ම ගමන් කරනවා. කටුසයනයන්හි වාසය කරනවා. ලෑලිමත කටුගසා එහි සැතපෙනවා. පිළෙහි නිදනවා. ලෑල්ලෙහි නිදනවා. එක් ඇලයෙන් නිදනවා. නොයෙක් දැලිකුණු දරා සිටිනවා. එළිමහනේ සිටිනවා. ආසන තිබෙන අයුරින් වෙනස් නොකොට සිටිනවා. තමන් ගේ ම මලමුත්‍ර අනුභව කරනවා. සිහිල් දිය නොබී ඉන්නවා. සවස තුන්වෙනි කොට දිනකට තුන්වරක් ජලයෙහි ගිලී තපස් කිරීමේ ව්‍රත සමාදන්ව ඉන්නවා.

12. "අචේලකෝ වේ'පි කස්සප හෝති මුත්තාචාරෝ, හත්ථාපලේඛනෝ ..... සත්තාහිකම්'පි ආහාරං ආහාරේති. ඉති ඒවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභෝජනානුයෝගමනුයුත්තෝ විහරති. තස්ස චායං සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා අභාවිතා හෝති අසච්ඡිකතා. අථ ඛෝ සෝ ආරකා'ව සාමඤ්ඤා, ආරකා'ව බ්‍රහ්මඤ්ඤා.

12. ඉදින් පින්වත් කස්සප, ඔහු නිරුවත්ව සිටියත්, ආචාර ධර්ම බැහැර කළත්, කෑමෙන් පසු අත ලෙව කෑවත් ..... සත්දිනකට වරක් ආහාර ගත්තත්. මෙවැනි අයුරින් අඩමසකට වරක් ආහාර ගනිමින් ව්‍රත සමාදානයේ යෙදී වාසය කෙරුවත් ඔහුට මේ සීලසම්පත්තිය, සමාධි සම්පත්තිය, ප්‍රඥාසම්පත්තිය වැඩීමක් වෙලා නැත්නම්, සාක්ෂාත් කිරීමක් වෙලා නැත්නම්, ඇත්තෙන් ම ඔහු මහණකමින් දුරු වෙලා ම යි ඉන්නේ. බ්‍රාහ්මණකමෙනුත් දුරු වෙලා ම යි ඉන්නේ.

යතෝ ඛෝ කස්සප භික්ඛු අවේරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවේති, ආසවානඤ්ච ඛයා අනාසවං චේතෝ විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති කස්සප භික්ඛු සමණෝ ඉති'පි බ්‍රාහ්මණෝ ඉති'පි.

පින්වත් කස්සප, යම් දවසක් භික්ෂුව වෛරයෙන් තොර, තරහෙන් තොර මෙත් සිත වඩනවා නම්, ආශ්‍රවයන් ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චිත්ත විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් මේ ජීවිතයේ දී ම ස්වකීය විශිෂ්ඨ නුවණින් සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරනවා නම්, පින්වත් කස්සප, මෙන්න මේ භික්ෂුවට තමයි ශ්‍රමණයා කියන්නේ. බ්‍රාහ්මණයා කියන්නේ.

13. **සාකහක්ඛෝ චේ'පි කස්සප හෝති. සාමාකහක්ඛෝ චේ'පි කස්සප හෝති ..... වනමූලඵලාහාරෝ යාපේති පවත්තඵලභෝජී. තස්ස චායං සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා අභාවිතා හෝති අසච්ඡිකතා. අථ ඛෝ සෝ ආරකා'ව සාමඤ්ඤා, ආරකා'ව බ්‍රහ්මඤ්ඤා.**

13. පින්වත් කස්සප, ඉදින් කෙනෙක් අමු කොළ කකා හිටියත්, ගස් බොඩ කකා හිටියත් ..... වනමුල් ගෙඩි කකා හිටියත්. ගස්වලින් වැටෙන ගෙඩි පමණක් කකා හිටියත් ඔහුට මේ සීලසම්පත්තිය, සමාධි සම්පත්තිය, ප්‍රඥාසම්පත්තිය වැඩීමක් වෙලා නැත්නම්, සාක්ෂාත් කිරීමක් වෙලා නැත්නම්, ඇත්තෙන් ම ඔහු මහණකමින් දුරු වෙලා ම යි ඉන්නේ. බ්‍රාහ්මණකමෙනුත් දුරු වෙලා ම යි ඉන්නේ.

යතෝ ඛෝ කස්සප භික්ඛු අවේරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවේති, ආසවානඤ්ච ඛයා අනාසවං චේතෝ විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති කස්සප භික්ඛු සමණෝ ඉති'පි බ්‍රාහ්මණෝ ඉති'පි.

පින්වත් කස්සප, යම් දවසක භික්ෂුව වෛරයෙන් තොර, තරහෙන් තොර මෙත් සිත වඩනවා නම්, ආශ්‍රවයන් ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චිත්ත විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් මේ ජීවිතයේ දී ම ස්වකීය විශිෂ්ඨ ඥානයෙන් සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරනවා නම්, පින්වත් කස්සප, මෙන්න මේ භික්ෂුවට තමයි ශ්‍රමණයා කියන්නේ. බ්‍රාහ්මණයා කියන්නේ.

14. සාණානි චේ'පි කස්සප ධාරේති මසාණානි'පි ධාරේති ..... සායතතියකම්'පි උදකරෝහණානුයෝගමනුයුත්තෝ විහරති. තස්ස චායං සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා අභාවිතා හෝති අසච්ඡිකතා. අථ ඛෝ සෝ ආරකා'ව සාමඤ්ඤා, ආරකා'ව බ්‍රහ්මඤ්ඤා.

14. පින්වත් කස්සප, යම් කෙනෙක් හණවැහැරි දැරුවත්, හණවැහැර මිශ්‍ර රෙදි දැරුවත් ..... සවස තුන්වෙනි කොට දිනකට තුන්වරක් ජලයෙහි ගිලී තපස් රැක්කත් ඔහුට මේ සීලසම්පත්තිය, සමාධි සම්පත්තිය, ප්‍රඥාසම්පත්තිය වැඩීමක් වෙලා නැත්නම්, සාක්ෂාත් කිරීමක් වෙලා නැත්නම්, ඇත්තෙන් ම ඔහු මහණකමින් දුරු වෙලා ම යි ඉන්නේ. බ්‍රාහ්මණකමෙනුත් දුරු වෙලා ම යි ඉන්නේ.

යතෝ ඛෝ කස්සප භික්ඛු අවේරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවේති, ආසවානඤ්ච ඛයා අනාසවං චේතෝ විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති කස්සප භික්ඛු සමණෝ ඉති'පි බ්‍රාහ්මණෝ ඉති'පීති.

පින්වත් කස්සප, යම් දවසක භික්ෂුව වෛරයෙන් තොර, තරහෙන් තොර මෙත් සිත වඩනවා නම්, ආශ්‍රවයන් ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චිත්ත විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් මේ ජීවිතයේ දී ම ස්වකීය විශිෂ්ඨ ඥානයෙන් සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරනවා නම්, පින්වත් කස්සප, මෙන්න මේ භික්ෂුවට තමයි ශ්‍රමණයා කියන්නේ. බ්‍රාහ්මණයා කියන්නේ.

15. එවං වුත්තේ අවේලෝ කස්සපෝ භගවන්තං එතදවෝච: දුක්කරං භෝ ගෝතම සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති. "පකති ඛෝ එසා කස්සප ලෝකස්මිං දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති."

15. මෙසේ වදාළ විට අවේල කස්සප භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පැවසුවා. භවත් ගෞතමයෙනි, මහණකම දුෂ්කර යි නෙව. බ්‍රාහ්මණකම දුෂ්කර යි නෙව. "පින්වත් කස්සප, මහණකම දුෂ්කර යි යන

කීමත්, බ්‍රාහ්මණකම දුෂ්කර යි යන කීමත් මේ ලෝකයෙහි ඇති ප්‍රකෘති කථාවකි.

අචේලකෝ වේ'පි කස්සප හෝති මුත්තාචාරෝ ..... ඉති ඒවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභෝජනානුයෝගමනුයුත්තෝ විහරති, ඉමාය ච කස්සප මත්තාය ඉමිනා ච තපෝපක්කමේන සාමඤ්ඤං වා අභවිස්ස බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, නේතං අභවිස්ස කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤ"න්ති.

පින්වත් කස්සප, කෙනෙක් නිරුවත්ව සිටියා කියල, ආචාර ධර්ම අත්හැරියා කියල ..... ඔය විදිහට අඩමසකට වරක් බත් කෑව කියල, ඒ තපස් රැකුමෙන් වාසය කළා කියල එපමණකින් ම කස්සප, මහණකමත් බ්‍රාහ්මණකමත් දුෂ්කර වෙනවා නම්, වඩාත් දුෂ්කර වෙනවා නම්, මහණකම දුෂ්කර යි, බ්‍රාහ්මණකම දුෂ්කර යි කියල කීම සුදුසු වන්නේ නෑ.

16. සක්කා ච පනේතං අභවිස්ස කාතූ ගහපතිනා වා ගහපති පුත්තේන වා අන්තමසෝ කුම්භදාසියා'පි: "හන්දාහං අචේලකෝ හෝමි මුත්තාචාරේ ..... ඉති ඒවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභෝජනානුයෝගමනුයුත්තෝ විහරාමී"ති. යස්මා ච ඛෝ කස්සප අඤ්ඤත්‍රේව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපෝපක්කමේන සාමඤ්ඤං වා හෝති. බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, තස්මා ඒතං කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති.

16. පින්වත් කස්සප, ගෘහපතියෙකුට වුණත් ගෘහපති පුත්‍රයෙකුට වුණත් අඩු ගණනේ ගෙදරකට වතුර අදින දාසී කෙල්ලකට වුණත් පුළුවනි "මං දැන් නිරුවත් තවුසෙක් වෙනවා, ආචාර ධර්ම අත්හරිනවා ..... මේ විදිහට සති දෙකකට වරක් බත් අනුභව කරනවා. තපස් කරනවා" කියල ඉන්න. නමුත් කස්සප, මේ ඉතා ස්වල්ප වූ තපස් උපක්‍රමයෙන් වෙන් වෙලා මේ තපස් ක්‍රමයෙන් බැහැරව මහණකමත්, බ්‍රාහ්මණකමත් දුෂ්කර වෙනවා නම්, වඩාත් දුෂ්කර වෙනවා නම්, අන්න එතකොට නම් මහණකම් දුෂ්කර යි, බ්‍රාහ්මණකම දුෂ්කර යි කියල කිව්වට කමක් නෑ.

යතෝ ඛෝ කස්සප භික්ඛු අවේරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවේති, ආසවානඤ්ච ඛයා අනාසවං චේතෝ විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති කස්සප භික්ඛු සමණෝ ඉති'පි බ්‍රාහ්මණෝ ඉති'පි.

පින්වත් කස්සප, යම් දවසක භික්ෂුව වෛරයෙන් තොර, තරහෙන් තොර මෙත් සිත වඩනවා නම්, ආශ්‍රවයන් ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චිත්ත විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් මේ ජීවිතයේ දී ම ස්වකීය විශිෂ්ඨ ඥානයෙන් සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරනවා නම්, පින්වත් කස්සප, මෙන්න මේ භික්ෂුවට තමයි ශ්‍රමණයා කියන්නේ. බ්‍රාහ්මණයා කියන්නේ.

17. සාකභක්ඛෝ වේ'පි කස්සප හෝති. සාමාකභක්ඛෝ වේ'පි කස්සප හෝති ..... වනමූලඵලාහාරෝ යාපේති පවත්තඵලභෝජී. ඉමාය ච කස්සප මත්තාය ඉමිනා ච තපෝපක්කමේන සාමඤ්ඤං වා අභවිස්ස බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, නේතං අභවිස්ස කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤ"න්ති.

17. පින්වත් කස්සප, යම් කෙනෙක් කොළ වර්ග අමුවෙන් කෑව කියල. ගස් බොඩ අනුභව කළා කියල ..... වනමුල් ගෙඩි කෑව කියල, ගසෙන් වැටුනු ගෙඩි පමණක් කෑව කියල මේ ඉතා ස්වල්ප වූ තපස් උපක්‍රමයෙන් වෙන් වෙලා මේ තපස් ක්‍රමයෙන් බැහැරව මහණකමත්, බ්‍රාහ්මණකමත් දුෂ්කර වෙනවා නම්, වඩාත් දුෂ්කර වෙනවා නම්, එකරුණින් නම් මහණකම් දුෂ්කර යි, බ්‍රාහ්මණකම දුෂ්කර යි කියල කියන එක සුදුසු නෑ.

සක්කා ච පනේතං අභවිස්ස කාතුං ගහපතිනා වා ගහපති පුත්තේන වා අන්තමසෝ කුම්භදාසියාපි: "හන්දාහං සාකභක්ඛෝ වා හෝමි ..... වනමූලඵලාහාරෝ යාපේමි පවත්තඵලභෝජී"ති. යස්මා ච ඛෝ කස්සප අඤ්ඤත්‍රේව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපෝපක්කමේන සාමඤ්ඤං වා හෝති. බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, තස්මා ඒතං කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති.

පින්වත් කස්සප, ගෘහපතියෙකුට වුණත් ගෘහපති පුත්‍රයෙකුට වුණත් අඩු ගණනනේ ගෙදරකට වතුර අදින දාසී කෙල්ලකට වුණත් පුළුවනි "මං දැන් අමුවෙන් කොළ කන කෙනෙක් වෙනවා ..... වනමුල් ගෙඩි කන කෙනෙක් වෙනවා. ගස්වලින් වැටෙන ගෙඩි විතරක් කන කෙනෙක් වෙලා ඉන්නවා" කියල. නමුත් කස්සප, මේ ඉතා ස්වල්ප වූ තපස් උපක්‍රමයෙන් වෙන් වෙලා මේ තපස් ක්‍රමයෙන් බැහැරව මහණකමත්, බ්‍රාහ්මණකමත් දුෂ්කර වෙනවා නම්, වඩාත් දුෂ්කර වෙනවා නම්, අන්න එතකොට නම් මහණකම් දුෂ්කර යි, බ්‍රාහ්මණකම දුෂ්කර යි කියල කිව්වට කමක් නෑ.

යතෝ ඛෝ කස්සප භික්ඛු අවේරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවේති, ආසවානඤ්ච ඛයා අනාසවං චේතෝ විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති කස්සප භික්ඛු සමණෝ ඉති'පි බ්‍රාහ්මණෝ ඉති'පි.

පින්වත් කස්සප, යම් දවසක භික්ෂුව වෛරයෙන් තොර, තරහෙන් තොර මෙත් සිත වඩනවා නම්, ආශ්‍රවයන් ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චිත්ත විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් මේ ජීවිතයේ දී ම ස්වකීය විශිෂ්ඨ නුවණින් සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරනවා නම්, පින්වත් කස්සප, මෙන්න මේ භික්ෂුවට තමයි ශ්‍රමණයා කියන්නේ. බ්‍රාහ්මණයා කියන්නේ.

18. සාණානි චේ'පි කස්සප ධාරේති මසාණානි'පි ධාරේති ..... සායතතියකම්'පි උදකරෝහණානුයෝගමනුයුත්තෝ විහරති. ඉමාය ච කස්සප මත්තාය ඉමිනා ච තපෝපක්කමේන සාමඤ්ඤං වා අභවිස්ස බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, නේතං අභවිස්ස කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤ"න්ති.

18. පින්වත් කස්සප, හණුවැහැරි ඇන්දා කියලා, හණුවැහැරි මුසු රෙදි ඇන්දා කියල ..... සවස තුන්වෙනි කොට දවසට තුන්වරක් ජලයේ ගිලී තපස් රැකිමින් වාසය කළා කියල මේ ඉතා ස්වල්ප වූ තපස් උපක්‍රමයෙන් වෙන් වෙලා මේ තපස් ක්‍රමයෙන් බැහැරව මහණකමත්, බ්‍රාහ්මණකමත් දුෂ්කර වෙනවා නම්, වඩාත් දුෂ්කර වෙනවා නම්, එකරුණින් නම් මහණකම් දුෂ්කර යි, බ්‍රාහ්මණකම දුෂ්කර යි කියල කියන එක සුදුසු නෑ.

සක්කා ච පනේතං අභවිස්ස කාතුං ගහපතිනා වා ගහපති පුත්තේන වා අන්තමසෝ කුම්භදාසියා'පි: "හන්දාහං සාණානි'පි ධාරේමි, මසාණානි'පි ධාරේමි ..... සායතතියකම්'පි උදකරෝහානානුයෝගමනුයුත්තෝ විහරාමී"ති. යස්මා ච ඛෝ කස්සප අඤ්ඤත්‍රේව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපෝපක්කමේන සාමඤ්ඤං වා හෝති. බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං, තස්මා ඒතං කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති.

පින්වත් කස්සප, ගෘහපතියෙකුට වුණත් ගෘහපති පුත්‍රයෙකුට වුණත් අඩු ගණනනේ ගෙදරකට වතුර අදින දාසී කෙල්ලකට වුණත් පුළුවනි "මං දැන් හණ වැහැරි අදිනවා. හණුවැහැරි මුසු වස්ත්‍ර අදිනවා ..... සවස

තුන්වෙනි කොට දවසට තුන්වරක් ජලයේ ගිලී තපස් රැකිමින් වාසය කරන කෙනෙක් වෙලා ඉන්නවා" කියල. නමුත් කස්සප, මේ ඉතා ස්වල්ප වූ තපස් උපක්‍රමයෙන් වෙන් වෙලා මේ තපස් ක්‍රමයෙන් බැහැරව මහණකමත්, බ්‍රාහ්මණකමත් දුෂ්කර වෙනවා නම්, වඩාත් දුෂ්කර වෙනවා නම්, අන්න එතකොට නම් මහණකම් දුෂ්කර යි, බ්‍රාහ්මණකම දුෂ්කර යි කියල කිව්වට කමක් නෑ.

යතෝ ඛෝ කස්සප භික්ඛු අවේරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවේති, ආසවානඤ්ච ඛයා අනාසවං චේතෝ විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති කස්සප භික්ඛු සමණෝ ඉති'පි බ්‍රාහ්මණෝ ඉති'පීති.

පින්වත් කස්සප, යම් දවසක භික්ෂුව වෛරයෙන් තොර, තරහෙන් තොර මෙත් සිත වඩනවා නම්, ආශ්‍රවයන් ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චිත්ත විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් මේ ජීවිතයේ දී ම ස්වකීය විශිෂ්ඨ ඥානයින් සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරනවා නම්, පින්වත් කස්සප, මෙන්න මේ භික්ෂුවට තමයි ශ්‍රමණයා කියන්නේ. බ්‍රාහ්මණයා කියන්නේ.

19. ඒවං වුත්තේ අචේලෝ කස්සපෝ භගවන්තං ඒතදවෝච: "දුජ්ජනෝ හෝ ගෝතම සමණෝ දුජ්ජනෝ බ්‍රාහ්මණෝ"ති. "පකති ඛෝ ඒසා කස්සප ලෝකස්මිං "දුජ්ජනෝ හෝ ගෝතම සමණෝ දුජ්ජනෝ බ්‍රාහ්මණෝ"ති.

19. මෙසේ වදාළ විට අචේලකස්සප භාග්‍යවතුන් වහන්සේට මෙය කියා සිටියා. "භවත් ගෞතමයෙනි, ශ්‍රමණයා තේරුම් ගැනීම දුෂ්කර යි. බ්‍රාහ්මණයා තේරුම් ගැනීම දුෂ්කරයි" කියල. පින්වත් කස්සප, "ශ්‍රමණයා තේරුම් ගැනීම දුෂ්කර යි. බ්‍රාහ්මණයා තේරුම් ගැනීම දුෂ්කරයි" යන මෙය ලෝකයෙහි ඇති ප්‍රකෘති කථාවක්.

20. අචේලකෝ චේපි කස්සප හෝති ..... ඉති ඒවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභෝජනානුයෝගමනුයුත්තෝ විහරති, ඉමාය කස්සප මත්තාය ඉමිනා තපෝපක්කමේන සමණෝ වා අහවිස්ස බ්‍රාහ්මණෝ වා දුජ්ජනෝ සුදුජ්ජනෝ, නේතං අහවිස්ස කල්ලං වචනාය "දුජ්ජනෝ සමණෝ දුජ්ජනෝ බ්‍රාහ්මණෝ"ති.

20. පින්වත් කස්සප, කෙනෙක් නිරුවත්ව සිටියා කියල, ආචාර ධර්ම අත්හැරියා කියල ..... ඔය විදිහට අඩමසකට වරක් බත් කෑව කියල, ඒ තපස් රැකුමෙන් වාසය කළා කියල එපමණකින් ම කස්සප, ශ්‍රමණයාත්, බ්‍රාහ්මණයාත් තේරුම් ගැනීම දුෂ්කර වෙනවා නම්, වඩාත් දුෂ්කර වෙනවා නම්, ශ්‍රමණයා තේරුම් ගැනීම දුෂ්කර යි, බ්‍රාහ්මණයා තේරුම් ගැනීම දුෂ්කර යි කියල කීම සුදුසු වන්නේ නෑ.

සක්කා ච පනේසෝ අභවිස්ස ඤාතුං ගහපතිනා වා ගහපති පුත්තේන වා අන්තමසෝ කුම්භ දාසියාපි: අයං අචේලකෝ හෝති මුත්තාචාරෝ ..... ඉති ඒවරූපං අද්ධමාසිකම්පි පරියායභත්තභෝජනානුයෝගමනුයුත්තෝ විහරතී"ති. යස්මා ච ඛෝ කස්සප අඤ්ඤත්‍රේව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපෝපක්කමේන සමණෝ වා හෝති බ්‍රාහ්මණෝ වා දුජ්ජනෝ සුදුජ්ජනෝ, තස්මා ඒතං කල්ලං වචනාය "දුජ්ජනෝ සමණෝ දුජ්ජනෝ බ්‍රාහ්මණෝ"ති.

පින්වත් කස්සප, ගෘහපතියෙකුට වුණත් ගෘහපති පුත්‍රයෙකුට වුණත් අඩු ගණනනේ ගෙදරකට වතුර අදින දාසී කෙල්ලකට වුණත් පුළුවනි "මොහු නිරුවත් තවුසෙක්, ආචාර ධර්ම අත්හැරල ..... මේ විදිහට සති දෙකකට වරක් බත් අනුභව කරනවා. තපස් කරනවා" කියල තේරුම් ගන්න. නමුත් කස්සප, මේ ඉතා ස්වල්ප වූ තපස් උපක්‍රමයෙන් වෙන් වෙලා මේ තපස් ක්‍රමයෙන් බැහැරව ශ්‍රමණයාත්, බ්‍රාහ්මණයාත් තේරුම් ගැනීම දුෂ්කර වෙනවා නම්, වඩාත් දුෂ්කර වෙනවා නම්, ශ්‍රමණයා තේරුම් ගැනීම දුෂ්කර යි, බ්‍රාහ්මණයා තේරුම් ගැනීම දුෂ්කර යි කියල කිව්වට කමක් නෑ.

යතෝ ඛෝ කස්සප භික්ඛු අවේරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවේති, ආසවානඤ්ච ඛයා අනාසවං චේතෝ විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති කස්සප භික්ඛු සමණෝ ඉති'පි බ්‍රාහ්මණෝ ඉති'පීති.

පින්වත් කස්සප, යම් දවසක භික්ෂුව වෛරයෙන් තොර, තරහෙන් තොර මෙත් සිත වඩනවා නම්, ආශ්‍රවයන් ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චිත්ත විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් මේ ජීවිතයේ දී ම ස්වකීය විශිෂ්ඨ නුවණින් සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරනවා නම්, පින්වත් කස්සප, මෙන්න මේ භික්ෂුවට තමයි ශ්‍රමණයා කියන්නේ. බ්‍රාහ්මණයා කියන්නේ.

21. සාකහක්ඛෝ වේ'පි කස්සප හෝති. සාමාකහක්ඛෝ වේ'පි කස්සප හෝති ..... වනමූලඵලාහාරෝ යාපේති පවත්තඵලභෝජී. ඉමාය ච කස්සප මත්තාය ඉමිනා තපෝපක්කමේන සමණෝ වා අභවිස්ස බ්‍රාහ්මණෝ වා දුජ්ජනෝ සුදුජ්ජනෝ, නේතං අභවිස්ස කල්ලං වචනාය "දුජ්ජනෝ සමණෝ දුජ්ජනෝ බ්‍රාහ්මණෝ"ති.

21. පින්වත් කස්සප, යම් කෙනෙක් කොළ වර්ග අමුවෙන් කෑව කියල. ගස් බොඩ අනුභව කළා කියල ..... වනමුල් ගෙඩි කෑව කියල, ගසෙන් වැටුනු ගෙඩි පමණක් කෑව කියල ඒ තපස් රැකුමෙන් වාසය කළා කියල එපමණකින් ම කස්සප, ශ්‍රමණයාත්, බ්‍රාහ්මණයාත් තේරුම් ගැනීම දුෂ්කර වෙනවා නම්, වඩාත් දුෂ්කර වෙනවා නම්, ශ්‍රමණයා තේරුම් ගැනීම දුෂ්කරයි, බ්‍රාහ්මණයා තේරුම් ගැනීම දුෂ්කරයි කියල කීම සුදුසු වන්නේ නෑ.

සක්කා ච පනේසෝ අභවිස්ස ඤාතුං ගහපතිනා වා ගහපති පුත්තේන වා අන්තමසෝ කුම්භ දාසියාපි: අයං සාකහක්ඛෝ වා හෝති. සාමාකහක්ඛෝ වා ..... වනමූලඵලාහාරෝ යාපේති පවත්තඵලභෝජී'ති. යස්මා ච ඛෝ කස්සප අඤ්ඤත්‍රේව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපෝපක්කමේන සමණෝ වා හෝති බ්‍රාහ්මණෝ වා දුජ්ජනෝ සුදුජ්ජනෝ, තස්මා ඒතං කල්ලං වචනාය "දුජ්ජනෝ සමණෝ දුජ්ජනෝ බ්‍රාහ්මණෝ"ති.

පින්වත් කස්සප, ගෘහපතියෙකුට වුණත් ගෘහපති පුත්‍රයෙකුට වුණත් අඩු ගණනනේ ගෙදරකට වතුර අදින දාසී කෙල්ලකට වුණත් පුළුවනි "මොහු අමුවෙන් කොළ කන කෙනෙක් ..... වනමුල් ගෙඩි කන කෙනෙක්. ගස්වලින් වැටෙන ගෙඩි විතරක් කන කෙනෙක්" කියල තේරුම්ගන්න. නමුත් කස්සප, මේ ඉතා ස්වල්ප වූ තපස් උපක්‍රමයෙන් වෙන් වෙලා මේ තපස් ක්‍රමයෙන් බැහැරව ශ්‍රමණයාත්, බ්‍රාහ්මණයාත් තේරුම් ගැනීම දුෂ්කර වෙනවා නම්, වඩාත් දුෂ්කර වෙනවා නම්, ශ්‍රමණයා තේරුම් ගැනීම දුෂ්කර යි, බ්‍රාහ්මණයා තේරුම් ගැනීම දුෂ්කර යි කියල කිව්වට කමක් නෑ.

යතෝ ඛෝ කස්සප භික්ඛු අවේරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවේති, ආසවානඤ්ච ඛයා අනාසවං චේතෝ විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති කස්සප භික්ඛු සමණෝ ඉති'පි බ්‍රාහ්මණෝ ඉති'පීති.

පින්වත් කස්සප, යම් දවසක භික්ෂුව වෛරයෙන් තොර, තරහෙන් තොර මෙත් සිත වඩනවා නම්, ආශ්‍රවයන් ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චිත්ත විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් මේ ජීවිතයේ දී ම ස්වකීය විශිෂ්ඨ නුවණින් සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරනවා නම්, පින්වත් කස්සප, මෙන්න මේ භික්ෂුවට තමයි ශ්‍රමණයා කියන්නේ. බ්‍රාහ්මණයා කියන්නේ.

22. සාණානි වේ'පි කස්සප ධාරේති මසාණානි'පි ධාරේති ..... සායතනියකම්'පි උදකරෝහණානුයෝගමනුයුත්තෝ විහරති. ඉමාය ච කස්සප මත්තාය ඉමිනා ච තපෝපක්කමේන සමණෝ වා අභවිස්ස බ්‍රාහ්මණෝ වා දුජ්ජනෝ සුදුජ්ජනෝ, නේතං අභවිස්ස කල්ලං වචනාය "දුජ්ජනෝ සමණෝ දුජ්ජනෝ බ්‍රාහ්මණෝ"ති.

පින්වත් කස්සප, හණුවැහැරි ඇන්දා කියලා, හණුවැහැරි මුසු රෙදි ඇන්දා කියල ..... සවස තුන්වෙනි කොට දවසට තුන්වරක් ජලයේ ගිලී තපස් රැකිමින් වාසය කළා කියල ඒ තපස් රැකුමෙන් වාසය කළා කියල එපමණකින් ම කස්සප, ශ්‍රමණයාත්, බ්‍රාහ්මණයාත් තේරුම් ගැනීම දුෂ්කර වෙනවා නම්, වඩාත් දුෂ්කර වෙනවා නම්, ශ්‍රමණයා තේරුම් ගැනීම දුෂ්කර යි, බ්‍රාහ්මණයා තේරුම් ගැනීම දුෂ්කර යි කියල කීම සුදුසු වන්නේ නෑ.

සක්කා ච පනේසෝ අභවිස්ස ඤතුං ගහපතිනා වා ගහපති පුත්තේන වා අන්තමසෝ කුම්භ දාසියාපි: "අයං සාණානිපි ධාරේති මසාණානිපි ධාරේති ..... සායතනියකම්පි උදකරෝහණානුයෝගමනුයුත්තෝ විහරති"ති. යස්මා ච ඛෝ කස්සප අඤ්ඤත්‍රේව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපෝපක්කමේන සමණෝ වා හෝති බ්‍රාහ්මණෝ වා දුජ්ජනෝ සුදුජ්ජනෝ, තස්මා ඒතං කල්ලං වචනාය "දුජ්ජනෝ සමණෝ දුජ්ජනෝ බ්‍රාහ්මණෝ"ති.

පින්වත් කස්සප, ගෘහපතියෙකුට වුණත් ගෘහපති පුත්‍රයෙකුට වුණත් අඩු ගණනේ ගෙදරකට වතුර අදින දාසී කෙල්ලකට වුණත් පුළුවනි "මොහු හණු වැහැරි අදිනවා. හණුවැහැරි මුසු වස්ත්‍ර අඳිනවා ..... සවස තුන්වෙනි කොට දවසට තුන්වරක් ජලයේ ගිලී තපස් රකිමින් වාසය කරන කෙනෙක් වෙලා ඉන්නවා" කියල තේරුම්ගන්න. නමුත් කස්සප, මේ ඉතා ස්වල්ප වූ තපස් උපක්‍රමයෙන් වෙන් වෙලා මේ තපස් ක්‍රමයෙන් බැහැරව ශ්‍රමණයාත්, බ්‍රාහ්මණයාත් තේරුම් ගැනීම දුෂ්කර වෙනවා නම්, වඩාත් දුෂ්කර

වෙනවා නම්, ශ්‍රමණයා තේරුම් ගැනීම දුෂ්කර යි, බ්‍රාහ්මණයා තේරුම් ගැනීම දුෂ්කර යි කියල කිව්වට කමක් නෑ.

යතෝ ඛෝ කස්සප භික්ඛු අවේරං අබ්‍යාපජ්ජං මෙත්තචිත්තං භාවේති, ආසවානඤ්ච ඛයා අනාසවං චේතෝ විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති කස්සප භික්ඛු සමණෝ ඉති'පි බ්‍රාහ්මණෝ ඉති'පීති.

පින්වත් කස්සප, යම් දවසක භික්ෂුව වෛරයෙන් තොර, තරහෙන් තොර මෙත් සිත වඩනවා නම්, ආශ්‍රවයන් ගේ ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චිත්ත විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් මේ ජීවිතයේ දී ම ස්වකීය විශිෂ්ඨ නුවණින් සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරනවා නම්, පින්වත් කස්සප, මෙන්න මේ භික්ෂුවට තමයි ශ්‍රමණයා කියන්නේ. බ්‍රාහ්මණයා කියන්නේ.

23. ඒවං වුත්තේ අචේලෝ කස්සපෝ භගවන්තං ඒතදවෝච: "කතමා පන සා භෝ ගෝතම සීලසම්පදා, කතම චිත්තසම්පදා, කතමා පඤ්ඤාසම්පදා?ති.

23. මෙසේ වදාළ විට අචේලකස්සප භාග්‍යවතුන් වහන්සේගෙන් මෙහෙම ඇසුවා. "භවත් ගෞතමයන් වහන්ස, මොකක්ද ඒ සීලසම්පත්තිය? මොකක් ද ඒ සමාධිසම්පත්තිය? මොකක් ද ඒ ප්‍රඥාසම්පත්තිය?

"ඉධ කස්සප තථාගතෝ ලෝකේ උප්පජ්ජති අරහං ..... සෝ ඉමං ලෝකං ..... සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ..... බ්‍රහ්මචරියං පකාසේති. තං ධම්මං සුණාති ගහපති වා ..... සෝ තං ධම්මං සුත්වා තථාගතේ සද්ධං පටිලභති. සෝ තේන සද්ධාපටිලාභේන සමන්නාගතෝ ඉති පටිසංචික්ඛති: "සම්බාධෝ ඝරාවාසෝ ..... යන්නූනාහං කේසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අ-ජාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.

පින්වත් කස්සප, මෙහි අරහත් වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපත ලබනවා ..... තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඥාණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා ..... බඹසර ප්‍රකාශ කරනවා. එතකොට ගෘහපතියෙක් වේවා, ගෘහපති පුත්‍රයෙක් වේවා කවර හෝ කුලයක උපන් කෙනෙක් වේවා ඒ ධර්මය

අසනවා ..... ඔහු ඒ ධර්මය අසලා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ගන්නවා. ඉතින් ඔහු ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වෙලා මේ විදිහට නුවණින් කල්පනා කරනවා. "ගිහි ගෙදර වාසය කිරීම හරි ම කරදරයක් ..... ඒ නිසා මං කෙස් රැවුල් බාලා, කසාවත් පොරොවා ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට ඇතුළත් වෙන එක තමයි හොඳ" කියලා.

සෝ අපරේන සමයේන ..... අනගාරියං පබ්බජති. සෝ ඒවං පබ්බජිතෝ සමානෝ පාතිමොක්ඛසංවරසංවුතෝ විහරති ..... සමාදාය සික්ඛති සික්ඛාපදේසු .....

ඔහු පස්සෙ කාලෙක ..... ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙනවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් (පැවිද්දෙක් විසින් රැකගත යුතු නිවනට උපකාරී වන උතුම් සිල්පදවලින්) සංවරව ඉන්නවා ..... සික්ෂාපදවල සමාදන්ව හික්මෙනවා .....

24. කථඤ්ච කස්සප භික්ඛු සීලසම්පන්නෝ හෝති? ඉධ කස්සප භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ හෝති ..... ඉදම්පි'ස්ස හෝති සීලස්මිං ..... (යථා සාමඤ්ඤඵලේ ඒවං විත්ථාරේතබ්බං)

24. පින්වත් කස්සප, භික්ෂුව සීලයෙන් යුක්ත වන්නේ කොහොම ද? පින්වත් මහාරාජ, මෙහි භික්ෂුව සතුන් මැරීම අත්හැර දාල සතුන් මැරීමෙන් වැළකී ඉන්නවා ..... මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි ..... (සාමඤ්ඤඵල සූත්‍රයෙහි මෙන් විස්තර කළ යුතුය)

යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපා තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: සන්තිකම්මං ..... විසඨීනං පටිමොක්ඛෝ ඉති වා ඉති ඒවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පිස්ස හෝති සීලසම්පදාය.

ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙවැනි වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ, ශාන්ති කර්ම ..... වනවලට බෙහෙත් බැඳීම, ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන්

ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

ස ඛෝ සෝ කස්සප භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෙය්‍යථාපි කස්සප රාජා ඛත්තියෝ මුද්ධාවසිත්තෝ නිහතපච්චාමිත්තෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං පච්චත්ථිකතෝ, ඒවමේව ඛෝ කස්සප භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ.

පින්වත් කස්සප, ඒ භික්ෂුව වනාහී මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීල සංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. පින්වත් කස්සප, ඒක මේ වගේ දෙයක්. ඔටුනු පළන් රජ කෙනෙක් ඉන්නවා. ඔහු සතුරන් පරදවල බැහැර කරල යි ඉන්නේ. ඉතින් ඔහු සතුරන් හේතුවෙන් මොන ම අයුරකින්වත් භයක් දකින්නේ නෑ. පින්වත් කස්සප, භික්ෂුවත් ඔය විදිහම යි. මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ.

සෝ ඉමිනා අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ, අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ කස්සප භික්ඛු සීලසම්පන්නෝ හෝති. අයං ඛෝ කස්සප සීලසම්පදා .....

ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් සමන්විත ව ආධ්‍යාත්මිකව නිවැරදි සැපයක් විඳිනවා. පින්වත් කස්සප, ඔන්න විදිහට යි භික්ෂුව සීලසම්පන්න වන්නේ. පින්වත් කස්සප, මේ තමයි සීලසම්පත්තිය .....

25. කථඤ්ච කස්සප භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති? ඉධ කස්සප භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී ..... චක්ඛුන්ද්‍රියේ සංවරං ආපජ්ජති. සෝත්තේන සද්දං සුත්වා ..... ඝාණේන ගන්ධං ඝායිත්වා ..... ජිව්හාය රසං සායිත්වා ..... කායේන ඵොට්ඨබ්බං ඵුසිත්වා ..... මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී ..... මනින්ද්‍රියේ සංවරං ආපජ්ජති. සෝ ඉමිනා අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ අජ්ඣත්තං අබ්‍යාසේකසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ කස්සප භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති.

25. පින්වත් කස්සප, භික්ෂුව අකුසලයන් වැළකූ ද්වාර ඇති ඉඳුරන් ඇතිව ඉන්නේ කොහොම ද? පින්වත් කස්සප, මෙහිලා භික්ෂුව ඇසින් රූප දැක නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ ..... ඇස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. කණෙන් ශබ්දයක් අහලා ..... නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කරලා ..... දිවෙන් රසයක් රස විඳලා ..... කයෙන් පහසක් ලබලා ..... මනසින් අරමුණක් දැන ගෙන නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ ..... මනස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. ඔහු මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව ආධ්‍යාත්මිකව පීඩා රහිතව සැපයක් විඳිනවා. පින්වත් කස්සප, භික්ෂුව අකුසලයෙන් වැළැක් වූ දොරටු ඇති ඉන්ද්‍රියයන් තුළ ඉන්නේ ඔය විදිහට යි.

26. කථඤ්ච කස්සප භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති? ඉධ කස්සප භික්ඛු අභික්කන්තේ පටික්කන්තේ සම්පජානකාරී හෝති ..... ගතේ ඨිතේ නිසින්නේ සුත්තේ ජාගරිතේ භාසිතේ තුණ්හීභාවේ සම්පජානකාරී හෝති. ඒවං ඛෝ කස්සප භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති.

26. පින්වත් කස්සප, භික්ෂුව සිහිනුවණින් යුතුව සිටින්නේ කොහොම ද? පින්වත් කස්සප, මෙහිලා භික්ෂුව ඉදිරියට යද්දීත්, ආපසු එද්දීත්, එය කරන්නේ සිහි නුවණින් ම යි ..... ගමන් කරද්දී, සිටගෙන සිටිද්දී, වාඩි වී සිටිද්දී, සැතපෙද්දී, නිදිවරද්දී, කථාබස් කරද්දී, නිහඬව සිටිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. පින්වත් කස්සප, භික්ෂුව සිහිනුවණින් යුතු වන්නේ ඔය ආකාරයට යි.

27. කථඤ්ච කස්සප භික්ඛු සන්තුට්ඨෝ හෝති? ඉධ කස්සප භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරිකේන චීවරේන ..... කුච්ඡිපරිහාරිකේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. ඒවං ඛෝ කස්සප භික්ඛු සන්තුට්ඨෝ හෝති.

27. පින්වත් කස්සප, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ කොහොම ද? පින්වත් කස්සප, මෙහිලා භික්ෂුව කය පරිහරණයට සෑහෙන සිවුරෙන් ..... කුසගිනි නිවෙන්ට සෑහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. පින්වත් කස්සප, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ ඔය විදිහට යි.

28. සෝ ඉමිනා ච අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතෝ, විවිත්තං සේනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භෝකාසං පලාලපුඤ්ජං. සෝ ප-ඡාහත්තං පිණ්ඩපාතපටික්කන්තෝ නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

28. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ සිහිනුවණින් යුක්ත වෙලා, මේ ආර්ය වූ ලද දෙයින් සතුටුවීමෙන් යුක්ත වෙලා හුදෙකලා සෙනසුනක වාසය කරනවා. ඒ කියන්නේ ආරණ්‍යය, රුක්සෙවණ, පර්වතය, දිය ඇල්ල, ගිරිගුහාව, සොහොන, වනගැබ, ගස් කොළන් රහිත හිස් පිටිය, පිදුරු ගෙය ආදිය යි. ඔහු පිණ්ඩපාතය වළඳා, දානයෙන් පසු (එවැනි තැනක) පළඟක් බැඳ ගෙන, කය සෘජු කර ගෙන, භාවනා අරමුණෙහි සිහිය පිහිටුවා ගෙන වාඩිවෙනවා.

29. සෝ අභිජ්ඣං ලෝකේ පහාය විගතාභිජ්ඣේන චේතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසෝධේති ..... ව්‍යාපාදපදෝසං පහාය අව්‍යාපන්නචිත්තෝ විහරති ..... ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධෝ විහරති ..... උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතෝ විහරති ..... විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡෝ විහරති අකථංකථී කුසලේසු ධම්මේසු. විචිකිච්ඡාය චිත්තං පරිසෝධේති.

ඔහු ජීවිතය නම් වූ ලෝකය ගැන ඇති විසම ලෝභය දුරු කොට ඇලීම් රහිත වූ සිතින් වාසය කරනවා. විසම ලෝභය කෙරෙන් සිත පිරිසිදු කරනවා ..... තරහ වෛර ආදිය අත්හැර තරහ නැති සිතින් සියළු සතුන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා ..... නිදිමත අලසකම අත්හැර නිදිමත අලසකමින් බැහැරව වාසය කරනවා ..... සිතේ විසිරීමත්, පසුතැවීමත් බැහැර කොට වාසය කරනවා ..... සැකය දුරු කොට කුසල් දහම් ගැන කෙසේ ද? කෙසේ ද? යනාදී සැකයෙන් එතෙරව වාසය කරනවා. සැකය කෙරෙන් සිත පිරිසිදු කරනවා.

සෙය්‍යථාපි කස්සප පුරිසෝ ඉණං ආදාය කම්මන්තේ පයෝජෙය්‍ය, තස්ස තේ කම්මන්තා සම්ඡ්ජ්ඣෙය්‍යුං ..... සෝ තතෝ නිදානං

ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං. සෙය්‍යථාපි කස්සප පුරිසෝ ආබාධිකෝ අස්ස දුක්ඛිතෝ ..... සෝ අපරේන සමයේන තම්හා ආබාධා මු-වෙය්‍ය ..... සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං. සෙය්‍යථාපි කස්සප පුරිසෝ බන්ධනාගාරේ බද්ධෝ අස්ස, සෝ අපරේන සමයේන තම්හා බන්ධනා මු-වෙය්‍ය ..... සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං. සෙය්‍යථාපි කස්සප පුරිසෝ දාසෝ අස්ස අනත්තාධීනෝ ..... සෝ අපරේන සමයේන තම්හා දාසව්‍යා මුච්චෙය්‍ය ..... සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං. සෙය්‍යථාපි කස්සප පුරිසෝ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය ..... සෝ අපරේන සමයේන තං කන්තාරං නිත්ථරෙය්‍ය ..... සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං. එවමේව ඛෝ කස්සප භික්ඛු යථා ඉණං යථා රෝගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං ඉමේ පඤ්ච නීවරණේ අප්පහීණේ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි කස්සප ආනණ්‍යං, යථා ආරෝග්‍යං, යථා බන්ධනමොක්ඛං, යථා භුජිස්සං, යථා ඛේමභූමිං එවමේව ඛෝ කස්සප, භික්ඛු ඉමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සති.

පින්වත් කස්සප, එය මෙවැනි දෙයක්. පුරුෂයෙක් ණයක් අරගෙන කර්මාන්තයක යොදවනවා. ඔහු ගේ ඒ ව්‍යාපාරය සාර්ථක වෙනවා ..... ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා. පින්වත් කස්සප, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් රෝගී වෙලා, දුකට පත්වෙලා ..... නමුත් පස්සෙ කාලෙක ඔහු ඒ රෝගයෙන් මිදුනා ..... ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා. පින්වත් කස්සප, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් හිරගෙදරක බන්ධනයකට හසුවෙනවා. නමුත් ඔහු පස්සෙ කාලෙක තමන් ගේ ධනය වියදම් නොකොට සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වෙනවා ..... ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා. පින්වත් කස්සප, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නොහැකි, දාසයෙක් වෙලා හිටියා ..... නමුත් පසු කලෙක ඔහු ඒ දාසභාවයෙන් මිදුනා ..... ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා. පින්වත් කස්සප, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසෙනවා .....

නමුත් ඔහු පසු කාලෙක ඒ කාන්තාරයෙන් එතෙර වෙනවා ..... ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා. පින්වත් කස්සප, අන්න ඒ විදිහම යි. භික්ෂුවත් (කලින්) ණයක් ගත්තා වගේ, ලෙඩ වුණා වගේ, හිරේවිලංගුවේ වැටුනා වගේ, වහල්බවට පත් වුණා වගේ, නිරුදක කතරකට පැමිණුනා වගේ මේ පංච නීවරණයන් ප්‍රහාණය නො වී තමා තුළ පවතින හැටි දකිනවා. නමුත් පින්වත් කස්සප, ඒ ණය ගෙවා දමා ණය රහිත වුණා වගේ, රෝගයෙන් නිදහස් වෙලා නීරෝග වුණා වගේ, වියදම් නැතුව හිරෙන් නිදහස් වුණා වගේ, දාසබවෙන් නිදහස් වුණා වගේ, නිරුදක කතර ගෙවා ආරක්ෂා සහිත ක්ෂේම භූමියකට පැමිණුනා වගේ තමයි. පින්වත් කස්සප, අන්න ඒ විදිහමයි භික්ෂුව තමා තුළ මේ පංච නීවරණයන් දුරුවී ඇති ආකාරයත් දකින්නේ.

30. තස්සිමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සතෝ පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායෝ පස්සම්භති. පස්සද්ධකායෝ සුඛං වේදේති. සුඛිනෝ චිත්තං සමාධියති. සෝ විවිච්චේව කාමේහි විවිච්ච අකුසලේහි ධම්මේහි ..... පඨමං ඣානං උපසම්පජ්ජ විහරති ..... දුතියං ඣානං ..... තතියං ඣානං ..... චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. ඉදම්පි'ස්ස හෝති චිත්තසම්පදාය. අයං ඛෝ සා කස්සප චිත්තසම්පදා.

30. ඔහුට මේ පඤ්ච නීවරණයන් තමා තුළ නැති බව දකිද්දි මහත් සතුටක් ඇති වෙනවා. ඒ ප්‍රමුදිත වීම ඇති කෙනාට ප්‍රීතිය ඇති වෙනවා. ප්‍රීති මනසක් ඇති කෙනා ගේ කය සංසිඳෙනවා. සංසිඳුනු කයින් යුතු ව සැපක් විඳිනවා. සැප ඇති කෙනා ගේ සිත සමාධිමත් වෙනවා. ඔහු කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව ..... පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා ..... දෙවෙනි ධ්‍යානය ..... තුන්වන ධ්‍යානයත් ..... සතර වෙනි ධ්‍යානය උපදවා ගෙන වාසය කරනවා. මෙයත් ඔහු ගේ සමාධි සම්පත්තියට අයිති දෙයක්. පින්වත් කස්සප, මේ තමයි ඒ චිත්ත සම්පත්තිය.

31. සෝ එවං සමාහිතෝ චිත්තේ ..... ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති ..... ඉදමස්ස හෝති පඤ්ඤාසම්පදාය ..... නාපරං ඉත්ථත්තායාති පජානාති. ඉදම්පි'ස්ස හෝති පඤ්ඤාසම්පදාය. අයං ඛෝ සා කස්සප පඤ්ඤාසම්පදා.

31. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි ..... මෙයත් ඔහු ගේ ප්‍රඥාසම්පත්තියට අයත් දෙයක් ..... නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා. මෙයත් ඔහු ගේ ප්‍රඥාසම්පත්තියට අයත් දෙයක්. පින්වත් කස්සප, මේ තමයි ඒ ප්‍රඥාසම්පත්තිය.

32. ඉමාය ච කස්සප සීලසම්පදාය ඉමාය ච චිත්තසම්පදාය ඉමාය ච පඤ්ඤාසම්පදාය අඤ්ඤා සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා උත්තරිතරා වා පණීතතරා වා නත්ථි.

32. පින්වත් කස්සප මේ සීලසම්පත්තියෙනුත්, මේ සමාධිසම්පත්තියෙනුත්, මේ ප්‍රඥාසම්පත්තියෙනුත් බැහැර වූ වෙනත් උත්තරීතර වූත් ප්‍රණීතතර වූත් සීලසම්පත්තියක්, සමාධිසම්පත්තියක්, ප්‍රඥාසම්පත්තියක් නෑ.

33. සන්ති කස්සප ඒකේ සමණබ්‍රාහ්මණා සීලවාදා. තේ අනේක පරියායේන සීලස්ස වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියං පරමං සීලං, නාහං තත්ථ අත්තනෝ සමසමං සමනුපස්සාමි. කුතෝ භියෝ? අථ ඛෝ අහමේව තත්ථ භියෝ යදිදං අධිසීලං.

33. පින්වත් කස්සප, සීලය ගැන පමණක් කථා කරන ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඔවුන් නොයෙක් ආකාරයෙන් සීලයෙහි ගුණ කියනවා. එහෙත් කස්සප, යම්තාක් උත්තම වූ ආර්ය සීලයක් ඇද්ද එහිලා මං, මා හට සම සම වූ සිල්වත් කෙනෙක් ව දකින්නේ නෑ. ඊට වැඩි කෙනෙක් කොයින් සොයන්ට ද? එකරුණේ දී ඒ අධිසීලයක් ඇද්ද, එහිලා වැඩි දියුණු කොට ඇති සිල් ඇත්තේ මා තුළ ම යි.

34. සන්ති කස්සප ඒකේ සමණබ්‍රාහ්මණා තපෝජිගුච්ඡාවාදා. තේ අනේකපරියායේන තපෝජිගුච්ඡාය, වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියා පරමා තපෝජිගුච්ඡා, නාහං තත්ථ අත්තනෝ සමසමං සමනුපස්සාමි. කුතෝ භියෝ? අථ ඛෝ අහමේව තත්ථ භියෝ යදිදං අධිජේගුච්ඡං.

34. පින්වත් කස්සප, කෙලෙසුන් පිළිකුල් කරන කෙලෙස් තැවීම ගැන කථා කරන ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණවරුන් ඉන්නවා. ඔවුන් නොයෙක්

ආකාරයෙන් කෙලෙස් පිළිකුල් කිරීමේ ගුණ කියනවා. නමුත් කස්සප, යම්තාක් උත්තම වූ ආර්ය කෙලෙස් පිළිකුල් කිරීමක් ඇද්ද එහිලා මං, මා හට සම සම වූ කෙලෙස් පිළිකුල් කරන කෙනෙක්ව දකින්නේ නෑ. ඊට වැඩි කෙනෙක් කොයින් සොයන්ට ද? එකරුණේ දී ඒ අධි කෙලෙස් පිළිකුල් කිරීමක් ඇද්ද, එහිලා වැඩි දියුණු කොට ඇති කෙලෙස් පිළිකුල් කිරීම ඇත්තේ මා තුළ ම යි.

35. සන්ති කස්සප ඒකේ සමණබ්‍රාහ්මණා පඤ්ඤවාදා. තේ අනේකපරියායේන පඤ්ඤය වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියා පරමා පඤ්ඤා, නාහං තත්ථ අත්තනෝ සමසමං සමනුපස්සාමි. කුතෝ භියෝ? අථ ඛෝ අහමේව තත්ථ භියෝ යදිදං අධිපඤ්ඤා.

35. පින්වත් කස්සප, ප්‍රඥාව ගැන කථා කරන ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණවරුන් ඉන්නවා. ඔවුන් නොයෙක් ආකාරයෙන් ප්‍රඥාවේ ගුණ කියනවා. නමුත් කස්සප, යම්තාක් උත්තම වූ ආර්ය ප්‍රඥාවක් ඇද්ද එහිලා මං, මා හට සම සම වූ ප්‍රඥාව ඇති කෙනෙක් ව දකින්නේ නෑ. ඊට වැඩි කෙනෙක් කොයින් සොයන්ට ද? එකරුණේ දී ඒ අධි ප්‍රඥාවක් ඇද්ද, එහිලා වැඩි දියුණු කොට ඇති ප්‍රඥාව ඇත්තේ මා තුළ ම යි.

36. සන්ති කස්සප ඒකේ සමණබ්‍රාහ්මණා විමුත්තිවාදා. තේ අනේකපරියායේන විමුත්තියා වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියා පරමා විමුත්ති, නාහං තත්ථ අත්තනෝ සමසමං සමනුපස්සාමි. කුතෝ භියෝ? අථ ඛෝ අහමේව තත්ථ භියෝ යදිදං අධිමුත්ති.

36. පින්වත් කස්සප, විමුක්තිය ගැන කථා කරන ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණවරුන් ඉන්නවා. ඔවුන් නොයෙක් ආකාරයෙන් විමුක්තියේ ගුණ කියනවා. නමුත් කස්සප, යම්තාක් උත්තම වූ ආර්ය විමුක්තියක් ඇද්ද එහිලා මං, මා හට සම සම වූ විමුක්තිය ඇති කෙනෙක් ව දකින්නේ නෑ. ඊට වැඩි කෙනෙක් කොයින් සොයන්ට ද? එකරුණේ දී ඒ අධි විමුක්තියක් ඇද්ද, එහිලා වැඩි දියුණු කොට ඇති විමුක්තිය ඇත්තේ මා තුළ ම යි.

37. ඨානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ඒවං වදෙය්‍යුං: "සීහනාදං ඛෝ සමණෝ ගෝතමෝ නදති. තඤ්ච ඛෝ සුඤ්ඤාගාරේ නදති නෝ පරිසාසු"ති. තේ 'මා හේවන්ති'ස්සු වචනීයා. "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදතී"ති. ඒවමස්සු කස්සප වචනීයා.

37. පින්වත් කස්සප, මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. අන්‍ය ආගමික පිරිවැජියන් යමක් අරභයා මෙවැනි දෙයක් කියනවා ද, ඒ කියන්නේ "ශ්‍රමණ ගෞතමයන් සිංහනාදයෙන් නද දෙනවා. ඒ වුණාට ඔහු සිංහනාද කරන්නේ කාත් කවුරුත් නැති තැනක මිස පිරිස් අතර නොවෙයි" කියල. එතකොට ඔවුන්ට කිවයුත්තේ 'එහෙම කියන්ට එපා' කියල යි. "ශ්‍රමණ ගෞතමයන් සිංහනාද කරනවා. පිරිස් අතරේ ම යි සිංහනාද කරන්නේ" කියල යි පින්වත් කස්සප, ඔවුන්ට කිව යුත්තේ.

38. යානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ඒවං වදෙය්‍යුං: "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදති. නෝ ච ඛෝ විසාරදෝ නදතී"ති. තේ 'මා හේවන්ති'ස්සු වචනීයා. "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදති, විසාරදෝ ච නදතී"ති. ඒවමස්සු කස්සප වචනීයා.

38. පින්වත් කස්සප, මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. අන්‍ය ආගමික පිරිවැජියන් යමක් අරභයා මෙවැනි දෙයක් කියනවා ද, ඒ කියන්නේ "ශ්‍රමණ ගෞතමයන් සිංහනාදයෙන් නද දෙනවා. පිරිස් අතරත් සිංහනාද කරනවා. ඒ වුණාට විශාරද ලෙස සිංහනාද කරන්නේ නෑ." කියල. එතකොට ඔවුන්ට කිවයුත්තේ 'එහෙම කියන්ට එපා' කියල යි. "ශ්‍රමණ ගෞතමයන් සිංහනාද කරනවා. පිරිස් අතරේ ම යි සිංහනාද කරන්නේ, විශාරදව ම යි සිංහනාද කරන්නේ" කියල යි පින්වත් කස්සප, ඔවුන්ට කිව යුත්තේ.

39. යානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ඒවං වදෙය්‍යුං: "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදති. විසාරදෝ ච නදති. නෝ ච ඛෝ නං පඤ්හං පුච්ඡන්ති"ති. තේ 'මා හේවන්ති'ස්සු වචනීයා. "සීහනාදං ඛෝ සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදති, විසාරදෝ ච නදති, පඤ්හඤ්ච නං පුච්ඡන්ති"ති. ඒවමස්සු කස්සප වචනීයා.

39. පින්වත් කස්සප, මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. අන්‍ය ආගමික පිරිවැජියන් යමක් අරභයා මෙවැනි දෙයක් කියනවා ද, ඒ කියන්නේ "ශ්‍රමණ ගෞතමයන් සිංහනාදයෙන් නද දෙනවා. පිරිස් අතරත් සිංහනාද කරනවා. විශාරදව සිංහනාද කරනවා. ඒ වුණාට ඔහුගෙන් කවුරුවත් ප්‍රශ්න අසන්නේ නෑ." කියල. එතකොට ඔවුන්ට කිවයුත්තේ 'එහෙම කියන්ට එපා' කියල යි. "ශ්‍රමණ ගෞතමයන් සිංහනාද කරනවා. පිරිස් අතරේ ම යි සිංහනාද

කරන්නේ, විශාරදව ම යි සිංහනාද කරන්නේ, ඒ වගේ ම ඔහු ගෙන් අනික් උදවිය ප්‍රශ්න අසනවා" කියල යි පින්වත් කස්සප, ඔවුන්ට කිව යුත්තේ.

40. **යානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ඒවං වදෙය්‍යුං: "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදති. විසාරදෝ ච නදති. පඤ්හං ච පුච්ඡන්ති, නෝ ච ඛෝ නේසං පඤ්හං පුට්ඨෝ ව්‍යාකරෝතී"ති.** තේ 'මා හේවන්ති'ස්සු වචනීයා. **"සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදති, විසාරදෝ ච නදති, පඤ්හඤ්ච නං පුච්ඡන්ති, පඤ්හඤ්ච නේසං පුට්ඨෝ ව්‍යාකරෝතී"ති. ඒවමස්සු කස්සප වචනීයා.**

40. පින්වත් කස්සප, මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. අන්‍ය ආගමික පිරිවැජියන් යමක් අරභයා මෙවැනි දෙයක් කියනවා ද, ඒ කියන්නේ "ශ්‍රමණ ගෞතමයන් සිංහනාදයෙන් නද දෙනවා. පිරිස් අතරත් සිංහනාද කරනවා. විශාරදව සිංහනාද කරනවා. ඔහු ගෙන් අනික් උදවිය ප්‍රශ්නත් අසනවා. ඒ වුණාට ඔවුන් ගේ ඒ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නේ නෑ." කියල. එතකොට ඔවුන්ට කිවයුත්තේ 'එහෙම කියන්ට එපා' කියල යි. "ශ්‍රමණ ගෞතමයන් සිංහනාද කරනවා. පිරිස් අතරේ ම යි සිංහනාද කරන්නේ, විශාරදව ම යි සිංහනාද කරන්නේ, ඒ වගේ ම ඔහු ගෙන් අනික් උදවිය ප්‍රශ්න අසනවා, ඒ වගේ ම ඔවුන් ගේ ඒ ප්‍රශ්නවලට පිළිතුරුත් දෙනවා" කියල යි පින්වත් කස්සප, ඔවුන්ට කිව යුත්තේ.

41. **යානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ඒවං වදෙය්‍යුං: "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදති ..... පඤ්හඤ්ච නේසං පුට්ඨෝ ව්‍යාකරෝති, නෝ ච ඛෝ පඤ්හස්ස වෙය්‍යාකරණේන චිත්තං ආරාධේතී"ති.** තේ 'මා හේවන්ති'ස්සු වචනීයා. **"සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති ..... පඤ්හස්ස ච වෙය්‍යාකරණේන චිත්තං ආරාධේතී"ති. ඒවමස්සු කස්සප වචනීයා.**

41. පින්වත් කස්සප, මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. අන්‍ය ආගමික පිරිවැජියන් යමක් අරභයා මෙවැනි දෙයක් කියනවා ද, ඒ කියන්නේ "ශ්‍රමණ ගෞතමයන් සිංහනාදයෙන් නද දෙනවා. පිරිස් අතරත් සිංහනාද කරනවා ..... ඔවුන් ගේ ඒ ප්‍රශ්නවලට පිළිතුරුත් දෙනවා. ඒ වුණාට ඔවුන් ඒ පිළිතුරු ගැන සිත සතුටු වෙන්නේ නෑ" කියල. එතකොට ඔවුන්ට කිවයුත්තේ 'එහෙම කියන්ට එපා' කියල යි. "ශ්‍රමණ ගෞතමයන් සිංහනාද කරනවා

..... ඒ වගේ ම ඔවුන් ගේ ඒ ප්‍රශ්නවලට දෙන පිළිතුරුවලින් ඔවුන් ගේ සිතත් සතුටට පත්වෙනවා" කියල යි පින්වත් කස්සප, ඔවුන්ට කිව යුත්තේ.

42. යානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ඒවං වදෙය්‍යුං: "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදති ..... පඤ්හස්ස ච වෙය්‍යාකරණේන චිත්තං ආරාධේති, නෝ ච ඛෝ සෝතබ්බං මඤ්ඤන්තී"ති. තේ 'මා හේවන්ති'ස්සු වචනීයා. "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති ..... පඤ්හස්ස ච වෙය්‍යාකරණේන චිත්තං ආරාධේති, සෝතබ්බඤ්චස්ස මඤ්ඤන්තී"ති. ඒවමස්සු කස්සප වචනීයා.

42. පින්වත් කස්සප, මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. අන්‍ය ආගමික පිරිවැජියන් යමක් අරභයා මෙවැනි දෙයක් කියනවා ද, ඒ කියන්නේ "ශ්‍රමණ ගෞතමයන් සිංහනාදයෙන් නද දෙනවා. පිරිස් අතරත් සිංහනාද කරනවා ..... ඔවුන් ගේ ඒ ප්‍රශ්නවලට දෙන පිළිතුරුවලින් ඔවුන් ගේ සිතත් සතුටට පත්වෙනවා. ඒ වුණාට ඔවුන් ඔහු ගේ ධර්මය ඇසිය යුතු යි කියල හිතන්නේ නෑ" කියල. එතකොට ඔවුන්ට කිවයුත්තේ 'එහෙම කියන්ට එපා' කියල යි. "ශ්‍රමණ ගෞතමයන් සිංහනාද කරනවා ..... ඒ වගේ ම ඔවුන් ගේ ඒ ප්‍රශ්නවලට දෙන පිළිතුරුවලින් ඔවුන් ගේ සිතත් සතුටට පත්වෙනවා මෙන් ම ඔහු ගේ ධර්මයට සවන් දිය යුතුය කියලත් හිතනවා" කියල යි පින්වත් කස්සප, ඔවුන්ට කිව යුත්තේ.

43. යානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ඒවං වදෙය්‍යුං: "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදති ..... සෝතබ්බඤ්චස්ස මඤ්ඤන්ති. නෝ ච ඛෝ සුත්වා චස්ස පසීදන්ති"ති. තේ 'මා හේවන්ති'ස්සු වචනීයා. "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති ..... සෝතබ්බඤ්චස්ස මඤ්ඤන්ති. සුත්වා චස්ස පසීදන්ති"ති. ඒවමස්සු කස්සප වචනීයා.

43. පින්වත් කස්සප, මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. අන්‍ය ආගමික පිරිවැජියන් යමක් අරභයා මෙවැනි දෙයක් කියනවා ද, ඒ කියන්නේ "ශ්‍රමණ ගෞතමයන් සිංහනාදයෙන් නද දෙනවා. පිරිස් අතරත් සිංහනාද කරනවා ..... ඔවුන් ඔහු ගේ ධර්මය ඇසිය යුතු යි කියල හිතනවා. ඒ වුණාට ඔහු ගේ බණ අසා ඔවුන් පහදින්නේ නෑ" කියල. එතකොට ඔවුන්ට කිවයුත්තේ

'එහෙම කියන්ට එපා' කියල යි. "ශ්‍රමණ ගෞතමයන් සිංහනාද කරනවා ..... ඒ වගේ ම ඔහු ගේ ධර්මයට සවන් දිය යුතුය කියලත් හිතනවා. ධර්මය අසා ඔවුන් පහදිනවා" කියල යි පින්වත් කස්සප, ඔවුන්ට කිව යුත්තේ.

44. යානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදති ..... සුත්වා චස්ස පසීදන්ති. නෝ ච ඛෝ පසන්නා පසන්නාකාරං කරොන්ති"ති. තේ 'මා හේවන්ති'ස්සු වචනීයා. "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති ..... සුත්වා චස්ස පසීදති. පසන්නා ච පසන්නාකාරං කාරොන්ති"ති. එවමස්සු කස්සප වචනීයා.

44. පින්වත් කස්සප, මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. අන්‍ය ආගමික පිරිවැජියන් යමක් අරභයා මෙවැනි දෙයක් කියනවා ද, ඒ කියන්නේ "ශ්‍රමණ ගෞතමයන් සිංහනාදයෙන් නද දෙනවා. පිරිස් අතරත් සිංහනාද කරනවා ..... ඔහු ගේ බණ අසා ඔවුන් පහදිනවා. ඒ වුණාට ඔවුන් පැහැදිලා ඒ පහන්බව දක්වන්නේ නෑ" කියල. එතකොට ඔවුන්ට කිවයුත්තේ 'එහෙම කියන්ට එපා' කියල යි. "ශ්‍රමණ ගෞතමයන් සිංහනාද කරනවා ..... ඒ වගේ ම ධර්මය අසා ඔවුන් පහදිනවා. පැහැදිලා ඔවුන් පහන්බවත් දක්වනවා" කියල යි පින්වත් කස්සප, ඔවුන්ට කිව යුත්තේ.

45. යානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදති ..... පසන්නා ච පසන්නාකාරං කරෝති, නෝ ච ඛෝ තථත්තාය පටිපජ්ජන්ති"ති. තේ 'මා හේවන්ති'ස්සු වචනීයා. "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති ..... පසන්නා ච පසන්නාකාරං කරොන්ති, තථත්තාය ච පටිපජ්ජන්ති"ති. එවමස්සු කස්සප වචනීයා.

45. පින්වත් කස්සප, මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. අන්‍ය ආගමික පිරිවැජියන් යමක් අරභයා මෙවැනි දෙයක් කියනවා ද, ඒ කියන්නේ "ශ්‍රමණ ගෞතමයන් සිංහනාදයෙන් නද දෙනවා. පිරිස් අතරත් සිංහනාද කරනවා ..... ඔවුන් පැහැදිලා ඒ පහන්බව දක්වනවා. ඒ වුණාට ඔවුන් එය අවබෝධ කරගැනීම පිණිස ප්‍රතිපදාවේ යෙදෙන්නේ නෑ" කියල. එතකොට ඔවුන්ට කිවයුත්තේ 'එහෙම කියන්ට එපා' කියල යි. "ශ්‍රමණ ගෞතමයන් සිංහනාද කරනවා ..... ඒ වගේ ම පැහැදිලා ඔවුන් පහන්බවත්

දක්වනවා. එය අවබෝධ කර ගැනීමටත් ප්‍රතිපදාවෙහි යෙදෙනවා" කියල යි පින්වත් කස්සප, ඔවුන්ට කිව යුත්තේ.

46. යානං ඛෝ පනේතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා ඒවං වදෙය්‍යුං: "සීහනාදං ඛෝ සමණෝ ගෝතමෝ නදති ..... තථත්තාය ච පටිපජ්ජන්ති. නෝ ච ඛෝ පටිපන්නා ආරාධෙන්තී"ති. තේ 'මා හේවන්ති'ස්සු වචනීයා. "සීහනාදං ච සමණෝ ගෝතමෝ නදති. පරිසාසු ච නදති, විසාරදෝ ච නදති, පඤ්හඤ්ච නං පුච්ඡන්ති, පඤ්හඤ්ච නේසං පුට්ඨෝ බ්‍යාකරෝති, පඤ්හස්ස ච වෙය්‍යාකරණේන චිත්තං ආරාධෙති, සෝතබ්බඤ්චස්ස මඤ්ඤන්ති, සුත්වා චස්ස පසීදන්ති, පසන්නා ච පසන්නාකාරං කරොන්ති, තථත්තාය ච පටිපජ්ජන්ති පටිපන්නා ච ආරාධෙන්තී"ති. ඒවමස්සු කස්සප වචනීයා.

පින්වත් කස්සප, මෙවැනි දෙයක් දකින්ට ලැබෙනවා. අන්‍ය ආගමික පිරිවැජියන් යමක් අරභයා මෙවැනි දෙයක් කියනවා ද, ඒ කියන්නේ "ශ්‍රමණ ගෞතමයන් සිංහනාදයෙන් නද දෙනවා. පිරිස් අතරත් සිංහනාද කරනවා ..... ඔවුන් එය අවබෝධ කරගැනීම පිණිස ප්‍රතිපදාවේ යෙදෙනවා. නමුත් ඒ ප්‍රතිපදාව අනුගමනය කොට ශ්‍රමණ ගෞතමයන් ව සතුටු කරවන්නේ නෑ" කියල. එතකොට ඔවුන්ට කිවයුත්තේ 'එහෙම කියන්ට එපා' කියල යි. "ශ්‍රමණ ගෞතමයන් සිංහනාද කරනවා, පිරිස් මැදත් සිංහනාද කරනවා, විශාරදවත් සිංහනාද කරනවා, ඔහු ගෙන් ප්‍රශ්නත් අහනවා, ඔවුන් ගේ ප්‍රශ්නවලට පිළිතුරුත් දෙනවා. ඒ ප්‍රශ්න විසඳීමෙන් ඔවුන් ගේ සිතත් සතුටු වෙනවා. ඔහු ගේ ධර්මය ඇසිය යුතුයි කියලත් හිතනවා. ධර්මය අසාත් පහදිනවා. පැහැදිලා ඒ පහන්බවත් දක්වනවා. එය අවබෝධ කර ගැනීමටත් ප්‍රතිපදාවෙහි යෙදෙනවා. ප්‍රතිපදාවෙහි යෙදිලා ශ්‍රමණ ගෞතමයන්ව සතුටට පත් කරවනවා" කියල යි පින්වත් කස්සප, ඔවුන්ට කිව යුත්තේ.

47. ඒකමිදාහං කස්සප සමයං රාජගහේ විහරාමි ගිජ්ඣකූටේ පබ්බතේ. තත්‍ර මං අඤ්ඤතරෝ තපබ්‍රහ්මචාරී නිග්‍රෝධෝ නාම අධිජේගුච්ඡේ පඤ්හං පුච්ඡි. තස්සාහං අධිජේගුච්ඡේ පඤ්හං පුට්ඨෝ බ්‍යාකාසිං. බ්‍යාකතෝ ච පන මේ අත්තමනෝ අහෝසි පරං විය මන්තායාති.

47. පින්වත් කස්සප, එක් කාලයක මං වාසය කළේ රජගහනුවර ගිජ්ඣකූටපව්වේ. ඉතින් දවසක් එක්තරා තපෝ බ්‍රහ්මචාරී තවුසෙක් වන නිග්‍රෝධ නම් පිරිවැජියා මගෙන් අධිකෙලෙස් පිළිකුළ ගැන ප්‍රශ්නයක් ඇසුවා. මං ඔහුට

අධිකෙලෙස් පිළිකුළ ගැන ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දුන්නා. මා එය විසඳූ විට ඔහු අතිශයින් ම සන්තෝෂයට පත් වුණා.

48. "කෝ හි භන්තේ භගවතෝ ධම්මං සුත්වා න අත්තමානෝ අස්ස පරං විය මත්තාය? අහම්පි භන්තේ භගවතෝ ධම්මං සුත්වා අත්තමනෝ පරං විය මත්තාය. "අභික්කන්තං භන්තේ, අභික්කන්තං භන්තේ. සෙය්‍යථාපි භන්තේ, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටි-ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරේ වා තේල පජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තෝ රූපානි දක්ඛින්තීති. ඒවමේව භගවතා අනේකපරියායේන ධම්මෝ පකාසිතෝ. ඒසාහං භන්තේ භගවන්තං සරණං ග-ඡාමි ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. ලභෙය්‍යාහං භන්තේ භගවතෝ සන්තිකේ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති."

48. "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා අතිශයින් ම චිත්ත සන්තෝෂයට පත් නො වන්නේ කවුද? ස්වාමීනී, මමත් භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්මය අසා අතිශයින් ම චිත්ත සන්තෝෂයට පත් වුණා. "ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි. යටට හරවා තිබූ දෙයක් උඩු අතට හැරෙව්වා වගෙයි. වහලා තිබුණු දෙයක් ඇරලා පෙන්නුවා වගෙයි. මං මුලා වූවන්ට නියම මග පෙන්වා දෙනවා වගෙයි. ඇස් ඇති උදවියට රූප දකින්න අඳුරෙහි තෙල් පහනක් දල්වා ගෙන දරා සිටිනවා වගෙයි. ඔය විදිහට භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ශ්‍රී සද්ධර්මය වදාළා. ස්වාමීනී, මේ මමත් භාග්‍යවතුන් වහන්සේ ව සරණ යනවා. ශ්‍රී සද්ධර්මයත් ආර්ය මහා සංඝ රත්නයත් සරණ යනවා. ස්වාමීනී, මාත් භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි පැවිදි බව ලබනවා නම්, උපසම්පදාවත් ලබනවා නම් ඉතා යහපති.

49. "යෝ ඛෝ කස්සප අඤ්ඤතිත්ථියපුබ්බෝ ඉමස්මිං ධම්මවිනයේ ආකංඛති පබ්බජ්ජං, ආකංඛති උපසම්පදං, සෝ චත්තාරෝ මාසේ පරිවසති. චතුන්නං මාසානං අච්චයේන ආරද්ධචිත්තා භික්ඛූ නං පබ්බාජෙන්ති, උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අපි ච මෙත්ථ පුග්ගලවේමත්තතා විදිතා"ති.

49. "පින්වත් කස්සප, යම් කෙනෙක් කලින් අන්‍යාගමක ඉඳල ඔහු මේ ධර්ම විනය තුළ පැවිදි බව කැමැති වෙනවා නම්, උපසම්පදාව කැමැති වෙනවා නම්, ඔහු මාස හතරක් පිරිවෙස් වසන්නට විත. ඒ මාස හතර ඇවෑමෙන් සතුටු සිත් ඇති භික්ෂූන් වහන්සේලා ඔහුව පැවිදි කරනවා.

භික්ෂුභාවය පිණිස උපසම්පදා කරනවා. කොහොම නමුත් මෙහිලා මා පුද්ගලයන් ගේ විවිධ ස්වභාවයන් ගැන අවබෝධයකිනුයි ඉන්නේ.”

50. “සචේ භන්තේ අඤ්ඤතිත්ථියපුබ්බෝ ඉමස්මිං ධම්මවිනයේ ආකංඛති පබ්බජ්ජං, ආකංඛති උපසම්පදං, සෝ චත්තාරෝ මාසේ පරිවසති. චතුන්නං මාසානං අච්චයේන ආරද්ධචිත්තා භික්ඛූ තං පබ්බාජෙන්ති, උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අහං චත්තාරි වස්සානි පරිවසිස්සාමි. චතුන්නං වස්සානං අච්චයේන ආරද්ධචිත්තා භික්ඛූ මං පබ්බාජෙන්තු, උපසම්පාදෙන්තු භික්ඛුභාවායා”ති.

50. “ස්වාමීනී, ඉදින් කලින් අන්‍යාගමක සිටපු කෙනෙක් මේ ධර්ම විනය තුළ පැවිදිබව කැමැති වෙද්දී, උපසම්පදාව කැමැති වෙද්දී ඔහු මාස හතරක පරිවාස කාලයක් ගත කළ යුතු නම්, ඒ සිව්මාසය ඇවෑමෙන් ඔහු කෙරෙහි සතුටු සිත් ඇති භික්ෂූන් වහන්සේලා ඔහුව පැවිදි කරනවා නම්, භික්ෂුභාවය පිණිස උපසම්පදා කරනවා නම්, මං අවුරුදු හතරක පරිවාස කාලයක් වුණත් ඉන්නම්. ඒ අවුරුදු හතර ඇවෑමෙන් මා කෙරෙහි සතුටු සිත් ඇති භික්ෂූන් වහන්සේලා මාව පැවිදි කරන සේක්වා. භික්ෂුභාවය පිණිස උපසම්පදා කරන සේක්වා.”

51. අලත්ථ ඛෝ අචේලෝ කස්සපෝ භගවතෝ සන්තිකේ පබ්බජ්ජං. අලත්ථු පසම්පදං. අචිරූපසම්පන්නෝ ඛෝ පනායස්මා කස්සපෝ ඒකෝ වූපකට්ඨෝ අප්පමත්තෝ ආතාපී පහිතත්තෝ විහරන්තෝ න චිරස්සේව යස්සත්ථාය කුලපුත්තා සම්මදේව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියෝසානං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා ස-ඡිකත්වා උපසම්පජ්ජ විහාසි, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි.

ඉතින් අචේලකස්සප භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි පැවිද්ද ලබා ගත්තා. උපසම්පදාවත් ලබා ගත්තා. උපසම්පදාව ලබාගත් නොබෝ කලකින් ම ආයුෂ්මත් කස්සපයන් හුදෙකලා වුණා. පිරිසෙන් වෙන් වුණා. අප්‍රමාදී වුණා. කෙලෙස් ත වන වීරියෙන් යුතු වුණා. දහමට දිවි පුදා ධර්මයේ හැසිරෙන කොට යම් කුල පුත්‍රයෙක් යම් කිසි බලාපොරොත්තුවකින් ගිහි ජීවිතය අත් හැරලා බුදු සසුනේ පැවිදි වුණා ද, අන්න ඒ උත්තරීතර බඹසර පූර්ණත්වය වන අමා නිවන මේ ජීවිතයෙහි දී ම විශේෂ ඤාණයකින් යුතුව අවබෝධ කරගෙන පැමිණ වාසය කළා. “ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය

සම්පූර්ණ කර ගත්තා. නිවන පිණිස කළ යුතු දේ කර ගත්තා. ආයෙමත් නම් වෙන උපතක් නැතැ”යි අවබෝධ වුණා.

අඤ්ඤතරෝ ච ඛෝ පනායස්මා කස්සපෝ අරහතං අහෝසීති.

ආයුෂ්මත් කස්සප තෙරුන් එක්තරා රහතන් වහන්සේ නමක් බවට පත් වුණා.

සීහනාදසුත්තං නිට්ඨිතං අට්ඨමං
අටවෙනි සීහනාද සූත්‍රය නිමා විය.

සාදු ! සාදු !! සාදු !!!

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

9.
පොට්ඨපාදසුත්තං
පොට්ඨපාද පිරිවැජියාට වදාළ දෙසුම

1. එවං මේ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. තේන ඛෝ පන සමයේන පොට්ඨපාදෝ පරිබ්බාජකෝ සමයප්පවාදකේ තින්දුකාචිරේ ඒකසාලකේ මල්ලිකාය ආරාමේ පටිවසති මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං තිංසමත්තේහි පරිබ්බාජකසතේහි.

1. මා හට අසන්ට ලැබුණේ මේ විදිහට යි. ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටියේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුතුමා ගේ ආරාමයේ. ඒ දිනවල ම පොට්ඨපාද පිරිවැජියා තම තමන් ගේ ආගම් පැවසිය හැකි සමයප්‍රවාදක නම් වූ ද, තින්දුකාචීර (තිඹිරි රුක්වලින් වට වූ) නම් වූද, ඒකසාලක නම් වූද, මල්ලිකා බිසව විසින් කරන ලද්දා වූ ද ආරාමයේ තුන් දහසක් පමණ මහත් පිරිවැජි පිරිසක් සමග වාසය කළා.

2. අථ ඛෝ භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. අථ ඛෝ භගවතෝ එතදහෝසි: අතිප්පගෝ ඛෝ තාව සාවත්ථිං පිණ්ඩාය චරිතුං, යන්නූනාහං යේන සමයප්පවාදකෝ තින්දුකාචිරෝ ඒකසාලකෝ මල්ලිකාය ආරාමෝ, යේන පොට්ඨපාදෝ පරිබ්බාජකෝ, තේනුපසංකමෙය්‍යන්ති. අථ ඛෝ භගවා යේන සමයප්පවාදකෝ තින්දුකාචිරෝ ඒකසාලකෝ මල්ලිකාය ආරාමෝ තේනුපසංකමි.

2. එදා භාග්‍යවතුන් වහන්සේ පෙරවරුවෙහි සිවුරු හැඳපොරවා පාසිවුරු ගෙන සැවැත් නුවර පිඬු පිණිස වැඩම කළා. එතකොට භාග්‍යවතුන් වහන්සේට මේ අදහස ඇති වුණා. සැවැත් නුවර පිඬු සිහා වැඩීමට තවම වේලාසන වැඩියි. එනිසා මං සමයප්‍රවාදක නම් වූ ද, තින්දුකාචීර (තිඹිරි රුක්වලින් වට වූ) නම් වූද, ඒකසාලක නම් වූද, මල්ලිකා බිසව විසින් කරන ලද්දා වූ ද ආරාමය යම් තැනක ද, පොට්ඨපාද පිරිවැජියා යම් තැනක ද එතැනට යනවා නම් හොඳයි" කියලා. ඉතින් භාග්‍යවතුන් වහන්සේ ඒ

සමයප්‍රවාදක වූත්, තින්දුකාචීර වූත්, ඒකසාලක නම් වූද, මල්ලිකා බිසව විසින් කරන ලද්දා වූ ද ආරාමය වෙත වැඩම කළා.

3. තේන ඛෝ පන සමයේන පොට්ඨපාදෝ පරිබ්බාජකෝ මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං නිසින්නෝ හෝති උන්නාදිනියා උච්චාසද්දමහා-සද්දාය අනේකවිහිතං තිරච්ඡානකථං කථෙන්තියා. සෙය්‍යථීදං: රාජකථං, චෝරකථං, මහාමත්තකථං, සේනාකථං, භයකථං, යුද්ධකථං, අන්නකථං, පානකථං, වත්ථකථං, සයනකථං, ගන්ධකථං, මාලාකථං, ඤාතිකථං, යානකථං, ගාමකථං, නිගමකථං, නගරකථං, ජනපදකථං, ඉත්ථීකථං, පුරිසකථං, සූරකථං, විසීඛාකථං, කුම්භට්ඨානකථං, පුබ්බපේතකථං, නානත්තකථං, ලෝකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං, ඉති වා'ති.

3. ඒ වෙලාවෙහි පොට්ඨපාද පිරිවැජියා මහත් වූ පිරිවැජි පිරිසක් සමග උස් හඬින් මහාහඬින් අනේකප්‍රකාර වූ තිරිසන් කථාවන් කථා කරමින් කෑගසමින් වාඩි වෙලා හිටිය. ඒ කවර තිරිසන් කථා ද යත්: රජවරුන් ගැන කථා, සොරුන් ගැන කථා, මහ ඇමතිවරුන් ගැන කථා, හමුදාවන් ගැන කථා, භය ඇතිවෙන දේවල් ගැන කථා, ආහාර වර්ග ගැන කථා, බොන දේවල් ගැන කථා, ඇඳුම් පැළඳුම් ගැන කථා, ඇඳ පුටු ගැන කථා, මල් වර්ග ගැන කථා, සුවඳ වර්ග ගැන කථා, නෑදෑයන් ගැන කථා, යාන වාහන ගැන කථා, ගම්මාන ගැන කථා, නියම් ගම්මාන ගැන කථා, නගර ගැන කථා, රටවල් ගැන කථා, ස්ත්‍රීන් ගැන කථා, පුරුෂයින් ගැන කථා, ශූරයින් ගැන කථා, මංමාවත් ගැන කථා, වලං පොලේ දේවල් ගැන කථා, මියගිය උදවිය ගැන කථා, තව තව දේවල් ගැන කථා, ලෝකය ගැන කථා, සාගරය ගැන කථා, මෙහෙමයි වුණේ මෙහෙමයි නොවුණේ කියන දේ ගැන කථා කරකර ඉන්නවා.

4. අද්දසා ඛෝ පොට්ඨපාදෝ පරිබ්බාජකෝ භගවන්තං දූරතෝව ආගච්ඡන්තං. දිස්වාන සකං පරිසං සණ්ඨපේසි. "අප්පසද්දා භොන්තෝ හොන්තු. මා භොන්තෝ සද්දමකත්ථ. අයං සමණෝ ගෝතමෝ ආගච්ඡති. අප්පසද්දකාමෝ ඛෝ සෝ පනායස්මා, අප්පසද්දස්ස වණ්ණවාදී. අප්පේව නාම අප්පසද්දං පරිසං විදිත්වා උපසංකමිතබ්බං මඤ්ඤෙය්‍යා"ති. ඒවං වුත්තේ තේ පරිබ්බාජකා තුණ්හී අහේසුං. අථ ඛෝ භගවා යේන පොට්ඨපාදෝ පරිබ්බාජකෝ තේනුපසංකමි. අථ ඛෝ පොට්ඨපාදෝ පරිබ්බාජකෝ භගවන්තං ඒතදවෝච: "ඒතු ඛෝ භන්තේ භගවා. ස්වාගතං භන්තේ භගවතෝ. චිරස්සං ඛෝ භන්තේ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු

භන්තේ භගවා. ඉදමාසනං පඤ්ඤත්තන්ති.” නිසීදි භගවා පඤ්ඤත්තේන ආසනේ. පොට්ඨපාදෝ’පි ඛෝ පරිබ්බාජකෝ අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නං ඛෝ පොට්ඨපාදං පරිබ්බාජකං භගවා ඒතදවෝච: “කායනුත්ථ පොට්ඨපාද ඒතරහි කථාය සන්නිසින්නා? කා ච පන වෝ අන්තරා කථා විප්පකතා?”ති.

4. එතකොට දුරින් ම වැඩම කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේව පොට්ඨපාද පිරිවැජියාට දැකගන්ට ලැබුණා. දැකලා තමන් ගේ පිරිස සංසුන් කෙරෙව්වා. “හා ... හා ... භවත්නි, නිශ්ශබ්ද වෙත්වා! භවත්නි, ශබ්ද කරන්ට එපා! මේ ශ්‍රමණ ගෞතමයන් පැමිණෙනවා. ඒ ආයුෂ්මතුන් නිශ්ශබ්දතාවයට හරි කැමැති යි. නිශ්ශබ්දතාවයෙහි ගුණ වර්ණනා කරනවා. නිශ්ශබ්දව සිටින පිරිසක් බව දැන ඒ වෙත පැමිණිය යුතු යි කියල හිතල යි ඔය වඩින්නේ.” එසේ පැවැසූ විට ඒ පිරිවැජියන් නිශ්ශබ්ද වුණා. එතකොට භාග්‍යවතුන් වහන්සේ පොට්ඨපාද පිරිවැජියා වෙත වැඩම කළා. පොට්ඨපාද පිරිවැජියා භාග්‍යවතුන් වහන්සේට මෙය පවසා සිටියා. “ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, වඩින සේක්වා! ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේව සාදරයෙන් පිළිගන්නවා. සෑහෙන කාලෙකට පස්සෙයි භාග්‍යවතුන් වහන්සේ මෙහි වැඩම කරන්ට අවස්ථාව ලබාගෙන තියෙන්නේ. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්ස, වැඩ හිඳින සේක්වා! මේ ආසන පණවලා තියෙන්නේ.” ඉතින් භාග්‍යවතුන් වහන්සේ පණවන ලද අසුනෙහි වැඩ සිටියා. පොට්ඨපාද පිරිවැජියා ද එක්තරා කුඩා අසුනක් ගෙන එකත්පස්ව වාඩි වුණා. එකත්පස්ව වාඩිවුණ පොට්ඨපාද පිරිවැජියාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළා. “පින්වත් පොට්ඨපාද, දැන් ඔබ මෙහි කර කර හිටියේ මොන වගේ කථාවක් ද? මාගේ පැමිණීමෙන් ඔබේ ඒ කවර කථාවක් ද අඩාල වුණේ?” කියල.

5. ඒවං වුත්තේ පොට්ඨපාදෝ පරිබ්බාජකෝ භගවන්තං ඒතදවෝච: නිට්ඨතේසා භන්තේ කථා, යාය මයං ඒතරහි කථාය සන්නිසින්නා. නේසා භන්තේ කථා භගවතෝ දුල්ලභා භවිස්සති පච්ඡාපි සවණාය. පුරිමානි භන්තේ දිවසානි පුරිමතරානි නානාතිත්ථියානං සමණබ්‍රාහ්මණානං කුතූහලසාලාය සන්නිසින්නානං සන්නිපතිතානං අභිසඤ්ඤනිරෝධේ කථ උදපාදි “කථං නු ඛෝ හෝ අභිසඤ්ඤනිරෝධෝ හෝති?”ති.

5. මෙසේ වදාළ විට පොට්ඨපාද පිරිවැජියා භාග්‍යවතුන් වහන්සේට මෙය පැවසුවා. “ස්වාමීනී, අපි යම් කථාබහක යෙදිල හිටියා නම්, ඒ කථාව පසෙක තිබේවා. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේට එවැනි කථාබස් අසන්ට

ලැබීම දුර්ලභ දෙයක් නොවේ. නමුත් ස්වාමීනී, දින කිහිපයකට කලින් නානා ආගම්වලට අයත් ශ්‍රමණ බ්‍රාහ්මණයින් කුතුහල ශාලාවේ එක්වෙලා රැස්වෙලා කථා කර කර සිටිද්දි අභිසඤ්ඤානිරෝධය ගැන කථාවක් ඇති වුණා. භවත්නි, අභිසඤ්ඤානිරෝධය ඇති වෙන්නේ කොහොම ද? කියල.

(1). **තත්‍රේකච්චේ ඒවමාහංසු: "අහේතු අප්පච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්ති'පි නිරුජ්ඣන්ති'පි. යස්මිං සමයේ උප්පජ්ජන්ති, සඤ්ඤී තස්මිං සමයේ හෝති. යස්මිං සමයේ නිරුජ්ඣන්ති, අසඤ්ඤී තස්මිං සමයේ හෝති"ති ඉත්ථේකේ අභිසඤ්ඤානිරෝධං පඤ්ඤපෙන්ති.**

(1) එතකොට සමහරු මෙහෙම කිව්වා. "පුරුෂයා හට සඤ්ඤා උපදින්නේත් නිරුද්ධවන්නේත් හේතු රහිතව යි. ප්‍රත්‍ය රහිත ව යි. යම් වෙලාවක සඤ්ඤාවන් උපදිනවා නම් ඒ වෙලාවේ තමයි සඤ්ඤාව ඇතිවන්නේ. යම් වෙලාවක සඤ්ඤාවන් නිරුද්ධ වෙනවා නම් ඒ වෙලාවේ ඔහු සඤ්ඤා රහිත වෙනවා" කියල. ඔය විදිහටයි සමහර අය අභිසඤ්ඤා නිරෝධය විස්තර කළේ.

(2). **තමඤ්ඤේ ඒවමාහ: "න ඛෝ පන මේතං හෝ ඒවං භවිස්සති. සඤ්ඤා හි හෝ පුරිසස්ස අත්තා. සා ච ඛෝ උපේති'පි අපේති'පි. යස්මිං සමයේ උපේති, සඤ්ඤී තස්මිං සමයේ හෝති. යස්මිං සමයේ අපේති, අසඤ්ඤී තස්මිං සමයේ හෝති"ති ඉත්ථේකේ අභිසඤ්ඤානිරෝධං පඤ්ඤපෙන්ති.**

(2) එතකොට තව සමහරු මෙහෙම කිව්වා. "භවත්නි, වික වෙන්නේ ඔහොම නොවෙයි. භවත්නි, සඤ්ඤාව කියන්නේ පුරුෂයා ගේ ආත්මය යි. ඒ සඤ්ඤාව පුරුෂයා වෙතට එනවා වගේ ම ඉවත් වෙලත් යනවා. යම් වෙලාවක ඒ සඤ්ඤාව එනවා නම්, ඒ වෙලාවට ඔහු සඤ්ඤා සහිතව ඉන්නවා. යම් වෙලාවක ඒ සඤ්ඤාව ඉවත් වෙනවා නම් ඒ වෙලාවේ දී ඔහු සඤ්ඤා රහිත වෙනවා" කියල. ඔය විදිහටයි සමහර අය අභිසඤ්ඤා නිරෝධය විස්තර කළේ.

(3). **තමඤ්ඤේ ඒවමාහ: "න ඛෝ පන මේතං හෝ ඒවං භවිස්සති. සන්ති හි හෝ සමණබ්‍රාහ්මණා මහිද්ධිකා මහානුභාවා. තේ ඉමස්ස පුරිසස්ස සඤ්ඤං උපකඩ්ඪන්ති'පි අපකඩ්ඪන්ති'පි. යස්මිං සමයේ උපකඩ්ඪන්ති, සඤ්ඤී තස්මිං සමයේ හෝති. යස්මිං සමයේ අපකඩ්ඪන්ති, අසඤ්ඤී තස්මිං සමයේ හෝති"ති ඉත්ථේකේ අභිසඤ්ඤානිරෝධං පඤ්ඤපෙන්ති.**

(3). එතකොට තව සමහරු මෙහෙම කිව්වා. "භවත්නි, වික වෙන්නේ ඔහොම නොවෙයි. භවත්නි, මහා ඉර්ධිමත් මහානුභාව සම්පන්න ශ්‍රමණ බ්‍රාහ්මණවරු ඉන්නවා. මේ පුරුෂයා හට සඤ්ඤාව පමුණුවන්නේත්, ඔහුගෙන් බැහැර කරන්නේත් ඔවුන් විසිනුයි. යම් වෙලාවක ඔවුන් පුරුෂයා හට සඤ්ඤාව පමුණුවනවා ද, ඒ වෙලාවේ දී ඔහු සඤ්ඤා සහිත යි. යම් වෙලාවක සඤ්ඤාව ඉවතට අදිනවා ද ඒ වෙලාවේ දී ඔහු සඤ්ඤා රහිතයි" කියල. ඔය විදිහටයි සමහර අය අභිසඤ්ඤා නිරෝධය විස්තර කළේ.

(4). **තමඤ්ඤේ එවමාහ: "න ඛෝ පන මේතං භෝ එවං භවිස්සති. සන්තිහි භෝ දේවානා මහිද්ධිකා මහානුභාවා. තා ඉමස්ස පුරිසස්ස සඤ්ඤං උපකඩ්ඪන්ති'පි අපකඩ්ඪන්ති'පි. යස්මිං සමයේ උපකඩ්ඪන්ති, සඤ්ඤී තස්මිං සමයේ හෝති. යස්මිං සමයේ අපකඩ්ඪන්ති, අසඤ්ඤී තස්මිං සමයේ හෝති"ති ඉත්ථේකේ අභිසඤ්ඤානිරෝධං පඤ්ඤපෙන්ති.**

(4). එතකොට තව සමහරු මෙහෙම කිව්වා. "භවත්නි, වික වෙන්නේ ඔහොම නොවෙයි. භවත්නි, මහා ඉර්ධිමත් මහානුභාව සම්පන්න දෙවිවරු ඉන්නවා. මේ පුරුෂයා හට සඤ්ඤාව පමුණුවන්නේත්, ඔහුගෙන් බැහැර කරන්නේත් ඔවුන් විසිනුයි. යම් වෙලාවක ඔවුන් පුරුෂයා හට සඤ්ඤාව පමුණුවනවා ද, ඒ වෙලාවේ දී ඔහු සඤ්ඤා සහිත යි. යම් වෙලාවක සඤ්ඤාව ඉවතට අදිනවා ද ඒ වෙලාවේ දී ඔහු සඤ්ඤා රහිත යි" කියල. ඔය විදිහටයි සමහර අය අභිසඤ්ඤා නිරෝධය විස්තර කළේ.

6. තස්ස මය්හං භන්තේ භගවන්තං යේව ආරබ්භ සති උදපාදි: "අහෝ නූන භගවා, අහෝ නූන සුගතෝ, යෝ ඉමේසං ධම්මානං සුකුසලෝ"ති. භගවා භන්තේ කුසලෝ භගවා පකතඤ්ඤූ අභිසඤ්ඤානිරෝධස්ස. කථං නු ඛෝ භන්තේ අභිසඤ්ඤානිරෝධෝ හෝති?"ති.

6. එතකොට ස්වාමීනී, ඒ මට භාග්‍යවතුන් වහන්සේව ම යි මතක් වුණේ. "යම් කෙනෙක් මේ ධර්මයන් ගැන අතිශයින් ම දක්ෂ වුණා ද, අනේ මේ වෙලාවේ ඒ භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටියා නම්, අනේ මේ වෙලාවේ ඒ සුගතයන් වහන්සේ වැඩ සිටියා නම්" කියල. "ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේම මේ පිළිබඳව දක්ෂ වන සේක. භාග්‍යවතුන් වහන්සේ ම අභිසඤ්ඤා නිරෝධය පිළිබඳව නිපුණ වන සේක. ස්වාමීනී, ඇත්තෙන් ම අභිසඤ්ඤා නිරෝධය වන්නේ කොහොම ද?"

7. තත්‍ර පොට්ඨපාද යේ තේ සමණබ්‍රාහ්මණා එවමාහංසු: අත්තා

අප්පච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්ති'පි. නිරුජ්ඣන්තිපි'ති. ආදිතෝ'ව තේසං අපරද්ධං. තං කිස්ස හේතු? සහේතුහි පොට්ඨපාද සපච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්ති'පි නිරුජ්ඣන්ති'පි. සික්ඛා ඒකා සඤ්ඤා උප්පජ්ජන්ති, සික්ඛා ඒකා සඤ්ඤා නිරුජ්ඣන්ති."

7. පින්වත් පොට්ඨපාද, එහිලා යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් මෙහෙම කිව්වා නම්, "පුරුෂයා හට සඤ්ඤා උපදින්නේත් නිරුද්ධවන්නේත් හේතු රහිතව යි. ප්‍රත්‍ය රහිත ව යි" කියල. ඔවුන්ට පටන්ගත් තැන ම වැරදුනා. ඒකට හේතුව මොකක් ද? පින්වත් පොට්ඨපාද "පුරුෂයා හට සඤ්ඤා උපදින්නේත් නිරුද්ධවන්නේත් හේතු සහිතව යි. ප්‍රත්‍ය සහිත ව යි. ශික්ෂාවෙන් ඇතැම් සඤ්ඤා උපදිනවා. ශික්ෂාවෙන් ම ඇතැම් සඤ්ඤා නිරුද්ධ වෙනවා."

"කා ච සික්ඛා"ති භගවා අවෝච:

"ඒ ශික්ෂාව මොකක් ද?" කියල භාග්‍යවතුන් වහන්සේ පවසා වදාළා.

ඉධ පොට්ඨපාද තථාගතෝ ලෝකේ උප්පජ්ජති අරහං සම්මා-සම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣේඩිකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසේති.

පින්වත් පොට්ඨපාද, මෙහි අරහත් වූ සම්මාසම්බුද්ධ වූ විජ්ජාචරණ-සම්පන්න වූ සුගත වූ ලෝකවිදූ වූ අනුත්තර පුරිසදම්ම සාරථී වූ, සත්ථා දේවමනුස්සානං වූ, බුද්ධ වූ, භගවා වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපත ලබනවා. උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙව්මිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඥණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා.

8. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තෝ වා අඤ්ඤතරස්මිං වා කුලේ ප-චාජාතෝ. සෝ තං ධම්මං සුත්වා තථාගතේ සද්ධං පටිලභති.

සෝ තේන සද්ධාපටිලාභේන සමන්නාගතෝ ඉති පටිසංචික්ඛති: "සම්බාධෝ ඝරාවාසෝ රජෝපථෝ. අබ්භෝකාසෝ පබ්බජ්ජා. න ඉදං සුකරං අගාරං අජ්ඣාවසතා ඒකන්තපරිපුණ්ණං ඒකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං යන්නූනාහං කේසමස්සුං ඡිභාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.

8. එතකොට ගෘහපතියෙක් වේවා, ගෘහපති පුත්‍රයෙක් වේවා කවර හෝ කුලයක උපන් කෙනෙක් වේවා ඒ ධර්මය අසනවා. ඔහු ඒ ධර්මය අසලා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ගන්නවා. ඉතින් ඔහු ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වෙලා මේ විදිහට නුවණින් කල්පනා කරනවා. "ගිහි ගෙදර වාසය කිරීම හරිම කරදරයක්. කෙලෙස් වැඩෙන මාවතක්. නමුත් පැවිදි ජීවිතය ආකාසය වගේ. ගිහි ගෙදර වාසය කරමින් මුළුමණින් ම පිරිපුන්, මුළුමණින් ම පිරිසිදු, සුදෝසුදු බඹසර වසනවා යන කරණ ලෙහෙසි එකක් නොවේ. ඒ නිසා මං කෙස් රැවුල් බාලා, කසාවත් පොරොවා ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට ඇතුළත් වෙන එක තමයි හොඳ" කියලා.

9. **සෝ අපරේන සමයේන අප්පං වා භෝගක්ඛන්ධං පහාය මහන්තං වා භෝගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කේසමස්සුං ඡිභාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සෝ ඒවං පබ්බජිතෝ සමානෝ පාතිමොක්ඛසංවරසංවුතෝ විහරති, ආචාරගෝචරසම්පන්නෝ, අණුමත්තේසු වජ්ජේසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදේසු, කායකම්මවචිකම්මේන සමන්නාගතෝ කුසලේන, පරිසුද්ධාජීවෝ, සීලසම්පන්නෝ, ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ, භෝජනේ මත්තඤ්ඤූ, සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ සන්තුට්ඨෝ.**

9. ඔහු පස්සෙ කාලෙක ස්වල්ප වූ භෝග සම්පත් අත්හරිනවා. මහත් වූ භෝග සම්පත් අත්හරිනවා. ස්වල්ප වූ නෑදෑයන් අත්හරිනවා. මහත් වූ නෑදෑයන් අත්හරිනවා. කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙනවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් (පැවිද්දෙක් විසින් රැකගත යුතු නිවනට උපකාරී වන උතුම් සිල්පදවලින්) සංවරව ඉන්නවා. යහපත් ඇවැතුම් පැවැතුම්වලින් යුතු වෙනවා. අණුමාත්‍ර වූ වරදෙහි පවා භය දකිනවා. සික්ෂාපදවල සමාදන්ව හික්මෙනවා. කුසල්සහගත කායකර්මයෙන් හා වචිකර්මයෙන් යුතු වෙනවා. පිරිසිදු ආජීවයෙන් යුතු වෙනවා. සිල්වත්

වෙනවා. අකුසලයෙන් වැළකූ දොරටු ඇතුව ඉන්නවා. නුවණින් සළකා ආහාර ගන්නවා. සිහිනුවණින් යුතුව ඉන්නවා. ලද දෙයින් සතුටුව ඉන්නවා.

10. කථඤ්ච පොට්ඨපාද භික්ඛු සීලසම්පන්නෝ හෝති? ඉධ පොට්ඨපාද භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ හෝති. නිහිතදණ්ඩෝ නිහිතසත්ථෝ ..... අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතෝ හෝති ..... අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචරී හෝති ..... මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතෝ හෝති ..... පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතෝ හෝති ..... ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතෝ හෝති ..... සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතෝ හෝති ..... ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

10. පින්වත් පොට්ඨපාද, භික්ෂුව සීලයෙන් යුක්ත වන්නේ කොහොම ද? පින්වත් පොට්ඨපාද, මෙහි භික්ෂුව සතුන් මැරීම අත්හැර දාල සතුන් මැරීමෙන් වැළකී ඉන්නවා. දඬු මුගුරු අත්හැර දාල, අවි ආයුධ බැහැර කරලා ..... නුදුන් දේ ගැනීම අත්හැරලා නුදුන් දේ ගැනීමෙන් වැළකී ඉන්නවා ..... අබ්‍රහ්මචාරීබව අත් හැරලා බ්‍රහ්මචාරීව ඉන්නවා ..... බොරු කීම අත්හැරල, බොරු කීමෙන් වැළකී ඉන්නවා ..... කේලාම් කීම අත්හැරලා කේලාම් කීමෙන් වැළකී ඉන්නවා ..... පරුෂ වචනය අත්හැරලා පරුෂ වචනයෙන් වැළකී ඉන්නවා ..... තේරුමක් නැති කතා බහ අත්හැරලා තේරුමක් නැති කතා කීමෙන් වැළකී සිටිනවා ..... මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

11. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති ..... ඡේදනවධබන්ධනවිපරාමෝසආලෝපසහසාකාරා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

11. පැලවෙන බීජ හා පැල වුණ ගස් කොළන් විනාශ කිරීමෙන් වැළකී ඉන්නවා ..... අත්පා කැපීම් මැරීම් බන්ධන කිරීම් මං පැහැරගැනීම්, ගම් පැහැර ගැනීම් ආදී සැහැසි දෙයින් වැළකී සිටිනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

12. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති,

සෙය්‍යථීදං: නච්චං ගීතං ..... අණීකදස්සනං. ඉති වා ඉති ඒවරූපා විසූකදස්සනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

12. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයේ විසූක දර්ශනයන් නැරඹීමෙහි යෙදිල ඉන්නවා. ඒ කියන්නේ නැටුම්, ගැයුම් ..... හමුදාව නැරඹීම ආදී දේවල්වල යෙදෙමින් ඉන්නවා. මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලින් යුතු විසූක දර්ශන නැරඹීම්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

13. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං ජූතප්පමාදට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං: අට්ඨපදං දසපදං ..... යථාවජ්ජං. ඉති වා ඉති ඒවරූපා ජූතප්පමාදට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

13. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල තමාව ප්‍රමාදයට පත් කරවන මේ ආකාර වූ සූදු කෙළියෙන් කල් යවනවා. ඒ කියන්නේ හතරැස් කොටු අටකින් යුතුව කරණ සූදුව, කොටු දහයකින් කරන සූදුව ..... විකලාංග අනුකරණයෙන් හිනැස්සීමේ සෙල්ලම ආදී දේ කිරීමයි. මේ දෙයිනුත් මෙවැනි තවත් දේවල් ඇත්නම් එයිනුත් වැළකී ප්‍රමාදයට පත්වන සූදුවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

14. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා ..... තේ ඒවරූපං උ-චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: ආසන්දිං පල්ලංකං ..... උහතෝලෝහිතකූපධානං. ඉති වා ඉති ඒවරූපා උ-චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

14. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා ..... මේ ආකාර වූ පමණ ඉක්මවා උස් වූ ආසනත් වටිනා සුඛෝපභෝගී ආසනත් පරිහරණය කරනවා. ඒ කියන්නේ දිග හාන්සි පුටු, කවිච්චි ..... හිස දෙපැත්තට රතු විල්වීද කොට්ට තබා රතු උඩුවියන් බැඳ සැදූ වටිනා යහන් ආදිය පරිහරණය කරයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත්

වැළකී උස් අසුන් මහා අසුන් පරිහරණයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

15. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං: උ-ඡාදනං පරිමද්දනං ..... විදානානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති ඒවරූපා මණ්ඩනවිභූසනට්-ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

15. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් ඇඟපත සැරසීමෙන් හා විසිතුරු වස්ත්‍රාභරණ පැළඳීමෙන් යුක්තව කල් ගෙවනවා. ඒ කියන්නේ සුවඳ වර්ග ඇඟ තවරා සිරුර සිනිඳු කිරීම, තෙල් වර්ග ගා සම්බාහනය කොට සිරුර හැඩ කිරීම ..... දිග වාටි ඇති සුදු වස්ත්‍ර දැරීම ආදියෙන් යුතුවෙයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී ඇඟපත සැරසීම් හා විසිතුරු වස්ත්‍රාභරණ සැරසීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

16. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා ..... ඒවරූපං තිර-ඡානකතං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රාජකථං චෝරකථං ..... ඉතිභවාභවකථං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

16. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා ..... මෙබඳු වූ තිරිසන් කථාවල යෙදී වාසය කරනවා. ඒ කියන්නේ, රජවරුන් ගැන කථා, සොරුන් ගැන කථා ..... මෙහෙමයි වුණේ මෙහෙමයි නොවුණේ කියන දේ ගැන කථා කරකර ඉන්නවා, මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරිසන් කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

17. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා ..... ඒවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: "න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි ..... නිබ්බේඨේහි වා සෙ- පහෝසී"ති. ඉති වා ඉති ඒවරූපාය විග්ගාහිකකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

17. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා ..... මේ ආකාරයෙන් එකිනෙකා අතර බැණ දොඩා ගන්නා කථාවෙන් යුතුව යි ඉන්නෙ. ඒ කියන්නේ "නුඹ මේ ධර්ම විනය දන්නෙ නෑ ..... වාදයෙන් නිදහස් වීමට මගක් හොයාගෙන පලයන්. පුළුවන් නම් ලෙහාගනින්" යනාදිය කියමින් ආරවුල් හදාගන්නවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ බැණ දොඩාගන්නා කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

18. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා ..... තේ ඒවරූපං දූතෙය්‍යපහිණගමනානුයෝගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රඤ්ඤං රාජමහාමත්තානං ..... අමුත්‍ර ඉදං ආහරාති. ඉති වා ඉති ඒවරූපා දූතෙය්‍යපහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

18. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා ..... ගිහියන් ගේ පණිවිඩ පණත් ගෙන යන මෙබඳු වූ දූත මෙහෙවරෙහි යෙදෙනවා. ඒ කියන්නේ, "මෙහෙ යන්න, අසවල් තැනට එන්න, මේක (අපේ මේ පණිවිඩය) අරන් යන්න. අසවල් තැනට මේක අරන් යන්න" යනාදී රජුන් ගේ, රාජමහා ඇමතිවරුන් ගේ ක්ෂත්‍රියයන් ගේ, බ්‍රාහ්මණයන් ගේ, ගෘහපතියන් ගේ, කුමාරවරුන් ගේ, පණිවුඩ පණත් ගෙනියනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ පණිවුඩ පණත් ගෙනයන ගිහියන්ගේ දූත මෙහෙවරෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

19. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා ..... කුහකා ව හොන්ති ..... ලාභේන ලාභං නිජිගිංසිතාරෝ. ඉති වා ඉති ඒවරූපා කුහනලපනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

19. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා ..... කුහක (උඩින් වෙන ජීවිතයක් පෙන්වමින් යටින් වෙනත් ජීවිතයක් ගෙවමින් නැති ගුණ පෙන්වා) ජීවිත ගෙවනවා ..... ලාභයෙන් ලාභය හොයනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ කුහකකමින් චාටුබස්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

20. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා .....

එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: අංගං නිමිත්තං ..... මිගපක්ඛං. ඉති වා ඉති එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

20. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා ..... මෙවැනි වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා . ඒ කියන්නේ ශාරීරික අංග බලා ඵලාඵල කියනවා, නිමිති බලා ඵලාඵල කියනවා ..... මෘග පක්ෂ යනාදී මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

21. **යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා ..... එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: මණිලක්ඛණං වත්ථලක්ඛණං ..... මිගලක්ඛණං. ඉති වා ඉති එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

21. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා ..... මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ මැණික්වල සුභ අසුභ ලකුණු කීම, වස්ත්‍රවල සුභ අසුභ ලකුණු කීම ..... මුවන්ට මතුරා ඵලාඵල කීම ආදී තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

22. **යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා ..... එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති ..... ඉමස්ස පරාජයෝ භවිස්සති. ඉති වා ඉති එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

22. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා ..... මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් නැකතට රජතුමා ගේ යුධ පිණිස නික්මීම වන්නේ ..... මොහුට පරාජය වෙනවා" ආදී වශයෙන් පවසමින් තිරිසන්

විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

23. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා ..... එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: චන්දග්ගාහෝ භවිස්සති ..... එවං විපාකෝ චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං විගමනං සංකිලේසං වෝදානං භවිස්සති. ඉති වා ඉති එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

23. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා ..... මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් දින චන්ද්‍රග්‍රහණයක් සිදුවෙනවා ..... හිරු සඳු හා නැකත්වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම ලෝකයට මෙවැනි විපාක ලබා දෙනවා" කියල තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

24. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා ..... එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: සුබ්බුට්ඨිකා භවිස්සති ..... ලෝකායතං. ඉති වා ඉති එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

24. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා ..... මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "මේ කාලයේ දී වැස්ස වහිනවා ..... ලෝකායත ශාස්ත්‍ර, ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

25. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා ..... එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: ආවාහනං ..... සිරිවිභානං. ඉති වා ඉති එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

25. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා ..... මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, ආවාහයට නැකත් කීම ..... මන්ත්‍ර බලෙන් ලක්ෂ්මි පූජා කිරීම යනාදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

26. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා..... ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: සන්තිකම්මං පණිධිකම්මං ..... විසඨීනං පටිමොක්ඛෝ. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

26. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා ..... මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, ශාන්ති කර්ම, බාර ඔප්පු කිරීම ..... වනවලට බෙහෙත් බැඳීම, ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

27. ස ඛෝ සෝ පොට්ඨපාද භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ ..... සෝ ඉමිනා අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ පොට්ඨපාද භික්ඛු සීලසම්පන්නෝ හෝති.

27. පින්වත් පොට්ඨපාද, ඒ භික්ෂුව වනාහී මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ ..... ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් සමන්විත ව ආධ්‍යාත්මිකව නිවැරදි සැපයක් විඳිනවා. පින්වත් පොට්ඨපාද, ඔන්න විදිහට යි භික්ෂුව සීලසම්පන්න වන්නේ.

28. කථඤ්ච පොට්ඨපාද භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති? ඉධ පොට්ඨපාද භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී ..... මනින්ද්‍රියේ සංවරං ආපජ්ජති.

සෝ ඉමිනා අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ අජ්ඣත්තං අබ්‍යාසේකසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ පොට්ඨපාද භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති.

28. පින්වත් පොට්ඨපාද, භික්ෂුව අකුසලයන් වැළකූ ද්වාර ඇති ඉඳුරන් ඇතිව ඉන්නේ කොහොම ද? පින්වත් පොට්ඨපාද, මෙහිලා භික්ෂුව ඇසින් රූප දැක නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ ..... මනස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. ඔහු මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව ආධ්‍යාත්මිකව පීඩා රහිතව සැපයක් විඳිනවා. පින්වත් පොට්ඨපාද, භික්ෂුව අකුසලයෙන් වැළැක් වූ දොරටු ඇති ඉන්ද්‍රියයන් තුළ ඉන්නේ ඔය විදිහට යි.

29. කථඤ්ච පොට්ඨපාද භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති? ඉධ පොට්ඨපාද භික්ඛු අභික්කන්තේ පටික්කන්තේ සම්පජානකාරී හෝති ..... තුණ්හීභාවේ සම්පජානකාරී හෝති. ඒවං ඛෝ පොට්ඨපාද භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති.

29. පින්වත් පොට්ඨපාද, භික්ෂුව සිහිනුවණින් යුතුව සිටින්නේ කොහොම ද? පින්වත් පොට්ඨපාද, මෙහිලා භික්ෂුව ඉදිරියට යද්දීත්, ආපසු එද්දීත්, එය කරන්නේ සිහි නුවණින් ම යි ..... නිහඬව සිටිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. පින්වත් පොට්ඨපාද, භික්ෂුව සිහිනුවණින් යුතු වන්නේ ඔය ආකාරයට යි.

30. කථඤ්ච පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨෝ හෝති? ඉධ පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරියේන චීවරේන ..... සෙය්‍යථාපි පොට්ඨපාද පක්ඛී සකුණෝ යේන යේනේව ඩේති සපත්තභාරෝව ඩේති, ඒවමේව ඛෝ පොට්ඨපාද භික්ඛු ..... යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. ඒවං ඛෝ පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨෝ හෝති.

30. පින්වත් පොට්ඨපාද, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ කොහොම ද? පින්වත් පොට්ඨපාද, මෙහිලා භික්ෂුව කය පරිහරණයට සෑහෙන සිවුරෙන් ..... පින්වත් පොට්ඨපාද, ඒක මේ වගේ දෙයක්. කුරුල්ලෙක් යම් ම තැනකට පියඹා යනවා නම්, පියාපත් බර පමණක් සහිතව පියඹනවා වගෙයි. පින්වත් පොට්ඨපාද, ඔය අයුරින් ම භික්ෂුව ..... ඔහු යම් ම

තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. පින්වත් පොට්ඨපාද, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ ඔය විදිහට යි.

31. සෝ ඉමිනා ච අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතෝ, විවිත්තං සේනාසනං භජති අරඤ්ඤං ..... පලාලපුඤ්ජං. සෝ ප-ඡාහත්තං පිණ්ඩපාතපටික්කන්තෝ නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

31. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ සිහිනුවණින් යුක්ත වෙලා, මේ ආර්ය වූ ලද දෙයින් සතුටුවීමෙන් යුක්ත වෙලා හුදෙකලා සෙනසුනක වාසය කරනවා. ඒ කියන්නේ ආරණ්‍යය, රුක්සෙවණ, පර්වතය, දිය ඇල්ල, ගිරිගුහාව, සොහොන, වනගැබ, ගස් කොළන් රහිත හිස් පිටිය, පිදුරු ගෙය ආදිය යි. ඔහු පිණ්ඩපාතය වළඳා, දානයෙන් පසු (එවැනි තැනක) පළඟක් බැඳ ගෙන, කය සෘජු කර ගෙන, භාවනා අරමුණෙහි සිහිය පිහිටුවා ගෙන වාඩිවෙනවා.

32. සෝ අභිජ්ඣං ලෝකේ පහාය ..... ව්‍යාපාදපදෝසං පහාය ..... ථීනමිද්ධං පහාය ..... උද්ධ-චකුක්කු-චං පහාය ..... විචිකි-ඡං පහාය තිණ්ණවිචිකි-ඡෝ විහරති අකථංකථී කුසලේසු ධම්මේසු. විචිකි-ඡාය චිත්තං පරිසෝධේති.

32. ඔහු ජීවිතය නම් වූ ලෝකය ගැන ඇති විසම ලෝභය දුරු කොට ..... තරහ වෛර ආදිය අත්හැර ..... නිදිමත අලසකම අත්හැර නිදිමත අලසකමින් බැහැරව ..... සිතේ විසිරීමත්, පසුතැවීමත් බැහැර කොට ..... සැකය දුරු කොට කුසල් දහම් ගැන කෙසේ ද? කෙසේ ද? යනාදී සැකයෙන් එතෙරව වාසය කරනවා. සැකය කෙරෙන් සිත පිරිසිදු කරනවා.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසෝ ඉණං ආදාය කම්මන්තේ පයෝජෙය්‍ය, තස්ස තේ කම්මන්තා සම්ඡ්ජ්ඣෙය්‍යුං ..... සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

පින්වත් පොට්ඨපාද, එය මෙවැනි දෙයක්. පුරුෂයෙක් ණයක් අරගෙන කර්මාන්තයක යොදවනවා. ඔහු ගේ ඒ ව්‍යාපාරය සාර්ථක වෙනවා ..... ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසෝ ආබාධිකෝ අස්ස ..... සෝ අපරේන සමයේන තම්හා ආබාධා මු-චෙය්‍ය ..... සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

පින්වත් පොට්ඨපාද, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් රෝගී වෙලා ..... නමුත් පස්සෙ කාලෙක ඔහු ඒ රෝගයෙන් මිදුනා ..... ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසෝ බන්ධනාගාරේ බද්ධෝ අස්ස, සෝ අපරේන සමයේන තම්හා බන්ධනාගාර මු-චෙය්‍ය සොත්ථිනා අබ්භයේන ..... සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

පින්වත් පොට්ඨපාද, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් හිරගෙදරක බන්ධනයකට හසුවෙනවා. නමුත් ඔහු පස්සෙ කාලෙක තමන් ගේ ධනය වියදම් නොකොට සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වෙනවා. ඔහු ගේ සම්පත්වලින් කිසි වියදමක් යන්නේ නෑ ..... ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසෝ දාසෝ අස්ස ..... අපරේන සමයේන තම්හා දාසබ්‍යා මු-චෙය්‍ය ..... සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

පින්වත් පොට්ඨපාද, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් දාසයෙක් වෙලා හිටියා ..... ඔහු පස්සෙ කාලෙක ඒ දාසබවෙන් නිදහස් වුණා ..... ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසෝ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං, සෝ අපරේන සමයේන තං කන්තාරං නිත්ථරෙය්‍ය ..... සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

පින්වත් පොට්ඨපාද, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසෙනවා. නමුත් ඔහු පසු කාලෙක ඒ කාන්තාරයෙන් එතෙර වෙනවා ..... ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

ඒවමේව ඛෝ පොට්ඨපාද භික්ඛු යථා ඉණං යථා රෝගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං. ඒවං ඉමේ පඤ්ච නීවරණේ අප්පහීණේ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි පොට්ඨපාද ආනණ්‍යං, යථා ආරෝග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛේමන්තභූමිං ඒවමේව ඛෝ පොට්ඨපාද භික්ඛු ඉමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සති.

පින්වත් පොට්ඨපාද, අන්න ඒ විදිහම යි. භික්ෂුවත් (කලින්) ණයක් ගත්තා වගේ, ලෙඩ වුණා වගේ, හිරේවිලංගුවේ වැටුනා වගේ, වහල්බවට පත් වුණා වගේ, නිරුදක කතරකට පැමිණුනා වගේ මේ පංච නීවරණයන් ප්‍රහාණය නො වී තමා තුළ පවතින හැටි දකිනවා. නමුත් පින්වත් පොට්ඨපාද, ඒ ණය ගෙවා දමා ණය රහිත වුණා වගේ, රෝගයෙන් නිදහස් වෙලා නීරෝග වුණා වගේ, වියදම් නැතුව හිරෙන් නිදහස් වුණා වගේ, දාසබවෙන් නිදහස් වුණා වගේ, නිරුදක කතර ගෙවා ආරක්ෂා සහිත ක්ෂේම භූමියකට පැමිණුනා වගේ තමයි. පින්වත් පොට්ඨපාද, අන්න ඒ විදිහමයි භික්ෂුව තමා තුළ මේ පංච නීවරණයන් දුරුවී ඇති ආකාරයත් දකින්නේ.

33. තස්සිමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සතෝ පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායෝ පස්සම්භති. පස්සද්ධකායෝ සුඛං වේදේති. සුඛිනෝ චිත්තං සමාධියති. සෝ විවිච්චේව කාමේහි විවිච්ච අකුසලේහි ධම්මේහි, සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා කාමසඤ්ඤා සා නිරුජ්ඣති. විවේකජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤී යේව තස්මිං සමයේ හෝති. ඒවම්පි සික්ඛා ඒකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා ඒකා සඤ්ඤා නිරුජ්ඣති. අයං සික්ඛාති භගවා අවෝච.

33. ඔහුට මේ පඤ්ච නීවරණයන් තමා තුළ නැති බව දකිද්දි මහත් සතුටක් ඇති වෙනවා. ඒ ප්‍රමුදිත වීම ඇති කෙනාට ප්‍රීතිය ඇති වෙනවා. ප්‍රීති මනසක් ඇති කෙනා ගේ කය සංසිඳෙනවා. සංසිඳුනු කයින් යුතු ව සැපක් විඳිනවා. සැප ඇති කෙනා ගේ සිත සමාධිමත් වෙනවා. ඔහු කාමයන්ගෙන්

වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් හට ගත් ප්‍රීති සුඛය ඇති පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහුට කලින් යම් කාම සඤ්ඤාවක් තිබුණා නම්, ඒක නිරුද්ධ වෙනවා. ඒ වෙලාවට ඔහුට තිබෙන්නේ විවේකයෙන් හටගත් ඉතා සියුම් වූ ප්‍රීතිමත් ස්වභාවයෙන් යුතු සඤ්ඤාව යි. ඔය ආකාරයෙනුත් ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් උපදිනවා. ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් නිරුද්ධ වෙනවා. මේ තමයි ශික්ෂාව කියල භාග්‍යවතුන් වහන්සේ වදාළා.

34. "පුනචපරං පොට්ඨපාද භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසෝ ඒකෝදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා විවේකජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා සා නිරුජ්ඣති. සමාධිජපීතිසුඛසුඛුම-සච්චසඤ්ඤා තස්මිං සමයේ හෝති. සමාධිජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤී යේව තස්මිං සමයේ හෝති. ඒවම්පි සික්ඛා ඒකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා ඒකා සඤ්ඤා නිරුඣති. අයම්පි සික්ඛා"ති භගවා අවෝච.

34. පින්වත් පොට්ඨපාද, තව දුරටත් කියනවා නම් භික්ෂුව විතක්ක විචාරයන් ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්මිකව පැහැදීම ඇතිව සිතෙහි මනා එකඟ බවෙන් යුතු ව විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් හටගත්, ප්‍රීති සුඛය ඇති දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහුට කලින් යම් විවේකයෙන් හටගත් ඉතා සියුම් වූ ප්‍රීතිමත් ස්වභාවයෙන් යුතු සඤ්ඤාවක් තිබුණා නම්, ඒක නිරුද්ධ වෙනවා. ඒ වෙලාවට ඔහුට තිබෙන්නේ සමාධියෙන් හටගත් ඉතා සියුම් වූ සැපසහගත ස්වභාවයෙන් යුතු සඤ්ඤාව යි. ඔය ආකාරයෙනුත් ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් උපදිනවා. ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් නිරුද්ධ වෙනවා. මේ තමයි ශික්ෂාව කියල භාග්‍යවතුන් වහන්සේ වදාළා.

35. "පුනචපරං පොට්ඨපාද භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති සතෝ ච සම්පජානෝ. සුඛඤ්ච කායේන පටිසංවේදේති. යන්තං අරියා ආචික්ඛන්ති "උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරී"ති. තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා සමාධිජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා සා නිරුජ්ඣති. උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයේ හෝති. උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤී යේව තස්මිං සමයේ හෝති. ඒවම්පි සික්ඛා ඒකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා ඒකා සඤ්ඤා නිරුඣති. අයම්පි සික්ඛා"ති භගවා අවෝච.

35. පින්වත් පොට්ඨපාද, තව දුරටත් කියනවා නම් භික්ෂුව ප්‍රීතියට ද නො ඇලීමෙන් උපේක්ෂාවෙන් යුතුව වාසය කරනවා. සිහියෙන් නුවණින් යුතු ව කයෙන් සැපයක් ද විඳිනවා. ආර්යයන් වහන්සේලා යම් ධ්‍යානයකට උපේක්ෂා සහගත සිහිය ඇති සැප විහරණය යැයි පවසනවා ද, ඒ තුන්වන ධ්‍යානයත් උපදවා ගෙන වාසය කරනවා. ඔහුට කලින් යම් සමාධියෙන් හටගත් ඉතා සියුම් වූ සැපසහගත ස්වභාවයෙන් යුතු සඤ්ඤාවක් තිබුණා නම්, ඒක නිරුද්ධ වෙනවා. ඒ වෙලාවට ඔහුට තිබෙන්නේ උපේක්ෂාවෙන් හටගත් ඉතා සියුම් වූ සැපසහගත ස්වභාවයෙන් යුතු සඤ්ඤාව යි. ඔය ආකාරයෙනුත් ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් උපදිනවා. ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් නිරුද්ධ වෙනවා. මේ තමයි ශික්ෂාව කියල භාග්‍යවතුන් වහන්සේ වදාළා.

36. "පුනචපරං පොට්ඨපාද භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා, පුබ්බේව සෝමනස්සදෝමනස්සානං අත්ථගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤා සා නිරුජ්ඣති. අදුක්ඛමසුඛසුඛුම-සච්චසඤ්ඤා තස්මිං සමයේ හෝති. අදුක්ඛමසුඛසුඛුමසච්චසඤ්ඤී යේව තස්මිං සමයේ හෝති. එවම්පි සික්ඛා ඒකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා ඒකා සඤ්ඤා නිරුඣති. අයම්පි සික්ඛා"ති භගවා අවෝච.

36. පින්වත් පොට්ඨපාද, නැවතත් කියනවා නම් භික්ෂුව සැපය ද ප්‍රහාණය කිරීමෙන්, දුක ද ප්‍රහාණය කිරීමෙන් කලින් ම සොම්නස් දොම්නස් දෙක ඉක්ම යෑමෙන් දුක් සැප රහිත වූ පාරිශුද්ධ උපේක්ෂා සහගත සතිය ඇති සතර වෙනි ධ්‍යානය උපදවා ගෙන වාසය කරනවා. ඔහුට කලින් යම් උපේක්ෂාවෙන් හටගත් ඉතා සියුම් වූ සැපසහගත ස්වභාවයෙන් යුතු සඤ්ඤාවක් තිබුණා නම්, ඒක නිරුද්ධ වෙනවා. ඒ වෙලාවට ඔහුට තිබෙන්නේ දුක් සැප රහිත ව හටගත් ඉතා සියුම් වූ සැපසහගත ස්වභාවයෙන් යුතු සඤ්ඤාව යි. ඔය ආකාරයෙනුත් ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් උපදිනවා. ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් නිරුද්ධ වෙනවා. මේ තමයි ශික්ෂාව කියල භාග්‍යවතුන් වහන්සේ වදාළා.

37. "පුනචපරං පොට්ඨපාද භික්ඛු සබ්බසෝ රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා "අනන්තෝ ආකාසෝ"ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා රූපසඤ්ඤා සා නිරුජ්ඣති. ආකාසානඤ්චායතනසුඛුම-

සච්චසඤ්ඤා තස්මිං සමයේ හෝති. ආකාසානඤ්චායතනසුඛුමසච්චසඤ්ඤී යේව තස්මිං සමයේ හෝති. ඒවම්පි සික්ඛා ඒකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා ඒකා සඤ්ඤා නිරුඣති. අයම්පි සික්ඛා"ති භගවා අවෝච.

37. පින්වත් පොට්ඨපාද, නැවතත් කියනවා නම් භික්ෂුව සියළු රූප සඤ්ඤාවන් ඉක්මවා ගිහින් ගොරෝසු සඤ්ඤාවන් නැතිවීමෙන් නානා සඤ්ඤාවන් මෙනෙහි නො කර අනන්ත ආකාසය කියල මෙනෙහි කිරීමෙන් ආකාසානඤ්චායතනය උපදවා ගෙන වාසය කරනවා. ඔහුට කලින් යම් රූප සඤ්ඤාවක් තිබුණා නම්, ඒක නිරුද්ධ වෙනවා. ඒ වෙලාවට ඔහුට තිබෙන්නේ ආකාසානඤ්චායතන වූ ඉතා සියුම් වූ ස්වභාවයෙන් සඤ්ඤාව යි. ඔය ආකාරයෙනුත් ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් උපදිනවා. ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් නිරුද්ධ වෙනවා. මේ තමයි ශික්ෂාව කියල භාග්‍යවතුන් වහන්සේ වදාළා.

38. "පුනචපරං පොට්ඨපාද භික්ඛු සබ්බසෝ ආකාසානඤ්චායතනං සමතික්කම්ම, "අනන්තං විඤ්ඤණ"න්ති විඤ්ඤණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා ආකාසානඤ්චායතනසුඛුමසච්චසඤ්ඤා සා නිරුජ්ඣති. විඤ්ඤණඤ්චායතනසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයේ හෝති. විඤ්ඤණඤ්චායතනසුඛුමසච්චසඤ්ඤී යේව තස්මිං සමයේ හෝති. ඒවම්පි සික්ඛා ඒකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා ඒකා සඤ්ඤා නිරුඣති. අයම්පි සික්ඛා"ති භගවා අවෝච.

38. පින්වත් පොට්ඨපාද, නැවතත් කියනවා නම් භික්ෂුව සියළු ආකාසානඤ්චායතනය ඉක්මවා යෑමෙන් අනන්ත වූ විඤ්ඤණය කියල අරූප ධ්‍යාන වැඩීමෙන් විඤ්ඤණඤ්චායතනය උපදවා ගෙන වාසය කරනවා. ඔහුට කලින් යම් අකාසානඤ්චායතන වූ ඉතා සියුම් වූ ස්වභාවයෙන් යුතු සඤ්ඤාවක් තිබුණා නම්, ඒක නිරුද්ධ වෙනවා. ඒ වෙලාවට ඔහුට තිබෙන්නේ විඤ්ඤණඤ්චායතන වූ ඉතා සියුම් වූ ස්වභාවයෙන් යුතු සඤ්ඤාව යි. ඔය ආකාරයෙනුත් ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් උපදිනවා. ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් නිරුද්ධ වෙනවා. මේ තමයි ශික්ෂාව කියල භාග්‍යවතුන් වහන්සේ වදාළා.

39. "පුනචපරං පොට්ඨපාද භික්ඛු සබ්බසෝ විඤ්ඤණඤ්චායතනං සමතික්කම්ම, "නත්ථි කිඤ්චී"ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා විඤ්ඤණඤ්චායතනසුඛුමසච්චසඤ්ඤා සා නිරුජ්ඣති.

ආකිඤ්චඤ්ඤායතනසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයේ හෝති. ආකිඤ්චඤ්ඤා-යතනසුඛුමසච්චසඤ්ඤී යේව තස්මිං සමයේ හෝති. ඒවම්පි සික්ඛා ඒකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා ඒකා සඤ්ඤා නිරුඣති. අයම්පි සික්ඛා”ති භගවා අවෝච.

39. පින්වත් පොට්ඨපාද, නැවතත් කියනවා නම් භික්ෂුව සියළු විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා යෑමෙන් කිසිවක් නැත කියල අරූප ධ්‍යාන වැඩීමෙන් ආකිඤ්චඤ්ඤායතනය උපදවා ගෙන වාසය කරනවා. ඔහුට කලින් යම් විඤ්ඤාණඤ්චායතන වූ ඉතා සියුම් වූ ස්වභාවයෙන් යුතු සඤ්ඤාවක් තිබුණා නම්, ඒක නිරුද්ධ වෙනවා. ඒ වෙලාවට ඔහුට තිබෙන්නේ ආකිඤ්චඤ්ඤායතන වූ ඉතා සියුම් වූ ස්වභාවයෙන් යුතු සඤ්ඤාව යි. ඔය ආකාරයෙනුත් ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් උපදිනවා. ශික්ෂාවෙන් එක් සඤ්ඤාවක් නිරුද්ධ වෙනවා. මේ තමයි ශික්ෂාව කියල භාග්‍යවතුන් වහන්සේ වදාළා.

40. “යතෝ ඛෝ පොට්ඨපාද භික්ඛු ඉධ සකසඤ්ඤී හෝති, සෝ තතෝ අමුත්‍ර තතෝ අමුත්‍ර අනුපුබ්බේන සඤ්ඤග්ගං ඵුසති. තස්ස සඤ්ඤග්ගේ ඨිතස්ස ඒවං හෝති: චේතයමානස්ස මේ පාපියෝ අචේතයමානස්ස මේ සෙය්‍යෝ. අහඤ්චේව ඛෝ පන චේතෙය්‍යං අභිසංඛරෙය්‍යං, ඉමා ච මේ සඤ්ඤා නිරුජ්ඣෙය්‍යුං, අඤ්ඤා ච විළාරිකා සඤ්ඤා උප්පජ්ජෙය්‍යුං. යන්නූනාහං න චේව චේතෙය්‍යං න චාභිසංඛරෙය්‍යන්ති. සෝ න චේව චේතේති න චාභිසංඛාරෝති. තස්ස අචේතයතෝ අනභිසංඛරොතෝ තා චේව සඤ්ඤා නිරුජ්ඣන්ති, අඤ්ඤා ච විළාරිකා සඤ්ඤා න උප්පජ්ජන්ති. සෝ නිරෝධං ඵුසති. ඒවං ඛෝ පොට්ඨපාද අනුපුබ්බාභිසඤ්ඤානිරෝධසම්පජානසමාපත්ති හෝති.

40. “පින්වත් පොට්ඨපාද යම් විටෙක භික්ෂුව මෙහි තමන් ගේ සඤ්ඤාව සහිතව ඉන්නවා එතකොට ඔහු ඒ ඒ සඤ්ඤාවෙන් ඔබ්බට අනුපිළිවෙලින් සඤ්ඤා කෙළවර ස්පර්ශ කරනවා. ඉතින් ඒ සඤ්ඤා කෙලෙවරෙහි පිහිටි ඔහුට මෙහෙම හිතෙනවා. “චේතනාවන් පහළ කරන එක මට ලාමක දෙයක්. චේතනා පහළ නො කරන දෙය තමයි මට උතුම් වන්නේ එහෙම නම් මම චේතනා පහළ කරනවා නම්, අභිසංස්කරණ කරනවා නම් මාගේ මේ සඤ්ඤාවත් නිරුද්ධ වෙලා යාවි. අන්‍ය වූ ගොරෝසු සඤ්ඤාවන් උපදීවි. එනිසා මං චේතනා පහළ නො කර අභිසංස්කරණය නො කොට ඉන්න වින” කියල. ඉතින් ඔහු සිතන්නෙත් නෑ. අභිසංස්කරණ කරන්නෙත්

නෑ. නො සිතා ඉන්න කොට අභිසංස්කරණය නො කරන කොට ඔහු ගේ ඒ සඤ්ඤාවන් නිරුද්ධ වෙලා යනවා. අන්‍ය වූ ගොරෝසු සඤ්ඤාවන් උපදින්නේ නැතුව යනවා. එතකොට ඔහු නිරෝධය ස්පර්ශ කරනවා. පින්වත් පොට්ඨපාද, ඔන්න ඔය විදිහට යි අනුපිළිවෙලින් අභිසඤ්ඤා නිරෝධය දැන ගෙන එයට සමවදින්නේ.

41. තං කිම්මඤ්ඤසි පොට්ඨපාද? අපි නු තේ ඉතෝ පුබ්බේ ඒවරූපා අනුපුබ්බාභිසඤ්ඤානිරෝධසම්පජානසමාපත්ති සුතපුබ්බා?"ති.

41. පින්වත් පොට්ඨපාද මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? ඔබ මේ විදිහේ විස්තර සහිතව අනුපිළිවෙලින් අභිසඤ්ඤා නිරෝධය දැන ගෙන එයට සමවැදීම ගැන මෙයට කලින් අහල තියෙනවා ද?

"නෝ හේතම්භන්තේ. ඒවං ඛෝ අහං භන්තේ භගවතෝ භාසිතං ආජානාමි. යතෝ ඛෝ පොට්ඨපාද භික්ඛු ඉධ සකසඤ්ඤී හෝති, සෝ තතෝ අමුත්‍ර තතෝ අමුත්‍ර අනුපුබ්බේන සඤ්ඤග්ගං ඵුසති. තස්ස සඤ්ඤග්ගේ ඨිතස්ස ඒවං හෝති. චේතයමානස්ස මේ පාපියෝ, අචේතයමානස්ස මේ සෙය්‍යෝ. අහඤ්චේව ඛෝ පන චේතෙය්‍යං අභිසංඛරෙය්‍යං, ඉමා ච මේ සඤ්ඤා නිරුජ්ඣෙය්‍යුං, අඤ්ඤා ච විළාරිකා සඤ්ඤා උප්පජ්ජෙය්‍යුං. යන්නූනාහං න චේව චේතෙය්‍යං න ච අභිසංඛරෙය්‍යන්ති. සෝ න චේව චේතේති. න ච අභිසංඛරෝති. තස්ස අචේතයතෝ අනභිසංඛරෝතෝ තා චේව සඤ්ඤා නිරුජ්ඣන්ති. අඤ්ඤා ච විළාරිකා සඤ්ඤා න උප්පජ්ජන්ති. සෝ නිරෝධං ඵුසති. ඒවං ඛෝ පොට්ඨපාද අනුපුබ්බාභිසඤ්ඤානිරෝධසම්පජානසමාපත්ති හෝති"ති.

"අනේ ස්වාමීනී, අහල නෑ. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාවෙන් තමයි මං මේක දැන ගත්තේ. ඒ කියන්නේ: "පින්වත් පොට්ඨපාද, යම් විටෙක භික්ෂුව මෙහි තමන් ගේ සඤ්ඤාව සහිතව ඉන්නවා එතකොට ඔහු ඒ ඒ සඤ්ඤාවෙන් ඔබ්බට අනුපිළිවෙලින් සඤ්ඤා කෙළවර ස්පර්ශ කරනවා. ඉතින් ඒ සඤ්ඤා කෙලෙවරෙහි පිහිටි ඔහුට මෙහෙම හිතෙනවා. "චේතනාවන් පහළ කරන එක මට ලාමක දෙයක්. චේතනා පහළ නො කරන දෙය තමයි මට උතුම් වන්නේ. එහෙම නම් මම චේතනා පහළ කරනවා නම්, අභිසංස්කරණ කරනවා නම් මාගේ මේ සඤ්ඤාවත් නිරුද්ධ වෙලා යාවි. අන්‍ය වූ ගොරෝසු සඤ්ඤාවන් උපදීවි. එනිසා මං චේතනා පහළ නො කර අභිසංස්කරණය නො කොට ඉන්න වින" කියල. ඉතින් ඔහු සිතන්නෙත් නෑ.

අභිසංස්කරණ කරන්නෙත් නෑ. නො සිතා ඉන්න කොට අභිසංස්කරණය නො කරන කොට ඔහු ගේ ඒ සඤ්ඤාවන් නිරුද්ධ වෙලා යනවා. අන්‍ය වූ ගොරෝසු සඤ්ඤාවන් උපදින්නේ නැතුව යනවා. එතකොට ඔහු නිරෝධය ස්පර්ශ කරනවා. පින්වත් පොට්ඨපාද, ඔන්න ඔය විදිහට යි අනුපිළිවෙලින් අභිසඤ්ඤා නිරෝධය දැන ගෙන එයට සමවදින්නේ" කියල.

"එවං ඛෝ පොට්ඨපාදා"ති.

"පින්වත් පොට්ඨපාද, එහෙම තමයි."

"එකඤ්ඤේව නු ඛෝ භන්තේ භගවා සඤ්ඤග්ගං පඤ්ඤපේති උදාහු පුථූ'පි සඤ්ඤග්ගේ පඤ්ඤපේති?"ති.

"ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ එක ම සඤ්ඤා කෙළවරක් පණවන සේක් ද? එහෙමත් නැත්නම් විවිධ වූ සඤ්ඤා කෙළවරවල් පණවන සේක්ද?"

"එකම්පි ඛෝ අහං පොට්ඨපාද සඤ්ඤග්ගං පඤ්ඤපේමි. පුථූපි සඤ්ඤග්ගේ පඤ්ඤපේමී"ති.

"පින්වත් පොට්ඨපාද, මං එක ම සඤ්ඤා කෙළවරත් පණවනවා. විවිධ වූ සඤ්ඤා කෙළවරවත් පණවනවා."

"යථාකථං පන භන්තේ භගවා එකම්පි සඤ්ඤග්ගං පඤ්ඤපේති? පුථූපි සඤ්ඤග්ගේ පඤ්ඤපේති?"ති.

"ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ එක ම සඤ්ඤා කෙළවරකුත් පණවන සේක් නම්, විවිධ වූ සඤ්ඤා කෙළවරවල් ද පණවන සේක් නම් එසේ පණවන්නේ කොහොම ද?"

"යථා යථා ඛෝ පොට්ඨපාද නිරෝධං ඵුසති, තථා තථා'හං සඤ්ඤග්ගං පඤ්ඤපේමි. එවං ඛෝ අහං පොට්ඨපාද එකම්පි සඤ්ඤග්ගං පඤ්ඤපේමි, පුථූ'පි සඤ්ඤග්ගේ පඤ්ඤපේමී"ති.

"පින්වත් පොට්ඨපාද, යම් යම් ආකාරයකින් නිරෝධය ස්පර්ශ කරනවා නම්, මං සඤ්ඤාවේ කෙළවර පණවන්නේ ඒ ඒ ආකාරයෙනුයි.

පින්වත් පොට්ඨපාද, මං එක ම සඤ්ඤ කෙළවරක් පණවන්නේත්, විවිධ වූ සඤ්ඤ කෙළවරවත් පණවන්නේ ඔය විදිහට යි.”

“සඤ්ඤ නු ඛෝ භන්තේ පඨමං උප්පජ්ජති, පච්ඡා ඤාණං? උදාහු ඤාණං පඨමං උප්පජ්ජති, පච්ඡා සඤ්ඤ? උදාහු සඤ්ඤ ච ඤාණඤ්ච අපුබ්බං අචරිමං උප්පජ්ජන්ති?”ති.

“ස්වාමීනී, ඉස්සෙල්ලාම උපදින්නේ සඤ්ඤාව ද? ඊට පස්සෙ ද ඤාණය උපදින්නේ? එහෙම නැත්නම්, මුලින් ම ඤාණය උපදිනවා ද? පස්සෙ සඤ්ඤාව උපදිනවා ද? එහෙමත් නැත්නම්, සඤ්ඤාවත් ඤාණයත් යන දෙකම පෙර පසු නොවී එක්වරම උපදිනවා ද?”

“සඤ්ඤ ඛෝ පොට්ඨපාද පඨමං උප්පජ්ජති පච්ඡා ඤාණං. සඤ්ඤුප්පාදා ච පන ඤාණුප්පාදෝ හෝති. සෝ ඒවං පජානාති: ඉදප්පච්චයා කිර මේ ඤාණං උදපාදීති. ඉමිනා ඛෝ ඒතං පොට්ඨපාද පරියායේන වේදිතබ්බං, යථා සඤ්ඤ පඨමං උප්පජ්ජති පච්ඡා ඤාණං, සඤ්ඤුප්පාදා ච පන ඤාණුප්පාදෝ හෝති”ති.

“පින්වත් පොට්ඨපාද සඤ්ඤාව තමයි මුලින් ම උපදින්නේ. පස්සේ උපදින්නේ ඤාණය යි. සඤ්ඤාව ඉපදීමෙනුයි ඤාණය උපදින්නේ. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. “මේ මේ කරුණු ප්‍රත්‍ය කර ගෙනයි මට ඤාණය ඉපදුනේ” කියල. පින්වත් පොට්ඨපාද, ඔය කාරණය මෙන්න මේ ක්‍රමයෙනුත් තේරුම් ගත යුතු යි. “යම් අයුරකින් සඤ්ඤාව පළමුව උපදිනවා ද, පසුවට ඤාණය උපදිනවා ද, සඤ්ඤාව ඉපදීමෙනුයි ඤාණය උපදින්නේ” කියල.

“සඤ්ඤ නු ඛෝ භන්තේ පුරිසස්ස අත්තා? උදාහු අඤ්ඤ සඤ්ඤ, අඤ්ඤේ අත්තා?”ති.

“ස්වාමීනී, සඤ්ඤාව කියන්නේ පුරුෂයා ගේ ආත්මය ද? එහෙම නැත්නම්, සඤ්ඤාව වෙන එකක් ද? ආත්මය වෙන එකක් ද?”

“කිං පන ත්වං පොට්ඨපාද අත්තානං පච්චේසි?”ති.

“පින්වත් පොට්ඨපාද, ඔබ ආත්මය කියල අදහස් කළේ කුමක් ද?”

"විළාරිකං ඛෝ අහං භන්තේ අත්තානං පච්චේමි රූපිං චාතුම්මහාභූතිකං කබළීකාරාහාරභක්ඛන්ති."

"ස්වාමීනී, මං ආත්මය හැටියට සළකන්නේ සතර මහා භූතයන්ගෙන් හට ගත් රූපවත් වූද, ගොරෝසු ආහාර අනුභව කරන්නා වූද, විළාරික ශරීරය යි."

"විළාරිකෝ ච හි තේ පොට්ඨපාද අත්තා අභවිස්ස රූපී චාතුම්මහාභූතිකෝ කබළීකාරාහාරභක්ඛෝ, ඒවං සන්තං ඛෝ තේ පොට්ඨපාද අඤ්ඤ චේ සඤ්ඤ භවිස්සති, අඤ්ඤේ අත්තා. තදමිනාපේතං පොට්ඨපාද පරියායේන වේදිතබ්බං, යථා අඤ්ඤච සඤ්ඤ භවිස්සති, අඤ්ඤේ අත්තා.

"පින්වත් පොට්ඨපාද, ඉතින් එහෙම නම් ඔබ ගේ ආත්මය සතර මහා භූතයන්ගෙන් හට ගත් රූපවත් වූද, ගොරෝසු ආහාර අනුභව කරන්නා වූද, විළාරික ශරීරය නම් ඒ විදිහට සළකද්දී ඔබ ගේ සඤ්ඤාව වෙන දෙයක් ම ය. ආත්මයත් වෙන දෙයක් ම ය. එහෙම නම් පින්වත් පොට්ඨපාද, එය මේ විදිහට තේරුම්ගත යුතු ය. "යම් අයුරකින් සඤ්ඤාව වෙනත් දෙයක් නම් ආත්මය තවත් දෙයක්" කියල.

42. තිට්ඨතේවසායං පොට්ඨපාද විළාරිකෝ අත්තා රූපී චාතුම්මහාභූතිකෝ කබළීකාරාහාරභක්ඛෝ. අථ ඉමස්ස පුරිසස්ස අඤ්ඤ'ව සඤ්ඤ උප්පජ්ජන්ති අඤ්ඤ'ව සඤ්ඤ නිරුජ්ඣන්ති. ඉමිනා ඛෝ ඒතං පොට්ඨපාද පරියායේන වේදිතබ්බං, යථා අඤ්ඤ'ව සඤ්ඤ භවිස්සති, අඤ්ඤේ අත්තා"ති.

42. පින්වත් පොට්ඨපාද සතර මහා භූතයන්ගෙන් හට ගත් රූපවත් වූද, ගොරෝසු ආහාර අනුභව කරන්නා වූද, විළාරික ශරීරය නම් වූ ආත්මය පසෙක තිබේවා. එසේ නමුත් පුරුෂයාට අන්‍ය වූ ම සඤ්ඤාවන් උපදිනවා. අන්‍ය වූම සඤ්ඤාව නිරුද්ධ වෙනවා. පින්වත් පොට්ඨපාද, එය මේ විදිහට තේරුම්ගත යුතු ය. "යම් අයුරකින් සඤ්ඤාව වෙනත් දෙයක් නම් ආත්මය තවත් දෙයක්" කියල.

"මනෝමයං ඛෝ අහං භන්තේ අත්තානං පච්චේමි සබ්බංගපච්චංගිං අහීනින්ද්‍රියන්ති."

"එතකොට ස්වාමීනී, ආත්මය හැටියට මට සළකන්න වෙන්නේ නොපිරිහුණු ඉඳුරන් සහිත සියළු අඟපසඟ ඇති මනෝමය ශරීරය යි."

"මනෝමයං ච හි තේ පොට්ඨපාද අත්තා අහවිස්ස සබ්බංගපච්චංගී අහීනින්ද්‍රියෝ, ඒවං සන්තම්පි ඛෝ තේ පොට්ඨපාද අඤ්ඤ'ව සඤ්ඤා භවිස්සති, අඤ්ඤේ අත්තා. තදමිනාපේතං පොට්ඨපාද පරියායේන වේදිතබ්බං, යථා අඤ්ඤ'ව සඤ්ඤා භවිස්සති, අඤ්ඤේ අත්තා."

"පින්වත් පොට්ඨපාද, ඉතින් එහෙම නම් ඔබ ගේ ආත්මය නොපිරිහුණු ඉඳුරන් සහිත සියළු අඟපසඟ ඇති මනෝමය ශරීරය නම් ඒ විදිහට සළකද්දී ඔබ ගේ සඤ්ඤාව වෙන දෙයක් ම ය. ආත්මයත් වෙන දෙයක් ම ය. එහෙම නම් පින්වත් පොට්ඨපාද, එය මේ විදිහට තේරුම් ගත යුතු ය. "යම් අයුරකින් සඤ්ඤාව වෙනත් දෙයක් නම් ආත්මය තවත් දෙයක්" කියල.

"තිට්ඨතේවායං පොට්ඨපාද මනෝමයෝ අත්තා සබ්බංගපච්චංගී අහීනින්ද්‍රියෝ. අථ ඉමස්ස පුරිසස්ස අඤ්ඤ'ව සඤ්ඤා උප්පජ්ජන්ති, අඤ්ඤ'ව සඤ්ඤා නිරුජ්ඣන්ති. ඉමනාපි ඛෝ ඒතං පොට්ඨපාද පරියායේන වේදිතබ්බං, යථා අඤ්ඤ'ව සඤ්ඤා භවිස්සති, අඤ්ඤේ අත්තා'ති."

පින්වත් පොට්ඨපාද නොපිරිහුණු ඉඳුරන් සහිත සියළු අඟපසඟ ඇති මනෝමය ශරීරය නම් වූ ආත්මය පසෙක තිබේවා. එසේ නමුත් පුරුෂයාට අන්‍ය වූ ම සඤ්ඤාවන් උපදිනවා. අන්‍ය වූම සඤ්ඤාව නිරුද්ධ වෙනවා. පින්වත් පොට්ඨපාද, එය මේ විදිහට තේරුම්ගත යුතු ය. "යම් අයුරකින් සඤ්ඤාව වෙනත් දෙයක් නම් ආත්මය තවත් දෙයක්" කියල.

"අරූපිං ඛෝ අහං හන්තේ අත්තානං පච්චේමි සඤ්ඤාමයන්ති"

"එතකොට ස්වාමීනී, ආත්මය හැටියට මට සළකන්න වෙන්නේ අරූපී වූ සඤ්ඤාමය ශරීරය යි."

"අරූපී ච තේ පොට්ඨපාද අත්තා අහවිස්ස සඤ්ඤාමයෝ, ඒවං සන්තම්පි ඛෝ තේ පොට්ඨපාද අඤ්ඤ'ව සඤ්ඤා භවිස්සති. අඤ්ඤේ අත්තා. තදමිනාපේතං පොට්ඨපාද පරියායේන වේදිතබ්බං යථා අඤ්ඤ'ව සඤ්ඤා භවිස්සති. අඤ්ඤේ අත්තා.

"පින්වත් පොට්ඨපාද, ඉතින් එහෙම නම් ඔබ ගේ ආත්මය අරූපී වූ සඤ්ඤමය ශරීරය නම් ඒ විදිහට සළකද්දී ඔබ ගේ සඤ්ඤාව වෙන දෙයක් ම ය. ආත්මයත් වෙන දෙයක් ම ය. එහෙම නම් පින්වත් පොට්ඨපාද, එය මේ විදිහට තේරුම්ගත යුතු ය. "යම් අයුරකින් සඤ්ඤාව වෙනත් දෙයක් නම් ආත්මය තවත් දෙයක්" කියල.

තිට්ඨතේවායං පොට්ඨපාද අරූපී අත්තා සඤ්ඤමයෝ. අථ ඉමස්ස පුරිසස්ස අඤ්ඤ'ව සඤ්ඤා උප්පජ්ජන්ති, අඤ්ඤ'ව සඤ්ඤා නිරුජ්ඣන්ති. ඉමිනාපි ඛෝ ඒතං පොට්ඨපාද පරියායේන වේදිතබ්බං යථා අඤ්ඤ'ව සඤ්ඤා භවිස්සති, අඤ්ඤේ අත්තා'ති.

පින්වත් පොට්ඨපාද අරූපී වූ සඤ්ඤමය ශරීරය නම් වූ ආත්මය පසෙක තිබේවා. එසේ නමුත් පුරුෂයාට අන්‍ය වූ ම සඤ්ඤාවන් උපදිනවා. අන්‍ය වූම සඤ්ඤාව නිරුද්ධ වෙනවා. පින්වත් පොට්ඨපාද, එය මේ විදිහට තේරුම්ගත යුතු ය. "යම් අයුරකින් සඤ්ඤාව වෙනත් දෙයක් නම් ආත්මය තවත් දෙයක්" කියල.

"සක්කා පනේතං භන්තේ මයා ඤාතුං සඤ්ඤා පුරිසස්ස අත්තා'ති වා, අඤ්ඤා සඤ්ඤා, අඤ්ඤේ අත්තා'ති?"

"එහෙම නම් ස්වාමීනී, සඤ්ඤාව කියන්නේ පුරුෂයා ගේ ආත්මය ද? නැත්නම් සඤ්ඤාව වෙනත් දෙයක් ද? ආත්මය වෙනත් දෙයක් ද? යන කරුණ මට අවබෝධ කරන්ට පුළුවන් වේවි ද?"

"දුජ්ජානං ඛෝ ඒතං පොට්ඨපාද තයා අඤ්ඤදිට්ඨිකේන අඤ්ඤඛන්තිකේන අඤ්ඤරුචිකේන අඤ්ඤත්‍රායෝගේන අඤ්ඤත්‍රාචරියකේන සඤ්ඤා පුරිසස්ස අත්තා'තිවා, අඤ්ඤා සඤ්ඤා, අඤ්ඤේ අත්තා'ති වා"ති.

"පින්වත් පොට්ඨපාද, සඤ්ඤාව කියන්නේ පුරුෂයා ගේ ආත්මය ද? නැත්නම් සඤ්ඤාව වෙනත් දෙයක් ද? ආත්මය වෙනත් දෙයක් ද? යන කරුණ අන්‍ය දෘෂ්ටික වූ, අන්‍ය ලබ්ධික වූ, අන්‍ය මතයක් රුචි කරන, අන්‍ය ප්‍රතිපත්තියක සිටින, අන්‍ය වූ ආචාර්යවරයෙකු වන ඔබට අවබෝධ කිරීම දුෂ්කර දෙයක්."

"සචේ නං භන්තේ මයා දුජ්ජානං අඤ්ඤදිට්ඨිකේන අඤ්ඤඛන්තිකේන අඤ්ඤරුචිකේන අඤ්ඤත්‍රායෝගේන අඤ්ඤත්‍රාචරියකේන සඤ්ඤා පුරිසස්ස

අත්තා'තිවා, අඤ්ඤ සඤ්ඤ, අඤ්ඤේ අත්තා'ති වා"ති. කිං පන භන්තේ සස්සතෝ ලෝකෝ ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති?"

"ස්වාමීනී, අන්‍ය දෘෂ්ටික වූ, අන්‍ය ලබ්ධික වූ, අන්‍ය මතයක් රුචි කරන, අන්‍ය ප්‍රතිපත්තියක සිටින, අන්‍ය වූ ආචාර්යවරයෙකු වන මට සඤ්ඤව කියන්නේ පුරුෂයා ගේ ආත්මය ද? නැත්නම් සඤ්ඤව වෙනත් දෙයක් ද? ආත්මය වෙනත් දෙයක් ද? යන කරුණ අවබෝධ කිරීම දුෂ්කර දෙයක් නම් ස්වාමීනී, එහෙම නම් මේ ලෝකය සදාකාලික යි යන මේ කාරණ නේද සතය්‍ය? අනෙක් මතවාද හිස් නේද?"

"අබ්‍යාකතං ඛෝ ඒතං පොට්ඨපාද මයා: සස්සතෝ ලෝකෝ ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති."

"පින්වත් පොට්ඨපාද, ලෝකය සදාකාලික යි යන මෙය තමයි ඇත්ත, අනෙක් මතවාද හිස් කියන කරුණ මා විසින් ප්‍රකාශ නො කළ දෙයක්."

"කිං පන භන්තේ අසස්සතෝ ලෝකෝ ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති?"

"එහෙම නම් ස්වාමීනී, ලෝකය සදාකාලික නැත යන මේ කාරණ නේද සතය්‍ය? අනෙක් මතවාද හිස් නේද?"

"ඒතම්පි ඛෝ පොට්ඨපාද මයා අබ්‍යාකතං අසස්සාතෝ ලෝකෝ. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති."

"පින්වත් පොට්ඨපාද, ලෝකය සදාකාලික නැත යන මෙය තමයි ඇත්ත, අනෙක් මතවාද හිස් කියන කරුණත් මා විසින් ප්‍රකාශ නො කළ දෙයක්."

"කිං පන භන්තේ අන්තවා ලෝකෝ. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති?"

"එහෙම නම් ස්වාමීනී, ලෝකය අන්තවත්ය යන මේ කාරණ නේද සතය්‍ය? අනෙක් මතවාද හිස් නේද?"

"ඒතම්පි ඛෝ පොට්ඨපාද මයා අබ්‍යාකතං අන්තවා ලෝකෝ. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති."

"පින්වත් පොට්ඨපාද, ලෝකය අන්තවත් ය යන මෙය තමයි ඇත්ත, අනෙක් මතවාද හිස් කියන කරුණත් මා විසින් ප්‍රකාශ නොකළ දෙයක්."

"කිං පන භන්තේ අනන්තවා ලෝකෝ. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති?"

"එහෙම නම් ස්වාමීනී, ලෝකය අනන්තවත්ය යන මේ කාරණ නේද සතය්‍ය? අනෙක් මතවාද හිස් නේද?"

"එතම්පි ඛෝ පොට්ඨපාද මයා අබ්‍යාකතං අනන්තවා ලෝකෝ ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති."

"පින්වත් පොට්ඨපාද, ලෝකය අනන්තවත් ය යන මෙය තමයි ඇත්ත, අනෙක් මතවාද හිස් කියන කරුණත් මා විසින් ප්‍රකාශ නොකළ දෙයක්."

"කිං පන භන්තේ තං ජීවං තං සරීරං. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති?"

"එහෙම නම් ස්වාමීනී, "ජීවයත් එයම යි, ශරීරයත් එය ම යි" යන මේ කාරණ නේද සතය්‍ය? අනෙක් මතවාද හිස් නේද?"

"එතම්පි ඛෝ පොට්ඨපාද මයා අබ්‍යාකතං තං ජීවං තං සරීරං. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති."

පින්වත් පොට්ඨපාද, "ජීවයත් එයම යි, ශරීරයත් එය ම යි" යන මෙය තමයි ඇත්ත, අනෙක් මතවාද හිස් කියන කරුණත් මා විසින් ප්‍රකාශ නොකළ දෙයක්."

"කිං පන භන්තේ අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති?"

"එහෙම නම් ස්වාමීනී, "ජීවය අනෙකකි. ශරීරයත් තවත් දෙයකි" යන මේ කාරණ නේද සතය්‍ය? අනෙක් මතවාද හිස් නේද?"

"එතම්පි ඛෝ පොට්ඨපාද මයා අබ්‍යාකතං අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති."

පින්වත් පොට්ඨපාද, "ජීවය අනෙකකි. ශරීරයත් තවත් දෙයකි" යන මෙය තමයි ඇත්ත, අනෙක් මතවාද හිස් කියන කරුණත් මා විසින් ප්‍රකාශ නොකළ දෙයක්."

"කිං පන භන්තේ හෝති තථාගතෝ පරම්මරණා. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති?"

"එහෙම නම් ස්වාමීනී, "තථාගතයන් වහන්සේ මරණින් මතු සිටිති" යන මේ කාරණ නේද සතය්‍ය? අනෙක් මතවාද හිස් නේද?"

"එතම්පි ඛෝ පොට්ඨපාද මයා අබ්‍යාකතං හෝති තථාගතෝ පරම්මරණා. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති."

පින්වත් පොට්ඨපාද, "තථාගතයන් වහන්සේ මරණින් මතු සිටිති" යන මෙය තමයි ඇත්ත, අනෙක් මතවාද හිස් කියන කරුණත් මා විසින් ප්‍රකාශ නොකළ දෙයක්."

"කිං පන භන්තේ න හෝති තථාගතෝ පරම්මරණා. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති?"

"එහෙම නම් ස්වාමීනී, "තථාගතයන් වහන්සේ මරණින් මතු නොසිටිති" යන මේ කාරණ නේද සතය්‍ය? අනෙක් මතවාද හිස් නේද?"

"එතම්පි ඛෝ පොට්ඨපාද මයා අබ්‍යාකතං න හෝති තථාගතෝ පරම්මරණා. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති."

පින්වත් පොට්ඨපාද, "තථාගතයන් වහන්සේ මරණින් මතු නොසිටිති" යන මෙය තමයි ඇත්ත, අනෙක් මතවාද හිස් කියන කරුණත් මා විසින් ප්‍රකාශ නොකළ දෙයක්."

"කිං පන භන්තේ හෝති ච න ච හෝති තථාගතෝ පරම්මරණා. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති?"

"එහෙම නම් ස්වාමීනී, "තථාගතයන් වහන්සේ මරණින් මතු සිටිනවමෙන් ම, නොසිටිනවා ය" යන මේ කාරණ නේද සතය්‍ය? අනෙක් මතවාද හිස් නේද?"

"ඒතම්පි ඛෝ පොට්ඨපාද මයා අබ්‍යාකතං හෝති ච න ච හෝති තථාගතෝ පරම්මරණා. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති."

පින්වත් පොට්ඨපාද, "තථාගතයන් වහන්සේ මරණින් මතු සිටිනව මෙන් ම, නො සිටිනවා ය" යන මෙය තමයි ඇත්ත, අනෙක් මතවාද හිස් කියන කරුණත් මා විසින් ප්‍රකාශ නො කළ දෙයක්."

"කිං පන භන්තේ නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති?"

"එහෙම නම් ස්වාමීනී, "තථාගතයන් වහන්සේ මරණින් මතු ඇත්තේත් නැත, නැත්තේත් නැත" යන මේ කාරණ නේද සතය්‍ය? අනෙක් මතවාද හිස් නේද?"

"ඒතම්පි ඛෝ පොට්ඨපාද මයා අබ්‍යාකතං නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා. ඉදමේව සච්චං මෝඝමඤ්ඤන්ති."

පින්වත් පොට්ඨපාද, "තථාගතයන් වහන්සේ මරණින් මතු ඇත්තේත් නැත, නැත්තේත් නැත" යන මෙය තමයි ඇත්ත, අනෙක් මතවාද හිස් කියන කරුණත් මා විසින් ප්‍රකාශ නො කළ දෙයක්."

කස්මා පනේතං භන්තේ භගවතා අබ්‍යාකතන්ති?

ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ නො විසඳන ලද්දේ කවර හේතුවක් නිසා ද?

න හේතං පොට්ඨපාද අත්ථසංහිතං න ධම්මසංහිතං නාදිබ්‍රහ්මචරියකං න නිබ්බිදාය න විරාගාය න නිරෝධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බෝධාය න නිබ්බානාය සංවත්තති. තස්මා තං මයා අබ්‍යාකතන්ති.

පින්වත් පොට්ඨපාද, ඔය දෙය අර්ථවත් දෙයක් නොවෙයි. ධර්මානුකූල දෙයකුත් නොවෙයි. නිවන් මගට මුල්වන දෙයකුත් නොවෙයි. අවබෝධයෙන් කළකිරෙන දෙයකුත් නොවෙයි. විරාගය පිණිස පවතින දෙයකුත් නොවෙයි. තණ්හාව නිරුද්ධවීම පිණිස පවතින දෙයකුත් නොවෙයි. සංසිඳීම පිණිස පවතින දෙයකුත් නොවෙයි. විශේෂ ඥාණ පිණිස පවතින දෙයකුත් නොවෙයි.

සත්‍යාවබෝධය පිණිස පවතින දෙයකුත් නොවෙයි. නිවන පිණිස පවතින දෙයකුත් නොවෙයි. ඒ නිසයි ඔය දෙයට මා පිළිතුරු නො දෙන්නේ.

"ඉදං දුක්ඛන්ති ඛෝ පොට්ඨපාද මයා බ්‍යාකතං. අයං දුක්ඛසමුදයෝති ඛෝ පොට්ඨපාද මයා බ්‍යාකතං. අයං දුක්ඛනිරෝධෝති ඛෝ පොට්ඨපාද මයා බ්‍යාකතං. අයං දුක්ඛනිරෝධගාමිනීපටිපදාති ඛෝ පොට්ඨපාද මයා බ්‍යාකතන්ති."

"පින්වත් පොට්ඨපාද, මෙය තමයි දුක කියල මා පැහැදිළි කරල තියෙනවා. පින්වත් පොට්ඨපාද, මෙය තමයි දුකේ හට ගැනීම කියල මා පැහැදිළි කරල තියෙනවා. පින්වත් පොට්ඨපාද, මෙය තමයි දුක නිරුද්ධ වීම කියල මා පැහැදිළි කරල තියෙනවා. පින්වත් පොට්ඨපාද, මෙය තමයි දුක නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල මා පැහැදිළි කරල තියෙනවා."

"කස්මා පනේතං භන්තේ භගවතා බ්‍යාකතන්ති?"

"ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ විසින් ඔය කාරණය පැහැදිළි කොට වදාළේ කවර කරුණක් නිසාද?"

"ඒතං හි ඛෝ පොට්ඨපාද අත්ථසංහිතං ඒතං ධම්මසංහිතං ආදිබ්‍රහ්මචරියකං ඒතං නිබ්බිදාය විරාගාය නිරෝධාය උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති. තස්මා තං මයා බ්‍යාකතන්ති."

"පින්වත් පොට්ඨපාද, ඔය කරුණ අර්ථවත් දෙයක්. ධර්මානුකූල දෙයක්. නිවන් මගට මුල්වන දෙයක්. අවබෝධයෙන් කළකිරෙන දෙයක්. විරාගය පිණිස පවතින දෙයක්. තණ්හාව නිරුද්ධවීම පිණිස පවතින දෙයක්. සංසිඳීම පිණිස පවතින දෙයක්. විශේෂ නුවණ පිණිස පවතින දෙයක්. සත්‍යාවබෝධය පිණිස පවතින දෙයක්. නිවන පිණිස පවතින දෙයක්. ඒ නිසයි ඔය දෙය මා පැහැදිළි කරන්නේ."

"එවමේතං භගවා, එවමේතං සුගත, යස්සදානි භන්තේ භගවා කාලං මඤ්ඤති"ති. අථ ඛෝ භගවා උට්ඨායාසනා පක්කාමි.

"භාග්‍යවතුන් වහන්ස, එය එසේ ම යි. සුගතයන් වහන්ස, එය එසේ ම යි. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ යම් පිණ්ඩපාත ගමනට කල් එළඹිවග

හඟිනා සේක්නම් දැන් එයට කාලය යි." ඉතින් භාග්‍යවතුන් වහන්සේ අසුනෙන් නැගිට සැවැත් නුවර දෙසට නික්ම වදාළා.

43. අථ ඛෝ තේ පරිබ්බාජකා අචිරපක්කන්තස්ස භගවතෝ පොට්ඨපාදං පරිබ්බාජකං සමන්තතෝ වාචාසත්තිතෝදකේන සඤ්ජම්භරිං අකංසු: "එවමේව පනායං භවං පොට්ඨපාදෝ යඤ්ඤදේව සමණෝ ගෝතමෝ භාසති තං තදේවස්ස අබ්භනුමෝදති. "එවමේතං භගවා, එවමේතං සුගතා"ති. න ඛෝ පන මයං කිඤ්චි සමණස්ස ගෝතමස්ස ඒකංසිකං, ධම්මං දේසිතං ආජානාම: සස්සතෝ ලෝකෝ'ති වා, අසස්සතෝ ලෝකෝ'ති වා, අන්තවා ලෝකෝ'ති වා, අනන්තවා ලෝකෝ'ති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හෝති තථාගතෝ පරම්මරණා'ති වා, න හෝති තථාගතෝ පරම්මරණා'ති වා, හෝති ච න ච හෝති තථාගතෝ පරම්මරණා'ති වා, නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා'ති වා"ති.

43. භාග්‍යවතුන් වහන්සේ වැඩම කොට නොබෝ වේලාවකින් ඒ පිරිවැජියන් පොට්ඨපාද පිරිවැජියාව වට කරගෙන නපුරු වචන නැමැති ආයුධවලින් පහර දුන්නා. "ශ්‍රමණ ගෞතමයා, කියන්නේ මොකක් ද? ඒ කියන කියන එක "භාග්‍යවතුන් වහන්ස, එය එසේ මයි. සුගතයන් වහන්ස, එය එසේ මයි" කියල මෙයා අනුමෝදන් වුණා. ඒ වුණාට අපි නම් "ලෝකය ශාස්වතයි කියන කරුණ හෝ, ලෝකය අශාස්වතයි කියන කරුණ හෝ, ලෝකය අන්තවත්ය කියන කරුණ හෝ, ලෝකය අනන්තවත්ය කියන කරුණ හෝ, ජීවයත් ඒක මයි ශරීරයත් ඒකම යි කියන කරුණ හෝ, ජීවය තව එකක් ශරීරය වෙනත් එකක් කියන කරුණ හෝ, තථාගතයන් වහන්සේ මරණින් මතු සිටිනවා කියන කරුණ හෝ, තථාගතයන් වහන්සේ මරණින් මතු නැත කියන කරුණ හෝ, තථාගතයන් වහන්සේ මරණින් මතු සිටිනවා මෙන් ම නැත කියන කරුණ හෝ, තථාගතයන් වහන්සේ මරණින් මතු ඇත්තේත් නැත නැත්තේත් නැත කියන කරුණ හෝ" අරභයා ඔය ශ්‍රමණ ගෞතමයා එක දෙයක් ඉලක්ක කොට දෙසූ ධර්මයක් ගැන දන්නේ නෑ.

44. ඒවං වුත්තේ පොට්ඨපාදෝ පරිබ්බාජකෝ තේ පරිබ්බාජකේ ඒතදවෝච: "අහම්පි ඛෝ භෝ න කිඤ්චි සමණස්ස ගෝතමස්ස ඒකංසිකං ධම්මං දේසිතං ආජානාමි: සස්සතෝ ලෝකෝ'ති වා, අසස්සතෝ ලෝකෝ'ති වා ..... නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා'ති වා". අපි ච සමණෝ ගෝතමෝ භූතං තච්ඡං තථං පටිපදං පඤ්ඤපේති ධම්මට්ඨිතං

ධම්මනියාමකං. භූතං ඛෝ පන තච්ඡං තථං පටිපදං පඤ්ඤපෙන්තස්ස ධම්මට්ඨිතං ධම්මනියාමකං. කථං හි නාම මාදිසෝ විඤ්ඤූ සමණස්ස ගෝතමස්ස සුභාසිතං සුභාසිතතෝ නාබ්භනුමෝදෙය්‍යා?ති.

44. මෙසේ කී විට පොට්ඨපාද පිරිවැජියා ඒ පිරිවැජියන්ට මෙහෙම කිව්වා "භවත්නි, මම වුණත් "ලෝකය ශාස්වතයි කියන කරුණ හෝ, ලෝකය අශාස්වතයි කියන කරුණ හෝ ..... තථාගතයන් වහන්සේ මරණින් මතු ඇත්තේත් නැත නැත්තේත් නැත කියන කරුණ හෝ" අරභයා ඔය ශ්‍රමණ ගෞතමයන් වහන්සේ එක දෙයක් ඉලක්ක කොට දෙසූ ධර්මයක් ගැන දන්නේ නෑ තමයි. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තිබෙන්නා වූම ඇත්ත පෙනී පෙනී එබඳු වූම ප්‍රතිපදාවක් ධර්මය පිහිටවන පරිදි, ධර්මය උපදවන පරිදි හරි ලස්සනට පහදල දෙද්දී මං වගේ නුවණැති මනුෂ්‍යයෙක් ඒ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ සුභාෂිතය සුභාෂිතයක් වශයෙන් ම අනුමෝදන් නොවී ඉන්නේ කොහොම ද?

45. අථ ඛෝ ද්වීහතීහස්ස අච්චයේන චිත්තෝ ච හත්ථිසාරිපුත්තෝ පොට්ඨපාදෝ ච පරිබ්බාජකෝ යේන භගවා තේනුපසංකමිංසු. උපසංකමිත්වා චිත්තෝ හත්ථිසාරිපුත්තෝ භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදි. පොට්ඨපාදෝ පන පරිබ්බාජකෝ භගවතා සද්ධිං සම්මෝදි සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නෝ ඛෝ පොට්ඨපාදෝ පරිබ්බාජකෝ භගවන්තං ඒතදවෝච: තදා මං භන්තේ තේ පරිබ්බාජකා අචිරපක්කන්තස්ස භගවතෝ සමන්තතෝ වචාසත්ති තෝදකේන සඤ්ජම්භරිං අකංසු. ඒවමේව පනායං භවං පොට්ඨපාදෝ යඤ්ඤදේව සමණෝ ගෝතමෝ භාසති තං තදේවස්ස අබ්භනුමෝදති. "ඒවමේතං භගවා, ඒවමේතං සුගතා"ති. න ඛෝ පන මයං කිඤ්චි සමණස්ස ගෝතමස්ස ඒකංසිකං, ධම්මං දේසිතං ආජානාම: සස්සතෝ ලෝකෝ'ති වා, අසස්සතෝ ලෝකෝ'ති වා, අන්තවා ලෝකෝ'ති වා, අනන්තවා ලෝකෝ'ති වා, තං ජීවං තං සරීරන්ති වා, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා, හෝති තථාගතෝ පරම්මරණා'ති වා, න හෝති තථාගතෝ පරම්මරණා'ති වා, හෝති ච න ච හෝති තථාගතෝ පරම්මරණා'ති වා, නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා'ති වා"ති.

45. ඊට දෙතුන් දිනකට පස්සේ හත්ථිසාරිපුත්ත චිත්‍ර නැමැති කෙනාත් පොට්ඨපාද පිරිවැජියාත් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණුනා. පැමිණිලා හත්ථිසාරිපුත්ත චිත්‍ර භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කොට

එකත්වස්ව වාඩි වුණා. පොට්ඨපාද පිරිවැජියා භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වුණා. සතුටු විය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව වාඩි වුණා. එකත්පස්ව වාඩිවුණ පොට්ඨපාද පිරිවැජියා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පැවසුවා. එදා ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ වැඩම කොට නොබෝ වේලාවකින් ඒ පිරිවැජියන් මාව වට කරගෙන නපුරු වචන නැමැති අවි ආයුධවලින් මට අනින්න පටන් ගත්තා නෙව. "ශ්‍රමණ ගෞතමයා, කියන්නේ මොකක් ද? ඒ කියන කියන එක "භාග්‍යවතුන් වහන්ස, එය එසේ මයි. සුගතයන් වහන්ස, එය එසේ මයි" කියල මෙයා අනුමෝදන් වුණා. ඒ වුණාට අපි නම් "ලෝකය ශාස්වත යි කියන කරුණ හෝ, ලෝකය අශාස්වත යි කියන කරුණ හෝ, ලෝකය අන්තවත්ය කියන කරුණ හෝ, ලෝකය අනන්තවත්ය කියන කරුණ හෝ, ජීවයත් ඒක මයි ශරීරයත් ඒකම යි කියන කරුණ හෝ, ජීවය තව එකක් ශරීරය වෙනත් එකක් කියන කරුණ හෝ, තථාගතයන් වහන්සේ මරණින් මතු සිටිනවා කියන කරුණ හෝ, තථාගතයන් වහන්සේ මරණින් මතු නැත කියන කරුණ හෝ, තථාගතයන් වහන්සේ මරණින් මතු සිටිනවා මෙන් ම නැත කියන කරුණ හෝ, තථාගතයන් වහන්සේ මරණින් මතු ඇත්තේත් නැත නැත්තේත් නැත කියන කරුණ හෝ" අරභයා ඔය ශ්‍රමණ ගෞතමයා එක දෙයක් ඉලක්ක කොට දෙසූ ධර්මයක් ගැන දන්නේ නෑ" කියල.

46. ඒවං වුත්තෝ'හං භන්තේ තේ පරිබ්බාජකේ ඒතදවෝචං: "අහම්පි ඛෝ හෝ න කිඤ්චි සමණස්ස ගෝතමස්ස ඒකංසිකං ධම්මං දේසිතං ආජානාමි: සස්සතෝ ලෝකෝති වා, අසස්සතෝ ලෝකෝති වා ..... නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණාති වා". අපි ච සමණෝ ගෝතමෝ භූතං තච්ඡං තථං පටිපදං පඤ්ඤපේති ධම්මට්ඨිතං ධම්මනියාමකං. භූතං ඛෝ පන තච්ඡං තථං පටිපදං පඤ්ඤපෙන්තස්ස ධම්මට්ඨිතං ධම්මනියාමකං. කථං හි නාම මාදිසෝ විඤ්ඤූ සමණස්ස ගෝතමස්ස සුභාසිතං සුභාසිතතෝ නාබ්භනුමෝදෙය්‍යා?ති.

46. ස්වාමීනී, එහෙම කිව්වහම ඒ පිරිවැජියන්ට මං මෙහෙම කිව්ව. "භවත්නි, මම වුණත් "ලෝකය ශාස්වතයි කියන කරුණ හෝ, ලෝකය අශාස්වතයි කියන කරුණ හෝ ..... තථාගතයන් වහන්සේ මරණින් මතු ඇත්තේත් නැත නැත්තේත් නැත කියන කරුණ හෝ" අරභයා ඔය ශ්‍රමණ ගෞතමයන් වහන්සේ එක දෙයක් ඉලක්ක කොට දෙසූ ධර්මයක් ගැන දන්නේ නෑ තමයි. නමුත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ තිබෙන්නා වූම

ඇත්ත පෙනි පෙනී එබඳු වූම ප්‍රතිපදාවක් ධර්මය පිහිටවන පරිදි, ධර්මය උපදවන පරිදි හරි ලස්සනට පහදල දෙද්දී මං වගේ නුවණැති මනුෂ්‍යයෙක් ඒ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ සුභාෂිතය සුභාෂිතයක් වශයෙන් ම අනුමෝදන් නොවී ඉන්නේ කොහොම ද?" කියලා.

සබ්බේව ඛෝ එතේ පොට්ඨපාද පරිබ්බාජකා අන්ධා අචක්ඛුකා. න්වං යේව නේසං එකෝ චක්ඛුමා. ඒකංසිකංපි හි ඛෝ පොට්ඨපාද මයා ධම්මා දේසිතා පඤ්ඤත්තා. අනේකංසිකාපි හි ඛෝ පොට්ඨපාද මයා ධම්මා දේසිතා පඤ්ඤත්තා.

පින්වත් පොට්ඨපාද, ඔය ඔක්කෝම පිරිවැජියන් අන්ධ යි. ඔවුන්ට නුවණැස නෑ. ඔවුන් අතරේ ඇස් ඇති එකම කෙනා ඔබ විතරයි. පින්වත් පොට්ඨපාද, මා එක ම දෙයක් අරමුණු කර ගෙනත් ධර්මය දේශනා කරල තියෙනවා. පණවලා තියෙනවා. පින්වත් පොට්ඨපාද, මා අනේක අරමුණු මතත් ධර්මය දේශනා කරල තියෙනවා. පණවලා තියෙනවා.

47. කතමේ ච තේ පොට්ඨපාද මයා අනේකංසිකා ධම්මා දේසිතා පඤ්ඤත්තා? සස්සතෝ ලෝකෝ'ති වා ඛෝ පොට්ඨපාද මයා අනේකංසිකෝ ධම්මෝ දේසිතෝ පඤ්ඤත්තෝ. අසස්සතෝ ලෝකෝ'ති වා ඛෝ පොට්ඨපාද මයා අනේකංසිකෝ ධම්මෝ දේසිතෝ පඤ්ඤත්තෝ. අන්තවා ලෝකෝ'ති වා ඛෝ පොට්ඨපාද ..... අනන්තවා ලෝකෝ'ති වා ඛෝ පොට්ඨපාද ..... තං ජීවං තං සරීරන්ති වා ඛෝ පොට්ඨපාද ..... අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා ඛෝ පොට්ඨපාද ..... හෝති තථාගතෝ පරම්මරණා'ති වා ඛෝ පොට්ඨපාද ..... න හෝති තථාගතෝ පරම්මරණා'ති වා ඛෝ පොට්ඨපාද ..... හෝති ච න ච හෝති තථාගතෝ පරම්මරණා'ති වා ඛෝ පොට්ඨපාද ..... නේව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා'ති වා ඛෝ පොට්ඨපාද මයා අනේකංසිකෝ ධම්මෝ දේසිතෝ පඤ්ඤත්තෝ.

47. පින්වත් පොට්ඨපාද, අනේක අරමුණු ඇතිව මා දේශනා කොට තියෙන්නේ කවර ධර්මයක් ද? පින්වත් පොට්ඨපාද, ලෝකය ශාස්වතය යන කරුණ ගැන වේවා මා අනේක අරමුණු ඇතිව දහම් දෙසා තියෙනවා. පණවලා තියෙනවා. පින්වත් පොට්ඨපාද, ලෝකය අශාස්වතය යන කරුණ ගැන වේවා මා අනේක අරමුණු ඇතිව දහම් දෙසා තියෙනවා. පණවලා තියෙනවා. පින්වත්

පොට්ඨපාද, ලෝකය අන්තවත් ය ..... පින්වත් පොට්ඨපාද, ලෝකය අනන්තවත් ය ..... පින්වත් පොට්ඨපාද, එයම යි ජීවය එයමයි ශරීරය ..... පින්වත් පොට්ඨපාද, ජීවය අනෙකකි ශරීරය තව දෙයකි ..... පින්වත් පොට්ඨපාද, තථාගතයන් වහන්සේ මරණින් මතු සිටිනවා ..... පින්වත් පොට්ඨපාද, තථාගතයන් වහන්සේ මරණින් මතු නැත ..... පින්වත් පොට්ඨපාද, තථාගතයන් වහන්සේ මරණින් මතු සිටිනවා මෙන් ම නැත ..... පින්වත් පොට්ඨපාද, තථාගතයන් වහන්සේ මරණින් මතු ඇත්තේත් නැත නැත්තේත් නැත යන කරුණ ගැන වේවා මා අනේක අරමුණු ඇතිව දහම් දෙසා තියෙනවා. පණවලා තියෙනවා.

කස්මා ච තේ පොට්ඨපාද මයා අනේකංසිකා ධම්මා දේසිතා පඤ්ඤත්තා? න හේතේ පොට්ඨපාද අත්ථසංහිතා න ධම්මසංහිතා නාදිබ්‍රහ්මචරියකා න නිබ්බිදාය න විරාගාය න නිරෝධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බෝධාය න නිබ්බානාය සංවත්තන්ති. තස්මා තේ මයා අනේකංසිකා ධම්මා දේසිතා පඤ්ඤත්තා.

පින්වත් පොට්ඨපාද, මා විවිධ කරුණු ඔස්සේ දහම් දෙසා තිබෙන්නේ, පණවා තිබෙන්නේත් මක් නිසා ද? පින්වත් පොට්ඨපාද, ඔය කියන ලද දෘෂ්ටීන්වල කිසි අර්ථයක් නෑ. ධර්මානුකූලභවක් නෑ. නිවනට මුල් වන්නේ නෑ. අවබෝධයෙන් කළකිරෙන්නේ නෑ. විරාගය පිණිස පවතින්නේ නෑ. නිරෝධය පිණිස පවතින්නේ නෑ. සංසිඳීම පිණිස පවතින්නේ නෑ. විශේෂ ඤාණය පිණිස පවතින්නේ නෑ. ආර්ය සත්‍යාවබෝධය පිණිස පවතින්නේ නෑ. නිවන පිණිස පවතින්නේ නෑ. ඒ නිසරුකම පහදා දීම පිණිස යි මා විවිධ කරුණු ඔස්සේ දහම් දෙසා තියෙන්නේ. පණවලා තියෙන්නේ.

48. කතමේ ච තේ පොට්ඨපාද මයා ඒකංසිකා ධම්මා දේසිතා පඤ්ඤත්තා? "ඉදං දුක්ඛන්ති ඛෝ පොට්ඨපාද මයා ඒකංසිකෝ ධම්මෝ දේසිතෝ පඤ්ඤත්තෝ. අයං දුක්ඛසමුදයෝති ඛෝ පොට්ඨපාද මයා ඒකංසිකෝ ධම්මෝ දේසිතෝ පඤ්ඤත්තෝ. අයං දුක්ඛනිරෝධෝති ඛෝ පොට්ඨපාද මයා ඒකංසිකෝ ධම්මෝ දේසිතෝ පඤ්ඤත්තෝ. අයං දුක්ඛනිරෝධගාමිනීපටිපදාති ඛෝ පොට්ඨපාද මයා ඒකංසිකෝ ධම්මෝ දේසිතෝ පඤ්ඤත්තෝ.

48. පින්වත් පොට්ඨපාද, මා විසින් එකම අරමුණක් මත දේශනා කොට තියෙන පණවා තියෙන ධර්මය කුමක් ද? "පින්වත් පොට්ඨපාද, මා විසින්

එකම අරමුණක් මත දේශනා කොට තියෙන්නේ පණවා තියෙන්නේ මෙය දුකකි යන ධර්මය යි. පින්වත් පොට්ඨපාද, මා විසින් එකම අරමුණක් මත දේශනා කොට තියෙන්නේ පණවා තියෙන්නේ මෙය දුකේ හට ගැනීමයි යන ධර්මය යි. පින්වත් පොට්ඨපාද, මා විසින් එකම අරමුණක් මත දේශනා කොට තියෙන්නේ පණවා තියෙන්නේ මෙය දුක නිරුද්ධ වීමයි යන ධර්මය යි. පින්වත් පොට්ඨපාද, මා විසින් එකම අරමුණක් මත දේශනා කොට තියෙන්නේ පණවා තියෙන්නේ මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව යි යන ධර්මය යි."

කස්මා ච තේ පොට්ඨපාද මයා ඒකංසිකා ධම්මා දේසිතා පඤ්ඤත්තා? ඒතේ පොට්ඨපාද අත්ථසංහිතා ඒතේ ධම්මසංහිතා ඒතේ ආදිබ්‍රහ්මචරියකා නිබ්බිදාය විරාගාය නිරෝධාය උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තන්ති. තස්මා තේ මයා ඒකංසිකා ධම්මා දේසිතා පඤ්ඤත්තා.

පින්වත් පොට්ඨපාද, මා එකම කරුණක් ඔස්සේ දහම් දෙසා තිබෙන්නේ, පණවා තිබෙන්නේත් මක් නිසා ද? පින්වත් පොට්ඨපාද, ඔය කියන ලද චතුරාර්ය සත්‍ය ධර්මය අර්ථ සහිත යි. ධර්මානුකූල යි. නිවනට මුල් වෙනවා. අවබෝධයෙන් කළකිරෙනවා. විරාගය පිණිස පවතිනවා. නිරෝධය පිණිස පවතිනවා. සංසිඳීම පිණිස පවතිනවා. විශේෂ ඤාණය පිණිස පවතිනවා. ආර්ය සත්‍යාවබෝධය පිණිස පවතිනවා. නිවන පිණිස පවතිනවා. ඒ වටිනාකම පහදා දීම පිණිස යි මා එකම කරුණක් ඔස්සේ දහම් දෙසා තියෙන්නේ. පණවලා තියෙන්නේ.

49. සන්ති ඛෝ පොට්ඨපාද ඒකේ සමණබ්‍රාහ්මණා ඒවංවාදිනෝ ඒවංදිට්ඨිනෝ: ඒකන්තසුඛී අත්තා හෝති. අරෝගෝ පරම්මරණාති. තඤාහං උපසංකමිත්වා ඒවං වදාමි: "සච්චං කිර තුම්හේ ආයස්මන්තෝ ඒවං වාදිනෝ ඒවංදිට්ඨිනෝ ඒකන්තසුඛී අත්තා හෝති, අරෝගෝ පරම්මරණාති?" තේ චේ මේ ඒවං පුට්ඨා "ආමා"ති පටිජානන්ති, තඤාහං ඒවං වදාමි: "අපි පන තුම්හේ ආයසමන්තෝ ඒකන්තසුඛං ලෝකං ජානං පස්සං විහරථාති." ඉති පුට්ඨා "නෝ"ති වදන්ති. තඤාහං ඒවං වදාමි "අපි ච පන තුම්හේ ආයස්මන්තෝ ඒකං වා රත්තිං ඒකං වා දිවසං උපඩ්ඪං වා රත්තිං උපඩ්ඪං වා දිවසං ඒකන්තසුඛිං අත්තානං සම්පජානාථා?ති." ඉති පුට්ඨා "නෝ"ති වදන්ති, තඤාහං ඒවං වදාමි "අපි පන තුම්හේ ආයස්මන්තෝ ජානාථ: අයං මග්ගෝ අයං පටිපදා ඒකන්තසුඛස්ස ලෝකස්ස සච්ඡිකිරියායා?ති." ඉති පුට්ඨා

"නෝ"ති වදන්ති. තඤාහං එවං වදාමි. "අපි පන තුම්හේ ආයස්මන්තෝ යා තා දේවතා ඒකන්තසුඛං ලෝකං උපපන්නා, තාසං භාසමානානං සද්දං සුණාථ: සුපටිපන්නාත්ථ මාරිස, උජුපටිපන්නාත්ථ මාරිසා ඒකන්තසුඛස්ස ලෝකස්ස සච්ඡිකිරියාය. මයම්පි හි මාරිසා එවම්පටිපන්නා ඒකන්තසුඛං ලෝකං උපපන්නාති?" ඉති පුට්ඨා "නෝ"ති වදන්ති.

49. පින්වත් පොට්ඨපාද, මෙබඳු වාද ඇති, මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඒ කියන්නේ "මරණින් මතු ආරෝග්‍ය වූ ඒකාන්ත සැපවත් වූ ආත්මයක් තියෙනවා" කියල. මං ඔවුන් ළඟට ගිහින් මෙහෙම අහනවා. "හැබෑ ද ආයුෂ්මතුනි, "මරණින් මතු ආරෝග්‍ය වූ ඒකාන්ත සැපවත් වූ ආත්මයක් තියෙනවා" කියන මෙබඳු දෘෂ්ටි ඇති, මෙබඳු වාද ඇති දෙයක් ඔබ කියනවා කියන්නේ?" එතකොට මෙසේ අසන මා හට ඔවුන් "එසේ ය" කියල පිළිතුරු දෙනවා. එතකොට මං මෙහෙම කියනවා. "එහෙම නම් ආයුෂ්මතුනි, ඔබ ඒකාන්ත සැප ඇති ලෝකය මේක යි කියල දැන ගෙන, දැක ගෙන ද වාසය කරන්නේ?" එසේ ඇසූ විට ඔවුන් "නැත" කියල පිළිතුරු දෙනවා. එතකොට මං මෙහෙම කියනවා. "එහෙම නම් ආයුෂ්මතුනි, ඔබ එක රාත්‍රියක් හෝ එක දහවලක් හෝ අඩ රැයක් හෝ අඩ දහවලක් හෝ ඒකාන්ත සැපවත් ව තියෙන ආත්මයක් ගැන දන්නවා ද?" එසේ ඇසූ විටත් ඔවුන් පිළිතුරු දෙන්නේ "නැත" කියල යි. එතකොට මං මෙහෙම කියනවා. "එහෙම නම් ආයුෂ්මතුනි, ඔබ දන්නවා ද ඒකාන්ත සැප ඇති ලෝකය සාක්ෂාත් කිරීම පිණිස පවතින්නේ මේ මාර්ගය යි. මේ ප්‍රතිපදාවයි කියල." එසේ ඇසූවිට ඔවුන් පිළිතුරු දෙන්නෙත් "නැත" කියල ම යි. එතකොට මං මෙහෙම කියනවා. "එහෙම නම් ආයුෂ්මතුනි, ඒකාන්ත සැප ඇති ලොවක උපන්න යම් දේවතාවරු සිටිත් නම්, ඔවුන් කථාබස් කරන හඬවත් ඔබට අසන්ට ලැබුණා ද? "නිදුකාණෙනි, මනා පිළිවෙතෙහි යෙදෙව්. ඒකන්ත සැප ඇති ලොව සාක්ෂාත් කිරීම පිණිස සෘජු පිළිවෙතෙහි යෙදෙව්. අපිත් නිදුකාණෙනි, එබඳු පිළිවෙතෙක යෙදිලයි ඒකාන්ත සැප ඇති ලොවකට ආවේ" කියල. එසේ ඇසූවිටත් ඔවුන් ගේ පිළිතුරු එවන්නක් ඇසුවේ නැති බව යි.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද, "නනු එවං සන්තේ තේසං සමණබ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී?"ති.

පින්වත් පොට්ඨපාද, මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? "එතකොට කරුණු යෙදෙන්නේ ඔය විදිහට නම්, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ගේ කථාවන් කිසි පිළිසරණක් නැති දෙයක් බවට පත් නොවේ ද?"

"අද්ධා ඛෝ භන්තේ ඒවං සන්තේ තේසං සමණබ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී"ති.

"ස්වාමීනී, එතකොට කරුණු යෙදෙන්නේ ඔය විදිහට නිසා, ඒකාන්තයෙන් ම ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ගේ කථාවන් කිසි පිළිසරණක් නැති දෙයක් බවට පත් වෙනවා."

50. "සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසෝ ඒවං වදෙය්‍ය: "අහං යා ඉමස්මිං ජනපදේ ජනපදකල්‍යාණී, තං ඉච්ඡාම, තං කාමේමීති." තමේනං ඒවං වදෙය්‍යුං: "අම්භෝ පුරිස යං ත්වං ජනපදකල්‍යාණිං ඉච්ඡසි කාමේසි, ජානාසි තං ජනපදකල්‍යාණිං ඛත්තියී වා බ්‍රාහ්මණී වා වෙස්සී වා සුද්දී වා?ති." ඉති පුට්ඨෝ "නෝ"ති වදෙය්‍ය, තමේනං ඒවං වදෙය්‍යුං: "අම්භෝ පුරිස යං ත්වං ජනපදකල්‍යාණිං ඉච්ඡසි කාමේසි, ජානාසි තං ජනපදකල්‍යාණිං ඒවන්නාමා ඒවං ගොත්තාති වා, දීඝා වා රස්සා වා මජ්ඣිමා වා, කාළී වා සාමා වා මංගුරච්ඡවී වාති, අමුකස්මිං ගාමේ වා නිගමේ වා නගරේ වාති?" ඉති පුට්ඨෝ "නෝ"ති වදෙය්‍ය, තමේනං ඒවං වදෙය්‍යුං: "අම්භෝ පුරිස යං ත්වං න ජානාසි න පස්සසි, තං ත්වං ඉච්ඡසි කාමේසී?ති." ඉති පුට්ඨෝ "ආමා"ති වදෙය්‍ය.

50. පින්වත් පොට්ඨපාද, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් මෙහෙම කියනවා. "මේ ජනපදයෙහි යම් රූපරාජිනියක් ඉන්නවා නම් මං ඇයව පතනවා. මං ඇයට කැමැති යි" කියල. එතකොට ඔහු ගේ යහළුවන් මෙහෙම අහනවා. "එම්බා පුරුෂය, ඔබ යම් රූපරාජිනියක් පතනවා නම්, කැමැති නම් ඒ රූපරාජිනී ක්ෂත්‍රිය කුමරියක් ද? බ්‍රාහ්මණියක් ද? වෛශ්‍ය කුමරියක් ද? ශූද්‍ර තැනැත්තියක් ද? කියල ඔබ දන්නවා ද?" මෙසේ අසද්දී ඔහු පිළිතුරු දෙන්නේ "දන්නේ නැත" කියල යි. එතකොට ඔහුගෙන් මෙහෙම අහනවා. "එම්බා පුරුෂය, ඔබ යම් රූපරාජිනියක් පතනවා නම්, කැමැති නම් ඒ රූපරාජිනිය ගේ නම මේක යි, ගෝත්‍රනාමය මේකයි කියල දන්නවා ද? ඒ වගේ ම ඇය උස යි. මිටියි. මධ්‍යම ප්‍රමාණයි කියල දන්නවා ද? ඒ වගේ ම ඇය කළු යි, තලෙළු යි, සොඳුරු පැහැයෙන් යුක්ත යි කියල දන්නවා ද? ඒ වගේ ම ඇය ඉන්නේ අසවල් ගමේ, නියම් ගමේ, නගරයේ, කියල දන්නවා ද? ඒ හැම දෙයට ම ඔහු පිළිතුරු දෙන්නේ "දන්නේ නැත" කියල යි. එතකොට ඔහුගෙන් මෙහෙම අහනවා එම්බා පුරුෂය යම් ස්ත්‍රියක් ගැන ඔබ දන්නෙත් නැත්නම්, දැක්කෙත් නැත්නම්, ඒ ස්ත්‍රිය ව ද ඔබ පතන්නේ? කැමැති වන්නේ?" එතකොට ඔහු පිළිතුරු දෙන්නේ "එසේ ය" කියල යි.

"නං කිං මඤ්ඤසි පොට්ඨපාද, නනු ඒවං සන්තේ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී?"ති.

පින්වත් පොට්ඨපාද, මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? "එතකොට කරුණු යෙදෙන්නේ ඔය විදිහට නම්, ඒ පුරුෂයා ගේ කථාව කිසි පිළිසරණක් නැති දෙයක් බවට පත් නොවේ ද?"

"අද්ධා ඛෝ භන්තේ ඒවං සන්තේ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී"ති.

"ස්වාමීනී, එතකොට කරුණු යෙදෙන්නේ ඔය විදිහට නිසා, ඒකාන්තයෙන් ම ඒ පුරුෂයා ගේ කථාව කිසි පිළිසරණක් නැති දෙයක් බවට පත් වෙනවා."

51. **"ඒවමේව ඛෝ පොට්ඨපාද යේ තේ සමණබ්‍රාහ්මණා ඒවංවාදිනෝ ඒවංදිට්ඨිනෝ: ඒකන්තසුඛී අත්තා හෝති අරෝගෝ පරම්මරණාති. තඤාහං උපසංකමිත්වා ඒවං වදාමි: "සච්චං කිර තුම්හේ ආයස්මන්තෝ ඒවං වාදිනෝ ඒවංදිට්ඨිනෝ ඒකන්තසුඛී අත්තා හෝති, අරෝගෝ පරම්මරණාති?" තේ චේ මේ ඒවං පුට්ඨා "ආමා"ති පටිජානන්ති, තඤාහං ඒවං වදාමි: "අපි පන තුම්හේ ආයසමන්තෝ ඒකන්තසුඛං ලෝකං ජානං පස්සං විහරථාති." ඉති පුට්ඨා "නෝ"ති වදන්ති. තඤාහං ඒවං වදාමි "අපි ච පන තුම්හේ ආයස්මන්තෝ ඒකං වා රත්තිං ඒකං වා දිවසං උපඩ්ඪං වා රත්තිං උපඩ්ඪං වා දිවසං ඒකන්තසුඛිං අත්තානං සම්පජානාථා?ති." ඉති පුට්ඨා "නෝ"ති වදන්ති, තඤාහං ඒවං වදාමි "අපි පන තුම්හේ ආයස්මන්තෝ ජානාථ: අයං මග්ගෝ අයං පටිපදා ඒකන්තසුඛස්ස ලෝකස්ස සච්ඡිකිරියායා?ති." ඉති පුට්ඨා "නෝ"ති වදන්ති. තඤාහං ඒවං වදාමි. "අපි පන තුම්හේ ආයස්මන්තෝ යා නා දේවතා ඒකන්තසුඛං ලෝකං උපපන්නා, නාසං භාසමානානං සද්දං සුණාථ: සුපටිපන්නාත්ථ මාරිස, උජුපටිපන්නාත්ථ මාරිසා ඒකන්තසුඛස්ස ලෝකස්ස සච්ඡිකිරියාය. මයම්පි හි මාරිසා ඒවම්පටිපන්නා ඒකන්තසුඛං ලෝකං උපපන්නාති?" ඉති පුට්ඨා "නෝ"ති වදන්ති.**

51. පින්වත් පොට්ඨපාද, මේකත් ඒ විදිහම යි. මෙබඳු වාද ඇති, මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඒ කියන්නේ "මරණින් මතු ආරෝග්‍ය වූ ඒකාන්ත සැපවත් වූ ආත්මයක් තියෙනවා" කියල. මං

ඔවුන් ළඟට ගිහින් මෙහෙම අහනවා. "හැබෑ ද ආයුෂ්මතුනි, "මරණින් මතු ආරෝග්‍ය වූ ඒකාන්ත සැපවත් වූ ආත්මයක් තියෙනවා" කියන මෙබඳු දෘෂ්ටි ඇති, මෙබඳු වාද ඇති දෙයක් ඔබ කියනවා කියන්නේ?" එතකොට මෙසේ අසන මා හට ඔවුන් "එසේ ය" කියල පිළිතුරු දෙනවා. එතකොට මං මෙහෙම කියනවා. "එහෙම නම් ආයුෂ්මතුනි, ඔබ ඒකාන්ත සැප ඇති ලෝකය මේක යි කියල දැන ගෙන, දැක ගෙන ද වාසය කරන්නේ?" එසේ ඇසූ විට ඔවුන් "නැත" කියල පිළිතුරු දෙනවා. එතකොට මං මෙහෙම කියනවා. "එහෙම නම් ආයුෂ්මතුනි, ඔබ එක රාත්‍රියක් හෝ එක දහවලක් හෝ අඩ රැයක් හෝ අඩ දහවලක් හෝ ඒකාන්ත සැපවත් ව තියෙන ආත්මයක් ගැන දන්නවා ද?" එසේ ඇසූ විටත් ඔවුන් පිළිතුරු දෙන්නේ "නැත" කියල යි. එතකොට මං මෙහෙම කියනවා. "එහෙම නම් ආයුෂ්මතුනි, ඔබ දන්නවා ද ඒකාන්ත සැප ඇති ලෝකය සාක්ෂාත් කිරීම පිණිස පවතින්නේ මේ මාර්ගය යි. මේ ප්‍රතිපදාවයි කියල." එසේ ඇසූවිට ඔවුන් පිළිතුරු දෙන්නෙත් "නැත" කියල ම යි. එතකොට මං මෙහෙම කියනවා. "එහෙම නම් ආයුෂ්මතුනි, ඒකාන්ත සැප ඇති ලොවක උපන්න යම් දේවතාවරු සිටිත් නම්, ඔවුන් කථාබස් කරන හඬවත් ඔබට අසන්ට ලැබුණා ද? "නිදුකාණෙනි, මනා පිළිවෙතෙහි යෙදෙව්. ඒකන්ත සැප ඇති ලොව සාක්ෂාත් කිරීම පිණිස සෘජු පිළිවෙතෙහි යෙදෙව්. අපිත් නිදුකාණෙනි, එබඳු පිළිවෙතෙක යෙදිලයි ඒකාන්ත සැප ඇති ලොවකට ආවේ" කියල. එසේ ඇසූවිටත් ඔවුන් ගේ පිළිතුරු එවන්නක් ඇසුවේ නැති බව යි.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද, "නනු ඒවං සන්තේ තේසං සමණබ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී?"ති.

පින්වත් පොට්ඨපාද, මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? "එතකොට කරුණු යෙදෙන්නේ ඔය විදිහට නම්, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ගේ කථාවන් කිසි පිළිසරණක් නැති දෙයක් බවට පත් නොවේ ද?"

"අද්ධා බෝ භන්තේ ඒවං සන්තේ තේසං සමණබ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී"ති.

"ස්වාමීනී, එතකොට කරුණු යෙදෙන්නේ ඔය විදිහට නිසා, ඒකාන්තයෙන් ම ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ගේ කථාවන් කිසි පිළිසරණක් නැති දෙයක් බවට පත් වෙනවා."

52. සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසෝ චාතුම්මහාපථේ නිස්සේණිං කරෙය්‍ය පාසාදස්ස ආරෝහණාය, තමේනං ඒවං වදෙය්‍යුං: "අම්භෝ පුරිස යස්ස ත්වං පාසාදස්ස ආරෝහණාය නිස්සේණිං කරෝසි, ජානාසි නං පාසාදං පුරත්ථිමාය වා දිසාය දක්ඛිණාය වා දිසාය පච්ඡිමාය වා දිසාය උත්තරාය යා දිසාය, උච්චේ වා නීචෝ වා මජ්ඣිමෝ වා?ති." ඉති පුට්ඨෝ "නෝ"ති වදෙය්‍ය. තමේනං ඒවං වදෙය්‍යුං: "අම්භෝ පුරිස යං ත්වං න ජානාසි න පස්සසි, තස්ස ත්වං පාසාදස්ස ආරෝහණාය නිස්සේණිං කරෝසි?"ති. ඉති පුට්ඨෝ "ආමා"ති වදෙය්‍ය.

52. පින්වත් පොට්ඨපාද, මේ වගේ දේකුත් තියෙනවා. පුරුෂයෙක් හතරමං හන්දියක ප්‍රාසාදයකට නැගීම පිණිස කියල ඉණිමගක් බඳිනවා. එතකොට අනෙක් අය ඔහුගෙන් මෙහෙම අහනවා. "එම්බා පුරුෂය, ඔබ යම් ප්‍රාසාදයකට නැගීම පිණිස ඉණිමගක් බඳිමින් ඉන්නවා. ඒ ප්‍රාසාදය තියෙන්නේ පෙරදිග දිශාවේ ද? දකුණු දිශාවේ ද? බටහිර දිශාවේ ද? උතුරු දිශාවේ ද? කියල දන්නවා ද? ඒ ප්‍රාසාදය උස එකක් ද? මිටි එකක් ද? මධ්‍යම එකක් ද? කියල දන්නවා ද?" මෙසේ අසද්දිත් ඔහු පිළිතුරු දෙන්නේ "දන්නේ නැත" කියල යි. එතකොට අනෙක් අය මෙහෙම අහනවා "එම්බා පුරුෂය, යම් ප්‍රාසාදයක් ගැන ඔබ දන්නෙත් නැත්නම්, දකින්නෙත් නැත්නම්, ඒ ප්‍රාසාදයට නැගීම පිණිස ද ඔබ ඔය ඉණිමග බඳින්නේ?" කියල. එතකොට ඔහු පිළිතුරු දෙන්නේ "එසේ ය" කියල යි.

නං කිං මඤ්ඤසි පොට්ඨපාද, නනු ඒවං සන්තේ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති?"ති.

පින්වත් පොට්ඨපාද, මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? "එතකොට කරුණු යෙදෙන්නේ ඔය විදිහට නම්, ඒ පුරුෂයා ගේ කථාව කිසි පිළිසරණක් නැති දෙයක් බවට පත් නොවේ ද?"

"අද්ධා ඛෝ භන්තේ ඒවං සන්තේ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සමපජ්ජතී"ති.

"ස්වාමීනී, එතකොට කරුණු යෙදෙන්නේ ඔය විදිහට නිසා, ඒකාන්තයෙන් ම ඒ පුරුෂයා ගේ කථාව කිසි පිළිසරණක් නැති දෙයක් බවට පත් වෙනවා."

53. "එවමේව ඛෝ පොට්ඨපාද යේ තේ සමණබ්‍රාහ්මණා එවංවාදිනෝ එවංදිට්ඨිනෝ: එකන්තසුඛී අත්තා හෝති අරෝගෝ පරම්මරණාති. තඤාහං උපසංකමිත්වා එවං වදාමි: "සච්චං කිර තුම්හේ ආයස්මන්තෝ එවං වාදිනෝ එවංදිට්ඨිනෝ එකන්තසුඛී අත්තා හෝති, අරෝගෝ පරම්මරණාති?" තේ චේ මේ එවං පුට්ඨා "ආමා"ති පටිජානන්ති, තඤාහං එවං වදාමි: "අපි පන තුම්හේ ආයසමන්තෝ එකන්තසුඛං ලෝකං ජානං පස්සං විහරථාති." ඉති පුට්ඨා "නෝ"ති වදන්ති. තඤාහං එවං වදාමි "අපි ච පන තුම්හේ ආයස්මන්තෝ එකං වා රත්තිං එකං වා දිවසං උපඩ්ඪං වා රත්තිං උපඩ්ඪං වා දිවසං එකන්තසුඛිං අත්තානං සම්පජානාථා?ති." ඉති පුට්ඨා "නෝ"ති වදන්ති, තඤාහං එවං වදාමි "අපි පන තුම්හේ ආයස්මන්තෝ ජානාථ: අයං මග්ගෝ අයං පටිපදා එකන්තසුඛස්ස ලෝකස්ස සච්ඡිකිරියායා?ති." ඉති පුට්ඨා "නෝ"ති වදන්ති. තඤාහං එවං වදාමි. "අපි පන තුම්හේ ආයස්මන්තෝ යා තා දේවතා එකන්තසුඛං ලෝකං උපපන්නා, තාසං දේවතානං භාසමානානං සද්දං සුණාථ: සුපටිපන්නාත්ථ මාරිසා, උජුපටිපන්නාත්ථ මාරිසා එකන්තසුඛස්ස ලෝකස්ස සච්ඡිකිරියාය. මයම්පි හි මාරිසා එවම්පටිපන්නා එකන්තසුඛං ලෝකං උපපන්නාති?" ඉති පුට්ඨා "නෝ"ති වදන්ති.

51. පින්වත් පොට්ඨපාද, මේකත් ඒ විදිහම යි. මෙබඳු වාද ඇති, මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා. ඒ කියන්නේ "මරණින් මතු ආරෝග්‍ය වූ ඒකාන්ත සැපවත් වූ ආත්මයක් තියෙනවා" කියල. මං ඔවුන් ළඟට ගිහින් මෙහෙම අහනවා. "හැබෑ ද ආයුෂ්මතුනි, "මරණින් මතු ආරෝග්‍ය වූ ඒකාන්ත සැපවත් වූ ආත්මයක් තියෙනවා" කියන මෙබඳු දෘෂ්ටි ඇති, මෙබඳු වාද ඇති දෙයක් ඔබ කියනවා කියන්නේ?" එතකොට මෙසේ අසන මා හට ඔවුන් "එසේ ය" කියල පිළිතුරු දෙනවා. එතකොට මං මෙහෙම කියනවා. "එහෙම නම් ආයුෂ්මතුනි, ඔබ ඒකාන්ත සැප ඇති ලෝකය මේක යි කියල දැන ගෙන, දැක ගෙන ද වාසය කරන්නේ?" එසේ ඇසූ විට ඔවුන් "නැත" කියල පිළිතුරු දෙනවා. එතකොට මං මෙහෙම කියනවා. "එහෙම නම් ආයුෂ්මතුනි, ඔබ එක රාත්‍රියක් හෝ එක දහවලක් හෝ අඩ රැයක් හෝ අඩ දහවලක් හෝ ඒකාන්ත සැපවත් ව තියෙන ආත්මයක් ගැන දන්නවා ද?" එසේ ඇසූ විටත් ඔවුන් පිළිතුරු දෙන්නේ "නැත" කියල යි. එතකොට මං මෙහෙම කියනවා. "එහෙම නම් ආයුෂ්මතුනි, ඔබ දන්නවා ද ඒකාන්ත සැප ඇති ලෝකය සාක්ෂාත් කිරීම පිණිස පවතින්නේ මේ මාර්ගය යි. මේ ප්‍රතිපදාවයි කියල." එසේ ඇසූවිට ඔවුන් පිළිතුරු දෙන්නෙත් "නැත" කියල ම යි. එතකොට මං මෙහෙම කියනවා. "එහෙම නම් ආයුෂ්මතුනි, ඒකාන්ත සැප ඇති ලොවක උපන්න යම් දේවතාවරු සිටිත් නම්, ඔවුන් කථාබස් කරන

හඬවත් ඔබට අසන්ට ලැබුණා ද? "නිදුකාණෙනි, මනා පිළිවෙතෙහි යෙදෙව්. ඒකන්ත සැප ඇති ලොව සාක්ෂාත් කිරීම පිණිස සෘජු පිළිවෙතෙහි යෙදෙව්. අපිත් නිදුකාණෙනි, එබඳු පිළිවෙතෙක යෙදිලයි ඒකාන්ත සැප ඇති ලොවකට ආවේ" කියල. එසේ ඇසූවිටත් ඔවුන් ගේ පිළිතුරු එවන්නක් ඇසුවේ නැති බව යි.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද, "නනු ඒවං සන්තේ තේසං සමණබ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී?"ති.

පින්වත් පොට්ඨපාද, මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? "එතකොට කරුණු යෙදෙන්නේ ඔය විදිහට නම්, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ගේ කථාවන් කිසි පිළිසරණක් නැති දෙයක් බවට පත් නොවේ ද?"

"අද්ධා ඛෝ හන්තේ ඒවං සන්තේ තේසං සමණබ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී"ති.

"ස්වාමීනී, එතකොට කරුණු යෙදෙන්නේ ඔය විදිහට නිසා, ඒකාන්තයෙන් ම ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයින් ගේ කථාවන් කිසි පිළිසරණක් නැති දෙයක් බවට පත් වෙනවා."

"තයෝ ඛෝ'මේ පොට්ඨපාද අත්තපටිලාභා: විළාරිකෝ අත්තපටිලාභෝ, මනෝමයෝ අත්තපටිලාභෝ, අරූපෝ අත්තපටිලාභෝ"ති.

"පින්වත් පොට්ඨපාද, මේ ආත්මප්‍රතිලාභ හෙවත් ශරීර තුනක් තියෙනවා. විළාරික ශරීරය, මනෝමය ශරීරය, අරූපී ශරීරය කියල."

කතමෝ ච පොට්ඨපාද විළාරිකෝ අත්තපටිලාභෝ? රූපී චාතුම්මහාභූතිකෝ කබළීකාරාහාරභක්ඛෝ, අයං විළාරිකෝ අත්තපටිලාභෝ.

පින්වත් පොට්ඨපාද, මොකක් ද මේ විළාරික ශරීරය? සතර මහා භූතයින්ගෙන් හට ගත් ගොරෝසු ආහාර අනුභවයෙන් යැපෙන රූපවත් වූ ශරීරය යි. මේක තමයි විළාරික ආත්මප්‍රතිලාභය.

කතමෝ මනෝමයෝ අත්තපටිලාභෝ? රූපී මනෝමයෝ සබ්බංගපච්චංගී අහීනින්ද්‍රියෝ, අයං මනෝමයෝ අත්තපටිලාභෝ.

පින්වත් පොට්ඨපාද, මොකක් ද මේ මනෝමය ශරීරය? නො පිරිහුණු ඉඳුරන් ඇති සියළු අඟපසඟ ඇති රූපවත් වූ මනෝමය වූ ශරීරය යි. මේක තමයි මනෝමය ආත්මප්‍රතිලාභය.

කතමෝ ච අරූපෝ අත්තපටිලාභෝ? අරූපී සඤ්ඤමයෝ, අයං අරූපෝ අත්තපටිලාභෝ.

පින්වත් පොට්ඨපාද, මොකක් ද මේ අරූපී ශරීරය? අරූපී සඤ්ඤමය ශරීරය යි. මේක තමයි අරූපී ආත්ම ප්‍රතිලාභය.

54. විළාරිකස්සපි ඛෝ අහං පොට්ඨපාද අත්තපටිලාභස්ස පහානාය ධම්මං දේසේමි යථාපටිපන්නානං වෝ සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සන්තීති.

54. පින්වත් පොට්ඨපාද, මං විළාරික ශරීරයක් ලැබීම පිණිස පවතින දෙය ප්‍රහාණය කිරීම පිණිස දහම් දෙසනවා. ඒ කියා දෙන ආකාරයට අනුගමනය කළොත් සිත කෙලෙසෙන දේවල් ප්‍රහීණ වෙලා යනවා. සිත පිරිසිදු වෙන දේවල් වඩා වර්ධනය වෙනවා. ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා.

55. සියා ඛෝ පන තේ පොට්ඨපාද ඒවමස්ස. සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාම. දුක්ඛෝ ච ඛෝ විහාරෝ'ති.

55. පින්වත් පොට්ඨපාද, ඔබට මෙවැනි අදහසක් සිතෙන්න පුළුවනි. "සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ මාත් වාසය කරනවා නම් ඒ විහරණය දුක් සහිත යි කියල"

න ඛෝ පනේතං පොට්ඨපාද එවං දට්ඨබ්බං. සංකිලේසිකා චේව ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සන්ති. පාමුජ්ජඤ්චේව භවිස්සති පීති ච පස්සද්ධි ච සති ච සම්පජඤ්ඤඤ්ච සුඛෝ ච විහාරෝ.

පින්වත් පොට්ඨපාද, ඔබ එය සිතිය යුත්තේ ඔය විදිහට නොවේ. "සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා නම් ප්‍රමුදිතබව ම යි ඇති වන්නේ. ප්‍රීතියත්, සැහැල්ලු බවත්, සිහියත්, මනා නුවණත් තමයි ඇති වන්නේ. ඒ විහරණය සැප සහිත යි."

56. මනෝමයස්ස පි ඛෝ අහං පොට්ඨපාද අත්තපටිලාභස්ස පහානාය ධම්මං දේසේමි යථාපටිපන්නානං වෝ සංකිලේසිකා ධම්මා පහීස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථාති.

56. පින්වත් පොට්ඨපාද, මං මනෝමය ශරීරයක් ලැබීම පිණිස පවතින දෙය ප්‍රහාණය කිරීම පිණිස දහම් දෙසනවා. ඒ කියා දෙන ආකාරයට අනුගමනය කළොත් සිත කෙලෙසෙන දේවල් ප්‍රහීණ වෙලා යනවා. සිත පිරිසිදු වෙන දේවල් වඩා වර්ධනය වෙනවා. ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා.

සියා ඛෝ පන තේ පොට්ඨපාද එවමස්ස, සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාම. දුක්ඛෝ ච ඛෝ විහාරෝති.

පින්වත් පොට්ඨපාද, ඔබට මෙවැනි අදහසක් සිතෙන්න පුළුවනි. "සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ මාත් වාසය කරනවා නම් ඒ විහරණය දුක් සහිත යි කියල"

න ඛෝ පනේතං පොට්ඨපාද ඒවං දට්ඨබ්බං. සංකිලේසිකා චේව ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථෙති. පාමුජ්ජඤ්චේව භවිස්සති පීති ච පස්සද්ධි ච සති ච සම්පජඤ්ඤඤ්ච සුඛෝ ච විහාරෝ.

පින්වත් පොට්ඨපාද, ඔබ එය සිතිය යුත්තේ ඔය විදිහට නොවේ. "සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා නම් ප්‍රමුදිතබව ම යි ඇති වන්නේ. ප්‍රීතියත්, සැහැල්ලු බවත්, සිහියත්, මනා නුවණත් තමයි ඇති වන්නේ. ඒ විහරණය සැප සහිත යි."

57. අරූපස්සපි ඛෝ අහං පොට්ඨපාද අත්තපටිලාභස්ස පහානාය ධම්මං දේසේමි යථාපටිපන්නානං වෝ සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථෙති.

57. පින්වත් පොට්ඨපාද, මං අරූපී ශරීරයක් ලැබීම පිණිස පවතින දෙය ප්‍රහාණය කිරීම පිණිස දහම් දෙසනවා. ඒ කියා දෙන ආකාරයට අනුගමනය කළොත් සිත කෙලෙසෙන දේවල් ප්‍රහීණ වෙලා යනවා. සිත පිරිසිදු වෙන දේවල් වඩා වර්ධනය වෙනවා. ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා.

සියා ඛෝ පන තේ පොට්ඨපාද ඒවමස්ස. සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාම. දුක්ඛෝ ච ඛෝ විහාරෝති.

පින්වත් පොට්ඨපාද, ඔබට මෙවැනි අදහසක් සිතෙන්න පුළුවනි. "සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ මාත් වාසය කරනවා නම් ඒ විහරණය දුක් සහිත යි කියල"

න ඛෝ පනේතං පොට්ඨපාද එවං දට්ඨබ්බං. සංකිලේසිකා චේව ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථ. පාමුජ්ජඤ්චේව භවිස්සති පීති ච පස්සද්ධි ච සති ච සම්පජඤ්ඤඤ්ච සුඛෝ ච විහාරෝ.

පින්වත් පොට්ඨපාද, ඔබ එය සිතිය යුත්තේ ඔය විදිහට නොවේ. "සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා නම් ප්‍රමුදිතබව ම යි ඇති වන්නේ. ප්‍රීතියත්, සැහැල්ලු බවත්, සිහියත්, මනා නුවණත් තමයි ඇති වන්නේ. ඒ විහරණය සැප සහිත යි."

58. පරේ චේ පොට්ඨපාද අම්හේ එවං පුච්ඡෙය්‍යුං: කතමෝ පන සෝ ආවුසෝ විළාරිකෝ අත්තපටිලාභෝ යස්ස තුම්හේ පහාණාය ධම්මං දේසේථ යථාපටිපන්නානං වෝ සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථාති. තේසං මයං එවං පුට්ඨා එවං බ්‍යාකරෙය්‍යාම: "අයං වා සෝ ආවුසෝ විළාරිකෝ අත්තපටිලාභෝ යස්ස මයං පහානාය ධම්මං දේසේම යථාපටිපන්නානං වෝ සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති.

58. පින්වත් පොට්ඨපාද, අනෙක් අය අපෙන් මෙසේ අසන්ට පුළුවනි. "යමක් ප්‍රහාණය කිරීම පිණිස ඔබ දහම් දෙසනවා නම්, ඒ ආකාරයෙන් අනුගමනය කරන විට සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා නම් ආයුෂ්මතුනි, ඒ ඔබ කියන විළාරික ආත්මප්‍රතිලාභය කුමක් ද?" කියල. එසේ අපෙන් අසන විට අපි මෙහෙම පිළිතුරු දෙනවා. "යමක් ප්‍රහාණය කිරීම පිණිස අපි දහම් දෙසනවා නම්, ඒ ආකාරයෙන් අනුගමනය කරන විට සිත කෙලෙසෙන දේවල්

ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා නම් ආයුෂ්මතුනි, ඒ විලාරික ආත්මභාවය නම් මෙය යි" කියල

59. පරේ වේ පොට්ඨපාද අම්හේ ඒවං පුච්ඡෙය්‍යුං: කතමෝ පන සෝ ආවුසෝ මනෝමයෝ අත්තපටිලාභෝ, යස්ස තුම්හේ පහාණාය ධම්මං දේසේථ යථාපටිපන්නානං වෝ සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථාති. තේසං මයං ඒවං පුට්ඨා ඒවං බ්‍යාකරෙය්‍යාම: "අයං වා සෝ ආවුසෝ මනෝමයෝ අත්තපටිලාභෝ යස්ස මයං පහානාය ධම්මං දේසේමි යථාපටිපන්නානං වෝ සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති.

පින්වත් පොට්ඨපාද, අනෙක් අය අපෙන් මෙසේ අසන්ට පුළුවනි. "යමක් ප්‍රහාණය කිරීම පිණිස ඔබ දහම් දෙසනවා නම්, ඒ ආකාරයෙන් අනුගමනය කරන විට සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා නම් ආයුෂ්මතුනි, ඒ ඔබ කියන මනෝමය ආත්මප්‍රතිලාභය කුමක් ද?" කියල. එසේ අපෙන් අසන විට අපි මෙහෙම පිළිතුරු දෙනවා. "යමක් ප්‍රහාණය කිරීම පිණිස අපි දහම් දෙසනවා නම්, ඒ ආකාරයෙන් අනුගමනය කරන විට සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා නම් ආයුෂ්මතුනි, ඒ මනෝමය ආත්මභාවය නම් මෙය යි" කියල

60. පරේ වේ පොට්ඨපාද අම්හේ ඒවං පුච්ඡෙය්‍යුං: කතමෝ පන සෝ ආවුසෝ අරූපෝ අත්තපටිලාභෝ, යස්ස තුම්හේ පහාණාය ධම්මං දේසේථ යථාපටිපන්නානං වෝ සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා

අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථාති. තේසං මයං ඒවං පුට්ඨා ඒවං බ්‍යාකරෙය්‍යාම: "අයං වා සෝ ආවුසෝ අරූපෝ අත්තපටිලාභෝ යස්ස මයං පහානාය ධම්මං දේසේම යථාපටිපන්නානං වෝ සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති.

60. පින්වත් පොට්ඨපාද, අනෙක් අය අපෙන් මෙසේ අසන්ට පුළුවනි. "යමක් ප්‍රහාණය කිරීම පිණිස ඔබ දහම් දෙසනවා නම්, ඒ ආකාරයෙන් අනුගමනය කරන විට සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා නම් ආයුෂ්මතුනි, ඒ ඔබ කියන අරූපී ආත්මප්‍රතිලාභය කුමක් ද?" කියල. එසේ අපෙන් අසන විට අපි මෙහෙම පිළිතුරු දෙනවා. "යමක් ප්‍රහාණය කිරීම පිණිස අපි දහම් දෙසනවා නම්, ඒ ආකාරයෙන් අනුගමනය කරන විට සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා නම් ආයුෂ්මතුනි, ඒ අරූපී ආත්මභාවය නම් මෙය යි" කියල

නං කිම්මඤ්ඤසි පොට්ඨපාද, නනු ඒවං සන්තේ සප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී?ති.

පින්වත් පොට්ඨපාද, මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? "මේ විදිහට කරුණු යෙදෙන විට අප ගේ වචනය පිළිසරණ සහිත වන්නේ නැද්ද?"

"අද්ධා බෝ භන්තේ ඒවං සන්තේ සප්පටිහීරකතං භාසිතං සම්පජ්ජතී"ති.

"ස්වාමීනී, මේ විදිහට කරුණු යෙදෙන විට ඒකාන්තයෙන් ම ඔබ වහන්සේ ගේ වචනය පිළිසරණ සහිත ම යි."

61. සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසෝ නිස්සේණිං කරෙය්‍ය පාසාදස්ස ආරෝහණාය තස්සේව පාසාදස්ස හෙට්ඨා. තමේනං ඒවං වදෙය්‍යුං: "අම්භෝ

පුරිස යස්ස ත්වං පාසාදස්ස ආරෝහණාය නිස්සේණිං කරෝසි, ජානාසි තං පාසාදං පුරත්ථිමාය වා දිසාය දක්ඛිණාය වා දිසාය පච්ඡිමාය වා දිසාය උත්තරාය වා දිසාය උච්චෝ වා නීචෝ වා මජ්ඣිමෝ වා?ති" සෝ වේ එවං වදෙය්‍ය: "අයං සෝ ආවුසෝ පාසාදෝ, යස්සාහං අරෝහණාය නිස්සේණිං කරෝමි තස්සේව පාසාදස්ස හෙට්ඨාති."

61. පින්වත් පොට්ඨපාද, එක මේ වගේ දෙයක්. පුරුෂයෙක් ප්‍රාසාදයක යට තට්ටුවේ ඉඳලා ඒ ප්‍රාසාදයේ ම උඩට නැගීම පිණිස හිණිමගක් බඳිනවා නම්, ඔහුට අනික් අය මෙහෙම කියනවා. "එම්බා පුරුෂය ඔබ යම් ප්‍රාසාදයකට නැගීම පිණිස හිණිමගක් බඳිමින් ඉන්නවා. එතකොට ඒ ප්‍රාසාදය තියෙන්නේ පෙරදිග දිශාවේ ද? දකුණු දිශාවේ ද? බටහිර දිශාවේ ද? උතුරු දිශාවේ ද? ඒ වගේ ම ඒ ප්‍රාසාදය උස යි ද? පොඩියි ද? මධ්‍යම ද?" කියල. එතකොට ඔහු මෙහෙම කියනවා. "ආයුෂ්මතුනි, යම් ප්‍රාසාදයකට නැගීම පිණිස මං ඒ ප්‍රාසාදයේ ම යට ඉඳලා හිණිමගක් කරනවා නම්, මේ තියෙන්නේ ඒ ප්‍රාසාදය තමයි."

තං කිං මඤ්ඤසි පොට්ඨපාද? නනු එවං සන්තේ තස්ස පුරිසස්ස සප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී?ති.

පින්වත් පොට්ඨපාද, මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? "මේ විදිහට කරුණු යෙදෙන විට ඒ පුරුෂයා ගේ වචනය පිළිසරණ සහිත වන්නේ නැද්ද?"

"අද්ධා ඛෝ භන්තේ එවං සන්තේ තස්ස පුරිසස්ස සප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී"ති.

"ස්වාමීනී, මේ විදිහට කරුණු යෙදෙන විට ඒකාන්තයෙන් ම ඒ පුරුෂයා ගේ වචනය පිළිසරණ සහිත ම යි."

62. එවමේව ඛෝ පොට්ඨපාද පරේ වේ අම්හේ එවං පුච්ඡෙය්‍යුං: කතමෝ පන සෝ ආවුසෝ විළාරිකෝ අත්තපටිලාභෝ? ..... කතමෝ පන සෝ ආවුසෝ මනෝමයෝ අත්තපටිලාභෝ? ..... කතමෝ පන සෝ ආවුසෝ අරූපෝ අත්තපටිලාභෝ, යස්ස තුම්හේ පහාණාය ධම්මං දේසේථ යථාපටිපන්නානං වෝ සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථාති. තේසං මයං එවං පුට්ඨා එවං බ්‍යාකරෙය්‍යාම:

62. පින්වත් පොට්ඨපාද ඔන්න ඔය විදිහම යි අනෙක් අය අපෙන් මෙසේ අසන්ට පුළුවනි. "යමක් ප්‍රහාණය කිරීම පිණිස ..... ආයුෂ්මතුනි, ඒ ඔබ කියන විලාරික ආත්මප්‍රතිලාභය කුමක් ද?" කියල ..... මනෝමය ආත්මප්‍රතිලාභය කුමක් ද?" කියල ..... "යමක් ප්‍රහාණය කිරීම පිණිස ඔබ දහම් දෙසනවා නම්, ඒ ආකාරයෙන් අනුගමනය කරන විට සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා නම් ආයුෂ්මතුනි, ඒ ඔබ කියන අරූපී ආත්මප්‍රතිලාභය කුමක් ද?" කියල.

63. "අයං වා සෝ ආවුසෝ විළාරිකෝ අත්තපටිලාභෝ ..... මනෝමයෝ අත්තපටිලාභෝ ..... අරූපෝ අත්තපටිලාභෝ යස්ස මයං පහානාය ධම්මං දේසේම යථාපටිපන්නානං වෝ සංකිලේසිකා ධම්මා පහීයිස්සන්ති, වෝදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති, පඤ්ඤාපාරිපූරිං වේපුල්ලත්තඤ්ච දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති.

63. "ආයුෂ්මතුනි, ඒ විලාරික ආත්මභාවය නම් මෙය යි" කියල ..... ඒ මනෝමය ආත්මභාවය නම් මෙය යි" කියල. ..... "යමක් ප්‍රහාණය කිරීම පිණිස අපි දහම් දෙසනවා නම්, ඒ ආකාරයෙන් අනුගමනය කරන විට සිත කෙලෙසෙන දේවල් ප්‍රහාණය වෙලා යනවා නම්, සිත පිරිසිදු කරන දේවල් වඩා වර්ධනය වෙනවා නම්, ප්‍රඥාව පරිපූර්ණ වී විපුලබවට පත් වෙනවා. මේ ජීවිතයේ දී ම ඒ නිකෙලෙස් බව තමන් ගේ ම සුවිශේෂී නුවණින් සාක්ෂාත් කොට පැමිණ වාසය කරනවා නම් ආයුෂ්මතුනි, ඒ අරූපී ආත්මභාවය නම් මෙය යි" කියල.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද? නනු ඒවං සන්තේ සප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී?ති.

පින්වත් පොට්ඨපාද, මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? "මේ විදිහට කරුණු යෙදෙන විට අප ගේ වචනය පිළිසරණ සහිත වන්නේ නැද්ද?"

"අද්ධා ඛෝ භන්තේ ඒවං සන්තේ සප්පාටිහීරකතං භාසිතං සමපජ්ජතී"ති.

"ස්වාමීනී, මේ විදිහට කරුණු යෙදෙන විට ඒකාන්තයෙන් ම ඔබ වහන්සේ ගේ වචනය පිළිසරණ සහිත ම යි."

64. එවං වුත්තේ චිත්තෝ හත්ථිසාරිපුත්තෝ භගවන්තං එතදවෝච: යස්මිං භන්තේ සමයේ විළාරිකෝ අත්තපටිලාභෝ හෝති, මෝඝස්ස තස්මිං සමයේ මනෝමයෝ අත්තපටිලාභෝ හෝති, මෝඝෝ අරූපෝ අත්තපටිලාභෝ හෝති. විළාරිකෝ වාස්ස අත්තපටිලාභෝ තස්මිං සමයේ සච්චෝ හෝති.

64. මෙසේ වදාළ විට හත්ථිසාරිපුත්ත චිත්‍රයන් භාග්‍යවතුන් වහන්සේට මෙහෙම කිව්වා. "ස්වාමීනී, යම් වෙලාවක විලාරික ශරීරය නම් තියෙන්නේ ඒ වෙලාවට මනෝමය ශරීරය හිස් නේද (අප්‍රකටයි)? අරූපී ශරීරයත් හිස් නේද? ඒ වෙලාවේ දී ඔහු ගේ විලාරික ශරීරය විතරක් ම නේද සත්‍ය ලෙස ප්‍රකට වන්නේ?

යස්මිං භන්තේ සමයේ මනෝමයෝ අත්තපටිලාභෝ හෝති, මෝඝස්ස තස්මිං සමයේ විළාරිකෝ අත්තපටිලාභෝ හෝති, මෝඝෝ අරූපෝ අත්තපටිලාභෝ. මනෝමයෝ ච අත්තපටිලාභෝ තස්මිං සමයේ සච්චෝ හෝති.

"ස්වාමීනී, යම් වෙලාවක මනෝමය ශරීරය නම් තියෙන්නේ ඒ වෙලාවට විලාරික ශරීරය හිස් නේද (අප්‍රකටයි)? අරූපී ශරීරයත් හිස් නේද? ඒ වෙලාවේ දී ඔහු ගේ මනෝමය ශරීරය විතරක් ම නේද සත්‍ය ලෙස ප්‍රකට වන්නේ?

යස්මිං භන්තේ සමයේ අරූපෝ අත්තපටිලාභෝ හෝති, මෝඝස්ස තස්මිං සමයේ විළාරිකෝ අත්තපටිලාභෝ හෝති, මෝඝෝ මනෝමයෝ අත්තපටිලාභෝ. අරූපෝ'වාස්ස අත්තපටිලාභෝ තස්මිං සමයේ සච්චෝ හෝති"ති.

"ස්වාමීනී, යම් වෙලාවක අරූපී ශරීරය නම් තියෙන්නේ ඒ වෙලාවට විලාරික ශරීරය හිස් නේද (අප්‍රකටයි)? මනෝමය ශරීරයත් හිස් නේද? ඒ වෙලාවේ දී ඔහු ගේ අරූපී ශරීරය විතරක් ම නේද සත්‍ය ලෙස ප්‍රකට වන්නේ?

"යස්මිං චිත්ත සමයේ විළාරිකෝ අත්තපටිලාභෝ හෝති, නේව තස්මිං සමයේ මනෝමයෝ අත්තපටිලාභෝ'ති සංඛං ගච්ඡති, න අරූපෝ

අත්තපටිලාභෝ'ති සංඛං ගච්ඡති. විළාරිකෝ අත්තපටිලාභෝ ත්වේව තස්මිං සමයේ සංඛං ගච්ඡති.

"පින්වත් චිත්‍ර, යම් වෙලාවක විලාරික ශරීරය නම් තියෙන්නේ ඒ වෙලාවට මනෝමය ශරීරය තියෙනවා යන කරුණ ව්‍යවහාරයට එන්නේ නෑ. අරූපී ශරීරය තියෙනවා යන කරුණත් ව්‍යවහාරයට එන්නේ නෑ. ඒ වෙලාවේ දී ඔහු ගේ විලාරික ශරීරය විතරයි ව්‍යවහාරයට එන්නේ."

යස්මිං චිත්ත සමයේ මනෝමයෝ අත්තපටිලාභෝ හෝති, නේව තස්මිං සමයේ විළාරිකෝ අත්තපටිලාභෝ'ති සංඛං ගච්ඡති, න අරූපෝ අත්තපටිලාභෝ'ති සංඛං ගච්ඡති. මනෝමයෝ අත්තපටිලාභෝ ත්වේව තස්මිං සමයේ සංඛං ගච්ඡති.

"පින්වත් චිත්‍ර, යම් වෙලාවක මනෝමය ශරීරය නම් තියෙන්නේ ඒ වෙලාවට විලාරික ශරීරය තියෙනවා යන කරුණ ව්‍යවහාරයට එන්නේ නෑ. අරූපී ශරීරය තියෙනවා යන කරුණත් ව්‍යවහාරයට එන්නේ නෑ. ඒ වෙලාවේ දී ඔහු ගේ මනෝමය ශරීරය විතරයි ව්‍යවහාරයට එන්නේ."

යස්මිං චිත්ත සමයේ අරූපෝ අත්තපටිලාභෝ හෝති, නේව තස්මිං සමයේ විළාරිකෝ අත්තපටිලාභෝ'ති සංඛං ගච්ඡති, න මනෝමයෝ අත්තපටිලාභෝ'ති සංඛං ගච්ඡති. අරූපෝ අත්තපටිලාභෝ ත්වේව තස්මිං සමයේ සංඛං ගච්ඡති.

"පින්වත් චිත්‍ර, යම් වෙලාවක අරූපී ශරීරය නම් තියෙන්නේ ඒ වෙලාවට විලාරික ශරීරය තියෙනවා යන කරුණ ව්‍යවහාරයට එන්නේ නෑ. මනෝමය ශරීරය තියෙනවා යන කරුණත් ව්‍යවහාරයට එන්නේ නෑ. ඒ වෙලාවේ දී ඔහු ගේ අරූපී ශරීරය විතරයි ව්‍යවහාරයට එන්නේ."

65. සචේ තං චිත්ත එවං පුච්ඡෙය්‍යුං: අහෝසි ත්වං අතීතමද්ධානං, න ත්වං නාහෝසි? භවිස්සසි ත්වං අනාගතමද්ධානං, න ත්වං න භවිස්සසි? අත්ථි ත්වං එතරහි, න ත්වං නත්ථීති. එවං පුට්ඨෝ ත්වං චිත්ත කින්ති බ්‍යාකරෙය්‍යාසී?"ති.

65. ඉදින් චිත්‍ර, කවුරු හරි මේ විදිහට ඇහුවොත් "ඔබ අතීතයෙහි සිටියා ද? ඔබ නො සිටියේ නැද්ද? ඔබ අනාගත කාලයෙහි ඉන්නවා ද? ඔබ නො ඉන්නේ නැද්ද? ඔබ වර්තමානයෙහි ඉන්නවා ද? ඔබ නො ඉන්නේ නැද්ද?"

කියලා. පින්වත් චිත්‍ර, ඒ විදිහට ඇසුවොත් ඔබ පිළිතුරු දෙන්නේ කොහොම ද?

"සචේ මං හන්තේ ඒවං පුච්ඡෙය්‍යුං: අහෝසි ත්වං අතීතමද්ධානං න ත්වං නාහෝසි? භවිස්සසි ත්වං අනාගතමද්ධානං, න ත්වං භවිස්සසි? අත්ථි ත්වං ඒතරහි, න ත්වං නත්ථීති. ඒවං පුට්ඨෝ'හං භන්තේ ඒවං බ්‍යාකරෙය්‍යං: අහෝසාහං අතීතමද්ධානං, නාහං න අහෝසිං. භවිස්සාමහං අනාගතමද්ධානං, නාහං න භවිස්සාම. අත්ථාහං ඒතරහි, නාහං නත්ථීති. ඒවං පුට්ඨෝ'හං භන්තේ ඒවං බ්‍යාකරෙය්‍යන්ති."

ඉදින් ස්වාමීනී, කවුරු හරි මේ විදිහට ඇහුවොත් "ඔබ අතීතයෙහි සිටියා ද? ඔබ නො සිටියේ නැද්ද? ඔබ අනාගත කාලයෙහි ඉන්නවා ද? ඔබ නො ඉන්නේ නැද්ද? ඔබ වර්තමානයෙහි ඉන්නවා ද? ඔබ නො ඉන්නේ නැද්ද?" කියලා. ස්වාමීනී, ඒ විදිහට ඇසුවොත් මා මෙහෙමයි පිළිතුරු දෙන්නේ. "අතීතයෙහි මං හිටිය තමයි. නො සිටියා නොවේ. අනාගතයේත් මං ඉන්නවා තමයි. නො ඉන්නවා නොවේ. වර්තමානයේ මං ඉන්නවා. ඉන්නෙ නැතුවා නොවේ" කියලා, ස්වාමීනී ඔය විදිහට යි මං උත්තර දෙන්නේ.

66. සචේ පන තං චිත්ත ඒවං පුච්ඡෙය්‍යුං: යෝ තේ අහෝසි අතීතෝ අත්තපටිලාභෝ ස්වේව තේ අත්තපටිලාභෝ සච්චෝ, මෝසෝ අනාගතෝ, මෝසෝ පච්චුප්පන්නෝ? යෝ තේ භවිස්සති අනාගතෝ අත්තපටිලාභෝ, ස්වේව තේ අත්තපටිලාභෝ සච්චෝ, මෝසෝ අතීතෝ, මෝසෝ පච්චුප්පන්නෝ අත්තපටිලාභෝ. ස්වේව තේ අත්තපටිලාභෝ සච්චෝ මෝසෝ අතීතෝ, මෝසෝ අනාගතෝ? ති ඒවං පුට්ඨෝ ත්වං චිත්ත කින්ති බ්‍යාකරෙය්‍යාසී?"ති.

66. එතකොට පින්වත් චිත්‍ර ඔබෙන් මේ විදිහට ඇහුවොත්, "ඔබට අතීත වූ යම් ශරීරයක් තිබුණා ද, ඒ ආත්ම ප්‍රතිලාභයම ද සත්‍ය වන්නේ? අනාගත ශරීරය හිස් ද? වර්තමාන ශරීරයත් හිස් ද? ඔබට අනාගත වූ යම් ශරීරයක් ඇතිවෙනවා ද, ඒ ආත්ම ප්‍රතිලාභයම ද සත්‍ය වන්නේ? අතීත ශරීරය හිස් ද? වර්තමාන ශරීරයත් හිස් ද? ඔබට වර්තමාන ශරීරයක් තියෙනවා ද, ඒ ආත්ම ප්‍රතිලාභයම ද සත්‍ය වන්නේ? අතීත ශරීරය හිස් ද? අනාගත ශරීරයත් හිස් ද?" කියල. ඔය විදිහට ඇහුවොත් පින්වත් චිත්‍ර, ඔබ පිළිතුරු දෙන්නේ කොහොම ද?

67. සචේ පන මං භන්තේ ඒවං පුච්ඡෙය්‍යුං: යෝ තේ අහෝසි අතීතෝ අත්තපටිලාභෝ ස්වේව තේ අත්තපටිලාභෝ සච්චෝ, මෝසෝ අනාගතෝ, මෝසෝ පච්චුප්පන්නෝ? යෝ තේ භවිස්සති අනාගතෝ අත්තපටිලාභෝ, ස්වේව තේ අත්තපටිලාභෝ සච්චෝ, මෝසෝ අතීතෝ, මෝසෝ පච්චුප්පන්නෝ, යෝ තේ ඒතරහි පච්චුප්පන්නෝ අත්තපටිලාභෝ. ස්වේව තේ අත්තපටිලාභෝ සච්චෝ මෝසෝ අතීතෝ, මෝසෝ අනාගතෝ? ති ඒවං පුට්ඨෝ අහං භන්තේ ඒවං බ්‍යාකරෙය්‍යං: යෝ මේ අහෝසි අතීතෝ අත්තපටිලාභෝ, ස්වේව මේ අත්තපටිලාභෝ තස්මිං සමයේ සච්චෝ අහෝසි, මෝසෝ අනාගතෝ, මෝසෝ පච්චුප්පන්නෝ. යෝ මේ භවිස්සති අනාගතෝ අත්තපටිලාභෝ, ස්වේව මේ අත්තපටිලාභෝ තස්මිං සමයේ සච්චෝ භවිස්සති. මෝසෝ පච්චුප්පන්නෝ. යෝ මේ ඒතරහි පච්චුප්පන්නෝ අත්ත පටිලාභෝ, ස්වේව මේ අත්තපටිලාභෝ සච්චෝ, මෝසෝ අතීතෝ, මෝසෝ අනාගතෝ?ති. ඒවං පුට්ඨෝ අහං භන්තේ ඒවං බ්‍යාකරෙය්‍යන්ති.

67. ඉදින් ස්වාමීනී, මගෙන් මේ විදිහට ඇසුවොත්, "ඔබට අතීත වූ යම් ශරීරයක් තිබුණා ද, ඒ ආත්ම ප්‍රතිලාභයම ද සත්‍ය වන්නේ? අනාගත ශරීරය හිස් ද? වර්තමාන ශරීරයත් හිස් ද? ඔබට අනාගත වූ යම් ශරීරයක් ඇතිවෙනවා ද, ඒ ආත්ම ප්‍රතිලාභයම ද සත්‍ය වන්නේ? අතීත ශරීරය හිස් ද? වර්තමාන ශරීරයත් හිස් ද? ඔබට වර්තමාන ශරීරයක් තියෙනවා ද, ඒ ආත්ම ප්‍රතිලාභයම ද සත්‍ය වන්නේ? අතීත ශරීරය හිස් ද? අනාගත ශරීරයත් හිස් ද?" කියල. ස්වාමීනී, එතකොට මං මෙහෙම පිළිතුරු දෙනවා. "මට අතීත වූ යම් ශරීරයක් තිබුණා නම් ඒ ශරීරයම යි ඒ කාලයේ දී මට සත්‍ය වශයෙන් ප්‍රකට වන්නේ. එතකොට අනාගත සිරුර හිස්. වර්තමාන සිරුරත් හිස්. ඒ වගේ ම මට අනාගත වූ යම් ශරීරයක් තියෙනවා නම් ඒ ශරීරයම යි ඒ කාලයේ දී මට සත්‍ය වශයෙන් ප්‍රකට වන්නේ. එතකොට අතීත සිරුර හිස්. වර්තමාන සිරුරත් හිස්. ඒ වගේ ම මට වර්තමනා වූ යම් ශරීරයක් තියෙනවා නම් ඒ ශරීරයම යි ඒ කාලයේ දී මට සත්‍ය වශයෙන් ප්‍රකට වන්නේ. එතකොට අතීත සිරුර හිස්. අනාගත සිරුරත් හිස්" කියල. ස්වාමීනී, එහෙම ඇසූ විට ඔය විදිහට යි මං පිළිතුරු දෙන්නේ.

68. "ඒවමේව ඛෝ චිත්ත යස්මිං චිත්ත සමයේ විළාරිකෝ අත්තපටිලාභෝ හෝති, නේව තස්මිං සමයේ මනෝමයෝ අත්තපටිලාභෝති සංඛං ගච්ඡති, න අරූපෝ අත්තපටිලාභෝ ති සංඛං ගච්ඡති. විළාරිකෝ අත්තපටිලාභෝ ත්වේව තස්මිං සමයේ සංඛං ගච්ඡති. යස්මිං චිත්ත සමයේ මනෝමයෝ අත්තපටිලාභෝ හෝති, නේව තස්මිං සමයේ විළාරිකෝ

අත්තපටිලාභෝති සංඛං ගච්ඡති, න අරූපෝ අත්තපටිලාභෝති සංඛං ගච්ඡති. මනෝමයෝ අත්තපටිලාභෝ ත්වේව තස්මිං සමයේ සංඛං ගච්ඡති. යස්මිං චිත්ත සමයේ අරූපෝ අත්තපටිලාභෝ හෝති, නේව තස්මිං සමයේ විළාරිකෝ අත්තපටිලාභෝති සංඛං ගච්ඡති, න මනෝමයෝ අත්තපටිලාභෝති සංඛං ගච්ඡති. අරූපෝ අත්තපටිලාභෝ ත්වේව තස්මිං සමයේ සංඛං ගච්ඡති.

68. පින්වත් චිත්‍ර, අන්න ඒ විදිහම තමයි. "පින්වත් චිත්‍ර, යම් වෙලාවක විලාරික ශරීරය නම් තියෙන්නේ ඒ වෙලාවට මනෝමය ශරීරය තියෙනවා යන කරුණ ව්‍යවහාරයට එන්නේ නෑ. අරූපී ශරීරය තියෙනවා යන කරුණත් ව්‍යවහාරයට එන්නේ නෑ. ඒ වෙලාවේ දී ඔහු ගේ විලාරික ශරීරය විතරයි ව්‍යවහාරයට එන්නේ. පින්වත් චිත්‍ර, යම් වෙලාවක මනෝමය ශරීරය නම් තියෙන්නේ ඒ වෙලාවට විලාරික ශරීරය තියෙනවා යන කරුණ ව්‍යවහාරයට එන්නේ නෑ. අරූපී ශරීරය තියෙනවා යන කරුණත් ව්‍යවහාරයට එන්නේ නෑ. ඒ වෙලාවේ දී ඔහු ගේ මනෝමය ශරීරය විතරයි ව්‍යවහාරයට එන්නේ. පින්වත් චිත්‍ර, යම් වෙලාවක අරූපී ශරීරය නම් තියෙන්නේ ඒ වෙලාවට විලාරික ශරීරය තියෙනවා යන කරුණ ව්‍යවහාරයට එන්නේ නෑ. මනෝමය ශරීරය තියෙනවා යන කරුණත් ව්‍යවහාරයට එන්නේ නෑ. ඒ වෙලාවේ දී ඔහු ගේ අරූපී ශරීරය විතරයි ව්‍යවහාරයට එන්නේ."

69. සෙය්‍යථාපි චිත්ත ගවා ඛීරං, ඛීරම්හා දධි, දධිම්හා නවනීතං, නවනීතම්හා සප්පි, සප්පිම්හා සප්පිමණ්ඩෝ, යස්මිං සමයෝ ඛීරං හෝති, නේව තස්මිං සමයේ දධීති සංඛං ගච්ඡති. න නවනීතන්ති සංඛං ගච්ඡති. න සප්පීති සංඛං ගච්ඡති. න සප්පිමණ්ඩෝති සංඛං ගච්ඡති. ඛීරං ත්වේව තස්මිං සමයේ සංඛං ගච්ඡති. යස්මං සමයේ දධි හෝති ..... නවනීතං හෝති ..... සප්පි හෝති ..... යස්මිං සමයේ සප්පිමණ්ඩෝ හෝති, නේව තස්මිං සමයේ ඛීරන්ති සංඛං ගච්ඡති. න දධීති සංඛං ගච්ඡති. න නවනීතන්ති සංඛං ගච්ඡති. න සප්පීති සංඛං ගච්ඡති. සප්පිමණ්ඩෝත්වේව තස්මිං සමයේ සංඛං ගච්ඡති.

69. පින්වත් චිත්‍ර, ඒක මේ වගේ දෙයක්. ගව දෙනගෙන් කිරි ගන්නවා. කිරෙන් දී කිරි ගන්නවා. දී කිරෙන් වෙඩරු ගන්නවා. වෙඩරුවලින් ගිතෙල් ගන්නවා. ගිතෙලෙන් ගීමඩ ගන්නවා. එතකොට යම් වෙලාවක තියෙන්නේ කිරි නම්, ඒ වෙලාවට දී කිරි කියල ව්‍යවහාර වන්නේ නෑ. වෙඩරු කියල ව්‍යවහාර වන්නේ නෑ. ගිතෙල් කියල ව්‍යවහාර වන්නේ නෑ. ගීමඩ කියල ව්‍යවහාර වන්නේ නෑ. එතකොට ඒ වෙලාවෙදි ව්‍යවහාර වන්නේ කිරි කියල ම යි. යම් වෙලාවක තියෙන්නේ දී කිරි නම් ..... වෙඩරු නම්

..... ගිතෙල් නම් ..... යම් වෙලාවක තියෙන්නේ ගීමඩ නම්, ඒ වෙලාවට කිරි කියල ව්‍යවහාර වන්නේ නෑ. දී කිරි කියල ව්‍යවහාර වන්නේ නෑ. වෙඩරු කියල ව්‍යවහාර වන්නේ නෑ. ගිතෙල් කියල ව්‍යවහාර වන්නේ නෑ. එතකොට ඒ වෙලාවේ දී ව්‍යවහාර වන්නේ ගීමඩ කියල ම යි.

එවමේව ඛෝ චිත්ත යස්මිං සමයේ විළාරිකෝ අත්තපටිලාභෝ හෝති ..... යස්මිං චිත්ත සමයේ මනෝමයෝ අත්තපටිලාභෝ හෝති ..... යස්මිං චිත්ත සමයේ අරූපෝ අත්තපටිලාභෝ හෝති, නේව තස්මිං සමයේ විළාරිකෝ අත්තපටිලාභෝති සංඛං ගච්ඡති, න මනෝමයෝ අත්තපටිලාභෝ ති සංඛං ගච්ඡති. අරූපෝ අත්තපටිලාභෝ ත්වේව තස්මිං සමයේ සංඛං ගච්ඡති.

පින්වත් චිත්‍ර, අන්න ඒ විදිහම තමයි. "පින්වත් චිත්‍ර, යම් වෙලාවක විලාරික ශරීරය නම් තියෙන්නේ ..... පින්වත් චිත්‍ර, යම් වෙලාවක මනෝමය ශරීරය නම් තියෙන්නේ ..... පින්වත් චිත්‍ර, යම් වෙලාවක අරූපී ශරීරය නම් තියෙන්නේ ඒ වෙලාවට විලාරික ශරීරය තියෙනවා යන කරුණ ව්‍යවහාරයට එන්නේ නෑ. මනෝමය ශරීරය තියෙනවා යන කරුණත් ව්‍යවහාරයට එන්නේ නෑ. ඒ වෙලාවේ දී ඔහු ගේ අරූපී ශරීරය විතරයි ව්‍යවහාරයට එන්නේ."

ඉමා ඛෝ චිත්ත ලෝකසමඤ්ඤා, ලෝකනිරුත්තියෝ ලෝකවෝහාරා ලෝකපඤ්ඤත්තියෝ යාහි තථාගතෝ වෝහරති අපරාමසන්ති.

පින්වත් චිත්‍ර, මේවා ලෝක සම්මත නාමයන්. ලෝකයෙහි කථාබස් කරන ක්‍රමයන්. ලෝක ව්‍යවහාරයන්. ලෝකයේ සන්නිවේදන කරන ක්‍රමයන්. තථාගතයන් වහන්සේ ඒ කිසිවෙකට නොා පැටලී ව්‍යවහාර කරනවා.

70. ඒවං වුත්තේ පොට්ඨපාදෝ පරිබ්බාජකෝ භගවන්තං ඒතදවෝච: අභික්කන්තං භන්තේ, අභික්කන්තං භන්තේ. සෙය්‍යථාපි භන්තේ, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටි-ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරේ වා තේල පජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තෝ රූපානි දක්ඛින්තීති. ඒවමේව භන්තේ, භගවතා අනේකපරියායේන ධම්මෝ පකාසිතෝ. ඒසාහං භන්තේ භගවන්තං සරණං ග-ඡාමි ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. උපාසකං මං භන්තේ, භගවා ධාරේතු අජ්ජතග්ගේ පාණුපේතං සරණං ගතන්ති.

70. මෙහෙම දේශනා කළ විට පොට්ඨපාද පරිබ්බාජකයා භාග්‍යවතුන් වහන්සේට මේ විදිහට පවසා සිටියා "ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි. යටට හරවා තිබූ දෙයක් උඩු අතට හැරෙව්වා වගෙයි. වහලා තිබුණු දෙයක් ඇරලා පෙන්නුවා වගෙයි. මං මුලා වූවන්ට නියම මග පෙන්වා දෙනවා වගෙයි. ඇස් ඇති උදවියට රූප දකින්න අඳුරෙහි තෙල් පහනක් දල්වා ගෙන දරා සිටිනවා වගෙයි. ඔය විදිහට භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ශ්‍රී සද්ධර්මය වදාළා. ස්වාමීනී, මේ මමත් භාග්‍යවතුන් වහන්සේ ව සරණ යනවා. ශ්‍රී සද්ධර්මයත් ආර්ය මහා සංඝ රත්නයත් සරණ යනවා. ස්වාමීනී, මං ගැන අද පටන් දිවි තිබෙන තුරාවට ම තෙරුවන් සරණ ගිය උපාසකයෙක් ලෙස සළකන සේක්වා!

71. **චිත්තෝ පන හත්ථිසාරිපුත්තෝ භගවන්තං ඒතදවෝච: අභික්කන්තං භන්තේ, අභික්කන්තං භන්තේ. සෙය්‍යථාපි භන්තේ, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටි-ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරේ වා තේල පජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තෝ රූපානි දක්ඛින්තීති. ඒවමේව භන්තේ, භගවතා අනේකපරියායේන ධම්මෝ පකාසිතෝ. ඒසාහං භන්තේ භගවන්තං සරණං ග-ඡාමි ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. ලභෙය්‍යාහං භන්තේ භගවතෝ සන්තිකේ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති.**

71. හත්ථිසාරිපුත්ත චිත්‍රයන් ද භාග්‍යවතුන් වහන්සේට මේ විදිහට පවසා සිටියා "ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි. යටට හරවා තිබූ දෙයක් උඩු අතට හැරෙව්වා වගෙයි. වහලා තිබුණු දෙයක් ඇරලා පෙන්නුවා වගෙයි. මං මුලා වූවන්ට නියම මග පෙන්වා දෙනවා වගෙයි. ඇස් ඇති උදවියට රූප දකින්න අඳුරෙහි තෙල් පහනක් දල්වා ගෙන දරා සිටිනවා වගෙයි. ඔය විදිහට භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ශ්‍රී සද්ධර්මය වදාළා. ස්වාමීනී, මේ මමත් භාග්‍යවතුන් වහන්සේ ව සරණ යනවා. ශ්‍රී සද්ධර්මයත් ආර්ය මහා සංඝ රත්නයත් සරණ යනවා. ස්වාමීනී, මාත් භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි පැවිදි බව ලබනවා නම්, උපසම්පදාවත් ලබනවා නම් ඉතා යහපති.

72. **අලත්ථ ඛෝ චිත්තෝ හත්ථිසාරිපුත්තෝ භගවතෝ සන්තිකේ පබ්බජ්ජං. අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නෝ ඛෝ පනායස්මා චිත්තෝ**

හත්ථිසාරිපුත්තෝ ඒකෝ වූපකට්ඨෝ අප්පමත්තෝ ආතාපී පහිතත්තෝ විහරන්තෝ න චිරස්සේව යස්සත්ථාය කුලපුත්තා සම්මදේව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියෝසානං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා ස-ඡිකත්වා උපසම්පජ්ජ විහාසි, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි, අඤ්ඤතරෝ ච ඛෝ පනායස්මා චිත්තෝ හත්ථිසාරිපුත්තෝ අරහතං අහෝසීති.

72. ඉතින් හත්ථිසාරිපුත්ත චිත්‍රයන් භාග්‍යවතුන් වහන්සේ ගේ සමීපයෙහි පැවිද්ද ලබා ගත්තා. උපසම්පදාවත් ලබා ගත්තා. උපසම්පදාව ලබාගත් නොබෝ කලකින් ම ආයුෂ්මත් හත්ථිසාරිපුත්ත චිත්‍රයන් හුදෙකලා වුණා. පිරිසෙන් වෙන් වුණා. අප්‍රමාදී වුණා. කෙලෙස් තවන වීරියෙන් යුතු වුණා. දහමට දිවි පුදා ධර්මයේ හැසිරෙන කොට යම් කුල පුත්‍රයෙක් යම් කිසි බලාපොරොත්තුවකින් ගිහි ජීවිතය අත් හැරලා බුදු සසුනේ පැවිදි වුණා ද, අන්න ඒ උත්තරීතර බඹසර පූර්ණත්වය වන අමා නිවන මේ ජීවිතයෙහි දී ම විශේෂ ඤාණයකින් යුතුව අවබෝධ කරගෙන පැමිණ වාසය කළා. “ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කර ගත්තා. නිවන පිණිස කළ යුතු දේ කර ගත්තා. ආයෙමත් නම් වෙන උපතක් නැතැ”යි අවබෝධ වුණා. ආයුෂ්මත් හත්ථිසාරිපුත්ත චිත්‍ර තෙරුන් එක්තරා රහතන් වහන්සේ නමක් බවට පත් වුණා.

පොට්ඨපාදසුත්තං නිට්ඨිතං නවමං
නවවෙනි පොට්ඨපාද සූත්‍රය නිමා විය.

සාදු ! සාදු !! සාදු !!!

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

10.
සුභසුත්තං
සුභ මාණවකයාට වදාළ දෙසුම

1. එවං මේ සුතං. එකං සමයං ආයස්මා ආනන්දෝ සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ අචිරපරිනිබ්බුතේ භගවති. තේන ඛෝ පන සමයේන සුභෝ මාණවෝ තෝදෙය්‍යපුත්තෝ සාවත්ථියං පටිවසති කේනචිදේව කරණීයේන.

1. මා හට අසන්ට ලැබුණේ මේ විදිහට යි. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑමෙන් වැඩිකලක් ගත නොවුණ ඒ දිනවල ආයුෂ්මත් ආනන්දයන් වහන්සේ වැඩ සිටියේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුතුමා ගේ ආරාමයේ. ඒ දිනවල ම තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයා කිසියම් කරුණක් වෙනුවෙන් සැවැත් නුවර නැවතිලා හිටියා.

2. අථ ඛෝ සුභෝ මාණවෝ තෝදෙය්‍යපුත්තෝ අඤ්ඤතරං මාණවකං ආමන්තේසි: එහි ත්වං මාණවක, යේන සමණෝ ආනන්දෝ තේනුපසංකම. උපසංකමිත්වා මම වචනේන සමණං ආනන්දං අප්පාබාධං අප්පාතංකං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ "සුභෝ මාණවෝ තෝදෙය්‍යපුත්තෝ භවන්තං ආනන්දං අප්පාබාධං අප්පාතංකං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතී"ති. එවං ච වදේහි "සාධු කිර භවං ආනන්දෝ යේන සුභස්ස මාණවස්ස තෝදෙය්‍යපුත්තස්ස නිවේසනං තේනුපසංකමතු අනුකම්පං උපාදායා"ති.

2. එදා තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයා එක්තරා මාණවකයෙකු ඇමතුවා. "එම්බා මාණවකය, මෙහෙ එන්න. ආනන්ද ශ්‍රමණයන් වහන්සේ වෙත යන්න. ගිහින් මගේ වචනයෙන් ආනන්ද ශ්‍රමණයන් වහන්සේගෙන් ලෙඩදුක් අඩුබව, කරදර අඩුබව, සැහැල්ලු බව, කායබලය, පහසු විහරණය ගැන අහන්න. "තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයා භවත් ආනන්දයන් වහන්සේගෙන් ලෙඩදුක් අඩුබව, කරදර අඩුබව, සැහැල්ලු බව, කායබලය, පහසු විහරණය ගැන අහනවා" කියල. මෙහෙමත් කියන්න. භවත් ආනන්දයන් වහන්සේ අනුකම්පාව උපදවාගෙන තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයා ගේ නිවස කරා වඩින සේක් නම් ඉතා හොඳයි" කියල.

3. ඒවං භෝති ඛෝ සෝ මාණවකෝ සුභස්ස මාණවස්ස තෝදෙය්‍යපුත්තස්ස පටිස්සුත්වා යේනායස්මා ආනන්දෝ තේනුපසංකමි. උපසංකමිත්වා ආයස්මතා ආනන්දේන සද්ධිං සම්මෝදි. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නෝ ඛෝ සෝ මාණවකෝ ආයස්මන්තං ආනන්දං ඒතදවෝච: සුභෝ මාණවෝ තෝදෙය්‍යපුත්තෝ භවන්තං ආනන්දං අප්පාබාධං අප්පාතංකං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. ඒවං ච වදේති "සාධු කිර භවං ආනන්දෝ යේන සුභස්ස මාණවස්ස තෝදෙය්‍යපුත්තස්ස නිවේසනං තේනුපසංකමතු අනුකම්පං උපාදායා"ති.

3. "එසේය භවත" කියල ඒ මාණවකයා තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයාට පිළිතුරු දී ආයුෂ්මත් ආනන්දයන් වහන්සේ වෙත පැමිණුනා. "පැමිණ ආයුෂ්මත් ආනන්දයන් වහන්සේ සමග සතුටු වුණා. සතුටු විය යුතු පිළිසඳර කථාබහ අවසන් කොට එකත්පස්ව වාඩි වුණා. එකත්පස්ව වාඩිවුණ ඒ මාණවකයා ආයුෂ්මත් අනඳ තෙරුන් හට මෙකරුණ පැවසුවා. "තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයා භවත් ආනන්දයන් වහන්සේගෙන් ලෙඩදුක් අඩුබව, කරදර අඩුබව, සැහැල්ලු බව, කායබලය, පහසු විහරණය ගැන අහනවා" කියල. මෙහෙමත් කියනවා. භවත් ආනන්දයන් වහන්සේ අනුකම්පාව උපදවාගෙන තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයා ගේ නිවස කරා වඩින සේක් නම් ඉතා හොඳයි" කියල.

4. ඒවං වුත්තේ ආයස්මා ආනන්දෝ තං මාණවකං ඒතදවෝච: අකාලෝ ඛෝ මාණවක. අත්ථි මේ අජ්ජ භේසජ්ජමත්තා පීතා. අප්පේවනාම ස්වේපි උපසංකමෙය්‍යාම කාලඤ්ච සමයඤ්ච උපාදායාති. ඒවං භෝති ඛෝ සෝ මාණවකෝ ආයස්මතෝ ආනන්දස්ස පටිස්සුත්වා උට්ඨායාසනා යේන සුභෝ මාණවෝ තෝදෙය්‍යපුත්තෝ තේනුපසංකමි. උපසංකමිත්වා සුභං මාණවං තෝදෙය්‍යපුත්තං ඒතදවෝච: "අවෝචුම්හ ඛෝ මයං භෝතෝ තං භවන්තං ආනන්දං: සුභෝ මාණවෝ තෝදෙය්‍යපුත්තෝ භවන්තං ආනන්දං අප්පාබාධං අප්පාතංකං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. ඒවං ච වදේති "සාධු කිර භවං ආනන්දෝ යේන සුභස්ස මාණවස්ස තෝදෙය්‍යපුත්තස්ස නිවේසනං තේනුපසංකමතු අනුකම්පං උපාදායා"ති. ඒවං වුත්තේ භෝ සමණෝ ආනන්දෝ මං ඒතදවෝච: අකාලෝ ඛෝ මාණවක. අත්ථි මේ අජ්ජ භේසජ්ජමත්තා පීතා. අප්පේවනාම ස්වේපි උපසංකමෙය්‍යාම කාලඤ්ච සමයඤ්ච උපාදායා"ති. එත්තාවතාපි ඛෝ භෝ කතමේව ඒතං, යතෝ සෝ භෝ භවං ආනන්දෝ විකාසමකාසි ස්වාතනායපි උපසංකමනායා"ති.

4. මෙසේ කී කල්හී ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඒ මාණවකයාට මෙය පැවසුවා. "පින්වත් මාණවකය, මේ සුදුසු කාලය නොවේ. මා අද බෙහෙත් ස්වල්පයක් වළඳල තියෙන්නේ. කල්වේලා සළකා හෙට දවසේ දීවත් මට පැමිණෙන්ට පුළුවන් වේවි." "එසේය භවත" කියල ඒ මාණවකයා ආයුෂ්මත් අනඳ තෙරුන් හට පිළිතුරු දී අසුනෙන් නැගිට තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයා වෙත පැමිණුනා. පැමිණිලා තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයාට මෙහෙම කිව්වා. "භවතාණන් ගේ වචනයෙන් ඒ භවත් ආනන්දයන් හට එකරුණ සැළ කළා. "තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයා භවත් ආනන්දයන් වහන්සේගෙන් ලෙඩදුක් අඩුබව, කරදර අඩුබව, සැහැල්ලු බව, කායබලය, පහසු විහරණය ගැන අහනවා" කියල. මෙහෙමත් කියනවා. භවත් ආනන්දයන් වහන්සේ අනුකම්පාව උපදවාගෙන තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයා ගේ නිවස කරා වඩින සේක් නම් ඉතා හොඳයි" කියල. ඉතින් භවත, මෙසේ කී විට ආනන්ද ශ්‍රමණයන් වහන්සේ මට මෙහෙම පැවසුවා. "පින්වත් මාණවකය, මේ සුදුසු කාලය නොවේ. මා අද බෙහෙත් ස්වල්පයක් වළඳල තියෙන්නේ. කල්වේලා සළකා හෙට දවසේ දීවත් මට පැමිණෙන්ට පුළුවන් වේවි" කියල. ඉතින් යම් හෙයකින් භවත, ඒ භවත් ආනන්දයන් හෙට දවසේ දීවත් මෙහි පැමිණෙන්නට අවකාශ ලබා ගන්නවා යන කරුණ මෙතෙකින් ම මා කර ගත්තා.

5. අථ ඛෝ ආයස්මා ආනන්දෝ තස්සා රත්තියා අච්චයේන පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය චේතකේන භික්ඛුනා පච්ඡාසමණේන යේන සුභස්ස මාණවස්ස තෝදෙය්‍යපුත්තස්ස නිවේසනං තේනුපසංකමි. උපසංකමිත්වා පඤ්ඤත්තේ ආසනේ නිසීදි. අථ ඛෝ සුභෝ මාණවෝ තෝදෙය්‍යපුත්තෝ යේනායස්මා ආනන්දෝ තේනුපසංකමි. උපසංකමිත්වා ආයස්මතා ආනන්දේන සද්ධිං සම්මෝදි. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදි.

5. ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඒ රෑ ඇවැමෙන් උදේ වරුවේ සිවුරු හැඳපොරවා පාසිවුරු ගෙන චේතක භික්ෂුව තමා සමග පසුපසින් වඩින ශ්‍රමණ කෙනෙක් හැටියට රැගෙන තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයා ගේ නිවස කරා වැඩම කළා. වැඩම කොට පණවන ලද අසුනේ වැඩ සිටියා. එතකොට තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයා ආයුෂ්මත් ආනන්ද තෙරුන් වෙත පැමිණුනා. පැමිණිලා ආයුෂ්මත් ආනන්ද තෙරුන් සමග සතුටු වුණා. සතුටුවිය යුතු පිළිසඳර කථා බහේ යෙදිලා එකත්පස්ව වාඩි වුණා.

6. ඒකමන්තං නිසින්නෝ ඛෝ සුභෝ මාණවෝ තෝදෙය්‍යපුත්තෝ ආයස්මන්තං ආනන්දං ඒතදවෝච: "භවං හි ආනන්දෝ තස්ස භෝතෝ ගෝතමස්ස දීඝරත්තං උපට්ඨාකෝ සන්තිකාවචරෝ සමීපචාරී. භවං ඒතං ආනන්දෝ ජානෙය්‍ය යේසං සෝ භවං ගෝතමෝ ධම්මානං වණ්ණවාදී අහෝසි, යත්ථ ච ඉමං ජනතං සමාදපේසි නිවේසේසි පතිට්ඨාපේසි. කතමේසානං ඛෝ භෝ ආනන්ද ධම්මානං සෝ භවං ගෝතමෝ වණ්ණවාදී අහෝසි? කත්ථ ච ඉමං ජනතං සමාදපේසි නිවේසේසි පතිට්ඨාපේසි?"ති.

6. එකත්පස්ව වාඩිවුණ තෝදෙය්‍ය පුත්‍ර සුභ මාණවකයා ආයුෂ්මත් ආනන්ද තෙරුන් හට මෙය පැවසුවා. "භවත් ආනන්දයන් වහන්සේ ඒ භවත් ගෞතමයන් වහන්සේ හට බොහෝ කාලයක් උපස්ථායක වශයෙන් ළඟින් ම හැසිරෙමින් සමීපව හැසිරෙමින් සිටියා. ඒ භවත් ගෞතමයන් වහන්සේ යම් ධර්මයන් පිළිබඳව ගුණ කියනවා නම්, ඒ ධර්මයන් තුළ ම මේ ජනතාව සමාදන් කරවනවා නම්, පිවිසවනවා නම්, පිහිටුවනවා නම් අන්න ඒ කරුණ ආයුෂ්මත් ආනන්දයන් වහන්සේ දන්නවා. භවත් ආනන්දයෙනි, ඒ භවත් ගෞතමයන් වහන්සේ කවර ධර්මයන් ද වර්ණනා කොට වදාළේ? කවර ධර්මයන් තුළ ද මේ ජනතාව සමාදන් කෙරෙව්වේ, ඇතුළු කෙරෙව්වේ, පිහිටෙව්වේ?"

7. "තිණ්ණං ඛෝ මාණව ඛන්ධානං සෝ භගවා වණ්ණවාදී අහෝසි. එත්ථ ච ඉමං ජනතං සමාදපේසි නිවේසේසි පතිට්ඨාපේසි. කතමේසං තිණ්ණං? අරියස්ස සීලක්ඛන්ධස්ස, අරියස්ස සමාධික්ඛන්ධස්ස, අරියස්ස පඤ්ඤක්ඛන්ධස්ස. ඉමේසං ඛෝ මාණව තිණ්ණං ඛන්ධානං සෝ භගවා වණ්ණවාදී අහෝසි. එත්ථ ච ඉමං ජනතං සමාදපේසි නිවේසේසි පතිට්ඨාපේසී"ති.

7. "පින්වත් මාණවකය, ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධස්කන්ධයක් ගැන වර්ණනා කොට වදාළා. එහි ම මේ ජනතාව සමාදන් කොට වදාළා. ඇතුළු කොට වදාළා. පිහිටුවා වදාළා. කවර තුනක ද යත්? ආර්යය වූ සීලස්කන්ධයත්, ආර්යය වූ සමාධිස්කන්ධයත්, ආර්යය වූ ප්‍රඥස්කන්ධයත් යන තුන යි. පින්වත් මාණවකය ඒ භාග්‍යවතුන් වහන්සේ මේ ත්‍රිවිධස්කන්ධයන් ගැන තමයි වර්ණනා කොට වදාළේ. එහි ම තමයි මේ ජනතාව සමාදන් කොට වදාළේ. ඇතුළු කොට වදාළේ. පිහිටුවා වදාළේ.

8. “කතමෝ පන සෝ භෝ ආනන්ද අරියෝ සීලක්ඛන්ධෝ යස්ස සෝ භවං ගෝතමෝ වණ්ණවාදී අහෝසි, යත්ථ ච ඉමං ජනතා සමාදපේසි නිවේසේසි පතිට්ඨාපේසී?”ති.

8. “භවත් ආනන්දයන් වහන්ස, ඒ භවත් ගෞතමයන් වහන්සේ යම් ධර්මයක් වර්ණනා කළ සේක් නම්, යම් ධර්මයක් තුළ මේ ජනතාව සමාදන් කරවූ සේක් නම්, ඇතුළු කළ සේක්නම්, පිහිට වූ සේක් නම් ඒ ආර්ය වූ සීලස්කන්ධය කුමක් ද?”

9. ඉධ මාණව තථාගතෝ ලෝකේ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣේකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසේති.

28. පින්වත් මාණවකය, මෙහි අරහත් වූ සම්මාසම්බුද්ධ වූ විජ්ජාචරණසම්පන්න වූ සුගත වූ ලෝකවිදූ වූ අනුත්තර පුරිසදම්ම සාරථී වූ, සත්ථා දේවමනුස්සානං වූ, බුද්ධ වූ, භගවා වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපත ලබනවා. උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙව්මිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඤාණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා.

10. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තෝ වා අඤ්ඤතරස්මිං වා කුලේ ප-ච්චාජාතෝ. සෝ තං ධම්මං සුත්වා තථාගතේ සද්ධං පටිලභති. සෝ තේන සද්ධාපටිලාභේන සමන්නාගතෝ ඉති පටිසංචික්ඛති: “සම්බාධෝ ඝරාවාසෝ රජෝපථෝ. අබ්භෝකාසෝ පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා ඒකන්තපරිපුණ්ණං ඒකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය”න්ති.

10. එතකොට ගෘහපතියෙක් වේවා, ගෘහපති පුත්‍රයෙක් වේවා කවර හෝ කුලයක උපන් කෙනෙක් වේවා ඒ ධර්මය අසනවා. ඔහු ඒ ධර්මය අසලා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ගන්නවා. ඉතින් ඔහු ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වෙලා මේ විදිහට නුවණින් කල්පනා කරනවා. "ගිහි ගෙදර වාසය කිරීම හරිම කරදරයක්. කෙලෙස් වැඩෙන මාවතක්. නමුත් පැවිදි ජීවිතය ආකාසය වගේ. ගිහි ගෙදර වාසය කරමින් මුළුමණින් ම පිරිපුන්, මුළුමණින් ම පිරිසිදු, සුදෝසුදු බඹසර වසනවා යන කරණ ලෙහෙසි එකක් නොවේ. ඒ නිසා මං කෙස් රැවුල් බාලා, කසාවත් පොරොවා ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට ඇතුළත් වෙන එක තමයි හොඳ" කියලා.

11. **සෝ අපරේන සමයේන අප්පං ව භෝගක්ඛන්ධං පහාය මහන්තං වා භෝගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ජාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සෝ ඒවං පබ්බජිතෝ සමානෝ පාතිමොක්ඛසංවරසංවුතෝ විහරති, ආචාරගෝචරසම්පන්නෝ, අණුමත්තේසු වජ්ජේසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදේසු, කායකම්මවචිකම්මේන සමන්නාගෝ කුසලේන, පරිසුද්ධාජීවෝ, සීලසම්පන්නෝ, ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ, භෝජනේ මත්තඤ්ඤූ, සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ සන්තුට්ඨෝ.**

11. ඔහු පස්සෙ කාලෙක ස්වල්ප වූ භෝග සම්පත් අත්හරිනවා. මහත් වූ භෝග සම්පත් අත්හරිනවා. ස්වල්ප වූ නෑදෑයන් අත්හරිනවා. මහත් වූ නෑදෑයන් අත්හරිනවා. කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙනවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් (පැවිද්දෙක් විසින් රැකගත යුතු නිවනට උපකාරී වන උතුම් සිල්පදවලින්) සංවරව ඉන්නවා. යහපත් ඇවැතුම් පැවැතුම්වලින් යුතු වෙනවා. අණුමාත්‍ර වූ වරදෙහි පවා භය දකිනවා. සික්ෂාපදවල සමාදන්ව හික්මෙනවා. කුසල්සහගත කායකර්මයෙන් හා වචිකර්මයෙන් යුතු වෙනවා. පිරිසිදු ආජීවයෙන් යුතු වෙනවා. සිල්වත් වෙනවා. අකුසලයෙන් වැළකූ දොරටු ඇතුව ඉන්නවා. නුවණින් සළකා ආහාර ගන්නවා. සිහිනුවණින් යුතුව ඉන්නවා. ලද දෙයින් සතුටුව ඉන්නවා.

12. **කථඤ්ච මාණව භික්ඛු සීලසම්පන්නෝ හෝති? ඉධ මාණව භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ හෝති. නිහිතදණ්ඩෝ නිහිතසත්ථෝ ලජ්ජී දයාපන්නෝ සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

12. පින්වත් මාණවකය, භික්ෂුව සීලයෙන් යුක්ත වන්නේ කොහොම ද? පින්වත් මාණවකය, මෙහි භික්ෂුව සතුන් මැරීම අත්හැර දාල සතුන් මැරීමෙන් වැළකී ඉන්නවා. දඬු මුගුරු අත් හැර දාල, අවි ආයුධ බැහැර කරලා, පවට ලැජ්ජා ඇතිව ඉන්නවා. සතුන් කෙරෙහි දයාවන්ත වෙනවා, සියව් ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පිව වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

13. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතෝ හෝති. දින්නාදායී දින්නපාටිකංඛී අථේනේන සුචිභූතේන අත්තනා විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

13. නුදුන් දේ ගැනීම අත් හැරලා නුදුන් දේ ගැනීමෙන් වැළකී ඉන්නවා. දුන් දේ පමණක් පිළිගන්නවා. දුන් දේ පමණක් පිළිගනු කැමති වෙනවා. සොර රහිත සිතින් යුතු වූ පිරිසිදු සිතින් යුතු වූ ජීවිතයකින් වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

14. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හෝති. ආරාචාරී විරතෝ මේථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

14. අබ්‍රහ්මචාරී බව අත් හැරලා බ්‍රහ්මචාරීව ඉන්නවා. ලාමක දෙයක් වූ මෛථුන සේවනයෙන් වැළකී එය දුරින් ම දුරුකර දමනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

15. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතෝ හෝති. ස-චවාදී ස-චසන්ධෝ ථේතෝ ප-චයිකෝ අවිසංවදකෝ ලෝකස්ස. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

15. බොරු කීම අත් හැරල, බොරු කීමෙන් වැළකී ඉන්නවා. සත්‍යය කථා කරනවා. ඇත්තෙන් ඇත්ත ගලපනවා. ස්ථිරව පිහිටලා කථාකරනවා. පිළිගත හැකි දේ කථා කරනවා. ලෝකයාව රවටන්නේ නෑ. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

16. පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතෝ හෝති. ඉතෝ සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමේසම්භේදාය. අමුත්‍ර වා සුත්වා න ඉමේසං අක්ඛාතා අමූසම්භේදාය. ඉති භින්නානං වා සන්ධාතා සංහිතානං වා අනුප්පදාතා. සමග්ගාරාමෝ සමග්ගරතෝ සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

16. කේලාම් කීම අත්හැරලා කේලාම් කීමෙන් වැළකී ඉන්නවා. මෙතැනින් අහලා මේ අය බිඳවන්නට අතන කියන්නෙ නෑ. අතනින් අහලා ඒ උදවිය බිඳවන්නට මෙතැන කියන්නේ නෑ. මේ අයුරින් බිඳුනු උදවිය සමගි කරවනවා. සමගි වූවන්ට අනුබල දෙනවා. සමගි වූවන් හා වාසයට කැමතියි. සමගි වූවන් හා එක්ව වසනවා. සමගි වූවන් සමග සතුටු වෙනවා. සාමය උදෙසා සාමකාමී වචන කතා කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

17. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතෝ හෝති. යා සා වාචා නේළා කණ්ණසුඛා පේමනීයා හදයංගමා පෝරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

17. පරුෂ වචනය අත් හැරලා පරුෂ වචනයෙන් වැළකී ඉන්නවා. යම් වචනයක් දොස් රහිත නම්, කණට සැප නම්, ආදරවන්ත නම්, හෘදයාංගම නම්, ශිෂ්ට සම්පන්න නම්, බොහෝ ජනයා කැමති නම්, බොහෝ ජනයාට ප්‍රියමනාප නම් එබඳු වූ වචන පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

18. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතෝ හෝති. කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී, නිධානවතිං වාචං භාසිතා හෝති කාලේන සාපදේසං පරියන්තවතිං අත්ථසංහිතං. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

18. තේරුමක් නැති කතා බහ අත් හැරලා තේරුමක් නැති කතා කීමෙන් වැළකී සිටිනවා. කල් යල් බලා කථා කරනවා. ඇත්ත කතා කරනවා. අර්ථවත් දෙය කතා කරනවා. ධර්මය ම කථා කරනවා. විනය ම කථා කරනවා. සිත්හි ලා දරාගැනීමට සුදුසු, වෙලාවට ගැලපෙන උපදේශ සහිත වූ, මදිපාඩුකම් නො තබා, ප්‍රමාණවත් පරිදි, දෙලොව යහපත පිණිස වූ දේ පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

19. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඒකභත්තිකෝ රත්තූපරතෝ පටිවිරතෝ විකාලභෝජනා. න-චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතෝ හෝති. මාලාගන්ධවිලේපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතෝ හෝති. උ-චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ජාතරූපරජත පටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකමංසපටිග්ගහණා පටිවිරතෝ හෝති. ඉත්ථිකුමාරික-

පටිග්ගහණා පටිවිරතෝ හෝති. දාසිදාසපටිග්ගහණා පටිවිරතෝ හෝති. අජේළකපටිග්ගහණා පටිවිරතෝ හෝති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතෝ හෝති. හත්ථිගාවස්සවළවාපටිග්ගහණා පටිවිරතෝ හෝති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතෝ හෝති. දූතෙය්‍ය පහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. කයවික්කයා පටිවිරතෝ හෝති. තුලාකූටකංසකූට-මානකූට පටිවිරතෝ හෝති. උක්කෝටනාවඤ්චනනිකතිසාචියෝගා පටිවිරතෝ හෝති. ඡේදනවධබන්ධනවිපරාමෝසආලෝපසහසාකාරා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

19. පැලවෙන බීජ හා පැල වුණ ගස් කොළන් විනාශ කිරීමෙන් වැළකී ඉන්නවා. එක් වරුවේ බොජුන් වළඳනවා. රාත්‍රී ආහාරයෙන් වැළකී විකාල භෝජනයෙන් වැළකී ඉන්නවා. නැටුම්, ගැයුම්, වැයුම් හා විසූක දර්ශනයන් නැරඹීමෙන් වැළකී ඉන්නවා. මල් සුවඳ විලවුන් දැරීමෙන් ද ඇඟපත සැරසීමෙන් ද විසිතුරු වස්ත්‍රාභරණයෙන් සැරසීමෙන් ද වැළකී ඉන්නවා. ප්‍රමාණය ඉක්ම වූ උස් ආසන ද වටිනා සුඛෝපභෝගී ආසන ද පරිහරණයෙන් වැළකී ඉන්නවා. රන් රිදී මිල මුදල් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු ධාන්‍ය පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු මස් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ස්ත්‍රීන්, කුමරියන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. දැසි දස්සන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. එළුබැටළුවන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කුකුළන් ඌරන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ඇතුන් ගවයන් අසුන් වෙළඹුන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කෙත් වතු පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ගිහි කටයුතු සඳහා දූත මෙහෙවර කිරීමෙන් වැළකී ඉන්නවා. වෙළඳාම් කිරීමෙන් වැළකී ඉන්නවා. තරාදියෙන් රැවටීම, නො වටනා දෙයින් රැවටීම, මිනුමෙන් රැවටීම යන මෙයින් වැළකී ඉන්නවා. අල්ලස් ගෙන හිමිකරුවන් ගේ දේ අහිමි කිරීම, වංචා කිරීම, බාලදේ වටිනා දේ හැටියට පෙන්වීම, ආදී නොයෙක් වංචනික දෙයින් වැළකී ඉන්නවා. අත්පා කැපීම් මැරීම් බන්ධන කිරීම් මං පැහැරගැනීම්, ගම් පැහැර ගැනීම් ආදී සැහැසි දෙයින් වැළකී සිටිනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

චුල්ලසීලං නිට්ඨිතං
චූලසීලය නිමාවිය

20. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා**

විහරන්ති සෙය්‍යථීදං: මූලබීජ ඛන්ධබීජං එව්බීජං අග්ගබීජං බීජබීජමේව පඤ්චමං. ඉති වා ඉති ඒවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

20. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ විදිහේ පැලවෙන දේ හා ගස් කොළන් ආදිය වනසමින් ඉන්නවා. ඒ කියන්නේ මුලින් පැලවෙන දේවල්, කඳින් පැලවෙන දේවල්, පුරුකින් පැලවෙන දේවල්, දල්ලෙන් පැලවෙන දේවල්, බිජුවටින් පැලවෙන දේවල් යන ආදිය වනසමින් ඉන්නවා. ගස් කොළන් සිඳලීම් ආදී මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලිනුත් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

21. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප සන්නිධිකාරපරිභෝග අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉති ඒවරූපා සන්නිධිකාරපරිභෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

21. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ දේ රැස්කරගෙන පරිභෝග කරමින් වාසය කරනවා. ඒ කියන්නේ කෑම වර්ග රැස් කරලා තියා ගන්නවා. බීම වර්ග රැස් කරලා තියා ගන්නවා. වස්ත්‍ර රැස් කරලා තියා ගන්නවා. යාන වාහන රැස් කරලා තියා ගන්නවා. ඇඳ පුටු මේස රැස් කරලා තියා ගන්නවා. සුවඳ වර්ග රැස් කරලා තියා ගන්නවා. තවත් ආමිස රැස් කරලා තියා ගන්නවා. මෙවැනි හෝ මෙවැනි වෙනත් දේවල් හෝ රැස්කරගෙන පරිහරණය කිරීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

22. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: න-ච නීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වේතාලං කුම්භථූනං සෝභනකං චණ්ඩාලං වංසං ධෝවන හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යෝධිකං බලග්ගං සේනාබ්‍යූහං අනීකදස්සනං. ඉති වා ඉති ඒවරූපා විසූකදස්සනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

22. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයේ විසූක දර්ශනයන් නැරඹීමෙහි යෙදිල ඉන්නවා. ඒ කියන්නේ නැටුම්, ගැයුම්, වැයුම්, නාටක, පැරණි කථා රහදැක්වීම්, අත්තල ගසා නැටීම්, වේතාල නැටීම්, බෙර වාදන කිරීම්, රහමඩළෙහි දේවතාවන්ට පූජා පිණිස නැටීම්, උණ ගසින් කරන ක්‍රීඩා, මිනී ඇට මැද තබා වටකොට නැටීම්, ඇත් යුධ බැලීම්, අස්ව යුධ බැලීම්, ගොන් පොර බැලීම්, එළු පොර බැලීම්, බැටළු පොර බැලීම්, කුකුළු පොර බැලීම්, වටු පොර බැලීම්, පොව් හරඹ බැලීම්, මිටි හරඹ බැලීම්, මල්ලව පොර බැලීම්, යුධ සේනා බලන්ට යෑම, බලසෙන් ගණින තැන් බලන්ට යාම, බලසෙනඟ විසිරුවන තැන් බලන්ට යාම ආදී දේවල්වල යෙදෙමින් ඉන්නවා. මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලින් යුතු විසූක දර්ශන නැරඹීම්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

23. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං ජූතප්පමාදට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පංගචීරං වංක්කං මොක්ඛචිකං චිංගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනේසිකං යථාවජ්ජං. ඉති වා ඉති ඒවරූපා ජූතප්පමාදට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

23. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල තමාව ප්‍රමාදයට පත් කරවන මේ ආකාර වූ සූදු කෙළියෙන් කල් යවනවා. ඒ කියන්නේ හතරැස් කොටු අටකින් යුතුව කරණ සූදුව, කොටු දහයකින් කරන සූදුව, අහසේ රූ අඳිමින් කරන සූදුව, කොටු පැනීමෙන් කරණ සූදුව, සන්තික නම් වූ සූදුව, දාදු කැටයෙන් කරන සූදුව, කල්ලි ගැසුම, බුරුවා ගැසීම, ගුළ කෙළිය, නළා පිඹීම, කරණම් ගැසීම, මුගුරක් ගෙන උඩ යට වැටෙන පරිදි උඩට ගැසීම, කොළවලින් කළ ගොටුවලින් තරහෙට වැලි මැනීම, කුඩා රිය තරහ, කුඩා දුනුවලින් විදීමේ තරහ, අකුරු ලිවීමේ සෙල්ලම, සිතූ දේ කියන සෙල්ලම, විකලාංග අනුකරණයෙන් හිනැස්සීමේ සෙල්ලම ආදී දේ කිරීමයි. මේ දෙයිනුත් මෙවැනි තවත් දේවල් ඇත්නම් එයිනුත් වැළකී ප්‍රමාදයට පත්වන සූදුවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

24. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං උ-චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: ආසන්දිං පල්ලංකං ගෝනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලෝමිං ඒකන්තලෝමිං කට්ඨිස්සං කෝසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවේණිං කාදලිමිගපවරප-ච-ත්ථරණං සඋත්තර-ඡදං උභතෝලෝහිතකූපධානං. ඉති වා ඉති ඒවරූපා උ-චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

24. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ පමණ ඉක්මවා උස් වූ ආසනත් වටිනා සුඛෝපභෝගී ආසනත් පරිහරණය කරනවා. ඒ කියන්නේ දිග හාන්සි පුටු, කවිච්චි, ලොකු පලස් යෙදූ ආසන, විසිතුරු ගෙත්තම් කළ එළු ලොම් ඇතිරිළි, සුදු එළු ලොමින් කළ ඇතිරිළි, මල් යෙදූ එළු ලොමින් කළ ඇතිරිළි, පුළුන් යෙදූ මෙට්ට, සත්ව රූපවලින් සැරසූ එළු ලොම් ඇතිරිළි, මුළුමණින්ම එළු ලොමින් කළ ඇතිරිළි, රන් නූලෙන් සැරසූ කලාල, පට නූලෙන් කළ කලාල, නාටිකාංගනාවන් ඒ මත නැටිය හැකි එළු ලොමින් කළ කලාල, ඇතුන් පිට යොදන ඇතිරිළි, අසුන් පිට යොදන ඇතිරිළි, රථවල යොදන ඇතිරිළි, අඳුන් දිවි සමෙන් කළ ඇතිරිළි, කදලි මුව සමින් කළ කලාල, හිස දෙපැත්තට රතු විල්විද කොට්ට තබා රතු උඩුවියන් බැඳ සැදූ වටිනා යහන් ආදිය පරිහරණය කරයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී උස් අසුන් මහා අසුන් පරිහරණයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

25. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: උ-ජ්ජාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලේපනං මුඛචුණ්ණකං මුඛාලේපනං හත්ථබන්ධං සිඛාන්ධං දණ්ඩකං නාළිකං අසිං ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවිජනිං විදානානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති ඒවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

25. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් ඇඟපත සැරසීමෙන් හා විසිතුරු වස්ත්‍රාභරණ පැළඳීමෙන් යුක්තව කල් ගෙවනවා. ඒ කියන්නේ සුවඳ වර්ග ඇඟ තවරා සිරුර සිනිඳු කිරීම, තෙල් වර්ග ගා සම්බාහනය කොට

සිරුර හැඩ කිරීම, සුවඳපැන් නෑම, උරහිස් ආදියෙහි මස් වැඩීමට මුගුරෙන් තැලීම, කැඩපතින් මුහුණ බලා සැරසීම, ඇස්වල අඳුන් ගෑම, මල් හා සුවඳ විලවුන් දැරීම, මුව සුවඳ කිරීම, මුව විලවුන් දැරීම, අත්වල ආභරණ දැමීම, හිසෙහි කුඩුම්බි දැරීම, විසිතුරු සැරයැටි දැරීම, විසිතුරු බෙහෙත් නල දැරීම, විසිතුරු කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නලල් පට දැරීම, මැණික් පැළඳීම, චාමර දැරීම, දිග වාටි ඇති සුදු වස්ත්‍ර දැරීම ආදියෙන් යුතුවෙයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී ඇහපත සැරසීම් හා විසිතුරු වස්ත්‍රාභරණ සැරසීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

26. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං තිර-ඡානකථ‍ං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද‍ං: රාජකථ‍ං චෝරකථ‍ං මහාමත්තකථ‍ං සේනාකථ‍ං භයකථ‍ං යුද්ධකථ‍ං අන්නකථ‍ං පානකථ‍ං වත්ථකථ‍ං සයනකථ‍ං මාලාකථ‍ං ගන්ධකථ‍ං ඤාතිකථ‍ං යානකථ‍ං ගාමකථ‍ං නිගමකථ‍ං නගරකථ‍ං ජනපදකථ‍ං ඉත්ථීකථ‍ං පුරිසකථ‍ං (කුමාරකථ‍ං කුමාරිකථ‍ං) සූරකථ‍ං විසිඛාකථ‍ං කුම්භට්ඨානකථ‍ං පුබ්බපේතකථ‍ං නානත්තකථ‍ං ලෝකක්ඛායිකථ‍ං සමුද්දක්ඛායිකථ‍ං ඉතිභවාභවකථ‍ං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මි‍ං.

26. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරිසන් කථාවල යෙදී වාසය කරනවා. ඒ කියන්නේ, රජවරුන් ගැන කථා, සොරුන් ගැන කථා, මහ ඇමතිවරුන් ගැන කථා, හමුදාවන් ගැන කථා, භය ඇතිවෙන දේවල් ගැන කථා, ආහාර වර්ග ගැන කථා, බොන දේවල් ගැන කථා, ඇඳුම් පැළඳුම් ගැන කථා, ඇඳ පුටු ගැන කථා, මල් වර්ග ගැන කථා, සුවඳ වර්ග ගැන කථා, නෑදෑයන් ගැන කථා, යාන වාහන ගැන කථා, ගම්මාන ගැන කථා, නියම් ගම්මාන ගැන කථා, නගර ගැන කථා, රටවල් ගැන කථා, ස්ත්‍රීන් ගැන කථා, පුරුෂයින් ගැන කථා, කුමාරයින් ගැන කථා, කුමාරියන් ගැන කථා, ශූරයින් ගැන කථා, මංමාවත් ගැන කථා, වලං පොලේ දේවල් ගැන කථා, මියගිය උදවිය ගැන කථා, තව තව දේවල් ගැන කථා, ලෝකය ගැන කථා, සාගරය ගැන කථා, මෙහෙමයි වුණේ මෙහෙමයි නොවුණේ කියන දේ ගැන කථා කරකර ඉන්නවා, මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරිසන් කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

27. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මි-ඡාපටිපන්නෝ ත්වමසි, අහමස්මි සම්මා පටිපන්නෝ. සහිතං මේ, අසහිතං තේ. පුරේ වචනීයං ප-ඡා අවච. ප-ඡා වචනීයං පුරේ අවච. ආචිණ්ණං තේ විපරාවත්තං. ආරෝපිතෝ තේ වාදෝ. නිග්ගහිතෝ ත්වමසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බේඨේහි වා ස- පහෝසීති. ඉති වා ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

27. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් එකිනෙකා අතර බැණ දොඩා ගන්නා කථාවෙන් යුතුව යි ඉන්නෙ. ඒ කියන්නේ "නුඹ මේ ධර්ම විනය දන්නෙ නෑ. මම තමයි මේ ධර්ම විනය දන්නේ, ආ ... එහෙම ද එතකොට නුඹද මේ ධර්ම විනය දන්නේ? නුඹ ඉන්නේ මිත්‍යා වැඩ පිළිවෙලක යි. මම තමයි නියම වැඩ පිළිවෙල තුළ ඉන්නේ. මං කරුණු සහිතව යි කියන්නේ. නුඹේ කීම කරුණු රහිත යි. නුඹ කලින් කිවයුතු දේ පස්සේ කිව්වා. පස්සේ කිවයුතුදේ කලින් කිව්වා. නුඹ කලක් තිස්සේ කියපු දේ කණපිට පෙරළෙනා. මා විසින් නුඹට වාද නංවලයි තියෙන්නේ. නුඹට නිග්‍රහ කරල යි තියෙන්නේ. වාදයෙන් නිදහස් වීමට මගක් හොයාගෙන පලයන්. පුළුවන් නම් ලෙහාගනින්" යනාදිය කියමින් ආරවුල් හදාගන්නවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ බැණ දොඩාගන්නා කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

28. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයෝගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං "ඉධ ග-ඡ. අමුත්‍රග-ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

28. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල ගිහියන් ගේ පණිවිඩ පණත් ගෙන යන මෙබඳු වූ දූත මෙහෙවරෙහි යෙදෙනවා. ඒ කියන්නේ, "මෙහෙ යන්න, අසවල් තැනට එන්න, මේක (අපේ මේ පණිවිඩය) අරන් යන්න. අසවල් තැනට මේක

අරන් යන්න" යනාදී රජුන් ගේ, රාජමහා ඇමතිවරුන් ගේ, ක්ෂත්‍රියයන් ගේ, බ්‍රාහ්මණයන් ගේ, ගෘහපතියන් ගේ, කුමාරවරුන් ගේ, පණිවුඩ පණත් ගෙනියනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ පණිවුඩ පණත් ගෙනයන ගිහියන් ගේ දූත මෙහෙවරෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

29. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ කුහකා ච හොන්ති ලපකා ච නේමිත්තිකා ච නිප්පේසිකා ච ලාභේන ලාභං නිජිගිංසිතාරෝ. ඉති වා ඉති ඒවරූපා කුහනලපනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

29. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල කුහක (උඩින් වෙන ජීවිතයක් පෙන්වමින් යටින් වෙනත් ජීවිතයක් ගෙවමින් නැති ගුණ පෙන්වා) ජීවිත ගෙවනවා. ලාභ සත්කාර ලැබෙන විදිහට (පුහු වර්ණනා කිරීම්, තොදොල් කිරීම්, නැති ගුණ කීම් ආදී) චාටු බස් කියනවා. දායකයින් හට නො දී බැරි තත්වයට පත් වෙන ආකාරයේ නිමිති දක්වමින් කථා කරනවා. තමන්ට ලැබෙන විදිහට අනුන්ට ගරහනවා. ලාභයෙන් ලාභය හොයනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ කුහකකමින් චාටුබස්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

මජ්ඣිමසීලං නිට්ඨිතං
මධ්‍යම සීලය නිමාවිය

30. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: අංගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසික-ඡින්නං අග්ගිහෝමං දබ්බිහෝමං ථුසහෝමං කණහෝමං තණ්ඩුලහෝමං සප්පිහෝමං තේලහෝමං මුඛහෝමං ලෝහිතහෝමං අංගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජ භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා වි-ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගපක්ඛං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

30. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙවැනි වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ ශාරීරික අංග බලා ඵලාඵල කියනවා, නිමිති බලා ඵලාඵල කියනවා, උත්පාත බලා ඵලාඵල කියනවා, සිහින ඵලාඵල කියනවා, ශාරීරික ලක්ෂණ බලා ඵලාඵල කියනවා, මීයන් කෑ වස්ත්‍ර බලා ඵලාඵල කියනවා, ගිනි පූජා පවත්වනවා, හැන්දෙන් පූජා පවත්වනවා, ධාන්‍ය පොතුවලින් පූජා පවත්වනවා. කණ නම් සහලින් කළ පූජා පවත්වනවා, සහලින් පූජා පවත්වනවා, ගිතෙලින් පූජා පවත්වනවා, තල තෙලින් පූජා පවත්වනවා, විශේෂ කොට කරණ පූජා පවත්වනවා, සතුන් මරා ලේ පුදා කරන පූජා පවත්වනවා, අංග විද්‍යාව, වාස්තු විද්‍යාව, දේශපාලන විද්‍යාව, වාසනාව උරගා බැලීමේ (ලොතරැයි) විද්‍යාව, භූත විද්‍යාව, පොළොව යට බිම් ගෙයක ඉඳ මැතිරීමෙන් කරන (භූරි) විද්‍යාව, සර්ප විද්‍යාව, විෂ විද්‍යාව, වෘශ්චික විද්‍යාව, මූෂක විද්‍යාව, පක්ෂි විද්‍යාව, විශාල පක්ෂි විද්‍යාව, ඉදුණු දේ මුල් කොට අනාවැකි කියන විද්‍යාව, මතුරන ලද ඊතල විද ආරක්ෂා කරන විද්‍යාව, මෘග පක්ෂ යනාදී මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

31. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරීලක්ඛණං දාසලක්ඛණං දාසීලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගෝලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගෝධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං ක-ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

31. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ මැණික්වල සුභ අසුභ ලකුණු කීම, දඬුවල සුභ අසුභ ලකුණු කීම, වස්ත්‍රවල සුභ අසුභ ලකුණු කීම, කඩු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ඊතල ආදී සලකුණුවලින් සුභාසුභ කීම, දුනු

ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ආයුධ ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ස්ත්‍රීන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, පුරුෂයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දරුවන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දැරියන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසීයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, ඒ ඒ කටයුතු සඳහා තෝරා ගත යුතු ඇතුන් ගේ ලකුණු කීම, අසුන් ගේ ලකුණු කීම, ඔටුවන් ගේ ලකුණු කීම, වෘෂභයන් ගේ ලකුණු කීම, ගවයන් ගේ ලකුණු කීම, එළුවන් ගේ ලකුණු කීම, බැටළුවන් ගේ ලකුණු කීම, කුකුළු පොර ආදියට සුදුසු කුකුළන් ගේ ලකුණු කීම, වටුවන් ගේ ලකුණු කීම, සුහුනන් ඇහ වැටීමේ සහ හඬනැගීමේ ඵලාඵල කීම, කණෙහි පළඳාගත් උපකරණවලින් ඵලාඵල කීම, කැස්බෑවන්ට මතුරා ඵලාඵල කීම, මුවන්ට මතුරා ඵලාඵල කීම ආදී තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

32. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති. රඤ්ඤං අතියානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයෝ භවිස්සති. බහිරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයෝ භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. ඉති ඉමස්ස ජයෝ භවිස්සති. ඉමස්ස පරාජයෝ භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

32. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් නැකතට රජතුමා ගේ යුධ පිණිස නික්මීම වන්නේ ය. අසවල් නැකතින් ආපසු නුවරට ඇතුළුවීම සිදු කළ යුත්තේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිට පිටත සතුරු රජුන් හමුවීමට රජු ගේ ගමන කළයුත්තේ ය. අසවල් නැකතින් පිටත සිටින රජවරු රට ඇතුළට පැමිණීම වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජු ගේ ඉවත්වීම සිදුවන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජුට ජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුනට පරාජය වන්නේ ය. අසවල්

නැකතින් බාහිර රජුන්ට ජය වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ රජුට පරාජය වන්නේ ය කියල මොහුට ජය වෙනවා. මොහුට පරාජය වෙනවා" ආදී වශයෙන් පවසමින් තිරිසන් විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

33. "යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: චන්දග්ගාහෝ භවිස්සති, සුරියග්ගාහෝ භවිස්සති, නක්ඛත්තග්ගාහෝ භවිස්සති, චන්දිමසුරියානං පථගමනං භවිස්සති, චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, නක්ඛත්තානං පථගමනං භවිස්සති, නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, උක්කාපාතෝ භවිස්සති, දිසාඩාහෝ භවිස්සති, භූමිචාලෝ භවිස්සති, දේවදුන්දුභි භවිස්සති, චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමන විගමන සංකිලේස වෝදානං භවිස්සති, ඒව විපාකෝ චන්දග්ගාහෝ භවිස්සති, ඒව විපාකෝ සුරියග්ගාහෝ භවිස්සති, ඒව විපාකෝ නක්ඛත්තග්ගාහෝ භවිස්සති, ඒව විපාක චන්දිමසුරියානං පථගමනං භවිස්සති, ඒව විපාක චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, ඒව විපාක නක්ඛත්තානං පථගමනං භවිස්සති, ඒව විපාක නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, ඒව විපාකෝ උක්කාපාතෝ භවිස්සති, ඒව විපාකෝ දිසාඩාහෝ භවිස්සති, ඒව විපාකෝ භූමිචාලෝ භවිස්සති, ඒව විපාකෝ දේවදුන්දුභි භවිස්සති, ඒව විපාක චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමන විගමන සංකිලේස වෝදානං භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

33. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් දින චන්ද්‍රග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සූර්යග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින නැකත් ග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නිසිමහින් යෑම සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නොමහින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නිසි මහින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නොමහින් යෑම සිදුවෙනවා. අසවල් දින උල්කාපාත වැටෙනවා. අසවල් දින අසවල් දිශාවේ උෂ්ණත්වය වැඩිවෙනවා. අසවල් දින භූමි කම්පාවක් සිදුවෙනවා.

අසවල් දින වැසි රහිතව අහස ගුගුරනවා. හිරු සඳු හා නැකත් වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම මේ මේ වෙලාවට සිදුවෙනවා. චන්ද්‍ර ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. සූර්ය ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. නැකත් ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නිසිගමන මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නොමඟ යෑම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. උල්කාපාත වැටීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. දිශා දාහය මෙවැනි ඵල විපාක ලබා දෙනවා. භූකම්පන මෙවැනි ඵල විපාක ලබා දෙනවා. වැසි නැතිව අහස ගිගිරීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. හිරු සඳු හා නැකත්වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම ලෝකයට මෙවැනි විපාක ලබා දෙනවා" කියල තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

34. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: සුබ්බුට්ඨිකා භවිස්සති, දුබ්බුට්ඨිකා භවිස්සති, සුභික්ඛං භවිස්සති, දුබ්භික්ඛං භවිස්සති, ඛේමං භවිස්සති, භයං භවිස්සති, රෝගෝ භවිස්සති, ආරෝග්‍යං භවිස්සති, මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලෝකායතං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

34. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "මේ කාලයේ දී වැස්ස වහිනවා. මේ කාලයේ දී නියඟය ඇතිවෙනවා. මේ කාලයේ සුභික්ෂ වෙනවා. මේ කාලයේ දී දුර්භික්ෂය ඇතිවෙනවා. මේ කාලයේ දී රට සරුවෙනවා. මේ කාලයේ දී බිය සැක නැතිව ඉන්නවා. මේ කාලයේ දී භය උපදිනවා. මේ කාලයේ දී රෝග ඇති වෙනවා. මේ කාලයේ දී නීරෝග බව ඇති වෙනවා කියමින් ඵලාඵල පැවසීමත් මුද්‍රා, ගණිත, සංඛ්‍යාන, කාව්‍ය ශාස්ත්‍ර, ලෝකායත ශාස්ත්‍ර ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

35. **යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හානිත්ථම්භනං හනුසංහන්නං හත්ථාභිජප්පනං හනුජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිකාපඤ්හං දේවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්හායනං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

35. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, විවාහයට නැකත් කීම, ආවාහයට නැකත් කීම, වෙන් වූ අඹු සැමියන් එක් කිරීමට නැකත් සැදීම, එක් වූ අඹු සැමියන් වෙන් කිරීමට නැකත් සැදීම, දීපු ණය එකතු කිරීමට නැකත් සැදීම, මුදල් ණයට පොලියට දීමට නැකත් සැදීම, දියුණු වීමට ගුරුකම් කිරීම, පාඵවී නැති වීමට ගුරුකම් කිරීම, දරුගැබ් රැකෙන්නට ගුරුකම් කිරීම, දිව අගුළු බැඳෙන්නට ගුරුකම් කිරීම, හනු තද කරන්නට ගුරුකම් කිරීම, අත් පෙරලෙන්නට ගුරුකම් කිරීම, හනු සිරවෙන්නට ගුරුකම් කිරීම, කණ් අගුළු වැටෙන්නට ගුරුකම් කිරීම, කණ්ණාඩියෙන් භූතයන් කැඳවා ප්‍රශ්න විචාරීම, ගෑණු දරුවන් ලවා පේන කීම, දෙවියන් ලවා පේන කීම, සූර්ය වන්දනාව, මහ බඹු වන්දනාව, මන්ත්‍ර බලයෙන් කටින් ගිනිදැල් පිටකිරීම, මන්ත්‍ර බලෙන් ලක්ෂ්මි පූජා කිරීම යනාදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

36. **යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: සන්තිකම්මං පණිධිකම්මං (භූතකම්මං) භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකම්මං වත්ථුපරිකිරණං ආවමනං නහාපනං ජුහනං වමනං විරේචනං උද්ධවිරේචනං අධෝවිරේචනං සීසවිරේචනං කණ්ණතේලං නෙත්තතප්පනං නත්ථුකම්මං අඤ්ජනං ප-චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකි-ඡා මූලභේසජ්ජානං අනුප්පාදානං විසධීනං පටිමොක්ඛෝ. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡාන-විජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

36. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, ශාන්ති කර්ම, බාර ඔප්පු කිරීම, පොළොව යට හිඳ මතුරා ගුරුකම් කිරීම, නපුංසකයා පිරිමියෙකු කිරීම, පිරිමියා නපුංසකයෙකු කිරීම, ගෙවල් තැනීමේ දිශාවන් පෙන්වා දීම, අළුතෙන් නිවාස තැනීමේදී පුද පූජා පැවැත් වීම. වතුර මතුරා මූණ සේදවීම, වතුර මතුරා නැහැවීම, ගිනිපිඳීම, ලය විරේක කරවීම, බඩ විරේක කරවීම, වමනය කරවීම, වස්ති කරවීම, ශීර්ෂ විරේකය, කණට තෙල් පිඹීම, ඇස් වෙදකම, නස්න කිරීම, ඇස්වලට අඳුන් සෑදීම, ප්‍රති අංජන සෑදීම, ශල්‍ය කර්ම කිරීම, ළදරු චිකිත්සාව, කාය චිකිත්සාව, වනවලට බෙහෙත් බැඳීම ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

37. ස ඛෝ සෝ මාණව භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෙය්‍යථාපි මාණව, ඛත්තියෝ මුද්ධාවසිත්තෝ නිහතප-චාමිත්තෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං ප-චත්ථිකතෝ. ඒවමේව ඛෝ මාණව භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෝ ඉමිනා අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ මාණව භික්ඛු සීලසම්පන්නෝ හෝති.

37. පින්වත් මාණවකය, ඒ භික්ෂුව වනාහී මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. ඔටුනු පලන් රජ කෙනෙක් ඉන්නවා. ඔහු සතුරන් පරදවල බැහැර කරලයි ඉන්නේ. ඉතින් ඔහු සතුරන් හේතුවෙන් මොන ම අයුරකින්වත් භයක් දකින්නේ නෑ. පින්වත් මාණවකය, භික්ෂුවත් ඔය විදිහම යි. මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් සමන්විත ව ආධ්‍යාත්මිකව නිවැරදි සැපයක් විඳිනවා. පින්වත් මාණවකය, ඔන්න විදිහට යි භික්ෂුව සීලසම්පන්න වන්නේ.

38. අයං ඛෝ මාණව අරියෝ සීලක්ඛන්ධෝ යස්ස සෝ භගවා වණ්ණවාදී අහෝසි යත්ථ ච ඉමං ජනතං සමාදපේසි නිවේසේසි පතිට්ඨාපේසි. අත්ථි චේවෙත්ථ උත්තරිං කරණීයන්ති.”

38. පින්වත් මාණවකය, ඒ භවත් ගෞතමයන් වහන්සේ යම් ධර්මයක් වර්ණනා කළ සේක් නම්, යම් ධර්මයක් තුළ මේ ජනතාව සමාදන් කරවූ සේක් නම්, ඇතුළු කළ සේක්නම්, පිහිට වූ සේක් නම් ඒ මේ ආර්ය වූ සීලස්කන්ධය යි. ඒ වගේ ම ඒ සීලයෙන් මතුවටත් තව කළ යුතු දේවල් තියෙනවා.

39. "අච්ඡරියං හෝ ආනන්ද, අබ්භුතං හෝ ආනන්ද, සෝ'පායං හෝ ආනන්ද අරියෝ සීලක්ඛන්ධෝ පරිපුණ්ණෝ නෝ අපරිපුණ්ණෝ. ඒවම්පරිපුණ්ණඤ්චාහම්හෝ ආනන්ද අරියං සීලක්ඛන්ධං ඉතෝ බහිද්ධා අඤ්ඤේසු සමණබ්‍රාහ්මණේසු න සමනුපස්සාමි. ඒවම්පරිපුණ්ණඤ්ච හෝ ආනන්ද අරියං සීලක්ඛන්ධං ඉතෝ බහිද්ධා අඤ්ඤේ සමණබ්‍රාහ්මණා අත්තනි සමනුපස්සසෙය්‍යුං, තේ තාවතකේනේව අත්තමනා අස්සු අලමෙත්තාවතා, කතමෙත්තාවතා, අනුප්පත්තෝ නෝ සාමඤ්ඤත්ථෝ, නත්ථි නෝ කිඤ්චි උත්තරිං කරණීයන්ති. අථ ච පන භවං ආනන්දෝ ඒවාමහ: අත්ථි වේවෙත්ථ උත්තරිං කරණීය"න්ති.

39. "භවත් ආනන්දයෙනි, ආශ්චර්ය යි. භවත් ආනන්දයෙනි, පුදුම සහගත යි. භවත් ආනන්දයෙනි, ඒ මේ ආර්ය වූ සීලස්කන්ධය නම් පරිපූර්ණ ම යි. අපරිපූර්ණ නොවේ. භවත් ආනන්දයෙනි, ඔය ආකාරයෙන් පරිපූර්ණ වූ ආර්ය වූ සීලස්කන්ධයක් මේ බුදු සසුනෙන් බැහැර වූ වෙන ආගමක ශ්‍රමණ බ්‍රාහ්මණයින් තුළ මම නම් දකින්නේ නෑ. භවත් ආනන්දයෙනි, ඔය ආකාරයෙන් පරිපූර්ණ වූ ආර්ය වූ සීලස්කන්ධයක් මේ බුදු සසුනෙන් බැහැර වූ වෙන ආගමක ශ්‍රමණ බ්‍රාහ්මණයින් තුළ තම තමන් හට දකින්ට ලැබුණා නම්, ඔවුන් එපමණකින් ම සතුටට පත් වෙනවා "මේ අපට ඇති, මේ කරගත්තු හරිය ඇති, මහණකමේ අර්ථයට අපි පැමිණුනා, අපට මින් මත්තෙහි කළ යුතු කිසි දෙයක් නැත" කියල. නමුත් භවත් ආනන්දයන් පවසන්නේ මේ විදිහට යි. "ඒ වගේ ම ඔය සීලයෙන් මතුවටත් තවත් කළ යුතු දේවල් තියෙනවා" කියල.

පඨමභාණවාරං
පළමු බණවර යි

40. "කතමෝ පන සෝ හෝ ආනන්ද අරියෝ සමාධික්ඛන්ධෝ යස්ස සෝ භවං ගෝතමෝ වණ්ණවාදී අහෝසි යත්ථ ච ඉමං ජනතං සමාදපේසි නිවේසේසි පතිට්ඨාපේසි?"ති.

40. “භවත් ආනන්දයන් වහන්ස, ඒ භවත් ගෞතමයන් වහන්සේ යම් ධර්මයක් වර්ණනා කළ සේක් නම්, යම් ධර්මයක් තුළ මේ ජනතාව සමාදන් කරවූ සේක් නම්, ඇතුළු කළ සේක්නම්, පිහිට වූ සේක් නම් ඒ ආර්ය වූ සමාධි ස්කන්ධය කුමක් ද?”

41. **කථඤ්ච මාණව, භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති? ඉධ මාණව භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියේ සංවරාය ආපජ්ජති. සෝතේන සද්දං සුත්වා ..... ඝාණේන ගන්ධං ඝායිත්වා ..... ජිව්හාය රසං සායිත්වා ..... කායේන ඵොට්ඨබ්බං ඵුසිත්වා ..... මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියේ සංවරාය ආපජ්ජති. සෝ ඉමිනා අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ අජ්ඣත්තං අබ්‍යාසේකසුඛං පටිසංවේදේති. එවං ඛෝ මාණව, භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති.**

41. පින්වත් මාණවකය, භික්ෂුව අකුසලයන් වැළකූ ද්වාර ඇති ඉඳුරන් ඇතිව ඉන්නේ කොහොම ද? පින්වත් මාණවකය, මෙහිලා භික්ෂුව ඇසින් රූප දැක නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් ඇස නැමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. ඇස රැක ගන්නවා. ඇස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. කණෙන් ශබ්දයක් අහලා ..... නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කරලා ..... දිවෙන් රසයක් රස විඳලා ..... කයෙන් පහසක් ලබලා ..... මනසින් අරමුණක් දැන ගෙන නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් මනස නැමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. මනස රැක ගන්නවා. මනස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. ඔහු මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව ආධ්‍යාත්මිකව පීඩා රහිතව සැපයක් විඳිනවා. පින්වත් මාණවකය, භික්ෂුව අකුසලයෙන් වැළැක් වූ දොරටු ඇති ඉන්ද්‍රියයන් තුළ ඉන්නේ ඔය විදිහට යි.

42. කථඤ්ච මාණව, භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති? ඉධ මාණව, භික්ඛු අභික්කන්තේ පටික්කන්තේ සම්පජානකාරී හෝති. ආලෝකිතේ විලෝකිතේ සම්පජානකාරී හෝති. සම්මිඤ්ජිතේ පසාරිතේ සම්පජානකාරී හෝති. සංඝාටිපත්තචීවරධරණේ සම්පජානකාරී හෝති. අසිතේ පීතේ ඛායිතේ සායිතේ සම්පජානකාරී හෝති. උච්චාරපස්සාවකම්මේ සම්පජානකාරී හෝති. ගතේ ඨිතේ නිසින්නේ සුත්තේ ජාගරිතේ භාසිතේ තුණ්හීභාවේ සම්පජානකාරී හෝති. ඒවං ඛෝ මාණව, භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති.

42. පින්වත් මාණවකය, භික්ෂුව සිහිනුවණින් යුතුව සිටින්නේ කොහොම ද? පින්වත් මාණවකය, මෙහිලා භික්ෂුව ඉදිරියට යද්දීත්, ආපසු එද්දීත්, එය කරන්නේ සිහි නුවණින් ම යි. ඉදිරිය බලද්දී, වටපිට බලද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. අතපය හකුළද්දී, දිගහරිද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. දෙපට සිවුර, පාත්‍රය, අනෙක් සිවුරු ආදිය දරද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. වළඳද්දී පානය කරද්දී අනුභව කරද්දී රස විඳිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. වැසිකිළි කැසිකිළි යාමේ දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. ගමන් කරද්දී, සිටගෙන සිටිද්දී, වාඩි වී සිටිද්දී, සැතපෙද්දී, නිදිවරද්දී, කථාබස් කරද්දී, නිහඬව සිටිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. පින්වත් මාණවකය, භික්ෂුව සිහිනුවණින් යුතු වන්නේ ඔය ආකාරයට යි.

43. කථඤ්ච මාණව, භික්ඛු සන්තුට්ඨෝ හෝති? ඉධ මාණව භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරියේන චීවරේන කුච්ඡිපරිහාරියේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. සෙය්‍යථාපි මාණව, පක්ඛී සකුණෝ යේන යේනේව ඩේති සපත්තභාරෝව ඩේති, ඒවමේව ඛෝ මාණව, භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරියේන චීවරේන කුච්ඡිපරිහාරියේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. ඒවං ඛෝ මාණව, භික්ඛු සන්තුට්ඨෝ හෝති.

43. පින්වත් මාණවකය, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ කොහොම ද? පින්වත් මාණවකය, මෙහිලා භික්ෂුව කය පරිහරණයට සෑහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සෑහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. කුරුල්ලෙක් යම් ම තැනකට පියඹා යනවා නම්, පියාපත් බර පමණක් සහිතව පියඹනවා වගෙයි. පින්වත් මාණවකය,

ඔය අයුරින් ම භික්ෂුව කය පරිහරණයට සැහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සැහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. පින්වත් මාණවකය, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ ඔය විදිහට යි.

44. සෝ ඉමිනා ච අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතෝ, විවිත්තං සේනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භෝකාසං පලාලපුඤ්ජං. සෝ ප-ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තෝ නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

44. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ සිහිනුවණින් යුක්ත වෙලා, මේ ආර්ය වූ ලද දෙයින් සතුටුවීමෙන් යුක්ත වෙලා හුදෙකලා සෙනසුනක වාසය කරනවා. ඒ කියන්නේ ආරණ්‍යය, රුක්සෙවණ, පර්වතය, දිය ඇල්ල, ගිරිගුහාව, සොහොන, වනගැබ, ගස් කොළන් රහිත හිස් පිටිය, පිදුරු ගෙය ආදිය යි. ඔහු පිණ්ඩපාතය වළඳා, දානයෙන් පසු (එවැනි තැනක) පළඟක් බැඳ ගෙන, කය සෘජු කර ගෙන, භාවනා අරමුණෙහි සිහිය පිහිටුවා ගෙන වාඩිවෙනවා.

45. සෝ අභිජ්ඣං ලෝකේ පහාය විගතාභිජ්ඣේන චේතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසෝධේති. බ්‍යාපාදපදෝසං පහාය අබ්‍යාපන්නචිත්තෝ විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදෝසා චිත්තං පරිසෝධේති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධෝ විහරති ආලෝකසඤ්ඤී සතෝ සම්පජානෝ. ථීනමිද්ධා චිත්තං පරිසෝධේති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතෝ විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තෝ. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසෝධේති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡෝ විහරති අකථංකථී කුසලේසු ධම්මේසු. විචිකිච්ඡාය චිත්තං පරිසෝධේති.

45. ඔහු ජීවිතය නම් වූ ලෝකය ගැන ඇති විසම ලෝභය දුරු කොට ඇලීම් රහිත වූ සිතින් වාසය කරනවා. විසම ලෝභය කෙරෙන් සිත පිරිසිදු කරනවා. තරහ වෛර ආදිය අත්හැර තරහ නැති සිතින් සියළු සතුන් කෙරෙහි හිතානුකම්පිව වාසය කරනවා. තරහ වෛර ආදිය කෙරෙන් සිත පිරිසිදු

කරනවා. නිදිමත අලසකම අත්හැර නිදිමත අලසකමින් බැහැරව ආලෝක සඤ්ඤාවෙන් යුතුව, සිහිනුවණ ඇතිව වාසය කරනවා. නිදිමත අලසකම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සිතේ විසිරීමත්, පසුතැවීමත් බැහැර කොට නො කැළඹී ගිය සංසිඳුනු සිතින් වාසය කරනවා. සිතේ විසිරීම හා පසුතැවීම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සැකය දුරු කොට කුසල් දහම් ගැන කෙසේ ද? කෙසේ ද? යනාදී සැකයෙන් එතෙරව වාසය කරනවා. සැකය කෙරෙන් සිත පිරිසිදු කරනවා.

46. සෙය්‍යථාපි මාණව, පුරිසෝ ඉණං ආදාය කම්මන්තේ පයෝජෙය්‍ය, තස්ස තේ කම්මන්තා සම්ඡක්ඛෙය්‍යුං, සෝ යානි ච පෝරාණානි ඉණමූලානි තානි ච බ්‍යාන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ඉණං ආදාය කම්මන්තේ පයෝජේසිං. තස්ස මේ තේ කම්මන්තා සම්ඡක්ඛිංසු. සෝ'හං යානි ච පෝරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තී අකාසිං. අත්ථි ච මේ උත්තරිං අවසිට්ඨං දාරභරණායා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

46. පින්වත් මාණවකය, එය මෙවැනි දෙයක්. පුරුෂයෙක් ණයක් අරගෙන කර්මාන්තයක යොදවනවා. ඔහු ගේ ඒ ව්‍යාපාරය සාර්ථක වෙනවා. එතකොට ඔහු යම් පරණ මුල් ණයක් ඇද්ද, එය සම්පූර්ණයෙන් ම ගෙවලා දානවා. එයින් පසු ඔහුට අඹුදරුවන් පෝෂණය පිණිස ලාභයක් ඉතිරිත් වෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං කලින් ණයක් අරගෙනයි ව්‍යාපාරයක යෙදෙව්වේ. ඒ මගේ ව්‍යාපාරය සාර්ථක වුණා. ඒ මං යම් පරණ මුල් ණයක් ඇද්ද එය සම්පූර්ණයෙන් ම ගෙව්වා. අඹුදරුවන් පෝෂණයටත් මට ආදායම ඉතිරි වුණා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

47. සෙය්‍යථාපි මාණව, පුරිසෝ ආබාධිකෝ අස්ස දුක්ඛිතෝ බාළ්හගිලානෝ, භත්තං චස්ස න-ඡාදෙය්‍ය, න චස්ස කායේ බලමත්තා, සෝ අපරේන සමයේන තම්හා ආබාධා මු-චෙය්‍ය, භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායේ බලමත්තා, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ආබාධිකෝ අහෝසිං දුක්ඛිතෝ බාළ්හගිලානෝ. භත්තං ච මේ න-ඡාදේසි. න චස්ස මේ ආසි කායේ බලමත්තා. සෝ'මිහි ඒතරහි තම්හා ආබාධා මුත්තෝ. භත්තඤ්ච මේ ඡාදේති. අත්ථි ච මේ කායේ බලමත්තා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

47. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව ඉන්නවා. ඔහුට බත් කෑමටවත් පිරියක් නෑ. ඔහු ගේ ඇහේ පතේ ප්‍රාණවත් ගතියක් නෑ. නමුත් පස්සෙ කාලෙක ඔහු ඒ රෝගයෙන් මිදුනා. ඔහුට දැන් බත් කෑමත් ප්‍රිය යි. ඔහු ගේ ඇහපතත් ප්‍රාණවත්. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව හිටියේ. මට බත් කෑමටවත් පිරියක් තිබුණේ නෑ. මගේ ඇහේ පතේ ප්‍රාණවත් ගතියක් තිබුණේ නෑ. නමුත් දැන් මං ඒ රෝගයෙන් මිදුනා. මට දැන් බත් කෑමත් ප්‍රිය යි. මගේ ඇහපතත් ප්‍රාණවත්" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

48. සෙය්‍යථාපි මාණව, පුරිසෝ බන්ධනාගාරේ බද්ධෝ අස්ස, සෝ අපරේන සමයේන තම්හා බන්ධනාගාරා මු-චෙය්‍ය සොත්ථිනා අබ්බයේන න චස්ස කිඤ්චි භෝගානං වයෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ බන්ධනාගාරේ බද්ධෝ අහෝසිං. සෝ'මිහි එතරහි තම්හා බන්ධනාගාරා මුත්තෝ සොත්ථිනා අබ්බයේන. නත්ථි මේ කිඤ්චි භෝගානං වයෝ"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

48. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් හිරගෙදරක බන්ධනයකට හසුවෙනවා. නමුත් ඔහු පස්සෙ කාලෙක තමන් ගේ ධනය වියදම් නොකොට සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වෙනවා. ඔහු ගේ සම්පත්වලින් කිසි වියදමක් යන්නේ නෑ. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර හිරගෙදරක බන්ධනයකට අහු වුණා. නමුත් ඒ මං දැන් ධන වියදමකින් තොරව සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වුණා. මගේ භෝග සම්පත්වලින් කිසිදෙයක් වියදම් වුණේ නෑ" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

49. සෙය්‍යථාපි මාණව, පුරිසෝ දාසෝ අස්ස අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාමංගමෝ, සෝ අපරේන සමයෙන් තම්හා දාසබ්‍යා මු-චෙය්‍ය අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාමංගමෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ දාසෝ අහෝසිං අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාමංගමෝ. සෝ'මිහි එතරහි තම්හා දාසබ්‍යා මුත්තෝ අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාමංගමෝ"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

49. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නො හැකි, දාසයෙක් වෙලා හිටියා. ඔහු පස්සෙ කාලෙක ඒ දාසබවෙන් නිදහස් වුණා. තමාට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නො වන, තමන් කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබුණා. එතකොට ඔහුට මෙහෙම හිතුනා. "මං ඉස්සර තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නො හැකි, දාසයෙක් වෙලා හිටියා. ඒ මං දැන් ඒ දාසබවෙන් නිදහස් වෙලයි ඉන්නේ. මට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නො වන, මං කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබිලා තියෙනවා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

50. **සෙය්‍යථාපි මාණව, පුරිසෝ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං, සෝ අපරේන සමයේන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛේමං අප්පටිභයං, තස්ස එවමස්ස: "අහං ඛෝ පුබ්බේ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සෝ'ම්හි එතරහි තං කන්තාරං තිණ්ණෝ සොත්ථිනා ගාමන්තං අනුප්පත්තෝ ඛේමං අප්පටිභය"න්ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.**

50. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසෙනවා. නමුත් ඔහු පසු කාලෙක ඒ කාන්තාරයෙන් එතෙර වෙනවා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා "මං කලින් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසුනා. නමුත් දැන් මා ඒ කාන්තාරයෙන් එතෙර වුණා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණුනා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

51. **එවමේව ඛෝ මාණව, භික්ඛු යථා ඉණං යථා රෝගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං. එවං ඉමේ පඤ්ච නීවරණේ අප්පහීණේ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි මාණව, ආනණ්‍යං,**

යථා ආරෝග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛේමන්තභූමිං එවමේව ඛෝ මාණව භික්ඛු ඉමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සති.

59. පින්වත් මාණවකය, අන්න ඒ විදිහම යි. භික්ෂුවත් (කලින්) ණයක් ගත්තා වගේ, ලෙඩ වුණා වගේ, හිරේවිලංගුවේ වැටුනා වගේ, වහල්බවට පත් වුණා වගේ, නිරුදක කතරකට පැමිණුනා වගේ මේ පංච නීවරණයන් ප්‍රහාණය නො වී තමා තුළ පවතින හැටි දකිනවා. නමුත් පින්වත් මහාරාජ, ඒ ණය ගෙවා දමා ණය රහිත වුණා වගේ, රෝගයෙන් නිදහස් වෙලා නීරෝග වුණා වගේ, වියදම් නැතුව හිරෙන් නිදහස් වුණා වගේ, දාසබවෙන් නිදහස් වුණා වගේ, නිරුදක කතර ගෙවා ආරක්ෂා සහිත ක්ෂේම භූමියකට පැමිණුනා වගේ තමයි. පින්වත් මාණවකය, අන්න ඒ විදිහමයි භික්ෂුව තමා තුළ මේ පංච නීවරණයන් දුරුවී ඇති ආකාරයත් දකින්නේ.

52. තස්සිමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සතෝ පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායෝ පස්සම්භති. පස්සද්ධකායෝ සුඛං වේදේති. සුඛිනෝ චිත්තං සමාධියති.

52. ඔහුට මේ පඤ්ච නීවරණයන් තමා තුළ නැති බව දකිද්දි මහත් සතුටක් ඇති වෙනවා. ඒ ප්‍රමුදිත වීම ඇති කෙනාට ප්‍රීතිය ඇති වෙනවා. ප්‍රීති මනසක් ඇති කෙනා ගේ කය සංසිඳෙනවා. සංසිඳුනු කයින් යුතු ව සැපක් විඳිනවා. සැප ඇති කෙනා ගේ සිත සමාධිමත් වෙනවා.

53. සෝ විවි-ච-ව කාමේහි විවි-ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

53. ඔහු කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් හට ගත් ප්‍රීති සුඛය ඇති පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

54. සෙය්‍යථාපි මාණව දක්ඛෝ නහාපකෝ වා නහාපකන්තේවාසී වා කංසථාලේ නහානීයචුණ්ණානි ආකිරිත්වා උදකේන පරිප්ඵෝසකං පරිප්ඵෝසකං සන්නෙය්‍ය සායං නහානීයපිණ්ඩි සේනහානුගතා සේනහපරේතා සන්තරබාහිරා ඵුටා සේනහේන න ච පග්ඝරණි. එවමේව ඛෝ මාණව භික්ඛු ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

54. පින්වත් මාණවකය, එක මේ වගේ දෙයක්. (රජවරුන් ආදී පිරිස් නහවන) දක්ෂ නහවන්නෙක් හෝ නහවන කෙනෙකු ගේ ගෝලයෙක් ඉන්නවා. ඔහු ලෝහ බඳුනක නාන සුණු විසුරුවනවා. ඊට පස්සේ දිය ඉස ඉස පිඬු කරනවා. එතකොට ඒ නානසුණු පිඬට අර වතුර කාවදිනවා. හොඳින් තෙත් වෙනවා. ඒ නහන පිඬ ඇතුළත පිටත සෑම තැන ම හොඳින් දිය පැතිරිලා තියෙනවා. පිටතට වැගිරෙන්නෙත් නෑ. පින්වත් මාණවකය, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

55. යම්පි මාණව භික්ඛු විවිච්චේව කාමේහි විවිච්ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, සෝ ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති, ඉදම්පි'ස්ස හෝති සමාධිස්මිං.

55. පින්වත් මාණවකය, භික්ෂුව කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් හට ගත් ප්‍රීති සුඛය ඇති යම් පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා නම්, ඔහු මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. මෙය අයිති වන්නේත් ඔහු ගේ සමාධියට ම යි.

56. පුන ච පරං මාණව භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසෝ ඒකෝදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං

දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පූරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

56. පින්වත් මාණවකය, තව දුරටත් කියනවා නම් භික්ෂුව විතක්ක විචාරයන් ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්මිකව පැහැදීම ඇතිව සිතෙහි මනා එකඟ බවෙන් යුතු ව විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් හටගත්, ප්‍රීති සුඛය ඇති දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

57. සෙය්‍යථාපි මාණව උදකරහදෝ ගම්භීරෝ උබ්භිදෝදකෝ, තස්ස නේවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, න ප-ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, දේවෝ ච න කාලේන කාලං සම්මා ධාරං අනුපවෙ-ඡෙය්‍ය, අථ ඛෝ තම්හා ව උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමේව උදකරහදං සීතේන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතෝ උදකරහදස්ස වාරිනා සීතේන අප්ඵුටං අස්ස. ඒවමේව ඛෝ බ්‍රාහ්මණ භික්ඛු ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පූරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

57. පින්වත් මාණවකය, එක මේ වගේ දෙයක්. යට දිය උල්පත්වලින් වතුර ගලන ගැඹුරු විලක් තියෙනවා. හැබැයි ඒ විලට නැගෙනහිර පැත්තෙන් වතුර එන මගක් නෑ. දකුණු පැත්තෙන් වතුර එන මගක් නෑ. බටහිර පැත්තෙන් වතුර එන මගක් නෑ. උතුරු පැත්තෙන් වතුර එන මගක් නෑ. වැස්සත් කලින් කලට පිළිවෙලකට වහින්නේ නෑ. එතකොට ඒ විලෙන් ම සීතල දියදහරා උල්පත්වලින් උඩට මතු වෙවී ඒ විල ම සීතල ජලයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. වතුරෙන් පුරවනවා. හොඳින් පුරවනවා. ඒ මුළු විලේ ම සිහිල් ජලයෙන් පහස නොලැබූ කිසි තැනක් නෑ. පින්වත් මාණවකය, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

58. යම්පි මාණව භික්ඛු විතක්ක විචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසෝ ඒකෝදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, සෝ ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පූරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති. ඉදම්පි'ස්ස හෝති සමාධිස්මිං.

58. පින්වත් මාණවකය, භික්ෂුව විතක්ක විචාරයන් ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්මිකව පැහැදීම ඇතිව සිතෙහි මනා එකඟ බවෙන් යුතු ව විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් හටගත්, ප්‍රීති සුඛය ඇති යම් දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා නම්, ඔහු මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නැ. මෙය අයිති වන්නේත් ඔහු ගේ සමාධියට ම යි.

59. පුන ච පරං මාණව භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති සතෝ සම්පජානෝ සුඛඤ්ච කායේන පටිසංවේදේති. යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛතෝ සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති.

59. පින්වත් මාණවකය, තව දුරටත් කියනවා නම් භික්ෂුව ප්‍රීතියට ද නොඇලීමෙන් උපේක්ෂාවෙන් යුතුව වාසය කරනවා. සිහියෙන් නුවණින් යුතු ව කයෙන් සැපයක් ද විඳිනවා. ආර්යයන් වහන්සේලා යම් ධ්‍යානයකට උපේක්ෂා සහගත සිහිය ඇති සැප විහරණය යැයි පවසනවා ද, ඒ තුන්වන ධ්‍යානයත් උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නැ.

60. සෙය්‍යථාපි මාණව උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පේක-චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකේ ජාතානි උදකේ සංවද්ධානි උදකානුග්ගතානි අන්තෝනිමුග්ගපෝසීනි තානි යාව

වග්ගා යාව ච මූලා සීතේන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි, පරිප්පූටානි නාස්සා කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතේන වාරිනා අප්පූටං අස්ස. ඒවමේව ඛෝ මාණව භික්ඛු ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්පූටං හෝති.

60. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. මහනෙල් විලක හෝ රතු නෙළුම් විලක හෝ සුදු නෙළුම් විලක හෝ ඇතැම් මහනෙල් වේවා, රතු නෙළුම් වේවා, සුදු නෙළුම් වේවා ඒ නෙළුම් ජලයේ ම යි හට ගන්නේ. ජලයේ ම යි වැඩෙන්නේ. නමුත් ජලයෙන් උඩට ඇවිත් නෑ. ජලය තුළ ම ගිලී වැඩෙනවා. එතකොට ඒ නෙළුම් අග දක්වාත් මුල දක්වාත් සීතල දියෙන් හොඳට තෙත් වෙලා තියෙන්නේ. මුළුමණින් ම තෙත් වෙලා තියෙන්නේ. පිරිල තියෙන්නේ. හැම තැනම පැතිරිලා තියෙන්නේ. ඒ සෑම මහනෙල්වල, රතුනෙළුම්වල, සුදුනෙළුම්වල සීතල දිය නො පැතුරුණු කිසි තැනක් නෑ. පින්වත් මාණවකය, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

61. යම්පි මාණව භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති සතෝ සම්පජානෝ සුඛඤ්ච කායේන පටිසංවේදේති, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති, සෝ ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්දේති පරිසන්දේති පූරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්පූටං හෝති. ඉදම්පි'ස්ස හෝති සමාධිස්මිං.

61. පින්වත් මාණවකය, භික්ෂුව ප්‍රීතියට ද නො ඇලීමෙන් උපේක්ෂාවෙන් යුතුව වාසය කරනවා. සිහියෙන් නුවණින් යුතු ව කයෙන් සැපයක් ද විඳිනවා. ආර්යයන් වහන්සේලා යම් ධ්‍යානයකට උපේක්ෂා සහගත සිහිය ඇති සැප විහරණය යැයි පවසනවා ද, යම් ඒ තුන්වන ධ්‍යානයත් උපදවා ගෙන වාසය කරනවා නම්, ඔහු මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. මෙය අයිති වන්නේත් ඔහු ගේ සමාධියට ම යි.

62. පුන ච පරං මාණව භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බේව සෝමනස්සදෝමනස්සානං අත්ථගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති. සෙය්‍යථාපි මාණව පුරිසෝ විදාතේන වත්ථේන සසීසං පාරුපිත්වා නිසින්නෝ අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විදාතේන වත්ථේන අප්ඵුටං අස්ස, එවමේව ඛෝ මාණව භික්ඛු ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති.

62. පින්වත් මාණවකය, නැවතත් කියනවා නම් භික්ෂුව සැපය ද ප්‍රහාණය කිරීමෙන්, දුක ද ප්‍රහාණය කිරීමෙන් කලින් ම සොම්නස් දොම්නස් දෙක ඉක්ම යෑමෙන් දුක් සැප රහිත වූ පාරිශුද්ධ උපේක්ෂා සහගත සතිය ඇති සතර වෙනි ධ්‍යානය උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. පින්වත් මාණවකය, එක මේ වගේ දෙයක්. සුදු වස්ත්‍රයකින් හිස සහිතව මුළු සිරුර ම පොරොවාගෙන වාඩි වී සිටින කෙනෙක් ඉන්නවා. එතකොට ඔහු ගේ මුළු කයෙහි ම සුදු වස්ත්‍රයෙන් නො වැසුණු කිසි තැනක් නෑ. පින්වත් මාණවකය, අන්න ඒ වගේ ම යි භික්ෂුව මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

63. යම්පි මාණව භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බේව සෝමනස්සදෝමනස්සානං අත්ථගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති. ඉදම්පි 'ස්ස හෝති සමාධිස්මිං. අයං ඛෝ මාණව අරියෝ සමාධික්ඛන්ධෝ යස්ස සෝ භගවා වණ්ණවාදී අහෝසි, යත්ථ ච ඉමං ජනතං සමාදපේසි නිවේසේසි පතිට්ඨාපේසි. අත්ථි චේවෙත්ථ උත්තරිං කරණීයන්ති.

63. පින්වත් මාණවකය, භික්ෂුව සැපය ද ප්‍රහාණය කිරීමෙන්, දුක ද ප්‍රහාණය කිරීමෙන් කලින් ම සොම්නස් දොම්නස් දෙක ඉක්ම යෑමෙන් දුක්

සැප රහිත වූ පාරිශුද්ධ උපේක්ෂා සහගත සතිය ඇති යම් සතර වෙනි ධ්‍යානයක් උපදවා ගෙන වාසය කරනවා නම්, ඔහු මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. මෙය අයිති වන්නෙත් ඔහු ගේ සමාධිය ට ම යි. පින්වත් මාණවකය, මේ වනාහී ආර්ය වූ සමාධි ස්කන්ධය යි. ඒ භාග්‍යවතුන් වහන්සේ යම් සමාධියක ගුණ වර්ණනා කළ සේක් නම්, ඒ තුළ තමයි මේ ජනතාව සමාදන් කොට වදාළේ. ඇතුළු කොට වදාළේ පිහිටුවා වදාළේ. ඒ වගේ ම මේ සමාධියෙන් මත්තටත් කළ යුතු දේවල් තියෙනවා.

64. "අච්ඡරියං හෝ ආනන්ද, අබ්භුතං හෝ ආනන්ද, සෝ චායං හෝ ආනන්ද අරියෝ සමාධික්ඛන්ධෝ පරිපුණ්ණෝ නෝ අපරිපුණ්ණෝ. එවම්පරිපුණ්ණඤ්චාහං හෝ ආනන්ද අරියං සමාධික්ඛන්ධං ඉතෝ බහිද්ධා අඤ්ඤේසු සමණබ්‍රාහ්මණේසු න සමනුපස්සාමි. එවං පරිපුණ්ණඤ්ච හෝ ආනන්ද අරියං සමාධික්ඛන්ධං ඉතෝ බහිද්ධා අඤ්ඤේ සමණබ්‍රාහ්මණා අත්තනි සමනුපස්සෙය්‍යුං, තේ තාවතකේනේව අත්තමනා අස්සු අලමෙත්තාවතා, කතමෙත්තාවතා, අනුප්පත්තෝ නෝ සාමඤ්ඤත්ථෝ, නත්ථි නෝ කිඤ්චි උත්තරිං කරණීයන්ති. අථ ච පන භවං ආනන්දෝ එවාමහ: අත්ථි වේවෙත්ථ උත්තරිං කරණීය"න්ති.

64. "භවත් ආනන්දයෙනි, ආශ්චර්ය යි. භවත් ආනන්දයෙනි, පුදුම සහගත යි. භවත් ආනන්දයෙනි, ඒ මේ ආර්ය වූ සමාධිස්කන්ධය නම් පරිපූර්ණ ම යි. අපරිපූර්ණ නොවේ. භවත් ආනන්දයෙනි, ඔය ආකාරයෙන් පරිපූර්ණ වූ ආර්ය වූ සමාධිස්කන්ධයක් මේ බුදු සසුනෙන් බැහැර වූ වෙන ආගමක ශ්‍රමණ බ්‍රාහ්මණයින් තුළ මම නම් දකින්නේ නෑ. භවත් ආනන්දයෙනි, ඔය ආකාරයෙන් පරිපූර්ණ වූ ආර්ය වූ සමාධිස්කන්ධයක් මේ බුදු සසුනෙන් බැහැර වූ වෙන ආගමක ශ්‍රමණ බ්‍රාහ්මණයින් තුළ තම තමන් හට දකින්ට ලැබුණා නම්, ඔවුන් එපමණකින් ම සතුටට පත් වෙනවා "මේ අපට ඇති, මේ කරගත්තු හරිය ඇති, මහණකමේ අර්ථයට අපි පැමිණුනා, අපට මින් මත්තේහි කළ යුතු කිසි දෙයක් නැත" කියල. නමුත් භවත් ආනන්දයන් පවසන්නේ මේ විදිහට යි. "ඒ වගේ ම ඔය සමාධියෙන් මතුවටත් තවත් කළ යුතු දේවල් තියෙනවා" කියල.

65. කතමෝ පන සෝ හෝ ආනන්ද අරියෝ පඤ්ඤක්ඛන්ධෝ යස්ස සෝ භවං ගෝතමෝ වණ්ණවාදී අහෝසි යත්ථ ච ඉමං ජනතං සමාදපේසි නිවේසේසි පතිට්ඨාපේසි?"ති.

65. භවත් ආනන්දයෙනි, යම් ප්‍රඥාවක් ගැන ඒ භවත් ගෞතමයන් වහන්සේ වර්ණනා කළ සේක් නම්, ඒ තුළ මේ ජනතාව සමාදන් කෙරවූ සේක් නම්, ඇතුළු කළ සේක් නම්, පිහිට වූ සේක් නම් ඒ ආර්ය වූ ප්‍රඥා ස්කන්ධය කුමක් ද?

66. "පුනචපරං මාණව සෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සානය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතා-පෙත්තිකසම්භවෝ විදනකුම්මාසූපචයෝ අනි-චු-ඡාදනපරිමද්දනභේදන-විද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති.

69. පින්වත් මාණවකය, තව දුරටත් කියනවා නම් භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් ව්‍යංජන ආදියෙන් වැඩුණු, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි.

67. සෙය්‍යථාපි මාණව, මණි වේළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ සබ්බාකාරසම්පන්නෝ, තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා විදානං වා පණ්ඩුසුත්තං වා. තමේනං චක්ඛුමා පුරිසෝ හත්ථේ කරිත්වා ප-ච්චවෙක්ඛෙය්‍ය "අයං ඛෝ මණි වේළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ, අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ සබ්බාකාරසම්පන්නෝ, තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා විදානං වා පණ්ඩුසුත්තං වා"ති. ඒවමේව ඛෝ මාණව, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සානය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතාපෙත්තිකසම්භවෝ

වේදනකුම්මාසූපචයෝ අනි-චු-ඡාදනපරිමද්දනභේදනවිද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති.

67. පින්වත් මාණවකය, එක මේ වගේ දෙයක්. වෛරෝඩි මාණික්‍යයක් තියෙනවා. හරි ලස්සනට පහළ වුණ දෙයක්. අටපට්ටම්. හොඳින් ඔපමට්ටම්, ඉතාමත් හොඳ යි. ඉතාම ප්‍රසන්න යි. පිවිතුරු යි. මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. ඉතින් ඔය මැණික තුළ නිල් වේවා, රන්වන් වේවා, රතු වේවා, සුදු වේවා, පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා. එතකොට ඇස් ඇති පුරුෂයෙක් මැණික අතට ගෙන හොඳින් විමසා බලනවා. "මේ වෛරෝඩි මැණික හරි ලස්සනට පහළ වුණ දෙයක්. අටපට්ටම්. හොඳින් ඔපමට්ටම්, ඉතාමත් හොඳ යි. ඉතාම ප්‍රසන්න යි. පිවිතුරු යි. මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. මේ මැණික තුළ නිල් වේවා, රන්වන් වේවා, රතු වේවා, සුදු වේවා, පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා" කියලා. පින්වත් මාණවකය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් ව්‍යංජන ආදියෙන් වැඩුණ, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි" කියල.

68. යම්පි මාණව භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... ඒවං පජානාති ..... ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිපද්ධන්ති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤාය.

68. පින්වත් මාණවකය, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... මේ විදිහට දැන ගන්නවා ..... මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි" කියල. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

69. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගප-චංගිං අහීනින්ද්‍රියං.

69. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා.

70. සෙය්‍යථාපි මාණව පුරිසෝ මුඤ්ජම්හා ඉසිකං පවාහෙය්‍ය. තස්ස එවමස්ස: "අයං මුඤ්ජෝ අයං ඉසිකා අඤ්ඤෝ මුඤ්ජෝ, අඤ්ඤා ඉසිකා මුඤ්ජම්හාත්වේව ඉසිකා පබ්බාළ්හාති." සෙය්‍යථාපි වා පන මාණව පුරිසෝ අසිං කෝසියා පවාහෙය්‍ය, තස්ස එවමස්ස "අයං අසි, අයං කෝසි, අඤ්ඤේ අසි, අඤ්ඤ කෝසි, කෝසියත්වේව අසි පබාළ්හෝ"ති. සෙය්‍යථාපි වා පන මාණව, පුරිසෝ අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස එවමස්ස: අයං අහි, අයං කරණ්ඩෝ, අඤ්ඤෝ අහි, අඤ්ඤේ කරණ්ඩෝ, කරණ්ඩාත්වේව අහි උබ්භතෝ"ති. එවමේව ඛෝ මාණව භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනම්මිනාති රූපිං මනෝමයං සබ්බංගපච්චංගිං අහීනින්ද්‍රියං.

පින්වත් මාණවකය, එක මේ වගේ දෙයක්. පුරුෂයෙක් මුඤ්ජතණ ගසෙන් තණ ගොබය ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ මුඤ්ජතණ ගස යි, මේ තණ ගොබය යි. එතකොට මුඤ්ජතණ ගස වෙන එකක්. තණ ගොබය වෙන එකක්. නමුත් මුඤ්ජතණ ගසෙන් ම යි තණ ගොබය ඇදල ගත්තේ" කියලා. පින්වත් මාණවකය, එක මේ වගේ දෙයක්. පුරුෂයෙක් කොපුවෙන් කඩුවක් ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ කඩුව යි. මේ කොපුව. එතකොට කඩුව අනෙකක්, කොපුව අනෙකක්. නමුත් කොපුවෙන් තමයි කඩුව ඇදල ගත්තේ" කියලා. පින්වත්

මාණවකය, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් නයි පෙට්ටියෙන් නයෙකුව ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ තමයි නයා. මේක නයිපෙට්ටිය. එතකොට නයා අනෙකෙක්. නයි පෙට්ටිය අනෙකක්. නමුත් නයි පෙට්ටියෙන් තමයි නයාව ඇදල ගත්තේ" කියලා. පින්වත් මාණවකය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වැනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා.

71. යම්පි මාණව භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගපච්චංගිං අහීනින්ද්‍රියං, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

71. පින්වත් මාණවකය, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... මේ කයෙන් වෙනත් වූ සියළු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා. මෙය අයිතිවන්නෙත් ඔහුගේ ප්‍රඥාවට ම යි.

72. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝ'පි හුත්වා බහුධා හෝති, බහුධා'පි හුත්වා ඒකෝ හෝති, ආවීභාවං තිරෝභාවං තිරෝකුඩ්ඩං තිරෝපාකාරං තිරෝපබ්බතං අසජ්ජමානෝ ග-ඡති සෙය්‍යථාපි ආකාසේ, පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරෝති සෙය්‍යථාපි උදකේ, උදකේපි අභිජ්ජමානේ ග-ඡති, සෙය්‍යථාපි පඨවිං, ආකාසේති පල්ලංකේන කමති, සෙය්‍යථාපි පක්ඛී සකුණෝ, ඉමේපි චන්දිමසූරියේ ඒවම්මහිද්ධිකේ ඒවම්මහානුභාවේ පාණිනා පරාමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලෝකා'පි කායේන වසං වත්තේති.

72. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වැනෑම දෙයකට හැරවිය හැකි පරිදි

සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි. එයට සිත නතු කරයි. තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. පෙනෙන්ට සළස්වනවා. නො පෙනී යනවා. බිත්තිය විනිවිද, ප්‍රාකාරය විනිවිද, පර්වතය විනිවිද කිසිවක් හා නො ගැටී, අහසේ යන්නාක් මෙන් යනවා. ජලයේ වගේ පොළොවෙහි කිදාබැසීමත්, උඩට මතුවීමත් කරනවා. පොළොව මතුපිට වගේ ජලය මත නො ගිලී ඇවිද යනවා. අහසෙහි පියාසරණ කුරුල්ලන් පරිද්දෙන් පළඟක් බැඳ ගෙන අහසේ යනවා. මේසා මහත් ඉර්ධි ඇති, මහානුභාව ඇති හිරු සඳු පවා අතින් අල්ලනවා. පිරිමඳිනවා. බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා.

73. සෙය්‍යථාපි මාණව, දක්ඛෝ කුම්භකාරෝ වා කුම්භකාරන්තේවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදේව භාජනවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය.

73. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ මැටිටෙන් යම් ම ආකාරයේ භාජනයක් හදන්ට කැමැති නම්, ඒ ඒ ආකාරයේ බඳුන් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා.

74. සෙය්‍යථාපි වා පන මාණව, දක්ඛෝ දන්තකාරෝ වා දන්තකාරන්තේවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදේව දන්තවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය.

74. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. දක්ෂ ඇත්දත් කැටයම්කරුවෙක් හෝ ඇත්දත් කැටයම්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ ඇත්දතක යම් ම ආකාරයේ ඇත් දළ කැටයමක් කරන්ට කැමති නම්, ඒ ඒ ආකාරයේ ඇත් දළ කැටයම් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා.

75. සෙය්‍යථාපි වා පන මාණව, දක්ඛෝ සුවණ්ණකාරෝ වා සුවණ්ණකාරන්තේවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදේව සුවණ්ණවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය;

75. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. දක්ෂ රන් කැටයම්කරුවෙක් හෝ රන් කැටයම්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ රනක යම් ම ආකාරයේ රන් කැටයමක් කරන්ට කැමති නම්, ඒ ඒ ආකාරයේ රන් කැටයම් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා.

76. ඒවමේව ඛෝ මාණව, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝ'පි හුත්වා බහුධා හෝති ..... යාව බ්‍රහ්මලෝකාපි කායේන වසං වත්තේති.

76. පින්වත් මාණවකය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි. එයට සිත නතු කරයි. තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා ..... බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා.

77. යම්පි මාණව භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... යාව බ්‍රහ්මලෝකා'පි කායේන වසං වත්තේති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

77. පින්වත් මාණවකය, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

78. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බාය සෝතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච.

78. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය

හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා. එයට සිත නතු කරනවා. එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා.

79. සෙය්‍යථාපි මාණව, පුරිසෝ අද්ධානමග්ගපටිපන්නෝ සෝ සුණෙය්‍ය භේරිසද්දම්'පි මුදිංගසද්දම්'පි සංඛපණවදෙණ්ඩිමසද්දම්'පි, තස්ස එවමස්ස: භේරිසද්දෝ ඉති'පි මුදිංගසද්දෝ ඉති'පි සංඛපණවදෙණ්ඩිමසද්දෝ ඉති'පි. එවමේව ඛෝ මාණව භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බාය සෝතධාතුයා විසුද්ධාය අතික්කන්ත-මානුසිකාය උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච.

79. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. දුගු ගමනකට පිළිපන් පුරුෂයෙක් ඉන්නවා. ඔහු බෙර හඬත්, මිහිඟු බෙර හඬත්, සක්, පනා බෙර, ගැට බෙර හඬත් අසනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක බෙර හඬක්, මේ තමයි මිහිඟු බෙර හඬ, මේක සක් හඬ, මේක පනා බෙර හඬ, මේක ගැට බෙර හඬ" කියලා. පින්වත් මාණවකය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා. එයට සිත නතු කරනවා. එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා.

80. යම්පි මාණව භික්ඛු එවං සමාහිතේ චිත්තේ ..... උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

80. පින්වත් මාණවකය, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

81. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉතෝපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ පරසත්තානං පරපුග්ගලානං ඉතසා ඉතෝ පරි-ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති, වීතදෝසං වා චිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති, සමෝහං වා චිත්තං සමෝහං චිත්තන්ති පජානාති, වීතමෝහං වා චිත්තං වීතමෝහං චිත්තන්ති පජානාති, සංඛිත්තං වා චිත්තං සංඛිත්තං චිත්තන්ති පජානාති, වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති, මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති, සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති, අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති, සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති, අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති, විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

81. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, අනුන් ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා. රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. රාග රහිත සිත වීතරාගී සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ රහිත සිත වීතදෝසී සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ සහිත සිත මෝහ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ රහිත සිත වීතමෝහී සිතක් වශයෙන් දැන ගන්නවා. හැකුළුනු සිත හැකිළුණු සිතක් වශයෙන් දැන ගන්නවා. විසිරුණු සිත විසිරුණු සිතක් වශයෙන් දැන ගන්නවා. සමාධිමත් සිත සමාධිමත් සිතක් වශයෙන් දැන ගන්නවා. සමාධි රහිත සිත සමාධි රහිත සිතක් වශයෙන් දැන ගන්නවා. නො දියුණු සිත නො දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා. දියුණු සිත දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා. එකඟ වෙන සිත එකඟ වෙන සිතක් වශයෙන් දැන ගන්නවා. එකඟ නො වෙන සිත එකඟ නො වෙන සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් මිදුණු සිත

කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් නොමිදුණු සිත කෙලෙසුන්ගෙන් නොමිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා.

82. සෙය්‍යථාපි මාණව, ඉත්ථී වා පුරිසෝ වා දහරෝ වා යුවා මණ්ඩනකජාතිකෝ ආදාසේ වා පරිසුද්ධේ පරියෝදාතේ අ-ඡේ වා උදකපත්තේ සකං මුඛනිමිත්තං ප-චවෙක්ඛමානෝ සකණිකං වා සකණිකන්ති ජානෙය්‍ය, අකණිකං වා අකණිකන්ති ජානෙය්‍ය. එවමේව ඛෝ මාණව, භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ෙ-තෝපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ පරසත්තානං පරපුග්ගලානං ෙ-තසා ෙ-තෝ පරි-ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති, වීතදෝසං වා චිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති, සමෝහං වා චිත්තං සමෝහං චිත්තන්ති පජානාති, වීතමෝහං වා චිත්තං වීතමෝහං චිත්තන්ති පජානාති, සංඛිත්තං වා චිත්තං ..... වික්ඛිත්තං වා චිත්තං ..... මහග්ගතං වා චිත්තං ..... අමහග්ගතං වා චිත්තං ..... සඋත්තරං වා චිත්තං ..... අනුත්තරං වා චිත්තං ..... සමාහිතං වා චිත්තං ..... අසමාහිතං වා චිත්තං ..... විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

82. පින්වත් මාණවකය, එක මේ වගේ දෙයක්. ලස්සනට සැරසෙන්ට කැමති ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දරුවෙක් හෝ තරුණයෙක් හෝ ඉන්නවා. ඔහු පිරිසිදු දීප්තිමත් කණ්ණාඩියක් ඉදිරියේ හෝ පැහැදිලි දිය ඇති බඳුනකින් හෝ තමන් ගේ මුව මඩල හොඳින් විමසා බලනවා. එතකොට දොස් ඇති තැන දොස් ඇති තැන වශයෙන් දැන ගන්නවා. දොස් නැති තැන දොස් නැති තැන වශයෙන් දැන ගන්නවා. පින්වත් මාණවකය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අනුන් ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා. රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. රාග රහිත සිත වීතරාගී

සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ රහිත සිත වීතදෝසී සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ සහිත සිත මෝහ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ රහිත සිත වීතමෝහී සිතක් වශයෙන් දැන ගන්නවා. හැකුළුනු සිත ..... විසිරුණු සිත ..... සමාධිමත් සිත ..... සමාධි රහිත සිත ..... නො දියුණු සිත ..... දියුණු සිත ..... එකඟ වෙන සිත ..... එකඟ නො වෙන සිත ..... කෙලෙසුන්ගෙන් මිදුණු සිත කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා.

83. යම්පි මාණව භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

83. පින්වත් මාණවකය, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

84. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: ඒකම්'පි ජාතිං, ද්වේ'පි ජාතියෝ, තිස්සෝ'පි ජාතියෝ, චතස්සෝ'පි ජාතියෝ, පඤ්ච'පි ජාතියෝ, දස'පි ජාතියෝ, වීසම්පි ජාතියෝ, තිංසම්පි ජාතියෝ, චත්තාරීසම්පි ජාතියෝ, පඤ්ඤාසම්පි ජාතියෝ, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනේකේ'පි සංවට්ටකප්පේ, අනේකේ'පි විවට්ටකප්පේ, අනේකේ'පි සංවට්ටවිවට්ටකප්පේ, අමුත්‍රාසිං ඒවන්නාමෝ ඒවං ගොත්තෝ ඒවං වණ්ණෝ ඒවමාහාරෝ ඒවං සුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උදපාදිං. තත්‍රාපාසිං ඒවන්නාමෝ ඒවං ගොත්තෝ ඒවං වණ්ණෝ ඒවමාහාරෝ ඒවං සුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති.

78. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාස්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර

වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. ඉතින් ඔහු නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක්, ජීවිත දෙකක්, ජීවිත තුනක්, ජීවිත හතරක්, ජීවිත පහක්, ජීවිත දහයක්, ජීවිත විස්සක්, ජීවිත තිහක්, ජීවිත හතළිහක්, ජීවිත පනහක්, ජීවිත සියයක්, ජීවිත දහසක්, ජීවිත ලක්ෂයක්, අනේකවිධ වූ සංවට්ට කල්පයන් ද, අනේකවිධ වූ විවට්ට කල්පයන් ද, අනේකවිධ වූ සංවට්ට විවට්ට කල්පයන් ද සිහි කරනවා. මං ඉස්සර සිටියේ අසවල් තැන, එතකොට මගේ නම මේක යි. ගෝත්‍ර නාමය මේක යි. හැඩරුව මෙහෙම යි. කෑම බීම මෙහෙම යි. දුක් සැප වින්දේ මේ විදිහට යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. ඒ මං එතැනින් චුත වුණා. අසවල් තැන උපන්නා. එතකොට මගේ නම වුණේ මේක යි. ගෝත්‍රනාමය මේක යි. හැඩරුව වුණේ මෙහෙමයි. කෑවේ බිව්වේ මෙහෙම යි. සැප දුක් වින්දේ මෙහෙම යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. මං එතැනින් චුත වුණා. මේ ලෝකෙ උපන්නා" ආදී වශයෙන් ආකාර සහිතව සවිස්තරව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා.

85. සෙය්‍යථාපි මාණව පුරිසෝ සකම්හා ගාමා අඤ්ඤං ගාමං ග-ඡෙය්‍ය තම්හා'පි ගාමා අඤ්ඤං ගාමං ග-ඡෙය්‍ය. සෝ තම්හා ගාමා සකඤ්ඤේව ගාමං ප-චාග-ඡෙය්‍ය. තස්ස ඒවමස්ස: "අහං ඛෝ සකම්හා ගාමං අමුං ගාමං ආග-ඡිං තත්‍ර ඒවං අට්ඨාසිං ඒවං නිසීදිං ඒවං අභාසිං ඒවං තුණ්හී අහෝසිං. තම්හා'පි ගාමා අමුං ගාමං අග-ඡිං තත්‍රාපි ඒවං අට්ඨාසිං ඒවං නිසීදිං ඒවං අභාසිං ඒවං තුණ්හී අහෝසිං. සෝ'ම්හි තම්හා ගාමා සකඤ්ඤේව ගාමං ප-චාගතෝති." ඒවමේව ඛෝ මාණව, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: ඒකම්'පි ජාතිං, ද්වේ'පි ජාතියෝ, තිස්සෝ'පි ජාතියෝ, චතස්සෝ'පි ජාතියෝ, පඤ්ච'පි ජාතියෝ, දස'පි ජාතියෝ, වීසම්පි ජාතියෝ, තිංසම්පි ජාතියෝ, චත්තාරීසම්පි ජාතියෝ, පඤ්ඤාසම්පි ජාතියෝ, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනේකේ'පි සංවට්ටකප්පේ, අනේකේ'පි විවට්ටකප්පේ, අනේකේ'පි සංවට්ට-විවට්ටකප්පේ, අමුත්‍රාසිං ඒවන්නාමෝ ඒවං ගොත්තෝ ඒවං වණ්ණෝ ඒවමාහාරෝ ඒවං සුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ

අමුත්‍ර උදපාදිං. තත්‍රාපාසිං ඒවන්නාමෝ ඒවං ගොත්තෝ ඒවං වණ්ණෝ ඒවමාහාරෝ ඒවං සුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති.

85. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමන් ගේ ගමෙන් වෙනත් ගමකට යනවා. ඒ ගමෙන් තවත් ගමකට යනවා. ඒ ගමෙන් යළි තමන් ගේ ගමට එනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. මං මගේ ගමෙන් අසවල් ගමට ගියා. මං එහෙදී මෙහෙමයි හිටියේ. මෙහෙමයි වාඩි වුණේ. මෙහෙමයි කතාබහ කළේ. මෙහෙමයි නිශ්ශබ්දව සිටියේ. ඉතින් මං ඒ ගමෙනුත් අසවල් ගමට ගියා. එහෙ හිටියේ මේ විදිහට යි. වාඩි වුණේ මේ විදිහට යි. කථාබස් කළේ මේ විදිහට යි. නිහඬව සිටියේ මේ විදිහට යි. ඒ මං ඒ ගමෙන් මගේ ගමටම නැවත ආවා" කියලා. පින්වත් මාණවකය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. ඉතින් ඔහු නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක්, ජීවිත දෙකක්, ජීවිත තුනක්, ජීවිත හතරක්, ජීවිත පහක්, ජීවිත දහයක්, ජීවිත විස්සක්, ජීවිත තිහක්, ජීවිත හතළිහක්, ජීවිත පනහක්, ජීවිත සියයක්, ජීවිත දහසක්, ජීවිත ලක්ෂයක්, අනේකවිධ වූ සංවට්ට කල්පයන් ද, අනේකවිධ වූ විවට්ට කල්පයන් ද, අනේකවිධ වූ සංවට්ට විවට්ට කල්පයන් ද සිහි කරනවා. මං ඉස්සර සිටියේ අසවල් තැන, එතකොට මගේ නම මේක යි. ගෝත්‍ර නාමය මේක යි. හැඩරුව මෙහෙම යි. කෑම බීම මෙහෙම යි. දුක් සැප වින්දේ මේ විදිහට යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. ඒ මං එතැනින් චුත වුණා. අසවල් තැන උපන්නා. එතකොට මගේ නම වුණේ මේක යි. ගෝත්‍රනාමය මේක යි. හැඩරුව වුණේ මෙහෙමයි. කෑවේ බිව්වේ මෙහෙම යි. සැප දුක් වින්දේ මෙහෙම යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. මං එතැනින් චුත වුණා. මේ ලෝකෙ උපන්නා" ආදී වශයෙන් ආකාර සහිතව සවිස්තරව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා.

86. යම්පි මාණව භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤෑය.

86. පින්වත් මාණවකය, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

87. **සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උප්පජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානති: ඉමේ වත භොන්තෝ සත්තා කායදු-චරිතේන සමන්නාගතා, වච්දු-චරිතේන සමන්නාගතා, මනෝදු-චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මි-ඡාදිට්ඨිකා, මි-ඡාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමේ වා පන භොන්තෝ සත්තා කායසුචරිතේන සමන්නාගතා, වච්සුචරිතේන සමන්නාගතා, මනෝසුචරිතේන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නාති. ඉති දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උප්පජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති.**

87. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා. එයට සිත නතු කරනවා. එතකොට ඒ භික්ෂුව මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. “අහෝ! මේ භවත් සත්වයන් කයින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, මනසින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයේ ඉපදිලා ඉන්නවා. ඒ වගේ ම මේ භවත් සත්වයන් කයින් සුචරිතයෙහි යෙදීම

නිසා, වචනයෙන් සුචරිතයෙහි යෙදීම නිසා, මනසින් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නොකොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ සුගති නම් වූ, ස්වර්ග ලෝකයෙහි ඉපදිලා ඉන්නවා" කියලා. මේ විදිහට මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිව්‍යසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා.

88. සෙය්‍යථාපි මාණව, මජ්ඣෙඩ්ඩි සිංඝාටකේ පාසාදෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ ඨිතෝ පස්සෙය්‍ය මනුස්සේ ගේහං පවිසන්තේ'පි නික්ඛමන්තේ'පි රථියා වීතිසඤ්චරන්තේ'පි මජ්ඣෙඩ්ඩි සිංඝාටකේ නිසින්නේ'පි, තස්ස එවමස්ස: ඒතේ මනුස්සා ගේහං පවිසන්ති. ඒතේ නික්ඛමන්ති. ඒතේ රථියා වීතිසඤ්චරන්ති. ඒතේ මජ්ඣෙඩ්ඩි සිංඝාටකේ නිසින්නාති.

88. පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. හතරමං හන්දියක තට්ටු නිවසක් තියෙනවා. එහි ඇස් ඇති පුරුෂයෙක් සිටගෙන බලාගෙන ඉන්නවා. ඔහු (පහළ) ගෙට ඇතුළ් වන්නා වූත්, නික්මෙන්නා වූත්, වීදියේ එහාට මෙහාට ඇවිදින්නා වූත්, හතරමං හන්දිය මැද වාඩි වී සිටින්නා වූත් මිනිසුන් දකිනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා "මේ මිනිසුන් ගෙට ඇතුළු වෙනවා. මේ උදවිය ගෙයින් නික්මෙනවා. මේ උදවිය වීදියේ එහාට මෙහාට ඇවිදිනවා. මේ උදවිය හතරමං හන්දිය මැද වාඩි වෙලා ඉන්නවා" කියලා.

89. එවමේව ඛෝ මාණව, භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උප්පජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානති: ඉමේ වත භොන්තෝ සත්තා කායදු-චරිතේන සමන්නාගතා, වචිදු-චරිතේන සමන්නාගතා, මනෝදු-චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මි-ඡාදිට්ඨිකා, මි-ඡාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමේ වා පන භොන්තෝ සත්තා කායසුචරිතේන සමන්නාගතා, වචිසුචරිතේන සමන්නාගතා, මනෝසුචරිතේන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං

ලෝකං උපපන්නාති. ඉති දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උප්පජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති.

89. පින්වත් මාණවකය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා. එයට සිත නතු කරනවා. එතකොට ඒ භික්ෂුව මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. “අහෝ! මේ භවත් සත්වයන් කයින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, මනසින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයේ ඉපදිලා ඉන්නවා. ඒ වගේ ම මේ භවත් සත්වයන් කයින් සුචරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් සුචරිතයෙහි යෙදීම නිසා, මනසින් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නොකොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ සුගති නම් වූ, ස්වර්ග ලෝකයෙහි ඉපදිලා ඉන්නවා” කියලා. මේ විදිහට මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා.

90. යම්පි මාණව භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... සුගතේ දුග්ගතේ යථාකම්මූපගේ සත්තේ පජානාති, ඉදම්පි ’ස්ස හෝති පඤ්ඤය.

90. පින්වත් මාණවකය, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

91. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමේ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. තස්ස එවං ජානතෝ එවං පස්සතෝ කාමාසවා'පි චිත්තං විමු-චති. භවාසවා'පි චිත්තං විමු-චති. අවිජ්ජාසවා'පි චිත්තං විමු-චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

91. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා. එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මේවා ආශ්‍රවයන් කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රවයන් ගේ හට ගැනීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස් වුණ බවට ඤාණය ඇති වෙනවා. "ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා.

සෙය්‍යථාපි මාණව, පබ්බතසංඛේපේ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ තීරේ ඨිතෝ පස්සෙය්‍ය සිප්පිසම්බුකම්'පි සක්ඛරකඨලම්'පි ම-ඡගුම්බම්'පි චරන්තම්'පි තිට්ඨන්තම්'පි. තස්ස එවමස්ස: අයං ඛෝ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්‍රිමේ සිප්පිසම්බූකා'පි සක්ඛරකඨලා'පි ම-ඡගුම්බා'පි චරන්ති'පි තිට්ඨන්ති'පිති. එවමේව ඛෝ මාණව, භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමේ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.

පින්වත් මාණවකය, ඒක මේ වගේ දෙයක්. පර්වත මුදුනක ජලාශයක් තියෙනවා. එහි ජලය ඉතා හොඳ යි. හරිම ප්‍රසන්න යි. කැළඹිලා නෑ. එතැන ඇස් ඇති පුරුෂයෙක් ඒ ඉවුරේ සිටගෙන ජලාශය දෙස බලා සිටිනවා. එතකොට ඔහුට සිප්පිබෙල්ලනුත්, සක්බෙල්ලනුත්, කැටකැබලිත්, මාළු රංචු ආදියත් හැසිරෙන අයුරු, සිටින අයුරු දකින්ට ලැබෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක ඉතා හොඳ ජලය ඇති හරිම ප්‍රසන්න වූ නොකැළඹුණු දිය ඇති විලක්. මෙහි මේ සිප්පිබෙල්ලන්, සක්බෙල්ලන්, කැටකැබලිති, මාළු රංචුත් හැසිරෙනවා නෙව. ඉන්නවා නෙව" කියල. පින්වත් මාණවකය, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වැනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා. එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යයයි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මේවා ආශ්‍රවයන් කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රවයන් ගේ හට ගැනීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය

ආශ්‍රව නිරුද්ධ වීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

92. තස්ස ඒවං ජානතෝ ඒවං පස්සතෝ කාමාසවා'පි චිත්තං විමු-චති. භවාසවා'පි චිත්තං විමු-චති. අවිජ්ජාසවා'පි චිත්තං විමු-චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. යම්පි මාණව භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

92. ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස් වුණ බවට ඤාණය ඇති වෙනවා. "ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා. මෙයත් ඔහු ගේ ප්‍රඥා ස්කන්ධයට අයිති දෙයක්. පින්වත් මාණවකය, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

93. අයං බෝ මාණව සෝ අරියෝ පඤ්ඤක්ඛන්ධෝ යස්ස සෝ භගවා වණ්ණවාදී අහෝසි, යත්ථ ච ඉමං ජනතං සමාදපේසි නිවේසේසි පතිට්ඨාපේසි. නත්ථි චේවෙත්ථ උත්තරිං කරණීයන්ති.

93. පින්වත් මාණවකය, මේ වනාහී ආර්ය වූ ප්‍රඥා ස්කන්ධය යි. ඒ භාග්‍යවතුන් වහන්සේ යම් ප්‍රඥාවක ගුණ වර්ණනා කළ සේක් නම්, මේ තුළ තමයි මේ ජනතාව සමාදන් කොට වදාළේ. ඇතුළු කොට වදාළේ පිහිටුවා වදාළේ. මෙම ප්‍රඥාවෙන් මතුවට නම් කළ යුතු කිසිදෙයක් නෑ.

94. "අච්ඡරියං හෝ ආනන්ද, අබ්භුතං හෝ ආනන්ද, සෝ චායං හෝ ආනන්ද අරියෝ පඤ්ඤක්ඛන්ධෝ පරිපුණ්ණෝ. ඒවම්පරිපුණ්ණඤ්චාහං හෝ ආනන්ද අරියං පඤ්ඤක්ඛන්ධං ඉතෝ බහිද්ධා අඤ්ඤේසු සමණබ්‍රාහ්මණේසු න සමනුපස්සාමි. නත්ථි චෙත්ථ උත්තරිං කරණීයන්ති. අභික්කන්තං හෝ ආනන්ද, අභික්කන්තං හෝ ආනන්ද. සෙය්‍යථාපි හෝ ආනන්ද නික්කුජ්ජිතං

වා උක්කුජ්ජෙය්‍ය. පටි-ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරේ වා තේල පජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තෝ රූපානි දක්ඛින්තීති. ඒවමේව ඛෝ භෝතා ආනන්දේන අනේකපරියායේන ධම්මෝ පකාසිතෝ. ඒසාහං භෝ ආනන්ද, භගවන්තං ගෝතමං සරණං ග-ඡාමි ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. උපාසකං මං භවං ආනන්දෝ ධාරේතු අජ්ජතග්ගේ පාණුපේතං සරණං ගතන්ති.

94. "භවත් ආනන්දයෙනි, ආශ්චර්යයි. භවත් ආනන්දයෙනි, පුදුම සහගත යි. භවත් ආනන්දයෙනි, ඒ මේ ආර්ය වූ ප්‍රඥා ස්කන්ධය නම් පරිපූර්ණ ම යි. අපරිපූර්ණ නොවේ. භවත් ආනන්දයෙනි, ඔය ආකාරයෙන් පරිපූර්ණ වූ ආර්ය වූ ප්‍රඥාස්කන්ධයක් මේ බුදු සසුනෙන් බැහැර වූ වෙන ආගමක ශ්‍රමණ බ්‍රාහ්මණයින් තුළ මම නම් දකින්නේ නෑ. මෙම ප්‍රඥාවෙන් මතුවට නම් කළ යුතු කිසිදෙයක් නෑ තමයි. "භවත් ආනන්දයන් වහන්ස, ඉතා සුන්දර යි. භවත් ආනන්දයන් වහන්ස ඉතා සුන්දර යි. යටට හරවා තිබූ දෙයක් උඩු අතට හැරෙව්වා වගෙයි. වහලා තිබුණු දෙයක් ඇරලා පෙන්නුවා වගෙයි. මං මුලා වූවන්ට නියම මග පෙන්වා දෙනවා වගෙයි. ඇස් ඇති උදවියට රූප දකින්න අඳුරෙහි තෙල් පහනක් දල්වා ගෙන දරා සිටිනවා වගෙයි. ඔය විදිහට භවත් ආනන්දයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ශ්‍රී සද්ධර්මය වදාළා. භවත් ආනන්දයන් වහන්ස, මේ මමත් භාග්‍යවතුන් ගෞතමයන් වහන්සේ ව සරණ යනවා. ශ්‍රී සද්ධර්මයත් ආර්ය මහා සංඝ රත්නයත් සරණ යනවා. භවත් ආනන්දයන් වහන්ස, මං ගැන අද පටන් දිවි තිබෙන තුරාවට ම තෙරුවන් සරණ ගිය උපාසකයෙක් ලෙස සළකන සේක්වා!

සුභසුත්තං නිට්ඨිතං දසමං.
දහ වෙනි සුභ සූත්‍රය නිමා විය.

සාදු ! සාදු !! සාදු !!!

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

11.
කේවඩ්ඪ සුත්තං
කේවඩ්ඪ ගෘහපති පුත්‍රයාට වදාළ දෙසුම

1. එවං මේ සුතං. එකං සමයං භගවා නාළන්දායං විහරති පාවාරිකම්බවනේ. අථ ඛෝ කේවඩ්ඪෝ ගහපතිපුත්තෝ යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නෝ ඛෝ කේවඩ්ඪෝ ගහපතිපුත්තෝ භගවන්තං එතදවෝච: අයං භන්තේ නාළන්දා ඉද්ධා චේව ඵීතා ච, බහුජනා ආකිණ්ණමනුස්සා, භගවති අභිප්පසන්නා. සාධු භන්තේ භගවා එකං භික්ඛුං සමාදිසතු යෝ උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති. එවායං නාළන්දා භියෝසෝමත්තාය භගවති අභිප්පසීදිස්සතීති.

1. මා හට අසන්ට ලැබුණේ මේ විදිහට යි. ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ වැඩසිටියේ නාළන්දාවේ පාවාරික අඹ වනයේ. එදා කේවඩ්ඪ ගෘහපති පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණුනා. පැමිණ භාග්‍යවතුන් වහන්සේට ආදරයෙන් වන්දනා කරල එකත්පසකින් වාඩිවුණා. එකත්පස්ව වාඩිවුණ කේවඩ්ඪ ගෘහපති පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළ කළා. “ස්වාමීනී, මේ නාළන්දා නුවර ඉතා දියුණු යි. බොහෝ මිනිසුන්ගෙන් ජනයාගෙන් පිරී තියෙනවා. අනික ඔවුන් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි හරියට පැහැදිලා ඉන්නේ. ඉතින් ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ යම් භික්ෂුවක් මිනිස් දහමින් උත්තරීතර වූ ඉර්ධිප්‍රාතිහාර්යයන් කරන්නේ නම් එබඳු එක් භික්ෂුවක් ඒ සඳහා යොදවන සේක්නම් කොතරම් අගේ ද! එතකොට මේ නාළන්දා වැසියන් ඒ දෙයින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වඩ වඩාත් බලවත්ව පහදීවි.”

2. එවං වුත්තේ භගවා කේවඩ්ඪං ගහපතිපුත්තං එතදවෝච: න ඛෝ අහං කේවඩ්ඪ භික්ඛූනං එවං ධම්මං දේසේමි. එථ තුම්හේ භික්ඛවේ ගිහීනං විදාතවසනානං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරෝථාති.

2. මෙසේ කී විට භාග්‍යවතුන් වහන්සේ කේවඩ්ඪ ගෘහපති පුත්‍රයාට මෙය වදාළා. “පින්වත් කේවඩ්ඪ, මං භික්ෂූන්ට “පින්වත් මහණෙනි, මෙහෙ

එව්. සුදුවත් හඳින ගිහි පින්වතුන් හට උතුරුමිනිස් දහම් වූ ඉර්ධි ප්‍රාතිහාර්යය දක්වව්" කියල ඔය විදිහට දහම් දෙසන්නේ නම් නෑ.

3. දුතියම්පි ඛෝ කේවඩ්ඪෝ ගහපතිපුත්තෝ භගවන්තං ඒතදවෝච: නාහං භන්තේ භගවන්තං ධංසේමි. අපි ච ඒවං වදාමි: අයං භන්තේ නාළන්දා ඉද්ධා චේව ඵීතා ච, බහුජනා ආකිණ්ණමනුස්සා, භගවති අභිප්පසන්නා. සාධු භන්තේ භගවා ඒකං භික්ඛුං සමාදිසතු යෝ උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති. ඒවායං නාළන්දා භියෝසෝමත්තාය භගවති අභිප්පසීදිස්සතීති. දුතියම්පි ඛෝ භගවා කේවඩ්ඪං ගහපතිපුත්තං ඒතදවෝච: න ඛෝ අහං කේවඩ්ඪ භික්ඛූනං ඒවං ධම්මං දේසේමි. ඒථ තුම්හේ භික්ඛවේ ගිහීනං විදාතවසනානං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරෝථාති.

3. දෙවන වතාවටත් කේවඩ්ඪ ගෘහපති පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පවසා සිටියා. "ස්වාමීනී, මං භාග්‍යවතුන් වහන්සේ ගේ ගුණ බැහැර කොට කථා කළා නොවේ. ඒ නිසයි මං මෙහෙම කියන්නේ. ස්වාමීනී, මේ නාළන්දා නුවර ඉතා දියුණු යි. බොහෝ මිනිසුන්ගෙන් ජනයාගෙන් පිරී තියෙනවා. අනික ඔවුන් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි හරියට පැහැදිලා ඉන්නේ. ඉතින් ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ යම් භික්ෂුවක් මිනිස් දහමින් උත්තරීතර වූ ඉර්ධිප්‍රාතිහාර්යයන් කරන්නේ නම් එබඳු එක් භික්ෂුවක් ඒ සඳහා යොදවන සේක්නම් කොතරම් අගේ ද! එතකොට මේ නාළන්දා වැසියන් ඒ දෙයින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වඩ වඩාත් බලවත් ව පහදීවි." කියල. දෙවෙනි වතාවට ද භාග්‍යවතුන් වහන්සේ කේවඩ්ඪ ගෘහපති පුත්‍රයාට මෙය වදාළා. "පින්වත් කේවඩ්ඪ, මං භික්ෂූන්ට "පින්වත් මහණෙනි, මෙහෙ එව්. සුදුවත් හඳින ගිහි පින්වතුන් හට උතුරුමිනිස් දහම් වූ ඉර්ධි ප්‍රාතිහාර්යය දක්වව්" කියල ඔය විදිහට දහම් දෙසන්නේ නම් නෑ.

4. තතියම්පි ඛෝ කේවඩ්ඪෝ ගහපතිපුත්තෝ භගවන්තං ඒතදවෝච: නාහං භන්තේ භගවන්තං ධංසේමි. අපි ච ඒවං වදාමි: අයං භන්තේ නාළන්දා ඉද්ධා චේව ඵීතා ච, බහුජනා ආකිණ්ණමනුස්සා, භගවති අභිප්පසන්නා. සාධු භන්තේ භගවා ඒකං භික්ඛුං සමාදිසතු යෝ උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති. ඒවායං නාළන්දා භියෝසෝමත්තාය භගවති අභිප්පසීදිස්සතීති.

4. තෙවෙනි වතාවටත් කේවඩ්ඪ ගෘහපති පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පවසා සිටියා. "ස්වාමීනී, මං භාග්‍යවතුන් වහන්සේ

ගේ ගුණ බැහැර කොට කථා කළා නොවේ. ඒ නිසයි මං මෙහෙම කියන්නේ. ස්වාමීනී, මේ නාළන්දා නුවර ඉතා දියුණු යි. බොහෝ මිනිසුන්ගෙන් ජනයාගෙන් පිරී තියෙනවා. අනික ඔවුන් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි හරියට පැහැදිලා ඉන්නේ. ඉතින් ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ යම් භික්ෂුවක් මිනිස් දහමින් උත්තරීතර වූ ඉර්ධිප්‍රාතිහාර්යයන් කරන්නේ නම් එබඳු එක් භික්ෂුවක් ඒ සඳහා යොදවන සේක්නම් කොතරම් අගේ ද! එතකොට මේ නාළන්දා වැසියන් ඒ දෙයින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වඩ වඩාත් බලවත් ව පහදීවි." කියල.

5. "තීණි ඛෝ ඉමානි කේවට්ට පාටිහාරියානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදිතානි. කතමානි තීණි? ඉද්ධිපාටිහාරියං. ආදේසනාපාටිහාරියං. අනුසාසනීපාටිහාරියන්ති. කතමඤ්ච කේවට්ට ඉද්ධිපාටිහාරියං? ඉධ කේවට්ට භික්ඛු අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝපි හුත්වා බහුධා හෝති, බහුධාපි හුත්වා ඒකෝ හෝති, ආවීභාවං තිරෝභාවං තිරෝකුඩ්ඩං තිරෝපාකාරං තිරෝපබ්බතං අසජ්ජමානෝ ග-ඡති සෙය්‍යථාපි ආකාසේ, පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරෝති සෙය්‍යථාපි උදකේ, උදකේපි අභිජ්ජමානේ ග-ඡති, සෙය්‍යථාපි පඨවියං, ආකාසේපි පල්ලංකේන කමති, සෙය්‍යථාපි පක්ඛී සකුණෝ, ඉමේපි චන්දිමසූරියේ ඒවංමහිද්ධිකේ ඒවංමහානුභාවේ පාණිනා පරාමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලෝකාපි කායේන වසං වත්තේති.

5. පින්වත් කේවට්ඨ, මා විසින් ස්වකීය ප්‍රඥාවෙන් සාක්ෂාත් කොට දෙසන ලද මේ ප්‍රාතිහාර්යයන් තුනක් තියෙනවා. මොනවා ද ඒ තුන? ඉර්ධි ප්‍රාතිහාර්යයත්, ආදේශනා ප්‍රාතිහාර්යයත්, අනුශාසනා ප්‍රාතිහාර්යයත් යන තුන යි. පින්වත් කේවට්ඨ, මොකක් ද මේ ඉර්ධි ප්‍රාතිහාර්යය? පින්වත් කේවට්ඨ, මෙහිලා භික්ෂුව, අනේක ප්‍රකාර වූ ඉර්ධි ප්‍රාතිහාර්යය දක්වනවා. ඒ කියන්නේ තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. පෙනෙන්ට සළස්වනවා. නො පෙනී යනවා. බිත්තිය විනිවිද, ප්‍රාකාරය විනිවිද, පර්වතය විනිවිද කිසිවක් හා නො ගැටී අහසේ යන්නාක් මෙන් යනවා. ජලයේ වගේ පොළොවෙහි කිදාබැසීමත්, උඩට මතුවීමත් කරනවා. පොළොව මතුපිට වගේ ජලය මත නො ගිලී ඇවිද යනවා. අහසෙහි පියාසළණ කුරුල්ලන් පරිද්දෙන් පළඟක් බැඳ ගෙන අහසේ යනවා. මේ සා මහත් ඉර්ධි ඇති, මහානුභාව ඇති හිරු සඳු පවා අතින් අල්ලනවා. පිරිමඳිනවා. බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා.

6. තමේනං අඤ්ඤතරෝ සද්ධෝ පසන්නෝ පස්සති තං භික්ඛුං අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභොන්තං, ඒකම්පි හුත්වා බහුධා හොන්තං, බහුධාපි හුත්වා ඒකං හොන්තං, ආවීභාවං තිරෝභාවං තිරෝකුඩ්ඩං තිරෝපාකාරං තිරෝපබ්බතං අසජ්ජමානං ග-ඡන්තං සෙය්‍යථාපි ආකාසේ, පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරොන්තං සෙය්‍යථාපි උදකේ, උදකේපි අභිජ්ජමානේ ග-ඡන්තං, සෙය්‍යථාපි පඨවියං, ආකාසේපි පල්ලංකේන කමන්තං, සෙය්‍යථාපි පක්ඛී සකුණෝ, ඉමේපි චන්දිමසුරියේ ඒවංමහිද්ධිකේ ඒවංමහානුභාවේ පාණිනා පරිමසන්තං පරිමජ්ජන්තං, යාව බ්‍රහ්මලෝකාපි කායේන වසං වත්තෙන්තං.

6. විකට ශ්‍රද්ධාවන්ත ඇතැම් කෙනෙක් පැහැදේවි තමයි. ඒ භික්ෂුව අනේක ප්‍රකාර වූ ඉර්ධි ප්‍රාතිහාර්යය දක්වනවා නෙව. ඒ කියන්නේ තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා නෙව. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා නෙව. පෙනෙන්ට සළස්වනවා නෙව. නො පෙනී යනවා නෙව. බිත්තිය විනිවිද, ප්‍රාකාරය විනිවිද, පර්වතය විනිවිද කිසිවක් හා නො ගැටී අහසේ යන්නාක් මෙන් යනවා නෙව. ජලයේ වගේ පොළොවෙහි කිදාබැසීමත්, උඩට මතුවීමත් කරනවා නෙව. පොළොව මතුපිට වගේ ජලය මත නො ගිලී ඇවිද යනවා නෙව. අහසෙහි පියාසළණ කුරුල්ලන් පරිද්දෙන් පළඟක් බැඳ ගෙන අහසේ යනවා නෙව. මේසා මහත් ඉර්ධි ඇති, මහානුභාව ඇති හිරු සඳු පවා අතින් අල්ලනවා නෙව. පිරිමඳිනවා නෙව. බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා නෙව.

7. තමේනං සෝ සද්ධෝ පසන්නෝ අඤ්ඤතරස්ස අස්සද්ධස්ස අප්පසන්නස්ස ආරෝචේති: අච්ඡරියං වත භෝ අබ්භුතං වත භෝ සමණස්ස මහිද්ධිකතා මහානුභාවතා. අමාහං භික්ඛුං අද්දසං අනේකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොන්තං: ඒකම්පි හුත්වා බහුධා හොන්තං, බහුධාපි හුත්වා ඒකම්පි හොන්තං ..... යාව බ්‍රහ්මලෝකාපි කායේන වසං වත්තෙන්තන්ති. තමේනං අස්සද්ධෝ අප්පසන්නෝ තං සද්ධං පසන්නං ඒවං වදෙය්‍ය: අත්ථි කිර භෝ ගන්ධාරී නාම විජ්ජා. තාය සෝ භික්ඛු අනේකවිහිතං ඉද්ධිවිධං පච්චානුභොන්තං: ඒකම්පි හුත්වා බහුධා හොන්තං, බහුධාපි හුත්වා ඒකම්පි හොන්තං ..... යාව බ්‍රහ්මලෝකාපි කායේන වසං වත්තේතීති. තං කිං මඤ්ඤසි කේවඩ්ඪ? අපි නු සෝ අස්සද්ධෝ අප්පසන්නෝ තං සද්ධං පසන්නං ඒවං වදෙය්‍යා?"ති. "වදෙය්‍ය භන්තේ"ති. "ඉමං ඛෝ අහං කේවඩ්ඪ ඉද්ධිපාටිහාරියේ ආදීනවං සම්පස්සමානෝ ඉද්ධිපාටිහාරියේන අට්ටියාමි හරායාමි ජිගුච්ඡාමි.

7. එතකොට ඒ ගැන පැහැදුන සද්ධාවන්ත කෙනා ශ්‍රද්ධාරහිත ව නො පැහැදුනු සිතින් සිටින තවත් කෙනෙකුට වික දැනුම් දෙනවා. භවත්නි, ඒ ශ්‍රමණයන් වහන්සේ ගේ මහා ඉර්ධිමත් බව, මහානුභාව ඇති බව ආශ්චර්ය යි. භවත්නි, පුදුම සහගත යි. මේ ඒ භික්ෂුව අනේකප්‍රකාර විදිහට ඉර්ධිප්‍රාතිහාර්යය දක්වන හැටි මං දැක්කා නෙව. තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා නෙව. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා නෙව ..... බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා නෙව. එතකොට සද්ධා රහිත වූ නො පහන් වූ කෙනා අර ශ්‍රද්ධාවන්ත පහන් වූ කෙනාට මෙහෙම කියන්ට පුළුවනි. "භවත, ගන්ධාරී කියලත් විජ්ජාවක් තියෙනවා නෙව. ඒ භික්ෂුව අනේක ප්‍රකාර ඉර්ධි ප්‍රාතිහාර්ය දක්වන්ට ඇත්තේ ඒකෙන් තමයි. ඒ කියන්නේ තනි කෙනෙක් ඉඳගෙන බොහෝ දෙනෙක්ව වශයෙන් පෙනී සිටිනවා නෙව. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා නෙව ..... බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා නෙව. පින්වත් කේවඩ්ඪ ඒ ගැන ඔබ කුමක් ද හිතන්නේ? ඒ සද්ධා රහිත වූ නො පහන් පුද්ගලයා අර සැදැහැවත් පැහැදුනු කෙනාට ඔය විදිහට කියාවි නේද? "ස්වාමීනී, එහෙම කියාවි නම් තමයි." "පින්වත් කේවඩ්ඪ, ඉර්ධි ප්‍රාතිහාර්යයේ තිබෙන ඔය දෝෂය දැකල තමයි මං ඉර්ධි ප්‍රාතිහාර්යය ගැන අකමැති වෙන්නේ. ලැජ්ජා වෙන්නේ. පිළිකුල් කරන්නේ."

8. **කතමඤ්ච කේවඩ්ඪ ආදේසනාපාටිහාරියං? ඉධ කේවඩ්ඪ භික්ඛු පරසත්තානං පරපුග්ගලානං චිත්තම්පි ආදිසති චේතසිකම්පි ආදිසති විතක්කිතම්පි ආදිසති විචාරිතම්පි ආදිසති: ඒවම්පි තේ මනෝ, ඉත්ථම්පි තේ මනෝ, ඉතිපි තේ චිත්තන්ති. තමේනං අඤ්ඤතරෝ සද්ධෝ පසන්නෝ පස්සති තං භික්ඛුං පරසත්තානං පරපුග්ගලානං චිත්තම්පි ආදිසන්තං චේතසිකම්පි ආදිසන්තං විතක්කිතම්පි ආදිසන්තං විචාරිතම්පි ආදිසන්තං: ඒවම්පි තේ මනෝ, ඉත්ථම්පි තේ මනෝ, ඉතිපි තේ චිත්තන්ති.**

8. පින්වත් කේවඩ්ඪ, ආදේශනා ප්‍රාතිහාර්යය කියන්නේ මොකක් ද? පින්වත් කේවඩ්ඪ, මෙහිලා භික්ෂුව පිටස්තර උදවිය ගේ, පිටස්තර පුද්ගලයන් ගේ සිත ද හෙළිදරව් කරනවා. සිතේ ස්වභාවයන් ද හෙළිදරව් කරනවා. විතර්ක කරන දේත් හෙළිදරව් කරනවා. හිත හැසිරෙන හැටිත් හෙළිදරව් කරනවා. "ඔබේ මනස මේ විදිහ යි. ඔබේ මනස මේ විදිහටත් තියෙනවා. ඔබේ සිත මේ විදිහ යි" කියල. එතකොට "ඔබේ මනස මේ විදිහ යි. ඔබේ

මනස මේ විදිහටත් තියෙනවා. ඔබේ සිත මේ විදිහ යි" කියල පිටස්තර උදවිය ගේ, පිටස්තර පුද්ගලයන් ගේ සිත ද හෙළිදරව් කරන, සිතේ ස්වභාවයන් ද හෙළිදරව් කරන, විතර්ක කරන දේත් හෙළිදරව් කරන, හිත හැසිරෙන හැටිත් හෙළිදරව් කරන ඒ භික්ෂුව සැදැහැවත් පහන් වූ ඇතැම් කෙනෙකුට දකින්ට ලැබෙනවා.

තමේනං සෝ සද්ධෝ පසන්නෝ අඤ්ඤතරස්ස අස්සද්ධස්ස අප්පසන්නස්ස ආරෝචේති: අච්ඡරියං වත භෝ අබ්භුතං වත භෝ සමණස්ස මහිද්ධිකතා මහානුභාවතා. අමාහං භික්ඛුං අද්දසං පරසත්තානං පරපුග්ගලානං චිත්තම්පි ආදිසන්තං චේතයිතම්පි ආදිසන්තං විතක්කිතම්පි ආදිසන්තං විචාරිතම්පි ආදිසන්තං: ඒවම්පි තේ මනෝ, ඉත්ථම්පි තේ මනෝ, ඉතිපි තේ චිත්තන්ති. තමේනං සෝ අස්සද්ධෝ අප්පසන්නෝ තං සද්ධං පසන්නං ඒවං වදෙය්‍ය: අත්ථි ඛෝ භෝ මණිකා නාම විජ්ජා. තාය සෝ භික්ඛු පරසත්තානං පරපුග්ගලානං චිත්තම්පි ආදිසති චේතසිකම්පි ආදිසති විතක්කිතම්පි ආදිසති විචාරිතම්පි ආදිසති: ඒවම්පි තේ මනෝ, ඉත්ථම්පි තේ මනෝ, ඉතිපි තේ චිත්තන්ති. තං කිං මඤ්ඤසි කේවඩ්ඪ? අපි නු සෝ අස්සද්ධෝ අප්පසන්නෝ තං සද්ධං පසන්නං ඒවං වදෙය්‍යා?"ති. "වදෙය්‍ය භන්තේ"ති. ඉමං ඛෝ අහං කේවඩ්ඪ ආදේසනා පාටිහාරියේ ආදීනවං සම්පස්සමානෝ ආදේසනාපාටිහාරියේන අට්ටියාමි හරායාමි ජිගුච්ඡාමි.

එතකොට ඒ ගැන පැහැදුන සද්ධාවන්ත කෙනා ශ්‍රද්ධාරහිත ව නො පැහැදුනු සිතින් සිටින තවත් කෙනෙකුට වික දැනුම් දෙනවා. භවත්නි, ඒ ශ්‍රමණයන් වහන්සේ ගේ මහා ඉර්ධිමත් බව, මහානුභාව ඇති බව ආශ්චර්ය යි. භවත්නි, පුදුම සහගත යි. මේ ඒ භික්ෂුව "ඔබේ මනස මේ විදිහ යි. ඔබේ මනස මේ විදිහටත් තියෙනවා. ඔබේ සිත මේ විදිහ යි" කියල පිටස්තර උදවිය ගේ, පිටස්තර පුද්ගලයන් ගේ සිත ද හෙළිදරව් කරන හැටි, සිතේ ස්වභාවයන් ද හෙළිදරව් කරන හැටි, විතර්ක කරන දේත් හෙළිදරව් කරන හැටි, හිත හැසිරෙන හැටිත් හෙළිදරව් කරන හැටි මං දැක්කා නෙව. එතකොට සද්ධා රහිත වූ නො පහන් වූ කෙනා අර ශ්‍රද්ධාවන්ත පහන් වූ කෙනාට මෙහෙම කියන්ට පුළුවනි. "භවත මණිකා කියලත් විජ්ජාවක් තියෙනවා නෙව. ඒ භික්ෂුව "ඔබේ මනස මේ විදිහ යි. ඔබේ මනස මේ විදිහටත් තියෙනවා. ඔබේ සිත මේ විදිහ යි" කියල පිටස්තර උදවිය ගේ, පිටස්තර පුද්ගලයන් ගේ සිත ද හෙළිදරව් කරන්නේ, සිතේ ස්වභාවයන් ද හෙළිදරව් කරන්නේ, විතර්ක කරන දේත් හෙළිදරව් කරන්නේ, හිත හැසිරෙන හැටිත් හෙළිදරව් කරන්නේ ඔය විජ්ජාවෙන් තමයි කියල. පින්වත් කේවඩ්ඪ, ඒ ගැන ඔබ කුමක් ද

හිතන්නේ? ඒ සද්ධා රහිත වූ නො පහන් පුද්ගලයා අර සැදැහැවත් පැහැදුනු කෙනාට ඔය විදිහට කියාවි නේද? "ස්වාමීනී, එහෙම කියාවි නම් තමයි." "පින්වත් කේවඩ්ඪ, ආදේශනා ප්‍රාතිහාර්යයේ තිබෙන ඔය දෝෂය දැකල තමයි මං ආදේශනා ප්‍රාතිහාර්යය ගැන අකමැති වෙන්නේ. ලැජ්ජා වෙන්නේ. පිළිකුල් කරන්නේ. "

9. කතමඤ්ච කේවඩ්ඪ අනුසාසනීපාටිහාරියං? ඉධ කේවඩ්ඪ භික්ඛු එවමනුසාසති: එවං විතක්කේථ, මා එවං විතක්කයිත්ථ, එවං මනසිකරෝථ, මා එවං මනසාකත්ථ, ඉදං පජහථ, ඉදං උපසම්පජ්ජ විහරථාති. ඉදම්පි වුච්චති කේවඩ්ඪ අනුසාසනීපාටිහාරියං.

9. පින්වත් කේවඩ්ඪ, අනුශාසනා ප්‍රාතිහාර්යය කියන්නේ මොකක් ද? පින්වත් කේවඩ්ඪ, මෙහිලා භික්ෂුව මේ විදිහට අනුශාසනා කරනවා. "මේ අයුරින් කල්පනා කරන්න. මේ අයුරින් කල්පනා කරන්න එපා. මේ විදිහට මෙනෙහි කරන්න. මේ විදිහට මෙනෙහි කරන්න එපා. මේ දේ අත්හරින්න. මේ දේ උපදවා ගෙන වාසය කරන්න" කියල. පින්වත් කේවඩ්ඪ, මේකට තමයි අනුශාසනා ප්‍රාතිහාර්යය කියල කියන්නේ.

10. පුන ච පරං කේවඩ්ඪ ඉධ තථාගතෝ ලෝකේ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣේඩිකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසේති.

10. පින්වත් කේවඩ්ඪ, තවදුරටත් කියනවා නම්, මෙහි අරහත් වූ, සම්මාසම්බුද්ධ වූ, විජ්ජාචරණසම්පන්න වූ, සුගත වූ, ලෝකවිදූ වූ, අනුත්තර පුරිසදම්ම සාරථී වූ, සත්ථා දේවමනුස්සානං වූ, බුද්ධ වූ, භගවා වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපත ලබනවා. උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙවිමිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඤාණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා.

11. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තෝ වා අඤ්ඤතරස්මිං වා කුලේ ප-ච්චාජාතෝ. සෝ තං ධම්මං සුත්වා තථාගතේ සද්ධං පටිලභති. සෝ තේන සද්ධාපටිලාභේන සමන්නාගතෝ ඉති පටිසංචික්ඛති: "සම්බාධෝ ඝරාවාසෝ රජෝපථෝ. අබ්භෝකාසෝ පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා ඒකන්තපරිපුණ්ණං ඒකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කේසමස්සුං ඡිඳාරෙත්වා කාසායානි වත්ථානි අ-ච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති. සෝ අපරේන සමයේන අප්පං වා භෝගක්ඛන්ධං පහාය මහන්තං වා භෝගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කේසමස්සුං ඡිඳාරෙත්වා කාසායානි වත්ථානි අ-ච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සෝ ඒවං පබ්බජිතෝ සමානෝ පාතිමොක්ඛ-සංවරසංවුතෝ විහරති, ආචාරගෝචරසම්පන්නෝ, අණුමත්තේසු වජ්ජේසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදේසු, කායකම්මවචිකම්මේන සමන්නාගෝ කුසලේන, පරිසුද්ධාජීවෝ, සීලසම්පන්නෝ, ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ, භෝජනේ මත්තඤ්ඤූ, සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ සන්තුට්ඨෝ.

එතකොට ගෘහපතියෙක් වේවා, ගෘහපති පුත්‍රයෙක් වේවා කවර හෝ කුලයක උපන් කෙනෙක් වේවා ඒ ධර්මය අසනවා. ඔහු ඒ ධර්මය අසලා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ගන්නවා. ඉතින් ඔහු ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වෙලා මේ විදිහට නුවණින් කල්පනා කරනවා. "ගිහි ගෙදර වාසය කිරීම හරිම කරදරයක්. කෙලෙස් වැඩෙන මාවතක්. නමුත් පැවිදි ජීවිතය ආකාසය වගේ. ගිහි ගෙදර වාසය කරමින් මුළුමණින් ම පිරිපුන්, මුළුමණින් ම පිරිසිදු, සුදෝසුදු බඹසර වසනවා යන කාරණ ලෙහෙසි එකක් නොවේ. ඒ නිසා මං කෙස් රැවුල් බාලා, කසාවත් පොරොවාගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට ඇතුළත් වෙන එක තමයි හොඳ" කියලා. ඔහු පස්සෙ කාලෙක ස්වල්ප වූ භෝග සම්පත් අත්හරිනවා. මහත් වූ භෝග සම්පත් අත්හරිනවා. ස්වල්ප වූ නෑදෑයන් අත්හරිනවා. මහත් වූ නෑදෑයන් අත්හරිනවා. කෙස් රැවුල් බාල, කසාවත් පොරොවාගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙනවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් (පැවිද්දෙක් විසින් රැකගත යුතු නිවනට උපකාරී වන උතුම් සිල්පදවලින්) සංවරව ඉන්නවා. යහපත් ඇවැතුම් පැවැතුම්වලින් යුතු වෙනවා. අණුමාත්‍ර වූ වරදෙහි පවා භය දකිනවා. සික්ෂාපදවල සමාදන්ව හික්මෙනවා. කුසල්සහගත කායකර්මයෙන් හා වචිකර්මයෙන් යුතු වෙනවා. පිරිසිදු ආජීවයෙන් යුතු වෙනවා. සිල්වත් වෙනවා. අකුසලයෙන් වැළකූ දොරටු ඇතුව

ඉන්නවා. නුවණින් සළකා ආහාර ගන්නවා. සිහිනුවණින් යුතුව ඉන්නවා. ලද දෙයින් සතුටුව ඉන්නවා.

12. කථඤ්ච කෝඩඩිඨ භික්ඛු සීලසම්පන්නෝ හෝති? ඉධ කෝඩඩිඨ භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ හෝති. නිහිතදණ්ඩෝ නිහිතසත්ථෝ ලජ්ජී දයාපන්නෝ සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතෝ හෝති. දින්නාදායී දින්නපාටිකංඛී අථේනේන සුචිභූතේන අත්තනා විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හෝති. ආරාචාරී විරතෝ මේථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතෝ හෝති. ස-චචාදී ස-චසන්ධෝ ථේතෝ ප-චයිකෝ අවිසංවාදකෝ ලෝකස්ස. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතෝ හෝති. ඉතෝ සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමේසං භේදාය. අමුත්‍ර වා සුත්වා න ඉමේසං අක්ඛාතා අමූසං භේදාය. ඉති භින්නානං වා සන්ධාතා සංහිතානං වා අනුප්පදාතා. සමග්ගාරාමෝ සමග්ගරතෝ සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතෝ හෝති. යා සා වාචා නේළා කණ්ණසුඛා පේමනීයා හදයංගමා පෝරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතෝ හෝති. කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී, නිධානවතිං වාචං භාසිතා හෝති කාලේන සාපදේසං පරියන්තවතිං අත්ථසඤ්හිතං. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

12. පින්වත් කෝඩඩිඨ, භික්ෂුව සීලයෙන් යුක්ත වන්නේ කොහොම ද? පින්වත් කෝඩඩිඨ, මෙහි භික්ෂුව සතුන් මැරීම අත්හැරදාල සතුන් මැරීමෙන් වැළකී ඉන්නවා. දඬු මුගුරු අත් හැරදාල, අවි ආයුධ බැහැර කරලා, පවට ලැජ්ජා ඇතිව ඉන්නවා. සතුන් කෙරෙහි දයාවන්ත වෙනවා, සියවි ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. නුදුන් දේ ගැනීම අත්හැරලා නුදුන් දේ ගැනීමෙන් වැළකී ඉන්නවා. දුන් දේ පමණක් පිළිගන්නවා. දුන් දේ පමණක් පිළිගනු කැමති වෙනවා. සොර රහිත සිතින් යුතු වූ පිරිසිදු සිතින් යුතු වූ ජීවිතයකින් වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. අබ්‍රහ්මචාරී බව අත් හැරලා බ්‍රහ්මචාරීව ඉන්නවා. ලාමක දෙයක් වූ මෛථුන සේවනයෙන් වැළකී එය දුරින් ම දුරුකර දමනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. බොරු කීම අත් හැරල, බොරු කීමෙන් වැළකී ඉන්නවා. සත්‍යය කථා කරනවා. ඇත්තෙන් ඇත්ත ගලපනවා. ස්ථිරව

පිහිටලා කථාකරනවා. පිළිගත හැකි දේ කථා කරනවා. ලෝකයාව රවටන්නේ නෑ. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. කේලාම් කීම අත්හැරලා කේලාම් කීමෙන් වැළකී ඉන්නවා. මෙතැනින් අහලා මේ අය බිඳවන්නට අතන කියන්නෙ නෑ. අතනින් අහලා ඒ උදවිය බිඳවන්නට මෙතැන කියන්නේ නෑ. මේ අයුරින් බිඳුනු උදවිය සමගි කරවනවා. සමගි වූවන්ට අනුබල දෙනවා. සමගි වූවන් හා වාසයට කැමතියි. සමගි වූවන් හා එක්ව වසනවා. සමගි වූවන් සමග සතුටු වෙනවා. සාමය උදෙසා සාමකාමී වචන කතා කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. පරුෂ වචනය අත් හැරලා පරුෂ වචනයෙන් වැළකී ඉන්නවා. යම් වචනයක් දොස් රහිත නම්, කණට සැප නම්, ආදරවන්ත නම්, හෘදයාංගම නම්, ශිෂ්ට සම්පන්න නම්, බොහෝ ජනයා කැමති නම්, බොහෝ ජනයාට ප්‍රියමනාප නම් එබඳු වූ වචන පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. තේරුමක් නැති කතා බහ අත් හැරලා තේරුමක් නැති කතා කීමෙන් වැළකී සිටිනවා. කල්යල් බලා කථා කරනවා. ඇත්ත කතා කරනවා. අර්ථවත් දෙය කතා කරනවා. ධර්මය ම කථා කරනවා. විනය ම කථා කරනවා. සිත්හි ලා දරාගැනීමට සුදුසු, වෙලාවට ගැලපෙන උපදේශ සහිත වූ, මදිපාඩුකම් නො තබා, ප්‍රමාණවත් පරිදි, දෙලොව යහපත පිණිස වූ දේ පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

13. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඒකභත්තිකෝ රත්තූපරතෝ පවිරතෝ විකාලභෝජනා. න-චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතෝ හෝති. මාලාගන්ධවිලේපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතෝ හෝති. උ-චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ජාතරූපරජත පටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකමංසපටිග්ගහණා පටිවිරතෝ හෝති. ඉත්ථිකුමාරික-පටිග්ගහණා පටිවිරතෝ හෝති. දාසිදාසපටිග්ගහණා පටිවිරතෝ හෝති. අජේළකපටිග්ගහණා පටිවිරතෝ හෝති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතෝ හෝති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා පටිවිරතෝ හෝති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතෝ හෝති. දූතෙය්‍ය පහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. කයවික්කයා පටිවිරතෝ හෝති. තුලාකූටකංසකූට-මානකූටා පටිවිරතෝ හෝති. උක්කෝටනවඤ්චනනිකතිසාචියෝගා පටිවිරතෝ හෝති. ඡේදනවධබන්ධනවිපරාමෝසආලෝපසහසාකාරා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

13. පැලවෙන බීජ හා පැල වුණ ගස් කොළන් විනාශ කිරීමෙන් වැළකී ඉන්නවා. එක් වරුවේ බොජුන් වළඳනවා. රාත්‍රී ආහාරයෙන් වැළකී විකාල භෝජනයෙන් වැළකී ඉන්නවා. නැටුම්, ගැයුම්, වැයුම් හා විසූක දර්ශනයන් නැරඹීමෙන් වැළකී ඉන්නවා. මල් සුවඳ විලවුන් දැරීමෙන් ද ඇඟපත සැරසීමෙන් ද විසිතුරු වස්ත්‍රාභරණයෙන් සැරසීමෙන් ද වැළකී ඉන්නවා. ප්‍රමාණය ඉක්ම වූ උස් ආසන ද වටිනා සුඛෝපභෝගී ආසන ද පරිහරණයෙන් වැළකී ඉන්නවා. රන් රිදී මිල මුදල් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු ධාන්‍ය පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු මස් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ස්ත්‍රීන්, කුමරියන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. දැසි දස්සන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. එළුබැටළුවන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කුකුළන් ඌරන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ඇතුන් ගවයන් අසුන් වෙළඹුන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කෙත් වතු පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ගිහි කටයුතු සඳහා දූත මෙහෙවර කිරීමෙන් වැළකී ඉන්නවා. වෙළඳාම් කිරීමෙන් වැළකී ඉන්නවා. තරාදියෙන් රැවටීම, නො වටනා දෙයින් රැවටීම, මිනුමෙන් රැවටීම යන මෙයින් වැළකී ඉන්නවා. අල්ලස් ගෙන හිමිකරුවන් ගේ දේ අහිමි කිරීම, වංචා කිරීම, බාල දේ වටිනා දේ හැටියට පෙන්වීම, ආදී නොයෙක් වංචනික දෙයින් වැළකී ඉන්නවා. අත්පා කැපීම් මැරීම් බන්ධන කිරීම් මං පැහැරගැනීම්, ගම් පැහැර ගැනීම් ආදී සැහැසි දෙයින් වැළකී සිටිනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

14. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං: මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං අග්ගබීජං බීජබීජමේව පඤ්චමං. ඉති වා ඉති ඒවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

14. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ විදිහේ පැලවෙන දේ හා ගස් කොළන් ආදිය වනසමින් ඉන්නවා. ඒ කියන්නේ මුලින් පැලවෙන දේවල්, කඳින් පැලවෙන දේවල්, පුරුකින් පැලවෙන දේවල්, දල්ලෙන් පැලවෙන දේවල්, බිජුවටින් පැලවෙන දේවල් යන ආදිය වනසමින් ඉන්නවා. ගස් කොළන් සිඳලීම් ආදී මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලිනුත් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

15. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං සන්නිධිකාරපරිභෝගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉති ඒවරූපා සන්නිධිකාරපරිභෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

15. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ දේ රැස්කරගෙන පරිභෝග කරමින් වාසය කරනවා. ඒ කියන්නේ කෑම වර්ග රැස් කරලා තියා ගන්නවා. බීම වර්ග රැස් කරලා තියා ගන්නවා. වස්ත්‍ර රැස් කරලා තියා ගන්නවා. යාන වාහන රැස් කරලා තියා ගන්නවා. ඇඳ පුටු මේස රැස් කරලා තියා ගන්නවා. සුවඳ වර්ග රැස් කරලා තියා ගන්නවා. තවත් ආමිස රැස් කරලා තියා ගන්නවා. මෙවැනි හෝ මෙවැනි වෙනත් දේවල් හෝ රැස්කරගෙන පරිහරණය කිරීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

16. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: න-ච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වේතාලං කුම්භථූනං සෝභනකං චණ්ඩාලං වංසං ධෝපනකං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යෝධිකං බලග්ගං සේනාබ්‍යූහං අණීකදස්සනං. ඉති වා ඉති ඒවරූපා විසූකදස්සනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

16. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයේ විසූක දර්ශනයන් නැරඹීමෙහි යෙදිල ඉන්නවා. ඒ කියන්නේ නැටුම්, ගැයුම්, වැයුම්, නාටක, පැරණි කථා රහදැක්වීම්, අත්තල ගසා නැටීම්, වේතාල නැටීම්, බෙර වාදන කිරීම්, රහමඩළෙහි දේවතාවන්ට පූජා පිණිස නැටීම්, උණ ගසින් කරන ක්‍රීඩා, මිනී ඇට මැද තබා වටකොට නැටීම්, ඇත් යුධ බැලීම්, අස්ව යුධ බැලීම්, ගොන් පොර බැලීම්, එළු පොර බැලීම්, බැටළු පොර බැලීම්, කුකුළු පොර බැලීම්, වටු පොර බැලීම්, පොව් හරඹ බැලීම්, මිටි හරඹ බැලීම්, මල්ලව පොර බැලීම්, යුධ සේනා බලන්ට යෑම, බලසෙන් ගණින තැන් බලන්ට යාම, බලසෙනඟ විසිරුවන තැන් බලන්ට යාම ආදී දේවල්වල යෙදෙමින් ඉන්නවා. මෙවැනි

දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලින් යුතු විසූක දර්ශන නැරඹීම්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

17. **යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං ජූතප්පමාදට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං බලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පංගචිරං වංක්කං මොක්ඛචිකං චිංගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනේසිකං යථාවජ්ජං. ඉති වා ඉති ඒවරූපා ජූතප්පමාදට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

17. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල තමාව ප්‍රමාදයට පත් කරවන මේ ආකාර වූ සූදු කෙළියෙන් කල් යවනවා. ඒ කියන්නේ හතරැස් කොටු අටකින් යුතුව කරණ සූදුව, කොටු දහයකින් කරන සූදුව, අහසේ රූ අඳිමින් කරන සූදුව, කොටු පැනීමෙන් කරණ සූදුව, සන්තික නම් වූ සූදුව, දාදු කැටයෙන් කරන සූදුව, කල්ලි ගැසුම, බුරුවා ගැසීම, ගුළ කෙළිය, නළා පිඹීම, කරණම් ගැසීම, මුගුරක් ගෙන උඩ යට වැටෙන පරිදි උඩට ගැසීම, කොළවලින් කළ ගොටුවලින් තරහෙට වැලි මැනීම, කුඩා රිය තරහ, කුඩා දුනුවලින් විදීමේ තරහ, අකුරු ලිවීමේ සෙල්ලම, සිතූ දේ කියන සෙල්ලම, විකලාංග අනුකරණයෙන් හිනැස්සීමේ සෙල්ලම ආදී දේ කිරීමයි. මේ දෙයිනුත් මෙවැනි තවත් දේවල් ඇත්නම් එයිනුත් වැළකී ප්‍රමාදයට පත්වන සූදුවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

18. **යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං උ-චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: ආසන්දිං පල්ලංකං ගෝනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලෝමිං ඒකන්තලෝමිං කට්ඨිස්සං කෝසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවේණිං කාදලිමිගපවර-ප-චත්ථරණං සඋත්තර-ඡදං උභතෝලෝහිතකූපධානං. ඉති වා ඉති ඒවරූපා උ-චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

18. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ පමණ ඉක්මවා උස් වූ ආසනත්

වටිනා සුඛෝපභෝගී ආසනත් පරිහරණය කරනවා. ඒ කියන්නේ දිග හාන්සි පුටු, කවිච්චි, ලොකු පලස් යෙදූ ආසන, විසිතුරු ගෙත්තම් කළ එළු ලොම් ඇතිරිළි, සුදු එළු ලොමින් කළ ඇතිරිළි, මල් යෙදූ එළු ලොමින් කළ ඇතිරිළි, පුළුන් යෙදූ මෙට්ට, සත්ව රූපවලින් සැරසූ එළු ලොම් ඇතිරිළි, මුළුමණින්ම එළු ලොමින් කළ ඇතිරිළි, රන් නූලෙන් සැරසූ කලාල, පට නූලෙන් කළ කලාල, නාටිකාංගනාවන් ඒ මත නැටිය හැකි එළු ලොමින් කළ කලාල, ඇතුන් පිට යොදන ඇතිරිළි, අසුන් පිට යොදන ඇතිරිළි, රථවල යොදන ඇතිරිළි, අඳුන් දිවි සමෙන් කළ ඇතිරිළි, කදලි මුව සමින් කළ කලාල, හිස දෙපැත්තට රතු විල්වැද කොට්ට තබා රතු උඩුවියන් බැඳ සැදූ වටිනා යහන් ආදිය පරිහරණය කරයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී උස් අසුන් මහා අසුන් පරිහරණයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

19. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: උ-ච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලේපනං මුඛචුණ්ණකං මුඛලේපනං හත්ථබන්ධං සිඛාබන්ධං දණ්ඩකං නාළිකං අසිං ඡග්ගං ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාළවීජනිං විදානානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති ඒවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

19. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් ඇඟපත සැරසීමෙන් හා විසිතුරු වස්ත්‍රාභරණ පැළඳීමෙන් යුක්තව කල් ගෙවනවා. ඒ කියන්නේ සුවඳ වර්ග ඇඟ තවරා සිරුර සිනිඳු කිරීම, තෙල් වර්ග ගා සම්බාහනය කොට සිරුර හැඩ කිරීම, සුවඳපැන් නෑම, උරහිස් ආදියෙහි මස් වැඩීමට මුගුරෙන් තැලීම, කැඩපතින් මුහුණ බලා සැරසීම, ඇස්වල අඳුන් ගෑම, මල් හා සුවඳ විලවුන් දැරීම, මුව සුවඳ කිරීම, මුව විලවුන් දැරීම, අත්වල ආභරණ දැමීම, හිසෙහි කුඩුම්බි දැරීම. විසිතුරු සැරයැටි දැරීම, විසිතුරු බෙහෙත් නල දැරීම, විසිතුරු කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නලල් පට දැරීම, මැණික් පැළඳීම, චාමර දැරීම, දිග වාටි ඇති සුදු වස්ත්‍ර දැරීම ආදියෙන් යුතුවෙයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී ඇඟපත සැරසීම් හා විසිතුරු වස්ත්‍රාභරණ සැරසීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

20. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං තිර-ඡානකථ‍ං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද‍ං: රාජකථ‍ං චෝරකථ‍ං මහාමත්තකථ‍ං සේනාකථ‍ං භයකථ‍ං යුද්ධකථ‍ං අන්නකථ‍ං පානකථ‍ං වත්ථකථ‍ං සයනකථ‍ං මාලාකථ‍ං ගන්ධකථ‍ං ඤාතිකථ‍ං යානකථ‍ං ගාමකථ‍ං නිගමකථ‍ං නගරකථ‍ං ජනපදකථ‍ං ඉත්ථිකථ‍ං පුරිසකථ‍ං (කුමාරකථ‍ං කුමාරිකථ‍ං) සූරකථ‍ං විසිඛාකථ‍ං කුම්භට්ඨානකථ‍ං පුබ්බපේතකථ‍ං නානත්තකථ‍ං ලෝකක්ඛායිකථ‍ං සමුද්දක්ඛායිකථ‍ං ඉතිභවාභවකථ‍ං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මි‍ං.

20. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරිසන් කථාවල යෙදී වාසය කරනවා. ඒ කියන්නේ, රජවරුන් ගැන කථා, සොරුන් ගැන කථා, මහ ඇමතිවරුන් ගැන කථා, හමුදාවන් ගැන කථා, භය ඇතිවෙන දේවල් ගැන කථා, ආහාර වර්ග ගැන කථා, බොන දේවල් ගැන කථා, ඇඳුම් පැළඳුම් ගැන කථා, ඇඳ පුටු ගැන කථා, මල් වර්ග ගැන කථා, සුවඳ වර්ග ගැන කථා, නෑදෑයන් ගැන කථා, යාන වාහන ගැන කථා, ගම්මාන ගැන කථා, නියම් ගම්මාන ගැන කථා, නගර ගැන කථා, රටවල් ගැන කථා, ස්ත්‍රීන් ගැන කථා, පුරුෂයින් ගැන කථා, (කුමාරයින් ගැන කථා, කුමාරියන් ගැන කථා) ශූරයින් ගැන කථා, මංමාවත් ගැන කථා, වල‍ං පොලේ දේවල් ගැන කථා, මියගිය උදවිය ගැන කථා, තව තව දේවල් ගැන කථා, ලෝකය ගැන කථා, සාගරය ගැන කථා, මෙහෙමයි වුණේ මෙහෙමයි නොවුණේ කියන දේ ගැන කථා කරකර ඉන්නවා, මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරිසන් කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

21. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං විග්ගාහිකකථ‍ං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද‍ං: න ත්වං ඉම‍ං ධම්මවිනය‍ං ආජානාසි. අහ‍ං ඉම‍ං ධම්මවිනය‍ං ආජානාමි. කි‍ං ත්වං ඉම‍ං ධම්මවිනය‍ං ආජානිස්සසි? මි-ඡාපටිපන්නෝ ත්වමසි, අහමස්මි සම්මා පටිපන්නෝ. සහිත‍ං මේ, අසහිත‍ං තේ. පුරේ වචනීය‍ං ප-ඡා අවච. ප-ඡා වචනීය‍ං පුරේ අවච. ආචිණ්ණ‍ං තේ විපරාවත්ත‍ං. ආරෝපිතෝ තේ වාදෝ. නිග්ගහීතෝ ත්වමසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බේඨේහි වා සං- පහෝසීති. ඉති වා ඉති ඒවරූපාය විග්ගාහිකකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මි‍ං.

21. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් එකිනෙකා අතර බැණ දොඩා ගන්නා කථාවෙන් යුතුව යි ඉන්නෙ. ඒ කියන්නේ "නුඹ මේ ධර්ම විනය දන්නෙ නෑ. මම තමයි මේ ධර්ම විනය දන්නේ, ආ.. එහෙම ද එතකොට නුඹද මේ ධර්ම විනය දන්නේ? නුඹ ඉන්නේ මිත්‍යා වැඩ පිළිවෙලක යි. මම තමයි නියම වැඩ පිළිවෙල තුළ ඉන්නේ. මං කරුණු සහිතව යි කියන්නේ. නුඹේ කීම කරුණු රහිත යි. නුඹ කලින් කිවයුතු දේ පස්සේ කිව්වා. පස්සේ කිවයුතුදේ කලින් කිව්වා. නුඹ කලක් තිස්සේ කියපු දේ කණපිට පෙරළෙනා. මා විසින් නුඹට වාද නංවලයි තියෙන්නේ. නුඹට නිග්‍රහ කරල යි තියෙන්නේ. වාදයෙන් නිදහස් වීමට මගක් හොයාගෙන පලයන්. පුළුවන් නම් ලෙහාගනින්" යනාදිය කියමින් ආරවුල් හදාගන්නවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ බැණ දොඩාගන්නා කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

22. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං දූතෙය්‍යපහිණගමනානුයෝගමනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං "ඉධ ග-ඡ. අමුත්‍රාග-ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉති ඒවරූපා දූතෙය්‍යපහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

22. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල ගිහියන් ගේ පණිවිඩ පණත් ගෙන යන මෙබඳු වූ දූත මෙහෙවරෙහි යෙදෙනවා. ඒ කියන්නේ, "මෙහෙ යන්න, අසවල් තැනට එන්න, මේක (අපේ මේ පණිවිඩය) අරන් යන්න. අසවල් තැනට මේක අරන් යන්න" යනාදී රජුන් ගේ, රාජමහා ඇමතිවරුන් ගේ, ක්ෂත්‍රියයන් ගේ, බ්‍රාහ්මණයන් ගේ, ගෘහපතියන් ගේ, කුමාරවරුන් ගේ, පණිවුඩ පණත් ගෙනියනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ පණිවුඩ පණත් ගෙනයන ගිහියන් ගේ දූත මෙහෙවරෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

23. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ කුහකා ච හොන්ති ලපකා ච නේමිත්තිකා ච නිප්පේසිකා ච ලාභේන ච ලාභං නිජිගිංසිතාරෝ. ඉති වා ඉති ඒවරූපා කුහනලපනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

23. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල කුහක (උඩින් වෙන ජීවිතයක් පෙන්වමින් යටින් වෙනත් ජීවිතයක් ගෙවමින් නැති ගුණ පෙන්වා) ජීවිත ගෙවනවා. ලාභ සත්කාර ලැබෙන විදිහට (පුහු වර්ණනා කිරීම්, තොදොල් කිරීම්, නැති ගුණ කීම් ආදී) චාටු බස් කියනවා. දායකයින් හට නො දී බැරි තත්වයට පත් වෙන ආකාරයේ නිමිති දක්වමින් කථා කරනවා. තමන්ට ලැබෙන විදිහට අනුන්ට ගරහනවා. ලාභයෙන් ලාභය හොයනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ කුහකකමින් චාටුබස්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

24. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: අංගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසික-ඡින්නං අග්ගිහෝමං දබ්බිහෝමං ථුසිහෝමං කණහෝමං තණ්ඩුලහෝමං සප්පිහෝමං තේලහෝමං මුඛහෝමං ලෝහිතහෝමං අංගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජ භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා වි-ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගපක්ඛං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි 'ස්ස හෝති සීලස්මිං.**

24. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙවැනි වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ ශාරීරික අංග බලා ඵලාඵල කියනවා, නිමිති බලා ඵලාඵල කියනවා, උත්පාත බලා ඵලාඵල කියනවා, සිහින ඵලාඵල කියනවා, ශාරීරික ලක්ෂණ බලා ඵලාඵල කියනවා, මීයන් කෑ වස්ත්‍ර බලා ඵලාඵල කියනවා, ගිනි පූජා පවත්වනවා, හැන්දෙන් පූජා පවත්වනවා, ධාන්‍ය පොතුවලින් පූජා පවත්වනවා. කණ නම් සහලින් කළ පූජා පවත්වනවා, සහලින් පූජා පවත්වනවා, ගිතෙලින් පූජා පවත්වනවා, තල තෙලින් පූජා පවත්වනවා, විශේෂ කොට කරණ පූජා පවත්වනවා, සතුන් මරා ලේ පුදා කරන පූජා පවත්වනවා, අංග විද්‍යාව, වාස්තු විද්‍යාව, දේශපාලන විද්‍යාව, වාසනාව උරගා බැලීමේ (ලොතරැයි) විද්‍යාව, භූත විද්‍යාව, පොළොව යට බිම් ගෙයක ඉඳ මැතිරීමෙන් කරන (භූරි) විද්‍යාව, සර්ප විද්‍යාව, විෂ විද්‍යාව, වෘශ්චික විද්‍යාව, මූෂක විද්‍යාව, පක්ෂි විද්‍යාව, විශාල පක්ෂි විද්‍යාව, ඉදුණු දේ මුල් කොට අනාවැකි කියන විද්‍යාව, මතුරන ලද ඊතල විද ආරක්ෂා කරන විද්‍යාව, මෘග පක්ෂ යනාදී මිත්‍යා ආජීවයෙන්

ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

25. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරීලක්ඛණං දාසලක්ඛණං දාසීලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගෝලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගෝධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං ක-ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

25. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ මැණික්වල සුභ අසුභ ලකුණු කීම, දඬුවල සුභ අසුභ ලකුණු කීම, වස්ත්‍රවල සුභ අසුභ ලකුණු කීම, කඩු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ඊතල ආදී සලකුණුවලින් සුභාසුභ කීම, දුනු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ආයුධ ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ස්ත්‍රීන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, පුරුෂයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දරුවන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දැරියන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසීයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, ඒ ඒ කටයුතු සඳහා තෝරා ගත යුතු ඇතුන් ගේ ලකුණු කීම, අසුන් ගේ ලකුණු කීම, ඔටුවන් ගේ ලකුණු කීම, වෘෂභයන් ගේ ලකුණු කීම, ගවයන් ගේ ලකුණු කීම, එළුවන් ගේ ලකුණු කීම, බැටළුවන් ගේ ලකුණු කීම, කුකුළු පොර ආදියට සුදුසු කුකුළන් ගේ ලකුණු කීම, වටුවන් ගේ ලකුණු කීම, සුභුනන් ඇහ වැටීමේ සහ හඬනැගීමේ ඵලාඵල කීම, කණෙහි පළඳාගත් උපකරණවලින් ඵලාඵල කීම, කැස්බෑවන්ට මතුරා ඵලාඵල කීම, මුවන්ට මතුරා ඵලාඵල කීම ආදී තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

26. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති. රඤ්ඤං අතියානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයෝ භවිස්සති. බාහිරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයෝ භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. ඉති ඉමස්ස ජයෝ භවිස්සති. ඉමස්ස පරාජයෝ භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

26. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් නැකතට රජතුමා ගේ යුධ පිණිස නික්මීම වන්නේ ය. අසවල් නැකතින් ආපසු නුවරට ඇතුල්වීම සිදු කළ යුත්තේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිට පිටත සතුරු රජුන් හමුවීමට රජු ගේ ගමන කළයුත්තේ ය. අසවල් නැකතින් පිටත සිටින රජවරු රට ඇතුළට පැමිණීම වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජු ගේ ඉවත්වීම සිදුවන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජුට ජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුනට පරාජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුන්ට ජය වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ රජුට පරාජය වන්නේ ය කියල මොහුට ජය වෙනවා. මොහුට පරාජය වෙනවා" ආදී වශයෙන් පවසමින් තිරිසන් විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

27. "යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: චන්දග්ගාහෝ භවිස්සති, සුරියග්ගාහෝ භවිස්සති, නක්ඛත්තග්ගාහෝ භවිස්සති, චන්දිමසුරියානං පථගමනං භවිස්සති, චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, නක්ඛත්තානං පථගමනං භවිස්සති, නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, උක්කාපාතෝ භවිස්සති, දිසාඩාහෝ භවිස්සති, භූමිචාලෝ භවිස්සති, දේවදුන්දුභි භවිස්සති, චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං විගමනං සංකිලේසං වෝදානං

භවිස්සති, ඒව‍ං විපාකෝ චන්දග්ගාහෝ භවිස්සති, ඒව‍ං විපාකෝ සුරියග්ගාහෝ භවිස්සති, ඒව‍ං විපාකෝ නක්ඛත්තග්ගාහෝ භවිස්සති, ඒව‍ං විපාක‍ං චන්දිමසුරියාන‍ං පථගමන‍ං භවිස්සති, ඒව‍ං විපාක‍ං චන්දිමසුරියාන‍ං උප්පථගමන‍ං භවිස්සති, ඒව‍ං විපාක‍ං නක්ඛත්තාන‍ං පථගමන‍ං භවිස්සති, ඒව‍ං විපාක‍ං නක්ඛත්තාන‍ං උප්පථගමන‍ං භවිස්සති, ඒව‍ං විපාකෝ උක්කාපාතෝ භවිස්සති, ඒව‍ං විපාකෝ දිසාඩාහෝ භවිස්සති, ඒව‍ං විපාකෝ භූමිචාලෝ භවිස්සති, ඒව‍ං විපාකෝ දේවදුන්දුභි භවිස්සති, ඒව‍ං විපාක‍ං චන්දිමසුරියනක්ඛත්තාන‍ං උග්ගමන‍ං විගමන‍ං සංකිලේස‍ං වෝදාන‍ං භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මි‍ං.

27. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් දින චන්ද්‍රග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සූර්යග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින නැකත් ග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නිසිමහින් යෑම සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නොමහින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නිසි මහින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නොමහින් යෑම සිදුවෙනවා. අසවල් දින උල්කාපාත වැටෙනවා. අසවල් දින අසවල් දිශාවේ උෂ්ණත්වය වැඩිවෙනවා. අසවල් දින භූමි කම්පාවක් සිදුවෙනවා. අසවල් දින වැසි රහිතව අහස ගුගුරනවා. හිරු සඳු හා නැකත්වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම මේ මේ වෙලාවට සිදුවෙනවා. චන්ද්‍ර ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. සූර්ය ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. නැකත් ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නිසිගමන මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නොමඟ යෑම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. උල්කාපාත වැටීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. දිශා දාහය මෙවැනි ඵල විපාක ලබා දෙනවා. භූකම්පන මෙවැනි ඵල විපාක ලබා දෙනවා. වැසි නැතිව අහස ගිගිරීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. හිරු සඳු හා නැකත්වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම ලෝකයට මෙවැනි විපාක ලබා දෙනවා" කියල තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල් වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

28. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: සුබ්බුට්ඨිකා භවිස්සති, දුබ්බුට්ඨිකා භවිස්සති, සුභික්ඛං භවිස්සති, දුබ්භික්ඛං භවිස්සති, ඛේමං භවිස්සති, භයං භවිස්සති, රෝගෝ භවිස්සති, ආරෝග්‍යං භවිස්සති, මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලෝකායතං. ඉති වා ඉති එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

28. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "මේ කාලයේ දී වැස්ස වහිනවා. මේ කාලයේ දී නියහය ඇතිවෙනවා. මේ කාලයේ දී සුභික්ෂාව ඇතිවෙනවා. මේ කාලයේ දී දුර්භික්ෂය ඇතිවෙනවා. මේ කාලයේ දී රට සරුවෙනවා. මේ කාලයේ දී බිය සැක නැතිව ඉන්නවා. මේ කාලයේ දී භය උපදිනවා. මේ කාලයේ දී රෝග ඇති වෙනවා. මේ කාලයේ දී නීරෝග බව ඇති වෙනවා කියමින් එලාඵල පැවසීමත් මුද්‍රා, ගණිත, සංඛ්‍යාන, කාව්‍ය ශාස්ත්‍ර, ලෝකායත ශාස්ත්‍ර ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

29. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හා-නිත්ථම්භනං හනුසංහන්නං හත්ථාභිජප්පනං හනුජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං දේවපඤ්හං ආදි-චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්භායනං. ඉති වා ඉති එවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

29. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, විවාහයට නැකත් කීම, ආවාහයට නැකත් කීම, වෙන් වූ අඹු සැමියන් එක් කිරීමට නැකත් සැදීම, එක් වූ අඹු සැමියන් වෙන් කිරීමට නැකත් සැදීම, දීපු ණය එකතු කිරීමට

නැකත් සැදීම, මුදල් ණයට පොලියට දීමට නැකත් සැදීම, දියුණු වීමට ගුරුකම් කිරීම, පාළුවී නැති වීමට ගුරුකම් කිරීම, දරුගැබ් රැකෙන්නට ගුරුකම් කිරීම, දිව අගුළු බැඳෙන්නට ගුරුකම් කිරීම, හනු තද කරන්නට ගුරුකම් කිරීම, අත් පෙරලෙන්නට ගුරුකම් කිරීම, හනු සිරවෙන්නට ගුරුකම් කිරීම, කණ් අගුළු වැටෙන්නට ගුරුකම් කිරීම, කණ්ණාඩියෙන් භූතයන් කැඳවා ප්‍රශ්න විචාරීම, ගෑණු දරුවන් ලවා පේන කීම, දෙවියන් ලවා පේන කීම, සූර්ය වන්දනාව, මහ බඹු වන්දනාව, මන්ත්‍ර බලයෙන් කටින් ගිනිදැල් පිටකිරීම, මන්ත්‍ර බලෙන් ලක්ෂ්මී පූජා කිරීම යනාදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

30. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං ආවමනං නහාපනං ජූහනං වමනං විරේචනං උද්ධවිරේචනං අධෝවිරේචනං සීසවිරේචනං කණ්ණතේලං නෙත්තතප්පනං නත්ථුකම්මං අඤ්ජනං ප-චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකි-ඡා මූලභේසජ්ජානං අනුප්පාදානං විසධීනං පටිමොක්ඛෝ. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

30. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, ශාන්ති කර්ම, බාර ඔප්පු කිරීම, පොළොව යට හිඳ මතුරා ගුරුකම් කිරීම, නපුංසකයා පිරිමියෙකු කිරීම, පිරිමියා නපුංසකයෙකු කිරීම, ගෙවල් තැනීමේ දිශාවන් පෙන්වා දීම, අළුතෙන් නිවාස තැනීමේදී පුද පූජා පැවැත් වීම. වතුර මතුරා මූණ සේදවීම. වතුර මතුරා නැහැවීම, ගිනිපිඳීම, ලය විරේක කරවීම, බඩ විරේක කරවීම, වමනය කරවීම, වස්ති කරවීම, ශීර්ෂ විරේකය, කණට තෙල් පිඹීම, ඇස් වෙදකම, නස්න කිරීම, ඇස්වලට අඳුන් සැදීම, ප්‍රති අංජන සැදීම, ශල්‍ය කර්ම කිරීම, ළදරු චිකිත්සාව, කාය චිකිත්සාව, වනවලට බෙහෙත් බැඳීම ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

31. ස ඛෝ සෝ කේවට්ඨ භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෙය්‍යථාපි කේවට්ඨ, ඛත්තියෝ මුද්ධාවසිත්තෝ නිහතප-චාමිත්තෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං ප-චත්ථිකතෝ. ඒවමේව ඛෝ කේවට්ඨ, භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෝ ඉමිනා අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ කේවට්ඨ, භික්ඛු සීලසම්පන්නෝ හෝති.

31. පින්වත් කේවට්ඨ, ඒ භික්ෂුව වනාහී මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. පින්වත් කේවට්ඨ, ඒක මේ වගේ දෙයක්. ඔටුනුපළන් රජ කෙනෙක් ඉන්නවා. ඔහු සතුරන් පරදවල බැහැර කරලයි ඉන්නේ. ඉතින් ඔහු සතුරන් හේතුවෙන් මොන ම අයුරකින්වත් භයක් දකින්නේ නෑ. පින්වත් කේවට්ඨ, භික්ෂුවත් ඔය විදිහම යි. මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් සමන්විත ව ආධ්‍යාත්මිකව නිවැරදි සැපයක් විඳිනවා. පින්වත් කේවට්ඨ, ඔන්න විදිහට යි භික්ෂුව සීලසම්පන්න වන්නේ.

32. කථඤ්ච කේවට්ඨ, භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති? ඉධ කේවට්ඨ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියේ සංවරං ආපජ්ජති. සෝතේන සද්දං සුත්වා ..... ඝාණේන ගන්ධං ඝායිත්වා ..... ජිව්හාය රසං සායිත්වා ..... කායේන ඵොට්ඨබ්බං ඵුසිත්වා ..... මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියේ සංවරං ආපජ්ජති. සෝ ඉමිනා අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ අජ්ඣත්තං අබ්‍යාසේකසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ කේවට්ඨ, භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති.

32. පින්වත් කේවට්ඨ, භික්ෂුව අකුසලයන් වැළකූ ද්වාර ඇති ඉඳුරන් ඇතිව ඉන්නේ කොහොම ද? පින්වත් කේවට්ඨ, මෙහිලා භික්ෂුව ඇසින් රූප

දැක නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් ඇස නැමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. ඇස රැක ගන්නවා. ඇස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. කණෙන් ශබ්දයක් අහලා ..... නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කරලා ..... දිවෙන් රසයක් රස විඳලා ..... කයෙන් පහසක් ලබලා ..... මනසින් අරමුණක් දැන ගෙන නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් මනස නැමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. මනස රැක ගන්නවා. මනස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. ඔහු මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව ආධ්‍යාත්මිකව පීඩා රහිතව සැපයක් විඳිනවා. පින්වත් කේවඩ්ඪ, භික්ෂුව අකුසලයෙන් වැළැක් වූ දොරටු ඇති ඉන්ද්‍රියයන් තුළ ඉන්නේ ඔය විදිහට යි.

33. කථඤ්ච කේවඩ්ඪ, භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති? ඉධ කේවඩ්ඪ, භික්ඛු අභික්කන්තේ පටික්කන්තේ සම්පජානකාරී හෝති. ආලෝකිතේ විලෝකිතේ සම්පජානකාරී හෝති. සම්මිඤ්ජිතේ පසාරිතේ සම්පජානකාරී හෝති. සංඝාටිපත්තචීවරධාරණේ සම්පජානකාරී හෝති. අසිතේ පීතේ ඛායිතේ සායිතේ සම්පජානකාරී හෝති. උච්චාරපස්සාවකම්මේ සම්පජානකාරී හෝති. ගතේ ඨිතේ නිසින්නේ සුත්තේ ජාගරිතේ භාසිතේ තුණ්හීභාවේ සම්පජානකාරී හෝති. එවං ඛෝ කේවඩ්ඪ, භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති.

33. පින්වත් කේවඩ්ඪ, භික්ෂුව සිහිනුවණින් යුතුව සිටින්නේ කොහොම ද? පින්වත් කේවඩ්ඪ, මෙහිලා භික්ෂුව ඉදිරියට යද්දීත්, ආපසු එද්දීත්, එය කරන්නේ සිහි නුවණින් ම යි. ඉදිරිය බලද්දී, වටපිට බලද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. අතපය හකුළද්දී, දිගහරිද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. දෙපට සිවුර, පාත්‍රය, අනෙක් සිවුරු ආදිය දරද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. වළඳද්දී, පානය කරද්දී, අනුභව කරද්දී, රස විඳිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. වැසිකිළි කැසිකිළි යාමේ දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. ගමන් කරද්දී, සිටගෙන සිටිද්දී, වාඩි වී සිටිද්දී, සැතපෙද්දී, නිදිවරද්දී, කථාබස් කරද්දී, නිහඬව සිටිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. පින්වත් කේවඩ්ඪ, භික්ෂුව සිහිනුවණින් යුතු වන්නේ ඔය ආකාරයට යි.

34. කථඤ්ච කෝඩඬ්ඪ, භික්ඛු සන්තුට්ඨෝ හෝති? ඉධ කෝඩඬ්ඪ භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරියේන චීවරේන කු-ඡිපරිහාරියේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. සෙය්‍යථාපි කෝඩඬ්ඪ, පක්ඛී සකුණෝ යේන යේනේව ඩේති සපත්තභාරෝව ඩේති, ඒවමේව ඛෝ කෝඩඬ්ඪ, භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරියේන චීවරේන කු-ඡිපරිහාරියේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. ඒවං ඛෝ කෝඩඬ්ඪ, භික්ඛු සන්තුට්ඨෝ හෝති.

34. පින්වත් කෝඩඬ්ඪ, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ කොහොම ද? පින්වත් කෝඩඬ්ඪ, මෙහිලා භික්ෂුව කය පරිහරණයට සෑහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සෑහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. ඒක මේ වගේ දෙයක්. කුරුල්ලෙක් යම් ම තැනකට පියඹා යනවා නම්, පියාපත් බර පමණක් සහිතව පියඹනවා වගෙයි. පින්වත් කෝඩඬ්ඪ, ඔය අයුරින් ම භික්ෂුව කය පරිහරණයට සෑහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සෑහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. පින්වත් කෝඩඬ්ඪ, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ ඔය විදිහට යි.

35. සෝ ඉමිනා ච අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතෝ, විවිත්තං සේනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භෝකාසං පලාලපුඤ්ජං. සෝ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තෝ නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

35. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ සිහිනුවණින් යුක්ත වෙලා, මේ ආර්ය වූ ලද දෙයින් සතුටුවීමෙන් යුක්ත වෙලා හුදෙකලා සෙනසුනක වාසය කරනවා. ඒ කියන්නේ ආරණ්‍යය, රුක්සෙවණ, පර්වතය, දිය ඇල්ල, ගිරිගුහාව, සොහොන, වනගැබ, ගස් කොළන් රහිත හිස් පිටිය, පිදුරු ගෙය ආදිය යි. ඔහු පිණ්ඩපාතය වළඳා, දානයෙන් පසු (එවැනි තැනක) පළඟක් බැඳ ගෙන, කය සෘජු කර ගෙන, භාවනා අරමුණෙහි සිහිය පිහිටුවා ගෙන වාඩිවෙනවා.

36. සෝ අභිජ්ඣං ලෝකේ පහාය විගතාභිජ්ඣේන චේතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසෝධේති. බ්‍යාපාදපදෝසං පහාය අබ්‍යාපන්නචිත්තෝ විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදෝසා චිත්තං පරිසෝධේති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධෝ විහරති ආලෝකසඤ්ඤී සතෝ සම්පජානෝ. ථීනමිද්ධා චිත්තං පරිසෝධේති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතෝ විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තෝ. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසෝධේති. විචිකිච්ඡා පහාය තිණ්ණවිචිකිච්ඡෝ විහරති අකථංකථී කුසලේසු ධම්මේසු. විචිකිච්ඡාය චිත්තං පරිසෝධේති.

36. ඔහු ජීවිතය නම් වූ ලෝකය ගැන ඇති විසම ලෝභය දුරු කොට ඇලීම් රහිත වූ සිතින් වාසය කරනවා. විසම ලෝභය කෙරෙන් සිත පිරිසිදු කරනවා. තරහ වෛර ආදිය අත්හැර තරහ නැති සිතින් සියළු සතුන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා. තරහ වෛර ආදිය කෙරෙන් සිත පිරිසිදු කරනවා. නිදිමත අලසකම අත්හැර නිදිමත අලසකමින් බැහැරව ආලෝක සඤ්ඤාවෙන් යුතුව, සිහිනුවණ ඇතිව වාසය කරනවා. නිදිමත අලසකම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සිතේ විසිරීමත්, පසුතැවීමත් බැහැර කොට නො කැළඹී ගිය සංසිඳුනු සිතින් වාසය කරනවා. සිතේ විසිරීම හා පසුතැවීම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සැකය දුරු කොට කුසල් දහම් ගැන කෙසේ ද? කෙසේ ද? යනාදී සැකයෙන් එතෙරව වාසය කරනවා. සැකය කෙරෙන් සිත පිරිසිදු කරනවා.

37. සෙය්‍යථාපි කේවට්ඨ, පුරිසෝ ඉණං ආදාය කම්මන්තේ පයෝජෙය්‍ය, තස්ස තේ කම්මන්තා සම්ඡ්ජේය්‍යුං, සෝ යානි ච පෝරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ඉණං ආදාය කම්මන්තේ පයෝජේසිං. තස්ස මේ තේ කම්මන්තා සම්ඡ්ජිංසු. සෝහං යානි ච පෝරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීඅකාසිං. අත්ථි ච මේ උත්තරිං අවසිට්ඨං දාරභරණායා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සෝමනස්සං.

37. පින්වත් කේවට්ඨ, එය මෙවැනි දෙයක්. පුරුෂයෙක් ණයක් අරගෙන කර්මාන්තයක යොදවනවා. ඔහු ගේ ඒ ව්‍යාපාරය සාර්ථක වෙනවා. එතකොට ඔහු යම් පරණ මුල් ණයක් ඇද්ද, එය සම්පූර්ණයෙන් ම ගෙවලා දානවා. එයින් පසු ඔහුට අඹුදරුවන් පෝෂණය පිණිස ලාභයක් ඉතිරිත් වෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං කලින් ණයක් අරගෙනයි

ව්‍යාපාරයක යෙදෙව්වේ. ඒ මගේ ව්‍යාපාරය සාර්ථක වුණා. ඒ මං යම් පරණ මුල් ණයක් ඇද්ද එය සම්පූර්ණයෙන් ම ගෙව්වා. අඹුදරුවන් පෝෂණයටත් මට ආදායම ඉතිරි වුණා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

38. සෙය්‍යථාපි කේවඩ්ඪ, පුරිසෝ ආබාධිකෝ අස්ස දුක්ඛිතෝ බාළ්හගිලානෝ, භත්තං චස්ස න-ඡාදෙය්‍ය, න චස්ස කායේ බලමත්තා, සෝ අපරේන සමයේන තම්හා ආබාධා මු-චෙය්‍ය, භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායේ බලමත්තා, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ආබාධිකෝ අහෝසිං දුක්ඛිතෝ බාළ්හගිලානෝ. භත්තං ච මේ න-ඡාදේසි. න චස්ස මේ ආසි කායේ බලමත්තා. සෝම්හි ඒතරහි තම්හා ආබාධා මුත්තෝ. භත්තඤ්ච මේ ඡාදේති. අත්ථි ච මේ කායේ බලමත්තා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

38. පින්වත් කේවඩ්ඪ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව ඉන්නවා. ඔහුට බත් කෑමටවත් පිරියක් නෑ. ඔහු ගේ ඇඟේ පතේ ප්‍රාණවත් ගතියක් නෑ. නමුත් පස්සෙ කාලෙක ඔහු ඒ රෝගයෙන් මිදුනා. ඔහුට දැන් බත් කෑමත් ප්‍රියයි. ඔහු ගේ ඇඟපතත් ප්‍රාණවත්. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව හිටියේ. මට බත් කෑමටවත් පිරියක් තිබුණේ නෑ. මගේ ඇඟේ පතේ ප්‍රාණවත් ගතියක් තිබුණේ නෑ. නමුත් දැන් මං ඒ රෝගයෙන් මිදුනා. මට දැන් බත් කෑමත් ප්‍රියයි. මගේ ඇඟපතත් ප්‍රාණවත්" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

39. සෙය්‍යථාපි කේවඩ්ඪ, පුරිසෝ බන්ධනාගාරේ බද්ධෝ අස්ස, සෝ අපරේන සමයේන තම්හා බන්ධනාගාරා මු-චෙය්‍ය සොත්ථිනා අබ්බයේන න චස්ස කිඤ්චි භෝගානං වයෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ බන්ධනාගාරේ බද්ධෝ අහෝසිං. සෝම්හි ඒතරහි තම්හා බන්ධනාගාරා මුත්තෝ සොත්ථිනා අබ්බයේන. නත්ථි මේ කිඤ්චි භෝගානං වයෝ"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

39. පින්වත් කේවඩ්ඪ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් හිරගෙදරක බන්ධනයකට හසුවෙනවා. නමුත් ඔහු පස්සෙ කාලෙක තමන් ගේ ධනය වියදම් නොකොට සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වෙනවා. ඔහු ගේ සම්පත්වලින් කිසි වියදමක් යන්නේ නෑ. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා.

“ම‍ං ඉස්සර හිරගෙදරක බන්ධනයකට අහු වුණා. නමුත් ඒ ම‍ං දැන් ධන වියදමකින් තොරව සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වුණා. මගේ භෝග සම්පත්වලින් කිසිදෙයක් වියදම් වුණේ නෑ” කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

40. සෙය්‍යථාපි කේවට්ට, පුරිසෝ දාසෝ අස්ස අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාම‍ංගමෝ, සෝ අපරේන සමයේන තම්හා දාසබ්‍යා මු-චෙය්‍ය අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාම‍ංගමෝ, තස්ස ඒවමස්ස: “අහ‍ං ඛෝ පුබ්බේ දාසෝ අහෝසි‍ං අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාම‍ංගමෝ. සෝම්හි ඒතරහි තම්හා දාසබ්‍යා මුත්තෝ අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාම‍ංගමෝ”ති. සෝ තතෝ නිදාන‍ං ලභේථ පාමොජ්ජ‍ං, අධිග-ඡෙය්‍ය සෝමනස්ස‍ං.

40. පින්වත් කේවට්ට, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නො හැකි, දාසයෙක් වෙලා හිටියා. ඔහු පස්සෙ කාලෙක ඒ දාසබවෙන් නිදහස් වුණා. තමාට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නො වන, තමන් කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබුණා. එතකොට ඔහුට මෙහෙම හිතුනා. “ම‍ං ඉස්සර තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නො හැකි, දාසයෙක් වෙලා හිටියා. ඒ ම‍ං දැන් ඒ දාසබවෙන් නිදහස් වෙලයි ඉන්නේ. මට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නො වන, ම‍ං කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබිලා තියෙනවා” කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

41. සෙය්‍යථාපි කේවට්ට, පුරිසෝ සධනෝ සභෝගෝ කන්තාර-ද්ධානමග්ග‍ං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛ‍ං සප්පටිභය‍ං, සෝ අපරේන සමයේන ත‍ං කන්තාර‍ං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්ත‍ං අනුපාපුණෙය්‍ය ඛේම‍ං අප්පටිභය‍ං, තස්ස ඒවමස්ස: “අහ‍ං ඛෝ පුබ්බේ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ග‍ං පටිපජ්ජි‍ං දුබ්භික්ඛ‍ං සප්පටිභය‍ං. සෝම්හි ඒතරහි ත‍ං කන්තාර‍ං තිණ්ණෝ සොත්ථිනා ගාමන්ත‍ං අනුප්පත්තෝ ඛේම‍ං අප්පටිභය”න්ති. සෝ තතෝ නිදාන‍ං ලභේථ පාමොජ්ජ‍ං, අධිග-ඡෙය්‍ය සෝමනස්ස‍ං.

41. පින්වත් කේවට්ට, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර

ගමනකට පිවිසෙනවා. නමුත් ඔහු පසු කාලෙක ඒ කාන්තාරයෙන් එතෙර වෙනවා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා "මං කලින් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසුනා. නමුත් දැන් මා ඒ කාන්තාරයෙන් එතෙර වුණා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණුනා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

42. ඒවමේව ඛෝ කේවඩ්ඪ, භික්ඛු යථා ඉණං යථා රෝගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං. ඒවං ඉමේ පඤ්ච නීවරණේ අප්පහීණේ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි කේවඩ්ඪ, ආනණ්‍යං, යථා ආරෝග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛේමන්තභූමිං ඒවමේව ඛෝ කේවඩ්ඪ භික්ඛු ඉමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සති.

42. පින්වත් කේවඩ්ඪ, අන්න ඒ විදිහම යි. භික්ෂුවත් (කලින්) ණයක් ගත්තා වගේ, ලෙඩ වුණා වගේ, හිරේවිලංගුවේ වැටුනා වගේ, වහල්බවට පත් වුණා වගේ, නිරුදක කතරකට පැමිණුනා වගේ මේ පංච නීවරණයන් ප්‍රහාණය නො වී තමා තුළ පවතින හැටි දකිනවා. නමුත් පින්වත් කේවඩ්ඪ, ඒ ණය ගෙවා දමා ණය රහිත වුණා වගේ, රෝගයෙන් නිදහස් වෙලා නීරෝග වුණා වගේ, වියදම් නැතුව හිරෙන් නිදහස් වුණා වගේ, දාසබවෙන් නිදහස් වුණා වගේ, නිරුදක කතර ගෙවා ආරක්ෂා සහිත ක්ෂේම භූමියකට පැමිණුනා වගේ තමයි. පින්වත් කේවඩ්ඪ, අන්න ඒ විදිහමයි භික්ෂුව තමා තුළ මේ පංච නීවරණයන් දුරුවී ඇති ආකාරයත් දකින්නේ.

43. තස්සිමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සතෝ පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායෝ පස්සම්භති. පස්සද්ධකායෝ සුඛං වේදේති. සුඛිනෝ චිත්තං සමාධියති.

43. ඔහුට මේ පඤ්ච නීවරණයන් තමා තුළ නැති බව දකිද්දි මහත් සතුටක් ඇති වෙනවා. ඒ ප්‍රමුදිත වීම ඇති කෙනාට ප්‍රීතිය ඇති වෙනවා. ප්‍රීති මනසක් ඇති කෙනා ගේ කය සංසිඳෙනවා. සංසිඳුනු කයින් යුතු ව සැපක් විඳිනවා. සැප ඇති කෙනා ගේ සිත සමාධිමත් වෙනවා.

44. සෝ විවි-ඒ-ව කාමේහි විවි-ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

61. ඔහු කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් හට ගත් ප්‍රීති සුඛය ඇති පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

45. සෙය්‍යථාපි කේවට්ඨ දක්ඛෝ නහාපකෝ වා නහාපකන්තේවාසී වා කංසථාලේ නහානීයචුණ්ණානි ආකිරිත්වා උදකේන පරිප්ඵෝසකං පරිප්ඵෝසකං සන්නෙය්‍ය සායං නහානීයපිණ්ඩි සේනහානුගතා සේනහපරේතා සන්තරබාහිරා ඵුටා සේනහේන න ච පග්ඝරණි. ඒවමේව ඛෝ මාණව භික්ඛු ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

45. පින්වත් කේවට්ඨ, ඒක මේ වගේ දෙයක්. (රජවරුන් ආදී පිරිස් නහවන) දක්ෂ නහවන්නෙක් හෝ නහවන කෙනෙකු ගේ ගෝලයෙක් ඉන්නවා. ඔහු ලෝහ බඳුනක නාන සුණු විසුරුවනවා. ඊට පස්සේ දිය ඉස ඉස පිඬු කරනවා. එතකොට ඒ නානසුණු පිඬට අර වතුර කාවදිනවා. හොඳින් තෙත් වෙනවා. ඒ නහන පිඬ ඇතුළත පිටත සෑම තැන ම හොඳින් දිය පැතිරිලා තියෙනවා. පිටතට වැගිරෙන්නෙත් නෑ. පින්වත් කේවට්ඨ, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

යම්පි කේවට්ඨ භික්ඛු විවිච්චේව කාමේහි විවිච්ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, සෝ ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති

පරිපූරේති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති, ඉදම්පි'ස්ස හෝති සමාධිස්මිං.

පින්වත් කේවඩ්ඪ, භික්ෂුව කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් හට ගත් ප්‍රීති සුඛය ඇති යම් පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා නම්, ඔහු මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. මෙය අයිති වන්නේත් ඔහු ගේ සමාධියට ම යි.

46. පුන ච පරං කේවඩ්ඪ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසෝ ඒකෝදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

46. පින්වත් කේවඩ්ඪ, තව දුරටත් කියනවා නම් භික්ෂුව විතක්ක විචාරයන් ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්මිකව පැහැදීම ඇතිව සිතෙහි මනා එකඟ බවෙන් යුතු ව විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් හටගත්, ප්‍රීති සුඛය ඇති දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

47. සෙය්‍යථාපි කේවඩ්ඪ උදකරහදෝ උබ්භිදෝදකෝ, තස්ස නේවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, දේවෝ ච න කාලේන කාලං සම්මා ධාරං අනුපවේච්ඡෙය්‍ය, අථ ඛෝ තම්හා ච උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමේව උදකරහදං සීතේන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතෝ උදකරහදස්ස සීතේන වාරිනා අප්ඵුටං අස්ස. එවමේව ඛෝ කේවඩ්ඪ භික්ඛු ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

47. පින්වත් කේවඩ්ඪ, ඒක මේ වගේ දෙයක්. යට දිය උල්පත්වලින් වතුර ගලන ගැඹුරු විලක් තියෙනවා. හැබැයි ඒ විලට නැගෙනහිර පැත්තෙන් වතුර එන මගක් නෑ. දකුණු පැත්තෙන් වතුර එන මගක් නෑ. බටහිර පැත්තෙන් වතුර එන මගක් නෑ. උතුරු පැත්තෙන් වතුර එන මගක් නෑ. වැස්සත් කලින් කලට පිළිවෙලකට වහින්නේ නෑ. එතකොට ඒ විලෙන් ම සීතල දියදහරා උල්පත්වලින් උඩට මතු වෙවී ඒ විල ම සීතල ජලයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. වතුරෙන් පුරවනවා. හොඳින් පුරවනවා. ඒ මුළු විලේ ම සිහිල් ජලයෙන් පහස නො ලැබූ කිසි තැනක් නෑ. පින්වත් කේවඩ්ඪ, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

යම්පි කේවඩ්ඪ භික්ඛු විතක්ක විචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසෝ ඒකෝදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, සෝ ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති. ඉදම්පි'ස්ස හෝති සමාධිස්මිං.

පින්වත් කේවඩ්ඪ, භික්ෂුව විතක්ක විචාරයන් ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්මිකව පැහැදීම ඇතිව සිතෙහි මනා එකඟ බවෙන් යුතු ව විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් හටගත්, ප්‍රීති සුඛය ඇති යම් දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා නම්, ඔහු මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. මෙය අයිති වන්නේත් ඔහු ගේ සමාධියට ම යි.

48. **පුන ච පරං කේවඩ්ඪ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති සතෝ සම්පජානෝ සුඛඤ්ච කායේන පටිසංවේදේති. යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරීති, තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති.**

48. පින්වත් කේවට්ඨ, තව දුරටත් කියනවා නම් භික්ෂුව ප්‍රීතියට ද නො ඇලීමෙන් උපේක්ෂාවෙන් යුතුව වාසය කරනවා. සිහියෙන් නුවණින් යුතු ව කයෙන් සැපයක් ද විඳිනවා. ආර්යයන් වහන්සේලා යම් ධ්‍යානයකට උපේක්ෂා සහගත සිහිය ඇති සැප විහරනය යැයි පවසනවා ද, ඒ තුන්වන ධ්‍යානයත් උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

49. සෙය්‍යථාපි කේවට්ඨ උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පේක-චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකේ ජාතානි උදකේ සංවද්ධානි උදකානුග්ගතානි අන්තෝනිමුග්ගපෝසීනි, තානි යාව චග්ගා යාව ච මූලා සීතේන වාරිනා අභිස්සන්නානි පරිස්සන්නානි පරිපූරානි, පරිප්ඵුටානි නාස්සා කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතේන වාරිනා අප්ඵුටං අස්ස. ඒවමේව ඛෝ කේවට්ඨ භික්ඛු ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති.

49. පින්වත් කේවට්ඨ, ඒක මේ වගේ දෙයක්. මහනෙල් විලක හෝ රතු නෙළුම් විලක හෝ සුදු නෙළුම් විලක හෝ ඇතැම් මහනෙල් වේවා, රතු නෙළුම් වේවා, සුදු නෙළුම් වේවා ඒ නෙළුම් ජලයේ ම යි හට ගන්නේ. ජලයේ ම යි වැඩෙන්නේ. නමුත් ජලයෙන් උඩට ඇවිත් නෑ. ජලය තුළ ම ගිලී වැඩෙනවා. එතකොට ඒ නෙළුම් අග දක්වාත් මුල දක්වාත් සීතල දියෙන් හොඳට තෙත් වෙලා තියෙන්නේ. මුළුමණින් ම තෙත් වෙලා තියෙන්නේ. පිරිල තියෙන්නේ. හැම තැනම පැතිරිලා තියෙන්නේ. ඒ සෑම මහනෙල්වල, රතුනෙළුම්වල, සුදුනෙළුම්වල සීතල දිය නො පැතුරුණු කිසි තැනක් නෑ. පින්වත් කේවට්ඨ, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

යම්පි කේවට්ඨ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති සතෝ සම්පජානෝ සුඛඤ්ච කායේන පටිසංවේදේති, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති,

සෝ ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්දේති පරිසන්දේති පූරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති. ඉදම්පි'ස්ස හෝති සමාධිස්මිං.

පින්වත් කේවඩ්ඪ, භික්ෂුව ප්‍රීතියට ද නො ඇලීමෙන් උපේක්ෂාවෙන් යුතුව වාසය කරනවා. සිහියෙන් නුවණින් යුතු ව කයෙන් සැපයක් ද විඳිනවා. ආර්යයන් වහන්සේලා යම් ධ්‍යානයකට උපේක්ෂා සහගත සිහිය ඇති සැප විහරණය යැයි පවසනවා ද, යම් ඒ තුන්වන ධ්‍යානයත් උපදවා ගෙන වාසය කරනවා නම්, ඔහු මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. මෙය අයිති වන්නේත් ඔහු ගේ සමාධියට ම යි.

50. පුන ච පරං කේවඩ්ඪ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බේව සෝමනස්සදෝමනස්සානං අත්ථංගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති. සෙය්‍යථාපි කේවඩ්ඪ පුරිසෝ විදාතේන වත්ථේන සසීසං පාරුපිත්වා නිසින්නෝ අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විදාතේන වත්ථේන අප්ඵුටං අස්ස, එවමේව ඛෝ කේවඩ්ඪ, භික්ඛු ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති.

50. පින්වත් කේවඩ්ඪ, නැවතත් කියනවා නම් භික්ෂුව සැපය ද ප්‍රහාණය කිරීමෙන්, දුක ද ප්‍රහාණය කිරීමෙන් කලින් ම සොම්නස් දොම්නස් දෙක ඉක්ම යෑමෙන් දුක් සැප රහිත වූ පාරිශුද්ධ උපේක්ෂා සහගත සතිය ඇති සතර වෙනි ධ්‍යානය උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. පින්වත් කේවඩ්ඪ, එක මේ වගේ දෙයක්. සුදු වස්ත්‍රයකින් හිස සහිතව මුළු සිරුර ම පොරොවාගෙන වාඩි වී සිටින කෙනෙක් ඉන්නවා. එතකොට ඔහු ගේ මුළු කයෙහි ම සුදු වස්ත්‍රයෙන් නො වැසුණු කිසි තැනක් නෑ. පින්වත් කේවඩ්ඪ, අන්න ඒ වගේ ම යි භික්ෂුව මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

යම්පි කේවඩ්ඪ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බේව සෝමනස්සදෝමනස්සානං අත්ථංගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති. ඉදම්පි'ස්ස හෝති සමාධිස්මිං.

පින්වත් කේවඩ්ඪ, භික්ෂුව සැපය ද ප්‍රහාණය කිරීමෙන්, දුක ද ප්‍රහාණය කිරීමෙන් කලින් ම සොම්නස් දොම්නස් දෙක ඉක්ම යෑමෙන් දුක් සැප රහිත වූ පාරිශුද්ධ උපේක්ෂා සහගත සතිය ඇති යම් සතර වෙනි ධ්‍යානයක් උපදවා ගෙන වාසය කරනවා නම්, ඔහු මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ. මෙය අයිති වන්නෙත් ඔහු ගේ සමාධිය ට ම යි.

51. පුනචපරං කේවඩ්ඪ සෝ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සානාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතාපෙත්තිකසම්භවෝ විදනකුම්මාසූපචයෝ අනිච්චුච්ඡාදනපරිමද්දනභේදනවිද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති.

51. පින්වත් කේවඩ්ඪ, තව දුරටත් කියනවා නම් භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් ව්‍යංජන ආදියෙන් වැඩුණු, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි.

52. සෙය්‍යථාපි කේවඩ්ඪ, මණි වේළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ සබ්බාකාරසම්පන්නෝ,

තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා විදාතං වා පණ්ඩුසුත්තං වා. තමේනං චක්ඛුමා පුරිසෝ හත්ථේ කරිත්වා ප-ච්චවෙක්ඛෙය්‍ය: "අයං ඛෝ මණි වේළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ, අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ සබ්බාකාරසම්පන්නෝ, තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා විදාතං වා පණ්ඩුසුත්තං වා"ති. ඒවමේව ඛෝ කේවඩ්ඪ, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතාපෙත්තිකසම්භවෝ විදනකුම්මාසූපචයෝ අනි-ච්ච-ඡාදනපරිමද්දනභේදනවිද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති.

70. පින්වත් කේවඩ්ඪ, එක මේ වගේ දෙයක්. වෛරෝඩි මාණික්‍යයක් තියෙනවා. හරි ලස්සනට පහළ වුණ දෙයක්. අටපට්ටම්. හොඳින් ඔපමට්ටම්, ඉතාමත් හොඳයි. ඉතාම ප්‍රසන්නයි. පිවිතුරු යි. මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. ඉතින් ඔය මැණික තුළ නිල් වේවා, රන්වන් වේවා, රතු වේවා, සුදු වේවා, පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා. එතකොට ඇස් ඇති පුරුෂයෙක් මැණික අතට ගෙන හොඳින් විමසා බලනවා. "මේ වෛරෝඩි මැණික හරි ලස්සනට පහළ වුණ දෙයක්. අටපට්ටම්. හොඳින් ඔපමට්ටම්, ඉතාමත් හොඳයි. ඉතාම ප්‍රසන්නයි. පිවිතුරු යි. මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. මේ මැණික තුළ නිල් වේවා, රන්වන් වේවා, රතු වේවා, සුදු වේවා, පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා" කියලා. පින්වත් කේවඩ්ඪ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වින්‍යෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් ව්‍යංජන ආදියෙන් වැඩුණ, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි" කියල.

53. යම්පි කේවඩ්ඪ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... ඒවං පජානාති ..... ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

53. පින්වත් කේවඩ්ඪ, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... මේ විඳිහට දැන ගන්නවා ..... මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි" කියල. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

54. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගපච්චංගිං අහීනින්ද්‍රියං, සෙය්‍යථාපි කේවඩ්ඪ පුරිසෝ මුඤ්ජම්හා ඉසිකං පවාහෙය්‍ය. තස්ස ඒවමස්ස: අයං මුඤ්ජෝ අයං ඉසිකා. අඤ්ඤෝ මුඤ්ජෝ, අඤ්ඤා ඉසිකා. මුඤ්ජම්හාත්වේව ඉසිකා පබාළ්හාති. සෙය්‍යථාපි වා පන කේවඩ්ඪ පුරිසෝ අසිං කෝසියා පවාහෙය්‍ය, තස්ස ඒවමස්ස "අයං අසි, අයං කෝසි, අඤ්ඤේ අසි, අඤ්ඤා කෝසි, කෝසියාත්වේව අසි පබාළ්හෝ"ති. සෙය්‍යථාපි වා පන කේවඩ්ඪ, පුරිසෝ අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස ඒවමස්ස: අයං අහි, අයං කරණ්ඩෝ, අඤ්ඤෝ අහි, අඤ්ඤේ කරණ්ඩෝ, කරණ්ඩාත්වේව අහි උබ්භතෝ"ති. ඒවමේව ඛෝ කේවඩ්ඪ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගපච්චංගිං අහීනින්ද්‍රියං.

54. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා. පින්වත් කේවඩ්ඪ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් මුඤ්ජතණ ගසෙන් තණ ගොබය ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. මේ මුඤ්ජතණ ගස යි, මේ තණ ගොබය

යි. එතකොට මුඤ්ජතණ ගස වෙන එකක්. තණ ගොබය වෙන එකක්. නමුත් මුඤ්ජතණ ගසෙන් ම යි තණ ගොබය ඇදල ගත්තේ කියලා. පින්වත් කේවඩ්ඪ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් කොපුවෙන් කඩුවක් ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ කඩුව යි. මේ කොපුව. එතකොට කඩුව අනෙකක්, කොපුව අනෙකක්. නමුත් කොපුවෙන් තමයි කඩුව ඇදල ගත්තේ" කියලා. පින්වත් කේවඩ්ඪ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් නයි පෙට්ටියෙන් නයෙකුව ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ තමයි නයා. මේක නයිපෙට්ටිය. එතකොට නයා අනෙකෙක්. නයි පෙට්ටිය අනෙකක්. නමුත් නයි පෙට්ටියෙන් තමයි නයාව ඇදල ගත්තේ" කියලා. පින්වත් කේවඩ්ඪ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වින්‍යම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා.

යම්පි කේවඩ්ඪ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගපච්චංගිං අහීනින්ද්‍රියං, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

පින්වත් කේවඩ්ඪ, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... මේ කයෙන් වෙනත් වූ සියළු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා. මෙය අයිතිවන්නෙත් ඔහුගේ ප්‍රඥාවට ම යි.

55. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝපි හුත්වා බහුධා හෝති, බහුධාපි හුත්වා ඒකෝ හෝති, ආවීභාවං තිරෝභාවං තිරෝකුඩ්ඩං තිරෝපාකාරං තිරෝපබ්බතං අසජ්ජමානෝ ග-ඡති සෙය්‍යථාපි ආකාසේ, පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරෝති සෙය්‍යථාපි උදකේ, උදකේපි අභිජ්ජමානේ ග-ඡති, සෙය්‍යථාපි පඨවියං, ආකාසේපි පල්ලංකේන කමති, සෙය්‍යථාපි පක්ඛී සකුණෝ, ඉමේපි

චන්දිමසූරියෝ ඒවංමහිද්ධිකේ ඒවංමහානුභාවේ පාණිනා පරාමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලෝකාපි කායේන වසං වත්තේති.

55. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි. එයට සිත නතු කරයි. තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. පෙනෙන්ට සළස්වනවා. නො පෙනී යනවා. බිත්තිය විනිවිද, ප්‍රාකාරය විනිවිද, පර්වතය විනිවිද කිසිවක් හා නො ගැටී අහසේ යන්නාක් මෙන් යනවා. ජලයේ වගේ පොළොවෙහි කිදාබැසීමත්, උඩට මතුවීමත් කරනවා. පොළොව මතුපිට වගේ ජලය මත නො ගිලී ඇවිද යනවා. අහසෙහි පියාසරණ කුරුල්ලන් පරිද්දෙන් පළඟක් බැඳ ගෙන අහසේ යනවා. මේසා මහත් ඉර්ධි ඇති, මහානුභාව ඇති හිරු සඳු පවා අතින් අල්ලනවා. පිරිමඳිනවා. බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා.

56. සෙය්‍යථාපි කේවඩ්ඪ, දක්ඛෝ කුම්භකාරෝ වා කුම්භකාරන්තේවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදේව භාජනවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථාපි වා පන කේවඩ්ඪ, දක්ඛෝ දන්තකාරෝ වා දන්තකාරන්තේවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදේව දන්තවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථාපි වා පන කේවඩ්ඪ, දක්ඛෝ සුවණ්ණකාරෝ වා සුවණ්ණකාරෙන්තේවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදේව සුවණ්ණවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය; ඒවමේව ඛෝ කේවඩ්ඪ, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝපි හුත්වා බහුධා හෝති ..... යාව බ්‍රහ්මලෝකාපි කායේන වසං වත්තේති.

56. පින්වත් කේවඩ්ඪ, ඒක මේ වගේ දෙයක්. දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ මැටිටෙන් යම් ම ආකාරයේ භාජනයක් හදන්ට කැමැති නම්, ඒ ඒ

ආකාරයේ බඳුන් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා. පින්වත් කේවඩ්ඪ, ඒක මේ වගේ දෙයක්. දක්ෂ ඇත්දත් කැටයම්කරුවෙක් හෝ ඇත්දත් කැටයම්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ ඇත්දතක යම් ම ආකාරයේ ඇත් දළ කැටයමක් කරන්ට කැමති නම්, ඒ ඒ ආකාරයේ ඇත් දළ කැටයම් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා. පින්වත් කේවඩ්ඪ, ඒක මේ වගේ දෙයක්. දක්ෂ රන් කැටයම්කරුවෙක් හෝ රන් කැටයම්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ රනක යම් ම ආකාරයේ රන් කැටයමක් කරන්ට කැමති නම්, ඒ ඒ ආකාරයේ රන් කැටයම් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා. පින්වත් කේවඩ්ඪ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි. එයට සිත නතු කරයි. තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා ..... බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා.

යම්පි කේවඩ්ඪ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... යාව බ්‍රහ්මලෝකාපි කායේන වසං වත්තේති, **ඉදම්පි'ස්ස** හෝති පඤ්ඤය.

පින්වත් මාණවකය, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

57. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බාය සෝතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච. සෙය්‍යථාපි කේවඩ්ඪ, පුරිසෝ අද්ධානමග්ගපටිපන්නෝ සෝ සුණෙය්‍ය භේරිසද්දම්පි මුදිංගසද්දම්පි සංඛපණවදෙණ්ඩිමසද්දම්පි, තස්ස ඒවමස්ස: භේරිසද්දෝ ඉතිපි මුදිංගසද්දෝ ඉතිපි සංඛපණවදෙණ්ඩිමසද්දෝ ඉතිපි. ඒවමේව ඛෝ කේවඩ්ඪ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති

අභිනින්නාමේති. සෝ දිබ්බාය සෝතධාතුයා විසුද්ධාය අතික්කන්ත-මානුසිකාය උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච.

57. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා. එයට සිත නතු කරනවා. එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා. පින්වත් කේවඩ්ඪ, ඒක මේ වගේ දෙයක්. දුගු ගමනකට පිළිපන් පුරුෂයෙක් ඉන්නවා. ඔහු බෙර හඬත්, මිහිඟු බෙර හඬත්, සක්, පනා බෙර, ගැට බෙර හඬත් අසනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක බෙර හඬක්, මේ තමයි මිහිඟු බෙර හඬ, මේක සක් හඬ, මේක පනා බෙර හඬ, මේක ගැට බෙර හඬ" කියලා. පින්වත් කේවඩ්ඪ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා. එයට සිත නතු කරනවා. එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා.

58. යම්පි කේවඩ්ඪ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

58. පින්වත් කේවඩ්ඪ, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

59. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ චේතෝපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ පරසත්තානං පරපුග්ගලානං චේතසා චේතෝ පරි-ච පජානාති: සරාගං වා චිත්තං සරාගං

චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති, වීතදෝසං වා චිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති, සමෝහං වා චිත්තං සමෝහං චිත්තන්ති පජානාති, වීතමෝහං වා චිත්තං වීතමෝහං චිත්තන්ති පජානාති, සංඛිත්තං වා චිත්තං සංඛිත්තං චිත්තන්ති පජානාති, වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති, මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති, සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති, අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති, සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති, අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති, විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

59. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, අනුන් ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා. රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. රාග රහිත සිත වීතරාගී සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ රහිත සිත වීතදෝසී සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ සහිත සිත මෝහ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ රහිත සිත වීතමෝහී සිතක් වශයෙන් දැන ගන්නවා. හැකුළුනු සිත හැකිළුණු සිතක් වශයෙන් දැන ගන්නවා. විසිරුණු සිත විසිරුණු සිතක් වශයෙන් දැන ගන්නවා. සමාධිමත් සිත සමාධිමත් සිතක් වශයෙන් දැන ගන්නවා. සමාධි රහිත සිත සමාධි රහිත සිතක් වශයෙන් දැන ගන්නවා. නො දියුණු සිත නො දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා. දියුණු සිත දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා. එකඟ වෙන සිත එකඟ වෙන සිතක් වශයෙන් දැන ගන්නවා. එකඟ නො වෙන සිත එකඟ නො වෙන සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් මිදුණු සිත කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා.

60. සෙය්‍යථාපි කේවඩ්ඪ, ඉත්ථී වා පුරිසෝ වා දහරෝ වා යුවා මණ්ඩනකජාතිකෝ ආදාසේ වා පරිසුද්ධේ පරියෝදාතේ අ-ඡේ වා උදකපත්තේ සකං මුඛනිමිත්තං ප-චවෙක්ඛමානෝ සකණිකං වා සකණිකන්ති ජානෙය්‍ය, අකණිකං වා අකණිකන්ති ජානෙය්‍ය. ඒවමේව ඛෝ කේවඩ්ඪ, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ෙ-තෝපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ පරසත්තානං පරපුග්ගලානං ෙ-තසා ෙ-තෝ පරි-ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති, වීතදෝසං වා චිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති, සමෝහං වා චිත්තං සමෝහං චිත්තන්ති පජානාති, වීතමෝහං වා චිත්තං වීතමෝහං චිත්තන්ති පජානාති, සංඛිත්තං වා චිත්තං ..... වික්ඛිත්තං වා චිත්තං ..... මහග්ගතං වා චිත්තං ..... අමහග්ගතං වා චිත්තං ..... සඋත්තරං වා චිත්තං ..... අනුත්තරං වා චිත්තං ..... සමාහිතං වා චිත්තං ..... අසමාහිතං වා චිත්තං ..... විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

60. පින්වත් කේවඩ්ඪ, ඒක මේ වගේ දෙයක්. ලස්සනට සැරසෙන්ට කැමති ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දරුවෙක් හෝ තරුණයෙක් හෝ ඉන්නවා. ඔහු පිරිසිදු දීප්තිමත් කණ්ණාඩියක් ඉදිරියේ හෝ පැහැදිලි දිය ඇති බඳුනකින් හෝ තමන් ගේ මුව මඩල හොඳින් විමසා බලනවා. එතකොට දොස් ඇති තැන දොස් ඇති තැන වශයෙන් දැන ගන්නවා. දොස් නැති තැන දොස් නැති තැන වශයෙන් දැන ගන්නවා. පින්වත් කේවඩ්ඪ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අනුන් ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා. රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. රාග රහිත සිත වීතරාගී සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ රහිත සිත වීතදෝසී සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ සහිත සිත මෝහ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ රහිත සිත වීතමෝහී

සිතක් වශයෙන් දැන ගන්නවා. හැකුළුනු සිත ..... විසිරුණු සිත ..... සමාධිමත් සිත ..... සමාධි රහිත සිත ..... නො දියුණු සිත ..... දියුණු සිත ..... එකඟ වෙන සිත ..... එකඟ නො වෙන සිත ..... කෙලෙසුන්ගෙන් මිදුණු සිත කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා.

61. යම්පි කේවඩ්ඪ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

61. පින්වත් කේවඩ්ඪ, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

62. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: ඒකම්පි ජාතිං, ද්වේපි ජාතියෝ, තිස්සෝපි ජාතියෝ, චතස්සෝපි ජාතියෝ, පඤ්චපි ජාතියෝ, දසපි ජාතියෝ, වීසම්පි ජාතියෝ, තිංසම්පි ජාතියෝ, චත්තාරීසම්පි ජාතියෝ, පඤ්ඤාසම්පි ජාතියෝ, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනේකේපි සංවට්ටකප්පේ, අනේකේපි විවට්ටකප්පේ, අනේකේපි සංවට්ටවිවට්ටකප්පේ, අමුත්‍රාසිං ඒවංනාමෝ ඒවංගොත්තෝ ඒවංවණ්ණෝ ඒවමාහාරෝ ඒවංසුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං ඒවංනාමෝ ඒවංගොත්තෝ ඒවංවණ්ණෝ ඒවමාහාරෝ ඒවංසුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති.

62. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාස්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි.

ඉතින් ඔහු නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක්, ජීවිත දෙකක්, ජීවිත තුනක්, ජීවිත හතරක්, ජීවිත පහක්, ජීවිත දහයක්, ජීවිත විස්සක්, ජීවිත තිහක්, ජීවිත හතළිහක්, ජීවිත පනහක්, ජීවිත සියයක්, ජීවිත දහසක්, ජීවිත ලක්ෂයක්; අනේකවිධ වූ සංවට්ට කල්පයන් ද, අනේකවිධ වූ විවට්ට කල්පයන් ද, අනේකවිධ වූ සංවට්ටවිවට්ට කල්පයන් ද සිහි කරනවා. මං ඉස්සර සිටියේ අසවල් තැන, එතකොට මගේ නම මේක යි. ගෝත්‍ර නාමය මේක යි. හැඩරුව මෙහෙම යි. කෑම බීම මෙහෙම යි. දුක් සැප වින්දේ මේ විදිහට යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. ඒ මං එතැනින් චුත වුණා. අසවල් තැන උපන්නා. එතකොට මගේ නම වුණේ මේක යි. ගෝත්‍රනාමය මේක යි. හැඩරුව වුණේ මෙහෙමයි. කෑවේ බිව්වේ මෙහෙම යි. සැප දුක් වින්දේ මෙහෙම යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. මං එතැනින් චුත වුණා. මේ ලෝකයේ උපන්නා” ආදී වශයෙන් ආකාර සහිත ව සවිස්තර ව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා.

63. සෙය්‍යථාපි කේවඩ්ඪ පුරිසෝ සකම්හා ගාමා අඤ්ඤං ගාමං ග-ඡෙය්‍ය තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ග-ඡෙය්‍ය. සෝ තම්හා ගාමා සකඤ්ඤේව ගාමං ප-චාග-ඡෙය්‍ය. තස්ස ඒවමස්ස: අහං ඛෝ සකම්හා ගාමං අමුං ගාමං ආග-ඡිං තත්‍ර ඒවං අට්ඨාසිං ඒවං නිසීදිං ඒවං අභාසිං ඒවං තුණ්හී අහෝසිං. තම්හාපි ගාමා අමුං ගාමං අග-ඡිං තත්‍රාපි ඒවං අට්ඨාසිං ඒවං නිසීදිං ඒවං අභාසිං ඒවං තුණ්හී අහෝසිං. සෝම්හි තම්හා ගාමා සකඤ්ඤේව ගාමං ප-චාගතෝති. ඒවමේව ඛෝ කේවඩ්ඪ, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: ඒකම්පි ජාතිං, ද්වේපි ජාතියෝ, තිස්සෝපි ජාතියෝ, චතස්සෝපි ජාතියෝ, පඤ්චපි ජාතියෝ, දසපි ජාතියෝ, වීසම්පි ජාතියෝ, තිංසම්පි ජාතියෝ, චත්තාරීසම්පි ජාතියෝ, පඤ්ඤාසම්පි ජාතියෝ, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනේකේපි සංවට්ටකප්පේ, අනේකේපි විවට්ටකප්පේ, අනේකේපි සංවට්ටවිවට්ටකප්පේ, අමුත්‍රාසිං ඒවං නාමෝ ඒවංගොත්තෝ ඒවංවණ්ණෝ ඒවමාහාරෝ ඒවංසුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං. තත්‍රාපාසිං ඒවංනාමෝ ඒවංගොත්තෝ ඒවංවණ්ණෝ ඒවමාහාරෝ ඒවංසුඛදුක්ඛපටිසංවේදී ඒවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති.

63. පින්වත් කේවඩ්ඪ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමන් ගේ ගමෙන් වෙනත් ගමකට යනවා. ඒ ගමෙන් තවත් ගමකට යනවා. ඒ ගමෙන් යළි තමන් ගේ ගමට එනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. මං මගේ ගමෙන් අසවල් ගමට ගියා. මං එහෙදී මෙහෙමයි හිටියේ. මෙහෙමයි වාඩි වුණේ. මෙහෙමයි කතාබහ කළේ. මෙහෙමයි නිශ්ශබ්දව සිටියේ. ඉතින් මං ඒ ගමෙනුත් අසවල් ගමට ගියා. එහෙ හිටියේ මේ විදිහට යි. වාඩි වුණේ මේ විදිහට යි. කථාබස් කළේ මේ විදිහට යි. නිහඬව සිටියේ මේ විදිහට යි. ඒ මං ඒ ගමෙන් මගේ ගමටම නැවත ආවා" කියලා. පින්වත් කේවඩ්ඪ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. ඉතින් ඔහු නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක්, ජීවිත දෙකක්, ජීවිත තුනක්, ජීවිත හතරක්, ජීවිත පහක්, ජීවිත දහයක්, ජීවිත විස්සක්, ජීවිත තිහක්, ජීවිත හතළිහක්, ජීවිත පනහක්, ජීවිත සියයක්, ජීවිත දහසක්, ජීවිත ලක්ෂයක්; අනේකවිධ වූ සංවට්ට කල්පයන් ද, අනේකවිධ වූ විවට්ට කල්පයන් ද, අනේකවිධ වූ සංවට්ටවිවට්ට කල්පයන් ද සිහි කරනවා. මං ඉස්සර සිටියේ අසවල් තැන, එතකොට මගේ නම මේක යි. ගෝත්‍ර නාමය මේක යි. හැඩරුව මෙහෙම යි. කෑම බීම මෙහෙම යි. දුක් සැප වින්දේ මේ විදිහට යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. ඒ මං එතැනින් චුත වුණා. අසවල් තැන උපන්නා. එතකොට මගේ නම වුණේ මේක යි. ගෝත්‍රනාමය මේක යි. හැඩරුව වුණේ මෙහෙමයි. කෑවේ බිව්වේ මෙහෙම යි. සැප දුක් වින්දේ මෙහෙම යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. මං එතැනින් චුත වුණා. මේ ලෝකයේ උපන්නා" ආදී වශයෙන් ආකාර සහිත ව සවිස්තර ව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා.

යම්පි කේවඩ්ඪ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

පින්වත් කේවඩ්ඪ, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

64. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානති: ඉමේ වත භොන්තෝ සත්තා කායදු-චරිතේන සමන්නාගතා, වචිදු-චරිතේන සමන්නාගතා, මනෝදු-චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මි-ඡාදිට්ඨිකා, මි-ඡාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමේ වා පන භොන්තෝ සත්තා කායසුචරිතේන සමන්නාගතා, වචිසුචරිතේන සමන්නාගතා, මනෝසුචරිතේන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නාති. ඉති දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති.

64. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා. එයට සිත නතු කරනවා. එතකොට ඒ භික්ෂුව මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. “අහෝ! මේ භවත් සත්වයන් කයින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, මනසින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයේ ඉපදිලා ඉන්නවා. ඒ වගේ ම මේ භවත් සත්වයන් කයින් සුචරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් සුචරිතයෙහි යෙදීම නිසා, මනසින් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නොකොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ

සුගති නම් වූ, ස්වර්ග ලෝකයෙහි ඉපදිලා ඉන්නවා" කියලා. මේ විදිහට මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා.

65. සෙය්‍යථාපි කේවඩ්ඪ, මජ්ඣෙඩි සිංඝාටකේ පාසාදෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ ඨිතෝ පස්සෙය්‍ය මනුස්සේ ගේහං පවිසන්තේ'පි නික්ඛමන්තේ'පි රථියා වීතිසඤ්චරන්තේ'පි මජ්ඣෙඩි සිංඝාටකේ නිසින්නේ'පි, තස්ස ඒවමස්ස: ඒතේ මනුස්සා ගේහං පවිසන්ති. ඒතේ නික්ඛමන්ති. ඒතේ රථියා වීතිසඤ්චරන්ති. ඒතේ මජ්ඣෙඩි සිංඝාටකේ නිසින්නාති. ඒවමේව ඛෝ කේවඩ්ඪ, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානති: ඉමේ වත භොන්තෝ සත්තා කායදු-චරිතේන සමන්නාගතා, වචිදු-චරිතේන සමන්නාගතා, මනෝදු-චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මි-ඡාදිට්ඨිකා, මි-ඡාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමේ වා පන භොන්තෝ සත්තා කායසුචරිතේන සමන්නාගතා, වචිසුචරිතේන සමන්නාගතා, මනෝසුචරිතේන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නාති. ඉති දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති.

65. පින්වත් කේවඩ්ඪ, එක මේ වගේ දෙයක්. හතරමං හන්දියක තට්ටු නිවසක් තියෙනවා. එහි ඇස් ඇති පුරුෂයෙක් සිටගෙන බලාගෙන ඉන්නවා. ඔහු (පහළ) ගෙට ඇතුළ් වන්නා වූත්, නික්මෙන්නා වූත්, වීදියේ එහාට මෙහාට ඇවිදින්නා වූත්, හතරමං හන්දිය මැද වාඩි වී සිටින්නා වූත් මිනිසුන් දකිනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා "මේ මිනිසුන් ගෙට ඇතුළු වෙනවා. මේ උදවිය ගෙයින් නික්මෙනවා. මේ උදවිය වීදියේ එහාට මෙහාට ඇවිදිනවා. මේ උදවිය හතරමං හන්දිය මැද වාඩි වෙලා ඉන්නවා" කියලා. පින්වත් කේවඩ්ඪ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත

පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා. එයට සිත නතු කරනවා. එතකොට ඒ භික්ෂුව මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිව්‍යැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. “අහෝ! මේ භවත් සත්වයන් කයින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, මනසින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයේ ඉපදිලා ඉන්නවා. ඒ වගේ ම මේ භවත් සත්වයන් කයින් සුචරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් සුචරිතයෙහි යෙදීම නිසා, මනසින් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නොකොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ සුගති නම් වූ, ස්වර්ග ලෝකයෙහි ඉපදිලා ඉන්නවා” කියලා. මේ විදිහට මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිව්‍යැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා.

66. යම්පි කේවඩ්ඪ භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... සුගතේ දුග්ගතේ යථාකම්මූපගේ සත්තේ පජානාති, ඉදම්පි ’ස්ස හෝති පඤ්ඤය.

66. පින්වත් කේවඩ්ඪ, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

67. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයෝති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධෝති

යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. ඉමේ ආසවාති යථාභූතං පජානාති. අයං ආසවසමුදයෝති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධෝති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතෝ එවං පස්සතෝ කාමාසවාපි චිත්තං විමු-චති භවාසවාපි චිත්තං විමු-චති. අවිජ්ජාසවාපි චිත්තං විමු-චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

67. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා. එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මේවා ආශ්‍රවයන් කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රවයන් ගේ හට ගැනීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස් වුණ බවට ඤාණය ඇති වෙනවා. “ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ”යි අවබෝධයෙන් ම දැන ගන්නවා.

සෙය්‍යථාපි කේවට්ඨ, පබ්බතසංඛේපෝ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ තීරේ ඨිතෝ පස්සෙය්‍ය සිප්පිසම්බුකම්’පි සක්ඛරකඨලම්’පි ම-ඡගුම්බම්’පි චරන්තම්’පි තිට්ඨන්තම්’පි. තස්ස එවමස්ස: අයං ඛෝ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ

අනාවිලෝ. තත්‍රිමේ සිප්පිසම්බූකා'පි සක්ඛරකඨලා'පි ම-ඡගුම්බා'පි චරන්ති'පි තිට්ඨන්තිපි'ති. ඒවමේව ඛෝ කෝඩඩඪ, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයෝති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධෝති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. ඉමේ ආසවාති යථාභූතං පජානාති. අයං ආසවසමුදයෝති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධෝති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධගාමිනී පටිපදාති යථාභූතං පජානාති.

පින්වත් කෝඩඩඪ, එක මේ වගේ දෙයක්. පර්වත මුදුනක ජලාශයක් තියෙනවා. එහි ජලය ඉතා හොඳයි. හරිම ප්‍රසන්නයි. කැළඹිලා නෑ. එතැන ඇස් ඇති පුරුෂයෙක් ඒ ඉවුරේ සිටගෙන ජලාශය දෙස බලා සිටිනවා. එතකොට ඔහුට සිප්පිබෙල්ලනුත්, සක්බෙල්ලනුත්, කැටකැබලිත්, මාළු රංචු ආදියත් හැසිරෙන අයුරු, සිටින අයුරු දකින්ට ලැබෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක ඉතා හොඳ ජලය ඇති හරිම ප්‍රසන්න වූ නොකැළඹුණු දිය ඇති විලක්. මෙහි මේ සිප්පිබෙල්ලන්, සක්බෙල්ලන්, කැටකැබලිති, මාළු රංචුත් හැසිරෙනවා නෙව. ඉන්නවා නෙව" කියල. පින්වත් කෝඩඩඪ, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වැනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා. එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මේවා ආශ්‍රවයන් කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රවයන් ගේ හට ගැනීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

තස්ස මේ එවං ජානතෝ එවං පස්සතෝ කාමාසවා'පි චිත්තං විමු-චති භවාසවා'පි චිත්තං විමු-චති. අවිජ්ජාසවා'පි චිත්තං විමු-චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස් වුණ බවට ඤාණය ඇති වෙනවා. "ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා.

යම්පි කේවට්ඨ භික්ඛු එවං සමාහිතේ චිත්තේ ..... කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

පින්වත් කේවට්ඨ, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

68. ඉදං වුච්චති කේවට්ඨ අනුසාසනීපාටිහාරියං. ඉමානි ඛෝ කේවට්ඨ තීණි පාටිහාරියානි මයා සයං අභිඤ්ඤය සච්ඡිකත්වා පවේදිතානි.

68. පින්වත් කේවට්ඨ, අනුශාසනා ප්‍රාතිහාර්යය කියල කියන්නේ මේකට යි. පින්වත් කේවට්ඨ, මා ස්වකීය විශිෂ්ඨ වූ ඥානයින් ම සාක්ෂාත් කර ගෙන යි මේ ත්‍රිවිධ වූ ප්‍රාතිහාර්යයන් දේශනා කරල තියෙන්නේ.

69. භූතපුබ්බං කේවට්ඨ ඉමස්මිඤ්ඤේව භික්ඛුසංඝේ අඤ්ඤතරස්ස භික්ඛුනෝ එවං චේතසෝ පරිවිතක්කෝ උදපාදි: කත්ථ නු ඛෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අථ ඛෝ සෝ කේවට්ඨ භික්ඛු තථාරූපං සමාධිං සමාපජ්ජි, යථා සමාහිතේ චිත්තේ දේවයානියෝ මග්ගෝ පාතුරහෝසි. අථ ඛෝ සෝ කේවට්ඨ භික්ඛු යේන චාතුම්මහාරාජිකා දේවා තේනුපසංකමි. උපසංකමිත්වා චාතුම්මහාරාජිකේ දේවේ එතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූ?ති. එවං වුත්තේ කේවට්ඨ චාතුම්මහාරාජිකා දේවා තං භික්ඛුං එතදවෝචුං: මයම්පි ඛෝ භික්ඛු

න ජානාම යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු චත්තාරෝ මහාරාජානෝ අම්හේහි අභික්කන්තතරා ච පණීතතරා ච. තේ ඛෝ ඒතං ජානෙය්‍යුං යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

69. පින්වත් කේවට්ඨ, මේක කලින් වෙච්ච දෙයක්. මේ භික්ෂු සංඝයා අතර ම ඉන්න එක්තරා භික්ෂුවකට මෙවැනි චිත්ත පරිවිතර්කයක් උපන්නා. ඒ කියන්නේ "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල. ඉතින් පින්වත් කේවට්ඨ, ඒ භික්ෂුව සමාහිත සිතින් ඉර්ධියෙන් දෙව්ලොව යා හැකි මගක් පහළ වෙනවා නම්, එබඳු ආකාර වූ සමාධියක් ඇති කර ගත්තා. පින්වත් කේවට්ඨ, ඒ භික්ෂුව චාතුම්මහාරාජික දෙවියන් කරා ගියා. ගිහින් චාතුම්මහාරාජික දෙවියන් හට ඔය කාරණය කිව්වා. "ඇවැත්නි, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල. එසේ කී විට පින්වත් කේවට්ඨ, චාතුම්මහාරාජික දෙවිවරු අර භික්ෂුවට මෙහෙම කිව්වා. "අනේ! පින්වත් භික්ෂුව, අපි වුණත් "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ සතරවරම් දිව්‍ය රාජවරු ඉන්නවා. උන්නාන්සේලා නම් මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නවා ඇති."

70. අථ ඛෝ සෝ කේවට්ඨ භික්ඛු යේන චත්තාරෝ මහාරාජානෝ තේනුපසංකමි. උපසංකමිත්වා චත්තාරෝ මහාරාජේ ඒතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති?

70. පින්වත් කේවට්ඨ, එතකොට ඒ භික්ෂුව සතරවරම් දිව්‍යරාජවරුන් ළඟට ගියා. ගිහින් සතරවරම් දිව්‍ය රාජවරුන්ට මෙකරුණ කීවා. "ආයුෂ්මතුනි, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල.

71. එවං වුත්තේ කේවඩ්ඪ චත්තාරෝ මහාරාජානෝ තං භික්ඛුං එතදවෝචුං: මයම්පි ඛෝ භික්ඛු න ජානාම යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු තාවතිංසා නාම දේවා අම්හේහි අභික්කන්තතරා ච පණීතතරා ච. තේ ඛෝ එතං ජානෙය්‍යුං යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

71. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, සතරවරම් දිව්‍යරාජවරු අර භික්ෂුවට මෙහෙම කිව්වා. “අනේ! පින්වත් භික්ෂුව, අපි වුණත් “මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද” කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ තව්තිසා නම් දෙවිවරු ඉන්නවා. උන්නාන්සේලා නම් මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද” කියන ඔය කාරණය දන්නවා ඇති.”

72. අථ ඛෝ සෝ කේවඩ්ඪ භික්ඛු යේන තාවතිංසා දේවා තේනුපසංකමි. උපසංකමිත්වා තාවතිංසේ දේවේ එතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? එවං වුත්තේ කේවඩ්ඪ තාවතිංසා දේවා තං භික්ඛුං එතදවෝචුං: මයම්පි ඛෝ භික්ඛු න ජානාම යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු සක්කෝ නාම දේවානමින්දෝ අම්හේහි අභික්කන්තතරෝ ච පණීතතරෝ ච. සෝ ඛෝ ජානෙය්‍ය යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ භික්ෂුව තව්තිසා නම් දෙවිවරුන් ළඟට ගියා. ගිහින් තව්තිසා නම් දෙවිවරුන්ට මෙකරුණ කීවා. “ආයුෂ්මතුනි, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?” කියල. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, තව්තිසා නම් දෙවිවරු අර භික්ෂුවට මෙහෙම කිව්වා. “අනේ! පින්වත් භික්ෂුව, අපි වුණත් “මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම

නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ ශක්‍ර නම් දේවේන්ද්‍රයා ඉන්නවා. උන්නාන්සේ නම් මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නවා ඇති."

73. අථ ඛෝ සෝ කේවඩ්ඪ භික්ඛු යේන සක්කෝ දේවානමින්දෝ තේනුපසංකමි. උපසංකමිත්වා සක්කං දේවනමින්දං ඒතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? ඒවං වුත්තේ කේවඩ්ඪ සක්කෝ දේවානමින්දෝ තං භික්ඛුං ඒතදවෝච: අහම්පි ඛෝ භික්ඛු න ජානාමි යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු යාමා නාම දේවා අම්හේහි අභික්කන්තතරා ච පණීතතරා ච. තේ ඛෝ ඒතං ජානෙය්‍යුං යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

73. පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ භික්ෂුව ශක්‍ර දේවේන්ද්‍රයා ළඟට ගියා. ගිහින් ශක්‍ර දේවේන්ද්‍රයාට මෙකරුණ කීවා. "ආයුෂ්මතුනි, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, ශක්‍ර දේවේන්ද්‍රයා අර භික්ෂුවට මෙහෙම කිව්වා. "අනේ! පින්වත් භික්ෂුව, මම වුණත් "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ යාම නම් දෙව්වරු ඉන්නවා. උන්නාන්සේලා නම් මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහාභූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නවා ඇති."

74. අථ ඛෝ සෝ කේවඩ්ඪ භික්ඛු යේන යාමා දේවා තේනුපසංකමි. උපසංකමිත්වා යාමේ දේවේ ඒතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? ඒවං වුත්තේ කේවඩ්ඪ යාමා දේවා තං භික්ඛුං ඒතදවෝචුං: මයම්පි ඛෝ භික්ඛු න ජානාම යත්ථිමේ චත්තාරෝ

මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු සුයාමෝ නාම දේව පුත්තෝ අම්හේහි අභික්කන්තතරෝ ච පණීතතරෝ ච. සෝ ඛෝ ඒතං ජානෙය්‍ය යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

74. පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ භික්ෂුව යාම දෙවිවරුන් ළඟට ගියා. ගිහින් යාම දෙවිවරුන්ට මෙකරුණ කීවා. "ආයුෂ්මතුනි, මේ පථවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, යාම දෙවිවරුන් අර භික්ෂුවට මෙහෙම කිව්වා. "අනේ! පින්වත් භික්ෂුව, අපි වුණත් "මේ පථවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ සුයාම නම් දිව්‍ය පුත්‍රයා ඉන්නවා. උන්නාන්සේ නම් මේ පථවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නවා ඇති."

75. අථ ඛෝ සෝ කේවඩ්ඪ, භික්ඛු යේන සුයාමෝ දේවපුත්තෝ තේනුපසංකමි. උපසංකමිත්වා සුයාමං දේවපුත්තං ඒතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? ඒවං වුත්තේ කේවඩ්ඪ සුයාමෝ දේවපුත්තෝ තං භික්ඛුං ඒතදවෝචුං: අහම්පි ඛෝ භික්ඛු න ජානාමි යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු තුසිතා නාම දේවා අම්හේහි අභික්කන්තතරා ච පණීතතරා ච. තේ ඛෝ ඒතං ජානෙය්‍යුං යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ භික්ෂුව සුයාම දිව්‍ය පුත්‍රයා ළඟට ගියා. ගිහින් සුයාම දිව්‍ය පුත්‍රයාට මෙකරුණ කීවා. "ආයුෂ්මතුනි, මේ පථවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, සුයාම දිව්‍ය පුත්‍රයා අර භික්ෂුවට මෙහෙම කිව්වා. "අනේ! පින්වත්

භික්ෂුව, මම වුණත් "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ තුසිත නම් වූ දෙවිවරු ඉන්නවා. උන්නාන්සේලා නම් මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නවා ඇති."

76. අථ ඛෝ සෝ කේවඩ්ඪ භික්ඛු යේන තුසිතා දේවා තේනුපසංකමි. උපසංකමිත්වා තුසිතේ දේවේ ඒතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? ඒවං වුත්තේ කේවඩ්ඪ තුසිතා දේවා තං භික්ඛුං ඒතදවෝචුං: මයම්පි ඛෝ භික්ඛු න ජානාම යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු සන්තුසිතෝ නාම දේවපුත්තෝ අම්හේහි අභික්කන්තතරෝ ච පණීතතරෝ ච. සෝ ඛෝ ඒතං ජානෙය්‍ය යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ භික්ෂුව තුසිත නම් වූ දෙවිවරුන් ළඟට ගියා. ගිහින් තුසිත නම් වූ දෙවිවරුන්ට මෙකරුණ කීවා. "ආයුෂ්මතුනි, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, තුසිත නම් වූ දෙවිවරුන් අර භික්ෂුවට මෙහෙම කිව්වා. "අනේ පින්වත් භික්ෂුව, අපි වුණත් "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ සන්තුසිත නම් දිව්‍ය පුත්‍රයෙක් ඉන්නවා. උන්නාන්සේ නම් මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නවා ඇති."

77. අථ ඛෝ සෝ කේවඩ්ඪ භික්ඛු යේන සන්තුසිතෝ නාම දේවපුත්තෝ තේනුපසංකමි. උපසංකමිත්වා සන්තුසිතං දේවපුත්තං ඒතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං

පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? ඒවං වුත්තේ කේවඩ්ඪ සන්තුසිතෝ දේවපුත්තෝ තං භික්ඛුං ඒතදවෝචුං: අහම්පි ඛෝ භික්ඛු න ජානාමි යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු නිම්මානරතී නාම දේවා අම්හේහි අභික්කන්තතරා ච පණීතතරා ච. තේ ඛෝ ඒතං ජානෙය්‍යුං යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

77. පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ භික්ෂුව සන්තුසිත දිව්‍ය පුත්‍රයා ළඟට ගියා. ගිහින් සන්තුසිත දිව්‍ය පුත්‍රයාට මෙකරුණ කීවා. "ආයුෂ්මතුනි, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, සන්තුසිත දිව්‍ය පුත්‍රයා අර භික්ෂුවට මෙහෙම කිව්වා. "අනේ! පින්වත් භික්ෂුව, මම වුණත් "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ නිම්මාණරතී නම් දෙවිවරුන් ඉන්නවා. උන්නාන්සේලා නම් මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නවා ඇති."

78. අථ ඛෝ සෝ කේවඩ්ඪ භික්ඛු යේන නිම්මානරතී දේවා තේනුපසංකමි. උපසංකමිත්වා නිම්මානරතී දේවේ ඒතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? ඒවං වුත්තේ කේවඩ්ඪ නිම්මානරතී දේවා තං භික්ඛුං ඒතදවෝචුං: මයම්පි ඛෝ භික්ඛු න ජානාම යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු සුනිම්මිතෝ නාම දේවපුත්තෝ අම්හේහි අභික්කන්තතරෝ ච පණීතතරෝ ච. සෝ ඛෝ ඒතං ජානෙය්‍ය යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

78 පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ භික්ෂුව නිම්මාණරතී දෙවිවරුන් ළඟට ගියා. ගිහින් නිම්මාණරතී දෙවිවරුන්ට මෙකරුණ කීවා. "ආයුෂ්මතුනි, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා

භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියල. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, නිම්මාණරතී දෙවිවරුන් අර භික්ෂුවට මෙහෙම කිව්වා. "අනේ! පින්වත් භික්ෂුව, අපි වුණත් "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ සුනිම්මිත නම් දිව්‍ය පුත්‍රයෙක් ඉන්නවා. උන්නාන්සේ නම් මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නවා ඇති."

79. අථ ඛෝ සෝ කේවඩ්ඪ, භික්ඛු යේන සුනිම්මිතෝ දේවපුත්තෝ තේනුපසංකමි. උපසංකමිත්වා සුනිම්මිතං දේවපුත්තං ඒතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? ඒවං වුත්තේ කේවඩ්ඪ සුනිම්මිතෝ දේවපුත්තෝ තං භික්ඛුං ඒතදවෝචුං: අහම්පි ඛෝ භික්ඛු න ජානාමි යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු පරනිම්මිතවසවත්තී නාම දේවා අම්හේහි අභික්කන්තතරා ච පණීතතරා ච. තේ ඛෝ ඒතං ජානෙය්‍යුං යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

79. පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ භික්ෂුව සුනිම්මිත දිව්‍ය පුත්‍රයා ළඟට ගියා. ගිහින් සුනිම්මිත දිව්‍ය පුත්‍රයාට මෙකරුණ කීවා. "ආයුෂ්මතුනි, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, සුනිම්මිත දිව්‍ය පුත්‍රයා අර භික්ෂුවට මෙහෙම කිව්වා. "අනේ! පින්වත් භික්ෂුව, මම වුණත් "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ පරනිම්මිතවසවත්තී නම් දෙවිවරුන් ඉන්නවා. උන්නාන්සේලා නම් මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නවා ඇති."

80. අථ ඛෝ සෝ කේවඩ්ඪ භික්ඛු යේන පරනිම්මිතවසවත්තී දේවා තේනුපසංකමි. උපසංකමිත්වා පරනිම්මිතවසවත්තී දේවේ ඒතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? ඒවං වුත්තේ කේවඩ්ඪ පරනිම්මිතවසවත්තී දේවා තං භික්ඛුං ඒතදවෝචුං: මයම්පි ඛෝ භික්ඛු න ජානාම යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු වසවත්තී නාම දේවපුත්තෝ අම්හේහි අභික්කන්තතරෝ ච පණීතතරෝ ච. සෝ ඛෝ ඒතං ජානෙය්‍ය යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

80. පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ භික්ෂුව පරනිම්මිතවසවත්තී දෙවිවරුන් ළඟට ගියා. ගිහින් පරනිම්මිතවසවත්තී දෙවිවරුන්ට මෙකරුණ කීවා. “ආයුෂ්මතුනි, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?” කියල. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, පරනිම්මිතවසවත්තී දෙවිවරුන් අර භික්ෂුවට මෙහෙම කිව්වා. “අනේ! පින්වත් භික්ෂුව, අපි වුණත් “මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද” කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ වසවත්තී නම් දිව්‍ය පුත්‍රයෙක් ඉන්නවා. උන්නාන්සේ නම් මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද” කියන ඔය කාරණය දන්නවා ඇති.”

81. අථ ඛෝ සෝ කේවඩ්ඪ භික්ඛු යේන වසවත්තී නාම දේවපුත්තෝ තේනුපසංකමි. උපසංකමිත්වා වසවත්තිං දේවපුත්තං ඒතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? ඒවං වුත්තේ කේවඩ්ඪ වසවත්තී දේවපුත්තෝ තං භික්ඛුං ඒතදවෝචුං: අහම්පි ඛෝ භික්ඛු න ජානාමි යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු බ්‍රහ්මකායිකා නාම දේවා අම්හේහි අභික්කන්තතරා ච පණීතතරා ච. තේ ඛෝ ඒතං ජානෙය්‍යුං යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

81. පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ භික්ෂුව වසවත්තී දිව්‍ය පුත්‍රයා ළඟට ගියා. ගිහින් වසවත්තී දිව්‍ය පුත්‍රයාට මෙකරුණ කීවා. "ආයුෂ්මතුනි, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියල. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, වසවත්තී දිව්‍ය පුත්‍රයා අර භික්ෂුවට මෙහෙම කිව්වා. "අනේ! පින්වත් භික්ෂුව, මම වුණත් "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ බ්‍රහ්මකායික නම් දෙවිවරුන් ඉන්නවා. උන්නාන්සේලා නම් මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නවා ඇති."

82. අථ ඛෝ සෝ කේවඩ්ඪ භික්ඛු තථාරූපං සමාධිං සමාපජ්ජි යථාසමාහිතේ චිත්තේ බ්‍රහ්මයානියෝ මග්ගෝ පාතුරහෝසි. අථ ඛෝ සෝ කේවඩ්ඪ භික්ඛු යේන බ්‍රහ්මකායිකා දේවා තේනුපසංකමි. උපසංකමිත්වා බ්‍රහ්මකායිකා දේවේ ඒතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? ඒවං වුත්තේ කේවඩ්ඪ බ්‍රහ්මකායිකා දේවා තං භික්ඛුං ඒතදවෝචුං: මයම්පි ඛෝ භික්ඛු න ජානාම යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. අත්ථි ඛෝ භික්ඛු බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතෝ අඤ්ඤදත්ථුදසෝ වසවත්තී ඉස්සරෝ කත්තා නිම්මාතා සෙට්ඨෝ සජිතා වසී පිතා භූතභව්‍යානං අම්හේහි අභික්කන්තතරෝ ච පණීතතරෝ ච. සෝ ඛෝ ඒතං ජානෙය්‍ය යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති.

82. එතකොට පින්වත් කේවඩ්ඪ ඒ භික්ෂුව යම් ආකාර වූ සමාධියකින් බඹලොව යන මාර්ගය පහළ වෙනවා ද, එබඳු වූ චිත්ත සමාධියකට පත් වුණා. පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ භික්ෂුව බ්‍රහ්මකායික දෙවිවරුන් ළඟට ගියා. ගිහින් බ්‍රහ්මකායික දෙවිවරුන්ට මෙකරුණ කීවා. "ආයුෂ්මතුනි, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, බ්‍රහ්මකායික දෙවිවරුන් අර භික්ෂුවට මෙහෙම කිව්වා. "අනේ! පින්වත් භික්ෂුව, අපි වුණත් "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ

ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නේ නෑ. පින්වත් භික්ෂුව, අපට වඩා ඉතා රූප සෝභා ඇති, ප්‍රණීතතර වූ, බ්‍රහ්මයා ඉන්නවා. එයා තමයි මහා බ්‍රහ්මයා. ලොව මැඩලන කෙනා. වෙන කෙනෙකුන්ට නො මැඩිය හැකි කෙනා. සියල්ල දක්නා කෙනා. ලොව වසඟයෙහි පවත්වන කෙනා. මෙයා තමයි කර්තෘ. නිර්මාතෘ. මෙයා තමයි ශ්‍රේෂ්ඨ කෙනා. ලොව සකස් කරන කෙනා. පුරුදු කළ වශී ඇති කෙනා. ඉපදුනු උපදින සත්වයන් ගේ පියාණන් වහන්සේ. උන්නාන්සේ නම් මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද" කියන ඔය කාරණය දන්නවා ඇති."

83. "කහං පනාවුසෝ ඒතරහි සෝ මහාබ්‍රහ්මා?"ති. "මයම්පි ඛෝ භික්ඛු න ජානාම යත්ථ වා බ්‍රහ්මා යේන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මාති. අපි ච භික්ඛු යථා නිමිත්තා දිස්සන්ති ආලෝකෝ සඤ්ජායති. විභාසෝ පාතුභවති, බ්‍රහ්මා පාතුභවිස්සති. බ්‍රහ්මුනෝ හේතං පුබ්බනිමිත්තං පාතුභාවාය යදිදං ආලෝකෝ සඤ්ජායති විභාසෝ පාතුභවතීති. අථ ඛෝ සෝ කේවඩ්ඪ මහාබ්‍රහ්මා න චිරස්සේව පාතුරහෝසි. අථ ඛෝ සෝ කේවඩ්ඪ භික්ඛු යේන මහාබ්‍රහ්මා තේනුපසංකමි. උපසංකමිත්වා තං මහාබ්‍රහ්මානං ඒතදවෝච: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? ඒවං වුත්තේ කේවඩ්ඪ සෝ මහාබ්‍රහ්මා තං භික්ඛුං ඒතදවෝචුං: අහමස්මිං භික්ඛු බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතෝ අඤ්ඤදත්ථුදසෝ වසවත්තී ඉස්සරෝ කත්තා නිම්මාතා සෙට්ඨෝ සජිතා වසී පිතා භූතභව්‍යානන්ති.

83. "ආයුෂ්මතුනි, මේ දවස්වල ඒ මහාබ්‍රහ්මයා ඉන්නේ කොහේද?" පින්වත් භික්ෂුව, අපි දන්නෙත් නෑ. ඒ බ්‍රහ්මයා කොතැනක ඉන්නවා ද? කොහෙන් එනවා ද? කොතැනක පහළ වෙනවා ද? කියල. නමුත් පින්වත් භික්ෂුව, යම් විටෙක නිමිති පහළ වෙලා. ආලෝකය ඇති වෙනවා ද, දීප්තිමත් බවක් පහළ වෙනවා ද, එතකොට බ්‍රහ්මයා පහළ වෙනවා. බ්‍රහ්මයා ගේ පහළ වීමට පෙර නිමිත්ත වශයෙන් තිබෙන්නේ ආලෝකය හට ගැනීම යි. දීප්තිමත්බව පහළ වීම යි. ඉතින් පින්වත් කේවඩ්ඪ, ඒ මහාබ්‍රහ්මයා වැඩි වෙලාවක් නො ගිහින් පහළ වෙනවා. එතකොට පින්වත් කේවඩ්ඪ, අර භික්ෂුව මහා බ්‍රහ්මයා ළඟට ගියා. ගිහින් ඒ මහා බ්‍රහ්මයාට මෙහෙම කිව්වා. "ආයුෂ්මතුනි, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?"

කියල. එසේ කී විට ඒ මහා බ්‍රහ්මයා අර භික්ෂුවට මෙහෙම කිව්වා. "පින්වත් භික්ෂුව, මං තමයි බ්‍රහ්මයා. මහාබ්‍රහ්මයා. ලොව මැඩලන කෙනා. වෙන කෙනෙකුන්ට නො මැඩිය හැකි කෙනා. සියල්ල දක්නා කෙනා. ලොව වසඟයෙහි පවත්වන කෙනා. මම තමයි කර්තෘ. නිර්මාතෘ. මම තමයි ශ්‍රේෂ්ඨ කෙනා. ලොව සකස් කරන කෙනා. පුරුදු කළ වශී ඇති කෙනා. ඉපදුනු උපදින සත්වයන් ගේ පියාණන් වහන්සේ" කියල.

84. දුතියම්පි ඛෝ සෝ කේවඩ්ඪ, භික්ඛු තං මහාබ්‍රහ්මානං ඒතදවෝච: න ඛෝහං තං ආවුසෝ ඒවං පුච්ඡාමි: ත්වමසි බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතෝ අඤ්ඤදත්ථුදසෝ වසවත්තී ඉස්සරෝ කත්තා නිම්මාතා සෙට්ඨෝ සජිතා වසී පිතා භූතභව්‍යානන්ති? ඒවඤ්ච ඛෝ අහං තං ආවුසෝ පුච්ඡාමි: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? දුතියම්පි ඛෝ කේවඩ්ඪ සෝ මහාබ්‍රහ්මා තං භික්ඛුං ඒතදවෝචුං: අහමස්මිං භික්ඛු බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතෝ අඤ්ඤදත්ථුදසෝ වසවත්තී ඉස්සරෝ කත්තා නිම්මාතා සෙට්ඨෝ සජිතා වසී පිතා භූතභව්‍යානන්ති.

84. පින්වත් කේවඩ්ඪ, දෙවෙනි වතාවටත් අර භික්ෂුව ඒ මහා බ්‍රහ්මයාට මෙකරුණ කිව්වා "ආයුෂ්මතුනි, මං ඔබෙන් ඔය කාරණය ඇසුවේ නෑ නෙව. ඒ කියන්නේ ඔබ බ්‍රහ්මයා ද? මහාබ්‍රහ්මයා ද? ලොව මැඩලන කෙනා ද? වෙන කෙනෙකුන්ට නො මැඩිය හැකි කෙනා ද? සියල්ල දක්නා කෙනා ද? ලොව වසඟයෙහි පවත්වන කෙනා ද? ඔබ කර්තෘ ද? නිර්මාතෘ ද? ඔබ ශ්‍රේෂ්ඨ කෙනා ද? ලොව සකස් කරන කෙනා ද? පුරුදු කළ වශී ඇති කෙනා ද? ඉපදුනු උපදින සත්වයන් ගේ පියාණන් වහන්සේ ද?" කියල. නමුත් ආයුෂ්මතුනි, මං ඔබෙන් අහන්නේ මෙය යි. "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල. එතකොට පින්වත් කේවඩ්ඪ දෙවෙනි වතාවේ දීත් ඒ මහා බ්‍රහ්මයා අර භික්ෂුවට මෙහෙම කිව්වා. "පින්වත් භික්ෂුව, මං තමයි බ්‍රහ්මයා. මහාබ්‍රහ්මයා. ලොව මැඩලන කෙනා. වෙන කෙනෙකුන්ට නො මැඩිය හැකි කෙනා. සියල්ල දක්නා කෙනා. ලොව වසඟයෙහි පවත්වන කෙනා. මම තමයි කර්තෘ. නිර්මාතෘ. මම තමයි ශ්‍රේෂ්ඨ කෙනා. ලොව සකස් කරන කෙනා. පුරුදු කළ වශී ඇති කෙනා. ඉපදුනු උපදින සත්වයන් ගේ පියාණන් වහන්සේ" කියල.

85. තතියම්පි ඛෝ සෝ කේවඩ්ඪ, භික්ඛු තං මහාබ්‍රහ්මානං ඒතදවෝච: න ඛෝහං තං ආවුසෝ ඒවං පුච්ඡාමි: ත්වමසි බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතෝ අඤ්ඤදත්ථුදසෝ වසවත්තී ඉස්සරෝ කත්තා නිම්මාතා සෙට්ඨෝ සජිතා වසී පිතා භූතභව්‍යානන්ති? ඒවඤ්ච ඛෝ අහං තං ආවුසෝ පුච්ඡාමි: කත්ථ නු ඛෝ ආවුසෝ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති?

85. පින්වත් කේවඩ්ඪ, තුන්වෙනි වතාවටත් අර භික්ෂුව ඒ මහා බ්‍රහ්මයාට මෙකරුණ කිව්වා "ආයුෂ්මතුනි, මං ඔබෙන් ඔය කාරණය ඇසුවේ නෑ නෙව. ඒ කියන්නේ ඔබ බ්‍රහ්මයා ද? මහාබ්‍රහ්මයා ද? ලොව මැඩලන කෙනා ද? වෙන කෙනෙකුන්ට නො මැඩිය හැකි කෙනා ද? සියල්ල දක්නා කෙනා ද? ලොව වසඟයෙහි පවත්වන කෙනා ද? ඔබ කර්තෘ ද? නිර්මාතෘ ද? ඔබ ශ්‍රේෂ්ඨ කෙනා ද? ලොව සකස් කරන කෙනා ද? පුරුදු කළ වශී ඇති කෙනා ද? ඉපදුනු උපදින සත්වයන් ගේ පියාණන් වහන්සේ ද?" කියල. නමුත් ආයුෂ්මතුනි, මං ඔබෙන් අහන්නේ මෙය යි. "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල.

86. අථ ඛෝ සෝ කේවඩ්ඪ මහාබ්‍රහ්මා තං භික්ඛු බාහාය ගහෙත්වා ඒකමන්තං අපනෙත්වා තං භික්ඛු. ඒතදවෝච: ඉමේ ඛෝ මං භික්ඛු බ්‍රහ්මකායිකා දේවා ඒවං ජානන්ති: නත්ථි කිඤ්චි බ්‍රහ්මුනෝ අදිට්ඨං, නත්ථි කිඤ්චි බ්‍රහ්මුනෝ අවිදිතං, නත්ථි කිඤ්චි බ්‍රහ්මුනෝ අසච්ඡිකතන්ති. තස්මාහං තේසං සම්මුඛා න බ්‍යාකාසිං. අහම්පි ඛෝ භික්ඛු න ජානාමි යත්ථිමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති. තස්මාතිහ භික්ඛු තුය්හේවේතං දුක්කටං තුය්හවේතං අපරද්ධං යං ත්වං තං භගවන්තං අනිසිත්වා බහිද්ධා පරියේට්ඨිං ආපජ්ජසි ඉමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණාය. ගච්ඡ ත්වං භික්ඛු තමේව භගවන්තං උපසංකමිත්වා ඉමං පඤ්හං පුච්ඡ. යථා ච තේ භගවා බ්‍යාකරෝති තථා නං ධාරෙය්‍යාසීති.

86. පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ මහාබ්‍රහ්මයා අර භික්ෂුව ගේ අතින් අල්ලා ගෙන එතක්පසට කරවලා ඒ භික්ෂුවට (රහසේ) මෙහෙම කිව්වා. "පින්වත් භික්ෂුව, මේ බ්‍රහ්මකායික දෙවිවරුන් මං ගැන හිතාගෙන ඉන්නේ මේ විදිහට යි. මහා බ්‍රහ්මයා නො දුටු මොකවත් ම නෑ කියලයි. මහා බ්‍රහ්මයා අවබෝධ නො කළ කිසිවක් නෑ කියල යි. මහා බ්‍රහ්මයා සාක්ෂාත් නො කළ

කිසිවක් නෑ කියල යි. උන්නැහෙලා ඉදිරියේ මං මේක නො කිව්වේ ඒ නිසයි. පින්වත් භික්ෂුව "මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියන කාරණය මංවත් දන්නේ නෑ. එනිසා පින්වත් භික්ෂුව ඔබ යම් ඒ භාග්‍යවතුන් වහන්සේව ඉක්මවා උන්වහන්සේගෙන් බාහිරව ඔය ප්‍රශ්නයට පිළිතුරු සොයන්ට යෑම කරන්ට ගිහින් ඔබ අතින් ම යි මේ වැරැද්ද වුණේ. ඔබ අතින් ම යි මේ දෝෂය වුණේ. පින්වත් භික්ෂුව, ඔබ ඒ භාග්‍යවතුන් වහන්සේ ළඟට යන්න. ගිහින් ඔය ප්‍රශ්නය අහන්න. ඒ භාග්‍යවතුන් වහන්සේ යම් පරිදි පිළිතුරු දෙන සේක් නම් ඒ අයුරින් ම එය දරාගන්න.

87. අථ ඛෝ සෝ කේවඩ්ඪ, භික්ඛු සෙය්‍යථාපි නාම බලවා පුරිසෝ සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමේව ඛෝ බ්‍රහ්මලෝකේ අන්තරහිතෝ මම පුරතෝ පාතුරහෝසි. අථ ඛෝ සෝ කේවඩ්ඪ, භික්ඛු මං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නෝ ඛෝ කේවඩ්ඪ සෝ භික්ඛු මං ඒතදවෝච: කත්ථ නු ඛෝ භන්තේ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථිදං පඨවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති?

87. පින්වත් කේවඩ්ඪ, එතකොට ඒ භික්ෂුව බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන වේගයෙන්, දිගු කළ අතක් හකුළුවන වේගයෙන් ඔය විදිහට බඹලොවින් අතුරුදහන් වෙලා මා ඉදිරියේ පහළ වුණා. පින්වත් කේවඩ්ඪ, ඉතින් ඒ භික්ෂුව මට ආදරයෙන් වන්දනා කොට එකත්පස්ව වාඩි වුණා. පින්වත් කේවඩ්ඪ එකත්පස්ව වාඩිවුණ ඒ භික්ෂුව මට මෙහෙම කිව්වා. "ස්වාමීනී, මේ පඨවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල.

88. එවං වුත්තේ අහං කේවඩ්ඪ තං භික්ඛුං ඒතදවෝච: භූතපුබ්බං භික්ඛු සාමුද්දිකා වාණිජා තීරදස්සිං සකුණං ගහෙත්වා නාවාය සමුද්දං අජ්ඣෝගාහන්ති. තේ අතීරදස්සිනියා නාවාය තීරදස්සිං සකුණං මුඤ්චන්ති. සෝ ගච්ඡතේව පුරත්ථිමං දිසං, ගච්ඡති දක්ඛිණං දිසං, ගච්ඡති පච්ඡිමං දිසං, ගච්ඡති උත්තරං දිසං, ගච්ඡති උද්ධං, ගච්ඡති අනුදිසං. සචේ සෝ සමන්තා තීරං පස්සති, තථාගතකෝ ව හෝති. සචේ පන සෝ සමන්තා තිරං න පස්සති, තමේව නාවං පච්චාගච්ඡති. ඒවමේව ඛෝ ත්වං භික්ඛු යතෝ යාව බ්‍රහ්මලෝකා පරියේසමානෝ ඉමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණං නාජ්ඣගා,

අථ මමඤ්ඤේව සන්තිකේ පච්චාගතෝ. න ඛෝ ඒසෝ භික්ඛු පඤ්හෝ ඒවං පුච්ඡිතබ්බෝ: "කත්ථ නු ඛෝ භන්තේ ඉමේ චත්තාරෝ මහාභූතා අපරිසේසා නිරුජ්ඣන්ති, සෙය්‍යථීදං පථවීධාතු ආපෝධාතු තේජෝධාතු වායෝධාතූති? ඒවඤ්ච ඛෝ ඒසෝ භික්ඛු පඤ්හෝ පුච්ඡිතබ්බෝ:

88. එසේ කී විට පින්වත් කේවඩ්ඪ, මං ඒ භික්ෂුව මෙය පැවසුවා. "පින්වත් භික්ෂුව, ඉස්සර මෙහෙම දෙයක් වුණා. මුහුදු යන වෙළෙන්දෝ පරතෙර හඳුනාගැනීමෙහි දක්ෂ ලිහිණියෙකුත් අරගෙන නැවෙන් මුහුදේ ඈත දියඹට යනවා. ඔවුන්ට ගොඩබිමක් සොයා ගන්ට බැරිවෙන කොට අර ගොඩබිම දකිනා ලිහිණියාව මුදා හරිනවා. එතකොට ඌ පෙරදිග දිශාවටත් යනවා, දකුණු දිශාවටත් යනවා, බටහිර දිශාවටත් යනවා, උතුරු දිශාවටත් යනවා, උඩ දිශාවටත් යනවා, අනු දිශාවටත් යනවා, ඉදින් ඒ ලිහිණියා හාත්පස ගොඩබිමක් දකිනවා නම්, ඒ ගිය පැත්තට ම යනවා. (නැවත හැරී එන්නේ නෑ) ඉදින් ඒ ලිහිණියා හාත්පස ගොඩ බිමක් දකින්නේ නැත්නම්, ආයෙමත් ඒ නැවට ම ආපහු හැරිල එනවා. ඒ වගේ ම යි පින්වත් භික්ෂුව, ඔබ යම් තාක් බ්‍රහ්මලෝක දක්වා ඔබ ගේ ප්‍රශ්නයට උත්තරය සොය සොයා ගිහින් හමුවුණේ නෑ නෙව. අයෙමත් මා සමීපයට ම හැරිල ආව නෙව. පින්වත් භික්ෂුව ඔය ප්‍රශ්නය ඇසිය යුත්තේ "ස්වාමීනී, මේ පථවී ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතරමහා භූතයන් ඉතිරි නැතිව ම මුළුමණින් ම නිරුද්ධ වන්නේ කොහේද?" කියල මේ විදිහට නොවෙයි. පින්වත් භික්ෂුව, ඔය ප්‍රශ්නය ඇසිය යුත්තේ මේ විදිහට යි.

කත්ථ ආපෝ ච පථවී තේජෝ වායෝ න ගාධති.
කත්ථ දීඝඤ්ච රස්සඤ්ච අණුං ථූලං සුභාසුභං
කත්ථ නාමඤ්ච රූපඤ්ච අසේසං උපරුජ්ඣතීති.

අපෝ ධාතුවත්, පථවී ධාතුවත්, තේජෝ ධාතුවත්, වායෝ ධාතුවත් නො පිහිටන්නේ කොහේ ද? දිග වූත්, කෙටි වූත්, ඉතා කුඩා වූත්, මහත් වූත්, ලස්සන අවලස්සන වූත්, රූප ස්වභාවයන් නො පිහිටන්නේ කොහේ ද? නාමත්, රූපත් ශේෂ රහිත ව නිරුද්ධ වන්නේ කොහේ ද?

තත්‍ර වෙය්‍යාකරණං භවති:

එයට පිළිතුර වන්නේ මෙය යි:

විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතෝ පභං
එත්ථ ආපෝ ච පඨවී තේජෝ වයෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපඤ්ච අසේසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරෝධේන එත්ථේතං උපරුජ්ඣතීති.

(තෘෂ්ණාව ප්‍රහීණවීමෙන්) නිදර්ශන රහිත වූත්, අන්ත රහිත වූත්, සියළු අයුරින් ම ප්‍රභූවෙන් ආලෝකවත් වූත් විඤ්ඤාණයක් ඇද්ද, (රහතන් වහන්සේ ගේ විඤ්ඤාණය) මෙහි අපෝ ධාතුවත්, පඨවී ධාතුවත්, තේජෝ ධාතුවත්, වායෝ ධාතුවත් පිහිටන්නේ නෑ. දිග වූත්, කෙටි වූත්, ඉතා කුඩා වූත්, මහත් වූත්, ලස්සන අවලස්සන වූත්, රූප ස්වභාවයන් පිහිටන්නේ නෑ. නාමත්, රූපත් ශේෂ රහිත ව නිරුද්ධ වන්නේ මෙහි තමයි. විඤ්ඤාණය නිරුද්ධ වීමෙන් (පිරිනිවන් පෑමෙන්) එහි දී ඔය සෑම දෙයක් ම නිරුද්ධ වී යනවා.

ඉදමවෝච භගවා. අත්තමනා කේවඩ්ඪෝ ගහපතිපුත්තෝ භගවතෝ භාසිතං අභිනන්දීති.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළා. සතුටු සිත් ඇති කේවඩ්ඪ ගෘහපති පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේ ගේ මෙම දේශනය සතුටින් පිළිගත්තා.

කේවඩ්ඪසුත්තං නිට්ඨිතං ඒකාදසමං.
එකොළොස් වෙනි කේවඩ්ඪ සූත්‍රය නිමා විය.

සාදු ! සාදු !! සාදු !!!

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

12.
ලෝහිච්චසුත්තං
ලෝහිච්ච බ්‍රාහ්මණයාට වදාළ දෙසුම

1. එවං මේ සුතං. එකං සමයං භගවා කෝසලේසු චාරිකං චරමානෝ මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි යේන සාලවතිකා තදවසරි. තේන ඛෝ පන සමයේන ලෝහිච්චෝ බ්‍රාහ්මණෝ සාලවතිකං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨෝදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා පසේනදිනා කෝසලේන දින්නං රාජාදායං බ්‍රහ්මදෙය්‍යං.

1. මා හට අසන්ට ලැබුණේ මේ විදිහට යි. ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග කොසොල් රටෙහි චාරිකාවේ වඩිද්දී සාලවතී ගමට ද වැඩම කළා. ඒ දිනවල ලෝහිච්ච බ්‍රාහ්මණයා වාසය කළේ සාලවතික ගමේ ම යි. ඒ බ්‍රාහ්මණ ගම ඔහුට පසේනදී කොසොල් රජුගෙන් ලැබුණු තෑග්ගක්. ඒක ශ්‍රේෂ්ඨ තෑග්ගක්. එහි බොහෝ ජනයා ඉන්නවා. තණ සහිත, දරසහිත, ජලය සහිත වූ, බොහෝ ධාන්‍ය තියෙනවා. රාජ පරිභෝග ගමක්.

2. තේන ඛෝ පන සමයේන ලෝහිච්චස්ස බ්‍රාහ්මණස්ස ඒවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හෝති: ඉධ සමණෝ වා බ්‍රාහ්මණෝ වා කුසලං ධම්මං අධිගච්ඡය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරෝචෙය්‍ය. "කිං හි පරෝ පරස්ස කරිස්සති? සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය. ඒවං සම්පදමිදං පාපකං ලෝභධම්මං වදාමි. කිං හි පරෝපරස්ස කරිස්සති"ති.

2. ඒ කාලයේ දී ලෝහිච්ච බ්‍රාහ්මණයා හට මෙවැනි වූ පවිටු මිත්‍යාදෘෂ්ටියක් ඇති වෙලා තිබෙනවා. ඒ කියන්නේ මෙහි ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, යම් කුසල ධර්මයක් උපදවා ගෙන සිටිනවා නම්, ඒ කුසල ධර්මය උපදවාගෙන ඒ ගැන අන් අයට නො කිව යුතුයි කියල. තව කෙනෙක් තවත් කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද? ඒක හරියට පැරණි බන්ධනයක් සිඳදමා වෙනත් අළුත් බන්ධනයක් කරනවා වගේ. තමන් උපදවා ගත් කුසල ධර්ම ගැන අනුන්ට කියන එකත් ඒ වගේ ම පවිටු ලෝභ දෙයක්. තව කෙනෙක් තව කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද? කියල.

3. අස්සෝසි ඛෝ ලෝහච්චෝ බ්‍රාහ්මණෝ: සමණෝ ඛලු භෝ ගෝතමෝ සක්‍යපුත්තෝ සක්‍යාකුලා පබ්බජිතෝ කෝසලේසු චාරිකං චරමානෝ මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි සාලවතිකං අනුප්පත්තෝ. තං ඛෝ පන භවන්තං ගෝතමං ඒවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගතෝ: ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරාථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣේකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසේති. සාධු ඛෝ පන තථාරූපං අරහතං දස්සනං හෝතීති.

3. ඉතින් ලෝහිච්ච බ්‍රාහ්මණයා හට මේ කාරණය අසන්ට ලැබුණා. “භවත්නි, අන්න ශාක්‍ය පුත්‍ර වූ, ශාක්‍ය කුලයෙන් නික්මී පැවිදි වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමඟ කොසොල් ජනපදයෙහි චාරිකාවේ වඩිද්දී සාලවතික ගමටත් වැඩම කරල ඉන්නවා. ඒ භවත් ගෞතමයන් වහන්සේ ගැන මෙවැනි වූ කල්‍යාණ කීර්ති ඝෝෂාවක් පැතිර ගොසින් තියෙනවා. “ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණින් අරහත් වන සේක! සම්මාසම්බුද්ධ වන සේක! විජ්ජාචරණසම්පන්න වන සේක! සුගත වන සේක! ලෝකවිදූ වන සේක! අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක! සත්ථා දේවමනුස්සානං වන සේක! බුද්ධ වන සේක! භගවා වන සේක! උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙව්මිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඤාණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා. එබඳු වූ රහතුන් දැකගන්නට ලැබීම කොතරම් යහපත් දෙයක් ද” කියලා.

4. අථ ඛෝ ලෝහිච්චෝ බ්‍රාහ්මණෝ හේසිකං නහාපිතං ආමන්තේසි: ඒහි ත්වං සම්ම හේසිකේ, යේන සමණෝ ගෝතමෝ තේනුපසංකම. උපසංකමිත්වා මම වචනේන සමණං ගෝතමං අප්පාබාධං අප්පාතංකං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ: ලෝහිච්චෝ භෝ ගෝතම බ්‍රාහ්මණෝ භවන්තං ගෝතමං අප්පාබාධං අප්පාතංකං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං

පුච්ඡතීති. ඒවඤ්ච වදේහි: අධිවාසේතු කිර භවං ගෝතමෝ ලෝහිච්චස්ස බ්‍රාහ්මණස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසංඝේනාති.

4. ඉතින් ලෝහිච්ච බ්‍රාහ්මණයා හේසිකා නම් වූ තමාව නහවන කෙනා ඇමතුවා. "යහළු හේසිකා, මෙහෙ එන්න. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වෙත යන්න. ගිහින් මගේ වචනයෙන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ගේ සැප සනීප, නීරෝග බව, සැහැල්ව් බව, කායබලය, පහසු විහරණය ගැන අසන්න. "භවත් ගෞතමයන් වහන්ස, ලෝහිච්ච බ්‍රාහ්මණයා භවත් ගෞතමයන් වහන්සේගෙන් සැප සනීප, නීරෝග බව, සැහැල්ව් බව, කායබලය, පහසු විහරණය ගැන අසනවා. ඒ වගේ ම ඔහු මෙහෙමත් කියනවා. භවත් ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමග හෙට දවසේ ලෝහිච්ච බ්‍රාහ්මණයා ගේ දානය පිළිගන්නා සේක්වා" කියල.

5. ඒවං භන්තේති ඛෝ හේසිකා නහාපිතෝ ලෝහිච්චස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යේන භගවා තේනුසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නෝ ඛෝ හේසිකා නහාපිතෝ භගවන්තං ඒතදවෝච: ලෝහිච්චෝ භන්තේ බ්‍රාහ්මණෝ භගවන්තං අප්පාබාධං අප්පාතංකං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. ඒවඤ්ච වදේති: අධිවාසේතු කිර භන්තේ භගවා ලෝහිච්චස්ස බ්‍රාහ්මණස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසංඝේනාති. අධිවාසේසි භගවා තුණ්හීභාවේන.

5. එසේය හිමියනි, කියල දිය නහවන හේසිකා ලෝහිච්ච බ්‍රාහ්මණයාට පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ වෙත ගියා. ගිහින් භාග්‍යවතුන් වහන්සේට වන්දනා කොට එකත්පස්ව වාඩිවුණා. එකත්පස්ව වාඩි වුණ දිය නහවන හේසිකා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළ කළා. "ස්වාමීනී, ලෝහිච්ච බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේගෙන් සැප සනීප, නීරෝග බව, සැහැල්ව් බව, කායබලය, පහසු විහරණය ගැන අසනවා. ඒ වගේ ම ඔහු මෙහෙමත් කියනවා. භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග හෙට දවසේ ලෝහිච්ච බ්‍රාහ්මණයා ගේ දානය පිළිගන්නා සේක්වා" කියල. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව වැඩ සිටීමෙන් එම ඇරැයුම පිළිගෙන වදාළා.

6. අථ ඛෝ හේසිකා නහාපිතෝ භගවතෝ අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යේන ලෝහිච්චෝ බ්‍රාහ්මණෝ තේනුපසංකමි. උපසංකමිත්වා ලෝහිච්චං බ්‍රාහ්මණං ඒතදවෝච:

"අවෝචුම්හා ඛෝ මයං භන්තේ තව වචනේන තං භගවන්තං. ලෝහිච්චෝ භන්තේ බ්‍රාහ්මණෝ භගවන්තං අප්පාබාධං අප්පාතංකං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. ඒවඤ්ච වදේති: අධිවාසේතු කිර භන්තේ භගවා ලෝහිච්චස්ස බ්‍රාහ්මණස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසංඝේනා"ති. අධිවුත්ථඤ්ච පන තේන භගවතාති."

6. එතකොට දියනහවන හේසිකා භාග්‍යවතුන් වහන්සේ එම ඇරැයුම පිළිගෙන වදාළ බව දැන අසුණෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වන්දනා කොට පැදකුණු කොට ලෝහිච්ච බ්‍රාහ්මණයා සිටි තැනට ගියා. ගිහින් ලෝහිච්ච බ්‍රාහ්මණයාට මෙහෙම කිව්වා. "හිමියනි, ඔබේ වචනයෙන් ඒ භාග්‍යවතුන් වහන්සේට අපි සැළ කළා. "ස්වාමීනී, ලෝහිච්ච බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේගෙන් සැප සනීප, නීරෝග බව, සැහැල්ලු බව, කායබලය, පහසු විහරණය ගැන අසනවා. ඒ වගේ ම ඔහු මෙහෙමත් කියනවා. භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග හෙට දවසේ ලෝහිච්ච බ්‍රාහ්මණයා ගේ දානය පිළිගන්නා සේක්වා" කියල. ඉතින් ඒ භාග්‍යවතුන් වහන්සේ ඒ ඇරැයුම පිළිගත් සේක."

7. අථ ඛෝ ලෝහිච්චෝ බ්‍රාහ්මණෝ තස්සා රත්තියා අච්චයේන සකේ නිවේසනේ පණීතං ඛාදනීයං භෝජනීයං පටියාදාපෙත්වා හේසිකං නහාපිතං ආමන්තේසි. ඒහි ත්වං සම්ම හේසිකේ යේන සමණෝ ගෝතමෝ තේනුපසංකම. උපසංකමිත්වා සමණස්ස ගෝතමස්ස කාලං ආරෝචේහි: කාලෝ භෝ ගෝතම නිට්ඨිතං භත්තන්ති. ඒවං භන්තේති ඛෝ හේසකා නහාපිතෝ ලෝහිච්චස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි. ඒකමන්තං ඨිතෝ ඛෝ හේසිකා නහාපිතෝ භගවතෝ කාලං ආරෝචේසි: කාලෝ භන්තේ නිට්ඨිතං භත්තන්ති. අථ ඛෝ භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසංඝේන යේන සාලවතිකා තේනුපසංකමි.

7. ඉතින් ලෝහිච්ච බ්‍රාහ්මණයා ඒ රෑ ඇවෑමෙන් තම නිවසෙහි ප්‍රණීත වූ වළඳන අනුභව කරන දන් පිළියෙල කොට දියනහවන හේසිකා ඇමතුවා. "යහළු හේසිකා, ඔබ එන්න. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ළඟට යන්න. ගිහින් "භවත් ගෞතමයන් වහන්ස, දානය පිළියෙළ කරල තියෙන්නේ. දැන් එයට සුදුසු කාලය යි" කියල ශ්‍රමණ ගෞතමයන් වහන්සේට කල් දන්වන්න. එසේය

හිමියනි, කියල දියනහවන හේසිකා ලෝහිච්ච බ්‍රාහ්මණයාට පිළිතුරු දීල භාග්‍යවතුන් වහන්සේ ළඟට ගියා. ගිහින් භාග්‍යවතුන් වහන්සේට වන්දනා කොට එකත්පස්ව සිට ගත්තා. එකත්පස්ව සිටි දියනහවන හේසිකා භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනී, දානය පිළියෙළ කරල තියෙන්නේ. දැන් එයට සුදුසු කාලය යි" කියල කල් දැනුම් දුන්නා. එතකොට භාග්‍යවතුන් වහන්සේ පෙරවරුවෙහි සිවුරු හැඳපොරවා පාසිවුරු ගෙන භික්ෂු සංඝයා සමඟ සාලවතිකාවට වැඩම කළා.

8. තේන ඛෝ පන සමයේන හේසිකා නහාපිතෝ භගවන්තං පිට්ඨිතෝ පිට්ඨිතෝ අනුබද්ධෝ හෝති. අථ ඛෝ හේසිකා නහාපිතෝ භගවන්තං ඒතදවෝච: "ලෝහිච්චස්ස භන්තේ බ්‍රාහ්මණස්ස ඒවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: ඉධ සමණෝ වා බ්‍රාහ්මණෝ වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරෝචෙය්‍ය. කිං හි පරෝ පරස්ස කරිස්සති? සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය? ඒවං සම්පදමිදං පාපකං ලෝභධම්මං වදාමි. කිං හි පරෝපරස්ස කරිස්සතී"ති. සාධු භන්තේ භගවා ලෝහිච්චං බ්‍රාහ්මණං ඒතස්මා පාපකා දිට්ඨිගතා විවේචේතූ"ති. "අප්පේවනාම සියා හේසිකේ අප්පේවනාම සියා හේසිකේ"ති.

8. ඉතින් (භාග්‍යවතුන් වහන්සේ දානයට වඩින වේලේ) දියනහවන හේසිකා භාග්‍යවතුන් වහන්සේ පිටුපසින් ගමන් කළා. එතකොට දියනහවන හේසිකා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළ කළා. "ස්වාමීනී, ලෝහිච්ච බ්‍රාහ්මණයා හට මෙවැනි වූ පවිටු මිත්‍යාදෘෂ්ටියක් ඇති වෙලා තිබෙනවා. ඒ කියන්නේ මෙහි ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, යම් කුසල ධර්මයක් උපදවා ගෙන සිටිනවා නම්, ඒ කුසල ධර්මය උපදවාගෙන ඒ ගැන අන් අයට නො කිව යුතුයි කියල. තව කෙනෙක් තවත් කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද? ඒක හරියට පැරණි බන්ධනයක් සිඳදමා වෙනත් අළුත් බන්ධනයක් කරනවා වගේ. තමන් උපදවා ගත් කුසල ධර්ම ගැන අනුන්ට කියන එකත් ඒ වගේ ම පවිටු ලෝභ දෙයක්. තව කෙනෙක් තව කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද?" කියල. ස්වාමීනී, භාග්‍යවතුන් වහන්සේ විසින් ලෝහිච්ච බ්‍රාහ්මණයාව මේ පවිටු දෘෂ්ටියෙන් මුදවන සේක් නම් ඉතා යහපති. "පින්වත් හේසිකයෙනි, ඒක එහෙම වේවි. පින්වත් හේසිකයෙනි, ඒක එහෙම වේවි."

9. අථ ඛෝ භගවා යේන ලෝහිච්චස්ස බ්‍රාහ්මණස්ස නිවේසනං තේනුපසංකමි. උපසංකමිත්වා පඤ්ඤත්තේ ආසනේ නිසීදි. අථ ඛෝ

ලෝහිච්චෝ බ්‍රාහ්මණෝ බුද්ධප්පමුඛං භික්ඛුසංඝං පණීතේන ඛාදනීයේන භෝජනීයේන සහත්ථා සන්තප්පේසි සම්පවාරේසි. අථ ඛෝ ලෝහිච්චෝ බ්‍රාහ්මණෝ භගවන්තං භුත්තාවිං විනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා ඒකමන්තං නිසීදි. ඒකමන්තං නිසින්නං ඛෝ ලෝහිච්චං බ්‍රාහ්මණං භගවා ඒතදවෝච: "සච්චං කිර තේ ලෝහිච්ච ඒවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: ඉධ සමණෝ වා බ්‍රාහ්මණෝ වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරෝචෙය්‍ය. කිං හි පරෝ පරස්ස කරිස්සති? සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය? ඒවං සම්පදමිදං පාපකං ලෝභධම්මං වදාමි. කිං හි පරෝපරස්ස කරිස්සතී?"ති.

9. ඉතින් භාග්‍යවතුන් වහන්සේ ලෝහිච්ච බ්‍රාහ්මණයා ගේ නිවසට වැඩම කළා. වැඩම කොට පණවන ලද ආසනයෙහි වැඩ සිටියා. එතකොට ලෝහිච්ච බ්‍රාහ්මණයා බුදු රජාණන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සංඝයා වහන්සේ ප්‍රණීත වූ වැළඳිය යුතු, අනුභව කළ යුතු දෙයින් සියතින් ම හොඳින් වැළඳෙව්වා. හොඳින් පිළිගැන්වුවා. පසුව ලෝහිච්ච බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේ දන් වළඳා අවසන් වූ පසු එක්තරා කුඩා ආසනයක් ගෙන එකත්පස්ව වාඩි වුණා. එකත්පස්ව වාඩිවුණ ලෝහිච්ච බ්‍රාහ්මණයාට භාග්‍යවතුන් වහන්සේ මෙකරුණ වදාළා. "පින්වත් ලෝහිච්ච, ඔබ තුළ මෙවැනි වූ පවිටු මිත්‍යාදෘෂ්ටියක් ඇති වෙලා තිබෙනවා කියන්නේ ඇත්තක ද? ඒ කියන්නේ මෙහි ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, යම් කුසල ධර්මයක් උපදවා ගෙන සිටිනවා නම්, ඒ කුසල ධර්මය උපදවාගෙන ඒ ගැන අන් අයට නොකිව යුතුයි කියල. තව කෙනෙක් තවත් කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද? ඒක හරියට පැරණි බන්ධනයක් සිඳදමා වෙනත් අළුත් බන්ධනයක් කරනවා වගේ. තමන් උපදවා ගත් කුසල ධර්ම ගැන අනුන්ට කියන එකත් ඒ වගේ ම පවිටු ලෝභ දෙයක්. තව කෙනෙක් තව කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද?" කියල.

"ඒවං භෝ ගෝතම."

"භවත් ගෞතමයන් වහන්ස, එසේය."

10. "තං කිං මඤ්ඤසි ලෝහිච්ච? නනු ත්වං සාලවතිකං අජ්ඣාවසසී"?ති

10. “පින්වත් ලෝහිච්ච, මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? ඔබ සාලවතිකා ගම් ප්‍රධානියාව සිටින කෙනෙක් නේද?”

“එවං හෝ ගෝතම.”

“භවත් ගෞතමයන් වහන්ස, එසේය.”

“යෝ නු ඛෝ ලෝහිච්ච එවං වදෙය්‍ය ලෝහිච්චෝ බ්‍රාහ්මණෝ සාලවතිකං අජ්ඣාවසති. යා සාලවතිකාය සමුදයසඤ්ඤාති ලෝහිච්චෝව තං බ්‍රාහ්මණෝ ඒකකෝ පරිභුඤ්ජෙය්‍ය, න අඤ්ඤේසං දදෙය්‍යා’ති. එවං වාදී සෝ යේ තං උපජීවන්ති තේසං අන්තරායකරෝ වා හෝති නෝ වා?”ති.

“ඉතින් පින්වත් ලෝහිච්ච, යම් කෙනෙක් මෙහෙම කිව්වොත්, “ලෝහිච්ච බ්‍රාහ්මණයා සාලවතිකාවෙහි ප්‍රධානියා වශයෙන් ඉන්නවා. ඉතින් සාලවතිකා ගමේ යම් ධනධාන්‍යයක් ඇති වෙනවා නම් ඒවා ලෝහිච්ච බ්‍රාහ්මණයා තනියම අනුභව අනුභව කළ යුතු යි. අනික් අයට දිය යුතු නෑ” කියල. ඒ විදිහට කියන ඒ තැනැත්තා යමෙක් ඔබ ඇසුරෙන් ජීවත් වෙනවා නම්, ඔවුන්ට අන්තරාය කරන කෙනෙක් ද? නොකරන කෙනෙක් ද?”

“අන්තරායකරෝ හෝ ගෝතම.”

“භවත් ගෞතමයන් වහන්ස, ඔහු අන් අය ලබන දෙයට අන්තරාය කරන කෙනෙක් ම යි.”

“අන්තරායකරෝ සමානෝ ලෝහිච්ච හිතානුකම්පී වා තේසං හෝති අහිතානුකම්පී වා?”ති.

“පින්වත් ලෝහිච්ච, යමෙකු ගේ ලාභයට අනතුරු කරන කෙනා ඒ උදවිය ගැන හිතානුකම්පීව ඉන්නවා ද? අනුකම්පා රහිතව ඉන්නවා ද?”

“අහිතානුකම්පී හෝ ගෝතම.”

“භවත් ගෞතමයන් වහන්ස, ඔහු අනුකම්පා රහිත කෙනෙක් ම යි.”

"අහිතානුකම්පිස්ස මෙත්තං වා තේසු චිත්තං පච්චුපට්ඨිතං හෝති සපත්තකං වා?"ති.

"අනුකම්පා රහිත කෙනෙකුට ඔවුන් කෙරෙහි ඇති වන්නේ මෙත් සිතද? සතුරු සිත ද?"

"සපත්තකං හෝ ගෝතම"

"භවත් ගෞතමයන් වහන්ස, සතුරු සිතයි."

"සපත්තකේ චිත්තේ පච්චුපට්ඨිතේ මිච්ඡාදිට්ඨි වා හෝති සම්මා දිට්ඨිවා?ති.

"යමෙකු තුළ සතුරු සිත පිහිටා තියෙන විට ඔහු මිත්‍යා දෘෂ්ටික කෙනෙක් වෙනවා ද? සම්මා දිට්ඨියෙන් යුතු වෙනවා ද?"

"මිච්ඡාදිට්ඨි හෝ ගෝතම"

"භවත් ගෞතමයන් වහන්ස, ඔහු මිත්‍යා දෘෂ්ටික කෙනෙක්."

"මිච්ඡාදිට්ඨිස්ස ඛෝ අහං ලෝහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි: නිරයං වා තිරච්ඡානයෝනිං වා"

"පින්වත් ලෝහිච්ච, මිත්‍යා දෘෂ්ටික කෙනෙකුට මේ උපත් අතරින් එක උපතක් ලැබෙන බවයි මා කියන්නේ. එක්කෝ නිරයේ යනවා. නැත්නම් තිරිසන් අපායේ උපදිනවා."

11. **නං කිම්මඤ්ඤසි ලෝහිච්ච? නනු රාජා පසේනදී කෝසලෝ කාසිකෝසලං අජ්ඣාවසතී"?ති. "එවං හෝ ගෝතම."**

11. "පින්වත් ලෝහිච්ච, මේ ගැන ඔබ කුමක් ද හිතන්නේ? පසේනදී කොසොල් රජ්ජුරුවෝ කාසිකෝසල රාජධානිවලට අධිපතිව නේද ඉන්නේ?" "භවත් ගෞතමයන් වහන්ස, එසේය."

"යෝ නු ඛෝ ලෝහිච්ච ඒවං වදෙය්‍ය: රාජා පසේනදී කෝසලෝ කාසිකෝසලං අජ්ඣාවසති. යා කාසිකෝසලේ සමුදයසඤ්ජාති, රාජා'ව තං පසේනදී කෝසලෝ ඒකකෝ පරිභුඤ්ජෙය්‍ය, න අඤ්ඤේසං දදෙය්‍යා'ති. ඒවංවාදී සෝ යේ රාජානං පසේනදිං කෝසලං උපජීවන්ති තුම්හේ චේව අඤ්ඤේ ච, තේසං අන්තරායකරෝ වා හෝති නෝ වා?"ති. "අන්තරායකරෝ හෝ ගෝතම."

"ඉතින් පින්වත් ලෝහිච්ච, යම් කෙනෙක් මෙහෙම කිව්වොත්, "පසේනදී කොසොල් රජතුමා කාසිකෝසල දෙරටට ප්‍රධානියා වශයෙන් ඉන්නවා. ඉතින් කාසිකෝසල ජනපදවල යම් ධනධාන්‍යයක් ඇති වෙනවා නම් ඒවා පසේනදි කොසොල් රජතුමා තනියම අනුභව කළ යුතු යි. අනික් අයට දිය යුතු නෑ" කියල. ඒ විදිහට කියන ඒ තැනැත්තා යමෙක් පසේනදී කෝසල රජු ඇසුරෙන් ජීවත් වෙන්නා වූ ඔබටත් අන් අයටත් කියන මේ අයට අන්තරාය කරන කෙනෙක් ද? නො කරන කෙනෙක් ද?" "භවත් ගෞතමයන් වහන්ස, ඔහු අන් අය ලබන දෙයට අන්තරාය කරන කෙනෙක් ම යි."

"අන්තරායකරෝ සමානෝ ලෝහිච්ච හිතානුකම්පී වා තේසං හෝති අහිතානුකම්පී වා?"ති. "අහිතානුකම්පී හෝ ගෝතම."

"පින්වත් ලෝහිච්ච, යමෙකු ගේ ලාභයට අනතුරු කරන කෙනා ඒ උදවිය ගැන හිතානුකම්පීව ඉන්නවා ද? අනුකම්පා රහිතව ඉන්නවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, ඔහු අනුකම්පා රහිත කෙනෙක් ම යි."

"අහිතානුකම්පිස්ස ලෝහිච්ච මෙත්තං වා තේසු චිත්තං පච්චුපට්ඨිතං සපත්තකං වා?"ති. "සපත්තකං හෝ ගෝතම"

"අනුකම්පා රහිත කෙනෙකුට ඔවුන් කෙරෙහි ඇති වන්නේ මෙත් සිතද? සතුරු සිත ද?" "භවත් ගෞතමයන් වහන්ස, සතුරු සිත යි."

"සපත්තකේ චිත්තේ පච්චුපට්ඨිතේ මිච්ඡාදිට්ඨි වා හෝති සම්මා දිට්ඨිවා?ති. "මිච්ඡාදිට්ඨි හෝ ගෝතම"

"යමෙකු තුළ සතුරු සිත පිහිටා තියෙන විට ඔහු මිත්‍යා දෘෂ්ටික කෙනෙක් වෙනවා ද? සම්මා දිට්ඨියෙන් යුතු වෙනවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, ඔහු මිත්‍යා දෘෂ්ටික කෙනෙක්."

"මිච්ඡාදිට්ඨිස්ස ඛෝ අහං ලෝහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි: නිරයං වා තිරච්ඡානයෝනිං වා"

"පින්වත් ලෝහිච්ච, මිත්‍යා දෘෂ්ටික කෙනෙකුට මේ උපත් අතරින් එක උපතක් ලැබෙන බවයි මා කියන්නේ. එක්කෝ නිරයේ යනවා. නැත්නම් තිරිසන් අපායේ උපදිනවා."

12. ඉති කිර ලෝහිච්ච යෝ ඒවං වදෙය්‍ය: ලෝහිච්චෝ බ්‍රාහ්මණෝ සාලවතිකං අජ්ඣාවසති. යා සාලවතිකාය සමුදයසඤ්ජාති ලෝහිච්චෝව නං බ්‍රාහ්මණෝ ඒකකෝ පරිභුඤ්ජෙය්‍ය, න ච අඤ්ඤේසං දදෙය්‍යාති. ඒවංවාදී සෝ යේ නං උපජීවන්ති තේසං අන්තරායකරෝ හෝති. අන්තරායකරෝ සමානෝ අහිතානුකම්පී හෝති. අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හෝති. සපත්තකේ චිත්තේ පච්චුපට්ඨිතේ මිච්ඡාදිට්ඨි හෝති. ඒවමේව ඛෝ ලෝහිච්ච යෝ ඒවං වදෙය්‍ය: "ඉධ සමණෝ වා බ්‍රාහ්මණෝ වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරෝචෙය්‍ය, කිං හි පරෝ පරස්ස කරිස්සති? සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය? ඒවං සම්පදමිදං පාපකං ලෝභධම්මං වදාමි. කිං හි පරෝපරස්ස කරිස්සතී"ති.

12. ඉතින් පින්වත් ලෝහිච්ච, යම් කෙනෙක් මෙහෙම කියනවා නම්, "ලෝහිච්ච බ්‍රාහ්මණයා සාලවතික ගමෙහි අධිපතිව ඉන්නවා. සාලවතික ගමෙහි යම් ධනධාන්‍යාදියක් උපදිනවා නම්, ඒවා ලෝහිච්ච බ්‍රාහ්මණයා විතරක් පරිභෝග කළ යුතු යි. අන් අයට නො දිය යුතු යි" කියල. එතකොට ඔය විදිහට කියන කෙනා ඔබ නිසා ජීවත්වන උදවියට අන්තරායක් කරනවා. ඒ වගේ ම ඒ ලාභයට අනතුරු කරන කෙනා අනුකම්පාව නැති කෙනෙක් ම යි. අනුකම්පා රහිත කෙනා තුළ ඔවුන් කෙරෙහි පිහිටල තියෙන්නේ සතුරු සිතයි. සතුරු සිත පිහිටා තියෙන විට තියෙන්නේ මිත්‍යා දෘෂ්ටිය යි. පින්වත් ලෝහිච්ච, අන්න ඒ වගේ ම යි. යම් කෙනෙක් මෙහෙම කියනවා නම්, "මෙහි ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, යම් කුසල ධර්මයක් උපදවා ගෙන සිටිනවා නම්, ඒ කුසල ධර්මය උපදවාගෙන ඒ ගැන අන් අයට නො කිව යුතුයි කියල. තව කෙනෙක් තවත් කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද? ඒක හරියට පැරණි බන්ධනයක් සිඳදමා වෙනත් අළුත් බන්ධනයක් කරනවා වගේ. තමන් උපදවා ගත් කුසල ධර්ම ගැන අනුන්ට කියන එකත් ඒ වගේ ම පවිටු ලෝභ දෙයක්. තව කෙනෙක් තව කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද?" කියල.

එවංවාදී සෝ යේ තේ කුලපුත්තා තථාගතප්පවේදිතං ධම්මවිනයං ආගම්ම එවරූපං උළාරං විසේසං අධිගච්ඡන්ති: සෝතාපත්තිඵලම්පි සච්ඡිකරොන්ති, සකදාගාමිඵලම්පි සච්ඡිකරොන්ති, අනාගාමිඵලම්පි සච්ඡිකරොන්ති, අරහත්තම්පි සච්ඡිකරොන්ති, යේචිමේ දිබ්බා ගබ්භා පරිපාචෙන්ති දිබ්බානං භවානං අභිනිබ්බත්තියා, තේසං අන්තරායකරෝ හෝති. අන්තරායකරෝ සමානෝ අහිතානුකම්පි හෝති. අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හෝති. සපත්තකේ චිත්තේ පච්චුපට්ඨිතේ මිච්ඡාදිට්ඨි හෝති. මිච්ඡාදිට්ඨිස්ස ඛෝ අහං ලෝහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි: නිරයං වා තිරච්ඡානයෝනිං වා.

ඔය ආකාරයට කියන කෙනා යම් ඒ කුලපුත්‍රයන් තථාගතයන් වහන්සේ අවබෝධයෙන් ම දෙසන ලද ධර්ම විනයට පැමිණිලා මෙබඳු උදාර වූ විශේෂතා සාක්ෂාත් කර ගන්නවා නම්, ඒ කියන්නේ සෝවාන් ඵලය සාක්ෂාත් කරනවා නම්, සකදාගාමී ඵලය සාක්ෂාත් කරනවා නම්, අනාගාමී ඵලය සාක්ෂාත් කරනවා නම්, අරහත් ඵලය සාක්ෂාත් කරනවා නම්, ඒ වගේ ම යමෙක් දෙව්ලොව උපත පිණිස දිව්‍ය ගර්භයන් මුහුකුරුවනවා නම්, ඔවුන්ටත් අන්තරායක් කරනවා. එතකොට ඒ ලාභයට අනතුරු කරන කෙනා අනුකම්පාව නැති කෙනෙක් ම යි. අනුකම්පා රහිත කෙනා තුළ ඔවුන් කෙරෙහි පිහිටල තියෙන්නේ සතුරු සිතයි. සතුරු සිත පිහිටා තියෙන විට තියෙන්නේ මිත්‍යා දෘෂ්ටිය යි. පින්වත් ලෝහිච්ච, මං මිත්‍යා දෘෂ්ටිකයා හට කියන්නේ මේ උපත් දෙකෙන් එක්තරා උපතක් තමයි. එක්කෝ නිරයේ උපදිනවා. නැත්නම් තිරිසන් යෝනියේ උපදිනවා.

13. ඉති කිර ලෝහිච්ච යෝ එවං වදෙය්‍ය: "රාජා පසේනදි කෝසලෝ කාසිකෝසලං අජ්ඣාවසති. යා කාසිකෝසලේ සමුදයසඤ්ඤාති රාජා'ව තං පසේනදී කෝසලෝ ඒකකෝ පරිභුඤ්ජෙය්‍ය, න අඤ්ඤේසං දදෙය්‍යා"ති. එවංවාදී සෝ යේ රාජානං පසේනදිං කෝසලං උපජීවන්ති තුම්හේ චේව අඤ්ඤේව තේසං අන්තරායකරෝ හෝති. අන්තරායකරෝ සමානෝ අහිතානුකම්පී තේසං හෝති. අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හෝති. සපත්තකේ චිත්තේ පච්චුපට්ඨිතේ මිච්ඡාදිට්ඨි හෝති. එවමේව ඛෝ ලෝහිච්ච යෝ එවං වදෙය්‍ය: "ඉධ සමණෝ වා බ්‍රාහ්මණෝ වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය, කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරෝචෙය්‍ය, කිං හි පරෝ පරස්ස කරිස්සති? සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය? එවං සම්පදමිදං පාපකං ලෝභධම්මං වදාමි. කිං හි පරෝපරස්ස කරිස්සතී"ති.

13. ඉතින් පින්වත් ලෝහිච්ච, යම් කෙනෙක් මෙහෙම කියනවා නම්, "පසේනදී කොසොල් රජතුමා කාසිකෝසල දේශයන්ට අධිපතිව ඉන්නවා. කාසිකෝසල දේශයෙහි යම් ධනධාන්‍යාදියක් උපදිනවා නම්, ඒවා පසේනදී කොසොල් රජතුමා විතරක් පරිභෝග කළ යුතු යි. අන් අයට නො දිය යුතු යි" කියල. එතකොට ඔය විදිහට කියන කෙනා පසේනදී කොසොල් රජතුමා නිසා ජීවත්වන උදවියට අන්තරායක් කරනවා. ඒ වගේ ම ඒ ලාභයට අනතුරු කරන කෙනා අනුකම්පාව නැති කෙනෙක් ම යි. අනුකම්පා රහිත කෙනා තුළ ඔවුන් කෙරෙහි පිහිටල තියෙන්නේ සතුරු සිත යි. සතුරු සිත පිහිටා තියෙන විට තියෙන්නේ මිත්‍යා දෘෂ්ටිය යි. පින්වත් ලෝහිච්ච, අන්න ඒ වගේ ම යි. යම් කෙනෙක් මෙහෙම කියනවා නම්, "මෙහි ශ්‍රමණයෙක් වේවා, බ්‍රාහ්මණයෙක් වේවා, යම් කුසල ධර්මයක් උපදවා ගෙන සිටිනවා නම්, ඒ කුසල ධර්මය උපදවාගෙන ඒ ගැන අන් අයට නො කිව යුතුයි කියල. තව කෙනෙක් තවත් කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද? ඒක හරියට පැරණි බන්ධනයක් සිඳදමා වෙනත් අළුත් බන්ධනයක් කරනවා වගේ. තමන් උපදවා ගත් කුසල ධර්ම ගැන අනුන්ට කියන එකත් ඒ වගේ ම පවිටු ලෝභ දෙයක්. තව කෙනෙක් තව කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද?" කියල.

ඒවංවාදී සෝ යේ තේ කුලපුත්තා තථාගතප්පවේදිතං ධම්මවිනයං ආගම්ම ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡන්ති: සෝතාපත්තිඵලම්පි සච්ඡිකරොන්ති, සකදාගාමිඵලම්පි සච්ඡිකරොන්ති, අනාගාමිඵලම්පි සච්ඡිකරොන්ති, අරහත්තම්පි සච්ඡිකරොන්ති, යේචිමේ දිබ්බා ගබ්භා පරිපාචෙන්ති දිබ්බානං භවානං අභිනිබ්බත්තියා, තේසං අන්තරායකරෝ හෝති. අන්තරායකරෝ සමානෝ අහිතානුකම්පි හෝති. අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හෝති. සපත්තකේ චිත්තේ පච්චුපට්ඨිතේ මිච්ඡාදිට්ඨි හෝති. මිච්ඡාදිට්ඨිස්ස ඛෝ අහං ලෝහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි: නිරයං වා තිරච්ඡානයෝනිං වා.

ඔය ආකාරයට කියන කෙනා යම් ඒ කුලපුත්‍රයන් තථාගතයන් වහන්සේ අවබෝධයෙන් ම දෙසන ලද ධර්ම විනයට පැමිණිලා මෙබඳු උදාර වූ විශේෂතා සාක්ෂාත් කර ගන්නවා නම්, ඒ කියන්නේ සෝවාන් ඵලය සාක්ෂාත් කරනවා නම්, සකදාගාමී ඵලය සාක්ෂාත් කරනවා නම්, අනාගාමී ඵලය සාක්ෂාත් කරනවා නම්, අරහත් ඵලය සාක්ෂාත් කරනවා නම්, ඒ වගේ ම යමෙක් දෙව්ලොව උපත පිණිස දිව්‍ය ගර්භයන් මුහුකුරුවනවා නම්, ඔවුන්ටත් අන්තරායක් කරනවා. එතකොට ඒ ලාභයට අනතුරු කරන කෙනා අනුකම්පාව නැති කෙනෙක් ම යි. අනුකම්පා රහිත කෙනා තුළ ඔවුන් කෙරෙහි

පිහිටල තියෙන්නේ සතුරු සිතයි. සතුරු සිත පිහිටා තියෙන විට තියෙන්නේ මිත්‍යා දෘෂ්ටිය යි. පින්වත් ලෝහිච්ච, මං මිත්‍යා දෘෂ්ටිකයා හට කියන්නේ මේ උපත් දෙකෙන් එක්තරා උපතක් තමයි. එක්කෝ නිරයේ උපදිනවා. නැත්නම් තිරිසන් යෝනියේ උපදිනවා.

14. තයෝ ඛෝ මේ ලෝහිච්ච සත්ථාරෝ යේ ලෝකේ චෝදනාරහා, යෝ ච පනේවරූපේ සත්ථාරෝ චෝදේති, සා චෝදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා. කතමේ තයෝ? ඉධ ලෝහිච්ච ඒකච්චෝ සත්ථා යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතෝ හෝති, ස්වාස්ස සාමඤ්ඤත්ථෝ අනනුප්පත්තෝ හෝති, සෝ තං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දේසේති: ඉදං වෝ හිතාය ඉදං වෝ සුඛායාති. තස්ස සාවකා න සුස්සූසන්ති, න සෝතං ඕදහන්ති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති. සෝ ඒවමස්ස චෝදේතබ්බෝ: "ආයස්මා ඛෝ යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතෝ, සෝ තේ සාමඤ්ඤත්ථෝ අනනුප්පත්තෝ. තං ත්වං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දේසේසි: ඉදං වෝ හිතාය ඉදං වෝ සුඛායාති. තස්ස තේ සාවකා න සුස්සූසන්ති. න සෝතං ඕදහන්ති. න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති"ති. සෙය්‍යථාපි නාම ඔස්සක්කන්තියා වා උස්සක්කෙය්‍ය, පරම්මුඛං වා ආලිංගෙය්‍ය, ඒවං සම්පදමිදං පාපකං ලෝභධම්මං වදාමි. කිං හි පරෝපරස්ස කරිස්සති?"ති. අයං ඛෝ ලෝහිච්ච පඨමෝ සත්ථා යෝ ලෝකේ චෝදනාරහෝ, යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා.

14. පින්වත් ලෝහිච්ච, මේ ලෝකයෙහි යම් ශාස්තෘවරයෙක් චෝදනා ලැබිය යුතු නම්, ඒ වගේ ම යම් කෙනෙක් ශාස්තෘවරුන්ට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඔවුන් තුළ තිබෙන දෙයක් නම්, ඇත්තක් නම්, ධාර්මික නම්, නිවැරදි නම්, එබඳු චෝදනා ලබන ශාස්තෘවරු තුන් දෙනෙක් ඉන්නවා. ඒ තුන් දෙනා කවුද? පින්වත් ලෝහිච්ච, ඇතැම් ශාස්තෘවරයෙක් යම් අර්ථයක් පිණිස ගිහි ජීවිතය අත් හැර පැවිදි වෙලා ඉන්නවා. ඔහුට ඒ පැවිදි බවෙහි ඵලය උපදවා ගන්ට බැරි වෙනවා. ඒ ශාස්තෘවරයා ඒ ශ්‍රමණඵල නො ලබා "මෙය ඔබට හිත පිණිස පවතිනවා. මෙය ඔබට සුව පිණිස පවතිනවා" කියල ශ්‍රාවකයින් හට දහම් දෙසනවා. එතකොට ඔහු ගේ ශ්‍රාවකයන් එයට සවන් දෙන්නේ නැත්නම්, කණ් යොමු කරන්නේ නැත්නම්, අවබෝධය පිණිස හිත පිහිටුවන්නේ නැත්නම්, ඔවුන් වාසය කරන්නේ ශාස්තෘ සාසනයෙන් බැහැර වෙලයි. ඒ ශාස්තෘවරයා මෙවැනි චෝදනාවකට ලක් විය යුතුයි. "ආයුෂ්මතුන්

යම් කිසි අරුතක් පිණිසයි ගිහි ජීවිතය අත්හැර අනගාරිකව පැවිදි වුණේ. ඒ ඔබ මහණකමේ කිසිවක් උපදවාගෙනත් නෑ. ශ්‍රමණ ඵලයක් නුපදවාගෙන ම "මෙය ඔබට හිත පිණිස පවතිනවා. මෙය ඔබට සුව පිණිස පවතිනවා" කියල ශ්‍රාවකයින්ට ධර්මයත් කියනවා. ඒ ශ්‍රාවකයිනුත් ඔබේ ධර්මයට සවන් දෙන්නෙත් නෑ, කණ් යොමු කරන්නෙත් නෑ, අවබෝධය පිණිස හිත පිහිටුවන්නෙත් නෑ, ඔවුන් වාසය කරන්නෙත් ශාස්තෘ සාසනයෙන් බැහැර වෙලයි" කියල. ඒක මේ වගේ දෙයක් තමාව පිළිකෙව් කොට ඉවත්ව යන්නියක පසු පස යනවා වගෙයි. තමාට නො කැමැත්තෙන් පිටුපා සිටින්නියක වැළඳ ගන්නවා වගෙයි. ඔන්න ඔය විදිහේ කරුණක් නම් පවිටු වූ ලෝභ ධර්මයක් කියලයි මං කියන්නේ. එබඳු ශාස්තෘවරයා වූ කෙනෙක් තවත් කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද? පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුසු ප්‍රථමයා ය. යමෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරයි නම්, ඒ චෝදනාව ඔහු තුළ තියෙනවා. ඒක ඇත්තක්. ධාර්මික යි. නිවැරදි යි.

15. පුනචපරං ලෝහිච්ච ඉධේකච්චෝ සත්ථා යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජීතෝ හෝති, ස්වාස්ස සාමඤ්ඤත්ථෝ අනනුප්පත්තෝ හෝති, සෝ තං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දේසේති: ඉදං වෝ හිතාය ඉදං වෝ සුඛායාති. තස්ස තේ සාවකා සුස්සූසන්ති, සෝතං විදහන්ති, අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, න ච වොක්කම්ම සත්ථුසාසනා වත්තන්ති.

15. පින්වත් ලෝහිච්ච, තව දුරටත් කියනවා නම්, මෙහි ඇතැම් ශාස්තෘවරයෙක් යම් අර්ථයක් පිණිස ගිහි ජීවිතය අත් හැර පැවිදි වෙලා ඉන්නවා. ඔහුට ඒ පැවිදි බවෙහි ඵලයක් උපදවා ගන්ට බැරි වෙනවා. ඒ ශාස්තෘවරයා ඒ ශ්‍රමණඵල නො ලබා "මෙය ඔබට හිත පිණිස පවතිනවා. මෙය ඔබට සුව පිණිස පවතිනවා" කියල ශ්‍රාවකයින් හට දහම් දෙසනවා. එතකොට ඔහු ගේ ශ්‍රාවකයන් එයට සවන් දෙනවා. කණ් යොමු කරනවා. අවබෝධය පිණිස හිත පිහිටුවනවා. ඔවුන් වාසය කරන්නේ ශාස්තෘ සාසනයෙන් බැහැර වෙලා නොවෙයි.

සෝ ඒවමස්ස චෝදේතබ්බෝ: "ආයස්මා බෝ යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජීතෝ, සෝ තේ සාමඤ්ඤත්ථෝ අනනුප්පත්තෝ. තං ත්වං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දේසේසි: ඉදං වෝ හිතාය ඉදං වෝ සුඛායාති. තස්ස තේ සාවකා සුස්සූසන්ති. සෝතං විදහන්ති. අඤ්ඤා

චිත්තං උපට්ඨපෙන්ති න ච වොක්කම්ම සත්ථුසාසනා වත්තන්ති. සෙය්‍යථාපි නාම සකං ඛෙත්තං විහාය පරඛෙත්තං නිඩ්ඩායිතබ්බං මඤ්ඤෙය්‍ය, ඒවං සම්පදමිදං පාපකං ලෝභධම්මං වදාමි. කිං හි පරෝ පරස්ස කරිස්සති?"ති. අයං ඛෝ ලෝහිච්ච දුතියෝ සත්ථා යෝ ලෝකේ චෝදනාරහෝ, යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා.

ඒ ශාස්තෘවරයා මෙවැනි චෝදනාවකට ලක් විය යුතුයි. "ආයුෂ්මතුන් යම් කිසි අරුතක් පිණිසයි ගිහි ජීවිතය අත්හැර අනගාරිකව පැවිදි වුණේ. ඒ ඔබ මහණකමේ කිසිවක් උපදවාගෙනත් නෑ. ශ්‍රමණ ඵලයක් නුපදවාගෙන ම "මෙය ඔබට හිත පිණිස පවතිනවා. මෙය ඔබට සුව පිණිස පවතිනවා" කියල ශ්‍රාවකයින්ට ධර්මයත් කියනවා. ඒ ශ්‍රාවකයිනුත් ඔබේ ධර්මයට සවන් දෙනවා. කණ් යොමු කරනවා. අවබෝධය පිණිස හිත පිහිටුවනවා. ඔවුන් වාසය කරන්නෙත් ශාස්තෘ සාසනයෙන් බැහැර වෙලා නොවෙයි" කියල. ඒක මේ වගේ දෙයක් තමන් ගේ කුඹුර අත්හැරල අනුන් ගේ කුඹුරේ වල් නෙලිය යුතු කොට සිතනවා වගේ. ඔන්න ඔය විදිහේ කරුණක් නම් පවිටු වූ ලෝභ ධර්මයක් කියලයි මං කියන්නේ. එබඳු ශාස්තෘවරයා වූ කෙනෙක් තවත් කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද? පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුසු දෙවෙනියා යි. යමෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරයි නම්, ඒ චෝදනාව ඔහු තුළ තියෙනවා. ඒක ඇත්තක්. ධාර්මික යි. නිවැරදි යි.

16. පුනචපරං ලෝහිච්ච ඉධේකච්චෝ සත්ථා යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතෝ හෝති, ස්වාස්ස සාමඤ්ඤත්ථෝ අනුප්පත්තෝ හෝති, සෝ තං සාමඤ්ඤත්ථං අනුපාපුණිත්වා සාවකානං ධම්මං දේසේති: ඉදං වෝ හිතාය ඉදං වෝ සුඛායාති. තස්ස සාවකා න සුස්සූසන්ති, න සෝතං ඕදහන්ති, න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති.

16. පින්වත් ලෝහිච්ච, තව දුරටත් කියනවා නම්, මෙහි ඇතැම් ශාස්තෘවරයෙක් යම් අර්ථයක් පිණිස ගිහි ජීවිතය අත් හැර පැවිදි වෙලා ඉන්නවා. ඔහුට ඒ පැවිදි බවෙහි ඵලය උපදවා ගන්නවා. ඒ ශාස්තෘවරයා ඒ ශ්‍රමණඵලය ලබාගෙන ම "මෙය ඔබට හිත පිණිස පවතිනවා. මෙය ඔබට සුව පිණිස පවතිනවා" කියල ශ්‍රාවකයින් හට දහම් දෙසනවා. එතකොට ඔහු ගේ ශ්‍රාවකයන් එයට සවන් දෙන්නේ නෑ. කණ් යොමු කරන්නේ නෑ. අවබෝධය පිණිස හිත පිහිටුවන්නේ නෑ. ඔවුන් වාසය කරන්නේ ශාස්තෘ සාසනයෙන් බැහැර වෙල යි.

සෝ ඒවමස්ස වෝදේතබ්බෝ: "ආයස්මා ඛෝ යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජීතෝ, සෝ තේ සාමඤ්ඤත්ථෝ අනුප්පත්තෝ. තං ත්වං සාමඤ්ඤත්ථං අනුපාපුණිත්වා සාවකානං ධම්මං දේසේසි: ඉදං වෝ හිතාය ඉදං වෝ සුඛායාති. තස්ස තේ සාවකා න සුස්සූසන්ති. න සෝතං විදහන්ති. න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති. සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය, ඒවං සම්පදමිදං පාපකං ලෝභධම්මං වදාමි. කිං හි පරෝපරස්ස කරිස්සතී?"ති. අයං ඛෝ ලෝහිච්ච තතියෝ සත්ථා යෝ ලෝකේ චෝදනාරහෝ, යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා.

ඒ ශාස්තෘවරයා මෙවැනි චෝදනාවකට ලක් විය යුතුයි. "ආයුෂ්මතුන් යම් කිසි අරුතක් පිණිසයි ගිහි ජීවිතය අත්හැර අනගාරිකව පැවිදි වුණේ. ඒ ඔබ මහණකමේ ඵලය උපදවාගෙන තියෙනවා. ශ්‍රමණ ඵලය උපදවාගෙන ම "මෙය ඔබට හිත පිණිස පවතිනවා. මෙය ඔබට සුව පිණිස පවතිනවා" කියල ශ්‍රාවකයින්ට ධර්මයත් කියනවා. නමුත් ශ්‍රාවකයින් ඔබේ ධර්මයට සවන් දෙන්නේ නෑ. කණ් යොමු කරන්නේ නෑ. අවබෝධය පිණිස හිත පිහිටුවන්නේ නෑ. ඔවුන් වාසය කරන්නෙත් ශාස්තෘ සාසනයෙන් බැහැර වෙල යි" කියල. ඒක මේ වගේ දෙයක් පුරාණ බන්ධනය සිඳ දමා, අන්‍ය වූ අළුත් බන්ධනයක් කරනවා වගේ. ඔන්න ඔය විදිහේ කරුණක් නම් පවිටු වූ ලෝභ ධර්මයක් කියලයි මං කියන්නේ. එබඳු ශාස්තෘවරයා වූ කෙනෙක් තවත් කෙනෙකුට කවර නම් දෙයක් කරන්ට ද? පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුසු තුන්වෙනියා යි. යමෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරයි නම්, ඒ චෝදනාව ඔහු තුළ තියෙනවා. ඒක ඇත්තක්. ධාර්මික යි. නිවැරදි යි.

ඉමේ ඛෝ ලෝහිච්ච තයෝ සත්ථාරෝ යේ ලෝකේ චෝදනාරහා, යෝ ච පනේවරූපේ සත්ථාරෝ චෝදේති, සා චෝදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා'ති.

පින්වත් ලෝහිච්ච, මේ ලෝකයෙහි යම් ශාස්තෘවරයෙක් චෝදනා ලැබිය යුතු නම්, ඒ වගේ ම යම් කෙනෙක් ශාස්තෘවරුන්ට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඔවුන් තුළ තිබෙන දෙයක් නම්, ඇත්තක් නම්, ධාර්මික නම්, නිවැරදි නම්, එබඳු චෝදනා ලබන්නේ මේ ශාස්තෘවරුන් තුන් දෙනා තමයි.

17. **ඒවං වුත්තේ ලෝහිච්චෝ බ්‍රාහ්මණෝ භගවන්තං ඒතදවෝච: "අත්ථි පන භෝ ගෝතම කෝචි සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ?"ති.**

17. මෙසේ වදාළ විට ලෝහිච්ච බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළ කළා. "භවත් ගෞතමයන් වහන්ස, ලෝකයෙහි යම් ශාස්තෘවරයෙක් චෝදනා නොලැබිය යුතු නම්, එබඳු ශාස්තෘවරයෙක් ඉන්නවා ද?"

"අත්ථි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ"ති.

"පින්වත් ලෝහිච්ච, ලෝකයෙහි යම් ශාස්තෘවරයෙක් චෝදනා නොලැබිය යුතු නම්, එබඳු ශාස්තෘවරයෙක් ඉන්නවා."

"කතමෝ පන සෝ භෝ ගෝතම සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ"ති.

"භවත් ගෞතමයන් වහන්ස, ලෝකයෙහි යම් ශාස්තෘවරයෙක් චෝදනා නොලැබිය යුතු නම්, එබඳු ශාස්තෘවරයා කවුද?"

18. **ඉධ ලෝහිච්ච තථාගතෝ ලෝකේ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣේ-කල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසේති. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තෝ වා අඤ්ඤතරස්මිං වා කුලේ ප-ච්චාජාතෝ. සෝ තං ධම්මං සුත්වා තථාගතේ සද්ධං පටිලභති. සෝ තේන සද්ධාපටිලාභේන සමන්නාගතෝ ඉති පටිසංචික්ඛති: "සම්බාධෝ ඝරාවාසෝ රජෝපථෝ. අබ්භෝකාසෝ පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා ඒකන්තපරිපුණ්ණං ඒකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං යන්නූනාහං කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.**

18. පින්වත් ලෝහිච්ච, මෙහි අරහත් වූ සම්මාසම්බුද්ධ වූ විජ්ජාචරණසම්පන්න වූ සුගත වූ ලෝකවිදූ වූ අනුත්තර පුරිසදම්ම සාරථී

වූ, සත්ථා දේවමනුස්සානං වූ, බුද්ධ වූ, භගවා වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපත ලබනවා. උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙව්මිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඤාණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා. එතකොට ගෘහපතියෙක් වේවා, ගෘහපති පුත්‍රයෙක් වේවා කවර හෝ කුලයක උපන් කෙනෙක් වේවා ඒ ධර්මය අසනවා. ඔහු ඒ ධර්මය අසලා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ගන්නවා. ඉතින් ඔහු ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වෙලා මේ විදිහට නුවණින් කල්පනා කරනවා. “ගිහි ගෙදර වාසය කිරීම හරිම කරදරයක්. කෙලෙස් වැඩෙන මාවතක්. නමුත් පැවිදි ජීවිතය ආකාසය වගේ. ගිහි ගෙදර වාසය කරමින් මුළුමණින් ම පිරිපුන්, මුළුමණින් ම පිරිසිදු, සුදෝසුදු බඹසර වසනවා යන කරුණ ලෙහෙසි එකක් නොවේ. ඒ නිසා මං කෙස් රැවුල් බාලා, කසාවත් පොරොවා ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට ඇතුළත් වෙන එක තමයි හොඳ” කියලා.

19. සෝ අපරේන සමයේන අප්පං වා භෝගක්ඛන්ධං පහාය මහන්තං වා භෝගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සෝ ඒවං පබ්බජිතෝ සමානෝ පාතිමොක්ඛසංවරසංවුතෝ විහරති, ආචාරගෝචරසම්පන්නෝ, අණුමත්තේසු වජ්ජේසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදේසු, කායකම්මවචිකම්මේන සමන්නාගතෝ කුසලේන, පරිසුද්ධාජීවෝ, සීලසම්පන්නෝ, ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ, භෝජනේ මත්තඤ්ඤූ, සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ සන්තුට්ඨෝ.

19. ඔහු පස්සෙ කාලෙක ස්වල්ප වූ භෝග සම්පත් අත්හරිනවා. මහත් වූ භෝග සම්පත් අත්හරිනවා. ස්වල්ප වූ නෑදෑයන් අත්හරිනවා. මහත් වූ නෑදෑයන් අත්හරිනවා. කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙනවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් (පැවිද්දෙක් විසින් රැකගත යුතු නිවනට උපකාරී වන උතුම් සිල්පදවලින්) සංවරව ඉන්නවා. යහපත් ඇවැතුම් පැවැතුම්වලින් යුතු වෙනවා. අණුමාත්‍ර වූ වරදෙහි පවා භය දකිනවා. සික්ෂාපදවල සමාදන්ව හික්මෙනවා. කුසල්සහගත කායකර්මයෙන් හා

වචිකර්මයෙන් යුතු වෙනවා. පිරිසිදු ආජීවයෙන් යුතු වෙනවා. සිල්වත් වෙනවා. අකුසලයෙන් වැළකූ දොරටු ඇතුව ඉන්නවා. නුවණින් සළකා ආහාර ගන්නවා. සිහිනුවණින් යුතුව ඉන්නවා. ලද දෙයින් සතුටුව ඉන්නවා.

20. කථඤ්ච ලෝහිච්ච භික්ඛු සීලසම්පන්නෝ හෝති? ඉධ බ්‍රාහ්මණ භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ හෝති. නිහිතදණ්ඩෝ නිහිතසත්ථෝ ලජ්ජී දයාපන්නෝ සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතෝ හෝති. දින්නාදායී දින්නාපාටිකංඛී අථේනේන සුචිභූතේන අත්තනා විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හෝති. ආරාචාරී විරතෝ මේථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතෝ හෝති. ස-චවාදී ස-චසන්ධෝ ථේතෝ ප-චයිකෝ අවිසංවාදකෝ ලෝකස්ස. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවරතෝ හෝති. ඉතෝ සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමේසම්භේදාය. අමුත්‍ර වා සුත්වා න ඉමේසං අක්ඛාතා අමූසම්භේදාය. ඉති භින්නානං වා සන්ධාතා සංහිතානං වා අනුප්පදාතා. සමග්ගාරාමෝ සමග්ගරතෝ සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතෝ හෝති. යා සා වාචා නේළා කණ්ණසුඛා පේමනීයා හදයංගමා පෝරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතෝ හෝති. කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී, නිධානවතිං වාචං භාසිතා කාලේන සාපදේසං පරියන්තවතිං අත්ථසංහිතං. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

20. පින්වත් ලෝහිච්ච, භික්ෂුව සීලයෙන් යුක්ත වන්නේ කොහොම ද? පින්වත් ලෝහිච්ච, මෙහි භික්ෂුව සතුන් මැරීම අත්හැර දාල සතුන් මැරීමෙන් වැළකී ඉන්නවා. දඬු මුගුරු අත් හැර දාල, අවි ආයුධ බැහැර කරලා, පවට ලැජ්ජා ඇතිව ඉන්නවා. සතුන් කෙරෙහි දයාවන්ත වෙනවා, සියව් ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. නුදුන් දේ ගැනීම අත් හැරලා නුදුන් දේ ගැනීමෙන් වැළකී ඉන්නවා. දුන් දේ පමණක් පිළිගන්නවා. දුන් දේ පමණක් පිළිගනු කැමති වෙනවා. සොර රහිත සිතින් යුතු වූ පිරිසිදු සිතින් යුතු වූ ජීවිතයකින් වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. අබ්‍රහ්මචාරී බව අත් හැරලා බ්‍රහ්මචාරීව ඉන්නවා. ලාමක දෙයක් වූ මෛථුන සේවනයෙන් වැළකී එය දුරින් ම දුරුකර දමනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. බොරු කීම අත් හැරල, බොරු කීමෙන්

වැළකී ඉන්නවා. සත්‍යය කථා කරනවා. ඇත්තෙන් ඇත්ත ගලපනවා. ස්ථිරව පිහිටලා කථාකරනවා. පිළිගත හැකි දේ කථා කරනවා. ලෝකයාව රවටන්නේ නෑ. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. කේලාම් කීම අත්හැරලා කේලාම් කීමෙන් වැළකී ඉන්නවා. මෙතැනින් අහලා මේ අය බිඳවන්නට අතන කියන්නෙ නෑ. අතනින් අහලා ඒ උදවිය බිඳවන්නට මෙතැන කියන්නේ නෑ. මේ අයුරින් බිඳුනු උදවිය සමගි කරවනවා. සමගි වූවන්ට අනුබල දෙනවා. සමගි වූවන් හා වාසයට කැමති යි. සමගි වූවන් හා එක්ව වසනවා. සමගි වූවන් සමග සතුටු වෙනවා. සාමය උදෙසා සාමකාමී වචන කතා කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. පරුෂ වචනය අත් හැරලා පරුෂ වචනයෙන් වැළකී ඉන්නවා. යම් වචනයක් දොස් රහිත නම්, කණට සැප නම්, ආදරවන්ත නම්, හෘදයාංගම නම්, ශිෂ්ට සම්පන්න නම්, බොහෝ ජනයා කැමති නම්, බොහෝ ජනයාට ප්‍රියමනාප නම් එබඳු වූ වචන පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. තේරුමක් නැති කතා බහ අත් හැරලා තේරුමක් නැති කතා කීමෙන් වැළකී සිටිනවා. කල් යල් බලා කථා කරනවා. ඇත්ත කතා කරනවා. අර්ථවත් දෙය කතා කරනවා. ධර්මය ම කථා කරනවා. විනය ම කථා කරනවා. සිත්හි ලා දරාගැනීමට සුදුසු, වෙලාවට ගැලපෙන උපදේශ සහිත වූ, මදිපාඩුකම් නො තබා, ප්‍රමාණවත් පරිදි, දෙලොව යහපත පිණිස වූ දේ පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

21. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඒකභත්තිකෝ රත්තූපරතෝ පටිවිරතෝ විකාලභෝජනා. න-චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතෝ හෝති. මාලාගන්ධවිලේපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතෝ හෝති. උ-චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ජාතරූපරජත පටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතෝ හෝති, ආමකමංස පටිග්ගහණා පටිවිරතෝ හෝති, ඉත්ථිකුමාරික-පටිග්ගහණා පටිවිරතෝ හෝති. දාසිදාසපටිග්ගහණා පටිවිරතෝ හෝති. අජේළකපටිග්ගහණා පටිවිරතෝ හෝති. කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතෝ හෝති. හත්ථිගාවස්සවළවාපටිග්ගහණා පටිවිරතෝ හෝති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතෝ හෝති. දූතෙය්‍ය පහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. කයවික්කයා පටිවිරතෝ හෝති. තුලාකූටකංසකූට-මානකූටා පටිවිරතෝ හෝති. උක්කෝටනවඤ්චනනිකතිසාචියෝගා පටිවිරතෝ හෝති. ඡේදනවධබන්ධනවිපරමෝසආලෝපසහසාකාරා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

21. පැලවෙන බීජ හා පැල වුණ ගස් කොළන් විනාශ කිරීමෙන් වැළකී ඉන්නවා. එක් වරුවේ බොජුන් වළඳනවා. රාත්‍රී ආහාරයෙන් වැළකී විකාල භෝජනයෙන් වැළකී ඉන්නවා. නැටුම්, ගැයුම්, වැයුම් හා විසූක දර්ශනයන් නැරඹීමෙන් වැළකී ඉන්නවා. මල් සුවඳ විලවුන් දැරීමෙන් ද ඇඟපත සැරසීමෙන් ද විසිතුරු වස්ත්‍රාභරණයෙන් සැරසීමෙන් ද වැළකී ඉන්නවා. ප්‍රමාණය ඉක්ම වූ උස් ආසන ද වටිනා සුඛෝපභෝගී ආසන ද පරිහරණයෙන් වැළකී ඉන්නවා. රන් රිදී මිල මුදල් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු ධාන්‍ය පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු මස් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ස්ත්‍රීන්, කුමරියන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. දැසි දස්සන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. එළුබැටළුවන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කුකුළන් ඌරන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ඇතුන් ගවයන් අසුන් වෙළඹුන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කෙත් වතු පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ගිහි කටයුතු සඳහා දූත මෙහෙවර කිරීමෙන් වැළකී ඉන්නවා. වෙළ හෙළඳාම් කිරීමෙන් වැළකී ඉන්නවා. තරාදියෙන් රැවටීම, නො වටනා දෙයින් රැවටීම, මිනුමෙන් රැවටීම යන මෙයින් වැළකී ඉන්නවා. අල්ලස් ගෙන හිමිකරුවන් ගේ දේ අහිමි කිරීම, වංචා කිරීම, බාලදේ වටිනා දේ හැටියට පෙන්වීම, ආදී නොයෙක් වංචනික දෙයින් වැළකී ඉන්නවා. අත්පා කැපීම් මැරීම් බන්ධන කිරීම් මං පැහැරගැනීම්, ගම් පැහැර ගැනීම් ආදී සැහැසි දෙයින් වැළකී සිටිනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

22. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං බීජගාමභූතගාමසමාරම්භං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං: මූලබීජ ඛන්ධබීජං ඵග්ගුබීජං අග්ගබීජං බීජබීජමේව පඤ්චමං. ඉති වා ඉති ඒවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

22. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ විදිහේ පැලවෙන දේ හා ගස් කොළන් ආදිය වනසමින් ඉන්නවා. ඒ කියන්නේ මුලින් පැලවෙන දේවල්, කඳින් පැලවෙන දේවල්, පුරුකින් පැලවෙන දේවල්, දල්ලෙන් පැලවෙන දේවල්, බීජුවටින් පැලවෙන දේවල් යන ආදිය වනසමින් ඉන්නවා. ගස් කොළන් සිඳලීම් ආදී මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලිනුත් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

23. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං සන්නිධිකාරපරිභෝගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: අන්නසන්නිධිං පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං. ඉති වා ඉති ඒවරූපා සන්නිධිකාරපරිභෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

23. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ දේ රැස්කරගෙන පරිභෝග කරමින් වාසය කරනවා. ඒ කියන්නේ කෑම වර්ග රැස් කරලා තියා ගන්නවා. බීම වර්ග රැස් කරලා තියා ගන්නවා. වස්ත්‍ර රැස් කරලා තියා ගන්නවා. යාන වාහන රැස් කරලා තියා ගන්නවා. ඇඳ පුටු මේස රැස් කරලා තියා ගන්නවා. සුවඳ වර්ග රැස් කරලා තියා ගන්නවා. තවත් ආමිස රැස් කරලා තියා ගන්නවා. මෙවැනි හෝ මෙවැනි වෙනත් දේවල් හෝ රැස්කරගෙන පරිහරණය කිරීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

24. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: න-ච නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වේතාලං කුම්භථූනං සෝභනකං චණ්ඩාලං වංසං ධෝවන හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යෝධිකං බලග්ගං සේනාබ්‍යූහං අනීකදස්සනං. ඉති වා ඉති ඒවරූපා විසූකදස්සනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

24. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයේ විසූක දර්ශනයන් නැරඹීමෙහි යෙදිල ඉන්නවා. ඒ කියන්නේ නැටුම්, ගැයුම්, වැයුම්, නාටක, පැරණි කථා රහදැක්වීම්, අත්තල ගසා නැටීම්, වේතාල නැටීම්, බෙර වාදන කිරීම්, රහමඩළෙහි දේවතාවන්ට පූජා පිණිස නැටීම්, උණ ගසින් කරන ක්‍රීඩා, මිනී ඇට මැද තබා වටකොට නැටීම්, ඇත් යුධ බැලීම්, අස්ව යුධ බැලීම්, ගොන් පොර බැලීම්, එළු පොර බැලීම්, බැටළු පොර බැලීම්, කුකුළු පොර බැලීම්, වටු පොර බැලීම්, පොව් හරඹ බැලීම්, මිටි හරඹ බැලීම්, මල්ලව පොර බැලීම්, යුධ සේනා බලන්ට යෑම, බලසෙන් ගණින තැන් බලන්ට යාම, බලසෙනඟ

විසිරුවන තැන් බලන්ට යාම ආදී දේවල්වල යෙදෙමින් ඉන්නවා. මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලින් යුතු විසූක දර්ශන නැරඹීම්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

25. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං ජූතප්පමාදට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං බලිකං සටිකං සලාකහත්ථං අක්ඛං පංගචිරං වංක්කං මොක්ඛචිකං චිංගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනේසිකං යථාවජ්ජං. ඉති වා ඉති ඒවරූපා ජූතප්පමාදට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

25. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල තමාව ප්‍රමාදයට පත් කරවන මේ ආකාර වූ සූදු කෙළියෙන් කල් යවනවා. ඒ කියන්නේ හතරැස් කොටු අටකින් යුතුව කරණ සූදුව, කොටු දහයකින් කරන සූදුව, අහසේ රූ අඳිමින් කරන සූදුව, කොටු පැනීමෙන් කරණ සූදුව, සන්තික නම් වූ සූදුව, දාදු කැටයෙන් කරන සූදුව, කල්ලි ගැසුම, බුරුවා ගැසීම, ගුළ කෙළිය, නළා පිඹීම, කරණම් ගැසීම, මුගුරක් ගෙන උඩ යට වැටෙන පරිදි උඩට ගැසීම, කොළවලින් කළ ගොටුවලින් තරහෙට වැලි මැනීම, කුඩා රිය තරහ, කුඩා දුනුවලින් විදීමේ තරහ, අකුරු ලිවීමේ සෙල්ලම, සිතූ දේ කියන සෙල්ලම, විකලාංග අනුකරණයෙන් හිනැස්සීමේ සෙල්ලම ආදී දේ කිරීමයි. මේ දෙයිනුත් මෙවැනි තවත් දේවල් ඇත්නම් එයිනුත් වැළකී ප්‍රමාදයට පත්වන සූදුවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

26. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං උ-චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: ආසන්දිං පල්ලංකං ගෝනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලෝමිං ඒකන්තලෝමිං කට්ඨිස්සං කෝසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවේණිං කාදලිමිගපවර-ප-චත්ථරණං සඋත්තර-ඡදං උභතෝලෝහිතකූපධානං. ඉති වා ඉති ඒවරූපා උ-චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

26. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ පමණ ඉක්මවා උස් වූ ආසනත් වටිනා සුඛෝපභෝගී ආසනත් පරිහරණය කරනවා. ඒ කියන්නේ දිග හාන්සි පුටු, කව්විච්චි, ලොකු පලස් යෙදූ ආසන, විසිතුරු ගෙත්තම් කළ එළු ලොම් ඇතිරිළි, සුදු එළු ලොමින් කළ ඇතිරිළි, මල් යෙදූ එළු ලොමින් කළ ඇතිරිළි, පුළුන් යෙදූ මෙට්ට, සත්ව රූපවලින් සැරසූ එළු ලොම් ඇතිරිළි, මුළුමණින්ම එළු ලොමින් කළ ඇතිරිළි, රන් නූලෙන් සැරසූ කලාල, පට නූලෙන් කළ කලාල, නාටිකාංගනාවන් ඒ මත නැටිය හැකි එළු ලොමින් කළ කලාල, ඇතුන් පිට යොදන ඇතිරිළි, අසුන් පිට යොදන ඇතිරිළි, රථවල යොදන ඇතිරිළි, අඳුන් දිවි සමෙන් කළ ඇතිරිළි, කදලි මුව සමින් කළ කලාල, හිස දෙපැත්තට රතු විල්වැද කොට්ට තබා රතු උඩුවියන් බැඳ සැදූ වටිනා යහන් ආදිය පරිහරණය කරයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී උස් අසුන් මහා අසුන් පරිහරණයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

27. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යාථීදං: උ-ජ්ඣාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලේපනං මුඛචුණ්ණකං මුඛාලේපනං හත්ථබන්ධං සිඛාන්ධං දණ්ඩකං නාළිකං අසිං ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවිජනි විදානානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති ඒවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

27. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් ඇඟපත සැරසීමෙන් හා විසිතුරු වස්ත්‍රාභරණ පැළඳීමෙන් යුක්තව කල් ගෙවනවා. ඒ කියන්නේ සුවඳ වර්ග ඇඟ තවරා සිරුර සිනිඳු කිරීම, තෙල් වර්ග ගා සම්බාහනය කොට සිරුර හැඩ කිරීම, සුවඳපැන් නෑම, උරහිස් ආදියෙහි මස් වැඩීමට මුගුරෙන් තැලීම, කැඩපතින් මුහුණ බලා සැරසීම, ඇස්වල අඳුන් ගෑම, මල් හා සුවඳ විලවුන් දැරීම, මුව සුවඳ කිරීම, මුව විලවුන් දැරීම, අත්වල ආභරණ දැමීම, හිසෙහි කුඩුම්බි දැරීම, විසිතුරු සැරයැටි දැරීම, විසිතුරු බෙහෙත් නල දැරීම, විසිතුරු කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නලල් පට දැරීම, මැණික් පැළඳීම, චාමර දැරීම, දිග වාටි ඇති සුදු වස්ත්‍ර දැරීම ආදියෙන්

යුතුවෙයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී ඇහපත සැරසීම් හා විසිතුරු වස්ත්‍රාභරණ සැරසීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

28. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං තිර-ඡානකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රාජකථං චෝරකථං මහාමත්තකථං සේනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථීකථං පුරිසකථං (කුමාරකථං කුමාරිකථං) සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපේතකථං නානත්තකථං ලෝකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං. ඉති වා ඉතිඒවරූපාය තිර-ඡානකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

28. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරිසන් කථාවල යෙදී වාසය කරනවා. ඒ කියන්නේ, රජවරුන් ගැන කථා, සොරුන් ගැන කථා, මහ ඇමතිවරුන් ගැන කථා, හමුදාවන් ගැන කථා, භය ඇතිවෙන දේවල් ගැන කථා, ආහාර වර්ග ගැන කථා, බොන දේවල් ගැන කථා, ඇඳුම් පැළඳුම් ගැන කථා, ඇඳ පුටු ගැන කථා, මල් වර්ග ගැන කථා, සුවඳ වර්ග ගැන කථා, නෑදෑයන් ගැන කථා, යාන වාහන ගැන කථා, ගම්මාන ගැන කථා, නියම් ගම්මාන ගැන කථා, නගර ගැන කථා, රටවල් ගැන කථා, ස්ත්‍රීන් ගැන කථා, පුරුෂයින් ගැන කථා, කුමාරයින් ගැන කථා, කුමාරියන් ගැන කථා, ශූරයින් ගැන කථා, මංමාවත් ගැන කථා, වලං පොලේ දේවල් ගැන කථා, මියගිය උදවිය ගැන කථා, තව තව දේවල් ගැන කථා, ලෝකය ගැන කථා, සාගරය ගැන කථා, මෙහෙමයි වුණේ මෙහෙමයි නොවුණේ කියන දේ ගැන කථා කරකර ඉන්නවා, මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරිසන් කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

29. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මි-ඡාපටිපන්නෝ

ත්වමසි, අහමස්මි සම්මා පටිපන්නෝ. සහිතං මේ, අසහිතං තේ. පුරේ වචනීයං ප-ඡා අවච. ප-ඡා වචනීයං පුරේ අවච. ආචිණ්ණං තේ විපරාවත්තං. ආරෝපිතෝ තේ වාදෝ. නිග්ගහිතෝ ත්වමසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බේඨේහි වා සෙ- පහෝසීති. ඉති වා ඉති ඒවරූපාය විග්ගහිකකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

29. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් එකිනෙකා අතර බැණ දොඩා ගන්නා කථාවෙන් යුතුව යි ඉන්නෙ. ඒ කියන්නේ "නුඹ මේ ධර්ම විනය දන්නෙ නෑ. මම තමයි මේ ධර්ම විනය දන්නේ, ආ ... එහෙම ද එතකොට නුඹද මේ ධර්ම විනය දන්නේ? නුඹ ඉන්නේ මිත්‍යා වැඩ පිළිවෙලක යි. මම තමයි නියම වැඩ පිළිවෙල තුළ ඉන්නේ. මං කරුණු සහිතව යි කියන්නේ. නුඹේ කීම කරුණු රහිත යි. නුඹ කලින් කිවයුතු දේ පස්සේ කිව්වා. පස්සේ කිවයුතුදේ කලින් කිව්වා. නුඹ කලක් තිස්සේ කියපු දේ කණපිට පෙරළුනා. මා විසින් නුඹට වාද නංවලයි තියෙන්නේ. නුඹට නිග්‍රහ කරල යි තියෙන්නේ. වාදයෙන් නිදහස් වීමට මගක් හොයාගෙන පලයන්. පුළුවන් නම් ලෙහාගනින්" යනාදිය කියමින් ආරවුල් හදාගන්නවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ බැණ දොඩාගන්නා කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

30. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං දූතෙය්‍යපහිණගමනානුයෝගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං "ඉධ ග-ඡ. අමුත්‍රාග-ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉති ඒවරූපා දූතෙය්‍යපහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

30. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල ගිහියන් ගේ පණිවිඩ පණත් ගෙන යන මෙබඳු වූ දූත මෙහෙවරෙහි යෙදෙනවා. ඒ කියන්නේ, "මෙහෙ යන්න, අසවල් තැනට එන්න, මේක (අපේ මේ පණිවිඩය) අරන් යන්න. අසවල් තැනට මේක අරන් යන්න" යනාදී රජුන් ගේ, රාජමහා ඇමතිවරුන් ගේ, ක්ෂත්‍රියයන් ගේ, බ්‍රාහ්මණයන් ගේ, ගෘහපතියන් ගේ, කුමාරවරුන් ගේ, පණිවුඩ පණත් ගෙනියනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ

පණිවුඩ පණත් ගෙනයන ගිහියන් ගේ දූත මෙහෙවරෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

31. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ කුහකා ච හොන්ති ලපකා ච නේමිත්තිකා ච නිප්පේසිකා ච ලාභේන ලාභං නිජිගිංසිතාරෝ. ඉති වා ඉති ඒවරූපා කුහනලපනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

31. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල කුහක (උඩින් වෙන ජීවිතයක් පෙන්වමින් යටින් වෙනත් ජීවිතයක් ගෙවමින් නැති ගුණ පෙන්වා) ජීවිත ගෙවනවා. ලාභ සත්කාර ලැබෙන විදිහට (පුහු වර්ණනා කිරීම්, තොදොල් කිරීම්, නැති ගුණ කීම් ආදී) චාටු බස් කියනවා. දායකයින් හට නොදී බැරි තත්වයට පත් වෙන ආකාරයේ නිමිති දක්වමින් කථා කරනවා. තමන්ට ලැබෙන විදිහට අනුන්ට ගරහනවා. ලාභයෙන් ලාභය හොයනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ කුහක කමින් චාටුබස්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

32. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: අංගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසික-ඡින්නං අග්ගිහෝමං දබ්බිහෝමං ථුසහෝමං කණහෝමං තණ්ඩුලහෝමං සප්පිහෝමං තේලහෝමං මුඛහෝමං ලෝහිතහෝමං අංගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජ භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා වි-ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගපක්ඛං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

32. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙවැනි වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ ශාරීරික අංග බලා ඵලාඵල කියනවා, නිමිති බලා ඵලාඵල කියනවා, උත්පාත බලා ඵලාඵල කියනවා, සිහින ඵලාඵල කියනවා, ශාරීරික ලක්ෂණ බලා ඵලාඵල කියනවා, මීයන් කෑ වස්ත්‍ර බලා ඵලාඵල කියනවා, ගිනි පූජා පවත්වනවා, හැන්දෙන් පූජා

පවත්වනවා, ධාන්‍ය පොතුවලින් පූජා පවත්වනවා. කණ නම් සහලින් කළ පූජා පවත්වනවා, සහලින් පූජා පවත්වනවා, ගිතෙලින් පූජා පවත්වනවා, තල තෙලින් පූජා පවත්වනවා, විශේෂ කොට කරණ පූජා පවත්වනවා, සතුන් මරා ලේ පුදා කරන පූජා පවත්වනවා, අංග විද්‍යාව, වාස්තු විද්‍යාව, දේශපාලන විද්‍යාව, වාසනාව උරගා බැලීමේ (ලොතරැයි) විද්‍යාව, භූත විද්‍යාව, පොළොව යට බිම් ගෙයක ඉඳ මැතිරීමෙන් කරන (භූරි) විද්‍යාව, සර්ප විද්‍යාව, විෂ විද්‍යාව, වෘශ්චික විද්‍යාව, මූෂක විද්‍යාව, පක්ෂි විද්‍යාව, විශාල පක්ෂි විද්‍යාව, ඉදුණු දේ මුල් කොට අනාවැකි කියන විද්‍යාව, මතුරන ලද ඊතල විද ආරක්ෂා කරන විද්‍යාව, මෘග පක්ෂ යනාදී මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

33. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි හෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරීලක්ඛණං දාසලක්ඛණං දාසීලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගෝලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගෝධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං ක-ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

33. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ මැණික්වල සුභ අසුභ ලකුණු කීම, දඬුවල සුභ අසුභ ලකුණු කීම, වස්ත්‍රවල සුභ අසුභ ලකුණු කීම, කඩු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ඊතල ආදී සලකුණුවලින් සුභාසුභ කීම, දුනු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ආයුධ ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ස්ත්‍රීන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, පුරුෂයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දරුවන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දැරියන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසීයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, ඒ ඒ කටයුතු

සඳහා තෝරා ගත යුතු ඇතුන් ගේ ලකුණු කීම, අසුන් ගේ ලකුණු කීම, ඔටුවන් ගේ ලකුණු කීම, වෘෂභයන් ගේ ලකුණු කීම, ගවයන් ගේ ලකුණු කීම, එළුවන් ගේ ලකුණු කීම, බැටළුවන් ගේ ලකුණු කීම, කුකුළු පොර ආදියට සුදුසු කුකුළන් ගේ ලකුණු කීම, වටුවන් ගේ ලකුණු කීම, සුභූනන් ඇහ වැටීමේ සහ හඬනැගීමේ ඵලාඵල කීම, කණෙහි පළඳාගත් උපකරණවලින් ඵලාඵල කීම, කැස්බෑවන්ට මතුරා ඵලාඵල කීම, මුවන්ට මතුරා ඵලාඵල කීම ආදී තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

34. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති. රඤ්ඤං අතියානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයෝ භවිස්සති. බහිරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයෝ භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. ඉති ඉමස්ස ජයෝ භවිස්සති. ඉමස්ස පරාජයෝ භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

34. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් නැකතට රජතුමා ගේ යුධ පිණිස නික්මීම වන්නේ ය. අසවල් නැකතින් ආපසු නුවරට ඇතුළ්වීම සිදු කළ යුත්තේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිට පිටත සතුරු රජුන් හමුවීමට රජු ගේ ගමන කළයුත්තේ ය. අසවල් නැකතින් පිටත සිටින රජවරු රට ඇතුළට පැමිණීම වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජු ගේ ඉවත්වීම සිදුවන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජුට ජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුනට පරාජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුන්ට ජය වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ රජුට පරාජය වන්නේ ය කියල මොහුට ජය වෙනවා. මොහුට පරාජය වෙනවා" ආදී වශයෙන් පවසමින් තිරිසන් විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ

තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

35. "යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: චන්දග්ගාහෝ භවිස්සති, සුරියග්ගාහෝ භවිස්සති, නක්ඛත්තග්ගාහෝ භවිස්සති, චන්දිමසුරියානං පථගමනං භවිස්සති, චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, නක්ඛත්තානං පථගමනං භවිස්සති, නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, උක්කාපාතෝ භවිස්සති, දිසාඩාහෝ භවිස්සති, භූමිචාලෝ භවිස්සති, දේවදුන්දුභි භවිස්සති, චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං විගමනං සංකිලේසං වෝදානං භවිස්සති, ඒවං විපාකෝ චන්දග්ගාහෝ භවිස්සති, ඒවං විපාකෝ සුරියග්ගාහෝ භවිස්සති, ඒවං විපාකෝ නක්ඛත්තග්ගාහෝ භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියානං පථගමනං භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, ඒවං විපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති, ඒවං විපාකං නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, ඒවං විපාකෝ උක්කාපාතෝ භවිස්සති, ඒවං විපාකෝ දිසාඩාහෝ භවිස්සති, ඒවං විපාකෝ භූමිචාලෝ භවිස්සති, ඒවං විපාකෝ දේවදුන්දුභි භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං විගමනං සංකිලේසං වෝදානං භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

35. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් දින චන්ද්‍රග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සූර්යග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින නැකත් ග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නිසිමහින් යෑම සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නොමහින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නිසි මහින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නොමහින් යෑම සිදුවෙනවා. අසවල් දින උල්කාපාත වැටෙනවා. අසවල් දින අසවල් දිශාවේ උෂ්ණත්වය වැඩිවෙනවා. අසවල් දින භූමි කම්පාවක් සිදුවෙනවා. අසවල් දින වැසි රහිතව අහස ගුගුරනවා. හිරු සඳු හා නැකත් වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම මේ මේ වෙලාවට සිදුවෙනවා. චන්ද්‍ර ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. සූර්ය ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. නැකත් ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක

ලබාදෙනවා. හිරු සඳු ගේ නිසිගමන මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නොමඟ යෑම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. උල්කාපාත වැටීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. දිශා දාහය මෙවැනි ඵල විපාක ලබා දෙනවා. භූකම්පන මෙවැනි ඵල විපාක ලබා දෙනවා. වැසි නැතිව අහස ගිගිරීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. හිරු සඳු හා නැකත්වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම ලෝකයට මෙවැනි විපාක ලබා දෙනවා" කියල තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

36. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: සුබ්බුට්ඨිකා භවිස්සති, දුබ්බුට්ඨිකා භවිස්සති, සුභික්ඛං භවිස්සති, දුබ්භික්ඛං භවිස්සති, ඛේමං භවිස්සති, භයං භවිස්සති, රෝගෝ භවිස්සති, ආරෝග්‍යං භවිස්සති, මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලෝකායතං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

36. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "මේ කාලයේ දී වැස්ස වහිනවා. මේ කාලයේ දී නියඟය ඇතිවෙනවා. මේ කාලයේ දී සුභික්ෂ වෙනවා. මේ කාලයේ දී දුර්භික්ෂය ඇතිවෙනවා. මේ කාලයේ දී රට සරුවෙනවා. මේ කාලයේ දී බිය සැක නැතිව ඉන්නවා. මේ කාලයේ දී භය උපදිනවා. මේ කාලයේ දි රෝග ඇති වෙනවා. මේ කාලයේ දි නීරෝග බව ඇති වෙනවා කියමින් ඵලාඵල පැවසීමත් මුද්‍රා, ගණිත, සංඛ්‍යාන, කාව්‍ය ශාස්ත්‍ර, ලෝකායත ශාස්ත්‍ර, ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

37. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං

විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හා-නිත්ථම්භනං හනුසංහන්නං හත්ථාභිජප්පනං හනුජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිකපඤ්හං දේවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්හායනං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

37. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, විවාහයට නැකත් කීම, ආවාහයට නැකත් කීම, වෙන් වූ අඹු සැමියන් එක් කිරීමට නැකත් සැදීම, එක් වූ අඹු සැමියන් වෙන් කිරීමට නැකත් සැදීම, දීපු ණය එකතු කිරීමට නැකත් සැදීම, මුදල් ණයට පොලියට දීමට නැකත් සැදීම, දියුණු වීමට ගුරුකම් කිරීම, පාළුවී නැති වීමට ගුරුකම් කිරීම, දරුගැබ් රැකෙන්නට ගුරුකම් කිරීම, දිව අගුළු බැඳෙන්නට ගුරුකම් කිරීම, හනු තද කරන්නට ගුරුකම් කිරීම, අත් පෙරලෙන්නට ගුරුකම් කිරීම, හනු සිරවෙන්නට ගුරුකම් කිරීම, කණ් අගුළු වැටෙන්නට ගුරුකම් කිරීම, කණ්ණාඩියෙන් භූතයන් කැඳවා ප්‍රශ්න විචාරීම, ගෑණු දරුවන් ලවා පේන කීම, දෙවියන් ලවා පේන කීම, සූර්ය වන්දනාව, මහ බඹු වන්දනාව, මන්ත්‍ර බලයෙන් කටින් ගිනිදැල් පිටකිරීම, මන්ත්‍ර බලෙන් ලක්ෂ්මි පූජා කිරීම යනාදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

38. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: සන්තිකම්මං පණිධිකම්මං (භූතකම්මං) භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකම්මං වත්ථුපරිකිරණං ආචමනං නහාපනං ජුහනං වමනං විරේචනං උද්ධවිරේචනං අධෝවිරේචනං සීසවිරේචනං කණ්ණතේල්ලං නෙත්තතප්පනං නත්ථුකම්මං අඤ්ජනං ප-චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකි-ඡා මූලභේසජ්ජානං අනුප්පදානං විසධීනං පටිමොක්ඛෝ. ඉති වා ඉති ඒවරූපාය තිර-චානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

38. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, ශාන්ති කර්ම, බාර ඔප්පු කිරීම,

පොලොව යට හිඳ මතුරා ගුරුකම් කිරීම, නපුංසකයා පිරිමියෙකු කිරීම, පිරිමියා නපුංසකයෙකු කිරීම, ගෙවල් තැනීමේ දිශාවන් පෙන්වා දීම, අළුතෙන් නිවාස තැනීමේදී පුද පූජා පැවැත් වීම, වතුර මතුරා මූණ සේදවීම, වතුර මතුරා නැහැවීම, ගිනිපිදීම, ලය විරේක කරවීම, බඩ විරේක කරවීම, වමනය කරවීම, වස්ති කරවීම, ශීර්ෂ විරේකය, කණට තෙල් පිඹීම, ඇස් වෙදකම, නස්න කිරීම, ඇස්වලට අඳුන් සැදීම, ප්‍රති අංජන සැදීම, ශල්‍ය කර්ම කිරීම, ළදරු චිකිත්සාව, කාය චිකිත්සාව, වනවලට බෙහෙත් බැඳීම, ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

39. ස ඛෝ සෝ ලෝහිච්ච භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෙය්‍යථාපි ලෝහිච්ච, ඛත්තියෝ මුද්ධාවසිත්තෝ නිහතප-චාමිත්තෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං ප-චත්ථිකතෝ. ඒවමේව ඛෝ ලෝහිච්ච භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෝ ඉමිනා අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ ලෝහිච්ච භික්ඛු සීලසම්පන්නෝ හෝති.

39. පින්වත් ලෝහිච්ච, ඒ භික්ෂුව වනාහී මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. ඔටුනු පළන් රජ කෙනෙක් ඉන්නවා. ඔහු සතුරන් පරදවල බැහැර කරලයි ඉන්නේ. ඉතින් ඔහු සතුරන් හේතුවෙන් මොන ම අයුරකින්වත් භයක් දකින්නේ නෑ. පින්වත් ලෝහිච්ච, භික්ෂුවත් ඔය විදිහම යි. මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් සමන්විතව ආධ්‍යාත්මිකව නිවැරදි සැපයක් විඳිනවා. පින්වත් ලෝහිච්ච, ඔන්න විදිහට යි භික්ෂුව සීලසම්පන්න වන්නේ.

40. කථඤ්ච ලෝහිච්ච, භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති? ඉධ ලෝහිච්ච භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියේ සංවරං ආපජ්ජති.

සෝතේන සද්දං සුත්වා ..... ඝාණේන ගන්ධං ඝායිත්වා ..... ජිව්හාය රසං සායිත්වා ..... කායේන ඵොට්ඨබ්බං ඵුසිත්වා ..... මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේතං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියේ සංවරං ආපජ්ජති. සෝ ඉමිනා අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ අජ්ඣත්තං අබ්‍යාසේකසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ ලෝහිච්ච, භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති.

40. පින්වත් ලෝහිච්ච, භික්ෂුව අකුසලයන් වැළකූ ද්වාර ඇති ඉඳුරන් ඇතිව ඉන්නේ කොහොම ද? පින්වත් ලෝහිච්ච, මෙහිලා භික්ෂුව ඇසින් රූප දැක නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් ඇස නැමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. ඇස රැක ගන්නවා. ඇස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. කණෙන් ශබ්දයක් අහලා ..... නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කරලා ..... දිවෙන් රසයක් රස විඳලා ..... කයෙන් පහසක් ලබලා ..... මනසින් අරමුණක් දැන ගෙන නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් මනස නැමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. මනස රැක ගන්නවා. මනස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. ඔහු මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව ආධ්‍යාත්මිකව පීඩා රහිතව සැපයක් විඳිනවා. පින්වත් ලෝහිච්ච, භික්ෂුව අකුසලයෙන් වැළැක් වූ දොරටු ඇති ඉන්ද්‍රියයන් තුළ ඉන්නේ ඔය විදිහට යි.

41. **කථඤ්ච ලෝහිච්ච, භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති? ඉධ ලෝහිච්ච, භික්ඛු අභික්කන්තේ පටික්කන්තේ සම්පජානකාරී හෝති. ආලෝකිතේ විලෝකිතේ සම්පජානකාරී හෝති. සම්මිඤ්ජිතේ පසාරිතේ සම්පජානකාරී හෝති. සංඝාටිපත්තචීවරධාරණේ සම්පජානකාරී හෝති. අසිතේ පීතේ ඛායිතේ සායිතේ සම්පජානකාරී හෝති. උ-චාරපස්සාවකම්මේ සම්පජානකාරී හෝති. ගතේ ඨිතේ නිසින්නේ සුත්තේ ජාගරිතේ භාසිතේ තුණ්හීභාවේ සම්පජානකාරී හෝති. ඒවං ඛෝ ලෝහිච්ච, භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති.**

50. පින්වත් ලෝහිච්ච, භික්ෂුව සිහිනුවණින් යුතුව සිටින්නේ කොහොම ද? පින්වත් ලෝහිච්ච, මෙහිලා භික්ෂුව ඉදිරියට යද්දීත්, ආපසු එද්දීත්, එය කරන්නේ සිහි නුවණින් ම යි. ඉදිරිය බලද්දී, වටපිට බලද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. අතපය හකුළද්දී, දිගහරිද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. දෙපට සිවුර, පාත්‍රය, අනෙක් සිවුරු ආදිය දරද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. වළඳද්දී පානය කරද්දී අනුභව කරද්දී රස විඳිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. වැසිකිළි කැසිකිළි යාමේ දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. ගමන් කරද්දී, සිටගෙන සිටිද්දී, වාඩි වී සිටිද්දී, සැතපෙද්දී, නිදිවරද්දී, කථාබස් කරද්දී, නිහඬව සිටිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. පින්වත් ලෝහිච්ච, භික්ෂුව සිහිනුවණින් යුතු වන්නේ ඔය ආකාරයට යි.

42. කථඤ්ච ලෝහිච්ච, භික්ඛු සන්තුට්ඨෝ හෝති? ඉධ ලෝහිච්ච භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරියේන චීවරේන කුච්ඡිපරිහාරියේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. සෙය්‍යථාපි ලෝහිච්ච, පක්ඛී සකුණෝ යේන යේනේව ඩේති සපත්තභාරෝ'ව ඩේති, එවමේව ඛෝ ලෝහිච්ච, භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරියේන චීවරේන කුච්ඡිපරිහාරියේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. එවං ඛෝ ලෝහිච්ච, භික්ඛු සන්තුට්ඨෝ හෝති.

42. පින්වත් ලෝහිච්ච, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ කොහොම ද? පින්වත් ලෝහිච්ච, මෙහිලා භික්ෂුව කය පරිහරණයට සැහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සැහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. ඒක මේ වගේ දෙයක්. කුරුල්ලෙක් යම් ම තැනකට පියඹා යනවා නම්, පියාපත් බර පමණක් සහිතව පියඹනවා වගෙයි. පින්වත් ලෝහිච්ච, ඔය අයුරින් ම භික්ෂුව කය පරිහරණයට සැහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සැහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. පින්වත් ලෝහිච්ච, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ ඔය විදිහට යි.

43. සෝ ඉමිනා ච අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතෝ, විවිත්තං සේනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භෝකාසං පලාලපුඤ්ජං. සෝ

ප-ඡාහත්ථං පිණ්ඩපාතපටික්කන්තෝ නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

43. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ සිහිනුවණින් යුක්ත වෙලා, මේ ආර්ය වූ ලද දෙයින් සතුටුවීමෙන් යුක්ත වෙලා හුදෙකලා සෙනසුනක වාසය කරනවා. ඒ කියන්නේ ආරණ්‍යය, රුක්සෙවණ, පර්වතය, දිය ඇල්ල, ගිරිගුහාව, සොහොන, වනගැබ, ගස් කොළන් රහිත හිස් පිටිය, පිදුරු ගෙය ආදිය යි. ඔහු පිණ්ඩපාතය වළඳා, දානයෙන් පසු (එවැනි තැනක) පළඟක් බැඳ ගෙන, කය සෘජු කර ගෙන, භාවනා අරමුණෙහි සිහිය පිහිටුවා ගෙන වාඩිවෙනවා.

44. සෝ අභිජ්ඣං ලෝකේ පහාය විගතාභිජ්ඣේන චේතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසෝධේති. බ්‍යාපාදපදෝසං පහාය අබ්‍යාපන්නචිත්තෝ විහරති සබ්බපාණභූතහිතානුකම්පී. බ්‍යාපාදපදෝසා චිත්තං පරිසෝධේති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධෝ විහරති ආලෝකසඤ්ඤී සතෝ සම්පජානෝ. ථීනමිද්ධා චිත්තං පරිසෝධේති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතෝ විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තෝ. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසෝධේති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡෝ විහරති අකථංකථී කුසලේසු ධම්මේසු. විචිකිච්ඡාය චිත්තං පරිසෝධේති.

44. ඔහු ජීවිතය නම් වූ ලෝකය ගැන ඇති විසම ලෝභය දුරු කොට ඇලීම් රහිත වූ සිතින් වාසය කරනවා. විසම ලෝභය කෙරෙන් සිත පිරිසිදු කරනවා. තරහ වෛර ආදිය අත්හැර තරහ නැති සිතින් සියළු සතුන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා. තරහ වෛර ආදිය කෙරෙන් සිත පිරිසිදු කරනවා. නිදිමත අලසකම අත්හැර නිදිමත අලසකමින් බැහැරව ආලෝක සඤ්ඤාවෙන් යුතුව, සිහිනුවණ ඇතිව වාසය කරනවා. නිදිමත අලසකම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සිතේ විසිරීමත්, පසුතැවීමත් බැහැර කොට නො කැළඹී ගිය සංසිඳුනු සිතින් වාසය කරනවා. සිතේ විසිරීම හා පසුතැවීම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සැකය දුරු කොට කුසල් දහම් ගැන කෙසේ ද? කෙසේ ද? යනාදී සැකයෙන් එතෙරව වාසය කරනවා. සැකය කෙරෙන් සිත පිරිසිදු කරනවා.

45. සෙය්‍යථාපි ලෝහිච්ච, පුරිසෝ ඉණං ආදාය කම්මන්තේ පයෝජෙය්‍ය, තස්ස තේ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං, සෝ යානි ච පෝරාණානි

ඉණමූලානි තානි ච බ්‍යාන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ඉණං ආදාය කම්මන්තේ පයෝජේසිං. තස්ස මේ තේ කම්මන්තා සම්ඡ්ඣඩිංසු. සෝ'හං යානි ච පෝරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීඅකාසිං. අත්ථි ච මේ උත්තරිං අවසිට්ඨං දාරභරණායා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

45. පින්වත් ලෝහිච්ච, එය මෙවැනි දෙයක්. පුරුෂයෙක් ණයක් අරගෙන කර්මාන්තයක යොදවනවා. ඔහු ගේ ඒ ව්‍යාපාරය සාර්ථක වෙනවා. එතකොට ඔහු යම් පරණ මුල් ණයක් ඇද්ද, එය සම්පූර්ණයෙන් ම ගෙවලා දානවා. එයින් පසු ඔහුට අඹුදරුවන් පෝෂණය පිණිස ලාභයක් ඉතිරිත් වෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං කලින් ණයක් අරගෙනයි ව්‍යාපාරයක යෙදෙව්වේ. ඒ මගේ ව්‍යාපාරය සාර්ථක වුණා. ඒ මං යම් පරණ මුල් ණයක් ඇද්ද එය සම්පූර්ණයෙන් ම ගෙව්වා. අඹුදරුවන් පෝෂණයටත් මට ආදායම ඉතිරි වුණා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

46. සෙය්‍යථාපි ලෝහිච්ච, පුරිසෝ ආබාධිකෝ අස්ස දුක්ඛිතෝ බාළ්හගිලානෝ, භත්තං චස්ස න-ඡාදෙය්‍ය, න චස්ස කායේ බලමත්තා, සෝ අපරේන සමයේන තම්හා ආබාධා මු-චෙය්‍ය, භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායේ බලමත්තා, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ආබාධිකෝ අහෝසිං දුක්ඛිතෝ බාළ්හගිලානෝ. භත්තං ච මේ න-ඡාදේසි. න චස්ස මේ ආසි කායේ බලමත්තා. සෝ'ම්හි ඒතරහි තම්හා ආබාධා මුත්තෝ. භත්තඤ්ච මේ ඡාදේති. අත්ථි ච මේ කායේ බලමත්තා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

46. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව ඉන්නවා. ඔහුට බත් කෑමටවත් පිරියක් නෑ. ඔහු ගේ ඇහේ පතේ ප්‍රාණවත් ගතියක් නෑ. නමුත් පස්සෙ කාලෙක ඔහු ඒ රෝගයෙන් මිදුනා. ඔහුට දැන් බත් කෑමත් ප්‍රියයි. ඔහු ගේ ඇහපතත් ප්‍රාණවත්. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව හිටියේ. මට බත් කෑමටවත් පිරියක් තිබුණේ නෑ. මගේ ඇහේ පතේ ප්‍රාණවත් ගතියක් තිබුණේ නෑ. නමුත් දැන් මං ඒ රෝගයෙන් මිදුනා. මට දැන් බත් කෑමත් ප්‍රියයි. මගේ ඇහපතත් ප්‍රාණවත්" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

47. සෙය්‍යථාපි ලෝහිච්ච, පුරිසෝ බන්ධනාගාරේ බද්ධෝ අස්ස, සෝ අපරේන සමයේන තම්හා බන්ධනාගාර මු-චෙය්‍ය සොත්ථිනා අබ්බයේන න චස්ස කිඤ්චි භෝගානං වයෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ බන්ධනාගාරේ බද්ධෝ අහෝසිං. සෝ'මිහි ඒතරහි තම්හා බන්ධනාගාරා මුත්තෝ සොත්ථිනා අබ්බයේන. නත්ථි මේ කිඤ්චි භෝගානං වයෝ"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

47. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් හිරගෙදරක බන්ධනයකට හසුවෙනවා. නමුත් ඔහු පස්සෙ කාලෙක තමන් ගේ ධනය වියදම් නොකොට සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වෙනවා. ඔහු ගේ සම්පත්වලින් කිසි වියදමක් යන්නේ නෑ. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර හිරගෙදරක බන්ධනයකට අහු වුණා. නමුත් ඒ මං දැන් ධන වියදමකින් තොරව සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වුණා. මගේ භෝග සම්පත්වලින් කිසිදෙයක් වියදම් වුණේ නෑ" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

48. සෙය්‍යථාපි ලෝහිච්ච, පුරිසෝ දාසෝ අස්ස අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාමංගමෝ, සෝ අපරේන සමයේන තම්හා දාසබ්‍යා මු-චෙය්‍ය අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාමංගමෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ දාසෝ අහෝසිං අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාමංගමෝ. සෝ'මිහි ඒතරහි තම්හා දාසබ්‍ය මුත්තෝ අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාමංගමෝ"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

48. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නොහැකි, දාසයෙක් වෙලා හිටියා. ඔහු පස්සෙ කාලෙක ඒ දාසබවෙන් නිදහස් වුණා. තමාට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නොවන, තමන් කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබුණා. එතකොට ඔහුට මෙහෙම හිතුනා. "මං ඉස්සර තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නොහැකි, දාසයෙක් වෙලා හිටියා. ඒ මං දැන් ඒ දාසබවෙන් නිදහස් වෙලයි ඉන්නේ. මට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නොවන, මං කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබිලා තියෙනවා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

49. සෙය්‍යථාපි ලෝහිච්ච, පුරිසෝ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං, සෝ අපරේන සමයේන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛේමං අප්පටිභයං, තස්ස එවමස්ස: "අහං ඛෝ පුබ්බේ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සෝ'මිහි එතරහි තං කන්තාරං තිණ්ණෝ සොත්ථිනා ගාමන්තං අනුප්පත්තෝ ඛේමං අප්පටිභය"න්ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

49. පින්වත් ලෝහිච්ච, එක මේ වගේ දෙයක්. පුරුෂයෙක් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසෙනවා. නමුත් ඔහු පසු කාලෙක ඒ කාන්තාරයෙන් එතෙර වෙනවා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා "මං කලින් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසුනා. නමුත් දැන් මා ඒ කාන්තාරයෙන් එතෙර වුණා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණුනා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

50. එවමේව ඛෝ ලෝහිච්ච, භික්ඛු යථා ඉණං යථා රෝගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං. එවං ඉමේ පඤ්ච නීවරණේ අප්පහීණේ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි ලෝහිච්ච, ආනණ්‍යං, යථා ආරෝග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛේමන්තභූමිං එවමේව ඛෝ ලෝහිච්ච භික්ඛු ඉමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සති.

50. පින්වත් ලෝහිච්ච, අන්න ඒ විදිහම යි. භික්ෂුවත් (කලින්) ණයක් ගත්තා වගේ, ලෙඩ වුණා වගේ, හිරේවිලංගුවේ වැටුනා වගේ, වහල්බවට පත් වුණා වගේ, නිරුදක කතරකට පැමිණුනා වගේ මේ පංච නීවරණයන් ප්‍රහාණය නො වී තමා තුළ පවතින හැටි දකිනවා. නමුත් පින්වත් ලෝහිච්ච, ඒ ණය ගෙවා දමා ණය රහිත වුණා වගේ, රෝගයෙන් නිදහස් වෙලා නීරෝග වුණා වගේ, වියදම් නැතුව හිරෙන් නිදහස් වුණා වගේ, දාසබවෙන් නිදහස් වුණා වගේ, නිරුදක කතර ගෙවා ආරක්ෂා සහිත ක්ෂේම භූමියකට පැමිණුනා වගේ තමයි. පින්වත් ලෝහිච්ච, අන්න ඒ විදිහමයි භික්ෂුව තමා තුළ මේ පංච නීවරණයන් දුරුවී ඇති ආකාරයත් දකින්නේ.

51. තස්සිමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සතෝ පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායෝ පස්සම්භති. පස්සද්ධකායෝ සුඛං වේදේති. සුඛිනෝ චිත්තං සමාධියති.

51. ඔහුට මේ පඤ්ච නීවරණයන් තමා තුළ නැති බව දකිද්දි මහත් සතුටක් ඇති වෙනවා. ඒ ප්‍රමුදිත වීම ඇති කෙනාට ප්‍රීතිය ඇති වෙනවා. ප්‍රීති මනසක් ඇති කෙනා ගේ කය සංසිඳෙනවා. සංසිඳුනු කයින් යුතු ව සැපක් විඳිනවා. සැප ඇති කෙනා ගේ සිත සමාධිමත් වෙනවා.

52. සෝ විවි-ච-ව කාමේහි විවි-ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

52. ඔහු කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් හට ගත් ප්‍රීති සුඛය ඇති පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

53. සෙය්‍යථාපි ලෝහිච්ච දක්ඛෝ නහාපකෝ වා නහාපකන්තේවාසී වා කංසථාලේ නහානීයචුණ්ණානි ආකිරිත්වා උදකේන පරිප්ඵොසකං පරිප්ඵොසකං සන්නෙය්‍ය සායං නහානීයපිණ්ඩි සේනාහනුගතා සේනාහපරේතා සන්තරබාහිරා ඵුටා සේනහේන න ච පග්ඝරණි. එවමේව ඛෝ ලෝහිච්ච භික්ඛු ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

53. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. (රජවරුන් ආදී පිරිස් නහවන) දක්ෂ නහවන්නෙක් හෝ නහවන කෙනෙකු ගේ ගෝලයෙක් ඉන්නවා. ඔහු ලෝහ බඳුනක නාන සුණු විසුරුවනවා. ඊට පස්සේ දිය ඉස ඉස පිඬු කරනවා. එතකොට ඒ නානසුණු පිඬට අර වතුර කාවදිනවා. හොඳින් තෙත් වෙනවා. ඒ නහන පිඬ ඇතුළත පිටත සෑම තැන ම හොඳින් දිය පැතිරිලා

තියෙනවා. පිටතට වැගිරෙන්නෙත් නෑ. පින්වත් ලෝහිච්ච, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ.

54. යම්පි ලෝහිච්ච භික්ඛු විවිච්චේව කාමේහි විවිච්ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවිචාරං විවේකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, සෝ ඉමමේව කායං විවේකජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති, නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විවේකජේන පීතිසුඛේන අප්ඵුටං හෝති, ඉදම්පි'ස්ස හෝති සමාධිස්මිං.

54. පින්වත් ලෝහිච්ච, භික්ෂුව කාමයන්ගෙන් වෙන්ව, අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් හටගත් ප්‍රීති සුඛය ඇති යම් පළමු වෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා නම්, ඔහු මේ කය ම විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි විවේකයෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නොකළ කිසිතැනක් නෑ. මෙය අයිති වන්නේත් ඔහු ගේ සමාධියට ම යි.

55. යස්මිං ඛෝ ලෝහිච්ච සත්ථරි සාවකෝ ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡති අයම්පි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

55. පින්වත් ලෝහිච්ච, යම් කිසි ශාස්තෘවරයෙක් වෙත පැමිණි ශ්‍රාවකයා මෙබඳු වූ උදාර විශේෂත්වයන් ශාක්ෂාත් කරනවා නම්, පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් නොවේ. යම් කිසි කෙනෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඒ ශාස්තෘවරයා තුළ නෑ. එය අසත්‍යයක්. අධාර්මික යි. වැරදියි.

56. පුන ච පරං ලෝහිච්ච භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසෝ ඒකෝදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පූරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

56. පින්වත් ලෝහිච්ච, තව දුරටත් කියනවා නම් භික්ෂුව විතක්ක විචාරයන් ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්මිකව පැහැදීම ඇතිව සිතෙහි මනා එකඟ බවෙන් යුතු ව විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් හටගත්, ප්‍රීති සුඛය ඇති දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා. ඔහු මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

57. සෙය්‍යථාපි ලෝහිච්ච උදකරහදෝ ගම්භීරෝ උබ්භිදෝදකෝ, තස්ස නේවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං, න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං, න ප-ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං, න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං, දේවෝ ච න කාලේන කාලං සම්මා ධාරං අනුප්පවෙ-ඡෙය්‍ය, අථ ඛෝ තම්හා ව උදකරහදා සීතා වාරිධාරා උබ්භිජ්ජිත්වා තමේව උදකරහදං සීතේන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය, නාස්ස කිඤ්චි සබ්බාවතෝ උදකරහදස්ස සීතේන වාරිනා අප්ඵුටං අස්ස. ඒවමේව ඛෝ ලෝහිච්ච භික්ඛු ඉමමේව කායං සමාධිජේන පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති.

57. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. යට දිය උල්පත්වලින් වතුර ගලන ගැඹුරු විලක් තියෙනවා. හැබැයි ඒ විලට නැගෙනහිර පැත්තෙන් වතුර එන මගක් නෑ. දකුණු පැත්තෙන් වතුර එන මගක් නෑ. බටහිර පැත්තෙන් වතුර එන මගක් නෑ. උතුරු පැත්තෙන් වතුර එන මගක් නෑ. වැස්සත් කලින් කලට පිළිවෙලකට වහින්නේ නෑ. එතකොට ඒ විලෙන් ම සීතල දියදහරා උල්පත්වලින් උඩට මතු වෙවී ඒ විල ම සීතල ජලයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. වතුරෙන් පුරවනවා. හොඳින් පුරවනවා. ඒ මුළු විලේ ම සිහිල් ජලයෙන් පහස නො ලැබූ කිසි තැනක් නෑ. පින්වත් ලෝහිච්ච, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

58. යම්පි ලෝහිච්ච භික්ඛු විතක්ක විචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චේතසෝ ඒකෝදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, සෝ ඉමමේව කායං සමාධිජේන

පීතිසුඛේන අභිසන්දේති පරිසන්දේති පූරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස සමාධිජේන පීතිසුඛේන අප්ඵුටං හෝති. ඉදම්පි'ස්ස හෝති සමාධිස්මිං.

58. පින්වත් ලෝහිච්ච, භික්ෂුව විතක්ක විචාරයන් ගේ සංසිඳීමෙන් ආධ්‍යාත්මිකව පැහැදීම ඇතිව සිතෙහි මනා එකඟ බවෙන් යුතු ව විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් හටගත්, ප්‍රීති සුඛය ඇති යම් දෙවෙනි ධ්‍යානය උපදවාගෙන වාසය කරනවා නම්, ඔහු මේ කය ම සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. මෙය අයිති වන්නේත් ඔහු ගේ සමාධියට ම යි.

59. යස්මිං ඛෝ ලෝහිච්ච සත්ථරි සාවකෝ ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡති අයම්පි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

59. පින්වත් ලෝහිච්ච, යම් කිසි ශාස්තෘවරයෙක් වෙත පැමිණි ශ්‍රාවකයා මෙබඳු වූ උදාර විශේෂත්වයන් ශාක්ෂාත් කරනවා නම්, පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් නොවේ. යම් කිසි කෙනෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඒ ශාස්තෘවරයා තුළ නෑ. එය අසත්‍යයක්. අධාර්මික යි. වැරදියි.

60. පුන ච පරං ලෝහිච්ච භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති සතෝ සම්පජානෝ සුඛඤ්ච කායේන පටිසංවේදේති. යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති.

60. පින්වත් ලෝහිච්ච, තව දුරටත් කියනවා නම් භික්ෂුව ප්‍රීතියට ද නො ඇලීමෙන් උපේක්ෂාවෙන් යුතුව වාසය කරනවා. සිහියෙන් නුවණින් යුතු ව කයෙන් සැපයක් ද විඳිනවා. ආර්යයන් වහන්සේලා යම් ධ්‍යානයකට උපේක්ෂා සහගත සිහිය ඇති සැප විහරණය යැයි පවසනවා ද, ඒ තුන්වන

ධ්‍යානයත් උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

61. සෙය්‍යථාපි ලෝහිච්ච උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පේක-චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකේ ජාතානි උදකේ සංවද්ධානි උදකානුග්ගතානි අන්තෝනිමුග්ගපෝසීනි තානි යාව චග්ගා යාව ච මූලා සීතේන වාරිනා අභිසන්නානි පරිසන්නානි පරිපූරානි, පරිප්ඵුටානි නාස්සා කිඤ්චි සබ්බාවතං උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතේන වාරිනා අප්ඵුටං අස්ස. ඒවමේව ඛෝ ලෝහිච්ච භික්ඛු ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්නේති පරිසන්නේති පරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති.

61. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. මහනෙල් විලක හෝ රතු නෙළුම් විලක හෝ සුදු නෙළුම් විලක හෝ ඇතැම් මහනෙල් වේවා, රතු නෙළුම් වේවා, සුදු නෙළුම් වේවා ඒ නෙළුම් ජලයේ ම යි හට ගන්නේ. ජලයේ ම යි වැඩෙන්නේ. නමුත් ජලයෙන් උඩට ඇවිත් නෑ. ජලය තුළ ම ගිලී වැඩෙනවා. එතකොට ඒ නෙළුම් අග දක්වාත් මූල දක්වාත් සීතල දියෙන් හොඳට තෙත් වෙලා තියෙන්නේ. මුළුමණින් ම තෙත් වෙලා තියෙන්නේ. පිරිල තියෙන්නේ. හැම තැනම පැතිරිලා තියෙන්නේ. ඒ සෑම මහනෙල්වල, රතුනෙළුම්වල, සුදුනෙළුම්වල සීතල දිය නො පැතුරුණු කිසි තැනක් නෑ. පින්වත් ලෝහිච්ච, ඔය විදිහම යි. භික්ෂුව මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන්ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

62. යම්පි ලෝහිච්ච භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති සතෝ සම්පජානෝ සුඛඤ්ච කායේන පටිසංවේදේති, යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකෝ සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති, සෝ ඉමමේව කායං නිප්පීතිකේන සුඛේන අභිසන්දේති පරිසන්දේති පූරිපූරේති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස නිප්පීතිකේන සුඛේන අප්ඵුටං හෝති. ඉදම්පි'ස්ස හෝති සමාධිස්මිං.

62. පින්වත් ලෝහිච්ච, භික්ෂුව ප්‍රීතියට ද නො ඇලීමෙන් උපේක්ෂාවෙන් යුතුව වාසය කරනවා. සිහියෙන් නුවණින් යුතු ව කයෙන් සැපයක් ද විඳිනවා. ආර්යයන් වහන්සේලා යම් ධ්‍යානයකට උපේක්ෂා සහගත සිහිය ඇති සැප විහරනය යැයි පවසනවා ද, යම් ඒ තුන්වන ධ්‍යානයත් උපදවා ගෙන වාසය කරනවා නම්, ඔහු මේ කය ම ප්‍රීති රහිත සුඛයෙන් හොඳට තෙත් කරනවා. මුළුමණින් ම තෙත් කරනවා. එයින් පුරවනවා. පිරිපුන් ව පුරවනවා. ඔහු ගේ සියළු කයෙහි ප්‍රීති රහිත සුඛයෙන් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. මෙය අයිති වන්නේත් ඔහු ගේ සමාධියට ම යි.

63. යස්මිං ඛෝ ලෝහිච්ච සත්ථරි සාවකෝ ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡති අයම්පි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

63. පින්වත් ලෝහිච්ච, යම් කිසි ශාස්තෘවරයෙක් වෙත පැමිණි ශ්‍රාවකයා මෙබඳු වූ උදාර විශේෂත්වයන් ශාක්ෂාත් කරනවා නම්, පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් නොවේ. යම් කිසි කෙනෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඒ ශාස්තෘවරයා තුළ නෑ. එය අසත්‍යයක්. අධාර්මික යි. වැරදියි.

64. පුන ච පරං ලෝහිච්ච භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බේව සෝමනස්සදෝමනස්සානං අත්ථංගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන ඵරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති.

64. පින්වත් ලෝහිච්ච, නැවතත් කියනවා නම් භික්ෂුව සැපය ද ප්‍රහාණය කිරීමෙන්, දුක ද ප්‍රහාණය කිරීමෙන් කලින් ම සොම්නස් දොම්නස් දෙක ඉක්ම යෑමෙන් දුක් සැප රහිත වූ පාරිශුද්ධ උපේක්ෂා සහගත සතිය ඇති සතර වෙනි ධ්‍යානය උපදවා ගෙන වාසය කරනවා. ඔහු මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

65. සෙය්‍යථාපි ලෝහිච්ච පුරිසෝ විදාතේන වත්ථේන සසීසං පාරුපිත්වා නිසින්නෝ අස්ස, නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස විදාතේන වත්ථේන අප්ඵුටං අස්ස, ඒවමේව ඛෝ ලෝහිච්ච භික්ඛු ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන එරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති.

65. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. සුදු වස්ත්‍රයකින් හිස සහිතව මුළු සිරුර ම පොරොවාගෙන වාඩි වී සිටින කෙනෙක් ඉන්නවා. එතකොට ඔහු ගේ මුළු කයෙහි ම සුදු වස්ත්‍රයෙන් නො වැසුණු කිසි තැනක් නෑ. පින්වත් ලෝහිච්ච, අන්න ඒ වගේ ම යි භික්ෂුව මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ.

66. යම්පි ලෝහිච්ච භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බේව සෝමනස්සදෝමනස්සානං අත්ථංගමා අදුක්ඛමසුඛං උපෙක්ඛා-සතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සෝ ඉමමේව කායං පරිසුද්ධේන චේතසා පරියෝදාතේන එරිත්වා නිසින්නෝ හෝති. නාස්ස කිඤ්චි සබ්බාවතෝ කායස්ස පරිසුද්ධේන චේතසා පරියෝදාතේන අප්ඵුටං හෝති. ඉදම්පි'ස්ස හෝති සමාධිස්මිං.

66. පින්වත් ලෝහිච්ච, භික්ෂුව සැපය ද ප්‍රහාණය කිරීමෙන්, දුක ද ප්‍රහාණය කිරීමෙන් කලින් ම සොම්නස් දොම්නස් දෙක ඉක්ම යෑමෙන් දුක් සැප රහිත වූ පාරිශුද්ධ උපේක්ෂා සහගත සතිය ඇති යම් සතර වෙනි ධ්‍යානයක් උපදවා ගෙන වාසය කරනවා නම්, ඔහු මේ කය ම පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් පතුරුවා ගෙන වාඩි වී ඉන්නවා. ඔහු ගේ සියළු කයෙහි පාරිශුද්ධ වූ ප්‍රභාශ්වර සිතින් ස්පර්ශ නො කළ කිසිතැනක් නෑ. මෙය අයිති වන්නෙත් ඔහු ගේ සමාධිය ට ම යි.

67. යස්මිං ඛෝ ලෝහිච්ච සත්ථරි සාවකෝ ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡති අයම්පි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

67. පින්වත් ලෝහිච්ච, යම් කිසි ශාස්තෘවරයෙක් වෙත පැමිණි ශ්‍රාවකයා මෙබඳු වූ උදාර විශේෂත්වයන් ශාක්ෂාත් කරනවා නම්, පින්වත්

ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් නොවේ. යම් කිසි කෙනෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඒ ශාස්තෘවරයා තුළ නෑ. එය අසත්‍යයක්. අධාර්මික යි. වැරදියි.

68. පුනචපරං ලෝහිච්ච සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සානාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතා-පෙත්තිකසම්භවෝ විදනකුම්මාසූපචයෝ අනි-චු-ඡාදනපරිමද්දනභේදන-විද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්"ති.

68. පින්වත් ලෝහිච්ච, තව දුරටත් කියනවා නම් භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් ව්‍යංජන ආදියෙන් වැඩුණු, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි.

69. සෙය්‍යථාපි ලෝහිච්ච, මණි වේළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ සබ්බාකාරසම්පන්නෝ, තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා ඵලිතං වා පණ්ඩුසුත්තං වා. තමේනං චක්ඛුමා පුරිසෝ හත්ථේ කරිත්වා ප-ච්චෙක්ඛෙය්‍ය "අයං ඛෝ මණි වේළුරියෝ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ, අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ සබ්බාකාරසම්පන්නෝ, තත්‍රිදං සුත්තං ආවුතං නීලං වා පීතං වා ලෝහිතං වා ඵලිතං වා පණ්ඩුසුත්තං වා"ති. ඒවමේව ඛෝ ලෝහිච්ච, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඤාණදස්සානාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඒවං පජානාති: "අයං ඛෝ මේ කායෝ රූපී චාතුම්මහාභූතිකෝ මාතාපෙත්තිකසම්භවෝ

විදනකුම්මාසූපචයෝ අනි-චු-ඡාදනපරිමද්දනභේදනවිද්ධංසනධම්මෝ. ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධ"න්ති.

69. පින්වත් ලෝහිච්ච, එක මේ වගේ දෙයක්. වෛරෝඩි මාණික්‍යයක් තියෙනවා. හරි ලස්සනට පහළ වුණ දෙයක්. අටපට්ටම්. හොඳින් ඔපමට්ටම්, ඉතාමත් හොඳ යි. ඉතාම ප්‍රසන්න යි. පිවිතුරු යි. මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. ඉතින් ඔය මැණික තුළ නිල් වේවා, රන්වන් වේවා, රතු වේවා, සුදු වේවා, පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා. එතකොට ඇස් ඇති පුරුෂයෙක් මැණික අතට ගෙන හොඳින් විමසා බලනවා. "මේ වෛරෝඩි මැණික හරි ලස්සනට පහළ වුණ දෙයක්. අටපට්ටම්. හොඳින් ඔපමට්ටම්, ඉතාමත් හොඳ යි. ඉතාම ප්‍රසන්න යි. පිවිතුරු යි. මැණිකක තිබිය යුතු හැම දෙයක් ම තියෙනවා. මේ මැණික තුළ නිල් වේවා, රන්වන් වේවා, රතු වේවා, සුදු වේවා, පඬුපැහැ වේවා, නූලක් අමුණලා තියෙනවා" කියලා. පින්වත් ලෝහිච්ච, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඤාණදර්ශනය (නුවණින් අවබෝධ වීම) පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. එතකොට ඔහු මේ විදිහට දැන ගන්නවා. "මාගේ මේ කය වනාහී සතර මහා භූතයන්ගෙන් හට ගත්, මව්පියන් නිසා හට ගත්, බත් ව්‍යංජන ආදියෙන් වැඩුණ, අනිත්‍ය වූ, ඇතිල්ලීම් පිරිමැදීම්වලින් නඩත්තු කළ යුතු වූ, බිඳී වැනසී යන ස්වභාවයට අයත් වූ, රූපවත් (මහාභූත නම් වූ රූපයෙන් හැදුනු) දෙයක්. මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි" කියල.

70. යම්පි ලෝහිච්ච භික්ඛු එවං සමාහිතේ චිත්තේ ..... එවං පජානාති ..... ඉදං ච පන මේ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිපද්ධන්ති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤාය.

70. පින්වත් ලෝහිච්ච, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... මේ විදිහට දැන ගන්නවා ..... මාගේ මේ විඤ්ඤාණය ද පවතින්නේ මේ සිරුරෙහි ම යි. බැඳී තිබෙන්නේත් මෙහි ම යි" කියල. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

72. යස්මිං ඛෝ ලෝහිච්ච සත්ථරි සාවකෝ ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡති අයම්පි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

72. පින්වත් ලෝහිච්ච, යම් කිසි ශාස්තෘවරයෙක් වෙත පැමිණි ශ්‍රාවකයා මෙබඳු වූ උදාර විශේෂත්වයන් ශාක්ෂාත් කරනවා නම්, පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් නොවේ. යම් කිසි කෙනෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඒ ශාස්තෘවරයා තුළ නෑ. එය අසත්‍යයක්. අධාර්මික යි. වැරදියි.

72. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගප-චංගියා අහීනින්ද්‍රියං,

72. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අඟපසඟ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා.

73. සෙය්‍යථාපි ලෝහිච්ච පුරිසෝ මුඤ්ජම්හා ඉසිකං පවාහෙය්‍ය. තස්ස ඒවමස්ස: "අයං මුඤ්ජෝ, අයං ඉසිකා අඤ්ඤෝ මුඤ්ජෝ, අඤ්ඤා ඉසිකා මුඤ්ජම්හාත්වේව ඉසිකා පබාළ්හා"ති. සෙය්‍යථාපි වා පන ලෝහිච්ච පුරිසෝ අසිං කෝසියා පවාහෙය්‍ය, තස්ස ඒවමස්ස "අයං අසි, අයං කෝසි, අඤ්ඤේ අසි, අඤ්ඤා කෝසි, කෝසියාත්වේව අසි පබාළ්හෝ"ති. සෙය්‍යථාපි වා පන ලෝහිච්ච, පුරිසෝ අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස ඒවමස්ස: අයං අහි, අයං කරණ්ඩෝ, අඤ්ඤෝ අහි, අඤ්ඤේ කරණ්ඩෝ, කරණ්ඩාත්වේව අහි උබ්භතෝ"ති. ඒවමේව ඛෝ ලෝහිච්ච භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ මනෝමයං කායං අභිනිම්මින්නාය චිත්තං අභිනීහරති

අභිනින්නාමේති. සෝ ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගපච්චංගිං අහීනින්ද්‍රියං.

පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් මුඤ්ජතණ ගසෙන් තණ ගොබය ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. මේ මුඤ්ජතණ ගස යි, මේ තණ ගොබය යි. එතකොට මුඤ්ජතණ ගස වෙන එකක්. තණ ගොබය වෙන එකක්. නමුත් මුඤ්ජතණ ගසෙන් ම යි තණ ගොබය ඇදල ගත්තේ කියලා. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් කොපුවෙන් කඩුවක් ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ කඩුව යි. මේ කොපුව. එතකොට කඩුව අනෙකක්, කොපුව අනෙකක්. නමුත් කොපුවෙන් තමයි කඩුව ඇදල ගත්තේ" කියලා. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් නයි පෙට්ටියෙන් නයෙකුව ඇදල ගන්නවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේ තමයි නයා. මේක නයිපෙට්ටිය. එතකොට නයා අනෙකෙක්. නයි පෙට්ටිය අනෙකක්. නමුත් නයි පෙට්ටියෙන් තමයි නයාව ඇදල ගත්තේ" කියලා. පින්වත් ලෝහිච්ච, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, මනෝමය කයක් විශේෂයෙන් මැවීම පිණිස සිත යොමු කරයි. ඒ දෙසට ම නතු කරයි. ඉතින් ඔහු මේ කයෙන් වෙනත් වූ සියළු අහපසහ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා.

74. යම්පි ලෝහිච්ච භික්ඛු එවං සමාහිතේ චිත්තේ ..... අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනෝමයං සබ්බංගපච්චංගිං අහීන්ද්‍රියං, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

74. පින්වත් ලෝහිච්ච, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... මේ කයෙන් වෙනත් වූ සියළු අහපසහ ඇති, නොපිරිහුණු ඉඳුරන් ඇති රූපී මනෝමය කයක් විශේෂ කොට මවනවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

75. යස්මිං ඛෝ ලෝහිච්ච සත්ථරි සාවකෝ ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡති අයම්පි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

75. පින්වත් ලෝහිච්ච, යම් කිසි ශාස්තෘවරයෙක් වෙත පැමිණි ශ්‍රාවකයා මෙබඳු වූ උදාර විශේෂත්වයන් ශාක්ෂාත් කරනවා නම්, පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් නොවේ. යම් කිසි කෙනෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඒ ශාස්තෘවරයා තුළ නෑ. එය අසත්‍යයක්. අධාර්මික යි. වැරදියි.

76. **සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝ'පි හුත්වා බහුධා හෝති, බහුධා'පි හුත්වා ඒකෝ හෝති, ආවීභාවං තිරෝභාවං තිරෝකුඩ්ඩං තිරෝපාකාරං තිරෝපබ්බතං අසජ්ජමානෝ ග-ඡති සෙය්‍යථාපි ආකාසේ, පඨවියාපි උම්මුජ්ජනිම්මුජ්ජං කරෝති සෙය්‍යථාපි උදකේ, උදකේපි අභිජ්ජමානේ ග-ඡති සෙය්‍යථාපි පඨවියං, ආකාසේති පල්ලංකේන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණෝ, ඉමේපි චන්දිමසූරියේ ඒවම්මහිද්ධිකේ ඒවම්මහානුභාවේ පාණිනා පරාමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලෝකා'පි කායේන වසං වත්තේති.**

76. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාස්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි. එයට සිත නතු කරයි. තනි කෙනෙක්ව ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. බොහෝ දෙනෙක් වශයෙන් ඉඳගෙන එක්කෙනෙක් වශයෙන් පෙනී සිටිනවා. පෙනෙන්ට සළස්වනවා. නො පෙනී යනවා. බිත්තිය විනිවිද, ප්‍රාකාරය විනිවිද, පර්වතය විනිවිද කිසිවක් හා නො ගැටී, අහසේ යන්නාක් මෙන් යනවා. ජලයේ වගේ පොළොවෙහි කිදාබැසීමත්, උඩට මතුවීමත් කරනවා. පොළොව මතුපිට වගේ ජලය මත නො ගිලී ඇවිද යනවා. අහසෙහි පියාසරණ කුරුල්ලන් පරිද්දෙන් පළඟක් බැඳ ගෙන අහසේ යනවා. මේසා මහත් ඉර්ධි ඇති, මහානුභාව ඇති හිරු සඳු පවා අතින් අල්ලනවා. පිරිමඳිනවා. බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා.

77. **සෙය්‍යථාපි ලෝහිච්ච, දක්ඛෝ කුම්භකාරෝ වා කුම්භ-කාරන්තේවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදේව භාජනවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථාපි වා පන**

ලෝහිච්ච, දක්ඛෝ දන්තකාරෝ වා දන්තකාරන්තේවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදේව දන්තවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථාපි වා පන ලෝහිච්ච, දක්ඛෝ සුවණ්ණකාරෝ වා සුවණ්ණකාරන්තේවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදේව සුවණ්ණවිකතිං ආකංඛෙය්‍ය තං තදේව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. ඒවමේව ඛෝ ලෝහිච්ච, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං ඉද්ධිවිධං ප-චනුභෝති, ඒකෝ'පි හුත්වා බහුධා හෝති ..... යාව බ්‍රහ්මලෝකා'පි කායේන වසං වත්තේති.

73. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ මැටිටෙන් යම් ම ආකාරයේ භාජනයක් හදන්ට කැමැති නම්, ඒ ඒ ආකාරයේ බඳුන් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. දක්ෂ ඇත්දත් කැටයම්කරුවෙක් හෝ ඇත්දත් කැටයම්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ ඇත්දතක යම් ම ආකාරයේ ඇත් දළ කැටයමක් කරන්ට කැමති නම්, ඒ ඒ ආකාරයේ ඇත් දළ කැටයම් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. දක්ෂ රන් කැටයම්කරුවෙක් හෝ රන් කැටයම්කරුවෙකු ගේ අතවැසියෙක් ඉන්නවා. ඔහු ඉතා හොඳින් සකස් කළ රනක යම් ම ආකාරයේ රන් කැටයමක් කරන්ට කැමති නම්, ඒ ඒ ආකාරයේ රන් කැටයම් හදනවා. විශේෂයෙන් නිර්මාණය කරනවා. පින්වත් ලෝහිච්ච, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වැනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, ඉර්ධි ප්‍රාතිහාර්ය පිණිස සිත මෙහෙයව යි. එයට සිත නතු කරයි. තනි කෙනෙක් ඉඳගෙන බොහෝ දෙනෙක් වශයෙන් වශයෙන් පෙනී සිටිනවා ..... බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා.

යම්පි ලෝහිච්ච භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... යාව බ්‍රහ්මලෝකා'පි කායේන වසං වත්තේති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

පින්වත් ලෝහිච්ච, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... බඹලොව දක්වා ම කයෙන් වශී කරගෙන ඉන්නවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

78. යස්මිං ඛෝ ලෝහිච්ච සත්ථරි සාවකෝ ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡති අයම්පි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

78. පින්වත් ලෝහිච්ච, යම් කිසි ශාස්තෘවරයෙක් වෙත පැමිණි ශ්‍රාවකයා මෙබඳු වූ උදාර විශේෂත්වයන් ශාක්ෂාත් කරනවා නම්, පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් නොවේ. යම් කිසි කෙනෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඒ ශාස්තෘවරයා තුළ නෑ. එය අසත්‍යයක්. අධාර්මික යි. වැරදියි.

79. සෝ එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බාය සෝතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච. සෙය්‍යථාපි ලෝහිච්ච, පුරිසෝ අද්ධානමග්ගපටිපන්නෝ සෝ සුණෙය්‍ය භේරිසද්දම්'පි මුදිංගසද්දම්'පි සංඛපණවදෙණ්ඩිමසද්දම්'පි, තස්ස එවමස්ස: භේරසද්දෝ ඉති'පි මුදිංගසද්දෝ ඉති'පි සංඛපණවදෙණ්ඩිමසද්දෝ ඉති'පි. එවමේව ඛෝ ලෝහිච්ච භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ දිබ්බාය සෝතධාතුයා චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බාය සෝතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච.

79. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා. එයට සිත නතු කරනවා. එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන්

මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. දුගු ගමනකට පිළිපන් පුරුෂයෙක් ඉන්නවා. ඔහු බෙර හඬත්, මිහිඟු බෙර හඬත්, සක්, පනා බෙර, ගැට බෙර හඬත් අසනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක බෙර හඬක්, මේ තමයි මිහිඟු බෙර හඬ, මේක සක් හඬ, මේක පනා බෙර හඬ, මේක ගැට බෙර හඬ" කියලා. පින්වත් ලෝහිච්ච, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වින්‍යෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, දිව්‍ය වූ ශ්‍රවණය පිණිස සිත යොමු කරනවා. එයට සිත නතු කරනවා. එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා.

80. යම්පි ලෝහිච්ච භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... උභෝ සද්දේ සුණාති දිබ්බේ ච මානුසේ ච යේ දූරේ සන්තිකේ ච, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

80. පින්වත් ලෝහිච්ච, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... එතකොට ඔහු මිනිසුන් ගේ සවන් දීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ, දිව්‍ය වූ ශ්‍රවණයෙන් මානුෂික වූත්, දිව්‍ය වූත් දෙයාකාර වූ දුර ළඟ ශබ්දයන් අසනවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

81. යස්මිං ඛෝ ලෝහිච්ච සත්ථරි සාවකෝ ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡති අයම්පි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

81. පින්වත් ලෝහිච්ච, යම් කිසි ශාස්තෘවරයෙක් වෙත පැමිණි ශ්‍රාවකයා මෙබඳු වූ උදාර විශේෂත්වයන් ශාක්ෂාත් කරනවා නම්, පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් නොවේ. යම් කිසි කෙනෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඒ ශාස්තෘවරයා තුළ නෑ. එය අසත්‍යයක්. අධාර්මික යි. වැරදියි.

82. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ චේතෝපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ පරසත්තානං

පරපුග්ගලානං ෙ-තසා ෙ-තෝ පරි-ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති, වීතදෝසං වා චිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති, සමෝහං වා චිත්තං සමෝහං චිත්තන්ති පජානාති, වීතමෝහං වා චිත්තං වීතමෝහං චිත්තන්ති පජානාති, සංඛිත්තං වා චිත්තං සංඛිත්තං චිත්තන්ති පජානාති, වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති, මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති, සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති, අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති, සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති, අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති, විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

82. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, අනුන් ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා. රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. රාග රහිත සිත වීතරාගී සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ රහිත සිත වීතදෝසී සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ සහිත සිත මෝහ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ රහිත සිත වීතමෝහී සිතක් වශයෙන් දැන ගන්නවා. හැකුළුනු සිත හැකිළුණු සිතක් වශයෙන් දැන ගන්නවා. විසිරුණු සිත විසිරුණු සිතක් වශයෙන් දැන ගන්නවා. සමාධිමත් සිත සමාධිමත් සිතක් වශයෙන් දැන ගන්නවා. සමාධි රහිත සිත සමාධි රහිත සිතක් වශයෙන් දැන ගන්නවා. නො දියුණු සිත නො දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා. දියුණු සිත දියුණු සිතක් වශයෙන් දැන ගන්නවා. එකඟ වෙන සිත එකඟ වෙන සිතක් වශයෙන් දැන ගන්නවා. එකඟ නො වෙන සිත එකඟ නො වෙන සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් මිදුණු සිත කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා.

83. සෙය්‍යථාපි **ලෝහිච්ච**, ඉත්ථී වා පුරිසෝ වා දහරෝ වා යුවා මණ්ඩනකජාතිකෝ ආදාසේ වා පරිසුද්ධේ පරියෝදාතේ අ-ඡේ වා උදකපත්තේ සකං මුඛනිමිත්තං ප-චවෙක්ඛමානෝ සකණිකං වා සකණිකන්ති ජානෙය්‍ය, අකණිකං වා අකණිකන්ති ජානෙය්‍ය. එවමේව ඛෝ **ලෝහිච්ච**, භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ෙ-තෝපරියඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ පරසත්තානං පරපුග්ගලානං ෙ-තසා ෙ-තෝ පරි-ච පජානාති: සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති, සදෝසං වා චිත්තං සදෝසං චිත්තන්ති පජානාති, වීතදෝසං වා චිත්තං වීතදෝසං චිත්තන්ති පජානාති, සමෝහං වා චිත්තං සමෝහං චිත්තන්ති පජානාති, වීතමෝහං වා චිත්තං වීතමෝහං චිත්තන්ති පජානාති, සංඛිත්තං වා චිත්තං ..... වික්ඛිත්තං වා චිත්තං ..... මහග්ගතං වා චිත්තං ..... අමහග්ගතං වා චිත්තං ..... සඋත්තරං වා චිත්තං ..... අනුත්තරං වා චිත්තං ..... සමාහිතං වා චිත්තං ..... අසමාහිතං වා චිත්තං ..... විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

83. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. ලස්සනට සැරසෙන්ට කැමති ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දරුවෙක් හෝ තරුණයෙක් හෝ ඉන්නවා. ඔහු පිරිසිදු දීප්තිමත් කණ්ණාඩියක් ඉදිරියේ හෝ පැහැදිලි දිය ඇති බඳුනකින් හෝ තමන් ගේ මුව මඩල හොඳින් විමසා බලනවා. එතකොට දොස් ඇති තැන දොස් ඇති තැන වශයෙන් දැන ගන්නවා. දොස් නැති තැන දොස් නැති තැන වශයෙන් දැන ගන්නවා. පින්වත් ලෝහිච්ච, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අනුන් ගේ සිත් පිරිසිඳ දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. එතකොට ඔහු වෙනත් සත්වයන් ගේ වෙනත් පුද්ගලයන් ගේ සිත තම සිතින් පිරිසිඳ දැන ගන්නවා. රාග සහිත සිත රාග සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. රාග රහිත සිත වීතරාගී සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ සහිත සිත ද්වේශ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. ද්වේශ රහිත සිත වීතදෝසී සිතක් වශයෙන් දැන ගන්නවා.

මෝහ සහිත සිත මෝහ සහිත සිතක් වශයෙන් දැන ගන්නවා. මෝහ රහිත සිත වීතමෝහී සිතක් වශයෙන් දැන ගන්නවා. හැකුළුනු සිත ..... විසිරුණු සිත ..... සමාධිමත් සිත ..... සමාධි රහිත සිත ..... නො දියුණු සිත ..... දියුණු සිත ..... එකඟ වෙන සිත ..... එකඟ නො වෙන සිත ..... කෙලෙසුන්ගෙන් මිදුණු සිත කෙලෙසුන්ගෙන් මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා.

84. යම්පි ලෝහිච්ච භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

84. පින්වත් කේවඩ්ඪ, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... කෙලෙසුන්ගෙන් නො මිදුණු සිත කෙලෙසුන්ගෙන් නො මිදුණු සිතක් වශයෙන් දැන ගන්නවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

85. යස්මිං ඛෝ ලෝහිච්ච සත්ථරි සාවකෝ ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡති අයම්පි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

85. පින්වත් ලෝහිච්ච, යම් කිසි ශාස්තෘවරයෙක් වෙත පැමිණි ශ්‍රාවකයා මෙබඳු වූ උදාර විශේෂත්වයන් ශාක්ෂාත් කරනවා නම්, පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් නොවේ. යම් කිසි කෙනෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඒ ශාස්තෘවරයා තුළ නෑ. එය අසත්‍යයක්. අධාර්මික යි. වැරදියි.

86. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යාථීදං: ඒකම්'පි ජාතිං, ද්වේ'පි ජාතියෝ, තිස්සෝපි ජාතියෝ, චතස්සෝපි ජාතියෝ, පඤ්චපි ජාතියෝ, දසපි ජාතියෝ, වීසම්'පි ජාතියෝ, තිංසම්'පි ජාතියෝ, චත්තාරීසම්'පි ජාතියෝ, පඤ්ඤාසම්'පි ජාතියෝ, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනේකේ'පි සංවට්ටකප්පේ, අනේකේ'පි විවට්ටකප්පේ, අනේකේ'පි

සංවට්ටවිවට්ටකප්පේ, අමුත්‍රාසිං එවන්නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං. තත්‍රූපාසිං එවන්නාමෝ එවංගොත්තෝ එවංවණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති.

86. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. ඉතින් ඔහු නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක්, ජීවිත දෙකක්, ජීවිත තුනක්, ජීවිත හතරක්, ජීවිත පහක්, ජීවිත දහයක්, ජීවිත විස්සක්, ජීවිත තිහක්, ජීවිත හතළිහක්, ජීවිත පනහක්, ජීවිත සියයක්, ජීවිත දහසක්, ජීවිත ලක්ෂයක්; අනේකවිධ වූ සංවට්ට කල්පයන් ද, අනේකවිධ වූ විවට්ට කල්පයන් ද, අනේකවිධ වූ සංවට්ට විවට්ට කල්පයන් ද සිහි කරනවා. මං ඉස්සර සිටියේ අසවල් තැන, එතකොට මගේ නම මේක යි. ගෝත්‍ර නාමය මේක යි. හැඩරුව මෙහෙම යි. කෑම බීම මෙහෙම යි. දුක් සැප වින්දේ මේ විදිහට යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. ඒ මං එතැනින් චුත වුණා. අසවල් තැන උපන්නා. එතකොට මගේ නම වුණේ මේක යි. ගෝත්‍රනාමය මේක යි. හැඩරුව වුණේ මෙහෙමයි. කෑවේ බිව්වේ මෙහෙම යි. සැප දුක් වින්දේ මෙහෙම යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. මං එතැනින් චුත වුණා. මේ ලෝකෙ උපන්නා" ආදී වශයෙන් ආකාර සහිතව සවිස්තරව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා

87. **සෙය්‍යථාපි ලෝහිච්ච පුරිසෝ සකම්හා ගාමා අඤ්ඤං ගාමං ග-ඡෙය්‍ය තම්හා'පි ගාමා අඤ්ඤං ගාමං ග-ඡෙය්‍ය. සෝ තම්හා ගාමා සකඤ්ඤේව ගාමං ප-ච්චාග-ඡෙය්‍ය. තස්ස එවමස්ස: "අහං ඛෝ සකම්හා ගාමං අමුං ගාමං ආග-ඡිං තත්‍ර එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහෝසිං. තම්හා'පි ගාමා අමුං ගාමං අග-ඡිං තත්‍රාපි එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හී අහෝසිං. සෝ'මිහි තම්හා ගාමා සකඤ්ඤේව ගාමං ප-ච්චාගතෝති." එවමේව ඛෝ ලෝහිච්ච, භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ**

මුදුහුතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ පුබ්බේනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ අනේකවිහිතං පුබ්බේ නිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්'පි ජාතිං, ද්වේ'පි ජාතියෝ, තිස්සෝපි ජාතියෝ, චතස්සෝපි ජාතියෝ, පඤ්චපි ජාතියෝ, දසපි ජාතියෝ, වීසම්'පි ජාතියෝ, තිංසම්'පි ජාතියෝ, චත්තාරීසම්'පි ජාතියෝ, පඤ්ඤාසම්'පි ජාතියෝ, ජාතිසතම්පි, ජාතිසහස්සම්පි, ජාතිසතසහස්සම්පි; අනේකේ'පි සංවට්ටකප්පේ, අනේකේ'පි විවට්ටකප්පේ, අනේකේ'පි සංවට්ට-විවට්ටකප්පේ, අමුත්‍රාසිං එවන්නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං. තත්‍රූපාසිං එවන්නාමෝ එවංගොත්තෝ එවංවණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවේදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝති. ඉති සාකාරං සඋද්දේසං අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති.

87. පින්වත් ලෝහිච්ච, එක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමන් ගේ ගමෙන් වෙනත් ගමකට යනවා. ඒ ගමෙන් තවත් ගමකට යනවා. ඒ ගමෙන් යළි තමන් ගේ ගමට එනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං මගේ ගමෙන් අසවල් ගමට ගියා. මං එහෙදී මෙහෙමයි හිටියේ. මෙහෙමයි වාඩි වුණේ. මෙහෙමයි කතාබහ කළේ. මෙහෙමයි නිශ්ශබ්දව සිටියේ. ඉතින් මං ඒ ගමෙනුත් අසවල් ගමට ගියා. එහෙ හිටියේ මේ විදිහට යි. වාඩි වුණේ මේ විදිහට යි. කථාබස් කළේ මේ විදිහට යි. නිහඬව සිටියේ මේ විදිහට යි. ඒ මං ඒ ගමෙන් මගේ ගමටම නැවත ආවා" කියලා. පින්වත් ලෝහිච්ච, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, කලින් ජීවිතය ගත කළ ආකාරය දන්නා නුවණ පිණිස සිත යොමු කරයි. එයට සිත නතු කරයි. ඉතින් ඔහු නොයෙක් ආකාරයෙන් කලින් ජීවිත ගෙවූ හැටි (ආපස්සට) සිහි කරනවා. ඒ කියන්නේ: එක ජීවිතයක්, ජීවිත දෙකක්, ජීවිත තුනක්, ජීවිත හතරක්, ජීවිත පහක්, ජීවිත දහයක්, ජීවිත විස්සක්, ජීවිත තිහක්, ජීවිත හතළිහක්, ජීවිත පනහක්, ජීවිත සියයක්, ජීවිත දහසක්, ජීවිත ලක්ෂයක්, අනේකවිධ වූ සංවට්ට කල්පයන් ද, අනේකවිධ වූ විවට්ට කල්පයන් ද, අනේකවිධ වූ සංවට්ට විවට්ට කල්පයන් ද සිහි කරනවා. මං ඉස්සර සිටියේ අසවල් තැන, එතකොට මගේ නම මේක යි. ගෝත්‍ර නාමය මේක යි. හැඩරුව මෙහෙම යි. කෑම බීම මෙහෙම යි. දුක් සැප වින්දේ මේ විදිහට යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. ඒ මං එතැනින්

චුත වුණා. අසවල් තැන උපන්නා. එතකොට මගේ නම වුණේ මේක යි. ගෝත්‍රනාමය මේක යි. හැඩරුව වුණේ මෙහෙමයි. කෑවේ බිව්වේ මෙහෙම යි. සැප දුක් වින්දේ මෙහෙම යි. මේ විදිහට යි ජීවිතය අවසන් වුණේ. මං එතැනින් චුත වුණා. මේ ලෝකෙ උපන්නා" ආදී වශයෙන් ආකාර සහිතව සවිස්තරව අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා.

යම්පි ලෝහිච්ච භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤෑය.

පින්වත් ලෝහිච්ච, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... අනේක ප්‍රකාර වූ කලින් ගත කළ ජීවිත ගැන සිහි කරනවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

88. යස්මිං ඛෝ ලෝහිච්ච සත්ථරි සාවකෝ ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡති අයම්පි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

88. පින්වත් ලෝහිච්ච, යම් කිසි ශාස්තෘවරයෙක් වෙත පැමිණි ශ්‍රාවකයා මෙබඳු වූ උදාර විශේෂත්වයන් ශාක්ෂාත් කරනවා නම්, පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් නොවේ. යම් කිසි කෙනෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඒ ශාස්තෘවරයා තුළ නෑ. එය අසත්‍යයක්. අධාර්මික යි. වැරදියි.

89. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානති: ඉමේ වත භොන්තෝ සත්තා කායදු-චරිතේන සමන්නාගතා, වචිදු-චරිතේන සමන්නාගතා, මනෝදු-චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මි-ඡාදිට්ඨිකා, මි-ඡාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමේ වා පන භොන්තෝ සත්තා කායසුචරිතේන

සමන්නාගතා, වචීසුචරිතේන සමන්නාගතා, මනෝසුචරිතේන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නාති. ඉති දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති.

89. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා නුවණ පිණිස සිත පිහිටුවනවා. එයට සිත නතු කරනවා. එතකොට ඒ භික්ෂුව මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. "අහෝ! මේ භවත් සත්වයන් කයින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, මනසින් දුෂ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයේ ඉපදිලා ඉන්නවා. ඒ වගේ ම මේ භවත් සත්වයන් කයින් සුචරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් සුචරිතයෙහි යෙදීම නිසා, මනසින් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නොකොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ සුගති නම් වූ, ස්වර්ග ලෝකයෙහි ඉපදිලා ඉන්නවා" කියලා. මේ විදිහට මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා.

90. **සෙය්‍යථාපි ලෝහිච්ච, මජ්ඣේඩි සිංසාටකේ පාසාදෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ ඨිතෝ පස්සෙය්‍ය මනුස්සේ ගේහං පවිසන්තේ'පි නික්ඛමන්තේ'පි රථියා වීතිසඤ්චරන්තේ'පි මජ්ඣේඩි සිංසාටකේ නිසින්නේ'පි, තස්ස එවමස්ස: "එතේ මනුස්ස ගේහං පවිසන්ති. එතේ නික්ඛමන්ති. එතේ රථියා වීතිසඤ්චරන්ති. එතේ මජ්ඣේඩි සිංසාටකේ නිසින්නා"ති. එවමේව ඛෝ ලෝහිච්ච, භික්ඛු එවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ**

විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උපපජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානති: ඉමේ වත භොන්තෝ සත්තා කායදු-චරිතේන සමන්නාගතා, වචිදු-චරිතේන සමන්නාගතා, මනෝදු-චරිතේන සමන්නාගතා, අරියානං උපවාදකා, මි-ඡාදිට්ඨිකා, මි-ඡාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමේ වා පන භොන්තෝ සත්තා කායසුචරිතේන සමන්නාගතා, වචිසුචරිතේන සමන්නාගතා, මනෝසුචරිතේන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා, තේ කායස්ස භේදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපන්නාති. ඉති දිබ්බේන චක්ඛුනා විසුද්ධේන අතික්කන්තමානුසකේන සත්තේ පස්සති චවමානේ උප්පජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ. යථාකම්මූපගේ සත්තේ පජානාති.

90. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. හතරමං හන්දියක තට්ටු නිවසක් තියෙනවා. එහි ඇස් ඇති පුරුෂයෙක් සිටගෙන බලාගෙන ඉන්නවා. ඔහු (පහළ) ගෙට ඇතුළ් වන්නා වූත්, නික්මෙන්නා වූත්, වීදියේ එහාට මෙහාට ඇවිදින්නා වූත්, හතරමං හන්දිය මැද වාඩි වී සිටින්නා වූත් මිනිසුන් දකිනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා "මේ මිනිසුන් ගෙට ඇතුළු වෙනවා. මේ උදවිය ගෙයින් නික්මෙනවා. මේ උදවිය වීදියේ එහාට මෙහාට ඇවිදිනවා. මේ උදවිය හතරමං හන්දිය මැද වාඩි වෙලා ඉන්නවා" කියලා. පින්වත් ලෝහිච්ච, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වින්‍යම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, සත්වයන් ගේ චුතියත් උපතත් දකිනා ඤාණ පිණිස සිත පිහිටුවනවා. එයට සිත නතු කරනවා. එතකොට ඒ භික්ෂුව මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිව්‍යමය චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. "අහෝ! මේ භවත් සත්වයන් කයින් දුශ්චරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් දුශ්චරිතයෙහි යෙදීම නිසා, මනසින් දුශ්චරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස කරලා, මිසදිටු වෙලා, මිසදිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ අපාය

නම් වූ දුගතිය නම් වූ විනිපාත නම් වූ නිරයේ ඉපදිලා ඉන්නවා. ඒ වගේ ම මේ භවත් සත්වයන් කයින් සුචරිතයෙහි යෙදීම නිසා, වචනයෙන් සුචරිතයෙහි යෙදීම නිසා, මනසින් සුචරිතයෙහි යෙදීම නිසා, ආර්යයන් වහන්සේලාට අපහාස නො කොට, සම්දිටු වෙලා, සම්දිටු දේවල් සමාදන් වෙලා ඉඳල තියෙනවා. ඔවුන් කය බිඳී මරණයෙන් මත්තේ සුගති නම් වූ, ස්වර්ග ලෝකයෙහි ඉපදිලා ඉන්නවා" කියලා. මේ විදිහට මිනිසුන් ගේ දැකීමේ හැකියාව ඉක්මවා ගිය පිරිසිදු වූ දිවැසින් චුත වන්නා වූත්, උපදින්නා වූත් සත්වයන් දකිනවා. ඒ ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා.

යම්පි ලෝහිච්ච භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... සුගතේ දුග්ගතේ යථාකම්මූපගේ සත්තේ පජානාති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤය.

පින්වත් ලෝහිච්ච, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... ඒ කර්මයන්ට අනුව හීන ප්‍රණීත වූත්, යහපත් අයහපත් වූත්, සුගති දුගතිවල සිටින්නා වූ සත්වයන් දකිනවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

91. යස්මිං ඛෝ ලෝහිච්ච සත්ථරි සාවකෝ ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡති අයම්පි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

91. පින්වත් ලෝහිච්ච, යම් කිසි ශාස්තෘවරයෙක් වෙත පැමිණි ශ්‍රාවකයා මෙබඳු වූ උදාර විශේෂත්වයන් ශාක්ෂාත් කරනවා නම්, පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් නොවේ. යම් කිසි කෙනෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඒ ශාස්තෘවරයා තුළ නෑ. එය අසත්‍යයක්. අධාර්මික යි. වැරදියි.

92. සෝ ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමේ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයෝ'ති යථාභූතං

පජානාති. අයං ආසවනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. තස්ස මේ එවං ජානතෝ එවං පස්සතෝ කාමාසවා'පි චිත්තං විමු-චති. භවාසවා'පි චිත්තං විමු-චති. අවිජ්ජාසවා'පි චිත්තං විමු-චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

92. ඔහු (ඒ භික්ෂුව) ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාෂ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (විනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, අකම්පිතව පිහිටි විට, ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා. එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මේවා ආශ්‍රවයන් කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රවයන් ගේ හට ගැනීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස් වුණ බවට ඤාණය ඇති වෙනවා. "ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා.

93. සෙය්‍යථාපි ලෝහිච්ච, පබ්බතසංඛේපේ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්ථ චක්ඛුමා පුරිසෝ තීරේ ඨිතෝ පස්සෙය්‍ය සිප්පිසම්බුකම්'පි සක්ඛරකඨලම්'පි ම-ඡගුම්බම්'පි චරන්තම්'පි තිට්ඨන්තම්'පි. තස්ස එවමස්ස: අයං ඛෝ උදකරහදෝ අ-ඡෝ විප්පසන්නෝ අනාවිලෝ. තත්‍රිමේ සිප්පිසම්බුකා'පි සක්ඛරකඨලා'පි ම-ඡගුම්බා'පි චරන්ති'පි තිට්ඨන්ති'පීති.

93. පින්වත් ලෝහිච්ච, ඒක මේ වගේ දෙයක්. පර්වත මුදුනක ජලාශයක් තියෙනවා. එහි ජලය ඉතා හොඳ යි. හරිම ප්‍රසන්න යි. කැළඹිලා නෑ. එතැන ඇස් ඇති පුරුෂයෙක් ඒ ඉවුරේ සිටගෙන ජලාශය දෙස බලා සිටිනවා. එතකොට ඔහුට සිප්පිබෙල්ලනුත්, සක්බෙල්ලනුත්, කැටකැබලිත්, මාළු රංචු ආදියත් හැසිරෙන අයුරු, සිටින අයුරු දකින්ට ලැබෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මේක ඉතා හොඳ ජලය ඇති හරිම ප්‍රසන්න වූ නො කැළඹුණු දිය ඇති විලක්. මෙහි මේ සිප්පිබෙල්ලන්, සක්බෙල්ලන්, කැටකැබලිති, මාළු රංචුත් හැසිරෙනවා නෙව. ඉන්නවා නෙව" කියල.

94. **ඒවමේව ඛෝ ලෝහිච්ච, භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ පරිසුද්ධේ පරියෝදාතේ අනංගණේ විගතූපක්කිලේසේ මුදුභූතේ කම්මනියේ ඨිතේ ආනෙඤ්ජප්පත්තේ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමේති. සෝ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛ-සමුදයෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. ඉමේ ආසවා'ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධෝ'ති යථාභූතං පජානාති. අයං ආසවනිරෝධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති.**

94. පින්වත් ලෝහිච්ච, අන්න ඒ විදිහම යි භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට, සිත පිරිසිදු වූ විට, ප්‍රභාශ්වර වූ විට, කෙලෙසුන්ගෙන් බාධා රහිත වූ විට, උපක්ලේශ බැහැර වූ විට, මෘදුබවට පත් වූ විට, කර්මණ්‍ය (වීනෑම දෙයකට හැරවිය හැකි පරිදි සකස්) වූ විට, ස්ථිරව පිහිටි විට, ආශ්‍රවයන් ක්ෂය වීම පිළිබඳ දන්නා නුවණ පිණිස සිත පිහිටුවනවා. සිත එයට නතු කරනවා. එතකොට ඔහු මෙය දුක නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුකේ හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම නම් වූ ආර්ය සත්‍යය යි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය දුක නිරුද්ධ වීම පිණිස පවතින මාර්ගය නම් වූ ආර්ය සත්‍යයයි කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මේවා ආශ්‍රවයන් කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රවයන් ගේ හට ගැනීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා. මෙය ආශ්‍රව නිරුද්ධ වීම පිණිස පවතින ප්‍රතිපදාව කියල යථාර්ථ වශයෙන් ම දැන ගන්නවා.

95. තස්ස මේ ඒවං ජානතෝ ඒවං පස්සතෝ කාමාසවා'පි චිත්තං විමු-චති. භවාසවා'පි චිත්තං විමු-චති. අවිජ්ජාසවා'පි චිත්තං විමු-චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හෝති ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති.

95. ඒ භික්ෂුව ඔය විදිහට දැන ගනිද්දී, ඔය විදිහට දැක ගනිද්දී කාම ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. භව ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. අවිද්‍යා ආශ්‍රවයන්ගෙන් සිත නිදහස් වෙනවා. නිදහස් වූ විට නිදහස් වුණ බවට ඤාණය ඇති වෙනවා. "ඉපදීම ක්ෂය වුණා. බඹසර වාසය සම්පූර්ණ කළා. කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා.

යම්පි ලෝහිච්ච භික්ඛු ඒවං සමාහිතේ චිත්තේ ..... සකතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති, ඉදම්පි'ස්ස හෝති පඤ්ඤෙය.

පින්වත් ලෝහිච්ච, භික්ෂුව ඔය අයුරින් සිත සමාධිමත් වූ විට ..... කළ යුතු දෙය කළා. නැවත සසරගමනක් නැතැ"යි අවබෝධයෙන් ම දැන ගන්නවා. මෙය අයිතිවන්නෙත් ඔහු ගේ ප්‍රඥාවට ම යි.

96. යස්මිං ඛෝ ලෝහිච්ච සත්ථරි සාවකෝ ඒවරූපං උළාරං විසේසං අධිගච්ඡති අයම්පි ඛෝ ලෝහිච්ච සත්ථා යෝ ලෝකේ න චෝදනාරහෝ යෝ ච පනේවරූපං සත්ථාරං චෝදේති, සා චෝදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

96. පින්වත් ලෝහිච්ච, යම් කිසි ශාස්තෘවරයෙක් වෙත පැමිණි ශ්‍රාවකයා මෙබඳු වූ උදාර විශේෂත්වයන් ශාක්ෂාත් කරනවා නම්, පින්වත් ලෝහිච්ච, මේ ශාස්තෘවරයා ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් නොවේ. යම් කිසි කෙනෙක් මෙබඳු ශාස්තෘවරයෙකුට චෝදනා කරනවා නම්, ඒ චෝදනාව ඒ ශාස්තෘවරයා තුළ නෑ. එය අසත්‍යයක්. අධාර්මික යි. වැරදියි.

97. ඒවං වුත්තේ ලෝහිච්චෝ බ්‍රාහ්මණෝ භගවන්තං ඒතදවෝච: සෙය්‍යථාපි භෝ ගෝතම පුරිසෝ පුරිසං නරකප්පපාතං පපතන්තං කේසේසු ගහෙත්වා උද්ධරිත්වා ථලේ පතිට්ඨාපෙය්‍ය, ඒවමේවාහං භෝතා ගෝතමේන නරකප්පපාතං පපතන්තෝ උද්ධරිත්වා ථලේ පතිට්ඨාපිතෝ. අභික්කන්තං භෝ ගෝතම, අභික්කන්තං භෝ ගෝතම. සෙය්‍යථාපි භෝ ගෝතම

නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරේ වා තේල පජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තෝ රූපානි දක්ඛින්තීති. ඒවමේව භෝතා ගෝතමේන අනේකපරියායේන ධම්මෝ පකාසිතෝ. ඒසාහං භවන්තං ගෝතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. උපාසකං මං භවං ගෝතමෝ ධාරේතු අජ්ජතග්ගේ පාණුපේතං සරණං ගතන්ති.

97. මෙසේ වදාළ විට ලෝහිච්ච බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළ කළා. “භවත් ගෞතමයන් වහන්ස, නරා වලක වැටෙන පුරුෂයෙකු කෙස්වලින් අල්ලා ගෙන ඔසවා ගොඩ තබනවා වගේ, භවත් ගෞතමයන් වහන්සේ ඒ විදිහට ම නරා වලේ වැටෙමින් සිටි මාව ඔසවා ගොඩට ගෙන වදාළා. භවත් ගෞතමයාණන් වහන්ස, ඉතා සුන්දර යි. භවත් ගෞතමයාණන් වහන්ස, ඉතා සුන්දර යි. යටට හරවා තිබූ දෙයක් උඩු අතට හැරෙව්වා වගෙයි. වහලා තිබුණු දෙයක් ඇරලා පෙන්නුවා වගෙයි. මං මුලා වුවන්ට නියම මග පෙන්වා දෙනවා වගෙයි. ඇස් ඇති උදවියට රූප දකින්න අඳුරෙහි තෙල් පහනක් දල්වා ගෙන දරා සිටිනවා වගෙයි. ඔය විදිහට භවත් ගෞතමයාණන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ශ්‍රී සද්ධර්මය වදාළා. ස්වාමීනී, මේ මමත් භවත් ගෞතමයාණන් වහන්සේ ව සරණ යනවා. ශ්‍රී සද්ධර්මයත් ආර්ය මහා සංඝ රත්නයත් සරණ යනවා. භවත් ගෞතමයාණන් වහන්ස, මං ගැන අද පටන් දිවි තිබෙන තුරාවට ම තෙරුවන් සරණ ගිය උපාසකයෙක් ලෙස සළකන සේක්වා!

ලෝහිච්චසුත්තං නිට්ඨිතං ද්වාදසමං.
දොළොස් වෙනි ලෝහිච්ච සූත්‍රය නිමා විය.

සාදු ! සාදු !! සාදු !!!

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට නමස්කාරවේවා!

13.
තේවිජ්ජසුත්තං
ත්‍රිවිද්‍යාව යනු කුමක්දැයි වදාළ දෙසුම

1. එවම්මේසුතං: එකං සමයං භගවා කෝසලේසු චාරිකං චරමානෝ මහතා භික්ඛුසංඝේන සද්ධිං පඤ්චමත්තේහි භික්ඛුසතේහි යේන මනසාකටං නාම කෝසලානං බ්‍රාහ්මණගාමෝ තදවසරි. තත්‍ර සුදං භගවා මනසාකටේ විහරති උත්තරේන මනසාකටස්ස අචිරවතියා නදියා තීරේ අම්බවනේ.

1. මා හට අසන්ට ලැබුණේ මේ විදිහට යි. ඒ දිනවල භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග කොසොල් ජනපදයෙහි චාරිකාවෙහි වඩිද්දී මනසාකට නම් වූ කොසොල් රටවැසියන් ගේ බ්‍රාහ්මණ ගමටත් වැඩම කළා. එහි දී භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටියේ මනසාකට ගමේ මනසාකටයට උතුරින් අචිරවතී නදී තෙර අඹ වනයේ.

2. තේන ඛෝ පන සමයේන සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහ්මණමහාසාලා මනසාකටේ පටිවසන්ති. සෙය්‍යථීදං: චංකි බ්‍රාහ්මණෝ තාරුක්ඛෝ බ්‍රාහ්මණෝ පොක්ඛරසාති බ්‍රාහ්මණෝ ජානුස්සෝනි බ්‍රාහ්මණෝ තොදෙය්‍යෝ බ්‍රාහ්මණෝ, අඤ්ඤේ ච අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහ්මණමහාසාලා.

2. ඒ දිනවල ඉතාමත් ප්‍රසිද්ධ වූ, බොහෝ ප්‍රසිද්ධ වූ, සම්භාවනීය බ්‍රාහ්මණයන් බොහෝ දෙනෙක් මනසාකට ගමේ වාසය කළා. ඒ කියන්නේ චංකී බ්‍රාහ්මණයා, තාරුක්ඛ බ්‍රාහ්මණයා, පොක්ඛරසාති බ්‍රාහ්මණයා, ජානුස්සෝනි බ්‍රාහ්මණයා, තෝදෙය්‍ය බ්‍රාහ්මණයා ආදී තවත් ඉතා ප්‍රසිද්ධ, බොහෝ ප්‍රසිද්ධ, සම්භාවනීය බ්‍රාහ්මණයන් වාසය කළා.

3. අථ ඛෝ වාසෙට්ඨ - භාරද්වාජානං ජංඝාවිහාරං අනුචංකමන්තානං අනුවිචරන්තානං මග්ගාමග්ගේ කථා උදපාදි. අථ ඛෝ වාසෙට්ඨෝ මාණවෝ ඒවමාහ: "අයමේව උජුමග්ගෝ අයමඤ්ජසායනෝ නිය්‍යානිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය ය්වායං අක්ඛාතෝ බ්‍රාහ්මණේන පොක්ඛරසාතිනා"ති.

3. එදා වාසෙට්ඨ, භාරද්වාජ යන බ්‍රාහ්මණ වංශික තරුණයන් දෙදෙනා ව්‍යායාම පිණිස ඔබමොබ ඇවිදගෙන යද්දී ඔවුන් අතර කථාවක් ඇති වුණා. වාසෙට්ඨ මාණවකයා මෙහෙම කිව්වා. "පොක්ඛරසාතී බ්‍රාහ්මණයා විසින් යම් මගක් කියා තිබෙනවා ද, ඒක ම තමයි බඹ ලොව උපදින්ට තියෙන සෘජු මාර්ගය. ඒක ම තමයි එක ම මාවත. ඔය මාර්ගය විතරම යි ඒ සඳහා තියෙන්නේ" කියල.

4. **භාරද්වාජෝ මාණවෝ ඒවමාහ: "අයමේව උජුමග්ගෝ අයමඤ්ජසායනෝ නිය්‍යානිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය යදිදං අක්ඛාතෝ බ්‍රාහ්මණේන තාරුක්ඛේනා"ති. නේව ඛ්වාසක්ඛි වාසෙට්ඨෝ මාණවෝ භාරද්වාජං මාණවං සඤ්ඤාපේතුං, න පනාසක්ඛි භාරද්වාජෝ මාණවෝ වාසෙට්ඨං මාණවං සඤ්ඤාපේතුං.**

4. එතකොට භාරද්වාජ මාණවකයා මෙහෙම කිව්වා. "තාරුක්ඛ බ්‍රාහ්මණයා විසින් යම් මගක් කියා තිබෙනවා ද, ඒක ම තමයි බඹ ලොව උපදින්ට තියෙන සෘජු මාර්ගය. ඒක ම තමයි එක ම මාවත. ඔය මාර්ගය විතරම යි ඒ සඳහා තියෙන්නේ" කියල. වාසෙට්ඨ මාණවකයා හට තම මතය භාරද්වාජ මාණවකයා හට දැනුවත් කරන්ට නො හැකි වුණා. වාසෙට්ඨ මාණවකයා හට තම මතය භාරද්වාජ මාණවකයා හට දැනුවත් කරන්ට නො හැකි වුණා. භාරද්වාජ මාණවකයා හටත් තම මතය වාසෙට්ඨ මාණවකයා හට දැනුවත් කරන්ට නො හැකි වුණා.

5. **අථ ඛෝ වාසෙට්ඨෝ මාණවෝ භාරද්වාජං මාණවං ආමන්තේසි: අයං ඛෝ භාරද්වාජ, සමණෝ ගෝතමෝ සක්‍යපුත්තෝ සක්‍යකුලා පබ්බජිතෝ මනසාකටේ විහරති උත්තරේන මනසාකටස්ස අචිරවතියා නදියා තීරේ අම්බවනේ. තං ඛෝ පන භවන්තං ගෝතමං ඒවං කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගතෝ: ඉතිපි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති. ආයාම භෝ භාරද්වාජ යේන සමණෝ ගෝතමෝ තේනුපසංකමිස්සාම. උපසංකමිත්වා ඒතමත්ථං සමණං ගෝතමං පුච්ඡිස්සාම. යථා නෝ සමණෝ ගෝතමෝ ව්‍යාකරිස්සති තථා නං ධාරෙස්සාමාති. ඒවම්භෝති ඛෝ භාරද්වාජෝ මාණවෝ වාසෙට්ඨස්ස මාණවස්ස පච්චස්සෝසි.**

5. එතකොට වාසෙට්ඨ මාණවකයා භාරද්වාජ මාණවකයාව ඇමතුවා. "භාරද්වාජයෙනි, ශාක්‍ය කුලයෙන් පැවිදි වූ ශාක්‍ය පුත්‍ර වූ මේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මනසාකට ගමේ උතුරු පෙදෙසේ මනසාකටයේ අචිරවතී නදී තෙර අඹ වනයේ වැඩ ඉන්නවා. ඒ භවත් ගෞතමයන් වහන්සේ ගැන මෙවැනි වූ කල්‍යාණ කීර්ති ඝෝෂාවක් පැතිර ගොසින් තියෙනවා. "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණින් අරහත් වන සේක! සම්මාසම්බුද්ධ වන සේක! විජ්ජාචරණසම්පන්න වන සේක! සුගත වන සේක! ලෝකවිදූ වන සේක! අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක! සත්ථා දේවමනුස්සානං වන සේක! බුද්ධ වන සේක! භගවා වන සේක!" කියල. ඉතින් භවත් භාරද්වාජයෙනි, යමු. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ළඟට යමු. ගිහින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේගෙන් ඔය කාරණ විමසමු. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඔය ගැටළුව විසඳන්නේ යම් අයුරකින් ද ඒ අයුරින් දරා ගනිමු. එසේය භවත, කියල භාරද්වාජ මාණවකයා වාසෙට්ඨ මාණවකයාට පිළිතුරු දුන්නා.

අථ ඛෝ වාසෙට්ඨභාරද්වාජා මාණවා යේන භගවා තේනුපසංකමිංසු. උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මෝදිංසු. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා ඒකමන්තං නිසීදිංසු. ඒකමන්තං නිසින්නෝ ඛෝ වාසෙට්ඨෝ මාණවෝ භගවන්තං ඒතදවෝච: "ඉධ භෝ ගෝතම අම්හාකං ජංඝාවිහාරං අනුචංකම්මන්තානං අනුවිචරන්තානං මග්ගාමග්ගේ කථා උදපාදි. අහං ඒවං වදාමි: අයමේව උජුමග්ගෝ අයමඤ්ඤසායනෝ නියාණිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය ය්වායං අක්ඛාතෝ බ්‍රාහ්මණේන පොක්ඛරසාතිනා"ති. භාරද්වාජෝ මාණවෝ ඒවමාහ: "අයමේව උජුමග්ගෝ අයමඤ්ඤසායනෝ නියාණිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය ය්වායං අක්ඛාතෝ බ්‍රාහ්මණේන තාරුක්ඛේනා"ති. එත්ථ භෝ ගෝතම අත්ථේව විග්ගහෝ අත්ථි විවාදෝ අත්ථි නානාවාදෝ"ති

ඉතින් වාසෙට්ඨ භාරද්වාජ මාණවකයන් භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටි තැනට ගියා. ගිහින් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වුණා. සතුටු විය යුතු පිළිසඳර කථාබහ නිමවා එකත්පස්ව වාඩි වුණා. එකත්පස්ව වාඩි වුණ වාසෙට්ඨ මාණවකයා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ පැවසුවා. "භවත් ගෞතමයන් වහන්ස, ව්‍යායාම පිණිස එහාට මෙහාට ඇවිද ඇවිද සිටි අප අතර කථාවක් ඇති වුණා. ම මේ විදිහට කිව්වා. "පොක්ඛරසාතී බ්‍රාහ්මණයා විසින් යම් මගක් කියා තිබෙනවා ද, ඒක ම තමයි බඹ ලොව උපදින්ට තියෙන ඍජු මාර්ගය. ඒක ම තමයි එක ම මාවත. ඔය මාර්ගය විතරම යි ඒ සඳහා තියෙන්නේ" කියල. එතකොට භාරද්වාජ මාණවකයා මෙහෙම කිව්වා.

"තාරුක්ඛ බ්‍රාහ්මණයා විසින් යම් මගක් කියා තිබෙනවා ද, වික ම තමයි බඹ ලොව උපදින්ට තියෙන සෘජු මාර්ගය. වික ම තමයි එක ම මාවත. ඔය මාර්ගය විතරම යි ඒ සඳහා තියෙන්නේ" කියල. භවත් ගෞතමයන් වහන්ස, ඔය කරුණ පිළිබඳ ව අප අතර නො ගැලපීමක් ඇති වුණා. වාදයක් ඇති වුණා. නානා අදහස් ඇති වුණා."

7. "ඉති කිර වාසෙට්ඨ ත්වං ඒවං වදේසි: අයමේව උජුමග්ගෝ අයමඤ්ජසායනෝ නියාණිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය ය්වයං අක්ඛාතෝ බ්‍රාහ්මණේන පොක්ඛරසාතිනාති. භාරද්වජෝ මාණවෝ ඒවමාහ: අයමේව උජුමග්ගෝ අයමඤ්ජසායනෝ නියාණිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය ය්වායං අක්ඛාතෝ බ්‍රාහ්මණේන තාරුක්ඛේනාති. අථ කිස්මිං පන වෝ වාසෙට්ඨා විග්ගහෝ? කිස්මිං විවාදෝ? කිස්මිං නානාවාදෝ?"ති.

7. "එතකොට පින්වත් වාසෙට්ඨ, ඔබ කියන්නේ මෙහෙමයි නේද? "පොක්ඛරසාතී බ්‍රාහ්මණයා විසින් යම් මගක් කියා තිබෙනවා ද, වික ම තමයි බඹ ලොව උපදින්ට තියෙන සෘජු මාර්ගය. වික ම තමයි එක ම මාවත. ඔය මාර්ගය විතරම යි ඒ සඳහා තියෙන්නේ" කියල. එතකොට භාරද්වාජ මාණවකයා කිව්වේ මෙහෙම නෙ. "තාරුක්ඛ බ්‍රාහ්මණයා විසින් යම් මගක් කියා තිබෙනවා ද, වික ම තමයි බඹ ලොව උපදින්ට තියෙන සෘජු මාර්ගය. වික ම තමයි එක ම මාවත. ඔය මාර්ගය විතරම යි ඒ සඳහා තියෙන්නේ" කියල. එහෙම නම් වාසෙට්ඨයෙනි, මොකක් ගැන ද නො ගැලපීම? මොකක් ගැන ද වාදය? මොකක් ගැන ද නානා අදහස්?

8. "මග්ගාමග්ගේ හෝ ගෝතම. කිඤ්චාපි හෝ ගෝතම බ්‍රාහ්මණා නානාමග්ගේ පඤ්ඤාපෙන්ති අද්ධරියා බ්‍රාහ්මණා, තිත්තිරියා බ්‍රාහ්මණා. ඡන්දෝකා බ්‍රාහ්මණා, බව්හාරිජ්ඣා බ්‍රාහ්මණා, අථ ඛෝ සබ්බානි තානි නියාණිකානි නියාන්ති තක්කරස්ස බ්‍රහ්මසව්‍යතාය. සෙය්‍යථාපි හෝ ගෝතම ගාමස්ස වා නිගමස්ස වා අවිදූරේ බහූනි ඓ-පි නානාමග්ගානි භවන්ති, අථ ඛෝ සබ්බානි තානි ගාමසමෝසරණානි භවන්ති. ඒවමේව ඛෝ හෝ ගෝතම කිඤ්චාපි බ්‍රාහ්මණා නානාමග්ගේ පඤ්ඤාපෙන්ති අද්ධාරියා බ්‍රාහ්මණා, තීත්තිරියා බ්‍රාහ්මණා, ඡන්දෝකා බ්‍රාහ්මණා, බව්හිරිවා බ්‍රාහ්මණා, අථ ඛෝ සබ්බානි තානි නියාණිකානි නියාන්ති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය"ති.

8. "භවත් ගෞතමයන් වහන්ස, මග නො මග ගැන යි. භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණවරුන් නානා මාර්ගයන් ගැන කියල තියෙනවා. අද්ධරිය බ්‍රාහ්මණයන්, තිත්තිරිය බ්‍රාහ්මණයන්, ඡන්දෝක බ්‍රාහ්මණයන්, බව්හාරිජ්ඣා බ්‍රාහ්මණයන් ඒ වගේ ම ඒ සියළු මාර්ගයන් බ්‍රහ්මලෝකයේ උපදින්ට හේතු වෙනවා කියල තියෙනවා. භවත් ගෞතමයන් වහන්ස, ඒක මේ වගේ දෙයක්. ගමකට හෝ නියම්ගමකට යෑම පිණිස වැඩි දුර නැතුව වුණත් බොහෝ නානා මාර්ග තියෙනවා. ඒ සෑම මාර්ගයක් ම තියෙන්නේ ගමට යෑම පිණිස යි. භවත් ගෞතමයන් වහන්ස, මේකත් ඒ වගේ තමයි. බ්‍රාහ්මණවරුන් නොයෙක් නොයෙක් මාර්ග පෙන්වුවත්, ඒ කියන්නේ අද්ධරිය බ්‍රාහ්මණයන්, තිත්තිරිය බ්‍රාහ්මණයන්, ඡන්දෝක බ්‍රාහ්මණයන් ඒ වගේ ම ඒ සියළු මාර්ගයන් බ්‍රහ්මලෝකයේ උපදින්ට හේතු වෙනවා කියල තියෙනවා.

9. "නිය්‍යාන්තීති වාසෙට්ඨ වදේසි?" "නිය්‍යාන්තීති හෝ ගෝතම වදාමි"

9. "පින්වත් වාසෙට්ඨ, ඒ සෑම මාර්ගයක් ම බඹලොව ඉපදීම පිණිස පවතිනවා කියල ද කියන්නේ?" "භවත් ගෞතමයන් වහන්ස, මං කියන්නේ ඒ සෑම මාර්ගයක් ම බඹලොව ඉපදීම පිණිස පවතිනවා කියල යි."

"නිය්‍යාන්තීති වාසෙට්ඨ වදේසි?" "නිය්‍යාන්තීති හෝ ගෝතම වදාමි."

"පින්වත් වාසෙට්ඨ, ඒ සෑම මාර්ගයක් ම බඹලොව ඉපදීම පිණිස පවතිනවා කියල ද කියන්නේ?" "භවත් ගෞතමයන් වහන්ස, මං කියන්නේ ඒ සෑම මාර්ගයක් ම බඹලොව ඉපදීම පිණිස පවතිනවා කියල යි."

"නිය්‍යාන්තීති වාසෙට්ඨ වදේසි?" "නිය්‍යාන්තීති හෝ ගෝතම වදාමි."

"පින්වත් වාසෙට්ඨ, ඒ සෑම මාර්ගයක් ම බඹලොව ඉපදීම පිණිස පවතිනවා කියල ද කියන්නේ?" "භවත් ගෞතමයන් වහන්ස, මං කියන්නේ ඒ සෑම මාර්ගයක් ම බඹලොව ඉපදීම පිණිස පවතිනවා කියල යි."

10. "කිං පන වාසෙට්ඨ අත්ථි කෝචි තේවිජ්ජානං බ්‍රාහ්මණානං ඒකබ්‍රාහ්මණෝ'පි යේන බ්‍රහ්මා සක්ඛි දිට්ඨෝ?"'ති. "නෝ හිදං හෝ ගෝතම."

10. "පින්වත් වාසෙට්ඨ එතකොට ඔය ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන්ගෙන් එක බ්‍රාහ්මණයෙක්වත් ඉන්නවා ද සියැසින් ම බ්‍රහ්මයාව දැකපු කෙනෙක්?" "භවත් ගෞතමයන් වහන්ස, එහෙම කෙනෙක් නම් නෑ."

“කිං පන වාසෙට්ඨ අත්ථි කෝචි තේවිජ්ජානං බ්‍රාහ්මණානං ඒකාචරියෝ’පි යේන බ්‍රහ්මා සක්ඛි දිට්ඨෝ?”ති. “නෝ හිදං භෝ ගෝතම.”

“පින්වත් වාසෙට්ඨ එතකොට ඔය ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන්ගෙන් එක ආචාර්යවරයෙක්වත් ඉන්නවා ද සියැසින් ම බ්‍රහ්මයාව දැකපු කෙනෙක්?” “භවත් ගෞතමයන් වහන්ස, එහෙම කෙනෙක් නම් නෑ.”

“කිං පන වාසෙට්ඨ අත්ථි කෝචි තේවිජ්ජානං බ්‍රාහ්මණානං ඒකාචරියපාචරියෝ’පි යේන බ්‍රහ්මා සක්ඛි දිට්ඨෝ?”ති. “නෝ හිදං භෝ ගෝතම.”

“පින්වත් වාසෙට්ඨ එතකොට ඔය ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන්ගෙන් එක ආචාර්ය ප්‍රාචාර්යවරයෙක්වත් ඉන්නවා ද සියැසින් ම බ්‍රහ්මයාව දැකපු කෙනෙක්?” “භවත් ගෞතමයන් වහන්ස, එහෙම කෙනෙක් නම් නෑ.”

“කිං පන වාසෙට්ඨ අත්ථි කෝචි තේවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියමහයුගා යේන බ්‍රහ්මා සක්ඛි දිට්ඨෝ?”ති. “නෝ හිදං භෝ ගෝතම.”

“පින්වත් වාසෙට්ඨ එතකොට ඔය ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන්ගෙන් සත්වෙනි ආචාර්ය පරම්පරාව දක්වා කවුරුවත් ඉන්නවා ද සියැසින් ම බ්‍රහ්මයාව දැකපු කෙනෙක්?” “භවත් ගෞතමයන් වහන්ස, එහෙම කෙනෙක් නම් නෑ.”

“කිං පන වාසෙට්ඨ යේපි තේවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයෝ මන්තානං කත්තාරෝ මන්තානං පවත්තාරෝ යේසමිදං එතරහි තේවිජ්ජා බ්‍රාහ්මණා පෝරාණං මන්තපදං ගීතං පවුත්තං සමූහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථීදං: අට්ටකෝ වාමකෝ වාමදේවෝ වෙස්සාමිත්තෝ යමතග්ගි අංගීරසෝ භාරද්වාජෝ වාසෙට්ඨෝ කස්සපෝ භගු, තේ’පි එවමාහංසු: මයමේතං ජානාම මයමේතං පස්සාම යත්ථ වා බ්‍රහ්මා යේන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මා’ති?” “නෝ හිදං භෝ ගෝතම.”

“එතකොට වාසෙට්ඨ, ඒ ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන් ගේ මන්ත්‍ර හදපු, මන්ත්‍ර නිර්මාණය කරපු, මන්ත්‍ර පවසපු පූර්ව ඍෂිවරු ඉන්නවා. ඒ කියන්නේ;

අට්ටක, වාමක, වාමදේව, වෙස්සාමිත්ත, යමතග්ගි, අංගීරස, භාරද්වාජ, වාසෙට්ඨ, කස්සප, භගු යන අය යි. දැන් කාලේ ඒ විදිහට ම ත්‍රිවේද ඇති බමුණන් ඒ ඍෂිවරුන් ගේ පැරණි මන්ත්‍රපද ගායනා කරනවා ද, රැස් කරනවා ද, ඒවා ඒ විදිහට ම ගයනවා ද, ඔවුන් කිව්ව අයුරින් ම කියනවා ද, ඔවුන් පවසන වචනවලින් ම පවසනවා ද, ඒ ඍෂිවරු පවා මෙහෙම කියල තියෙනවා ද? "යම් තැනක බ්‍රහ්මයා ඉන්නවා ද, යම් විටෙක බ්‍රහ්මයා ඉන්නවා ද, යම් පෙදෙසක බ්‍රහ්මයා ඉන්නවා ද ඒ ඔහුව අපි දන්නවා. අපි දකිනවා" කියල? "භවත් ගෞතමයන් වහන්ස, එහෙම දැකපු කෙනෙක් නම් නෑ."

11. **"ඉති කිර වාසෙට්ඨ නත්ථි කෝචි තේවිජ්ජානං බ්‍රාහ්මණානං ඒකබ්‍රාහ්මණෝ'පි යේන බ්‍රහ්මා සක්ඛි දිට්ඨෝ. නත්ථි කෝචි තේවිජ්ජානං බ්‍රාහ්මණානං ඒකචරියෝ'පි යේන බ්‍රහ්මා සක්ඛි දිට්ඨෝ. නත්ථි කෝචි තේවිජ්ජානං බ්‍රාහ්මණානං ඒකචරියපාචරියෝ'පි යේන බ්‍රහ්මා සක්ඛි දිට්ඨෝ. නත්ථි කෝචි තේවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියමහයුගා යේන බ්‍රහ්මා සක්ඛි දිට්ඨෝ, යේ'පි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයෝ මන්තානං කත්තාරෝ මන්තානං පවත්තාරෝ යේසමිදං එතරහි තේවිජ්ජා බ්‍රාහ්මණා පෝරාණං මන්තපදං ගීතං පවුත්තං සමූහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථීදං: අට්ටකෝ වාමකෝ වාමදේවෝ වෙස්සාමිත්තෝ යමතග්ගි අංගීරසෝ භාරද්වාජෝ වාසෙට්ඨෝ කස්සපෝ භගු, තේපි න ඒවමාහංසු: මයමේතං ජානාම මයමේතං පස්සාම යත්ථ වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මා"ති. තේ වත තේවිජ්ජා බ්‍රාහ්මණා ඒවමාහංසු: යං මයං න ජානාම. න පස්සාම. තස්ස සහව්‍යතාය මග්ගං දේසේම. අයමේව උජුමග්ගෝ අයමඤ්ජසායනෝ නියාණිකෝ නියාති තක්කරස බ්‍රහ්මසහව්‍යතායා"ති.**

11. එහෙම නම් වාසෙට්ඨ, යමෙකු විසින් සියැසින් බ්‍රහ්මයා දැකල තියෙනවා නම්, ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන් අතර එබඳු වූ එක බ්‍රාහ්මණයෙක්වත් නැත්නම්, යමෙකු විසින් සියැසින් බ්‍රහ්මයා දැකල තියෙනවා නම්, ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන් අතර එබඳු වූ එක ආචාර්යවරයෙක්වත් නැත්නම්, යමෙකු විසින් සියැසින් බ්‍රහ්මයා දැකල තියෙනවා නම්, ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන් අතර එබඳු වූ එක ආචාර්ය ප්‍රාචාර්යවරයෙක්වත් නැත්නම්, යමෙකු විසින් සියැසින් බ්‍රහ්මයා දැකල තියෙනවා නම්, ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන් අතර එබඳු වූ එක සත්වෙනි ආචාර්ය පරපුර දක්වා කවුරුවත් නැත්නම්, ඒ වගේ ම ඒ ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන් ගේ මන්ත්‍ර හදපු, මන්ත්‍ර නිර්මාණය කරපු, මන්ත්‍ර පවසපු පූර්ව ඍෂිවරු ඉන්නවා. ඒ කියන්නේ; අට්ටක, වාමක,

වාමදේව, වෙස්සාමිත්ත, යමතග්ගි, අංගීරස, භාරද්වාජ, වාසෙට්ඨ, කස්සප, භගු යන අය යි. දැන් කාලේ ඒ විදිහට ම ත්‍රිවේද ඇති බමුණන් ඒ ඍෂිවරුන් ගේ පැරණි මන්ත්‍රපද ගායනා කරනවා ද, රැස් කරනවා ද, ඒවා ඒ විදිහට ම ගයනවා ද, ඔවුන් කිව්ව අයුරින් ම කියනවා ද, ඔවුන් පවසන වචනවලින් ම පවසනවා ද, ඒ ඍෂිවරු පවා "යම් තැනක බ්‍රහ්මයා ඉන්නවා ද, යම් විටෙක බ්‍රහ්මයා ඉන්නවා ද, යම් පෙදෙසක බ්‍රහ්මයා ඉන්නවා ද ඒ ඔහුව අපි දන්නවා. අපි දකිනවා" ය යි මෙහෙම කියල නැතුව තිබිය දී ත්‍රිවේද ඇති බමුණන් ඒකාන්ත කොට මෙහෙම කියනවා නෙව. "අපි යම් බ්‍රහ්මයෙක්ව දන්නේ නෑ, දැකල නෑ. නමුත් ඔහු හා එක්වීම පිණිස මාර්ගය කියා දෙන්නම්. මේක ම යි මාර්ගය. මේක ම යි මාවත. මේක ම යි බඹ ලොව ඉපදීම පිණිස තිබෙන්නේ" කියල.

12. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, නනු ඒවං සන්තේ තේවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති?"ති.

12. පින්වත් වාසෙට්ඨ, මේ ගැන ඔබ කුමක්ද හිතන්නේ? ඔය විදිහට නම් කරුණු යෙදෙන්නේ ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන් ගේ කථාව කිසි ආනුභාවයක් නැති දෙයක් වෙනවා නේද?

"අද්ධා ඛෝ හෝ ගෝතම, ඒවං සන්තේ තේවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති"ති.

"භවත් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන් ම ඔය විදිහට නම් කරුණු යෙදෙන්නේ ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන් ගේ කථාව කිසි ආනුභාවයක් නැති දෙයක් වෙනවා ම යි."

13. සාධු වාසෙට්ඨ, තේ වත වාසෙට්ඨ තේවිජ්ජා බ්‍රාහ්මණා, යං න ජානන්ති යං න පස්සන්ති තස්ස සහව්‍යතාය මග්ගං දේසෙස්සන්ති: "අයමේව උජුමග්ගෝ අයමඤ්ජසායනෝ නිය්‍යාණිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායා"ති නේතං ඨානං විජ්ජති. සෙය්‍යථාපි වාසෙට්ඨ අන්ධවේණිපරම්පරං සංසත්තා පුරිමෝ'පි න පස්සති මජ්ඣිමෝ'පි න පස්සති ප-ඡිමෝ'පි න පස්සති, ඒවමේව ඛෝ වාසෙට්ඨ අන්ධවේණූපමං මඤ්ඤේ තේවිජ්ජානං බ්‍රාහ්මණානං භාසිතං. පුරිමෝ'පි න පස්සති මජ්ඣිමෝ'පි න පස්සති ප-ඡිමෝ'පි න පස්සති. තේසමිදං තේවිජ්ජානං

බ්‍රාහ්මණානං භාසිතං හස්සකඤ්ඤේව සම්පජ්ජති, නාමකඤ්ඤේව සම්පජ්ජති, රිත්තකඤ්ඤේව සම්පජ්ජති, තු-ඡකඤ්ඤේව සම්පජ්ජති.

13. හොඳයි පින්වත් වාසෙට්ඨයෙනි. ඒකාන්තයෙන් ම පින්වත් වාසෙට්ඨයෙනි, ඒ ත්‍රිවේද බ්‍රාහ්මණයන් යම් බ්‍රහ්මයෙකුව දන්නෙත් නැත්නම්, දකින්නෙත් නැත්නම්, ඔහු හා එක් වීම පිණිස මාර්ගයකුත් දේශනා කරනවා නම්, ඒ කියන්නේ "මේකම යි මාර්ගය. මේකම යි ඒකාන්ත මාවත, මේක ම යි බ්‍රහ්මයා ගේ ලෝකය කරා යන මාවත" කියල ඒක වෙන්න පුළුවන් දෙයක් නොවෙයි. පින්වත් වාසෙට්ඨයෙනි, ඒක මේ වගේ දෙයක්. සැරයැටි අරගත් අන්ධ පරපුරක් ඉන්නවා නම්, අන්න ඒ වගෙ යි. ඉදිරියෙන් යන කෙනා දකින්නෙත් නෑ. මැදින් යන කෙනා දකින්නෙත් නෑ. පස්සෙන් යන කෙනා දකින්නෙත් නෑ. පින්වත් වාසෙට්ඨ, ඔය ත්‍රිවේද බ්‍රාහ්මණයන් ගේ කීමත් අන්ධයන් ගේ සැරයැටි පරපුර වගේ කියලයි හිතෙන්නෙ. ඉදිරියෙන් යන කෙනා දකින්නෙත් නෑ. මැදින් යන කෙනා දකින්නෙත් නෑ. පස්සෙන් යන කෙනා දකින්නෙත් නෑ. ඔය ත්‍රිවේද බ්‍රාහ්මණයන් ගේ කීම සිනහවට ම යි ලක්වෙන්නේ. ලාමක දෙයක් ම යි වෙන්නේ. හිස්දෙයක් ම යි වෙන්නේ. තුච්ඡ දෙයක් ම යි වෙන්නේ.

14. **"තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, පස්සන්ති තේවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමං සූරියේ අඤ්ඤේ වාපි බහූ ජනා, යතෝ ච චන්දිමසූරියා උග්ග-ඡන්ති, යත්ථ ච විග-ඡන්ති, ආයාචන්ති, ථෝමයන්ති, පඤ්ජලිකා නමස්සමානා අනුපරිවත්තන්ති?"ති**

14. "පින්වත් වාසෙට්ඨ, මේ ගැන කුමක් ද හිතන්නේ? යම් වෙලාවක සඳහිරු නැගෙනවා ද, යම් වෙලාවක සඳහිරු බසිනවා ද, එතකොට ත්‍රිවේද බ්‍රාහ්මණයොත් අනෙක් බොහෝ දෙනාත් එය දකිනවා ද, එතකොට ඔවුන් ඒ සඳහිරු දෙදෙනාට යාඥා කරනවා නේද? ස්තුති කරනවා නේද? දොහොත් මුදුන් දී වැඳගෙන බිම පෙරළෙනවා නේද?"

"එවං භෝ ගෝතම. පස්සන්ති තේවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමසූරියේ අඤ්ඤේ වාපි බහූජනා, යතෝ ච චන්දිමසූරියා උග්ග-ඡන්ති යත්ථ ච විග-ඡන්ති, ආයාචන්ති, ථෝමයන්ති, පඤ්ජලිකා නමස්සමානා අනුපරිවත්තන්ති"ති.

"එසේය භවත් ගෞතමයන් වහන්ස. යම් වෙලාවක සඳහිරු නැගෙනවා ද, යම් වෙලාවක සඳහිරු බසිනවා ද, එතකොට ත්‍රිවේද බ්‍රාහ්මණයොත් අනෙක් බොහෝ දෙනාත් එය දකිනවා ද, එතකොට ඔවුන් ඒ සඳහිරු දෙදෙනාට යාඥා කරනවා තමයි. ස්තුති කරනවා තමයි. දොහොත් මුදුන් දී වැඳගෙන බිම පෙරළෙනවා තමයි."

15. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, යං පස්සන්ති තේවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමසූරියේ අඤ්ඤේ චාපි බහුජනා, යතෝ ච චන්දිමසූරියා උග්ග-ඡන්ති, යත්ථ ච විග-ඡන්ති, ආයාචන්ති ථෝමායන්ති පඤ්ජලිකා නමස්සමානා අනුපරිවත්තන්ති, පහොන්ති තේවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමසූරියානං සහව්‍යතාය මග්ගං දේසේතුං: අයමේව උජුමග්ගෝ අයමඤ්ජසායනෝ නියාණිකෝ නියාති තක්කරස්ස චන්දිමසූරියානං සහව්‍යතායා"?ති. "නෝ හිදං භෝ ගෝතම."

15. "පින්වත් වාසෙට්ඨ, මේ ගැන කුමක් ද හිතන්නේ? යම් වෙලාවක සඳහිරු නැගෙනවා ද, යම් වෙලාවක සඳහිරු බසිනවා ද, එතකොට ත්‍රිවේද බ්‍රාහ්මණයොත් අනෙක් බොහෝ දෙනාත් එය දකිනවා ද, එතකොට ඔවුන් ඒ සඳහිරු දෙදෙනාට යාඥා කරනවා නම්, ස්තුති කරනවා නම්, දොහොත් මුදුන් දී වැඳගෙන බිම පෙරළෙනවා නම්, ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණයන්ට සඳහිරු දෙක සමග එක්වීම පිණිස "මේකම යි මාර්ගය. මේකම යි ඒකාන්ත මාවත, මේක ම යි සඳහිරු දෙදෙනා ගේ ලෝකය කරා යන මාවත" කියල මාර්ගයක් දේශනා කරන්ට පුළුවන් ද? "භවත් ගෞතමයෙනි, මෙය නොවේ ම යි."

16. ඉති කිර වාසෙට්ඨ යං පස්සන්ති තේවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමාසූරියේ, අඤ්ඤේ චාපි බහු ජනා, යතෝ ච චන්දිමසූරියා උග්ග-ඡන්ති, යත්ථ ච විග-ඡන්ති, ආයාචන්ති ථෝමයන්ති පඤ්ජලිකා නමස්සමානා අනුපරිවත්තන්ති, තේ'පි නප්පහොන්ති චන්දිමසූරියානං සහව්‍යතාය මග්ගං දේසේතුං: අයමේව උජුමග්ගෝ අයමඤ්ජසායනෝ නියාණිකෝ නියාතී තක්කරස්ස චන්දිමසූරියානං සහව්‍යතායාති.

16. පින්වත් වාසෙට්ඨ, ඉතින් එහෙම නම් යම් වෙලාවක සඳහිරු නැගෙනවා ද, යම් වෙලාවක සඳහිරු බසිනවා ද, එතකොට ත්‍රිවේද බ්‍රාහ්මණයොත් අනෙක් බොහෝ දෙනාත් එය දකිනවා ද, එතකොට ඔවුන් ඒ සඳහිරු දෙදෙනාට යාඥා කරන නමුත්, ස්තුති කරනවා නමුත්, දොහොත් මුදුන් දී වැඳගෙන බිම පෙරළෙනවා නමුත්, ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණයන්ට සඳහිරු දෙක

සමග එක්වීම පිණිස "මේකම යි මාර්ගය. මේකම යි ඒකාන්ත මාවත, මේක ම යි සඳහිරු දෙදෙනා ගේ ලෝකය කරා යන මාවත" කියල මාර්ගයක් දේශනා කරන්ටත් බැරිනම්,

කිං පන, න කිර තේවිජ්ජේහි බ්‍රාහ්මණේහි බ්‍රහ්මා සක්ඛි දිට්ඨෝ. න පි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියේහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨෝ. න පි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියපාචරියේහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨෝ. න පි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියාමහයුගේහි යේන බ්‍රහ්මා සක්ඛිදිට්ඨෝ. "යේපි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයෝ මන්තානං කත්තාරෝ මන්තානං පවත්තාරෝ, යේසමිදං ඒතරහි තේවිජ්ජා බ්‍රාහ්මණා පෝරාණං මන්තපදං ගීතං පවුත්තං සමූහිතං, තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථීදං: අට්ටකෝ වාමකෝ වාමදේවෝ වෙස්සාමිත්තෝ යමතග්ගි අංගීරසෝ භාරද්වාජෝ වාසෙට්ඨා කස්සපෝ භගු. තේපි න ඒවමාහංසු: "මයමේතං ජානාම, මයමේතං පස්සාම, යත්ථ වා බ්‍රහ්මා යේන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මා"ති. තේවිජ්ජා බ්‍රාහ්මණා ඒවමාහංසු: යං න ජානාම යං න පස්සාම, තස්ස සහව්‍යතාය මග්ගං දේසේම: අයමේව උජුමග්ගෝ අයමක්ඛ්‍යසායනෝ නියාණිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායා"ති.

එහෙම තියෙද්දිත් ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණවරුන් විසින් බ්‍රහ්මයාව සියැසින් දැකලත් නෑ. ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණවරුන් ගේ ආචාර්යවරුන් විසින් බ්‍රහ්මයාව සියැසින් දැකලත් නෑ. ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණවරුන් ගේ ආචාර්යප්‍රාචාර්යවරුන් විසින් බ්‍රහ්මයාව සියැසින් දැකලත් නෑ. ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණවරුන් ගේ සත්වෙනි ආචාර්ය පරපුර විසින් ද බ්‍රහ්මයාව සියැසින් දැකලත් නෑ. ඒ වගේ ම ඒ ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන් ගේ මන්ත්‍ර හදපු, මන්ත්‍ර නිර්මාණය කරපු, මන්ත්‍ර පවසපු පූර්ව ඍෂිවරු ඉන්නවා. ඒ කියන්නේ; අට්ටක, වාමක, වාමදේව, වෙස්සාමිත්ත, යමතග්ගි, අංගීරස, භාරද්වාජ, වාසෙට්ඨ, කස්සප, භගු යන අය යි. දැන් කාලේ ඒ විදිහට ම ත්‍රිවේද ඇති බමුණන් ඒ ඍෂිවරුන් ගේ පැරණි මන්ත්‍රපද ගායනා කරනවා ද, රැස් කරනවා ද, ඒවා ඒ විදිහට ම ගයනවා ද, ඔවුන් කිව්ව අයුරින් ම කියනවා ද, ඔවුන් පවසන වචනවලින් ම පවසනවා ද, ඒ ඍෂිවරු පවා "යම් තැනක බ්‍රහ්මයා ඉන්නවා ද, යම් විටෙක බ්‍රහ්මයා ඉන්නවා ද, යම් පෙදෙසක බ්‍රහ්මයා ඉන්නවා ද ඒ ඔහුව අපි දන්නවා. අපි දකිනවා" යයි මෙහෙම කියලත් නෑ. නමුත් ත්‍රිවේද බ්‍රාහ්මණයන් මෙහෙම කියනවා. යම් බ්‍රහ්මයෙක් ගැන අපි දන්නේ නෑ තමයි. අපි දකින්නෙ නෑ තමයි. ඒ බ්‍රහ්මයා සමග එක්වෙන මාර්ගය නම් දේශනා කරනවා. "මේකම

යි මාර්ගය. මේකම යි ඒකාන්ත මාවත, මේක ම යි බ්‍රහ්මයා ගේ ලෝකය කරා යන මාවත" කියල

"තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, නනු ඒවං සන්තේ තේවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී?"ති.

"පින්වත් වාසෙට්ඨ, මේ ගැන කුමක් ද හිතන්නේ? ඔය විදිහට නම් ඒ කීම තියෙන්නෙ ත්‍රිවේද බ්‍රාහ්මණයන් ගේ කථාව පදනමක් නැති බවට පත් වෙනවා නේද?"

"අද්ධා ඛෝ හෝ ගෝතම ඒවං සන්තේ තේවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී"ති.

"භවත් ගෞතමයන් වහන්ස, ඔය විදිහට නම් ඒ කීම තියෙන්නෙ ත්‍රිවේද බ්‍රාහ්මණයන් ගේ කථාව ඒකාන්තයෙන් ම පදනමක් නැති බවට පත් වෙනවා ම යි."

17. **සාධු වාසෙට්ඨ. තේ වත වාසෙට්ඨ තේවිජ්ජා බ්‍රාහ්මණා යං න ජානන්ති යං න පස්සන්ති තස්ස සහව්‍යතාය මග්ගං දේසෙස්සන්ති: අයමේව උජුමග්ගෝ අයමඤ්ජසායනෝ නිය්‍යාණිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායාති නේතං ඨානං විජ්ජතීති.**

17. හොඳයි පින්වත් වාසෙට්ඨයෙනි. ඒකාන්තයෙන් ම පින්වත් වාසෙට්ඨයෙනි, ඒ ත්‍රිවේද බ්‍රාහ්මණයන් යම් බ්‍රහ්මයෙකුව දන්නෙත් නැත්නම්, දකින්නෙත් නැත්නම්, ඔහු හා එක් වීම පිණිස මාර්ගයකුත් දේශනා කරනවා නම්, ඒ කියන්නේ "මේකම යි මාර්ගය. මේකම යි ඒකාන්ත මාවත, මේක ම යි බ්‍රහ්මයා ගේ ලෝකය කරා යන මාවත" කියල ඒක වෙන්න පුළුවන් දෙයක් නොවෙයි.

18. **සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසෝ ඒවං වදෙය්‍ය: අහං ඛෝ යා ඉමස්මිං ජනපදේ ජනපදකල්‍යාණී, තං ඉ-ඡාමි තං කාමේමීති. තමේනං ඒවං වදෙය්‍යුං "අම්භෝ පුරිස, යං ත්වං ජනපදකල්‍යානිං ඉ-ඡසි කාමේසි ජානාසි තං ජනපදකල්‍යාණිං ඛත්තියී වා බ්‍රාහ්මණී වා වේස්සී වා සුද්දී වා?"ති ඉති පුට්ඨෝ "නෝ"ති වදෙය්‍ය තමේනං ඒවං වදෙය්‍යුං: "අම්භෝ පුරිස යං ත්වං ජනපද-කල්‍යානිං න ජානාසි, න පස්සසි ඒවං නාමා වා ඒවං ගොත්තා වා, දීඝා වා රස්සා වා මජ්ඣිමා වා කාළී වා සාමා වා මංගුර-ඡවී වා"ති. අමුකස්මිං**

ගාමේ වා නිගමේ වා නගරේ වා"ති ඉති පුට්ඨෝ "නෝ"ති වදෙය්‍ය. තමේනං ඒවං වදෙය්‍යුං: "අම්හෝ පුරිස යං ත්වං න ජානාසි, න පස්සසි, තං ත්වං ඉ-ඡාසි කාමේසී"ති. ඉති පුට්ඨෝ "ආමෝ"ති වදෙය්‍යු. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ නනු ඒවං සන්තේ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති"ති.

18. පින්වත් වාසෙට්ඨ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් මෙවැනි දෙයක් කියනවා. "මේ ජනපදයෙහි යම් රූප සුන්දරියක් ඉන්නවා නම්, ඇයට මං කැමැති යි. ඇයට මං ආස යි" කියල. එතකොට අනෙක් අය ඔහුට මෙහෙම කියනවා. "එම්බා පුරුෂය, ඔබ යම් රූප සුන්දරියකට කැමැති නම්, ආශා නම්, ඒ රූප සුන්දරිය ක්ෂත්‍රිය කුලයේ කෙනෙක් ය කියල හෝ බ්‍රාහ්මණ කුලයේ කෙනෙක් ය කියල හෝ වෛශ්‍ය කුලයේ කෙනෙක් ය කියල හෝ ශූද්‍ර කුලයේ කෙනෙක් ය කියල හෝ දන්නවා ද?" ඔහොම ඇසූ විට ඔහු පිළිතුරු දෙන්නේ ඒ ගැන දන්නේ නැති බව යි. එතකොට ඔහුට මෙහෙම කියනවා. "එම්බා පුරුෂය, ඔබ යම් රූප සුන්දරියකට කැමැති නම්, ආශා නම්, ඒ රූප සුන්දරිය මෙවැනි මෙවැනි නම් ඇත්තියක්, මෙවැනි ගෝත්‍ර ඇත්තියක්, ඈ උස යි. ඈ මිටි යි. ඈ මධ්‍යම ප්‍රමාණ යි. ඈ කළු යි. ඈ රන්වන් පාට යි. ඈ තළෙළු යි ආදී වශයෙන් ඈ ගැන දන්නවා ද? ඒ වගේ ම ඈ අසවල් ගමේ හෝ නියම්ගමේ හෝ නගරයේ එකියක් ය කියල ඇය ගැන දන්නවා ද?" ඔහොම ඇසූ විට ඔහු පිළිතුරු දෙන්නේ ඒ ගැන දන්නේ නැති බව යි. එතකොට ඔහුගෙන් මෙහෙම අහනවා. "එම්බා පුරුෂය, ඔබ යම් රූපසුන්දරියක් ගැන දන්නෙත් නැත්නම්, ඇය දකින්නෙත් නැත්නම්, ඇයව ද ඔබ කැමැති වන්නේ? ආසා කරන්නේ?" එතකොට එසේය කියල ඔහු පිළිතුරු දෙනවා. "පින්වත් වාසෙට්ඨ, මේ ගැන කුමක් ද හිතන්නේ? ඔහු ගේ කීම එවැනි දෙයක් නම් ඒ පුරුෂයා ගේ ඒ කථාව පදනමක් නැති දෙයක් බවට පත් වෙනවා නේ ද?

"අද්ධා ඛෝ හෝ ගෝතම තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති"ති.

"භවත් ගෞතමයන් වහන්ස, ඔහු ගේ කීම එවැනි දෙයක් නම් ඒ පුරුෂයා ගේ ඒ කථාව ඒකාන්තයෙන් ම පදනමක් නැති දෙයක් බවට පත් වෙනවා ම යි."

19. **ඒවමේව ඛෝ වාසෙට්ඨ න කිර තේවිජ්ජේහි බ්‍රාහ්මණේහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨෝ. න පි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියේහි බ්‍රහ්මා**

සක්ඛිදිට්ඨෝ. න පි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියපාචරියේහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨෝ. න පි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියාමහයුගේහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨෝ. "යෝපි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයෝ මන්තානං කත්තාරෝ මන්තානං පවත්තාරෝ, යේසමිදං එතරහි තේවිජ්ජා බ්‍රාහ්මණා පෝරාණං මන්තපදං ගීතං පවුත්තං සමූහිතං, තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිත-මනුවාචෙන්ති, සෙය්‍යථීදං: අට්ටකෝ වාමකෝ වාමදේවෝ වෙස්සාමිත්තෝ යමතග්ගි අංගීරසෝ භාරද්වාජෝ වාසෙට්ඨා කස්සපෝ භගු. තේපි න එවමාහංසු: මයමේතං ජානාමි, මයමේතං පස්සාමි, යත්ථ වා බ්‍රහ්මා යේන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මාති. තේවිජ්ජා බ්‍රාහ්මණා එවමාහංසු: යං න ජානාමි යං න පස්සාම, තස්ස සහව්‍යතාය මග්ගං දේසේම: අයමේව උජුමග්ගෝ අයමක්ඛ්ජසායනෝ නියාණිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායා"ති.

19. පින්වත් වාසෙට්ඨ, ඔය විදිහම යි ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණවරුන් විසින් බ්‍රහ්මයාව සියැසින් දැකලත් නෑ. ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණවරුන් ගේ ආචාර්යවරුන් විසින් බ්‍රහ්මයාව සියැසින් දැකලත් නෑ. ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණවරුන් ගේ ආචාර්යප්‍රාචාර්යවරුන් විසින් බ්‍රහ්මයාව සියැසින් දැකලත් නෑ. ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණවරුන් ගේ සත්වෙනි ආචාර්ය පරපුර විසින් ද බ්‍රහ්මයාව සියැසින් දැකලත් නෑ. ඒ වගේ ම ඒ ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන් ගේ මන්ත්‍ර හදපු, මන්ත්‍ර නිර්මාණය කරපු, මන්ත්‍ර පවසපු පූර්ව ඍෂිවරු ඉන්නවා. ඒ කියන්නේ; අට්ටක, වාමක, වාමදේව, වෙස්සාමිත්ත, යමතග්ගි, අංගීරස, භාරද්වාජ, වාසෙට්ඨ, කස්සප, භගු යන අය යි. දැන් කාලේ ඒ විදිහට ම ත්‍රිවේද ඇති බමුණන් ඒ ඍෂිවරුන් ගේ පැරණි මන්ත්‍රපද ගායනා කරනවා ද, රැස් කරනවා ද, ඒවා ඒ විදිහට ම ගයනවා ද, ඔවුන් කිව්ව අයුරින් ම කියනවා ද, ඔවුන් පවසන වචනවලින් ම පවසනවා ද, ඒ ඍෂිවරු පවා "යම් තැනක බ්‍රහ්මයා ඉන්නවා ද, යම් විටෙක බ්‍රහ්මයා ඉන්නවා ද, යම් පෙදෙසක බ්‍රහ්මයා ඉන්නවා ද ඒ ඔහුව අපි දන්නවා. අපි දකිනවා" යයි මෙහෙම කියලත් නෑ. නමුත් ත්‍රිවේද බ්‍රාහ්මණයන් මෙහෙම කියනවා. යම් බ්‍රහ්මයෙක් ගැන අපි දන්නේ නෑ තමයි. අපි දකින්නෙ නෑ තමයි. ඒ බ්‍රහ්මයා සමග එක්වෙන මාර්ගය නම් දේශනා කරනවා. "මේකම යි මාර්ගය. මේකම යි ඒකාන්ත මාවත, මේක ම යි බ්‍රහ්මයා ගේ ලෝකය කරා යන මාවත" කියල

"තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, නනු ඒවං සන්තේ තේවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති?"ති.

"පින්වත් වාසෙට්ඨ, මේ ගැන කුමක් ද හිතන්නේ? ඔය විදිහට නම් ඒ කීම තියෙන්නෙ ත්‍රිවේද බ්‍රාහ්මණයන් ගේ කථාව පදනමක් නැති බවට පත් වෙනවා නේද?"

"අද්ධා ඛෝ හෝ ගෝතම ඒවං සන්තේ තේවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී"ති.

"භවත් ගෞතමයන් වහන්ස, ඔය විදිහට නම් ඒ කීම තියෙන්නෙ ත්‍රිවේද බ්‍රාහ්මණයන් ගේ කථාව ඒකාන්තයෙන් ම පදනමක් නැති බවට පත් වෙනවා ම යි."

20. සාධු වාසෙට්ඨ. තේ වත වාසෙට්ඨ තේවිජ්ජා බ්‍රාහ්මණා යං න ජානන්ති යං න පස්සන්ති තස්ස සහව්‍යතාය මග්ගං දේසෙස්සන්ති: අයමේව උජුමග්ගෝ අයමඤ්ජසායනෝ නිය්‍යාණිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායාති නේතං ඨානං විජ්ජතීති.

20. හොඳයි පින්වත් වාසෙට්ඨයෙනි. ඒකාන්තයෙන් ම පින්වත් වාසෙට්ඨයෙනි, ඒ ත්‍රිවේද බ්‍රාහ්මණයන් යම් බ්‍රහ්මයෙකුව දන්නෙත් නැත්නම්, දකින්නෙත් නැත්නම්, ඔහු හා එක් වීම පිණිස මාර්ගයකුත් දේශනා කරනවා නම්, ඒ කියන්නේ "මේකම යි මාර්ගය. මේකම යි ඒකාන්ත මාවත, මේක ම යි බ්‍රහ්මයා ගේ ලෝකය කරා යන මාවත" කියල ඒක වෙන්න පුළුවන් දෙයක් නොවෙයි.

21. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසෝ චාතුම්මහාපථේ නිස්සේණිං කරෙය්‍ය පාසාදස්ස ආරෝහණාය, තමේනං ඒවං වදෙය්‍යුං: අම්භෝ පුරිස යස්ස ත්වං පාසාදස්ස ආරෝහණාය නිස්සේණිං කරෝසි, ජානාසි තං පාසාදං පුරත්ථිමාය වා දිසාය දක්ඛිණාය වා දිසාය ප-ඡිමාය වා දිසාය උත්තරාය වා දිසාය, උ-චෝ වා නීචෝ වා මජ්ඣිමෝ වා?ති, ඉති පුට්ඨෝ "නෝ"ති වදෙය්‍ය, තමේනං ඒවං වදෙය්‍යුං: අම්භෝ පුරිස යං ත්වං න ජානාසි න පස්සසි තස්ස ත්වං පාසාදස්ස ආරෝහණාය නිස්සේණිං කරෝසි?ති. ඉති පුට්ඨෝ "ආමෝ"ති වදෙය්‍ය.

21. පින්වත් වාසෙට්ඨ, මේ වගේ දේකුත් තියෙනවා. පුරුෂයෙක් හතරමං හන්දියක ප්‍රාසාදයකට නැගීම පිණිස කියල ඉණිමගක් බඳිනවා. එතකොට අනෙක් අය ඔහුගෙන් මෙහෙම අහනවා. "එම්බා පුරුෂය, ඔබ යම්

ප්‍රාසාදයකට නැගීම පිණිස ඉණිමගක් බඳිමින් ඉන්නවා. ඒ ප්‍රාසාදය තියෙන්නේ පෙරදිග දිශාවේ ද? දකුණු දිශාවේ ද? බටහිර දිශාවේ ද? උතුරු දිශාවේ ද? කියල දන්නවා ද? ඒ ප්‍රාසාදය උස එකක් ද? මිටි එකක් ද? මධ්‍යම එකක් ද? කියල දන්නවා ද? මෙසේ අසද්දිත් ඔහු පිළිතුරු දෙන්නේ "දන්නේ නැත" කියල යි. එතකොට අනෙක් අය මෙහෙම අහනවා "එම්බා පුරුෂය, යම් ප්‍රාසාදයක් ගැන ඔබ දන්නෙත් නැත්නම්, දකින්නෙත් නැත්නම්, ඒ ප්‍රාසාදයට නැගීම පිණිස ද ඔබ ඔය ඉණිමග බඳින්නේ?" කියල. එතකොට ඔහු පිළිතුරු දෙන්නේ "එසේ ය" කියල යි.

තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, නනු ඒවං සන්තේ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතී?ති.

"පින්වත් වාසෙට්ඨ, මේ ගැන කුමක් ද හිතන්නේ? ඔහු ගේ කීම එවැනි දෙයක් නම් ඒ පුරුෂයා ගේ ඒ කථාව පදනමක් නැති දෙයක් බවට පත් වෙනවා නේ ද?

"අද්ධා ඛෝ භෝ ගෝතම ඒවං සන්තේ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති"ති.

"භවත් ගෞතමයන් වහන්ස, ඔහු ගේ කීම එවැනි දෙයක් නම් ඒ පුරුෂයා ගේ ඒ කථාව ඒකාන්තයෙන් ම පදනමක් නැති දෙයක් බවට පත් වෙනවා ම යි."

22. ඒවමේව ඛෝ වාසෙට්ඨ න කිර තේවිජ්ජේහි බ්‍රාහ්මණේහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨෝ. න පි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියේහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨෝ. න පි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියපාචරියේහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨෝ. න පි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියමහයුගේහි බ්‍රහ්මා යේන බ්‍රහ්මා සක්ඛිදිට්ඨෝ. "යේපි කිර තේවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයෝ මන්තානං කත්තාරෝ මන්තානං පවත්තාරෝ, යේසමිදං එතරහි තේවිජ්ජා බ්‍රාහ්මණා පෝරාණං මන්තපදං ගීතං පවුත්තං සමූහිතං, තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති, සෙය්‍යථීදං: අට්ඨකෝ වාමකෝ වාමදේවෝ වෙස්සාමිත්තෝ යමතග්ගි අංගීරසෝ භාරද්වාජෝ වාසෙට්ඨා කස්සපෝ භගු. තේපි න ඒවමාහංසු: මයමේතං ජානාමි, මයමේතං පස්සාමි, යත්ථ වා බ්‍රහ්මා යේන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මාති. තේවිජ්ජා බ්‍රාහ්මණා ඒවමාහංසු: යං න ජානාම යං න පස්සාම, තස්ස සහව්‍යතාය මග්ගං දේසේම: අයමේව

උජුමග්ගෝ අයමඤ්ඤායනෝ නිය්‍යාණිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායා”ති.

22. පින්වත් වාසෙට්ඨ, ඔය විදිහම යි ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණවරුන් විසින් බ්‍රහ්මයාව සියැසින් දැකලත් නෑ. ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණවරුන් ගේ ආචාර්යවරුන් විසින් බ්‍රහ්මයාව සියැසින් දැකලත් නෑ. ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණවරුන් ගේ ආචාර්යප්‍රාචාර්යවරුන් විසින් බ්‍රහ්මයාව සියැසින් දැකලත් නෑ. ඒ ත්‍රිවිද්‍යා බ්‍රාහ්මණවරුන් ගේ සත්වෙනි ආචාර්ය පරපුර විසින් ද බ්‍රහ්මයාව සියැසින් දැකලත් නෑ. ඒ වගේ ම ඒ ත්‍රිවේද ඇති බ්‍රාහ්මණයන් ගේ මන්ත්‍ර හදපු, මන්ත්‍ර නිර්මාණය කරපු, මන්ත්‍ර පවසපු පූර්ව ඍෂිවරු ඉන්නවා. ඒ කියන්නේ; අට්ටක, වාමක, වාමදේව, වෙස්සාමිත්ත, යමතග්ගි, අංගීරස, භාරද්වාජ, වාසෙට්ඨ, කස්සප, භගු යන අය යි. දැන් කාලේ ඒ විදිහට ම ත්‍රිවේද ඇති බමුණන් ඒ ඍෂිවරුන් ගේ පැරණි මන්ත්‍රපද ගායනා කරනවා ද, රැස් කරනවා ද, ඒවා ඒ විදිහට ම ගයනවා ද, ඔවුන් කිව්ව අයුරින් ම කියනවා ද, ඔවුන් පවසන වචනවලින් ම පවසනවා ද, ඒ ඍෂිවරු පවා “යම් තැනක බ්‍රහ්මයා ඉන්නවා ද, යම් විටෙක බ්‍රහ්මයා ඉන්නවා ද, යම් පෙදෙසක බ්‍රහ්මයා ඉන්නවා ද ඒ ඔහුව අපි දන්නවා. අපි දකිනවා” යයි මෙහෙම කියලත් නෑ. නමුත් ත්‍රිවේද බ්‍රාහ්මණයන් මෙහෙම කියනවා. යම් බ්‍රහ්මයෙක් ගැන අපි දන්නේ නෑ තමයි. අපි දකින්නෙ නෑ තමයි. ඒ බ්‍රහ්මයා සමග එක්වෙන මාර්ගය නම් දේශනා කරනවා. “මේකම යි මාර්ගය. මේකම යි ඒකාන්ත මාවත, මේක ම යි බ්‍රහ්මයා ගේ ලෝකය කරා යන මාවත” කියල

“තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, නනු ඒවං සන්තේ තේවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති?”ති.

“පින්වත් වාසෙට්ඨ, මේ ගැන කුමක් ද හිතන්නේ? ඔය විදිහට නම් ඒ කීම තියෙන්නෙ ත්‍රිවේද බ්‍රාහ්මණයන් ගේ කථාව පදනමක් නැති බවට පත් වෙනවා නේද?”

“අද්ධා ඛෝ භෝ ගෝතම ඒවං සන්තේ තේවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජති”ති.

“භවත් ගෞතමයන් වහන්ස, ඔය විදිහට නම් ඒ කීම තියෙන්නෙ ත්‍රිවේද බ්‍රාහ්මණයන් ගේ කථාව ඒකාන්තයෙන් ම පදනමක් නැති බවට පත් වෙනවා ම යි.”

23. සාධු වාසෙට්ඨ. තේ වත වාසෙට්ඨ තේවිජ්ජා බ්‍රාහ්මණා යං න ජානන්ති යං න පස්සන්ති තස්ස සහව්‍යතාය මග්ගං දේසෙස්සන්ති: අයමේව උජුමග්ගෝ අයමඤ්ජසායනෝ නියාණිකෝ නියාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායාති නේතං ඨානං විජ්ජතීති.

23. හොඳයි පින්වත් වාසෙට්ඨයෙනි. ඒකාන්තයෙන් ම පින්වත් වාසෙට්ඨයෙනි, ඒ ත්‍රිවේද බ්‍රාහ්මණයන් යම් බ්‍රහ්මයෙකුව දන්නෙත් නැත්නම්, දකින්නෙත් නැත්නම්, ඔහු හා එක් වීම පිණිස මාර්ගයකුත් දේශනා කරනවා නම්, ඒ කියන්නේ "මේකම යි මාර්ගය. මේකම යි ඒකාන්ත මාවත, මේක ම යි බ්‍රහ්මයා ගේ ලෝකය කරා යන මාවත" කියල ඒක වෙන්න පුළුවන් දෙයක් නොවෙයි.

24. සෙය්‍යථාපි වාසෙට්ඨ අයං අචිරවතී නදී පූරා උදකස්ස සමතිත්තිකා කාකපෙය්‍යා, අථ පුරිසෝ ආග-ඡෙය්‍ය පාරත්ථිකෝ පාරගවේසී පාරගාමී පාරං තරිතුකාමෝ, සෝ විරිමේ තීරේ ඨිතෝ පාරිමං තීරං අව්හෙය්‍ය: ඒහි පාරාපාරං, ඒහි පාරාපාරන්ති, නං කිම්මඤ්ඤසි වාසෙට්ඨ අපි නු තස්ස පුරිසස්ස අව්හායනහේතු වා ආයාචනහේතු වා පත්ථනාහේතු වා අභිනන්දනහේතු වා අචිරවතියා නදියා පාරිමං තීරං විරිමං තීරං ආග-ඡෙය්‍යා?"ති. "නෝ හිදං භෝ ගෝතම"

24. පින්වත් වාසෙට්ඨ, ඒක මේ වගේ දෙයක්. මේ අචිරවතී නදිය වතුරෙන් පිරිල කට මට්ටමට ඇවිදින් කපුටන්ට වුණත් ඉවුරේ ඉදන් වතුර බොන්න පුළුවන් වෙලා තියෙද්දී, ඔතැනට පුරුෂයෙක් එනවා. ඔහු එතෙර යෑමෙන් ප්‍රයෝජන ඇති, එතෙර වීමක් සොයන, එතෙර යන, එතෙර යනු කැමැති කෙනෙක්. ඉතින් ඔහු මෙතෙර සිටිය දී ම එතෙරට අඬගසනවා. "අනේ එතෙර මෙතෙරට එනු මැනැව. අනේ එතෙර මෙතෙරට එනු මැනැව" කියල. පින්වත් වාසෙට්ඨ, මේ ගැන කුමක් ද හිතන්නේ? අර පුද්ගලයා ගේ අඬගැසීමේ හේතුවෙන් හෝ යාඥාවේ හේතුවෙන් හෝ පැතීමේ හේතුවෙන් හෝ ස්තුති කිරීමේ හේතුවෙන් හෝ අචිරවතී නදියේ එතෙර මෙතෙරට ඒවිද? භවත් ගෞතමයෙනි, එය නොවේ ම යි.

25. එවමේව ඛෝ වාසෙට්ඨ තේවිජ්ජා බ්‍රාහ්මණා යේ ධම්මා බ්‍රාහ්මණ කරණා තේ ධම්මේ පහාය වත්තමානා, යේ ධම්මා අබ්‍රාහ්මණකරණා තේ ධම්මේ සමාදාය වත්තමානා ඒවමාහංසු: ඉන්දමව්හයාම, සෝමමව්හයාම,

වරුණමව්හයාම, ඊසානමව්හයාම, පජාපතිමව්හයාම, බ්‍රහ්මමව්හයාම, මහින්දමව්හයාම, යාමමව්හයාමාති. තේ වත වාසෙට්ඨ තේවිජ්ජා බ්‍රාහ්මණා යේ ධම්මා බ්‍රාහ්මණකරණා තේ ධම්මේ පහාය වත්තමානා, යේ ධම්මා අබ්‍රාහ්මණකරණා තේ ධම්මේ සමාදාය වත්තමානා, අව්හායනහේතු වා ආයාචනහේතු වා පත්ථනාහේතු වා අභිනන්දනහේතු වා කායස්ස භේදා පරම්මරණා බ්‍රහ්මුණෝ සහව්‍යූපගා භවිස්සන්තීති. නේතං ඨානං විජ්ජති.

25. පින්වත් වාසෙට්ඨ, ඔන්න ඔය විදිහම යි ඒ ත්‍රිවේද බ්‍රාහ්මණවරු බ්‍රාහ්මණ බවට පමුණුවන යම් ධර්ම ඇත්නම්, ඒ ධර්මයන් බැහැර කරල, අබ්‍රාහ්මණබව ඇති කරන යම් ධර්ම ඇත්නම්, ඒ ධර්ම සමාදන් වෙලා පුරුදු කර කර මෙහෙම කියනවා. “අපි ඉන්ද්‍ර දෙවියාව කැඳවනවා. සෝම දෙවියාව කැඳවනවා. වරුණ දෙවියාව කැඳවනවා. ඊසාන දෙවියාව කැඳවනවා. ප්‍රජාපතී දෙවියාව කැඳවනවා. බ්‍රහ්ම දෙවියාව කැඳවනවා. මහේන්ද්‍ර දෙවියාව කැඳවනවා. යාම දෙවියාව කැඳවනවා” කියල. ඉතින් පින්වත් වාසෙට්ඨ, ඒ ත්‍රිවේද බ්‍රාහ්මණවරු බ්‍රාහ්මණවරු බ්‍රාහ්මණ බවට පමුණුවන යම් ධර්ම ඇත්නම්, ඒ ධර්මයන් බැහැර කරල, අබ්‍රාහ්මණබව ඇති කරන යම් ධර්ම ඇත්නම්, ඒ ධර්ම සමාදන් වෙලා පුරුදු කර කර දෙවියන්ට අඬගැසීමේ හේතුවෙන් හෝ යාඥාවේ හේතුවෙන් හෝ පැතීමේ හේතුවෙන් හෝ ස්තුති කිරීමේ හේතුවෙන් හෝ කය බිඳී මරණින් මතු බ්‍රහ්මයා සමග එක්වීමකට පත් වෙනවා ය යන කරුණ විය හැකි දෙයක් නම් නොවෙයි.

26. සෙය්‍යථාපි වාසෙට්ඨ අයං අචිරවතී නදී පූරා උදකස්ස සමතිත්තිකා කාකපෙය්‍යා, අථ ඛෝ පුරිසෝ ආග-ඡෙය්‍ය පාරත්ථිකෝ පාරගවේසී පාරගාමී පාරං තරිතුකාමෝ, සෝ විරිමේ තීරේ දළ්හාය අන්දුයා ප-ඡාබාහං ගාළ්හබන්ධනං බද්ධෝ, තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, අපි නු සෝ පුරිසෝ අචිරවතියා නදියා විරිමා තීරා පාරිමං තීරං ග-ඡෙය්‍යා?”ති. “නෝ හිදං හෝ ගෝතම”

26. පින්වත් වාසෙට්ඨ, මේ වගේ දෙයක් තියෙනවා. මේ අචිරවතී නදිය වතුරෙන් පිරිල කට මට්ටමට ඇවිදින් කපුටන්ට වුණත් ඉවුරේ ඉදන් වතුර බොන්න පුළුවන් වෙලා තියෙද්දී, ඔතැනට පුරුෂයෙක් එනවා. ඔහු එතෙර යෑමෙන් ප්‍රයෝජන ඇති, එතෙර වීමක් සොයන, එතෙර යන, එතෙර යනු කැමැති කෙනෙක්. නමුත් ඔහුව මෙතෙරට තියල දැත් පිටිපසට කරල දැඩි දම්වැලකින් තද කොට බැඳලා නම් තියෙන්නේ, පින්වත් වාසෙට්ඨ, කුමක් ද

මේ ගැන සිතන්නේ? එතකොට ඒ පුරුෂයාට අචිරවතී නදියේ මෙතෙරින් එතෙරට යන්ට පුළුවන් වේවි ද?" "භවත් ගෞතමයන් වහන්ස, එය නොවේ ම ය."

27. "ඒවමේව ඛෝ වාසෙට්ඨ පඤ්චිමේ කාමගුණා අරියස්ස විනයේ අන්දූ'නි'පි වු-චන්ති බන්ධනන්තිපි වු-චන්ති. කතමේ පඤ්ච? චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියාරූපා කාමූපසංහිතා රජනීයා. සෝතවිඤ්ඤෙය්‍යා සද්දා ..... ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා ..... ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා ..... කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියාරූපා කාමූපසංහිතා රජනීයා. ඉමේ ඛෝ වාසෙට්ඨ පඤ්ච කාමගුණා අරියස්ස විනයේ අන්දූති'පි වු-චන්ති බන්ධනන්ති'පි වු-චන්ති. ඉමේ ඛෝ වාසෙට්ඨ පඤ්චකාමගුණේ තේවිජ්ජා බ්‍රාහ්මණා ගථිතා මු-ඡිතා අජ්ඣෝපන්නා අනාදීනවදස්සාවිනෝ අනිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්ති.

27. "පින්වත් වාසෙට්ඨ, අන්න ඒ වගේ ම යි ආර්ය විනයෙහි මේ පංච කාම ගුණයන්ට කියන්නේ දම්වැල කියල යි, බන්ධනය කියල යි. කවර පහක් ද යත්; ඉතා යහපත් වූ, සුන්දර වූ, මනාප වූ, ප්‍රිය ස්වභාව ඇති කාමරාගය ඇති කරවන, කෙලෙස් ඇති කරවන, ඇසින් දත යුතු රූප තියෙනවා ..... කණින් දත යුතු ශබ්ද තියෙනවා. ..... නාසයෙන් දත යුතු ගඳ සුවඳ තියෙනවා. ..... දිවෙන් දත යුතු රස තියෙනවා. ..... ඉතා යහපත් වූ, සුන්දර වූ, මනාප වූ, ප්‍රිය ස්වභාව ඇති කාමරාගය ඇති කරවන, කෙලෙස් ඇති කරවන, කයින් දත යුතු පහස තියෙනවා. පින්වත් වාසෙට්ඨ, ආර්ය විනයෙහි දම්වැල කියන්නෙත්, බන්ධනය කියන්නෙත් ඔය පංචකාම ගුණයට යි. පින්වත් වාසෙට්ඨ, ත්‍රිවේද බ්‍රාහ්මණයන් මේ පංච කාමගුණයෙහි ගිජුවෙලා, මුසපත් වෙලා, එහි ම බැසගෙන ඒ පංචකාමයන් ගැන ආදීනව නො දැක එය අත්හැරීමේ ප්‍රඥාවෙන් තොරව තමයි ඒවා පරිභෝග කරන්නෙ.

28. තේ වත වාසෙට්ඨ තේවිජ්ජා බ්‍රාහ්මණා යේ ධම්මා බ්‍රාහ්මණකරණා තේ ධම්මේ පහාය වත්තමානා, යේ ධම්මා අබ්‍රාහ්මණකරණා තේ ධම්මේ සමාදාය වත්තමානා, පඤ්චකාමගුණේ ගථිතා මු-ඡිතා අජ්ඣෝපන්නා අනාදීනවදස්සාවිනෝ අනිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්තා කාමන්දූ බන්ධනාබද්ධා කායස්ස භේදා පරම්මරණා බ්‍රහ්මුනෝ සහව්‍යූපගා භවිස්සන්තීති. නේතං ඨානං විජ්ජති.

28. පින්වත් වාසෙට්ඨ, ඔන්න ඔය විදිහටම ත්‍රිවේද බ්‍රාහ්මණවරු බ්‍රාහ්මණ බවට පමුණුවන යම් ධර්ම ඇත්නම්, ඒ ධර්මයන් බැහැර කරල, අබ්‍රාහ්මණබව ඇති කරන යම් ධර්ම ඇත්නම්, ඒ ධර්ම සමාදන් වෙලා පුරුදු කර කර පංච කාම ගුණයන්ට ගිජුවෙලා, මුසපත් වෙලා, එහි ම බැසගෙන ඒ පංචකාමයන් ගැන ආදීනව නොදැක එය අත්හැරීමේ ප්‍රඥාවෙන් තොරව තමයි ඒව පරිභෝග කරමින් කාමබන්ධනයෙන් බැඳිල ඉඳගෙන කය බිඳී මරණින් මතු බ්‍රහ්මයා සමග එක්වීමකට යනවා කියන කරුණ නම් සිදුවිය හැකි දෙයක් නොවෙයි.

29. සෙය්‍යථාපි වාසෙට්ඨ අයං අචිරවතී නදී පූරා උදකස්ස සමතිත්තිකා කාකපෙය්‍යා, අථ පුරිසෝ ආග-ඡෙය්‍ය පාරත්ථිකෝ පාරගවේසී පාරගාමී පාරං තරිතුකාමෝ, සෝ විරිමේ තීරේ සසීසං පාරුපිත්වා නිපජ්ජෙය්‍ය, තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, අපි නු සෝ පුරිසෝ අචිරවතියා නදියා විරිමා තීරා පාරිමං තීරං ග-ඡෙය්‍යා?"ති. "නෝ හිදං භෝ ගෝතම"

29. පින්වත් වාසෙට්ඨ, මේ වගේ දෙයක් තියෙනවා. මේ අචිරවතී නදිය වතුරෙන් පිරිල කට මට්ටමට ඇවිදින් කපුටන්ට වුණත් ඉවුරේ ඉඳන් වතුර බොන්න පුළුවන් වෙලා තියෙද්දී, ඔතැනට පුරුෂයෙක් එනවා. ඔහු එතෙර යෑමෙන් ප්‍රයෝජන ඇති, එතෙර වීමක් සොයන, එතෙර යන, එතෙර යනු කැමැති කෙනෙක්. නමුත් ඔහු මෙතෙරට වෙලා හිසපටන් මුළු ඇඟම පොරොවා ගෙන වැතිරිලා ඉන්නවා. පින්වත් වාසෙට්ඨ, කුමක් ද මේ ගැන සිතන්නේ? එතකොට ඒ පුරුෂයාට අචිරවතී නදියේ මෙතෙරින් එතෙරට යන්ට පුළුවන් වේවි ද?" "භවත් ගෞතමයන් වහන්ස, එය නොවේ ම ය."

30. ඒවමේව ඛෝ වාසෙට්ඨ පඤ්චිමේ නීවරණා අරියස්ස විනයේ ආවරණා'ති'පි වු-චන්ති. නීවරණා'ති'පි වු-චන්ති. විනාහා'ති'පි වු-චන්ති. පරියෝනාහා'ති'පි වු-චන්ති. කතමේ පඤ්ච? කාම-ඡන්දනීවරණං. ව්‍යාපාදනීවරණං. ථීනමිද්ධනීවරණං. උද්ධ-චකුක්කු-චනීවරණං. විචිකි-ඡානීවරණං. ඉමේ ඛෝ වාසෙට්ඨ පඤ්චනීවරණා අරියස්ස විනයේ ආවරණා'ති'පි වු-චන්ති. නීවරණා'ති'පි වු-චන්ති. විනාහා'ති'පි වු-චන්ති. පරියෝනාහා'ති'පි වු-චන්ති. ඉමේ හි ඛෝ වාසෙට්ඨ පඤ්චහි නීවරණේහි තේවිජ්ජා බ්‍රාහ්මණා ආවුටා නිවුටා ව්වුටා පරියෝනද්ධා. තේ වත වාසෙට්ඨ තේවිජ්ජා බ්‍රාහ්මණා යේ ධම්මා බ්‍රාහ්මණකරණා තේ ධම්මේ පහාය වත්තමානා, යේ ධම්මා අබ්‍රාහ්මණකරණා තේ ධම්මේ සමාදාය වත්තමානා. පඤ්ච නීවරණේහි ආවුටා නිවුටා ව්වුටා පරියෝනද්ධා කායස්ස භේදා

පරම්මරණා බ්‍රහ්මුණෝ සහව්‍යූපගා භවිස්සන්ති'ති නේතං ඨානං විජ්ජති.

30. පින්වත් වාසෙට්ඨ, අන්න ඒ වගේ ම යි ආර්ය විනයෙහි මේ පංච නීවරණයන්ට කියන්නේ "නිවන් මග වසාලන දේ" කියල යි. "නීවරණ" කියල යි. "යටිකුරු අතට (අපා ගමනට) බැඳතබන දේ" කියල යි. "හාත්පසින් බැඳ තබන දේ" කියල යි. කවර පහක් ද යත්? කාමච්ඡන්ද (කම් සුවයට ඇති කැමැත්ත) නීවරණය. ව්‍යාපාද (තරහ) නීවරණය. ථීනමිද්ධ (නිදිමත අලසබව) නීවරණය. උද්ධච්චකුක්කුච්ච (සිතේ විසිරීම, පසුතැවීම) නීවරණය. විචිකිච්ඡා (සැකය) නීවරණය යන පහ යි. පින්වත් වාසෙට්ඨ, ආර්ය විනයෙහි "නිවන් මග වසාලන දේ" කියල, "නීවරණ" කියල, "යටිකුරු අතට (අපා ගමනට) බැඳතබන දේ" කියල, "හාත්පසින් බැඳ තබන දේ" කියල කියන්නේ මේ පංච නීවරණයන්ට යි. පින්වත් වාසෙට්ඨ, ත්‍රිවේද බ්‍රාහ්මණවරු මේ පංච නීවරණයන්ගෙන් වැහිලයි ඉන්නේ, ඒ තුළට ම වැදිලයි ඉන්නේ, ගැටගැසිලයි ඉන්නේ, හාත්පසින් ම බැඳිලයි ඉන්නේ, ඉතින් පින්වත් වාසෙට්ඨ, ඒ ත්‍රිවේද බ්‍රාහ්මණවරු බ්‍රාහ්මණබව ඇති කරවන යම් ධර්ම ඇත්නම් එයින් බැහැර වෙලා, අබ්‍රාහ්මණබව ඇති කරවන යම් ධර්ම ඇත්නම් ඒවා සමාදන් වෙලා, පුරුදු කර කර පංච නීවරණයන්ගෙන් වැහිල ඒ තුළට ම වැදිල, ගැට ගැසිල, හාත්පසින් ම බැඳිල ඉඳගෙන කය බිඳී මරණින් මතු බ්‍රහ්මයා හා එක්වීමකට යනවා කියන කරුණ සිදු වෙන දෙයක් නම් නොවෙයි.

31. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, කින්ති තේ සුතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං: "සපරිග්ගහෝ වා බ්‍රහ්මා අපරිග්ගහෝ වා"ති. "අපරිග්ගහෝ භෝ ගෝතම."

31. පින්වත් වාසෙට්ඨ, කුමක් ද මේ ගැන හිතන්නේ? වයෝවෘද්ධ මහළු ආචාර්ය ප්‍රාචාර්ය වූ බ්‍රාහ්මණයන් කියන්නා වූ වචන ඔබ අහල තියෙන්නේ කොහොම ද? "බ්‍රහ්මයා ස්ත්‍රීන් සමග එක්ව වාසය කරන කෙනෙක් ද? ස්ත්‍රීන් හා එක්වීම නැති කෙනෙක් ද?" "භවත් ගෞතමයන් වහන්ස, (බ්‍රහ්මයා) ස්ත්‍රීන් හා එක්වීම නැති කෙනෙක්."

"සවේරචිත්තෝ වා අවේරචිත්තෝ වා?"ති. "අවේරචිත්තෝ භෝ ගෝතම."

"(බ්‍රහ්මයා) වෛර සිත් ඇති කෙනෙක් ද? අවෛරී සිත් ඇති කෙනෙක් ද?" "භවත් ගෞතමයන් වහන්ස, (බ්‍රහ්මයා) අවෛරී සිත් ඇති කෙනෙක්."

"සව්‍යාපජ්ඣචිත්තෝ වා අව්‍යාපජ්ඣචිත්තෝ වා?"ති. "අව්‍යාපජ්ඣචිත්තෝ හෝ ගෝතම."

"(බ්‍රහ්මයා) පීඩා සහිත සිත් ඇති කෙනෙක් ද? පීඩා රහිත සිත් ඇති කෙනෙක් ද?" "භවත් ගෞතමයන් වහන්ස, (බ්‍රහ්මයා) පීඩා රහිත සිත් ඇති කෙනෙක්."

"සංකිලිට්ඨචිත්තෝ වා අසංකිලිට්ඨචිත්තෝ වා?"ති. "අසංකිලිට්ඨචිත්තෝ හෝ ගෝතම."

"(බ්‍රහ්මයා) කිලිටි සිත් ඇති කෙනෙක් ද? නො කිලිටි සිත් ඇති කෙනෙක් ද?" "භවත් ගෞතමයන් වහන්ස, (බ්‍රහ්මයා) නො කිලිටි සිත් ඇති කෙනෙක්."

"වසවත්තී වා අවසවත්තී වා?"ති. "වසවත්තී හෝ ගෝතම."

"(බ්‍රහ්මයා) තමා වසඟයෙහි පවත්වාගත හැකි සිත් ඇති කෙනෙක් ද? තමා වසඟයෙහි පවත්වාගත නො හැකි සිත් ඇති කෙනෙක් ද?" "භවත් ගෞතමයන් වහන්ස, (බ්‍රහ්මයා) තමා වසඟයෙහි පවත්වාගත හැකි සිත් ඇති කෙනෙක්."

32. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, සපරිග්ගහා වා තේවිජ්ජා බ්‍රාහ්මණා අපරිග්ගහා වා"ති. "සපරිග්ගහා හෝ ගෝතම."

පින්වත් වාසෙට්ඨ, කුමක් ද මේ ගැන හිතන්නේ? "ත්‍රිවේද බ්‍රාහ්මණවරු ස්ත්‍රීන් සමග එක්ව වාසය කරනවාද? ස්ත්‍රීන් හා එක්ව වාසය කිරීමක් නැද්ද?" "භවත් ගෞතමයන් වහන්ස, (ත්‍රිවේද බ්‍රාහ්මණවරු) ස්ත්‍රීන් සමග එක්ව වාසය කරනවා."

"සවේරචිත්තා වා අවේරචිත්තා වා?"ති. "සවේරචිත්තා හෝ ගෝතම."

"(ත්‍රිවේද බ්‍රාහ්මණවරු) වෛර සිත් ඇතුව ඉන්නවා ද? අවෛරී සිත් ඇතුව ඉන්නවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, (ත්‍රිවේද බ්‍රාහ්මණවරු) වෛරී සිත් ඇතිවයි ඉන්නේ."

"සව්‍යාපජ්ඣචිත්තා වා අව්‍යාපජ්ඣචිත්තා වා?"ති. "සව්‍යාපජ්ඣචිත්තා හෝ ගෝතම."

"(ත්‍රිවේද බ්‍රාහ්මණවරු) පීඩා සහිත සිත් ඇතුව ඉන්නවා ද? පීඩා රහිත

සිත් ඇතුව ඉන්නවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, (ත්‍රිවේද බ්‍රාහ්මණවරු) පීඩා සහිත සිත් ඇතිවයි ඉන්නේ."

"සංකිලිට්ඨචිත්තා වා අසංකිලිට්ඨචිත්තා වා?"ති. "සංකිලිට්ඨචිත්තා හෝ ගෝතම."

"(ත්‍රිවේද බ්‍රාහ්මණවරු) කිලිටි සිත් ඇතුව ඉන්නවා ද? නොා කිලිටි සිත් ඇතුව ඉන්නවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, (ත්‍රිවේද බ්‍රාහ්මණවරු) කිලිටි සිත් ඇතිවයි ඉන්නේ."

"වසවත්තී වා අවසවත්තී වා?"ති. "අවසවත්තී හෝ ගෝතම."

"(ත්‍රිවේද බ්‍රාහ්මණවරු) තමා වසඟයෙහි පවත්වාගත හැකි සිත් ඇතුව ඉන්නවා ද? තමා වසඟයෙහි පවත්වාගත නොා හැකි සිත් ඇතුව ඉන්නවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, (ත්‍රිවේද බ්‍රාහ්මණවරු) තමා වසඟයෙහි පවත්වාගත නොා හැකි සිත් ඇතිවයි ඉන්නේ."

33. ඉති කිර වාසෙට්ඨ සපරිග්ගහා තේවිජ්ජා බ්‍රාහ්මණා. අපරිග්ගහෝ බ්‍රහ්මා. අපි නු ඛෝ සපරිග්ගහානං තේවිජ්ජානං බ්‍රාහ්මණානං අපරිග්ගහේන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දන්ති සමේති?"ති. "නෝ හිදං හෝ ගෝතම"

33. එහෙම නම් පින්වත් වාසෙට්ඨ, ත්‍රිවේද බ්‍රාහ්මණවරු ස්ත්‍රීන් සමග ඇසුරෙන් යුක්තවයි ඉන්නේ. නමුත් බ්‍රහ්මයා ස්ත්‍රී ඇසුරෙන් තොරව යි ඉන්නේ. එහෙම නම් ස්ත්‍රීන් සමග එක්ව වාසය කරන ත්‍රිවේද බ්‍රාහ්මණයන් හා ස්ත්‍රී ඇසුරෙන් තොරව ඉන්න බ්‍රහ්මයා සැසඳෙනවා ද? සම වෙනවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, එය නොවේ ම ය."

සාධු වාසෙට්ඨ. තේ වත වාසෙට්ඨ සපරිග්ගහා තේවිජ්ජා බ්‍රාහ්මණා කායස්සභේදා පරම්මරණා අපරිග්ගහස්ස බ්‍රහ්මුනෝ සහව්‍යූපගා භවිස්සන්තීති. නේතං ඨානං විජ්ජති.

"හොඳයි පින්වත් වාසෙට්ඨ, ස්ත්‍රී ඇසුරෙන් යුක්ත වූ ඒ ත්‍රිවේද බ්‍රාහ්මණවරු ඒකාන්තයෙන් ම කය බිඳී මරණින් මතු ස්ත්‍රී ඇසුරක් නැති බ්‍රහ්මයා හා එක්වීමකට යනවා ය යන කරුණ සිදුවෙන දෙයක් නම් නොවේ."

34. ඉති කිර වාසෙට්ඨ සවේරචිත්තා තේවිජ්ජා බ්‍රාහ්මණා. අවේරචිත්තෝ බ්‍රහ්මා. අපි නු ඛෝ සවේරචිත්තානං තේවිජ්ජානං බ්‍රාහ්මණානං

අවේරචිත්තේන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දන්ති සමේති?"ති. "නෝ හිදං භෝ ගෝතම"

34. එහෙම නම් පින්වත් වාසෙට්ඨ, ත්‍රිවේද බ්‍රාහ්මණවරු වෛර සිතින් යුක්තව යි ඉන්නේ. නමුත් බ්‍රහ්මයා වෛර සිතින් තොරව යි ඉන්නේ. එහෙම නම් වෛර සිතින් වාසය කරන ත්‍රිවේද බ්‍රාහ්මණයන් හා වෛර සිතින් තොරව ඉන්න බ්‍රහ්මයා සැසඳෙනවා ද? සම වෙනවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, එය නොවේ ම ය."

සාධු වාසෙට්ඨ. තේ වත වාසෙට්ඨ සවේරචිත්තා තේවිජ්ජා බ්‍රාහ්මණා කායස්සභේදා පරම්මරණා අවේරචිත්තස්ස බ්‍රහ්මුනෝ සහව්‍යූපගා භවිස්සන්තීති. නේතං ඨානං විජ්ජති.

"හොඳයි පින්වත් වාසෙට්ඨ, වෛර සිතින් යුක්ත වූ ඒ ත්‍රිවේද බ්‍රාහ්මණවරු ඒකාන්තයෙන් ම කය බිඳී මරණින් මතු වෛර සිත් නැති බ්‍රහ්මයා හා එක්වීමකට යනවා ය යන කරුණ සිදුවෙන දෙයක් නම් නොවේ."

35. ඉති කිර වාසෙට්ඨ සව්‍යාපජ්ඣචිත්තා තේවිජ්ජා බ්‍රාහ්මණා. අව්‍යාපජ්ඣචිත්තෝ බ්‍රහ්මා. අපි නු ඛෝ සව්‍යාපජ්ඣචිත්තානං තේවිජ්ජානං බ්‍රාහ්මණානං අව්‍යාපජ්ඣචිත්තේන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දන්ති සමේති?"ති. "නෝ හිදං භෝ ගෝතම"

35. එහෙම නම් පින්වත් වාසෙට්ඨ, ත්‍රිවේද බ්‍රාහ්මණවරු පීඩා සහිත සිතින් යුක්තවයි ඉන්නේ. නමුත් බ්‍රහ්මයා පීඩා රහිත සිතිනුයි ඉන්නේ. එහෙම නම් පීඩා සහිත සිතින් වාසය කරන ත්‍රිවේද බ්‍රාහ්මණයන් හා පීඩා රහිත සිත් ඇති බ්‍රහ්මයා සැසඳෙනවා ද? සම වෙනවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, එය නොවේ ම ය."

සාධු වාසෙට්ඨ. තේ වත වාසෙට්ඨ සව්‍යාපජ්ඣචිත්තා තේවිජ්ජා බ්‍රාහ්මණා කායස්සභේදා පරම්මරණා අව්‍යාපජ්ඣචිත්තස්ස බ්‍රහ්මුනෝ සහව්‍යූපගා භවිස්සන්තීති. නේතං ඨානං විජ්ජති.

"හොඳයි පින්වත් වාසෙට්ඨ, පීඩා සහිත සිතින් යුක්ත වූ ඒ ත්‍රිවේද බ්‍රාහ්මණවරු ඒකාන්තයෙන් ම කය බිඳී මරණින් මතු පීඩා රහිත සිත් ඇති බ්‍රහ්මයා හා එක්වීමකට යනවා ය යන කරුණ සිදුවෙන දෙයක් නම් නොවේ."

36. ඉති කිර වාසෙට්ඨ සංකිලිට්ඨචිත්තා තේවිජ්ජා බ්‍රාහ්මණා. අසංකිලිට්ඨචිත්තෝ බ්‍රහ්මා. අපි නු ඛෝ සංකිලිට්ඨචිත්තානං තේවිජ්ජානං බ්‍රාහ්මණානං අසංකිලිට්ඨචිත්තේන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දන්ති සමේතී?"ති. "නෝ හිදං භෝ ගෝතම"

36. එහෙම නම් පින්වත් වාසෙට්ඨ, ත්‍රිවේද බ්‍රාහ්මණවරු කිලිටි සිතින් යුක්තවයි ඉන්නේ. නමුත් බ්‍රහ්මයා නො කිලිටි සිතිනුයි ඉන්නේ. එහෙම නම් කිලිටි සිතින් වාසය කරන ත්‍රිවේද බ්‍රාහ්මණයන් හා නො කිලිටි සිත් ඇති බ්‍රහ්මයා සැසඳෙනවා ද? සම වෙනවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, එය නොවේ ම ය."

සාධු වාසෙට්ඨ. තේ වත වාසෙට්ඨ සංකිලිට්ඨචිත්තා තේවිජ්ජා බ්‍රාහ්මණා කායස්සභේදා පරම්මරණා අසංකිලිට්ඨචිත්තස්ස බ්‍රහ්මුනෝ සහව්‍යූපගා භවිස්සන්තීති. නේතං ඨානං විජ්ජති.

"හොඳයි පින්වත් වාසෙට්ඨ, කිලිටි සිතින් යුක්ත වූ ඒ ත්‍රිවේද බ්‍රාහ්මණවරු ඒකාන්තයෙන් ම කය බිඳී මරණින් මතු නො කිලිටි සිත් ඇති බ්‍රහ්මයා හා එක්වීමකට යනවා ය යන කරුණ සිදුවෙන දෙයක් නම් නොවේ."

37. ඉති කිර වාසෙට්ඨ අවසවත්තී තේවිජ්ජා බ්‍රාහ්මණා. වසවත්තී බ්‍රහ්මා. අපි නු ඛෝ අවසවත්තීනං තේවිජ්ජානං බ්‍රාහ්මණානං වසවත්තිනා බ්‍රහ්මුනා සද්ධිං සංසන්දන්ති සමේතී?"ති. "නෝ හිදං භෝ ගෝතම"

37. එහෙම නම් පින්වත් වාසෙට්ඨ, ත්‍රිවේද බ්‍රාහ්මණවරු තමා ගේ වසඟයේ පැවැත්විය නොහැකි සිතින් යුක්තවයි ඉන්නේ. නමුත් බ්‍රහ්මයා තමා ගේ වසඟයේ පැවැත්විය හැකි සිතිනුයි ඉන්නේ. එහෙම නම් තමා ගේ වසඟයේ පැවැත්විය නොහැකි සිතින් වාසය කරන ත්‍රිවේද බ්‍රාහ්මණයන් හා තමා ගේ වසඟයේ පැවැත්විය හැකි සිත් ඇති බ්‍රහ්මයා සැසඳෙනවා ද? සම වෙනවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, එය නොවේ ම ය."

සාධු වාසෙට්ඨ. තේ වත වාසෙට්ඨ අවසවත්තී තේවිජ්ජා බ්‍රාහ්මණා කායස්සභේදා පරම්මරණා වසවත්තිස්ස බ්‍රහ්මුනෝ සහව්‍යූපගා භවිස්සන්තීති. නේතං ඨානං විජ්ජති.

"හොඳයි පින්වත් වාසෙට්ඨ, තමාගේ වසඟයේ පැවැත්විය නො හැකි සිතින් යුක්ත වූ ඒ ත්‍රිවේද බ්‍රාහ්මණවරු ඒකාන්තයෙන් ම කය බිඳී මරණින්

මතු තමා ගේ වසඟයේ පැවැත්විය හැකි සිත් ඇති බ්‍රහ්මයා හා එක්වීමකට යනවා ය යන කරුණ සිදුවෙන දෙයක් නම් නොවේ.”

ඉධ බෝ පන තේ වාසෙට්ඨ තේවිජ්ජා බ්‍රාහ්මණා ආසීදිත්වා සංසීදන්ති, සංසීදිත්වා විසාදං වා පාපුණන්ති. සුක්ඛතරණං මඤ්ඤේ පතරන්ති. තස්මා ඉදං තේවිජ්ජානං බ්‍රාහ්මණානං තේවිජ්ජං ඉරණන්ති’පි වු-චති, තේවිජ්ජං විපිනන්ති’පි වු-චති. තේවිජ්ජං ව්‍යසනන්ති’පි වු-චතී”ති.

“පින්වත් වාසෙට්ඨ, මෙහිලා ඒ ත්‍රිවේද බ්‍රාහ්මණවරු නො මගට පැමිණිලා කාම මඩේම යි එරිල ඉන්නේ. කාම මඩේ එරී දුකට ම යි පත්වෙලා ඉන්නේ. දිය සිඳුනු වියළි බිමක අත්පා ගසමින් පිහිනන අය වගේ වෙහෙසෙන්නේ. ඒ නිසා ත්‍රිවේද බ්‍රාහ්මණයන් ගේ ඔය ත්‍රිවිද්‍යාව මහා කටුවනයක් කියලයි කියන්නේ. ඔය ත්‍රිවිද්‍යාව මහා කැලෑවක් කියලයි කියන්නේ. ඔය ත්‍රිවිද්‍යාව මහා විපත්තියක් කියලයි කියන්නේ.”

38. එවං වුත්තේ වාසෙට්ඨෝ මාණවෝ භගවන්තං එතදවෝච: “සුතං මේතං භෝ ගෝතම, සමණෝ ගෝතමෝ බ්‍රහ්මුණෝ සහව්‍යතාය මග්ගං ජානාතී”ති.

38. මෙසේ වදාළ විට වාසෙට්ඨ මාණවකයා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළ කළා. “භවත් ගෞතමයන් වහන්ස, මං අහල තියෙනවා ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බ්‍රහ්මයා හා එක්වීමට මාර්ගය දන්නා සේක් ය කියල.

තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ ආසන්නේන ඉතෝ මනසාකටං, නයිතෝ දූරේ මනසාකටන්ති?”

පින්වත් වාසෙට්ඨ, ඔබ මේ ගැන කුමක් ද හිතන්නේ? මනසාකට ගම තියෙන්නේ මේ ළඟ ම නේද? නැත්නම් මනසාකට තියෙන්නේ මෙයින් සෑහෙන දුරකින් නොවේ නේද?

“එවං භෝ ගෝතම. ආසන්නේන ඉතෝ මනසාකටං. නයිතෝ දූරේ මනසාකටන්ති”

“භවත් ගෞතමයන් වහන්ස, එසේ ය. මනසාකටය තියෙන්නේ මේ ළඟ ම යි. මෙයින් එතරම් දුරක් නෑ.”

39. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ, ඉධස්ස පුරිසෝ මනසාකටේ

ජාතසංවද්ධෝ, තමේනං මනසාකටතෝ තාවදේව අවසටං මනසාකටස්ස මග්ගං පු-ඡෙය්‍යුං, සියා නු ඛෝ වාසෙට්ඨ තස්ස පුරිසස්ස මනසාකටේ ජාතිසංවද්ධස්ස මනසාකටස්ස මග්ගං පුට්ඨස්ස දන්ධායිතත්තං වා විත්ථායිතත්තං වා?ති.

39. පින්වත් වාසෙට්ඨ, ඔබ මේ ගැන කුමක් ද හිතන්නේ? මෙහි මනසාකට ගමේ ඉපදුන එහි ම හැදුනු වැඩුනු පුරුෂයෙක් ඉන්නවා. ඔහු මනසාකටයෙන් ගිය දවසේ ම ඔහුගෙන් මනසාකටයට යන මාර්ගය කවුරු හරි විමසනවා නම්, එතකොට පින්වත් වාසෙට්ඨ, අර මනසාකට ගමේ ම උපන්, ඒ ගමේ ම හැදුනු වැඩුනු පුරුෂයාට මනසාකටයට යන මාර්ගය විමසද්දී ඒ ගැන කියා ගන්ට බැරුව, වැටහීම ප්‍රමාද වෙවී තියේවි ද? කට උත්තර නැතුව සිටීවි ද?

"නෝ හිදං භෝ ගෝතම. තං කිස්ස හේතු? අසු හි භෝ ගෝතම පුරිසෝ මනසාකටේ ජාතවද්ධෝ. තස්ස සබ්බානේව මනසාකටස්ස මග්ගානි සුවිදිතානී"ති.

"භවත් ගෞතමයන් වහන්ස, එය නොවේ ම යි. කවර කරුණක් නිසා ද යත්, භවත් ගෞතමයන් වහන්ස, මනසාකටයේ උපන් එහි ම හැදුනු වැඩුනු අර පුරුෂයාට මනසාකටයේ සියළු මාර්ග ගැන ඉතා පැහැදිලි අවබෝධයක් තියෙනවා."

40. **"සියා ඛෝ වාසෙට්ඨ තස්ස පුරිසස්ස මනසාකටේ ජාතසංවද්ධස්ස මනසාකටස්ස මග්ගං පුට්ඨස්ස දන්ධායිතත්තං වා විත්ථායිතත්තං වා, නත්ථේව තථාගතස්ස බ්‍රහ්මලෝකේ වා බ්‍රහ්මලෝකගාමිනියා වා පටිපදාය පුට්ඨස්ස දන්ධායිත්තං වා විත්ථායිත්තං වා. බ්‍රහ්මානඤ්චාහං වාසෙට්ඨ පජානාමි බ්‍රහ්මලෝකඤ්ච බ්‍රහ්මලෝකාගාමිනිඤ්ච පටිපදං. යථාපටිපන්නෝ බ්‍රහ්මලෝකං උපපන්නෝ, තඤ්චපජානාමී"ති.**

40. "පින්වත් වාසෙට්ඨ, මනසාකටයේ උපන් එහි ම හැදුනු වැඩුනු ඒ පුරුෂයාට මනසාකටයට යන පාර ගැන විමසද්දී වැටහීමේ ප්‍රමාද බවක් සිදු වෙන්ට ඉඩ තියෙන නමුත් කට උත්තර නැතුව සිටින්ට ඉඩ තියෙන නමුත් බ්‍රහ්මලෝකයත්, බ්‍රහ්මලෝකයට යෑම පිණිස පවතින ප්‍රතිපදාව ගැනත් විමසන විට තථාගතයන් වහන්සේට නම් වැටහීමේ ප්‍රමාද බවක්වත්, කට උත්තර නැතුව සිටීමක්වත් ඇති වෙන්නේ නෑ ම යි. පින්වත් වාසෙට්ඨ, මං බ්‍රහ්මයා ගැනත් දන්නවා, බ්‍රහ්ම ලෝකය ගැනත් දන්නවා. බ්‍රහ්ම ලෝකයට

යන ප්‍රතිපදාවත් දන්නවා. යම් ප්‍රතිපදාවකින් යුක්ත වූ කෙනෙක් බඹ ලොව උපදිනවා නම්, මං ඔහු ගැනත් දන්නවා.”

41. **එවං වුත්තේ වාසෙට්ඨා මාණවෝ භගවන්තං එතදවෝච: “සුතං මේතං හෝ ගෝතම සමණෙෝ ගෝතමෝ බ්‍රහ්මුණෙෝ සහව්‍යතාය මග්ගං දේසේතී’ති. සාධු නෝ භවං ගෝතමෝ බ්‍රහ්මුනෝ සහව්‍යතාය මග්ගං දේසේතු. උල්විම්පතු භවං ගෝතමෝ බ්‍රාහ්මණිං පජ”න්ති,**

41. මෙසේ වදාළ විට වාසෙට්ඨ මාණවකයා භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැළ කළා. “භවත් ගෞතමයන් වහන්ස, මං අහල තියෙනවා ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බ්‍රහ්මයා හා එක්වීමේ මාර්ගය දේශනා කරන සේක් ය කියල. ඉතින් භවත් ගෞතමයන් වහන්සේත් අපට බ්‍රහ්මයා හා එක් වීමේ මාර්ගය දේශනා කරන සේක් නම් ඉතා මැනැවි. භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණ දරුවන් වන අප ව මේ මගින් ඔසවා බඹ ලොවෙහි පිහිටුවා වදාරණ සේක් වා.”

“තේන හි වාසෙට්ඨ සුණාහි. සාධුකං මනසිකරෝහි. භාසිස්සාමී”ති.

“එසේ නම් පින්වත් වාසෙට්ඨ, සවන් යොමා අසන්ට. හොඳින් නුවණින් මෙනෙහි කරන්න. මං කියා දෙන්නම්.”

“එවං හෝ”ති ඛෝ වාසෙට්ඨෝ මාණවෝ භගවතෝ ප-චස්සෝසි. භගවා එතදවෝච:

“එසේය භවතාණෙනි” කියල වාසෙට්ඨ මාණවකයා භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නා. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළා:

42. **ඉධ වාසෙට්ඨ තථාගතෝ ලෝකේ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවා. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා ස-ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣෙඩිකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කේවල-පරිපුණ්ණං පරිසුද්ධං, බ්‍රහ්මචරියං පකාසේති.**

42. පින්වත් වාසෙට්ඨ, මෙහි අරහත් වූ සම්මාසම්බුද්ධ වූ විජ්ජාචරණ-සම්පන්න වූ සුගත වූ ලෝකවිදූ වූ අනුත්තර පුරිසදම්ම සාරථී වූ, සත්ථා දේවමනුස්සානං වූ, බුද්ධ වූ, භගවා වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපත ලබනවා. උන්වහන්සේ දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බමුණන් සහිත වූ දෙව්මිනිස් ප්‍රජාවෙන් යුතු මේ ලෝකය තමා විසින් උපදවා ගත් විශිෂ්ට ඤාණයෙන් සාක්ෂාත් කරලා ලෝකයට කියා දෙනවා. උන්වහන්සේ දහම් දෙසනවා. ආරම්භය කල්‍යාණ වූත්, මැද කල්‍යාණ වූත්, අවසානය කල්‍යාණ වූත්, අර්ථ සහිත වූත්, පැහැදිලි ප්‍රකාශනවලින් යුතු වූත්, මුළුමණින් ම පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරනවා.

43. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තෝ වා අඤ්ඤතරස්මිං වා කුලේ ප-ච්චාජාතෝ. සෝ තං ධම්මං සුත්වා තථාගතේ සද්ධං පටිලභති. සෝ තේන සද්ධාපටිලාභේන සමන්නාගතෝ ඉති පටිසංචික්ඛති: "සම්බාධෝ ඝරාවාසෝ රජාපථෝ. අබ්භෝකාසෝ පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා ඒකන්තපරිපුණ්ණං ඒකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං යන්නූනාහං කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍ය"න්ති.

43. එතකොට ගෘහපතියෙක් වේවා, ගෘහපති පුත්‍රයෙක් වේවා කවර හෝ කුලයක උපන් කෙනෙක් වේවා ඒ ධර්මය අසනවා. ඔහු ඒ ධර්මය අසලා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව උපදවා ගන්නවා. ඉතින් ඔහු ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වෙලා මේ විදිහට නුවණින් කල්පනා කරනවා. "ගිහි ගෙදර වාසය කිරීම හරිම කරදරයක්. කෙලෙස් වැඩෙන මාවතක්. නමුත් පැවිදි ජීවිතය ආකාසය වගේ. ගිහි ගෙදර වාසය කරමින් මුළුමණින් ම පිරිපුන්, මුළුමණින් ම පිරිසිදු, සුදෝසුදු බඹසර වසනවා යන කරුණ ලෙහෙසි එකක් නොවේ. ඒ නිසා මං කෙස් රැවුල් බාලා, කසාවත් පොරොවා ගෙන ගිහිගෙයින් නික්ම පැවිද්දට ඇතුලත් වෙන එක තමයි හොඳ" කියලා.

44. සෝ අපරේන සමයේන අප්පං වා භෝගක්ඛන්ධං පහාය මහන්තං වා භෝගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කේසමස්සුං විහාරෙත්වා කාසායානි වත්ථානි අ-ච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සෝ ඒවං පබ්බජිතෝ සමානෝ පාතිමොක්ඛසංවරසංවුතෝ විහරති, ආචාරගෝචරසම්පන්නෝ, අණුමත්තේසු වජ්ජේසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදේසු, කායකම්මවචිකම්මේන සමන්නාගතෝ කුසලේන, පරිසුද්ධාජීවෝ,

සීලසම්පන්නෝ, ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ, භෝජනේ මත්තඤ්ඤූ, සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ සන්තුට්ඨෝ.

44. ඔහු පස්සෙ කාලෙක ස්වල්ප වූ භෝග සම්පත් අත්හරිනවා. මහත් වූ භෝග සම්පත් අත්හරිනවා. ස්වල්ප වූ නෑදෑයන් අත්හරිනවා. මහත් වූ නෑදෑයන් අත්හරිනවා. කෙස් රැවුල් බාල, කසාවත් පොරොවා ගෙන ගිහි ගෙයින් නික්ම පැවිදි ජීවිතයට පත් වෙනවා. ඔහු ඔය විදිහට පැවිද්දෙක් වෙලා ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙන් (පැවිද්දෙක් විසින් රැකගත යුතු නිවනට උපකාරී වන උතුම් සිල්පදවලින්) සංවරව ඉන්නවා. යහපත් ඇවැතුම් පැවැතුම්වලින් යුතු වෙනවා. අණුමාත්‍ර වූ වරදෙහි පවා භය දකිනවා. සික්ෂාපදවල සමාදන්ව හික්මෙනවා. කුසල්සහගත කායකර්මයෙන් හා වචිකර්මයෙන් යුතු වෙනවා. පිරිසිදු ආජීවයෙන් යුතු වෙනවා. සිල්වත් වෙනවා. අකුසලයෙන් වැළකූ දොරටු ඇතුව ඉන්නවා. නුවණින් සළකා ආහාර ගන්නවා. සිහිනුවණින් යුතුව ඉන්නවා. ලද දෙයින් සතුටුව ඉන්නවා.

45. කථඤ්ච වාසෙට්ඨ භික්ඛු සීලසම්පන්නෝ හෝති? ඉධ වාසෙට්ඨ භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ හෝති. නිහිතදණ්ඩෝ නිහිතසත්ථෝ ලජ්ජී දයාපන්නෝ සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතෝ හෝති. දින්නාදායී දින්නපාටිකංඛී අථේනේන සුචිභූතේන අත්තනා විහරති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හෝති. ආරාචාරී විරතෝ මේථුනා ගාමධම්මා. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතෝ හෝති. ස-චවාදී ස-චසන්ධෝ ථේතෝ ප-චයිකෝ අවිසංවාදකෝ ලෝකස්ස. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතෝ හෝති. ඉතෝ සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමේසම්භේදාය. අමුත්‍ර වා සුත්වා න ඉමේසං අක්ඛාතා අමූසම්භේදාය. ඉති භින්නානං වා සන්ධාතා සංහිතානං වා අනුප්පදාතා. සමග්ගාරාමෝ සමග්ගරතෝ සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතෝ හෝති. යා සා වාචා නේළා කණ්ණසුඛා පේමනීයා හදයංගමා පෝරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතෝ හෝති. කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී, නිධානවතිං වාචං භාසිතා කාලේන සාපදේසං පරියන්තවතිං අත්ථසංහිතං. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

45. පින්වත් වාසෙට්ඨ, භික්ෂුව සීලයෙන් යුක්ත වන්නේ කොහොම ද? පින්වත් වසෙට්ඨ, මෙහි භික්ෂුව සතුන් මැරීම අත්හැර දාල සතුන් මැරීමෙන් වැළකී ඉන්නවා. දඬු මුගුරු අත්හැර දාල, අවි ආයුධ බැහැර කරලා, පවට ලැජ්ජා ඇතිව ඉන්නවා. සතුන් කෙරෙහි දයාවන්ත වෙනවා, සියව් ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. නුදුන් දේ ගැනීම අත්හැරලා නුදුන් දේ ගැනීමෙන් වැළකී ඉන්නවා. දුන් දේ පමණක් පිළිගන්නවා. දුන් දේ පමණක් පිළිගනු කැමති වෙනවා. සොර රහිත සිතින් යුතු වූ පිරිසිදු සිතින් යුතු වූ ජීවිතයකින් වාසය කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. අබ්‍රහ්මචාරී බව අත්හැරලා බ්‍රහ්මචාරීව ඉන්නවා. ලාමක දෙයක් වූ මෛථුන සේවනයෙන් වැළකී එය දුරින් ම දුරුකර දමනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. බොරු කීම අත්හැරල, බොරු කීමෙන් වැළකී ඉන්නවා. සත්‍යය කථා කරනවා. ඇත්තෙන් ඇත්ත ගලපනවා. ස්ථිරව පිහිටලා කථාකරනවා. පිළිගත හැකි දේ කථා කරනවා. ලෝකයාව රවටන්නේ නෑ. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. කේලාම් කීම අත්හැරලා කේලාම් කීමෙන් වැළකී ඉන්නවා. මෙතැනින් අහලා මේ අය බිඳවන්නට අතන කියන්නෙ නෑ. අතනින් අහලා ඒ උදවිය බිඳවන්නට මෙතැන කියන්නේ නෑ. මේ අයුරින් බිඳුනු උදවිය සමගි කරවනවා. සමගි වූවන්ට අනුබල දෙනවා. සමගි වූවන් හා වාසයට කැමතියි. සමගි වූවන් හා එක්ව වසනවා. සමගි වූවන් සමග සතුටු වෙනවා. සාමය උදෙසා සාමකාමී වචන කතා කරනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. පරුෂ වචනය අත් හැරලා පරුෂ වචනයෙන් වැළකී ඉන්නවා. යම් වචනයක් දොස් රහිත නම්, කණට සැප නම්, ආදරවන්ත නම්, හෘදයාංගම නම්, ශිෂ්ට සම්පන්න නම්, බොහෝ ජනයා කැමති නම්, බොහෝ ජනයාට ප්‍රියමනාප නම් එබඳු වූ වචන පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි. තේරුමක් නැති කතා බහ අත් හැරලා තේරුමක් නැති කතා කීමෙන් වැළකී සිටිනවා. කල් යල් බලා කථා කරනවා. ඇත්ත කතා කරනවා. අර්ථවත් දෙය කතා කරනවා. ධර්මය ම කථා කරනවා. විනය ම කථා කරනවා. සිත්හි ලා දරාගැනීමට සුදුසු, වෙලාවට ගැලපෙන උපදේශ සහිත වූ, මදිපාඩුකම් නො තබා, ප්‍රමාණවත් පරිදි, දෙලොව යහපත පිණිස වූ දේ පවසනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

46. **බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඒකභත්තිකෝ හෝති රත්තූපරතෝ පටිවිරතෝ විකාලභෝජනා. න-චගීතවාදිතවිසූක-දස්සනා පටිවිරතෝ හෝති. මාලාගන්ධවිලේපනධාරණමණ්ඩන-විභූසනට්ඨානා පටිවිරතෝ හෝති. උ-චාසයනමහාසයනා පටිවිරතෝ**

හෝති. ජාතරූපරජත පටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකධඤ්ඤ පටිග්ගහණා පටිවිරතෝ හෝති. ආමකමංස පටිග්ගහණා පටිවිරතෝ හෝති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතෝ හෝති. දාසිදාසපටිග්ගහණා පටිවිරතෝ හෝති. අජේළකපටිග්ගහණා පටිවිරතෝ හෝති. කුක්කුටසූකර-පටිග්ගහණා පටිවිරතෝ හෝති. හත්ථිගාවස්සවළවාපටිග්ගහණා පටිවිරතෝ හෝති. ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතෝ හෝති. දූතෙය්‍ය පහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. කයවික්කයා පටිවිරතෝ හෝති. තුලාකූටකංසකූටමානකූට පටිවිරතෝ හෝති. උක්කෝටනාවඤ්චන-නිකතිසාචියෝගා පටිවිරතෝ හෝති. ඡේදනවධබන්ධනවිපරමෝස-ආලෝපසහසාකාරා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

46. පැලවෙන බීජ හා පැල වුණ ගස් කොළන් විනාශ කිරීමෙන් වැළකී ඉන්නවා. එක් වරුවේ බොජුන් වළඳනවා. රාත්‍රී ආහාරයෙන් වැළකී විකාල භෝජනයෙන් වැළකී ඉන්නවා. නැටුම්, ගැයුම්, වැයුම් හා විසූක දර්ශනයන් නැරඹීමෙන් වැළකී ඉන්නවා. මල් සුවඳ විලවුන් දැරීමෙන් ද ඇඟපත සැරසීමෙන් ද විසිතුරු වස්ත්‍රාභරණයෙන් සැරසීමෙන් ද වැළකී ඉන්නවා. ප්‍රමාණය ඉක්ම වූ උස් ආසන ද වටිනා සුඛෝපභෝගී ආසන ද පරිහරණයෙන් වැළකී ඉන්නවා. රන් රිදී මිල මුදල් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු ධාන්‍ය පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. අමු මස් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ස්ත්‍රීන්, කුමරියන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. දැසි දස්සන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. එළුබැටළුවන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කුකුළන් ඌරන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ඇතුන් ගවයන් අසුන් වෙළඹුන් පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. කෙත් වතු පිළිගැනීමෙන් වැළකී ඉන්නවා. ගිහි කටයුතු සඳහා දූත මෙහෙවර කිරීමෙන් වැළකී ඉන්නවා. වෙළ හෙළදාම් කිරීමෙන් වැළකී ඉන්නවා. තරාදියෙන් රැවටීම, නො වටනා දෙයින් රැවටීම, මිනුමෙන් රැවටීම යන මෙයින් වැළකී ඉන්නවා. අල්ලස් ගෙන හිමිකරුවන් ගේ දේ අහිමි කිරීම, වංචා කිරීම, බාලදේ වටිනා දේ හැටියට පෙන්වීම ආදී නොයෙක් වංචනික දෙයින් වැළකී ඉන්නවා. අත්පා කැපීම් මැරීම් බන්ධන කිරීම් මං පැහැරගැනීම්, ගම් පැහැර ගැනීම් ආදී සැහැසි දෙයින් වැළකී සිටිනවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

47. යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප බීජගාමභූතගාමසමාරම්භ අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං: මූලබීජ ඛන්ධබීජ එව්බීජ අග්ගබීජ බීජබීජමේව පඤ්චමං. ඉති වා ඉති ඒවරූපා බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

47. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ විදිහේ පැලවෙන දේ හා ගස් කොළන් ආදිය වනසමින් ඉන්නවා. ඒ කියන්නේ මුලින් පැලවෙන දේවල්, කඳින් පැලවෙන දේවල්, පුරුකින් පැලවෙන දේවල්, දල්ලෙන් පැලවෙන දේවල්, බිජුවටින් පැලවෙන දේවල් යන ආදිය වනසමින් ඉන්නවා. ගස් කොළන් සිඳලීම් ආදී මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලිනුත් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

48. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං සන්නිධිකාරපරිභෝග‍ං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද‍ං: අන්නසන්නිධි‍ං පානසන්නිධි‍ං වත්ථසන්නිධි‍ං යානසන්නිධි‍ං සයනසන්නිධි‍ං ගන්ධසන්නිධි‍ං ආමිසසන්නිධි‍ං. ඉති වා ඉති ඒවරූපා සන්නිධිකාරපරිභෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මි‍ං.**

48. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ දේ රැස්කරගෙන පරිභෝග කරමින් වාසය කරනවා. ඒ කියන්නේ කෑම වර්ග රැස් කරලා තියා ගන්නවා. බීම වර්ග රැස් කරලා තියා ගන්නවා. වස්ත්‍ර රැස් කරලා තියා ගන්නවා. යාන වාහන රැස් කරලා තියා ගන්නවා. ඇඳ පුටු මේස රැස් කරලා තියා ගන්නවා. සුවඳ වර්ග රැස් කරලා තියා ගන්නවා. තවත් ආමිස රැස් කරලා තියා ගන්නවා. මෙවැනි හෝ මෙවැනි වෙනත් දේවල් හෝ රැස්කරගෙන පරිහරණය කිරීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

49. **යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං විසූකදස්සන‍ං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද‍ං: න-ච‍ං ගීත‍ං වාදිත‍ං පෙක්ඛ‍ං අක්ඛාන‍ං පාණිස්සර‍ං වේතාල‍ං කුම්භථූන‍ං සෝභනක‍ං චණ්ඩාල‍ං වංස‍ං ධෝවන හත්ථියුද්ධ‍ං අස්සයුද්ධ‍ං මහිසයුද්ධ‍ං උසභයුද්ධ‍ං අජයුද්ධ‍ං මෙණ්ඩයුද්ධ‍ං කුක්කුටයුද්ධ‍ං වට්ටකයුද්ධ‍ං දණ්ඩයුද්ධ‍ං මුට්ඨියුද්ධ‍ං නිබ්බුද්ධ‍ං උය්‍යෝධික‍ං බලග්ග‍ං සේනාබ්‍යූහ‍ං අනීකදස්සන‍ං. ඉති වා ඉති ඒවරූපා විසූකදස්සනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මි‍ං.**

49. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයේ විසූක දර්ශනයන් නැරඹීමෙහි යෙදිල ඉන්නවා. ඒ කියන්නේ නැටුම්, ගැයුම්, වැයුම්, නාටක, පැරණි කථා

රහදැක්වීම්, අත්තල ගසා නැටීම්, වේතාල නැටීම්, බෙර වාදන කිරීම්, රහමඩලෙහි දේවතාවන්ට පූජා පිණිස නැටීම්, උණ ගසින් කරන ක්‍රීඩා, මිනී ඇට මැද තබා වටකොට නැටීම්, ඇත් යුධ බැලීම්, අස්ව යුධ බැලීම්, ගොන් පොර බැලීම්, එළු පොර බැලීම්, බැටළු පොර බැලීම්, කුකුළු පොර බැලීම්, වටු පොර බැලීම්, පොව් හරඹ බැලීම්, මිටි හරඹ බැලීම්, මල්ලව පොර බැලීම්, යුධ සේනා බලන්ට යෑම, බලසෙන් ගණින තැන් බලන්ට යාම, බලසෙනඟ විසිරුවන තැන් බලන්ට යාම ආදී දේවල්වල යෙදෙමින් ඉන්නවා. මෙවැනි දේවල්වලිනුත් මෙවැනි වෙනත් දේවල්වලින් යුතු විසූක දර්ශන නැරඹීම්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

50. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං ජූතප්පමාදට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පංගචිරං වංකකං මොක්ඛචිකං චිංගුලකං පත්තාළ්හකං රථකං ධනුකං අක්ඛරිකං මනේසිකං යථාවජ්ජං. ඉති වා ඉති ඒවරූපා ජූතප්පමාදට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

50. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල තමාව ප්‍රමාදයට පත් කරවන මේ ආකාර වූ සූදු කෙළියෙන් කල් යවනවා. ඒ කියන්නේ හතරැස් කොටු අටකින් යුතුව කරණ සූදුව, කොටු දහයකින් කරන සූදුව, අහසේ රූ අඳිමින් කරන සූදුව, කොටු පැනීමෙන් කරණ සූදුව, සන්තික නම් වූ සූදුව, දාදු කැටයෙන් කරන සූදුව, කල්ලි ගැසුම, බුරුවා ගැසීම, ගුළ කෙළිය, නළා පිඹීම, කරණම් ගැසීම, මුගුරක් ගෙන උඩ යට වැටෙන පරිදි උඩට ගැසීම, කොළවලින් කළ ගොටුවලින් තරහෙට වැලි මැනීම, කුඩා රිය තරහ, කුඩා දුනුවලින් විදීමේ තරහ, අකුරු ලිවීමේ සෙල්ලම, සිතූ දේ කියන සෙල්ලම, විකලාංග අනුකරණයෙන් හිනැස්සීමේ සෙල්ලම ආදී දේ කිරීමයි. මේ දෙයිනුත් මෙවැනි තවත් දේවල් ඇත්නම් එයිනුත් වැළකී ප්‍රමාදයට පත්වන සූදුවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

51. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං උ-චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: ආසන්දිං පල්ලංකං ගෝනකං චිත්තකං පටිකං පටලිකං තූලිකං විකතිකං උද්දලෝමිං ඒකන්තලෝමිං කට්ඨිස්සං කෝසෙය්‍යං කුත්තකං

හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවේණිං කාදලිමිගපවර-ප-චත්ථරණං සඋත්තර-ඡදං උභතෝලෝහිතකූපධානං. ඉති වා ඉති ඒවරූපා උ-චාසයනමහාසයනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

51. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාර වූ පමණ ඉක්මවා උස් වූ ආසනත් වටිනා සුඛෝපභෝගී ආසනත් පරිහරණය කරනවා. ඒ කියන්නේ දිග හාන්සි පුටු, කවිච්චි, ලොකු පලස් යෙදූ ආසන, විසිතුරු ගෙත්තම් කළ එළු ලොම් ඇතිරිළි, සුදු එළු ලොමින් කළ ඇතිරිළි, මල් යෙදූ එළු ලොමින් කළ ඇතිරිළි, පුළුන් යෙදූ මෙට්ට, සත්ව රූපවලින් සැරසූ එළු ලොම් ඇතිරිළි, මුළුමණින් ම එළු ලොමින් කළ ඇතිරිළි, රන් නූලෙන් සැරසූ කලාල, පට නූලෙන් කළ කලාල, නාටිකාංගනාවන් ඒ මත නැටිය හැකි එළු ලොමින් කළ කලාල, ඇතුන් පිට යොදන ඇතිරිළි, අසුන් පිට යොදන ඇතිරිළි, රථවල යොදන ඇතිරිළි, අදුන් දිවි සමෙන් කළ ඇතිරිළි, කදලි මුව සමින් කළ කලාල, හිස දෙපැත්තට රතු විල්වීද කොට්ට තබා රතු උඩුවියන් බැඳ සැදූ වටිනා යහන් ආදිය පරිහරණය කරයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී උස් අසුන් මහා අසුන් පරිහරණයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

52. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයෝගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: උ-ජ්ජාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලේපනං මුඛචුණ්ණකං මුඛාලේපනං හත්ථබන්ධං සිඛාන්ධං දණ්ඩකං නාළිකං අසිං ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවිජනි විදානානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති ඒවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

52. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් ඇඟපත සැරසීමෙන් හා විසිතුරු වස්ත්‍රාභරණ පැළඳීමෙන් යුක්තව කල් ගෙවනවා. ඒ කියන්නේ සුවඳ වර්ග ඇඟ තවරා සිරුර සිනිඳු කිරීම, තෙල් වර්ග ගා සම්බාහනය කොට සිරුර හැඩ කිරීම, සුවඳපැන් නෑම, උරහිස් ආදියෙහි මස් වැඩීමට මුගුරෙන්

තැලීම, කැඩපතින් මුහුණ බලා සැරසීම, ඇස්වල අඳුන් ගෑම, මල් හා සුවඳ විලවුන් දැරීම, මුව සුවඳ කිරීම, මුව විලවුන් දැරීම, අත්වල ආභරණ දැමීම, හිසෙහි කුඩුම්බි දැරීම, විසිතුරු සැරයැටි දැරීම, විසිතුරු බෙහෙත් නල දැරීම, විසිතුරු කඩු දැරීම, විසිතුරු කුඩ දැරීම, විසිතුරු පාවහන් දැරීම, නලල් පට දැරීම, මැණික් පැළඳීම, චාමර දැරීම, දිග වාටි ඇති සුදු වස්ත්‍ර දැරීම ආදියෙන් යුතුවෙයි. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී ඇහපත සැරසීම් හා විසිතුරු වස්ත්‍රාභරණ සැරසීමෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

53. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූප‍ං තිර-ඡානකථ‍ං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීද‍ං: රාජකථ‍ං චෝරකථ‍ං මහාමත්තකථ‍ං සේනාකථ‍ං භයකථ‍ං යුද්ධකථ‍ං අන්නකථ‍ං පානකථ‍ං වත්ථකථ‍ං සයනකථ‍ං මාලාකථ‍ං ගන්ධකථ‍ං ඤාතිකථ‍ං යානකථ‍ං ගාමකථ‍ං නිගමකථ‍ං නගරකථ‍ං ජනපදකථ‍ං ඉත්ථීකථ‍ං පුරිසකථ‍ං කුමාරකථ‍ං කුමාරිකථ‍ං සූරකථ‍ං විසිඛාකථ‍ං කුම්භට්ඨානකථ‍ං පුබ්බපේතකථ‍ං නානත්තකථ‍ං ලෝකක්ඛායිකථ‍ං සමුද්දක්ඛායිකථ‍ං ඉතිභවාභවකථ‍ං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මි‍ං.

53. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරිසන් කථාවල යෙදී වාසය කරනවා. ඒ කියන්නේ, රජවරුන් ගැන කථා, සොරුන් ගැන කථා, මහ ඇමතිවරුන් ගැන කථා, හමුදාවන් ගැන කථා, භය ඇතිවෙන දේවල් ගැන කථා, ආහාර වර්ග ගැන කථා, බොන දේවල් ගැන කථා, ඇඳුම් පැළඳුම් ගැන කථා, ඇඳ පුටු ගැන කථා, මල් වර්ග ගැන කථා, සුවඳ වර්ග ගැන කථා, නෑදෑයන් ගැන කථා, යාන වාහන ගැන කථා, ගම්මාන ගැන කථා, නියම් ගම්මාන ගැන කථා, නගර ගැන කථා, රටවල් ගැන කථා, ස්ත්‍රීන් ගැන කථා, පුරුෂයින් ගැන කථා, කුමාරයන් ගැන කථා, කුමාරියන් ගැන කථා, ශූරයින් ගැන කථා, මංමාවත් ගැන කථා, වල‍ං පොලේ දේවල් ගැන කථා, මියගිය උදවිය ගැන කථා, තව තව දේවල් ගැන කථා, ලෝකය ගැන කථා, සාගරය ගැන කථා, මෙහෙමයි වුණේ මෙහෙමයි නොවුණේ කියන දේ ගැන කථා කරකර ඉන්නවා, මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරිසන් කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

54. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: "න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මි-ඡාපටිපන්නෝ ත්වමසි, අහමස්මි සම්මා පටිපන්නෝ. සහිතං මේ, අසහිතං තේ. පුරේ වචනීයං ප-ඡා අවච. ප-ඡා වචනීයං පුරේ අවච. ආචිණ්ණං තේ විපරාවත්තං. ආරෝපිතෝ තේ වාදෝ. නිග්ගහිතෝ ත්වමසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බේඨේහි වා සං- පහෝසී"ති. ඉති වා ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

54. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මේ ආකාරයෙන් එකිනෙකා අතර බැණ දොඩා ගන්නා කථාවෙන් යුතුව යි ඉන්නෙ. ඒ කියන්නේ "නුඹ මේ ධර්ම විනය දන්නෙ නෑ. මම තමයි මේ ධර්ම විනය දන්නේ, ආ ... එහෙම ද එතකොට නුඹද මේ ධර්ම විනය දන්නේ? නුඹ ඉන්නේ මිත්‍යා වැඩ පිළිවෙලකයි. මම තමයි නියම වැඩපිළිවෙල තුළ ඉන්නේ. මං කරුණු සහිතවයි කියන්නේ. නුඹේ කීම කරුණු රහිතයි. නුඹ කලින් කිවයුතු දේ පස්සේ කිව්වා. පස්සේ කිවයුතුදේ කලින් කිව්වා. නුඹ කලක් තිස්සේ කියපු දේ කණපිට පෙරළෙනා. මා විසින් නුඹට වාද නංවලයි තියෙන්නේ. නුඹට නිග්‍රහ කරල යි තියෙන්නේ. වාදයෙන් නිදහස් වීමට මගක් හොයාගෙන පලයන්. පුළුවන් නම් ලෙහාගනින්" යනාදිය කියමින් ආරවුල් හදාගන්නවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ බැණ දොඩාගන්නා කථාවෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

55. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයෝගං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං "ඉධ ග-ඡ. අමුත්‍රග-ඡ. ඉදං හර. අමුත්‍ර ඉදං ආහරා"ති. ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයෝගා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

55. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල ගිහියන් ගේ පණිවිඩ පණත් ගෙන යන මෙබඳු වූ දූත මෙහෙවරෙහි යෙදෙනවා. ඒ කියන්නේ, "මෙහෙ යන්න, අසවල් තැනට එන්න, මේක (අපේ මේ පණිවිඩය) අරන් යන්න. අසවල් තැනට මේක

අරන් යන්න" යනාදී රජුන් ගේ, රාජමහා ඇමතිවරුන් ගේ, ක්ෂත්‍රියයන් ගේ, බ්‍රාහ්මණයන් ගේ, ගෘහපතියන් ගේ, කුමාරවරුන් ගේ, පණිවුඩ පණත් ගෙනියනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ පණිවුඩ පණත් ගෙනයන ගිහියන්ගේ දූත මෙහෙවරෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

56. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ කුහකා ව හොන්ති ලපකා ච නේමිත්තිකා ච නිප්පේසිකා ච ලාභේන ලාභං නිජිගිංසිතාරෝ. ඉති වා ඉති ඒවරූපා කුහනලපනා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

56. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල කුහක (උඩින් වෙන ජීවිතයක් පෙන්වමින් යටින් වෙනත් ජීවිතයක් ගෙවමින් නැති ගුණ පෙන්වා) ජීවිත ගෙවනවා. ලාභ සත්කාර ලැබෙන විදිහට (පුහු වර්ණනා කිරීම්, තොදොල් කිරීම්, නැති ගුණ කීම් ආදී) චාටු බස් කියනවා. දායකයින් හට නො දී බැරි තත්වයට පත් වෙන ආකාරයේ නිමිති දක්වමින් කථා කරනවා. තමන්ට ලැබෙන විදිහට අනුන්ට ගරහනවා. ලාභයෙන් ලාභය හොයනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ කුහකකමින් චාටුබස්වලින් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

57. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: අංගං නිමිත්තං උප්පාතං සුපිනං ලක්ඛණං මූසික-ඡින්නං අග්ගිහෝමං දබ්බිහෝමං ථුසහෝමං කණහෝමං තණ්ඩුලහෝමං සප්පිහෝමං තේලහෝමං මුඛහෝමං ලෝහිතහෝමං අංගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා සිවවිජ්ජා භූතවිජ්ජ භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා වි-ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං සරපරිත්තානං මිගපක්ඛං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

57. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙවැනි වූ තිරශ්චින විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ ශාරීරික අංග බලා ඵලාඵල කියනවා, නිමිති බලා ඵලාඵල කියනවා, උත්පාත බලා ඵලාඵල කියනවා,

සිහින ඵලාඵල කියනවා, ශාරීරික ලක්ෂණ බලා ඵලාඵල කියනවා, මීයන් කෑ වස්ත්‍ර බලා ඵලාඵල කියනවා, ගිනි පූජා පවත්වනවා, හැන්දෙන් පූජා පවත්වනවා, ධාන්‍ය පොතුවලින් පූජා පවත්වනවා. කණ නම් සහලින් කළ පූජා පවත්වනවා, සහලින් පූජා පවත්වනවා, ගිතෙලින් පූජා පවත්වනවා, තල තෙලින් පූජා පවත්වනවා, විශේෂ කොට කරණ පූජා පවත්වනවා, සතුන් මරා ලේ පුදා කරන පූජා පවත්වනවා, අංග විද්‍යාව, වාස්තු විද්‍යාව, දේශපාලන විද්‍යාව, වාසනාව උරගා බැලීමේ (ලොතරැයි) විද්‍යාව, භූත විද්‍යාව, පොළොව යට බිම් ගෙයක ඉඳ මැතිරීමෙන් කරන (භූරි) විද්‍යාව, සර්ප විද්‍යාව, විෂ විද්‍යාව, වෘශ්චික විද්‍යාව, මූෂක විද්‍යාව, පක්ෂි විද්‍යාව, විශාල පක්ෂි විද්‍යාව, ඉදුණු දේ මුල් කොට අනාවැකි කියන විද්‍යාව, මතුරන ලද ඊතල විද ආරක්ෂා කරන විද්‍යාව, මෘග පක්ෂ යනාදී මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

58. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරීලක්ඛණං දාසලක්ඛණං දාසීලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගෝලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගෝධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං ක-ඡපලක්ඛණං මිගලක්ඛණං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

58. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. ඒ කියන්නේ මැණික්වල සුභ අසුභ ලකුණු කීම, දඬුවල සුභ අසුභ ලකුණු කීම, වස්ත්‍රවල සුභ අසුභ ලකුණු කීම, කඩු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ඊතල ආදී සලකුණුවලින් සුභාසුභ කීම, දුනු ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ආයුධ ආදී සලකුණුවලින් සුභාසුභ කීම, ස්ත්‍රීන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, පුරුෂයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දරුවන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දැරියන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, දාසයන් ගේ හැඩ රුවින් සුභාසුභ

ලකුණු කීම, දාසීයන් ගේ හැඩ රුවින් සුභාසුභ ලකුණු කීම, ඒ ඒ කටයුතු සඳහා තෝරා ගත යුතු ඇතුන් ගේ ලකුණු කීම, අසුන් ගේ ලකුණු කීම, ඔටුවන් ගේ ලකුණු කීම, වෘෂභයන් ගේ ලකුණු කීම, ගවයන් ගේ ලකුණු කීම, එළුවන් ගේ ලකුණු කීම, බැටළුවන් ගේ ලකුණු කීම, කුකුළු පොර ආදියට සුදුසු කුකුළන් ගේ ලකුණු කීම, වටුවන් ගේ ලකුණු කීම, සුභූනන් ඇහ වැටීමේ සහ හඬනැගීමේ ඵලාඵල කීම, කණෙහි පළඳාගත් උපකරණවලින් ඵලාඵල කීම, කැස්බෑවන්ට මතුරා ඵලාඵල කීම, මුවන්ට මතුරා ඵලාඵල කීම ආදී තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

59. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති. රඤ්ඤං අතියානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයෝ භවිස්සති. බහිරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයෝ භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං පරාජයෝ භවිස්සති. ඉති ඉමස්ස ජයෝ භවිස්සති. ඉමස්ස පරාජයෝ භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-චානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

59. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් නැකතට රජතුමා ගේ යුධ පිණිස නික්මීම වන්නේ ය. අසවල් නැකතින් ආපසු නුවරට ඇතුළ්වීම සිදු කළ යුත්තේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිට පිටත සතුරු රජුන් හමුවීමට රජු ගේ ගමන කළයුත්තේ ය. අසවල් නැකතින් පිටත සිටින රජවරු රට ඇතුළට පැමිණීම වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජු ගේ ඉවත්වීම සිදුවන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ සිටින රජුට ජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුනට පරාජය වන්නේ ය. අසවල් නැකතින් බාහිර රජුන්ට ජය වන්නේ ය. අසවල් නැකතින් රට ඇතුළේ රජුට පරාජය වන්නේ ය කියල මොහුට ජය වෙනවා. මොහුට පරාජය වෙනවා" ආදී වශයෙන් පවසමින් තිරිසන් විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් කල් ගෙවනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ

තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

60. "යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: චන්දග්ගාහෝ භවිස්සති, සුරියග්ගාහෝ භවිස්සති, නක්ඛත්තග්ගාහෝ භවිස්සති, චන්දිමසුරියානං පථගමනං භවිස්සති, චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, නක්ඛත්තානං පථගමනං භවිස්සති, නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, උක්කාපාතෝ භවිස්සති, දිසාඩාහෝ භවිස්සති, භූමිචාලෝ භවිස්සති, දේවදුන්දුභි භවිස්සති, චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං විගමනං සංකිලේසං වෝදානං භවිස්සති, ඒවං විපාකෝ චන්දග්ගාහෝ භවිස්සති, ඒවං විපාකෝ සුරියග්ගාහෝ භවිස්සති, ඒවං විපාකෝ නක්ඛත්තග්ගාහෝ භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියානං පථගමනං භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියානං උප්පථගමනං භවිස්සති, ඒවං විපාකං නක්ඛත්තානං පථගමනං භවිස්සති, ඒවං විපාකං නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති, ඒවං විපාකෝ උක්කාපාතෝ භවිස්සති, ඒවං විපාකෝ දිසාඩාහෝ භවිස්සති, ඒවං විපාකෝ භූමිචාලෝ භවිස්සති, ඒවං විපාකෝ දේවදුන්දුභි භවිස්සති, ඒවං විපාකං චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං විගමනං සංකිලේසං වෝදානං භවිස්සති. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

60. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "අසවල් දින චන්ද්‍රග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සූර්යග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින නැකත් ග්‍රහණයක් සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නිසිමහින් යෑම සිදුවෙනවා. අසවල් දින සඳ හිරු ගේ නොමහින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නිසි මහින් යෑම සිදුවෙනවා. අසවල් දින නැකත් තරුවල නොමහින් යෑම සිදුවෙනවා. අසවල් දින උල්කාපාත වැටෙනවා. අසවල් දින අසවල් දිශාවේ උෂ්ණත්වය වැඩිවෙනවා. අසවල් දින භූමි කම්පාවක් සිදුවෙනවා. අසවල් දින වැසි රහිතව අහස ගුගුරනවා. හිරු සඳු හා නැකත් වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම මේ මේ වෙලාවට සිදුවෙනවා. චන්ද්‍ර ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. සූර්ය ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක ලබාදෙනවා. නැකත් ග්‍රහණය ලෝකයට මෙවැනි ඵල විපාක

ලබාදෙනවා. හිරු සඳු ගේ නිසිගමන මෙවැනි ඵල විපාක ලබාදෙනවා. හිරු සඳු ගේ නොමඟ යෑම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. උල්කාපාත වැටීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. දිශා දාහය මෙවැනි ඵල විපාක ලබා දෙනවා. භූකම්පන මෙවැනි ඵල විපාක ලබා දෙනවා. වැසි නැතිව අහස ගිගිරීම මෙවැනි ඵල විපාක ලබා දෙනවා. හිරු සඳු හා නැකත්වල උදාව බැසීම කෙලෙසීම පිරිසිදු වීම ලෝකයට මෙවැනි විපාක ලබා දෙනවා" කියල තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

61. **යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: සුබ්බුට්ඨිකා භවිස්සති, දුබ්බුට්ඨිකා භවිස්සති, සුභික්ඛං භවිස්සති, දුබ්භික්ඛං භවිස්සති, ඛේමං භවිස්සති, භයං භවිස්සති, රෝගෝ භවිස්සති, ආරෝග්‍යං භවිස්සති, මුද්දා ගණනා සංඛානං කාවෙය්‍යං ලෝකායතං. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.**

61. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, "මේ කාලයේ දී වැස්ස වහිනවා. මේ කාලයේ දී නියඟය ඇතිවෙනවා. මේ කාලයේ දී සුභික්ෂාව ඇති වෙනවා. මේ කාලයේ දී දුර්භික්ෂය ඇතිවෙනවා. මේ කාලයේ දී රට සරුවෙනවා. මේ කාලයේ දී බිය සැක නැතිව ඉන්නවා. මේ කාලයේ දී භය උපදිනවා. මේ කාලයේ දි රෝග ඇති වෙනවා. මේ කාලයේ දි නීරෝග බව ඇති වෙනවා කියමින් ඵලා ඵල පැවසීමත් මුද්‍රා, ගණිත, සංඛ්‍යාන, කාව්‍ය ශාස්ත්‍ර, ලෝකායත ශාස්ත්‍ර, ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා.මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

62. **යථා වා පනේකේ හොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති - සෙය්‍යථීදං: ආවාහනං විවාහනං සංවදනං විවදනං සංකිරණං විකිරණං සුභගකරණං දුබ්භගකරණං විරුද්ධගබ්භකරණං ජිව්හා-**

නිත්ථම්භනං හනුසංහනනං හත්ථාභිජප්පනං හනුජප්පනං කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිකාපඤ්හං දේවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්භායනං. ඉති වා ඉති ඒවරූපාය තිර-ච්ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

62. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, විවාහයට නැකත් කීම, ආවාහයට නැකත් කීම, වෙන් වූ අඹු සැමියන් එක් කිරීමට නැකත් සැදීම, එක් වූ අඹු සැමියන් වෙන් කිරීමට නැකත් සැදීම, දීපු ණය එකතු කිරීමට නැකත් සැදීම, මුදල් ණයට පොලියට දීමට නැකත් සැදීම, දියුණු වීමට ගුරුකම් කිරීම, පාළුවී නැති වීමට ගුරුකම් කිරීම, දරුගැබ් රැකෙන්නට ගුරුකම් කිරීම, දිව අගුළු බැඳෙන්නට ගුරුකම් කිරීම, හනු තද කරන්නට ගුරුකම් කිරීම, අත් පෙරලෙන්නට ගුරුකම් කිරීම, හනු සිරවෙන්නට ගුරුකම් කිරීම, කණ් අගුළු වැටෙන්නට ගුරුකම් කිරීම, කණ්ණාඩියෙන් භූතයන් කැඳවා ප්‍රශ්න විචාරීම, ගෑණු දරුවන් ලවා පේන කීම, දෙවියන් ලවා පේන කීම, සූර්ය වන්දනාව, මහ බඹු වන්දනාව, මන්ත්‍ර බලයෙන් කටින් ගිනිදැල් පිටකිරීම, මන්ත්‍ර බලෙන් ලක්ෂ්මී පූජා කිරීම යනාදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චීන විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

63. යථා වා පනේකේ භොන්තෝ සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භෝජනානි භුඤ්ජිත්වා තේ ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවේන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: සන්තිකම්මං පණිධිකම්මං භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකම්මං වත්ථුපරිකිරණං ආවමනං නහාපනං ජුහනං වමනං විරේචනං උද්ධවිරේචනං අධෝවිරේචනං සීසවිරේචනං කණ්ණතේලං නෙත්තතප්පනං නත්ථුකම්මං අඤ්ජනං ප-චඤ්ජනං සාලාකියං සල්ලකත්තියං දාරකතිකි-ඡා මූලභේසජ්ජානං අනුප්පදානං විසධීනං පටිමොක්ඛෝ. ඉති වා ඉති ඒවරූපාය තිර-ඡානවිජ්ජාය මි-ඡාජීවා පටිවිරතෝ හෝති. ඉදම්පි'ස්ස හෝති සීලස්මිං.

63. ඒ වගේ ම ඇතැම් භවත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඉන්නවා. ඔවුන් ශ්‍රද්ධාවෙන් දුන් දන් අනුභව කරල මෙබඳු වූත් තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවිකාව ගෙවනවා. ඒ කියන්නේ, ශාන්ති කර්ම, බාර ඔප්පු කිරීම,

පොළොව යට හිඳ මතුරා ගුරුකම් කිරීම, නපුංසකයා පිරිමියෙකු කිරීම, පිරිමියා නපුංසකයෙකු කිරීම, ගෙවල් තැනීමේ දිශාවන් පෙන්වා දීම, අළුතෙන් නිවාස තැනීමේදී පුද පූජා පැවැත් වීම, වතුර මතුරා මූණ සේදවීම, වතුර මතුරා නැහැවීම, ගිනිපිඳීම, ලය විරේක කරවීම, බඩ විරේක කරවීම, වමනය කරවීම, වස්ති කරවීම, ශීර්ෂ විරේකය, කණට තෙල් පිඹීම, ඇස් වෙදකම, නස්න කිරීම, ඇස්වලට අඳුන් සෑදීම, ප්‍රති අංජන සෑදීම, ශල්‍ය කර්ම කිරීම, ළදරු චිකිත්සාව, කාය චිකිත්සාව, වනවලට බෙහෙත් බැඳීම, ආදී තිරිසන් විද්‍යාවෙන් යුතුව මිත්‍යා ආජීවයෙන් ජීවත් වෙනවා. මෙවැනි දෙයිනුත් මෙවැනි වෙන දේවල්වලිනුත් වැළකී මෙබඳු වූ තිරශ්චින විද්‍යාවෙන් යුතු මිත්‍යා ආජීවයෙන් වැළකී ඉන්නවා. මෙයත් ඔහු ගේ සීලයට අයත් දෙයකි.

64. ස ඛෝ සෝ වාසෙට්ඨ භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෙය්‍යථාපි වාසෙට්ඨ ඛත්තියෝ මුද්ධාවසිත්තෝ නිහතප-චාමිත්තෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං ප-චත්ථිකතෝ. ඒවමේව ඛෝ වාසෙට්ඨ භික්ඛු ඒවං සීලසම්පන්නෝ න කුතෝචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතෝ. සෝ ඉමිනා අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ වාසෙට්ඨ භික්ඛු සීලසම්පන්නෝ හෝති.

64. පින්වත් වාසෙට්ඨ, ඒ භික්ෂුව වනාහී මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. පින්වත් වාසෙට්ඨ, ඒක මේ වගේ දෙයක්. ඔටුනු පළන් රජ කෙනෙක් ඉන්නවා. ඔහු සතුරන් පරදවල බැහැර කරලයි ඉන්නේ. ඉතින් ඔහු සතුරන් හේතුවෙන් මොන ම අයුරකින්වත් භයක් දකින්නේ නෑ. පින්වත් වාසෙට්ඨ, භික්ෂුවත් ඔය විදිහම යි. මේ අයුරින් සීලසම්පන්නව සිටින විට ඒ සීලසංවරය හේතු කොට ගෙන මොන ම අයුරකින්වත් බියක් දකින්නේ නෑ. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් සමන්විත ව ආධ්‍යාත්මිකව නිවැරදි සැපයක් විඳිනවා. පින්වත් වාසෙට්ඨ, ඔන්න විදිහට යි භික්ෂුව සීලසම්පන්න වන්නේ.

65. කථඤ්ච වාසෙට්ඨ භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති? ඉධ වාසෙට්ඨ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේතං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං. චක්ඛුන්ද්‍රියේ සංවරාය ආපජ්ජති.

සෝතේන සද්දං සුත්වා ..... ඝාණේන ගන්ධං ඝායිත්වා ..... ජිව්හාය රසං සායිත්වා ..... කායේන ඵොට්ඨබ්බං ඵුසිත්වා ..... මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හෝති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමේතං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෝමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති මනින්ද්‍රියං. මනින්ද්‍රියේ සංවරාය ආපජ්ජති. සෝ ඉමිනා අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ අජ්ඣත්තං අබ්‍යාසේකසුඛං පටිසංවේදේති. ඒවං ඛෝ වාසෙට්ඨ භික්ඛු ඉන්ද්‍රියේසු ගුත්තද්වාරෝ හෝති.

65. පින්වත් වාසෙට්ඨ, භික්ෂුව අකුසලයන් වැළකූ ද්වාර ඇති ඉඳුරන් ඇතිව ඉන්නේ කොහොම ද? පින්වත් වාසෙට්ඨ, මෙහිලා භික්ෂුව ඇසින් රූප දැක නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් ඇස නැමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. ඇස රැක ගන්නවා. ඇස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. කණෙන් ශබ්දයක් අහලා ..... නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කරලා ..... දිවෙන් රසයක් රස විඳලා ..... කයෙන් පහසක් ලබලා ..... මනසින් අරමුණක් දැන ගෙන නිමිති ගන්නේ නෑ. නිමිත්තක කොටසක්වත් ගන්නේ නෑ. යම් හෙයකින් මනස නැමැති ඉන්ද්‍රිය අසංවරව වසන කෙනෙකුට දැඩි ලෝභයත් දොම්නසත් පාපී අකුසලත් ඇති වී අර්බුදයක් හට ගන්නවා නම්, එහි සංවරය පිණිස පිළිපදිනවා. මනස රැක ගන්නවා. මනස නැමැති ඉන්ද්‍රියයේ සංවරයට පැමිණෙනවා. ඔහු මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව ආධ්‍යාත්මිකව පීඩා රහිතව සැපයක් විඳිනවා. පින්වත් වාසෙට්ඨ, භික්ෂුව අකුසලයෙන් වැළැක් වූ දොරටු ඇති ඉන්ද්‍රියයන් තුළ ඉන්නේ ඔය විදිහට යි.

66. කථඤ්ච වාසෙට්ඨ භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති? ඉධ වාසෙට්ඨ භික්ඛු අභික්කන්තේ පටික්කන්තේ සම්පජානකාරී හෝති. ආලෝකිතේ විලෝකිතේ සම්පජානකාරී හෝති. සම්මිඤ්ජිතේ පසාරිතේ සම්පජානකාරී හෝති. සංඝාටිපත්තචීවරධාරණේ සම්පජානකාරී හෝති. අසිතේ පීතේ ඛායිතේ සායිතේ සම්පජානකාරී හෝති. උච්චාරපස්සාවකම්මේ සම්පජානකාරී හෝති. ගතේ ඨිතේ නිසින්නේ සුත්තේ ජාගරිතේ භාසිතේ තුණ්හීභාවේ සම්පජානකාරී හෝති. ඒවං ඛෝ වාසෙට්ඨ භික්ඛු සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ හෝති.

66. පින්වත් වාසෙට්ඨ, භික්ෂුව සිහිනුවණින් යුතුව සිටින්නේ කොහොම ද? පින්වත් වාසෙට්ඨ, මෙහිලා භික්ෂුව ඉදිරියට යද්දීත්, ආපසු එද්දීත්, එය කරන්නේ සිහි නුවණින් ම යි. ඉදිරිය බලද්දී, වටපිට බලද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. අතපය හකුළද්දී, දිගහරිද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. දෙපට සිවුර, පාත්‍රය, අනෙක් සිවුරු ආදිය දරද්දී එය කරන්නෙත් සිහිනුවණින් ම යි. වළඳද්දී පානය කරද්දී අනුභව කරද්දී රස විඳිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. වැසිකිළි කැසිකිළි යාමේ දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. ගමන් කරද්දී, සිටගෙන සිටිද්දී, වාඩි වී සිටිද්දී, සැතපෙද්දී, නිදිවරද්දී, කථාබස් කරද්දී, නිහඬව සිටිද්දී එය කරන්නෙත් සිහි නුවණින් ම යි. පින්වත් වාසෙට්ඨ, භික්ෂුව සිහිනුවණින් යුතු වන්නේ ඔය ආකාරයට යි.

67. කථඤ්ච වාසෙට්ඨ භික්ඛු සන්තුට්ඨෝ හෝති? ඉධ වාසෙට්ඨ භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරියේන චීවරේන කුච්ඡිපරිහාරියේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. සෙය්‍යථාපි වාසෙට්ඨ පක්ඛී සකුණෝ යේන යේනේව ඩේති සපත්තභාරෝව ඩේති, එවමේව ඛෝ වාසෙට්ඨ භික්ඛු සන්තුට්ඨෝ හෝති කායපරිහාරියේන චීවරේන කුච්ඡිපරිහාරියේන පිණ්ඩපාතේන. සෝ යේන යේනේව පක්කමති සමාදායේව පක්කමති. එවං ඛෝ වාසෙට්ඨ භික්ඛු සන්තුට්ඨෝ හෝති.

67. පින්වත් වාසෙට්ඨ, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ කොහොම ද? පින්වත් වාසෙට්ඨ, මෙහිලා භික්ෂුව කය පරිහරණයට සෑහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සෑහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. ඒක මේ වගේ දෙයක්. කුරුල්ලෙක් යම් ම තැනකට පියඹා යනවා නම්, පියාපත් බර පමණක් සහිතව පියඹනවා වගෙයි. පින්වත් වාසෙට්ඨ, ඔය අයුරින් ම භික්ෂුව කය පරිහරණයට සෑහෙන සිවුරෙන්, කුසගිනි නිවෙන්ට සෑහෙන පිණ්ඩපාතයෙන් සතුටු වෙනවා. ඔහු යම් ම තැනකට පිටත් වෙනවා නම්, පාසිවුරු පමණක් අරගෙන යනවා. පින්වත් වාසෙට්ඨ, භික්ෂුව ලද දෙයින් සතුටු වන්නේ ඔය විදිහට යි.

68. සෝ ඉමිනා ච අරියේන සීලක්ඛන්ධේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන ඉන්ද්‍රියසංවරේන සමන්නාගතෝ, ඉමිනා ච අරියේන සතිසම්පජඤ්ඤේන සමන්නාගතෝ, ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතෝ, විවිත්තං සේනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භෝකාසං පලාලපුඤ්ජං. සෝ

ප-ඡාහත්ථං පිණ්ඩපාතපටික්කන්තෝ නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

68. ඔහු මේ ආර්ය වූ සීලස්කන්ධයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වෙලා, මේ ආර්ය වූ සිහිනුවණින් යුක්ත වෙලා, මේ ආර්ය වූ ලද දෙයින් සතුටුවීමෙන් යුක්ත වෙලා හුදෙකලා සෙනසුනක වාසය කරනවා. ඒ කියන්නේ ආරණ්‍යය, රුක්සෙවණ, පර්වතය, දිය ඇල්ල, ගිරිගුහාව, සොහොන, වනගැබ, ගස් කොළන් රහිත හිස් පිටිය, පිදුරු ගෙය ආදිය යි. ඔහු පිණ්ඩපාතය වළඳා, දානයෙන් පසු (එවැනි තැනක) පළඟක් බැඳ ගෙන, කය සෘජු කර ගෙන, භාවනා අරමුණෙහි සිහිය පිහිටුවා ගෙන වාඩිවෙනවා.

69. සෝ අභිජ්ඣං ලෝකේ පහාය විගතාභිජ්ඣේන චේතසා විහරති. අභිජ්ඣාය චිත්තං පරිසෝධේති. බ්‍යාපාදපදෝසං පහාය අබ්‍යාපන්නචිත්තෝ විහරති සබ්බපාණභූත හිතානුකම්පී. බ්‍යාපාදපදෝසා චිත්තං පරිසෝධේති. ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධෝ විහරති ආලෝකසඤ්ඤී සතෝ සම්පජානෝ. ථීනමිද්ධා චිත්තං පරිසෝධේති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතෝ විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තෝ. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසෝධේති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡෝ විහරති අකථංකථී කුසලේසු ධම්මේසු. විචිකිච්ඡාය චිත්තං පරිසෝධේති.

69. ඔහු ජීවිතය නම් වූ ලෝකය ගැන ඇති විසම ලෝභය දුරු කොට ඇලීම් රහිත වූ සිතින් වාසය කරනවා. විසම ලෝභය කෙරෙන් සිත පිරිසිදු කරනවා. තරහ වෛර ආදිය අත්හැර තරහ නැති සිතින් සියළු සතුන් කෙරෙහි හිතානුකම්පීව වාසය කරනවා. තරහ වෛර ආදිය කෙරෙන් සිත පිරිසිදු කරනවා. නිදිමත අලසකම අත්හැර නිදිමත අලසකමින් බැහැරව ආලෝක සඤ්ඤාවෙන් යුතුව, සිහිනුවණ ඇතිව වාසය කරනවා. නිදිමත අලසකම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සිතේ විසිරීමත්, පසුතැවීමත් බැහැර කොට නො කැළඹී ගිය සංසිඳුනු සිතින් වාසය කරනවා. සිතේ විසිරීම හා පසුතැවීම කෙරෙන් සිත පිරිසිදු කරනවා. සැකය දුරු කොට කුසල් දහම් ගැන කෙසේ ද? කෙසේ ද? යනාදී සැකයෙන් එතෙරව වාසය කරනවා. සැකය කෙරෙන් සිත පිරිසිදු කරනවා.

70. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසෝ ඉණං ආදාය කම්මන්තේ පයෝජෙය්‍ය, තස්ස තේ කම්මන්තා සම්ඡ්ජ්ජෙය්‍යුං, සෝ යානි ච පෝරාණානි

ඉණමූලානි තානි ච බ්‍යාන්තීකරෙය්‍ය, සියා චස්ස උත්තරිං අවසිට්ඨං දාරභරණාය, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ඉණං ආදාය කම්මන්තේ පයෝජේසිං. තස්ස මේ තේ කම්මන්තා සම්ඡ්ජ්ඣිංසු. සෝ'හං යානි ච පෝරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීඅකාසිං. අත්ථි ච මේ උත්තරිං අවසිට්ඨං දාරභරණායා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

70. පින්වත් වාසෙට්ඨ, එය මෙවැනි දෙයක්. පුරුෂයෙක් ණයක් අරගෙන කර්මාන්තයක යොදවනවා. ඔහු ගේ ඒ ව්‍යාපාරය සාර්ථක වෙනවා. එතකොට ඔහු යම් පරණ මුල් ණයක් ඇද්ද, එය සම්පූර්ණයෙන් ම ගෙවලා දානවා. එයින් පසු ඔහුට අඹුදරුවන් පෝෂණය පිණිස ලාභයක් ඉතිරිත් වෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං කලින් ණයක් අරගෙනයි ව්‍යාපාරයක යෙදෙව්වේ. ඒ මගේ ව්‍යාපාරය සාර්ථක වුණා. ඒ මං යම් පරණ මුල් ණයක් ඇද්ද එය සම්පූර්ණයෙන් ම ගෙව්වා. අඹුදරුවන් පෝෂණයටත් මට ආදායම ඉතිරි වුණා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

71. **සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසෝ ආබාධිකෝ අස්ස දුක්ඛිතෝ බාළ්හගිලානෝ, භත්තං චස්ස න-ඡාදෙය්‍ය, න චස්ස කායේ බලමත්තා, සෝ අපරේන සමයේන තම්හා ආබාධා මු-චෙය්‍යා, භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායේ බලමත්තා, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ ආබාධිකෝ අහෝසිං දුක්ඛිතෝ බාළ්හගිලානෝ. භත්තං ච මේ න-ඡාදේසි. න චස්ස මේ ආසි කායේ බලමත්තා. සෝ'ම්හි එතරහි තම්හා ආබාධා මුත්තෝ. භත්තඤ්ච මේ ඡාදේති. අත්ථි ච මේ කායේ බලමත්තා"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.**

71. පින්වත් වාසෙට්ඨ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව ඉන්නවා. ඔහුට බත් කෑමටවත් පිරියක් නෑ. ඔහු ගේ ඇඟේ පතේ ප්‍රාණවත් ගතියක් නෑ. නමුත් පස්සෙ කාලෙක ඔහු ඒ රෝගයෙන් මිදුනා. ඔහුට දැන් බත් කෑමත් ප්‍රිය යි. ඔහු ගේ ඇඟපතත් ප්‍රාණවත්. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර රෝගී වෙලා, දුකට පත්වෙලා, දැඩිසේ ගිලන්ව හිටියේ. මට බත් කෑමටවත් පිරියක් තිබුණේ නෑ. මගේ ඇඟේ පතේ ප්‍රාණවත් ගතියක් තිබුණේ නෑ. නමුත් දැන් මං ඒ රෝගයෙන් මිදුනා. මට දැන් බත් කෑමත් ප්‍රියයි. මගේ ඇඟපතත් ප්‍රාණවත්" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

72. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසෝ බන්ධනාගාරේ බද්ධෝ අස්ස, සෝ අපරේන සමයේන තම්හා බන්ධනාගාරා මු-චෙය්‍ය සොත්ථිනා අබ්බයේන න චස්ස කිඤ්චි භෝගානං වයෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ බන්ධනාගාරේ බද්ධෝ අහෝසිං. සෝ'ම්හි ඒතරහි තම්හා බන්ධනාගාරා මුත්තෝ සොත්ථිනා අබ්බයේන. නත්ථි ච මේ කිඤ්චි භෝගානං වයෝ"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

72. පින්වත් වාසෙට්ඨ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් හිරගෙදරක බන්ධනයකට හසුවෙනවා. නමුත් ඔහු පස්සෙ කාලෙක තමන් ගේ ධනය වියදම් නොකොට සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වෙනවා. ඔහු ගේ සම්පත්වලින් කිසි වියදමක් යන්නේ නෑ. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා. "මං ඉස්සර හිරගෙදරක බන්ධනයකට අහු වුණා. නමුත් ඒ මං දැන් ධන වියදමකින් තොරව සුවසේ ම ඒ බන්ධනාගාරයෙන් නිදහස් වුණා. මගේ භෝග සම්පත්වලින් කිසිදෙයක් වියදම් වුණේ නෑ" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

73. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසෝ දාසෝ අස්ස අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාමංගමෝ, සෝ අපරේන සමයේන තම්හා දාසබ්‍යා මු-චෙය්‍ය අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාමංගමෝ, තස්ස ඒවමස්ස: "අහං ඛෝ පුබ්බේ දාසෝ අහෝසිං අනත්තාධීනෝ පරාධීනෝ න යේනකාමංගමෝ. සෝ'ම්හි ඒතරහි තම්හා දාසබ්‍යා මුත්තෝ අත්තාධීනෝ අපරාධීනෝ භුජිස්සෝ යේනකාමංගමෝ"ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

73. පින්වත් වාසෙට්ඨ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නොහැකි, දාසයෙක් වෙලා හිටියා. ඔහු පස්සෙ කාලෙක ඒ දාසබවෙන් නිදහස් වුණා. තමාට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නොවන, තමන් කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබුණා. එතකොට ඔහුට මෙහෙම හිතුනා. "මං ඉස්සර තමාට සිතූ පරිදි ගත කරන්නට බැරි, අනුන්ට යටත් වෙලා වාසය කරන, තමා කැමැති පරිදි යා ගත නොහැකි, දාසයෙක් වෙලා හිටියා. ඒ මං දැන් ඒ දාසබවෙන් නිදහස් වෙලයි ඉන්නේ. මට සිතූ පරිදි ගත කරන, අනුන්ට යටත් නොවන, මං කැමැති පරිදි යා හැකි ජීවිතයක් ලැබිලා තියෙනවා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

74. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසෝ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං, සෝ අපරේන සමයේන තං කන්තාරං නිත්ථරෙය්‍ය, සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛේමං අප්පටිභයං, තස්ස ඒවමස්ස: "අයං ඛෝ පුබ්බේ සධනෝ සභෝගෝ කන්තාරද්ධානමග්ගං පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සෝ'මිහි ඒතරහි තං කන්තාරං තිණ්ණෝ සොත්ථිනා ගාමන්තං අනුප්පත්තෝ ඛේමං අප්පටිභය"න්ති. සෝ තතෝ නිදානං ලභේථ පාමොජ්ජං, අධිග-ඡෙය්‍ය සෝමනස්සං.

74. පින්වත් වාසෙට්ඨ, ඒක මේ වගේ දෙයක්. පුරුෂයෙක් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසෙනවා. නමුත් ඔහු පසු කාලෙක ඒ කාන්තාරයෙන් එතෙර වෙනවා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණෙනවා. එතකොට ඔහුට මෙහෙම හිතෙනවා "මං කලින් ධනය ඇතිව, භෝග සම්පත් ඇතිව, ආහාරපාන දුලභ වූ, බිය උවදුරු සහිත කාන්තාර ගමනකට පිවිසුනා. නමුත් දැන් මා ඒ කාන්තාරයෙන් එතෙර වුණා. සුවසේ ම ගමන අවසන් කොට බිය, උවදුරු නැති ආරක්ෂාව ඇති තැනකට පැමිණුනා" කියලා. ඒ හේතුවෙන් ඔහු මහත් සතුටක් ලබනවා. මහත් සොම්නසක් ලබනවා.

75. ඒවමේව ඛෝ වාසෙට්ඨ භික්ඛු යථා ඉණං යථා රෝගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං. ඒවං ඉමේ පඤ්ච නීවරණේ අප්පහීණේ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි වාසෙට්ඨ ආනණ්‍යං, යථා ආරෝග්‍යං, යථා බන්ධනා මොක්ඛං, යථා භුජිස්සං, යථා ඛේමන්තභූමිං ඒවමේව ඛෝ වාසෙට්ඨ භික්ඛු ඉමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සති.

75. පින්වත් වාසෙට්ඨ, අන්න ඒ විදිහම යි. භික්ෂුවත් (කලින්) ණයක් ගත්තා වගේ, ලෙඩ වුණා වගේ, හිරේවිලංගුවේ වැටුනා වගේ, වහල්බවට පත් වුණා වගේ, නිරුදක කතරකට පැමිණුනා වගේ මේ පංච නීවරණයන් ප්‍රහාණය නො වී තමා තුළ පවතින හැටි දකිනවා. නමුත් පින්වත් වාසෙට්ඨ, ඒ ණය ගෙවා දමා ණය රහිත වුණා වගේ, රෝගයෙන් නිදහස් වෙලා නීරෝග වුණා වගේ, වියදම් නැතුව හිරෙන් නිදහස් වුණා වගේ, දාසබවෙන් නිදහස් වුණා වගේ, නිරුදක කතර ගෙවා ආරක්ෂා සහිත ක්ෂේම භූමියකට

පැමිණුනා වගේ තමයි. පින්වත් වාසෙට්ඨ, අන්න ඒ විදිහමයි භික්ෂුව තමා තුළ මේ පංච නීවරණයන් දුරුවී ඇති ආකාරයත් දකින්නේ.

76. තස්සිමේ පඤ්ච නීවරණේ පහීණේ අත්තනි සමනුපස්සතෝ පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායෝ පස්සම්භති. පස්සද්ධකායෝ සුඛං වේදේති. සුඛිනෝ චිත්තං සමාධියති.

76. ඔහුට මේ පඤ්ච නීවරණයන් තමා තුළ නැති බව දකිද්දි මහත් සතුටක් ඇති වෙනවා. ඒ ප්‍රමුදිත වීම ඇති කෙනාට ප්‍රීතිය ඇති වෙනවා. ප්‍රීති මනසක් ඇති කෙනා ගේ කය සංසිඳෙනවා. සංසිඳුනු කයින් යුතු ව සැපක් විඳිනවා. සැප ඇති කෙනා ගේ සිත සමාධිමත් වෙනවා.

77. සෝ මෙත්තාසහගතේන චේතසා ඒකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං. ඉති උද්ධමධෝ තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලෝකං මෙත්තාසහගතේන චේතසා විපුලේන මහග්ගතේන අප්පමාණේන අවේරේන අව්‍යාපජ්ඣේන ඵරිත්වා විහරති. සෙය්‍යථාපි වාසෙට්ඨ බලවා සංඛධමෝ අප්පකසිරේනේව චාතුද්දිසං සද්දං විඤ්ඤාපෙය්‍ය, ඒවමේව ඛෝ වාසෙට්ඨ ඒවං භාවිතාය මෙත්තාය චේතෝවිමුත්තියා යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති, න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛෝ වාසෙට්ඨ බ්‍රහ්මුනෝ සහව්‍යතාය මග්ගෝ.

77. ඔහු මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරනවා. ඒ වගේ ම දෙවෙනි දිශාවටත්, තුන්වෙනි දිශාවටත්, හතරවෙනි දිශාවටත් පතුරුවා වාසය කරනවා. ඒ වගේ ම උඩ යට හරහට සියළු තැන ම, සියළු අයුරින් තමා හා සමකොට සකල ලෝකයට ම විපුල වූ ප්‍රදේශ වශයෙන් පුළුල් වූ ප්‍රමාණ රහිත වූ වෛර නැති තරහ නැති මෙත් සිත පතුරුවා වාසය කරනවා. පින්වත් වාසෙට්ඨ, එය මෙවැනි දෙයක් සක්පිඹින බලවත් පුරුෂයෙක් ඉතා පහසුවෙන් ම සිව් දිශාවට සක් හඬ පතුරුවනවා වගේ, අන්න ඒ අයුරින් ම පින්වත් වාසෙට්ඨ, ඔය විදිහට වඩන ලද මෛත්‍රී චිත්ත විමුක්තියෙන් ප්‍රමාණවත් පරිදි කරන ලද යම් කර්මයක් ඇත්නම් එය එහි (කාම ලෝකයෙහි) ඉතුරු වෙන්නේ නෑ. එය එහි යටවෙලා තිබෙන්නේ නෑ. පින්වත් වාසෙට්ඨ, මේ මෛත්‍රී චිත්ත විමුක්තියත් බ්‍රහ්මයා හා එක්වන මාර්ගයකි.

78. පුනචපරං වාසෙට්ඨ භික්ඛු කරුණාසහගතේන චේතසා ඒකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං. ඉති උද්ධමධෝ

තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලෝකං කරුණාසහගතේන චේතසා විපුලේන මහග්ගතේන අප්පමාණේන අවේරේන අව්‍යාපජ්ඣේන ඵරිත්වා විහරති. සෙය්‍යථාපි වාසෙට්ඨ බලවා සංඛධමෝ අප්පකසිරේනේව චාතුද්දිසං සරේන විඤ්ඤාපෙය්‍ය, ඒවමේව ඛෝ වාසෙට්ඨ ඒවං භාවිතාය කරුණාය චේතෝවිමුත්තියා යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති, න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛෝ වාසෙට්ඨ බ්‍රහ්මුනෝ සහව්‍යතාය මග්ගෝ.

78. පින්වත් වාසෙට්ඨ, තව දුරටත් කියනවා නම්, භික්ෂුව කරුණා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරනවා. ඒ වගේ ම දෙවෙනි දිශාවටත්, තුන්වෙනි දිශාවටත්, හතරවෙනි දිශාවටත් පතුරුවා වාසය කරනවා. ඒ වගේ ම උඩ යට හරහට සියළු තැන ම, සියළු අයුරින් තමා හා සමකොට සකල ලෝකයට ම විපුල වූ ප්‍රදේශ වශයෙන් පුළුල් වූ ප්‍රමාණ රහිත වූ වෛර නැති තරහ නැති කරුණා සිත පතුරුවා වාසය කරනවා. පින්වත් වාසෙට්ඨ, එය මෙවැනි දෙයක් සක්පිඹින බලවත් පුරුෂයෙක් ඉතා පහසුවෙන් ම සිව් දිශාවට සක් හඬ පතුරුවනවා වගේ, අන්න ඒ අයුරින් ම පින්වත් වාසෙට්ඨ, ඔය විදිහට වඩන ලද කරුණා චිත්ත විමුක්තියෙන් ප්‍රමාණවත් පරිදි කරන ලද යම් කර්මයක් ඇත්නම් එය එහි (කාම ලෝකයෙහි) ඉතුරු වෙන්නේ නෑ. එය එහි යටවෙලා තිබෙන්නේ නෑ. පින්වත් වාසෙට්ඨ, මේ කරුණා චිත්ත විමුක්තියත් බ්‍රහ්මයා හා එක්වන මාර්ගයකි.

79. පුනචපරං වාසෙට්ඨ භික්ඛු මුදිතාසහගතේන චේතසා ඒකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං. ඉති උද්ධමධෝ තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලෝකං මුදිතාසහගතේන චේතසා විපුලේන මහග්ගතේන අප්පමාණේන අවේරේන අව්‍යාපජ්ඣේන ඵරිත්වා විහරති. සෙය්‍යථාපි වාසෙට්ඨ බලවා සංඛධමෝ අප්පකසිරේනේව චාතුද්දිසං සරේන විඤ්ඤාපෙය්‍ය, ඒවමේව ඛෝ වාසෙට්ඨ ඒවං භාවිතාය මුදිතාය චේතෝවිමුත්තියා යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති, න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛෝ වාසෙට්ඨ බ්‍රහ්මුනෝ සහව්‍යතාය මග්ගෝ.

79. පින්වත් වාසෙට්ඨ, තව දුරටත් කියනවා නම්, භික්ෂුව මුදිතා (අන්‍යයන් සැප සේ වාසය කිරීම ගැන තමා සතුටු වීම) සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරනවා. ඒ වගේ ම දෙවෙනි දිශාවටත්, තුන්වෙනි දිශාවටත්, හතරවෙනි දිශාවටත් පතුරුවා වාසය කරනවා. ඒ වගේ ම උඩ යට හරහට සියළු තැන ම, සියළු අයුරින් තමා හා සමකොට සකල ලෝකයට ම විපුල වූ ප්‍රදේශ වශයෙන් පුළුල් වූ ප්‍රමාණ රහිත වූ වෛර නැති තරහ නැති

මුදිතා සිත පතුරුවා වාසය කරනවා. පින්වත් වාසෙට්ඨ, එය මෙවැනි දෙයක් සක්පිඹින බලවත් පුරුෂයෙක් ඉතා පහසුවෙන් ම සිව් දිශාවට සක් හඬ පතුරුවනවා වගේ, අන්න ඒ අයුරින් ම පින්වත් වාසෙට්ඨ, ඔය විදිහට වඩන ලද මුදිතා චිත්ත විමුක්තියෙන් ප්‍රමාණවත් පරිදි කරන ලද යම් කර්මයක් ඇත්නම් එය එහි (කාම ලෝකයෙහි) ඉතුරු වෙන්නේ නෑ. එය එහි යටවෙලා තිබෙන්නේ නෑ. පින්වත් වාසෙට්ඨ, මේ මුදිතා චිත්ත විමුක්තියත් බ්‍රහ්මයා හා එක්වන මාර්ගයකි.

80. **පුනචපරං වාසෙට්ඨ භික්ඛු උපෙක්ඛාසහගතේන චේතසා ඒකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං තථා තතියං තථා චතුත්ථිං. ඉති උද්ධමධෝ තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලෝකං උපෙක්ඛාසහගතේන චේතසා විපුලේන මහග්ගතේන අප්පමාණේන අවේරේන අව්‍යාපජ්ඣේන ඵරිත්වා විහරති. සෙය්‍යථාපි වාසෙට්ඨ බලවා සංඛධමෝ අප්පකසිරේනේව චාතුද්දිසං සරේන විඤ්ඤාපෙය්‍ය, ඒවමේව ඛෝ වාසෙට්ඨ ඒවං භාවිතාය උපෙක්ඛාය චේතෝවිමුත්තියා යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති, න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛෝ වාසෙට්ඨ බ්‍රහ්මුනෝ සහව්‍යතාය මග්ගෝ.**

80. පින්වත් වාසෙට්ඨ, තව දුරටත් කියනවා නම්, භික්ෂුව උපේක්ෂා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරනවා. ඒ වගේ ම දෙවෙනි දිශාවටත්, තුන්වෙනි දිශාවටත්, හතරවෙනි දිශාවටත් පතුරුවා වාසය කරනවා. ඒ වගේ ම උඩ යට හරහට සියළු තැන ම, සියළු අයුරින් තමා හා සමකොට සකල ලෝකයට ම විපුල වූ ප්‍රදේශ වශයෙන් පුළුල් වූ ප්‍රමාණ රහිත වූ වෛර නැති තරහ නැති උපේක්ෂා සිත පතුරුවා වාසය කරනවා. පින්වත් වාසෙට්ඨ, එය මෙවැනි දෙයක් සක්පිඹින බලවත් පුරුෂයෙක් ඉතා පහසුවෙන් ම සිව් දිශාවට සක් හඬ පතුරුවනවා වගේ, අන්න ඒ අයුරින් ම පින්වත් වාසෙට්ඨ, ඔය විදිහට වඩන ලද උපේක්ෂා චිත්ත විමුක්තියෙන් ප්‍රමාණවත් පරිදි කරන ලද යම් කර්මයක් ඇත්නම් එය එහි (කාම ලෝකයෙහි) ඉතුරු වෙන්නේ නෑ. එය එහි යටවෙලා තිබෙන්නේ නෑ. පින්වත් වාසෙට්ඨ, මේ උපේක්ෂා චිත්ත විමුක්තියත් බ්‍රහ්මයා හා එක්වන මාර්ගයකි.

81. **තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? ඒවං විහාරී භික්ඛු සපරිග්ගහෝ වා අපරිග්ගහෝ වා”ති. “අපරිග්ගහෝ හෝ ගෝතම.”**

81. පින්වත් වාසෙට්ඨ, මේ ගැන කුමක් ද හිතන්නේ? ඔය විදිහට වාසය

කරණ භික්ෂුව ස්ත්‍රීන් සමග එක් වීමක් තියෙනවා ද? ස්ත්‍රීන් සමග එක් වීමක් නැද්ද?" "භවත් ගෞතමයන් වහන්ස, (ඒ භික්ෂුව) ස්ත්‍රීන් සමග එක් වීමක් නෑ."

"සවේරචිත්තෝ වා අවේරචිත්තෝ වා?"ති. "අවේරචිත්තෝ හෝ ගෝතම."

"(ඒ භික්ෂුව) වෛර සිත් ඇතිව ද ඉන්නේ? අවෛරී සිතින් ද ඉන්නේ?" භවත් ගෞතමයන් වහන්ස, (ඒ භික්ෂුව) අවෛරී සිතිනුයි ඉන්නේ."

"සව්‍යාපජ්ඣචිත්තෝ වා අව්‍යාපජ්ඣචිත්තෝ වා?"ති. "අව්‍යාපජ්ඣචිත්තෝ හෝ ගෝතම."

"(ඒ භික්ෂුව) පීඩා සහිත සිත් ඇතිව ද ඉන්නේ? පීඩා රහිත සිතින් ද ඉන්නේ?" භවත් ගෞතමයන් වහන්ස, (ඒ භික්ෂුව) පීඩා රහිත සිතිනුයි ඉන්නේ."

"සංකිලිට්ඨචිත්තෝ වා අසංකිලිට්ඨචිත්තෝ වා?"ති. "අසංකිලිට්ඨචිත්තෝ හෝ ගෝතම."

"(ඒ භික්ෂුව) කිලිටි වූ සිත් ඇතිව ද ඉන්නේ? නො කිලිටි සිතින් ද ඉන්නේ?" භවත් ගෞතමයන් වහන්ස, (ඒ භික්ෂුව) නො කිලිටි සිතිනුයි ඉන්නේ."

"වසවත්තී වා අවසවත්තී වා?"ති. "වසවත්තී හෝ ගෝතම."

"(ඒ භික්ෂුව) තමා ගේ වසඟයේ පැවැත්විය නො හැකි සිත් ඇතිව ද ඉන්නේ? තමා ගේ වසඟයේ පැවැත්විය හැකි සිතින් ද ඉන්නේ?" භවත් ගෞතමයන් වහන්ස, (ඒ භික්ෂුව) තමා ගේ වසඟයේ පැවැත්විය හැකි සිතිනුයි ඉන්නේ."

82. ඉති කිර වාසෙට්ඨ අපරිග්ගහෝ භික්ඛු. අපරිග්ගහෝ බ්‍රහ්මා. අපි නු ඛෝ අපරිග්ගහස්ස භික්ඛුනෝ අපරිග්ගහේන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දන්ති සමේති?"ති. "ඒවං හෝ ගෝතම"

82. එහෙම නම් පින්වත් වාසෙට්ඨ, භික්ෂුව ස්ත්‍රී ඇසුරෙන් තොරව යි

ඉන්නේ. ඒ වගේ ම බ්‍රහ්මයාත් ස්ත්‍රී ඇසුරෙන් තොරව යි ඉන්නේ. එහෙම නම් ස්ත්‍රී ඇසුරෙන් තොරව යි ඉන්න භික්ෂුව හා ස්ත්‍රී ඇසුරෙන් තොරව ඉන්න බ්‍රහ්මයා සැසඳෙනවා ද? සම වෙනවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, එය එසේ ම යි."

"සාධු වාසෙට්ඨ. තේ වත වාසෙට්ඨ අපරිග්ගහෝ භික්ඛු කායස්සභේදා පරම්මරණා අපරිග්ගහස්ස බ්‍රහ්මුනෝ සහව්‍යූපගෝ භවිස්සතීති. ඨානමේතං විජ්ජති."

"හොඳයි පින්වත් වාසෙට්ඨ, ස්ත්‍රී ඇසුරෙන් තොරව ඉන්න භික්ෂුව ඒකාන්තයෙන් ම කය බිඳී මරණින් මතු ස්ත්‍රී ඇසුරක් නැති බ්‍රහ්මයා හා එක්වීමකට යනවා ය යන කරුණ සිදු විය හැකි දෙයක් ම යි."

83. ඉති කිර වාසෙට්ඨ අවේරචිත්තෝ භික්ඛු. අවේරචිත්තෝ බ්‍රහ්මා. අපි නු ඛෝ අවේරචිත්තස්ස භික්ඛුනෝ අවේරචිත්තේන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දන්ති සමේතී?"ති. "ඒවං හෝ ගෝතම"

83. එහෙම නම් පින්වත් වාසෙට්ඨ, භික්ෂුව අවෛරී සිත් ඇතිව යි ඉන්නේ. ඒ වගේ ම බ්‍රහ්මයාත් අවෛරී සිත් ඇතුව යි ඉන්නේ. එහෙම නම් අවෛරී සිත් ඇතිව ඉන්න භික්ෂුව හා අවෛරී සිත් ඇතිව ඉන්න බ්‍රහ්මයා සැසඳෙනවා ද? සම වෙනවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, එය එසේ ම යි."

"සාධු වාසෙට්ඨ. සෝ වත වාසෙට්ඨ අවේරචිත්තෝ භික්ඛු කායස්සභේදා පරම්මරණා අවේරචිත්තස්ස බ්‍රහ්මුනෝ සහව්‍යූපගෝ භවිස්සතීති. ඨානමේතං විජ්ජති."

"හොඳයි පින්වත් වාසෙට්ඨ, අවෛරී සිත් ඇතිව ඉන්න භික්ෂුව ඒකාන්තයෙන් ම කය බිඳී මරණින් මතු අවෛරී සිත් ඇති බ්‍රහ්මයා හා එක්වීමකට යනවා ය යන කරුණ සිදු විය හැකි දෙයක් ම යි."

84. ඉති කිර වාසෙට්ඨ අබ්‍යාපජ්ඣචිත්තෝ භික්ඛු. අබ්‍යාපජ්ඣචිත්තෝ බ්‍රහ්මා. අපි නු ඛෝ අබ්‍යාපජ්ඣචිත්තස්ස භික්ඛුනෝ අබ්‍යාපජ්ඣචිත්තේන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දන්ති සමේතී?"ති. "ඒවං හෝ ගෝතම"

84. එහෙම නම් පින්වත් වාසෙට්ඨ, භික්ෂුව පීඩා රහිත සිත් ඇතිව යි ඉන්නේ. ඒ වගේ ම බ්‍රහ්මයාත් පීඩා රහිත සිත් ඇතුව යි ඉන්නේ. එහෙම නම් පීඩා රහිත සිත් ඇතිව ඉන්න භික්ෂුව හා පීඩා රහිත සිත් ඇතිව ඉන්න බ්‍රහ්මයා සැසඳෙනවා ද? සම වෙනවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, එය එසේ ම යි."

"සාධු වාසෙට්ඨ. සෝ වත වාසෙට්ඨ අබ්‍යාපජ්ඣචිත්තෝ භික්ඛු කායස්සභේදා පරම්මරණා අබ්‍යාපජ්ඣචිත්තස්ස බ්‍රහ්මුනෝ සහව්‍යූපගෝ භවිස්සතීති. ඨානමේතං විජ්ජති."

"හොඳයි පින්වත් වාසෙට්ඨ, පීඩා රහිත සිත් ඇතිව ඉන්න භික්ෂුව ඒකාන්තයෙන් ම කය බිඳී මරණින් මතු පීඩා රහිත සිත් ඇති බ්‍රහ්මයා හා එක්වීමකට යනවා ය යන කරුණ සිදු විය හැකි දෙයක් ම යි."

85. ඉති කිර වාසෙට්ඨ අසංකිලිට්ඨචිත්තෝ භික්ඛු. අසංකිලිට්ඨචිත්තෝ බ්‍රහ්මා. අපි නු ඛෝ අසංකිලිට්ඨචිත්තස්ස භික්ඛුනෝ අසංකිලිට්ඨචිත්තේන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දන්ති සමේතී?"ති. "ඒවං හෝ ගෝතම"

85. එහෙම නම් පින්වත් වාසෙට්ඨ, භික්ෂුව නො කිලිටි සිත් ඇතිව යි ඉන්නේ. ඒ වගේ ම බ්‍රහ්මයාත් නො කිලිටි සිත් ඇතුව යි ඉන්නේ. එහෙම නම් නො කිලිටි සිත් ඇතිව ඉන්න භික්ෂුව හා නො කිලිටි සිත් ඇතිව ඉන්න බ්‍රහ්මයා සැසඳෙනවා ද? සම වෙනවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, එය එසේ ම යි."

"සාධු වාසෙට්ඨ. තේ වත වාසෙට්ඨ අසංකිලිට්ඨචිත්තෝ භික්ඛු කායස්සභේදා පරම්මරණා අසංකිලිට්ඨචිත්තස්ස බ්‍රහ්මුනෝ සහව්‍යූපගෝ භවිස්සතීති. ඨානමේතං විජ්ජති."

"හොඳයි පින්වත් වාසෙට්ඨ, නො කිලිටි සිත් ඇතිව ඉන්න භික්ෂුව ඒකාන්තයෙන් ම කය බිඳී මරණින් මතු නො කිලිටි සිත් ඇති බ්‍රහ්මයා හා එක්වීමකට යනවා ය යන කරුණ සිදු විය හැකි දෙයක් ම යි."

86. ඉති කිර වාසෙට්ඨ වසවත්තී භික්ඛු. වසවත්තී බ්‍රහ්මා. අපි නු ඛෝ වසවත්තිස්ස භික්ඛුනෝ වසවත්තිනා බ්‍රහ්මුනා සද්ධිං සංසන්දන්ති සමේතී?"ති. "ඒවං හෝ ගෝතම"

86. එහෙම නම් පින්වත් වාසෙට්ඨ, භික්ෂුව තමා වසඟයේ පවත්වා ගත හැකි සිත් ඇතිව යි ඉන්නේ. ඒ වගේ ම බ්‍රහ්මයාත් තමා වසඟයේ පවත්වා ගත හැකි සිත් ඇතුව යි ඉන්නේ. එහෙම නම් තමා වසඟයේ පවත්වා ගත හැකි සිත් ඇතිව ඉන්න භික්ෂුව හා තමා වසඟයේ පවත්වා ගත හැකි සිත් ඇතිව ඉන්න බ්‍රහ්මයා සැසඳෙනවා ද? සම වෙනවා ද?" "භවත් ගෞතමයන් වහන්ස, එය එසේ ම යි."

"සාධු වාසෙට්ඨ. තේ වත වාසෙට්ඨ වසවත්තී භික්ඛු කායස්සභේදා පරම්මරණා වසවත්තිස්ස බ්‍රහ්මුනෝ සහව්‍යූපගෝ භවිස්සතීති. ඨානමේතං විජ්ජතී"ති.

"හොඳයි පින්වත් වාසෙට්ඨ, තමා වසඟයේ පවත්වා ගත හැකි සිත් ඇතිව ඉන්න භික්ෂුව ඒකාන්තයෙන් ම කය බිඳී මරණින් මතු තමා වසඟයේ පවත්වා ගත හැකි සිත් ඇති බ්‍රහ්මයා හා එක්වීමකට යනවා ය යන කරුණ සිදු විය හැකි දෙයක් ම යි."

87. ඒවං වුත්තේ වාසෙට්ඨභාරද්වාජ මාණවා භගවන්තං ඒතදවෝචුං: "අභික්කන්තං භෝ ගෝතම අභික්කන්තං භෝ ගෝතම. සෙය්‍යථාපි භෝ ගෝතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය. පටි-ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරේ වා තේල පජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තෝ රූපානි දක්ඛින්තීති. ඒවමේව භෝතා ගෝතමේන අනේකපරියායේන ධම්මෝ පකාසිතෝ. ඒතේ මයං භගවන්තං ගෝතමං සරණං ග-ඡාම ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. උපාසකෝ නෝ භවං ගෝතමෝ ධාරේතු අජ්ජතග්ගේ පාණුපේතං සරණංගතේ"ති.

87. මෙසේ වදාළ විට වාසෙට්ඨ භාරද්වාජ මාණවකයන් භාග්‍යවතුන් වහන්සේට මෙහෙම සැළ කර සිටියා. "ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඉතා සුන්දර යි. යටට හරවා තිබූ දෙයක් උඩු අතට හැරෙව්වා වගෙයි. වහලා තිබුණු දෙයක් ඇරලා පෙන්නුවා වගෙයි. මං මුලා වූවන්ට නියම මග පෙන්වා දෙනවා වගෙයි. ඇස් ඇති උදවියට රූප දකින්න අඳුරෙහි තෙල් පහනක් දල්වා ගෙන දරා සිටිනවා වගෙයි. ඔය විදිහට භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ශ්‍රී සද්ධර්මය වදාළා. ස්වාමීනී, මේ අපිත් භාග්‍යවතුන් වහන්සේ ව සරණ යනවා. ශ්‍රී සද්ධර්මයත් ආර්ය මහා සංඝ රත්නයත් සරණ යනවා. ස්වාමීනී, අප ගැන

අද පටන් දිවි තිබෙන තුරාවට ම තෙරුවන් සරණ ගිය උපාසකයන් ලෙස සළකන සේක්වා!" කියල

තේවිජ්ජසුත්තං නිට්ඨිතං තේරසමං
දහතුන්වෙනි තේවිජ්ජ සූත්‍රය නිමාවිය

සීලක්ඛන්ධවග්ගෝ නිට්ඨිතෝ පඨමෝ.
පළමු වෙනි සීලක්ඛන්ධක වර්ගය නිමා විය.

මේ ජීවිතය තුළ ම උතුම් ශ්‍රී සද්ධර්මය අවබෝධ කරනු කැමැති සැදැහැවතුන් ගේ ප්‍රසාද සංවේගය උදෙසාත්, ධර්මාවබෝධය උදෙසාත් මහත් ශ්‍රද්ධාවෙන් යුතුව මෙම දීඝ නිකායෙහි ප්‍රථම භාගය පරිවර්තනය කිරීමෙන් ලත් සියළු පින පිං කැමැති සියල්ලේ සතුටින් අනුමෝදන් වෙත්වා!

සාදු ! සාදු !! සාදු !!!

නමෝ තස්ස භගවතෝ සම්මා සම්බුද්ධස්ස!
ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!